# පට්ඨාන මහා පකරණ සන්නය

ප්‍රථම භාගය

(තෘතීය මුද්‍රණය)


මහාචාර්ය

රේරුකානේ චන්දවිමල

(සාහිත්‍යචක්‍රවර්ති, පණ්ඩිත, ප්‍රවචන විශාරද, අමරපුර
මහා මහෝපාධ්‍යාය ශාසන ශෝභන, ශ්‍රී සද්ධර්ම ශිරෝමණී)
**මහානායක ස්වාමිපාදයන් වහන්සේ විසින්**


පෞරාණික වාචනා මාර්ගය අනුව
සම්පාදිතයි.

*Non-commercial distribution*

**සබ්බදානං ධම්මදානං ජිනාති.**

ගෞරවාහී රේරුකානේ චන්දවිමල මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ දහම් පොත් නැවත නැවත මුද්‍රණය කර හැකි අඩුම මිලට සපයා,

ධර්මකාමී සැදැහැවතුන්ගේ සංඛ්‍යාව වර්ධනය කිරීම,

ශ්‍රී චන්දවිමල ධර්ම පුස්තක සංරක්‍ෂණ මණ්ඩලයේ

**පරමාර්ථය යි.**

එමගින් සිල්වත් ගුණවත් මහ සඟරුවන දැකීමත්, උන්වහන්සේලා රැක බලාගන්නා සැදැහැවත් ගිහි බොදුනුවන් දැකීමත්

**අපේ අපේක්‍ෂාව යි.**

වර්ධනය වන ආර්ථික අසමතුලිතතාව තුල, පවතින මිලට පොත් අලෙවි කර ලබන මුදල හා ඊ ළඟ මුද්‍රණයට වැය වන මුදල අතර ඇති පරතරය පියවීමට හැකි වී ඇත්තේ මෙහි අන් තැනක සඳහන් ආකාරයෙන් අනුග්‍රාහක සැදැහැවතුන් සහභාගි වන නිසා ය. අපේ කැපවීම හා අවංකභාවයේ මුදුවෙන් **ඔබේ දයකත්වය එල ගන්වමු.**

නාහිමිපාණන්ට වසර 100 ක් සම්පූර්ණවීමත්, අප මණ්ඩලයට වසර 10 ක් සම්පූර්ණවීමත් තුලින් බුදුන් වහන්සේගේ සදහම් පණිවුඩය බෙද දීමෙන් සුවහසක් ජනයා සහනයට පත්වීම ගැන

**අපි සතුටු වන්නෙමු.**

"චිරං තිට්ඨතු සද්ධම්මො"

*Non-commercial distribution*

## පට්ඨාන මහා පකරණයේ තෙවන මුද්‍රණය සඳහා සහාය වූ සාමාජිකයෝ.

| | | රු. ශ. |
|---|---|---|
| ප්‍රජා පොල්පිටිය මෙව් - පිටකෝට්ටේ | - | 50,000.00 |
| පී. ඩී ජගත්සිරි මානෙල් මයා - තඹුත්තේගම | - | 10,000.00 |
| සමින්ද රණසිංහ මයා - රාගම | - | 5,000.00 |
| පියදස වත්තිළච්චි මයා - කළුබෝවිල | - | 5,000.00 |
| දර්ශන සිල්වා මයා ඇතුලු පිරිස - අබුඩාබි | - | 4,000.00 |
| ඒ. එච්. එල්. යසවර්ධන මයා - අතුරුගිරිය | - | 4,000.00 |
| ආර්. ජී. රූපා අමරවතී මිය - අළුබෝමුල්ල | - | 3,000.00 |
| නයනි මුහන්දිරම් මිය - ඕස්ට්‍රේලියාව | - | 2,000.00 |
| එච්. ඩී. පී. කරුණාරත්න, රූපා කරුණාරත්න යුවල - හොරණ | - | 2,000.00 |
| වසන්ත පෙරේරා මයා - පානදුර | - | 2,000.00 |
| ජයන්ත වනිගසිංහ මයා - රත්නපුර | - | 2,000.00 |
| පී. ගුණවර්ධන මිය - රත්මලාන | - | 2,000.00 |
| කේ. ඒ. සුනිල් කුරුප්පු මයා - බෙම්මුල්ල | - | 2,000.00 |
| ටී. ආනන්ද මෙන්ඩිස් මයා - ජා-ඇල | - | 1,500.00 |
| වෛද්‍ය - කේ. ඩී. ජී. පොන්සේකා මයා - දෙහිවල | - | 1,500.00 |
| හර්ෂණ කීර්තිසිංහ මයා - පිළියන්දල | - | 1,000.00 |
| වෛද්‍ය - ආර්. සෙනෙවිරත්න මයා - මහනුවර | - | 1,000,00 |
| වෛද්‍ය - ඩී. රූබසිංහ මිය - බොරැල්ල | - | 1,000.00 |
| පී. එන්. කළුබෝවිල යුවල - - එප්පාවල | - | 1,000.00 |
| අයිරාංගනී කරුණාරත්න මිය - අඹගස්පිටිය | - | 1,000.00 |
| සෝමපාල කහවිට මයා - බදුරලිය | - | 1,000.00 |
| නන්දීශ කපුගේ මයා - නුගේගොඩ | - | 1,000.00 |
| එම්. එල්. පියතිස්ස මයා - පිළියන්දල | - | 1,000.00 |
| නිරාජ් ද සිල්වා මයා - පානදුර | - | 1,000.00 |
| අශෝක රූපසිංහ, නීලමනී රූපසිංහ යුවල - කෑගල්ල | - | 1,000.00 |
| කේ. ඒ. එල්. පොන්සේකා මිය - බලන්ගොඩ | - | 600.00 |
| අමරපාල මිය - දෙහිවල | - | 500.00 |
| අයි. ගුණවර්ධන මිය - නුගේගොඩ | - | 500.00 |
| පී. මහානාම මයා - නුගේගොඩ | - | 500.00 |
| අජිත් මනෝරත්න මයා - කොළඹ 6 | - | 500.00 |
| යූ. බී. තෙන්නකෝන් මයා - මුණමල්දෙණිය | - | 500.00 |
| අමරදස මුදලිගේ මයා - කැස්බෑව | - | 500.00 |
| ජේ. ආර්. ඒ. ආරියරත්න , ජී. වී. රාමසිංහ මිය - මාතර | - | 500.00 |
| රු. 500 අඩු පිරිනැමීම් එකතුව | - | 3496.00 |
| | | 113596.00 |

Non-commercial distribution

# ලේකම්ගේ සටහන්........

සම්බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටක ශ්‍රී සද්ධර්මය රැකගැනීම සඳහා මහා සංඝරත්නයෙන් ඉටු වූ කාර්යභාරය අති විශාලය. ත්‍රිපිටය සංගායනා කර ක්‍රමානුකූල කිරීම, භාණක පරම්පරාවලට බෙදී කටපාඩමින් පවත්වා ගැනීම, අටුවා, ටීකා හා වෙනත් පරිවාර ග්‍රන්ථ සම්පාදනය කිරීම මගින් මුල් බුදුදහමේ නිර්මල මූලික අඩී තහවුරු කරතැබීම ඒ අතර ප්‍රමුඛස්ථානය ගනී. අටමහ කුසල් අතර "ධම්මස්ස ලෙඛනං" යනුවෙන් දැක්වීමෙන් ධර්මය රැකගැනීම පිළිබඳව තිබූ අවධානය පැහැදිලි වේ. ධර්මයේ පැවැත්ම පිළිබඳව ඓතිහාසික වූත්, ධර්මානුකූල වූත් මතවාදයන්ට පිළිතුරු දීමට ද මේ භික්ෂූන් වහන්සේට සිදුවිය.

"අභිධර්මය බුද්ධ දේශනාවක් නොවේ" ය යන්න මෙවැනි එක් මතයකි. ගැඹුරු වූත්, දර්ශනික වූත් අභිධර්ම පිටකය දරන්නන් සමාජයේ ලබා තිබූ සැලකිල්ල පහත හෙළීම හෝ ඊට පහරදීම තුළින් බුදුදහම පිරිහීමට ලක්කිරීම හෝ අරමුණු කරගත් විතණ්ඩවාදීහු බුදුදහම ලක්දිව පිහිටුවූ මුල් යුගයේදී මේ අදහස පලකළහ. ක්‍රිස්තු ධර්මය මෙහි ප්‍රචලිත කළ යුගයේදී නැවත යුරෝපීය පඬිවරුන් මගින් උගතුන් හරහා මේ අදහස ලක්දිව ප්‍රකට විය. අභිධර්ම පිටකයේ අභ්‍යන්තර කරුණු වටහා නොගෙන, අහුලාගත් කරුණු මත, ගැතිව අදහස් පලකිරීමෙන් හා එය කිය යුතු ආකාරය නොසලකා කීමෙන් වන හානිය සුළුපටු නොවේ. ඒ නිසාම අපේ දෑ රැකගැනීමේ අරමුණින් ඇරඹුණු දහම් පාසල් අධ්‍යාපන ක්‍රමය, අභිධර්මය ඉගැන්වීම සඳහා තිබූ අපේ පාරම්පරික ක්‍රමපටිපාටිය බැහැර කර හරය තබා සුඹුල සූරා දක්වන ඉගැන්වීම් රටාවකට පැමිණ ඇති බව පෙනේ. එවැනි අදහස්වලට අභීතව පිළිතුරු දීමේ සම්ප්‍රදයක් ගොඩනගා ගත්තවුන් අතර, අටුවාචාරී බුද්ධඝෝෂ හිමියන්ට පසුව අපට දක්නට ලැබෙන ප්‍රමුඛ නාමයකි; රේරුකානේ චන්දවිමල හිමි නාමය. උන්වහන්සේගේ අදහස් නිසා භාවනා පංති, අභිධර්ම පංති හා එවැනි මධ්‍යස්ථාන ලක්දිව ප්‍රචලිත වූ අතර, බොහෝ ගිහි බෞද්ධයෝ ධර්ම - විනය දත් පිරිසක් බවට පත්වූහ.

Non-commercial distribution

ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහයන් කියූ පරිදි 2500 බුද්ධ ජයන්තිය අරබයා වැඩි ඝෝෂාවක් නැතිව කළ සාර්ථකම වැඩ පිළිවෙල රේරුකානේ නාහිමියන්ගේ "**බුද්ධ ජයන්ති පොත් මාලාව**" ය. ලක්දිව බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීමට සමත් වූ ඒ පොත් සම්පාදනයෙන් "අමත දුංදුභිය" වැයූ උන්වහන්සේ බුද්ධ වර්ෂ 2541 ක්වූ ඇසළ පුන් පෝදිනට වසර සීයක් සම්පූර්ණ කරති.

අභිධර්මය රේරුකානේ නාහිමියන්ගේ පදනමයි. බොහෝ දෙනා උන්වහන්සේ හඳුන්වන්නේ ද 'ආභිධම්මික' නාමයෙනි. ඒ නිසා බොහෝ සැදැහැවතුන්ගේ ඉල්ලීම පරිදි අවුරුදු 41 කින් මෙපිට ලබාගන්නට නොහැකිව තිබූ, නාහිමියන්ගේ සියුම් නුවණ ප්‍රකට වන 'පට්ඨාන මහා ප්‍රකරණ සන්නය' මුද්‍රණය කිරීමට අදහස් කළෙමු.

ඊට වැය වන **රුපියල් ලක්ෂ 5** කට වැඩි පිරිවැය දැරීම ගැටලුවක් වුවද, ශ්‍රී ලංකා ජනාධිපතිනි **චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග** මැතිණියගේත්, බුද්ධශාසන, සංස්කෘතික හා ආගමික කටයුතු අමාත්‍ය **ලක්ෂමන් ජයකොඩි** මැතිතුමාගේත්, **බුද්ධ ශාසන අරමුදලේ පාලක මණ්ඩලයේත්** අවබෝධය නිසා අපට මේ ගැටලුවෙන් නිදහස් වීමට හැකිවිය. පොලී රහිතව සැපයූ මේ මුදල ධර්මයට කළ අතිමහත් පූජාවකි. එය ලබා ගැනීමේදී අනුග්‍රහය දැක්වූ **බුද්ධශාසන අමාත්‍යාංශයේ** හා **හොරණ ලංකා බැංකුවේ කාර්ය මණ්ඩලයන්ට** කෘතඥ වෙමු.

පට්ඨාන ප්‍රකරණය මුද්‍රණය කර තිබුණේ පැරණි අකුරු රටාවට ය. පාලි භාෂාව ලිවීමේ පැරණි රීතියත්, පැරණි සිංහලයේ බැඳි අකුරු රීතියත් ආරක්ෂා කර එසේ ම මෙය මුද්‍රණය කර තැබීම සුදුසු යයි කල්පනා කළ නිසාත්, නවීන තාක්ෂණයෙන් අපේ පැරණි හරය ආරක්ෂා කර ගැනීමට බාධාවක් නොවන බව දැක්විය යුතු නිසාත් පරිඝනකයේ නවීන තාක්ෂණයෙන් අපි පැරණි ක්‍රමය මුද්‍රණය කළෙමු. ඒ අවශ්‍යතාව එසේම ඉටු කළ සිකුරු මුද්‍රණාලයාධිපති **කේ. ටී. ඒ. ජයවර්ධන මහතා ඇතුළු කාර්ය මණ්ඩලය** විද්වත් ජනයාගේ පැසසුමට ලක්වෙති.

මෙවැනි පොතක සෝදුපත් කියවීම අතිශය දුෂ්කර වූවකි. රසවත් බව නොවැටහීම, කාලය ලබාගැනීමේ හා කියවීමේ අපහසුතාව නිසා එක දිගට මුල් පොත හා සැසඳීමට කෙනකු ලබාගැනීම වඩාත් දුෂ්කර විය. පූජ්‍ය **කිරිඹරුවේ ධම්මානන්ද** හිමි, **කුකුල්පනේ සිද්ධාර්ථ** හිමි. ශාස්ත්‍රපති **කුසුමා දෙඩන්ගොඩ මිය, ඩී. කේ. කාරියප්පෙරුම** (උප ලේකම්) මයා, **ලලනි ගුණතිලක** මෙනවිය, වරින්වර දැක්වූ සහාය අගය කරන අතර,

*Non-commercial distribution*

කෙටි කලක් තුළ පොතෙහි වැඩි කොටසක් සැසඳීමට ඉදිරිපත් වූ **ගයානි වනිගතුංග** මෙනවිය දැක්වූ උනන්දුව හා නිපුනතාව, දහම් පාසල් අධ්‍යාපනයේ හරය උකහාගැනීමක් ලෙස දකිමි.

අනෙක් පොත් හා සසඳන විට රේරුකානේ නාහිමියන්ගේ පොත් මිල බෙහෙවින් අඩු බව ඔබ දනී. පොතෙහි මිලෙන් 1/4 ක් වෙළෙඳ වට්ටම් වශයෙන් අඩු කළ විට මුද්‍රණ වියදම් හා ප්‍රවාහන වියදම් ආදිය ඉතිරි මුදලින් ආවරණය වෙයි. ඊළඟ මුද්‍රණය සඳහා වැඩියෙන් වැය වන මුදල පියවනු ලබන්නේ ධර්මයේ පැවැත්ම පිණිස සැදැහැවතුන් කරන අනුග්‍රහයෙනි. මේ පොත සඳහා ගත් ණය මුදල පියවීමට එසේ අනුග්‍රහය දැක්වූ සැදැහැවතුන්ට වහා කෙලෙස් මල දුරුකර නිවනින් සැනසීමට මේ පින හේතු වේවා.

නාහිමියන්ගේ ජන්ම ශත සංවත්සරයේදී උන්වහන්සේගේ පොත් පැවැත්වීම සඳහා සහාය දුන් දැනට අප අතර නැති කීප දෙනකු සිහිපත් කිරීම යුතුකමකි. කිසියම් සංවිධානයක් නැති යුගයේ පොත් රැකගත් පූජ්‍ය **ගොඩිගමුවේ සෝරත හිමි**, එකල හා මණ්ඩලය පිහිටවූ පසු (සභාපති වශයෙන්) කටයුතු කළ පූජ්‍ය **හේන්ගොඩ කල්‍යාණධම්ම හිමි**, භාණ්ඩාගාරිකව සිටි වෛද්‍ය **ඒ. ඩී. ටී. ජයවර්ධන** මහතා, ගත්කතුවර **කරුණාසේන ජයලත්** මහතා ඒ අතර වෙති. මේ පොත් පෙළ ශාස්ත්‍රීය පර්යේෂකයන්ට යොමු කරමින් අනුක්‍රමණිකාවන් ලියූ පරලෝසැපත් **හර්බට් පතිරණ** ශූරීන්ට නිවන් සුව අත්වේවා. වත්මන් සභාපති කිරිඔරුවේ ධම්මානන්ද හිමිපාණන් ඇතුළු සාමාජික හවතුන්ගෙන් ලැබෙන සහායත්, හිටපු අමාත්‍යවරයකු වූ **ඉන්ද්‍රදස හෙට්ටිආරච්චි** මහතාගෙන් ලැබෙන දිරිමත් කිරීමත් ප්‍රසන්නව මෙහි යෙදීමට අප මෙහෙයවයි.

**තෙරුවන් සරණයි !**

1997 ජූනි 10 වන දින
පොකුණුවිට දී ය.

**සී. තනිප්පුලිආරච්චි**
ලේකම්
ශ්‍රී චන්ද්‍රවිමල ධර්ම පුස්තක
සංරක්ෂණ මණ්ඩලය.

*Non-commercial distribution*

# ප්‍රස්තාවනා

ඥෙය සාගර පාරගත වූ මහා කාරුණික වූ අප භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුද්ධයන් වහන්සේ සර්වඥ පද ප්‍රාප්තව ධර්මදූත මෙහෙය සඳහා ප්‍රථම වරට පිටත් කර යවන ලද සැට නමක් වූ මහරහතන් වහන්සේලා ගෙන් කෙනෙකු වූ **අස්සජි** මහරහතන් වහන්සේ විසින් තමන් වහන්සේ වෙත එළඹ තථාගත යන් වහන්සේ දේශනය කරන ධර්මය කවරේ දැ යි විචාළ **උපතිස්ස** නම් වූ පිරිවැජි හට

"යෙ ධම්මා හෙතුප්පභවා තෙසං හෙතුං තථාගතො ආහ,
තෙසඤ්ච යො නිරොධො එවං වාදී මහාසමණො."

යනුවෙන් හේතුවෙන් හටගන්නා පඤ්චස්කන්ධ සංඛ්‍යාත නාම රූප ධර්මයන් හට ගැනීමේ හේතුන් හා ඒ හේතුඵල ධර්මයන් ගේ නිරෝධය වූ නිවනත් තථාගතයන් වහන්සේ දේශනය කරන්නාහයි වදරන ලද්දේය. එයින් දැක්වෙන්නේ තථාගතයන් වහන්සේ විසින් දේශනය කරන ධර්මය හේතුඵල ධර්මයක් බව ය.

බුදුන් වහන්සේ විසින් හේතුඵල දේශනය කර ඇත්තේ ද එක් ක්‍රමයකින් ම නොව ක්‍රම තුනකිනි. **ආර්‍ය්‍යසත්‍යය ක්‍රමය ය, ප්‍රතීත්‍ය සමුත්පාද ක්‍රමය ය, ප්‍රස්ථාන ක්‍රමය ය** යන තුන තථාගතයන් වහන්සේ ගේ හේතුඵල දේශනා ක්‍රම තුනය. තථාගතයන් වහන්සේගේ හේතුඵල දේශනා තුන අතුරෙන් ආර්‍ය්‍යසත්‍ය දේශනය කර තිබෙන්නේ සංසාර ප්‍රවෘත්තියේ හේතුව වශයෙන් තෘෂ්ණා සංඛ්‍යාත එක් ධර්මයක් පමණක් දැක්වීමෙනි. ප්‍රතීත්‍ය සමුත්පාද දේශනයෙහි දැක්වෙන්නේ ද්වාදශාඞ්ගයක් ඇති හේතුඵල පරම්පරා වෙකි. ඒ දේශනා දෙක්හිම තෘෂ්ණාදිය ඵලයට හේතුවන බව පමණ මුත් හේතුවන සැටි දක්වා නැත. තථාගතයන් වහන්සේගේ සර්වාඞ්ග සම්පූර්ණ අති විස්තර හේතුඵල දේශනය ප්‍රස්ථාන මහා ප්‍රකරණය ය.

දේව මනුෂ්‍ය තිරශ්චීන වෘක්ෂ පර්වතාදි වශයෙන් ලොව ඇති සකල සජීවාජීව වස්තූන් ම සෑදී ඇති මූල ධාතු සමූහය වූ චිත්ත චෛතසික රූප යන පරමාර්ථ ධර්ම තුන් කොටස හා නිර්වාණ පරමාර්ථය ද ප්‍රඥප්තිය ද යන මේ සියල්ල මූලභාව ආරම්මණභාව අධිපති භාවාදි ඵලය උපකාර වන ශක්ති විශේෂයන් ගේ වශයෙන් හේතුප්‍රත්‍යය ආරම්මණප්‍රත්‍යය අධිපතිප්‍රත්‍යය යනාදීන් කොටස් සූවිස්සකට බෙද නැවත පරමාර්ථ ධර්මයන් කුශලාකුශල අව්‍යාකෘතාදි වශයෙන් කෙටස් සසැටකට හා හේතු

Non-commercial distribution

නහේතු ආදි වශයෙන් කොටස් දෙසියයකටද බෙද කුශලාදි ධර්මයන්ට ඒ ඒ ශක්ති විශේෂවලින් ප්‍රත්‍යය වන සැටිත් ප්‍රත්‍යය නොවන සැටිත් දැක්වීම් වශයෙන් ප්‍රස්ථාන ප්‍රකරණය දේශිතය.

මේ ප්‍රකරණය සේ ගැඹුරුවූ ද විශාලවූ ද තවත් ග්‍රන්ථයක් ලෝකයෙහි නැත්තේ ය. මේ ලොව ඇති ග්‍රන්ථරාජයා ය. දැනට සිංහල අකුරෙන් මුද්‍රණය වී ඇති පට්ඨාන මහාපකරණ පාලිය පිටු 1456 කින් යුක්තය. එපමණ පිටු ගණනක පට්ඨාන පකරණය මුද්‍රණය කළ හැකිවී තිබෙන්නේ අගමුල පමණක් දැක්වීම් වශයෙන් ද විස්තර කළ යුතු ක්‍රමය පමණක් වචන සවල්පයකින් දැක්වීම් වශයෙන් ද පොත්වල ලිවිය හැකි පරිදි භික්ෂූන් විසින් දැරිය හැකි පරිදි කෙටිකර තිබෙන බැවිනි. එසේ කෙටිකර ඇති තැන් සම්පූර්ණ කර ප්‍රස්ථාන ප්‍රකරණය පත්වල ලියත හොත් එයට කඩදාසි පිටු කෝටියක් වුව ද ප්‍රමාණ නොවේ.

අනන්ත නය ඇත්තා වූ මේ ප්‍රකරණය නය සාගරයෙකි. **මහාගතිම්බය තිස්සදත්ත තෙරුන්** වහන්සේ මහබෝ විදිනු පිණිස නැවකින් දඹදිව යන්නාහු මහසයුරේදී නැවේ උඩතට්ටුවේ සිට සාගරය දෙස බැලූහ. උන් වහන්සේට සාගරයේ එතරක් හෝ මෙතරක් නොපෙනිණි. සිවුදිගින්ම මහ හඬ නඟා බිඳි බිඳී යන රළ නිසා හටගන්නා සුදු පෙණින් වැසී ගිය රිදීපටක් සේ දිලෙන සාගර ජලයම පෙනිණ. ඉක්බිති උන්වහන්සේ මහාසාගරයේ රළ වේගය බලවත් ද ප්‍රභේද විසින් ප්‍රකරණ සූවිස්සක් වන සමන්ත පට්ඨාන පකරණයේ නය මුඛය බලවත් දැයි සිතූහ. සිතන්නා වූ උන්වහන්සේට උඩ යට දෙකින් හා සිවුදිගිනුත් මේ මහාසාගරයේ පරිච්ඡේදයක් ඇත්තේය. අනන්ත නය සමන්වාගත ප්‍රස්ථාන මහා ප්‍රකරණයේ පරිච්ඡේදයක් නො පෙනේය යි බලවත් ප්‍රීතියක් ඇතිවිය. උන්වහන්සේ එතැනම හිඳ ඒ ප්‍රීතිය විෂ්කම්භනය කොට විදසුන් වඩා සව් කෙලෙසුන් නසා රහත් වූහ.

## බුදුරැස් විහිදීම

තථාගතයන් වහන්සේ බෝධිමූලයේ අපරාජිත පර්‍යංකයෙහි වැඩහිඳ සම්‍යක් සම්බෝධි සමධිගමය කොට "මේ ධර්මය සොයන්නට පටන් ගත් මා හට චතුරසඞ්ඛ්‍ය කල්පලක්ෂයක් ඉක්ම ගියේ ය. මම මේ පර්‍යංකයෙහි හිඳ මතු කිසිකලෙක හිස ඔසවා නො එන පරිදි එක් දහස් පන්සියයක් කෙලෙස් සතුරන් පරදවා පළවා හැර එතෙක් කල් සොයමින් සිටි ධර්මය ප්‍රතිවේධ කෙළෙමි" යි මහත් සොම්නසට පැමිණ ලොවුතුරා බුදු වුවද එම අස්නෙන් නො නැඟී සම්‍යක් සම්බෝධිය පිණිස බැඳගත් පර්‍යංකය නොබිඳ අනේක සමවත්වලට සමවදිමින් දහම් රස විඳිමින් නිවන් සුව විඳිමින්

Non-commercial distribution

සතියක් ඒ අසුනෙහිම වැඩහුන් සේක. බුදුවීමෙන් අට වන දිනයෙහි ඒ අසුනෙන් නැඟිට එයින් මදක් ඈත්ව "මෙය මාවිසින් සාරාසඞ්ඛ්‍යකල්ප ලක්‍ෂයක් මුළුල්ලෙහි රැස්කළ පාරමිතා කුශලයන් ගේ ඵල ලැබූ තැනය" යි වැඩහුන් තැනට හා මහබෝරුකටත් ගරුකිරීමක් වශයෙන් එදෙස බලාගත් වනම ඇසිපිය නොහෙළාම සතියක් සිටගෙන ම හුන්සේක. පර්‍ය්‍යඞ්කයට උතුරු දිග වූ ඒ ස්ථානය **අනිමිස චේතිය** නම් විය. ඉක්බිති ඒ සිටිතැනටත් පර්‍ය්‍යඞ්කයටත් අතරෙහි නැගෙනහිරට හා බස්නාහිරට දික්ව පිහිටි රුවන් සක්මනෙහි සක්මන් කරමින් සතියක් කල් යැවූ සේක.

දින එක් විස්සක් ඉක්ම ගියේ ය. ඒ එක් දිනකදීවත් තථාගත ශරීරයෙන් රැස් නොවිහිදිණ. සතරවන සතිය පැමිණි කල්හි මහබෝමැඩින් බස්නාහිර උතුරු දෙදිගට අතර රතනඝරයෙහි වැඩහිඳ අභිධර්‍මය මෙනෙහි කරන්නට පටන්ගත් සේක. උන් වහන්සේ ධම්මසඞ්ගණී විභඞ්ග ධාතුකථා පුග්ගලපඤ්ඤත්ති කථා වත්ථු යමක යන ප්‍රකරණ සය පිළිවෙළින් මෙනෙහි කොට පට්ඨාන මහාපකරණයට බැස "හෙතුපච්චයො ආරම්මණ පච්චයො අධිපති පච්චයො" යනාදීන් ධර්‍මය මෙනෙහි කරන්නට පටන්ගත් සේක. උන්වහන්සේ විසින් පළමුව මෙනෙහි කළ ප්‍රකරණ සය කුඩා බැවින් සර්‍වඥතාඥානය රිසිසේ පවත් වන්නට ඒ ප්‍රකරණ ප්‍රමාණ නො වී ය. අනන්ත ක්‍රම ඇති අති විශාල වූ පට්ඨාන මහාපකරණය තථාගතයන් වහන්සේට තමන්වහන්සේ ගේ සර්‍වඥතාඥානය හැසිර වීමට ඉඩ ඇති ස්ථානය විය. පට්ඨාන ප්‍රකරණයට අයත් ඉමක් කොණක් නැති පරම සූක්‍ෂම ධර්‍මයන්හි රිසි සේ සර්‍වඥතාඥානය හසුරුවන්නට තථාගතයන්වහන්සේ ගේ සිත අතිශයින් පහන් විය. ඒ ප්‍රශාන්ත සිතින් උපදවන රූපද ඒවා නිසා තථාගතයන් වහන්සේ ගේ ශ්‍රී ශරීරය ද පැහැපත් විය. තථාගතයන් වහන්සේගේ කෙස් ලොම්වලින් හා නේත්‍රයන් ගෙන් ද නිල්වන් රැස් දහර නික්මෙන්නට විය. එකෙනෙහි ඒ රශ්මීන් නිසා අහස නිල් මල් නිල් කොඩි නිල් වියන් වලින් වැසීගියාක් මෙන් විය. සමින් හා ඇස්වල ඇතැම් තැනකින් ද රන්වන් රැස් දහර නික්මෙන්නට විය. ඒ රැස් නිසා ලෝක කුහරය රන්මල් රන්සුණු රන්වන් මල් විසුරුවා හැරි කලෙක මෙන් කහ පැහැයෙන් බබලන්නට විය. ලේමස්වලින් හා ඇස්වල රතු තැන්වලින් රතු රැස්දහර නික්මෙන්නට විය. ඒවායින් ලෝක ධාතුව රත්පැහැයෙන් බබලන්නට විය. ඇටවලින් හා දත්වලින් ද ඇස්වල සුදු තැන්වලින් ද සුදු රැස් දහර නික්මෙන්නට විය. එයින් ලෝකධාතුව සුදු පැහැයෙන් බබලන්නට විය. ශ්‍රී ශරීරයේ ඒ ඒ තැන්වලින් මාඤ්ජිෂ්ඨක ප්‍රභාෂ්වර රශ්මිහු ද නික්මෙන්නට වූහ. පට්ඨාන මහාපකරණයා ගේ විශිෂ්ටත්වය මේ බුදු රැස් විහිදීමෙන් ද තේරුම් ගත හැකි ය.

Non-commercial distribution

## පට්ඨාන පකරණ සන්නය සම්පාදනය කිරීම

පට්ඨාන මහා පකරණ පාලිය කියවා එයින් ප්‍රයෝජනයක් ලබනු තබා එහි සැටිවත් කිසිවකුට තේරුම් ගත නොහැකිය. පාලි භාෂාව දතහොත් බුදු දහම දත හැකිය. යන හැඟීමක් බොහෝ දෙනෙකුට ඇතත් එය මුළාවෙකි. පාලිය කොතෙක් දතුවකුට වුවද පාලි දැනීමේ බලයෙන් මේ ප්‍රකරණය තේරුම් ගත නො හැකිය. කොතෙක් පාලි දතුවකු විසින් වුව ද පට්ඨාන පකරණය තේරුම් ගනු කැමති නම් අභිධර්මය දතුවකුගෙන් උගත යුතුමය. සන්නයක් නැති කල්හි එය ගුරුවරයකුගෙන් ඉගෙනීමද අපහසු ය. ඒ බව දත් අපෙන් අභිධර්මය උගත් කාන්තාවක් ඇතුළු බොහෝ දෙනකුගේ ඉල්ලීම පරිදි අපවිසින් මේ ග්‍රන්ථය සම්පාදනය කරන ලදී.

පට්ඨාන පකරණය ඉතා ගැඹුරු ඉතා විශාල ග්‍රන්ථයක් වුව ද එහි වචන ඇත්තේ සුළු ගණනෙකි, එබැවින් පට්ඨානය ගැන දැනුම නැති පාලි භාෂාව දත් කෙනකුට වැඩි අපහසුවක් නැතිව පට්ඨාන පාලියට පදයෙන් පදය අර්ථ දෙන සන්නයක් නම් සැපයිය හැකිය. එය සිංහලට ද පෙරලිය හැකි ය, එහෙත් එබඳු සන්නයකින් හෝ පරිවර්තනයකින් සිදුවන අර්ථයක් නම් නැත. එබඳු සන්නයකින් හෝ පරිවර්තනයකින් පට්ඨානය ඉගෙනගන්නකුට ලැබිය හැකි අල්පමාත්‍ර ප්‍රයෝජනයකුදු නැත. පට්ඨානපකරණයට සන්නයක් සැපයිය යුත්තේ ඒ ප්‍රකරණය උගත යුතු ක්‍රමයට ය. පට්ඨානයට සැපයිය යුතු සන්නය කෙබඳු විය යුතු ද යනු මේ සන්නය කියවීමෙන් තේරුම් ගත හැකි වනු ඇත. මේ ප්‍රකරණය ශිෂ්‍යයනට උගත හැකි වන පරිදි උගතයුතු ක්‍රමය දැක්වෙන සන්නයක් එයට සැපයීම නම් ඉතා දුෂ්කර කරුණෙකි. අනික් පොත්වලට සන්න සපයන්නාක් මෙන් අටුවා ටීකා ආශ්‍රයෙන් මෙය නො කළ හැකි ය. අතීතයේ පටන් පැවතෙන පට්ඨානපකරණය උගැන්වීමේ ක්‍රමයක් ඇත්තේ ය. අප රටේ ඒවා ලියා තැබූ පොත් අද කොතැකවත් දක්නට නැත. සතුරු උවදුරුවලින් අප රටේ කලින් කල ඇතිවුණු ශාසන විනාශවලදී අප රටේ තුබූ ඒ පොත් නැතිවී යන්නට ඇත. බුරුමයේ වනාහි අභිධර්මය උගැන්වීමේ පෞරාණික ක්‍රමය හා පොත පත ද අදත් පවතී. අපට මේ පට්ඨාන සන්නය සැපයිය හැකිවූයේ බුරුමයේ අදත් ඒ උගැන්වීම් ක්‍රමය පවත්නා නිසා ය, මෙය අප විසින් සපයන ලද්දේ බුරුම පට්ඨාන සන්නය හා පට්ඨානය පිළිබඳවූ තවත් බුරුම පොත් ඇසුරු කිරීමෙනි. මෙහි ඇත්තේ අප විසින් අමුතුවෙන් උපදවන ලද්දක් නොව පෙර පටන් ආචාර්ය්‍ය පරම්පරාවෙන් පැවත ආ උගැන්වීම් ක්‍රමය ය.

Non-commercial distribution

## ද්විතීය සංස්කරණය හා මුද්‍රණය

ඉතා ගැඹුරු වූද ඉතා විශාල වූද මේ ප්‍රකරණයට එකවරකදීම සර්‍වාකාර පාරිශුද්ධියක් ඇති සන්නයක් නො සැපයිය හැකිය. පට්ඨානයට සන්නයක් සැපයීමේ ඇති දුෂ්කරත්‍වය කෙසේ කිවද පට්ඨානය නොදන් නවුන් හට වැටහෙන්නේ නොවේ. මේ පට්ඨාන පකරණය ලොවුතුරා බුදුවරයන්ගේ නුවණට පමණක් ගැලපෙන සෙස්සනට අවිෂය ග්‍රන්ථයකි. එහි ඇත්තේ නුවණ මඳ අප වැනි අයට හිසරදය ඇති කරන විද්‍යාවකි. මේ සන්නයෙහි ඇති සෑම වචනයක් ම සෑම කරුණක් ම තවත් කරුණු සිය ගණනකට තුඩු දෙන තවත් කරුණු සිය ගණනක් හා සම්බන්ධය ඇති ඒවා ය. එබැවින් මේ සන්නය ලිවීමේදී සෑම වචනයක්ම සෑම කරුණක් ම ලියන්නට සිදුවූයේ තවත් සිය ගණන් කරුණු දෙස බලාගෙන ඒවාටද විරුද්ධ නොවන පරිදිය., නිරතුරුවම සිහියෙන් යුක්තවිය නොහෙන බැවින් එසේ කිරීමේ දී තැනින් තැන යම් යම් අඩුපාඩු හා වැරදිත් ඇතිවිය හැකි ය. මෙය සම්පූර්ණයෙන් ශුද්ධත්‍වයට පැමිණීමට නම් නැවත නැවත පරීක්‍ෂා කොට කීපවාරයක් සංස්කරණය කළ යුතු ය. එහෙත් මේ විශාල ග්‍රන්ථය නැවත නැවත කීපවාරයක් කියවා පරීක්‍ෂා කිරීමට අපට කලක් නැත. සෝමාවතී මූනසිංහ මැතිනිය විසින් පළමුවෙනි වරට මුද්‍රණය කරවූ පට්ඨාන සන්නය අප විසින් ලියන ලද මුල් කොපිය ය. සංස්කරණය සඳහා එය නැවත පරීක්‍ෂා කිරීමට අවස්ථාවක් අපට නො ලැබිණ. පළමුවර පොත මුද්‍රණය කරවූ අප ශිෂ්‍යාවක් වූ සෝමාවතී මූනසිංහ මැතිනිය ඒ පොත නැවත නැවත පරීක්‍ෂා කර බලා සංස්කරණය කළ යුතු තැන් අපට සලකුණු කරදෙන ලදි. ඒ තැන් අප විසින් පරීක්‍ෂාකර සංස්කරණය කරන ලදී. එබැවින් මේ ද්විතීය මුද්‍රණය ප්‍රථම මුද්‍රණයට වඩා ශුද්ධ බව කිය යුතු ය. මේ පොත පළමුවෙන් මුද්‍රණය කරවීමේදී ඒ සඳහා ගෙන්වා තුබූ කරදාසි අවසන් වී යාම නිසා එයට ඇතුළත් කරන්නට නුපුළුවන් වී ඉතිරිව තුබූ කොටසක් ද මේ දෙ වන මුද්‍රණයට ඇතුළත් කර ඇත්තේය. එබැවින් මේ පොත පළමු මුද්‍රණය කරවූ පොතට පිටු 84 කින් වැඩි බව ද සැලකිය යුතු ය.

මේ ග්‍රන්ථය දෙවන වරට මෙසේ මුද්‍රණය කරවන ලදුයේ කොළඹ මෙට්ලන්ඩ් ක්‍රෙසන්ට් මාවතේ පෙනන්ලොප් නමැති මන්දිරයෙහි වෙසෙමින් සිය ධනයෙන් බොහෝ ලෝසසුන් වැඩ කරන සැදැහැවත් බෞද්ධ කාන්තාවක් වූ **සෝමාවතී හේවාවිතාරණ මැතිනිය** විසිනි. ඇය විසින් මෙය මුද්‍රණය කරවන ලදුයේ ඇගේ පියාණන් වූ නිධනප්‍රාප්ත සද්ගුණවත් දෙන්. **තියදෝරිස් වික්‍රමසිංහ ගුණතිලක හල්ලල රාලහාමිට** හා ආදරනීය

Non-commercial distribution

මැණියන් වූ පරලෝ සැපත් ඇනා දිම්ටි මනම්පේරි මැතිනියට ද ආදරනීය සහෝදරයකු වූ ඇඩ්වින් වික්‍රමසිංහ ගුණතිලක මහතාට ද සිය ධනයෙන් ත්‍රිපිටක මුද්‍රණයක් පිහිටවීම් ආදියෙන් බොහෝ ලෝ සසුන් වැඩ කොට ස්වර්ගප්‍රාප්ත ඇගේ ආදරනීය ස්වාමිපුරුෂයා වූ සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතාට ද මේ පින අනුමෝදන් කරවනු පිණිස මේ අගනා දහම් පොත මුද්‍රණය කරවීමේ කුශලයෙන් සෝමාවතී හේවාවිතරණ මැතිණිය හා පරලෝ සැපත් එතුමිය ගේ ඥාතිහූ බුද්ධාදි මහෝත්තමයන් විසින් පැමිණි වදාළ පරමසුන්දර සර්වකාලික ලෝකෝත්තර නිර්වාණයට පැමිණෙත්වා.

මෙම මුද්‍රණයේදී අභිධර්මාචාර්ය බේන්දඑවේ ධීරානන්ද ස්ථවිරයන් විසින් ශෝධ්‍යපත්‍රාවලෝකනය කරදීමෙන් මේ සත්කෘත්‍යයට සහාය වූ බව ද මතක් කරමු.

චිරං තිට්ඨතු සද්ධම්මො

මීට, ශාසනස්ථිතිකාමී

රේරුකානේ චන්දවිමල මහාස්ථවිර

2499/1955 දෙසැම්බර් මස 9 වෙනි දින

පොකුණුවිට ශ්‍රී විනයාලංකාරාරාමයේදීය.

Non-commercial distribution

# පට්ඨාන මහා පකරණය

## සැකෙවින් දැක්වීම.

පට්ඨාන මහා පකරණය වනාහි ලෝකයේ ඇති විශාල ම පකරණය ය, එහි කොණක් නො දැකිය හැකි ය. ඒ බැවින් එය අනන්ත නයසමන්නාගත සමන්ත පට්ඨාන මහා පකරණය යි කියනු ලැබේ. එය පොත්වල ලියා තිබෙන්නේ පෙය්‍යාල ක්‍රමයෙනි. පොත් වල ලියැවී ඇති ප්‍රමාණයෙන් එය බණවර දෙසිය සතළිස් දෙකකි. ප්‍රකරණය අති විශාල වුව ද එහි වචන ඇත්තේ ශීමා සහිත ගණනෙකි.

"හෙතුපච්චයො ආරම්මණපච්චයො" යනාදි ප්‍රත්‍යයපද සූ විස්ස ය, "කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යාකතා ධම්මා" යනාදි ධම්මසඞගණි පකරණයෙහි දැක්වෙන තිකමාතිකා පද ස සැට ය.,"හෙතු ධම්මා න හෙතු ධම්මා" යනාදි දුකමාතිකා පද දෙසිය ය යන මේ පද දෙසිය අනූව පට්ඨාන මහා පකරණයේ මූල පදයෝ ය. ඒ මූලපදයන් හා නවත් නාමපද ක්‍රියාපද ස්වල්පයක් යොදා පට්ඨාන පකරණය දේශනය කර තිබේ.

මේ පට්ඨාන පකරණය පච්චයවිභඞගවාරය ය, මහාවාරය ය යි කොටස් දෙකකින් යුක්ත ය. එයින් පච්චය විභඞගවාරය පළමු කොට දේශනය කර තිබේ. එය සූවිසිප්‍රත්‍යයන් පිළිබඳ සාමාන්‍ය විස්තරයෙකි. මාතිකා නික්ඛෙපවාරය යනු ද එයට නමෙකි. එය පට්ඨාන මහා පකරණයට පිවිසීමේ දොරටුවක් වැනි ය.

මහාවාරය පට්ඨාන සූවිස්සකින් යුක්ත ය. එයින් එක් එක් පට්ඨානයක්, අතිවිශාල ප්‍රකරණයෙකි. පට්ඨාන සූවිස්ස මෙ සේ දත යුතු. මේ ප්‍රකරණයෙහි අනුලෝම නය ය, පච්චනීය නය ය, අනුලෝම පච්චනීය නය ය, පච්චනීයානුලෝම නය ය යි මහා නය සතරක් ඇත්තේ ය. ඒ මහා නය සතර ධර්මපද විෂයෙහි ද ප්‍රත්‍යය පද විෂයෙහි ද ලැබේ.

"කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා" යනාදීන් පද ඇති සැටියට ම ගෙන දේශනය කිරීමේ ක්‍රමය අනුලෝම නම් වේ. "න කුසලං ධම්මං පටිච්ච න කුසලො ධම්මො" යනාදීන් පදයන් ගේ පූර්වයෙහි නකාරය යොදා දේශනය කිරීමේ ක්‍රමය පච්චනීය නය නම් වේ. "කුසලං ධම්මං පටිච්ච න කුසලො ධම්මො" යනාදීන් පශ්චිම පදය නකාරයෙන් යුක්තකොට දේශනය කිරීමේ ක්‍රමය අනුලෝම පච්චනීය නම් වේ. "න කුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො"

Non-commercial distribution

යනාදීන් ආදිපදය නකාරයෙන් යුක්ත කොට දේශනය කිරීමේ ක්‍රමය පච්චනීයානුලෝම නම් වේ.

තිකපට්ඨානය ය, දුකපට්ඨානය ය, දුකතිකපට්ඨානය ය, තිකදුකපට්ඨානය ය, තිකතිකපට්ඨානය ය, දුකදුකපට්ඨානය ය යි පට්ඨාන සයෙකි.

තිකපදයන් මූලපද කොට දේශිත පට්ඨානය තිකපට්ඨාන නමි. දුක පදයන් මූලපද කොට දේශිත පට්ඨානය දුකපට්ඨාන නමි. තික පදයන් ගේ පූර්වයෙහි දුකපද යෙදූ මූලපදයන් ගේ වශයෙන් දේශිත පට්ඨානය දුකතිකපට්ඨාන නමි. දුක පදයන් ගේ පූර්වයෙහි තිකපද යෙදූ මූලපදයන් ගේ වශයෙන් දේශිත පට්ඨානය තිකදුකපට්ඨාන නමි. තික පද තිකපදයන් හා යෙදූ මූලපද ඇති පට්ඨානය තිකතික පට්ඨානය නමි. දුකපද දුකපදයන් හා යෙදූ මූල්පද ඇති පට්ඨානය දුකදුක පට්ඨාන නමි. මේ පට්ඨාන සය දේශනය කර තිබෙන්නේ ඉහත කී මහා නය සතරෙනි.

එ බැවින් අනුලෝම තික පට්ඨානය ය, අනුලෝම දුකපට්ඨානය ය, අනුලෝම දුකතිකපට්ඨානය ය, අනුලෝම තිකදුකපට්ඨානය ය, අනුලෝම තිකතිකපට්ඨානය ය, අනුලෝම දුකදුකපට්ඨානය ය යි අනුලෝම නයයෙහි පට්ඨාන සයෙකි. පච්චනීය නයාදි ඉතිරි නයත්‍රයා ගේ වශයෙන් ද පට්ඨාන සය බැගින් වේ. සියල්ල පිඩු කළ කල්හි නය සතර ගේ වශයෙන් පට්ඨාන සූවිස්සක් වේ.

සූවිසි පට්ඨානයන් අතුරෙන් **"කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා"** යනාදීන් දේශිත පට්ඨානය අනුලෝම තිකපට්ඨානය ය.

**"හෙතුං ධම්මං පටිච්ච හෙතු ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා"** යනාදීන් දේශිත පට්ඨානය අනුලෝම දුක පට්ඨානය ය.

"හෙතුං කුසලං ධම්මං පටිච්ච හෙතු කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් දේශිත පට්ඨානය අනුලෝම දුකතිකපට්ඨානය ය.

"කුසලං හෙතුං ධම්මං පටිච්ච කුසලො හෙතු ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් තිකදුක මිශ්‍රණයෙන් දේශිත පට්ඨානය අනුලෝම තිකදුකපට්ඨානය ය.

"කුසලං සුඛාය වෙදනාය සම්පයුත්තං ධම්මං පටිච්ච කුසලො සුඛාය වේදනාය සම්පයුත්තො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් දේශිත පට්ඨානය අනුලෝම තික තික පට්ඨානය ය.

*Non-commercial distribution*

"හෙතුං සහෙතුකං ධම්මං පටිච්ච හෙතු සහෙතුකො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් දේශිත පට්ඨානය අනුලෝම දුකදුකපට්ඨානය ය.

"න කුසලං ධම්මං පටිච්ච න කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් නකාරයුක්ත කොට දේශිත පට්ඨානය පච්චනීය තිකපට්ඨානය ය.

"න හෙතුං ධම්මං පටිච්ච න හෙතු ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා" යනාදීන් දේශිත පට්ඨානය පච්චනීය දුකපට්ඨානය ය.

"න හෙතුං න කුසලං ධම්මං පටිච්ච න හෙතු න කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් දේශිත පට්ඨානය පච්චනීය දුකතිකපට්ඨානය ය.

"න කුසලං න හෙතුං ධම්මං පටිච්ච න කුසලො න හෙතු ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් දේශිත පට්ඨානය පච්චනීය තිකදුකපට්ඨානය ය.

"න කුසලං න සුඛාය වෙදනාය සම්පයුත්තං ධම්මං පටිච්ච න කුසලො න සුඛාය වෙදනාය සම්පයුත්තො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා" යනාදීන් දේශිත පට්ඨානය පච්චනීය තිකතිකපට්ඨානය ය.

"න හෙතුං න සහෙතුකං ධම්මං පටිච්ච න හෙතු න සහෙතුකො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් දේශිත පට්ඨානය පච්චනීය දුකදුක පට්ඨානය ය.

කුසලං ධම්මං පටිච්ච න කුසලො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා" යනාදීන් දේශිත පට්ඨානය අනුලෝමපච්චනීය තිකපට්ඨානයය.

"හෙතුං ධම්මං පටිච්ච න හෙතු ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා" යනාදීන් දේශිත පට්ඨානය අනුලෝම පච්චනීය දුක පට්ඨානය ය.

"හෙතුං කුසලං ධම්මං පටිච්ච න හෙතු න කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් දේශිත පට්ඨානය අනුලෝම පච්චනීය දුකතිකපට්ඨාන ය.

"කුසලං හෙතුං ධම්මං පටිච්ච න කුසලො න හෙතු ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා." යනාදීන් දේශිත පට්ඨානය අනුලෝම පච්චනීය තිකදුක පට්ඨානය ය.

Non-commercial distribution

"කුසලං සුඛාය වෙදනාය සම්පයුත්තං ධම්මං පටිච්ච න කුසලො න සුඛාය වෙදනාය සම්පයුත්තො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා" යනාදීන් දේශිත පට්ඨානය අනුලෝමපච්චනීය තිකතික පට්ඨානය ය.

"හෙතු සහෙතුකං ධම්මං පටිච්ච න හෙතු න සහෙතුකො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් දේශිත පට්ඨානය අනුලෝමපච්චනීය දුකදුක පට්ඨානය ය.

"න කුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා" යනාදීන් දේශිත පට්ඨානය පච්චනීයානුලෝමදුකපට්ඨානයය.

"න හෙතුං ධම්මං පටිච්ච හෙතු ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා" යනාදීන් දේශිත පට්ඨානය පච්චනීයානුලෝම තික පට්ඨානය ය.

"න හෙතුං න කුසලං ධම්මං පටිච්ච හෙතු කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් දේශිත පට්ඨානය පච්චනීයානුලෝම දුකතික පට්ඨාන ය.

"න කුසලං න හෙතු ධම්මං පටිච්ච අකුසලො හෙතු ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් දේශිත පට්ඨානය පච්චනීයානුලෝම තිකදුක පට්ඨානය ය.

"න කුසලං න සුඛාය වෙදනාය සම්පයුත්තං ධම්මං පටිච්ච අකුසලො සුඛාය වෙදනාය සම්පයුත්තො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා" යනාදීන් දේශිත පට්ඨානය පච්චනීයානුලෝම තිකතික පට්ඨානය ය.

"න හෙතුං න සහෙතුකං ධම්මං පටිච්ච හෙතු සහෙතුකො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් දේශිත පට්ඨානය පච්චනීයානුලෝම දුකදුක පට්ඨානය ය.

මේ ප්‍රකරණයෙහි පච්චය නිද්දෙසයට අනතුරුව ඇති කොටසට පණ්ණත්තිවාරය යි කියනු ලැබේ. එහි ඇත්තේ ප්‍රශ්න පමණෙකි. මෙ පමණ කෝටිගණනක් ය ප්‍රකෝටිගණනක් ය. කියා එහි ඇති ප්‍රශ්න ගණන පිරිසඳ නො දැක්විය හැකි ය. එය පිරිසිඳ දැක්වීමට ලෝකයෙහි ව්‍යාවහාරයට පැමිණ ඇති සඞ්ඛ්‍යා ප්‍රමාණ නො වන්නේ ය, සඞ්ඛ්‍යා ඇතිවාට වඩා එහි ප්‍රශ්න ඇත්තේ ය. පෙය්‍යාලක්‍රමයෙන් පිටු සත අටකින් ඒ පණ්ණත්තිවාරය පුස්තකාරූඪකර තිබේ. සම්පූර්ණ කර ලියුව හොත් එය ම පිටු දහස්ගණනක පොතක් විය හැකි ය. ඉන් ඔබ්බෙහි ඇති පට්ඨානපාලිය ඒ ප්‍රශ්නවලට පිළිතුරුය.

Non-commercial distribution

සූවිසි පට්ඨානයන් ගෙන් පළමු වැන්න වූ අනුලෝම තික-පට්ඨානය කුසලත්තික පට්ඨානාදි වසයෙන් දෙවිසි වැදෑරුම් වේ. ඒ දෙවිසි පට්ඨානයන්ගෙන් වාචනාමාර්ගීය තරමක් දුරට සම්පූර්ණකර පොත්වල ලියා ඇත්තේ කුසලත්තික පට්ඨානය පමණෙකි. එහි පටිච්ච වාරය ය, සහජාත වාරය ය, පච්චයවාරය ය, නිස්සය වාරය ය, සංසට්ඨ වාරය ය, සම්පයුත්තවාරය ය, පඤ්හා වාරය යයි වාර සතක් ඇත්තේ ය. එහි "කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් පටිච්ච යන වචනයෙන් යුක්ත කොට දේශිත වාරය පටිච්චවාර නම්. සහජාතාදි වචන යුක්ත කොට දේශිත වාර පස සහජාතාදි වාරයෝ ය. පණ්ණත්ති වාරයෙහි එක්වූණු ප්‍රශ්නයන් වඩා විස්තර වශයෙන් විසඳ ඇති අවසාන වාරය පඤ්හා වාර නම් වේ.

ඉහත කී අනුලෝමාදි නය සතර ධර්මපද විෂයෙහි මෙන් ම ප්‍රත්‍යය පද විෂයෙහි ද යෙදෙන්නේ ය, එබැවින් මේ අනුලෝම කුසලත්තික පට්ඨානයෙහි ප්‍රත්‍යය පදයන් ගේ වශයෙන් පච්චයානුලෝම වාරය ය, පච්චය පච්චනීය වාරය ය, පච්චයානුලෝම පච්චනීය වාරය ය, පච්චය පච්චනීයානුලෝම වාරය ය යි වාර සතරක් ඇත්තේ ය. "කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් දේශනය කරන ලද වාරය පච්චයානුලෝම වාරයය, අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති න හෙතුපච්චයා යනාදීන් ප්‍රත්‍යය පදය නකාරයෙන් යුක්ත කොට දේශිත වාරය පච්චය පච්චනීය වාරය ය. හෙතුපච්චයා න ආරම්මණෙ පඤ්ච යනාදීන් පශ්චිම පදය නකාරයෙන් යුක්තකොට දේශිත වාරය පච්චයානුලෝම පච්චනීය වාරය ය. "න හෙතුපච්චයා ආරම්මණෙ ද්වෙ" යනාදීන් පූර්වපදය නකාරයෙන් යුක්ත කොට දේශිත වාරය පච්චය පච්චනීයානුලෝම වාරය ය.

කුසලත්තික පට්ඨානයේ පළමු වන කොටස වූ පච්චයානුලෝම වාරයෙහි ද ඒකක වාරය දුකාදිවාරය යි වාර දෙකක් ඇත්තේය. "කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා" යනාදීන් එක් එක් ප්‍රත්‍යයක්හු ගේ වශයෙන් දේශිත වාරය ඒකක වාරය ය. පොත්වල පාලිය සම්පූර්ණ වශයෙන් දක්වා ඇත්තේ ඒ ඒකක වාරයේ පමණෙකි. එයට විභඞ්ගවාරාදිය යි ද කියනු ලැබේ. "කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා ආරම්මණපච්චයා" යනාදීන් දෙකේ පටන් තෙවිස්ස දක්වා ප්‍රත්‍යයෙන් ගෙන දේශනය කළ යුතු වාරය දුකාදි වාරය ය. එය ඉතා දීර්ඝ බැවින් විස්තර වශයෙන් නො දක්වා "හෙතුපච්චයා ආරම්මණෙ තීණි, අධිපතියා නව" යනාදීන් ඒ ඒ ආකාරයෙන් දේශනය කරන කල්හි

Non-commercial distribution

ලැබෙන විභඞ්ගවල (වාක්‍යවල) ගණන පමණක් දැක්වීම් වශයෙන් කෙටි කර තිබේ. සඞ්ඛ්‍යා පමණක් දක්වන්නා වූ ඒ කොටසට සඞ්ඛ්‍යාවාරයයි කියනු ලැබේ.

හෙතුපච්චය දුකාදි වාරය ආරම්මණ පච්චය දුකාදි වාරය යනාදීන් දුකාදි වාර තෙවිස්සක් ඇත්තේ ය. එක් එක් දුකාදි වාරයක ද දුකවාර තිකවාරාදි වශයෙන් වාර තෙවිස්ස බැගින් ඇත්තේ ය. ඒ එක් එක් වාරයක ද ඉතිරි ප්‍රත්‍යයන්ගේ වශයෙන් බොහෝ වාර ඇත්තේ ය. විභඞ්ග උදුරා ඒ සියල්ල සම්පූර්ණ කොට පත්වල ලියුව හොත් කුසලත්තිකයේ පච්චයානුලෝම වාරය ම පිටු සිය ගණනක පොතක් වේ. මේ කුසලත්තික පට්ඨානයේ වාර සතර ම පත්වල ලියුව හොත් පිටු දහස් ගණනක පොතක් වේ. මේ කුසලත්තික පට්ඨානය අනුලෝම තිකපට්ඨානයෙන් දෙවිස්සෙන් පංගුවකි. සම්පූර්ණ අනුලෝම තිකපට්ඨානය පත්වල ලියුව හොත් කොතෙක් විශාල පත් ගොඩක් වේද යන බව කියවන්නවුන්-විසින් සිතා ගතයුතු ය. අනුලෝම තිකපට්ඨානය සූවිසි පට්ඨානයන් ගෙන් කුඩා ම පට්ඨානය ය. එය ඉතිරි පට්ඨාන තෙවිස්සෙන් දහසෙන් පංගුවක් පමණවත් වෙතැ යි නොසිතමි. සම්පූර්ණ ප්‍රස්ථාන ප්‍රකරණයා ගේ ප්‍රමාණය දක්වීම දුෂ්කරය. එය ලෝකයේ අතිවිශාල ග්‍රන්ථය බව පමණක් කිය හැකිය.

Non-commercial distribution

# පට්ඨාන මහා පකරණ සන්නය.

නමො තස්ස භගවතො අරහතො
සම්මා සම්බුද්ධස්ස

විචිත්ත මති ගම්භීර මනන්ත නය මණ්ඩිතං,
පට්ඨානං සම්මසන්තස්ස විමලා මිත බුද්ධියා.

යස්ස දෙහා නික්ඛමිංසු සුභා ඡබ්බණ්ණ රංසියො,
නීල පීතා රත්ත සෙතා මඤ්ජිට්ඨා ච පභස්සරා.

තං ලොකනාථං සුගතං ධම්මඤ්ච ජින සෙවිතං,
සඞ්ඝං නිරඞ්ගණං සෙට්ඨං නමාමි සිරසාදරං.

මේ මහා භද්‍ර කල්පයෙන් චතුරසඞ්ඛ්‍ය කල්ප ලක්ෂයකට පූර්වයෙහි ලොව පහළ වී වදළා වූ සකල ලෝක ශිවඞ්කර වූ දීපඞ්කර සර්වඥ රාජෝත්තමයාණන් වහන්සේ ශ්‍රී සද්ධර්මාලෝකයෙන් ජනසන්තාන ගත මෝහාන්ධකාරය දුරු කෙරෙමින් වැඩ වෙසෙන සමයෙහි, තමන් වහන්සේ අතට පත් අමා මහ නිවන් සුවය සකල සත්ත්වයන් කෙරෙහි පතළ මහා කරුණාවෙන් හැර, අපමණ දුක් ඇති සසර කතරට බැස, සරාසකි කප් සුවහස් මුළුල්ලෙහි අසරණ සත්ත්වයන් නිසා අපමණ දුක් විඳිමින් දනාදි සමත්‍රිංශත් පාරමී ධර්මයන් සම්පූර්ණ කොට සර්වඥපදප්‍රාප්ත වූ අප ශ්‍රී සිද්ධාර්ථ ගෞතම ශාක්‍ය මුනීන්ද්‍රයන් වහන්සේ, සම්‍යක් සම්බෝධි සමධිගමයෙන් සත් වන වස ඇසළ පුණු පොහෝ දිනයෙහි, සැවැත්නුවර ගණ්ඩම්බ නම් වෘක්ෂ මූලයෙහි ප්‍රාතිහාර්ය්‍ය පාම්හ යි තමන් වහන්සේ ලුහු බැඳ ආ තීර්ථකයන් ගේ මාන මර්දනය පිණිස හා බුද්ධබලය දක්නා සජ්ජනයන් ගේ ප්‍රසාදය පිණිස ද අනන්‍යසාධාරණ වූ යමක ප්‍රාතිහාර්ය්‍යය දක්වා අවසානයෙහි පෙර බුදුවරයන් වහන්සේලා ගේ චාරිත්‍ර ධර්මය පිරිදි තුන් පියවරකින් තව්තිසා දෙව්ලොවට වැඩ

Non-commercial distribution

වදරා එහි පාරිච්ඡත්‍රක නම් වූ සුරදම මූලයෙහි පිහිටි පාණ්ඩුකම්බල නම් වූ දිව්‍ය ශෛලාසන මතුයෙහි උදගිරි පර්‍වත මස්තකයට පත් සූර්‍ය්‍ය මණ්ඩලය සේ සවනක් ගන බුදුරැස් මාලාවෙන් දිළියෙමින් දසදහසක් සක්වළින් පැමිණි දේවබ්‍රහ්ම ගණයා පිරිවරා වැඩ හිඳ, මාතෘදේවරාජයා ප්‍රධාන කොට දෙව් බඹ පිරිස අමතා **"කුසලා ධම්මා, අකුසලා ධම්මා, අව්‍යාකතා ධම්මා"** යනාදීන් අභිධර්‍ම පිටකය දේශනය කරනසේක් ධර්‍මසඞ්ගණී ප්‍රකරණය ය, විභඞ්ගප්‍රකරණය ය, ධාතුකථා ප්‍රකරණය ය, පුද්ගල ප්‍රඥප්ති ප්‍රකරණය ය, කථාවස්තු ප්‍රකරණය ය, යමක ප්‍රකරණය ය යන ප්‍රකරණයන් පිළිවෙළින් දේශනය කොට, අවසානයෙහි පරම ගම්භීර වූ අනන්ත නය සමන්වාගත ප්‍රස්ථාන මහා ප්‍රකරණය දේශනය කළ සේක. ඒ මහා ප්‍රකරණයෙහි ප්‍රත්‍යය විභඞ්ග වාරය ය, මහාවාරය ය යි වාර දෙකක් ඇත්තේ ය. එයින් ප්‍රත්‍යය විභඞ්ග වාරය පළමු කොට වදළ සේක. එය ද ප්‍රත්‍යයෝද්දෙශ ප්‍රත්‍යය නිර්දේශ වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් ප්‍රත්‍යයෝද්දෙශය පළමු කොට වදළ සේක.

ඒ මෙසේ ය. **හෙතු පච්චයො, ආරම්මණ පච්චයො, අධිපති පච්චයො, අනන්තර පච්චයො, සමනන්තර පච්චයො, සහජාත පච්චයො, අඤ්ඤමඤ්ඤ පච්චයො, නිස්සය පච්චයො, උපනිස්සය පච්චයො, පුරෙජාත පච්චයො, පච්ඡාජාත පච්චයො, ආසෙවන පච්චයො, කම්ම පච්චයො, විපාක පච්චයො, ආහාර පච්චයො, ඉන්ද්‍රිය පච්චයො, ඣාන පච්චයො, මග්ග පච්චයො, සම්පයුත්ත පච්චයො, විප්පයුත්ත පච්චයො, අත්ථිපච්චයො, නත්ථි පච්චයො, විගත පච්චයො, අවිගත පච්චයො, ති.**

එහි පදාර්ථ මෙසේ ය. හෙතු පච්චයො, හේතු භාවයෙන් උපකාරක ධර්‍මය ය, ආරම්මණ පච්චයො, ආරම්මණ භාවයෙන් උපකාරක ධර්‍මය ය, අධිපති පච්චයො, අධිපති භාවයෙන් උපකාරක ධර්‍මය ය, අනන්තර පච්චයො, අනන්තර භාවයෙන් උපකාරක ධර්‍මය ය, සමනන්තර පච්චයො, සමනන්තර භාවයෙන් උපකාරක ධර්‍මය ය, සහජාත පච්චයො, සහජාත භාවයෙන් උපකාරක ධර්‍මය ය, අඤ්ඤමඤ්ඤ පච්චයො, අන්‍යෝන්‍ය භාවයෙන් උපකාරක ධර්‍මය ය, නිස්සය පච්චයො, නිඃශ්‍රය භාවයෙන් උපකාරක ධර්‍මය ය, උපනිස්සය පච්චයො, බලවත් හේතු භාවයෙන් උපකාරක ධර්‍මය ය, පුරෙජාත පච්චයො, පෙරාතුව ඉපිද පැවතීම් වශයෙන් උපකාරක ධර්‍මය ය, පච්ඡාජාත පච්චයො, පසුව ඉපිද පූර්‍වයෙහි උපන් ධර්‍මයන්ට උපකාරක ධර්‍මය ය, ආසෙවන පච්චයො, තමා ගේ ස්වභාවය ප්‍රදනය කිරීම් වශයෙන් උපකාරක ධර්‍මය ය, කම්ම පච්චයො, චිත්ත ප්‍රයෝග සඞ්ඛ්‍යාත ක්‍රියා භාවයෙන් උපකාරක ධර්‍මය ය, විපාක පච්චයො, නිරුත්සාහ ශාන්තභාව සඞ්ඛ්‍යාත විපාක ස්වභාවයෙන් උපකාරක ධර්‍මය ය, ආහාර පච්චයො, උපස්තම්භක

Non-commercial distribution

භාවයෙන් උපකාරක ධර්‍මය ය, ඉන්‍ද්‍රිය පච්චයො, ඊශ්වර භාවයෙන් උපකාරක ධර්‍මය ය, ඣාන පච්චයො, එළඹ බැලීම් වශයෙන් උපකාරක ධර්‍මය ය, මග්ග පච්චයො, එතර කරවීම් වශයෙන් උපකාරක ධර්‍මය ය, සම්පයුත්ත පච්චයො, සම්ප්‍රයුක්ත භාවයෙන් උපකාරක ධර්‍මය ය, විප්පයුත්ත පච්චයො, විප්‍රයුක්ත භාවයෙන් උපකාරක ධර්‍මය ය, අත්ථි පච්චයො, විද්‍යමාන භාවයෙන් උපකාරක ධර්‍මය ය, නත්ථි පච්චයො, අවිද්‍යමාන භාවයෙන් උපකාරක ධර්‍මය ය, විගත පච්චයො, පහවීම් වශයෙන් උපකාරක ධර්‍මය ය, අවිගත පච්චයො ති, නො පහවීම් වශයෙන් උපකාරක ධර්‍මය ය (යන මේ සූවිසි දෙනෙක් වූ ප්‍රත්‍යය ධර්‍මයෝ මහා ප්‍රකරණයෙහි සිටියාහු ය.)

## ත්‍රිරාශිය.

(1) **හෙතු පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි සවරූපයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න, ප්‍රත්‍යනීක වශයෙන් ත්‍රිවිධ වෙති. එයින් ලෝභය, ද්වෙෂය, මෝහය, අලෝභය, අද්වෙෂය, අමෝහය යන හේතු ධර්‍මයෝ සදෙන හේතු ප්‍රත්‍යය වන ධර්‍මයෝ ය.

සහේතුක සිත් එක් සැත්තෑව ය. මෝහ මූල චිත්තද්වයයෙහි මෝහ වර්ජිත චෛතසික දෙපනස ය, සහේතුක චිත්තජ රූපයෝ ය, සහේතුක ප්‍රතිසන්ධි කර්‍මජ රූපයෝ ය යන මොවුහු හේතු ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

අහේතුක සිත් අටළොස ය, ඡන්දවර්ජිත අන්‍යසමාන චෛතසික දෙළොස ය, මෝහමූල චිත්තද්වයෙහි මෝහය ය, අහේතුක චිත්තජ රූපයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි කර්‍මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්‍මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්‍මජ රූපයෝ ය යන මේ ධර්‍මයෝ හේතු ප්‍රත්‍යයයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

(2) **ආරම්මණ පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි සවරූපයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න ප්‍රත්‍යනීක වශයෙන් තෙවැදෑරුම් වෙති. එයින් වර්තමාන වූ ද අතීත වූ ද අනාගත වූ ද එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය, අටවිසි රූපය ය., කාලමුක්ත වූ නිර්වාණය හා ප්‍රඥප්තිය ය යන මොවුහු ආරම්මණ ප්‍රත්‍යය වන ධර්‍මයෝ ය. එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය යන මොවුහු ආරම්මණ ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

Non-commercial distribution

චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු අරම්මණ ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

**(3) අධිපති පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි **අධිපති ප්‍රත්‍යය** ආරම්මණාධිපති ප්‍රත්‍යය ය, සහජාතාධිපති ප්‍රත්‍යය යි දෙවැදෑරුම් වේ. එයින් ආරම්මණාධිපති ප්‍රත්‍යයේ සවරූපයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න ප්‍රත්‍යනීක වශයෙන් තෙවැදෑරුම් වෙති. එයින් ගරු කළ යුතු වූ වර්තමාන වූ ද අතීත වූ ද අනාගත වූ ද ඉෂ්ට නිෂ්පන්නරූප අටළොස ය, ද්වේෂමූල මෝහමූල දුඃඛසහගත කාය විඥාන වර්ජිත සිත් සූ අසූවය, ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය විචිකිත්සා වර්ජිත චෛතසික සත්සාළිස ය, කාලමුක්ත වූ නිර්වාණය ය යන ෂඩාරම්මණ ධර්මයෝ ආරම්මණාධිපති ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

ගරු කළ යුතු ධර්මයන් ගරු කොට අරමුණු කරන්නා වූ ලෝභමූල සිත් අට ය, මහා කුසල් සිත් අට ය, මහාක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරය, ලෝකෝත්තර සිත් අටය, ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය විචිකිත්සා අප්‍රමාණ්‍යවර්ජිත චෛතසික පන්සාලිස ය යන මොවුහු ආරම්මණාධිපති ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

යම්. කිසි ධර්මයක් ගරු කොට අරමුණු නො කරන අවස්ථාවෙහි වූ ද කිසි ධර්මයක් ගරු කොට අරමුණු නො කරන්නා වූ ද ලෞකික සිත් එක් අසූව ය, චෛතසික දෙපනසය, චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු ආරම්මණාධිපති ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීකයෝ ය.

**සහජාතාධිපති ප්‍රත්‍යයෙහි** සවරූපයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න ප්‍රත්‍යනීක වශයෙන් තෙවැදෑරුම් වෙති. එයින් තම තමන් අධිපති වන අවස්ථාවෙහි මෝහමූල හසිතෝත්පාද වර්ජිත දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයන්හි ඇත්තා වූ ඡන්ද ය, වීර්‍ය්‍ය ය, විමංසය ය, සාධිපති ජවන දෙපනස ය යන මේ ධර්මයෝ සහජාතාධිපති ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

තම තමා අධිපති වන අවස්ථාවෙහි අධිපති වන ධර්මය හැර දෙපනස් සාධිපති ජවනයෝ ය, විචිකිත්සා වර්ජිත එක්පනස් චෛතසිකයෝ ය, සාධිපති චිත්තජ රූපයෝ ය යන මොවුහු සහජාතාධිපති ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

Non-commercial distribution

සහජාතාධිපති ප්‍රත්‍යය නො ලබන්නා වූ ද, නො ලබන අවස්ථාවෙහි වූ ද කාම සිත් සිව්පනසය, මහද්ගත විපාක නවය ය, චෛතසික දෙපනස ය, ඒ ඒ අවස්ථාවෙහි අධිපති වන ධර්මයෝ ය, නිරාධිපති චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු සහජාතාධිපති ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

**(4) අනන්තර පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි ස්වරූපයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න ප්‍රත්‍යනීක වශයෙන් තෙවැදෑරුම් වෙති. එයින් අර-හන්තච්‍යුති වර්ජිත වූ පූර්‍ව පූර්‍ව වූ එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය යන මොවුහු අනන්තර ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

අභිනවච්‍යුතිය සහිත වූ පශ්චිම පශ්චිම වූ එකුන් අනූ චිත්තය, චෛතසික දෙපනස ය යන මොවුහු අනන්තර ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

අභිනවච්‍යුතිය සහිත වූ එකුන් අනූ චිත්තය, චෛතසික දෙපනස ය යන මොවුහු අනන්තර ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

චිත්තජරූපයෝ ය, ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු අනන්තර ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

**(5) සමනන්තර ප්‍රත්‍යය** අනන්තර ප්‍රත්‍යය මෙනි.

**(6) සහජාත පච්චයො** යන ප්‍රත්‍යයොද්දෙශයෙහි ස්වරූපයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් දෙවැදෑරුම් වෙති. එයින් ඔවුනොවුන්ට හා චිත්තජ රූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන සියලු එකුන් අනූ චිත්තය ය චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට හා උපාදය රූපයන්ට ප්‍රත්‍යය වන චිත්තජ ප්‍රතිසන්ධි කර්මජ බාහිර ආහාරජ ඍතුජ අසංඥ සත්ත්ව කර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයන්ට අයත් වූ සකල මහා භූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන හෘදය වස්තුව ය, හෘදය වස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවොකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොවුහු සහජාත ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන සියලු එකුන් අනූ චිත්තය ය චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, *නාමස්කන්ධයන්ගෙන්* ප්‍රත්‍යය ලබන චිත්තජරූප හා ප්‍රතිසන්ධිකර්මජ

*Non-commercial distribution*

රූපයෝ ය, ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන සකල මහා භූතයෝ ය, මහාභූතයන්ගෙන් ප්‍රත්‍යය ලබන උපාදය රූපයෝ ය, හෘදයවස්තුවෙන් ප්‍රත්‍යය ලබන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තුව ය යන මොවුහු සහජාත ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

(7) **අඤ්ඤමඤ්ඤ පච්චයො** යන ප්‍රත්‍යයොද්දෙශයෙහි ස්වරූපයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න ප්‍රත්‍යනීක වශයෙන් තෙවැදෑරුම් වෙති. [illegible]යෝ ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සියලු එකුන් අනූ චිත්තය ය චෛතසික දෙපනස ය යන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන චිත්තජ ප්‍රතිසන්ධි කර්මජ බාහිර ආහාරජ ඍතුජ අසංඥ සත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයන්ට අයත් සකල මහා භූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන හෘදයවස්තුව ය, හෘදය වස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොවුහු අන්‍යෝන්‍ය ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන එකුන් අනූ චිත්තය ය චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ බාහිර ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයන්ට අයත් වූ සකල මහා භූතයෝ ය හෘදයවස්තුවෙන් ප්‍රත්‍යය ලබන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හෘදය වස්තුව ය යන මොවුහු අන්‍යෝන්‍ය ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

නාමස්කන්ධ සතරෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ රූපයෝ ය. හෘදය වස්තුවෙන් අන්‍ය වූ ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය, මහාභූතයන්ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ බාහිර ආහාරජ ඍතුජ අසංඥ සත්ත්ව කර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයන්ට අයත් වූ සකල උපාදය රූපයෝ ය යන මොවුහු අන්‍යෝන්‍ය ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

(8) **නිස්සය පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි නිඃශ්‍රය ප්‍රත්‍යය සහජාත නිඃශ්‍රය, වස්තු පුරේජාත නිඃශ්‍රය, වස්ත්වාරම්මණ පුරේජාත නිඃශ්‍රය වශයෙන් තෙවැදෑරුම් වේ. එයින් සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යයේ ස්වරූපයෝ සහජාත ප්‍රත්‍යයෙහි මෙන් දත යුත්තාහු ය.

වස්තුපුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යයෙහි ස්වරූපයෝ - පෙ - තෙවැදෑරුම් වෙති. එයින් ප්‍රවෘත්ති කාලයෙහි ෂට්වස්තූහු වස්තුපුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය වන ධර්මයෝ ය, නොහොත් ප්‍රවෘත්තිකාලයෙහි මන්දයුෂ්ක අමන්දයුෂ්ක

Non-commercial distribution

මධ්‍යමායුෂ්ක යන තෙවැදෑරුම් චක්ෂුඃප්‍රසාද රූපයන් අතුරෙන් ප්‍රථම අතීත භවාඞ්ග චිත්තය හා උපදනා මධ්‍යමායුෂ්ක චක්ෂුර් වස්තුව ය, - පෙ - මධ්‍යමායුෂ්ක ශ්‍රෝත්‍ර වස්තුව ය, - පෙ - මධ්‍යමායුෂ්ක ඝ්‍රාණ වස්තුවය, -පෙ- මධ්‍යමායුෂ්ක ජිහ්වා වස්තුව ය, මධ්‍යමායුෂ්ක කාය වස්තුවය, ප්‍රතිසන්ධ්‍යාදි චුති පූර්ව චිත්තයන් හා උපදනා හෘදය වස්තුව ය, නිරෝධසමාපත්තියෙන් නැඟී සිටිනා අවස්ථාවෙහි පූර්වයෙහි එක් චිත්තස්ථිතිය කාලයේ උපදනා හෘදයවස්තුව ය, මරණාසන්න කාලයෙහි ච්‍යුති චිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදනා හෘදයවස්තුව ය යන මොවුහු වස්තුපූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

ප්‍රවෘත්තිකාලයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අරූප විපාක වර්ජිත විඥානධාතු සතය චෛතසික දෙපනස ය යන මොවුහු වස්තු පූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

චතුවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල සිත් අට ය, මෝහමූල සිත් දෙක ය, මනෝද්වාරාවර්ජනය ය, මහාකුශල සිත් අට ය, මහා ක්‍රියා සිත් අට ය, අරූපාවචර සිත් දොළස ය, සෝවාන් මාර්ග වර්ජිත ලෝකෝත්තර සිත් සත ය, ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සසාළිස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා චෛතසික පන්තිස ය, චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්වකර්මජ රූපයෝ ය, ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු වස්තු පූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීකයෝ ය.

වස්තවාරම්මණ පූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යයෙහි ස්වරූපයෝ -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් මරණාසන්න කාලයෙහි ච්‍යුතිචිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදනා හෘදයවස්තුව වස්තවාරම්මණ පූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යය වේ. මරණාසන්න කාලයෙහි උපදනා වූ මනෝද්වාරාවර්ජනය ය, කාමජවන එකුන්තිස ය, තදාරම්මණ එකොළොස ය, අභිඥා දෙසිත ය, ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සිව්සාළිස ය යන මොවුහු වස්තවාරම්මණ පූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

වස්තවාරම්මණ පූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යය නො ලබන්නා වූ එකුන් අනූ චිත්තය ය චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය, චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව

Non-commercial distribution

කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු වස්ත්වාරම්මණ පූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

(9) **උපනිස්සය පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි උපනිශ්‍රය ප්‍රත්‍යය ආරම්මණොපනිඃශ්‍රය අනන්තරෝපනිඃශ්‍රය ප්‍රකෘතෝප නිඃශ්‍රය වශයෙන් තෙවැදෑරුම් වේ. එයින් ආරම්මණෝප නිඃශ්‍රය ප්‍රත්‍යයේ ත්‍රිරාශිය ආරම්මණාධිපතියෙහි මෙනි. අනන්තරෝපනිඃශ්‍රය ප්‍රත්‍යයේ ත්‍රිරාශිය අනන්තර ප්‍රත්‍යයෙහි මෙනි.

ප්‍රකෘතෝප නිඃශ්‍රය ප්‍රත්‍යයෙහි -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් බලවත් වූ එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනසය, රූප අට විස්ස ය, ඇතැම් ප්‍රඥප්තිහු ය යන මොවුහු ප්‍රකෘතෝප නිඃශ්‍රය ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි වශයෙන් සකල එකුන්අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය යන මොවුහු ප්‍රකෘතෝපනිඃශ්‍රය ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු ප්‍රකෘතෝප නිඃශ්‍රය ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

(10) **පුරෙජාත පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි පූර්වජාත ප්‍රත්‍යය වස්තු පූර්වජාත, වස්ත්වාරම්මණ පූර්වජාත, ආරම්මණ පූර්වජාත වශයෙන් තෙවැදෑරුම් වේ. එයින් වස්තුපූර්වජාත ප්‍රත්‍යයෙහි සවරූපයෝ වස්තුපූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යයෙහි මෙන් ද වස්ත්වාරම්මණ පූර්වජාත ප්‍රත්‍යයෙහි සවරූපයෝ වස්ත්වාරම්මණ පූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යයෙහි මෙන් ද දතයුත්තාහු ය.

ආරම්මණ පූර්වජාත ප්‍රත්‍යයේ සවරූපයෝ -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් වර්තමාන නිෂ්පන්න රූපයෝ අටළොස්දෙන ආරම්මණ පූර්වජාත ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කාමසිත් සිවුපනස ය, අභිඥචිත්තද්වය ය, අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික පනස ය යන මොවුහු ආරම්මණ පූර්වජාත ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

ආරම්මණ පූර්වජාත ප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි වූ ද්විපඤ්ච විඥනයන් ගෙන් හා මනෝධාතු ත්‍රිකයෙන් අන්‍ය වූ සිත් සසැත්තෑවය,

Non-commercial distribution

චෛතසික දෙපනසය, චිත්තජ රූපයෝය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු ආරම්මණ පුරේජාත ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

(11) **පච්ඡාජාත පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් අරූප විපාක වර්ජිත ප්‍රථම භවඞ්ගාදි පශ්චිම පශ්චිම වූ සිත් පස් අසූව ය, චෛතසික දෙපනසය යන මොවුහු පශ්චාජාත ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

ප්‍රතිසන්ධ්‍යාදි පූර්ව පූර්ව චිත්තයන් හා ඉපද රූපස්ථිතියට පැමිණියා වූ ඒකජකාය ය, ද්විජකාය ය, ත්‍රිජකාය ය, චතුජකාය ය යන මොවුහු පශ්චාජාත ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය, පශ්චිම පශ්චිම චිත්තයන් හා උපදනා චිත්තජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු පශ්චාජාත ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීකයෝ ය.

(12) **ආසෙවන පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් මාර්ගජවන ඵලජවන වර්ජිත පූර්ව පූර්ව වූ ලෞකික ජවනයෝ සත්සාළිස් දෙනය, චෛතසික දෙපනසය යන මොවුහු ආසේවන ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

ප්‍රථම ජවන ඵලජවන වර්ජිත පශ්චිම පශ්චිම ජවනයෝ එක්පනස් දෙන ය, චෛතසික දෙපනසය යන මොවුහු ආසේවන ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

ප්‍රථමජවන වශයෙන් උපදනා එකුන්තිස් කාම ජවනයෝ ය, ආවර්ජනද්වය ය, විපාක සිත් සතිස ය, චෛතසික දෙපනස ය, චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු ආසෙවන ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

(13) **කම්ම පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි **කර්මප්‍රත්‍යය** සහජාත කර්මප්‍රත්‍ය ය, නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය වශයෙන් දෙවැදෑරුම් වේ.

එයින් සහජාත කර්ම ප්‍රත්‍යයෙහි ස්වරූපයෝ -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් එකුන් අනූ චිත්තයෙහි ඇති චේතනා එකුන් අනූව සහජාත කර්ම ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

Non-commercial distribution

එකුන් අනූ චිත්තය ය, චේතනා වර්ජිත චෛතසික එක් පනස ය, චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොවුහු සහජාත කර්ම ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

එකුන් අනූ චිත්තයෙහි ඇති චේතනා එකුන් අනූවය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු සහජාත කර්ම ප්‍රත්‍යයේ ප්‍රත්‍යනීකයෝ ය.

නානාක්ෂණික කර්මප්‍රත්‍යයෙහි -පෙ- තෙවදෑරුම් වෙති. එයින් අතීත වූ කුශලාකුශල චේතනාවෝ තෙතිස් දෙන නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

විපාක සිත් සතිස ය, චෛතසික අටතිස ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූප යෝ ය යන මොවුහු නානාක්ෂණික කර්ම ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

කුසල් සිත් එක්විස්ස ය, අකුසල් සිත් දෙළොස ය, ක්‍රියා සිත් විස්සය, චෛතසික දෙපනස ය, චිත්තජ රූපයෝ ය, බාහිර රූප යෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය යන මොවුහු නානාක්ෂණික කර්ම ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

**(14) විපාක පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි -පෙ- තෙවදෑරුම් වෙති. එයින් ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජ රූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන විපාක සිත් සතිස ය, චෛතසික අට තිස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ විපාක ප්‍රත්‍ය ය වන ධර්මයෝ ය.

ඔවුනොවුන් ගෙන් ප්‍රත්‍යය ලබන විපාක සිත් සතිස ය, චෛතසික අටතිස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමසකන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් නිසා උපදනා වූ විඥපතිරූප වර්ජිත චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොවුහු විපාක ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

කුසල් සිත් එක් විස්ස ය, අකුසල් සිත් දෙළොස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික දෙපනස ය යන නාමස්කන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ය. බාහිර රූපයෝ ය, *ආහාරජ රූපයෝ* ය, ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු විපාක ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

*Non-commercial distribution*

**(15) ආහාර පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි **ආහාර ප්‍රත්‍යය** රූපාහාර ප්‍රත්‍යය ය, නාමාහාර ප්‍රත්‍යය ය යන මොවුන් ගේ වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් රූපාහාර ප්‍රත්‍යයේ -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් කබලිංකාරාහාරය යි කියනු ලබන ආහාරපානයන්හි ඇත්තා වූ බාහිර ඕජාව රූපාහාර ප්‍රත්‍යය ය.

ආහාර සමුට්ඨානික රූපයෝ රූපාහාර ප්‍රත්‍යයේ ප්‍රත්‍ය-යෝත්පන්නයෝ ය.

එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය, චිත්තජ රූප-යෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූප යෝ ය යන මොවුහු රූපාහාර ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

තවත් ක්‍රමයකින් මෙසේ ය. ආධ්‍යාත්ම සන්තානයෙහි වූ චතු සමුට්ඨානික ඕජාව ය, බාහිර ඍතුජ ඕජාව ය යන මොවුහු රූපාහාර ප්‍රත්‍යය වන ධර්මයෝ ය. ප්‍රත්‍යය වන ඕජාවෙන් අන්‍ය වූ චතුසමුට්ඨානික රූපයෝ රූපහාර ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය, බාහිර රූප යෝ ය යන මොවුහු රූපාහාර ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

නාමාහාර ප්‍රත්‍යයෙහි සවරූපයෝ -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් ස්පර්ශ චේතනා විඥාන යන නාමාහාරයෝ තිදෙන නාමාහාර ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

එකුන්අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය, චිත්තජ රූප-යෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොවුහු නාමාහාර ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු නාමාහාර ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

**(16) ඉන්ද්‍රිය පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි ඉන්ද්‍රිය ප්‍රත්‍යය සහජාතින්ද්‍රිය, පූර්වජාතින්ද්‍රිය, රූපජීවිතින්ද්‍රිය වශයෙන් තෙවැදෑරුම් වේ. එයින් සහජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි සවරූපයෝ -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් ජීවිතින්ද්‍රිය ය, චිත්තය ය, වේදනාව ය, ශ්‍රද්ධාව ය, වීර්‍ය්‍යය ය, ස්මෘතිය ය, ඒකාග්‍රතාව ය, ප්‍රඥාව ය යන නාමේන්ද්‍රිය ධර්මයෝ අටදෙන සහජාතින්ද්‍රිය ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

Non-commercial distribution

එකුන්අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය, චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොවුහු සහජාතින්ද්‍රිය ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු සහජාතින්ද්‍රිය ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

පුරේජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි සවරූපයෝ -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් මන්දායුෂ්ක අමන්දායුෂ්ක මධ්‍යමායුෂ්ක යන තෙවැදෑරුම් චක්ෂුඃ ප්‍රසාදයන් අතුරෙන් පළමුවන අතීත භවාඞ්ගය හා උපදනා මධ්‍ය-මායුෂ්ක චක්ෂුර්වස්තුව ය, -පෙ- ශ්‍රොත්‍ර වස්තුව ය, -පෙ- ඝ්‍රාණ වස්තුව ය, -පෙ- ජිහ්වා වස්තුව ය, -පෙ-කාය වස්තුවය යන මොවුහු පුරේජාතින්ද්‍රිය ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

ද්විපඤ්චවිඥාන දශය ය, සර්ව චිත්තසාධාරණ චෛතසික සතය යන මොවුහු පුරේජාතින්ද්‍රිය ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

ද්විපඤ්චවිඥාන වර්ජිත එකුන් අසූ චිත්තය ය, චෛතසික දෙපනස ය, චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු පුරේජාතින්ද්‍රිය ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

රූපජීවිතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි සවරූපයෝ -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි වශයෙන් සකල රූපජීවිතින්ද්‍රියයෝ රූපජීවිතින්ද්‍රිය ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

රූපජීවිතේන්ද්‍රියයෙන් අන්‍ය වූ කර්මජ කලාප ගත රූපයෝ රූපජීවිතේන්ද්‍රිය ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

එකුන් අනූ චිත්තය, චෛතසික දෙපනස ය, චිත්තජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයනට අයත් වූ ජීවිතින්ද්‍රිය රූපයෝ ය යන මොවුහු රූපජීවිතින්ද්‍රිය ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

**(17) ඣානපච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් ද්විපඤ්චවිඥානයෙන් අන්‍ය වූ එකුන් අසූ චිත්තයෙහි ඇත්තා වූ විතර්ක විචාර ප්‍රීති වේදනා ඒකාග්‍රතා සඞ්ඛ්‍යාත ධ්‍යානාඞ්ග ධර්මයෝ ධ්‍යාන ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

Non-commercial distribution

ද්විපඤ්චවිඥානයෙන් අන්‍ය වූ සිත් එකුන් අසූව ය, චෛතසික දෙපනස ය, චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොවුහු ධ්‍යාන ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

ද්විපඤ්චවිඥාන දශය ය, සර්ව චිත්තසාධාරණ චෛතසික සතය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජරූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු ධ්‍යාන ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

**(18) මග්ගපච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් සහේතුක සිත් එක් සැත්තෑවෙහි ඇත්තා වූ ප්‍රඥා විතර්ක සම්‍යක් වචන සම්‍යක් කර්මාන්ත සම්‍යගාජීව වීර්‍ය්‍ය ස්මෘති ඒකාග්‍රතා දෘෂ්ටි සඞ්ඛ්‍යාත මාර්ගාඞ්ග ධර්මයෝ නවදෙන මාර්ග ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

සහේතුක සිත් එක් සැත්තෑව ය, චෛතසික දෙපනස ය, සහේතුක චිත්තජ රූපයෝ ය, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොවුහු මාර්ගප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය

අහේතුක සිත් අටළොස ය, ඡන්දවර්ජිත අන්‍ය සමාන චෛතසික දොළොස ය, අහේතුක චිත්තජ රූපයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූප ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු මාර්ග ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

**(19) සම්පයුත්ත පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් ඔවුනොවුන්ට ප්‍රත්‍යය ය වන එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

ඔවුනොවුන් ගෙන් ප්‍රත්‍යය ලබන එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යනීකයෝ ය.

**(20) විප්පයුත්ත පච්චයො** යන ප්‍රත්‍යයෝද්දෙශයෙහි විප්‍රයුක්ත ප්‍රත්‍යය සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍ය ය, වස්තු පූර්වජාත විප්‍රයුක්ත ප්‍රත්‍ය ය,

Non-commercial distribution

වස්තවාරම්මණ පුරේජාත විප්‍රයුක්ත ප්‍රත්‍ය ය, පශ්චාජ්ජාත විප්‍රයුක්ත ප්‍රත්‍ය ය යන මොවුන් ගේ වශයෙන් සිව්වැදෑරුම් වේ.

එයින් සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයෙහි -පෙ- තෙවැදෑරුම් වෙති. එයින් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක ද්විපඤ්චවිඥාන අභිඥාචයුති වර්ජිත පන්සැත්තෑ චිත්තය ය, චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන හෘදය වස්තුව ය, හෘදය වස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොවුහු සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය වන ධර්මයෝ ය.

චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, හෘදයවස්තුවෙන් ප්‍රත්‍යය ලබන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හෘදය වස්තුව ය යන මොවුහු සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය.

චතුවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල සිත් අට ය, මෝහමූලද්වය ය, මනෝද්වාරාවර්ජනය ය, මහාකුසල් සිත් අට ය, මහාක්‍රියා සිත් අට ය, අරූපාවචර සිත් දෙළොස ය, ශ්‍රෝතාපත්ති මාර්ග චිත්තයෙන් අන්‍ය වූ ලෝකෝත්තර සිත් සත ය, ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සසාළිස ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යනීකයෝ ය.

වස්තුපුරේජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයේ ස්වරූපයෝ වස්තුපුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යයෙහි මෙන් ද, වස්තවාරම්මණ පුරේජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයේ ස්වරූපයෝ වස්තවාරම්මණ පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යයෙහි මෙන්ද, පශ්චාජ්ජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයේ සවරූපයෝ පශ්චාජ්ජාත ප්‍රත්‍යයෙහි මෙන් ද දතයුත්තාහු ය.

**(21) අත්ථි පච්චයො** යන ප්‍රත්‍යයෝද්දේශයෙහි අස්ති ප්‍රත්‍යය සහජාතාස්තිප්‍රත්‍යය ය, වස්තු පුරේජාතාස්ති ප්‍රත්‍යය ය, වස්තවාරම්මණ පුරේජාතාස්ති ප්‍රත්‍යය ය, ආරම්මණ පුරේජාතාස්ති ප්‍රත්‍ය ය, පශ්චාජ්ජාතාස්ති ප්‍රත්‍යය ය, ආහාරාස්ති ප්‍රත්‍යය ය, ඉන්ද්‍රියාස්ති ප්‍රත්‍යය ය යන මොවුන් ගේ වශයෙන් සත්වැදෑරුම් වේ.

එහි සහජාතාස්ති ප්‍රත්‍යයේ ස්වරූපයේ සහජාත ප්‍රත්‍යයෙහි මෙන් ද වස්තු පුරේජාතාස්ති ප්‍රත්‍යයේ ස්වරූපයෝ වස්තුපුරේජාත

Non-commercial distribution

නිඃශ්‍රය ප්‍රත්‍යයෙහි මෙන් ද, වස්තවාරම්මණ පූරේජාතාස්ති ප්‍රත්‍යයේ ස්වරූපයෝ වස්තවාරම්මණ පූරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යයෙහි මෙන් ද, ආරම්මණ පූරේජාතාස්ති ප්‍රත්‍යයේ ස්වරූපයෝ ආරම්මණ පූරේජාත ප්‍රත්‍යයෙහි මෙන් ද, පශ්චාජ්ජාතාස්ති ප්‍රත්‍යයේ සවරූපයෝ පශ්චජ්ජාත ප්‍රත්‍යයෙහි මෙන් ද, ආහාරාස්ති ප්‍රත්‍යයේ ස්වරූපයෝ රූපාහාර ප්‍රත්‍යයෙහි මෙන් ද, ඉන්ද්‍රියාස්ති ප්‍රත්‍යයේ ස්වරූපයෝ රූපජීවිතින්ද්‍රියාස්ති ප්‍රත්‍යයෙහි මෙන් ද දතයුත්තාහූ ය.

(22) (23) **නාස්ති, විගත ප්‍රත්‍යය** දෙකහි ස්වරූපයෝ අනන්තර ප්‍රත්‍යයෙහි මෙන් දත යුත්තාහූය.

(24) **අවිගත ප්‍රත්‍යය** යෙහි ස්වරූපයෝ අස්තිප්‍රත්‍යයෙහි මෙන් දත යුත්තාහ.

•

——— ප්‍රස්ථාන ත්‍රිරාශිය නිමියේ ය. ———

Non-commercial distribution

# ප්‍රත්‍යය විස්තරය.

මේ ප්‍රස්ථාන මහා ප්‍රකරණය වනාහි අතිශයින් ගැඹුරු වූ ද මහත් වූ ද ප්‍රකරණයෙකි. එබැවින් එය උගෙනීමට එයට බැස ගැනීමට එහි ආස්වාදයක් ලැබීමට අතිශයින් දුෂ්කර ය. අතිශයින් ගැඹුරු වූ ද පුළුල් වූ ද කෙළ ගණන් රළ පෙළ ඇත්තා වූ ද මහ සයුරෙහි සුන්දර නෞකාවක් ඇති තැනැත්තා හට අමාරුවක් නැතිව හැසිරිය හැකි ය. එහි ආස්වාදයක් ලැබිය හැකි ය. එමෙන් මේ ප්‍රකරණයට බැස ගත හැකි වීමට කලින් දතමනා ධර්මයන් දැන ගත් තැනැත්තා හට වැඩි වෙහෙසක් නැතිව ප්‍රස්ථාන ප්‍රකරණ සඞ්ඛ්‍යාත ධර්ම සාගරයෙහි හැසිරිය හැකි ය. ආස්වාදයක් ලැබිය හැකි ය. කලින් දතමනා කරුණු නො දැන නො උගෙන පට්ඨාන ප්‍රකරණයට බස්නා තැනැත්තන් ගේ ව්‍යායාමය පොරොවෙන් කළ යුත්ත තියෙන් කරන්නට තැත්කරන්නවුන්ගේ ව්‍යායාමය සේ නිෂ්ඵල වන්නේ ය. එබන්දන්ට පට්ඨාන ප්‍රකරණයෙන් වෙහෙස මිස ආස්වාදයක් නො ලැබෙන්නේ ය. එබැවින් පට්ඨානය උගෙනීමට බලාපොරොත්තු වන්නවුන් විසින් කලින් දතමනා ධර්මයන් දැන උගෙන ම පට්ඨානය උගෙනීම ආරම්භ කළ යුතු ය.

පට්ඨානය උගත හැකි වීමට පරමාර්ථ ධර්මයන් ගේ ස්වරූප විභාග ප්‍රගුණ කරගෙන තිබිය යුතු ය. හේත්වාදි ප්‍රත්‍යයන් ගේ ස්වභාවය දැන තිබිය යුතු ය. ඉහත දක් වූ ත්‍රිරාශිය ප්‍රගුණ කරගෙන තිබිය යුතු ය. මතු දක්වෙන ප්‍රත්‍යය ඝටනාව ප්‍රගුණ කර ගෙන තිබිය යුතුය. එ බැවින් මෙහි ප්‍රත්‍යයන් පිළිබඳ විස්තරයක් කරනු ලැබේ. එය ඉහත දක් වූ ත්‍රිරාශිය හා එකිනෙක සම්බන්ධ කොට බලා ප්‍රත්‍යයන් ගේ ස්වභාවය හා ත්‍රිරාශිය මැනවින් තේරුම් ගෙන ඉදිරියට පට්ඨානය උගෙනීම ආරම්භ කළ යුතු ය.

යමක උපකාරයෙන් නූපන් චිත්ත චෛතසික රූපයෝ උපදිත් ද උපන් ධර්මයෝ පරම්පරා වශයෙන් පවතිත් ද පරම්පරා වශයෙන් වැඩෙත් ද ඒ උපකාරක ධර්මයට ප්‍රත්‍යය ය යි කියනු ලැබේ. චිත්තය චෛතසිකය රූපය නිර්වාණය ප්‍රඥප්තිය යන පඤ්චප්‍රකාර ධර්මයෝම ප්‍රත්‍යයෝ වෙති. ප්‍රත්‍යය නො වන කිසි ධර්මයක් නැත්තේ ය. ප්‍රත්‍යයෙන් හටගන්නා පවත්නා ධර්මයට ප්‍රත්‍යයෝත්පන්න යයි කියනු ලැබේ. චිත්තචෛතසික රූපයෝ හටගැනීමක් ඇත්තාවූ ධර්මයෝ ය. නිර්වාණ ප්‍රඥප්ති දෙක හටගැනීමක් නැතිව ඇත්තා වූ ධර්මයෝ ය, හට ගැනීම ඇත්තා වූ ධර්මයන් අතර ප්‍රත්‍යයෙන් තොරව ස්වශක්තියෙන් ම හට ගන්නා ධර්මයෙක් නැත්තේ ය. හට ගන්නා ධර්ම සියල්ල ම ප්‍රත්‍යයන් ගේ ප්‍රතිලාභයෙන් ම හටගන්නා ධර්මයෝ ය. එබැවින් හටගන්නා ධර්ම සියල්ල ම අන්‍ය ධර්මයන්ගේ

Non-commercial distribution

හටගැනීමට උපකාර වීමෙන් ප්‍රත්‍යයෝ ද වෙති. තමන් ප්‍රත්‍යයෙන් හටගන්නා බැවින් ප්‍රත්‍යයෝත්පන්නයෝ ද වෙති. නො හට ගන්නා වූ නිර්වාණ ප්‍රඥප්ති දෙක ප්‍රත්‍යය වනු මිස ප්‍රත්‍යයෝත්පන්න නො වේ.

යම්කිසි එක ප්‍රත්‍යය ධර්මයක් ම ද යම් කිසි ඵලයක් ඇති කිරීමෙහි සමත් නො වේ. එක් එක් ප්‍රත්‍යයක් තමන් විසින් ඇති කරන ඵල ධර්මය ඇති කිරීමට සමත් වන්නේ තවත් ප්‍රත්‍යයන් ඒ ඵලය ඇති කිරීමට සහාය වුවහොත් ය. එබැවින් යම්කිසි එක් ප්‍රත්‍යයකින් ම හට ගන්නා ධර්මයක් ද නැත්තේ ය. ප්‍රත්‍යයෙන් උපදනා කවර ධර්මයක වුව ද ඉපදීම වනුයේ ප්‍රත්‍යය ධර්ම බොහෝ ගණනක උපකාරය ලැබීමෙනි. අපේ දහම් පොත්වල මේ අසවල් පිනේ විපාකය ය, මේ අසවල් පාපයේ විපාකය ය යනාදීන් ඇතැම් තැනක එක් එක් ඵලයකට එක් එක් ප්‍රත්‍යයක් දක්වා තිබෙන්නේ ඒ ඒ ඵලයන් ඇතිවීමට එක්විය යුතු වූ බොහෝ ප්‍රත්‍යයන් ගෙන් ප්‍රධාන ප්‍රත්‍යයන් දක්වීම් වශයෙනි.

ප්‍රත්‍යය ය යි කියනු ලබන උපකාරක ධර්මය උපකාරකත්වයෙන් එකක් වුව ද උපකාරකත්වයේ බොහෝ ප්‍රභේද ඇත්තේ ය. බොහෝ ආකාර ඇත්තේ ය. ඒ උපකාර වන්නා වූ ආකාරයන්ට උපකාරක ශක්තිහු ය යි කියනු ලැබේ. උපකාරක ධර්මය අනෙකකි. උපකාරක ශක්තිය යි කියනු ලබන ප්‍රත්‍යය ශක්තිය අනෙකකි. ඒ උපකාරක ශක්තිය ප්‍රත්‍යය ය යි කියනු ලබන උපකාරක ධර්මයෙහි ඇතියකි. උපකාරක ධර්මය වූ ප්‍රත්‍යය තේරුම් ගැනීමට වඩා ඒ ඒ ප්‍රත්‍යයන්හි ශක්ති විශේෂ තේරුම් ගැනීම අපහසු ය. ප්‍රත්‍යයකථාවෙහි දත යුතු ප්‍රධාන දෙය ප්‍රත්‍ය ශක්තිය ය. එබැවින් එය තේරුම් ගැනීමට විශෙෂයෙන් උත්සාහ කළ යුතු ය. ගසක ඇතිවීමට හා පැවැත්මට බීජය ද පොළොව ද ජලය ද වාතය ද හිරුඑළිය ද තවත් නොයෙක් දේ ද උපකාර වේ. ගසට බීජය උපකාර වන්නේ එක් ආකාරයකිනි. පොළොව උපකාර වන්නේ එයට වෙනස් වූ ආකාරයකිනි. ජලය උපකාර වන්නේ ඒ දෙකටම වෙනස් වූ අන් ආකාරයකිනි. වාතාදිය උපකාර වන්නේ ද එකිනෙකට වෙනස් වූ ආකාර වලිනි. මෙසේ ඒ ඒ දෙයට ඒ ඒ දෙය නොයෙක් අයුරින් උපකාර වන බව දත යුතු ය. ඒ ඒ දෙයට උපකාර ධර්ම අතුරෙන් ඇතැමෙක් මූල භාවයෙන් උපකාරක වෙති. සකල ධර්මයෝ ම ආරම්මණ භාවයෙන් උපකාර වෙති. ඇතැම් ධර්ම කෙනෙක් අධිපති භාවයෙන් උපකාරක වෙති. ඇතැම් ධර්ම කෙනෙක් අනන්තර භාවයෙන් උපකාරක වෙති. ඇතැම් ධර්ම කෙනෙක් සහජාත භාවයෙන් උපකාරක වෙති. එසේ ඇත්තාවූ උපකාරවීමේ අනේකාකාරයන් ගේ වශයෙන් තථාගතයන් වහන්සේ මේ ප්‍රස්ථාන ප්‍රකරණයෙහි ප්‍රත්‍යය සූවිස්සක් වදළ සේක.

Non-commercial distribution

යම් කිසි ධර්මයක ඉපදීමට උපකාර වන එක් ප්‍රත්‍යය ධර්මයක් ප්‍රත්‍යයෝත්පන්න ධර්මයට සමහර විට එක් ආකාරයකින් උපකාර වේ. සමහර විට ආකාර කීපයකින් ද උපකාරක වේ. එක් දෙයක් වූ වස්ත්‍රය ශරීරයෙහි අශෝභන තැන් වැසීම ය, ශරීරය හොබ වීම ය, උණුසුම් කිරීම ය, මැසි මදුරු ආදීන්ගෙන් ආරක්‍ෂා කිරීමය යනාදි ආකාර කීපයකින් එක වරම මිනිසාට උපකාරක වන්නාක් මෙනි. එක් ධර්මයක් යම් කිසිවකට කීප ආකාරයකින් උපකාරක වන කල්හි ඒ එකම ධර්මය ප්‍රත්‍යය කීපයක් සැටියට ගණන් ගනු ලැබේ. සමහර විට එක් ධර්මයක් යම්කිසි ධර්මයකට යම්කිසි ආකාරයකින් උපකාර වන අතර ම ඒ ධර්මය තවත් ධර්මයකට අන් ආකාරයකින් ද උපකාර වේ. එක් දෙයක් වූ වස්ත්‍රය හැඳ සිටින තැනැත්තා ගේ ශරීරය හොබවමින් ම දක්නවුන් ගේ සිත්හි ලෝභය ඇති කරන්නාක් මෙනි. මේ ප්‍රකරණයෙහි එක් ප්‍රත්‍යයක් හැටියට දක්වන්නේ එක් ධර්මයක් ම නොවේ. එක් ආකාරයකින් එක් ශක්තිවිශේෂයකින් අන්‍ය ධර්මයනට උපකාර වන ධර්ම කොතෙක් ඇත ද ඒ සියල්ල ම එක් ප්‍රත්‍යයක් සැටියට මෙහි දක්වනු ලැබේ. මූල භාවයෙන් උපකාරවන ධර්ම සියල්ල ම හේතු ප්‍රත්‍යය ය, ආරම්මණ භාවයෙන් උපකාර වන ධර්ම සියල්ල ම ආරම්මණ ප්‍රත්‍යය ය. ඉතිරි ප්‍රත්‍යයෝ ද එසේ දත යුත්තා හ.

ප්‍රත්‍යය වන්නා වූ එක් ධර්මයක නොයෙක් ශක්තීන් ඇති බැවින් එක් එක් ධර්මයක් ද ප්‍රත්‍යය බොහෝ ගණනකට අයත් වේ. එක් ධර්මයක් වූ ලෝභය මූල භාවයෙන් උපකාරක වීම් වශයෙන් හේතු ප්‍රත්‍යය වේ. චිත්තචෛතසිකයනට ආරම්මණ භාවයෙන් උපකාරවීම් වශයෙන් ආරම්මණ ප්‍රත්‍යය වේ. ගරුකොට අරමුණු කළ යුතු ස්‍වභාවයෙන් ආරම්මණාධිපති ප්‍රත්‍යය වේ. අනතුරුව උපදනා චිත්ත චෛතසිකයනට උපකාර වීම් වශයෙන් අනන්තර ප්‍රත්‍යය ද සමනන්තර ප්‍රත්‍යය ද වේ. එක් ව ඉපදීම් වශයෙන් උපකාරක වීමෙන් සහජාත ප්‍රත්‍යය වේ. අන්‍යෝන්‍ය වශයෙන් උපකාර වීමෙන් අන්‍යෝන්‍ය ප්‍රත්‍යය වේ. එක් ව උපදනා චිත්ත චෛතසිකයන්ට ආධාරවීම් වශයෙන් නිඃශ්‍රය ප්‍රත්‍යය වේ. කුශලාදි ධර්මයන්ට බලවත් හේතු වීමෙන් උපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. පසුව ඉපද පූර්වයෙහි උපන් රූපයනට උපකාර වීම් වශයෙන් පශ්චාජ්ජාත ප්‍රත්‍යය වේ. අනතුරුව උපදනා ලෝභයට තමා ගේ සවභාවය ගැන්වීම් වශයෙන් ආසේවන ප්‍රත්‍යය වේ. එක්ව උපදනා චිත්ත චෛතසිකයන් හා මිශ්‍ර වීම් වශයෙන් සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය වේ. රූපයනට අමිශ්‍ර භාවයෙන් උපකාර වීම් වශයෙන් විප්‍රයුක්ත ප්‍රත්‍යය වේ. විද්‍යමානත්වයෙන් උපකාර වීම් වශයෙන් අස්ති ප්‍රත්‍යය ද අවිගත ප්‍රත්‍යයද වේ. අවිද්‍යමානත්වයෙන් උපකාරිවීම් වශයෙන් නාස්ති ප්‍රත්‍යය ද විගත ප්‍රත්‍යය ද වේ. අන්‍යධර්මයන් ද එ සේ ඒ ඒ ධර්මයන්හි ඇති අනේක ශක්තීන් ගේ වශයෙන් අනේක ප්‍රත්‍ය භාවයට පැමිණෙන සැටි තේරුම් ගත යුතු ය.

Non-commercial distribution

එක් එක් ප්‍රත්‍යයක් පිළිබඳ ව ප්‍රත්‍යය ය, ප්‍රත්‍යයෝත්පන්නය ය, ප්‍රත්‍යනීක ය කියා ධර්ම කොටස් තුනක් දත යුතු ය. ත්‍රිරාශිය ය කියනුයේ ඒ ධර්ම කොටස් තුනට ය. එහි ප්‍රත්‍යය යනු යම්කිසි ශක්ති විශේෂයකින් අන්‍ය ධර්මයකට උපකාර වන ධර්මය ය. ප්‍රත්‍යයෝත්පන්නය යනු යම් කිසි ප්‍රත්‍යය ධර්මයක් නිසා ඇති වූ ධර්මය ය. ප්‍රත්‍යනීකය යනු යම්කිසි ප්‍රත්‍යයක ප්‍රත්‍යයෝත්පන්න භාවයට නො පැමිණෙන ධර්මය ය. ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න ප්‍රත්‍යනීක විභාගය පහසු වනු සඳහා ත්‍රිරාශියෙහි රූපධර්ම සමූහය චිත්තජ රූප ය, ප්‍රතිසන්ධි කර්මජ රූප ය, බාහිර රූප ය, ආහාරජ රූප ය, ඍතුජ රූප ය, අසංඥසත්ත්ව කර්මජරූපය ප්‍රවෘත්ති කර්මජ රූපය යි සත් කොටසකට බෙද දක්වා තිබේ.

## (1) හේතු ප්‍රත්‍යය.

යම්කිසිවක ඇති වීමේ ද පැවතීමේ ද දියුණු වීමේ ද පිරිහීමේ ද විකෘතියට පැමිණීමේ ද විනාශ වීමේ ද කාරණයට ලෝකයෙහි හේතු යන නාමය ව්‍යවහාර කරනු ලැබේ. ශාසනයෙහි ද -

"යෙ ධම්මා **හෙතුප්පභවා** තෙසං **හෙතුං** තථාගතො ආහ"
"නයිදං අත්ත කතං බිම්බං නයිදං පරකතං අසං
**හෙතුප්පටිච්ච** සම්භූතං **හෙතු** භඞ්ගා නිරුජ්ඣති"

යනාදීන් යම් කිසි සිදුවීමක කාරණය පැවසීමට **හේතු** යන වචනය ව්‍යවහාර කරනු ලැබේ. "අයම්පි ඛො මහාලි **හෙතු** අයං **පච්චයො** සත්තානං විසුද්ධියා" යනාදීන් බොහෝ සූත්‍ර ධර්මවල හේතු පච්චය යන වචන දෙක ම යම් කිසිවක් සිදු වීමේ කාරණය යන එක ම අර්ථය දක්වීමට යොදා තිබේ.

මේ ප්‍රත්‍යය කථාවෙහි **හෙතු** යන වචනය යොදා තිබෙන්නේ මූලය යන අර්ථය දීම සඳහා ය. පච්චය යන වචනය ද නොයෙක් අර්ථවල යෙදේ. මෙහි ඒ වචනය යොදා තිබෙන්නේ උපකාරක ධර්මය යන අර්ථය දීම සඳහා ය. අභිධර්ම පිටකයෙහි සැම තැනම හේතු යන වචනය යොදා තිබෙනුයේ මූලය යන අර්ථය දීම සඳහා ය. පච්චය යන වචනය යොදා තිබෙන්නේ කාරණාසඞ්ඛ්‍යාත උපකාරක ධර්මය දක්වීම සඳහා ය. හෙතුය පච්චය ය යන වචන දෙක හෙතුපච්චයො කියා සමාස වූ කල්හි මූල භාවයෙන් උපකාරක ධර්මය ය යන අර්ථය කියවේ. **මූල භාවයෙන් අන්‍ය ධර්මයන්ට උපකාර වන ධර්මය හේතු ප්‍රත්‍යය ය.**

Non-commercial distribution

ගස්වල මුල් පොළොවෙහි කා වැදී පොළොව තදින් ගන්නා මෙන් එක් අරමුණක් ගෙන එකට බැඳී උපදනා චිත්ත චෛතසික ධර්‍ම පිණ්ඩයන්හි අන්‍ය ධර්‍මයනට වඩා තදින් ආරම්මණය ගන්නා වූ චෛතසිකයෝ සදෙනෙක් ඇත්තාහ. **ලෝභය ද්වේෂය මෝහය අලෝභය අද්වේෂය අමෝහය** යනු ඒ ධර්‍මයෝ සදෙන ය. ගස්වල මුල් පොළොව තදින් ගන්නාක් මෙන් ආරම්මණය තදින් ගන්නා ධර්‍මයෝ ය යන අර්ථයෙන් ඔවුනට හේතු ය යි කියනු ලැබේ. පොළොවට වැද පොළොව තදින් ගෙන සිටින මුල් ඒ තදින් ගැනීම නිසා පොළොවෙහි නොසැලී පිහිටන්නාක් මෙන් අරමුණක් ගනිමින් උපදනා ධර්‍ම සමූහයක ඒ අරමුණ තදින් ගෙන සිටින්නා වූ ධර්‍මය ඒ ග්‍රහණය නිසා ඒ ආරම්මණයෙහි ස්ථිර ව පිහිට යි. ස්ථිරව පිහිටි මුල් හා බැඳී සිටීම නිසා පොළොව මතුයෙහි තිබෙන ගස ද පොළොවෙහි ස්ථිර ව පිහිටා සිටින්නාක් මෙන් අරමුණ තදින් ගන්නා ලෝභාදීන් හා මිශ්‍රවන චිත්ත චෛතසිකයෝ ද ඒ ලෝභාදිය නිසා අරමුණෙහි මනාකොට පිහිටති. ලෝභාදියෙහි ඇති අරමුණෙහි නො සැලී පිහිටන ස්වභාවයට හේතු ශක්තිය ය යි කියනු ලැබේ.

සම්ප්‍රයුක්ත ධර්‍මයනට සැලෙන්නට නො දී ආරම්මණයෙහි මනා කොට පිහිටවීමේ උත්සාහයක් හේතූන්හි නැත. එහෙත් හේතූන් නිසා ඔවුනට අනුව සම්ප්‍රයුක්ත ධර්‍මයෝ ආරම්මණයෙහි නො සැලී පිහිටති. ඒ බැවින් හේතූහු සම්ප්‍රයුක්ත ධර්‍මයන් ආරම්මණයෙහි මැනවින් පිහිට වන ධර්‍මයෝය යි කියනු ලැබෙත්. නූපන් හොත් හේතු සම්ප්‍රයුක්ත ධර්‍මයනට අරමුණෙහි නො පිහිටිය හැකි ය. හේතූන්ට අනුව ආරම්මණයෙහි නො සැලී පිහිටීමටත් ඒ ධර්‍මයන් ඉපදිය යුතු ය. හේතු සම්ප්‍රයුක්ත ධර්‍මයෝ හේතූන් අනුව ආරම්මණය ග්‍රහණය කරමින් අරමුණෙහි මනා කොට පිහිටමින් හේතු ධර්‍මයනට අනුකූල වීම් වශයෙන් ඔවුන් හා බැඳී උපදිති. හේතූන් ගේ හේතු ශක්තිය නැත හොත් ඒ අනුකූල ව ඉපදීම සිදු නො වේ. සම්ප්‍රයුක්ත ධර්‍මයන් ඉපද වීමේ උත්සාහයක් හේතූන්හි නැත ද ඔවුන් නිසා සම්ප්‍රයුක්ත ධර්‍මයන් උපදනා බැවින් හේතූහු සම්ප්‍රයුක්ත ධර්‍මයන් ගේ උත්පත්තියට උපකාරක ධර්‍මයෝ යයි කියනු ලැබෙත්. සම්ප්‍රයුක්ත ධර්‍ම සහිත වූ සහේතුක චිත්තය නූපදින හොත් සහේතුක චිත්තජ රූපයනට හා සහේතුක ප්‍රතිසන්ධි කර්‍මජ රූපයන්ට ද නූපදිය හැකිය. ඒවා උපදින්නේ ද සහේතුක චිත්තය උපදනා නිසාය. ඒ බැවින් හේතූහු සහේතුක චිත්තජ රූප සහේතුක ප්‍රතිසන්ධි කර්‍මජ රූපයන් ගේ උත්පත්තියට ද උපකාරයෝ ය යි කියනු ලැබෙත්.

**ජනක ප්‍රත්‍යයෝ ය, උපස්ථම්භක ප්‍රත්‍යයෝ ය, ජනකෝපස්ථම්භක ප්‍රත්‍යයෝ ය** යි ප්‍රත්‍යය තුන් වර්ගයෙකි. යම්කිසි ධර්‍මයක ඉපදීමට

Non-commercial distribution

උපකාරක ධර්මය **ජනක ප්‍රත්‍යය** ය. පැවැත්මට උපකාරක ධර්මය **උපස්තම්භක ප්‍රත්‍යය** ය. ඉපදීමය පැවැත්මය යන දෙකටම උපකාරක ධර්මය **ජනකොපස්තම්භක** ප්‍රත්‍යය ය. ජනක ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න ධර්මයා ගේ උත්පාදයට ප්‍රත්‍යය වේ. උපස්තම්භක ප්‍රත්‍යය ස්ථිතියට ප්‍රත්‍යය වේ. ජනකෝපස්තම්භක ප්‍රත්‍යය උත්පාද ස්ථිති දෙකටම ප්‍රත්‍යය වේ. හේතු ප්‍රත්‍යය ජනකෝපස්තම්භක ප්‍රත්‍යයෙකි. එය ප්‍රත්‍යයෝත්පන්නයා ගේ උත්පාද ස්ථිති දෙකට ම ප්‍රත්‍යය වේ.

හේතු ධර්මයන් අන්‍ය ධර්මයන්ට වඩා අරමුණ තදින් ගන්නා බව ඉහත කියන ලදී. ඒවායේ ඇති අරමුණ තදින් ගන්නා බව ලෝභ ද්වේෂ දෙක ගැන සිතා බැලීමෙන් තේරුම් ගත හැකි ය. මනුෂ්‍යයන් විසින් ලස්සනය හොඳ ය කියා සලකන සත්‍රිරූපාදි ආරම්මණයන් ගෙන් යම් කිසිවක් දුටු කල්හි එය අරමුණු කොට ලෝභ සහගත සිත් උපදනේ ය. ඒ සිත්වල ලෝභය හා තවත් චෛතසික ද ඇත්තේ ය. එ බඳු අවස්ථාවල දී මනුෂ්‍යයෝ "මට ආශාවක් ඇතිවි ය, ආදරයක් ඇතිවිය යි" කියති. ඒ අරමුණ ගෙන එකවර ඇතිවුණු සිත හා බොහෝ චෛතසිකයන් ගැන නො කියා මිනිසා ආශාව ආදරය ඇති වූ බව පමණක් කියනුයේ ඔහුට ඒ අවස්ථාවේ දී ලෝභය පමණක් ඇති වූ බව දැනෙන නිසා ය. සිත හා අන්‍ය චෛතසිකයන් ඇති වූ බව ඔහුට නො දැනෙන්නේ අරමුණ තදින් ගනිමින් ඇතිවන ලෝභයෙන් ඒවා වැසී යන නිසා ය. හොඳයයි සලකන අරමුණ තුළට කාවැදෙන්නාක් මෙන් ලෝභය එය තදින් ගනිමින් උපදී. එ බැවින් ලෝභයෙන් සම්ප්‍රයුක්ත ධර්මයෝ වැසී යෙත්. ඒ අරමුණ ගනිමින් වරක් ලෝභය ඇති වූ කල්හි එය ගැන නැවත නැවත ද ලෝභය උපදින්නට පටන් ගනී. එය නැවැත්වීමට හෙවත් ප්‍රහාණය කිරීමට දුෂ්කර ය. ලෝභයේ නැවත නැවත ඉපදීම නැවැත්වීමට දුෂ්කර වන්නේ ද එය අරමුණට ඇතුළු වන්නාක් මෙන් නොහොත් ගිලගන්නාක් මෙන් අරමුණ තදින් ගත් බැවිනි.

යම්කිසිවකු ගැන ද්වේෂය ඇති වූ කල්හි ද මනුෂ්‍යයෝ එය හා සම්ප්‍රයුක්ත වශයෙන් ඇති වන්නා වූ සිත හා අන්‍ය චෛතසිකයන් හැර දමා කෝපයක් ඇති වූ බව පමණක් කියති. සිත හා අන්‍ය චෛතසිකයන් එය හා ඇති වන බව නො දැනෙන්නේ ද්වේෂය ඒ ආරම්මණය ගිල ගන්නාක් මෙන් සිතට ද අන්‍ය චෛතසිකයන්ට ද වඩා තදින් ගන්නා බැවිනි. සිත හා අන්‍ය චෛතසිකයෝ තදින් අරමුණ ගන්නා ද්වේෂයෙන් වැසී යෙති. වරක් ද්වේෂය ඇති වූ කල්හි ඒ ආරම්මණය කෙරෙහි නැවත නැවත ද ද්වේෂය ඇති වන්නට පටන්

Non-commercial distribution

ගනී. එය නැවැත්වීමට දුෂ්කර ය. එය නැවත නැවත ඇතිවන්නේ ද නැවැත්වීමට දුෂ්කර වන්නේ ද එයින් අරමුණ තදින් ගත් බැවිනි.

සත්ත්වයන් විසින් මිහිරිකොට ගෙන ඇලුම් කරන්නා වූ රූපාදි ආරම්මණයෝ අනේකාදීනවයෙන් යුක්තයෝ ය. සතුරෝ ය. මාරයෝ ය. ඒවායේ බිය විය යුතු බවක් මිස ඇලුම් කළ යුතු බවක් නැත්තේ ය. ඇලුම් කළ යුතු බවක් නැත්තා වූ ආරම්මණය ලෝභයට තදින් ගත හැකි වන්නේ එය හා එක් ව පවත්නා වූ මෝහය නිසා ය. මෝහය ආරම්මණයේ සත්‍ය ස්වභාවය වසා ගෙන එය මිහිරක් කොට තදින් ගන්නේ ය. මෝහයාගේ ඒ ගැනීම නො වෙත හොත් ලෝභය ඇති නොවන්නේ ය. ලෝභය අරමුණ තදින් ගන්නේ මෝහය ආරම්මණය මිහිරක් කොට තදින් ගත් පමණට ය. ආරම්මණයන් කෙරෙහි පවත්නා සම්මෝහය ලෙහෙසියෙන් දුරලිය නො හැක්කේ මෝහයා ගේ ගැන්මේ තද බව නිසා ය.

මෝහය ඇතැම් ආරම්මණයන් මිහිරි කොට ගන්නාක් මෙන් ඇතැම් ආරම්මණයන් අමිහිරි කොට පිළිකුල් කොට නපුරු කොට ද ගන්නේ ය. ද්වේෂය ඇතිවන්නේ ඒ අමිහිරි කොට නපුරු කොට ගැනීම අනුව ය. ද්වේෂය ආරම්මණය තදින් ගන්නේ ද එය හා සම්ප්‍රයුක්ත මෝහයෙන් ආරම්මණය අමිහිරි කොට ගත් පමණට ය. ද්වේෂය ලෙහෙසියෙන් දුරලිය නො හෙන්නේ මේ නැනැත්තා නරක ය, සතුරුය කියා මෝහයෙන් කරන ගැනීමේ තද බව නිසා ය. එය දුරු කළ හොත් එයට අනුව ද්වේෂය ඉබේ ම දුරුවන්නේ ය. ද්වේෂයේ ආරම්මණය තදින් ගන්නා බව එය හා සම්ප්‍රයුක්ත මෝහය අනුව ද, මෝහයේ අරමුණ තදින් ගන්නා බව එය හා සම්ප්‍රයුක්ත ද්වේෂයට අනුව ද සිතා කාරණය තේරුම් ගැනීමට උත්සාහ කළ යුතු ය.

අනිත්‍ය වූ ද දුඃඛ වූ ද අනාත්ම වූ ද අශුභ වූ ද සංස්කාරයන් හි නිත්‍ය වශයෙන් ද සුඛ වශයෙන් ද ආත්ම වශයෙන් ද ශුභ වශයෙන් ද පවත්නා සම්මෝහය සත්ත්වයන් කෙරෙහි ලෙහෙසියෙන් දුරු කළ නො හෙන ලෙස පවතී. එය ද මෝහයේ ආරම්මණය තදින් ගැනීම වන බව කිය යුතු ය. අලෝභාදි ධර්‍ම තුනෙහි මූල භාවය ද සිතිය යුතු ය. ලෝභාදි ධර්‍මයන් ගේ හේතු භාවය හෙවත් මූල භාවය ගැන සෑහෙන විස්තරයක් පැරණි පොත්වල සඳහන් වී නැත. හේතූන් පිළිබඳ වූ මේ විස්තරය අප අදහස පරිදි කරන ලද්දකි. එබැවින් එය ගැන වැඩිදුරටත් විමසිය යුතු ය.

ත්‍රිරාශියෙහි හේතු ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයන් වශයෙන් දක්වෙන ධර්‍ම සියල්ලට ම හේතු සියල්ල ම ප්‍රත්‍යය වන්නේ නොවේ. එ බැවින් එහි විභාගය දත යුතු ය. ඒ ඒ හේතූන් ඒ ඒ ධර්‍මයන්ට ප්‍රත්‍යය

Non-commercial distribution

වන අයුරු අභිධර්මාර්ථ සඞ්ග්‍රහයෙහි දක්වෙන චිත්ත විභාගය අනුව දක්වනු ලැබේ. ඒ මෙසේ ය :–

ලෝභ මූල සිත් අටෙහි ලෝභ මෝහ වශයෙන් හේතු දෙකක් ඇත්තේ ය. ඒ හේතු දෙක ලෝභ මූල චිත්තයට හා හේතූන් ගෙන් අන්‍ය වූ චෛතසිකයන්ට ද චිත්තජරූපයන්ට ද හේතු ශක්තියෙන් උපකාරක වේ. ලෝභමූල සිත්හි ලෝභය එහි ඇති මෝහයට ද මෝහය ලෝභයට ද හේතු ශක්තියෙන් උපකාරක වේ. එ බැවින් ලෝභ මෝහයෝ දෙදෙන හේතු ප්‍රත්‍යය ද වෙති. හේතු ප්‍රත්‍යයෝත්පන්න ද වෙති. සිත හා ලෝභ මෝහයන් ගෙන් අන්‍ය චෛතසික හේතු ප්‍රත්‍යයෝත්පන්නයෝ පමණක් වෙති. චිත්තජ රූපයනට හේතූන් ප්‍රත්‍යය වෙතැයි කී පමණින් චිත්තජ රූපයෝ හේතූන් නිසා ම උපදින්නාහුය යි නො ගත යුතු ය. චිත්තය ම ද චිත්තජ රූප ඉපදවීමට සමත් නොවේ. හේතූහු ම ද චිත්තජ රූප ඉපදවීමට සමත් නො වෙති. චිත්තජරූප උපදවන්නේ එකට උපදනා චිත්ත චෛතසික සියල්ලෙනි. ව්‍යවහාර පහසුව පිණිස සිත ප්‍රධාන කොට ගෙන එසේ උපදනා රූපයන්ට චිත්තජ රූපයෝය යි කියනු ලැබේ. චිත්ත චෛතසික සමූහය ම එක් ව රූප ඉපදවීමෙහි දී ඒ හේතූහු රූපයන්ට හේතු ශක්තියෙන් උපකාර වෙති. එ බැවින් ඒ රූපයෝ ද හේතු ප්‍රත්‍යයෝත්පන්නයන් වශයෙන් කියනු ලැබෙත්. හේතූන් රූපයන්ට උපකාරක වන්නේ චිත්ත චෛතසිකයන්ට සේ ආරම්මණයෙහි නො සැලී සිටීමට නොව ඉපදීමට පමණෙකි.

ද්වේෂමූලික දෙසිතෙහි ද්වේෂ මෝහ වශයෙන් හේතු දෙකකි. ඒවා ප්‍රත්‍යය වන සැටි ලෝභමූලික චිත්තයට අනුව දත යුතු ය.

මෝහමූලික දෙසිතෙහි ඇත්තේ මෝහ හේතුව පමණකි. එය සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වේ. එයට ප්‍රත්‍යය වන තවත් හේතු ධර්මයක් ඒ සිත්හි නො වන බැවින් ඒ මෝහය හේතු ප්‍රත්‍යය මුත් හේතු ප්‍රත්‍යයෝත්පන්න නො වේ. ත්‍රිරාශියෙහි මෝහමූල ද්වයෙහි මෝහය හේතු ප්‍රත්‍යයෝත්පන්න භාවයෙන් හැර තිබෙන්නේ එහෙයිනි.

අහේතුක සිත් අටොළොසෙහි එක හේතුවකු දු නැත්තේ ය. ඒ බැවින් අහේතුක චිත්තචෛතසිකයෝ ද අහේතුක චිත්තජ රූපයෝ ද අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ද හේතු ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න භාවයට නො පැමිණෙති. හේතු ප්‍රත්‍යය ලබන්නා වූ චිත්තචෛතසිකයෝ පොළොවට කා වැදුණු මුල් ඇති ගස් සේ ස්ථිර වෙති. බලවත් වෙති. හේතු ප්‍රත්‍යය නො ලබන ධර්මයෝ ජල මතුයෙහි වැවෙන දිය පරඬල් සේ දුබලයෝ වෙති.

Non-commercial distribution

කාමාවචර කුසල් සිත් අට අතුරෙන් ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරෙහි ආලෝභ අද්වේෂ අමෝහ වශයෙන් හේතු තුනක් ඇත්තේ ය. ඥාන විප්‍රයුක්ත සිත් සතරෙහි අලෝභ අද්වේෂ වශයෙන් හේතු දෙක බැගින් ඇත්තේ ය. ප්‍රත්‍යය වන ආකාරය ලෝභමූලික සිත්වලට කී පරිද්දෙන් සලකා ගත යුතු ය.

මහා විපාක ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරෙහි අලෝභ අද්වේෂ අමෝහ වශයෙන් හේතු තුන බැගින් ඇත්තේ ය. ඥානවිප්‍රයුක්ත සිත් සතරෙහි අලෝභ අද්වේෂ වශයෙන් හේතු දෙක බැගින් ඇත්තේ ය. මහා විපාක චිත්තයෝ ප්‍රතිසන්ධි කෘත්‍යයෙන් ද භවාඞ්ග කෘත්‍යයෙන් ද ච්‍යුති කෘත්‍යයෙන් ද තදාරම්මණ කෘත්‍යයෙන් ද උපදිති. ප්‍රතිසන්ධි කෘත්‍යයෙන් උපදනා මහා විපාක චිත්තයන්හි ඇති හේතූහු සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වෙති. ඒවායින් චිත්තජ රූප නූපදවන බැවින් ප්‍රතිසන්ධි චිත්ත සම්ප්‍රයුක්ත හේතූහු චිත්තජ රූපයනට ප්‍රත්‍යය නො වෙති. තදාරම්මණ වශයෙන් හා භවාඞ්ග වශයෙන් ද ශෛක්‍ෂ්‍ය පෘථග්ජන ච්‍යුති වශයෙන් ද පවත්නා වූ මහා විපාක චිත්ත සම්ප්‍රයුක්ත හේතූහු සම්ප්‍රයුක්ත ධර්මයන්ට හා චිත්තජ රූපයන්ට ද ප්‍රත්‍යය වෙති. අර්හත්තච්‍යුති චිත්ත සම්ප්‍රයුක්ත හේතූහු සම්ප්‍රයුක්ත ධර්මයන්ට පමණක් ප්‍රත්‍යය වෙති.

කර්මජ රූපයන් ගේ සිත හා සම්බන්ධය ඇත්තේ ප්‍රතිසන්ධික්‍ෂණයෙහි පමණෙකි. ප්‍රතිසන්ධි චිත්තය ප්‍රතිසන්ධි කර්මජ රූපයන් ගේ බීජය ය. බීජයක් නැති ව අඞ්කුරයක් නො හටගන්නාක් මෙන් ප්‍රතිසන්ධි චිත්තය නො පහළ වූව හොත් කර්මජ රූපයෝ නූපදිති. ප්‍රතිසන්ධි චිත්තය හා ප්‍රතිසන්ධි කර්මජ රූපයන් ගේ බලවත් සම්බන්ධයක් ඇත්තේ ය. එ බැවින් දුබල වූ ද ප්‍රතිසන්ධි චිත්ත සම්ප්‍රයුක්ත හේතූහු පතිසන්ධි කර්මජ රූපයනට ප්‍රත්‍යය වෙති. ප්‍රතිසන්ධියෙන් පසු සිත් උපනත් නූපනත් කර්මජ රූපයෝ නො නැවතී ම උපදිති. නිරෝධ සමාපත්තියට සමවන් තැනැත්තන් කෙරෙහි සිත නො මැති කල්හි දු අඩුවක් නැති ව කර්මජ රූපයන් උපදනා බව ප්‍රවෘත්ති කර්මජ රූපයන් ගේ සිත හා සබඳ කමක් නැති බවට ශාක්‍ෂ්‍යයකි. ප්‍රවෘත්ති කර්මජ රූපයන් ගේ සිත හා සබඳ කමක් නැති බැවින් ප්‍රවෘත්ති කාලයෙහි හේතූහු කර්මජ රූපයන්ට ප්‍රත්‍යය නො වෙති. ප්‍රතිසන්ධි චිත්තය ආගන්තුක බැවින් ද දුබල වස්තුරූපයක් ඇසුරු කොට උපන් බැවින් ද දුබල ය. චිත්තය උත්පාදයේ දී බලවත් ධර්මයෙකි. රූපය ස්ථිතියේ දී බලවත් ධර්මයකි. ප්‍රතිසන්ධි චිත්තයෙන් අන්‍ය වූ සිත් උපදින්නේ ස්ථිතියට පැමිණීමෙන් බලවත් වූ වස්තූන් ඇසුරු කරමනි. •ප්‍රතිසන්ධි චිත්තයට ඇසුරු කොට ඉපදීමට කලින් උපන් වස්තුරූපයක් නැති

Non-commercial distribution

බැවින් තමා සමග ම උපදනා වූ ස්ථිතියට නො පැමිණි දුබල වස්තු රූපය ඇසුරු කොට උපදී. දුබල බැවින් ප්‍රතිසන්ධි චිත්තය රූප ඉපදවීමට සමත් නො වේ. ඒ බැවින් ප්‍රතිසන්ධි චිත්ත සම්ප්‍රයුක්ත හේතූන් ගේ චිත්තජ රූපයනට ප්‍රත්‍යය වීමක් නැත.

ඇතැම් ආචාර්‍ය්‍යවරු සකල සත්ත්වයන් ගේ ම ච්‍යුති චිත්තය රූප නූපදවන ලෙස පිළිගනිති. බොහෝ ආචාර්‍ය්‍යවරයන් පිළිගන්නේ රහතුන් ගේ ච්‍යුති චිත්තය පමණක් රූප නූපදන ලෙස ය. පැරණියන් පට්ඨාන සන්නය ලියා තිබෙන්නේ ද රහතුන් ගේ ච්‍යුති චිත්තය පමණක් රූප නූපදවන හැටියට දක්වමිනි. අප ද මේ සන්නය පැරණි සන්නයන් අනුව ලියනු ලැබේ. මතු උපදනා සත්ත්වයා ගේ ච්‍යුති චිත්තය චිත්තපරම්පරාවේ අන්තිම සිත නොවේ. ච්‍යුතියෙන් පසු රහතනට නැවත කොතැනක වත් සිතක් නූපදනා බැවින් අර්හත්ත ච්‍යුතිය සත්ත්වයකු ගේ චිත්ත පරම්පරාවේ අවසාන සිත ය. ඒ අවසාන සිතෙහි යම්කිසි විශේෂයක් තිබිය යුතු බව පිළිගත හැකි ය.

මහා ක්‍රියා චිත්ත සම්ප්‍රයුක්ත හේතූහු ද, මහද්ගත කුශල මහද්ගත ක්‍රියා සම්ප්‍රයුක්ත හේතූහු ද ලෝකෝත්තර චිත්ත සම්ප්‍රයුක්ත හේතූහු ද සම්ප්‍රයුක්ත ධර්‍මයන්ට හා චිත්තජ රූපයන්ට ද ප්‍රත්‍යය වෙති. ප්‍රතිසන්ධි කෘත්‍යවත් රූපාවචර විපාක හේතූහු සම්ප්‍රයුක්ත ධර්‍මයන්ට හා ප්‍රතිසන්ධි කර්‍මජ රූපයන්ට ප්‍රත්‍යය වෙති. භවාඞ්ග ච්‍යුති කෘත්‍යවත් රූපාවචර විපාක සම්ප්‍රයුක්ත හේතූහු සම්ප්‍රයුක්ත ධර්‍මයන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වෙති. අරූපාවචර විපාක සම්ප්‍රයුක්ත හේතූහු සම්ප්‍රයුක්ත ධර්‍මයන්ට පමණක් ප්‍රත්‍යය වෙති. මේ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න විභාගය දක්වන ලදුයේ පඤ්චවෝකාර භවයා ගේ වශයෙනි. චතුවෝකාර භූමිය රූප උපදනා තැනක් නො වන බැවින් එහි උපදනා චිත්තයන් හා සම්ප්‍රයුක්ත හේතූන් සම්ප්‍රයුක්ත ධර්‍මයන්ට පමණක් ප්‍රත්‍යය වන බව දත යුතු ය.

හෙතුපච්චයො යනුවෙහි **වචනාර්ථ** මෙසේ ය :– **හිනොති පතිට්ඨාති එත්ථාති හෙතු** මෙහි ඵලය පිහිටා නූයි හේතු නම් වේ. අධිකරණ සාධන විග්‍රහයි. හි ධාතුව කෙරෙන් ආධාරාර්ථයෙහි තු ප්‍රත්‍යය වී ඉකාරයට වෘද්ධි ව හේතු යනු සිඩයි. ඵල වූ සම්ප්‍රයුක්ත ධර්‍මයන් ගේ ස්ථිරව පිහිටීමට ස්ථාන වන ධර්‍මය හේතුව ය යනු අදහස යි. **හිනොති පතිට්ඨාති එතෙනාති හෙතු** එය කරණකොට ගෙන ඵලය ස්ථිර ලෙස පිහිටා නූයි හේතු නම්. කරණ සාධන විග්‍රහයි. හි ධාතුව කෙරෙන් කරණාර්ථයෙහි තු ප්‍රත්‍යය ව වෘද්ධිව සිඩයි. සම්ප්‍රයුක්ත ධර්‍මයන් ගේ ස්ථිරව පිහිටීමට උපකාරවන ධර්‍මය හේතු නම් වේය යනු අදහසයි. වෘද්ධිය ය, ප්‍රවර්‍ත්තනය

Non-commercial distribution

ය, ප්‍රතිෂ්ඨානය ය, හිංසනය ය, නාශනය ය යන හි ධාත්වර්ථ පසෙන් මෙහි හි ධාතුව ප්‍රතිෂ්ඨානාර්ථයෙහි වේ.

'වචනාවයවෙ මූලෙ කථිතො හෙතු කාරණෙ'

යනුවෙන් දක්වෙන වචනාවයව ය, මූල ය, කාරණය යන හේතු ශබ්දාර්ථත්‍රයෙන් මෙහි හේතුශබ්දය මූලාර්ථයෙහි වේ. **පටිච්ච එතස්මා එතී ති පච්චයො,** එයින් ඵලය ඒ නුයි පච්චය නම්. අපාදාන සාධන විග්‍රහයි. පති යන උපසර්ගය පූර්ව කොට ඇති ඉ ධාතුව කෙරෙන් ණ ප්‍රත්‍යය වී ඉ කාරයට වෘද්ධි වී ආදේශ වී ති කාරයට ච කාරාදේශ හා ද්විත්ව ද වීමෙන් පච්චය යනු සිඩයි. යම්කිසි ඵලයක් ඇතිවීමට උපකාර වන්නා වූ ඵලය විසින් නො හරනා ලද්ද වූ දෙය පච්චය නම් වේ.

'ණාදො සඩා චීවරාදී හෙත්වාධාරෙසු පච්චයො.'

යනුවෙන් දක්වෙන ණාදිප්‍රත්‍යය ය, විශ්වාසය ය, චීවරාදිය ය, හේතුව ය, ආධාරය ය යන ප්‍රත්‍ය ය ශබ්දාර්ථ පස අතුරෙන් මෙහි ප්‍රත්‍යය ශබ්දය හේත්වර්ථයෙහි හෙවත් කාරණාර්ථයෙහි වේ. **හෙතු ච සො පච්චයො චා ති හෙතුපච්චයො.** විශෙෂණොභයපද කර්මධාරය සමාස යි. මූලය ද වූ උපකාරක ද වූ ධර්මය හේතුපච්චය නම් වේ. හෙතු ය පච්චය ය යන දෙපදය ආධ්‍යහාර කරගතයුතු ධම්ම යන්නට විශේෂණ ය. **හෙතු හුත්වා පච්චයො හෙතුපච්චයො.** සම්භාවනා කර්මධාරය සමාසය යි. මූලය වී උපකාරක ධර්මය හේතුපච්චය නම් වේ. මූලභාවයෙන් උපකාරක ධර්මය හේතුපච්චය නම් වේය යනු අදහසයි.

## (2) ආරම්මණ ප්‍රත්‍යය.

සිත නම් අරමුණු දැනීම ය. දැනීමය යනු ද එක්තරා ගැනීමෙකි. දැකීම ය ඇසීම ය යන මේවා ද දැනීම්ම ය. දැනීම යම්කිසි අන් දෙයක් පිළිබඳ වූවකි. දත යුතු වූ අන් දෙයක් නැති කල්හි නොලත් කල්හි දැනීමක් නො විය හැකිය. දැනීමක් ඇති විය හැකිවීමට දත යුතු දෙයක් ලැබිය යුතුම ය. ආරම්මණය යි කියනුයේ සිතින් ගන්නා වූ දේවලට ය. අරමුණක් නො ලැබ සිතකට නුපදිය හැකි බැවින් අරමුණ සිත් ඇතිවීමට මහත් උපකාරයෙකි. චෛතසිකයෝ ද සිත හා බැඳී සිතට අනුව අරමුණු ගනිමින් ම ඒ ඒ කෘත්‍යය සිදු කරන්නෝ ය. ඒවාට ද අරමුණ නො ලැබ නුපදිය හැකිය. චිත්ත චෛතසිකයන් ගේ ඉපදීමට උපකාරවන බැවින් ආරම්මණයන්ට **ආරම්මණප්‍රත්‍යය** යි කියනු ලැබේ. ආරම්මණය චිත්ත

Non-commercial distribution

චෛතසිකයන්ට උපකාර වන්නකැ යි කියන ලද නුමුත් චිත්ත චෛතසිකයන් ඉපද වීමේ උත්සාහයක් එහි නැත්තේ ය. නෙළුම් පතට වැටෙන දිය බිඳුව එහි නො තැවරී ලිස්සා වැටෙයි. එයට හේතුව වතුරට ඇලීමට ඉඩ දෙන ස්වභාවයක් එහි නැති බව ය. වස්ත්‍රයකට වැටෙන දිය බිඳුව එහි ඇලෙ යි. එයට හේතුව වස්ත්‍රයෙහි ඇති ජලයට තැවරීමට ප්‍රවේශ වීමට ඉඩ දෙන සවභාවය යි. වස්ත්‍රයෙහි ඇති ජලයට ඉඩ දෙන ස්වභාවය සේ රූපාදීන්හි ද සිතට ගැනීමට ඉඩ දෙන සිතට ගැනීමට යෝග්‍යවන ස්වභාවයක් ඇත්තේ ය. ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය ය යි කියනුයේ එයට ය. ස්වභාව ධර්ම වශයෙන් හා අස්වාභාව ධර්ම වශයෙන් ද ලොව ඇති සියල්ලෙහි ම ඒ ශක්තිය ඇත්තේ ය. එ බැවින් චිත්ත චෛතසිකයන් ගේ අරමුණු බවට නො පැමිණෙන කිසිවක් ලොව නැත්තේ ය. සියල්ලම ආරම්මණ ප්‍රත්‍යයෝ ය. අරමුණු නිසා අරමුණක් ගනිමින් උපදනා සිත ආරම්මණ ප්‍රත්‍යයෝත්පන්නයක් වතුදු එය අන් සිතකට අරමුණු වීම් වශයෙන් ආරම්මණ ප්‍රත්‍යය ද වේ. ආරම්මණ ප්‍රත්‍යය ධර්මයන් අතුරෙන් චිත්ත චෛතසිකයෝ ආරම්මණප්‍රත්‍යය ද වෙති. ප්‍රත්‍යයෝත්පන්නයෝ ද වෙති. රූප නිර්වාණ ප්‍රඥප්තී හු ආරම්මණ ප්‍රත්‍යය පමණක් වෙති. ආරම්මණ ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. ආරම්මණ ප්‍රත්‍යය වන ධර්මයන්හි ඇති ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය ද සියල්ලෙහි සමාන නො වේ. ඇතැම් ධර්මයක ආරම්මණ ප්‍රත්‍යය ශකතිය අධිකව ඇත්තේ ය. ඇතැම් ධර්මයන් හි එය මඳ ය. ආරම්මණ ශක්තිය අධික ධර්මයන් නිසා බොහෝ චිත්තචෛතසිකයෝ උපදිති. එය මඳ වූ ධර්මයන් නිසා මඳක් චිත්තචෛතසිකයෝ උපදිති. ලෝකයෙහි සිත් ඇදගන්නා දේවල් හැටියට සලකන වස්තූහු ආරම්මණ ශක්තිය අධික වස්තූහු ය. ආරම්මණාධිපති ප්‍රත්‍යය වන ධර්මයෝ ද ආරම්මණ ශක්තිය අධික ධර්මයෝ ය. ආරම්මණාධිපති ප්‍රත්‍යය භාවයට නො පැමිණෙන ධර්මයෝ ආරම්මණ ශක්ති හීනයෝ ය.

ත්‍රිරාශියෙහි ආරම්මණ ප්‍රත්‍යය වශයෙන් කියන ලද ධර්ම සියල්ල ම ආරම්මණ ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් කියන ලද චිත්ත චෛතසික සියල්ලට ම සමාන ව ප්‍රත්‍යය නො වන්නේ ය. එ බැවින් එහි විභාගය ද දත යුතු ය. ඒ මෙසේ ය.

චක්ෂුර්ද්වාරික සිත් ස සාළිසට ප්‍රත්‍යුත්පන්න රූපය හෙවත් වර්ණායතනය ආරම්මණ ප්‍රත්‍යය වේ. ශ්‍රෝත්‍රද්වාරික චිත්තයන්ට වර්තමාන ශබ්දය ආරම්මණ ප්‍රත්‍යය වේ. ඝ්‍රාණද්වාරික චිත්තයන්ට වර්තමාන ගන්ධය ආමරම්මණප්‍රත්‍යය වේ. ජිහ්වාද්වාරික චිත්තයන්ට වර්තමාන රසය ආරම්මණ ප්‍රත්‍යය වේ. කායද්වාරික චිත්තයන්ට

Non-commercial distribution

ස්ප්‍රෂ්ටව්‍යය යි කියනු ලබන වර්තමාන පඨවි තේජෝ වායෝ යන භූත රූප තුන ආරම්මණ ප්‍රත්‍යය වේ. මනෝද්වාරික චිත්තයන්ට වර්තමාන වූ ද අතීත වූ ද අනාගත වූ ද කාලත්‍රයට අයත් නො වන්නා වූ ද පරමාර්ථ වූ ද අපරමාර්ථ වූ ද සකල ධර්මයෝ ම ආරම්මණ ප්‍රත්‍යය වෙති. ද්වාරවිමුක්ත චිත්තයෝ ය යි කියනු ලබන ප්‍රතිසන්ධි භවාඞ්ග ච්‍යුති කෘත්‍යයන් ඇත්තා වූ සිත් එකුන් විස්සට අතීත භවයෙහි මරණාසන්න කාලයේ දී වැටහුණු කර්මය කර්ම නිමිත්තය ගති නිමිත්තය යන තුන ආරම්මණ ප්‍රත්‍යය වේ. එක් පුද්ගලයෙකු ගේ ප්‍රතිසන්ධ්‍යාදි සිත් වලට කර්මාදි තුනෙන් එකක් පමණක් ආරම්මණ ප්‍රත්‍යය වන බව සැලකිය යුතු ය.

දෙළොස් අකුසල් සිත් වලට නව ලෝකෝත්තර ධර්මය හැර ඉතිරි සියල්ල ආරම්මණ ප්‍රත්‍යය වේ. අහේතුක සිත් වලින් චක්ෂුර්විඥානද්වයට වර්තමාන වර්ණය ද, ශ්‍රෝත්‍ර විඥානද්වයට වර්තමාන ශබ්දය ද, ඝ්‍රාණවිඥානද්වයට වර්තමාන ගන්ධය ද, ජිහ්වාවිඥානද්වයට වර්තමාන රසය ද, කායවිඥානද්වයට වර්තමාන ස්ප්‍රෂ්ටව්‍යය ද ආරම්මණ ප්‍රත්‍යය වේ. සම්ප්‍රත්‍යෂණද්වයට හා පඤ්චද්වාරාවර්ජනයට වර්තමාන රූපාදි පඤ්චාරම්මණය ම ආරම්මණ ප්‍රත්‍යය වේ. සන්තීරණ තුනට හා හසිතෝත්පාද චිත්තයට කාමාවචර ධර්ම සියල්ලම ආරම්මණ ප්‍රත්‍යය වේ. මනොද්වාරාවර්ජන චිත්තයට සියල්ල ම ආරම්මණ ප්‍රත්‍යය වේ. මහා කුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට අර්හත්මාර්ග අර්හත්ඵලයෙන් අන්‍ය වූ සියල්ල ම ආරම්මණ ප්‍රත්‍යය වේ. ඥාන විප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් සතරට ලෞකික ධර්ම සියල්ල ආරම්මණ ප්‍රත්‍යය වේ. මහා විපාක සිත් අටට කාමාවචර ධර්ම ආරම්මණ ප්‍රත්‍යය වේ. ඥාන සම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතරට ලෞකික වූ ද ලෝකෝත්තර වූ ද සියල්ල ම ආරම්මණ ප්‍රත්‍යය වේ. ඥාන විප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතරට ලෞකික ධර්ම සියල්ල ආරම්මණ ප්‍රත්‍යය වේ.

රූපාවචර ප්‍රථමධ්‍යාන සිත් තුනට දස කසිණ ය, දශාශුභ ය, කේශාදි කොට්ඨාස ය, ආශ්වාස ප්‍රශ්වාස ය, මෛත්‍රී කරුණා මුදිතාවන්ට අරමුණු වන සත්ත්වප්‍රඥප්තිය ය යන ප්‍රඥප්ති පස්විස්ස ආරම්මණ ප්‍රත්‍යය වේ. රූපාවචර ද්විතීය තෘතීය චතුර්ථ ධ්‍යාන සිත් නවයට දස කසිනයය, ආශ්වාස ප්‍රශ්වාසයය, මෛත්‍රීකරුණාමුදිතාවන්ට අරමුණු වන සත්ත්ව ප්‍රඥප්තිය ය යන ප්‍රඥප්ති තුදුස ආරම්මණ ප්‍රත්‍යය වේ. රූපාවර පඤ්චමධ්‍යාන සිත් තුනට දසකසිණය ය, ආශ්වාස ප්‍රශ්වාසය ය, උපේක්ෂා බ්‍රහ්මවිහාරයට අරමුණු වන සත්ත්ව ප්‍රඥප්ති ය ය යන ප්‍රඥප්ති දෙළස ආරම්මණ ප්‍රත්‍යය වේ. රූපාවචර පඤ්චමධ්‍යාන

Non-commercial distribution

කුශලාභිඥ චිත්තයට අභීත්මාර්ගීය හා අභීත්ඵලය හැර සකල ධර්මයෝ ම ආරම්මණ ප්‍රත්‍යය වෙති. රූපාවචර පඤ්චම ධ්‍යාන ක්‍රියාභිඥ චිත්තයට සකල ධර්මයෝ ම ආරම්මණ ප්‍රත්‍යය වෙති.

අරූපාවචර සිත් අතුරෙන් ආකාසානඤ්චායතන සිත් තුනට ආකාස කසිණයෙන් අන්‍ය වූ කසිණ නවය උද්ඝාටනය කොට ලබන ආකාශ ප්‍රඥප්තිය ආරම්මණ ප්‍රත්‍යය වේ. විඤ්ඤානඤ්චායතන කුශල චිත්තයට ඒ සන්තානයෙහි වර්තමාන භවයේ හෝ අතීත භවයෙහි ඇති වූ ආකාසානඤ්චායතන කුසල චිත්තය ආරම්මණ ප්‍රත්‍යය වේ. විඤ්ඤාණඤ්චායතන විපාක චිත්තයට අතිත භවයෙහි ඒ සන්තානයෙහි ඇති වූ ආකාසානඤ්චායතන කුසලය ආරම්මණ ප්‍රත්‍යය වේ. විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තයට වර්තමාන භවයෙහි ඇති වූ ආකාසානඤ්චායතන කුසලය හා වර්තමාන භවයෙහි ඇති වූ ආකාසානඤ්චායතන ක්‍රියා චිත්තය ද ආරම්මණ ප්‍රත්‍යය වේ. ආකිඤ්චඤ්ඤායතන සිත් තුනට ආකාසනඤ්චායතන කුසල ක්‍රියා චිත්තයන් ගේ නාස්තිභාව ප්‍රඥප්තිය ආරම්මණ ප්‍රත්‍යය වේ. නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාක චිත්තයට අතිත භවයෙහි ඇති වූ ආකිඤ්චඤ්ඤායතන කුසලය ආරම්මණ ප්‍රත්‍යය වේ. නෙවසඤ්ඤ-නාසඤ්ඤායතන ක්‍රියා චිත්තයට ආකිඤ්චඤ්ඤායතන කුසල ක්‍රියා දෙක ආරම්මණ ප්‍රත්‍යය වේ. ලෝකෝත්තර සිත් අටට නිර්වාණය ආරම්මණ ප්‍රත්‍යය වේ.

"චිත්තචෙතසිකා ආගන්ත්වා රමන්ති එත්ථා ති ආරම්මණං" යනු ආරම්මණ ශබ්දය ආචාර්‍ය්‍යවරයන් විසින් විග්‍රහ කරන ආකාරය යි. ආ පූර්ව රමු ධාතුව කෙරෙන් අධිකරණාර්ථයෙහි යු ප්‍රත්‍යය වී එයට අනාදේශ වී මකාරය ද්විත්ව ව නකාරයට ණකාරවී ආරම්මණ කියා සිද්ධයි. මේ වෛයාකාරණිකයන් එහි සිද්ධිය දක්වන අයුරු ය. චිත්ත චෛතසිකයෝ අවුත් යමක ඇලේ ද එය ආරම්මණ නම් වේය යනු විග්‍රහ වාක්‍යයේ තේරුම ය. චිත්තචෛතසිකයෝ උපදින්නට කලින් ඇත්තාහු නො වෙති. උපන් චිත්තචෛතසිකයන් ගේ ද ගමනක් නැත. චිත්තචෛතසිකයන් උපදින්නේ ආරම්මණය ගනිමින් ම ය. එ බැවින් චිත්තචෛතසිකයෝ අවුත් ඇලෙති යි කීම පර්‍ය්‍යාය කථාවෙකි. චිත්තචෛතසිකයන් ඇලෙතැ යි කියන ලදුයේ ලෝභයේ ඇලීම බඳු ඇලීමකට නො ව ආරම්මණ ග්‍රහණ මාත්‍රයට ය. අරමුණ නො ගෙන අරමුණෙහි නො ගැටී චිත්තචෛතසිකයෝ කිසිකලෙක නූපදිති. ඔවුන් ගේ ඒ අරමුණ නො හරනා බව එහි ඇලීමක් කොට ගෙන අරමුණ චිත්තචෛතසිකයන් ඇලෙනා තැනක් සැටියට කියනු ලැබේ. ධාතු

Non-commercial distribution

පොත්වල "රමු කීළායං" යි රමු ධාතුවේ අර්ථය දක්වා තිබේ. ඒවායේ අදහස් කරන ක්‍රීඩනය ඇල්ම මිස අනෙකක් නො වන බව දත යුතු. ආරම්මණ පච්චයො යනු "ආරම්මණං ච තං පච්චයො චා ති ආරම්මණ පච්චයො" කියා ද "ආරම්මණං හුත්වා පච්චයො ආරම්මණ පච්චයො" කියා ද පෙර කී පරිදි විග්‍රහ කරනු.

## (3) අධිපති ප්‍රත්‍යය.

අන්‍යයන්ට ඔවුන් ගේ කැමැත්තේ සැටියට හැසිරෙන්නට නො දී ඔවුන් තමන් ගේ කැමැත්තේ සැටියට හසුරුවන රාජාදීහු අධිපතීහු නම් වෙති. රාජාදීන්ට ඇති අනුන් තමන් ගේ කැමැත්තේ සැටියට හැසිරවීමේ බලය අධිපති ශක්තිය ය, අධිපති බව ය. අනුන් ස්වවශයෙහි පවත්වන රාජාදීන්ට මෙන් අන්‍ය නාමරූප ධර්මයන් ස්වවශයෙහි පැවැත්වීමේ ශක්තිය පැවැත්වීමේ බලය ඇති නාමරූප ධර්මයෝ ද ඇත හ. ඔවුන් ගේ ඒ අධිපති ශක්තිය නිසා ඔවුනට අනුකූල වීම් වශයෙන් උපදනා ධර්මයෝ ද වෙති. ඒ ධර්මයන් ගේ ඉපදීමට අධිපති ශක්තිය ඇති ධර්මය හේතු වන බැවින් අධිපති ශක්තිය ඇත්තා වූ ධර්මයට අධිපති ප්‍රත්‍යය යි කියනු ලැබේ.

ඒ අධිපති ප්‍රත්‍යය ද ආරම්මණාධිපති ප්‍රත්‍යයය, සහජාතාධිපති ප්‍රත්‍යය ය යි දෙවැදෑරුම් වේ. මඟ යන්නකු විසින් යම්කිසි තැනක දී වටිනා මාණික්‍ය රත්නයක් දුටු හොත් එය ඔහුට මඟ දෙපස වැටී තිබෙනු දුටු වියලි පත් සේ අමතක නො වෙයි. එය ඔහුට නැවත නැවත සිහි වෙයි. නැවත නැවත සිහිවීමය යි කියනුයේ ඒ පුද්ගලයා ගේ සන්තානයෙහි දුටු මාණික්‍ය රත්නය ගැන නැවත නැවත සිත් පහළ වීම ය. මඟ දෙපස දුටු බොහෝ වියලි කොළ ගැන නැවත නැවත සිත් පහළ නොවන්නේ ඒවා දුටු මාත්‍රයෙන් ම අමතක වී යන්නේ නැවත නැවත තමන් සිහි කරවන ශක්තියක් ඒවායේ නැති බැවිනි. මාණික්‍යරත්නය දුටුවහුට අමතක නො වන්නේ නැවත නැවත සිහි වන්නේ එහි දුටු තැනැත්තාට අමතක නො කරවන දුටු තැනැත්තා ලවා නැවත නැවත සිහි කරවන ශක්ති විශේෂයක් ඇති බැවිනි. ඒ ශක්තිවිශේෂය නම් එහි ඇති ගරු කළ යුතු බව ය. ඒ ගරු කළ යුතු බව අනුන්ගේ සිත් තමා කරා යොමු කරවන්නා වූ ඇදගන්නා වූ ස්වභාවයෙකි. මාණික්‍ය රත්නයෙහි සේ සිත් ඇදගන්නා බලය ඇති බොහෝ නාම රූප ධර්මයෝ වෙති. ඒ ධර්මයන් ගේ ඒ සිත් ඇදගන්නා

Non-commercial distribution

බලයට අනුකූලවීම් වශයෙන් ඒ ධර්මයන් අරමුණු කොට බොහෝ චිත්ත චෛතසිකයෝ උපදිති. ඒ ධර්මයන් ගේ ඒ චිතත චෛතසිකයන් අනුකූල කරවන්නා වූ ස්වභාවය චිත්ත චෛතසිකයන් විෂයෙහි ඇති අධිපති බවෙකි. එ බැවින් අන්‍ය චිත්ත චෛතසිකයන් තමාට අනුකූල කරවන ස්වභාවය ඇති ගරු කළ යුතු වූ ධර්මයනට ආරම්මණා-ධිපති ප්‍රත්‍යය යි කියනු ලැබේ.

ත්‍රිරාශියෙහි ආරම්මණාධිපති ප්‍රත්‍යය වශයෙන් දක්වෙන ධර්මයන් අරමුණු කරන සිත් ආරම්මණාධිපති ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් දක්වා තිබෙන සිත් හැර තවත් බොහෝ ඇත්තේ ය. ඒ සිත් ආරම්මණාධිපති ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් නො ගෙන හැර තිබෙන්නේ යම්කිසි ධර්මයක් ගරු කොට අරමුණු කිරීමට ඒ සිත් අපොහොසත් බැවිනි. ආරම්මණාධිපති ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් දක්වෙන සිත්වලින් ද සැම කල්හි ම ආරම්මණාධිපති ප්‍රත්‍යයෝත්පන්න වන්නේ ලෝකෝත්තර සිත් අට පමණෙකි. ඒ සිත් සැම කල්හි ම නිවන ගරු කොට අරමුණු කරන බැවිනි. ඉතිරි සිත් ගරු කළ යුතු ධර්මයන් ගරු කර අරමුණු කරන අවස්ථාවෙහි ආරම්මණාධිපති ප්‍රත්‍යයෝතපන්න වේ. ගරු කොට අරමුණු නො කරන අවස්ථාවෙහි ආරම්මණාධිපති ප්‍රත්‍යයෝත්පන්න නො වේ. රහත්හු ලෝකෝත්තර ධර්ම මිස ලෞකික ධර්මයන් ගරු කොට අරමුණු නො කරති. ඥාන විප්‍රයුක්ත චිත්තයෝ ලෝකෝතතර ධර්ම අරමුණු කිරීමෙහි සමත් නො වෙති. එ බැවින් මහා ක්‍රියා ඥාන විප්‍රයුක්ත චිත්තයෝ ආරම්මණාධිපති ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති.

ත්‍රිරාශියෙහි ආරම්මණාධිපති ප්‍රත්‍යය වශයෙන් දක්වන ලද ධර්මයන් ප්‍රත්‍යයෝත්පන්නයන්ට ප්‍රත්‍යය වීම පිළිබඳ වූ විභාගය **පච්චයත්‍ථ පකාසිනියෙහි** මෙසේ දක්වා තිබේ.

"සෙජං තිපාකං තික්‍රියං චතුරූපක්ඛ සෙජිනො
තිපුඤ්ඤං කාමපුඤ්ඤස්ස සෙජස්සාධිපතී භවෙ.
උත්තරං ධීයුත්තඩ්ඪන්තං තිබ්බානං උත්තරස්ස ච"

මේ ගාථාවෙහි **'සෙජං'** යනුවෙන් දක්වෙන්නේ ලෝභ මූල චිත්තය ය. **එජා** යනු ලෝභයට නමෙකි. එජා නම් වූ ලෝභය හා යුක්ත වන්නේ **සේජ** නම් වේ. ගාථාවෙහි අදහස මෙසේ ය.:–

ලෞකික කුසල් සිත් සතළොස ය, දුඃඛ සහගත කායවිඥානයෙන් අන්‍ය වූ ලෞකික විපාක සිත් එක් තිස ය. ලෝභ මූල සිත් අට ය, ඉෂ්ටනිෂ්පන්න රූප අටළොස ය යන මොව්හු ලෝභ මූල සිත් අටට

Non-commercial distribution

ආරම්මණාධිපති ප්‍රත්‍යය වෙති. ලෞකික කුශල චිත්තයෝ මහා කුශල ඥාන විප්‍රයුක්ත සිත් සතරට ආරම්මණාධිපති ප්‍රත්‍යය වෙති.

ලෞකික කුශල චිත්තයෝ ය, හෙට්ඨිම ලෝකෝත්තර චිත්තයෝ සදෙන ය. නිර්වාණය යන මොව්හූ මහා කුශල ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරට ආරම්මණාධිපති ප්‍රත්‍යය වෙති. අර්හත්මාර්ගය හා අර්හත්ඵලය ද නිර්වාණ ද යන මොව්හූ මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරට ආරම්මණාධිපති ප්‍රත්‍යය වෙති.

කාමාවචර කුශල චිත්තය හා මහා ක්‍රියා චිත්තය ද ලෝකෝත්තර චිත්තය ද ඒ ඒ දෙය ගරුකොට අරමුණු කරනුයේ ඒ ඒ ධර්මයන්හි ඇති උසස් බව නිසා ය. ලෝභමූල චිත්තය ඒ ඒ දෙය ගරු කොට අරමුණු කරනුයේ ආස්වාදනීය භාවය නිසා ය. එ බැවින් සුනඛාදීන් කෙරෙහි ඇති වන ලෝභමූල චිත්තය අසූචිය ද ගරු කොට අරමුණු කරන්නේ ය. අසූචියෙහි සුනඛාදීන්ට ආස්වාදනීය භාවයක් ඇති බව එහි ඇති ගරු කළ යුතු බව ය.

ගරු කොට අරමුණු කරන කුශලාදි ධර්මයනට ඒ ඒ ධර්ම අධිපති ප්‍රත්‍යය වන සැටි මෙසේ ය.:– දන් දීම් සිල් රැකීම් පෙහෙවස් විසීම් ආදි පින් කම් කොට ඒවා උසස්කොට සිතීමෙහි ද අනුන් කළ පින් කම් උසස් කොට සිතීමෙහි ද කාමාවචර කුශලය කාමාවචර කුශලයට ආරම්මණාධිපති ප්‍රත්‍යය වේ. ධ්‍යානලාභීන් ධ්‍යානයෙන් නැඟී එය උසස් කොට සිතීමෙහි දී ශෛක්ෂයන් තම තමන් ගේ මාර්ගයන් උසස් කොට සිතීමෙහි ද රූපාවචර අරූපාවචර ලෝකෝත්තර කුශලයෝ කාමාවචර කුශලයට ආරම්මණාධිපති ප්‍රත්‍යය වෙති. කුශලය කොට එය ගරු කොට ලෝභ සහගත චිත්තයෙන් ආස්වාදනය කරන කල්හි ද එයට සතුටු වන කල්හි ද මම කුශලය කෙළෙමි යනාදීන් දෘෂ්ටිය උපදනා කල්හි ද කුශලය ලෝභමූල චිත්තයට ආරම්මණාධිපති ප්‍රත්‍යය වේ. රාගය උසස් කොට ආස්වාදනය කිරීම ය, එයට සතුටු වීම ය, දෘෂ්ටිය උසස් කොට ගෙන එයට සතුටු වීම ය යනාදීන්හි ලෝභමූල චිත්තයම ලෝභමූල චිත්තයට ආරම්මණාධිපති ප්‍රත්‍යය වේ. විස්තර පඤ්හාවාරයෙන් දත යුතු ය.

**ඡන්දය චිත්තය විරියය වීමංසය** යි අධිපති ධර්ම සතරෙකි. ඒවායේ අධිපති බව ඇත්තේ ඒවා හා එක් ව උපදනා ධර්මයන්ට ය. එ බැවින් ඒවාට සහජාතාධිපති ප්‍රත්‍යය යි කියනු ලැබේ. ඡන්දදීන් සහජාත ධර්මයනට අධිපති වන්නේ ද ඒවා බලවත් වූ කල්හි ය. දුබල ඡන්දදීහු තමන් හා උපදනා ධර්මයනට අධිපති නො වෙති. එ බැවින් ඡන්දදීහු සැම කල්හි ම අධිපති ප්‍රත්‍යය නො වෙති. දීම ගැන බලවත් ඡන්දය

Non-commercial distribution

ඇති තැනැත්තා ඒ ඡන්දය නිසා දීම සිදුකරන්නේ ය. ඡන්දය චෛතසිකයෙකි. එයට දීමට තබා චිත්තයෙන් වෙන්ව ඉපදීමේ ශක්තිය පවා නැත. දීමක් සිදුවීමට චිත්ත චේතනාදි ධර්‍ම රාශියක් එක වර ඉපදිය යුතු ය. දානච්ඡන්දය ඇති තැනැත්තා කෙරෙහි ඒ ඡන්දය දීම සඳහා උපදනා කල්හි දාන ක්‍රියාව සිදු කිරීමට ඉපදිය යුතු වූ චිත්ත චේතනාදි ධර්‍මයෝ එයට අනුකූල ව එය හා එක වරම උපදිති. එයින් දානක්‍රියාව සිදු වේ. දානච්ඡන්දය නූපදිත හොත් එය හා සමග උපදනා චිත්ත චේතනාදිහු නූපදනාහ. ඒවා දානච්ඡන්දය හා උපදිනුයේ චිත්ත චේතනාදි ධර්‍මයන් තමාට අනුකූල කොට ඉපදවීමේ බල විශේෂයක් එහි ඇති බැවිනි. ඒ බල විශේෂයට අධිපති ප්‍රත්‍යය ශක්තිය යි කියනු ලැබේ. චිත්තාදීන් ගේ අධිපති ප්‍රත්‍යය භාවය ද ඡන්දයට අනුව සිතා තේරුම් ගත යුතු ය. සමහර චිත්ත වාරවල දී ඡන්ද දී ධර්‍ම සතර ම එක වර උපදනේ ය. එහෙත් ඒ සතරට ම එක වර එක් ක්‍රියාවක් පිළිබඳ ව සහජාත ධර්‍මයන්ට අධිපති නො විය හැකි බැවින් එක් වරක දී එයින් එකක් පමණක් අධිපති ප්‍රත්‍යය වන්නේ ය. සේසෝ තමතමන් අධිපති නො වන අවසථාවේ දී අධිපති වන ධර්‍මයට අනුකූල වීම් වශයෙන් අධිපති ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙති. ත්‍රිරාශියෙහි ඡන්දාදි ධර්‍ම සතර ම අධිපති ප්‍රත්‍යය අධිපති ප්‍රත්‍යයෝත්පන්න දෙපක්‍ෂයට ගෙන තිබෙන්නේ එ හෙයිනි.

**අධීනානං පති අධිපති,** තමා පිළිබඳ ව පවත්නා ධර්‍මයන්ගේ ස්‍වාමි තෙමේ අධිපති නම්. අධීන පති යි කිවමනා තන්හි ඊකාරය හ්‍රස්‍ව ව නකාරය ලොප් ව අධිපති කියා වේ:– **අධිකො පති අධිපති** කියා ද විග්‍රහ කෙරෙති. අධික වූ ස්‍වාමි තෙමේ අධිපති නම් වේය යනු එහි තේරුම ය. ඊශ්වරත්වය ශ්‍රද්ධාදි ධර්‍මයන්හි ද ඇත්තේ ය. ඡන්දාදි ධර්‍මයන්හි ද ඇත්තේ ය. ශ්‍රද්ධාදීහු තමා විසින් සිදු කරන කෘත්‍ය විෂයෙහි අන්‍යධර්‍මයනට ඊශ්වර වෙති. එ සේ ඊශ්‍වර වෙමින් ම ඔව්හු අන්‍ය ධර්‍මයන් ගේ කෘත්‍ය විෂයෙහි ඒ ධර්‍මයනට අනුකූල වෙති. ඡන්දාදි ධර්‍මයෝ ඊශ්වරත්වය ඇත්තා වූ ශ්‍රද්ධාදීන් ඇතුළු සකල සහජාත ධර්‍ම සමූහයට ම ඊශ්වර වෙති. එ බැවින් ඔව්හු ඉන්ද්‍රිය නාමයෙන් දක්වෙන ඊශ්වරත්වය ඇති ධර්‍මයන් ගේ ඊශ්‍වරත්වයට වඩා අධික වූ ඊශ්‍වරත්වයක් හෙවත් ස්‍වාමිත්වයක් ඇත්තෝ ය. අධිපති පච්චය යනු පෙර සේම **අධිපති ච සො පච්චයො චා ති අධිපති පච්චයො** කියා ද **අධිපති භූත්වා පච්චයො අධිපති පච්චයො** කියා ද විග්‍රහ කළ යුතු ය.

## (4) (5) අනන්තර ප්‍රත්‍යය හා සමනන්තර ප්‍රත්‍යය.

අනන්තර සමනන්තර ප්‍රත්‍යය දෙක ආචාර්‍ය්‍ය මත භේද ඇති ප්‍රත්‍ය දෙකකි. අනන්තර ප්‍රත්‍යය වන්නේ ද සමනන්තර ප්‍රත්‍යය වන්නේ ද පූර්‍ව

Non-commercial distribution

පූර්ව චිත්තය ම ය. එය ගැන මතභේදයක් නැත්තේ ය. මතභේද ඇත්තේ ප්‍රත්‍යය වන ආකාරය පිළිබඳව ය. උපන් සිත සැනෙකින් බිඳෙන්නේ ය. කොතෙක් සිත් බිඳී ගියත් බිඳී යන පූර්ව පූර්ව චිත්තයන් හා සම්බන්ධ ව ඒ පරම්පරාවට අයත් ව නැවත නැවත සිත් ඉපදීම සිදු වන නිසා සත්ත්වයා ගේ පැවැත්ම වේ. ආවර්ජනචක්ෂුර්විඥාන සම්ප්‍රතෝෂණ ව්‍යවස්ථාපන ජවන තදරම්මණාදි වශයෙන් සිත් උපදනා ක්‍රමයක් ඇත්තේ ය. ඒ ක්‍රමය අනුව නිරුද්ධ වී යන චිත්තයන්ට අනතුරුව නැවත නැවත නොනැවතී සිත් ඉපදීම වන්නේ පූර්ව පූර්ව චිත්තය නිසා ය. චක්ෂුර්ද්වාරවීථියෙහි ජවනය උපදිනුයේ එයට කලින් ව්‍යවස්ථාපන චිත්තය උපන් නිසා ය. නො එසේ නම් ජවනයක් නූපදනේ ය. ව්‍යවස්ථාපන චිත්තය උපදනේ එයට කලින් සන්තීරණ චිත්තය උපන් නිසා ය. සන්තීරණය නූපන්නේ නම් ව්‍යවස්ථාපනය නූපදනේ ය. සන්තීරණ චිත්තය උපදිනුයේ ද සම්ප්‍රතෝෂණ චිත්තය උපන් නිසා ය. සම්ප්‍රතෝෂණ චිත්තය උපදිනුයේ ද චක්ෂුර්විඥානය උපන් නිසා ය. චක්ෂුර් විඥානය උපදිනුයේ ද ආවර්ජන චිත්තය උපන් නිසා ය. ආවර්ජනය උපදිනුයේ ද භවාඞ්ග චිත්තය උපන් නිසා ය. මෙසේ සෑම සිතක් ම පූර්ව පූර්ව චිත්තය නිසා උපදිති. ඒවාට එසේ ක්‍රමානුකූල ව ඉපදීමට ඇත්තා වූ ප්‍රධාන හේතුව පූර්ව පූර්ව චිත්තය ය. චිත්ත පරම්පරාව නොසිඳෙන පරිදි නිරවුල් ලෙස ක්‍රමානුකූලව ම පශ්චිම පශ්චිම චිත්තයන් ගේ උත්පත්තියට උපකාර වන පූර්ව පූර්ව චිත්තය අනන්තර ප්‍රත්‍යය ය. යමක් අනන්තර ප්‍රත්‍යය ද එය ම සමනන්තර ප්‍රත්‍යය ය. වචනවල මිස අර්ථවශයෙන් ඒ දෙක්හි වෙනසක් නැත්තේ ය. කියන ලදු යේ අනන්තර සමනන්තර ප්‍රත්‍ය දෙක අටුවාවෙහි විස්තර කර තිබෙන ආකාරය ය.

"යම්කිසි අන්‍ය ධර්මයකට අතරට පැමිණෙන්නට අවකාශ නොතබා තමාට අනතුරුව ම උපදනා පරිදි දෙවන චිත්තයට උපකාරවන ධර්මය අනන්තර ප්‍රත්‍යය ය, කාලයෙන් අතරක් නො සිටින සැටියට ඉපදීමට දෙවන චිත්තයට උපකාර වන ධර්මය සමනන්තර ප්‍රත්‍ය ය" යනු **එක් ආචාර්ය්‍ය මතයෙකි.** එය රේවතාචාර්ය්‍යයන් ගේ මතය ය යි විශුද්ධිමාර්ග ටීකාවෙහි කියා තිබේ. ඒ වාදය නිරෝධ සමාපත්තියෙන් නැඟිටින්නා වූ තැනැත්තාට නිරෝධ සමාපත්තියෙන් නැගිටීමේදී ඇති වන ඵල චිත්තයට නිරෝධ සමාපත්තියෙන් පූර්වභාගයෙහි ඇති වූ නෛවසඤ්ඤා නාසඤ්ඤායතන චිත්තය අනන්තර වශයෙන් ද, සමනන්තර වශයෙන් ද ප්‍රත්‍ය වන බව පට්ඨාන පාළියෙහි වදරා තිබෙන බව දක්වා අටුවාවෙහි ප්‍රතික්ෂේප කර තිබේ.

"චිත්ත පරම්පරාව නො සිඳී යන පරිදි නිරුද්ධ වන චිත්තයට අනතුරු ව තවත් චිත්තයකට ඉපදීමට උපකාරවන සවභාවය අනන්තර

Non-commercial distribution

ප්‍රත්‍යයතාව ය. අන්‍ය චිත්තයන් උපදනා කල්හි ද ප්‍රතිසන්ධ්‍යාදි කෘත්‍යස්ථාන පටිපාටිය අවුල් නො වන සැටියට චිත්ත නියමය අනු ව තැනට සුදුසු සිතක් ඉපදීමට උපකාර වන බව සමනන්තර ප්‍රත්‍යතාවය ය" යනු තවත් ආචාර්‍ය්‍ය මතයකි. නිරෝධසමාපත්තියට පූර්‍වයෙහි ඇති වූ අවසාන සිත නිරෝධ සමාපත්තියෙන් නැගිටීමෙහි දී කල් ගත වී ඇති වන ඵල චිත්තයට පූර්‍ව චිත්තය අනන්තර සමනන්තර භාවයෙන් ප්‍රත්‍යය වීම දක්වා ඒ වාදය ප්‍රතික්ෂේප නො කළ හැකි ය. මේ මත සියල්ලේ ම සැටියට අනන්තර ප්‍රත්‍යය වන්නේ ද සමනන්තර ප්‍රත්‍යය වන්නේ ද පූර්‍ව පූර්‍ව වූ චිත්තය ය. එය ගැන මත භේදයක් නැත්තේ ය. ප්‍රත්‍යයෝත්පන්න වන්නේ ද පශ්චිම පශ්චිම චිත්තය ය. එය ගැන ද මත භේදයක් නැත්තේ ය. අර්හත්‍ත ච්‍යුතියෙන් අන්‍ය වූ සකල චිත්තයෝ ම අනන්තර චිත්තයා ගේ වශයෙන් අනන්තර සමනන්තර ප්‍රත්‍යයෝ ද වෙති. අර්හත්‍තච්‍යුතිය ද සහිත වූ සකල චිත්තයෝ ම පූර්‍ව චිත්තයන් ගේ වශයෙන් අනන්තර සමනන්තර ප්‍රත්‍යයෝත්පන්නයෝ ද වෙති. ප්‍රත්‍ය නො වන සිතක් ඇත්තේ අර්හත්‍ත ච්‍යුතිය පමණෙකි. ප්‍රත්‍යයෝත්පන්න භාවයට නොපැමිණෙන සිතක් නැත. පූර්‍ව පූර්‍ව චිත්තය පශ්චිම පශ්චිම චිත්තයට ප්‍රත්‍යය වන අයුරු චිත්තවීථීන් ගේ වශයෙන් කිය යුතු ය. දීර්‍ඝ වන බැවින් මෙහි විස්තර නො කරනු ලැබේ.

එකක් ඉපිද නිරුද්ධවීමෙන් පසු අනෙකක් ඉපදීම් වශයෙන් පවත්නා වූ සත්ත්වයාගේ චිත්තසන්තතිය එකම සිතක් සේ දනෙන්නේ ද දහස් ගණන් සිත්වලින් සිදු කරන කාර්‍ය්‍යයන් එක ම සිතකින් සිදු කරන්නාක් මෙන් කිසිදු අවුලක් නැතිව සිදුවන්නේ ද ඒ සිත් චිත්ත නියාමය අනුව සුදුසු පරිදි දම්වැලක මුදු සේ එකිනෙකට සම්බන්ධව උපදනා නිසා ය. මෙය තේරුම් ගත හැකි වීමට චිත්තවීථි පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු ය. චිත්තවීථි ගැන අවබෝධය නැතියවුන්ට මෙය නොවැටහේ. එසේ ඇති වන්නා වූ සිත් අතරට අන්‍ය ධර්‍මයක් පැමිණ ඒවායේ අන්‍යෝන්‍ය සම්බන්ධය නැති වූවහොත් අන්‍යෝන්‍ය සම්බන්ධයා ගේ වශයෙන් ඇත්තා වූ චිත්තයාගේ ඒකත්වය නැති වූවහොත් සිත කිසිදු බලයක් නැති කිසිම ක්‍රියාවක් සිදු කිරීමට සමත් නොවන කිසි ම ප්‍රයෝජනයක් නැති දෙයක් වන්නේ ය. අවුලක් නැතිව ඒ ඒ ක්‍රියා සිදු කළ හැකි ලෙස චිත්ත සන්තතිය ක්‍රමානුකූල ව ඇති වන්නේ අන් බලයකින් නොව පූර්‍ව පූර්‍ව චිත්තයා ගේ ම බලයෙනි. අර්හත්‍ත ච්‍යුතියෙන් අන්‍ය වූ නිරුද්ධ වන්නා වූ සෑම සිතක්ම තමන් ළඟට ඒ සන්තානයෙහි ඇති වීමට සුදුසු වූම සිත ඇතිවීමට උපකාර වේ. එයින් නිරුද්ධ වන සිතට අනතුරුව තැනට සුදුසු වූ සිත පූර්‍ව චිත්තය නිරුද්ධවනු සමගම පූර්‍ව චිත්තයාගේ ස්ථානය ගනිමින් පූර්‍ව

Non-commercial distribution

චිත්තය හා ඒකත්වයට පැමිණෙන්නාක් මෙන් උපදී. අනන්තර ප්‍රත්‍යය යි කියනුයේ ද සමනන්තර ප්‍රත්‍යය යි කියනුයේ ද පසු සිත ඇති වීමට උපකාර වන පසු සිත ඇති කරවන පූර්ව චිත්තයට ය.

සත්ත්වයා ජීවත් වන කාලයේ දී එක් සිතක් නිරුද්ධ වනු සමඟ ම එහි ස්ථානය ගනිමින් අන්තරයක් නැතිවන පරිදි නිරුද්ධ වූ චිත්තය හා ඒකත්වයට පැමිණෙන්නාක් මෙන් පසු පසු සිත් උපදනාක් මෙන්ම ච්‍යුතිචිත්තයට අනුව ප්‍රතිසන්ධි චිත්තය ද උපදනේ ය. **පරලොවට මෙලොවින් කිසිවක් නො යන්නේ වි නමුත් පරලොව ගිය තැනැත්තේ අනිකකු නො වන්නේ ද මෙලොව කළ කර්මවල හිමි බව පරලොව ගිය කල නො නැසෙන්නේ ද ඒ සම්බන්ධය නිසා ය.** නිරුද්ධ වූ අතීත චිත්තයට පසු ඉපදිය යුතු වූ සිත ඉපදීමට කල්ගත වන්නේ නිරෝධසමාපත්තියට සමවන් අවස්ථාවය, අසංඥ භවයෙහි උපන් අවස්ථාවය යන මේ දෙක්හි පමණෙකි. නිරෝධ සමාපත්තියට සමවදිනා තැනැත්තාගේ අන්තිම චිත්තය වූ නේවසඤ්ඤානාසඤ්ඤායතන චිත්තය නිරෝධ සමාපත්තියෙන් නැගිටිනා අවස්ථාවෙහි ඇති වන පළමුවන චිත්තයට ද දෙවන ජාතියෙහි අසංඥභවයෙහි උපදනා තැනැත්තා ගේ ච්‍යුති චිත්තය කල්ප පන්සියයකින් පසු අසංඥභවයෙන් ච්‍යුත ව අන් භවයක ඇති වන්නා වූ ප්‍රතිසන්ධි චිත්තයට ද අනන්තර වශයෙන් හා සමනන්තර වශයෙන් ද ප්‍රත්‍යය වේ. අභාව මාත්‍රයක් වූ කාලය ඒ සිත්වලට අන්තරයක් වශයෙන් සිටීමට සමත් නො වේ. අභාවය වූ කාලයට පූර්ව චිත්තයෙහි ඇති තමාට අනතුරුව යෝග්‍ය සිතක් ඉපදවීමේ ශක්තියට බාධා නො කළ හැකි ය. රූප සන්තානය අනෙකකි. අරූප සන්තානය අනෙකකි. එබැවින් නිරෝධයට සමවන් තැනැත්තාගේ රූප හා අසංඥ භවයෙහි උපනහුගේ රූපයෝ ද අන්‍ය සන්තානයක් වූ අරූප ධර්ම පරම්පරාවෙහි අන්තරයක් ඇති කිරීමට සමත් නො වෙති. එබැවින් කාලයෙන් හෝ රූපයන්ගෙන් අනන්තර සමනන්තර ප්‍රත්‍යය භාවයට බාධාවක් නො වන බව දත යුතු ය.

**අන්තරයතී ති අන්තරං**, මැද සිට යම්කිසි දෙයක් ඔවුනොවුන් ගෙන් වෙන් කරන දෙය අන්තර නම්. **අනෙන අරති පවත්තතී ති අන්තරං**, අන්‍ය යන පදය පූර්ව කොට ඇති අර ධාතුව කෙරෙන් කර්තෘර්ථයෙහි අප්‍රත්‍යය වී අන්තර යනු සිධයි. වස්තූන් ගේ කෙළවර පවත්නා දෙය අන්තර නම් වේ ය යනු එහි තේරුම ය. **නත්ථි අන්තරං එතස්සාති අනන්තරො**, ප්‍රත්‍යයෝත්පන්න ධර්මය තමා ගෙන් වෙන් කරන්නා වූ දෙයක් මෙයට නැත්තේ නුයි අනන්තර නම්. අනන්තර යනු පූර්ව චිත්තය ය. **අනන්තරො ච සො පච්චයො චාති අනන්තර පච්චයො, අන්තරං භූත්වා පච්චයො අනන්තර**

Non-commercial distribution

පච්චයො යි පෙර පරිද්දෙන් සමාස විග්‍රහ කරනු. ප්‍රත්‍යයෝත්පන්නධර්මය තමාගෙන් වෙන් කරන අන්තර් ධර්මයක් ඇති නොවන ලෙස උපකාරක ධර්මය අනන්තර ප්‍රත්‍යය ය යනු අදහසයි. **සුට්ඨු නත්ථි අන්තරං එතස්සාති සමනන්තරං**, රූප ධර්මයන්ට මෙන් අන්තරයක් දක්වීමට උපකාර වන සටහනක් මේ අරූප ධර්මයට නැති නිසා ද ප්‍රත්‍යය නිරුද්ධ වීමෙන් පසු ම ඵලය ඇතිවන නිසා ද හොඳට ම අන්තරයක් මෙයට නැත් නුයි සමනන්තර නම්. පච්චය ශබ්දය හා යෙදීම පෙර සේ ම ය.

## (6) සහජාත ප්‍රත්‍යය

චිත්ත චෛතසික රූප ධර්ම සියල්ලෝ ම සමූහ වශයෙන් උපදින්නෝ ය. තවත් ධර්මයන් හා එක් නො වී හුදකලා ව උපදනා ධර්මයක් නැත. එසේ ඉපදීමට ශක්තියක් ද කිසිම ධර්මයකට නැත. එකට බැඳී අන්‍යෝන්‍ය සම්බන්ධයෙන් උපදනා නාම ධර්ම සමූහයක හෝ රූප ධර්ම සමූහයක හෝ රූපාරූප සමූහයක හෝ එකඑක ධර්මයකම ඉපදීම ඒ සමූහයේ අන්‍ය ධර්මයන් ගේ ඉපදීමට උපකාරයක් වේ. එක් එක් සමූහයකට අයත් ධර්මයන් ගෙන් එක් ධර්මය කුදු නූපදනේ නම් අන්‍යධර්මයෝ ද නූපදනාහ. එසේ උපදනා ධර්ම සමූහයන්හි තමා ගේ ඉපදීම ම තමා හා උපදනා අන්‍යධර්මයන් ගේ ඉපදීමට උපකාර වන ධර්මය සහජාත ප්‍රත්‍යය ය. තවත් ක්‍රමයකින් කියත හොත් එක්ව ඉපදීම් වශයෙන් අන්‍ය ධර්මයන් ගේ ඉපදීමට උපකාරක ධර්මය සහජාත ප්‍රත්‍යය යි කිය යුතු ය. සෝමනස්ස සහගත දෘෂ්ටි සම්ප්‍රයුක්ත අසංස්කාරික සිත උපදනා කල්හි එය හා චෛතසික ධර්ම එකුන් විස්සක් උපදී. ධර්ම විස්සක් ඇති ඒ අරූප ධර්ම රාශියට අයත් ධර්මයන්ගෙන් කවර ධර්මයක් වුවද උපදිනුයේ ඉතිරි එකුන් විස්ස ද උපදනා නිසා ය. ඉතිරි එකුන් විස්ස උපදිනුයේ ද ඒ එක් ධර්මය උපදනා නිසා ය. මෙසේ ඒ ධර්ම රාශියට අයත් සියල්ල ම ඔවුනොවුන්ට සහජාත වශයෙන් ප්‍රත්‍යය වන සැටි දත යුතු ය.

ප්‍රත්‍යය වන ආකාරය පට්ඨාන පාලියෙහි දක්වෙන්නේ ස්කන්ධ ක්‍රමයෙනි. ඉහත කී ධර්ම රාශියෙහි වේදනා සංඥා සංස්කාර විඥාන වශයෙන් ස්කන්ධ සතරක් ඇත්තේ ය. ස්කන්ධ වශයෙන් සහජාත ප්‍රත්‍යය කියත හොත් එහි එක් ස්කන්ධයක් ඉතිරි තුනට ද, ඉතිරි තුන ඒ එක් ස්කන්ධයට ද, ස්කන්ධ දෙකක් ස්කන්ධ දෙකකට ද සහජාත වශයෙන් ප්‍රත්‍යය වේ ය යි කිය යුතු ය. ස්කන්ධ වශයෙන් දක්වීම පට්ඨාන පාලියේ ස්වභාවය ය. ඉහත කී අරූප ධර්ම රාශිය උපදනා කල්හි එය උපදිනුයේ පඤ්චවෝකාර භූමියෙහි නම් එය නිසා එය හා සමග ම චිත්තජ රූපයෝ ද උපදිති. ඒ ධර්ම රාශිය

Non-commercial distribution

නූපදිත හොත් ඒ චිත්තජ රූපයන් ද නූපදනා බැවින් අරූප ධර්මරාශිය තමා හා උපදනා චිත්තජ රූපයනට සහජාත වශයෙන් ප්‍රත්‍යය වන බව කියනු ලැබේ. එහෙත් චිත්තජ රූපයෝ ඒ අරූප ධර්ම රාශියට ප්‍රත්‍යය නො වෙති. ඒ අරූප ධර්ම රාශිය ඔවුනොවුන්ට ද චිත්තජ රූපයන්ට ද සහජාත ශක්තියෙන් ප්‍රත්‍යය වේ. අරූප ධර්ම රාශිය සහජාත ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න දෙකට ම අයත් වේ. චිත්තජ රූපයෝ ප්‍රත්‍යයෝත්පන්නයෝ පමණක් වෙති. එක් එක් රූප කලාපයක මහා භූතයෝ ඔවුනොවුන්ට හා උපාදාය රූපයන්ට සහජාත වශයෙන් ප්‍රත්‍යය වෙති. රූප කලාපයෙහි මහා භූතයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න දෙකට ම අයත් වෙති. උපාදාය රූපයෝ ප්‍රත්‍යයෝත්පන්නයෝ පමණක් වෙති. පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ඔවුනොවුන්ට හා හෘදය වස්තුවෙන් අන්‍ය වූ ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද සහජාත ප්‍රත්‍යය වෙති. එහි නාමස්කන්ධයෝ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න දෙපක්ෂයට ම අයත් වෙති. හෘදය වස්තුවෙන් අන්‍ය කර්මජ රූපයෝ ප්‍රත්‍යයෝත්පන්න පමණක් වෙති. ප්‍රතිසන්ධි කර්මජ රූපයන් ගෙන් හෘදය වස්තුව පමණක් නාමස්කන්ධයන්ට ද සහජාත භාවයෙන් ප්‍රත්‍යය වේ. නාමස්කන්ධයෝ ද එයට සහජාත භාවයෙන් ප්‍රත්‍යය වෙති. උපදනා ධර්ම අතර අන්‍ය ධර්මයන්ගේ සම්බන්ධයෙන් තොරව හුදකලාව උපදනාම් ධර්මයක් නැති බැවින් සකල චිත්ත චෛතසික රූපයෝ ම සහජාත ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙති. එ බැවින් සහජාත ප්‍රත්‍යයට ප්‍රත්‍යනීක ධර්ම නැත්තේ ය. මේ ප්‍රත්‍යය ගැන දක්වීමට සුදුසු උපමා ද සුලභ නැත. ආලෝකයට ප්‍රත්‍යය වන ප්‍රදීපය මෙයට උපමා වශයෙන් ආචාර්‍ය්‍යවරයෝ දක්වති. ආලෝක ප්‍රදීප දෙක පෙර පසු නොවී එකවර ම ඇති වන්නාහු යි නො සිතම්. ඒ දෙක පෙර පසු නොවී එකවර ම ඇති නො වේ නම් ඒ උපමාව ලෝකසම්මුතියේ සැටියට දක්වන ලද්දකැ යි ගත යුතු ය.

**පච්චයුප්පන්නෙන සහ ජායතී ති සහජාතො,** සහජාතො ච සො පච්චයො චාති සහජාත පච්චයො, සහජාතො හුත්වා පච්චයො සහජාතපච්චයො යනු විග්‍රහ යි.

## (7) අන්‍යෝන්‍ය ප්‍රත්‍යය.

මුල් කොන් එකිනෙකට මදක් දුර කොට තබා අග් කොන් එකි-නෙකට හේත්තු කොට නැගිටුවා තබන ලද දඬු තුන නො පෙරළී සිටීමට ඔවුනොවුන්ට උපකාර වන්නාක් මෙන් ඒකාබද්ධ ව උපදනා රූපාරූප ධර්මරාශීන්හි ඔවුනොවුන්ට උපකාර වන ස්වභාවයක් ඇත්තේ ය. අන්‍යෝන්‍ය

Non-commercial distribution

ප්‍රත්‍යය ය යනු ඔවුනොවුන්ට උපකාර වන්නා වූ ඒ රූපාරූප ධර්මයෝ ය. අන්‍යෝන්‍ය වශයෙන් උපකාර වීම ය හෙවත් ඔවුනොවුන්ට උපකාර වීම ය යනු තමා අනෙක් ධර්මයකට උපකාර වෙමින් ඒ තමා උපකාර වන ධර්මයෙන් තමාත් උපකාර ලැබීම ය. එය අනුන්ට උපකාර වීම ය, අනුන්ගෙන් උපකාර ලැබීම ය යන මොවුන් ගේ වශයෙන් ශක්ති දෙකක් සේ පෙනෙන නමුත් ශක්ති දෙකක් නො වේ. එය එකම ශක්තියක් බව ඉහත කී ත්‍රිදණ්ඩෝපමාවෙන් ම තේරුම් ගත හැකි ය. එකිනෙකට හේත්තු වී තිබෙන දඬු තුනෙහි එක් දණ්ඩක ඉතිරි දෙකට බරවීම නැමැති එක ම ක්‍රියාව ඉතිරි දඬු දෙකට උපකාර වීම ද, ඒ දඬු දෙකින් තමා උපකාර ගැනීම ද වෙයි. එමෙන් එක්ව උපදනා අරූපධර්මපිණ්ඩයක එක් ධර්මයක් විසින් කරන ඉතිරි ධර්මයන් වැළඳ ගැනීම ඒ ධර්මයන් ගේ ඉපදීමට හා පැවැත්මට උපකාර වීම ද තමා ගේ ඉපදීමට හා පැවැත්මට උපකාර ගැනීම ද වේ. අරූප ධර්ම රාශීන් හා උපදනා චිත්තජ රූප ඒ අරූප ධර්මයන් නිසා ඒවා හා එක වරම උපදනේ වී නමුත් චිත්තචෛතසිකයන්ගේ චිත්තජරූපයන් වැළඳගන්නා ස්වභාවයක් නැති නිසා චිත්ත-චෛතසිකයෝ චිත්තජරූපයන්ට සහජාත ශක්තියෙන් ප්‍රත්‍යය වෙති. අන්‍යෝන්‍ය ශක්තියෙන් ප්‍රත්‍යය නො වෙති. අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රත්‍යය වන ධර්මයෝ ඒ ධර්මයන්ට සහජාත වශයෙන් ද ප්‍රත්‍යය වෙති. සහජාත වශයෙන් ප්‍රත්‍යය වන ධර්ම සියල්ල ම ඒ ඒ ධර්මයනට අන්‍යෝන්‍ය වශයෙන් ප්‍රත්‍යය නො වේ. සහජාත අන්‍යෝන්‍ය ශක්ති දෙකේ වෙනස තේරුම් ගත හැකි වීමට ඉහත කී අන්‍යෝන්‍ය ප්‍රත්‍යය ශක්තිය මැනවින් තේරුම් ගත යුතු ය. මෙය තරමක් ගැඹුරු කරුණෙකි.

"**අඤ්ඤමඤ්ඤපච්චයො**" යන මෙහි අඤ්ඤ යනු සර්වනාම ශබ්දයක් බැවින් විග්‍රහ නොකළ යුතු ය. එය අපාදනාපේක්ෂක ශබ්දයෙකි. මෙහි ඇති අඤ්ඤ ශබ්ද දෙකින් එකකින් ප්‍රත්‍යයෝත්පන්නයෙන් අන්‍ය වූ ප්‍රත්‍යය ගත යුතු ය. ඉතිරි අඤ්ඤ ශබ්දයෙන්, ප්‍රත්‍යයෙන් අන්‍ය වූ ප්‍රත්‍යයෝත්පන්නය ගත යුතු ය. **අඤ්ඤො ච අඤ්ඤො ච අඤ්ඤ ච අඤ්ඤො ච අඤ්ඤමඤ්ඤො**, ද්වන්ද්වසමාස විග්‍රහ යි. අඤ්ඤඤ්ඤො යි විය යුතු තැන පද දෙක අතරට සන්ධි ක්‍රමයෙන් මකාරයක් පැමිණීමෙන් අඤ්ඤමඤ්ඤ කියා වේ. මෙහි අඤ්ඤමඤ්ඤ යනුවෙන් කියැවෙන්නේ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න දෙකය. **අඤ්ඤමඤ්ඤො** ච **සො පච්චයො චාති අඤ්ඤමඤ්ඤ පච්චයො** යනාදීන් පෙර කී නයින් පච්චය යන්න හා යොද විග්‍රහ කරනු. මේ අන්‍යෝන්‍ය ප්‍රත්‍යයෙහි ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න දෙක ම ප්‍රත්‍යය ද වේ. ප්‍රත්‍යයෝත්පන්න ද වේ.

Non-commercial distribution

## (8) නිඃශ්‍රය ප්‍රත්‍යය.

කරදසි ආදිය චිත්‍ර රූපාදියේ පිහිටීමට උපකාර වන්නාක් මෙන් පිහිටීමට තැනක් ලැබිය යුතු ධර්මයනට පිහිටීමට ස්ථාන වන ධර්මය නිඃශ්‍රය ප්‍රත්‍යය ය. එය සහජාත නිඃශ්‍රය පූරේජාත නිඃශ්‍රය වශයෙන් දෙවැදෑරුම් වේ. තමා හා එක් ව උපදනා ධර්මයකට පිහිටීමට උපකාර වන ධර්මය සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යය ය. තමා ගෙන් පසු ව ඇතිවන ධර්මයක පිහිටීමට උපකාරවන පූර්වයෙහි හටගත් ධර්මය පූරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය ය. රටාවය යි කියනු ලබන වියුමෙන් හටගන්නා චිත්‍රයේ පිහිටීමට උපකාර වන පැදුර මෙන් සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යය දත යුතුය. පැදුර ඇති වන්නේ ද චිත්‍රය ඇති වන්නේ ද වියුමෙනි. එකවර ඇති වන්නා වූ ඒ දෙකින් පැදුර චිත්‍රයට නිඃශ්‍රයය, හෙවත් පිහිටීමට ස්ථානය වේ. පසු ව ඇතිවන චිත්‍ර රූපයන් ගේ පිහිටීමට උපකාර වන කරදසිය මෙන් පූරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය දත යුතු ය.

චිත්ත චෛතසික රූපයන් අතර අනෙකක් නිඃශ්‍රය කර නො ගෙන උපදනා ධර්මයක් නැත. නිඃශ්‍රයයකින් තොර ව ඉපදිය හැකි ශක්තියක්ද ඒවාට නැත. උපදනාවූ සකල ධර්මයෝ ම සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙති. එ බැවින් සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යයට ද සහජාත ප්‍රත්‍යයට මෙන් ම ප්‍රත්‍යනීක ධර්ම නැත්තේය. නෙළුම්පත තමා මතුයෙහි වැටෙන දිය බිඳුවලට තමා අල්ලා ගැනීමට නො දෙන්නාක් මෙන් එක් ව උපදනා ධර්මයන්ට තමා වැළඳ ගැනීමට ඉඩ නොදී ඒවා තල්ලු කර හරින ස්වභාවයට ප්‍රතිපක්ෂ වූ වස්ත්‍රයෙහි ඇති සායමට තමන් වැළඳ ගැනීමට ඉඩ දෙන ස්වභාවය බඳු සවභාවයක් බොහෝ රූපාරූප ධර්මයන්හි ඇත්තේ ය. එය නිඃශ්‍රය ප්‍රත්‍යය ශක්තිය ය. ඒ ශක්තිය ඇති නිසා එක් ව උපදනා චිත්ත චෛතසිකයෝ ඔවුනොවුන්ට නිඃශ්‍රය ප්‍රත්‍යය වෙති. එක්ව උපදනා මහා භූතයෝ ද ඔවුනොවුන්ට නිඃශ්‍රය ප්‍රත්‍යය වෙති. මහා භූතයෝ උපාදය රූපයන්ට ද නිඃශ්‍රය ප්‍රත්‍යය වෙති. උපාදය රූපයන්හි ඔවුනොවුන්ට නිඃශ්‍රය වන ස්වභාවය නැත. සිත චිත්තජරූපයන්ට ද නිඃශ්‍රය ප්‍රත්‍යය වෙති. එහෙත් චිත්තජරූපයෝ සිතට නිඃශ්‍රය ප්‍රත්‍යය නො වෙති. චිත්තජරූපයන්ගේ සිත නිඃශ්‍රය කරගෙන පැවැත්ම ආලෝකයේ ප්‍රදීපය නිඃශ්‍රය කර ගෙන පැවැත්ම මෙන් දත යුතු ය. එය චිත්ත චෛතසිකයන් ඔවුනොවුන්ට නිඃශ්‍රයවීමෙහි දී ඔවුනොවුන් ගිල ගෙන නිඃශ්‍රය වන ස්වභාවයට වෙනස් සවභාවයකි. ප්‍රතිසන්ධිනාමස්කන්ධයන් ඇති නුවූවහොත් ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ඇති නො වෙති. ප්‍රතිසන්ධිකර්මජරූපයන් ඇති වන්නේ ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් ගේ උපකාරයෙන් ඒවායේ එල්ලී ගෙන

Non-commercial distribution

ය. එබැවින් ප්‍රතිසන්ධිනාමස්කන්‍ධයෝ ද ප්‍රතිසන්ධිකර්‍මජ රූපයන්ට නිඃශ්‍රය ප්‍රත්‍යය වෙති. හෘදය වස්තුවෙන් අන්‍යවූ ප්‍රතිසන්ධිකර්‍මජ රූපයෝ ප්‍රතිසන්ධි නාමස්කන්‍ධයන්ට නිඃශ්‍රය නො වෙති. ප්‍රතිසන්ධි කාලයේ හෘදය වසතුව නාමස්කන්‍ධයන්ට ද නාමස්කන්‍ධයෝ හෘදය වස්තුවට ද නිඃශ්‍රය වෙති.

**වස්තුපුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය, වස්ත්වාරම්මණ පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය** යයි පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය දෙවැදෑරුම් වේ. පූර්‍වයෙහි ඉපද පසුව උපදනා නාමස්කන්‍ධයන්ට නිඃශ්‍රය වන චක්‍ෂුරාදි වස්තු සය **වස්තු පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය ය.** සමහර අවස්ථාවක දි තමාගේ නිඃශ්‍රය වසතුව අරමුණු කොට ද සිත් උපදී. එසේ උපදනා සිත්වලට නිඃශ්‍රය වස්තුව ය අරමුණ ය යන දෙක එකක් ම වේ. චක්‍ෂුරාදි වස්තු පස අරමුණු කරමින් ඒ වස්තූන් නිඃශ්‍රය ද කොට ගෙන සිත් නූපදී. නිඃශ්‍රය වස්තුව ම අරමුණු කොට සිත් උපදිනුයේ හෘදය වස්තුව ඇසුරු කොට ය. එසේ උපදනා සිත්වලට අරමුණය නිඃශ්‍රය ය යන දෙකම වන්නා වූ හෘදය වසතුරූපයට **වස්ත්වාරම්මණ පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය** යයි කියනු ලැබේ. එය තේරුම් ගැනීමට දුෂ්කර වූ ආචාර්‍ය්‍ය මත භේද ඇත්තා වූ ප්‍රත්‍යයෙකි. එය තේරුම් ගත හැකිවීමට චිත්ත වීථි ගැන මනා දැනුමක් තිබිය යුතුය. චිත්තවීථි ගැන දැනුම නැති අයට එය තේරුම් ගත නො හැකි ය.

මරණාසන්න කාලයෙන් මොබ ප්‍රවෘත්ති කාලයෙහි හෘදය වස්තුව ඇසුරු කොට උපදනා සිත්වලට ඒ ඒ සිතට පූර්‍වයෙහි උපන් සිත හා උපන් හෘදය වස්තුරූපය ම නිඃශ්‍රය වන බවය, චිත්තවීථියක උපදනා ජවනය ආවර්ජන චිත්තයට අනුව ආවර්ජනයෙන් ගන්නා ලද අරමුණ ම ගනිමින් උපදනා බව ය, එක් වීථියක සිත්වල අරමුණ වස්තු වශයෙන් හා කාල වශයෙන් ද වෙනස් නො විය යුතු බව ය, ආවර්ජනයක් නැතිව ජවනය ඇති නො වන බව ය යන **මේ චිත්තෝත්පත්තිය පිළිබඳ වූ නීති සතර මෙහි දී සැලකිය යුතු ය.**

තමාගේ නිඃශ්‍රය වස්තුව අරමුණු කොට ආවර්ජන චිත්තයක් ඇති වුව හොත් එයට අරමුණු විය යුත්තේ භවඞ්ගුපච්ඡේද චිත්තය හා උපන් හෘදය වසතුව ය. ආවර්ජනයට අනතුරුව උපදනා ජවනයට නිඃශ්‍රය විය යුත්තේ ආවර්ජනචිත්තයා ගේ උත්පාදයෙහි උපන් හෘදය වස්තුව ය. ඉදින් ජවනය ආවර්ජනයට අනුව ආවර්ජන චිත්තයෙන් ගත් අරමුණ වූ භවාඞ්ගුපච්ඡේදය හා උපන් හෘදය වස්තුව අරමුණු කොට උපදී නම් ඒ ජවනය තමා ගේ නිඃශ්‍රය වස්තුව අරමුණු කරන්නක් නො වේ. ඉදින් ජවනයක් තමාගේ නිඃශ්‍රය වස්තුව අරමුණු කොට උපදී නම් එය ආවර්ජනයෙන් ගන්නා ලද අරමුණෙන් අනෙකක් අරමුණු කොට ඉපදීමක්

Non-commercial distribution

වේ. ආවර්ජනයෙන් නො ගන්නා ලද අනෙක් අරමුණක් ගෙන ජවනය ඉපදීම ඉහත කී නියාම ධර්මවලට විරුද්ධ ය. චිත්තනියාමය පිළිබඳ වූ ඉහත කී නීතිවලට අනුව තමා ගේ නිඃශ්‍රය වස්තුව අරමුණු කරන චිත්තවීථියකට ඇතිවීමට ප්‍රකෘතිකාලයෙහි අවකාශයක් නැත. මරණාසන්න කාලයෙහි ච්‍යුති චිත්තයෙන් මොබ සතළොස් වන චිත්තයා ගේ උත්පාදක්ෂණයෙන් පසු හෘදය වස්තු රූපයෝ නූපදිති. මරණාසන්න කාලයේ ඇති වන සකල චිත්තයන්ට ම නිඃශ්‍රය වස්තුව වන්නේ ච්‍යුතිචිත්තයෙන් මොබ සතළොස් වන චිත්තය හා උපන් හෘදය වස්තුව ය. ඒ අවස්ථාවෙහි දී සිතට නිඃශ්‍රය වන වර්තමාන හෘදය වස්තු රූපය අරමුණු කොට චිත්තවීථියක් ඇති වුව හොත් ඒ වීථියේ ආවර්ජන ජවන සියල්ලට ම ච්‍යුතිචිත්තයෙන් සතළොස් වන චිත්තයා ගේ උත්පාදයෙහි උපන් හෘදය වස්තුරූපය ම අරමුණ ද නිඃශ්‍රය වස්තුව ද වන්නේ ය. එ බැවින් ආචාර්ය්‍ය වරයෝ වස්තාරම්මණ පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය වශයෙන් මරණාසන්න කාලයෙහි වූ හෘදයවස්තු රූපය ම දක්වූහ.

යම්කිසිවකුට මරණාසන්න කාලයේ දී තමා ගේ හෘදය වසතුව අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කරන්නා වූ හෝ එයට ඇලුම් කරන්නා වූ හෝ එය ආත්ම වශයෙන් සලකන්නා වූ හෝ සිත් ඇති වුව හොත් ඒ සිත්වලට ච්‍යුතිචිත්තයෙන් මොබ සතළොස් වන චිත්තය හා උපන් හෘදය වසතුව ආරම්මණය ද විය හැකි ය. නිඃශ්‍රය ද විය හැකි ය. ඒ අවස්ථාවේ දී ඒ සිත්වලට මරණාසන්න හෘදය වස්තුව වස්තාරම්මණ පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය වේ. සමූහඝන සන්තතිඝන වශයෙන් ඔවුනොවුන් ගෙන් වෙන් කර ගැනීමට දුෂ්කර වූ රූපධර්මයන් අතුරෙන් සියුම් රූපයක් වූ මේ හෘදය වස්තුව මරණාසන්න කාලයේ දී වෙන් කොට සිතට ගැනීම අති දුෂ්කර ය. එ බන්දක් සිදු වෙතැ යි සිතීමට ද දුෂ්කර ය. සම්පූර්ණ වර්තමාන පඤ්චස්කන්ධය හෝ රූප කය හෝ අනිත්‍යාදි වශයෙන් සලකන්නා වූ හෝ රූප කයට ඇලුම් කරන්නා වූ හෝ එය ආත්ම වශයෙන් ගන්නා වූ හෝ සිත් මරණාසන්නයේ දී ද කලාතුරකින් ඇති වන්නට බැරි කමක් නැත. ඒ අවස්ථාවේ දී ඒ සිත්වල නිඃශ්‍රය වස්තුව ද ඒ සිත්වලින් අරමුණු කරන රූප කයේ කොටසක් වීමෙන් ඒ සිත්වල ද අරමුණ වන බැවින් ඒ වස්තුරූපය ආරම්මණ පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය විය හැකි ය. පැරණියන් පට්ඨාන සන්නය සම්පාදනය කර තිබෙන්නේ වස්තාරම්මණ පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය මරණාසන්න කාලයේ දී ම ලැබෙන සැටියට ගැනීමෙනි. අප විසින් ද මේ පට්ඨාන සන්නය එයට අනුව කරනු ලැබේ.

Non-commercial distribution

වස්ත්වාරම්මණ පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය ප්‍රකෘති කාලයේ දී ද ලැබෙන බව කියන ආචාර්ය්‍යවරයෝ ද වෙති. ඔවුන් ගේ මතයේ සැටියට ප්‍රකෘති කාලයේ දී වර්තමාන හෘදය වස්තු රූපය අනිත්‍ය වශයෙන් හෝ දුඃඛ වශයෙන් හෝ අනාත්ම වශයෙන් හෝ මෙනෙහි කිරීමෙහි දී ද එයට ඇලුම් කිරීමෙහි දී ද එය ආත්ම වශයෙන් සැලකීමෙහි දී ද වස්ත්වාරම්මණ පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය ලැබේ. ප්‍රකෘති කාලයේ උපදනා සිත්වල නිඃශ්‍රය වස්තූන් එකින් එකට වෙනස් බව ඒ ආචාර්ය්‍යවරයෝ ද පිළිගනිති. ආවර්ජනයට අනුකූල නො වී ආවර්ජනයෙන් ගත් අරමුණ හැර අනෙක් අරමුණක් ගෙන ජවනය ඇති නො වන බව ද ආවර්ජනයෙන් තොර ව ජවනයක් ඇති නො වන බව ද පිළිගනිති. වර්තමාන හෘදය වස්තුව අරමුණු කොට ඇති වන වීථිවල ජවනයන්ට ආවර්ජනයෙන් ගන්නා ලද වස්තුරූපය නො ගෙන තමා ගේ නිඃශ්‍රය වූ වස්තු රූපය ගනිමින් ඇති වීමට බාධාවක් නැත ය, ජවනයෙන් ගන්නා වස්තුරූපය ආවර්ජනයෙන් ගත් වස්තුරූපය නොවතුදු වර්තමාන වස්තුරූපය ගැනීම් වශයෙන් ඇතිවන බැවින් ඒ ජවනය ආවර්ජනයට අනුකූලව ම ඇතිවන්නක් ය, එසේ ඇතිවන ජවනය ආවර්ජනයෙන් තොර ව ඇතිවන්නක් ද නො වේ ය, වර්තමාන වස්තුරූපත්වයෙන් ආවර්ජනයෙන් ගත් වස්තු රූපයට සර්වාකාරයෙන් සමාන වස්තුරූපයක් ම ගන්නා බැවින් ආවර්ජන ජවනයන් ගේ අරමුණු වෙනස් වීමේ දෝෂය ද එතැන්හි නො වේ ය යනු ප්‍රකෘතිකාලයේ වස්ත්වාරම්මණ පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය ලැබේ ය යි ගන්නා ආචාර්ය්‍යවරයන් ගේ අදහස ය.

**පච්චයුප්පන්නෙහි නිස්සීයතෙ ති නිස්සයො**, කර්මසාධන විග්‍රහ යි. නි පූර්ව සි ධාතුව කෙරෙන් ණ ප්‍රත්‍යය ව වෘද්ධි හා අයාදේශ වීමෙන් නිස්සයො යි සිද්ධයි. ප්‍රත්‍යයෝත්පන්නයන් විසින් ආධාර කර ගන්නා භූමියක් බඳු වූ ධර්මය නිස්සය නම් වේ.

**පච්චයුප්පන්නෙන සහ ජායතී ති සහජාතො**, කර්තෘ සාධන විග්‍රහයි. සහ ශබ්දය පූර්ව කොට ඇති ජන ධාතුව කෙරෙන් ත ප්‍රත්‍යය ව ධාත්වන්තාක්ෂරය ලොප් ව සහජාත කියා සිද්ධ වේ. ප්‍රත්‍යයෝත්පන්නය හා එක් ව උපදනා ධර්මය සහජාත නම්.

**සහජාතො ච සො නිස්සයො චා ති සහජාත නිස්සයො. වසන්ති චිත්ත චෙතසිකා එත්ථා ති වත්ථු**, අධිකරණ සාධන විග්‍රහ යි. වස ධාතුව කෙරෙන් රත්ථු ප්‍රත්‍යය ව ධාත්වන්තය හා රකාරය ලොප් ව වත්ථු කියා වේ: මෙහි චිත්ත චෛතසිකයෝ වෙත් නුයි වත්ථු නම්. **පුරේජාතො ච සො වත්ථු චා ති වත්ථුපුරේජාතො, වත්ථුපුරේජාතො ච සො නිස්සයො චා ති**

Non-commercial distribution

වත්ථුපුරේජාත නිස්සයො. වත්ථු ච තං ආරම්මණං චාති වත්ථාරම්මණං, පුරේජාතංච තං වත්ථාරම්මණං චාති වත්ථාරම්මණ පුරේජාතං, වත්ථාරම්මණ පුරේජාතං ච සො නිස්සයො චාති වත්ථාරම්මණ පුරේජාත නිස්සයො. පච්චය ශබ්දය හා උක්තානුසාරයෙන් යොදනු.

## (9) උපනිඃශ්‍රය ප්‍රත්‍යය.

චිත්ත චෛතසිකයන් ඇති වීමට එක් විය යුතු වූ ලැබිය යුතු වූ අනේක ප්‍රත්‍යය ධර්මයන් අතුරෙන් ඒ ඒ චිත්ත චෛතසිකයන් ඇති වීමට අතිශයින් උපකාර වූ බලවත් හේතුවට උපනිඃශ්‍රය ප්‍රත්‍යය ය යි කියනු ලැබේ. එය කම්කරුවන්ට වැටුප් දී ගෙයක් කරවන ගෙහිමියකු මෙන් දත යුතු ය. ගෙහිමියා ය කම්කරුවෝ ය යන සියල්ලෝම ගෙය ඇති කරන්නෝ ය. එහෙත් කම්කරුවන් ගෙන් ඇතමෙක් නැත ද ගෙය නැනීම සිදුවන්නේ ය. කම්කරුවන්ට වැටුප් දෙන කර්මාන්තයට ද්‍රව්‍ය සපයන ගෙහිමියා නැත හොත් ගෙය නො තැනෙන්නේ ය. ගෙය ඇතිවීමට ප්‍රධාන උපකාරකයා ගෙහිමියා ය. කම්කරුවෝ ගෙය ඇතිවීමෙහි අප්‍රධාන හේතූහු ය. චිත්තචෛතසිකයන් හට ගැනීමට ඇත්තා වූ හේතූන් අතුරෙන් උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙන් අන්‍ය ප්‍රත්‍යයෝ ගෙය තනන කම්කරුවන් මෙන් දත යුත්තාහු ය. උපනිඃශ්‍රය ප්‍රත්‍යය ගෙහිමියා මෙන් දත යුතු ය. යම්කිසිවක උපනිඃශ්‍රයයෙන් ඇති විය යුතු චිත්ත චෛතසික ධර්මයෝ ඒ දෙයෙහි උපනිඃශ්‍රයභාවය නො ලද හොත් හේත්වාරම්මණාදි අන්‍ය ප්‍රත්‍යයන් නිසා පමණක් නූපදනාහ. හේත්වාදි ප්‍රත්‍යයෝ උපනිඃශ්‍රය ප්‍රත්‍යයා ගේ සහායත්වය නො ලැබ ඒ ධර්මය ඉපදවීමට නො සමත් වන්නාහ. මේ උපනිඃශ්‍රය ප්‍රත්‍යය සාමාන්‍යයෙන් එකක් වුව ද ප්‍රභේද වශයෙන් **ආරම්මණෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ය, අනන්තරෝපනිඃශ්‍රය ප්‍රත්‍ය ය, ප්‍රකෘතෝප නිඃශ්‍රය ප්‍රත්‍යය යි** ත්‍රිවිධ වේ.

ලෝකයා විසින් උසස් කොට සලකනු ලබන ගරු කරනු ලබන අරමුණු ආරම්මණෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ය. ආරම්මණෝපනිඃශ්‍රය ප්‍රත්‍යය වන ගරු කළ යුතු අරමුණු නම් ආරම්මණාධිපති ප්‍රත්‍යය වශයෙන් දක්වූ ධර්මයෝ ම ය. ගරු කළ යුතු ධර්මයෝ බොහෝ චිත්ත චෛතසිකයන් ගේ උත්පත්තියට හේතු වෙති. ඒවායේ ගරු කළ යුතු බව පිළිබඳ දතයුතු කරුණු ආරම්මණාධිපති ප්‍රත්‍යය විස්තරයේ දක්විණ. රුවන්වැලි මහසෑය ලෝකයා ගරු කරන වස්තුවකි. එ බැවින් එය දකීමට හා එයට වැඳුම් පිදුම් කිරීමට බොහෝ ජනයෝ යෙති. එසේ යන්නවුන් කෙරෙහි එය සඳහා

Non-commercial distribution

උපදනා චිත්ත චෛතසිකයෝ ඉතා බොහෝ ය. රුවන්වැලි මහසෑය සම්බන්ධයෙන් ඒ මනුෂ්‍යයන් තුළ ඇති වන චිත්ත චෛතසිකයන් ඇති වීමට තවත් බොහෝ ධර්ම ප්‍රත්‍යය වන්නේ වී නමුත් රුවන්වැලි මහසෑය නමැති ගරු කළ යුතු වස්තුව නැති නම් ඒ සිත් නූපදනාහ. ගරු කළ යුතු ආරම්මණයන් නිසා බොහෝ සිත් උපදනා සැටි රුවන්වැලි මහසෑය නිසා වන චිත්තචෛතසිකයන් ගේ ඉපදීම අනුව තේරුම් ගත යුතු ය.

දන් දී සිල්රැක පෙහෙවස් වැස තවත් නොයෙක් පින්කම් කොට ඒවා ගරු කොට මෙනෙහි කිරීම් වශයෙන් උපදනා කුසල් සිත්වලට ද ධ්‍යාන ලබා ධ්‍යානය ගරුකොට මෙනෙහි කිරීම් වශයෙන් උපදනා කුසල් සිත්වලට ද තම තමන් ගේ ලෝකෝත්තර මාර්ග ඵලයන් ගරු කොට මෙනෙහි කිරීම් වශයෙන් ශෛක්‍ෂයන්ට උපදනා කුසල් සිත් වලට ද කුසලය ආරම්මණෝපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. දනාදි පින්කම් කොට ඒවා ගරු කොට තෘෂ්ණාවෙන් ආස්වාදනය කරන්නවුන් ගේ ද තෘෂ්ණාසහගත සිතින් ඒවාට සතුටු වන්නවුන් ගේ ද ඒවා ගැන දෘෂ්ටි උපදවන්නවුන් ගේ ද ඒ අකුශල සිත්වලට කුශලය ආරම්මණෝපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. රාගය ගරු කොට ආස්වාදනය කරන්නවුන්ට ද රාගය ගැන තෘෂ්ණාසහගත චිත්තයෙන් සතුටු වන්නවුන්ට ද රාගය ගැන දෘෂ්ටි උපදවන්නවුන්ට ද ඒ ක්‍රියා සිදු කිරීම් වශයෙන් ඇති වන අකුශල චිත්තයන්ට රාගසඞ්ඛ්‍යාත අකුශලය ආරම්මණෝපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. විස්තර පඤ්හාවාරයෙන් දත යුතු ය. එක ම ආරම්මණ ධර්මය එක ම ප්‍රත්‍යයෝත්පන්න ධර්මයට එක වර ම ආරම්මණ ආරම්මණාධිපති ආරම්මණෝපනිඃශ්‍රය යන ශක්ති තුනෙන් ම ප්‍රත්‍යය වේ. ඒ ප්‍රත්‍යය ශක්ති වෙන වෙන ම කල්පනා කොට තේරුම් ගත යුතු ය.

ඒ ඒ සන්තානවල උපදනා ඒ ඒ සිතට පූර්වයෙන් ඉපද නිරුද්ධ වන චිත්තය **අනන්තරෝපනිඃශ්‍රය ප්‍රත්‍යය** ය. සිත් ඉපදීමේ හේතූන් කොතෙක් ඇත ද පවත්නා චිත්ත පරම්පරාවක සම්බන්ධයක් නැතිව ඒ හේතූහු සිත් ඉපදවීමට සමත් නො වෙති. සෑම සිතක් ම උපදනේ පවත්නා චිත්ත-පරම්පරාවක අගිනි. චිත්තපරම්පරාවේ අගින් ඉපද නිරුධ වන චිත්තය එයට අනතුරු ව සිතක් ඇතිවීමට බලවත් හේතුවකි. එ බැවින් ඒ ඒ සිත්වලට පූර්වයෙන් ඉපද නිරුධ වූ චිත්තයට අනන්තරෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ය යි කියනු ලැබේ. එය විස්තර කළ යුත්තේ අනන්තර ප්‍රත්‍යයේ සැටියට ය. අනන්තර අනන්තරෝපනිඃශ්‍රය ප්‍රත්‍යය දෙක්හි ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න ධර්ම වශයෙන් වෙනසක් නැත්තේ ය. වෙනස වන්නේ ශක්ති වශයෙන් පමණෙකි. පූර්ව පූර්ව චිත්තයන්හි ඇති තමතමාට අනතුරු ව චිත්තසන්තතිය

Non-commercial distribution

නො සිදෙනු පිණිස තැනට සුදුසු සිතක් ඉපදවීමේ ශක්තිය අනන්තර ප්‍රත්‍යය ශක්තිය ය. පූර්ව චිත්තයෙහි ඇති පශ්චිම චිත්තය ඉපදීමට බලවත් හේතු භාවය අනන්තරෝපනිඃශ්‍රය ශක්තිය ය. **මේ ධර්මයේ සැටියට අභිනව සත්ත්වයන් පහළවීමට අවකාශයක් නැත.** කුමක් හෙයින් ද යත හොත් අභිනව සත්ත්වයන්ට පහළ විය යුතු පළමු වන සිත පහළ වීමට අනන්තර අනන්තරෝපනිඃශ්‍රය වශයෙන් ප්‍රත්‍යය වන්නට ධර්මයක් නැති බැවිනි.

සත්ත්ව සන්තානයෙහි උපන්නා වූ රාග ශ්‍රද්ධාදි කුශලාකුශල ධර්මයෝ ය, සත්ත්වයා විසින් සේවනය කළ පුද්ගල සෘතු ආහාරාදීහු ය, කළා වූ කුශලාකුශල ක්‍රියාවෝ ය යන මොව්හු ප්‍රකෘතෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ය. රූපශෝභාව ඇති කාන්තාවක් දක යම්කිසි පුරුෂයකු කෙරෙහි මැ ලස්සන ය, හොඳ ය, කියා රාගය උපන හොත් ඒ පුරුෂයා ඒ කාන්තාව නැවත නැවත සිහි කරයි. ඇය දකීමට නැවත නැවත යයි. ඇගේ සිත් ගැනීමට නොයෙක් ක්‍රියා කරයි. මෙ සේ ඒ පුරුෂයා කෙරෙහි රාගය ඇති වූ කාන්තාව සම්බන්ධයෙන් බොහෝ චිත්ත චෛතසිකයෝ උපදිති. ඒ පුද්ගලයා ගේ සන්තානයෙහි ඉහත කී කාන්තාව ගැන රාගය ඇති නො වී නම් අන් කොතෙක් හේතුන් ඇත ද ඇය සම්බන්ධයෙන් ඇති වන ඒ සිත්වලින් එකකුදු ඇති නො වේ. රාගය ඒ සිත් ඇති වීමට බලවත් හේතුව ය. ප්‍රධාන හේතුව ය. ඒ රාගය ඉහත කී ස්ත්‍රිය සම්බන්ධයෙන් උපදනා වූ චිත්තචෛතසිකයනට ප්‍රකෘතෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ය. ඉහත කී ශ්‍රද්ධාදි අන්‍යකාරණයන් නිසා බොහෝ චිත්තචෛතසිකයන් උපදනා සැටි උක්තානුසාරයෙන් දත යුතු ය. ප්‍රකෘතෝපනිඃශ්‍රය ප්‍රත්‍යය බොහෝ කරුණු ඇත්තා වූ මහත් වූ ප්‍රත්‍යයෙකි. කුශලය කුශල අකුශල අව්‍යාකෘත තුනට ම ප්‍රකෘතෝපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. එ සේ ම අකුශලය හා අව්‍යාකෘතය ද කුශලාකුශලාව්‍යාකෘත තුනට ම ප්‍රත්‍යය වේ.

ශ්‍රද්ධා ප්‍රඥා වීර්‍ය්‍ය මෛත්‍රී කරුණාදි කුශල ධර්මයන් නිසා දන් දීම් සිල් සමාදන්වීම් පෙහෙවස් විසීම් ධ්‍යාන ඉපදවීම් ආදියෙහිදී ශ්‍රද්ධාදි කුශල ධර්ම, දනාදි කුශල ධර්මයන්ට ප්‍රකෘතෝපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. ශ්‍රද්ධා ශීල ශ්‍රැත ත්‍යාග ප්‍රඥාදි කුසල ධර්මයන් නිසා තමා උසස් කොට සිතන්නවුන්ගේ ද අනුන් පහත් කොට සිතන්නවුන්ගේ ද කුශලයන්ට ඇලුම් කරන්නවුන්ගේ ද කුශලය නිසා දෘෂ්ටි ගන්නවුන්ගේ ද ඒ අකුසල සිත්වලට කුශලය උපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ.

ලෝභ ද්වේෂ මෝහ මානාදි අකුශල ධර්මයන් නිසා ප්‍රාණඝාතාදිය කරන්නවුන්ගේ අකුශලය අකුශලයට ම ප්‍රකෘතෝපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. ප්‍රාණඝාතාදි පාපක්‍රියා කොට ඒවායින් ගැලවෙන්නට සිතා

Non-commercial distribution

පින්කම් කරන්නවුන්ගේ කුශලයට අකුශලය ප්‍රකෘතෝපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. විසතර පඤ්හාවාරයෙන් දත යුතු ය.

රූපාරූප ධර්ම දෙවර්ගීය ම උපනිඃශ්‍රය ප්‍රත්‍යය වේ. උපනිඃශ්‍රය ප්‍රත්‍යයෝත්පන්න වන්නේ අරූප ධර්මයෝ ම ය. රූපධර්මයෝ උපනිඃශ්‍රය ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. ශාරීරික රූපයන්ට කර්මය ද බලවත් හේතුවකි. වර්ෂාව ගස් වැල්වලට බලවත් ප්‍රත්‍යයෙකි. රූපධර්මයනට ප්‍රත්‍යය වන ඒ බලවත් හේතු අභිධර්මයෙහි උපනිඃශ්‍රය ප්‍රත්‍යය සැටියට නො දක්වනු ලැබේ. සෞත්‍රාන්තික ක්‍රමයෙන් ඒවාට ද උපනිඃශ්‍රය නාමය ව්‍යවහාර කරනු ලැබේ. "පකතූපනිස්සය" යන මෙහි "පකත" යන්නෙහි තේරුම කරන ලද්ද ය යනුයි. එහි අදහස් කරන කිරීම ස්වසන්තානයෙහි ඉපදවීම හා සේවනය කිරීම ය. උපනිඃශ්‍රය ප්‍රත්‍යය වන ශ්‍රද්ධාදීහු ඒ ඒ පුද්ගලයා ගේ සන්තානයෙහි උපන් ශ්‍රද්ධාදීහු ය. එක් අයකු ගේ සන්තානයෙහි උපන් ශ්‍රද්ධාදීහු අනෙකකු ගේ සන්තානයේ චිත්ත චෛතසිකයනට උපනිඃශ්‍රය නො වෙති. එක් අයකු සේවනය කළ ආහාරාදිය ද අනෙකකු ගේ චිත්තචෛතසිකයනට උපනිඃශ්‍රය නො වේ. රූපසන්තානය ය අරූප සන්තානය ය යි සත්ත්වයකු ගේ සන්තාන දෙකකි. එයින් පකත යන වචනයෙන් කියැවෙන උත්පාදන සේවන දෙක සිදු කරන්නේ අරූප සන්තානයෙහි. රූප සන්තානයෙන් ඒ දෙක නො කරනු ලැබේ. එ බැවින් උපනිඃශ්‍රය ප්‍රත්‍යය අරූප සන්තානයට පමණක් ලැබේ.

**භුසො නිස්සයො උපනිස්සයො** පාදි පූර්වපද කර්මධාරය සමාස විග්‍රහයි. **ආරම්මණං ච තං උපනිස්සයො චා ති ආරම්මණූපනිස්සයො, අනන්තරො ච සො උපනිස්සයො චා ති අනන්තරූපනිස්සයො, කරීයිත්ථා ති කතො,** සන්තානයෙහි උපදවන ලද්දා වූ ද සේවනය කරන ලද්දා වූ ද දෙය කත යනුවෙන් ගත යුතු ය. පකාරෙන කතො පකතො, ප්‍රකාරයෙන් කරන ලද්ද හෙවත් උත්පාදනය හා සේවනය කරන ලද්ද පකත නම් වේ. කිනම් ප්‍රකාරයකින් ද? යත් යම් ප්‍රකාරයකින් ඉපද වූ කල්හි සේවනය කළ කල්හි අනාගතයෙහි ඒ සන්තානයෙහි චිත්තචෛතසිකයෝ උපදිත් ද ඒ ප්‍රකාරයෙන් කරන ලද්ද ය. **පකතො ච සො උපනිස්සයො චා ති පකතූපනිස්සයො.**

## (10) පුරේජාත ප්‍රත්‍යය.

තමත් කලින් හටගෙන පසුව හටගන්නා මල්පලවලට උපකාර වන ගස් සේ කලින් හටගෙන පසුව හටගන්නා අරූප ධර්මයනට

Non-commercial distribution

උපකාර වන ධර්මය පුරේජාත ප්‍රත්‍යය ය. පුරේජාත ප්‍රත්‍යය වන්නෝ රූප ධර්මයෝ ය. ප්‍රත්‍යයෝත්පන්න වන්නෝ අරූප ධර්මයෝ ය. මෙය පහසුවෙන් තේරුම් ගත හැකි ප්‍රත්‍යයක් සේ පෙනෙන නමුත් ආචාර්ය්‍ය මත භේද ඇති තේරුම් ගැනීමට දුෂ්කර ප්‍රත්‍යයෙකි. පුරේජාත ප්‍රත්‍යය වන රූප ධර්මයෝ ඇතැම් චිත්ත චෛතසිකයනට ආරම්මණ වශයෙන් ප්‍රත්‍යය වෙති. ඒ රූප ධර්මයන් ගෙන් කොටසක් වූ ෂට්වස්තූහු අරූප ධර්මයන්ට වස්තු වශයෙන් ප්‍රත්‍යය වෙති.

පඤ්චාරම්මණය පඤ්චවිඤ්ඤාණ වීථීන්ට හා නිෂ්පන්නරූප අටළොස ඇතැම් මනෝද්වාර වීථීන්ට ද ප්‍රත්‍යය වන්නේ ආරම්මණ ශක්තියෙන් ය, ෂට්වස්තූන් සප්ත විඥාන ධාතූන්ට ප්‍රත්‍යය වන්නේ නිඃශ්‍රය ශක්තියෙන් ය, පුරේජාත භාවයෙන් වෙනස් කොට කියන ආරම්මණයන් හා වස්තූහු ම පුරේජාත ප්‍රත්‍යය ය, පුරේජාත ශක්තිය ය කියා ආරම්මණ නිඃශ්‍රය ශක්තීන් ගෙන් අන්‍ය වූ විශේෂ ශක්තියක් නැත ය යනු එක් ආචාර්ය්‍ය මතයෙකි.

චක්ෂුර්ද්වාර වීථියෙහි චක්ෂුර්විඥානය උපදිනුයේ ඉපද චිත්තක්ෂණ ගණනක් ඉක්ම ගිය චක්ෂුර්වස්තුවක් ආශ්‍රය කොට ය. එය උපදිනුයේ කලින් ඒ වස්තු රූපයෙහි රූපාරම්මණය ගැටීම නිසා ය. රූපාරම්මණය එහි ගැටීම චක්ෂුර්විඥානය ඉපදීමේ ප්‍රාරම්භය ය. ඒ ගැටීම නුවූව හොත් චක්ෂුර්විඥානයක් නූපදනේ ය. ඒ ගැටීම සිදු වීමට ද චක්ෂුර්වස්තුව චක්ෂුර්විඥානයට කලින් ඉපද තිබිය යුතු ය. එ බැවින් චක්ෂුර්වස්තුව ගේ කලින් ඉපද තිබීම චක්ෂුර්විඥානය ඇති වීමට එක් හේතුවකි. ඒ චක්ෂුර්ව-ස්තුවෙහි කලින් හට ගෙන තිබෙන බව පුරේජාත ප්‍රත්‍යය භාවය ය. චක්ෂුර්විඥානයට එය නිඃශ්‍රය වීම පසු ව චක්ෂුර්විඥානය උපදනා අවස්ථාවෙහි සිදුවන්නක් ය. එ බැවින් එහි පුරේජාත ප්‍රත්‍යය භාවය අනෙකක් ය. නිඃශ්‍රය ප්‍රත්‍යය භාවය අනෙකක් ය. යනු එක් ආචාර්ය්‍ය මතයෙකි. ආරම්මණ භාවයේ හා පුරේජාත භාවයේ නානත්වය ද වස්තුවට කී නයින් තේරුම් ගත යුතු ය. මෙය ගැඹුරු කරුණෙකි.

පුරේජාත ප්‍රත්‍යය වන්නෝ වර්තමාන නිෂ්පන්නරූපයෝ ය. අතීත රූපයෝ පුරේජාත වූවාහු ද ඒවා අරමුණු කොට උපදනා චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් හා උපනිඃශ්‍රය ශක්තියෙන් ප්‍රත්‍යය වනු මිස පුරේජාත ශක්තියෙන් ප්‍රත්‍යය නො වෙති. ආරම්මණ ශක්තියෙන් වෙනස් වූ පුරේජාත ශක්තියක් තිබෙන බවට මෙය ද වැදගත් සාක්ෂ්‍යයෙකි. මෙය ද ගැඹුරු කරුණෙකි. අතීත රූපයන් පුරේජාතයන් වී පුරේජාත ප්‍රත්‍යය නො වීමේ හේතුව අවබෝධ කර ගැනීමට උත්සාහ කළ යුතු ය. එය පුරේජාත ශක්තිය ගැන ඉහත දක් වූ කරුණු අනුව සිතා තේරුම් ගත යුත්තකි.

Non-commercial distribution

ත්‍රිරාශියෙහි අප්‍රමාණ චෛතසිකයන් ආරම්මණ පූරේජාත ප්‍රත්‍ය-යෝත්පන්න භාවයෙන් බැහැර කර තිබෙන්නේ සත්ත්ව ප්‍රඥප්තිය විෂයෙහි පවත්නා ඒ චෛතසිකයන් රූපයන් අරමුණු කොට උපදනා සිත් හා නො යෙදෙන බැවිනි. පූරේජාත ප්‍රත්‍යය වන අටළොස් රූපයන් අතුරෙන් චක්ෂුරූප සය ප්‍රත්‍යය වන සැටි චක්ෂුපූරේජාත වස්ත්වාරම්මණ පූරේජාත ප්‍රත්‍යයන් ගැන කී කරුණු අනුව තෙරුම් ගත යුතු ය. අටළොස් වැදෑරුම් වර්තමාන රූපයන් ආරම්මණ පූරේජාත වශයෙන් ප්‍රත්‍යය වන්නේ මෙසේ ය. අනිත්‍ය වශයෙන් දුඃඛ වශයෙන් අනාත්ම වශයෙන් සම්මර්ශනය කිරීම් ආදියෙහි ඒවා අරමුණු කොට උපදනා කාමාවචර කුශල ක්‍රියා චිත්තයන්ට ද ආරම්මණ පූරේජාත ප්‍රත්‍යය වේ. රූප දක්නා වූ ද ශබ්ද ශ්‍රවණය කරන්නා වූ ද කුශල ක්‍රියා වශයෙන් පවත්නා වූ අභිඥාසිතට ද රූප ශබ්දයෝ ආරමණ පූරේජාත භාවයෙන් ප්‍රත්‍යය වෙති. චක්ෂුරාදිය හොඳය කියා ආස්වාදනය කරන්නා වූ ද චක්ෂුරාදීන් කෙරෙහි රාගය උපදවන්නා වූ ද චක්ෂුරාදීන් විෂයෙහි දෘෂ්ටි උපදවන්නා වූ ද දෙම්නස් උපදවන්නා වූ ද විචිකිත්සා ඇති කරන්නා වූ ද ඖද්ධත්‍යය ඇති කරන්නා වූ ද නැනැත්තන් ගේ වශයෙන් චක්ෂුරාදිහු අකුශල සිත් දෙළොසට ආරම්මණ පූරේජාත ප්‍රත්‍යය වෙති. රූප දර්ශනාදි වශයෙන් ඇති වන්නා වූ පඤ්චවිඥාන වීථීන්ට අයත් සිත්වලට ද රූපාදිය ආරම්මණ පූරේජාත ප්‍රත්‍යය වේ. ප්‍රත්‍යය වන සැටි විස්තර වශයෙන් සිතා සොයාගත යුතු ය.

වචනාර්ථ මෙසේ ය :- **අජනී ති ජාතො.** ජන ධාතුව කෙරෙන් ත ප්‍රත්‍ය ව නකාරය ලොප්ව ජාත කියා වේ. එයින් කියැවෙන්නේ උපන් ධර්මය ය. **පච්චයුප්පන්නතො පුබ්බෙ ජාතො ති පූරේජාතො.** එයට අලුපත සමාස ය යි ද 'පූරෙ' යන නිපාතය පූර්ව වූ සමාස ය යි ද කිය හැකි ය. ප්‍රත්‍යයෝත්පන්නයට පූර්වයෙහි හටගත් ධර්මය එයින් වාච්‍ය වේ.

## (11) පච්චාජ්ජාත ප්‍රත්‍යය.

සත්ත්ව සන්තානයෙහි කර්මාදි ප්‍රත්‍යය සතරෙන් හටගන්නා රූප පරම්පරා සතර වැඩෙමින් පවත්නේ ඒ සන්තානයෙහි අරූප ධර්ම පරම්පරාව පවත්නා තෙක් පමණෙකි. අරූප ධර්මයන් ගේ ඉපදීම නැවතුන තැන් පටන් රූප ධර්ම පරම්පරා පිරිහෙන්නට පටන් ගන්නේ ය. අරූප ධර්මයන් ගේ හටගැනීම නවතින්ට ළංවන කොට ම කර්මයෙන් හටගන්නා රූපයන් ගේ ඉපදීම නවතින්නේ ය. අන්තිම චිත්තයේ නිරෝධයෙන් පසු කර්මජ රූප ඉතිරි නො වන්නේ ය. පූර්වයෙහි කර්මාදි ප්‍රත්‍යයන්ගෙන් හටගන්නා

Non-commercial distribution

වූ රූපයනට ඒ ඒ වගී වල රූප කලාප මතු මතුයෙහි ද ඇති කොට පරම්පරාව පැවැත්විය හැකි වීමේ ශක්තිය ලැබෙන පරිදි පසුව උපදනා චිත්ත චෛතසික යන්ගෙන් අනුබල ලැබෙන්නේ ය. ඒ හේතුවෙන් සත්ත්වයා ජීවත් වන තෙක් රූප පරම්පරා සතර පවත්නේ ය. අරූප ධර්‍මයෝ අනේකානුභාවයන් ගෙන් යුක්තයෝ ය. තමා පසුව ඉපිද තමාට පෙර උපන් රූපයනට අනුබල දෙන බව ද ඒවායේ ඇති එක් ආනුභාවයෙකි. පශ්චාජ්ජාත ප්‍රත්‍යය ය යි කියනුයේ තමන් පසුව ඉපිද කලින් හටගත් රූප ධර්‍මයනට එසේ අනුබල දෙන චිත්ත චෛතසිකයන්ට ය. එය කලින් ඇති වී පවත්නා වෘක්ෂලතාවන් වෙතට පසු ව පැමිණ ඒවායේ වැඩීමට හා පැවැත්මට උපකාර වන වර්‍ෂා ජලය මෙන් දත යුතු ය.

පට්ඨාන අටුවාවෙහි **"ගිජ්ඣපොතක සරීරානං ආහාරාසා චෙතනාවිය"** යනුවෙන් එය ගිජුලිහිණි පැටවුන් ගේ ශරීර වලට උපකාර වන ආහාරාසා චේතනාව සේ දතයුතු බව දක්වා තිබේ. ගිජුලිහිණි පැටවුන්ට මාපියන්ගෙන් ආහාරයක් නො ලැබෙන්නේ ය යි කියති. ආහාරයක් නො ලබන්නා වූ ඔවුන් ගේ ශරිර ඔවුන්ට පසුව ඇතිවන ආහාරාසා චේතනාවේ බලයෙන් වැඩෙත් ය යි ද කියති.

ප්‍රතිසන්ධ්‍යාදි පූර්‍ව පූර්‍ව චිත්තයන් හා ඉපිද රූපස්ථිතියට පැමිණි ඒකජකාය ය, ද්විජකාය ය, තිජකාය ය, චතුජකාය ය යන මොවුහු පශ්චාජ්ජාත ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝය යි ත්‍රිරාශියෙහි දක්වා තිබේ. ඒකජකායාදීන්ට ප්‍රත්‍යය වන සැටි නොයෙක් පොත්වල නොයෙක් ලෙසින් දක්වෙන අවුල් කරුණෙකි. පට්ඨාන අටුවාවෙහි ඒකජකායයක් හා ද්විජකායයක් ගැන සඳහන් කොට නැත. එහි "ඉමස්ස කායස්සා ති තිසමුට්ඨානික චතුසමුට්ඨානික භූත උපාදයරූප සඞ්ඛාතස්ස කායස්ස" යි තිජකාය චතුජකාය දෙක පමණක් සඳහන් කොට තිබේ.

කායයන් අතුරෙන් **ඒකජකාය** යනු කර්‍මාදි ප්‍රත්‍යයන් අතුරෙන් යම්කිසි එක් ප්‍රත්‍යයකින් හටගත් රූප කයය ය. **ද්විජකාය** යනු ප්‍රත්‍ය දෙකකින් හටගත් කය ය. **තිජකාය** යනු ප්‍රත්‍යය තුනකින් හටගත් කය ය. **චතුජකාය** යනු ප්‍රත්‍යය සතරෙන් ම හටගත් කය ය. සත්ත්වයකු භවයෙහි පළමුවෙන් ඉපදීමෙහි දී ප්‍රතිසන්ධි චිත්තය සමග උපදනෝ කර්‍මජරූප පමණෙකි. ප්‍රතිසන්ධි චිත්තයා ගේ උත්පාද ස්ථිති භඞ්ග යන ක්‍ෂණ තුනෙන් උත්පාදක්‍ෂණ යෙහි ඇති කය කර්‍මසඞ්ඛ්‍යාත එක් ප්‍රත්‍යයකින් පහළ වූවක් බැවින් ඒකජකාය නම් වෙයි. ප්‍රතිසන්ධි චිත්තයා ගේ ස්ථිතික්‍ෂණයෝ දී ඒ සන්තානයෙහි ඍතුජරූප ද පහළ වෙයි. එ බැවින් ස්ථිතික්‍ෂණයෙහි ඇති රූප කය ද්විජ කාය ය. ප්‍රතිසන්ධි චිත්තයා ගේ භඞ්ගක්‍ෂණයෙහි

Non-commercial distribution

ඇත්තේ ද ද්විජකායය ම ය. ප්‍රතිසන්ධි චිත්තයට අනතුරු ව ප්‍රථම භවාඞ්ග චිත්තය පහළවන කල්හි චිත්තජ රූප ද පහළ වේ. එබැවින් ප්‍රථම භවාඞ්ගයා ගේ උත්පාදක්ෂණයෙහි පටන් ආහාරජ රූපයන් පහළ වන තුරු ඇත්තා වූ රූප කය ත්‍රිජකාය ය. ආහාරජ රූප පහළ වූ තැන් පටන් ඇත්තා වූ කය චතුජකාය ය. රූපලෝකයෙහි ආහාරජ රූප නො ලැබෙන බැවින් එහි වෙසෙන බ්‍රහ්මයන්ට ඇත්තේ ත්‍රිජකායයෙකි. පට්ඨාන අටුවාවෙහි තිසමුට්ඨානික කාය ය යි දක්වන ලද්දේ ඒ බ්‍රහ්මකාය ය.

එහි චතුසමුට්ඨානික කාය ය යි දක්වා තිබෙනනේ කාමසත්ත්වයන් ගේ කර්මාදි ප්‍රත්‍යය සතරෙන් හටගත් කය ය. අසංඥ සත්ත්වයන්ගේ කය ද ද්විජ කායයෙකි. එහි සිත් නූපදනා බැවින් එය පශ්චාජ්ජාත ප්‍රත්‍යය නො ලබයි.

ත්‍රිරාශියෙහි පශ්චාජ්ජාත ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් දක්වා තිබෙන්නේ පූර්ව පූර්ව චිත්තයන් සමග ඉපද ස්ථිතියට පැමිණෙන රූප ය. චිත්තයන් ගේ ස්ථිති භඞ්ග ක්ෂණවල උපදනා රූප ගැන එහි සඳහන් කර නැත. චිත්තයන් ගේ ස්ථිති භඞ්ග ක්ෂණයන්හි උපදනා රූපයන් පශ්චාජ්ජාත ප්‍රත්‍යයෝත්පන්න භාවයට නො පැමිණීමට හේතුවක් නො පෙනේ. එය විමසිය යුතු ය. චිත්තයන් ගේ ස්ථිති භඞ්ගක්ෂණයන්හි උපදනා රූපයන් පශ්චාජ්ජාත ප්‍රත්‍යයෝත්පන්නයන් නො වෙත හොත් ඒවා ප්‍රත්‍යනීකරාශියට ඇතුළු කොට දැක්විය යුතු ය. ත්‍රිරාශියෙහි එසේ දක්වා ද නැත. චිත්තයන් ගේ උත්පාද ක්ෂණයෙහි උපදනා රූපයන් පමණක් පශ්චාජ්ජාත ප්‍රත්‍යයෝත්පන්න වෙතැයි ගෙන කියතහොත් ප්‍රතිසන්ධියට අනතුරු ව උපදනා ප්‍රථම භවාඞ්ගය ප්‍රතිසන්ධි චිත්තයාගේ උත්පාදය සමග උපන් කර්මජරූප පිණ්ඩය වූ ඒකජකායයට පශ්වාජ්ජාත වශයෙන් ප්‍රත්‍යය වන බව කිය යුතු ය. ප්‍රථම භවාඞ්ගය උපදනා කල්හි ප්‍රතිසන්ධිචිත්තයාගේ ස්ථිතික්ෂණයෙහි උපන් ඍතුජ රූප ද ස්ථිතියට පැමිණ තිබෙන බැවින් චිත්තයාගේ ස්ථිතියෙහි උපදනා රූප ද පශ්චාජාත ප්‍රත්‍යය ලබන සැටියට ගෙන කියත හොත් ප්‍රථම භවාඞ්ගය ද්විජකායයට පශ්වාජ්ජාත ප්‍රත්‍යය වන බව කිය යුතු ය. එසේ ගත හොත් ඒකජකායයට ප්‍රත්‍යය වන තැනක් නො ලැබේ. ප්‍රථම භවාඞ්ගය සමග කර්ම චිත්ත ඍතු යන ප්‍රත්‍යය තුනෙන් ම රූපයෝ උපදිති. එහි ස්ථිති භඞ්ගක්ෂණ වල දී ද ත්‍රිජරූපයෝ උපදිති. ඉහත කී ආකාර දෙකින් කවර ආකාරයකින් කියතත් ද්විතීය භවාඞ්ගය ත්‍රිජකායයට ප්‍රත්‍යය වන බව කිය යුතු ය. ද්විතීය භවාඞ්ගයේ පටන් ආහාරජ රූප ඉපද ස්ථිතියට පැමිණෙන තුරු උපදනා සකල චිත්තයෝ ම ත්‍රිජකායයට ප්‍රත්‍යය වෙති. ආහාරජ රූප ඉපද ස්ථිතියට පැමිණි පසු උපදනා රූපයෝ චතුජකායයට ප්‍රත්‍යය වෙති.

Non-commercial distribution

**මරණාසන්න කාලයෙහි ච්‍යුති චිත්තයෙන් මොබ සතළොස් වන චිත්තයා ගේ ස්ථිතික්ෂණයෙහි පටන් කර්මජ රූපයෝ නූපදිති.** ඒ ඒ චිත්තයන් ගේ උත්පාදක්ෂණයෙහි උපදනා රූපයන්ට පමණක් පශ්චාජ්ජාත ප්‍රත්‍යය ලැබෙන සැටියට ගෙන කියත හොත් ච්‍යුති චිත්තයෙන් පසළොස් වන චිත්තයේ පටන් ච්‍යුති චිත්තය දක්වා ඇති චිත්තයන් කාමලෝකයෙහි ත්‍රිජකායයට ද රූපලෝකයෙහි ද්විජකායයට ද ප්‍රත්‍යය වන බව කිය යුතු ය.

ඒ ඒ චිත්තයන්ට පූර්වචිත්තයා ගේ උත්පාදය හා උපන් රූපය පශ්චාජ්ජාත ප්‍රත්‍යය ලබාය යනු **එක් මතයෙකි.** පූර්ව චිත්තයා ගේ ක්ෂණත්‍රයේ ම උපන් රූප අනන්තර චිත්තයෙන් පශ්චාජ්ජාත ප්‍රත්‍යය ලබා ය යනු **එක් ආචාර්ය මතයෙකි.** එක් එක් සිතක් තමන්ට පූර්වයෙහි අටවන චිත්තයා ගේ උත්පාදක්ෂණයෙහි පටන් චිත්තක්ෂණයන්හි උපන් රූප පශ්චාජ්ජාත ප්‍රත්‍යය ලබති ය යනු ද **එක් ආචාර්ය වාදයෙකි.** එයට කරුණු වශයෙන් අටවන චිත්තක්ෂණය දක්වා කාලය රූපය වැඩෙන කාලය ය, දශවන චිත්තක්ෂණයේ පටන් රූපය පිරිහෙන්නට පටන් ගන්නේ ය. ප්‍රත්‍යය ලැබ බලවත් වන්නේ වැඩෙන කාලයේ ය. "පිරිහෙන්නට පටන්ගත් රූපය ප්‍රත්‍යය ලාභයෙන් නොවැඩෙන්නේ ය, ඒ නිසා වැඩෙන කාලයේ මිස පිරිහෙන කාලයේ පශ්චාජ්ජාත ප්‍රත්‍යයෙන් ප්‍රයෝජනයක් නැත" යි කියති. එක් එක් සිතක් තමන් උපදින්නට කලින් චිත්තක්ෂණ සොළොසක පටන් ම උපන් රූපයන්ට පශ්චාජ්ජාත වශයෙන් ප්‍රත්‍යය වේ ය යනු ද **එක් ආචාර්ය මතයෙකි.** මරණාසන්න කාලයෙහි ච්‍යුති චිත්තයෙන් සතළොස් වන චිත්තය සමග උපන් හෘදය වස්තුව ච්‍යුති චිත්තයට නිඃශ්‍රය ප්‍රත්‍යය විය හැකි නම් ච්‍යුතිචිත්තය ද එයට පශ්චාජ්ජාත ප්‍රත්‍යය විය හැකි නොවීමට කරුණක් නැතය යි ඒ ආචාර්යවරයෝ පවසති. ආහාරයෙන් වන උපස්ථම්භනය ලැබෙන්නේ වැඩෙන ශරීරයට පමණක් නො වේ ය. ජරපත් වී වැටී ගෙන යන ශරීරයට ද ආහාරයා ගේ උපස්ථම්භනය ලැබෙන්නේ ය. එ මෙන් ආයුෂයෙන් අඩක් ගෙවා පරිහාණි පක්ෂයට වැටී තිබෙන රූපයට ද පශ්චාජ්ජාත චිත්ත චෛතසිකයන් ගේ උපස්ථම්භනය නො ලැබේ ය යි නො කිය හැකිය යි ද ඒ ආචාර්යවරයෝ කියති.

තවද පූර්ව චිත්තය හා ඉපද ස්ථිතියට පැමිණෙන්නා වූ රූපය අනන්තර චිත්තය ඉපදීමට පෙරාතුව ම ඒකාන්තයෙන් අනන්තර චිත්තය උපදනා බැවින් නූපන් අනන්තර චිත්තයා ගේ උපස්ථම්භනය ලබන්නේ ය යි ද **ඇතැම් ආචාර්ය වරයෝ පවසති.** නූපන් චිත්තයෙන් උපකාර ලබන්නේ කෙසේ ද යන ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් **බක්කුල තෙරුන් වහන්සේ** ගේ කථාව හා **සංකිච්ච තෙරුන් වහන්සේ** ගේ කථාව ගෙන හැර දක්වති. යම්කිසි භවයක දී අර්හත්වයට පැමිණීමට නියත තැනැත්තේ

Non-commercial distribution

අභිඤ්ඤයට නො පැමිණ නො මියෙන්නේ යයි පත පොතෙහි දක්වා තිබේ. එසේ නො මිය යෑමේ හේතුව ඒකාන්තයෙන් මතු ඇතිවන්නට තිබෙන අභිඤ්ඤාගීයේ ආනුභාවය ය. මසකු විසින් ගිලින ලදුව ද බක්කුල තෙරුන් වහන්සේ ජීවත් වූයේ ද, මවු කුස සිටිය දී මව කාලක්‍රියා කොට සිරුර වූ ගින්නෙන් දවනු ලබද්දී මවු කුස විසූ සංකිච්ච ළදරුවා ජීවත්වූයේ ඒ අය විසින් මතු ලබන්නට තිබෙන අභිඤ්ඤාගීයේ ආනුභාවයෙන් ය. නූපන්නා වූ අභිඤ්ඤාගීයේ ඵල එය ඉපදීමට කලින් ලැබෙන්නාක් මෙන් ම නූපන් චිත්තයා ගේ උපස්ථම්භනය ද ලැබේ ය යනු ඒ ආචාර්‍ය්‍යවරයන් ගේ මතය ය.

විඤ්ඤාණය රූපයනට සහජාත වශයෙන් ද අන්‍යෝන්‍ය වශයෙන් ද නිඃශ්‍රය වශයෙන් ද ප්‍රත්‍යය වන්නේ විඤ්ඤාණයා ගේ උත්පාදක්ෂණයෙහි ය. පූර්‍වයෙහි හටගත් රූපයනට පශ්චාජ්ජාත වශයෙන් ප්‍රත්‍යය විය යුත්තේ ද එ කෙණෙහි ම ය. එ බැවින් පූර්‍ව චිත්තය හා උපන් රූපයෝ ඒ චිත්තයා ගේ ස්ථිති භඞ්ග ක්ෂණවලදී පශ්චාජ්ජාත ප්‍රත්‍යය නො ලබත් ය, අනන්තර චිත්තයා ගේ උත්පාදක්ෂණයෙහි දී ම ඔව්හු පශ්චාජ්ජාත ප්‍රත්‍යය ලබත් ය යනු ඉහත කී වාදය නො පිළිගන්නා ආචාර්‍ය්‍යවරයන් ගේ මතය ය.

පූර්‍වයෙහි ඉපද ස්ථිතියට පැමිණෙන රූපයනට පසු ව උපදනා සිත් පශ්චාජ්ජාත වශයෙන් ප්‍රත්‍යය වන බව සියල්ලෝ ම අවිවාදයෙන් පිළිගනිති. මෙහි සැලකිය යුතු ප්‍රධාන කරුණ එය ය. මත භේද ඇත්තේ පශ්චාජ්ජාත ප්‍රත්‍යය පිළිබඳ අප්‍රධාන කරුණු ගැන ය. ඒවා දක්වීමෙන් එතරම් ප්‍රයෝජනයක් නැත ද වැඩිදුර කල්පනා කිරීම ඥානවර්‍ධනයට හේතු වන බැවින් අභිධර්‍මය උගතුවන් ගේ බහුශ්‍රැත භාවය පිණිස ඒවා ද මෙහි දක්වන ලදී.

**අත්තනො පච්චයුප්පන්නතො පච්ඡා ජායතී ති පච්ඡා ජාතො,** පච්ඡා යන නිපාත පදය පෙරටු කොට ඇති ජන ධාතුව කෙරෙන් ත ප්‍රත්‍යය ව පච්ඡාජාත යනු සිඬ යි. යම් ධර්‍මයක් තමා ගේ ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මය ඉපදීමෙන් පසු උපදී නම් එය පච්ඡාජාත නම් වේ.

## (12) ආසේවන ප්‍රත්‍යය.

යම්කිසි වස්තුවක කලින් ගල්වා තිබෙන සායම එය මතුයෙහි නැවත ගල්වන ඒ වර්‍ගයේ සායමට පැහැපත් වීමට උපකාර වන්නාක් මෙන් අනතුරු ව උපදනා තමා ගේ ජාතියේ සිත තමා ගේ කුශලාදි

Non-commercial distribution

ස්වභාවය ගෙන, වඩා බලවත් වීමට උපකාර වන සිත ආසේවන ප්‍රත්‍යය ය. තමා ගේ ස්වභාවය අනන්තර චිත්තයට දෙන බව හා අනන්තර චිත්තයට තමා ගේ ස්වභාවය ගන්වන බව ආසේවන ශක්තිය ය. තමා ගේ ස්වභාවය අනන්තර චිත්තයට ගැන්වීමේ ශක්තිය ඇත්තේ ද අතීත චිත්තයේ ස්වභාවය ගෙන, වඩා බලවත් වීමේ ශක්තිය ඇත්තේ ද උත්සාහයෙන් යුක්ත වන බලවත් චිත්තයන්ට ය. ඔව්හු නම් ජවන චිත්තයෝ ය. අජවන චිත්තයෝ දුබලයෝ ය. ඔවුහු තමා ගේ ස්වභාවය අනන්තර චිත්තයනට ගැන්වීමට සමත් නොවෙති. අතීත චිත්තයේ ස්වභාවය ගැනීමට ද සමත් නො වෙති. ලෝකෝත්තර ඵලචිත්තයෝ ජවනයන් වුව ද විපාක බැවින් ආසේවන ප්‍රත්‍යය නො වෙති. විපාක චිත්තයන් ගේ බලවත් බව හෝ දුබල බව කර්මානුරූපව සිදුවන්නකි. ඒ බැවින් ඔව්හු තමා ගේ ස්වභාවය අපර චිත්තයට ගන්වන්නාහු ද පූර්ව චිත්තයේ ස්වභාවය ගන්නාහු ද නො වෙති. ඒ බැවින් එකිනෙකට අනතුරු ව උපදනා භවාඞ්ග චිත්තයේ ආසේවන ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න භාවයට නොපැමිණෙති. සමහර වීථිවලදී ආවර්ජන චිත්තය ව්‍යවස්ථාපන කෘත්‍යයෙන් කීප වාරයක් උපදී. එහෙත් එය දුබල වූ අජවන චිත්තයක් වන බැවින් ආසේවන ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න භාවයට නො පැමිණේ.

"කුශලාකුශලවිපාක ක්‍රියා යන සතර ජාතියට අයත් චිත්තයන් ගෙන් විපාක චිත්තයේ ආසේවන ප්‍රත්‍යය නො වෙති. ඉතිරි ජාති තුනට අයත් චිත්තයන් ගෙන් ද එක් ජාතියක සිතක් අන් ජාතියක සිතකට ආසේවන ප්‍රත්‍යය නො වේ. එක ම ජාතියේ සිත්වලින් ද එක් වේදනාවකින් යුක්ත සිත ඒ වේදනාවෙන් යුක්ත සිතකට ම මිස අන් වේදනාවකින් යුක්ත සිතකට ආසේවන ප්‍රත්‍යය නො වේ. කාමාවචර ය, රූපාවචර ය, අරූපාවචර ය, ලෝකෝත්තර ය යන භූමිභේදය ආසේවන ප්‍රත්‍යය නොලැබීමට කරුණක් නො වේ. ආරම්මණ භේදය ද ආසේවන ප්‍රත්‍යය නො ලැබීමට කරුණක් නො වේ. කාමාවචර චිත්තය රූපාවචරාරූපාවචර ලෝකෝත්තර චිත්තයන්ට ද සමහර තැනක ආසේවන ප්‍රත්‍යය වේ. සංස්කාරයන් අරමුණු කරන අනුලෝම චිත්තය නිර්වාණය අරමුණු කරන ගෝත්‍රභූ චිත්තයට ආසේවන ප්‍රත්‍යය වේ.

ත්‍රිරාශියෙහි අනියමින් කියැවෙන ආසේවන ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් ගේ ක්‍රමය මෙසේ ය. කාමාවචර කුශල චිත්තය තමාට අනතුරු ව උපදනා වූ වේදනා වශයෙන් අභින්න වූ කාමාවචර කුශලයට ආසේවන ප්‍රත්‍යය වේ. එහි ඥානසම්ප්‍රයුක්ත චිත්තයෝ වේදනා වශයෙන් තමන් හා සමාන වූ රූපාවචරාරූපාවචර ලෝකෝත්තර කුශල චිත්තයන්ට ද ප්‍රත්‍යය වෙති. රූපාවචර කුශලයෝ තමන් හා සමාන

Non-commercial distribution

රූපාවචර කුශලයන්ට ද ආසේවන ප්‍රත්‍යය වෙති. අරූපාවචර කුශලයෝ තමන් හා සමාන අරූපාවචර කුශලයන්ටද ආසේවන ප්‍රත්‍යය වෙති. ලෝකෝත්තර කුශල චිත්තයකට අනතුරු ව ලෝකෝත්තර කුශල චිත්තයක් නූපදනා බැවින් ඔව්හු කිසිවකට ආසේවන ප්‍රත්‍යය නො වෙති. අකුසල චිත්තයෝ වේදනාදී වශයෙන් තමන් හා සමාන වූ අකුශල චිත්තයන්ට ම ආසේවන ප්‍රත්‍යය වෙති. කාමාවචර ක්‍රියා චිත්තයෝ වේදනාදි වශයෙන් තමන් හා සමාන වූ කාමාවචර ක්‍රියා චිත්තයන්ට ප්‍රත්‍යය වෙති. එහි ඥාන සම්ප්‍රයුක්ත චිත්තයෝ වේදනා වශයෙන් තමන් හා සමාන වූ රූපා-වචරාරූපාවචර ක්‍රියා චිත්තයන්ට ද ආසේවන ප්‍රත්‍යය වෙති. රූපාවචර ක්‍රියා චිත්තයෝ තමන් හා සමාන වූ රූපාවචර ක්‍රියා චිත්තයන්ට ආසේවන ප්‍රත්‍යය වෙති. අරූපාවචර ක්‍රියා චිත්තයෝ තමන් හා සමාන අරූපාවචර ක්‍රියා චිත්තයනට ප්‍රත්‍යය වෙති. කුශලාදීන් අතුරෙන් ආසේවන ප්‍රත්‍යය ලැබූ චිත්තයෝ නො ලැබූ චිත්තයන්ට වඩා බලවත් වෙති.

**ආ පුනප්පුනං සෙවතී ති ආසෙවනං** කර්තෘ සාධන විග්‍රහ යි. ආ පූර්ව සි සෙවායං යන ධාතුව කෙරෙන් යු ප්‍රත්‍යය ව වෘද්ධි වකාරා ගම ව ආසෙවන ක්‍රියා වේ. ප්‍රත්‍යයෝත්පන්න ධර්මය නැවත නැවත සේවනය කරන්නේ ආසේවන නමි. **ආපුනප්පුනං සෙවිතබ්බන්ති ආසෙවනං** කර්මසාධන විග්‍රහ යි. ප්‍රත්‍යයෝත්පන්නයා විසින් නැවත නැවත සේවනය කරනු ලබන්නේ ආසේවන නමි. ආසේවන ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න දෙක ඒකක්‍ෂණයෙහි නො ලැබෙන බැවින් ඒ ධර්මයන් ගේ ඒකාන්තයෙන් අන්‍යෝන්‍ය සේවනයක් නැත. එහෙත් අපරචිත්තය පූර්වචිත්තයා ගේ සවභාවය ඒකාන්තයෙන් ම ගෙන උපදනා බැවින් ඒ ප්‍රත්‍යප්‍රත්‍යයෝත්පන්නයන් ගේ අන්‍යෝන්‍ය සේවනයක් ඇතුවාක් වැනි වේ. එ බැවින් ඒ ප්‍රත්‍යයට ආසේවන යන නාමය දී තිබේ.

## (13) කර්ම ප්‍රත්‍යය

අත් පා ආදි ශරීරාවයවයන් එසවීම් පහත් කිරීම් දිගු කිරීම් හැකිලවීම් ආදි වූ ද දීම් ගැනීම් පහර දීම් කථා කිරීම් විමසීම් ආදි වූ ද කායික වූ ද වාචසික වූ ද මානසික වූ ද සකල ක්‍රියාවන් සිදු කිරීමේ උත්සාහයක් සිත හා සම්බන්ධව ඇත්තේ ය. සෑම යන්ත්‍රයක් ම ක්‍රියා කරන්නේ ඒ යන්ත්‍රයෙහි යම්කිසි මූලස්ථානයක ඇති වායුවෙහි තල්ලු කිරීමේ වේගයෙනි. චිත්තය හා සම්බන්ධ වූ ක්‍රියා කිරීමේ උත්සාහය හෙවත් ක්‍රියා සිදු කිරීමේ වේගය, යන්ත්‍ර ක්‍රියා කරවන වායුවෙහි ඇති

Non-commercial distribution

තල්ලු කිරීමේ වේගය මෙන් දත යුතු ය. එය සිත හා සම්බන්ධ වූ වේගයක් වන බැවින් එයට අටුවා ටීකාවල චිත්තප්පයෝග (චිත්තප්‍රයෝග) යන නම ව්‍යවහාර කර තිබේ. යන්ත්‍රයක සෑම අවයවයක ම ක්‍රියා කිරීමේ මූලය වායුවේ තල්ලු කිරීම වන්නාක් මෙන් ඒ චිත්තප්‍රයෝග සඞ්ඛ්‍යාත වේගය හෙවත් උත්සාහය චිත්ත චෛතසිකයන් ගේ ක්‍රියා කිරීමේ මූලය වේ. යන්ත්‍රයේ මූලස්ථානයෙහි වායුව තල්ලු කරන කල්හි එහි සියලු ම අවයව එයට අනුව සැලෙන්නාක් මෙන් චිත්තප්‍රයෝග සඞ්ඛ්‍යාත වේගය අනුව එය හා සම්බන්ධ වූ සකල චිත්තචෛතසිකයෝ ම ක්‍රියා කෙරෙති. චිත්තය හා සම්බන්ධ වූ ඒ මූලික වේගය උත්සාහයකැ යි කියන ලද නමුත් එය වීර්‍ය්‍ය චෛතසිකය නො වන බව ද දත යුතු ය. ඒ චිත්තප්‍රයෝග සඞ්ඛ්‍යාත වේගයට චේතනාව ය යි ද කර්‍මය ය යි ද කියනු ලැබේ. එය සාමාන්‍යයෙන් එකක් වුව ද ආකාර නානත්වයෙන් අනේක ප්‍රභේද වේ. සමාන චෛතසික ගණනකින් යුක්ත වන එක් සිතකින් අනේක ක්‍රියා සිදු කළ හැකි වන්නේ චේතනා නානත්වයෙනි.

සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික කාමාවචර කුශල චිත්තය චෛතසික තෙතිසක් හා උපදනේ ය. ධර්‍ම සූතිසක් ඇති ඒ ධර්‍මරාශියට අයත් චේතනාව දීම සිදු කිරීමේ උත්සාහයක් වී නම් එයින් දනක්‍රියාවක් සිදු වේ. එහි චේතනාව වැඳීමේ උත්සාහයක් වී නම් එයින් වැඳීම සිදු වේ. එහි චේතනාව ගරු කළ යුත්තකුට ගරු කිරීමේ උත්සාහයක් වී නම් එයින් ගරු කිරීමක් සිදු වේ. එහි චේතනාව වතක් පිළිවෙතක් කිරීමේ උත්සාහය වී නම් එයින් වත් පිළිවෙත් කිරීම සිදු වේ. එහි චේතනාව බණ ඇසීමේ උත්සාහයක් වී නම් එයින් බණ ඇසීම සිදු වේ. එහි චේතනාව බණ කීමේ උත්සාහයක් වී නම් එයින් බණ කීමක් සිදු වේ. මෙ සේ සමාන චෛතසික ගණනකින් යුක්ත එක සිතකින් අනේක ක්‍රියා සිදු වන්නේ චේතනා චෛතසිකයේ නානත්වයෙනි. චේතනාව දන චේතනා අභිවාදන චේතනාදි වශයෙන් අනේක ප්‍රභේද වේ.

චෛතසික ධර්‍මයක් වූ චේතනාව තවත් ධර්‍මයන් ගේ සහයෝගය නොලැබ දනාදි ක්‍රියා සිදු කිරීමට සමත් නො වේ. ඇතැම් ක්‍රියාවක සිද්ධියට චේතනාවට චිත්ත චෛතසිකයන් ගේ සහයෝගය ලැබිය යුතු ය. ඇතැම් ක්‍රියාවක සිද්ධියට චේතනාවට චිත්ත චෛතසිකයන් ගේ හා රූපයන් ගේ ද සහයෝගය ලැබිය යුතුය. ඒ ඒ ක්‍රියා සම්බන්ධයෙන් උපදනා චේතනාවන්ට වුවමනා රූපාරූප ධර්‍මයන් තමන් සමගම ඉපදවීමේ ශක්තියක් ඇත්තේ ය. එබැවින් චේතනාව ක්‍රියා සිද්ධියට වුවමනා රූපාරූප ධර්‍මයන් උපදවා ගෙන ම ඒ රූපාරූප ධර්‍මයන් සමහම උපදී. බලවත් වූ ඇතැම් චේතනාවන්ට අනාගතයෙහි රූපාරූප

Non-commercial distribution

ධර්මයන් ඉපදවීමේ ශක්තිය ද ඇත්තේ ය. කුශලාකුශල විපාක ක්‍රියා වශයෙන් චේතනාව සිවු වැදෑරුම් වේ. පඤ්චවෝකාර භූමියෙහි උපදනාවූ පඤ්චවිඥාන චේතනාවන්ගෙන් අන්‍ය වූ සකල කුශලාකුශල විපාක ක්‍රියා චේතනාවෝ ම තමන් හා රූපාරූප ධර්මයන් ඉපදවීමෙහි සමත් වෙති. පඤ්චවිඥාන චේතනාවන් හා චතුවෝකාර භවයේ උපදනා චේතනාවෝ තමන් හා අරූප ධර්ම පමණක් උපදවති. චතුර්විධ චේතනාවන් අතුරෙන් කුශලාකුශල චේතනාවෝ අන්‍ය ප්‍රත්‍යයන් ගේ ද සහයෝගය ලදහොත් අනාගතයෙහිදු රූපාරූප ධර්මයෝ උපදවති. තමන් උපදනා කෙණෙහි හා අනාගතයෙහි ද රූපාරූප ධර්මයන් උපදවන්නා වූ කුශලා 'කුශල විපාක ක්‍රියා වශයෙන් සිවු වැදෑරුම් වූ චේතනාව කර්මප්‍රත්‍යය ය.

කර්ම ප්‍රත්‍යය වනාහි **සහජාත කර්ම ප්‍රත්‍යය ය, නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය** ය යි දෙවැදෑරුම් වේ. තමා උපදනා කෙණෙහිම රූපා 'රූප ධර්මයන් උපදවන චේතනාව සහජාත කර්ම ප්‍රත්‍යය නම් වේ. තමා උපදනා අවස්ථාවෙන් අන්‍ය වූ අවස්ථාවක අනාගතයෙහි රූපාරූප ධර්මයන් උපදවන චේතනාව නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය නම් වේ.

චේතනාව හෙවත් කර්මය එක්තරා වේගයක් බව ඉහත දක්වන ලදී. චේතනා සඞ්ඛ්‍යාත ඒ වේගය උපදනා කල්හි එයට අනුකූලව එය හා තවත් රූපාරූප ධර්මයෝ උපදිති. දන චේතනාවක් උපදනා කල්හි ඒ දන චේතනාව අනුව ඒ වේගය නිසා සිතක් ද එය හා බැඳී උපදනේ ය. චේතනාවෙන් අන්‍ය වූ අන්‍ය සමාන චෛතසික දොළොස හා සෝභන සාධාරණ චෛතසික එකුන් විස්ස ද සමහර විට ප්‍රඥා චෛතසිකය ද ඒ දන චේතනාව අනුව එය හා බැඳී උපදනේ ය. දන චේතනාව සහිත වූ ඒ අරූප ධර්ම පිණ්ඩය හා බැඳී දීම සඳහා ශරීරය ක්‍රියා කරවීමට වුවමනා චිත්තජ රූපයෝ ද උපදිති. එයින් දන ක්‍රියාව සිදු වේ. මෙසේ හැම චේතනාවක් සමග ම චිත්තචෛතසිකයෝ ද ඇතැම් චේතනාවක් හා චිත්ත චෛතසික රූපයෝ ද උපදිති. සෑම කල්හි ම චිත්තචෛතසිකයන් උපදින්නේ යම්කිසි චේතනාවකට අනුව ම ය.චේතනාවක් හා නොබැ දී චිත්තචෛතසිකයන් ගේ ඉපදීමක් නැත. චේතනාවකින් තොරව චිත්ත චෛතසිකයන් උපන හොත් ඒවා කිසි වැඩක් නැති ධර්ම කොටසක් වන්නේ ය. චිත්තචෛතසිකයන් චේතනාවට අනුව ම ඉපදිය යුතු බැවින් කර්ම ප්‍රත්‍යය සෑම චිත්තචෛතසිකයකට ම ප්‍රත්‍යයෙකි.

තමා ගේ උත්පත්ති ක්ෂණයෙහි දී චිත්ත චෛතසික චිත්තජ රූපයන් ගේ උත්පත්තියට උපකාරක වූ ඉහත කී දනචේතනාව අනාගතයෙහි ද සුදුසු පරිදි රූපාරූප ධර්මයන් ඇතිවීමට උපකාර වන

Non-commercial distribution

ශක්ති විශේෂයක් ශේෂකොට නිරුද්ධ වන්නේ ය. නිරුද්ධවීමෙන් පසු ඒ චේතනාව නැත ද අනාගතයෙහි යම්කිසි අවස්ථාවක දී අන්‍ය ප්‍රත්‍යයන් ගේ සහයෝගය ලද හොත් එය නවත් රූපාරූප ධර්මයන් ද උපදවයි. ඒ දන චේතනාව උපන්නේ යම් සන්තානයක නම් ඒ තැනැත්තා ගේ ඒ භවයේ අවසානයෙහි හෝ අනාගත භවයක අවසානයෙහි හෝ ච්‍යුතිචිත්තයකට අනතුරුව ඒ දන චේතනාව විසින් අන්‍ය ප්‍රත්‍යයන්ගේ ද සහයෝගය ලදහොත් ප්‍රතිසන්ධි චිත්තයක් හා කර්මජ රූප සමූහයක් ද ඇති කරනු ලැබේ. ප්‍රතිසන්ධියෙන් පසු ඒ භවය මුලුල්ලෙහි භවාඞ්ග සිත් ඇති කරනු ලැබේ. තව ද ඒ දන චේතනා සංඛ්‍යාත කර්මයෙන් පිළිසිඳ ගත් තැනැත්තා හට ඉෂ්ට රූපයන් හමු වූ කල්හි චක්ෂුර්විඥාන සම්ප්‍රතිච්ඡන්න සන්තීරණ තදරම්මණයන් ඇති වීමට ද ඉෂ්ට ශබ්ද ගන්ධ රස ස්පර්ශයන් හමුවීමෙහි දී ශ්‍රෝත්‍රවිඥාන ඝ්‍රාණවිඥාන ජිහ්වාවිඥාන කාය විඥාන සම්ප්‍රතිච්ඡන්න සන්තීරණ තදරම්මණයන් ඇති වීමට ද මනෝද්වාරයෙහි තදරම්මණයන් ඇති වීමට ද ඒ අතීත දන චේතනාව ප්‍රත්‍යය වේ. චක්ෂුර්විඥානාදි ඒ චිත්තයෝ අතීත කර්ම හේතුවෙන් උපදනා චිත්තයෝ ය. මෙසේ එක් කුශල චේතනාවකින් අනාගතයෙහි බොහෝ කර්මජ රූපයන් හා චිත්තචෛතසික ධර්මයෝ ඇති කරනු ලැබෙත්.

ප්‍රත්‍යය ධර්මයා ගේ නිරෝධයෙන් පසු ප්‍රත්‍යය ධර්මය නැතිව අනාගතයේ දී යම්කිසි ඵලයක් ඇති කරන බව තේරුම් ගැනීමට දුෂ්කර වූ ගැඹුරු කරුණෙකි. අඹ ඇටයක් රෝපණය කළ කල්හි එයින් අඹ පැලයක් ඇති වේ. අඹ පැලය අඹ ඇටය තිබියදී ම හට ගත් බැවින් එය අඹ ඇටයෙන් හටගත් බව ප්‍රකට ය. අඹ පැලය ක්‍රමයෙන් වැඩී වර්ෂ ගණනකින් මහ අඹ ගසක් වේ. අඹ ඇටය දිරා නොබෝ කලකින් අභාව ප්‍රාප්ත වේ. ඒ ගසෙහි අඹ ඵල හටගන්නා කාලය වන විට රෝපනය කළ අඹ ඇටයෙන් කිසිවක් ඉතිරිවී නැත්තේ ය. එහෙත් ඒ ගසෙහි අන්‍යඵල වර්ගයක් නො හට ගෙන අඹ ඵල ම හටගන්නේ එවකට නැත්තා වූ රෝපණය කල අඹ ඇටය නිසාම ය. ඒ ගසෙහි වර්ෂයෙන් වර්ෂය යම් පමණ අඹ ඵල හටගන්නේ නම් ඒ සියල්ලම හටගන්නේ රෝපණය කළ අඹ ඇටය නිසාම ය. ඵලය හටගන්නා කාලයෙහි නැත්තා වූ අතීත චේතනාව ප්‍රතිසන්ධි භවාඞ්ගාදි චිත්තයන් හා කර්මජ රූපයන් හටගැනීමට හේතුවන බව නැත්තා වූ අතීත අඹ ඇටය බොහෝ අඹ ඵල වලට හේතු වන්නාක් මෙන් දත යුතු ය.

කුශලාකුශල කර්මය වනාහි එකෙණෙහිම ඵලය උපදවන්නේ හෝ නිරන්තරයෙන් ඵලය උපදවන්නේ හෝ නොවේ. එය කවද හෝ අවකාශය ලත් විටෙක සුදුසු අවස්ථාවෙහි ම ඵලය උපදවන්නේ ය. විපාක

Non-commercial distribution

චිත්ත චෛතසිකයෝ නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය සංඛ්‍යාත අතීත කර්ම ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ද විපාක චිත්ත සම්ප්‍රයුක්ත වර්තමාන චේතනා වූ සහජාත කර්ම ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ද වෙති. කුශලාකුශල ක්‍රියා නාමස්කන්ධයෝ ඒ ඒ චිත්තයන් හා සම්ප්‍රයුක්ත චේතනාව ගේ වශයෙන් සහජාත කර්මප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙති.

**කරොති පටිසඞ්ඛරොතී ති කම්මං** කර්තෘසාධන විග්‍රහ යි. කර ධාතුව කෙරෙන් රම්ම ප්‍රත්‍යය ව අනුබන්ධ රකාරය හා ධාත්වන්ත රකාරය ද ලොප් ව කම්ම කියා වේ. යම් ධර්මයක් තෙමේ සහජාත ධර්මයන් පිළියෙල කෙරේ ද ඒ ධර්මය කම්ම නම් වේ. චේතනාව උපදනා කල්හි එයට අනුව එය නිසා එය හා බැඳී උපදනා බොහෝ චිත්ත චෛතසිකයන් උපදනා බැවින් එය සහජාත ධර්මයන් පිළියෙල කරන්නක් වැනි ය. **පච්චයුප්පන්නෙන සහජායතී ති සහජාතං, සහජාතං ච තං කම්මඤ්චාති සහජාත කම්මං, විපාක ක්ඛණතො අඤ්ඤස්මිං ඛණෙ නිබ්බත්තං නානාක්ඛණිකං** තද්ධිත විග්‍රහයයි. **නානාක්ඛණිකං ච තං කම්මං චාති නානාක්ඛණික කම්මං.**

## (14) විපාක ප්‍රත්‍යය.

දනාදි වූද ප්‍රාණඝාතාදි වූ ද ඒ ඒ ක්‍රියා සිදු කිරීම් වශයෙන් උපදනා වූ කුශලාකුශල ක්‍රියා චිත්ත චෛතසිකයෝ සඤ්ජානන විජානනාදි තම තමා අයත් කෘත්‍යය විෂයෙහි උත්සාහය ඇත්තාහු වෙති. උත්සාහය ඇත ය යි කියනුයේ වීර්‍ය්‍ය චෛතසිකය ගැන නො වන බව ද සැලකිය යුතු ය. මෙහි උත්සාහය ය යි කියනුයේ ඒ ඒ ධර්මයට අයත්වූ ක්‍රියාමය වේගයා ගේ අධික භාවයට ය. ක්‍රියාමය වේගය හීන වූ දුබල චිත්ත චෛතසිකයෝ දනාදි විශේෂ ක්‍රියා සිදු කිරීමට නො සමත් වන්නා හ. විපාක චිත්තචෛතසිකයෝ වනාහි උත්සාහයෙන් තොර ව අතීත කුශලාකුශලකර්මයන් නිසා උපදනා ධර්මයෝ ය. එබැවින් ඒවායේ සඤ්ජානන විජනනාදි ක්‍රියාමය වේගය ඉතා හීන ය. දනාදි විශේෂ ක්‍රියා සිදු කිරීම් වශයෙන් නූපදනා වූ ඒ විපාක චිත්තචෛතසිකයනට කුශලාකුශල ක්‍රියා චිතත චෛතසිකයන්ට සේ මහත් වූ ක්‍රියාමය වේගයක් වුවමනා ද නැත. ඒ විපාක චිත්තචෛතසිකයෝ නිරුත්සාහයෙන් යුක්ත වන බැවින් ශාන්ත ද වෙති. චිත්ත චෛතසිකයන්ගේ ශාන්ත භාවය දෙපරිද්දකින් වේ. කෙලශප්‍රහාණය සිත ශාන්ත වීමේ එක් හේතුවකි. ධ්‍යානලාභීන් ගේ හා ආර්‍ය්‍යයන් ගේ සිත කෙලශප්‍රහාණය නිසා ශාන්ත ය. විශේෂයෙන් ම රහතුන්ගේ සිත ඒ නිසා ශාන්ත ය. වේගමන්දතාව නිසා ද චිතතචෛතසිකයෝ ශාන්ත වෙති. විපාකචිත්තයන් ගේ ශාන්ත භාවය කෙලශප්‍රහාණයෙන් නොව වේගමන්දතාව නිසා ඇති ශාන්ත භාවයෙකි.

Non-commercial distribution

නිරුත්සාහ ශාන්තභාවය ඇති බැවින් විපාක චිත්තයන් උපදනා බව ද දැන ගැනීමට දුෂ්කර ය. නිදන තැනැත්තාට රාත්‍රිය මුළුල්ලෙහි ම භවාඞ්ග සිත් ඇතිවන මුත් අති ශාන්ත බැවින් ඒවා ඇති වූ බව ඒ පුද්ගලයාට නො දනේ. රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍යයන් ගනිමින් පඤ්චද්වාර විථීවල උපදනා විපාක චිත්තයන් වූ පඤ්චවිඤ්ඤාන සම්ප්‍රතිච්ඡන්න සන්තීරණ තදාරම්මණ චිත්තයන් ගේ උත්පත්තිය ද නො දනෙන්නේ ය. ඒ අරමුණු ප්‍රකට වන්නේ ජවනචිත්තය නිසා ය. විපාකචිත්ත චෛතසිකයෝ ඔවුනොවුන්ට හා සහජාත රූපයන්ට ද තමාගේ නිරුත්සාහ ශාන්තභාවය ගන්වති. ඔවුනොවුන්ට හා සහජාත රූපයන්ට තමන් ගේ නිරුත්සාහ භාවය ගන්වන්නා වූ විපාක චිත්තචෛතසිකයෝ **විපාක ප්‍රත්‍යය ය.**

වේගයෙන් යන්නකුට හා සෙමින් යන්නකුට එකට ගමන් කළ නො හෙන්නාක් මෙන් එක් අරූප ධර්‍මරාශියක සකල ධර්‍මයන් ම වේග ප්‍රමාණයෙන් නො සම වූව හොත් අන්‍යෝන්‍ය සම්ප්‍රයෝගත්වයෙන් ඒ ධර්‍ම රාශියට නූපදිය හැකි ය. නො පැවතිය හැකි ය. අන්‍යෝන්‍ය සම්ප්‍රයෝගත්වයෙන් ඉපදිය හැකි වීමට පැවතිය හැකි වීමට එක් ධර්‍මරාශියක සකල ධර්‍මයන් ම සමත්වයෙන් සිටිය යුතු ය. විපාක චිත්තයට චෛතසික ධර්‍මයන් ගෙන් තොර ව නූපදිය හැකි ය. එ බැවින් එයට තමා හා බැඳී ඉපදීමට චෛතසිකධර්‍ම වුවමනා ය. වුවමනා වන්නේ ද තමා සේ ම නිරුත්සාහ ශාන්ත භාවයෙන් යුක්ත චෛතසිකයන් ය. එබැවින් විපාකචිත්තය තමන් හා බැඳී උපදනා චෛතසිකයනට තමා ගේ නිරුත්සාහ ශාන්තභාවය ගන්වන්නේ ය. චෛතසිකයෝ ද විපාක චිත්තයා ගේ නිරුත්සාහ ශාන්ත භාවය ගනිමින් එයට අනුකූල ව එය හා සම්ප්‍රයෝගත්වයෙන් උපදනාහ. නිරුත්සාහ ශාන්ත භාවයෙන් උපදනා වූ චෛතසිකයන්ට සම්ප්‍රයෝගත්වයට පැමිණ ඉපදීමට නිරුත්සාහ ශාන්තභාවයෙන් තමන් හා සමාන සිතක් ලැබිය යුතු ය. එ බැවින් චෛතසිකයෝ ද තමාගේ නිරුත්සාහ ශාන්තභාවය සිතට ගන්වන්නාහ. සිත චෛතසිකයන්ට තමා ගේ නිරුත්සාහ ශාන්ත භාවය දෙයි. චෛතසිකයෝ ද තමන් ගේ නිරුත්සාහ ශාන්ත භාවය සිතට දෙති. එක් විපාක ධර්‍මරාශියක සකලධර්‍මයෝ ම මෙ සේ තමන් ගේ නිරුත්සාහ ශාන්ත භාවය තමන් හා සම්ප්‍රයුක්ත වන අන්‍ය ධර්‍මයන්ට ගන්වන්නාහ. විපාක චිත්ත චෛතසික රාශියක අන්‍යයන් ගේ නිරුත්සාහ ශාන්ත භාවය නො ගත හොත් අන්‍යයන් හා සම්ප්‍රයෝගත්වයෙන් නූපදිය හැකි වන බැවින් ඒ නිරුත්සාහ ශාන්ත භාවය ගැන්වීම ගන්නා වූ ධර්‍මයන් ගේ ඉපදීමට උපකාරයකි. නිරුත්සාහ ශාන්තභාවය ගන්වන ධර්‍මය විපාක ප්‍රත්‍යය යි කියනුයේ එ හෙයිනි. විපාක චිත්තචෛතසිකයනට ඉපදීමට උපකාර වීම ම විපාක චිත්තජ රූපයන් ගේ හා ප්‍රතිසන්ධි කර්‍මජ

Non-commercial distribution

රූපයන්ගේ උත්පත්තියට ද උපකාර වීමකි. විපාක චිත්තචෛතසිකයන් නුපදිත හොත් ඒවාද නුපදනා බැවිනි. විපාක චිත්තජ රූපයන්ට හා ප්‍රතිසන්ධි කර්මජ රූපයනට අමුතු ශාන්තභාවයක් ගැන්විය යුතු බවක් නො කිය හැකි ය. ශාන්ත වූ විපාක චිත්තය නිසා උපදනා රූපයෝ ඒ චිත්තය සේ ම ශාන්ත ව උපදිති. ඒ රූපයන් ගේ ශාන්ත භාවය නම් ක්‍රියාසාධක චිත්තචෛතසිකයන් නිසා උපදනා රූප සේ ශරීරය නො සෙලවන බව ය. ක්‍රියාසාධක වූ කුශලාදි චිත්තයන් නිසා උපදනා රූපයන් ගෙන් ශරීරය සෙලවීම ද උස් පහත් කිරීම ද තද කිරීම ද නැවීම ද කරනු ලැබේ. විපාක චිත්තචෛතසිකයන් නිසා උපදනා රූප ශාන්තභාවයෙන් උපදනා බැවින් විපාක ධර්මයෝ ඔවුනොවුන්ට හා සහජාත ධර්මයනට ශාන්ත භාවය ගැන්වීම් වශයෙන් උපකාරක ධර්මයෝ යයි කියනු ලැබෙත්.

**විපච්චතී ති විපාකො** කර්තෘසාධන විග්‍රහ යි. වි පූර්ව පච ධාතුව කෙරෙන් ණ ප්‍රත්‍යය වැ ආදිස්වරයට වෘද්ධි හා ච කාරයට ක කාරාදේශ ද වීමෙන් විපාක කියා වේ. ළදරු අවස්ථාව ඉක්මවා පැසෙන්නා වූ ධර්ම විපාක නම් වේ. විපාක නම් පැසීමට පැමිණියා වූ කුශලා කුශල ධර්මයෝ ය. එය චතුර්විධ සමඞ්ගිතාවන් ගේ වශයෙන් විස්තර කළ යුතු ය. දීර්ඝ වන බැවින් මෙහි විස්තර නො කරනු ලැබේ.

"අඤ්ඤමඤ්ඤ විරුද්ධානං කුසලා කුසලානං පාකා විපාකා" යි ද,"අඤ්ඤමඤ්ඤ විසිට්ඨානං කුසලානං පාකා විපාකා යි ද, අඤ්ඤ මඤ්ඤ විසදිසානං කුසලා 'කුසලානං පාකා විපාකා" යි ද විපාක යනු විග්‍රහ කෙරෙති.

## (15) ආහාර ප්‍රත්‍යය.

ආහාර යනු සාමාන්‍යයෙන් ප්‍රත්‍යය ය යන අර්ථය දෙන වචනයෙකි. කබලිංකාරාහාර ය ඵස්ස ය මනෝසඤ්චේතනා ය විඤ්ඤාණ ය යන මේ ධර්ම සතරට ඒ නාමය විශේෂයෙන් ආරූඪ කර තිබේ. එ සේ කර තිබෙන්නේ ප්‍රත්‍යය වන අනේක ධර්මයන් අතුරෙන් ඒ ධර්ම සතර අතිරේක වශයෙන් ප්‍රත්‍යය වන බැවිනි. මේ ආහාර ප්‍රත්‍යය සූත්‍රාභිධර්ම පිටක දෙක්හි දක්වෙන්නේ ක්‍රම දෙකකට ය. වෙනස ඇත්තේ ප්‍රත්‍යය වන ආකාරය පිළිබඳව ය. සූත්‍රාභිධර්ම දෙක්හි ම ප්‍රත්‍යය වශයෙන් දක්වෙන ධර්මවල වෙනසක් නැත. සෞත්‍රාන්තික ක්‍රමයෙන් ප්‍රත්‍යය වන ආකාරය කිය යුත්තේ මෙසේ ය. කබලිංකාරාහාර සඞ්ඛ්‍යාත ඕජාරූපය ඕජාෂ්ටමක රූපකලාප උපදවයි. සම්පූර්ණ රූපකායයට උපස්තම්භකභාවයෙන් ද උපකාරක වේ.

Non-commercial distribution

ඵස්සාහාරය වේදනාත්‍රය උපදවයි. මනෝසඤ්චේතනාහාරය භවත්‍රය ඇතිකරයි. විඥානාහාරය ප්‍රතිසන්ධි නාමරූපයන් ඇතිකරයි. අරූපාහාර තුන මෙසේ වේදනාදිය ඇති කරමින් සත්ත්වයා පිළිබඳ වූ සකල නාමරූප ධර්මයන් ගේ පරම්පරා වශයෙන් පැවැත්මට උපස්තම්භනය කෙරේ. කබලිංකාරාහාරයේ අතිරේක කෘත්‍යය චතුජකායය පාලනය කිරීම ය. අරූපාහාරයන් ගේ අතිරේක කෘත්‍යය සත්ත්වයා පිළිබඳ වූ සකල රූපාරූප ධර්මසමූහය ම පාලනය කිරීමය.

සත්ත්වයා පිළිබඳ වූ රූපාරූපධර්මයන් ගේ නැවත නැවත ඇති වීමට හා පරම්පරා වශයෙන් වැඩීමට ද නො සිඳී පැවැත්මට ද ආහාරයෝ සතර දෙන බලවත් ප්‍රත්‍යය සතරෙකි. බීජයකට සමත්කම ඇත්තේ පැළයක් ඇති කිරීමට පමණෙකි. පැළය මහ ගසක් කර වීමට සමත් කමක් බීජයට නැත. බීජයෙන් ඇතිවූ පැළය පෘථිවිරස ආපෝරසයන් ගේ අනුග්‍රහයෙන් මහගසක් වී දීර්ඝ කාලයක් පවතී. එමෙන් කර්මයට විශේෂ වශයෙන් ශක්තිය ඇත්තේ ද පළමු කොට කර්මජරූප ඇති කිරීමට ය. ඒවායේ පරම්පරාව චිරකාලයක් පැවැත්වීමේ ශක්තිය කර්මයට නැත්තේ ය. එ බැවින් ඍතු ආහාරයන් ගේ අනුග්‍රහය නො ලද හොත් සත්ත්වයා මිය යන්නේ ය. කර්මජරූප පරම්පරාව සිඳෙන්නේ ය. කර්මජරූපපරම්පරාව චිරකාලයක් පවත්නේ ඍතු ආහාර දෙක්හි අනුග්‍රහයෙනි. ඍතුව ඒ කර්මජරූපයන් පාලනය කිරීමට සමත් වන්නේ ආහාරයා ගේ අනුග්‍රහය ලැබෙත හොත් පමණෙකි. ආහාරයා ගේ අනුග්‍රහය නො ලද හොත් කර්මජරූප පරම්පරාව සිඳෙන්නේ ය. කර්මජරූප පරම්පරාව සිඳී සත්ත්වයා මළ හොත් ඉතිරි රූප ද නො පවත්නේ ය. එ බැවින් ආහාරයා ගේ උපස්ථම්භනය රූපකායයා ගේ පැවැත්මට මහත් වූ ප්‍රත්‍යයෙකි.

පක්ෂීහු තුඩින් ආහාර ගනිමින් ඔවුන් ගේ ආත්මභාවය පවත්වති. ඉදින් තුඩ නැත්තේ නම් ආහාරය නැති ව වියලී ඔව්හු මැරෙති. එ මෙන් මේ සත්ත්වයෝ ස්පර්ශයෙන් ආරම්මණයන්හි රසය ගෙන වේදනා නමැති උපභෝග පරිභෝග රසය ගෙන එය ආස්වාදනය කෙරෙමින් එයට සතුටු වෙමින් සංසාරයෙහි නො කලකිරී සිටිති. ඉදින් ඵස්සය නැත්තේ නම් තෘෂ්ණාව ඇති වීමට වැඩීමට හේතුවක් නැති වී සංසාරය නැති වන්නේ ය. එ බැවින් සංසාර ප්‍රවෘත්තියට හෙවත් ස්කන්ධයන් ගේ අවිච්ඡින්න ප්‍රවෘත්තියට ඵස්සය මහත් වූ ප්‍රත්‍යයක් වේ. පක්ෂීහු පියාපත්වලින් වනයෙන් වනයට ගසින් ගසට යෙමින් ආහාර සපයා ගනිමින් තමන් ගේ ආත්මභාවයන් පවත්වති. ඉදින් පියාපත් නැත්තේ නම් නො යා හැකි ව ආහාරය නො ලබා ඒ ඒ තැන්වල ම මියයෙති. එමෙන් මේ සත්ත්වයෝ ද චේතනා සඞ්ඛ්‍යාත කර්මයෙන්

Non-commercial distribution

භවයෙන් භවයට යෙමින් අද දක්වා මේ සංසාරයෙහි හැසිරෙති. ඉදින් චේතනා සඞ්ඛ්‍යාත කර්‍මය නැත්තේ නම් ජාතියෙන් ජාතිය නැවත නැවත ඉපදීමක් නො වීමෙන් ස්කන්ධපරම්පරාව සිඳෙන්නේ ය. එ බැවින් ආධ්‍යාත්මික ස්කන්ධසන්තතියේ අවිච්ඡින්න ප්‍රවෘත්තියට මේ චේතනාව ද මහත් වූ ප්‍රත්‍යයක් වේ. පක්ෂීහු ඇස් වලින් යා යුතු දිශාවන් හා අනුභව කළ යුතු ආහාරයන් ද බලා ගනිමින් ඒ ඒ දිශාවන්ට පියාසර කරමින් ගොස් ආහාර සපයා ගනිමින් ජීවත් වෙති. ඉදින් ඇස නැත්තේ නම් යා යුතු දිශාවක් නො ලැබ ගත යුතු ආහාරයක් නො ලැබ ඔව්හු ඒ ඒ තැන්වල ම මිය යන්නාහ. එ මෙන් මේ සත්ත්වයෝ විඥානයේ උපකාරයෙන් අරමුණු ලැබ ඒ අරමුණු වල ස්පර්ශ වේදනා චේතනා දීන් උපදවා ත්‍රිවිධ වෘතය සම්පූර්ණ කරමින් අද දක්වා සසර හැසිරෙති. එ බැවින් විඥානය ද ස්කන්ධයන්ගේ අවිච්ඡින්න ප්‍රවෘත්තියට මහත් වූ ප්‍රත්‍යයක් වේ.

සත්ත්වසන්තානයට අයත් වූ හේත්වාරම්මණාදි සකලප්‍රත්‍යයන්ට හා ප්‍රත්‍යයෝත්පන්නයන්ට ද ප්‍රත්‍යය වන මේ ආහාර ප්‍රත්‍යයා ගේ මහත්ත්වය දක්වන සේක් තථාගතයන් වහන්සේ "**චත්තාරො මෙ භික්ඛවෙ ආහාරා භූතානං වා සත්තානං ඨිතියා සම්භවෙසීනං වා අනුග්ගහාය**" යනුවෙන් "මහණෙනි! උපන් සත්ත්වයන් ගේ පැවැත්මට ද උපදින්නට සිටින සත්ත්වයන්ට අනුග්‍රහය පිණිස ද මේ ආහාරයෝ සතර දෙනෙක් වන්නාහ" යි වදාළ සේක.

ආහාර සතර අතුරෙන් කබලිංකාරාහාරයා ගේ මහත් වූ කෘත්‍යය රූප කයට උපස්තම්භනය කිරීම ය. එ බැවින් පට්ඨාන ප්‍රකරණයෙහි කබලිංකාරාහාරය ආහාරජරූපයන්ට ප්‍රත්‍යය වීම ගැන සඳහන් නො කොට "කබලිංකාරො ආහාරො ඉමස්ස කායස්ස ආහාර පච්චයෙන පච්චයො" යි කබලිංකාරාහාරය චතුසමුට්ඨානික රූප කයට ප්‍රත්‍යය වන බව වදරා තිබේ. අරූපාහාරයන් ගේ වේදනාදි ඒ ඒ ධර්‍මයන්ට වෙන් වශයෙන් ප්‍රත්‍යය වීමක් පට්ඨානයෙහි වදරා නැත. එසේ ම අරූපාහාරයන් අසහජාත ධර්‍මයන්ට ප්‍රත්‍යය වන බවකුත් එහි වදරා නැත. "අරූපිනො ආහාරා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ආහාර පච්චයෙන පච්චයො" යි අරූපාහාරයන් සම්ප්‍රයුක්ත ධර්‍මයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන බව පමණක් පට්ඨාන පච්චය නිද්දෙසයෙහි වදරා තිබේ. "පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා ආහාරා සම්පයුත්තකානං ඛන්ධානං කටත්තා ච රූපානං ආහාර පච්චයෙන පච්චයො" යි ප්‍රතිසන්ධික්ෂණයෙහි අරූපාහාරයන් සම්ප්‍රයුක්තධර්‍මයන්ට හා තමන් හා උපදනා කර්‍මජරූපයන්ට ද ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන බව වදරා තිබේ. එක් එක් සම්ප්‍රයුක්ත ධර්‍ම

Non-commercial distribution

රාශියක ඇති ධර්මයන් සහජාත සම්ප්‍රයුක්ත අන්‍යෝන්‍ය නිඃශ්‍රය අස්ති අවිගතාදි ශක්තිවලින් යෙදෙන පරිදි සහජාත නාමරූපයන්ට ප්‍රත්‍යය වෙමින් ම සහජාත ධර්මයන් ගේ ඉපදීමට හා බලවත් වීමට ද විශේෂයෙන් ප්‍රත්‍යය වෙති. ඵස්සාදි ධර්ම තුනෙහි ම නො වෙනස් ව පවත්නා වූ ආහාර ශක්තිය නම් වූ විශේෂ ශක්තියක් නැත. ඵස්සයෙහි ආහාර ප්‍රත්‍යය ශක්තිය හැටියට කිය යුත්තේ ද එහි ඇති ආරම්මණය හා සැපෙන ස්වභාවය ම ය. චේතනාවෙහි ආහාර ප්‍රත්‍යය ශක්තිය සැටියට කිය යුත්තේ ද එහි ඇති උත්සාහ භාවය ම ය. විඤ්ඤාණයා ගේ ආහාර ප්‍රත්‍යය ශක්තිය සැටියට කිය යුත්තේ ද එහි ඇති ආරම්මණ විජානන ස්වභාවය ම ය. ඒ ශක්තීහු සාමාන්‍යයෙන් සහජාත නාමරූපයන් හට ජනකත්වයෙන් ද විශේෂයෙන් උපස්ථම්භකත්වයෙන් ද උපකාර වෙති. ආහාරයන්ගේ ජනක ශක්තිය නිසා සහජාත නාමරූපයෝ උපදිති. ආහාරයන් ගේ උපස්ථම්භක ශක්තිය නිසා උපදින සහජාත ධර්මයෝ ස්කන්ධයන් ගේ අවිච්ඡෙද ප්‍රවෘත්තියට උපකාර විය හැකි ලෙසට බලවත් ව උපදිති.

රූපාහාර ප්‍රත්‍යයා ගේ ත්‍රිරාශියෙහි දක්වෙන ක්‍රම දෙකින් පළමුවන ක්‍රමය ඕජාරූපයෙහි ඇති ජනකත්වයා ගේ වශයෙන් දක්වන ලද්දකි. ප්‍රත්‍යය වන බාහිර ඕජාව වශයෙන් ගතයුත්තේ ද සෘතුජ ඕජාව ය. කර්මජ චිත්තජ ආහාරජ රූපයන් හි ඇත්තා වූ ඕජාව ගිලින්නට ලැබෙන්නේ සර්පාදීන්ට පමණෙකි. සර්පයකු විසින් පණ ඇති මැඩියකු ගිලි කල්හි ඒ මැඩියා සර්පකුක්ෂියෙහි ජීවත් වන තෙක් උගේ ශරීරයෙහි කර්මාදි ප්‍රත්‍යය සතරෙන් ම හටගන්නා වූ රූප ඇත්තේ ය. එහෙත් මැඩියා ජීවත් ව සිටින තෙක් උගේ ශරීරයේ ඇති ඕජාවෙන් සර්පශරීරයේ ආහාරජ රූපයෝ නූපදිති. මැඩියා ගේ ශරීරයෙහි ඇති ඕජාව සර්පශරීරයේ පැතිර ආහාර සමුට්ඨානික රූප උපදින්නේ මැඩියා මැරී උගේ ශරීරය සුණු වී ගිය පසු වය. මැඩියා ගේ ශරීරයෙන් ඒ අවස්ථාව වන තෙක් ඉතිරි වන්නේ සෘතුජ රූප පමණෙකි. එ බැවින් කර්මාදි ප්‍රත්‍ය තුනෙන් හටගත් ඕජාව ගිලින ලදුයේ ද ආහාර ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන අවස්ථාවක් නො ළඹෙන බව දත යුතු ය.

රූපාහාර ප්‍රත්‍යයේ ත්‍රිරාශිය දක්වා තිබෙන දෙවන ක්‍රමය ඕජා රූපයා ගේ උපස්තම්භකත්වය අනුව දක්වන ලද්දකි. කර්මාදි ප්‍රත්‍යය සතරෙන් ම හටගත්තා වූ රූපයන්හි ඇත්තා වූ ද අනුභව කළ ආහාරයෙහි ඇත්තා වූ ද සකල ඕජා රූපයෝ ම ශාරිරික සකල රූපයන්ට ම උපස්තම්භනය කිරීම් වශයෙන් ප්‍රත්‍යය වෙති. බාහිර ඕජාව සත්ත්වයා ගේ ශරීරයට පැමිණෙන්නට මත්තෙන් කර්මාදි ප්‍රත්‍යය තුනෙන් හටගත් ඕජාවන් ගෙන් සත්ත්ව ශරීරය පාලනය කරනු ලැබේ. බාහිර ඕජාව

Non-commercial distribution

ශරීරයට පැමිණි තැන් පටන් ඒ බාහිර ඕජාව ය, චතුසමුට්ඨානික වූ ආධ්‍යාත්මික ඕජාව ය යන සිල්ලෙන් ම ශරීරය පාලනය වේ. ශාරීරික රූපකලාපයන් ගෙන් එක් එක් කලාපයක ඇති ඕජා රූපය ඒ කලාපයේ ඉතිරි රූපයන්ට හා අන්‍ය සකල ශාරීරික රූපයන්ට ද ප්‍රත්‍යය වේ. චතුසමුට්ඨානික රූපකලාපයන්හි ඇති ඕජා රූපයෙන් අන්‍ය රූපයෝ රූපාහාර ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ පමණක් වෙති. ඒ කලාපවල ඇති ඕජාරූපයෝ තමන් ප්‍රත්‍යය වීමෙන් ආහාර ප්‍රත්‍යය ද වෙති. එක් කලාපයක ඕජාව අන්‍ය කලාපයක ඕජාවට ද උපස්තම්භක වන බැවින් ආහාර ප්‍රත්‍යයෝත්පන්නයෝ ද වෙති.

**ඔජාට්ඨමකරූපාදයො. ආහරතී ති ආහාරො** කර්තෘසාධන විග්‍රහ යි. ආ පූර්ව හර ධාතුව කෙරෙන් ණ ප්‍රත්‍යය ව ආහාර යි සිඩ ය. යම් ධර්මයක් තෙමේ ඕජාෂ්ටමක රූපාදිය උපදවා ද එය ආහාර නම් වේ.

## (16) ඉන්ද්‍රිය ප්‍රත්‍යය

තමන් හා සම්බන්ධ ධර්මයනට තමන් අයත් කෘත්‍යයෙහි තමන් ගේ ස්වභාවය ඉක්මවන්නට නො දී තමන්ට අනුකූල කරවන්නා වූ ධර්මයෝ ඉන්ද්‍රිය යෝ ය. චක්ෂුඃප්‍රසාදය එක් ඉන්ද්‍රියයකි. එය දර්‍ශනකෘත්‍යයෙහි චක්ෂුර්විඥානය කෙරෙහි තමා ගේ අධිපති බව පවත්වයි. චක්ෂුඃප්‍රසාදය දීප්තිමත් වේ නම් එහි පිරිසිදු ලෙස රූපාරම්මණය ගන්නා චක්ෂුර්විඥාන යෝ උපදිති. චක්ෂුඃප්‍රසාදය අඳුරු වූවහොත් එහි මැනවින් රූපාරම්මණය ගැනීමට නො සමත් වූ චක්ෂුර්විඥානයෝ උපදිති. චක්ෂුඃප්‍රසාදය යහපත් වන කල්හි අරමුණ වැරදි සැටියට ගන්නා චක්ෂුර්විඥානයෝ එහි නූපදිති. එසේ ම චක්ෂුඃප්‍රසාදය අඳුරු කල්හි ආරම්මණය පැහැදිලි ලෙස ගැනීමට සමත් වූ චක්ෂුර්විඥානයෝ එහි නූපදිති. අඳුරු වූ චක්ෂුඃප්‍රසාදයෙහි අරමුණ පිරිසිදු ලෙස ගන්නා චක්ෂුර්විඥානයන් නූපදින්නේ ද සුන්දර චක්ෂුඃප්‍රසාදයෙහි අරමුණ වරදවා ගන්නා චක්ෂුර් විඥානයන් නූපදින්නේ ද චක්ෂුර්විඥානයන්ට ප්‍රසාද රූපයේ ස්වභාවය නොයික්මවිය හැකි බැවිනි. චක්ෂුර්විඥානයන්ට ප්‍රසාදයේ ස්වභාවය නොයික්ම විය හැකි වන්නේ එය දර්‍ශනයෙහි ඊශ්වරත්වය පවත්වන බැවිනි. චක්ෂුර්විඥානය සැම කල්හි ම එයට අනුකූල ව පැවතිය යුතු ය. ශ්‍රෝත්‍රප්‍රසාදදියෙහි ඇති ඊශ්වරත්වය ද චක්ෂුඃප්‍රසාදදිය අනුව තේරුම් ගත යුතු ය. චක්ෂුඃප්‍රසාදය සේ තමා ඇසුරු කරන අරූප ධර්මයන් තමාට අනුකූල කරවන්නා වූ ද තමන් හා එක්ව උපදනා රූපාරූප ධර්මයන්

Non-commercial distribution

තමන්ට අනුකූල කර වන්නා වූ ද රූපාරූප ධර්මයෝ ඉන්ද්‍රියයෝ ය රජුගේ ඊශ්වරත්වය රටවැසියා ගේ පැවැත්මට උපකාර වන්නාක් මෙන් ඉන්ද්‍රිය ධර්මයන් ගේ ඊශ්වරත්වය ඒවා හා සම්බන්ධ ධර්මයන් ගේ ඉපදීමට උපකාර වේ. ඉන්ද්‍රිය ප්‍රත්‍යය යි කියනු යේ ඊශ්වරත්වයෙන් තමන් හා සම්බන්ධ රූපාරූප ධර්මයනට උපකාරවන ධර්මයන්ට ය. ඉන්ද්‍රිය නාමයෙන් හඳුන්වන ධර්ම දෙවිස්සෙකි. දෙවිසි ඉන්ද්‍රිය ධර්මයන් අතුරෙන් ඉන්ද්‍රිය ප්‍රත්‍යය වන්නෝ ධර්ම විස්සකි. ස්ත්‍රීන්ද්‍රිය පුරුෂින්ද්‍රිය දෙක ඉන්ද්‍රිය ප්‍රත්‍ය නො වේ.

**ප්‍රත්‍යය වශයෙන් ගණන්ගනු ලබන්නෝ ජනකත්වය හෝ උපස්තම්භකත්වය හෝ අනුපාලකත්වය හෝ ඇත්තා වූ ධර්මයෝ ය.** යම් ධර්මයක ඒ තුනෙන් එකකදු නැත්තේ නම් ඒ ධර්මය ප්‍රත්‍යයක් ලෙස ගණන් ගනු නො ලැබේ. භාව රූප දෙක්හි ඒ තුනෙන් එක කුදු නැත්තේ ය. එබැවින් භාවරූප දෙක ඉන්ද්‍රිය වතුදු ඉන්ද්‍රිය ප්‍රත්‍යය නො වේ. භාවරූපයන් ගේ ඊශ්වරත්වය ඇත්තේ ස්ත්‍රීලිංග පුරුෂලිංගාදියට ය. මෙහි ලිංගය යි කියන ලදුයේ ස්ත්‍රීපුරුෂ ආකාරයන්ට ය. භාව රූපයෝ අන්‍යහේතූන්ගෙන් උපදනා රූපයනට ස්ත්‍රී ආකාරාදිය ගන්වති. භාවරූපයට අනුකූල ව අන්‍ය හේතූන් ගෙන් හටගන්නා රූපයෝ ස්ත්‍රීපුරුෂ ආකාරයන් ගනිති. එ බැවින් භාවරූපයෝ ඉන්ද්‍රිය වෙති. ඉන්ද්‍රිය ප්‍රත්‍යය තමා හා බැඳී උපදනා ධර්මයනට සැම කල්හි ප්‍රත්‍යය වන්නේ ය. එහි ප්‍රත්‍යය නො වී සිටින අවස්ථාවක් නැත්තේ ය. කලලාදි අවස්ථාවන්හි භාවරූපයන් ඇත ද එය නිසා ඇති වන ස්ත්‍රී ආකාරාදිය ඒ අවස්ථාවන්හි නැත. ඒ සේ නැත්තේ ඒවා ප්‍රත්‍යය නො වන ධර්ම නිසා ය යි ද කියති.

සහජාතින්ද්‍රිය ප්‍රත්‍යය, පූරේජාතින්ද්‍රිය ප්‍රත්‍යය, රූපජීවිතින්ද්‍රිය ප්‍රත්‍යය යි ඉන්ද්‍රිය ප්‍රත්‍යය තෙවැදෑරුම් වන බව ත්‍රිරාශියෙහි දක්විණි. තමන් හා එකවර උපදනා ධර්මයන්ට ප්‍රත්‍යය වන අරූපේන්ද්‍රිය ධර්මයෝ **සහජාතින්ද්‍රිය ප්‍රත්‍යය ය.** තමන් පළමු ඉපිද පසු ව උපදනා පඤ්චවිඤ්ඤාණයන්ට ප්‍රත්‍යය වන ප්‍රසාද රූපයෝ **පූරේජාතින්ද්‍රිය ප්‍රත්‍යය ය.** ජීවිතින්ද්‍රිය රූපය **රූප ජීවිතින්ද්‍රිය ප්‍රත්‍යය ය.** සහජාතින්ද්‍රිය ප්‍රත්‍යය වන අරූපේන්ද්‍රිය ධර්මයෝ තමන් ඉන්ද්‍රිය ශක්තියෙන් ප්‍රත්‍යය වන ධර්මයන්ට සහජාත ශක්තියෙන් ද ප්‍රත්‍යය වෙති. රූපජීවිතින්ද්‍රිය ඉන්ද්‍රියත්වයෙන් ප්‍රත්‍යය වන්නේ ද සහජාත රූපයනට ය. එහෙත් එය ප්‍රත්‍යය වන්නේ උත්පාදක්ෂණයෙහි දී නොව ස්ථිතික්ෂණයෙහිදී ය යි පට්ඨාන අටුවාවෙහි කීහ. මූලටීකාවෙහි එය ප්‍රතික්ෂේප කර තිබේ. එ බැවින් එය වැඩි දුරට ද විමසිය යුතු ය.

Non-commercial distribution

**ඉදති පරමිස්සරියං කරොතීති ඉන්ද්‍රියං**, ඉදි පරමිස්සරියෙ යන ධාතුව කෙරෙන් කර්තෲර්ථයෙහි ණ්‍ය ප්‍රත්‍යය ව ඉන්ද්‍රිය කියා වේ. ඊස්වරත්වය කරන්නේ ඉන්ද්‍රිය නම්. **ඊසති අභිභවතී ති ඉන්ද්‍රියං** යි ද විග්‍රහ කෙරෙති. ඊස අභිභවනෙ යන ධාතු යි. ණ්‍ය ප්‍රත්‍යය ව ඊකාරය හ්‍රස්ව ව නිරුක්ති නයින් ඉන්ද්‍රිය කියා වේ.

' "**ඉන්දලිඞ්ගට්ඨො ඉන්ද්‍රියට්ඨො, ඉන්ද දෙසිතට්ඨො ඉන්ද්‍රියට්ඨො, ඉන්ද දිට්ඨට්ඨො ඉන්ද්‍රියට්ඨො,ඉන්ද සිට්ඨට්ඨො ඉන්ද්‍රියට්ඨො, ඉන්ද ජුට්ඨට්ඨො ඉන්ද්‍රියට්ඨො**" යි විභඞ්ගාර්ථකථාවෙහි ඉන්ද්‍රිය ශබ්දාර්ථය දක්වූ පරිදි විග්‍රහ කළ යුත්තේ මෙ සේ ය.:–

**ඉන්දං ලිඞ්ගෙන්තී ති ඉන්ද්‍රියානි**, තද්ධිත විග්‍රහයි. ඉන්ද ශබ්දයා කෙරෙන් ඉය ප්‍රත්‍යය ව න්ද යන්නට න්ද්‍ර ආදේශ ව ඉන්ද්‍රිය කියා සිඩ යි. ඉන්ද යනු කුශලාකුශලයන්ට නමෙකි. ඉන්ද නම් වූ කුශලාකුශල කර්මය ප්‍රකාශ කෙරෙත් නුයි ඉන්ද්‍රිය නම් වේ.

**ඉන්දෙන සිට්ඨානී ති ඉන්ද්‍රියානි.** ඉන්ද නම් වූ කුශලාකුශල-කර්මයෙන් නිපදවන ලද්දහු ඉන්ද්‍රිය නම් වෙති. මේ වචනාර්ථ දෙකින් ම මුඛ්‍ය වශයෙන් කර්මජේන්ද්‍රියයෝ ගැනෙති. සෙස්සෝ සදෘශත්වයෙන් ගැනෙති. **ඉන්දෙන දෙසිතානි ඉන්ද්‍රියානි.** ඉන්ද යනු බුදුනටද නමෙකි. ඉන්ද නම් වූ තථාගතයන් වහන්සේ විසින් දේශනය කරන ලද්දහු ය යන අර්ථයෙන් ද ඉන්ද්‍රිය නම් වෙති.

**ඉන්දෙන දිට්ඨානි ඉන්ද්‍රියානි.** ඉන්ද නම් වූ තථාගතයන් වහන්සේ විසින් දක්නා ලද්දහු නුයි ඉන්ද්‍රිය නම් වේ. **ඉන්දෙන ජුට්ඨානී ති ඉන්ද්‍රියානි,** ඉන්ද නම් වූ තථාගතයන් වහන්සේ විසින් සේවනය කරන ලද්දහුනුයි ඉන්ද්‍රියයෝ නම් වෙති.

## (17) ධ්‍යාන ප්‍රත්‍යය

සාමාන්‍යයෙන් සියලු ම චිත්තචෛතසික ධර්මයෝ අරමුණු ගනිති. අරමුණක් නො ගෙන නුපදිති. නො පවතිති. එහෙත් ඒ ධර්මයන් අතුරෙන් විතක්කය. විචාරය, පීතිය, ඒකග්ගතාය, සෝමනස්සය, දෝමනස්සය, උපෙක්ඛාය යන ධර්මයෝ සත් දෙන විශේෂයෙන් අරමුණු ගනිති. ඔව්හු අරමුණ කරා යන්නාක් මෙන් අරමුණට පිවිසෙන්නාක් මෙන් අරමුණ දෙස බලන්නාක් මෙන් අරමුණ පිරිමදින්නාක් මෙන් විශේෂයෙන් ම අරමුණ ගැනීම කෙරෙති. සම්ප්‍රයුක්ත ධර්මයන් අතර අරමුණු ගැනීමෙහි

Non-commercial distribution

අධිකෝත්සාහයක් ඇත්තා වූ ද අරමුණු ගැනීමෙහි ප්‍රමුඛත්වය දරන්නාවූ ද ඒ ධර්‍මයෝ ධ්‍යාන නම් වෙති.

කුශලාකුශල දෙපක්‍ෂයෙහි හා අව්‍යාකෘත පක්‍ෂයෙහි ද්විපඤ්චවිඥනයන් ගෙන් අන්‍ය වූ සකලචිත්තචෛතසිකයන් ගේ අරමුණට යොමුවීම අරමුණ දෙස බැලීම අරමුණ ගනිමින් ඉපදීම ධ්‍යාන ධර්‍මයන් නිසා සිදු වන්නකි. ධ්‍යානධර්‍මයන් අරමුණ ගන්නා කල්හි එයට අනුව අරමුණ ගනිමින් සිත හා ඒ ඒ සිත්වල යෙදෙන අන්‍ය චෛතසිකයෝ ද උපදිති. තමන් හා එක් ව ආරම්මණ ග්‍රහණය කිරීම් වශයෙන් උපදනාවූ සම්ප්‍රයුක්ත ධර්‍මයනට උපකාර වන්නා වූ ඒ ධ්‍යාන ධර්‍මයෝ **ධ්‍යාන ප්‍රත්‍යය නම් වෙති.**

චිත්තය චිත්තජරූපයන් උපදවන්නේ තනි ව නො ව සම්ප්‍රයුක්ත ධර්‍මයන් ද සමග ය. ධ්‍යානධර්‍මයන් ද සිත හා එක් ව චිත්තජ රූප ඉපදවීමට හා ප්‍රතිසන්ධි කර්‍මජරූප ඉපදවීමට ද සහභාගී වන බැවින් ඔව්හු සම්ප්‍රයුක්තධර්‍මයන්ට පමණක් නො ව චිත්තජරූප ප්‍රතිසන්ධි කර්‍මජ රූපයනට ද ප්‍රත්‍යය වෙති.

රූපාදි ආරම්මණයන් චක්ෂුරාදි වස්තූන්හි සැපීම නිසා ඒ ස්ථානවල උපදනා වූ ද්විපඤ්චවිඥානයෝ ආරම්මණ ග්‍රහණෝත්සාහයෙන් උපදනාහු නො වෙති. එ බැවින් ද්විපඤ්චවිඥානයන්හි ඇති ඒකාග්‍රතා සුඛ දුඃඛෝපේක්ෂාවෝ ධ්‍යාන ප්‍රත්‍යය භාවයෙන් නො සලකනු ලැබෙත්.

ආරම්මණං උපනිජ්ඣායතී ති ඣානං, පච්චනීකධම්මෙ ඣාපෙතී ති ඣානං, කත්තෘසාධන විග්‍රහයෝ ය. ඣෙ ධාතුව කෙරෙන් යු ප්‍රත්‍යය ව ඣාන කියා සිද්ධ වේ. ආරම්මණය එළඹ බලන්නේ ය යන අර්ථයෙන් ද ප්‍රතිපක්‍ෂ ධර්‍මයන් දවන්නේ ය යන අර්ථයෙන් ද ඣාන නම් වේ. ද්විතීයාර්ථය යෙදෙන්නේ රූපාවචරාරූපාවචර ලෝකෝත්තර ධ්‍යානයන්ට ය.

## (18) මාර්ග ප්‍රත්‍යය.

සත්ත්වයා ගේ චිත්තය ඒ ඒ අවසථාවල දී කුශලකර්මාභිමුඛ ව ද අකුශලකර්මාභිමුඛව ද දුර්ගත්‍යාභිමුඛ ද සුගත්‍යාභිමුඛ ව ද නිර්වාණාභිමුඛ ව ද පවත්නේ ය. චිත්තය කුශලාකුශල කර්මාදි ඒ ඒ දිශාවන්ට හැරෙන්නේ එයට උපාය වන සම්මාදිට්ඨි, සම්මාසංකප්ප, සම්මාවාචා,

Non-commercial distribution

සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි, මිච්ඡාදිට්ඨි, මිච්ඡාසංකප්ප, මිච්ඡාවායාම, මිච්ඡාසමාධි යන ධර්‍මයන් නිසා ය. සිතට ඒ ඒ දිශාවට හැරීමට උපාය වන බැවින් ඔව්හු මග්ග නම් වෙති. මෙහි මග්ගයන්නෙහි තේරුම උපාය ය යනු යි. සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පාදිය නිසා සිත කුශල කර්‍මාභිමුඛ වෙයි. කුශලකර්‍මාභිමුඛවීම් වශයෙන් සුගතියට හෝ නිර්‍වාණයට හෝ අභිමුඛ ද වෙයි. මිච්ඡාදිට්ඨි මිච්ඡාසංකප්පාදිය නිසා සිත පාපපක්‍ෂයට අභිමුඛ වෙයි. පාපක්‍රියාභිමුඛ වීම් වශයෙන් ම දුර්‍ගත්‍යාභිමුඛද වේ. මෙහි චිත්තය යි කියන ලදුයේ ශුද්ධචිත්තයට නො ව සම්ප්‍රයුක්තධර්‍ම සහිත වූ චිත්තයට ය. සම්ප්‍රයුක්ත ධර්‍මසහිත වූ චිත්තයට ඒ ඒ දිශාවට අභිමුඛ ව ඉපදීමට පැවැත්මට උපකාරක වන බැවින් සම්මාදිට්ඨි ආදි ධර්‍මයෝ දෙළොස් දෙන මාර්‍ග ප්‍රත්‍යය නම් වෙති.

ත්‍රිරාශියෙහි මාර්‍ගප්‍රත්‍යය වශයෙන් ධර්‍ම නවයක් දක්වා ඇත්තේ සම්මාසංකප්ප මිච්ඡාසංකප්ප දෙක ධර්‍ම වශයෙන් එක ම විතර්‍ක චෛතසිකය ද, සම්මාවායාමු මිච්ඡාවායාම දෙක එක ම වීර්‍ය්‍ය චෛතසිකය ද, සම්මාසමාධි මිච්ඡාසමාධි දෙක එක ම ඒකාග්‍රතා-චෛතසිකය ද වන බැවිනි.

අහේතුක චිත්තයෝ හේතු විරහිතත්වයෙන් දුබලයෝ ය. එ බැවින් ඒ චිත්තයන්හි කල්‍යාණකර්‍ම පාපකර්‍මාදීන්ට මාර්‍ග නො වෙති. එ බැවින් ත්‍රිරාශියෙහි සහේතුක චිත්තයන්හි ලැබෙන මාර්‍ගාඞ්ගයන් පමණක් මාර්‍ගප්‍රත්‍යය භාවයෙන් දක්වා තිබේ.

සූත්‍රධර්‍මයන්හි මිච්ඡාවාචා මිච්ඡාකම්මන්ත මිච්ඡාආජීව මිච්ඡාසති යන මේවා ද මාර්‍ගාඞ්ග වශයෙන් දක්වා තිබේ. ඒවා ඒ ආකාරයෙන් පවත්නා අකුශල චිත්තෝත්පාදයන් මිස වෙන් වූ චෛතසික ධර්‍ම නො වන බැවින් මාර්‍ග ප්‍රත්‍යය වශයෙන් නො ගන්නා ලදී.

පට්ඨාන අටුවාවෙහි මාර්‍ග ප්‍රත්‍යය නිර්දේශ වර්‍ණනාවෙහි ඇතැම් පිටපත්වල "**අහෙතුක චිත්තුප්පාද වජ්ජෙසු සෙස චිත්තෙසු උප්පන්නානි පඤ්ඤා, විතක්කො, සම්මාවාචා, සම්මාකම්මන්තාජීවා, විරියං, සති, සමාධි, මිච්ඡාදිට්ඨි මිච්ඡාවාචා කම්මන්තාජීවා ති ඉමානි ද්වාදසඞ්ගානි**" යනුවෙන් මාර්‍ගාඞ්ග දක්වා තිබේ. ඇතැම් පිටපත් වල "**පඤ්ඤා, විතක්කො, සම්මාවාචා, සම්මාකම්මන්තාජීවා, විරියං, සති, සමාධි, මිච්ඡාදිට්ඨි, මිච්ඡා සඞ්කප්පො, මිච්ඡාවායාමො, *මිච්ඡා සමාධි***" යි මාර්‍ගාඞ්ග දොළොස දක්වා තිබේ. පට්ඨානපකරණ-

Non-commercial distribution

යෙහි මාර්ගාඞ්ගයෝ කොතෙක් ද කවරහු ද යන බව දක්වා නැත. ධම්මසඞ්ගණියෙහි අකුශල චිත්තයන්හි මාර්ගාඞ්ග වශයෙන් උදුරා දක්වා තිබෙන්නේ මිථ්‍යාදිට්ඨි, මිථ්‍යාසඞ්කප්ප, මිථ්‍යාවායාම, මිථ්‍යා-සමාධි යන සතර ය. එබැවින් පසු ව දක්වුණු පට්ඨාන අටුවාපාඨය ම ශුද්ධපාඨය සැටියට සැලකිය යුතු ය.

මාර්ගාඞ්ගයෝ කුශල අකුශල අව්‍යාකෘත වශයෙන් තෙවැදෑරුම් වෙති. ඔවුන් ගෙන් අකුශලමාර්ගාඞ්ගයෝ සම්ප්‍රයුක්තචිත්තය දුර්ගතියට අභිමුඛ කරවීම් වශයෙන් සත්ත්වයා දුර්ගතියට පමුණුවති. කුශල-මාර්ගාඞ්ගයෝ සම්ප්‍රයුක්තචිත්තය සුගතියට හා නිවණට යොමුකරවීම් වශයෙන් සුගති නිර්වාණයන්ට පමුණුවති. අව්‍යාකෘත මාර්ගාඞ්ගයන් ගේ සුගති දුර්ගති නිර්වාණයන්ට පැමිණවීමක් නැත. සුගත්‍යාදියට පැමිණවීමක් නො කරන අව්‍යාකෘත මාර්ගාඞ්ගයන් මාර්ග ප්‍රත්‍යය භාවයෙන් වදරා තිබීමේ කාරණය විශේෂයෙන් සැලකිය යුත්තකි. මාර්ගාඞ්ග දොළොස අතුරෙන් මිථ්‍යාදිට්ඨි මිථ්‍යාසඞ්කප්ප මිථ්‍යාවායාම මිථ්‍යාසමාධි යන සතර අකුශල පක්ෂයෙහි ම මිස අව්‍යාකෘත පක්ෂයෙහි නො ලැබේ. සම්මාදිට්ඨි සම්මාසඞ්කප්පාදි අටදෙන කුශලාව්‍යාකෘත දෙපක්ෂයෙහි ම ලැබෙත්. සම්මාදිට්ඨි ආදීන් ගේ නිවැරදි ලෙස දැකීමාදි යම් ලක්ෂණයක් වේනම් ඒ ලක්ෂණ කුශලාව්‍යාකෘත දෙපක්ෂයට ම ගිය මාර්ගාඞ්ගයන් හි වෙනසක් නැති ව ඇත්තේ ය. එ බැවින් කුශලාව්‍යාකෘත දෙපක්ෂයෙහි ම මාර්ගාඞ්ග ධර්මයෝ සහජාත නාමරූපයනට මාර්ගප්‍රත්‍යය වෙති. ප්‍රත්‍යය විකලත්වය නිසා අව්‍යාකෘත ධර්මයන් ගෙන් සුගති නිර්වාණයන්ට පැමිණවීමේ කාර්‍ය්‍යය සිදු නො වේ.

විපාක චිත්තයෝ උත්සාහයෙන් තොර ව කර්මවේගයෙන් ඇති වන්නෝ ය. එබැවින් විපාක චිත්තසම්ප්‍රයුක්ත චේතනාව නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය භාවයට නො පැමිණෙත්. මාර්ගාඞ්ගයන් සුගත්‍යාදියට පැමිණවීමට සමත් වන්නේ නානාක්ෂණික කර්මප්‍රත්‍යය වන චේතනාවක් හා බැඳී උපන් කල්හි ය. එසේ නො වන කල්හි ඔවුහු සුගත්‍යාදියට පැමිණවීමට නො සමත් වෙති. ක්‍රියා චිත්තයන් උපදනේ සුගත්‍යාදියට පැමිණීමට තිබිය යුතු අනුශයයන් නැත්තා වූ රහතුන් ගේ සන්තානයෙහි ය. එ බැවින් ක්‍රියාචිත්ත සම්ප්‍රයුක්ත මාර්ගාඞ්ගයෝ සුගතියට නො පමුණුවති. ඒ රහතුන් ගේ සන්තානයන්හි ප්‍රහාණය කළ යුතු කෙලෙශයක් නැති බැවින් ක්‍රියා චිත්ත සම්ප්‍රයුක්ත මාර්ගාඞ්ගයෝ නිවණට පැමිණ වීම ද සිදු නො කෙරෙති. මාර්ගාඞ්ගයන්ගේ සහජාත රූපයනට ප්‍රත්‍යය වීම ධ්‍යානප්‍රත්‍යය විස්තරයෙහි දක් වූ පරිදි දත යුතු ය.

Non-commercial distribution

**සුගතියා වා දුගතියා වා නිබ්බානස්ස වා අභිමුඛං මග්ගෙති පාපෙතී ති මග්ගො,** යම් ධර්මයක් තෙමේ සුගතිය ගේ හෝ දුගීතිය ගේ හෝ නිර්වාණයා ගේ හෝ අභිමුඛයට සම්ප්‍රයුක්ත ධර්මයන් පමුණුවා ද ඒ ධර්මය මග්ග නම් වේ. මග්ගධාතුව කෙරෙන් කර්තෲර්ථයෙහි අ ප්‍රත්‍යය ව මග්ග කියා වේ. මග්ග යන පදය නොයෙක් ආකාරයෙන් විග්‍රහ කරති.

## (19) සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය.

පෙර පසු නො වී එක වර ඉපදීම ය, එක වර ම නිරුද්ධ වීම ය, එක් අරමුණක් ගැනී ම ය, එක් වස්තුවක පිහිටීම ය යන ලක්ෂණ සතරෙන් හෝ එහි පූර්ව ලක්ෂණ තුනෙන් හෝ එකක් අනෙක තුළට පිවිසියාක් මෙන් එකකින් අනෙක ගිලගත්තාක් මෙන් ඒකත්වයට පැමිණියාක් මෙන් අන්‍යෝන්‍ය මිශ්‍රත්වයෙන් උපදනා වූ චිත්තචෛතසික ධර්මයන් ගේ ඒ මිශ්‍රත්වයට පැමිණෙන ස්වභාවය සම්ප්‍රයුක්තතාවය ය. මෙය අරූප ධර්මයන්හි මිස රූප ධර්මයන්හි නො ලැබෙන්නේ ය. පැහැයකට ද්‍රව්‍යයකින් තොර ව නො පැවතිය හැකි වන්නාක් මෙන් චිත්තචෛතසිකයන් ගෙන් එකකටවත් සම්ප්‍රයුක්ත වන තවත් ධර්ම නොලැබ හුදකලාව නො ඉපදිය හැකි ය චිත්ත චෛතසික යන්ගෙන් එක එකක ඉපදීමට තමන් හා සම්ප්‍රයුක්ත ව උපදනා ධර්ම බොහෝ ගණනක් ලැබිය යුතුය. සම්ප්‍රයුක්ත වන්නා වූ ධර්මය තමා සම්ප්‍රයුක්ත වන ධර්මයන්ගේ උත්පත්තියට මහත් වූ උපකාරයෙකි. සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය යයි කියනුයේ සම්ප්‍රයුක්ත වීම් වශයෙන් අන්‍ය ධර්මයනට උපකාර වන චිත්තචෛතසිකයනට ය. සම්ප්‍රයුක්ත භාවය අන්‍යෝන්‍ය වශයෙන් සිදුවන්නකි. අන්‍ය ධර්මයක් හා සම්ප්‍රයුක්ත වන ධර්මය තමා සම්ප්‍රයුකත වන ධර්මයා ගේ තමා හා සම්ප්‍රයුක්ත භාවය ද ලබන්නේ ය. චිත්තචෛතසික සියල්ලෙහි තමන් අන්‍යයන් හා සම්ප්‍රයුක්ත වන ස්වභාවය ද අන්‍යයන් ගේ සම්ප්‍රයුක්ත වීම තමන් ලබන්නා වූ පිළිගන්නා වූ ස්වභාවය ද ඇත්තේ ය. එක් එක් ධර්මයක් සම්ප්‍රයුක්ත වීම් වශයෙන් අන්‍ය ධර්මයන් හට උපකාර වෙමින් තමන් උපකාර වන ධර්මයන් ගේ සම්ප්‍රයුක්තත්වයෙන් තුමූ ද උපදිති. එබැවින් එක් ව උපදනා සකල චිත්තචෛතසිකයෝ ම සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ද වෙති. සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයෝත්පන්නයෝ ද වෙති. සම්ප්‍ර යුක්ත ප්‍රත්‍යය වන ධර්ම සියල්ල ම සහජාත ප්‍රත්‍යය ද අන්‍යෝන්‍ය ප්‍රත්‍යය ද වේ. ඒවායේ ලක්ෂණ හා ශක්ති වෙන වෙන ම තේරුම් ගත යුතු ය.

**අඤ්ඤමඤ්ඤං යුජ්ජන්තී ති යුත්තා.** යුජ ධාතුව කෙරෙන් ත ප්‍රත්‍යය ව යුත්ත කියා වේ. යම් ධර්ම කෙනෙක් ඒකත්වයට පැමිණෙන්නාක් මෙන් ඔවුනොවුන් සම්බන්ධ වෙද්ද ඒ ධර්මයෝ යුත්ත නම් වෙති.

Non-commercial distribution

සමං එකුප්පාදදීහි පකාරෙහි යුත්තා සම්පයුත්තා. සම ව එකෝත්පාදදි ප්‍රකාරයෙන් ඔවුනොවුන් සම්බන්ධ වන ධර්මයෝ සම්ප්‍රයුක්ත නම් වෙති.

## (20) විප්‍රයුක්ත ප්‍රත්‍යය.

පියුම් පත මත තිබෙන ජල බිඳුව පියුම් පතෙහි නො තැවරී ම තිබෙන්නාක් මෙන් රූපයන්හි ගැටී තිබෙන්නේ වී නමුත් රූපයන් හා මිශ්‍රත්වයට නො පැමිණෙන සවභාවයක් අරූප ධර්මයන්හි ඇත්තේ ය. එසේ ම අරූප ධර්මයන් හා මිශ්‍ර නො වන සවභාවයක් රූපයන්හි ද ඇත්තේ ය. ඒ මිශ්‍ර නො වන සවභාවය විප්‍රයුක්ත තාවය ය. විප්‍රයුක්ත භාවයෙන් ප්‍රත්‍යයෝත්පන්න ධර්මයනට උපකාර වන ධර්මයෝ විප්‍රයුක්ත ප්‍රත්‍යය නම් වෙති.

චිත්තචෛතසිකයන් ගෙන් එක එකකට ඉපදීමට තමන් හා සම්ප්‍රයුක්ත වන ධර්ම ලැබිය යුතුම ය. නො ලැබ ඒවාට නූපදිය හැකි ය. එබැවින් සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයෝත්පන්න යන්ට නැතිවම බැරි විශේෂ ප්‍රත්‍යයෙකි. රූපාරූප ධර්මයන්හි විප්‍රයුක්ත ශක්තියක් ඇත ද එය සම්ප්‍රයුක්ත ශක්තිය සේ අනෙකකට උපකාර වන ශක්තියක් සේ නො පෙනේ. පට්ඨාන අටුවාවෙහි දක්වෙන සැටියට සිතිය හැක්කේ මේ විප්‍රයුක්තප්‍රත්‍යය ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් ඔවුනොවුන් ගැටී උපදනා රූපාරූප ධර්මයන් ගේ අරූප ධර්මයන් ගේ මෙන් සම්ප්‍රයුක්ත භාවයක් නැති බව දක්වනු පිණිස වදළ ප්‍රත්‍යයක් බව ය. පට්ඨාන පාලියෙහි මේ ප්‍රත්‍යය විස්තර කර තිබෙන්නේ ද සහජාත නිඃශ්‍රය පශ්චාජ්ජාත ප්‍රත්‍යයන් හා සම්බන්ධ කොට ය.

චිත්තචෛතසිකයෝ ඔවුනොවුන්ට හා චිත්තජ රූපයන්ට සහජාත භාවයෙන් ප්‍රත්‍යය වෙති. ඒ ප්‍රත්‍යය වීමෙහි දී චිත්ත චෛතසිකයෝ ඔවුනොවුන්ට සම්ප්‍රයෝග භාවයෙන් ද ප්‍රත්‍යය වෙති. සම්ප්‍රයෝග භාවය ද චිත්ත චෛතසිකයන්ට වුවමනා උපකාරයෙකි. චිත්තචෛතසිකයන් චිත්තජරූපයනට සහජාත භාවයෙන් ප්‍රත්‍යය වතු දූ ඒවායේ රූපයන් හා සම්ප්‍රයෝග භාවයක් නැත්තේ ය. එබැවින් චිත්තචෛතසිකයෝ චිත්තජ රූපයනට විප්‍රයුක්ත භාවයෙන් ප්‍රත්‍යය වෙතැ යි කියනු ලැබේ. සම්ප්‍රයෝගත්වයෙන් චිත්තචෛතසිකයන්ට ප්‍රයෝජනයක් ඇතුවාක් මෙන් චිත්තචෛතසිකයන් ගේ විප්‍රයුක්ත භාවයෙන් රූපයනට වන අමුතු ප්‍රයෝජනයක් නො පෙනේ. චිත්තචෛතසිකයන් ගේ විප්‍රයුක්ත භාවයෙන් චිත්තජ රූපයනට යම්කිසි ප්‍රයෝජනයක් වෙත හොත් රූපයන් ගේ විප්‍රයුක්ත භාවයෙන් චිත්තචෛතසිකයනට ද ප්‍රයෝජනයක් තිබිය යුතු ය.

Non-commercial distribution

එසේ ප්‍රයෝජනයක් ඇති නම් චිත්තජරූපයන් චිත්තයන්ට විප්‍රයුක්ත ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වන බව ද වදළ යුතු ය. එසේ නො වදළ සේක.

චක්ෂුරාදි වස්තූහු චිත්තචෛතසිකයනට නිඃශ්‍රය භාවයෙන් ප්‍රත්‍යය වෙති. චිත්තචෛතසිකයෝ ද ඔවුනොවුන්ට නිඃශ්‍රය භාවයෙන් ප්‍රත්‍යය වෙති. චිත්තචෛතසිකයන් ඔවුනොවුන්ට නිඃශ්‍රය වන්නේ සම්ප්‍රයෝගත්වය ද ඇති ව ය. වස්තුරූපයන් චිත්ත චෛතසිකයනට නිඃශ්‍රය වන්නේ සම්ප්‍රයෝග භාවයක් නැති ව ය. සම්ප්‍රයෝග භාවයක් නැති බව නම් විප්‍රයුක්තත්වය ය. වස්තූන් ගෙන් චිත්තචෛතසිකයනට වන්නා වූ මහත් වූ උපකාරය නිඃශ්‍රය භාවය ය. වස්තූන් ගේ විප්‍රයුක්තභාවයෙන් චිත්තචෛතසිකයන් ගේ ඉපදීමට ප්‍රයෝජනයක් වන බවක් නො පෙනේ.

පසු පසුව උපදනා චිත්තචෛතසිකයෝ පූර්වයෙහි හටගත් කායික රූපයන්ට පශ්චාජ්ජාත වශයෙන් ප්‍රත්‍යය වෙති. ඒවා රූපයන්ට ප්‍රත්‍යය වන්නේ ද විප්‍රයුක්ත වශයෙනි. පසුව උපදනා චිත්ත චෛතසිකයන් නිසා පූර්වයෙහි උපන් රූපයෝ බලවත් වෙති. පශ්චාජ්ජාත ප්‍රත්‍යය උපස්තම්භක ප්‍රත්‍යයකි. පසුව උපදනා චිත්ත චෛතසිකයන් ගේ උපස්තම්භනය රූපයනට ප්‍රයෝජන ය. එහෙත් ඒ චිත්තචෛතසිකයන් ගේ රූපයන් හා විප්‍රයුක්තතාවෙන් රූපයන්ට අමුතු ප්‍රයෝජනයක් වෙතැ යි නො සිතිය හැකි ය. විප්‍රයුක්ත ප්‍රත්‍යය විස්තර කර තිබෙන සැටියෙන් ඒ කරුණු අනුව තේරුම් ගන්නට තිබෙන්නේ ප්‍රත්‍යය ප්‍රත්‍යොත්පන්න වශයෙන් බැඳී පවත්නා වූ රූපාරූප ධර්මයන් සේ සම්ප්‍රයුක්තත්වයට නො පැමිණෙන බව දැක්වීම සඳහා විප්‍රයුක්ත ප්‍රත්‍යය දේශනය කරන ලද්දක් ය කියා ය. මේ විප්‍රයුක්ත ප්‍රත්‍යය කාමරූපලෝක දෙක්හි පමණක් ලැබෙන අරූපලෝකයෙහි නො ලැබෙන ප්‍රත්‍යයෙකි. සිත්වලින් අරූපලෝකයෙහි නො ලැබෙන ප්‍රත්‍යයෙකි. සිත්වලින් අරූප විපාක සිත් සතර පඤ්චවෝකාර භවයෙහි නො ලැබෙන බැවින් කිසිකලෙක විප්‍රයුක්ත ප්‍රත්‍යය නොවේ. විප්‍රයුක්ත ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න විභාගය ත්‍රිරාශියෙහි දක්වා ඇත්තේ සමූහ වශයෙනි. එය විස්තර වශයෙන් දතයුත්තේ මෙසේ ය. :–

විප්‍රයුක්තප්‍රත්‍යය වන්නෝ නම් පඤ්චවෝකාර භවයෙහි උපදනා රූපාරූප ධර්මයෝ ය. රූපයන් ගෙන් ද විප්‍රයුක්තප්‍රත්‍යය වන්නේ වස්තුරූප සය පමණකි. අරූපයන් ගෙන් පඤ්චවෝකාර භවයෙහි උපදනා සකල චිත්තචෛතසිකයෝ ම විප්‍රයුක්ත ප්‍රත්‍යය වෙති. විප්‍රයුක්ත ප්‍රත්‍යය වන අරූපධර්මයන් අතුරෙන් කුසල් සිත් එක් විස්ස ය, අකුසල් සිත් දොළොස ය, ඔවුන් හා සම්ප්‍රයුක්ත චෛතසිකයෝ ය යන මොව්හූ ඒ සිත් නිසා උපදනා රූපයන්ට සහජාත විප්‍රයුක්ත භාවයෙන් ප්‍රත්‍යය වෙති.

Non-commercial distribution

පූර්‍වයෙහි හටගෙන ස්ථිතියට පැමිණියා වූ චතුසමුට්ඨානික තිසමුට්ඨානික රූපකායයන්ට පශ්චාජ්ජාත විප්‍රයුක්ත වශයෙන් ප්‍රත්‍යය වෙති. තිසමුට්ඨානික කාය යනු ආහාරජරූප නැත්තා වූ බ්‍රහ්මයන්ගේ කාය ය.

කාමාවචර රූපාවචර විපාකයෝ වනාහි ප්‍රවෘත්ති කාලයෙහි චිත්ත සමුට්ඨාන රූපයන්ට හා ප්‍රතිසන්ධි කාලයෙහි කම්මසමුට්ඨාන රූපයන්ටද සහජාත විප්‍රයුක්ත වශයෙන් ප්‍රත්‍යය වෙති. ලෝකෝත්තර විපාකයෝ චිත්තසමුට්ඨාන රූපයන්ට ම සහජාත විප්‍රයුක්තභාවයෙන් ප්‍රත්‍යය වෙති. කාමාවචර රූපාවචර ලෝකෝත්තර විපාකයෝ චතුසමුට්ඨානික තිසමුට්ඨානික රූප කයට පශ්චාජ්ජාත විප්‍රයුක්ත වශයෙන් ප්‍රත්‍යය වෙති.

ක්‍රියානාමස්කන්ධයෝ තමන් නිසා උපදනා රූපයන්ට සහජාත විප්‍රයුක්ත වශයෙන් ද පූර්‍වයෙහි ඉපද ස්ථිතියට පැමිණි තිජචතුජ කායයන්ට පශ්චාජ්ජාත විප්‍රයුක්ත වශයෙන් ද ප්‍රත්‍යය වෙති.

රූපයන්ගෙන් හෘදයවස්තුරූපය ප්‍රතිසන්ධික්‍ෂණයෙහි දී කාමාවචර රූපාවචර විපාකයන්ට සහජාත විප්‍රයුක්ත භාවයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රවෘත්ති කාලයෙහි අරූපවිපාක ද්විපඤ්ච විඥාන වර්ජිත නාමස්කන්ධයන්ට පුරේජාත විප්‍රයුක්ත භාවයෙන් ප්‍රත්‍යය වේ. පඤ්චප්‍රසාදයෝ පඤ්චවිඥාන නාමස්කන්ධයන්ට පුරේජාත විප්‍රයුක්ත භාවයෙන් ප්‍රත්‍යය වෙති.

දිට්ඨිගතවිප්පයුත්ත, ඤාණවිප්පයුත්ත යන තැන්වල විප්පයුත්ත යන වචනයෙන් කියැවෙන්නේ ඒ ධර්‍මයන් ගේ අභාවය ය. විප්පයුත්ත පච්චය යන මෙහි විප්පයුත්ත සදින් කියැවෙන්නේ අභාවය නො වේ. එයින් කියැවෙන්නෝ තමන් ගේ ප්‍රත්‍යයෝත්පන්නයන් හා ඒකත්වයට පැමිණියවුන් සේ නො බැඳී, ප්‍රත්‍යයෝත්පන්නය හා අමිශ්‍ර ව පවත්නා රූපාරූප ධර්‍මයෝ ය. විප්පයුත්ත පච්චය යනු "**විසුං පයුත්තා විප්පයුත්තා, විප්පයුත්තා ච තෙ පච්චයො චා ති විප්පයුත්ත පච්චයො**" යි විග්‍රහ කළ යුතු ය.

## (21) අස්ති ප්‍රත්‍යය.

පොළොවෙහි පැවැත්ම හෙවත් ඇති බව එය ඇසුරු කොට පවත්නා වෘක්‍ෂලතාවන් ගේ හටගැනීමට පැවැත්මට උපකාර වන්නාක් මෙන් උත්පාදදි ක්‍ෂණත්‍රයට පැමිණ තිබෙන වර්‍තමාන රූපාරූපයෝ රූපාරූප ධර්‍මයන් ගේ හටගැනීමට හා බලවත් වීමට ද උපකාර වෙති. අස්තිප්‍රත්‍යය යි කියනුයේ තමන් ගේ විද්‍යමානත්වයෙන් අන්‍ය රූපාරූප ධර්‍මයන්ගේ උත්පත්තියට හා බලවත් වීමට උපකාර වන රූපා රූප ධර්‍මයන්ට ය. පොළොව ඇසුරුකොට පවත්නා වූ වෘක්‍ෂලතාවන් ගේ හටගැනීමට ප්‍රධාන වශයෙන් හේතු වන්නෝ බීජයෝ ය.

Non-commercial distribution

පොළොව එයට හේතුවන්නේ අප්‍රධාන වශයෙනි. බීජයන්ගෙන් හටගත් වෘක්ෂලතාවන් ගේ වැඩීමට හා පැවැත්මට ප්‍රධාන වශයෙන් හේතුවන්නේ පොළොව ය. එ මෙන් අත්ථිභාවයෙන් රූපාරූප ධර්‍මයන්ට ප්‍රත්‍යය වන රූපාරූප ධර්‍මයන් අන්‍ය රූපාරූප ධර්‍මයනට ප්‍රධාන වශයෙන් ප්‍රත්‍යය වන්නේ ඒවායේ බලවත් වීමට ය. එ බැවින් අත්ථිප්‍රත්‍යය උපස්තම්භනය ප්‍රධාන කොට ඇති ප්‍රත්‍යයක් සැටියට සලකනු ලැබේ. එහෙත් එහි ජනකභාවය ද සම්පූර්ණයෙන් නැත්තේ නො වේ.

සහජාතාදි අන්‍යශක්තීන් ගෙන් තොර ව අත්ථිතා මාත්‍රයෙන් යම්කිසි ධර්‍මයකට ප්‍රත්‍යය වන ධර්‍මයක් නැත්තේ ය. අත්ථිත්වයෙන් ප්‍රත්‍යය වන්නේ ද සහජාතාදී වශයෙන් ප්‍රත්‍යය වන ධර්‍මයන්ම ය. එ බැවින් අත්ථි ප්‍රත්‍යය ත්‍රිරාශියෙහි සහජාත ය. වස්තු පූරේජාතය, වත්ථාරම්මණ පූරේජාත ය, ආරම්මණපූරේජාත ය, පශ්චාජ්ජාතය ආහාර ය, රූපජීවිතේන්ද්‍රිය ය යන ප්‍රත්‍යය සත ගේ වශයෙන් දක් වේ.

ත්‍රිරාශියෙහි සත් වැදෑරුම් කොට දක්වන ලද මේ අත්ථිප්‍රත්‍යය සර්වසඞ්ග්‍රාහික වශයෙන් සඞ්ක්ෂෙපයෙන් දත යුතතේ මෙ සේ ය. උත්පාද දි ක්ෂණත්‍රයට පැමිණීම් වශයෙන් වර්තමාන වන්නා වූ එකුන් අනූවිත්තය ය, චෛතසික දෙපනස ය. රූප අටවිස්ස ය යන මොවුහු අත්ථි ප්‍රත්‍යය වන ධර්‍මයෝ ය. නිර්වාණය විද්‍යාමාන ධර්‍මයක් වුව ද අත්ථිප්‍රත්‍යය භාවයෙන් සලකනු නො ලැබේ. අස්තිප්‍රත්‍යය වන්නේ වර්තමාන භාවය ලැබීමට කලින් ප්‍රත්‍යය නො වන වර්තමාන භාවය ලැබීම නිසා ම ප්‍රත්‍යය වන ධර්‍මයන් ය. නිර්වාණය එය අරමුණු කොට උපදනා චිත්තයන්ට ආරම්මණ ප්‍රත්‍යය වන්නේ කලින් වර්තමාන භාවය නො ලැබ සිට පසුව වර්තමාන භාවය ලැබීම නිසා නො වේ. නිර්වාණයා ගේ කාලභේදයක් ද නැත්තේ ය. එය ආරම්මණ භාවයෙන් ප්‍රත්‍යය වන්නේ අතීත වූ ද අනාගත වූ ද ආරම්මණ ප්‍රත්‍යය වන ආකාරයට සමාන වූ ආකාරයෙනි. එ බැවින් එය අත්ථිප්‍රත්‍යය නො වේ. එකම ධර්‍මය අන්‍ය ධර්‍මයනට ක්ෂණත්‍රයට පැමිණීමෙන් අත්ථි භාවයෙන් ද නිරුද්ධ වීමෙන් නාස්ති භාවයෙන් ද ප්‍රත්‍යය වේ. අස්තිප්‍රත්‍යය නාත්ථි ප්‍රත්‍යයට විරුධ ප්‍රත්‍යයෙකි. නිර්වාණයෙහි නාත්ථිත්වයක් නො ලැබෙන බැවින් අමුතුවෙන් අත්ථිත්වයට පැමිණීමෙන් තමන් අරමුණු කරන ධර්‍මයනට ප්‍රත්‍යය වීමක් නැත. එ බැවින් ද නිර්වාණය අත්ථි ප්‍රත්‍යයට අයත් නො වේ.

අත්ථි ප්‍රත්‍යය ධර්‍මයන් ගෙන් නාම ධර්‍මයෝ සහජාත පශ්චාජ්ජාත වශයෙන් ද රූපයෝ සහජාත පූරේජාත වශයෙන් ද ප්‍රත්‍යය වෙති. ආහාරය හා රූපජීවිතේන්ද්‍රිය ය තමන් ගේ ප්‍රත්‍යයෝත්පන්නයන් සමඟ

Non-commercial distribution

ද ඒවාට පෙර ද පසුව ද ලැබෙන්නේ වී නමුත් අස්ති භාවයෙන් මිස සහජාතාදි ප්‍රත්‍යය භාවයෙන් නො සලකනු ලැබේ. අස්ති ප්‍රත්‍යය ධර්‍මයන් ගේ ප්‍රත්‍යය වීමේ පිළිවෙළ මෙසේ ය. :-

පඤ්චවෝකාරභූමියෙහි උපදනා වූ කුශලස්කන්ධයෝ ඔවුනොවුන්ට හා චිත්තජ රූපයන්ට ද චතුවෝකාර භූමියෙහි උපදනා කුශලස්කන්ධයෝ ඔවුනොවුන්ට ද සහජාතාස්ති භාවයෙන් ප්‍රත්‍යය වෙති. අකුශලස්කන්ධයන් ප්‍රත්‍යය වන්නේ ද එසේ ය. පඤ්චවෝකාරභවයෙහි පශ්චාජ්ජාත කුශලා-කුශලයෝ පූර්‍වයෙහි හටගත් චතුසමුට්ඨානික තිසමුට්ඨානික කායයන්ට පශ්චාජ්ජාතාස්ති භාවයෙන් ප්‍රත්‍යය වෙති.

කාමාවචර රූපාවචර විපාකස්කන්ධයෝ ප්‍රතිසන්ධියෙහි දී ඔවුනොවුන්ට හා කර්‍මජ රූපයන්ට ද ප්‍රවෘත්ති කාලයෙහි ඔවුනොවුන්ට හා චිත්තජ රූපයන්ට ද සහජාතාස්ති භාවයෙන් ප්‍රත්‍යය වෙති. ප්‍රවෘත්තිකාලයෙහි ස්ථිතිප්‍රාප්ත චතුසමුට්ඨානික තිසමුට්ඨානික කායයන්ට ද පශ්චාජ්ජාතාස්ති භාවයෙන් ප්‍රත්‍යය වෙති. අරූපාවචර විපාකස්කන්ධයන් හා අරූපලෝකයෙහි උපදනා ලෝකෝත්තර විපාකස්කන්ධයෝ ද ඔවුනොවුන්ට සහජාතාස්ති භාවයෙන් ප්‍රත්‍යය වෙති. පඤ්චවෝකාර භවයෙහි ලෝකෝත්තර විපාකයෝ ඔවුනොවුන්ට හා චිත්තජරූපයනට සහජාතාසති භාවයෙන් ද පූර්‍වයෙහි උපන් තිජ චතුජකායයන්ට පශ්චාජ්ජාතාස්ති භාවයෙන් ද ප්‍රත්‍යය වෙති.

රූපාවචර ක්‍රියානාමස්කන්ධයෝ සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට සහජාතාස්ති භාවයෙන් ද පූර්‍වජාත තිජ චතුජ රූපයන්ට පශ්චාජ්ජාතාස්ති භාවයෙන් ද ප්‍රත්‍යය වෙති. කාමාවචරාරූපාවචර ක්‍රියා නාමස්කන්ධයෝ රූප ලෝකයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ටද පඤ්චවෝකාරයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ද සහජාතාස්ති භාවයෙන් ප්‍රත්‍යය වෙති.

රූපාස්තිප්‍රත්‍යය සහජාත පූර්‍වජාත ආහාර රූපජීවිතේන්ද්‍රිය වශයෙන් සිව්වැදෑරුම් වේ. සහජාත රූපාස්තිප්‍රත්‍යය කර්‍මාදි හේතූන් ගේ වශයෙන් සිව්වැදෑරුම් වේ. එයින් කර්‍මජ භූත රූපයෝ ඔවුනොවුන්ට හා උපාදය රූපයන්ට ද සහජාතාස්ති භාවයෙන් ප්‍රත්‍යය වෙති. ප්‍රතිසන්ධික්ෂණයෙහි හෘදයරූපය කාමාවචර රූපාවචර විපාකස්කන්ධයන්ට සහජාතාස්ති භාවයෙන් ප්‍රත්‍යය වේ. චිත්තජ ඍතුජ ආහාරජ භූතයෝ ද ඔවුනොවුන්ට හා උපාදය රූපයනට සහජාතාස්ති භාවයෙන් ප්‍රත්‍යය වෙති.

පූර්‍වජාතාස්තිප්‍රත්‍යය වනාහි වස්තුපූර්‍වජාත ආරම්මණ පූර්‍වජාත වශයෙන් දෙවැදෑරුම් වේ. එය ත්‍රිරාශියෙහි දක්වූ පරිද්දෙන් දත යුතු ය.

Non-commercial distribution

රූපජීවිතේන්ද්‍රියඤ්ඤප්‍රත්‍යය ද ත්‍රිරාශියෙහි කී පරිද්දෙන් දත යුතු ය. මෙහි කුශලාදී ධර්‍මයන් ගේ ඔවුනොවුන්ට ප්‍රත්‍යය වීම කියන ලදුයේ එකට උපදනා චිත්තචෛතසිකයන් ගැන ය, සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වීම ය යි කියන ලදුයේ ද එය ම ය. මහා භූතයන් ගේ ඔවුනොවුන්ට ප්‍රත්‍යය වීම කියන ලදුයේ ද එක් එක් කලාපයක භූතයන් ගේ වශයෙනි. අත්‍ථි (අස්ති) යනු විග්‍රහ නො කළ හැකි නිපාත පදයෙකි.

## (22) නාස්ති ප්‍රත්‍යය.

එක් සන්තානයක එක් වරෙක අවකාශ ඇත්තේ චිත්ත ස්පර්‍ශාදී එක් අරූප ධර්‍ම සමූහයකට පමණක් ඉපදීමට ය. අනික් අරූප ධර්‍ම සමූහයකට ඉපදීමට අවකාශ ලැබීමට පළමු උපන් අරූප ධර්‍ම සමූහය අභාවප්‍රාප්ත විය යුතු ය. පළමු උපන් අරූපධර්‍ම සමූහයන් නිරුද්ධ වූ පසු නිරුද්ධ වූ ධර්‍ම සමූහයන් ගේ ස්ථානය ලබා පසු පසු ව උපදනා අරූප ධර්‍ම සමූහයෝ උපදිති. තමන් ගේ ස්ථානය ගෙන අන්‍ය අරූප ධර්‍මයන්ට ඉපදිය හැකිවන පරිදි නිරුද්ධ වූ අරූපධර්‍මයෝ තමතමන්ට අනතුරුව තමන් ගේ තැන ගෙන උපදනා අරූපධර්‍මයනට නාස්ති භාවයෙන් උපකාර වෙති. එසේ උපකාර වන්නා වූ අරූපධර්‍මයෝ නාස්තිප්‍රත්‍යය ය. එය ජනක ප්‍රත්‍යයකි. නාස්තිශක්තිය ය කියා විශේෂ ප්‍රත්‍යය ශක්තියක් නැත. "යාමෙහි දී උපන් සිත සිටීමෙහි දී ද ඇත. හිඳීමෙහි දී ද ඇත. නිදීමෙහි දී ද ඇත. ඊයේ උපන් සිත අදත් ඇත." යනාදීන් නිරුද්ධ වූ සිත් ද ඇති සැටියට වරදවා ගන්නවුන් ගේ ඒ වැරදි හැඟීම දුරුවනු පිණිස නාස්තිප්‍රත්‍යය වදාරන ලද යි ඇතැම් ආචාර්‍ය්‍යයෝ කියති. එය විමසා ගත යුත්තෙකි. නාස්තිප්‍රත්‍යය ධර්‍මයන් ගේ විභාග හා ප්‍රත්‍යය වීමේ ක්‍රමය ද අනන්තර ප්‍රත්‍යයෙහි මෙන් දත යුතු ය.

## (23-24) විගත ප්‍රත්‍යය හා අවිගත ප්‍රත්‍යය.

විනාශයට ගිය ධර්‍මය හෙවත් නිරුද්ධ වූ ධර්‍ම විගත නම් වේ. විගතභාවයෙන් උපකාරක ධර්‍මයෝ විගත ප්‍රත්‍යය ය. විනාශයට නො ගිය ධර්‍මය හෙවත් උත්පාද ස්ථිති භඞ්ග යන ක්‍ෂණත්‍රයෙහි සිටින ධර්‍මය අවිගත නම් වේ. අවිගත භාවයෙන් උපකාරක ධර්‍මයෝ අවිගත ප්‍රත්‍යය ය. ධර්‍ම වශයෙන් හා ප්‍රත්‍යය වන ආකාරයෙන් ද නාස්තිප්‍රත්‍යය විගත ප්‍රත්‍යය දෙක්හි වෙනසක් නැත්තේ ය. වෙනස ඇත්තේ වචන වල

Non-commercial distribution

පමණෙකි. එසේ ම අස්ති අවිගත ප්‍රත්‍යය දෙක්හි ද වෙනසක් නැත්තේ ය. අස්ති නාස්ති ප්‍රත්‍යය දෙක දේශනය කිරීමෙන් ම ප්‍රත්‍යය කථාව සම්පූර්ණ වතු දූ දේශනා විලාස වශයෙන් හෝ මේ දුකය දේශනය කිරීමෙන් ම කාරණය අවබෝධ කරවිය හැකි පුද්ගලයන් ගේ වශයෙන් හෝ නැවත විගතාවිගත දුකය වදරණ ලදැයි පට්ඨාන අටුවාවෙහි දක්වා තිබේ. දේශනය කළ හැකි බොහෝ ධර්‍ම හා බොහෝ ආකාර ඇති තැන කැමති ධර්‍මයක් කැමති ආකාරයකින් දේශනය කරන බව දේශනා විලාශය ය. මේ ප්‍රත්‍යය කථාවෙහි අත්‍ථි යන වචනයෙන් අදහස් කරනුයේ උත්පාදදී ක්‍ෂණත්‍රයෙහි පවත්නා ධර්‍මය ය. නත්‍ථි යන වචනයෙන් අදහස් කරනුයේ උත්පාද දී ක්‍ෂණත්‍රය ඉක්ම වූ ධර්‍මය ය. **"අත්‍ථිපුග්ගලො අත්තහිතාය පටිපනෙනා, අත්‍ථීති ඛො කච්චාන එකො අනෙතා, නත්‍ථීති ඛො කච්චාන එකො අනෙතා"**

යනාදීන් බුදුසස්නෙහි ද ලෝකයෙහි ද අනේකාර්‍ථයන් සඳහා අත්‍ථි නත්‍ථි යන වචන දෙක ව්‍යවහාර කෙරෙති. එ බැවින් අත්‍ථිපච්චය නත්‍ථි පච්චය දෙක පමණක් වදළ කල්හි සැමට ම කාරණය තේරුම් ගත හැකි නොවේ. අත්‍ථි නත්‍ථි පච්චය දෙක වදළ පමණින් කාරණය තේරුම් ගත නො හැකි තැනැත්තන්ට තෙරුම් ගත හැකි වනු පිණිස විගතපච්චයො අවිගතපච්චයො යි අන් ආකාරයකින් අත්‍ථි නත්‍ථි ප්‍රත්‍යය දෙක ම වදරන ලදය යනු අටුවාවෙහි දක්වෙන අදහස ය. මූලටීකාවෙහි හා විසුද්ධිමග්ග ටීකාවෙහි අත්‍ථි අවිගත නත්‍ථි විගත දුකයන් ගේ වෙනස් කම් ද දක්වා තිබේ. ඒවා කාරණයට ගැලපෙතැ යි නො සිතේ. විමසා ගත යුතු ය.

## ප්‍රත්‍යයන් ගේ විනිශ්චය.

ධම්මතො කාලතො චෙ ව නානප්පකාර භෙදතො,
පච්චයුප්පන්නතො චෙ ව විඤ්ඤා තබ්බො විනිච්ඡයො.

යනුවෙන් දක්වෙන පරිදි ප්‍රත්‍යය පිළිබඳ වූ ඥානය පිරිසිදු වනු පිණිස ධර්‍ම වශයෙන් ද, කාල වශයෙන් ද, නානාප්‍රකාර භේදයෙන් ද, ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් ද, ප්‍රත්‍යයන් ගේ විනිශ්චය දත යුතු ය.

**එහි ධර්‍ම වශයෙන් විනිශ්චය මෙසේ ය.** :- සූවිසි දෙනෙක් වූ ප්‍රත්‍යයන් අතුරෙන් හේතු ප්‍රත්‍යය නාමරූපධර්‍මයන් අතුරෙන් නාම ධර්‍මයන් ගෙන් එක් කොටසකි. ආරම්මණප්‍රත්‍යය ප්‍රඥප්තිය හා අභාවයන් සමඟ සකල නාමරූපධර්‍මයෝ ය. අධිපතිප්‍රත්‍යයෙහි සහජාතාධිපතිය

Non-commercial distribution

නාමධර්මෛකදේශයකි. කර්ම, ධ්‍යාන මාර්ග ප්‍රත්‍යයෝ ද නාමධර්මෛකදේශයෝ ය. ආරම්මණාධිපතිප්‍රත්‍යය ගරු කළ යුතු සකල නාමරූප ධර්මයෝ ය. අනන්තර ය, සමනන්තර ය, පච්ඡාජාත ය, ආසේවන ය, විපාක ය, සම්පයුත්ත ය, නත්‍ථි ය, විගත ය යන මේ ප්‍රත්‍යයෝ නාමධර්මයෝ ය. ඒ ප්‍රත්‍යයන්ට නිර්වාණය නො ගැනෙන බැවින් නාමධර්මෛකදේශයෝ ය යි ද කිය යුතු ය. පූර්වජාත ප්‍රත්‍යය රූපෛකදේශයෙකි. අවශේෂ ප්‍රත්‍යයෝ නාම රූපයෝ ය.

**ප්‍රත්‍යයන්ගේ කාල වශයෙන් විනිශ්චය මෙසේ ය** :–

පච්චුප්පන්නා ව හොන්තෙත්‍ථ පච්චයා දස පඤ්ච ච
අතීතා එව පඤ්ච කො තෙ කාලෙ ද්වෙ පි නිස්සිතො
තයො තිකාලිකා වෙ ච විමුත්තා පි ච කාලතො

සූවිසි ප්‍රත්‍යයන් අතුරෙන් හේතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, පූර්වජාත, පච්ඡාජාත, විපාක, ආහාර, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, සම්පයුත්ත, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන මේ ප්‍රත්‍යයෝ පසළොස් දෙන ප්‍රත්‍යුත්පන්න කාලිකයෝ ය. අනන්තර, සමනන්තර, ආසේවන, නත්‍ථි විගත යන ප්‍රත්‍යයෝ පස් දෙන අතීත කාලිකයෝ ය. කර්මප්‍රත්‍යය සහජාත කර්මප්‍රත්‍යයා ගේ වශයෙන් වර්තමාන කාලික ද නානාක්ෂණික කර්මප්‍රත්‍යයා ගේ වශයෙන් අතීත කාලික ද වේ. ආරම්මණ, අධිපති, උපනිස්සය යන ප්‍රත්‍යයෝ තිදෙන ත්‍රිකාලිකයෝ ද වෙති. නිර්වාණ ප්‍රඥප්තීන් ගේ වශයෙන් කාලමුක්තයෝ ද වෙති. ප්‍රත්‍යයන් ගේ නානාප්‍රකාර භේදය හා ප්‍රත්‍යයෝත්පන්නයෝ ද ත්‍රිරාශියෙන් හා යට දක්වුණු ප්‍රත්‍යය විස්තරයෙන් ද දත යුතු ය.

තවද අනේක ධර්මයන් ගේ ඒක ප්‍රත්‍යය භාවය ය, එක් ධර්මයක්හු-ගේ අනේක ප්‍රත්‍යය භාවය ය, එක් ප්‍රත්‍යයක ගේ අනේක ප්‍රත්‍යය භාවය ය, ප්‍රත්‍යයන් ගේ සභාග භාවය ය, ප්‍රත්‍යයන් ගේ විසභාග භාවය ය, ප්‍රත්‍යයන් ගේ යුගල භාවය ය, ජනකාජනක භාවය ය, සර්වස්ථානිකා-සර්වස්ථානික භාවය ය, රූපය රූපයට ප්‍රත්‍යය වීම යනාදි විභාගය ය, භවභේදය ය යන **මේ කරුණු දසය පිළිබඳ විනිශ්චය** ද දත යුතු ය.

**එහි අනේක ධර්මයන් ගේ ඒකප්‍රත්‍යය භාවය පිළිබඳ විනිශ්චය මෙ සේ ය.** :– සූවිසි ප්‍රත්‍යයන් අතුරෙන් කර්මප්‍රත්‍යයෙන් අන්‍යවූ ප්‍රත්‍යය තෙවිස්ස ම අනේක ධර්ම ප්‍රත්‍යයෝ ය. කර්මප්‍රත්‍යය එක් ධර්මයක් වූ චේතනාව ය. එය ඒකධර්ම ප්‍රත්‍යය ය.

**එක් ධර්මයක්හු ගේ අනේක ප්‍රත්‍යය භාවය පිළිබඳ විනිශ්චය මෙ සේ ය** :– හේතු ප්‍රත්‍යයට අයත් එක් ධර්මයක් වූ අමෝහය පූර්වජාත

Non-commercial distribution

කම්ම අහාර ඣාන යන ප්‍රත්‍යය සතර හැර ඉතිරි ප්‍රත්‍යය විස්සට ම අයත් වේ. ඉතිරි විසි ආකාරයෙන් ම එය ප්‍රත්‍යය වේ. අලෝභය හා අදෝසය ඉන්ද්‍රිය මාර්ග ප්‍රත්‍යයභාවයට ද නො පැමිණෙති. ඉතිරි අටළොස් ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වෙති. ලෝභ මෝහයෝ විපාක ප්‍රත්‍යය භාවයට ද නො පැමිණෙති. ඉතිරි ප්‍රත්‍යය සතොළොසට ඒවා අයත් වෙති. ද්වේෂය අධිපති ප්‍රත්‍යය භාවයට ද නො පැමිණේ. ඉතිරි සොළොස් ප්‍රත්‍යයන්ට අයත් වේ.

ආරම්මණප්‍රත්‍යයෙහි රූපායතනය චක්ෂුර්විඥානධාතුවට ආරම්මණ පුරේජාත අත්ථි අවිගත යන සතර ආකාරයෙන් ප්‍රත්‍යය වේ. මනෝ ධාතුවට හා අහේතුක මනෝවිඤ්ඤාණධාතුවට ද ප්‍රත්‍යය වේ. සහේතුක මනෝවිඤ්ඤාණ ධාතුවට වනාහි ආරම්මණාධිපති ආරම්මණූපනිස්සය යන ප්‍රත්‍යයන් ගේ වශයෙන් ද ප්‍රත්‍යය වේ. මෙසේ සකලාරම්මණ ධර්මයන් ගේ ම අනේක ප්‍රත්‍යය භාවය දත යුතු.

අධිපති ප්‍රත්‍යයෙහි ආරම්මණාධිපතියෙහි අනේක ප්‍රත්‍යය භාවය ආරම්මණ ප්‍රත්‍යයෙහි කී පරිද්දෙන් ම දත යුතු ය. සහජාතාධිපති ධර්මයන් අතුරෙන් වීමංසාධිපතිය අමෝහහේතුව සේ විසි ආකාරය කින් ප්‍රත්‍යය වේ. ඡන්ද හේතුපුරේජාත කම්ම ආහාර ඉන්ද්‍රිය ඣාන මග්ග යන ප්‍රත්‍යයෝ නො වේ. ඉතිරි සතොළොස් ප්‍රත්‍යයන්ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. චිත්තය හේතු පුරේජාත කම්ම ඣාන මග්ග යන ප්‍රත්‍යයෝ නො වේ. ඉතිරි එකුන්විසි ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. විරියය හේතු පුරේජාත කම්ම ආහාර ඣාන යන ප්‍රත්‍යයෝ නො වේ. සෙසු එකුන්විසි ප්‍රත්‍යයන්ගේ වශයෙන් ප්‍රත්‍යය වේ.

අනන්තර ප්‍රත්‍යයෙහි චක්ඛුවිඤ්ඤාණධාතු යනාදීන් පාලියෙහි දක්වෙන චතුස්කන්ධයන් අතුරෙන් වේදනාස්කන්ධය හේතු පුරේජාත කර්මාහාර මාර්ග ප්‍රත්‍යයෝ නො වේ. සෙසු එකුන්විසි ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. සංඥාස්කන්ධය ඉන්ද්‍රිය ධ්‍යාන ප්‍රත්‍යයෝ ද නො වේ. සෙසු සතොළොස් ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. සංස්කාරස්කන්ධ-යෙහි හේතූහු හේතුප්‍රත්‍යයෙහි කී පරිද්දෙන් ද ඡන්ද වීර්‍ය්‍යයෝ අධිපතිප්‍රත්‍යයෙහි කී පරිද්දෙන් ද ප්‍රත්‍යය වෙති. ස්පර්ශය හේතුපුරේජාත කර්මේන්ද්‍රිය ධ්‍යාන මාර්ග ප්‍රත්‍යයෝ නො වේ. සෙසු අටොළොස් ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. චේතනාව හේතු පුරේජාතේන්ද්‍රිය ධ්‍යාන මාර්ග ප්‍රත්‍යයෝ නො වේ. සෙසු එකුන්විසි ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. විතර්කය හේතු පුරේජාත කර්මා හාර ඉන්ද්‍රිය ප්‍රත්‍යයෝ නො වේ. සෙසු එකුන්විසි ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. විචාරය මාර්ග ප්‍රත්‍යය ද නො වේ.

Non-commercial distribution

එය සෙසු අටොළොස් ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. ප්‍රීතිය ද ඒ ප්‍රත්‍යයන්ගේ වශයෙන් ම ප්‍රත්‍යය වේ. චිත්තෙකග්ගතාව හේතු පූරේජාත කර්‍මාහාර ප්‍රත්‍යයෝ නො වේ.ඉතිරි විසි ප්‍රත්‍යයන්ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. ශ්‍රද්ධාව හේතු පූරේජාත කර්‍මාහාර ඣාන මාර්‍ගී ප්‍රත්‍යයෝ නොවේ. සෙසු අටොළොස් ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. ස්මෘතිය ඒ අටොළොස් ප්‍රත්‍යයෝ ය, මාර්‍ගීප්‍රත්‍යය ය යන එකුන්විසි ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. ජීවිතේන්ද්‍රියය ශ්‍රද්ධාවට කී අටොළොස් ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. හිරිය හා ඔත්තප්පය එයින් ඉන්ද්‍රිය ප්‍රත්‍යය හැර සෙසු සතොළොස් ප්‍රත්‍යයන්ගේ වශයෙන් ප්‍රත්‍යය වෙති. කායපස්සද්ධාදි යුගලයෝ ද එ සේ ම ය. යේවාපනක ධර්‍මයන්ට අයත් වූ අධිමොක්ඛ මනස්කාර තත්‍රමජ්ඣත්තතා කරුණා මුදිතා යන මොවුන්ගේ ප්‍රත්‍යය භාවය ද එ සේ ම ය. විරතීහු වනාහි ඉහත කී ප්‍රත්‍යයෝ ය, මාර්‍ගීප්‍රත්‍යය ය යන අටොළොස් ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වෙති. දෘෂ්ටිය එයින් විපාක ප්‍රත්‍යය හැර සෙසු සතොළොස් ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. මිච්ඡාවාචා මිච්ඡාකම්මන්ත මිච්ඡාආජීවයෝ ඒ ප්‍රත්‍යයෝ ය, කර්‍මාහාර ප්‍රත්‍යය දෙකය යන එකුන්විසි ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වේ. අහිරික අනොත්තප්ප මාන ථීනමිද්ධ උද්ධච්ච යන මොහු හේතු පූරේජාත කම්ම විපාක ආහාර ඉන්ද්‍රිය ඣාන මග්ග යන ප්‍රත්‍යයෝ නො වෙති. ඉතිරි සොළොස් ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වෙති. විචිකිච්ඡා ඉස්සා මච්ඡරිය කුක්කුච්ච යන මොහු ඒවායින් අධිපති ප්‍රත්‍යය හැර සෙසු පසළොස් ප්‍රත්‍යයන් ගේ වශයෙන් ප්‍රත්‍යය වෙති. විඥානස්කන්ධයා ගේ අනේක ප්‍රත්‍යය භාවය අධිපති ප්‍රත්‍යයෙහි කී පරිදි දත යුතු ය.

සහජාත ප්‍රත්‍යයට අයත් නාමධර්‍මයන් ගේ අනේකප්‍රත්‍යය භාවය කියන ලද පරිදි දත යුතු ය. රූපධර්‍මයන් අතුරෙන් මහා භූතයෝ සතර දෙන ආරම්මණ ආරම්මණාධිපති සහජාත අඤ්ඤ මඤ්ඤ නිස්සය උප නිස්සය පූරේජාත අත්‍ථි අවිගත යන ප්‍රත්‍යය නවදෙනාගේ වශයෙන් අනේකප්‍රත්‍යය භාවයට පැමිණෙති. හෘදය වස්තුව ඒ ප්‍රත්‍යයන් ගේ හා විප්‍රයුක්ත ප්‍රත්‍යයා ගේ ද වශයෙන් දශාකාරයකින් ප්‍රත්‍යය වේ.

අන්‍යෝන්‍යප්‍රත්‍යයෙහි පෙර නො කියවුණු ධර්‍මයක් නැත්තේ ය. නිඃශ්‍රය ප්‍රත්‍යයෙහි චක්ඛායතනාදීහු ආරම්මණ ආරම්මණාධිපති නිස්සය උපනිස්සය පූරේජාත ඉන්ද්‍රිය විප්පයුත්ත අත්‍ථි අවිගත යන මොවුන් ගේ වශයෙන් නවකාරයෙන් ප්‍රත්‍යය වෙති.

උපනිඃශ්‍රයප්‍රත්‍යයෙහි ද නො කියවුණු ධර්‍මයක් නැත්තේ ය. පූරේජාත ප්‍රත්‍යයෙහි රූප ශබ්ද ගන්ධ රසායතනයෝ ආරම්මණ ආරම්මණාධිපති

Non-commercial distribution

උපනිස්සය පුරේජාත අත්ථි අවිගත යන ප්‍රත්‍යය සය ගේ වශයෙන් ප්‍රත්‍යය වෙති. මෙහි පෙර නො කියවුණු දෙයක් ඇත්තේ මෙපමණ ය. පශ්චාජ්ජාතාදියෙහි ද නො කියවුණු ධර්‍මයක් නැත්තේ ය.

ආහාර ප්‍රත්‍යයෙහි කබලිංකාරාහාරය ආරම්මණ ආරම්මණාධිපති උපනිස්සය ආහාර අත්ථි අවිගත යන සයාකාරයෙන් ප්‍රත්‍යයවේ. ඉන්ද්‍රියප්‍රත්‍යයාදියෙහි ද නො කියවුණු ධර්‍මයක් නැත්තේ ය.

**එක් ප්‍රත්‍යයක ගේ අනේක ප්‍රත්‍යය භාවය මෙසේ ය :–** හේත්වාදි ප්‍රත්‍යයන්ට අයත් ධර්‍මයන් ගෙන් එක් එක් ධර්‍මයක් ස්වකීය ප්‍රත්‍යයෝත්පන්න යන්ට හේත්වාදි වශයෙන් ප්‍රත්‍යය වෙමින් එකෙණෙහි ම ඒ ධර්‍මයන්ට ම අන්‍යාකාරයන්ගෙන් ද ප්‍රත්‍යය වෙති. එය එක් ප්‍රත්‍යයක ගේ අනේක ප්‍රත්‍යය භාවය ය. ඒ අනේක ප්‍රත්‍යය භාවය පිළිබඳ විනිශ්චය මෙසේ ය.

අමෝහය හේතුප්‍රත්‍යය ය, එය තමා ගේ හේතුප්‍රත්‍යය භාවය නොහරිමින් ම අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත අත්ථි අවිගත යන අන්‍ය වූ ආකාර එකොළොසකින් ද ප්‍රත්‍ය වේ. හෙවත් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ. අලෝභාදෝසයෝ දෙදෙන ඒවායින් අධිපති ඉන්ද්‍රිය මග්ග යන ප්‍රත්‍යය තුන හැර සෙසු ප්‍රත්‍යයන්ගේ වශයෙන් අනේකප්‍රත්‍යය භාවයට පැමිණෙති. මේ විපාක හේතුන් ප්‍රත්‍යය වීමේ ක්‍රමය ය. කුශලක්‍රියා හේතුන්ට විපාක ප්‍රත්‍යය භාවය නො ලැබේ. ලෝභදෝස මෝහයෝ ඒ ප්‍රත්‍යය තුන හා විපාක ප්‍රත්‍යය ද හැර සෙසු ප්‍රත්‍යයන් ගේ වශයෙන් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණෙති.

. ආරම්මණ ප්‍රත්‍යය තමා ගේ ආරම්මණ ප්‍රත්‍යය භාවය නො හරිමින් ම ආරම්මණාධිපති නිස්සය උපනිස්සය පුරේජාත විප්පයුක්ත අත්ථි අවිගත යන ප්‍රත්‍යයන් ගේ වශයෙන් අන්‍ය වූ සත් ආකාරයකින් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ. මේ උත්කෘෂ්ට වශයෙන් ලැබෙන ප්‍රත්‍යය ගණනය. අතීතානාගත අරූප ධර්‍මයන් හා රූප ධර්‍මයන් ආරම්මණ ප්‍රත්‍යය වන කල්හි ආරම්මණාධිපති ආරම්මණූපනිස්සය යන මොවුන් ගේ වශයෙන් පමණක් අනේක ප්‍රත්‍යය භාවය ලැබේ.

අධිපති ප්‍රත්‍යයෙහි වීමංසය අමෝහය මෙනි. ඡන්දාධිපතිය, අධිපති ප්‍රත්‍යය භාවය නොහරිමින් ම සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත විප්පයුත්ත අත්ථි අවිගත යන අන්‍ය වූ අටාකාරයකින් අනේකප්‍රත්‍යය භාවයට පැමිණේ. වීර්‍ය්‍යය ඒ ප්‍රත්‍යයන් අටදෙනා ගේ හා ඉන්ද්‍රිය මාර්‍ග ප්‍රත්‍යය දෙදෙනාගේ ද යන දස දෙනෙක් වූ ප්‍රත්‍යයන් ගේ වශයෙන් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ. චිත්තය ඒ ප්‍රත්‍යයන්

Non-commercial distribution

ගෙන් මාර්ග ප්‍රත්‍යය හැර ආහාර ප්‍රත්‍යය ඇතුළු කොට ලැබෙන ප්‍රත්‍යය දස දෙනා ගේ වශයෙන් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ. ආරම්මණාධිපති ප්‍රත්‍යයා ගේ අනේක ප්‍රත්‍යය භාවය ඉහත ආරම්මණ ප්‍රත්‍යයෙහි කී පරිදි දත යුතු ය.

අනන්තර සමනන්තර ප්‍රත්‍යයෝ දෙදෙන අනන්තර සමනන්තර භාවය නොහරිමින් ම උපනිස්සය කම්ම ආසේවන නත්ථි විගත යන මොවුන් ගේ වශයෙන් පස් ආකාරයකින් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණෙති. එහි කර්මප්‍රත්‍යය භාවය ලබන්නේ ආර්‍ය්‍ය මාර්ග චේතනාව ය. සෙස්සෝ එය නො ලබති.

සහජාතප්‍රත්‍යය තමා ගේ සහජාත ප්‍රත්‍යය භාවය නො හරිමින් ම හේතු අධිපති අඤ්ඤමඤ්ඤ නිස්සය කම්ම විපාක ආහාර ඉන්ද්‍රිය ඣාන මග්ග සම්පයුත්ත විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍යයන් ගේ වශයෙන් තුදුස් ආකාරයකින් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ. මෙය ද උත්කෘෂ්ට පරිච්ඡේදය ය. හෘදයවසතුව සහජාත ප්‍රත්‍යය වන කල්හි හේතුප්‍රත්‍යාදිය නො ලැබේ. අන්‍යෝන්‍ය ප්‍රත්‍යයෙහි ක්‍රමය ද එසේ ම ය.

නිඃශ්‍රය ප්‍රත්‍යය තමා ගේ නිඃශ්‍රයප්‍රත්‍යය භාවය නො හැර ම සූවිසි ප්‍රත්‍යයන් අතුරෙන් තමා ගේ නිඃශ්‍රය ප්‍රත්‍යය භාවය හා අනන්තර සමනන්තර පච්ඡාජාත ආසේවන නත්ථි විගත යන ප්‍රත්‍යය සය ද හැර අවශේෂ ප්‍රත්‍යයන් ගේ වශයෙන් සතළොස් ආකාරයකින් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ. මෙය ද උත්කෘෂ්ට පරිච්ඡේදය ය. නිඃශ්‍රය ප්‍රත්‍යය වන හෘදයවස්ත්වාදියට හේතුප්‍රත්‍යාදිය නො ලැබේ.

උපනිඃශ්‍රය ප්‍රත්‍යයෙහි ආරම්මණූපනිඃශ්‍රයය ආරම්මණාධිපති ප්‍රත්‍යය මෙනි. අනන්තරූප නිඃශ්‍රයය අනන්තරූපනිඃශ්‍රයය ප්‍රත්‍යය භාවය නො හැර ම අනන්තර සමනන්තර කම්ම ආසේවන නත්ථි විගත යන මොවුන් ගේ වශයෙන් සයාකාරයකින් ද අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ. මෙහි කර්ම ප්‍රත්‍යය භාවය ලබන්නේ ආර්‍ය්‍ය මාර්ග චේතනාව පමණෙකි. ප්‍රකෘතෝපනිඃශ්‍රයය ප්‍රකෘතෝපනිඃශ්‍රය වශයෙන් ම ප්‍රත්‍යය වේ. නානාක්ෂණික කර්මය කර්මාදි වශයෙන් ද ප්‍රත්‍යය වේ.

පූර්වජාතප්‍රත්‍යය තමා ගේ පූර්වජාත භාවය නො හරිමින් ම ආරම්මණ ආරම්මණාධිපති නිස්සය උපනිස්සය ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත යන මොවුන් ගේ වශයෙන් අන්‍ය වූ අෂ්ටාකාරයකින් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ. මෙය ද උත්කෘෂ්ට පරිච්ඡේදය ය. ආරම්මණ පූර්වජාතයෙහි නිඃශ්‍රය ඉන්ද්‍රිය විප්‍රයුක්ත ප්‍රත්‍යය භාවයෝ නො ලැබෙති.

Non-commercial distribution

පශ්චාජ්ජාත ප්‍රත්‍යය තමා ගේ පශ්චාජ්ජාත භාවය නො හරිමින් ම විප්‍රයුක්ත අත්ථි අවිගත යන මොවුන් ගේ වශයෙන් අන්‍ය වූ ද තුන් ආකාරයකින් අනේකප්‍රත්‍යය භාවයට පැමිණේ.

ආසේවනප්‍රත්‍යය ආසේවනප්‍රත්‍යය භාවය නො හරිමින් ම අනන්තර සමනන්තර උපනිස්සය නත්ථි විගත යන මොවුන් ගේ වශයෙන් අන්‍ය වූ ද පඤ්චාකාරයකින් අනේකප්‍රත්‍යය භාවයට පැමිණේ.

කර්මප්‍රත්‍යයෙහි සහජාතකර්මය තමා ගේ කර්ම ප්‍රත්‍යය භාවය නො හරිමින් ම සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත අත්ථි අවිගත යන මොවුන් ගේ වශයෙන් අන්‍ය වූ ද නවාකාරයකින් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ. නානාක්ෂණික කර්මප්‍රත්‍යය උපනිස්සය අනන්තර සමනන්තර නත්ථි විගත යන මොවුන් ගේ වශයෙන් අන්‍ය වූ ද පඤ්චාකාරයකින් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ.

විපාකප්‍රත්‍යය තමා ගේ විපාකප්‍රත්‍යය භාවය නො හරිමින් ම හේතු අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය කම්ම ආහාර ඉන්ද්‍රිය ඣාන මග්ග සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත අත්ථි අවිගත යන මොවුන් ගේ වශයෙන් අන්‍ය වූ ද තුදුස් ආකාරයකින් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ.

ආහාර ප්‍රත්‍යයෙහි කබලිංකාරාහාරය ආහාර ප්‍රත්‍යය භාවය නො හරිමින් ම අත්ථි අවිගත යන දෙයාකාරයෙන් ද අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ. ඉතිරි ආහාරයෝ තිදෙන ආහාර ප්‍රත්‍යය භාවය නො හරිමින් ම සුදුසු පරිදි අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය කම්ම විපාක ඉන්ද්‍රිය සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත අත්ථි අවිගත යන මොවුන් ගේ වශයෙන් අන්‍ය වූ ද එකොළොස් ආකාරයකින් අනේකප්‍රත්‍යය භාවයට පැමිණේ.

ඉන්ද්‍රියප්‍රත්‍යයෙහි රූපේන්ද්‍රියයෝ පස්දෙන ඉන්ද්‍රිය ප්‍රත්‍යය භාවය නොහරිමින් ම නිස්සය පුරේජාත විප්‍රයුක්ත අත්ථි අවිගත යන මොවුන් ගේ වශයෙන් අන්‍ය වූ ද පස් ආකාරයකින් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ. රූපජීවිතේන්ද්‍රිය ය ද ඉන්ද්‍රියප්‍රත්‍යයභාවය නො හරිමින් ම අත්ථි අවිගත යන මොවුන් ගේ වශයෙන් අන්‍ය වූ ද දෙයාකාරයකින් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ. අරූපේන්ද්‍රියයෝ ද සුදුසු පරිදි ඉන්ද්‍රිය ප්‍රත්‍යයභාවය නො හරිමින් ම හේතු අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර ඣාන මග්ග සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත අත්ථි අවිගත යන මොවුන් ගේ වශයෙන් අන්‍ය වූ ද තෙළෙස් ආකාරයකින් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණෙති.

Non-commercial distribution

ධ්‍යානප්‍රත්‍යය තමා ගේ ධ්‍යාන ප්‍රත්‍යය භාවය නො හරිමින් ම සුදුසු පරිදි සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග සම්පයුක්ත විප්පයුත්ත අත්ථි අවිගත යන මොවුන් ගේ වශයෙන් අන්‍ය වූ ද දසාකාරයකින් අනේකප්‍රත්‍යය භාවයට පැමිණේ.

මාර්ගප්‍රත්‍යය තමා ගේ මාර්ගප්‍රත්‍යයභාවය නො හරිමින් ම යථානුරූප වශයෙන් ධ්‍යානප්‍රත්‍යයෙහි කී ප්‍රත්‍යය දශය ය, හේතු අධිපති ප්‍රත්‍යය දෙකය යන මොවුන් ගේ වශයෙන් අන්‍ය වූ ද ද්වාදසාකාරයකින් අනේක ප්‍රත්‍යය භාවයට පැමිණේ.

සම්ප්‍රයුක්තප්‍රත්‍යය සම්ප්‍රයුක්ත ප්‍රත්‍යයභාවය නොහරිමින් ම යථානුරූප පරිද්දෙන් හේතු අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය කම්ම විපාක ආහාර ඣාන මග්ග අත්ථි අවිගත යන මොවුන් ගේ වශයෙන් අන්‍ය වූ ද තෙළෙස් ආකාරයකින් අනේකප්‍රත්‍යය භාවයට පැමිණේ.

විප්‍රයුක්තප්‍රත්‍යය විප්‍රයුක්තප්‍රත්‍යය භාවය නො හරිමින් ම අනන්තර සමනන්තර ආසේවන නත්ථි විගත යන ප්‍රත්‍යය පස හැර ඉතිරි ප්‍රත්‍යයන් ගේ වශයෙන් යෙදෙන පරිදි අන්‍ය වූ ද අටළොස් ආකාරයකින් අනේකප්‍රත්‍යය භාවයට පැමිණේ.

අස්තිප්‍රත්‍යය අස්තිප්‍රත්‍යය භාවය නො හරිමින් ම අනන්තර සමනන්තර ආසේවන නත්ථි විගත යන ප්‍රත්‍යය පස හැර ඉතිරි ප්‍රත්‍යයන් ගේ වශයෙන් යෙදෙන පරිදි අන්‍ය වූ ද අටළොස් ආකාරයකින් අනේකප්‍රත්‍යය භාවයට පැමිණේ.

නාස්ති විගත ප්‍රත්‍යයෝ අනන්තර ප්‍රත්‍යය මෙනි. අවිගත ප්‍රත්‍යය අස්තිප්‍රත්‍යය මෙනි. මේ එක් ප්‍රත්‍යයක්හු ගේ අනේක ප්‍රත්‍යභාවය ය පිළිබඳ විනිශ්චය ය.

**ප්‍රත්‍යයන් ගේ සභාගත්වය පිළිබඳ වූ විනිශ්චය මෙ සේ ය** :- සූවිසි ප්‍රත්‍යයන් අතුරෙන් අනන්තර සමනන්තර අනන්තරූපනිස්සය ආසේවන නත්ථි විගත යන මේ ප්‍රත්‍යයෝ සභාගයෝ ය. එ සේ ම ආරම්මණ ආරම්මණාධිපති ආරම්මණූපනිස්සය ප්‍රත්‍යයෝ ද සභාගයෝ ය. මේ ක්‍රමයෙන් ප්‍රත්‍යයන් ගේ සභාගත්වය සලකා ගත යුතු ය.

**ප්‍රත්‍යයන් ගේ විසභාගත්වය පිළිබඳ විනිශ්චය මෙ සේ ය** :- පූරේජාත ප්‍රත්‍යය පශ්චාජ්ජාත ප්‍රත්‍යය හා විසභාග ය. සම්ප්‍රයුක්තප්‍රත්‍යය විප්‍රයුක්තප්‍රත්‍යය හා විසභාග ය. අස්තිප්‍රත්‍යය නාස්තිප්‍රත්‍යය හා විස

Non-commercial distribution

භාග ය. විගතප්‍රත්‍යය අවිගතප්‍රත්‍යය හා විසභාග ය. මේ ක්‍රමයෙන් ප්‍රත්‍යයන් ගේ සභාග විසභාග භාවය සලකාගත යුතු ය.

**යුගල වශයෙන් විනිශ්චය මෙ සේ ය :–** අර්ථයා ගේ සමාන භාවයෙන් ද ශබ්දයා ගේ සමාන භාවයෙන් ද කාලප්‍රතිපක්‍ෂතාවෙන් ද හේතු ඵල භාවයෙන් ද අන්‍යෝන්‍ය විරුද්ධ භාවයෙන් ද ප්‍රත්‍යය යුගලයෝ වෙති. අනන්තර සමනන්තර ප්‍රත්‍යය දෙක අර්ථ සමානත්වයෙන් එක් ප්‍රත්‍යය යුගළයෙකි. නිඃශ්‍රය උපනිඃශ්‍රය ප්‍රත්‍යය දෙක ශබ්දසමානත්වයෙන් එක් යුගළයෙකි. පූර්ජාත පශ්චාජ්ජාත ප්‍රත්‍යය දෙක කාලප්‍රති-පක්‍ෂත්වයෙන් එක් යුගළයෙකි. කර්මප්‍රත්‍යය විපාකප්‍රත්‍යය දෙක හේතුඵල භාවයෙන් එක් යුගළයෙකි. සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත ප්‍රත්‍යය දෙක අන්‍යෝන්‍ය ප්‍රතිපක්‍ෂ භාවයෙන් එක් යුගළයෙකි. අස්ති නාස්ති විගතාවිගත ප්‍රත්‍යයෝ ද අන්‍යෝන්‍ය ප්‍රතිපක්‍ෂ යුගළයෝ ය.

**ජනකාජනක වශයෙන් විනිශ්චය මෙ සේ ය :–** සූවිසි ප්‍රත්‍යයන් අතුරෙන් අනන්තර සමනන්තර අනන්තරූපනිස්සය පකතූපනිස්සය ආසේවන නානක්ඛණිකකම්ම නත්ථි විගත යන මේ ප්‍රත්‍යයෝ ජනක ප්‍රත්‍යයෝ ය. පශ්චාජ්ජාත ප්‍රත්‍යය උපස්තම්භක ප්‍රත්‍යයෙකි. සෙස්සෝ ජනකයෝ ද උපස්තම්භකයෝ ද වෙති.

**සර්වස්ථානිකාසර්වස්ථානික වශයෙන් විනිශ්චය මෙ සේ ය :–**ප්‍රත්‍යයන් අතුරෙන් සහජාත නිස්සය අත්ථි අවිගත යන මේ ප්‍රත්‍යයෝ සර්වස්ථානිකයෝ ය. සර්වස්ථානික යන්නෙහි තේරුම සකල රූපාරූප ධර්මයන්ට ම ප්‍රත්‍යය වන ධර්මයෝ ය යනුයි. සහජාතාදී ප්‍රත්‍යය සතර නො ලැබ උපදනා එක් ධර්මයකුදු නැත්තේ ය. ආරම්මණ ආරම්මණාධිපති අනන්තර සමනන්තර අනන්තරූපනිස්සය පකතූපනිස්සය ආසේවන සම්පයුත්ත නත්ථි විගත යන ප්‍රත්‍යයෝ අසර්වස්ථානිකයෝ ය. ඇතැම් රූපාරූප ධර්මයන්ට මිස සකල රූපාරූප ධර්මයන්ට ම ප්‍රත්‍යය නො වන්නෝ ය. ඔව්හු අරූපස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන්නෝ ය. ඒ ප්‍රත්‍යයන් නිසා අරූප ධර්ම මිස රූපධර්මයෝ නූපදනාහ. පූර්ජාත පශ්චාජ්ජාත ප්‍රත්‍යයෝ දෙදෙන ද අසර්වස්ථානිකයෝ ය. පූර්ජාත ප්‍රත්‍යය වන්නේ නාම ධර්මයන්ට පමණෙකි. පශ්චාජ්ජාත ප්‍රත්‍යය වන්නේ රූප ධර්මයන්ට පමණකි. කියන ලද ප්‍රත්‍යයන්ගෙන් අන්‍ය ප්‍රත්‍යයෝ දරූපාරූපධර්මයන් ගෙන් යම්කිසි කොටසකට පමණක් ප්‍රත්‍යය වන බැවින් අසර්වස්ථානිකයෝ ය.

**රූපය රූපයට ම ප්‍රත්‍යවීමය යනාදි විනිශ්චය මෙ සේ ය :–** සූවිසි ප්‍රත්‍යයන් අතුරෙන් රූපයම ප්‍රත්‍යය වී රූපය ම ප්‍රත්‍යයෝත්පන්න ද වන ප්‍රත්‍යයක් නැත්තේ ය. ප්‍රත්‍යය රූප වී ප්‍රත්‍යයෝත්පන්නයන්

Non-commercial distribution

අරූපයන් ම වන එක් ප්‍රත්‍යයක් ඇත්තේ ය. එනම් පුරේජාත ප්‍රත්‍යය ය. ප්‍රත්‍යය ඒකාන්තයෙන් රූප වී රූපාරූප දෙකට ප්‍රත්‍යය වන ප්‍රත්‍යයක් ද නැත්තේ ය. ප්‍රත්‍යය ඒකාන්තයෙන් අරූපධර්ම වී අරූපධර්මයන්ට ම ප්‍රත්‍යය වන ප්‍රත්‍යයෝ ඇතහ. ඔව්හු නම් අනන්තර සමනන්තර ආසේවන සම්පයුත්ත නත්ථි විගත යන ප්‍රත්‍යයෝ ය. ප්‍රත්‍ය ය ඒකාන්තයෙන් අරූප වී රූපයන්ට ම ප්‍රත්‍යය වන ප්‍රත්‍යයක් ඇත්තේ ය. එනම් පශ්චාජ්ජාත ප්‍රත්‍යය ය. ප්‍රත්‍යය ඒකාන්තයෙන් අරූපධර්ම වී රූපාරූප දෙකට ම ප්‍රත්‍යය වන ප්‍රත්‍යයෝ ද ඇතහ. ඔවුහු හේතු, කම්ම, මග්ග, විපාක, ඣාන යන ප්‍රත්‍යයෝ ය. ප්‍රත්‍යය ඒකාන්තයෙන් රූපාරූප දෙක ම වී රූපයට ම ප්‍රත්‍යය වන ප්‍රත්‍යයක් ද නැත්තේ ය. ප්‍රත්‍යය රූපාරූප දෙක ම වී අරූපයන්ට පමණක් ප්‍රත්‍යය වන ප්‍රත්‍යයෝ ඇතහ. ඔව්හු නම් ආරම්මණ උපනිස්සය යන ප්‍රත්‍යයෝ ය. ප්‍රත්‍යය ඒකාන්ත යෙන් රූපාරූප දෙක ම වී රූපාරූප දෙකට ම ප්‍රත්‍යය වන ප්‍රත්‍යයෝ ද ඇතහ. ඔව්හු නම් අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ආහාර ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත යන මේ ප්‍රත්‍යයෝ ය.

**භවභේදයා ගේ වශයෙන් විනිශ්චය මෙ සේ ය** :– ප්‍රත්‍යයෝ සූවිසි දෙන ම පඤ්චවෝකාර භවයෙහි ලැබෙත්. චතුවෝකාර භවයෙහි පුරේජාත පශ්චාජ්ජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයන් හැර ඉතිරි ප්‍රත්‍යයෝ එක්විසි දෙන ලැබෙත්. එකවෝකාර භවයෙහි සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය කම්ම ඉන්ද්‍රිය අත්ථි අවිගත යන ප්‍රත්‍යයෝ සත්දෙන පමණක් ලැබෙත්. බාහිර අනින්ද්‍රියබද්ධ රූපයන්හි සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගත යන ප්‍රත්‍යය පස පමණක් ලැබේ.

ඉමෙසු පඤ්චවොකාරෙ සබ්බෙ පි පච්චයා සියුං,
පුරෙ පච්ඡා විප්පයුත්තෙන විනා රූපෙකවීසති
සහජ ඤ්ඤාඤ්ඤ නිස්සය කම්ම ඉන්ද්‍රිය අත්ථි ච,
අවිගතා ති සත්තෙව අසඤ්ඤෙ උපලබ්භරෙ
බාහිරෙ නින්ද්‍රියෙ රූපෙ සහජ ඤ්ඤාඤ්ඤ නිස්සය,
අත්ථි අවිගතා චෙ ති ලබ්භරෙ පඤ්ච පච්චයා

---

## ප්‍රත්‍යය ඝටනාව.

(1) හේතුප්‍රත්‍යය පිළිබඳ ප්‍රත්‍යය ඝටනාවෝ මෙ සේ ය. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සහේතුක චිත්තජරූපයන්ට ද සහේතුක

Non-commercial distribution

ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ද ප්‍රත්‍යය වන හේතු සයෙහි සහජාත, නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

(2) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන හේතු සයෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(3) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන හේතු සයෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

(4) සහේතුක චිත්තජරූප, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන හේතු සයෙහි සහජාත, නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

## මේ අවිපාක ඝටනා සතර ය.

(5) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සහේතුක චිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක හේතු තුනෙහි සහජාත, නිස්සය, විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(6) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන විපාක හේතු තුනෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

(7) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන විපාක හේතු තුනෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

(8) සහේතුක චිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාක හේතු තුනෙහි සහජාත, නිස්සය, විපාක, විප්පයුත්ත, අත්ථි,අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

(9) හෘදයවස්තුවට පමණක් ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ත්‍රිහේතුක ප්‍රතිසන්ධිනාමස්කන්ධයන්හි ඇති හේතු තුනෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

මේ සවිපාක ඝටනා පස ය.

Non-commercial distribution

මේ සාමාන්‍ය ඝටනා නවය ය.

(10) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සහේතුක චිත්තජරූපයන්ට ද සහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ද ප්‍රත්‍යය වන අමෝහයෙහි සහජාත, නිඃසය, ඉන්ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ශක්ති සය ගැටේ.

(11) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදය වස්තුවට ප්‍රත්‍යය වන අමෝහයෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිඃසය, ඉන්ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

(12) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන අමෝහයෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිඃසය, ඉන්ද්‍රිය, මග්ග, සම්ප්‍රයුක්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැටේ.

(13) සහේතුක චිත්තජරූපයන්ට හා සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන අමෝහයෙහි සහජාත, නිඃසය, ඉන්ද්‍රිය, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

මේ අවිපාක ඝටනා ඝටනා සතර ය.

(14) සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක චිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකා මෝහයෙහි සහජාත, නිඃසය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

(15) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදය වස්තුවට ප්‍රත්‍යය වන විපාකාමෝහයෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිඃසය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැටේ.

(16) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන විපාකා මෝහයෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිඃසය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති නවය ගැටේ.

(17) සහේතුකචිත්තජ රූප සහේතුක ප්‍රතිසන්ධි කර්මජරූප යන්ට ප්‍රත්‍යය වන විපාකාමෝහයෙහි සහජාත, නිඃසය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැටේ.

(18) හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි අමෝහයෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිඃසය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති නවය ගැටේ.

සවිපාක ඝටනා පස ය.

Non-commercial distribution

**මේ සඉන්ද්‍රිය මග්ග ඝටනා නවය ය.**

(19) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතියෙහි අධිපති, සහජාත, නිස්සය, ඉන්‍ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති සත ගැටේ.

(20) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන වීමංසාධිපතියෙහි අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ඉන්‍ද්‍රිය, මග්ග, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති නවය ගැටේ.

(21) සාධිපතිචිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතියෙහි අධිපති, සහජාත, නිස්සය, ඉන්‍ද්‍රිය, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැටේ.

**මේ අවිපාක ඝටනා තුනය.**

(22) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ලෝකෝත්තර විපාක වීමංසාධිපතියෙහි අධිපති, සහජාත, නිස්සය, විපාක, ඉන්‍ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ශක්ති අට ගැටේ.

(23) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන ලෝකෝත්තර විපාක විමංසාධිපතියෙහි අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ඉන්‍ද්‍රිය, මග්ග, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දශය ගැටේ.

(24) සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ලෝකෝත්තර විපාක විමංසාධිපතියෙහි අධිපති, සහජාත, නිස්සය, විපාක, ඉන්‍ද්‍රිය, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත, යන ප්‍රත්‍යය ශක්ති නවය ගැටේ.

මේ සවිපාක ඝටනා තුන ය.
**සාධිපති ඉන්ද්‍රිය මග්ග ඝටනා සය ය.**
**මේ සූවිසි දෙන හේතු ප්‍රත්‍යය පිළිබඳ ඝටනාවෝ ය.**

## ආරම්මණ ප්‍රත්‍යය ඝටනා

(1) ගරු කොට අරමුණු කරන්නා වූ ලෝභමූල සිත් අට ය, මහා කුසල් සිත් අට ය, මහා ක්‍රියා ඥාන සම්ප්‍රයුක්ත සිත් සතර ය, ලෝකෝත්තර සිත් අට ය, ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍යය අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික පන්සාළිස ය යන මේ ධර්මයන්ට ප්‍රත්‍යය

Non-commercial distribution

වන ගරු කොට අරමුණු කළ යුතු වූ ඉෂ්ට නිෂ්පන්නරූප අටළොස ය, ද්වේෂමූල දෙසිත ය, මෝහමූල දෙසිතය, දුඃඛසහගත කායවිඥානය ය යන මොවුන් ගෙන් අන්‍ය වූ සිත් සූ අසූව ය, ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය විචිකිත්සා වර්ජිත චෛතසික සත් සාළිස ය, නිර්වාණය ය යන ආරම්මණාධිපති ප්‍රත්‍යය ධර්‍මයන්හි අධිපති, උපනිස්සය යන ප්‍රත්‍යය ශක්ති දෙක ගැටේ.

(2) පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කාම සිත් සිවුපනස ය, අභිඥ දෙසිත ය යන මොවුන්ට ප්‍රත්‍යය වන වර්තමාන නිෂ්පන්නරූප සඞ්ඛ්‍යාත ආරම්මණ පුරේජාත ප්‍රත්‍යයෙහි පුරේජාත අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැටේ.

(3) මනෝද්වාරාවර්ජනය ය, කාමජවන එකුන්තිස ය, තදාරම්මණ එකොළොස ය යන මොවුනට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපන් වස්තුවාරම්මණ පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යයෙහි නිස්සය, පුරේජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(4) ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ වර්තමාන නිෂ්පන්නරූප අටළොස වූ ආරම්මණ පුරේජාතාධිපති ප්‍රත්‍යයෙහි අධිපති, උපනිස්සය, පුරේජාත, අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(5) ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපන් හෘදයවස්තුව වූ ආරම්මණාධිපති ප්‍රත්‍යයෙහි අධිපති, නිස්සය, උපනිස්සය, පුරේජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

මේ ආරම්මණ ප්‍රත්‍යය සටනා පස ය.

---

## අධිපති ප්‍රත්‍යය සටනා.

(1) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන අධිපති ධර්‍ම තුන හා සතර අතුරෙන් එක එකක් වූ සහජාතාධිපති ප්‍රත්‍යයෙහි ද, ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු ඉෂ්ට නිෂ්පන්නරූප අටළොස වූ ආරම්මණාධිපති ප්‍රත්‍යයෙහි ද අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දෙක ගැටේ.

Non-commercial distribution

(2) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන අධිපති ධර්ම තුන හා සතර අතුරෙන් එකක් වූ සහජාතාධිපති ප්‍රත්‍යයෙහි හා ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවන පසට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් පූර්වයෙහි සතළොස්වන චිත්තය හා උපන් හෘදයවස්තුව වූ ආරම්මණාධිපති ප්‍රත්‍යයෙහි ද නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැවේ.

(3) සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන අධිපති ධර්ම තුන හා සතර අතුරෙන් එක එකක් වූ සහජාතාධිපති ප්‍රත්‍යයෙහි හා ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුති චිත්තයෙන් පූර්වයෙහි සතළොස්වන චිත්තය හා උපන් හෘදයවස්තුව වූ ආරම්මණාධිපති ප්‍රත්‍යයෙහි ද නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැවේ.

මේ මිශ්‍රක ඝටනා තුන ය.

(4) ගරුකොට අරමුණු කරන්නා වූ ලෝභමූල සිත් අට ය, මහා කුසල් සිත් අට ය, මහාක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිත් සතර ය, ලෝකෝත්තර සිත් අට ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ ඉෂ්ට නිෂ්පන්නරූප අටොළොස ය, ද්වේෂමූල ද්වය ය, මෝහමූල ද්වයය, දුඃඛ සහගත කායවිඥානය ය යන මොවුන් ගෙන් අන්‍ය වූ සිත් සූ අසූව ය, ද්වෙෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය කෞකෘත්‍යය විචිකිත්සා වර්ජිත චෛතසික සත්සාළිස ය කාලමුක්ත නිර්වාණය ය යන ආරම්මණාධිපති ප්‍රත්‍යයෙහි ආරම්මණ උපනිස්සය යන ප්‍රත්‍යය ශක්ති දෙක ගැවේ.

(5) ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කොට අරමුණු කළ යුතු වූ වර්තමාන ඉෂ්ට නිෂ්පන්නරූප අටොළොස වූ ආරම්මණාධිපති ප්‍රත්‍යයෙහි ආරම්මණ, උපනිස්සය, පුරේජාත, අත්ථි, අවිගත යන ප්‍රත්‍ය ය ශකති පස ගැවේ.

(6) ගරු කොට අරමුණු කරන්නා වූ ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුති චිත්තයෙන් පූර්වයෙහි සතොළොස්වන චිත්තය හා උපන් හෘදයවස්තු රූපයෙහි ආරම්මණ, නිස්සය, උපනිස්සය, පුරේජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැවේ.

මේ ප්‍රකීර්ණක ඝටනා තුන ය.

(7) සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ඡන්දාධිපතියෙහි සහජාත, නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැවේ.

Non-commercial distribution

(8) සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන ඡන්දාධිපතියෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

(9) සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ඡන්දාධිපතියෙහි සහජාත, නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

මේ අවිපාක ඝටනා තුනය.

(10) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන් ට ද ප්‍රත්‍යය වන ලෝකෝත්තර ඵල සිත් සතරෙහි වූ ඡන්දාධිපතියෙහි සහජාත, නිස්සය, විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(11) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන ඵලචිත්ත සම්ප්‍රයුක්ත ඡන්දාධිපතියෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්ප්‍රයුක්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

(12) සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ඵල චිත්ත සම්ප්‍රයුක්ත ඡන්දාධිපතියෙහි සහජාත, නිස්සය, විපාක, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

මේ සවිපාක ඝටනා තුන ය.

මෙසේ ඡන්දාධිපති ඝටනා සයක් වේ.

(13) සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන චිත්තාධිපතියෙහි සහජාත, නිස්සය, ආහාර, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

(14) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන චිත්තාධිපතියෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, ඉන්ද්‍රිය, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැටේ.

(15) සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන චිත්තාධිපතියෙහි සහජාත, නිස්සය, ආහාර, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

මේ අවිපාක ඝටනා තුන ය.

(16) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ඵලචිත්ත සඞ්ඛ්‍යාත චිත්තාධිපතියෙහි සහජාත, නිස්සය, ආහාර, විපාක, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

Non-commercial distribution

(17) සම්ප්‍රයුක්තස්කන්ධයට පමණක් ප්‍රත්‍යය වන ලෝකෝත්තර ඵලචිත්ත සඞ්ඛ්‍යාත චිත්තාධිපතියෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ආහාර, ඉන්ද්‍රිය, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති නවය ගැටේ.

(18) සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ලෝකෝත්තර ඵලචිත්ත සඞ්ඛ්‍යාත චිත්තාධිපතියෙහි සහජාත, නිස්සය, විපාක, ආහාර, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශකති අට ගැටේ.

මේ සවිපාක ඝටනා තුන ය.

මෙසේ චිත්තාධිපති ඝටනා සයක් වේ.

(19) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන වීර්‍ය්‍යාධිපතියෙහි සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

(20) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන වීර්‍ය්‍යාධිපතියෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ඉන්ද්‍රිය, මග්ග, සම්ප්‍රයුක්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැටේ.

(21) සාධිපති චිත්තජ රූපයන්ට පමණක් ප්‍රත්‍යය වන වීර්‍ය්‍යාධිපතියෙහි සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැටේ.

මේ අවිපාක ඝටනා තුනය.

(22) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ලෝකෝත්තර ඵල චිත්ත සම්ප්‍රයුක්ත වීර්‍ය්‍යාධිපතියෙහි සහජාත, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

(23) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන ඵලචිත්ත සම්ප්‍රයුක්ත වීර්‍ය්‍යාධිපතියෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, සම්පයුත්ත, අත්ථි, අවිගත, යන ප්‍රත්‍යය ශක්ති නවය ගැටේ.

(24) සාධිපතිචිත්තජරූපයන්ට පමණක් ප්‍රත්‍යය වන ඵලචිත්ත සම්ප්‍රයුක්ත වීර්‍ය්‍යාධිපතියෙහි සහජාත, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැටේ.

මේ සවිපාක ඝටනා තුන ය.

මෙසේ වීර්‍ය්‍යාධිපති ඝටනා සයක් වේ.

Non-commercial distribution

(25) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතියෙහි හේතු, සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

(26) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන වීමංසාධි-පතියෙහි හේතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ඉන්ද්‍රිය, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති නවය ගැටේ.

(27) සාධිපති චිත්තජරූපයන්ට පමණක් ප්‍රත්‍යය වන වීමංසාධිපතියෙහි හේතු, සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍ය ශක්ති අට ගැටේ.

මේ අවිපාක ඝටනා තුන ය.

(28) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ඵල චිත්ත සම්ප්‍රයුක්ත වීමංසාධිපතියෙහි හේතු, සහජාත, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැටේ.

(29) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන ඵලචිත්ත සම්ප්‍රයුක්ත වීමංසාධිපතියෙහි හේතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දශය ගැටේ.

(30) සාධිපති චිත්තජ රූපයන්ට පමණක් ප්‍රත්‍යය වන ඵලචිත්ත සම්ප්‍රයුක්ත වීමංසාධිපතියෙහි හේතු, සහජාත, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති නවය ගැටේ.

මේ සවිපාක ඝටනා තුන ය.
මෙසේ වීමංසාධිපති ඝටනා සයක් වේ.

## අනන්තර ප්‍රත්‍යය ඝටනා.

(1) අභින්න ව්‍යුතිය සහිත වූ පශ්චිම පශ්චිම සිත් එකුන් අනූවට හා චෛතසික දෙපනසට ද ප්‍රත්‍යය වන අභින්නව්‍යුතියෙන් අන්‍ය වූ පූර්ව පූර්ව වූ සිත් එකුන් අනූව ය, චෛතසික දෙපනස ය යන සතර නාමස්කන්ධයන්හි සමනන්තර, උපනිස්සය, නත්ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

(2) ප්‍රථම ජවන ඵල ජවන වර්ජිත පශ්චිම පශ්චිම එක් පනස් ජවනයන්ට ප්‍රත්‍යය වන ජාතියෙන් සමාන අන්තිම ජවන වර්ජිත පූර්ව පූර්ව

Non-commercial distribution

වූ සත්සාළිස් ලෞකික ජවනයන්හි සමනන්තර, උපනිස්සය, ආසේවන, නත්ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(3) මාර්‍ගානන්තරයෙහි උපදනා ඵල ජවනයන්ට ප්‍රත්‍යය වන ජාතියෙන් මාර්‍ගචිත්ත සම්ප්‍රයුක්ත චේතනා සතරෙහි සමනන්තර, උපනිස්සය, කම්ම, නත්ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

මේ අනන්තර ඝටනා තුන ය.
සමනන්තර ප්‍රත්‍යය ඝටනා අනන්තර ප්‍රත්‍යය ඝටනා මෙන් දත යුතු ය.

## සහජාත ප්‍රත්‍යය ඝටනා.

(1) ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්‍මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට හා උපාදය රූපයන්ට ප්‍රත්‍යය වන චිත්තජ ප්‍රතිසන්ධි කර්‍මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්‍මජ ප්‍රවෘත්තිකර්‍මජ වශයෙන් සකල මහා භූතයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා හෘදය වස්තුව ය යන මේ ප්‍රත්‍යය ධර්‍මයන්හි නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැටේ.

(2) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන එකුන් අනූ චිත්තය, චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන චිත්තජ ප්‍රතිසන්ධි කර්‍මජබාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥ-සත්ත්වකර්‍මජ ප්‍රවෘත්ති කර්‍මජ වශයෙන් සකල මහා භූතයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධ හෘදය වස්තුහු ය යන මේ ධර්‍මයන්හි අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

(3) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්හි අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(4) චිත්තජ රූප ප්‍රතිසන්ධි කර්‍මජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා වූ අරූප විපාක ද්විපඤ්චවිඥාන අර්හත්තච්‍යුති වර්ජිත සිත් පන්සැත්තෑව ය, චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය හෘදය වස්තුව යන මේ ධර්‍මයන්හි නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

Non-commercial distribution

(5) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධ හෘදය වස්තුන්හි අඤ්ඤමඤ්ඤ, නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

මේ අවිපාක ඝටනා පස ය.

(6) ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජ රූපයන්ට ද ඔවුනොවුන්ට හා ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන විපාක සිත් සතිස ය, චෛතසික අටතිස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදයවස්තුවට ප්‍රත්‍ය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මේ ධර්මයන්හි නිස්සය, විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

(7) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන විපාකසිත් සතිස ය, චෛතසික අට තිස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදය වස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, යන මේ ධර්මයන්හි අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(8) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන විපාක සිත් සතිස ය, චෛතසික අටතිස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්හි නිස්සය, අඤ්ඤමඤ්ඤ, විපාක, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

(9) චිත්තජ රූපයන්ට හා ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අර්හත්ත ච්‍යුති වර්ජිත විපාකසිත් දෙවිස්ස ය, චෛතසික අටතිසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මේ ධර්මයන්හි නිස්සය, විපාක, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(10) හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්හි නිස්සය, විපාක, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

මේ සවිපාක ඝටනා පස ය.

මෙසේ සහජාත ඝටනා දසයෙක් වේ.

Non-commercial distribution

## අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ඝටනා.

(1) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සියලු එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන චිත්තජාදි සකල මහා භූතයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා හෘදයවස්තුවය යන මේ ධර්මයන්හි සහජාත, නිස්සය, අත්ථි, අවිගත යන මේ ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

(2) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනසය යන නාමස්කන්ධයන්හි සහජාත, නිස්සය, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(3) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධ හෘදයවස්තුන්හි සහජාත, නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

මේ අවිපාක ඝටනා තුන ය.

(4) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සියලු විපාක සිත් සතිස ය චෛතසික අටතිස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය යන මේ ධර්මයන්හි සහජාත, නිස්සය, විපාක, අත්ථි, අවිගත යන මේ ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(5) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන විපාක සිත් සතිසය, චෛතසික අටතිසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධිනාමස්කන්ධයන්හි සහජාත, නිස්සය, විපාක, සම්පයුත්ත, අත්ථි,අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

(6) හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්හි සහජාත, නිස්සය, විපාක, විප්පයුත්ත, අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

මේ සවිපාක ඝටනා තුනය.

මෙසේ අඤ්ඤමඤ්ඤ ප්‍රත්‍යය ඝටනා සයක් වේ.

---

## නිඃශ්‍රය ප්‍රත්‍යය ඝටනා.

(1) ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූපයන්ට ද ඔවුනොවුන්ට හා ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ද ප්‍රත්‍යය වන එකුන්

Non-commercial distribution

අනූ චිත්තය ය චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඕවුනොවුන්ට හා උපාදය රූපයන්ට ප්‍රත්‍යය වන සකල මහා භූතයෝ ය, ඕවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා හෘදයවස්තුව ය යන සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යයෙහි ද, පඤ්චවෝකාර භූමියෙහි උපදනා අරූප විපාක වර්ජිත සප්තවිඥාන ධාතූන්ට ප්‍රත්‍යය වන ප්‍රවෘත්තිකාලයට අයත් වූ ෂට්වස්තු සඞ්ඛ්‍යාත වස්තුපූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යයෙහි ද අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දෙක ගැවේ.

(2) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජ රූපයන්ට ද ප්‍රත්‍යය වන අධිපති ධර්මතුන හෝ සතර අතුරෙන් එකඑකක් වූ සහජාතාධිපති ධර්මයන්හි ද, ගරුකොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවන පසට ප්‍රත්‍යය වන ගරුකොට අරමුණු කළ යුතු වූ ච්‍යුතිචිත්තයට පූර්වයෙහි සතළොස්වන චිත්තය හා උපන් හෘදයවස්තුව වූ වස්තුවාරම්මණාධිපතියෙහි ද අධිපති, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැවේ.

(3). සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ද ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය අට වූ සහජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි ද, පඤ්චවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තු සඞ්ඛ්‍යාත පූර්වජාතින්ද්‍රියප්‍රත්‍යයෙහි ද ඉන්ද්‍රිය, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැවේ.

(4) චිත්තජ රූපයන්ට හා ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අර්හත්තච්‍යුති වර්ජිත සිත් පන්සැත්තෑව ය, චෛතසික දෙපනසය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඕවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා හෘදයවස්තුව ය යන සහජාතවිප්‍රයුක්ත ප්‍රත්‍යයෙහි ද, පඤ්චවෝකාරභූමියෙහි උපදනා වූ අරූපවිපාක වර්ජිත සප්තවිඥාන ධාතූන්ට ප්‍රත්‍යය වන ප්‍රවෘත්තිකාලයෙහි වූ වස්තුරූප සය වූ පූර්වජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයෙහි ද විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැවේ.

(5) සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන අධිපති ධර්මතුන සතර අතුරෙන් එක එකක් වූ සහජාතාධිපති ප්‍රත්‍යයෙහි ද, ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්නජවන පසට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපන් ගරුකළ යුතු වූ හෘදයවස්තු සඞ්ඛ්‍යාත වස්තුවාරම්මණ පූර්වජාත ප්‍රත්‍යයෙහි ද අධිපති, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය සතර ගැවේ.

Non-commercial distribution

(6) චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්ම අට වූ සහජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි ද පඤ්චවිඥාන ධාතූන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තු සංඛ්‍යාත පූර්වජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි ද ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

මේ මිශ්‍රක සටනා සය ය.

(7) පඤ්චවෝකාරභූමියෙහි උපදනා වූ අරූපවිපාක වර්ජිත සප්තවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන ප්‍රවෘත්තිකාලයෙහි ෂට්වස්තු සංඛ්‍යාත පූර්වජාතනිඃශ්‍රය ප්‍රත්‍යයෙහි පූර්වජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

(8) මනෝද්වාරාවර්ජනය ය, කාමජවන එකුන්තිස ය, තදරම්මණ එකොළොස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ව්‍යුතිචිත්තයෙන් පූර්වයෙහි සතළොස්වන චිත්තය හා උපන් හෘදයවස්තුව වූ වස්තාරම්මණ පූර්වජාත ප්‍රත්‍යයෙහි ආරම්මණ, පූර්වජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(9) ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවන පසට ප්‍රත්‍යය වන ව්‍යුතිචිත්තයෙන් පූර්වයෙහි සතළොස් වන චිත්තය හා උපන් ගරු කළ යුතු වූ හෘදයවස්තු සංඛ්‍යාත වස්තාරම්මණ ප්‍රත්‍යයෙහි ආරම්මණ, අධිපති, උපනිස්සය, පූර්වජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

(10) පඤ්චවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තු සංඛ්‍යාත පූර්වජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි පූර්වජාත, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

මේ ප්‍රකීර්ණක සටනා සතර ය.

(11) සහජාත සටනා දසය "ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජ රූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන එකුන් අනූ චිත්තය ය චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට හා උපාදාය රූපයන්ට ප්‍රත්‍යය වන මහාභූතයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා හෘදයවස්තුව ය යන මේ ධර්මයන්හි සහජාත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැටේ" මෙසේ සහජාත ප්‍රත්‍යය සටනා අනුව විස්තර කරනු.

Non-commercial distribution

## උපනිඃශ්‍රය ප්‍රත්‍යය ඝටනා.

(1) ගරු කොට අරමුණු කරන්නා වූ ලෝභමූල සිත් අට ය, මහාකුසල සිත් අට ය, මහාක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිත් සතර ය ලෝකෝත්තරසිත් අට ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ ප්‍රත්‍යුත්පන්න අතීත අනාගත ඉෂ්ට නිෂ්පන්නරූප අටළොස ය ද්වේෂමූලද්වය ය මෝහ මූලද්වය ය දුඃඛසහගත කායවිඥානය ය යන මොවුන්ගෙන් අන්‍ය වූ සිත් සූ අසූව ය, ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය විචිකිත්සා වර්ජිත චෛතසික සත්සාළිස ය, කාලමුක්ත නිර්වාණය ය යන ආරම්මණාධිපතියෙහි ආරම්මණ අධිපති යන ප්‍රත්‍යය ශක්ති දෙක ගැටේ.

(2) ගරු කොට අරමුණු කරන ලෝභමූලසිත් අටට ප්‍රත්‍යය වන ගරු කොට අරමුණු කරනු ලබන්නා වූ ප්‍රත්‍යුත්පන්න ඉෂ්ටනිෂ්පන්න රූප අටළොස වූ ආරම්මණාධිපති ප්‍රත්‍යයෙහි ආරම්මණ, අධිපති, පුරේජාත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(3) ගරු කොට අරමුණු කරන්නා වූ ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් ගරු කළ යුතු වූ හෘදයවස්තු සඞ්ඛ්‍යාත වස්ත්වාරම්මණ ප්‍රත්‍යයෙහි ආරම්මණ, අධිපති, නිස්සය, පුරේජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ. මෙය ආරම්මණාධිපති ඝටනා තුනට සමාන ය.

(4) අර්හත්තච්‍යුතිය සහිත වූ පශ්චිම පශ්චිම සිත් එකුන් අනූව ය, චෛතසික දෙපනසය යන නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අර්හත්තච්‍යුතිවර්ජිත පූර්වපූර්ව වූ එකුන් අනූ චිත්තය ය චෛතසික දෙපනස ය යන අනන්තරෝපනිඃශ්‍රය ප්‍රත්‍යයෙහි අනන්තර, සමනන්තර. නත්ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

(5) ප්‍රථමජවන ඵලජවන වර්ජිත පශ්චිමපශ්චිම වූ එක්පනස් ජවනයන්ට ප්‍රත්‍යය වන අන්තිමජවන මාර්ගජවන ඵලජවන වර්ජිත පූර්වපූර්ව වූ ලෞකික ජවන සත්සාළිසෙහි අනන්තර සමනන්තර, ආසේවන, නත්ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(6) පසු ව උපදනා විපාකසිත් සතිසට ප්‍රත්‍යය වන බලවත් වූ කුශලාකුශලචේතනාවෙහි කර්ම ප්‍රත්‍යය පමණක් ගැටේ.

Non-commercial distribution

(7) මාර්ගානන්තරයෙහි උපදනා ඵලචිත්තයන්ට ප්‍රත්‍යය වන මාර්ගචේතනා සතරෙහි අනන්තර, සමනන්තර, කම්ම, නත්‍ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

---

## පුරේජාත ප්‍රත්‍යය සටනා.

(1) පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අරූපවිපාක වර්ජිත සපනවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන ප්‍රවෘත්තිකාලයෙහි ෂට්වස්තු සඞ්ඛ්‍යාත වස්තුපුරේජාත ප්‍රත්‍යයෙහි අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දෙක ගැටේ.

(2) පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කාමසිත් සිවුපනස ය, අභිඥදෙසිත ය, අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික පනස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන වර්තමාන නිෂ්පන්නරූප අටොළොස වූ ආරම්මණපුරේජාත ප්‍රත්‍යයෙහි ද, පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක වර්ජිත සපනවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන ප්‍රවෘත්ති කාලයෙහි ෂට්වස්තුසඞ්ඛ්‍යාත වස්තුපුරේජාතප්‍රත්‍යයෙහි ද නිස්සය, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

(3) පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කාමසිත් සිවුපනස ය, අභිඥදෙසිත ය, අප්‍රමාණ්‍යවර්ජිත චෛතසික පනස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන නිෂ්පන්නරූප අටොළොස නමැති ආරම්මණ පුරේජාත ප්‍රත්‍යයෙහි ආරම්මණ, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැටේ.

(4) මනෝද්වාරාවර්ජනය ය කාමජවන් එකුන් තිස ය තදාරම්මණ එකොළොස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන මරණාසන්න කාලයෙහි ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් හෘදයවස්තුව වූ වස්ත්වාරම්මණයෙහි ආරම්මණ, නිස්සය, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(5) ගරු කොට අරමුණු කරන්නා වූ ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ වර්තමාන නිෂ්පන්නරූප අටොළොස වූ ආරම්මණාධිපතියෙහි ආරම්මණ, අධිපති, උපනිස්සය, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(6) ගරු කොට අරමුණු කරන්නා වූ ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය

Non-commercial distribution

හා උපන් ගරු කළ යුතු වූ හෘදයවස්තු සඞ්ඛ්‍යාත වත්ථාරම්මණාධිපති ප්‍රත්‍යයෙහි ආරම්මණ, අධිපති, නිස්සය, උපනිස්සය, විප්පයුත්ත, අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

(7) පඤ්චවිඥානධාතුන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තු සඞ්ඛ්‍යාත පූර්වජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි නිස්සය, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

මේ පුරේජාත ඝටනා සත ය.

---

## පශ්චාජ්ජාත ප්‍රත්‍යය ඝටනා.

(1) ප්‍රතිසන්ධ්‍යාදි පූර්ව පූර්ව චිත්තයන් හා ඉපිද රූපස්ථිතියට පැමිණි ඒකජකාය ද්විජකාය ත්‍රිජකාය චතුජකායයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අරූපවිපාක වර්ජිත ප්‍රථම භවාඞ්ගාදි පශ්චිම පශ්චිම වූ සිත් පස් අසූව ය, චෛතසික දෙපනස ය යන මොවුන් කෙරෙහි විප්‍රයුක්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැටේ.

පශ්චාජ්ජාත ප්‍රත්‍යය ඝටනා එකකි.

---

## ආසේවන ප්‍රත්‍යය ඝටනා.

(1) ප්‍රථම ජවන ඵලජවන වර්ජිත පශ්චිම පශ්චිම වූ ජවන එක් පනස ය, චෛතසික දෙපනස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන සමාන ජාති ඇත්තා වූ අන්තිමජවන වර්ජිත පූර්ව පූර්ව වූ ලෞකික ජවන සත් සාළිස ය, චෛතසික දෙපනස ය යන මේ ධර්මයන්හි අනන්තර, සමනන්තර, උපනිස්සය, නත්ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

ආසේවන ප්‍රත්‍යය ඝටනා එකකි.

---

## කර්ම ප්‍රත්‍යය ඝටනා.

(1) පශ්චිම පශ්චිම වූ විපාකසිත් සතිසට හා චෛතසික අටතිසට ප්‍රත්‍යය වන බලවත් වූ පූර්වයෙහි වූ කුශලාකුශල චේතනා එන්හි උපනිඃශ්‍රය ප්‍රත්‍යය ශක්තිය ගැටේ.

Non-commercial distribution

(2) මාර්ගානන්තර ඵලචිත්තයන්ට ප්‍රත්‍යය වන මාර්ගචේතනා සතරෙහි අනන්තර, සමනන්තර, උපනිස්සය, නත්ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

මේ ප්‍රකීර්ණක ඝටනා දෙක ය.

(3) සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන චේතනාවන්හි සහජාත, නිස්සය, ආහාර, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(4) සම්ප්‍රයුක්තසකන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන චේතනාවෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

(5) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන චේතනාවෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

(6) චිත්තජරූපයන්ට හා ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන චේතනාවෙහි සහජාත, නිස්සය, ආහාර, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

මේ අවිපාක ඝටනා සතර ය.

(7) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාක චේතනාවෙහි සහජාත, නිස්සය, විපාක, ආහාර, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

(8) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන විපාක චේතනාවෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

(9) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන විපාක චේතනාවෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, විපාක, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැටේ.

(10) චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට පමණක් ප්‍රත්‍යය වන විපාක චේතනාවෙහි සහජාත, නිස්සය, ආහාර, විපාක, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

Non-commercial distribution

(11) හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි චේතනාවෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ආහාර, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැවේ.

ප්‍රකීර්ණක ඝටනා දෙකය සහජාත ඝටනා නවයය යි.
කර්මප්‍රත්‍යය ඝටනා එකොළොසකි.

---

## විපාක ප්‍රත්‍යය ඝටනා.

(1) ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යයවන විපාක සිත් සතිස ය, චෛතසික අටතිස ය යන මේ ධර්මයන්හි ද, හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්හි ද සහජාත, නිස්සය, අත්ථි. අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැවේ.

(2) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන විපාකසිත් සතිස ය චෛතසික අටතිස ය යන නාමස්කන්ධයන්හි ද හෘදය වස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්හි ද සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැවේ.

(3) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි විපාක නාමස්කන්ධයන්හි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැවේ.

(4) චිත්තජරූපයන්ට හා ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥානච්‍යුති වර්ජිත පඤ්චවෝකාර විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්හි හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධයන්හිද සහජාත, නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැවේ.

(5) හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්හි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැවේ.

මේ විපාක ප්‍රත්‍යය ඝටනා පස ය.

Non-commercial distribution

## ආහාර ප්‍රත්‍යය ඝටනා.

(1) සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන නාමාහාරත්‍රය වූ අරූපාහාර ප්‍රත්‍යයෙහිද ආධ්‍යාත්මික සන්තානයෙහි වූ චතුසමුට්ඨානික රූපයන්ට ප්‍රත්‍යය වන ආධ්‍යාත්මික සන්තානයෙහි ඇති චතුසමුට්ඨානික ඕජාව ය, බාහිරසන්තානයෙහි වූ සෘතුජ ඕජාවය යන රූපාහාර ප්‍රත්‍යයෙහි ද අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දෙක ගැටේ.

මේ මිශ්‍රක ඝටනාව ය.

(2) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ-රූපයන්ට ද ප්‍රත්‍යය වන ඵස්ස චේතනා විඤ්ඤාන සඞ්ඛ්‍යාත නාමාහාර ප්‍රත්‍යයෙහි සහජාත, නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

(3) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන නාමාහාරත්‍රයෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(4) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමනක් ප්‍රත්‍යය වන නාමාහාර-ත්‍රයෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

(5) චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන නාමාහාරත්‍රයෙහි සහජාත, නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

මේ අවිපාක ඝටනා සතර ය.

(6) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන ඵස්ස චේතනා විඤ්ඤාණ යන විපාකනාමා හාරත්‍රයෙහි සහජාත, නිස්සය. විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(7) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන විපාක නාමාහාරත්‍රයෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

(8) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන විපාක නාමාහාරත්‍රයෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති සත ගැටේ.

Non-commercial distribution

(9) චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක නාමාහාර ප්‍රත්‍යයෙහි සහජාත, නිස්සය, විපාක, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

(10) හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට අයත් නාමාහාරත්‍රයෙහි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

මේ සවිපාක සටනා පස ය. මෙ සේ සාමාන්‍ය සටනා නවයෙකි.

(11) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන චේතනාහාරයෙහි සහජාත, නිස්සය, කම්ම, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

12, 13, 14, අන්‍යෝන්‍ය ප්‍රත්‍යය ද, අන්‍යෝන්‍යසම්ප්‍රයුක්ත ප්‍රත්‍යය දෙක ද, විප්‍රයුක්තප්‍රත්‍යය ද යොද ඉතිරි සටනා තුන ද වුක්තානු සාරයෙන් විස්තර කරනු.

(15) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාක චේතනාහාරයෙහි සහජාත, නිස්සය, කම්ම, විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

16,17, 18, 19. අන්‍යොන්‍ය ශක්තිය ද, අන්‍යොන්‍ය සම්ප්‍රයුක්ත ශක්ති දෙක ද, විප්‍රයුක්ත ශක්තිය ද, අන්‍යොන්‍ය විප්‍රයුක්ත ශක්ති දෙක ද ගෙන ඉතිරි සටනා සතර විස්තර කරනු.

මේ සවිපාක සටනා පස ය, මෙ සේ සකම්මසටනා නවයක් වේ.

20, 21, 22, 23, සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විඤ්ඤාණාහාරයෙහි සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ. ඉතිරි සටනා තුන ද විස්තර කරනු.

මේ අවිපාක සටනා සතර ය.

(24) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාක විඤ්ඤාණාහාරයෙහි සහජාත, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ. සටනා පස සම්පූර්ණකොට කියනු.

මේ අවිපාක සටනා පස ය. මෙසේ සඉන්ද්‍රිය සටනා නවයක් වේ.

Non-commercial distribution

(29) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන චිත්තාධිපතියෙහි අධිපති, සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති සය ගැටේ. ඉතිරි ඝටනා දෙක ද විස්තර කරනු.

මේ අවිපාක ඝටනා තුන ය.

(32) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ලෝකෝත්තර ඵලචිත්ත සඞ්ඛ්‍යාත චිත්තාධිපතියෙහි අධිපති, සහජාත, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

33, 34, ඉතිරි දෙක ව්‍යාඛ්‍යානුසාරයෙන් දත යුතු.
මේ සාධිපති ඉන්ද්‍රිය ඝටනා සය ය.

---

## ඉන්ද්‍රිය ප්‍රත්‍යය ඝටනා.

(1) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූප යන්ට ද ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය සඞ්ඛ්‍යාත සහජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි ද පඤ්චවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තු සඞ්ඛ්‍යාත පූරේජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි ද, කර්මජරූපකලාපයන්හි ඉතිරි රූපයන්ට ප්‍රත්‍යය වන රූපජීවිතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි ද අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දෙක ගැටේ.

(2) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය සඞ්ඛ්‍යාත සහජාතේන්ද්‍රිය ප්‍රත්‍යයෙහි ද පඤ්චවිඥාන ධාතූන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තුසඞ්ඛ්‍යාත පූරේජාත ප්‍රත්‍යයෙහි ද නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැටේ.

(3) චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය සඞ්ඛ්‍යාත සහජාතේන්ද්‍රියප්‍රත්‍යයෙහි ද, පඤ්චවිඥාන ධාතූන්ට ප්‍රත්‍යයවන පඤ්චවස්තු සඞ්ඛ්‍යාත පූරේජාත ප්‍රත්‍යයෙහි ද නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

මේ මිශ්‍රක ඝටනා තුන ය.

(4) පඤ්චවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තු සඞ්ඛ්‍යාත පූරේජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි නිස්සය, පූරේජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති පස ගැටේ.

මේ ප්‍රකීර්ණක ඝටනාව ය.

Non-commercial distribution

(5) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්ම අටෙහි සහජාත, නිඃස්‍රය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති සතර ගැවේ. ඉහත කී පරිදි ප්‍රත්‍යයන් යොද අවිපාකඝටනා සතර විස්තර කරත්‍ථ.

(9) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාක නාමේන්ද්‍රිය ධර්ම අටෙහි සහජාත, නිඃස්‍රය, විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැවේ. සවිපාක ඝටනා පස විස්තර කරත්‍ථ.

මේ සාමාන්‍ය ඝටනා නවය ය.

(14) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විරිය, සති, ඒකග්ගතා, පඤ්ඤා යන නාමේන්ද්‍රිය ධර්මයන්හි සහජාත, නිඃස්‍රය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැවේ. අවිපාක ඝටනා සතර ම විස්තර කරත්‍ථ.

(18) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විරිය, සති, ඒකග්ගතා, පඤ්ඤා යන විපාකේන්ද්‍රියයන්හි, සහජාත, නිඃස්‍රය, විපාක, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැවේ. සවිපාකඝටනා පස විස්තර කරත්‍ථ.

මෙ සේ සමාගී ඝටනා නවයක් වේ.

(23) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන වේදනා ඒකග්ගතා යන ඉන්ද්‍රියධර්ම දෙක්හි සහජාත, නිඃස්‍රය, ඣාන, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති පස ගැවේ. අවිපාකඝටනා සතර විස්තර කරත්‍ථ.

(27) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන වේදනා ඒකග්ගතා යන විපාකේන්ද්‍රිය ධර්ම දෙක්හි සහජාත, නිඃස්‍රය, විපාක, ඣාන, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති සය ගැවේ. සවිපාකඝටනා පස සම්පූර්ණ කරත්‍ථ.

මේ සඣ්‍යාන ඝටනා නවය ය.

(32) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන ඒකග්ගතාවෙහි සහජාත, නිඃස්‍රය, ඣාන, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැවේ. අවිපාක ඝටනා සතර විස්තර කරත්‍ථ.

*Non-commercial distribution*

(36) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාක ඒකග්‍රතාවෙහි සහජාත, නිස්සය, විපාක, ඣාන, මග්ග , අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති සත ගැවේ. සවිපාක ඝටනා පස විස්තර කරනු.

මේ සඣානමාර්ගඝටනා නවය ය.

(41) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන මනින්ද්‍රියයෙහි සහජාත, නිස්සය, ආහාර, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැවේ. අවිපාක ඝටනා සතර විස්තර කරනු.

(45) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකමනින්ද්‍රියයෙහි සහජාත, නිස්සය, විපාක, ආහාර, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැවේ. සවිපාකඝටනා පස විස්තර කරනු.

මේ සආහාර ඝටනා නවය ය.

(50) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන චිත්තාධිපතියෙහි අධිපති, සහජාත, නිස්සය, ආහාර, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැවේ. අන්‍යෝන්‍ය සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය දෙක හා විප්‍රයුක්ත ප්‍රත්‍යය දෙක හා විප්‍රයුක්ත ප්‍රත්‍යය ද ගෙන ඉතිරි අවිපාක ඝටනා දෙක විස්තර කරනු.

(53) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ලෝකෝත්තර ඵලචිත්තාධිපතියෙහි අධිපති, සහජාත, නිස්සය, විපාක, ආහාර, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැවේ. අන්‍යෝන්‍ය සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය දෙක ද විප්‍රයුක්ත ප්‍රත්‍යය ද යොද ඉතිරි ඝටනා දෙක විස්තර කරනු. සවිපාක ඝටනා තුනෙකි.

මේ සාධිපති ආහාර ඝටනා සය ය.

(56) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන විරියාධිපතියෙහි අධිපති, සහජාත, නිස්සය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැවේ. අවිපාක ඝටනා තුන සම්පූර්ණ කරනු.

(59) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලචිත්තයෙහි වූ වීර්‍ය්‍යාධිපතියෙහි අධිපති, සහජාත, නිස්සය, විපාක, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැවේ. සවිපාක ඝටනා තුනෙකි.

මේ සාධිපති ඝටනා සය ය.

Non-commercial distribution

(62) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා ත්‍රිහේතුක චිත්තජ රූප ත්‍රිහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන අමෝහයෙහි හේතු, සහජාත, නිශ්‍රය, මග්ග, අස්ති, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ. අවිපාක ඝටනා සතර සම්පූර්ණ කරනු.

(66) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා ත්‍රිහේතුක චිත්තජරූප ත්‍රිහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකාමෝහයෙහි හේතු, සහජාත, නිශ්‍රය, විපාක, මග්ග, අස්ති, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ. සවිපාකඝටනා පස සම්පූර්ණ කරනු.

මේ සහේතු මග්ග ඝටනා නවය ය.

(71) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතියෙහි හේතු, අධිපති, සහජාත, නිශ්‍රය, මග්ග, අස්ති, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ. අවිපාකඝටනා තුන සම්පූර්ණ කරනු.

(74) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලචිත්ත සම්ප්‍රයුක්ත වීමංසාධිපතියෙහි හේතු, අධිපති, සහජාත, නිශ්‍රය, විපාක, මග්ග, අස්ති, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැටේ. සවිපාකඝටනා තුන සම්පූර්ණ කරනු.

මේ හේතු අධිපති මග්ග ඝටනා සය ය.

## ධ්‍යාන ප්‍රත්‍යය ඝටනා.

(1) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ-රූපයන්ට ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ගධර්ම පසෙහි සහජාත, නිශ්‍රය, අස්ති, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ. ඉහත දක්වූ ක්‍රමය අනුව අවිපාකඝටනා සතර සම්පූර්ණ කරනු.

(5) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ-රූපයන්ට ප්‍රත්‍යය වන විපාකධ්‍යානාඞ්ගධර්ම පසෙහි සහජාත, නිශ්‍රය, විපාක, අස්ති, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ. සවිපාකඝටනා පස සම්පූර්ණ කරනු.

මේ සාමාන්‍ය ඝටනා නවය ය.

*Non-commercial distribution*

(10) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන වේදනා ඒකග්ගතා දෙක්හි සහජාත, නිඃස්සය, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ. අවිපාකඝටනා සතරක් වේ.

(14) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ-රූපයන්ට ප්‍රත්‍යය වන විපාක වේදනා ඒකග්ගතා දෙක්හි සහජාත, නිඃස්සය, විපාක, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ. සවිපාක ඝටනා පසෙකි.

මේ සඉන්ද්‍රිය ඝටනා නවය ය.

(19) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විතක්ක, ඒකග්ගතා දෙක්හි සහජාත, නිඃස්සය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ. අවිපාක ඝටනා සතරෙකි.

(23) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාක විතක්ක ඒකග්ගතා දෙක්හි සහජාත, නිඃස්සය, විපාක, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගටේ. සවිපාක ඝටනා පසෙකි.

මේ සමග්ගි ඝටනා නවය ය.

(28) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන ඒකග්ගතාවෙහි සහජාත, නිඃස්සය, ඉන්ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ. අවිපාක ඝටනා සතරෙකි.

(32) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාක ඒකග්ගතාවෙහි සහජාත, නිඃස්සය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ. සවිපාක ඝටනා පසෙකි.

මේ සඉන්ද්‍රිය මග්ග ඝටනා නවය ය.

## මාර්ග ප්‍රත්‍යය ඝටනා.

(1) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන මාර්ගාඞ්ග ධර්ම නවයෙහි සහජාත, නිඃස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ. අවිපාක ඝටනා සතරෙකි.

Non-commercial distribution

(5) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාකමාර්ගාඞ්ග ධර්ම අටෙහි සහජාත, නිස්සය, විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ. සවිපාක ඝටනා පසෙකි.

මේ සාමාන්‍ය ඝටනා නවය ය.

(10) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විරිය, සති, ඒකග්ගතා, පඤ්ඤා යන මාර්ගාඞ්ග සතරෙහි සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ. අවිපාක ඝටනා සතරෙකි.

(14) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විරිය, සති, ඒකග්ගතා, පඤ්ඤ යන විපාක මාර්ගාඞ්ග සතරෙහි සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ. අවිපාක ඝටනා සතරෙකි.

මේ සඉන්ද්‍රිය ඝටනා නවය ය.

(19) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විතක්ක ඒකග්ගතා දෙක්හි සහජාත, නිස්සය, ඣාන, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ. අවිපාක ඝටනා සතරෙකි.

(23) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විතක්ක ඒකග්ගතා යන විපාක මාර්ගාඞ්ග දෙක්හි සහජාත, නිස්සය, විපාක, ඣාන, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ. සවිපාක ඝටනා පසෙකි.

මේ සඣ්‍යානඝටනා නවය ය.

(28) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන ඒකග්ගතාවෙහි සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, ඣාන, අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

**අවිපාක ඝටනා සතරෙකි.**

(32) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාක චිත්ත සම්පයුක්ත ඒකාග්‍රතාවෙහි සහජාත, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, ඣාන, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ. සවිපාකඝටනා පසෙකි.

මේ සඉන්ද්‍රිය ඣාන ඝටනා නවය ය.

Non-commercial distribution

(37) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීය්‍යාධිපතියෙහි අධිපති, සහජාත, නිඃශ්‍රය, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ. අවිපාක ඝටනා තුනෙකි.

(40) සම්ප්‍රයුක්තසකන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ලෝකෝත්තර ඵලචිත්තසම්ප්‍රයුක්ත වීය්‍යාධිපතියෙහි අධිපති, සහජාත, නිඃශ්‍රය, විපාක, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ. සවිපාක ඝටනා තුනෙක් වේ.

මේ සාධිපති ඉන්ද්‍රිය ඝටනා සය ය.

(43) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා ත්‍රිහේතුක චිත්තජරූප ත්‍රිහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන අමෝහයෙහි හේතු, සහජාත, නිඃශ්‍රය, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ. අවිපාක-ඝටනා සතරෙකි.

(47) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා ත්‍රිහේතුක චිත්තජරූප ත්‍රිහේතුක ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකාමෝහයෙහි හේතු, සහජාත, නිඃශ්‍රය, විපාක, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ. සවිපාක ඝටනා පසෙකි.

මේ සහේතුක ඉන්ද්‍රිය ඝටනා නවය ය.

(52) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතියෙහි හේතු, අධිපති, සහජාත, නිඃශ්‍රය, විපාක, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැටේ. අවිපාක ඝටනා තුනෙකි.

(55) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලචිත්තයෙහි වූ වීමංසාධිපතියෙහි හේතු, අධිපති, සහජාත, නිඃශ්‍රය, විපාක, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට ගැටේ. සවිපාකඝටනා තුනෙකි.

මේ සහේතුක අධිපති ඉන්ද්‍රිය ඝටනා සය ය.

## සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ඝටනා

(1) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සියලු එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනසය යන ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයන්හි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිඃශ්‍රය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

Non-commercial distribution

(2) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකලවිපාක නාමස්කන්ධයන්ට සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ.

## විප්‍රයුක්ත ප්‍රත්‍යය සටනා.

(1) චිත්තජරූපයන්ට හා ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අර්හත්තච්‍යුති වර්ජිත සිත් පන්සැත්තෑව ය, චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරප්‍රතිසන්ධිනාමස්කන්ධයන් හා හෘදයවස්තුව ය යන සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයෙහි ද, පඤ්චවෝකාර භූමියෙහි උපදාන වූ අරූපවිපාක වර්ජිත සප්තවිඥාන ධාතුන්ට ප්‍රත්‍යය වන ෂට්වස්තුසඞ්ඛ්‍යාත පූර්වජාතවිප්‍රයුක්තප්‍රත්‍යයෙහි ද, ප්‍රතිසන්ධ්‍යාදි පූර්ව පූර්ව චිත්තයන් හා ඉපද රූපස්ථිතියට පැමිණෙන ඒකජකාය ද්විජකාය ත්‍රිජකාය චතුජකායයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අරූපවිපාක වර්ජිත ප්‍රථම භවාඞ්ගාදි පශ්චිම පශ්චිම වූ සිත් පස් අසූව ය, චෛතසික දෙපනසය යන පශ්චාජ්ජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයෙහි ද අත්ථි, අවිගත යන මේ ප්‍රත්‍යය ශක්ති දෙක ගැටේ.

(2) සකල සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයෙහි ද පූර්වජාත, විප්‍ර-යුක්ත ප්‍රත්‍යයෙහි ද, නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැටේ.

(3) සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන අධිපතිධර්ම තුන හෝ සතර අතුරෙන් එක එකක් වූ සහජාතාධිපති ප්‍රත්‍යයෙහි ද, ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපන් ගරු කළ යුතු වූ හෘදයවස්තු සඞ්ඛ්‍යාත වස්තාරම්මණාධිපති ප්‍රත්‍යයෙහි ද, අධිපති නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

(4) චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්ම අට වූ සහජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි ද, පඤ්චවිඥානයන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තු සඞ්ඛ්‍යාත පූර්වජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි ද, නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැටේ.

මේ මිශ්‍රක සටනා සතර ය.

Non-commercial distribution

(5) සකල පශ්චාජ්ජාතවිප්‍රයුක්ත ප්‍රත්‍යයෙහි පච්චාජාත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැටේ.

(6) සකල පුරේජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයෙහි නිස්සය, පුරේජාත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

(7) මනෝද්වාරාවජ්ජනය ය, එකුන්තිස් කාමජවනයෝ ය, තදරම්මණ එකොළොස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන මරණාසන්නකාලයෙහි ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් හෘදයවස්තු සඞ්ඛ්‍යාත වස්ත්වාරම්මණයෙහි ආරම්මණ, නිස්සය, පුරේජාත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(8) ගරු කොට අරමුණු කරන්නා වූ ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපන් ගරු කළ යුතු වූ හෘදවස්තු සඞ්ඛ්‍යාත වස්ත්වාරම්මණාධිපතියෙහි ආරම්මණ, අධිපති, නිස්සය, උපනිස්සය, පුරේජාත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත ගැටේ.

(9) පඤ්චවිඤ්ඤාන ධාතූන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තු සඞ්ඛ්‍යාත පුරේජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි නිස්සය, පුරේජාත, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගටේ.

මේ ප්‍රකීර්ණක ඝටනා පස ය.

(10) චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඤ්ඤාන අභිඥාච්‍යුති වර්ජිත සිත් පන්සැත්තෑවය, චෛතසික දෙපනය ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා හෘදය වස්තුවය යන සහජාත, විප්‍රයුක්ත ප්‍රත්‍යයෙහි සහජාත, නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

(11) ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරප්‍රතිසන්ධි නාමස්කන්ධ හෘදය වස්තූන්හි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

මේ අවිපාක ඝටනා දෙක ය.

(12) චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අරූපවිපාක ද්විපඤ්චවිඤ්ඤාන අභිඥාච්‍යුති වර්ජිත විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදයවස්තුවට ප්‍රත්‍යය

Non-commercial distribution

වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මේ ධර්‍මයන්හි සහජාත, නිඃශ්‍රය, විපාක, අස්ති, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස ගැටේ.

(13) හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්හි සහජාත, අඤ්ඤමඤ්ඤ, නිඃශ්‍රය, විපාක, අස්ති, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය ගැටේ. මේ සවිපාක ඝටනා දෙක ය.

සහජාත ඝටනා සතරෙකි.

---

## අස්ති ප්‍රත්‍ය ඝටනා.

(1) සකල සහජාතාස්ති පූරේජාතාස්ති, පශ්චාජ්ජාතාස්ති, ආහාරාස්ති, ඉන්ද්‍රියාස්ති ප්‍රත්‍යයන්හි අවිගතප්‍රත්‍යය ශක්තිය පමණක් ගැටේ.

(2) සකල සහජාතනිඃශ්‍රය පූරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යයන්හි නිඃශ්‍රය, අවිගත ප්‍රත්‍යය ශක්ති දෙක ගැටේ.

(3) සකල සහජාතාධිපතිප්‍රත්‍යයෙහි ද ගරු කොට අරමුණු කරන ලෝභමූලසිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ වර්‍තමාන නිෂ්පන්න රූප අටළොස වූ ආරම්මණාධිපති ප්‍රත්‍යයෙහි ද අධිපති අවිගත යන ප්‍රත්‍යය ශක්ති දෙක ගැටේ.

(4) සකල සහජාතාධිපති ප්‍රත්‍යයෙහි ද, ගරු කොට අරමුණු කරන්නා වූ ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුති චිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපන් ගරු කළ යුතු වූ හෘදය වස්තු සඞ්ඛ්‍යාත වස්තවාරම්මණාධිපතියෙහි ද අධිපති, නිඃශ්‍රය, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැටේ.

(5) සකල නාමාහාර රූපාහාර ප්‍රත්‍යයන්හි ආහාර, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දෙක ගැටේ.

(6) සකල සහජාතින්ද්‍රිය පූරේජාතින්ද්‍රිය රූපජීවිතේන්ද්‍රිය ප්‍රත්‍යයන්හි ඉන්ද්‍රිය, අවිගත යන ප්‍රත්‍ය ශක්ති දෙක ගැටේ.

(7) සකල සහජාතින්ද්‍රිය පූරේජාතින්ද්‍රිය ප්‍රත්‍යයන්හි නිඃශ්‍රය, ඉන්ද්‍රිය, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැටේ.

(8) සකල සහජාතවිප්‍රයුක්ත පූරේජාතවිප්‍රයුක්ත පශ්චාජ්ජාත විප්‍රයුක්ත ප්‍රත්‍යයන්හි විප්පයුත්ත, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දෙක ගැටේ.

Non-commercial distribution

(9) සකල සහජාතවිප්‍රයුක්ත පුරේජාතවිප්‍රයුක්ත ප්‍රත්‍යයන්හි නිස්සය, විප්පයුත්ත, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැටේ.

(10) සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන අධිපති ධර්ම තුන හෝ සතර අතුරෙන් එක එකක් වූ සහජාතාධිපති ප්‍රත්‍යයෙහි ද, ගරු කොට ඇරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන ව්‍යතිචිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපදනා ගරු කළ යුතු හෘදයවස්තුව වූ වස්තවාරම්මණාධිපති ප්‍රත්‍යයෙහි ද අධිපති, නිස්සය, විප්පයුත්ත, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

(11) චිත්තජරූප පතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්ම අට වූ සහජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි ද, පඤ්චවිඥාන ධාතුන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තු සඞ්ඛ්‍යාත පුරේජාතින්ද්‍රිය ප්‍රත්‍යයෙහි ද නිස්සය, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර ගැටේ.

මේ මිශ්‍රක ඝටනා එකොළොස ය.

(12) සකල පශ්චාජ්ජාතප්‍රත්‍යයෙහි පච්ඡාජාත, විප්පයුත්ත, අවිගත යන ප්‍රත්‍යය ශක්ති තුන ගැටේ.

(13) "කාමසිත් සිවුපනසයට හා අභිඥදෙසිතට ප්‍රත්‍යය වන වර්තමාන නිෂ්පන්නරූප අටළොස වූ ආරම්මණ පුරේජාත ප්‍රත්‍යයෙහි" යනාදීන් පුරේජාත ප්‍රත්‍යය ඝටනා සත සම්පූර්ණකොට යොදනු.

මේ ප්‍රකීර්ණක ඝටනා අට ය.

(21-38) ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ද යනාදි ක්‍රමයෙන් සහජාතඝටනා අටොළොස යොද ගත යුතු ය.

නත්ථි, විගත ප්‍රත්‍යය ඝටනා අනන්තර ප්‍රත්‍යයෙහි මෙන් ද, අවිගත ඝටනා අත්ථි ප්‍රත්‍යයෙහි මෙන් ද විස්තර කළ යුතු ය.

-ප්‍රත්‍යය ඝටනාව නිමියේ ය. -

Non-commercial distribution

# පට්ඨාන පකරණං.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

හෙතුපච්චයො, ආරම්මණපච්චයො, අධිපතිපච්චයො, අනන්තර පච්චයො, සමනන්තරපච්චයො, සහජාතපච්චයො, අඤ්ඤමඤ්ඤපච්චයො, නිස්සයපච්චයො, උපනිස්සයපච්චයො, පුරෙජාතපච්චයො, පච්ඡාජාත පච්චයො, ආසෙවනපච්චයො, කම්මපච්චයො, විපාකපච්චයො, ආහාර පච්චයො, ඉන්ද්‍රියපච්චයො, ඣානපච්චයො, මග්ගපච්චයො, සම්පයුත්ත පච්චයො, විප්පයුත්ත පච්චයො, අත්ථිපච්චයො, නත්ථිපච්චයො, විගතපච්චයො, අවිගත පච්චයො ති.

**පච්චයුද්දෙසො.**

(1) **හෙතුපච්චයො** ති, හෙතු හෙතුසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං හෙතුපච්චයෙන පච්චයො.

(2) **ආරම්මණපච්චයො** ති, රූපායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තංසම්පයුත්තකාන ඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො. සද්දායතනං සොතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො. ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො. රසායතනං ජිව්හාවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ-පච්චයෙන පච්චයො, ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො. රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො. සබ්බෙ ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො. යං යං ධම්මං ආරබ්භ, යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති, චිත්තචෙතසිකා ධම්මා තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං ආරම්මණපච්චයෙන පච්චයො.

(3) **අධිපතිපච්චයො** ති, ඡන්දාධිපති ඡන්දසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො. විරියාධිපති විත්තසම්පයුත්තකානං ධම්මානං තංසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො. චිත්තාධිපති චිත්ත සම්පයුත්ත කානං ධම්මානං තං සමුට්ඨානානඤ්චරූපානං අධිපති පච්චයෙන පච්චයො. වීමංසාධිපති වීමංසසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච

Non-commercial distribution

රූපානං අධිපති පච්චයෙන පච්චයො. යං යං ධම්මං ගරුං කත්වා යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසික ධම්මා තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං අධිපති පච්චයෙන පච්චයො.

(4) **අනන්තරපච්චයො** ති, චක්ඛුවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො, මනොධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකනෙඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො. සොතවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො. මනොධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො. ඝානවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනො ධාතුයා තං සම්පයුත්තකාන ඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො, මනොධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකාන-ඤ්ච ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො. ජිව්හාවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො, මනොධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො. කාය විඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො මනොධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තරපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො. යෙසං යෙසං ධම්මානං අනන්තරා යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං අනන්තර පච්චයෙන පච්චයො.

Non-commercial distribution

(5) **සමනන්තරපච්චයො** ති, චක්ඛුවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර පච්චයෙන පච්චයො, මනොධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර-පච්චයෙන පච්චයො. සොත විඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො, මනොධාතු තං සම්පයුත්තකාච ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො. ඝාන විඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර පච්චයෙන පච්චයො, මනොධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර පච්චයෙන පච්චයො. ජිව්හා විඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො, මනොධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො. කාය විඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනොධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර-පච්චයෙන පච්චයො, මනො ධාතු තං සම්පයුත්තකා ච ධම්මා මනො විඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං සමනන්තර-පච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං සමනන්තර පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං සමනන්තර පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං සමනන්තර පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො. යෙසං යෙසං ධම්මානං සමනන්තරා යෙ යෙ ධම්මා උප්පජ්ජන්ති චිත්තචෙතසිකා ධම්මා, තෙ තෙ ධම්මා තෙසං තෙසං ධම්මානං සමනන්තරපච්චයෙන පච්චයො.

(6) **සහජාතපච්චයො** ති, චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤ-*මඤ්ඤං* සහජාත පච්චයෙන පච්චයො. චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං

Non-commercial distribution

සහජාත පච්චයෙන පච්චයො. ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං සහජාතපච්චයෙන පච්චයො, චිත්ත චෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං සහජාතපච්චයෙන පච්චයො. මහාභූතා උපාදයරූපානං සහජාතපච්චයෙන පච්චයො. රූපිනො ධම්මා අරූපීනං ධම්මානං කිඤ්චි කාලෙ සහජාතපච්චයෙන පච්චයො. කිඤ්චි කාලෙ න සහජාත පච්චයෙන පච්චයො.

(7) **අඤ්ඤමඤ්ඤපච්චයො** ති. චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤපච්චයෙන පච්චයො. චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤ පච්චයෙන පච්චයො. ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤපච්චයෙන පච්චයො.

(8) **නිස්සයපච්චයො** ති. චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං නිස්සය පච්චයෙන පච්චයො. චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං නිස්සයපච්චයෙන පච්චයො. ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං නිස්සය පච්චයෙන පච්චයො. චිත්තචෙතසිකා ධම්මා චිත්ත සමුට්ඨානානං රූපානං නිස්සය පච්චයෙන පච්චයො. මහා භූතා උපාදය රූපානං නිස්සයපච්චයෙන පච්චයො. චක්ඛායතනං චක්ඛු විඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සය පච්චයෙන පච්චයො. සොතායතනං සොතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයෙන පච්චයො. ඝානායතනං ඝානවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයෙන පච්චයො. ජිව්හායතනං ජිව්හා විඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සය පච්චයෙන පච්චයො. කායායතනං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං නිස්සයපච්චයෙන පච්චයො. යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණධාතු ච වත්තන්ති තං රූපං මනොධාතුයා ච මනොවිඤ්ඤාණධාතුයා ච තංසම්පයුත්තකානඤ්ච ධම්මානං නිස්සයපච්චයෙන පච්චයො.

(9) **උපනිස්සයපච්චයො** ති පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං කෙසඤ්චි උපනිස්සයපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං උපනිස්සය පච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානංඅකුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං කෙසඤ්චි උපනිස්සයපච්චයෙන

Non-commercial distribution

පච්චයො. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං උපනිස්සය පච්චයෙන පච්චයො.

පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං උපනිස්සය පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං උපනිස්සයපච්චයෙන පච්චයො. උතුභොජනං පි උපනිස්සය පච්චයෙන පච්චයො. පුග්ගලො පි උපනිස්සය පච්චයෙන පච්චයො. සෙනාසනං පි උපනිස්සය පච්චයෙන පච්චයො.

**(10) පුරෙජාතපච්චයො** ති චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණ ධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො. සොතායතනං සොතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො. ඝානායතනං ඝානවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො. ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො. කායායතනං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො.

රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො. සද්දායතනං සොතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො.

ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො. රසායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයො. ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාත පච්චයෙන පච්චයො.

රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො. යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණධාතු ච වත්තන්ති තං රූපං මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං පුරෙජාතපච්චයෙන පච්චයො. මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානං ච ධම්මානං කිඤ්චි කාලෙ පුරෙජාතපච්චයෙන පච්චයො. කිඤ්චිකාලෙ න පුරෙජාත පච්චයෙන පච්චයො.

Non-commercial distribution

(11) **පච්ඡාජාතපච්චයො** ති පච්ඡා ජාතා චිත්තචෙතසිකා ධම්මා පුරෙජාතස්ස ඉමස්ස කායස්ස පච්ඡාජාතපච්චයෙන පච්චයො.

(12) **ආසෙවනපච්චයො** ති පුරිමා පුරිමා කුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා අකුසලා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො. පුරිමා පුරිමා ක්‍රියා අබ්‍යකතා ධම්මා පච්ඡිමානං පච්ඡිමානං ක්‍රියා අබ්‍යාකතානං ධම්මානං ආසෙවන පච්චයෙන පච්චයො.

(13) **කම්මපච්චයො** ති කුසලාකුසලං කම්මං විපාකානං ඛන්ධානං කටත්තා ච රූපානං කම්මපච්චයෙන පච්චයො. චෙතනා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං කම්මපච්චයෙන පච්චයො.

(14) **විපාකපච්චයො** ති විපාකා චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං විපාක පච්චයෙන පච්චයො.

(15) **ආහාරපච්චයො** ති කබලිංකාරො ආහාරො ඉමස්ස කායස්ස ආහාර පච්චයෙන පච්චයො. අරූපිනො ආහාරා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ආහාරපච්චයෙන පච්චයා.

(16) **ඉන්ද්‍රියපච්චයො** ති චක්ඛුන්ද්‍රියං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො. සොතින්ද්‍රියං සොතවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රියපච්චයෙන පච්චයො. ඝානින්ද්‍රියං ඝානවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො. ජිව්හින්ද්‍රියං ජිව්හා විඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රියපච්චයෙන පච්චයො. කායින්ද්‍රියං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං ඉන්ද්‍රියපච්චයෙන පච්චයො. රූපජීවිතින්ද්‍රියං කටත්තාරූපානං ඉන්ද්‍රියපච්චයෙන පච්චයො. අරූපිනො ඉන්ද්‍රියා සම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ඉන්ද්‍රිය පච්චයෙන පච්චයො.

(17) **ඣානපච්චයො** ති ඣානඞ්ගානි ඣානසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං ඣාන පච්චයෙන පච්චයො.

(18) **මග්ගපච්චයො** ති මග්ගඞ්ගානි මග්ගසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං මග්ගපච්චයෙන පච්චයෙන පච්චයො.

(19) **සම්පයුත්තපච්චයො** ති චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං සම්පයුත්තපච්චයෙන පච්චයො.

Non-commercial distribution

(20) **විප්පයුත්තපච්චයො** ති රූපිනො ධම්මා අරූපීනං ධම්මමානං විප්පයුත්තපච්චයෙන පච්චයො. අරූපිනො ධම්මා රූපීනං ධම්මානං විප්පයුත්තපච්චයෙන පච්චයො.

(21) **අත්ථිපච්චයො** ති චත්තාරෝ ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයෙන පච්චයො. චත්තාරෝ මහාභූතා අඤ්ඤමඤ්ඤං අත්ථි පච්චයෙන පච්චයො. ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං අත්ථිපච්චයෙන පච්චයො. චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං අත්ථිපච්චයෙන පච්චයො. මහාභූතා උපාදය රූපානං අත්ථි-පච්චයෙන පච්චයො.

චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. සොතායතනං සොතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. ඝානායතනං ඝානවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. කායායතනං කායවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො.

රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. සද්දායතනං සොතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. ගන්ධායතනං ඝානවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. රසායතනං ජිව්හාවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. ඵොට්ඨබ්බායතනං කායවිඤ්ඤාණ ධාතුයා තංසම්පයුත්තකාන ඤ්ච ධම්මානං අත්ථිපච්චයෙන පච්චයො. රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනොධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයෙන පච්චයො. යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණධාතු ච වත්තන්ති, තං රූපං මනොධාතුයා ච මනොවිඤ්ඤාණධාතුයා ච තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අත්ථි පච්චයෙන පච්චයො.

(22) **නත්ථිපච්චයො** ති සමනන්තරනිරුද්ධා චිත්තචෙතසිකා ධම්මා පටුප්පන්නානං චිත්තචෙතසිකානං ධම්මානං නත්ථිපච්චයෙන පච්චයො.

(23) **විගතපච්චයො** ති සමනන්තර විගතා චිත්තචෛතසිකා ධම්මා පටුප්පන්නානං චිත්තචෙතසිකානං ධම්මානං විගත පච්චයෙන පච්චයො.

Non-commercial distribution

(24) **අවිගතපච්චයො** ති චත්තාරො ඛන්ධා අරූපිනො අඤ්ඤමඤ්ඤං අවිගතපච්චයෙන පච්චයො. චත්තාරො මහාභූතා අඤ්ඤමඤ්ඤං අවිගතපච්චයෙන පච්චයො. ඔක්කන්තික්ඛණෙ නාමරූපං අඤ්ඤමඤ්ඤං අවිගතපච්චයෙන පච්චයො. චිත්තචෙතසිකා ධම්මා චිත්තසමුට්ඨානානං රූපානං අවිගතපච්චයෙන පච්චයො. මහා භූතා උපාදය රූපානං අවිගතපච්චයෙන පච්චයො.

චක්ඛායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයෙන පච්චයො. සොතායතනං සොත විඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. ඝානායතනං ඝානවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. ජිව්හායතනං ජිව්හාවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයෙන පච්චයො. කායායතනං කායවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයෙන පච්චයො.

රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. සද්දායතනං සොතවිඤ්ඤාණ ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගත පච්චයෙන පච්චයො. ගන්ධායතනං ඝානවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. රසායතනං ජිව්හා විඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. ඵොට්ඨබ්බායතනං කාය-විඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. රූපායතනං සද්දායතනං ගන්ධායතනං රසායතනං ඵොට්ඨබ්බායතනං මනො ධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො. යං රූපං නිස්සාය මනොධාතු ච මනොවිඤ්ඤාණ ධාතු ච වත්තන්ති, තං රූපං මනොධාතුයා ච මනොවිඤ්ඤාණ ධාතුයා ච තං සම්පයුත්තකානඤ්ච ධම්මානං අවිගතපච්චයෙන පච්චයො.

**පච්චයනිද්දෙසො.**

*Non-commercial distribution*

# ප්‍රත්‍යය නිර්දේශවාරය.

## 1. හේතුප්‍රත්‍යය නිර්දේශවාරය.

ප්‍රත්‍යයොද්දෙශයට අනතුරු ව ප්‍රත්‍යය නිර්දේශය වදළ සේක. එ ද හේතුප්‍රත්‍යය නිර්දේශාදි වශයෙන් සූවිසි වැදෑරුම් වේ. එයින් හේතුප්‍රත්‍යය නිර්දේශය පළමුකොට වදළ සේක. එ ද නිර්දිශිතව්‍ය නිදර්ශනාකාර වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් නිර්දිශිතව්‍යය පළමු කොට වදළ සේක. කෙසේ ද? යත්, **හෙතුපච්චයො ති** යනුවෙනි. අනතුරුව නිදර්ශනාකාරය වදළ සේක. කෙසේ ද? යත්, "හේතු හෙතුසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං හෙතුපච්චයෙන පච්චයො" යනුවෙනි.

**පදාර්‍ථ**

හෙතුපච්චයො ති, හේතුපච්චයො යන උද්දෙශයාගේ නිර්දේශය මෙසේ ය, හේතු ලෝභාදි හේතුහු සදෙන, හෙතුසම්පයුත්තකානං, ඒ හේතූන් හා සම්ප්‍රයුක්ත වූ ධම්මානං, සහේතුක සිත් එක් සැත්තෑ ව ය මෝහමූලද්වයෙහි මෝහය හැර චෛතසික දෙපන ස ය යන ධර්‍මයන්ට ද, තං සමුට්ඨානානං, ඒ හේතූන් හා හේතුසම්පයුක්ත ධර්‍මයන් නිසා උපදනා වූ, රූපානං ච, චිත්තජ ප්‍රතිසන්ධි කර්‍මජ රූපයන්ට ද, හෙතුපච්චයෙන, හේතුප්‍රත්‍යය ශක්තියෙන්, පච්චයො. උපකාරක වේ.

**අභිධෙයාර්‍ථ**

එහි "**හෙතුපච්චයො**" යන පාඨයෙන් නිර්දිශිතව්‍යය දක්වූ සේක.

"**හෙතු හෙතුසම්පයුත්තකානං - පෙ - පච්චයො**" යන පාඨයෙන් නිදර්ශනාකාරය දක් වූ සේක.

ඒ නිදර්ශනාකාර පාඨයෙහි 'හෙතු'යන කර්තෘපාඨයෙන් හේතු ෂට්කය වූ ප්‍රත්‍යය ධර්‍මය දක් වූ සේක.

"**හෙතුසම්පයුත්තකානං ධම්මානං තං සමුට්ඨානානඤ්ච රූපානං**" යන සම්ප්‍රදාන පාඨයෙන් සහේතුක සිත් එක්සැත්තෑවය, මෝහමූලද්වයයෙහි මෝහය වර්ජිත චෛතසික දෙපනස ය, සහේතුක චිත්තජ රූප ය, සහේතුක ප්‍රතිසන්ධි කර්‍මජරූප ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මයන් දක් වූ සේය.

'**හෙතුපච්චයෙන**' යන කරණපාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන හෙතු, අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, මග්ග,

Non-commercial distribution

සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දොළොස අතුරෙන් හේතු සඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් උපකාරවීම දක් වූ සේක. (මේ සභාගප්‍රත්‍යයන් ගේ වශයෙන් අභිධෙය දක්වීම ය.)

(ඝටනා ක්‍රමයෙන් මෙසේ ය.) නොහොත් හෙතුපච්චයො යන කරණ පාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සහේතුක චිත්තජ රූපසහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන හේතු සය වේ නම්, හේතු, සහජාත, නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන් හේතුසඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් උපකාර වීම ද,

සම්ප්‍රයුක්තසකන්ධයන්ට හා හෘදය වස්තුවට ප්‍රත්‍යය වන හේතු සය වේ නම්, හේතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති සය අතුරෙන් හේතු සඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් උපකාර වීම ද,

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන හේතු සය වේ නම් හේතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් හේතු සඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් උපකාර වීම ද,

සහේතුක චිත්තජරූපයන්ට හා සහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන හේතු සය වේ නම්, හේතු, සහජාත, නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් හේතු සඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් උපකාර වීම ද දක් වූ සේක. (මේ අවිපාක ඝටනා සතර ය)

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සහේතුකචිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක හේතු තුන වේ නම්, හේතු, සහජාත, නිස්සය, විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති සය අතුරෙන් හේතුසඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් උපකාර වීම ද,

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන විපාක හේතු තුන වේ නම් හේතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති සත අතුරෙන් -පෙ- වීම ද,

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන විපාක, හේතු තුන වේ නම්, හේතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති සත අතුරෙන් -පෙ- වීම ද,

චිත්තජරූපප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක හේතු තුන වේ නම් හේතු, සහජාත, නිස්සය, විපාක, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති අට අතුරෙන් -පෙ- වීම ද,

Non-commercial distribution

හෘදයවස්තුවට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි හේතු තුන වේ නම්, හේතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් හේතුසඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් උපකාර වීම ද දක් වූ සේක. (මේ සවිපාක ඝටනා පස ය.)

(මෙසේ සෙන්ද්‍රිය මාර්‍ගී ඝටනා නවය හා සාධිපති ඉන්ද්‍රිය මාර්‍ගී ඝටනා සය ද, අනු ව අභිධෙය අවුලා පුරුදු කරනු. මතු ප්‍රත්‍යය ඝටනාවලදී පහසු වන්නේ එසේ කළ කල්හිය.)

විශේෂ කරුණුඃ

ඉහත දක්වුණු නිදර්‍ශනාකාරපාඨයා ගේ ආදිය "හෙතු සම්පයුත්තකානං" යි නො වදරා හෙතු හෙතුසම්පයුත්තකානං යි වදරන ලදුයේ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්නයන් නිරවුල් වනු පිණිසය. සම්පයුත්ත යනු සාමාන්‍යයෙන් අන්‍යෝන්‍ය මිශ්‍රත්වයට පැමිණෙන සකල චිත්තචෛතසිකයන් ම කියැවෙන වචනයෙකි. හේතුහු සම්ප්‍රයුක්ත ධර්‍මයනට ප්‍රත්‍යය වෙතැ යි වදළ හොත් සම්පයුත්ත යන වචනයෙන් කියැවෙන චක්ෂුර්විඥනාදි අහේතුක ධර්‍මයනට ද හේතුහු ප්‍රත්‍යය වෙති ය යන වැරදි හැඟීම ඇති විය හැකි ය. සහේතුක ධර්‍ම විෂයෙහි අසවල් හේතුව ප්‍රත්‍යය වන්නේ අසවල් සම්ප්‍රයුක්ත ධර්‍මයනට ය යන විභාගය ද නො දනේ. හේතුහු හේතුසම්ප්‍රයුක්ත ධර්‍මයනට ප්‍රත්‍යය වේතැ යි වදල කල්හි අසන්නවුන්ට ඒ අවුල් දෙක ම නො වන්නේ ය.

"හෙතු හෙතුසම්පයුත්තකානන්ති එත්ථ හෙතු සම්පයුත්තකානන්ති අවත්වා හෙතු හෙතුසම්පයුත්තකාන න්ති කස්මා වුත්තන්ති? පච්චයස්ස චෙව පච්චයුප්පන්නානඤ්ච වවත්ථාපනතො. හෙතුසම්පයුත්තකානන්ති හි වුත්තෙ හෙතුනා සම්පයුත්තකානං අඤ්ඤකො නාම ධම්මො හෙතුපච්චයෙන පච්චයො ති පච්චය පච්චයුප්පන්න වවත්ථානං න පඤ්ඤායෙය්‍ය, අථා පි හෙතුනා සම්පයුත්තකානං හෙතුසම්පයුත්තකානන්ති අත්ථං අගගහෙත්වා යෙසං කෙසඤ්චි සම්පයුත්තකානං හෙතුපච්චයෙන පච්චයොති අත්ථො භවෙය්‍ය එවං සන්තෙ හෙතුනා විප්පයුත්තා චක්ඛුවිඤ්ඤාණාදයො පි සම්පයුත්තකා යෙව, හෙතුනා සම්පයුත්තා කුසලාදයො පි. තත්ථ අයං හෙතු අඤ්ඤකස්ස නාම සම්පයුත්තක ධම්මස්ස පච්චයොති පච්චයුප්පන්න වවත්ථානං න පඤ්ඤායෙය්‍ය තස්මා පච්චයඤ්චෙව පච්චයුප්පන්නං ච වවත්ථපෙන්තො හෙතු හෙතුසම්පයුත්තකානන්ති ආහ" යනු අටුවා යි.

"තං සමුට්ඨානානං යනු සමාස පදයෙකි. ත ශබ්දයා කෙරෙන් වූ බින්දුව ආගමවර්‍ණයෙකි. තංසමුට්ඨානානං යනුවෙන් හේතුන් හා

Non-commercial distribution

හේතුසම්ප්‍රයුක්ත ධර්මයන් නිසා හටගන්නා රූපයෝ කියැවෙති. ඔව්හු නම් සහේතුක චිත්තජරූප හා සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය. චිත්තජරූපයෝය යි කියනු ලබන රූපයෝ සිතින් පමණක් උපදවන්නාහු නො වෙති. ඒවා උපදවන්නේ චිත්ත චෛතසික දෙපක්ෂ විසිනි. චිත්තචෛතසික දෙපක්ෂය එක් ව රූප උපදවති. ඒවාට ව්‍යවහාර පහසුව පිණිස ප්‍රධාන ධර්මය වූ චිත්තයා ගේ වශයෙන් චිත්තජ රූපයෝය යි කියති.

"තෙ හෙතු චෙව හෙතුසම්පයුත්තකා ච ධම්මා සමුට්ඨානා එතෙසන්ති තංසමුට්ඨානානි. තෙසං තංසමුට්ඨානානං. හේතුතො චෙව හෙතුසම්පයුත්ත ධම්මෙහි ච නිබ්බත්තානන්ති අත්‍ථො. ඉමිනා චිත්ත සමුට්ඨාන රූපං සඞ්ගණ්හාති. සබ්බෙ පි හි චිත්තචෙතසිකා එකතො ව හුත්වා රූපං සමුට්ඨාපෙන්ති. ලොකියධම්මදෙසනායං පන චිත්තස්ස අධිකභාවතො තථාවිධං රූපං චිත්තසමුට්ඨානන්ති වුච්චති" යනු අටුවා යි. තවත් දත යුතු කරුණු යට දක්වුණු හේතුප්‍රත්‍යය විස්තරයෙන් දත යුතු ය.

## 2. ආරම්මණ ප්‍රත්‍යය නිර්දේශය

හේතුප්‍රත්‍යය නිර්දේශයට අනතුරු ව ආරම්මණප්‍රත්‍යය නිර්දේශය වදාළ සේක. එද නිර්දිශිතව්‍ය නිදර්ශිතාකාර වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් නිර්දිශිතව්‍යය පළමු කොට වදාළ සේක. කෙසේ ද? යත්; **ආරම්මණපච්චයො ති** යනුවෙනි. අනතුරු ව නිදර්ශිතාකාරය වදාළ සේක. කෙසේ ද? යත්, **රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා -පෙ- ආරම්මණපච්චයෙන පච්චයො** යනුවෙනි.

**පදාර්ථ :**

ආරම්මණපච්චයොති, ආරම්මණපච්චයො යන උද්දෙශයා ගේ නිර්දේශය මෙ සේ ය; රූපායතනං, වර්තමාන රූපාරම්මණය; චක්ඛු විඤ්ඤාණධාතුයා, චක්ෂුර්විඥනධාතුවට ද; තංසම්පයුත්තකානං, ඒ චක්ෂුර්විඥනධාතුව හා සම්ප්‍රයුක්ත වූ; ධම්මානඤ්ච, සර්වචිත්තසාධාරණ චෛතසිකයන් සත් දෙනා හට ද; ආරම්මණපච්චයෙන, ආරම්මණ ප්‍රත්‍යය ශක්තියෙන්; පච්චයො, උපකාරක වේ.
සද්දායතනං, -පෙ-

රූපායතනං, වර්තමානරූපාරම්මණය ද; -පෙ- ඵොට්ඨබ්බායතනං, වර්තමාන ස්ප්‍රෂ්ටව්‍යාරම්මණය ද යන මොහු; මනොධාතුයා, මනෝධාතුත්‍රිකයට ද; තං සම්පයුත්තකානං, ඒ මනෝධාතුව හා සම්ප්‍රයුක්ත වූ, ධම්මානඤ්ච,

Non-commercial distribution

ඡන්ද ප්‍රීති වීර්‍ය්‍ය වර්ජිත අන්‍යසමාන චෛතසික දශයට ද; ආරම්මණපච්චයෙන, ආරම්මණප්‍රත්‍යය ශක්තියෙන්; පච්චයො, උපකාරක වේ.

සබ්බෙ, සියලු වූ; ධම්මා, ෂඩාරම්මණධර්‍මයෝ; මනොවිඤ්ඤාණ ධාතුයා, මනෝවිඥානධාතුවට ද; තංසම්පයුත්තකානං, ඒ මනෝවිඥානධාතුව හා සම්ප්‍රයුක්ත වූ; ධම්මානඤ්ච, දෙපනස් චෛතසික ධර්‍මයන්ට ද; ආරම්මණපච්චයෙන, ආරම්මණප්‍රත්‍යය ශක්තියෙන්; පච්චයො, උප කාරක වේ.

යං යං ධම්මං, යම්යම් ප්‍රත්‍යය ධර්‍මයක්; ආරබ්භ, අරමුණු කොට; යෙයෙධම්මා, යම්යම් ආරම්මණික ප්‍රත්‍යයෝත්පන්න ධර්‍ම කෙනෙක්; උප්පජ්ජන්ති, උපදිත් ද; චිත්තචෙතසිකා, චිත්තචෛතසික වූ; ධම්මා, ආරම්මණික ධර්‍මයෝ වෙත් ද; තෙතෙ ධම්මා, ඒ ඒ ආරම්මණධර්‍මයෝ; තෙසංතෙසං ධම්මානං, ඒ ඒ ආරම්මණික චිත්තචෛතසික ධර්‍මයන්ට; ආරම්මණපච්චයෙන, ආරම්මණප්‍රත්‍යය ශක්තියෙන්; පච්චයො, උප කාරක වේ.

**ස්වරූපාර්ථ:**

"ආරම්මණපච්චයොති" යනාදි නිර්දේශපාලියෙහි **ආරම්මණප-ච්චයො ති** යනුවෙන් නිර්දිශ්‍යිතව්‍යධර්‍මය දක්වූ සේක: **රූපායතනං චක්ඛු විඤ්ඤාණධාතුයා** යනාදීන් නිදර්ශනාකාරය දක්වූ සේක.

එහි **"රූපායතනං"** යන කර්‍තෘපාඨයෙන් වර්‍තමාන රූපාරම්මණ සඞ්ඛ්‍යාත ප්‍රත්‍යය ධර්‍මය දක්වූ සේක.

**"චක්ඛුවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච, ධම්මානං'** යන සම්ප්‍රදාන පාඨයෙන් චක්ෂුර්විඥානද්වය සර්‍වචිත්තසාධාරණ චෛතසික සත ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්‍ම සමූහය දක්වූ සේක.

**"ආරම්මණපච්චයෙන"** යන කරණපාඨයෙන් එක්වර ලැබිය හැකි ආරම්මණ පුරෙජාත අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර අතුරෙන් ආරම්මණශක්තියෙන් ප්‍රත්‍යය වීම දක්වූ සේක. සද්දායතනං යනාදි පාඨයන් ගේ අභිධෙයයෝ වුක්තානුසාරයෙන් දත යුතු.

**"රූපායතනං -පෙ- ඵොට්ඨබ්බායතනං"** යන කර්‍තෘපාඨයෙන් වර්‍තමාන රූපාදිපඤ්චාරම්මණය දක්වූ සේක. මනොධාතුයා -පෙ- නං යන සම්ප්‍රදාන පාඨයෙන් මනොධාතුත්‍රිකය ය, ඡන්ද ප්‍රීති වීර්‍ය්‍ය වර්ජිත අන්‍යසමාන චෛතසික දශය ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මය දක්වූ සේක.

Non-commercial distribution

"ආරම්මණපච්චයෙන" යන කරණපාඨයෙන් එක්වර ලැබෙන ආරම්මණ, පුරේජාත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති සතර අතුරෙන් ආරමණප්‍රත්‍යයශකතියෙන් ප්‍රත්‍යය වීම දක්වූ සේක.

"සබ්බෙධම්මා" යන කර්තෘපාඨයෙන් එකුන්අනූ චිත්තය ය චෛතසික දෙපනස ය, රූපඅටවිස්ස ය, නිර්වාණයය, ප්‍රඥප්තිය ය යන ෂඩාරම්මණ ප්‍රත්‍යයධර්මය දක්වූ සේක.

"මනොවිඤ්ඤාණධාතුයා -පෙ- යන සම්ප්‍රදානපාඨයෙන් සසැත්තෑ වැදෑරුම් මනෝවිඤ්ඤාණධාතුව ය, චෛත්සික දෙපනසය යන ප්‍රත්‍යයෝත්පන්නධර්ම සමූහය දක්වූ සේක.

තවත් ක්‍රමයකින් කියත හොත් මෙසේ ය. තදරම්මණ එකොළොස ය, හසිතුප්පාදය යන මොවුන්ට ප්‍රත්‍යය වන කාමසිත් සිවූ පනස ය, චෛතසික දෙපනස ය, රූප අටවිස්ස ය යන ෂඩාරම්මණ ධර්මයෝ ය.

අකුසල් සිත් දොළොස ය, මහාකුශල මහාක්‍රියා ඥනවිප්‍රයුක්ත සිත් අට ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ලෞකික සිත් එක් අසූව ය, චෛතසික දෙපනස ය, රූප අටවිසස ය යන ෂඩාරම්මණධර්මයෝ ය,

මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන අර්හත්මාර්ග අර්හත්ඵල වර්ජිත සිත් සත් අසූව ය, චෛතසික දෙපනස ය, රූප අටවිසස ය, නිර්වාණය ය, ප්‍රඥපතිය ය යන ෂඩාරම්මණ ධර්මයෝ ය,

මහාක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිත් සතර ය මනොද්වාරාවර්ජනය ය යන මොවුන්ට ප්‍රත්‍යය වන එකුන්අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය රූප අටවිස්ස ය, නිර්වාණය ය, ප්‍රඥප්තියය යන ෂඩාරම්මණ ධර්මයෝ ය,

දිව්‍යචක්‍ෂුස්කුශලාභිඥවට ප්‍රත්‍යය වන දූර ප්‍රච්ඡන්න සණ්හ සූක්‍ෂ්ම වර්තමාන රූපාරම්මණ ය ය,

දිව්‍යශ්‍රෝත්‍ර කුශලාභිඥාවට ප්‍රත්‍යය වන දූර ප්‍රච්ඡන්න සණ්හ සූක්‍ෂ්ම වර්තමාන ශබ්දරම්මණය ය,

ඍද්ධිවිධ කුශලාභිඥාවට ප්‍රත්‍යය වන පාදක වූ රූපාවචර කුශල පඤ්චමධ්‍යානය ය සතසහස්‍රාදි නිර්මිතරූපයෝ ය යන ෂඩාරම්මණය ය,

චෙතෝපරියකුශලාභිඥවට ප්‍රත්‍යය වන ඉකුත් වූ සත්දින පටන් අනාගත සත්දින දක්වා කාලත්‍රයට අයත් වූ අර්හත්මාර්ග අර්හත්ඵල

Non-commercial distribution

වර්ජිත අන්‍යයන් ගේ සිත් සත් අසූව ය, චෛතසික දෙපනස ය යන ධර්මාරම්මණය ය,

පූර්වේනිවාසානුස්මෘති කුශලාභිඥවට ප්‍රත්‍යය වන පූර්වභවයන්ට අයත් වූ අභිඥාමාර්‍ගී අභිඥාඵල වර්ජිත සිත් සත්අසූව ය, චෛතසික දෙපනස ය, රූප අටවිස්ස ය යන පඤ්චස්කන්ධය ය, ඒ පඤ්චස්කන්ධය අනුව දත යුතු වූ නිර්වාණය, නාමගෝත්‍රාදි ප්‍රඥප්තීහු ය යන ෂඩාරම්මණය ය,

යථාකර්මූපග කුශලාභිඥාවට ප්‍රත්‍යය වන අතීත ලෞකික කුශලාකුශල සඞ්ඛ්‍යාත ධර්මාරම්මණය ය,

අනාගතාංශ කුශලාභිඥවට ප්‍රත්‍යය වන අනාගත වූ අභිඥාමාර්‍ගී අභිඥාඵල වර්ජිත සිත් සත් අසූවය ය, චෛතසික දෙපනස ය, රූප අටවිස්ස ය යන පඤ්චසකන්ධය ය, ඒ පඤ්චසකන්ධානුසාරයෙන් දත යුතු වූ නිර්වාණය ය, නාමගෝත්‍රාදී ප්‍රඥප්තීහු ය යන ෂඩාරම්මණය ය,

දිව්‍ය චක්ෂුස් ක්‍රියාභිඥාවට ප්‍රත්‍යය වන දූරප්‍රච්ඡන්න සඞ්ඛ සූක්ෂම වර්තමාන රූපාරම්මණය ය,

දිව්‍යශ්‍රෝත ක්‍රියාභිඥවට ප්‍රත්‍යය වන දූර ප්‍රච්ඡන්න සඞ්ඛ සූක්ෂම වර්තමාන ශබ්දාරම්මණය ය,

ඍද්ධිවිධ ක්‍රියාභිඥවට ප්‍රත්‍යය වන පාදක වූ රූපාවචර ක්‍රියා පඤ්චමධ්‍යානය ය ශතසහස්‍රාදි නිර්මිත රූපයෝ ය යන ෂඩාරම්මණය ය,

චෙතෝපරියක්‍රියාභිඥවට ප්‍රත්‍යය වන ඉකුත් වූ සත්දිනයෙහි පටන් අනාගත සත්දිනය දක්වා කාලත්‍රයෙහි වූ අන්‍යයන් ගේ එකුන් අනූ චිත්තය වූ ධර්මාරම්මණය ය,

පූර්වේනිවාසානුස්මෘති ක්‍රියාභිඥවට ප්‍රත්‍යය වන පූර්වභවයන්ට අයත් වූ එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය, අටවිසි රූපය ය යන පඤ්චස්කන්ධය ය, ඒ පඤ්චස්කන්ධය අනුව දත යුතු වූ නිර්වාණය ය, නාමගෝත්‍රාදි ප්‍රඥප්තීහු ය යන ෂඩාරම්මණය ය,

යථාකර්මූපග ක්‍රියාභිඥවට ප්‍රත්‍යය වන අතීත ලෞකික කුශලාකුශල කර්මසඞ්ඛ්‍යාත ධර්මාරම්මණය ය,

අනාගතාංශ ක්‍රියාභිඥවට ප්‍රත්‍යය වන එකුන්අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය, රූප අටවිස්ස ය යන පඤ්චස්කන්ධය ය, ඒ පඤ්චස්කන්ධය අනුව දත යුතු වූ නිර්වාණය ය, නාමගෝත්‍රාදි ප්‍රඥප්තීහු ය යන ෂඩාරම්මණය ය,

Non-commercial distribution

රූපාවචර ප්‍රථමධ්‍යාන සිත් තුනට ප්‍රත්‍යය වන කසිණ ප්‍රඥප්ති දශය ය, අශුභ ප්‍රඥප්ති දශය ය, කායගතාසතියට අරමුණු වන කේශාදි කොට්ඨාශ ප්‍රඥප්තිය ය, ආනාපානස්සතියට අරමුණු වන ආශ්වාසප්‍රශ්වාස ප්‍රඥප්තිය ය, මෛත්‍රී කරුණා මුදිතාවන්ට අරමුණු වන අප්‍රමාණ සත්ත්වප්‍රඥප්තියය යන ප්‍රඥප්ති පස්විස්ස වූ ධම්මාරම්මණය ය,

රූපාවචර ද්විතීයධ්‍යාන සිත් තුනය ය, තෘතීයධ්‍යාන සිත් තුන ය, චතුර්ථධ්‍යාන සිත් තුන ය යන මොවුන්ට ප්‍රත්‍යය වන කසිණ ප්‍රඥප්ති දශය ය, ආනාපානස්සතියට අරමුණු වන ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තිය ය, මෛත්‍රී කරුණා මුදිතා යන බ්‍රහ්මවිහාරයන්ට අරමුණු වන අප්‍රමාණ සත්ත්ව ප්‍රඥප්තිය ය යන ප්‍රඥප්ති තුදුස වූ ධම්මාරම්මණය ය,

රූපාවචරපඤ්චමධ්‍යාන සිත් තුනට ප්‍රත්‍යය වන කසිණ ප්‍රඥප්ති දශය ය, ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තිය ය, උපේක්ෂාබ්‍රහ්ම විහාරයට අරමුණු වන අප්‍රමාණ සත්ත්ව ප්‍රඥප්තිය ය යන ප්‍රඥප්ති දෙළොස වූ ධර්මාරම්මණය ය,

ආකාසානඤ්චායතන ධ්‍යාන සිත් තුනට ප්‍රත්‍යය වන ආකාස කසිණයෙන් අන්‍ය වූ කසිණ නවය අතුරෙන් යම්කිසි කසිණයක් උගුළුවා ලබන ලද ආකාශ ප්‍රඥප්තිය වූ ධර්මාරම්මණය ය,

විඤ්ඤාණඤ්චායතන කුසලයට ප්‍රත්‍යය වන අතීතභවයෙහි හෝ වර්තමානභවයෙහි ආධ්‍යාත්මික සන්තානයෙහි හටගත් ආකාසානඤ්චායතන කුශල සඞ්ඛ්‍යාත ධර්මාරම්මණය ය,

විඤ්ඤාණඤ්චායතන විපාකයට ප්‍රත්‍යය වන අතීතභවයෙහි ආධ්‍යාත්මික සන්තානයෙහි හටගත්තා වූ ආකාසානඤ්චායතන කුසලය වූ ධර්මාරම්මණය ය,

විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තයට ප්‍රත්‍යය වන වර්තමාන භවයේ ආධ්‍යාත්මික සන්තානයෙහි උපන් ආකාසානඤ්චායතන ක්‍රියා චිත්තය හා අතීතභවයෙහි හා වර්තමානභවයෙහි ආධ්‍යාත්මික සන්තානයෙහි උපන් ආකාසාඤ්චායතන කුශලචිත්තය ය යන ධර්මාරම්මණය ය,

ආකිඤ්චඤ්ඤායතන සිත් තුනට ප්‍රත්‍යය වන ආකාසානඤ්චායතන කුසලක්‍රියාවන් ගේ අභාවය වූ ධර්මාරම්මණය ය,

නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලයට ප්‍රත්‍යය වන වර්තමානාතීත භවයන්හි ආධ්‍යාත්මික සන්තානයෙහි හටගත් ආකිඤ්චඤ්ඤායතන කුසලය වූ ධර්මාරම්මණය ය.

Non-commercial distribution

නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකචිත්තයට ප්‍රත්‍යය වන පූර්ව භවයෙහි ආධ්‍යාත්මික සන්තානයෙහි හටගත් ආකිඤ්චඤ්ඤායතන කුසලචිත්තය වූ ධර්මාරම්මණය ය,

නෙවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියාචිත්තයට ප්‍රත්‍යය වන වර්තමාන භවයෙහි ආධ්‍යාත්මික සන්තානයෙහි හටගත් ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා චිත්තය ය, අතීතභවයෙහි හෝ වර්තමාන භවයෙහි ආධ්‍යාත්මික සන්තානයෙහි හටගත් ආකිඤ්චඤ්ඤායතන කුසලය ය යන ධර්මාරම්මණය ය,

ලෝකෝත්තර සිත් අටට ප්‍රත්‍යය වන නිර්වාණ සඞ්ඛ්‍යාත ධර්මාරම්මණය ය යන මේ ෂඩාරම්මණ ධර්මයන් "සබ්බෙ ධම්මා" යන කර්තෘපාඨයෙන් දක් වූ සේක.

"**මනොවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං**" යන සම්ප්‍රදානපාඨයෙන් සසැත්තෑවැදෑරුම් මනෝවිඤ්ඤාණධාතුව ය චෛතසික දෙපනස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් දක් වූ සේක.

"**ආරම්මණපච්චයෙන**"යන කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබිය හැකි වූ ආරම්මණ, අධිපති, නිස්සය, උපනිස්සය, පුරේජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් ආරම්මණ ශක්ති විශේෂයෙන් උපකාර වීම දක්වූ සේක.

(විස්තර ක්‍රමය)

යංයං ධම්මං යන පාඨයෙන් අනියමින් ෂඩාරම්මණ සඞ්ඛ්‍යාත ප්‍රත්‍යය ධර්මය දක්වූ සේක. යෙයෙ ධම්මා යන පාඨයෙන් ආරම්මණික ප්‍රත්‍යයෝත්පන්න ධර්මය අනියම වශයෙන් දක්වූසේක. චිත්තචෙතසිකා ධම්මා යන පාඨයෙන් ආරම්මණික ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් සවරූප වශයෙන් දක්වූ සේක. තෙතෙ ධම්මා යන පාඨයෙන් යංයං ධම්මං යන පාඨයෙන් අනියමින් දක්වූ ෂඩාරම්මණ ප්‍රත්‍යය ධර්මයන් නියම වශයෙන් දක්වූ සේක. තෙසංතෙසං ධම්මානං යන පාඨයෙන් යෙයෙ ධම්මා යන පාඨයෙන් දක්වුණු ආරම්මණික ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් දක්වූ සේක. ආරම්මණ පච්චයෙන යන කරණපාඨයෙන් -

ගරු කොට අරමුණු කරන්නා වූ ලෝභමූල සිත් අට ය, මහා කුශල සිත් අට ය, මහා ක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිත් සතර ය, ලෝකෝත්තර සිත් අට ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ඉෂ්ටනිෂ්පන්නරූප අටොළොස ය ද්වේෂමූල මෝහමූල දුඃඛසහගතකාය විඥාන වර්ජිත සිත් සූඅසූව ය, ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය වර්ජිත චෛතසික සත්සාළිස ය,

Non-commercial distribution

නිර්වාණය ය යන ආරම්මණාධිපති ප්‍රත්‍යය වේනම් ආරම්මණ, අධිපති, උපනිස්සය යන ප්‍රත්‍යය ශක්ති තුනෙන් ආරම්මණ සඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් ප්‍රත්‍යය වීමද,

කාමසිත් සිවුපනස ය අභිඥ දෙසිත ය යන මොවුන්ට ප්‍රත්‍යය වන වර්තමාන නිෂ්පන්නරූප අටොළොසවූ ආරම්මණ පූර්වජාත ප්‍රත්‍යය වේ නම් ආරම්මණ, පූර්වජාත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සතර අතුරෙන් ආරම්මණ ශක්තිවිශේෂයෙන් ප්‍රත්‍යයවීම ද,

මනෝද්වාරාවර්ජනය ය, මරණාසන්නජවන පස ය තදාරම්මණ එකොළොස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් පූර්වයෙහි සතොළොස්වන චිත්තය හා උපන් හෘදයවස්තුරූපය වූ වස්ත්වාරම්මණ ප්‍රත්‍යය වේ නම් ආරම්මණ, පූර්වජාත, නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් ආරම්මණ සඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් ප්‍රත්‍යය වීම ද,

ගරු කොට අරමුණු කරන්නා වූ ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරුකොට අරමුණු කළයුතු ඉෂ්ටනිෂ්පන්නරූප අටොළොස වූ ආරම්මණ පූර්වජාත ප්‍රත්‍යය වේනම් ආරම්මණ, පූර්වජාත, අධිපති, උපනිස්සය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති සය අතුරෙන් ආරම්මණ සඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් ප්‍රත්‍යය වීම ද,

ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවන පසට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් ගරු කළ යුතු වූ හෘදයවස්තු සඞ්ඛ්‍යාත වස්ත්වාරම්මණ ප්‍රත්‍යය වේ නම්. ආරම්මණ, පූර්වජාත, අධිපති. නිස්සය, උපනිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් ආරම්මණ සඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් ප්‍රත්‍යය වීම ද දක් වූ සේක.

**විශේෂ කරුණු :-**

"රූපායතනං චක්ඛුවිඤ්ඤාණධාතුයා" යනාදියෙහි පටන් සබ්බෙ ධම්මා මනොවිඤ්ඤාණධාතුයා තංසම්පයුත්තකානඤ්ච ධම්මානං ආරම්මණ පච්චයෙන පච්චයො" යන්න දක්වා ඇති දේශනයෙන් ආරම්මණ ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න විභාගය සම්පූර්ණ වතුදු " යංයං ධම්මං ආරබ්භ යෙයෙ ධම්මා උප්පජ්ජන්ති, චිත්තචෙතසිකා ධම්මා, තෙතෙ ධම්මා තෙසංතෙසං ධම්මානං ආරම්මණපච්චයෙන" යනු වදරන ලදුයේ රූපාදි අරමුණු සය සපතවිඤ්ඤාණධාතුන්ට ප්‍රත්‍යය වන්නේ ඒවා අරමුණු කර උපදනා

Non-commercial distribution

අවස්ථාවෙහි පමණක් බවත් එසේ ප්‍රත්‍යයවීම ඒ ඒ ධර්‍මය අරමුණු කරන චිත්තයන්ට පමණක් බවත් දක්වීම පිණිස ය.

"යංයං ධම්මං ආරබ්භා ති ඉමිනා යෙ තෙ එතාසං සත්තන්නං විඤ්ඤාණධාතූනං ආරම්මණ ධම්මා වුත්තා තෙ තාසං ධාතූනං ආරම්මණං කත්වා උප්පජ්ජනකඛණෙ යෙව ආරම්මණපච්චයො හොන්ති ති දීපෙති. එවං හොන්තා පි ච න එකතො හොන්ති. යංයං ආරබ්භ යෙයෙ උප්පජ්ජන්ති තෙසං තෙසං තෙතෙ විසුංවිසුං ආරම්මණ පච්චයො හොන්ති ති දීපෙති" යනු අටුවා යි.

---

### 3. අධිපතිප්‍රත්‍යය නිර්‍දේශය.

ආරම්මණප්‍රත්‍යය නිර්‍දේශයට අනතුරු ව අධිපතිප්‍රත්‍යය නිර්‍දේශය වදාළ සේක. නිර්දිශිතව්‍ය නිදර්‍ශිතාකාර විභාගය පෙර පරිදි සෑම තන්හි ම කරනු. මතු ප්‍රත්‍යයන්හි එය නොදක්වනු ලැබේ.

**පදර්ථ:**

අධිපතිපච්චයොති, අධිපතිපච්චයො යන උද්දෙශයා ගේ නිර්‍දේශය මෙසේ ය : ඡන්දාධිපති, ඡන්දසඞ්ඛ්‍යාත අධිපති ධර්‍මය තෙමේ ඡන්දසම්ප-යුත්තකානං, ඡන්දය හා සම්ප්‍රයුක්ත වූ; ධම්මානඤ්ච, සාධිපතිජවන දෙපනස ය, ඡන්දවිචිකිත්සා වර්ජිත චෛතසික පනස ය යන මේ ධර්‍මයන්ට ද; තංසමුට්ඨානානං, ඒ ඡන්දය හා ඡන්දසම්ප්‍රයුක්ත ධර්‍මයන් උත්පත්ති හේතුකොට ඇත්තා වූ; රූපානඤ්ච, සාධිපතිචිත්තජරූපයන්ට ද; අධිපතිපච්චයෙන, සහජාතාධිපති ශක්තියෙන්; පච්චයො, උපකාරක වේ.

චිත්තාධිපති, චිත්තාධිපතිය; චිත්තසම්පයුත්තකානං, චිත්තය හා සම්ප්‍රයුක්ත වූ; ධම්මානං, විචිකිත්සාවෙන් අන්‍ය චෛතසිකයන් එක්පනස් දෙනාහට ද; තංසමුට්ඨානානං, ඒ චිත්තාධිපතිය හා චිත්තාධිපති සම්ප්‍රයුක්ත ධර්‍මයන් උත්පත්ති හේතු කොට ඇත්තා වූ; රූපානඤ්ච, සාධිපතිචිත්තජ රූපයන්ට ද; අධිපති පච්චයෙන පච්චයො.

විරියාධිපති, වීර්‍ය්‍යාධිපතිය; විරියසම්පයුත්තකානං, වීර්‍ය්‍ය හා සම්ප්‍රයුක්ත වූ; ධම්මානං, සාධිපතිජවනදෙපනස ය, වීර්‍ය්‍ය විචිකිත්සා වර්ජිත චෛතසික පනස ය යන ධර්‍මයන් හට ද; තංසමුට්ඨානානං, ඒ වීර්‍ය්‍යාධිපතිය හා වීර්‍ය්‍යාධිපතිසම්ප්‍රයුක්තධර්‍මයන් උත්පත්ති හේතු කොට ඇත්තා වූ; රූපානඤ්ච, සාධිපතිචිත්තජ රූපයන්ට ද; අධිපතිපච්චයෙන පච්චයො.

Non-commercial distribution

විමංසාධිපති, විමංසාධිපතිය; වීමංසසම්පයුත්තකානං, වීමංසාධිපතිය හා සම්ප්‍රයුක්ත වූ; ධම්මානං, ත්‍රිහේතුක සාධිපතිජවන සූතිස ය, විමංසයෙන් අන්‍ය වූ චෛතසික සත්තිස ය යන මොවුන්ට ද; තංසමුට්ඨානානං, ඒ වීමංසය ද වීමංසය හා සම්ප්‍රයුක්ත ධර්මයන් ද උත්පත්ති හේතු කොට ඇත්තා වූ; රූපානං ච, සාධිපතිචිත්තජ රූපයන්ට ද; අධිපතිපච්චයෙන පච්චයො.

යංයං ධම්මං, යම්යම් ආරම්මණ ධර්මයක්; ගරුං කත්වා, ගරු කොට; යෙයෙ ධම්මා, යම් යම් ආරම්මණික ප්‍රත්‍යයෝත්පන්න ධර්මකෙනෙක්; උප්පජ්ජන්ති. උපදිත් ද; චිත්තචෙතසිකා, චිත්තචෛතසික වූ; ධම්මා, ධර්මයෝ වෙත් ද; තෙතෙ ධම්මා, ඒ ඒ ෂඩාරම්මණ ප්‍රත්‍යය ධර්මයෝ; තෙසං තෙසං ධම්මානං, ඒ ඒ ආරම්මණික ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන්හට; අධිපති පච්චයෙන, ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තියෙන්; පච්චයො, උපකාරක වේ.

**අභිධෙයාර්ථ** :

ඒ පාඨයන් අතුරෙන් **අධිපතිපච්චයො** ති යන පාඨයෙන් නිර්දිශ්‍යතව්‍යය දක්වූ සේක. **ඡන්දාධිපති - පෙ - පච්චයො** යන පාඨයෙන් නිදර්ශනාකාරය දක්වූ සේක.

නිදර්ශනාකාර පාඨයෙහි **ඡන්දාධිපති** යන කර්තෘපාඨයෙන් සාධිපති ජවන දෙපනසෙහි ඇති ඡන්දාධිපති ප්‍රත්‍යය ධර්මය දක් වූ සේක.

**ඡන්දසම්පයුත්තකානං - පෙ - රූපානං** යන සම්ප්‍රදානපාඨයෙන් සාධිපතිජවන දෙපනස ය, ඡන්ද විචිකිත්සා වර්ජිත චෛතසික පනස ය, සාධිපතිචිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්ම සමූහය දක්වූ සේක.

**අධිපතිපච්චයෙන** යන කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබිය හැකි අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති නවය අතුරෙන් අධිපති සඞ්ඛ්‍යාත ශක්තිවිශේෂයෙන් ප්‍රත්‍යවීම දක්වූ සේක.

නොහොත් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ඡන්දාධිපතිය වේ නම්, අධිපති, සහජාත, නිස්සය, අත්ථි, අවිගත යන ශක්ති පස අතුරෙන් අධිපති සඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් උපකාර වීම ද,

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන ඡන්දපතිය වේ නම්, අඤ්ඤමඤ්ඤ සම්පයුත්ත යන ශක්ති දෙක ද සහිත වූ ප්‍රත්‍යය ශක්ති සතෙන් අධිපතිසඞ්ඛ්‍යාත ශක්තිවිශේෂයෙන් උපකාරවීම ද,

Non-commercial distribution

සාධිපතිචිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ඡන්දාධිපතිය වේ නම් විප්‍රයුක්තශක්තිය ද සමඟ සයක් වූ ප්‍රත්‍යය ශක්තීන් ගෙන් අධිපති ශක්ති සඞ්ඛ්‍යාත ශක්තිවිශේෂයෙන් උපකාර වීම ද (මේ අවිපාක ඝටනා තුන ය.)

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන එළසිත් සතරෙහි ඇති ඡන්දාධිපතිය වේ නම්, අධිපති, සහජාත, නිඃස්‍රය, විපාක, අත්ථි, අවිගත යන සයක් වූ ශක්තීන් අතුරෙන් අධිපති ශක්ති සඞ්ඛ්‍යාත ශක්තිවිශේෂයෙන් උපකාර වීම ද,

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන එළසිත් සතරෙහි වූ ඡන්දාධිපතිය වේ නම්, අන්‍යෝන්‍යසම්ප්‍රයුක්ත ශක්ති දෙක ද සහිත වූ අටක් වූ ප්‍රත්‍යය ශක්තීන් ගෙන් අධිපති ශක්ති සඞ්ඛ්‍යාත ශක්ති විශේෂ-යෙන් උපකාර වීම ද,

සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන එළසිත් සතරෙහි වූ ඡන්දාධිපතිය වේ නම්, විප්‍රයුක්තශක්තිය සහිත වූ ප්‍රත්‍යය ශක්ති සතෙන් අධිපතිශක්ති සඞ්ඛ්‍යාත ශක්තිවිශේෂයෙන් උපකාර වීම ද "අධිපති-පච්චයෙන" යන කරණපාඨයෙන් දක්වූ සේක.

(මේ සවිපාක ඝටනා තුන ය.)

**චිත්තාධිපති** යන් කර්තෘපාඨයෙන් දෙපනස් සාධිපතිජවනය වූ චිත්තාධිපතිය දක්වූ සේක.

**චිත්තසම්පයුත්තකානං -පෙ- රූපානං** යන සම්ප්‍රදාන පාඨයෙන් විචිකිත්සා වර්ජිත චෛතසික එක්පනස ය සාධිපති චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්‍ම දක්වූ සේක.

**අධිපතිපච්චයෙන** යන කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබිය හැකි අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිඃස්‍රය, විපාක, ආහාර, ඉන්ද්‍රිය, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන එකොළොස් ප්‍රත්‍යය ශක්තීන් අතුරෙන් -පෙ- දක්වූ සේක.

නොහොත් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන චිත්තාධිපතිය වේ නම්, අධිපති, සහජාත, නිඃස්‍රය, ආහාර, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් -පෙ- උපකාර වීම ද,

Non-commercial distribution

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන චිත්තාධිපතිය වේ නම්, අන්‍යෝන්‍ය සම්ප්‍රයුක්ත ශක්ති දෙක ද සහිත වූ ප්‍රත්‍යය ශක්ති නවය අතුරෙන් -පෙ- වීම ද,

සාධිපතිචිත්තජරූපයන්ට පමණක් ප්‍රත්‍යය වන චිත්තාධිපතිය වේ නම්, විප්‍රයුක්තශක්තිය ද සහිතවූ අටක් වූ ප්‍රත්‍යශක්තීන් ගෙන් -පෙ- වීම ද, (මේ අවිපාක ඝටනා තුන ය)

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලචිත්ත සඞ්ඛ්‍යාත චිත්තාධිපතිය වේ නම් අධිපති. සහජාත, නිස්සය, විපාක, ආහාර, ඉන්ද්‍රිය, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් -පෙ- වීම ද,

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට පමණක් ප්‍රත්‍යය වන ඵලචිත්තසංඛ්‍යාත චිත්තාධිපතිය වේ නම්, අන්‍යෝන්‍ය සම්ප්‍රයුක්ත ශක්ති දෙක ද සහිත වූ දශයක් වූ ප්‍රත්‍යය ශක්තීන් අතුරෙන් -පෙ- වීමද,

සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලචිත්ත සඞ්ඛ්‍යාත චිත්තාධිපතිය වේ නම් විප්‍රයුක්ත ශක්තිය සහිත වූ ප්‍රත්‍යය ශක්ති නවයෙන් අධිපති ප්‍රත්‍යය සඞ්ඛ්‍යාත ශක්තිවිශේෂයෙන් ප්‍රත්‍යය වීම ද අධිපති පච්චයෙන යන කරණපාඨයෙන් දක්වූ සේක. (මේ සවිපාක ඝටනා තුන ය.)

**"විරියාධිපති"** යන කර්තෘපාඨයෙන් වීර්‍ය්‍යාධිපති සඞ්ඛ්‍යාත ප්‍රත්‍යය ධර්‍මය දක්වූ සේක.

**"විරියසම්පයුත්තකානං -පෙ- රූපානං"** යන සම්ප්‍රදාන පාඨයෙන් සාධිපති ජවන දෙපනස ය, වීර්‍ය්‍ය විචිකිත්සා වර්ජිත චෛතසික පනස ය, සාධිපති චිත්තජරූප ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මයන් දක්වූ සේක.

**"අධිපතිපච්චයෙන"** යන කරණපාඨයෙන් සූදුසු පරිදි එක් වර ලැබිය හැකි අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන එකොළොස් ප්‍රත්‍යය ශක්තීන් අතුරෙන් අධිපතිප්‍රත්‍යය සඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් ප්‍රත්‍යය වීම දක්වූ සේක.

නොහොත් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීර්‍ය්‍යාධිපතිය වේ නම්, අධිපති, සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් -පෙ- (අවිපාක

Non-commercial distribution

සටනා තුන හා සවිපාක සටනා තුන ප්‍රත්‍යයසටනාවෙහි දක්වූ පරිදි සම්පූර්ණ කොට කියනු.)

"**වීමංසාධිපති**" යන කර්තෘපාඨයෙන් වීමංසාධිපතිය වූ ප්‍රත්‍යය ධර්මය දක්වූ සේක.

"**වීමංස සම්පයුත්තකානං - පෙ - රූපානං**" යන සම්ප්‍රදාන පාඨයෙන් සාධිපති ත්‍රිහේතුක ජවන සූතිස ය, ප්‍රඥා වර්ජිත චෛතසික සත්තිස ය, සාධිපතිචිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් දක්වූ සේක.

"**අධිපතිපච්චයෙන**" යන කරණපාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබිය හැකි අධිපති, හේතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, මග්ග, සම්පයුත්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දොළොස අතුරෙන් අධිපති ප්‍රත්‍යය සඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් උපකාර වීම දක්වූ සේක.

නොහොත් සම්ප්‍රයුක්තසකන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතිය වේ නම්, අධිපති, හේතු, සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, මග්ග, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් -පෙ- (අවිපාකසටනා තුන හා සවිපාක සටනා තුන අනූ ව විස්තර කරනු.)

"**යං යං ධම්මං**" යන පාඨයෙන් ගරු කළ යුතු වූ ඉෂ්ටනිෂ්පන්න රූප අටොළොස ය, ද්වේෂමූලද්වය ය, මෝහමූලද්වය ය, දුඃඛසහගත කායවිඥානය ය යන මොවුන් ගෙන් අන්‍ය වූ සිත් සූඅසූවය, ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය වර්ජිත චෛතසික සත්සාළිස ය, නිර්වාණය ය යන ආරම්මණාධිපති ප්‍රත්‍යය ධර්මය අනියම වශයෙන් දක්වූ සේක.

"**යෙ යෙ ධම්මා**" යන පාඨයෙන් ගරු කොට අරමුණු කරන්නා වූ ලොභමූල සිත් අට ය, මහාකුසල සිත් අට ය, මහාක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිත් සතර ය, ලෝකෝත්තර සිත් අට ය, ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය විචිකිත්සා අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික පන්සාළිස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් අනියමින් දක්වූ සේක.

"**චිත්තචෙතසිකා ධම්මා**" යන පාඨයෙන් ගරු කොට අරමුණු කරන්නා වූ ප්‍රත්‍යයෝත්පන්න නාමස්කන්ධයන් ස්වරූප වශයෙන් දක්වූ සේක.

"**තෙ තෙ ධම්මා**" යන පාඨයෙන් "යං යං ධම්මං" යන පාඨයෙන් අනියමින් දක්වුණු ගරු කළ යුතු ෂඩාරම්මණ ධර්මයන් නියම වශයෙන් දක්වූ සේක.

Non-commercial distribution

"**තෙසං තෙසං ධම්මානං**" යන සම්ප්‍රදානපාඨයෙන් "යෙ යෙ ධම්මා" යනුවෙන් අනියමින් දක්වුණු ආරම්මණික ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් නියම වශයෙන් දක්වූ සේක.

"**අධිපති පච්චයෙන**" යන කරණපාඨයෙන් සකලාරම්මණාධිපති ප්‍රත්‍යය වේ නම්, අධිපති, ආරම්මණ, උපනිස්සය යන ප්‍රත්‍යය ශක්ති තුන අතුරෙන් -පෙ- ද,

ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ වර්තමාන ඉෂ්ටනිෂ්පන්නරූප අටොළොස වූ ආරම්මණ පූර්වජාත ප්‍රත්‍යය වේ නම් අධිපති, ආරම්මණ, උපනිස්සය, පූර්වජාත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් -පෙ- ද,

ගරු කොට අරමුණු කරන්නා වූ ලෝභමූල මරණාසන්න ජවන පසට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් ගරුකළ යුතු වූ වස්තවාරම්මණය වේ නම්, අධිපති, ආරම්මණ, නිස්සය, උපනිස්සය, පූර්වජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් අධිපති ශක්ති සඞ්ඛ්‍යාත ශක්තිවිශේෂයෙන් උපකාර වීම ද දක් වූ සේක.

**විශේෂ කරුණු.**

"හේතූ හෙතුසම්පයුත්තකානං" යනාදීන් හේතු සය එක් කොට හේතු ප්‍රත්‍යය නිර්දේශය වදළාක් මෙන් "අධිපතී අධිපති සම්පයුත්තකානං" යනාදීන් අධිපති ධර්ම එක් කොට නො වදරා "ඡන්දාධිපති ඡන්ද සම්පයුත්තකානං" යනාදීන් අධිපති ධර්ම වෙන වෙන ම වදරන ලදුයේ අධිපතිධර්ම සතරම එක්වර ප්‍රත්‍යය නොවන බැවිනි.

"කස්මා? පන යථා හෙතුපච්චය නිද්දෙසෙ හෙතූ හෙතුසම්පයුත්තකානන්ති වුත්තං එව මිධ අධිපති අධිපතිසම්පයුත්තකානන්ති අවත්වා, ඡන්දාධිපති ඡන්දසම්පයුත්තකානන්ති ආදිනා නයෙන දෙසනා කතා ති, එකක්ඛණෙ අභාවතො" යනු අටුවායි.

## 4. අනන්තර ප්‍රත්‍යය නිර්දේශය

අධිපති ප්‍රත්‍යය නිර්දේශයට අනතුරුව අනන්තරප්‍රත්‍යය නිර්දේශය වදළ සේක. (විභාග කරනු)

**පදාර්ථ**

චක්ඛුවිඤ්ඤාණධාතු, චක්ෂුර්විඥනධාතුවද; තංසම්පයුත්තකා, ඒ චක්ෂුර්විඥනධාතුව හා සම්ප්‍රයුක්තවූ; ධම්මාච, සර්වචිත්තසාධාරණ

Non-commercial distribution

චෛතසිකයෝ සත්දෙන ද; මනොධාතුයා, සම්ප්‍රතෝෂණද්වය සඞ්ඛ්‍යාත මනෝ ධාතුවටද; තංසම්පයුක්තකානං, ඒ මනෝධාතුව හා සම්ප්‍රයුක්ත වූ; ධම්මානඤ්ච, ඡන්ද ප්‍රීති වීර්‍ය්‍ය වර්ජිත අන්‍ය සමාන චෛතසිකයන් දශ දෙනාට ද; අනන්තර පච්චයෙන පච්චයො. මනොධාතු, සම්ප්‍රතෝෂණද්වය සඞ්ඛ්‍යාත මනෝධාතුව ද; තංසම්පයුත්තකා, ඒ මනෝධාතුත්‍රය හා සම්ප්‍රයුක්ත වූ; ධම්මා ච, ඡන්ද ප්‍රීති වීර්‍ය්‍ය වර්ජිත අන්‍යසමාන චෛතසිකයෝ ද; මනොවිඤ්ඤාණධාතුයා, සන්තීරණත්‍රය සඞ්ඛ්‍යාත මනෝවිඥනධාතුවට ද; තංසම්පයුත්තකානං, ඒ මනෝවිඥන ධාතුව හා සම්ප්‍රයුක්ත වූ; ධම්මාන-ඤ්ච, ඡන්ද වීර්‍ය්‍ය වර්ජිත අන්‍යසමාන චෛතසික එකොළොසට ද; අනන්තරපච්චයෙන පච්චයො.

පුරිමාපුරිමා, පූර්ව පූර්ව වූ; කුසලා,කුශල වූ; ධම්මා, අන්තිම ජවන වර්ජිත සප්තරස ලෞකික කුශලනාමස්කන්ධයෝ; පච්ඡිමානං පච්ඡිමානං, පශ්චිම පශ්චිම වූ; කුසලානං, කුශල වූ; ධම්මානං ප්‍රථමජවන වර්ජිත එක්විසි කුශලනාමස්කන්ධයන්ට; අනන්තර පච්චයෙන පච්චයො. පූරිමාපුරිමා, පූර්ව පූර්ව වූ; කුසලා, කුශල වූ; ධම්මා, සතොළොස් ලෞකික කුශල අන්තිමජවනයෝ ය මාර්ග ජවනයෝ ය යන නාමස්කන්ධයෝ; පච්ඡිමානංපච්ඡිමානං, පශ්චිම පශ්චිම වූ; අබ්‍යාකතානං, අව්‍යාකෘත වූ; ධම්මානං, සන්තීරණ තුන ය, මහාවිපාක අට ය, මහග්ගතවිපාක නව ය ය, ඵලසිත් සතර ය යන නාමස්කන්ධයන්ට; අනන්තර පච්චයෙන පච්චයො.

පූරිමාපුරිමා, පූර්ව පූර්ව වූ; අකුසලා, අකුශල වූ; ධම්මා, අන්තිම ජවන වර්ජිත අකුශල නාමස්කන්ධයෝ; පච්ඡිමානංපච්ඡිමානං, පශ්චිම පශ්චිම වූ; අකුසලානං, අකුශල වූ; ධම්මානං, ප්‍රථමජවන වර්ජිත අකුශල නාමස්කන්ධයන්ට; අනන්තරපච්චයෙන පච්චයො. පූරිමාපුරිමා, අකුසලා ධම්මා, ද්වාදශාකුශල අන්තිමජවන නාමස්කන්ධයෝ, පච්ඡිමානංපච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං, සන්තීරණතුනය, මහාවිපාක අට ය, මහද්ගත විපාක නවය ය යන නාමස්කන්ධයන්ට; අනන්තර පච්චයෙන පච්චයො.

පූරිමාපුරිමා අබ්‍යාකතා ධම්මා, අභිනිෂ්ක්‍රමව්‍යුති වර්ජිත විපාකසිත් සතිස ය, ක්‍රියාසිත් විස්සය යන නාමස්කන්ධයෝ; පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං; අභිනිෂ්ක්‍රමව්‍යුතිය සහිත වූ විපාකසිත් සතිස ය, ක්‍රියාසිත් විස්සය යන නාමස්කන්ධයන්ට; අනන්තරපච්චයෙන පච්චයො. පූරිමාපූරිමා අබ්‍යාකතා ධම්මා, ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජන නාමස්කන්ධයෝ; පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං, මහා කුශලප්‍රථමජවන නාමස්කන්ධයන්ට; අනන්තර පච්චයෙන පච්චයො.

Non-commercial distribution

පුරිමාපුරිමා අබ්‍යාකතා ධම්මා, ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජන නාමස්කන්ධයෝ; පච්ඡිමානංපච්ඡිමානං අකුසලානං ධම්මානං, ද්වාදශාකුශල ප්‍රථමජවන නාමස්කන්ධයන්ට; අනන්තරපච්චයෙන පච්චයො.

යෙසංයෙසං ධම්මානං, පූර්ව පූර්ව වූ අභිනවච්‍යුති වර්ජිත යම්යම් නාමස්කන්ධයන්ගේ; අනන්තරා, අනන්තරයෙහි; යෙයෙ ධම්මා, අභිනවච්‍යුතිය සහිත වූ යම්යම් පශ්චිමපශ්චිම නාමස්කන්ධ කෙනෙක්; උප්පජ්ජන්ති, උපදිත් ද; චිත්තචෙතසිකා, චිත්තචෛතසික වූ; ධම්මා, ධර්මයෝ වෙත් ද, තෙතෙ ධම්මා, අභිනවච්‍යුතිවර්ජිත පූර්වපූර්ව වූ ඒ ඒ නාමස්කන්ධයෝ; තෙසංතෙසං ධම්මානං, අභිනවච්‍යුතිය සහිත වූ ඒ ඒ පශ්චිම පශ්චිම නාමස්කන්ධයන්ට, අනන්තර පච්චයෙන පච්චයො.

අභිධෙයාර්ථ

එහි **අනන්තර පච්චයො** - යන පාඨයෙන් නිර්දිශිතව්‍යය දක් වූ සේක. **චක්ඛුවිඤ්ඤාණධාතු -පෙ- පච්චයො** යන පාඨයෙන් නිදර්ශිතාකාරය දක්වූ සේක.

ඒ නිදර්ශිතාකාරපාඨයෙහි "**චක්ඛුවිඤ්ඤාණධාතු තං සම්පයුත්තකා ච ධම්මා**" යන කර්තෘපාඨයෙන් චක්ෂුර්විඥාණ ධාතුව ය හා සර්වචිත්ත සාධාරණ චෛතසික සතය යන ප්‍රත්‍යය ධර්මය දක්වූ සේක.

"**මනෝධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං**" යන සම්ප්‍රදාන පාඨයෙන් සම්ප්‍රතෝෂණද්වය සංඛ්‍යාත මනෝධාතුව හා ඡන්ද ප්‍රීති වීර්‍ය්‍ය වර්ජිත අන්‍යසමාන චෛතසික දශය ද වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්මය දක්වූ සේක.

"**අනන්තරපච්චයෙන**" යන කරණපාඨයෙන් එක් වර ලැබෙන අනන්තර, සමනන්තර, උපනිස්සය, නත්ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් අනන්තර සංඛ්‍යාත ශක්ති විශේෂයෙන් උපකාර වීම දක්වූ සේක.

"**මනොධාතු තං සම්පයුත්තකා ච ධම්මා**" යන කර්තෘපාඨයෙන් සම්ප්‍රතෝෂණද්වය සංඛ්‍යාත මනෝධාතුව ය, ඡන්ද ප්‍රීති වීර්‍ය්‍ය වර්ජිත අන්‍යසමාන චෛතසික දශය ය යන ප්‍රත්‍යය ධර්ම දක්වූ සේක.

"**මනොවිඤ්ඤාණධාතුයා තං සම්පයුත්තකානඤ්ච ධම්මානං**" යන සම්ප්‍රදාන පාඨයෙන් සන්තීරණත්‍රය සංඛ්‍යාත මනෝවිඥාන ධාතුව ය ඡන්ද වීර්‍ය්‍ය වර්ජිත අන්‍යසමාන චෛතසික එකොළොස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්ම දක්වූ සේක.

Non-commercial distribution

"**අනන්තරපච්චයෙන**" යන කරණ පාඨයෙන් එක් වර ලැබෙන අනන්තර, සමනන්තර, උපනිස්සය, නත්ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන් අනන්තර ශක්තියෙන් උපකාර වීම දක්වූ සේක.

"**පුරිමාපුරිමා කුසලා ධම්මා**" යන පාඨයෙන් අන්තිම ජවන වර්ජිත පූර්වපූර්ව ලෞකික කුසල් සිත් සතොළොස වූ ප්‍රත්‍යය ධර්මය දක්වූ සේක.

"**පච්ඡිමානංපච්ඡිමානං කුසලානං ධම්මානං**" යන සම්ප්‍රදාන පාඨයෙන් ප්‍රථමජවන වර්ජිත පශ්චිමපශ්චිම කුසල් සිත් එක් විස්ස වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්ම දක්වූ සේක.

නොහොත් "පුරිමාපුරිමා කුසලා ධම්මා" යන පාඨයෙන් මහා කුශල ද්විතීය ජවනයට ප්‍රත්‍යය වන ප්‍රථමජවනය ය -පෙ- සප්තම ජවනයට ප්‍රත්‍යය වන සවන ජවනය ය, මහද්ගත කුශල සෝමනස්ස සහගත ජවන සතර ය, මාර්ග සෝමනස්ස සහගත ජවන සොළොස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ගෝත්‍රභූ වෝදාන කෘත්‍යවත් වූ මහා කුශල ප්‍රථම චිත්ත ද්වය ය, මහද්ගත කුශල උපේක්ෂා සහගත සිත් පසට හා මාර්ගෝපේක්ෂාසහගත සිත් සතරට ප්‍රත්‍යය වන ගෝත්‍රභූ වෝදාන කෘත්‍යවත් මහාකුශල තෘතීය චිත්තද්වය ය, සමාපජ්ජන වීථින්හි පශ්චිමපශ්චිම මහද්ගත කුශලයන්ට ප්‍රත්‍යය වන සමාන ජාතික පූර්වපූර්ව මහද්ගතකුශලයෝ ය යන ප්‍රත්‍යයධර්ම දක්වූ සේක.

"**පච්ඡිමානංපච්ඡිමානං කුසලානං ධම්මානං**" යන සම්ප්‍රදාන පාඨයෙන් ද්විතීයාදි මහාකුශල ජවනයෝ ය, මහද්ගත කුශල ජවනයෝ ය, මාර්ගජවනයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්ම දක්වූ සේක.

"**අනන්තරපච්චයෙන**" යන කරණපාඨයෙන් එක්වර ලැබෙන අනන්තර, සමනන්තර, උපනිස්සය, ආසෙවන, නත්ථි, විගත යන ප්‍රත්‍යශක්ති සය අතුරෙන් අනන්තර සඞ්ඛ්‍යාත ශක්තිවිශේෂයෙන් උපකාර වීම දක්වූ සේක.

"**පුරිමාපුරිමා කුසලා ධම්මා**" යන කර්තෘපාඨයෙන් සතොළොස් ලෞකික කුශලජවනයන් ගේ අන්තිම චිත්තයෝ ය මාර්ගජවනයෝ ය යන ප්‍රත්‍යය ධර්ම දක්වූ සේක.

"**පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං**" යන සම්ප්‍රදාන පාඨයෙන් සන්තීරණ තුන ය, මහාවිපාක අට ය, මහද්ගත විපාක නවය ය, ඵලසිත් සතර ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් දක්වූ සේක.

Non-commercial distribution

නොහොත් මහාකුශල ජවනයන්ට අනතුරු ව තදාරම්මණය වීමෙහිදී තදාරම්මණ එකොළොසට ද, නො වන කල්හි භවාඞ්ග එකුන්විස්සට ද ප්‍රත්‍යය වන මහාකුශල අන්තිම ජවනයෝ ය, හෙට්ඨිමඵල සෝමනස්ස සහගත ජවනයන්ට ප්‍රත්‍යය වන අනුලෝම කෘත්‍යවත් මහාකුශල ප්‍රථම චිත්තද්වය ය, හෙට්ඨිමඵල උපේක්ෂාසහගත සිත් තුනට ප්‍රත්‍යය වන අනුලෝමකෘත්‍යවත් මහාකුසල තෘතීය චිත්තද්ව ය, පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ග නවයට ප්‍රත්‍යය වන රූපාවචර කුශල අන්තිම ජවනය ය, පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ග නවයට හා ආකාසානඤ්චායතන භවාඞ්ගයට ප්‍රත්‍යය වන ආකාසනඤ්චායතන කුසල අන්තිම ජවනය ය, -පෙ- ත්‍රිහේතුක භවාඞ්ග තෙළෙසට හා නිරෝධසමාපත්තියෙන් නැඟීමෙහි දී අනාගාමිඵලයට ද ප්‍රත්‍යය වන නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසල අන්තිම ජවනය ය, සෝතාපත්ති ඵලයට ප්‍රත්‍යය වන සෝතාපත්තිමග්ග ජවනය ය, -පෙ- අරහත්තඵලජවනයට ප්‍රත්‍යය වන අරහත්තමග්ග ජවනය ය යන ප්‍රත්‍යය ධර්මයන් "පුරිමාපුරිමා කුසලා ධම්මා" යන කර්තෘපාඨයෙන් දක්වූ සේක. පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං යන සම්ප්‍රදනපාඨයෙන් සන්තීරණ තුන ය, මහාවිපාක අට ය, මහද්ගත විපාක නවය ය, ඵලසිත් සතර ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් දක්වූ සේක.

"**අනන්තරපච්චයෙන**" යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන අනන්තර, සමනන්තර, උපනිස්සය, නත්ථි, විගත යන ප්‍රත්‍යයශක්ති පස අතුරෙන් අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වීම දක්වූ සේක. ඵලචිත්තයට පූර්වයෙහි උපදනා මාර්ගචිත්තය වේ නම් කර්ම ප්‍රත්‍යය සහිත වූ ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් -පෙ- දක්වූ සේක.

"**පුරිමාපුරිමා අකුසලා ධම්මා**" යන කර්තෘපාඨයෙන් අන්තිම ජවන වර්ජිත ද්වාදශාකුශල ජවන සඞ්ඛ්‍යාත ප්‍රත්‍යය ධර්මය දක්වූ සේක.

"**පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං**" යන සම්ප්‍රදන පාඨයෙන් ප්‍රථම ජවන වර්ජිත ද්වාදශාකුශල ජවන සඞ්ඛ්‍යාත ප්‍රත්‍යයෝත්පන්න ධර්මය දක්වූ සේක.

නොහොත් "පුරිමාපුරිමා අකුසලා ධම්මා" යන කර්තෘපාඨයෙන් දොළොස් අකුසලයන් ගේ ද්විතීය ජවනයට ප්‍රත්‍යය වන ප්‍රථමජවනයය, -පෙ- සත් වන ජවනයට ප්‍රත්‍යය වන සවන ජවනය ය යන ප්‍රත්‍යය ධර්ම දක්වූ සේක. පච්ඡිමානං පච්ඡිමානං අකුසලානං ධම්මානං" යන සම්ප්‍රදනපාඨයෙන් ද්විතියාදි අකුශල ජවන වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් දක්වූ සේක.

Non-commercial distribution

"**අනන්තරපච්චයෙන**" යන කරණපාඨයෙන් එක්වර ලැබෙන අනන්තර, සමනන්තර, උපනිස්සය, ආසෙවන, නත්ථි, විගත යන ශක්ති සය අතුරෙන් අනන්තර සඞ්ඛ්‍යාත ශක්තිවිශේෂයෙන් උපකාර වීම දක්වූ සේක.

"පුරිමා පුරිමා අකුසලා ධම්මා" යන කර්තෘපාඨයෙන් දොළොස් අකුශල ජවනයන් ගේ අන්තිම ජවනයන් වූ ප්‍රත්‍යය ධර්මයන් දක්වූ සේක.

"**පච්ඡිමානං පච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං**" යන සම්ප්‍රදාන පාඨයෙන් සන්තීරණ තුන ය, මහාවිපාක අට ය, මහග්ගතවිපාක නවය ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් දක්වූ සේක.

නොහොත් "පුරිමාපුරිමා අකුසලා ධම්මා" යන කර්තෘපාඨයෙන් ලෝභමූල මෝහමූල ජවනයන් කෙරෙන් තදාරම්මණය වන කල්හි තදාරම්මණ එකොළොසට ද, තදාරම්මණය නො වන කල්හි භවාඞ්ග එකුන්විස්සට ද ප්‍රත්‍යය වන ලෝභමූල මෝහමූල අන්තිම ජවනයෝ ය, ද්වේෂමූලජවනය කෙරෙන් තදාරම්මණය වන කල්හි උපේක්ෂාතදාරම්මණ සයට ද නො වන කල්හි කාමඋපේක්ෂාභවාඞ්ග සයට ද ප්‍රත්‍යය වන ද්වේෂමූල ජවනය ය යන ප්‍රත්‍යයධර්මයන් දක්වූ සේක.

"පච්ඡිමානංපච්ඡිමානං අබ්‍යාකතානං ධම්මානං" යන සම්ප්‍රදාන පාඨයෙන් සන්තීරණ තුන ය, මහාවිපාක අට ය, මහග්ගත විපාක නවය ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්ම දක්වූ සේක.

"**අනන්තරපච්චයෙන**" යන කරණපාඨයෙන් එක් වර ලැබෙන අනන්තර, සමනන්තර, උපනිස්සය, නත්ථි, විගත යන ප්‍රත්‍යයශක්ති පස අතුරෙන් අනන්තර සඞ්ඛ්‍යාත ශක්තිවිශේෂයෙන් උපකාර වීම දක් වූ සේක.

"**පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා**" යන කර්තෘපාඨයෙන් අර්හත්තච්‍යුති වර්ජිත පූර්ව පූර්ව වූ විපාකසිත් සතිස ය, ක්‍රියාසිත් විස්ස ය යන ප්‍රත්‍යය ධර්මය දක්වූ සේක.

"පච්ඡිමානංපච්ඡිමානං" යනාදි සම්ප්‍රදානපාඨයෙන් අර්හන්ත ච්‍යුතිය සහිත වූ පශ්චිම පශ්චිම වූ විපාකසිත් සතිස ය ක්‍රියාසිත් විස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්ම දක් වූ සේක.

නොහොත් කර්තෘපාඨයෙන් ප්‍රථමභවාඞ්ග නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ද්විතීයාදි පශ්චිම පශ්චිම භවාඞ්ග නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ප්‍රථම භවාඞ්ගාදි පූර්ව පූර්ව භවාඞ්ග නාමස්කන්ධ-යෝ ය. ආවර්ජනද්වයයට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භවාඞ්ගුපච්ඡේද

Non-commercial distribution

පසළොස ය, මනෝද්වාරාවර්ජනයට ප්‍රත්‍යය වන අරූපභවාඞ්ගුපච්ඡේද සතරය,පඤ්චවිඥනයන්ට ප්‍රත්‍යය වන පඤ්චද්වාරාවර්ජනය ය, සම්ප්‍රතෝෂ්ෂණයට ප්‍රත්‍යය වන පඤ්චවිඥනය ය, සන්තීරණයට ප්‍රත්‍යය වන සම්ප්‍රතෝෂ්ෂණය ය, ව්‍යවසථාපනයට ප්‍රත්‍යය වන සන්තීරණය ය, පරිත්තාරම්මණවීථිය වේ නම් ද්තීය ව්‍යවසථාපනයට ප්‍රත්‍යය වන ප්‍රථම ව්‍යවසථාපනය ය, පඤ්චවෝකාරභවාඞ්ග පසළොසට ප්‍රත්‍යය වන ද්විතීය ව්‍යවසථාපනය ය, අතිමහන්තාරම්මණ මහන්තාරම්මණ විභූතාරම්මණ අවිභූතාරම්මණ වීථීන්හි හසිතෝත්පාද මහාක්‍රියා ප්‍රථම ජවනයන්ට ප්‍රත්‍යය වන ව්‍යවසථාපන මනෝද්වාරාවර්ජනයෝ ය, දෙවන ජවනයට ප්‍රත්‍යය වන පළමු වන ජවනය ය, -පෙ- සත්වන ජවනයට ප්‍රත්‍යය වන සවන ජවනය ය, හසිතෝත්පාද ජවනය කෙරෙන් තදරම්මණය වන කල්හි සෝමනස්ස තදාරම්මණ පසට ද නො වන කල්හි පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ගනවයට ද ප්‍රත්‍යය වන හසිතෝත්පාද අන්තිම ජවනය ය, මහාක්‍රියා සෝමනස්ස සහගත මහා ක්‍රියා අන්තිම ජවනයෝ ය. මහා ක්‍රියා උපේක්ෂා ජවනයන් කෙරෙන් තදරම්මණය වන කල්හි සෝමනස්සතදරම්මණ සතරට ද නොවන කල්හි තිහේතුක භවාඞ්ග තෙළෙසට ද ප්‍රත්‍යය වන සෝමනස්ස සහගත මහාක්‍රියා අන්තිම ජවනයෝ ය. මහාක්‍රියා උපේක්ෂා සහගත ජවනයන් කෙරෙන් තදරම්මණය වන කල්හි උපේක්ෂාතදරම්මණ සයට ද නො වන කල්හි ත්‍රිහේතුක භවාඞ්ග තෙළෙසට ද ප්‍රත්‍යය වන උපේක්ෂාසහගත මහාක්‍රියා අන්තිම ජවනයෝ ය, ද්විතීය තදරම්මණයට ප්‍රත්‍යය වන ප්‍රථම තදාරම්මණය ය, කාමභවාඞ්ග දශයට ප්‍රත්‍යය වන ද්විතීය තදරම්මණය ය, මහද්ගත ක්‍රියා සෝමනස්ස සහගත සිත් සතරට හා අර්හත්ඵල සෝමනස්ස සහගත සිත් සතරට ද ප්‍රත්‍යය වන ගෝත්‍රභූ අනුලෝම කෘත්‍යවත් මහාක්‍රියා ප්‍රථමද්වය ය, උපේක්ෂා සහගත මහද්ගත ක්‍රියා සතරට හා අර්හත්ඵල උපෙක්ෂාසහගත සිතට ද ප්‍රත්‍යය වන ගෝත්‍රභූ අනුලෝම කෘත්‍යවත් මහාක්‍රියා තෘතීය චිත්තද්වය ය, සමාපජ්ජන වීථීන්හි පශ්චිමපශ්චිම මහද්ගත ක්‍රියා චිත්තයන්ට ප්‍රත්‍යය වන සමානජාතික පූර්ව පූර්ව මහද්ගත ක්‍රියා ජවනයෝ ය, පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ග නවයට ප්‍රත්‍යය වන අන්තිම රූපාවචර ක්‍රියා ජවනයෝය, පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ගනවයට හා ආකාසානඤ්චායතන භවාඞ්ගයට ප්‍රත්‍යය වන ආකාසානඤ්චායතන ක්‍රියා අන්තිම ජවනය ය, පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ග නවයට හා ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන භවාඞ්ගයන්ට ද ප්‍රත්‍යය වන විඤ්ඤාණඤ්චායතන ක්‍රියා අන්තිම ජවනයය, පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ග නවයට හා ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන භවාඞ්ගයන්ටද ප්‍රත්‍යයවන ආකිඤ්චඤ්ඤායතන ක්‍රියා අන්තිම ජවනය ය, ත්‍රිහේතුක භවාඞ්ග තෙළෙසට හා නිරෝධ සමාපත්තියෙන්

Non-commercial distribution

නැඟීමේ දී උපදනා අභීත්ඵලයට ද ප්‍රත්‍යය වන නේවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා අන්තිම ජවනය ය, පශ්චිම පශ්චිම ඵලචිත්තයන්ට ප්‍රත්‍යය වන සමානජාතික පූර්ව පූර්ව ඵල චිත්තයෝ ය, ත්‍රිහේතුක භවාඞ්ග තෙළෙසට ප්‍රත්‍යය වන අන්තිම ලෝකෝත්තර ඵල ජවනයෝ ය, මරණාසන්න කාලයෙහි තදාරම්මණයට අනතුරු ව ච්‍යුතිය වන කල්හි කාමච්‍යුති දශයට ප්‍රත්‍යය වන ද්විතීය තදරම්මණය ය, ජවනයට අනතුරු ව ච්‍යුතිය වන කල්හි ත්‍රිහේතුක ච්‍යුතිතෙළෙසට ප්‍රත්‍යය වන මහාක්‍රියා පඤ්චම ජවනය ය, භවාඞ්ගයට අනතුරු ව ච්‍යුතිය වන කල්හි ච්‍යුති එකුන්විස්සට ප්‍රත්‍යය වන භවාඞ්ග එකුන්විස්ස ය, කාමප්‍රතිසන්ධි දශයට ප්‍රත්‍යය වන දුර්ගති අහේතුක ච්‍යුතිය ය, ප්‍රතිසන්ධි එකුන්විස්සට ප්‍රත්‍යය වන කාම ත්‍රිහේතුකච්‍යුති සතර ය, සහේතුක ප්‍රතිසන්ධි සතොළොසට ප්‍රත්‍යය වන රූපාවචරච්‍යුති පස ය, කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතරට හා අරූප ප්‍රතිසන්ධි සතරට ද ප්‍රත්‍යය වන ආකාසානඤ්චායතන ච්‍යුතිය ය, කාමත්‍රිහේතුකප්‍රතිසන්ධි සතරට හා විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධීන්ට ප්‍රත්‍යය වන විඤ්ඤාණඤ්චායතන චුතිය ය, කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතරට හා ආකිඤ්චඤ්ඤායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධීන්ට ප්‍රත්‍යය වන ආකිඤ්චඤ්ඤායතන චුතිය ය, ත්‍රිහේතුක කාමප්‍රතිසන්ධි සතරට හා නේවසඤ්ඤානාසඤ්ඤයතන ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වන නේවසඤ්ඤානාසඤ්ඤායතන චුතිය ය යන ප්‍රත්‍යය ධර්ම දක්වූ සේක. "පච්ජිමානං පච්ජිමානං" යනාදි සම්ප්‍රදනපාඨයෙන් අභීත්තච්‍යුතිය සහිත වූ පශ්චිමපශ්චිම විපාකසිත් සතිස ය ක්‍රියා සිත් විස්සය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්ම දක්වූ සේක.

"**අනන්තර පච්චයෙන**" යන කරණපාඨයෙන් පශ්චිමපශ්චිම විපාක ක්‍රියා නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අභීත්තච්‍යුතියෙන් අන්‍ය වූ පූර්වපූර්ව විපාක ක්‍රියාවෝ වෙත් නම්, එක්වර ලැබෙන අනන්තර, සමනන්තර, උපනිඃස්‍රය, නත්‍ථි, විගත යන ප්‍රත්‍යශක්තිපස අතුරෙන් අනන්තර සඞ්ඛ්‍යාත ශක්තිවිශේෂයෙන් ද, පශ්චිම පශ්චිම ක්‍රියාජවන අටොළොසට ප්‍රත්‍යය වන අන්තිමජවන වර්ජිත පූර්වපූර්ව අටළොස් ක්‍රියාජවනයෝ වෙත් නම්, ආසේවන ප්‍රත්‍යය ශක්තිය ද සහිත වූ ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් අනන්තර සඞ්ඛ්‍යාත ශක්තිවිශේෂයෙන් ප්‍රත්‍යය වීම ද දක්වූ සේක.

"**පුරිමාපුරිමා අබ්‍යාකතා ධම්මා**" යන කර්තෘපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජන සඞ්ඛ්‍යාත ප්‍රත්‍යය ධර්මය දක්වූ සේක. "**පච්ජිමානං - පෙ- ධම්මානං**" යන සම්ප්‍රදනපාඨයෙන් මහාකුශල ප්‍රථම ජවනය වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්මය දක්වූ සේක. "අනන්තර පච්චයෙන" යන කරණ පාඨයෙන් එක්වර ලැබෙන අනන්තර, සමනන්තර, උපනිඃස්‍රය, නත්‍ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන් -පෙ- දක්වූ සේක.

Non-commercial distribution

"**පුරිමා පුරිමා අබ්‍යාකතා ධම්මා**" යන කත්තෘපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජන සඞ්ඛ්‍යාත ප්‍රත්‍යය ධර්මය දක්වූ සේක. "**පච්ඡිමානං - පෙ- ධම්මානං**" යන සම්ප්‍රදානපාඨයෙන් දොළොස් අකුශලයන් ගේ ප්‍රථම ජවන වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්ම දක් වූ සේක. "**අනන්තර පච්චයෙන**" යන කරණපාඨයෙන් එක්වර ලැබෙන අනන්තර, සමනන්තර, උපනිස්සය, නත්ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන් -පෙ- දැක් වූ සේක.

"**යෙසං යෙසං ධම්මානං**" යන පාඨයෙන් අභින්නව්‍යුතියෙන් අන්‍ය වූ පූර්වපූර්ව වූ එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනසය යන ප්‍රත්‍යයධර්ම අනියමින් දක් වූ සේක. "**යෙ යෙ ධම්මා**" යන පාඨයෙන් පශ්චිමපශ්චිම වූ එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනසය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්ම දක් වූ සේක. "**චිත්තචෙතසිකාධම්මා**" යන පාඨයෙන් අනන්තර ප්‍රත්‍යයෝත්පන්න නාමස්කන්ධයන් ස්වරූප වශයෙන් දක්වූ සේක. "**තෙ තෙ ධම්මා**" යන පාඨයෙන් "යෙසංයෙසං ධම්මානං" යන පාඨයෙන් අනියම වශයෙන් දක්වූණු අභින්නව්‍යුතියෙන් අන්‍ය වූ පූර්වපූර්ව වූ එකුන්අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් නියම වශයෙන් දක් වූ සේක. "**තෙසංතෙසං ධම්මානං**" යන සම්ප්‍රදාන පාඨයෙන් "යෙයෙ ධම්මා" යන පාඨයෙන් අනියමයෙන් දක්වූණු අභින්නව්‍යුතිය සහිත වූ පශ්චිමපශ්චිම සිත් එකුන් අනූව ය, චෛතසික දෙපනස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් නියම වශයෙන් දක් වූ සේක.

"**අනන්තර පච්චයෙන**" යන කරණ පාඨයෙන් සුදුසු පරිදි, එක්වර ලැබෙන අනන්තර, සමනන්තර, උපනිස්සය, ආසෙවන, කම්ම, නත්ථි, විගත යන ශක්ති සත අතුරෙන් අනන්තර සඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් උපකාර වීම දැක්වූ සේක. .

නොහොත් "**අනන්තරපච්චයෙන**" යන කරණපාඨයෙන් අභින්නව්‍යුතිය සහිත වූ පශ්චිමපශ්චිම නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අභින්නව්‍යුතියෙන් අන්‍ය වූ පූර්වපූර්ව නාමස්කන්ධයෝ වෙත්නම් අනන්තර, සමනන්තර, උපනිස්සය, නත්ථි, විගත යන ප්‍රත්‍යය ශක්තීන් අතුරෙන්-පෙ.-ද, ප්‍රථම ජවන ඵල ජවන වර්ජිත පශ්චිම පශ්චිම එක්පනස් ජවනයන්ට ප්‍රත්‍යය වන අන්තිම ජවන වර්ජිත පූර්වපූර්ව වූ ලෞකික ජවන සත්සාළිස වේ නම් ආසේවන ශක්තිය ද සහිත වූ ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් -පෙ-උපකාර වීම ද, මාර්ගානන්තර ඵලයට ප්‍රත්‍යය වන චේතනාව වේ නම් කර්මශක්තිය සහිත වූ ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් -පෙ- උපකාර වීම ද, දැක්වූ සේක.

Non-commercial distribution

**විශේෂ කරුණු**

"චක්ඛුවිඤ්ඤාණධාතු තංසම්පයුත්තකා ච ධම්මා" යනාදි පාඨයෙන් චක්ඛුවිඤ්ඤාණය සම්පටිච්ඡනයට ද සම්පටිච්ඡනය සන්තීරණයට ද ප්‍රත්‍යය වීම දැක්වූ සේක. මෙහි දී සන්තීරණය ව්‍යවස්ථාපනයට ද ව්‍යවස්ථාපනය ජවනයට ද ජවනය තදරම්මණයට ද තදරම්මණය භවාඞ්ගයට ද ප්‍රත්‍යය වීම දැක්විය යුතු වුව ද වුක්තනයින් ඒවා දත හැකි හෙයින් දේශනාව සංක්ෂේප කරන ලදී. "පුරිමාපුරිමා කුසලා ධම්මා" යනාදි නයෙහි ඒවා සඞ්ගෘහිත වන බැවින් හෝ දේශනාව සංක්ෂේප කරන ලදී. "තතො පරං වොට්ඨබ්බන ජවන තදරම්මණ භවඞ්ග කිච්චා මනොවිඤ්ඤාන ධාතුයො වත්තබ්බා සියුං, තා අවුත්තා පි ඉමිනා ච නයෙන වෙදිතබ්බාති නයං දස්සෙත්වා දෙසනා සංඛිත්තා. පුරිමාපුරිමා කුසලා ධම්මා ති ආදිකෙ ඡට්ඨනයෙ තා සඞ්ගහිතා ති පි ඉධ න වුත්තා ති වෙදිතබ්බා" යනු අටුවා යි. සකල අනන්තර ප්‍රත්‍යයා ගේ ම සංක්ෂේප ලක්ෂණ දැක්වීම සඳහා "යෙසං යෙසං ධම්මානං" යනාදිය වදරන ලදි. "යෙසංයෙසන්ති ඉදං සබ්බසම්පි අනන්තර පච්චය ධම්මානං සඞ්ඛෙප ලක්ඛණං" යනු අටුවා යි.

සමනන්තර ප්‍රත්‍යය නිර්දේශය අනන්තර ප්‍රත්‍යය නිර්දේශය මෙනි.

## 6. සහජාත ප්‍රත්‍යය නිර්දේශය.

සමනන්තර ප්‍රත්‍යය නිර්දේශයට අනතුරු ව සහජාතප්‍රත්‍යය නිර්දේශය වදාළ සේක. (පෙර පරිදි විභාග කරනු.)

**පදලී**-

චත්තාරො, සතරදෙනෙකු වූ; අරූපිනො, අරූපි වූ; ඛන්ධා, ස්කන්ධයෝ: අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්ට: සහජාත පච්චයෙන, සහජාත ප්‍රත්‍යය ශක්ති-යෙන්: පච්චයො, උපකාරක වේ. චත්තාරො, සතර දෙනෙකු වූ: මහාභූතා, මහාභූතයෝ: අඤ්ඤමඤ්ඤං, ඔවුනොවුන්ට -පෙ- ඔක්කන්තික්ඛණෙ, පඤ්චවෝකාර ප්‍රතිසන්ධික්ෂණයෙහි: නාමරූපං, ප්‍රතිසන්ධි නාමස්කන්ධ හෘදයවස්තුහු: අඤ්ඤමඤ්ඤං -පෙ- චිත්තචෙතසිකා, චිත්ත චෛතසික වූ: ධම්මා, අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත පන්සැත්තෑ චිත්තය ය චෛතසික දෙපනස ය යන නාමස්කන්ධයෝ: චිත්තසමුට්ඨානානං, සිත නිසා උපදනා වූ: රූපානං, චිත්තජ රූපයන්ට නොහොත් චිත්තජ රූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට: සහජාත පච්චයෙන පච්චයො. මහාභූතා, මහාභූතයෝ: උපාදයරූපානං, උපාදය රූපයන්ට: -පෙ- රූපිනො, රූපී

Non-commercial distribution

වූ: ධම්මා, හෘදයවස්තු සඞ්ඛ්‍යාත ධර්මයෝ: අරූපීනං, අරූපී වූ: ධම්මානං, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට: කිස්මිංකාලෙ, ප්‍රතිසන්ධි කාලයෙහි: සහජාත පච්චයෙන පච්චයො. කිස්මිංකාලෙ, ප්‍රවෘත්ති කාලයෙහි: න සහජාත පච්චයෙන පච්චයො.

**අභිධෙයාර්ථ**

ඒ නිදර්ශනාකාර පාඨයෙහි "**චත්තාරො අරූපිනො ඛන්ධා**" යන පාඨයෙන් තුනක් තුනක් වූ නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන එක එකක් වූ නාමස්කන්ධයෝය, එක්එක් වූ නාමස්කන්ධයකට ප්‍රත්‍යය වන තුනක් තුනක් වූ නාමන්කන්ධයෝ ය, දෙකක් දෙකක් වූ නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන දෙකක් දෙකක් වූ නාමස්කන්ධයෝය යන ප්‍රත්‍යය ධර්මය දැක්වූ සේක. '**අඤ්ඤමඤ්ඤං**' යන සම්ප්‍රදාන පාඨයෙන් තුනක් තුනක් වූ ද, එක එකක් වූ ද, දෙකක් දෙකක් වූ ද නාමස්කන්ධයන් වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයන් දැක් වූ සේක.

'**සහජාත පච්චයෙන**' යන කරණපාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ වෙත් නම් සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, සම්ප්‍රයුක්ත, අත්ථි, අවිගත යන ශක්ති සය අතුරෙන්-පෙ-වීමද, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ වෙත් නම් විපාක ප්‍රත්‍යය ද සහිත වූ ප්‍රත්‍යය ශක්ති සත අතරෙන් -පෙ-වීම ද දැක් වූ සේක.

"**චත්තාරො මහා භූතා**"යන පාඨයෙන් තුනක් තුනක් වූ භූතයන්ට ප්‍රත්‍යය වන එකඑකක් වූ මහාභූතයෝ ය එක එකක් වූ මහාභූතයන්ට ප්‍රත්‍යය වන තුනක් තුනක් වූ මහාභූතයෝ ය, දෙකක් දෙකක් වූ මහාභූතයන්ය ප්‍රත්‍යය වන දෙකක් දෙකක් වූ මහාභූතයෝ ය යන ප්‍රත්‍යය ධර්මය දැක් වූ සේක.

"**අඤ්ඤමඤ්ඤං**" යන සම්ප්‍රදාන පාඨයෙන් තුනක් තුනක් වූ මහාභූතයෝ ය, එකඑකක් වූ මහාභූතයෝ ය, දෙකක් දෙකක් වූ මහාභූතයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්ම දැක් වූ සේක.

"**සහජාත පච්චයෙන**" යන කරණපාඨයෙන් එක්වර ලැබෙන සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත, යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන්-පෙ-දැක් වූ සේක.

"**ඔක්කන්තික්ඛණෙ නාමරූපං**" යන පාඨයෙන් පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා හෘදයවස්තුව වූ ප්‍රත්‍යය ධර්මය දැක්වූ සේක. '**අඤ්ඤමඤ්ඤං**' යන පාඨයෙන් පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධ හෘදයවස්තු

Non-commercial distribution

සඞ්ඛ්‍යාත ප්‍රත්‍යයෝත්පන්න ධර්‍ම දැක් වූ සේක. **'සහජාත පච්චයෙන'** යන පාඨයෙන් එක්වර ලැබෙන සහජාත,අඤ්ඤමඤ්ඤ, නිස්සය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ශක්ති සය අතුරෙන්-පෙ-වීම ද, හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ වෙත් නම් විපාක ප්‍රත්‍යය ද සහිත වූ ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් සහජාත සඞ්ඛ්‍යාත ශක්ති විශේෂයෙන් උපකාරවීම ද දැක් වූ සේක..

**'චිත්තචෙතසිකා ධම්මා'** යන කර්‍තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අරූප විපාක ද්විපඤ්චවිඥාන අභිඥාත්‍යුති වර්ජිත සිත් පන්සැත්තෑවය, චෛතසික දෙපනසය යන ප්‍රත්‍යය ධර්‍මය දැක් වූ සේක. **'චිත්තසමුට්ඨානානං රූපානං'** යන පාඨයෙන් චිත්තජරූප සඞ්ඛ්‍යාත ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මය දැක් වූ සේක. නොහොත් චිත්තජරූප ප්‍රතිසන්ධි කර්‍මජරූප සඞ්ඛ්‍යාත ප්‍රත්‍යයෝත්පන්න ධර්‍ම දැක්වූ සේක.

පඤ්චමූල මූලකාදිකා සංඛිත්තා. එකමූලකං දුමූලකං තිමූලකං චතුමූලකං පඤ්චමූකං සබ්බමූලකං අසම්මූය්හන්තෙන විත්ථාරෙතබ්බං. **හෙතුමූලකං.**

සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය ආරම්මණ පච්චයා හෙතු පච්චයා? ආරම්මණ පච්චයා අධිපති පච්චයා -පෙ- ආරම්මණ පච්චයා අවිගතපච්චයා?

සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය අධිපති පච්චයා-අනන්තර පච්චයා-සමනන්තර පච්චයා-සහජාත පච්චයා-අඤ්ඤමඤ්ඤ පච්චයා අවිගත පච්චයා හෙතු පච්චයා-

Non-commercial distribution

අවිගත පච්චයා ආරම්මණ පච්චයා-අවිගත පච්චයා අධිපති පච්චයා-අවිගත පච්චයා විගත පච්චයා,

සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය අවිගත පච්චයා හෙතුපච්චයා ආරම්මණ පච්චයා-අවිගත පච්චයා හෙතුපච්චයා අධිපති පච්චයා-අවිගත පච්චයා හෙතුපච්චයා අනන්තර පච්චයා-අවිගත පච්චයා හෙතුපච්චයා විගත පච්චයා?

සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය අවිගත පච්චයා හෙතුපච්චයා ආරම්මණ පච්චයා අධිපති පච්චයා - අවිගත පච්චයා හෙතුපච්චයා ආරම්මණ පච්චයා අනන්තර පච්චයා-විගත පච්චයා, එකෙකස්ස පදස්ස එකමූලකං දුමූලකං තිමූලකං චතුමූලකං පඤ්චමූලකං සබ්බමූලකං අසම්මුය්හන්තෙන විත්ථාරෙතබ්බං

තිකඤ්ච පට්ඨානවරං දුකුත්තමං
දුකං තිකඤ්චෙව ච තිකං දුකඤ්ච
තිකං තිකඤ්චෙව ච දුකං දුකඤ්ච
ඡ අනුලොමම්හි නයා සුගම්භිරා ති.

සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය න හෙතු පච්චයා? යථා අනුලොමෙ හෙතු පච්චයො විත්ථාරිතො, එවං පච්චනීයෙ පි න හෙතුපච්චයො විත්ථාරෙතබ්බො.

සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය න ආරම්මණ පච්චයා? න අධිපති පච්චයා,න අනන්තර පච්චයා, න සමනන්තර පච්චයා, න සහජාත පච්චයා, න අඤ්ඤමඤ්ඤ පච්චයා, න නිස්සය පච්චයා, න උපනිස්සය පච්චයා, න පුරෙජාත පච්චයා, න පච්ඡාජාත පච්චයා, න ආසෙවන පච්චයා, න කම්ම පච්චයා, න විපාක පච්චයා, න ආහාර පච්චයා, න ඉන්ද්‍රිය පච්චයා, න ඣාන පච්චයා, න මග්ග පච්චයා, න සම්පයුත්ත පච්චයා,න විප්පයුත්ත පච්චයා, නො අත්ථි පච්චයා, නො නත්ථි පච්චයා, නො විගත පච්චයා, නො අවිගත පච්චයා. සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය න හෙතු පච්චයා න ආරම්මණ පච්චයා, යථා අනුලොමෙ එකෙකස්ස පදස්ස එකමූලකං දුමූලකං තිමූලකං චතුමූලකං යාව තෙවීසති මූලකං ඒවං පච්චනීයෙ පි විත්ථාරෙතබ්බං.

තිකඤ්ච පට්ඨානවරං දුකුත්තමං
දුකං තිකඤ්චෙව ච තිකං දුකඤ්ච
තිකං තිකඤ්චෙව ච දුකං දුක චං
ඡ පච්චනීයම්හි නයා සුගම්භිරා ති

Non-commercial distribution

සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතු පච්චයා න ආරම්මණ පච්චයා? සියා කුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතුපච්චයා න ආරම්මණ පච්චයා? යථා අනුලොමෙ හෙතුපච්චයො විත්ථාරිතො, එවං අනුලොම පච්චනීයෙ පි පදං විත්ථාරෙතබ්බං.

සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතු පච්චයා න අධිපති පච්චයා, හෙතු පච්චයා න අනන්තර පච්චයා, -පෙ- හෙතුපච්චයා නො අවිගත පච්චයා.

සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතු පච්චයා ආරම්මණ පච්චයා න අධිපති පච්චයා, හෙතුපච්චයා ආරම්මණ පච්චයා න අනන්තර පච්චයා, -පෙ- හෙතුපච්චයා ආරම්මණ පච්චයා නො අවිගත පච්චයා.

හෙතු පච්චයා අරම්මණ පච්චයා අධිපති පච්චයා න අනන්තර පච්චයා,-පෙ-හෙතු පච්චයා ආරම්මණ පච්චයා අධිපති පච්චයා නො අවිගත පච්චයා,

හෙතුපච්චයා ආරම්මණ පච්චයා අධිපති පච්චයා අනන්තර පච්චයා න සමනන්තර පච්චයා, -පෙ- හෙතුපච්චයා ආරම්මණ පච්චයා අධිපති පච්චයා අනන්තර පච්චයා නො අවිගත පච්චයා.

හෙතු පච්චයා ආරම්මණ පච්චයා අධිපති පච්චයා අනන්තර පච්චයා සමනන්තර පච්චයා සහජාත පච්චයා අඤ්ඤමඤ්ඤ පච්චයා නිස්සය පච්චයා උපනිස්සය පච්චයා පුරෙජාත පච්චයා පච්ඡාජාත පච්චයා ආසෙවන පච්චයා කම්ම පච්චයා විපාක පච්චයා ආහාර පච්චයා ඉන්ද්‍රිය පච්චයා ඣාන පච්චයා මග්ග පච්චයා සම්පයුත්ත පච්චයා විප්පයුත්ත පච්චයා අත්ථි පච්චයා නත්ථි පච්චයා විගත පච්චයා නො අවිගත පච්චයා.

සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය ආරම්මණ පච්චයා අධිපති පච්චයා අනන්තර පච්චයා -පෙ- අවිගත පච්චයා න හෙතුපච්චයා, අවිගත පච්චයා න ආරම්මණ පච්චයා, අවිගත පච්චයා නො විගත පච්චයා, අවිගත පච්චයා හෙතු පච්චයා න ආරම්මණ පච්චයා, අවිගත පච්චයා හෙතු පච්චයා නො විගත පච්චයා, අවිගත පච්චයා හෙතුපච්චයා ආරම්මණ පච්චයා නාධිපති පච්චයා, අවිගත පච්චයා හෙතුපච්චයා ආරම්මණ පච්චයා නො විගත පච්චයා, අවිගත පච්චයා හෙතුපච්චයා ආරම්මණ පච්චයා අධිපති පච්චයා අනන්තර පච්චයා සමනන්තර පච්චයා සහජාත පච්චයා -පෙ- නො විගත පච්චයා

Non-commercial distribution

තිකඤ්ච පට්ඨාන වරං දුකුත්තමං
දුකං තිකඤ්චෙව ච තිකං දුකඤ්ච
තිකං තිකඤ්චෙව ච දුකං දුකඤ්ච
ඡ අනුලොම පච්චනීයම්හි නයා සුගම්භිරා ති

සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය න හෙතු පච්චයා ආරම්මණ පච්චයා? සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය න හෙතු පච්චයා අධිපති පච්චයා -පෙ- න හෙතුපච්චයා අවිගත පච්චයා?

සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය න හෙතු පච්චයා න ආරම්මණ පච්චයා අධිපති පච්චයා, -පෙ- අවිගත පච්චයා න හෙතු පච්චයා න ආරම්මණ පච්චයා -පෙ- අවිගත පච්චයා, න හෙතුපච්චයා න ආරම්මණ පච්චයා න අධිපති පච්චයා න අනන්තර පච්චයා න සමනන්තර පච්චයා -පෙ- නො අත්ථි පච්චයා නො නත්ථි පච්චයා නො විගත පච්චයා අවිගත පච්චයා?

සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය න ආරම්මණ පච්චයා අධිපති පච්චයා -පෙ- න ආරම්මණ පච්චයා අවිගත පච්චයා -පෙ- නො අවිගත පච්චයා හෙතු පච්චයා. නො අවිගත පච්චයා ආරම්මණ පච්චයා -පෙ- නො අවිගත පච්චයා විගත පච්චයා ආරම්මණ පච්චයා -පෙ- නො අවිගත පච්චයා විගත පච්චයා. නො අවිගත පච්චයා න හෙතුපච්චයා ආරම්මණ පච්චයා. නො අවිගත පච්චයා න හෙතුපච්චයා විගත පච්චයා. නො අවිගත පච්චයා. න හෙතුපච්චයා ආරම්මණ පච්චයා න අධිපති පච්චයා -පෙ- නො අත්ථි පච්චයා නො නත්ථි පච්චයා විගත පච්චයා?

තිකඤ්ච පට්ඨාන වරං දුකුත්තමං
දුකං තිකඤ්චෙව ච තිකං දුකඤ්ච
තිකං තිකඤ්චෙව ච දුකං දුකඤ්ච
ඡ පච්චනීයානු ලොමම්හි නයා සුගම්භිරා ති.

**පණ්ණත්ති වාරො.**

Non-commercial distribution

## පුච්ඡාවාරය නොහොත් පණ්ණත්තිවාරය.

ප්‍රත්‍යය නිර්දේශ වාරයට අනතුරු ව පුච්ඡා වාරය වදළ සේක. එහි ද-

ධම්මානුලෝම වාරය ය,
ධම්මපච්චනීය වාරය ය,
ධම්මානුලෝම පච්චනීය වාරය ය,
ධම්ම පච්චනීයානුලෝම වාරය යයි

වාර සතරක් ඇත්තේ ය. එයින් ධම්මානුලෝම වාරය පළමු කොට වදළ සේක. එහිද-

තිකපට්ඨානය ය,
දුකපට්ඨානය ය,
දුකතික පට්ඨාන ය,
තික දුක පට්ඨාන ය,
තික තික පට්ඨානය ය,
දුක දුක පට්ඨාන ය යි,

පට්ඨාන සයක් ඇත්තේය. එයින් තිකපට්ඨානය පළමු කොට වදළ සේක. එහිද කුසලත්තිකාදි වශයෙන් තික දෙවිස්සක් ඇත්තේය. එයින් කුසලත්තිකය පළමු කොට වදළ සේක.
එහිද-

පටිච්ච වාරය ය,
සහජාත වාරය ය,
පච්චය වාරය ය,
නිස්සය වාරය ය,
සංසට්ඨ වාරය ය,
සම්පයුත්ත වාරය ය,
පඤ්හා වාරය ය යි,

වාර සතක් ඇත්තේය. එයින් පටිච්ච වාරය පළමු කොට වදළ සේක. එහි ද,

පච්චයානුලෝම වාරය ය,
පච්චය පච්චනීය වාරය ය,
පච්චයානුලෝම පච්චනීය වාරය ය,
පච්චය පච්චනීයානුලෝම වාරයය යි

Non-commercial distribution

වාර සතරක් ඇත්තේය. එයින් පච්චයානුලෝම වාරය පළමු කොට වදළසේක. එහි ද ඒකමූලකවාර දුමූලික වාරාදි වශයෙන් වාර සූවිස්සක් ඇත්තේ ය. එහිද ඒකමූලකවාරය පළමු කොට වදළ සේක. එයින් හෙතුපච්චය ඒකමූල වාරය ආරම්මණ පච්චය ඒකමූල වාරය යනාදි වශයෙන් වාර සූවිස්සක් ඇත්තේය. එයින් හේතුපච්චය ඒකමූල වාරය පළමු කොට වදළ සේක. එහි ද,

කුසල පද වාරය ය,
අකුසල පද වාරය ය,
අබ්‍යාකත පද වාරය ය,
කුසලාබ්‍යාකත පද වාරය ය,
අකුසලාබ්‍යාකත පද වාරය ය,
කුසලාකුසල පද වාරය ය,
කුසලාකුසලාබ්‍යාකත පද වාරය යයි,

මූලපදයන් ගේ වශයෙන් වාර සතක් ඇත්තේය. එයින් කුසලපද වාරය පළමු කොට වදළ සේක. එහි ද කුසලපදවසාන වාරය අකුසලපදවසාන වාරය යනාදීන් අවසාන පදයන් ගේ වශයෙන් සත්වාරයක් ඇත්තේය. එයින් කුසලපදවසාන වාරය පළමු කොට වදළ සේක. කෙසේ ද යත් "**සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතුපච්චයා**" යනු වෙනි.

**එහි පදාර්ථ.**

කුසලං ධම්මං පටිච්ච, එක් ව ඉපිදීම් වශයෙන් කුසල ධර්මය නිසා, කුසලො ධම්මො, කුසල ධර්මයඃ උප්පජ්ජෙය්‍ය, උපදනේයඃ හෙතු පච්චයා සියා, ඒ කුසල ධර්මය හේතුප්‍රත්‍යයෙන් උපදනේදඃ යනුයි.

කුසල පදවසාන වාරයට අනතුරු ව අකුසල පදවසාන වාරය වදළ සේක. කෙසේ ද යත්, "**සියා කුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතු පච්චයා?**" යනුවෙනි. පදාර්ථ උක්තානුසාරයෙන් දත යුතු. අකුසල පදවසාන වාරයට අනතුරු ව අබ්‍යාකත පදවසාන වාරය වදළ සේක. කෙසේ ද? යත්, "**සියා කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතුපච්චයා**" යනු වෙනි. අබ්‍යාකත පදවසාන වාරයට අනතුරුව කුසලාබ්‍යාකත පදවසාන වාරය වදළ සේක. "**සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ච අබ්‍යාකතො ච ධම්මා උප්පජ්ජෙය්‍යුං හෙතුපච්චයා**" යනු වෙනි.

Non-commercial distribution

**පදළී.**

කුසලං ධම්මං පටිච්ච, එක්ව ඉපදීම් වශයෙන් කුසල ධර්මය නිසා, කුසලො ච, කුසල් වූ දඃ අබ්‍යාකතො ච, කුසලාකුසල නො වූ දඃ ධම්මා, ධර්මයෝඃ උප්පජ්ජෙය්‍යුං, උපදනාහඃ හෙතුපච්චයා සියා, ඒ කුශලාව්‍යාකෘත ධර්මයෝ හේතුප්‍රත්‍යයෙන් උපදනාහු ද යනුයි. මේ ක්‍රමයෙන් අකුසලාබ්‍යාකතවාරාදි වාර තුන ද විස්තර කරනු.

**කුසල පදයේ වාර සත නිමි.**

කුසලපද වාරයට අනතුරුව අකුසලපද වාරය වදළ සේක. එහි ද කුසල පදවසාන වාරාදි වශයෙන් සත් වාරයක් ඇත්තේය. එයින් කුසල පදවසාන වාරය පළමු කොට වදළ සේක. කෙසේ ද? යත්, "**සියා අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතුපච්චයා**" යනුවෙනි. මෙ සේ අකුසල පදයේ වාර සත විස්තර කරනු.

**අකුසල පදයේ වාර සත නිමි.**

මෙසේ අබ්‍යාකත පදයේ වාර සත ද, කුසලාබ්‍යාකත පදයේ වාර සත ද, අකුසලබ්‍යාකත පදයේ වාර සත ද, කුසලා කුසලාබ්‍යාකත පදයේ වාර සත ද විස්තර කරනු. සියල්ල පිඩු කළ කල්හි හේතුප්‍රත්‍යය ඒකමූල වාරයේ ප්‍රශ්න එකුන් පනසක් වේ. හේතුප්‍රත්‍යය ඒකමූල වාරයට අනතුරුව ආරම්මණ ප්‍රත්‍යය ඒකමූල වාරය වදළ සේක. එහි ද කුසලපදවාරාදි වශයෙන් වාර සතක් ඇත්තේය. හේතුප්‍රත්‍යය ඒකමූල වාරය අනුව සියල්ල විස්තර කරනු. එහි ද ප්‍රශ්න එකුන් පනසකි. එ සේ ම අවිගත ප්‍රත්‍යය දක්වා ඇති ප්‍රත්‍යය සියල්ල විස්තර කරනු. එක් එක් වාරයක ප්‍රශ්න එකුන් පනස බැගින් ඇත්තේය. ඒකමූලනයෙහි ප්‍රත්‍යය සූවිස්සෙහි සියල්ල පිඩු කළ කල්හි ප්‍රශන එක් දහස් එක්සිය ස සැත්තෑවක් වන්නේ ය.

සහස්ස මෙකඤ්ච සතං ඡ සත්තති පුනා පරා
පුච්ඡා සම්පිණ්ඩිතා හොන්ති නයම්හි එකමූලකෙ

**ඒකමූල වාරය නිමි.**

එකමූලක වාරයට අනතුරු ව දුමූලක වාරය වදළ සේක. එහි ද හේතාරම්මණදුක වාරය ය, හේතාධිපතිදුක වාරය ය, -පෙ- *හේතාවිගත* දුකවාරය යයි වාර තෙවිස්සක් ඇත්තේය. එයින් හේතාරම්මණ දුක වාරය පළමු කොට වදළ සේක. එහි ද කුසලපදවාරදි වශයෙන් වාර සතක්

Non-commercial distribution

ඇත්තේය. එයින් කුසලපද වාරය පළමු කොට වදළ සේක. එහි ද අවසාන පදයන්ගේ වශයෙන් වාර සතක් ඇත්තේ ය. එයින් කුසලපදවසාන වාරය පළමු කොට වදළ සේක. කෙසේ ද? යත් "**සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතු පච්චයා ආරම්මණ පච්චයා**" යනු වෙති. හේතාරම්මණදුක වාරයේ ප්‍රශ්න එකුන් පනස වුක්තානුසාරයෙන් විස්තර කරනු. අනතුරු ව හේතුප්‍රත්‍යයට අධිපති ප්‍රත්‍යයාදිය එපිළිවෙළින් එකතු කොට ඉතිරි දුකවාර දෙවිස්ස ද විස්තර කරනු. එක් එක් වාරයක ප්‍රශ්න එකුන් පනස බැගින් ලැබෙන බැවින් මේ හේතු පච්චය දුමූලක වාරයෙහි ප්‍රශ්න එක් දහස් එක් සිය සත් විස්සක් වන්නේය.

සහස්ස මෙකඤ්ච සතං සත්තවීසති මෙව ච
දුකෙසු තෙවීසතියා පුච්ඡා හොන්ති දුමූලකෙ

## දුමූලක වාරය නිමි.

දුමූලක වාරයට අනතුරු ව තිමූලක වාරය වදළ සේක. එහි ද හේතාරම්මණ අධිපති තිකාදි වශයෙන් වාර දෙවිස්සක් ඇත්තේය. එයින් හේතුආරම්මණ අධිපති තිකය පළමුකොට වදළ සේක. එහි ද කුසලපද වාරාදීන්ගේ වශයෙන් වාරසතක් ඇත්තේ ය. එයින් කුසලපද වාරය පළමු කොට වදළ සේක. එද අවසානපදයන් ගේ වශයෙන් සත් වැදෑරුම් වේ. එයින් කුසල පදවසාන වාරය පළමු කොට වදළ සේක. කෙසේ ද? යත් "**සියා කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතු පච්චයා ආරම්මණපච්චයා අධිපති පච්චයා**" යනුවෙති. එසේ ප්‍රශ්න එකුන් පනසම විස්තර කරනු. එසේ ම හේතු ආරම්මණ ප්‍රත්‍යය දෙකට අනන්තර ප්‍රත්‍යයේ පටන් අවිගත ප්‍රත්‍යය දක්වා ඇති ප්‍රත්‍යය එක්විස්ස ද පිළිවෙළින් යොදා ඉතිරි වාර එක් විස්ස ද විස්තර කරනු. එක් එක් වාරයෙක ප්‍රශ්න එකුන් පනස බැගින් වන බැවින් තික වාර දෙවිස්සෙහි ප්‍රශ්න එක් දහස් අට සැත්තෑවක් වේ.

සහස්ස මෙකං පුච්ඡානං අට්ඨසත්ත ති මෙව ච
පුච්ඡා ගණනතො හොන්තී නයම්හි තිකමූලකෙ

## තිමූලක වාරය නිමි.

හෙතු ආරම්මණ අධිපති යන ප්‍රත්‍යය තුන හා පිළිවෙළින් අනන්තරාදි ප්‍රත්‍යය එක් විස්ස යොදා චතුමූලක වාරය විස්තර කරනු. එක් එක් වාරයෙක ප්‍රශ්න එකුන් පනස බැගින් වීමෙන් වාර එක් විස්සෙහි ප්‍රශ්න එක් දහස් එකුන් තිසක් වේ.

Non-commercial distribution

සහස්ස මෙකං පුච්ඡානං එකූනතිංස පූනා පරා,
පුච්ඡා ගණනතො හොන්ති නයම්හි චතුමූලකෙ

**චතුමූලක වාරය නිමි.**

හේතු ආරම්මණ අධිපති අනන්තර යන ප්‍රත්‍යය සතර හා සමනන්තර ප්‍රත්‍යයේ පටන් අවිගත ප්‍රත්‍යය දක්වා ඇති ප්‍රත්‍යය විස්ස යොද පඤ්චමූලක වාරය විස්තර කරනු. එක් එක් වාරය ප්‍රශ්න එකුන් පනස බැගින් වීමෙන් වාරවිස්සෙහි නවසිය අසූවක් වේ.

සතානි නව පුච්ඡානං අසීති ච පුනාපරා,
පුච්ජා ගණනහො හොන්තී නමයහි පඤ්චමූලකෙ,

**පඤ්චමූලක වාරය නිමි.**

ඡමූලක වාරය හේතු, ආරම්මණ, අධිපති, අනන්තර, සමනන්තර යන ප්‍රත්‍යය පස හා සහජාතාදි ප්‍රත්‍යය එකුන්විස්ස පිළිවෙළින් යොද විස්තර කරනු. වාර එකුන්විස්සෙහි ප්‍රශ්න නවසිය එක්තිසක් වේ.

සතානි නව පුච්ඡානං එකතිංස තතො පරා,
පුච්ඡා ගණනතො හොන්ති නයම්හි ඡක්කමූලකෙ,

**ඡමූලක වාරය යි.**

සත්තමූලක වාරය හේතාදි ප්‍රත්‍යය සය හා අන්‍යෝන්‍ය ප්‍රත්‍යයාදි ප්‍රත්‍යය අටළොස පිළිවෙළින් යොද විස්තර කරනු. එක් එක් වාරයෙක ප්‍රශ්න එකුන් පනස බැගින් වීමෙන් ඡක්කවාර අටළොසෙහි ප්‍රශ්න අටසිය දෙ අසූවක් වේ.

සතානි අට්ඨ පුච්ඡානං ද්වාසීති ච තතො පරෙ,
පුච්ඡා ගණනතො හොන්ති නයම්හි සත්තමූලකෙ

**සත්තමූලක වාරය යි.**

අට්ඨමූලක වාරයේ පටන් සබ්බමූලකවාරය දක්වා ඇති වාර සොළොස ද උක්තානුසාරයෙන් විස්තර කරනු. ප්‍රශ්න සඞ්ඛ්‍යා මතු දැක්වෙන ගාථාවලින් දත යුතු ය.

සතානි අට්ඨ පුච්ඡානං තෙත්තිංසා ච තතො පරා,
පුච්ඡා ගණනතො හොන්ති නයම්හි අට්ඨමූලකෙ

Non-commercial distribution

සතානි සත්ත පුච්ඡානං චතුරාසීති තතො පරා,
පුච්ඡා ගණනතො හොන්ති නයම්හි නවමූලකෙ

සතානි සත්ත පුච්ඡානං පඤ්චතිංස තතො පරා,
පුච්ඡා ගණනතො හොන්ති නයම්හි දසමූලකෙ

ඡසතානි ච පුච්ඡානං ඡලාසීති තතො පරා,
නයම්හි පුච්ඡා ගණිතා එකා දසක මූලකෙ

ඡසතානි ච පුච්ඡානං සත්තතිංස තතො පරා,
පුච්ඡා ගණනතො හොන්ති නයෙ ද්වාදස මූලකෙ.

සතානි පඤ්ච පුච්ඡානං අට්ඨාසීති තතො පරා,
පුච්ඡා ගණනතො හොන්ති නයෙ තෙරස මූලකෙ

සතානි පඤ්ච පුච්ඡානං තිංස චා ඵ නවා පරා,
පුච්ඡා ගණනතො හොන්ති නයෙ චුද්දස මූලකෙ.

සතානි චත්තාරි පුච්ඡානං නවුතී ච තතො පරා,
පුච්ඡා ගණනතො හොන්ති නයෙ පන්නරස මූලකෙ.

සතානි චත්තාරි චත්තාළීසෙ කා ච පුනා පරා,
පුච්ඡා ගණනතො හොන්ති නයෙ සොළස මූලකෙ.

සතානි තීණි පුච්ඡානං නවුතී ද්වෙ පුනා පරා,
පුච්ඡා ගණනතො හොන්ති නයෙ සත්තරස මූලකෙ.

සතානි තීණි පුච්ඡානං තෙචත්තාරීස මෙව ච
පුච්ඡා ගණනතො හොන්ති නයෙ අට්ඨාරස මූලකෙ.

ද්වෙ සතා නවුති චෙව චතසෙසා ච පුනා පරා,
පුච්ඡා ගණනතො හොන්ති නයෙ එකූන වීසතිකෙ

ද්වෙ සතා හොන්ති පුච්ඡානං චත්තාළීසා ච පඤ්ච ච,
පුච්ඡා ගණනතො හොන්ති නයෙ වීසති මූලකෙ.

සතං ඡනවුති චෙව පුච්ඡා හොන්ති සම්පිණ්ඩිතා
ගණිතා ලක්ඛණඤ්ඤූහි එකවීසතිකෙ නයෙ.

චත්තාළීසාධික සතං සත්ත චෙව පුනා පරා,
පුච්ඡා ගණනතො හොන්ති නයෙ ද්වාවීසති මූලකෙ.

Non-commercial distribution

අට්ඨනවුති මෙව ධ පුච්ඡා ගණනතො මතා,
නයම්හි තෙවීසතිමෙ තෙවීසතික මූලකෙ.

අවසාන වාරය වූ චතුවීසති මූලකයෙහි හෙවත් සබ්බමූලකයෙහි ලැබෙන්නේ ප්‍රශ්න එකුන් පනසකි. ඒකමූලක වාරයෙහි පටන් සබ්බමූලක වාරය දක්වා ඇති මේ වාර සූවිස්සෙහි ලැබෙන ප්‍රශ්න සියල්ල පිඩු කළ කල්හි තුදුස් දහස් සත්සියයක් වේ.

චුද්දසෙ ච සහස්සානි පුන සත්ත සතානි ච,
පුච්ඡා හෙතු පදස්සෙ ච එක මූලාදි භෙදතො.

**හේතු ප්‍රත්‍යය පිළිබඳ වූ ඒකමූලාදි වාර සූවිස්ස නිමි.**

මේ හේතු ප්‍රත්‍යය මෙන් ම ආරම්මණාදි ප්‍රත්‍යය තෙවිස්ස ද විස්තර කළ යුතු ය. "එකෙකස්ස පදස්ස එකමූලං දුමූලං තිමූලං සබ්බමූලං අසම්මුය්හන්තෙන විත්ථාරෙතබ්බං" යනුවෙන් පාලියෙහි දැක්වෙන්නේ ආරම්මණාදි ප්‍රත්‍යය තෙවිස්ස ද හේතු ප්‍රත්‍යය මෙන් ම ඒකමූලාදි වශයෙන් විස්තර කළ යුතු බව ය. එසේ විස්තර කරන කල්හි හේතුප්‍රත්‍යයෙහි ප්‍රශ්න තුදුස් දහස් සත්සියයක් ලැබෙන්නාක් මෙන් ආරම්මණාදි ප්‍රත්‍යයන්හි ද ප්‍රශ්න තුදුස් දහස් සත්සියය බැගින් ලැබෙන්නේ ය. ප්‍රත්‍යය සූවිස්සෙහි ම ලැබෙන ප්‍රශ්න පිඩු කළ කල්හි තුන්ලක්ෂ පනස් දෙදහස් අටසියයක් වන්නේය.

ද්වාපඤ්ඤාස සහස්සානට්ඨ සතානි තීණි සතසහස්සානි,
කුසලත්තිකස්ස පුච්ඡා අනුලොම නයම්හි සුවිභත්තා

මේ තිකපට්ඨානයෙහි අනුලෝම නයයෙහි කුසලත්‍රිකය සම්බන්ධයෙන් ලැබෙන ප්‍රශ්න ගණන ය, වේදනාදි එක්විසි ත්‍රිකයන්හි ද එක එකක තුන්ලක්ෂ දෙපනස් දහස් අටසියය බැගින් ම ප්‍රශ්න ලැබෙන්නේය. ත්‍රික දෙවිස්සෙහි ලැබෙන ප්‍රශ්න සියල්ලම පිඩු කළ කල්හි සැත්තෑ සත් ලක්ෂ සැට එක් දහස් සය සියයක් වේ.

එකසට්ඨී සහස්සානි ඡසතානි සත්ත සත්තති,
සතසහස්සානි පුච්ඡානං තික භෙදෙ පභෙදතො,

සංඛිත්තා වාචනා මග්ගෙ
**තික පට්ඨානය යි.**

දුකපට්ඨානයෙහි සියයක් වූ දුකයන් ගෙන් පළමුවැන්න හේතුදුකය යි. එහි ද, හේතුපදය ය, නහේතු පදය ය, හේතුනහේතු පදය ය යි ආදි පද තුනක් වේ. එසේ ම අවසාන පද ද තුනක් වේ. එක් එක්

Non-commercial distribution

ආදි පදයක් හා පිළිවෙළින් අවසාන අවසාන පදතුන යෙදීමෙන් හේතු දුකය සම්බන්ධයෙන් ප්‍රශ්න නවයක් ලැබේ. ඒ මෙසේය.

(1) සියා හෙතුං ධම්මං පටිච්ච හෙතුධම්මො උප්පජ්ජෙය්‍ය හෙතුපච්චයා?

(2) සියා හෙතුං ධම්මං පටිච්ච න හෙතු ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතුපච්චයා?

(3) සියා හෙතුං ධම්මං පටිච්ච හෙතු ච නහෙතු ච ධම්මා උප්පජ්ජෙය්‍යුං හෙතුපච්චයා?

(4) සියා නහෙතුං ධම්මං පටිච්ච නහෙතු ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතුපච්චයා?

(5) සියා නහෙතුං ධම්මං පටිච්ච හෙතු ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතුපච්චයා?

(6) සියා නහෙතුං ධම්මං පටිච්ච හෙතු ච නහෙතු ච ධම්මා උප්පජ්ජෙය්‍යුං හෙතුපච්චයා?

(7) සියා හෙතුඤ්ච නහෙතුඤ්ච ධම්මං පටිච්ච හෙතුධම්මො උප්පජ්ජෙය්‍ය හෙතු පච්චයා?

(8) සියා හෙතුඤ්ච නහෙතුඤ්ච ධම්මං පටිච්ච නහෙතු ධම්මො උප්පජ්ජෙය්‍ය හෙතුපච්චයා?

(9) සියා හෙතුඤ්ච නහෙතුඤ්ච ධම්මං පටිච්ච හෙතු ච නහෙතු ච ධම්මා උප්පජ්ජෙය්‍යුං හෙතු පච්චයා?

මේ හේතු ප්‍රත්‍යයෙහි ලැබෙන ප්‍රශ්න නවය ය. ආරම්මණාදි ප්‍රත්‍යය තෙවිස්සෙහි ද මෙසේ ම ප්‍රශ්න නවය බැගින් ලැබෙන්නේය. සූවිසි ප්‍රත්‍යයෙහි ම ලැබෙන ප්‍රශ්න පිඬු කළ කල්හි දෙසිය සොළසක් වේ. මේ හේතුප්‍රත්‍යයේ ඒක මූලක නයයෙහි ලැබෙන ප්‍රශන සඞ්ඛ්‍යාවය, හේතු ප්‍රත්‍යය දූමූලකාදි වශයෙන්ද විස්තර කළ යුතුය. එසේ කරන කල්හි දූමූලක නයයෙහි ප්‍රශ්න දෙසිය සතක් වේ. තිමූලක නයයෙහි එක්සිය අටඅනූවක් වේ. චතුමූලකයෙහි එකසිය අසූනවයක් වේ. පඤ්චමූලකයෙහි එකසිය අසූවක් වේ. ඡමූලකයෙහි එක්සිය එක් සැතැවක් වේ. සත්තමූලකයෙහි එක්සිය සැට දෙකක් වේ. අට්ඨ මූලකයෙහි එක්සිය තෙපනසක් වේ. නව මූලකයෙහි එක්සිය සිවුසාලිසක් වේ. දසමූලකයෙහි එක්සිය පන්තිසක් වේ. ඒකාදස මූලකයෙහි එක්සිය සවිස්සක් වේ. ද්වාදසමූලකයෙහි එක්සිය සතොළොසක් වේ. තේරසමූලකයෙහි එක්සිය අටක් වේ. චුද්දසමූලකයෙහි අනූනවයක් වේ. පන්නරසමූලකයෙහි අනූවක් වේ. සෝළස මූලකයෙහි

Non-commercial distribution

එක් අසූවක් වේ. සත්තරස මූලකයෙහි දෙසැත්තෑවක් වේ. අට්ඨාරස මූලකයෙහි තෙසැටක් වේ. ඒකූනවීසති මූලකයෙහි සිවුපනසක් වේ. වීසති මූලකයෙහි පන්සාළිසක් වේ. එකවීසති මූලකයෙහි සතිසක් වේ. ද්වා වීසති මූලකයෙහි සත් විස්සක් වේ. තේවීසති මූලකයෙහි අටළොසක් වේ. සබ්බමූලකයෙහි නවයක් වේ. සියල්ල පිඩුකළ කල්හි හේතුප්‍රත්‍යයෙහි ප්‍රශ්න දෙදහස් සත්සියයක් වේ. ආරම්මණාදි ප්‍රත්‍යයන්හි එක එකක දෙදහසක් සත්සියය බැගින් ම ප්‍රශ්න වන්නේ ය. සූවිසි ප්‍රත්‍යයෙහි ම ප්‍රශ්න පිඩු කළ කල්හි සූසැට දහස් අට සියයක් වන්නේ ය.

චතුසට්ඨී සහස්සානි පුන අට්ඨ සතානි ච,
පුච්ඡා හෙතු දුකස්සෙ ච අනුලොම නයෙ මතො.

හේතු දුකයෙන් අන්‍ය වූ දුක අනූනවයෙහි ද එක් එක් දුකයක හේතු දුකයෙහි ලැබෙන ප්‍රශ්න සංඛ්‍යාවම ලැබෙන්නේ ය. දුක සියයෙහි අනුලෝම ක්‍රමයෙන් ලැබෙන ප්‍රශ්න පිඩු කළ කල්හි සූසැට ලක්‍ෂ අසූ දහසක් වන්නේය.

සට්ඨී සතසහස්සානි චත්තාරි ච තතො පරං,
අසීති ච සහස්සානි පුච්ඡා දුක සතෙ විදූ.

**මේ ශුද්ධික ත්‍රික ද්වික ප්‍රස්ථාන දෙක්හි ප්‍රශ්නයන් ගේ පරිච්ඡේදයය**

(මෙහි දක්වන ලදුයේ ක්‍රමය දත හැකි වීම සඳහා පුච්ඡාවාරයෙන් ස්වල්පයෙකි. දක්වන ලද කොටස අනු ව සිතා නො දැක්වූ පට්ඨානයන් ගේ නයයන් ගේ වශයෙන් සකල පුච්ඡාවාරය ම තේරුම් ගත යුතු ය. මෙහි පුච්ඡාවාරයම විස්තර කරන ලදුයේ අටුවාවේ දැක්වෙන ක්‍රමය අනුව ය. මෙය පිළිබඳ ව තවත් ආචාර්‍ය්‍යවාද ඇත්තේ ය. දීඝ වන බැවින් මෙහි නො දක්වන ලදි.)

**පණ්ණත්ති වාර වර්‍ණනාව**

**නිමි.**

*Non-commercial distribution*

විශෙෂ කරුණු.

මේ පණ්ණත්ති වාරයෙහි ලැබෙන ප්‍රශ්න සඞ්ඛ්‍යාව ඉතා බොහෝය. මෙහි දක්වා ඇත්තේ ඒවායින් සුළු කොටසකි. තිකපට්ඨානයෙහි ප්‍රශ්න (7761600) සැත්තෑසත් ලක්‍ෂ සැට එක් දහස් සයියයක් ප්‍රශ්න ලැබෙන බව ඉහත දක්වා ඇත. එය තිකපාට්ඨානයේ සම්පූර්ණ ප්‍රශ්න සඞ්ඛ්‍යාව නොව අනුලෝම ක්‍රමයෙන් පටිච්ච වාරයේ පමණක් ලැබෙන ප්‍රශ්න සංඛ්‍යාව ය. ඉහත දක්වන ලද ත්‍රිකප්‍රස්ථාන ප්‍රශ්න (7761600) සැත්තෑසත් ලක්‍ෂ සැට එක් දහස් සයියය ධම්මානු ලෝමාදි ක්‍රම සතරෙන් චතුර්ගුණ වන බැවින් 31046400 ක් වේ. එය පටිච්චවාරාදි සත්වාරයන්ට පැමිණීමෙන් සත්ගුණයකින් වැඩි වී 217324800 ක් වේ. එය නැවත පච්චයානුලෝමාදි ක්‍රම සතරට පැමිණ චතුර්ගුණ වී මෙන් (86,92,99200) අසූහය කෝටි අනූදෙලක්‍ෂ අනූනව දහස් දෙසියයක් වේ. මේ එක් පට්ඨානයක ප්‍රශ්නයෝ ය, දුකපට්ඨානයේ ප්‍රශ්න සඞ්ඛ්‍යාව එයට මඳක් අඩු ය. ඉතිරි පට්ඨාන සතරෙහි ලැබෙන ප්‍රශ්න සඞ්ඛ්‍යාව ඉතා බොහෝ වේ. මේ ප්‍රශ්නවලින් ඇතමෙක් දිය යුතු පිළිතුරක් නැති සිස් ප්‍රශ්නයෝ ය. ඒවා හැර දමා පිළිතුරු ලැබිය හැකි ප්‍රශ්නවලට පමණක් පිළිතුරු දැක්වීම් වශයෙන් මතු දැක්වෙන විසජ්ජනාවාරය වදරා තිබේ.

## තිකපට්ඨාන විසජ්ජනාවාර පාලිය.

(1) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

කුසලං ධම්මං පටිච්ච කුසලො ච අබ්‍යාකතො ච ධම්මා උප්පජ්ජන්ති හෙතුපච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨානඤ්ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨානඤ්ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨානඤ්ච රූපං.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා, අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා,

අකුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා, අකුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

Non-commercial distribution

අකුසල ධම්මං පටිච්ච අකුසලො ච අබ්‍යාකතො ච ධම්මා උප්පජ්ජන්ති හෙතුපච්චයා, අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨාන-ඤ්ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨානඤ්ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා, විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තස-මුට්ඨාන ඤ්ච රූපං. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තා ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො කටත්තා ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා කටත්තා ච රූපං, ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා, එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතා, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, මහාභූතෙ පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං, කටත්තාරූපං, උපාදය රූපං.

කුසල ඤ්ච අබ්‍යාකත ඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා, කුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං.

අකුසලං ඤ්ච අබ්‍යාකත ඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා, අකුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං.

(2) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති ආරම්මණ පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

අකුසල ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති ආරම්මණ පච්චයා, අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති ආරම්මණ පච්චයා, විපාකබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා, පටිසන්ධික්ඛණෙ විපාකබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා, වත්ථුං පටිච්ච ඛන්ධා.

Non-commercial distribution

(3) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති අධිපති පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති අධිපති පච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

කුසලං ධම්මං පටිච්ච කුසලො ච අබ්‍යාකතො ච ධම්මා උප්පජ්ජන්ති අධිපති පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨාන සඞ්ඛ රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨාන සඞ්ඛ රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨාන සඞ්ඛ රූපං.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති අධිපති පච්චයා, අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

අකුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති අධිපති පච්චයා, අකුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ච අබ්‍යාකතො ච ධම්මා උප්පජ්ජන්ති අධිපතිපච්චයා. අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨාන සඞ්ඛ රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨාන සඞ්ඛ රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨාන සඞ්ඛ රූපං.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති අධිපති පච්චයා, විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්ත සමුට්ඨාන සඞ්ඛ රූපං. තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨාන සඞ්ඛ රූපං ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨාන සඞ්ඛ රූපං, එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං උපාදය රූපං.

කුසල සඞ්ඛ අබ්‍යාකත සඞ්ඛ ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති අධිපති පච්චයා, කුසලෙ ඛන්ධෙ මහාභූතෙ ච පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං.

අකුසල සඞ්ඛ අබ්‍යාකත සඞ්ඛ ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති අධිපති පච්චයා අකුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

Non-commercial distribution

(4) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති අනන්තර පච්චයා, සමනන්තරපච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, අනන්තරම්පි සමනන්තරම්පි ආරම්මණපච්චය සදිසං.

(5) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති සහජාත පච්චයා කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති සහජාත පච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

කුසලං ධම්මං පටිච්ච කුසලො ච අබ්‍යාකතො ච ධම්මා උප්පජ්ජන්ති සහජාතපච්චයා, අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨානඤ්ච රූපං.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති සහජාත පච්චයා, අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

අකුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති සහජාත පච්චයා, අකුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ච අබ්‍යාකතො ච ධම්මා උප්පජ්ජන්ති සහජාත පච්චයා, අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්ත සමුට්ඨාන ඤ්ච රූපං. තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච දේව ඛන්ධා චිත්තස මුට්ඨාන ඤ්ච රූපං,

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති සහජාත පච්චයා, විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්ත සමුට්ඨාන ඤ්ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්ත සමුට්ඨාන ඤ්ච රූපං, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තා ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො කටත්තා ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා කටත්තා ච රූපං ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා, එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, කටත්තා රූපං උපාදය රූපං,

Non-commercial distribution

බාහිරං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, මහාභූතෙ පටිච්ච උපාදය රූපං. ආහාර සමුට්ඨානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, මහාභූතෙ පටිච්ච උපාදය රූපං. උතුසමුට්ඨානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, මහා භූතෙ පටිච්ච උපාදය රූපං. අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා මහාභූතෙ පටිච්ච කටත්තා රූපං, උපාදය රූපං.

කුසල ඤ්ච අබ්‍යාකත ඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති සහජාතපච්චයා, කුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

අකුසල ඤ්ච අබ්‍යාකත ඤ්ච ධම්මං පටිච්ච අබ්‍යකතො ධම්මො උප්පජ්ජති සහජාතපච්චයා, අකුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

(7) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති අඤ්ඤමඤ්ඤ පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති අඤ්ඤමඤ්ඤ පච්චයා, අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති අඤ්ඤමඤ්ඤ පච්චයා, විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා, පටිසන්ධික්ඛණෙ, විපාකාබ්‍යකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා වත්ථු ච, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, වත්ථු ච, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා වත්ථු ච, ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා, එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහා භූතෙ පටිච්ච එකං මහාභූතං ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, බාහිරං ආහාර සමුට්ඨානං, උතු සමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා.

Non-commercial distribution

(8) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති නිස්සය පච්චයා කුසලං එකං ඛන්ධං පටිච්ච, නිස්සය පච්චයං සහජාත පච්චය සදිසං.

(9) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති උපනිස්සය පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච, උපනිස්සය පච්චයං ආරම්මණ පච්චය සදිසං.

(10) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති පුරෙජාත පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා, වත්ථුං පුරෙජාත පච්චයා.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති පුරෙජාත පච්චයා අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා, වත්ථුං පුරෙජාත පච්චයා.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති පුරෙජාත පච්චයා, විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා, වත්ථුං පුරෙජාත පච්චයා.

(12) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති ආසෙවන පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති ආසෙවන පච්චයා. අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති ආසෙවන පච්චයා, කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

(13) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති කම්ම පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච, තීණි. අකුසලං ධම්මං පටිච්ච, තීණි.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති කම්ම පච්චයා, විපාකාබ්‍යාකතං, කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච, පටිසන්ධික්ඛණෙ එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, කටත්තා රූපං, උපාදය රූපං, අසඤ්ඤ

Non-commercial distribution

සත්තානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා මහාභූතෙ පටිච්ච කටත්තා රූපං, උපාදය රූපං.

කුසල ඤ්ච අබ්‍යාකත ඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති කම්ම පච්චයා; කුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්ත සමුට්ඨා රූපං.

අකුසල ඤ්ච අබ්‍යාකත ඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති කම්ම පච්චයා, අකුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං.

(14) අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති විපාක පච්චයා, විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තා ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො කටත්තාච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා කටත්තා ච රූපං, ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා. එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, කටත්තා රූපං, උපාදය රූපං.

(15) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති ආහාර පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තීණි. අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති ආහාර පච්චයා, අකුසලං එකං ඛන්ධං පටිච්ච තීණි.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති ආහාර පච්චයා, විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච. පටිසන්ධික්ඛණෙ එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා මහාභූතෙ පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං කටත්තා රූපං උපාදය රූපං. ආහාරසමුට්ඨානං එකං මහාභූතං පටිච්ච, මහාභූතෙ පටිච්ච උපාදය රූපං.

කුසල ඤ්ච අබ්‍යාකත ඤ්ච ධම්මං පටිච්ච, අකුසල ඤ්ච අබ්‍යාකත ඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො, උප්පජ්ජති ආහාර පච්චයා. අකුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං.

(16) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති ඉන්ද්‍රිය පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තීණි. අකුසලං ධම්මං පටිච්ච, තීණි. අබ්‍යාකතං ධම්මං පටිච්ච-ප-අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච. ඉන්ද්‍රියපච්චයං කම්මපච්චය සදිසං.

Non-commercial distribution

(17) (18) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති ඣාන පච්චයා, මග්ගපච්චයා, ඣානපච්චයං පි මග්ගපච්චයං පි හෙතුපච්චය සදිසං.

(19) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති සම්පයුත්ත පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච. සම්පයුත්ත පච්චයං ආරම්මණපච්චය සදිසං.

(20) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති විප්පයුත්ත පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා, වත්ථුං, විප්පයුත්තපච්චයා, කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති විප්පයුත්තපච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං ඛන්ධෙ විප්පයුත්ත පච්චයා.

කුසලං ධම්මං පටිච්ච කුසලො ච අබ්‍යාකතො ච ධම්මා උප්පජ්ජන්ති විප්පයුත්තපච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්ත සමුට්ඨාන ඤ්ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්ත සමුට්ඨාන ඤ්ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, ඛන්ධා වත්ථුං විප්පයුත්තපච්චයා, චිත්ත සමුට්ඨානං රූපං ඛන්ධෙ විපයුත්තපච්චයා.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති විප්පයුත්ත පච්චයා, අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා, වත්ථුං විප්පයුත්තපච්චයා.

අකුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති විප්පයුත්ත පච්චයා, අකුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, ඛන්ධෙ විප්පයුත්තපච්චයා.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ච අබ්‍යාකතො ච ධම්මා උප්පජ්ජන්ති විප්පයුත්තපච්චයා, අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ධන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨානං රූපං, ඛන්ධා වත්ථුං විපයුත්තපච්චයා. චිත්ත සමුට්ඨානං රූපං ඛන්ධෙ විප්පයුත්තපච්චයා.

Non-commercial distribution

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති විප්පයුත්ත පච්චයා, විපකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨානං ඝාව රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨාන ඝාව රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨාන ඝාව රූපං, ඛන්ධා වත්ථුං විප්පයුත්තපච්චයා, චිත්තසමුට්ඨානං රූපං ඛන්ධෙ විප්පයුත්ත පච්චයා. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තා ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො කටත්තා ච රූපං, ඛන්ධා වත්ථුං විප්පයුත්ත පච්චයා, කටත්තාරූපං ඛන්ධෙ විප්පයුත්ත පච්චයා. ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා, ඛන්ධා වත්ථුං විප්පයුත්ත පච්චයා. වත්ථුං ඛන්ධෙ විප්පයුත්ත පච්චයා. එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතා පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතෙ මහාභූතෙ පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං, කටත්තා රූපං, උපාදය රූපං, ඛන්ධෙ විප්පයුත්ත පච්චයා.

කුසල ඝාව අබ්‍යාකත ඝාව ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති විප්පයුත්ත පච්චයා, කුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, ඛන්ධෙ විප්පයුත්ත පච්චයා.

අකුසල ඝාව අබ්‍යාකත ඝාව ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති විප්පයුත්ත පච්චයා, අකුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං ඛන්ධෙ විප්පයුත්ත පච්චයා.

(21) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති අත්ථි පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, සංඛිත්තං අත්ථි පච්චයං සහජාත පච්චය සදිසං.

(22) (23) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති නත්ථි පච්චයා, විගතපච්චයා, නත්ථිපච්චය ම්පි විගතපච්චය ම්පි ආරම්මණ පච්චය සදිසං.

(24) කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති අවිගත පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, අවිගත පච්චයා සහජාත පච්චය සදිසං.

**ඉමෙ තෙවීසති පච්චයා සජ්ඣායනෙන**

**විත්ථාරෙතබ්බා.**

*Non-commercial distribution*

# තික පට්ඨාන විසජ්ජනා වාරයේ සන්නය.

## පටිච්ච අනුලොම.

(1) පුච්ඡාවාරයට අනතුරු ව විසජ්ජනා වාරය වදාළ සේක. එය ද ධම්මානුලෝමය ය, ධම්මපච්චනීය ය, ධම්මානුලෝම පච්චනීය ය, ධම්මපච්චනීයානු ලෝමය ය යන මොවුන්ගේ වශයෙන් සිවු වැදෑරුම් වේ. එයින් ධම්මානුලෝම වාරය පළමු කොට වදාළ සේක. එය ද තිකපට්ඨානය ය, දුකපට්ඨානය ය, දුකතිකපට්ඨානය ය, තිකදුක පට්ඨානය ය, තිකතික පට්ඨානය ය, දුකදුක පට්ඨානය ය යන මොවුන් ගේ වශයෙන් සවැදෑරුම් වේ. එයින් තිකපට්ඨානය පළමු කොට වදාළ සේක. එද කුසලත්තිකාදි වශයෙන් දෙවිසි වැදෑරම් වේ. එයින් කුසලත්තිකය පළමු කොට පදාළ සේක. එහි ද පටිච්චවාරය ය, සහජාත වාරය ය, පච්චය වාරය ය, නිස්සය වාරය ය, සංසට්ඨවාරය ය, සම්පයුත්ත වාරය ය, පඤ්හාවාරය ය යන වාරයන් ගේ වශයෙන් සත් වැදෑරුම් වේ. එයින් පටිච්ච වාරය පළමු කොට වදාළ සේක. එහි ද පච්චයානුලෝමය ය, පච්චය පච්චනීය ය, පච්චයානුලෝම පච්චනීය ය, පච්චය පච්චනීයානුලෝමය ය යි වාරසතරක් ඇත්තේ ය. එයින් පච්චයානුලෝම වාරය පළමු කොට වදාළ සේක. එය ද සඞ්ඛ්‍යාවාර විභඞ්ගවාරයන් ගේ වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් විභඞ්ග වාරය පළමු කොට වදාළ සේක. එහි ද හේතුපච්චය විභඞ්ගවාරාදි වශයෙන් වාර තෙවිස්සක් ඇත්තේ ය. එයින් හේතුපච්චය විභඞ්ග වාරය පළමු කොට වදාළ සේක. එහිද කුසල පදය, අකුසල පදය, අබ්‍යාකත පදය, කුසලාබ්‍යාකත පදය, අකුසලාබ්‍යාකත පදය යි පද පසක් ඇත්තේ ය. එයින් කුසල පද වාරය පළමු කොට වදාළ සේක. එ ද කුසලපදවසාන වාරය ය, අක්‍යාකතපදවසාන වාරයය, කුසලාබ්‍යාකත පදවසාන වාරයය යන මොවුන් ගේ වශයෙන් තෙවැදෑරුම් වේ. එයින් කුසලපදවසාන වාරය පළමු කොට වදාළ සේක. එ ද වීථි අනුවාද වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් වීථිය පළමු කොට වදාළ සේක. කෙසේ ද? යත් "**කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා**" යනුවෙනි. වීථියට අනතුරු ව අනුවාදය වදාළ සේක. කෙසේද? යත් "**කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.**" යනුවෙනි.

**පදාර්ථ.**

කුසලං ධම්මං පටිච්ච, එක් ව ඉපදීම් වශයෙන් කුශල ධර්මය නිසා: කුසලො ධම්මො, කුශල ධර්මය: හෙතුපච්චයා, හේතුප්‍රත්‍යයයෙන්: උප්පජ්ජති,

Non-commercial distribution

උපදී: කුසලං එකං ඛන්ධං පටිච්ච, එක්ව ඉපදීම් වශයෙන් වේදනාදි එක් කුශලස්කන්ධයක් නිසා: තයො ඛන්ධා, සංඥාස්කන්ධාදි සකන්ධයෝ තිදෙන උපදිති. තයො ඛන්ධෙ පටිච්ච, එක් ව ඉපදීම් වශයෙන් සංඥාදි ස්කන්ධ තුන නිසා: එකො ඛන්ධො, වේදනාදි එක් ස්කන්ධයක් උපදී: ද්වෙ ඛන්ධෙ පටිච්ච, එක් ව ඉපදීම් වශයෙන් වේදනා සංඥාදි ස්කන්ධ දෙකක් නිසා: ද්වෙ ඛන්ධා, සංසකාර විඥානාදි ස්කන්ධ දෙකක් උපදිති:

**අභිධෙයාර්ථ.**

"කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා" යන වීථිපාලියෙහි "කුසලො ධම්මො" යන කතෘපාඨයෙන් කුසල් සිත් එක් විස්ස ය. චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා කුසල් සිත එක්විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්. "හෙතු පච්චයා" යන පාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන කුසල් සිත් එක් විස්ස ය, චෛතසික අටතිස ය යන මොවුන් ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති අලෝභ අදෝසය, අලෝභ, අදෝස, අමෝහ ය යන හේතු දෙක්හි හා තුනෙහි ඇති හේතු ශක්තිය ලැබේ.

**සකන්ධවාර.**

අනුවාද පාලියෙහි ස්කන්ධවාර තුදුසෙකි.

(1) "එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා" යන අනුවාද පාලියෙහි "එකං ඛන්ධං" යනුවෙන් වේදනා ස්කන්ධය ගෙන "තයො ඛන්ධා" යනුවෙන් සංඥා සංස්කාර විඥානස්කන්ධයන් ගන්නා එක් වාරයෙකි.

(2) එකං ඛන්ධං යනුවෙන් සංඥාස්කන්ධය ගෙන, තයො ඛන්ධා යනුවෙන් සංස්කාර විඥාන වේදනාසකන්ධයන් ගන්නා එක් වාරයෙකි.

(3) "එකං ඛන්ධං යනුවෙන් සංස්කාරස්කන්ධය ගෙන තයො ඛන්ධා යනුවෙන් විඥාන වේදනා සංඥා ස්කන්ධයන් ගන්නා එක් වාරයෙකි.

(4) "එකං ඛන්ධං" යනුවෙන් විඥානස්කන්ධය ගෙන තයො ඛන්ධා යනුවෙන් වේදනා සංඥා සංස්කාරස්කන්ධයන් ගන්නා එක් වාරයෙකි. මෙසේ ඒකක වාර සතරක් වේ.

(1) "තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො" යන අනුවාද පාලියෙහි "තයො ඛන්ධෙ" යනුවෙන් වේදනා සංඥා සංස්කාර ස්කන්ධයන් ගෙන "එකො ඛන්ධො" යනුවෙන් විඥානස්කන්ධය ගන්නා එක් වාරයෙකි.

Non-commercial distribution

(2) "තයො ඛන්ධෙ" යනුවෙන් සංඥා සංස්කාර විඥානස්කන්ධයන් ගෙන "එකො ඛන්ධො" යනුවෙන් වේදනාස්කන්ධය ගන්නා එක් වාරයෙකි.

(3) "තයො ඛන්ධෙ" යනුවෙන් සංස්කාර විඥාන වේදනා ස්කන්ධයන් ගෙන "එකො ඛන්ධො" යනුවෙන් සංඥා ස්කන්ධය ගන්නා එක් වාරයෙකි.

(4) "තයො ඛන්ධෙ" යනුවෙන් විඥාන වේදනා සංඥා ස්කන්ධයන් ගෙන "එකො ඛන්ධො" යනුවෙන් සංස්කාරස්කන්ධය ගන්නා එක් වාරයෙකි. මෙසේ තිකවාර සතරක් වේ.

(1) "ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා" යන අනුවාද පාලියෙහි "ද්වෙ ඛන්ධෙ" යනුවෙන් වේදනා සංඥා ස්කන්ධ දෙක ගෙන "ද්වෙ ඛන්ධා" යනුවෙන් සංස්කාර විඥානස්කන්ධයන් ගන්නා එක් වාරයෙකි.

(2) "ද්වෙ ඛන්ධෙ" යනුවෙන් වේදනා සංස්කාරස්කන්ධයන් ගෙන "ද්වෙ ඛන්ධා" යනුවෙන් සංඥා විඥාන ස්කන්ධයන් ගන්නා එක් වාරයෙකි.

(3) "ද්වෙ ඛන්ධෙ" යනුවෙන් වේදනා විඥානස්කන්ධයන් ගෙන "ද්වෙ ඛන්ධා" යනුවෙන් සංඥා සංස්කාරස්කන්ධයන් ගන්නා එක් වාරයෙකි.

(4) "ද්වෙ ඛන්ධෙ" යනුවෙන් සංඥා සංස්කාරස්කන්ධයන් ගෙන "ද්වෙ ඛන්ධා" යනුවෙන් විඥාන වේදනා ස්කන්ධයන් ගන්නා එක් වාරයෙකි.

(5) "ද්වෙ ඛන්ධෙ" යනුවෙන් සංඥා විඥානසකන්ධයන් ගෙන "ද්වෙ ඛන්ධා" යනුවෙන් වේදනා සංසකාරස්කන්ධයන් ගන්නා එක්වාරයෙකි.

(6) "ද්වෙ ඛන්ධෙ" යනුවෙන් සංස්කාර විඥානස්කන්ධයන් ගෙන, "ද්වෙ ඛන්ධා" යනුවෙන් වේදනා සංඥාස්කන්ධයන් ගන්නා එක් වාරයෙකි. මෙසේ දුකවාර සයක් වේ. මෙසේ ඒකක වාර සතරක් ද තිකවාර සතරක් ද දුකවාර සයක් ද වීමෙන් ස්කන්ධවාර තුදුසක් වේ.

කුසලපදවසාන වාරයට අනතුරුව අබ්‍යාකත පදවසාන වාරය වදළ සේක. එ ද වීථි අනුවාද වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් වීථිය පළමුකොට වදළ සේක. කෙසේද? යත්, "**කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා**" යනුවෙනි. වීථියට අනතුරුව අනුවාදය වදළ සේක. කෙසේ ද? යත්, "**කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං**" යනුවෙනි.

Non-commercial distribution

**පදාර්ථ.**

කුසලං ධම්මං පටිච්ච, එක්ව ඉපදීම් වශයෙන් කුශල ධර්මය නිසාඃ අබ්‍යාකතො ධම්මො, අව්‍යාකෘත ධර්මයඃ හෙතුපච්චයා, හේතු ප්‍රත්‍යයෙන්ඃ උප්පජ්ජති, උපදී.

**අභිධෙයාර්ථ.**

"කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා" යන අනුවාද පාලියෙහි "අබ්‍යාකතො ධම්මො " යන කතෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව වූද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූප සඞ්ඛ්‍යාත ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. "හෙතු පච්චයා" යන පාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භවයෙහි උපදනා එක්විසි කුශල චිත්තයන් ගෙන් ද්විහේතුක සිත්වල ඇති අලෝභ අදෝස දෙක ය, ත්‍රිහේතුක සිත්වල ඇති අලෝභ අදෝස අමෝහ තුනය යන ප්‍රත්‍යය ධර්මයන් ගේ හේතු ශක්තිය ලැබේ.

**ස්කන්ධ වාර.**

අනුවාදපාලියෙහි ස්කන්ධවාර දෙසියවිසිපසෙකි. ඒ මෙසේ ය. පඨවිමහාභූතචිත්තජරූපයන්හි වාර පසළොසෙකි. ආපෝමහාභූත චිත්තජරූපයන්හි වාර පසළොසකි. තේජෝමහාභූත චිත්තජරූපයන්හි වාර පසළොසකි. වායෝමහාභූත චිත්තජරූපයන්හි වාර පසළොසකි. පඨවි ආපෝ තේජෝ මහාභූත චිත්තජරූපයන්හි වාර පසළොසෙකි. ආපෝ තේජෝ වායෝ මහාභූත චිත්තජරූපයන්හි වාර පසළොසෙකි. තේජෝ වායෝ පඨවි මහාභූත චිත්තජරූපයන්හි වාර පසළොසකි. වායෝ පඨවි ආපෝ මහාභූත චිත්තජරූපයන්හි වාර පසළොසකි. පඨවි ආපෝ මහාභූත -පෙ- වාර පසළොසකි. පඨවි තේජෝ මහාභූත -පෙ- වාර පසළොසකි. පඨවි වායෝ -පෙ- වාර පසළොසකි. ආපෝ තේජෝ -පෙ- වාර පසළොසකි. ආපෝ වායෝ -පෙ- වාර පසළොසකි. තේජෝ වායෝ -පෙ- වාර පසළොසකි. පඨවි ආපෝ තේජෝ වායෝ මහාභූත චිත්තජ රූපයන්හි වාර පසළොසකි. මෙසේ ස්කන්ධවාර දෙසිය විසිපසක් වේ.

පඨවිමහාභූත චිත්තජරූපයන්හි වාර පසළොස මෙසේ ය. එහි ඒකකවාර සතරෙකි. තිකවාර සතරෙකි. දුකවාර සයෙකි. චතුෂ්කවාර එකකි. මෙසේ පඨවිමහාභූත චිත්තජරූපයන්හි වාර පසළොසෙක් වේ.

Non-commercial distribution

එහි ඒකක වාර සතර මෙසේ ය. "කුසලෙ ඛන්‍ධෙ පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං" යන අනුවාද පාලියෙහි කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් වේදනාස්කන්‍ධය ගෙන, චිත්ත සමුට්ඨානං රූපං යනුවෙන් පඨවිමහාභූත චිත්තජරූපයන් ගන්නා එක්වාරයෙකි. කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් සංඥාස්කන්‍ධය ගෙන චිත්තසමුට්ඨානං රූපං යනුවෙන් පඨවි මහාභූත චිත්තජ රූපයන් ගන්නා එක්වාරයෙකි. කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් සංස්කාරස්කන්‍ධය ගෙන, චිත්තසමුට්ඨානං රූපං යනුවෙන් පඨවිමහාභූත චිත්තජරූපයන් ගන්නා එක් වාරයෙකි. කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් විඥානස්කන්‍ධය ගෙන, චිත්තසමුට්ඨානං රූපං යනුවෙන් පඨවිමහාභූත චිත්තජරූපයන් ගන්නා ඒකවාරයෙකි. මෙ සේ එක්කවාර සතරක් වේ.

තිකවාර සතර මෙසේය. කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් වේදනා සඤ්ඤා සංඛාරයන් ගෙන, චිත්තසමුට්ඨානං රූපං යනුවෙන් පඨවිමහාභූත චිත්තජරූපයන් ගන්නා එක්වාරයෙකි. කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණයන් ගෙන චිත්තසමුට්ඨානං රූපං යනුවෙන් පඨවිමහාභූත චිත්තජරූපයන් ගන්නා එක්වාරයෙකි. කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් සඞ්ඛාර විඤ්ඤාණ වේදනාවන් ගෙන චිත්ත සමුට්ඨානං රූපං යනුවෙන් පඨවි මහාභූත චිත්තජරූපයන් ගන්නා එක් වාරයකි. කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් විඤ්ඤාණ වේදනා සඤ්ඤාවන් ගෙන චිත්ත සමුට්ඨානං රූපං යනුවෙන් පඨවිමහාභූත චිත්තජරූපයන් ගන්නා එක්වාරයෙකි. මෙසේ තිකවාර සතරක් වේ.

දුකවාර සය මෙසේ ය. කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් වේදනා සඤ්ඤාවන් ගෙන, චිත්තසමුට්ඨානං රූපං යනුවෙන් පඨවිමහාභූත චිත්තජ රූපයන් ගන්නා එක්වාරයෙකි. කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් වේදනා සඞ්ඛාරයන් ගෙන චිත්තසමුට්ඨානං රූපං යනුවෙන් පඨවිමහාභූත චිත්තජ රූපයන් ගන්නා එක් වාරයෙකි. කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් වේදනා විඤ්ඤාණයන් ගෙන, චිත්ත සමුට්ඨානං රූපං යනුවෙන් පඨවි මහාභූත චිත්තජරූපයන් ගන්නා එක් වාරයෙකි. කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් සඤ්ඤා සඞ්ඛාරයන් ගෙන, චිත්තසමුට්ඨානං රූපං යනුවෙන් පඨවි මහාභූත චිත්තජරූපයන් ගන්නා එක් වාරයෙකි. කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් සංඥ විඤ්ඤාණයන් ගෙන, චිත්තසමුට්ඨානං රූපං යනුවෙන් පඨවිමහාභූත චිත්තජරූපයන් ගන්නා එක්වාරයෙකි. කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් සංඛාර විඤ්ඤාණයන් ගෙන චිත්ත සමුට්ඨානං රූපං යනුවෙන් පඨවි මහාභූත චිත්තජ රූපයන් ගන්නා එක් වාරයෙකි. මෙසේ දුකවාර සයක් වේ.

කුසලෙ ඛන්‍ධෙ යනුවෙන් වේදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණයන් ගෙන චිත්තසමුට්ඨානං රූපං යනුවෙන් පඨවිමහාභූත චිත්තජරූපයන්

Non-commercial distribution

ගන්නා වාරය චතුෂ්කවාරය ය. මෙ සේ පඨවිමහාභූත චිත්තජ රූපයන්හි ස්කන්ධවාර පසළොසක් වේ. ආපෝ මහාභූත චිත්තජ රූපාදීන් ගේ ස්කන්ධවාර විභාගය උක්තානුසාරයෙන් දත යුතු.

අබ්‍යාකතපදවසාන වාරයට අනතුරු ව කුසලාබ්‍යාකත පදවසාන වාරය වදාළ සේක. එපී අනුවාද විභාගය කරනු. **කුසලං ධම්මං පටිච්ච කුසලො ච අබ්‍යාකතො ච ධම්මා උප්පජ්ජන්ති හෙතුපච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨාන඾ච රූපං -පෙ- චිත්තසමුට්ඨාන඾ච රූපං.**

**පදපී.**

කුසලං ධම්මං පටිච්ච, එක් ව ඉපදීම් වශයෙන් කුශල ධර්‍මය නිසා: කුසලො ච, කුසල වූ ද: අබ්‍යාකතො ච, අබ්‍යාකත වූ ද: ධම්මා, ධර්‍මයෝ: හෙතුපච්චයා, හේතුප්‍රත්‍යයයෙන්: උප්පජ්ජන්ති, උපදිත්: කුසලං, කුසල වූ: එකං ඛන්ධං, එක්ස්කන්ධයක්: පටිච්ච, එක් ව ඉපදීම් වශයෙන් නිසා: තයො ඛන්ධා, ස්කන්ධයෝ තිදෙනෙක් ද: චිත්තසමුට්ඨානං, සිතින් උපදනා වූ: රූප඾ච, රූපය ද, උපදී: සෙස්ස දත යුතු ය.

**අභිධෙයාපී.**

කුසලං ධම්මං පටිච්ච කුසලො ච අබ්‍යාකතො ච ධම්මා උප්පජ්ජන්ති හෙතුපච්චයා යන අනුවාද පාලියෙහි "කුසලො ච අබ්‍යකතො ච ධම්මා" යන කර්‍තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ කුසල්සිත් එක් විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ය, ඔවුන් නිසා උපදනා චිත්තජරූපයෝය යන ධර්‍මයෝ ලැබෙත්. 'හෙතුපච්චයා' යන පාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන එක්විසි කුශල චිත්තයන් ගෙන් ද්විහේතුක චිත්තයන් හි ඇති අලෝභ අදෝස යන හේතු දෙක්හිද, ත්‍රිහේතුක චිත්තයන්හි ඇති අලෝභ අදෝස අමෝහ යන හේතු තුනෙහි ද ඇති හේතු ශක්තිය ලැබේ.

**ස්කන්ධ වාර.**

එහි අනුවාද පාලියෙහි ස්කන්ධවාර දෙසිය දසයකි. ඔවුහු නම් පඨවි මහාභූත චිත්තජ රූපයන්හි වාර තුදුසය, ආපෝ මහාභූත චිත්තජ රූපයන්හි වාර තුදුස ය, තේජෝ මහාභූත චිත්තජ රූපයන්හි වාර තුදුස ය, වායෝ මහා භූත චිත්තජ රූපයන්හි වාර තුදුස ය, පඨවි ආපෝ තේජෝ මහාභූත චිත්තජ රූපයන්හි වාර තුදුස ය, ආපෝ තේජෝ වායෝ මහාභූත චිත්තජ

Non-commercial distribution

රූපයන්හි වාර තුදුස ය, තේජෝ වායෝ පඨවි මහාභූත චිත්තජරූපයන්හි වාර තුදුස ය, වායෝ පඨවි ආපෝ මහාභූත චිත්තජරූපයන්හි වාර තුදුසු ය, පඨවි ආපෝ මහාභූත චිත්තජරූපයන්හි වාර තුදුස ය. පඨවි තේජෝ මහාභූත චිත්තජ රූපයන්හි වාර තුදුස ය, පඨවි වායෝ මහාභූත චිත්තජරූපයන්හි වාර තුදුස ය, ආපෝ තේජෝ මහාභූත චිත්තජ රූපයන්හි වාර තුදුස ය, ආපෝ වායෝ මහාභූත චිත්තජ රූපයන්හි වාර තුදුසය. තේජෝ වායෝ මහාභූත චිත්තජ රූපයන්හි වාර තුදුසය. පඨවි ආපෝ තේජෝ වායෝ මහාභූත චිත්තජරූපයන්හි වාර තුදුස ය යන මොහු ය.

ඒකකවාර සතරය, තිකවාර සතර ය, දුකවාර සය යයි පඨවි මහාභූත චිත්තජරූපයෙහි වාර තුදුසක් වේ.

(1) "එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" යන අනුවාද පාලියෙහි එකං ඛන්ධං යනුවෙන් වේදනාස්කන්ධය ගෙන "තයො ඛන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" යනුවෙන් සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ පඨවි මහාභූත චිත්තජරූපයන් ගන්නා එක් වාරයෙකි.

(2) "එකං ඛන්ධං" යනුවෙන් සංඥාස්කන්ධය ගෙන "තයො ඛන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" යනුවෙන් සඞ්ඛාර විඤ්ඤාණ වේදනා පඨවි මහාභූත චිත්තජ රූපයන් ගන්නා එක් වාරයෙකි.

(3) "එකං ඛන්ධං" යනුවෙන් සංස්කාරස්කන්ධය ගෙන, "තයො කන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" යනුවෙන් විඤ්ඤාණ වේදනා සඤ්ඤා පඨවි මහාභූත චිත්තජරූපයන් ගන්නා එක් වාරයෙකි.

(4) "එකං ඛන්ධං" යනුවෙන් විඥානස්කන්ධය ගෙන, "තයො ඛන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" වේදනා සඤ්ඤා සඞ්ඛාර පඨවි මහාභූත චිත්තජරූපයන් ගන්නා එක් වාරයෙකි. මෙසේ පඨවි මහාභූත චිත්තජරූපයෙහි වාර සතරක් වේ.

(1) "තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" යන අනුවාද පාලියෙහි "තයො ඛන්ධෙ" යනුවෙන් වේදනා සඤ්ඤා සඞ්ඛාරයන් ගෙන "එකො ඛන්ධො චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" යනුවෙන් විඤ්ඤාණ පඨවි මහාභූත චිත්තජරූපයන් ගන්නා එක් වාරයෙකි.

(2) "තයො ඛන්ධෙ යනුවෙන් සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණයන් ගෙන "එකො ඛන්ධො චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" යනුවෙන් වේදනා පඨවි මහාභූත චිත්තජරූපයන් ගන්නා එක් වාරයෙකි.

Non-commercial distribution

(3) "තයො ඛන්‍ධෙ" යනුවෙන් සඞ්ඛාර විඤ්ඤාණ වේදනාවන් ගෙන, "එකො ඛන්‍ධො චිත්තසමුට්ඨාන ඤ්ච රූපං " යනුවෙන් සඤ්ඤා පඨවිමහාභූත චිත්තජරූපයත් ගන්නා එක් වාරයෙකි.

(4) "තයො ඛන්‍ධෙ" යනුවෙන් විඤ්ඤාණ වේදනා සඤ්ඤාවන් ගෙන, 'එකො ඛන්‍ධො චිත්තසමුට්ඨාන ඤ්ච රූපං' යනුවෙන් සඞ්ඛාර පඨවි මහාභූත චිත්තජරූපයත් ගන්නා එක් වාරයෙකි. මෙසේ තිකවාර සතරක් වේ.

(1) "ද්වෙ ඛන්‍ධෙ පටිච්ච ද්වෙ ඛන්‍ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" යන අනුවාද පාලියෙහි "ද්වෙ ඛන්‍ධෙ" යනුවෙන් වේදනා සඤ්ඤා දෙක ගෙන, ද්වෙ ඛන්‍ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං යනුවෙන් සඞ්ඛාර විඤ්ඤාණ පඨවි මහාභූත චිත්තජරූපයත් ගන්නා එක් වාරයෙකි.

(2) "ද්වෙ ඛන්‍ධෙ" යනුවෙන් වේදනා සඞ්ඛාර දෙක ගෙන, "ද්වෙ ඛන්‍ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" යනුවෙන් විඤ්ඤාණ සඤ්ඤා පඨවි මහාභූත චිත්තජ රූපයත් ගන්නා එක් වාරයෙකි.

(3) "ද්වෙ ඛන්‍ධෙ" යනුවෙන් වේදනා විඤ්ඤාණයන් ගෙන, "ද්වෙ ඛන්‍ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" යනුවෙන් සඤ්ඤා සඞ්ඛාර පඨවි මහාභූත චිත්තජරූපයත් ගන්නා එක් වාරයෙකි.

(4) "ද්වෙ ඛන්‍ධෙ" යනුවෙන් සඤ්ඤා සඞ්ඛාර දෙක ගෙන, "ද්වෙ ඛන්‍ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" යනුවෙන් වේදනා විඤ්ඤාණ පඨවි මහාභූත චිත්තජරූපයත් ගන්නා එක් වාරයෙකි.

(5) "ද්වෙ ඛන්‍ධෙ" යනුවෙන් සඤ්ඤා විඤ්ඤාණයන් ගෙන, "ද්වෙ ඛන්‍ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" යනුවෙන් වේදනා සඞ්ඛාර පඨවි මහාභූත චිත්තජරූපයත් ගන්නා එක් වාරයෙකි.

(6) "ද්වෙ ඛන්‍ධෙ" යනුවෙන් සඞ්ඛාර විඤ්ඤාණයන් ගෙන, "ද්වෙ ඛන්‍ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං" යනුවෙන් වේදනා සඤ්ඤා පඨවි මහාභූත චිත්තජරූපයත් ගන්නා එක් වාරයෙකි. මෙසේ දුකවාර සයක් වේ.

මෙසේ ඒකකවාර සතරක් ද තිකවාර සතරක් ද දුකවාර සයක් ද වීමෙන් පඨවි මහාභූත චිත්තජරූපයෙහි ඝන්‍ධවාර තුදුසක් වේ. ආපෝ මහාභූත චිත්තජරූපාදියෙහි ඝන්‍ධවාරයන් වුකතානුසාරයෙන් යොද විස්තර කරනු.

කුසල පද වාරයට අනතුරු ව අකුසල පද වාරය වදළ සේක. එ ද අකුසලපදවසාන වාර අබ්‍යාකතපදවසාන වාර අකුසලාබ්‍යාකත

Non-commercial distribution

පදවසාන වාර වශයෙන් තෙවැදෑරුම් වේ. එයින් අකුසලපදවසාන වාරය පළමු කොට වදළ සේක. එ ද වීථි අනුවාද වශයෙන් තෙවදෑරුම් වේ. එයින් වීථිය පළමු කොට වදළ සේක. කෙසේ ද ? යත් "**අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා**" යනුවෙනි. වීථියට අනතුරු ව අනුවාද ය වදළ සේක. කෙසේ ද? යත්, "**අකුසලං එකං ඛන්ධං -පෙ-ඛන්ධා**" යනුවෙනි.

**අභිධෙයාර්‍ථ**

"අකුසලං-පෙ-හෙතුපච්චයා" යන අනුවාද පාලියෙහි "අකුසලො ධම්මො" යන කර්‍තෘ පාඨයෙන් අකුසල් සිත් දෙළොස ය, චෛතසික සත්විස්සය යන අවයව නාමස්කන්‍ධයන් නිසා උපදනා වූ අකුසල් සිත් දෙළොස ය, මෝහමූලද්වයෙහි මෝහය හැර චෛතසික සත් විස්ස ය, යන අවයව නාමස්කන්‍ධයෝ ලැබෙත්. හේතුපච්චයා යන පාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට ප්‍රත්‍යය වන දෙළොස් අකුසල චිත්තයන් ගෙන් ලෝභමූල චිත්තයෙහි ලෝභ මෝහ දෙක ය, දෝසමූල චිත්තයෙහි දෝස මෝහ දෙක ය, මෝහමූල චිත්තයෙහි මෝහය ය යන හේතු ධර්‍මයන් ගේ හේතු ශක්තිය ලැබේ. (අනුවාද පාලියෙහි ස්කන්‍ධවාර තුදුසෙකි. ඒවා කුසල පදයෙහි කී පරිදි දත යුතු ය.)

අකුසල පදවසාන වාරයට අනතුරු ව අබ්‍යාකත පදවසාන වාරය වදළ සේක. වීථි අනුවාද විභාගය කරතු. "**අකුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා, අකුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං**"

**අභිධෙයාර්‍ථ.**

අකුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා යන අනුවාද පාලියෙහි අබ්‍යාකතො ධම්මො යන කර්‍තෘ පාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අකුසල් සිත් දෙළොස ය, චෛතසික සත්විස්සය ය යන සමූහ නාමස්කන්‍ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්. හෙතුපච්චයා යන පාඨයෙන් චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ දෙළොස් අකුසල චිත්තයන් ගෙන් ලෝභමූල චිත්තයෙහි ලෝභ මෝහ දෙක ය, දෝසමූල චිත්තයෙහි දෝස මෝහ දෙක ය, මෝහමූල චිත්තයෙහි මෝහය යන හේතු ධර්‍මයන් ගේ හේතු ශක්තිය ලැබේ. (ස්කන්‍ධවාර දෙසිය විසිපසකි. ඒවා කුසලාබ්‍යාකත පද වාරයේ දැක් වූ පරිදි විස්තර කරතු.)

Non-commercial distribution

අබ්‍යාකතපදවසාන වාරයට අනතුරුව අකුසලාබ්‍යාකත පදවසාන වාරය වදළ සේක. වීථී අනුවාද විභාගය කරනු. **"අකුසලං ධම්මං පටිච්ච -පෙ- ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්ත සමුට්ඨාන ඤ්ච රූපං"** පදථී කියනු.

**අභිධෙයාථී.**

වීථීපාලියෙහි "අකුසලො ච අබ්‍යාකතො ච ධම්මා" යන කතිෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුසල් සිත් දෙළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අකුසල් සිත් දෙළොස ය, මෝහ මූලද්වයයෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ය, ඔවුන් නිසා උපදනා චිත්තජරූපයෝ ය යන මොව්හු ලැබෙත්. හේතුපච්චයා යන පාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්ච වෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ දෙළොස් අකුසල චිත්තයන් ගෙන් ලෝභ මූල චිත්තයන්හි ඇති ලෝභ මෝහ දෙක ය, ද්වේෂමූල චිත්තයයන්හි ඇති •දෝස මෝහ දෙක ය, මෝහමූල චිත්තයන්හි ඇති මෝහය ය යන හේතු ධර්මයන් ගේ හේතුශක්තිය ලැබේ. (ස්කන්ධවාර දෙසිය දසයකි. ඒවා කුසල පදයෙහි මෙන් දත යුතු ය.)

අකුසලපදයට අනතුරු ව අබ්‍යාකතපදය වදළ සේක. එහි ඇත්තේ අබ්‍යාකතපදවසානවාර වශයෙන් එක් වාරයෙකි. එය වීථී අනුවාද වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් වීථීය පළමු කොට වදළ සේක. එනම් **"අබ්‍යාකතං ධම්මං අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා"** යනු යි. වීථීයට අනතුරු ව අනුවාදය වදළ සේක. එනම් **"විපාකාබ්‍යාකතං කිරියා-බ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච-පෙ-කටත්තා රූපං උපාදයරූපං"** යනු යි.

**අභිධෙයාථී.**

"අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො" යනාදි පාඨයෙන් දැක්වෙන අව්‍යාකෘත ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි ශුඬරූප වශයෙන් තෙවැදෑරුම් වේ. එයින් ප්‍රවෘත්තිකාලයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කතිෘපාඨයෙන් සහේතුක විපාක සිත් එක්විස්ස ය, සහේතුක ක්‍රියා සිත් සතොළොස ය චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ සහේතුක විපාක සිත් එක් විස්ස ය සහේතුක ක්‍රියා සිත් සතොළොස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ය, ඔවුන් උපදවන චිත්තජරූපයෝ ය යන මොව්හු ලැබෙත්. "හේතුපච්චයා" යන පාඨයෙන් සම්පයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන සහේතුක විපාක සිත් එක්විස්ස ය

Non-commercial distribution

සහේතුක ක්‍රියා සිත් සතොළොස ය යන මොවුන් ගෙන් ද්විහේතුක චිත්තයන්හි ඇති අලෝභ අදෝස දෙක ය ත්‍රිහේතුක චිත්තයන්හි ඇති අලෝභ අදෝස අමෝහ තුන ය යන හේතුධර්මයන් ගේ හේතු ශක්තිය ලැබේ. ස්කන්ධවාර දෙසිය දසයකි. (ඉහත කී පරිදි විස්තර කරනු.)

ප්‍රතිසන්ධිකාලයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කත්තෘපාඨයෙන් සහේතුක ප්‍රතිසන්ධි සිත් සතොළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා හෘදය වස්තුව ද නිසා උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි සතළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, කර්මජ-රූපයෝ ය යන මොව්හු ලැබෙත්. "හේතුපච්චයා" යන පාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සමුප්‍රයුක්තස්කන්ධයන්ට හා කර්මජරූපයන්ට ද ප්‍රත්‍යය වන සහේතුක ප්‍රතිසන්ධි සතොළොසෙහි ද්විහේතුක චිත්තයන්හි ඇති අලෝභ අදෝස දෙක්හි ද ත්‍රිහේතුක චිත්තයන්හි ඇති අලෝභ අදෝස අමෝහයන් ගේ ද හේතු ශක්තිය ලැබේ.

**ස්කන්ධවාර.**

ස්කන්ධවාර දෙසිය සතළිසකි. අවයව නාමස්කන්ධයන්හි වාරදෙසිය දසයෙකි, අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන්හි වාර පසළොසෙකි, හෘදය වස්තුවෙහි වාර පසළොසෙකි, මෙ සේ ස්කන්ධවාර දෙසිය සතළිසක් වේ. අවයව නාමස්කන්ධයන්හි වාර දෙසිය දසය පඨවි මහාභූත කටත්තාරූපයන්හි වාරතුදුස ය යනාදීන් උක්තානුසාරයෙන් විස්තර කරනු. පඨවි මහාභූත කටත්තාරූපයන්හි ඒකකවාර සතර ද තිකවාර සතර ද දුකවාර සය ද විස්තර කරනු. ආපෝ මහාභූත කටත්තාරූපාදියෙහි වාර-යන් ද එසේ ම විස්තර කරනු. වාර දෙසිය දසය ලැබෙනු ඇත.

අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන්හි ඒකක වාර සතරක් ද තිකවාර සතරක් ද දුකවාර සයක් ද චතුක්කවාරයක් ද වීමෙන් වාර පසළොසක් වේ.

(1) "ඛන්ධෙ පටිච්ච වත්ථු" යන අනුවාද පාලියෙහි "ඛන්ධෙ" යනුවෙන් වේදනාව ගෙන "වත්ථු" යනුවෙන් හෘදය වස්තුව ගන්නා එක් වාරයෙකි. (2) "ඛන්ධෙ" යනුවෙන් සඤ්ඤාව ගෙන, "වත්ථු" යනුවෙන් හෘදය වස්තුව ගන්නා එක් වාරයෙකි. (3)"ඛන්ධෙ" යනුවෙන් සඞ්ඛාරය ගෙන, "වත්ථු" යනුවෙන් හෘදය වස්තුව ගන්නා එක් වාරයෙකි. (4)"ඛන්ධෙ" යනුවෙන් විඤ්ඤාණය ගෙන, "වත්ථු" යනුවෙන් හෘදය වස්තුව ගන්නා එක්වාරයෙකි. මෙ සේ ඒකක වාර සතරක් වේ.

Non-commercial distribution

(1) "ඛන්‍ධෙ" යනුවෙන් වේදනා සඤ්ඤා සඞ්ඛාරයන් ගෙන, "වත්‍ථු" යනුවෙන් හෘදය වස්‍තුව ගන්නා එක් වාරයෙකි. (2) "ඛන්‍ධෙ" යනුවෙන් සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණයන් ගෙන, "වත්‍ථු" -පෙ- එක් වාරයෙකි. (3) "ඛන්‍ධෙ" යනුවෙන් සඞ්ඛාර විඤ්ඤාණ වේදනාවන් ගෙන, "වත්‍ථු" -පෙ- එක් වාරයෙකි. (4) "ඛන්‍ධෙ" යනුවෙන් විඤ්ඤාණ වේදනා සඤ්ඤාවන් ගෙන, වත්‍ථු-පෙ- එක් වාරයෙකි. මෙසේ තිකවාර සතරක් වේ.

(1) "ඛන්‍ධෙ" යනුවෙන් වේදනා සඤ්ඤාවන් ගෙන, වත්‍ථු එක් වාරයෙකි. (2)"ඛන්‍ධෙ" යනුවෙන් වේදනා සඞ්ඛාරයන් ගෙන, වත්‍ථු එක් වාරයෙකි. (3)ඛන්‍ධෙ යනුවෙන් වේදනා විඤ්ඤාණයන් ගෙන, "වත්‍ථු" එක් වාරයෙකි. (4)"ඛන්‍ධෙ" යනුවෙන් සඤ්ඤා සඞ්ඛාරයන් ගෙන, "වත්‍ථු" එක් වාරයෙකි. (5) "ඛන්‍ධෙ" යනුවෙන් සඤ්ඤා විඤ්ඤාණයන් ගෙන, "වත්‍ථු" එක් වාරයෙකි. (6) "ඛන්‍ධෙ" යනුවෙන් සඞ්ඛාර විඤ්ඤාණයන් ගෙන, "වත්‍ථු" යනු වෙන් හෘදය වස්‍තුව ගන්නා එක් වාරයෙකි. මෙසේ දුකවාර සයක් වේ.

"ඛන්‍ධෙ" යනුවෙන් වේදනා සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණයන් ගෙන, "වත්‍ථු" යනුවෙන් හෘදය වස්තුව ගන්නා වාරය චතුක්ක වාරය ය. මෙසේ අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන්හි ස්කන්‍ධවාර පසළොස වේ.

ඒකකවාර සතරක් ද තිකවාර සතරක් ද දුකවාර සයක් ද චතුෂ්ක වාරයක් ද වීමෙන් හෘදය වස්‍තුවෙහි ස්කන්‍ධවාර පසළොසෙකි. "වත්‍ථුං පටිච්ච ඛන්‍ධා" යන අනුවාද පාලියෙහි "වත්‍ථුං" යනුවෙන් හෘදය වස්‍තුව ගෙන, "ඛන්‍ධා" යනුවෙන් පිළිවෙළින් වේදනාදි ස්කන්‍ධ සතර ගැනීමෙන් හෘදය වස්‍තුව පිළිබඳ ඒකක වාර වේ.

"වත්‍ථුං" යනුවෙන් හෘදය වස්‍තුව ගෙන, "ඛන්‍ධා" යනුවෙන් වේදනා සඤ්ඤා සඞ්ඛාර තුන ද, සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණ තුන ද, සඞ්ඛාර විඤ්ඤාණ වේදනා තුනද විඤ්ඤාණ වේදනා සඤ්ඤා තුන ද, ගැනීමෙන් තිකවාර සතර වේ.

"වත්‍ථුං" යනුවෙන් හෘදය වස්තුව ගෙන "ඛන්‍ධා" යනුවෙන් වේදනා සඤ්ඤා දෙක ද, වේදනා සඞ්ඛාර දෙක ද, වේදනා විඤ්ඤාණ දෙක ද, සඤ්ඤා සඞ්ඛාර දෙක ද, සඤ්ඤා විඤ්ඤාණ දෙක ද, සඞ්ඛාර විඤ්ඤාණ දෙක ද පිළිවෙළින් ගැනීමෙන් හෘදය වස්‍තුවෙහි දුකවාර සය වේ.

"වත්‍ථුං" යනුවෙන් හෘදය වස්‍තුව ගෙන "ඛන්‍ධා" යනුවෙන් නාමස්කන්‍ධ සතර ම ගැනීමෙන් හෘදය වස්‍තුවෙහි චතුෂ්කවාරය වේ. මෙ සේ හෘදය වස්‍තුවෙහි ස්කන්‍ධවාර පසළොස වේ. මෙ සේ අවයව නාමස්කන්‍ධයන්හි

Non-commercial distribution

වාර පසළොසක් ද, හෘදය වස්තුවෙහි වාර පසළොසක්ද වීමෙන් ප්‍රතිසන්ධිකාලයෙහි ඝතන්ධවාර දෙසිය සතළිසක් වේ.

ශුඬරූපවාරයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කතිෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක අරහන්තච්‍යුති වර්ජිත කුශලා කුශල සහේතුක විපාක සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් නිසා උපදනා වූ සහේතුක චිත්තජ මහාභූතයෝ ය, සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි තෙළෙස හා උපදනා සහේතුක කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා වූ භූත රූප සහිත වූ සහේතුක චිත්තජ උපාදයරූපයෝ ය සහේතුක ප්‍රතිසන්ධි කර්මජ උපාදය රූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්. "හේතු පච්චයා" යන පාඨයෙන් පඤ්චවෝකර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුශලා කුශල සහේතුක විපාක සහේතුක ක්‍රියා චිත්තයන්හි ඇති ලෝභ මෝහ ය, දෝස මෝහය, මෝහය ය, අලෝභ අදෝස ය, අලෝභ අදෝස අමෝහ ය යන හේතුන් ගේ හේතු ශක්තිය ලැබේ.

චිත්තජමහාභූතයන්හි පසළොස් වාරයක් ද කර්මජමහාභූතයන්හි පසළොස් වාරයක් ද වීමෙන් එහි ඝතන්ධවාර තිසකි. ඒකක වාර සතරක් ද තිකවාර සතරක් ද දුකවාර සයක් ද චතුෂ්ක වාරයක් ද වීමෙන් චිත්තජමහාභූතයන්හි ඝතන්ධවාර පසළොසක් වේ.

"එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා" යන අනුවාද පාලියෙහි "එකං මහාභූතං" යනුවෙන් පඨවි මහාභූතය ගෙන "තයො මහා භූතා" යනුවෙන් ආපෝ තේජෝ වායෝ මහාභූතයන් ගන්නා එක්වාරයෙකි. (2) "එකං මහාභූතං" යනුවෙන් ආපෝමහාභූතය ගෙන "තයොමහාභූතා" යනුවෙන් තේජෝ වායෝ පඨවි මහාභූතයන් ගන්නා එක් වාරයෙකි. (3) "එකං මහාභූතං" යනුවෙන් තේජෝ මහාභූතය ගෙන, "තයෝ මහාභූතා" යනුවෙන් වායෝ පඨවි ආපෝ මහාභූතයන් ගන්නා එක් වාරයෙකි. (4) "එකං මහාභූතං" යනුවෙන් වායෝ මහාභූතය ගෙන, "තයෝ මහාභූතා" යනුවෙන් පඨවි ආපෝ තේජෝ මහා භූතයන් ගන්නා එක් වාරයෙකි. මෙසේ ඒකකවාර සතරක් වේ.

"තයෝ මහභූතෙ පටිච්ච එකං මහාභූතං" යන අනුවාද පාලියෙහි "තයො මහාභූතෙ" යනුවෙන් පඨවි ආපෝ තේජෝ මහාභූතයන් ගෙන "එකං මහා භූතං" යනුවෙන් වායෝ මහාභූතය ගන්නා එක් වාරයෙකි. "තයෝ මහාභූතෙ" යනුවෙන් ආපෝ තේජෝ වායෝ මහාභූතයන් ගෙන එකං මහාභූතං යනුවෙන් පඨවි මහාභූතය ගන්නා එක් වාරයෙකි. (3)"තයො මහාභූතෙ" යනුවෙන් තේජෝ වායෝ පඨවි මහාභූතයන් ගෙන, "එකං මහාභූතං" යනුවෙන් ආපෝ මහාභූතය ගන්නා එක්වාරයෙකි.

Non-commercial distribution

(4) තයො මහාභූතෙ යනුවෙන් වායෝ පඨවි ආපෝ මහාභූතයන් ගෙන, ඒකං මහාභූතං යනුවෙන් තේජෝ මහාභූතය ගන්නා එක්-වාරයෙකි. මෙ සේ තිකවාර සතරක් වේ.

ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා යන අනුවාද පාලියෙහි
(1) "ද්වෙ මහාභූතෙ" යනුවෙන් පඨවි ආපෝ මහා භූතයන් ගෙන ද්වෙ මහාභූතා යනුවෙන් තේජෝ වායෝ මහාභූතයන් ගන්නා එක් වාරයෙකි.
(2) "ද්වෙ මහාභූතෙ" යනුවෙන් පඨවි තේජෝ මහාභූතයන් ගෙන, "ද්වෙ මහාභූතා යනුවෙන් ආපෝ වායෝ මහාභූතයන් ගන්නා එක් වාරයෙකි.
(3) "ද්වෙ මහාභූතෙ" යනුවෙන් පඨවි වායෝ මහාභූතයන් ගෙන, ද්වෙ මහාභූතා යනුවෙන් ආපෝ වායෝ මහාභූතයන් ගන්නා එක් වාරයෙකි.
(4) "ද්වෙ මහාභූතෙ" යනුවෙන් ආපෝ තේජෝ මහාභූතයන් ගෙන, ද්වෙ මහාභූතා යනුවෙන් පඨවි වායෝ මහාභූතයන් ගන්නා එක්වාරයෙකි.
(5) "ද්වෙ මහාභූතෙ" යනුවෙන් ආපෝ වායෝ මහාභූතයන් ගෙන, "ද්වෙ මහාභූතා" යනුවෙන් පඨවි තේජෝ මහාභූතයන් ගන්නා එක්වාරයෙකි.
(6) 'ද්වෙ මහාභූතෙ' යනුවෙන් තේජෝ වායෝ මහාභූයන් ගෙන 'ද්වෙ මහාභූතා යනුවෙන් පඨවි ආපෝ මහාභූතයන් ගන්නා එක්වාරයෙකි. මෙසේ ද්‍රකවාර සයක් වේ.

"මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං උපාදය රූපං" යන අනුවාද පාලියෙහි "මහාභූතෙ" යනුවෙන් මහාභූත සතර ගෙන, "චිත්තසමුට්ඨානං රූපං" යනුවෙන් උපාදයරූප ගන්නා වාරය චතුෂ්කවාරය ය. මෙසේ ඒකකවාර සතරක් ද තිකවාර සතරක් ද ද්‍රකවාර සයක් ද චතුෂ්කවාරයක් ද වීමෙන් චිත්තජමහාභූතයන්හි ස්කන්ධවාර පසළොසක් වේ. කර්මජ-මහාභූතයන්හි ද එ සේම පසළොස්වාරයක් වීමෙන් ශුඬරූපයන්හි ස්කන්ධ වාර තිසක් වේ. මෙසේ ප්‍රවෘත්ති කාලයෙහි වාර දෙසිය දසයක් ද ප්‍රතිසන්ධි කාලයෙහි වාර දෙසිය සතලිසක් ද ශුද්ධ රූපයෙහි වාර තිසක් ද වීමෙන් අබ්‍යාකත වාරයෙහි ස්කන්ධවාර සාරසිය අසූවක් වේ.

අබ්‍යාකතපදවාරයට අනතුරු ව කුසලාබ්‍යාකත පද වාරය වදළ සේක. එය අබ්‍යාකතපදවසානවාර වශයෙන් එක් වාරයෙකි. එය වීථි අනුවාද වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් වීථිය පළමු කොට වදළ සේක. එනම්- "**කුසලඤ්ච අබ්‍යාකතඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා**" යනුයි. වීථියට අනතුරු ව අනුවාදය වදළ සේක. එනම් "**කුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං**" යනු යි. කුසලෙ ඛන්ධෙ ච මහාභූතෙච පටිච්ච, එක්ව ඉපදීම් වශයෙන් කුසලස්කන්ධයන් හා මහාභූතයන් නිසාඃ චිත්ත සමුට්ඨානං රූපං, චිත්තසමුට්ඨානරූපය උපදී, යනු අර්ථ යි.

Non-commercial distribution

අභිධෙයාර්‍ථ

කුසල ඤච -පෙ- හෙතුපච්චයා යන අනුවාද පාලියෙහි 'අබ්‍යාකතො ධම්මො' යන කර්‍තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල්සිත් එක්විස්ස ය, චෛතසික අට තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් හා මහාභූතයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ලැබෙත්. හේතු පච්චයා යන පාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ එක්විසි කුසල චිත්තයන් ගේ අලෝභ අදෝස යන හේතු දෙකය අලෝභ අදෝස අමෝහ යන හේතු තුනය යන මොවුන් ගේ හේතුශක්තිය ලැබේ. ස්කන්‍ධවාර දෙසිය විසිපසෙකි. (කුසලපදයේ අබ්‍යාකත පදවසාන වාරයෙහි මෙන් ස්කන්‍ධවාර විභාගය දත යුතු ය. කර්‍මපදයෙන් ස්කන්‍ධයන් හා මහාභූතයන් ගැනීම පමණක් එහි වෙනස ය.)

කුසලාබ්‍යාකතපදවාරයට අනතුරු ව අකුසලාබ්‍යාකත පද වාරය වදළ සේක. -පෙ- **අකුසල ඤච අබ්‍යාකත ඤච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා**" යනුයි. -පෙ- "**අකුසලෙ -පෙ- චිත්තසමුට්ඨානං රූපං**" යනුයි.

අභිධෙයාර්‍ථ.

"අබ්‍යාකතො ධම්මො" යන කර්‍තෘපාඨයෙන් අකුසල් සිත් දෙළොසය චෛතසික සිත්විස්සය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් හා මහාභූතයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ලැබෙත්. 'හෙතු පච්චයා' යන පාඨයෙන් චිත්තජරූපයන් ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ දෙළොස් අකුසලචිත්තයන්හි ඇති ලෝභාදි හේතුන්ගේ හේතු ශක්තිය ලැබේ. ස්කන්‍ධවාර දෙසිය විසි පසෙකි.

**හේතු ප්‍රත්‍යය විභඞ්ගවාරය නිමි.**

විශේෂ කරුණු

පච්ඡාවාරයා ගේ ආදියෙහි හේතුප්‍රත්‍යය සම්බන්‍ධයෙන් දැක්වුණු ප්‍රශ්න එකුන්පනසෙන් මේ විස්සජ්ජනවාරයේ විසඳා වදරා තිබෙන්නේ ප්‍රශ්න නවයක් පමණය. ඉතිරි ප්‍රශ්න සතළිස විසඳා නැත. ඒවා විසඳත හොත් විසඳිය යුත්තේ "නුප්පජ්ජ ති" කියා ය. දැක්විය යුතු ධර්‍මයක් නො ලැබෙන ඒ ප්‍රශ්න විසඳීමෙන් දේශනය දික්වීම මිස විශේෂ ප්‍රයෝජනයක් නැති බැවින් දැක්විය යුතු ධර්‍ම ඇති ප්‍රශ්න නවය පමණක් විසඳා තිබේ. ඉදිරියෙහි විස්සර්ජනා වාරය ඇත්තේ මේ ක්‍රමයෙන් ම ය.

Non-commercial distribution

"කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජ ති හෙතු පච්චයා" යන්නෙහි තේරුම කුශලධර්මයන් හා එක්ව උපදනා වූ කුශල ධර්මය හේතුප්‍රත්‍යයෙන් උපදී ය යනු යි. සෝමනස්ස සහගත ඤාණසම්පයුත්ත අසඞ්ඛාරික කුසල සිත උපදින්නේ චෛතසික තෙතිසක් ද සමග ය. අවයව සූතිසක් ඇත්තා වූ ඒ ධර්මරාශියට අයත් ධර්මසියල්ල ම අන්‍යෝන්‍ය වශයෙන් කුශලයන් සමගම උපදී. ඒවායේ උත්පත්තියට ඒ සමූහයට අයත් හේතූන් ප්‍රත්‍යය වන බැවින් ඒ ධර්මයෝ අන්‍යෝන්‍ය වශයෙන් කුශලධර්ම සමග ම හේතු ප්‍රත්‍යයෙන් උපදිති. ඒ කුශලධර්මයන් ගේ උත්පත්තියට තවත් උපකාරක ධර්ම තවත් නැත්තේ නොවේ. මේ දේශනය කරනු යේ ඒ අනේක ප්‍රත්‍යයන් ගෙන් හේතු ප්‍රත්‍යය පමණක් දැක්වීමටය. ඒ ධර්ම තවත් ප්‍රත්‍යයන් ගේ උපකාරයක් නැති ව හේතු ප්‍රත්‍යයෙන් ම උපදීය යි නො ගත යුතු ය.

"කුසලං ධම්මං පටිච්ච" යනාදි පාලියෙහි "පටිච්ච" යනු අටුවා වෙහි විස්තර කර තිබෙන්නේ එහි "පටි" යනු සදෘශාර්ථය දෙන පදයක් ය, "ඉච්ච" යනු ගමනාර්ථය දෙන පදයක් ය කියා ය. එසේ ගන්නා කල්හි පටිච්ච යන්නට අර්ථ කිය යුත්තේ 'සමාන බවට පැමිණ' ය කියා ය. අටුවාවේ සැටියට සම්පූර්ණ පාඨයට පදාර්ථ කියයුත්තේ මෙසේ ය.

කුසලං, කුසල් වූ: ධම්මං, ධර්මය හා: පටිච්ච, (එක්ව ඉපදීම් වශයෙන්) සමාන බවට පැමිණ: කුසලො, කුසල් වූ: ධම්මො, ධර්මය: උප්පජ්ජ ති, උපදී: හෙතුපච්චයා, (එසේ උපදනා ධර්මය) හේතුප්‍රත්‍යයෙන් (උපදී.)

"චක්ඛු ඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජ ති චක්ඛු විඤ්ඤාණං, හෙතුං පටිච්ච සම්භූතා හෙතු භඞ්ගා නිරුජ්ඣති" යනාදීන්හි "පටිච්ච" යනු වෙන් දැක්වෙන්නේ කාරණාර්ථය ය. බුරුම සන්නයෙහි ඒ අර්ථය ගෙන කුසලං ධම්මං පටිච්ච කුශල ධර්මය නිසා කියා ද අටුවාවෙහි දැක්වෙන ක්‍රමයට ද යන දෙයාකාරයෙන්ම අර්ථ කියා තිබේ. අටුවාවෙහි සමාන භාවයට පැමිණීමය යි කියා තිබෙන්නේ ද අන් ක්‍රමයකින් සමාන භාවයකට පැමිණීමකට නොව එක්ව ඉපදීමෙන් සමාන බවට පැමිණීමට ය. සමූහ වශයෙන් උපදනා රූපා රූප ධර්මයන් ගෙන් එක් එක් ධර්මයක ම ඉපදීම ඒ ඒ ධර්ම හා එක් ව උපදනා අන්‍ය රූපා රූප ධර්මයන් ගේ ඉපදීමට උපකාරයක් වේ. (පටිච්ච යනුවෙන් කියැවෙන අදහස ද ඒ උපකාරකත්වය ය, එබැවින් අර්ථකීමේ පහසුව ද සලකා අප විසින් "කුසලං ධම්මං පටිච්ච, එක් ව ඉපදීම් වශයෙන් කුසලධර්මය නිසාය"යි පදාර්ථ දක්වන ලදී.

Non-commercial distribution

"කුසලො ධම්මො" යන කතීඃපාඨයේ අභිධෙයාර්ථ දැක්වීමේදී අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අවයව නාමස්කන්ධයෝ ය යි කියනුයේ නාමස්කන්ධ සතර ම එකවර ප්‍රත්‍යය භාවයෙන් හා ප්‍රත්‍යයෝත්පන්න භාවයෙන් නො ගත හැකි බැවිනි. එකට බැඳී එකවර උපදින්නා වූ නාමස්කන්ධයන් ගෙන් එක් කොටසකට අනික් කොටස ද අනික් කොටසට ඒ කොටස ද ප්‍රත්‍යය වේ. එබැවින් ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න භාවය අවයව වශයෙන් කියනු ලැබේ.

## (2) ආරම්මණ ප්‍රත්‍යය විභඞ්ගවාරය.

හේතුප්‍රත්‍යය විභඞ්ගවාරයට අනතුරු ව ආරම්මණ ප්‍රත්‍යය විභඞ්ගවාරය වදාළ සේක. එහි ද කුසලපද අකුසලපද අව්‍යාකෘත පද වශයෙන් වාර තුනක් ඇත්තේ ය. එයින් කුසලපද වාරය පළමු කොට වදාළ සේක. කුශලපදාවසාන වාර වශයෙන් එය එක් වාරයක් ම වේ. එ ද විධි අනුවාද වශයෙන් දෙවැදෑරුම් වේ. විධිය පළමු කොට වදාළ සේක. එනම් - "**කුසලං ධම්මං පටිච්ච -පෙ- ආරම්මණ පච්චයා**" යනු යි. එයට අනතුරු ව අනුවාදය වදාළ සේක. එනම්. "**කුසලං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා**" යනු යි. පදාර්ථ පෙර සේ කියනු.

**අභිධෙයාර්ථ**

"කුසලො ධම්මො" යන කතීඃපාඨයෙන් කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා කුසල්සිත් එක්විස්සය චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධ වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. "ආරම්මණ පච්චයා" යන හේතු පාඨයෙන් කුසල් සිත් එක්විස්සට ප්‍රත්‍යය වන අර්හත්මාර්ග අර්හත්ඵල වර්ජිත සිත් සත්අසූව ය චෛතසික දෙපනස ය අටවිසිරූප ය නිවණ ය ප්‍රඥප්තියය යන ෂඩාරම්මණ ධර්මයන් ගේ ආරම්මණ ප්‍රත්‍යශක්තිය ලැබේ.

විස්තර වශයෙන් මෙසේ ය. මහාකුශල ඥානවිප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන ලෞකික සිත් එක් අසූව ය, චෛතසික දෙපනස ය, අටවිසිරූපය ය ප්‍රඥප්තිය යන ෂඩාරම්මණය යඃ මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන අර්හත්මාර්ග අර්හත්ඵල වර්ජිත සිත් සත්අසූව ය, චෛතසික දෙපනස ය, අටවිසිරූප ය, නිර්වාණය ය, ප්‍රඥප්තිය ය යන ෂඩාරම්මණය යඃ දිබ්බචක්ඛු කුසලාභිඥාවට ප්‍රත්‍යය වන දූරප්‍රතිච්ඡන්න ප්‍රතිගඩ සූක්ෂම වර්තමාන රූපාරම්මණය ය, දිබ්බසෝත කුසලාභිඥාවට ප්‍රත්‍යය වන දූරප්‍රතිච්ඡන්න ප්‍රතිගඩ සූක්ෂම වර්තමාන ශබ්දාරම්මණය ය, ඉද්ධිවිධ කුසලාභිඥාවට ප්‍රත්‍යය වන පාදක රූපාවචර කුශල

Non-commercial distribution

පඤ්චමධ්‍යානය හා ශතසහශ්‍රාදි නිර්මිත රූපයෝ ද යන ෂඩාරම්මණය ය; චේතෝපරිය කුසලාභිඥාවට ප්‍රත්‍යය වන ඉකුත් සත්දිනයේ පටන් අනාගත සත්දිනය දක්වා කාලයෙහි කාලත්‍රයට අයත් වූ අභිත්මාගී අභිත්ඵල වර්ජිත සිත් සත්අසූව ය චෛතසික දෙපනස ය යන ධර්මාරම්මණය ය, පූර්‍වේනිවාසානුස්සති කුසලාභිඥාවට ප්‍රත්‍යය වන පෙර ජාතිවලට අයත් අභිනමාගී අභිත්ඵල වර්ජිත සිත් සත්අසූව ය චෛතසික දෙපනස ය රූප අටවිස්ස ය යන පඤ්චස්කන්ධය හා ඒ පඤ්චස්කන්ධය අනු ව දත යුතු වූ නිවන ය නාමගෝත්‍රාදි ප්‍රඥප්තීහුද යන ෂඩාරම්මණය ය, යථාකම්මූපග කුශලාභිඥාවට ප්‍රත්‍යය වන අතීත වූ ලෞකික කුශලාකුශල කර්ම සඞ්ඛ්‍යාත ධර්මාරම්මණය ය,අනාගතංස කුශලාභිඥාවට ප්‍රත්‍යය වන අනාගත වූ අභිත්මාගී අභිත්ඵල වර්ජිත සිත් සත්අසූව ය චෛතසික දෙපනසය ය රූප අටවිස්ස ය යන පඤ්චස්කන්ධය ය ඒ පඤ්චස්කන්ධානුසාරයෙන් දතයුතු වූ නිර්වාණ නාමගෝත්‍රාදීහුය යන ෂඩාරම්මණය ය, රූපාවචර ප්‍රථම ධ්‍යාන කුශලයට ප්‍රත්‍යය වන කසින දශය ය, අශුභ දශය ය, ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තිය ය කේශාදි කොට්ඨාශ ප්‍රඥප්තිය ය මෛත්‍රා කරුණා මුදිතා යන බ්‍රහ්මවිහාරයන්ට අරමුණු වන අප්‍රමාණ සත්ත්ව ප්‍රඥප්තිය ය යන පස්විසි ප්‍රඥප්ති වූ ධර්මාරම්මණය ය, රූපාවචර ද්විතීයධ්‍යාන තෘතීය ධ්‍යාන චතුර්ථධ්‍යාන කුශලයන්ට ප්‍රත්‍යය වන කසිණ දශය ය ආශ්වාස ප්‍රශ්වාස ය මෛත්‍රා කරුණා මුදිතා යන බ්‍රහ්මවිහාරයන්ට අරමුණු වන අප්‍රමාණ සත්ත්ව ප්‍රඥප්තිය ය යන ප්‍රඥප්ති තුදුස වූ ධර්මාරම්මණය ය, රූපාවචර පඤ්චමධ්‍යාන කුශලයට ප්‍රත්‍යය වන කසිණ දශය ය ආශ්වාස ප්‍රශ්වාස ප්‍රඥප්තිය ය උපේක්‍ෂා බ්‍රහ්මවිහාරයට අරමුණු වන අප්‍රමාණ සත්ත්ව ප්‍රඥප්ති ය යන ප්‍රඥප්ති දෙළොස වූ ධර්මාරම්මණය ය, ආකාසානඤ්චායතන කුසලයට අරමුණු වන කිසුණු උගුළා ලබන ආකාශප්‍රඥප්තිය වූ ධර්මාරම්මණය ය, විඤ්ඤාණඤ්චායතන කුසලයට ප්‍රත්‍යය වන වර්තමාන භවයේ ද අතීත භවයේ ද ස්වසන්තානයෙහි ඇති වූ ආකාසානඤ්චායතන කුසලය වූ ධර්මාරම්මණය ය, ආකිඤ්චඤ්ඤායතන කුසලයට ප්‍රත්‍යය වන ආකාසානඤ්චායතන කුසලයා ගේ නාස්තිභාව ප්‍රඥප්තිය වූ ධර්මාරම්මණය ය, නේවසඤ්ඤා නාසඤ්ඤායතන කුසලයට ප්‍රත්‍යය වන වර්තමාන අතීත භවයන්හි ස්වසන්තානයෙහි උපන් ආකිඤ්චඤ්ඤායතන කුසලය වූ ධර්මාරම්මණය ය, ලෝකෝත්තර මාර්ග සිත් සතරට ප්‍රත්‍යය වන නිර්වාණ සඞ්ඛ්‍යාත ධර්මාරම්මණය ය යන මොවුන් ගේ ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය 'ආරම්මණ පච්චයා' යන හේතු පාඨයෙන් ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි. (හේතුප්‍රත්‍යයෙහි මෙන් විස්තර කරනු.)

Non-commercial distribution

කුසලපද වාරයට අනතුරු ව අකුසලපද වාරය වදාළ සේක. විභාග කරත්‍. "අකුසලං ධම්මං -පෙ- ඛන්ධා" අකුසලො ධම්මො යන කර්තෘපාඨයෙන් අකුසල් සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අකුසල් සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන නාමස්කන්ධයෝ ලැබෙත්, ආරම්මණපච්චයා යන හේතුපාඨයෙන් ලෞකික සිත් එක් අසූව ය, චෛතසික දෙපනස ය, රූප අටවිස්ස ය, ප්‍රඥප්තිය ය යන ෂඩාරම්මණ ධර්මයන් ගේ ආරම්මණ ශක්තිය ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි.

අකුසල පදවාරයට අනතුරු ව අව්‍යාකෘත පද වාරය වදාළ සේක. විභාග කරත්‍. "අබ්‍යාකතං ධම්මං පටිච්ච -පෙ- ඛන්ධා"

අභිධෙයාර්ථ

ප්‍රවෘත්ති කාලයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කර්තෘපාඨයෙන් විපාකසිත් සතිස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික අට තිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ විපාක සිත් සතිස ය ක්‍රියාසිත් විස්ස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්. ආරම්මණපච්චයා යන හේතුපාඨයෙන් විපාකසිත් සතිසට හා ක්‍රියා සිත් විස්සට ප්‍රත්‍යය වන එකුන් අනූ චිත්තයය චෛතසික දෙපනස ය අටවිසි රූපය ය නිර්වාණ ය ප්‍රඥප්තිය ය යන ෂඩාරම්මණයන් ගේ ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය ලැබේ.

විස්තර වශයෙන් මෙසේ ය, චක්ෂුර් විඥානද්වයට ප්‍රත්‍යය වන වර්තමාන රූපාරම්මණය ය, ශ්‍රෝත විඥාන -පෙ- වර්තමාන ශබ්දාරම්මණය ය, -පෙ- මනෝධාතුත්‍රිකයට ප්‍රත්‍යය වන වර්තමාන පඤ්චාරම්මණය ය, තදාරම්මණ එකොළොසට හා හසිතෝත්පාද චිත්තයට ප්‍රත්‍යය වන කාමසිත් සිවුපනස ය, චෛතසික දෙපනසය අටවිසි රූපය ය යන ෂඩාරම්මණය ය, මහාක්‍රියා ඥානවිප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන ලෞකික සිත් එක්අසූව ය, චෛතසික දෙපනස ය රූප අටවිස්ස ය ප්‍රඥප්තිය ය යන ෂඩාරම්මණය ය, මහාක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට හා මනෝද්වාරාවර්ජනයට ප්‍රත්‍යය වන එකුන් අනූ චිත්තය ය චෛතසික දෙපනස ය අටවිසි රූපය ය නිර්වාණය ය ප්‍රඥප්තිය ය යන ෂඩාරම්මණය ය, (දිබ්බචක්ඛු දිබ්බසෝත ක්‍රියා අභිඥාවල අරමුණු ඉහත කී පරිදි ම ය, ඉද්ධිවිධ ක්‍රියා අභිඥාවට පාදක වූ රූපාවචර ක්‍රියා පඤ්චමධ්‍යානයද චෙතෝපරිය ක්‍රියා අභිඥාවට එකුන් අනූ චිත්තය ම ද අරමුණු වශයෙන් කිය යුතු ය. පුබ්බෙනිවාසානුස්සති අනාගතංස ක්‍රියා අභිඥාවලට ද එ සේ ම එකුන් අනූ චිත්තය ගත යුතු ය. යථාකම්මූපග ක්‍රියා අභිඥාවට

Non-commercial distribution

කුශලා කුශල සියල්ල ම කිය යුතු ය. රූපාවචර විපාක ක්‍රියා චිත්තයන්ගේ අරමුණු ද කුශලයෙහි මෙනි. සම්පූර්ණ කර කියනු.) ආකාසානඤ්චායතන විපාක ක්‍රියාවන්ට ප්‍රත්‍යය වන කසිණ උගුළා ලබන ආකාශ ප්‍රඥප්තිය වූ ධර්මාරම්මණය ය, විඤ්ඤාණඤ්චායතන විපාකයට ප්‍රත්‍යය වන අතීතභවයෙහි උපන් ආකාසානඤ්චායතන කුශලය වූ ධර්මාරම්මණය ය, විඤ්ඤාණඤ්චායතන ක්‍රියාවට අරමුණු වන වර්තමාන අතීත භවයන්හි ආධ්‍යාත්මික සන්තානයෙහි ඇති වූ ආකාසානඤ්චායතන කුශලක්‍රියා දෙක වූ ධර්මාරම්මණය ය, ආකිඤ්චඤ්ඤායතනවිපාක ක්‍රියා දෙකට ප්‍රත්‍යය වන ආකාසානඤ්චායතන කුශල ක්‍රියා දෙක්හි අභාවය වූ නාස්තිභාව ප්‍රඥප්තිය වූ ධර්මාරම්මණය ය, නේවසඤ්ඤා නාසඤ්ඤායතන විපාක සිතට ප්‍රත්‍යය වන අතීත භවයෙහි උපන් ආකිඤ්චඤ්ඤායතන කුසලය වූ ධර්මාරම්මණය ය, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන ක්‍රියා සිතට ප්‍රත්‍යය වන වර්තමාන අතීත භවයන්හි ඒ සන්තානයෙහි උපන් ආකිඤ්චඤ්ඤායතන කුසල ක්‍රියා දෙසිත වූ ධර්මාරම්මණය ය, ඵලසිත් සතරට ප්‍රත්‍යය වන නිර්වාණය වූ ධර්මාරම්මණ ය, යන මොවුන් ගේ ආරම්මණ ප්‍රත්‍යය ශක්තිය "ආරම්මණ පච්චයා" යන හේතුපදයෙන් ලැබේ.

ප්‍රතිසන්ධිකාලයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කර්තෘපාඨයෙන් ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය, චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයන් හා හෘදය වස්තුව ද නිසා උපදනා වූ ප්‍රතිසන්ධිසිත් එකුන්විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද, සමූහ වූ ද, නාමස්කන්ධයෝ ලැබෙත්. (නාමස්කන්ධයන් නිසා ඉපදීම කියන කල්හි අවයව නාමස්කන්ධ ලැබේ. හෘදයවස්තුව නිසා ඉපදීම කියන කල්හි නාමස්කන්ධ සතර ම ලැබේ. අවයව වූ ද සමූහ වූද නාමස්කන්ධයෝ යයි කියන ලදුයේ එහෙයිනි.) ආරම්මණපච්චයා යන හේතුපාඨයෙන් කර්මය කර්මනිමිත්තය ගති නිමිත්තය යන ආරම්මණයාගේ ආරම්මණශක්තිය ලැබේ. නොහොත් කාමප්‍රතිසන්ධි දශයට ප්‍රත්‍යය වන ෂට්ද්වාරික මරණාසන්න ජවනයෙන් ගන්නාලද වර්තමාන වූ ද අතීත වූ ද කාමසිත් සිවුපනස ය, චෛතසික දෙ පනසය, රූප අටවිස්ස ය, යන ධර්මයෝය, රූපාවචර ප්‍රතිසන්ධි පසට ප්‍රත්‍යය වන කසිණාදි පඤ්ඤත්තීහු ය, ආකාසානඤ්චායතන ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වන ආකාශ ප්‍රඥප්තිය ය, විඤ්ඤාණඤ්චායතන ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වන අතීත භවයෙහි ආධ්‍යාත්මික සන්තානයෙහි උපන් ආකාසානඤ්චායතන කුසලය ය, ආකිඤ්චඤ්ඤායතන ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වන ආකාසානඤ්චායතන කුශලයා ගේ අභාවය වූ නාස්තිභාව ප්‍රඥප්තිය ය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අතීතභවයෙහි උපන් ආකාසානඤ්චායතන කුශලය ය ආකිඤ්චඤ්ඤායතන

Non-commercial distribution

ප්‍රතිසන්ධියට ප්‍රත්‍යය වන ආකාසානඤ්චායතන කුසලයා ගේ අභාවය වූ නාස්තිභාව ප්‍රඥප්තිය ය, නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අතීතභවයෙහි ආධ්‍යාත්මික සන්තානයෙහි හටගත් ආකිඤ්චඤ්ඤායතන කුසල ය යන මේ කර්ම කර්මනිමිත්ත ගතිනිමිත්තය යි කියනු ලබන ෂඩාරම්මණ ධර්මයන් ගේ ආරම්මණ ශක්තිය ලැබේ. ස්කන්ධවාර එකුන් තිසකි. අවයව නාමස්කන්ධයන්හි වාර තුදුසෙකි. හෘදයවස්තුවෙහි වාර පසළොසෙකි.

**ආරම්මණප්‍රත්‍යය විභඞ්ගවාරය නිමි.**

---

## (3) අධිපතිප්‍රත්‍යය විභඞ්ගවාරය.

ආරම්මණප්‍රත්‍යය විභඞ්ග වාරයට අනතුරු ව අධිපතිප්‍රත්‍යය විභඞ්ගවාරය වදාළ සේක. විභාග කරනු. **කුසලං ධම්මං පටිච්ච -පෙ- ද්වේ ඛන්ධා.**

**අභිප්‍රායාර්ථ**

"කුසලො ධම්මො" යන කර්තෘ පාඨයෙන් අධිපතිප්‍රත්‍යය ලබන අවස්ථාවෙහි වූ මහාකුසල් අටය අධිපතිප්‍රත්‍යය නියමයෙන් ම ලැබෙන මහද්ගත කුශල නවය ය, මාර්ග සිත් සතරය ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධ වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. "අධිපති පච්චයා" යන හේතුපාඨයෙන් ගරු කොට අරමුණු කරන මහාකුශල ඥානවිප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ ලෞකික කුසල් සිත් සතොළොස ය, ගරු කොට අරමුණු කරන්නා වූ මහා කුශලඥානසම්ප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ අර්හත්මාර්ග වර්ජිත කුසල් සිත් විස්ස ය හෙට්ඨිම ඵල සිත් තුනය නිර්වාණය ය යන ධම්මාරම්මණය වූ ප්‍රත්‍යය ධර්මයා ගේ ආරම්මණාධිපති ප්‍රත්‍යය ශක්තිය ද, සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහා කුශල සිත් අට ය, නියමයෙන් අධිපති ප්‍රත්‍යය ලැබෙන මහද්ගත කුශල නවය ය, මාර්ග සිත් සතර ය, චෛතසික අටතිස ය යන මොවුන් ගේ එක් එක් චිත්තක්ෂණයක ලැබෙන අධිපති ධර්ම තුන් සතර අතුරෙන් එක් එක් වූ ප්‍රත්‍යය ධර්මයන් ගේ සහජාතාධිපති ශක්තිය ද ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි.

**විශේෂ කරුණක්**

ග්‍රන්ථය කෙටි වීම සඳහා මින් ඉදිරියෙහි ඒ ඒ වාරවලට කුසලෙන කුසල, කුසලෙන අකුසල, කුසලෙන අබ්‍යාකත, කුසලෙන කුසලාබ්‍යාකත,

Non-commercial distribution

අකුසලෙන අකුසල, අබ්‍යාකතෙන අබ්‍යාකත යනාදි නාම භාවිතා කරනු ලැබේ. ඒවා පූර්වාචාර්‍ය්‍යවරයන් භාවිතා කළ නාමයෝ ය.

කුසලෙන අබ්‍යාකත වාරයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කර්තෘ පාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුසල සිත් අට ය නියතයෙන් අධිපතිය ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුශල නවය යන අවයව වූ ද සමූහ වූද නාමස්කන්ධයන් නිසා උපදනා සාධිපති චිත්තජරූපයෝ ලැබෙත්. "අධිපති පච්චයා" යන හේතු පාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුශල සිත් අට ය නියතයෙන් අධිපති ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුශල තෙළෙස ය, චෛතසික අටතිස ය යන මේ ධර්මයන්ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති අධිපති ධර්ම තුන හා සතර අතුරෙන් එක් එක් අධිපති ධර්මයක සහජාතාධිපති ශක්තිය ලැබේ. ස්කන්ධවාර දෙසිය විසිපසෙකි.

කුසලෙන කුසලාබ්‍යාකත වාරයෙහි "කුසලො ච අබ්‍යාකතෝ ච ධම්මා" යන කර්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාකුසල් සිත් අට ය, නියතයෙන් අධිපති ප්‍රත්‍යය ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුශල තෙළෙසය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ අධිපතිවන ධර්මයෙන් අන්‍යවූ මහාකුසල්සිත් අටය මහද්ගත ලෝකෝත්තර කුසල් තෙළෙස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් හා ඔවුන් නිසා උපදනා චිත්තජරූපයෝ ද ලැබෙත්. හේතුපාඨයෙන් ආරම්මණාධිපති සහජාතාධිපති ශක්තීහු ගත යුතු. ස්කන්ධවාර දෙසිය දසයෙකි.

අකුසලෙන අකුසල වාරයෙහි "අකුසලො ධම්මො" යන කර්තෘපාඨයෙන් අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල සිත් අට ය, දෝසමූල සිත් දෙක ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ අධිපති වන ධර්මය හැර ලෝභමූල සිත් අටය, දෝසමූල සිත් දෙක ය, විචිකිත්සා වර්ජිත චෛතසික සවිස්ස ය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. හේතුපාඨයෙන් ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ ඉෂට නිෂ්පන්නරූප අටොළොස ය ද්වේෂමූල සිත් දෙක ය, මෝහමූල සිත් දෙක ය, දුඃඛසහගත කායවිඥාන ය යන මේ සිත් හැර ලෞකික සිත් සසැත්තෑව ය, ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය විචිකිත්සා වර්ජිත චෛතසික පන්සාළිස ය යන ෂඩාරම්මණ ධර්මයන් ගේ ආරම්මණාධිපති ශක්තිය ද, සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අධිපති ප්‍රත්‍යය ලබන අවස්ථාවෙහි වූ ලෝභමූල සිත් අට ය, ද්වේෂමූල සිත් දෙක ය, විචිකිත්සා වර්ජිත චෛතසික

Non-commercial distribution

සවිස්ස ය යන මේ ධර්මයන් ගේ එක් එක් චිත්තයක ලැබෙන අධිපති තුනෙන් එකක් වූ ප්‍රත්‍යය ධර්මයන් ගේ සහජාතාධිපති ශක්තිය ද ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි.

අකුසලෙන අබ්‍යාකත වාරයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කර්තෘ පාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල සිත් අට ය ද්වේෂ මූල සිත් දෙකය විචිකිත්සා වර්ජිත චෛතසික සවිස්ස ය යන අවයව වූ ද සමූහ වූද නාමස්කන්ධයන් නිසා උපදනා වූ සාධිපති චිත්තජරූප සඞ්ඛ්‍යාත ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්. හේතුපාඨයෙන් සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ ලෝභමූල සිත් අටය - පෙ- සහජාතාධිපති ශක්තිය ලැබේ. ස්කන්ධවාර දෙසිය විසි පසෙකි.

අකුසලෙන අකුසල අබ්‍යාකතයෙහි "අකුසලො ච අබ්‍යාකතො ච ධම්මා" යන කර්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ ලෝභමූල සිත් අට ය ද්වේෂමූල සිත් දෙක ය විචිකිත්සා වර්ජිත චෛතසික සවිස්ස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අධිපතිධර්ම වර්ජිත ලෝභමූල සිත් අට ය දෝසමූල සිත් දෙක ය විචිකිත්සා වර්ජිත චෛතසික සවිස්ස ය යන අවයව නාමස්කන්ධයන් හා ඒ නාමස්කන්ධයන් නිසා උපදනා සාධිපති චිත්තජ රූපයෝ ද ලැබෙත්. හේතුපාඨයේ අභිධෙය ඉහත කී පරිදි දත යුතු ය. ස්කන්ධවාර දෙසිය දසයෙකි.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කර්තෘපාඨයෙන් අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහා ක්‍රියා සිත් අට ය නියමයෙන් අධිපති ප්‍රත්‍යය ලැබෙන මහද්ගත ක්‍රියා සිත් නවය ය ඵලසිත් සතර ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ අධිපති ධර්ම වර්ජිත වූ මහාක්‍රියා සිත් අට ය මහද්ගත ක්‍රියා නවය ය ඵලසිත් සතර ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් හා ඒ නාමස්කන්ධයන් නිසා උපදනා සාධිපති චිත්තජරූපයෝ ද ලැබෙත්. හේතුපාඨයෙන් ගරු කොට අරමුණු කරන මහාක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන අර්හත්මාර්ග අර්හත්ඵල නිර්වාණයෝ ය ඵලසිත් සතරට ප්‍රත්‍යය වන නිර්වාණය ය යන ප්‍රත්‍යය ධර්මයන් ගේ ආරම්මණාධිපති ශක්තිය ද, සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යයවන අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාක්‍රියා සිත් අට ය නියම යෙන් අධිපති ප්‍රත්‍යය ලැබෙන මහද්ගත ක්‍රියා සිත් නවයය ඵලසිත් සතර ය චෛතසික

Non-commercial distribution

අටතිස ය යන මොවුන් ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති අධිපති ධර්ම තුන සතර අතුරෙන් එක එකක් වූ අධිපති ධර්මයන් ගේ සහජාතාධිපති ශක්තිය ද ලැබේ. ස්කන්ධවාර දෙසිය දසයෙකි.

ශුද්ධරූපවාරයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කර්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලබන අවස්ථාවෙහි වූ සාධිපති කුශලාකුශල විපාකක්‍රියා නාමස්කන්ධයන් විසින් ප්‍රදද්‍ය පරිදි උපදවන සාධිපති චිත්තජ මහා භූතයන් නිසා උපදනා වූ භූත රූප සහිත වූ සාධිපති චිත්තජ උපාදාය රූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ සාධිපති කුශලාකුශල විපාකක්‍රියා නාමස්කන්ධයන්හි ඇති අධිපති ධර්ම තුන සතර අතුරෙන් එක් එක් ධර්මයක් වූ ප්‍රත්‍යය ධර්මයන් ගේ අධිපති ශක්තිය ලැබේ. ස්කන්ධවාර පසළොසෙකි.

කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි "අබ්‍යාකතො" යන කර්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහා කුසල්සිත් අට ය. අධිපති ඒකාන්තයෙන් ලැබෙන මහද්ගතලෝකෝත්තර කුසල් තෙළෙස ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් හා මහාභූතයන් ද නිසා උපදනා වූ සාධිපති චිත්තජරූප සඞ්ඛ්‍යාත ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. හේතු පාඨයේ අභිධෙය කුසලෙන අබ්‍යාකතයෙහි මෙනි. ස්කන්ධවාර දෙසිය පස්විස්සෙකි.

අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි "අබ්‍යාකතො" යන කර්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල සිත් අට ය ද්වේෂමූල දෙසිත ය විචිකිත්සා වර්ජිත චෛතසික සවිස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් හා මහාභූතයන් නිසා උපදනා වූ සාධිපති චිත්තජරූප සඞ්ඛ්‍යාත ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්. හේතුපාඨයේ අභිධෙය අකුසලෙන අබ්‍යාකතයෙහි මෙනි. (මේ වාර සයෙහි සහජාතාධිපතිය පමණක් ගැනේය යි ආචාර්‍ය්‍යවරයෝ කියති. විමසිය යුතු.)

අධිපති ප්‍රත්‍යය විභඞ්ගය නිමි.

## (4) අනන්තර ප්‍රත්‍යය විභඞ්ගය.

අනන්තර ප්‍රත්‍යය විභඞ්ගයෙහි කුසලෙන කුසලයෙහි "කුසලො ධම්මො" යන කර්තෘ පාඨයේ අභිධෙය ආරම්මණ ප්‍රත්‍යයෙහි මෙනි. හේතු පාඨයෙන්

Non-commercial distribution

පශ්චිම පශ්චිම කුසල් සිත් එක්විස්සට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපනය හා මනෝද්වාරා වර්ජනය ය, අන්තිම ජවන වර්ජිත පූර්ව පූර්ව ලෞකික කුශල ජවනයෝ ය යන මොවුන් ගේ අනන්තර ප්‍රත්‍යය ශක්තිය ලැබේ. නොහොත් මහාකුශල ප්‍රථමජවනයට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපනය හා මනෝද්වාරා-වර්ජනය ද්විතීය ජවනයට ප්‍රත්‍යය වන ප්‍රථම ජවනය -පෙ- සප්තම ජවනයට ප්‍රත්‍යය වන ෂෂ්ඨ ජවනය ය මහද්ගත කුශල සෝමනස්ස සහගත සිත් සතරට හා මාර්ග සෝමනස්ස සහගත සිත් සොළොසට ප්‍රත්‍යය වන ගෝත්‍රභූ වෝදාන කෘත්‍යවත් මහා කුශල ප්‍රථමද්වය ය, මහද්ගත කුශල උපේක්ෂා සහගත සිත් පසට හා මාර්ග උපේක්ෂාසහගත සිත් සතරට ප්‍රත්‍යය වන ගෝත්‍රභූ වෝදාන කෘත්‍යවත් මහාකුශල තෘතීය ද්වය ය, සමාපජ්ජන වීථීන්හි පශ්චිම පශ්චිම මහද්ගත කුශලයන්ට ප්‍රත්‍යය වන පූර්ව පූර්ව මහද්ගත චිත්තයෝ ය යන මොවුන් ගේ අනන්තර ශක්තිය ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි.

අකුසලෙන අකුසලයෙහි "අකුසලො ධම්මො" යන කතීපායයෙන් (ආරම්මණයෙහි මෙන් අභිධෙය ගන්නේය.) හේතුපායයෙන් දෙළොස් අකුසලයන් ගේ ප්‍රථම ජවනයට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනෝද්වාරා වර්ජනයෝ ය, ද්විතීය ජවනයට ප්‍රත්‍යය වන ප්‍රථම ජවනය ය, -පෙ- සප්තම ජවනයට ප්‍රත්‍යය වන ෂෂ්ඨ ජවනය ය යන මොවුන් ගේ අනන්තර ශක්තිය ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි අභිධෙය ආරම්මණ-යෙහි මෙන් අවුලනු. හේතුපායයෙන් පශ්චිම පශ්චිම වූ විපාක ක්‍රියා නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අකුසල් සිත් දෙළොසය කුසල් සිත් එක්විස්ස ය යන මොවුන් ගේ අන්තිම ජවනයෝ ය අභිඥා ව්‍යුති වර්ජිත පූර්ව පූර්ව විපාක ක්‍රියා නාමස්කන්ධයෝ ය යන මොවුන් ගේ අනන්තර ශක්තිය ලැබේ.

විස්තර වශයෙන් මෙසේ යː "අබ්‍යාකතො ධම්මො" යන හේතුපායයෙන් ප්‍රථමභවාඞ්ග නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ද්විතීයාදි පශ්චිම පශ්චිම භවාඞ්ග නාමසකන්ධයන්ට ප්‍රත්‍යය වන ප්‍රථමාදි පූර්ව පූර්ව භවාඞ්ග නාමස්කන්ධයෝ ය, ආවර්ජනාද්වයට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භවාඞ්ගුපච්ඡේද පසළොස ය, මනෝද්වාරාවජ්ජනයට ප්‍රත්‍යය වන අරූප භවාඞ්ගුපච්ඡේද සතර ය, හසිතෝත්පාද මහා ක්‍රියා ප්‍රථම ජවනයට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනයෝ ය, ද්විතීය ජවනයට ප්‍රත්‍යයවන ප්‍රථම ජවනය ය, -පෙ- සප්තම ජවනයට ප්‍රත්‍යවන ෂෂ්ඨජවනය ය, ලෝභමූල මෝහමූල මහාකුසල ජවනයන් කෙරෙන් තදාරම්මණය වන කල්හි තදාරම්මණ එකොළොසට ද නො වන කල්හි භවාඞ්ග එකුන් විස්සට ද ප්‍රත්‍යය වන ලෝභමූල මෝහමූල

Non-commercial distribution

මහාකුශල අන්තිම ජවනයෝ ය, දෝසමූල ජවනයට අනතුරුව තදරම්මණය වන කල්හි උපේක්ෂා තදරම්මණ සයට ද, නො වන කල්හි කාමෝපේක්ෂා භවාඞ්ග සයට ද ප්‍රත්‍යය වන ද්වේෂමූල අන්තිම ජවනය ය, හසිතෝත්පාද ජවනය කෙරෙන් තදරම්මණය වන කල්හි සෝමනස්ස තදරම්මණ පසට ද නො වන කල්හි පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ග නවයට ද ප්‍රත්‍යය වන හසිතෝත්පාද අන්තිම ජවනය ය, සෝමනස්ස සහගත මහාක්‍රියා ජවනයන් කෙරෙන් තදරම්මණය වන කල්හි සෝමනස්ස තදරම්මණ පසට ද නො වන කල්හි ත්‍රිහේතුක භවාඞ්ග තෙළෙසට ද ප්‍රත්‍යය වන සෝමනස්ස මහාක්‍රියා අන්තිම ජවනය ය, මහාක්‍රියා උපේක්ෂා සහගත ජවන සතර කෙරෙන් තදරම්මණය වන කල්හි උපේක්ෂා තදරම්මණ සයට ද නො වන කල්හි ත්‍රිහේතුක භවාඞ්ග තෙළෙසට ද ප්‍රත්‍යය වන මහාක්‍රියා උපේක්ෂා සහගත අන්තිම ජවනය ය, ද්විතීය තදරම්මණයට ප්‍රත්‍යය වන ප්‍රථම තදරම්මණය ය, කාම භවාඞ්ග දශයට ප්‍රත්‍යය වන ද්විතීය තදරම්මණය ය, හෙට්ඨිමඵල සෝමනස්ස සහගත සිත් දෙළොසට ප්‍රත්‍යය වන අනුලෝම කෘත්‍යවත් මහා කුශල ප්‍රථමද්වය ය, හෙට්ඨිම ඵල උපේක්ෂා සහගත සිත් තුනට ප්‍රත්‍යය වන අනුලෝම කෘත්‍යවත් මහාකුශල තෘතීයද්වය ය, මහද්ගත ක්‍රියා සෝමනස්ස සහගත සිත් සතරට හා අභිත්ඵල සෝමනස්ස සහගත සිත් සතරට ද ප්‍රත්‍යය වන ගෝත්‍රභූ අනුලෝම කෘත්‍යවත් මහාක්‍රියා ප්‍රථමද්වය ය, මහද්ගත උපේක්ෂා සහගත ක්‍රියා සිත් පසට හා අභිත්ඵල උපේක්ෂා සහගත සිතට ද ප්‍රත්‍යය වන ගෝත්‍රභූ අනුලෝම කෘත්‍යවත් මහාක්‍රියා තෘතීය ද්වය ය, සමාපජ්ජන වීථීන්හි පශ්චිම පශ්චිම මහද්ගත ක්‍රියා ජවනයන්ට ප්‍රත්‍යය වන පූර්ව පූර්ව මහද්ගත ක්‍රියාජවනයෝ ය, පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ග නවයට ප්‍රත්‍යය වන රූපාවචර කුශලක්‍රියා අන්තිම ජවනය ය, පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ග නවයට හා ආකාසානඤ්චායතන භවාඞ්ගයට ද ප්‍රත්‍යය වන ආකාසානඤ්චායතන කුශලක්‍රියා අන්තිම ජවනය ය, ත්‍රිහේතුක භවාඞ්ග තෙළෙසට හා නිරෝධ සමාපත්තියෙන් නැගිටින අවස්ථාවෙහි ඇතිවන අනාගාමී අභිත් ඵල චිත්තයන්ට ද ප්‍රත්‍යයවන නේවසඤ්ඤා නාසඤ්ඤායතන කුශලක්‍රියා අන්තිම ජවනය ය, ශ්‍රෝතාපත්ති ඵලයට ප්‍රත්‍යය වන ශ්‍රෝතාපත්ති මාර්ගය -පෙ- අභිත් ඵලයට ප්‍රත්‍යය වන අභිත්මාර්ගය ය ත්‍රිහේතුක භවාඞ්ග තෙළෙසට ප්‍රත්‍යය වන ඵලසිත් සතරය යන මොවුන් ගේ අන්තිම ජවනයෝ ය, මරණාසන්න කාලයෙහි තදරම්මණයට අනතුරු ව ච්‍යුතිය වේ නම් කාමච්‍යුති දශයට ප්‍රත්‍යය වන ද්විතීය තදරම්මණය ය, ජවනයට අනතුරුව ච්‍යුතිය වේ නම් ච්‍යුති සිත් එකුන්විස්සට ප්‍රත්‍යය වන පඤ්චම ජවනය ය, භවාඞ්ගයට අනතුරු ව ච්‍යුති එකුන් විස්සට ප්‍රත්‍යය වන භවාඞ්ග එකුන්විස්සය යන මේ ප්‍රත්‍යය ධර්මයන්

Non-commercial distribution

ගේ අනන්තර ශක්තිය ලැබේ. (මෙය ප්‍රවෘත්ති කාලය වන බැවින් ව්‍යුතියෙන් කෙළවර වේ.) ස්කන්ධවාර තුදුසෙකි.

ප්‍රතිසන්ධි කාලයෙහි කතීපදයේ අභිධෙය ආරම්මණයෙහි මෙනි. "අනන්තර පච්චයා" යන හේතුපාඨයෙන් ප්‍රතිසන්ධි එකුන් විස්සට ප්‍රත්‍යය වන එකුන්විසි ව්‍යුතිචිත්තයන් ගේ අනන්තර ශක්තිය ලැබේ. නොහොත් කාමප්‍රතිසන්ධි දශයට ප්‍රත්‍යය වන ද්විහේතුකාහේතුක ව්‍යුතිහු ය. ප්‍රතිසන්ධි එකුන්විස්සට ප්‍රත්‍යය වන කාමත්‍රිහේතුක ව්‍යුතිය ය, සහේතුක ප්‍රතිසන්ධි සනොළොසට ප්‍රත්‍යය වන රූපාවචර ව්‍යුති පස ය කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතරට හා අරූපප්‍රතිසන්ධි සතරට ප්‍රත්‍යය වන ආකාසානඤ්චායතන ව්‍යුතිය ය, කාම ත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතරට හා විඤ්ඤාණඤ්චායතන ආකිඤ්චඤ්ඤායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධීන්ට ද ප්‍රත්‍යය වන විඤ්ඤාණඤ්චායතන ව්‍යුතිය ය, කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතරට හා ආකිඤ්චඤ්ඤායතන නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධීන්ට ප්‍රත්‍යය වන ආකිඤ්චඤ්ඤායතන ව්‍යුතිය ය, කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතරට හා නෙවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධියටද ප්‍රත්‍යයවන නේවසඤ්ඤානාසඤ්ඤායතන ව්‍යුතිය ය යන මොවුන් ගේ අනන්තර ශක්තිය ලැබේ. ස්කන්ධවාර එකුන්විස්සෙකි. අනන්තර ප්‍රත්‍යය විභඞ්ගය නිමි. සමනන්තර විභඞ්ගය ද එසේම ය,

## (6) සහජාත ප්‍රත්‍යය විභඞ්ගය.

සහජාත විභඞ්ගයෙහි කුසලෙන කුසලයෙහි කතීපාඨයේ අභිධෙය අවුලනු. හේතුපාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයන් ගේ සහජාත ශක්තිය ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි.

කුසලෙන අබ්‍යාකතයෙහි "අබ්‍යාකතො" යන කතීපාඨයේ අභිධෙය ආරම්මණයෙහි මෙනි. හේතුපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් ගේ හා උපාදයරූපයන්ට ප්‍රත්‍යය වන මහාභූතයන් ගේ ද සහජාත ශක්තිය ලැබේ. ස්කන්ධවාර දෙසිය විසිපසෙකි.

කුසලෙන කුසලාබ්‍යාකතයෙහි කතීපාඨයේ අභිධෙය හේතු-වෙහි මෙනි. හේතුපාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් ගේ ද ඔවුනොවුන්ට හා

Non-commercial distribution

උපාදයරූපයන්ට ප්‍රත්‍යය වන සතර මහාභූතයන් ගේ ද සහජාත ශක්තිය ලැබේ. ඍකන්‍ධවාර දෙසිය දසයෙකි.

අකුසලෙන අකුසලයෙහි කර්‍ත්‍රෘපාඨයේ අභිධෙය ආරම්මණයෙහි මෙනි. හේතුපාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන අකුසල් සිත් දොළොස ය. චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්‍ධයන් ගේ සහජාත ශක්තිය ලැබේ. ස්කන්‍ධවාර තුදුසෙකි. අකුසලෙන අව්‍යාකෘත වාරයෙහි අභිධෙය අවුලනු.

අකුසලෙන අකුසලාව්‍යාකෘතයෙහි කර්‍ත්‍රෘපාඨයෙන් අකුසල් සිත් දොළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්‍ධයන් නිසා උපදනා වූ අකුසල් සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්‍ධයෝ ය, ඔවුන් නිසා උපදනා චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. හේතුපාඨයේ අභිධෙය අවුලනු. ස්කන්‍ධවාර දෙසිය දසයෙකි.

අව්‍යාකෘතෙන අව්‍යාකෘත වාරයෙහි අව්‍යාකෘතය ප්‍රවෘත්ති ප්‍රතිසන්‍ධි ශුඬරූප වශයෙන් තෙවැදෑරුම් වේ. ප්‍රවෘත්තිකාලයෙහි "අව්‍යාකතො ධම්මො" යන කර්‍ත්‍රෘපාඨයෙන් විපාක සිත් සතිස ය, ක්‍රියා සිත් විස්ස ය. චෛතසික අටතිස ය අවයව නාමස්කන්‍ධයන් නිසා උපදනා විපාක සිත් සතිස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්‍ධයෝ ය ඔවුන් නිසා උපදනා චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. හේතුපාඨයෙන් ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන විපාක සිත් සතිස ය, ක්‍රියාසිත් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්‍ධයන්ගේ ද ඔවුනොවුන්ට හා උපාදයරූපයන්ට ද ප්‍රත්‍යය වන මහාභූතයෝ ය යන මොවුන්ගේ සහජාත ශක්තිය ලැබේ. ස්කන්‍ධවාර දෙසිය දසයෙකි.

ප්‍රතිසන්‍ධිකාලයෙහි කර්‍ත්‍රෘපාඨයෙන් ප්‍රතිසන්‍ධි සිත් එකුන් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්‍ධයන් හා හෘදය වස්තුව ද නිසා උපදනා වූ ප්‍රතිසන්‍ධි සිත් එකුන්විස්ස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්‍ධයන් හා කෘතත්වාත්රූපයෝ ද යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. හේතුපාඨයෙන් ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා කෘතත්වාත් රූපයන්ට ද ප්‍රත්‍යය වන ප්‍රතිසන්‍ධි සිත් එකුන්විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්‍ධයන් ගේ ද ඔවුනොවුන්ට හා උපාදයරූපයන්ට ප්‍රත්‍යය වන මහාභූත සතරෙහි ද ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන

Non-commercial distribution

පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් ගේ හා හෘදය වස්තුව ගේ ද සහජාත ශක්තිය ලැබේ, ස්කන්ධවාර දෙසිය සතළිසකි.

ශුද්ධරූපවාරයෙහි අබ්‍යාකතො ධම්මො යන කතීපායයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥානච්‍යුති වර්ජිත කුශලාකුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන චිත්තජ මහාභූතයෝය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා උපදනා කර්මජ මහාභූතයෝ ය, බාහිර මහාභූතයෝ ය, ඍතුජ මහාභූතයෝ ය, ආහාරජ මහා භූතයෝ ය අසංඥ සත්ත්ව කර්මජ මහාභූතයෝ ය, ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා වූ භූතරූප සහිත වූ චිත්තජ ප්‍රතිසන්ධි කර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥ සත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ උපාදයරූපයෝ ලැබෙත්. හේතු පායයෙන් චිත්තජරූපයන්ට හා ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥානච්‍යුති වර්ජිත කුශලාකුශල විපාකක්‍රියා නාමස්කන්ධයෝ ය ඔවුනොවුන්ට හා උපාදය රූපයන්ට ප්‍රත්‍යය වන මහාභූතයෝ ය යන ප්‍රත්‍යය ධර්මයන් ගේ සහජාත ශක්තිය ලැබේ. ස්කන්ධවාර එකසියපසෙකි. චිත්තජ මහාභූතයන්හි වාර පසළොසකි. ඉතිරි මහාභූත කොටස් සයෙහි ද ඒකක වාර පසළොස බැගින් ම වීමෙන් එකසියපස වේ. කුසලාබ්‍යාකත පද වාරයෙහි ද හේතුප්‍රත්‍යය අනූ ව අභිධෙය අවුලනු. හේතුපායයෙන් චිත්තජරූපයන් ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය ඔවුනොවුනට හා උපාදය රූපයන්ට ප්‍රත්‍යය වන මහාභූතයෝ ය යන ප්‍රත්‍යය ධර්මයන් ගේ සහජාත ශක්තිය ලැබේ. කුසලාබ්‍යාකත පද වාරය ද එසේ ම ය.

### සහජාත විභඞ්ගය නිමි.

## (7) අන්‍යෝන්‍ය ප්‍රත්‍යය විභඞ්ගය.

අන්‍යෝන්‍ය විභඞ්ගයෙහි කුසලපද අකුසලපද වාර දෙක සහජාතයට සමාන ය. අබ්‍යාකතපද වාරයෙහි ප්‍රවෘත්තිකාලයෙහි නාමස්කන්ධයන් අභිධෙය වශයෙන් අවුලනු. ප්‍රතිසන්ධි කාලයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කතීපායයෙන් ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් හා හෘදය වස්තුව නිසා උපදනා ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් හා හෘදය වස්තුව ද යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. හේතුපායයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය

Non-commercial distribution

චෛතසික පන්තිස ය යන් අවයව නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධ හෘදය වස්තුහු ය යන ප්‍රත්‍යය ධර්මයන් ගේ අන්‍යෝන්‍ය ශක්තිය ලැබේ. ස්කන්ධවාර සිවුසාළිසෙකි.

ශුඬරූප වාරයෙහි කත්‍රීපායයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාවජ්‍යුති වර්ජිත කුශලාකුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන චිත්තජ මහාභූත යන් හා ප්‍රතිසන්ධි කර්මජ මහාභූතයෝය. බාහිර මහා භූතයෝ ය, ආහාරජ මහාභූතයෝය, ඍතුජ මහාභූතයෝ ය, අසංඥසත්ත්ව කර්මජ මහාභූතයෝ ය, ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය යන මොවුහු ලැබෙත්. හේතුපායයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන මහාභූතයන් ගේ අන්‍යෝන්‍ය ශක්තිය ලැබේ. ස්කන්ධවාර අට අනූවෙකි. ප්‍රවෘත්තිකාලයෙහි වාර තුදුසක් ද ප්‍රතිසන්ධිකාලයෙහි වාර සිවුසාළිසක් ද ශුඬරූපවාරයෙහි අටඅනූවක් ද වීමෙන් ස්කන්ධවාර එක්සිය සපනසක් වේ.

## අන්‍යෝන්‍ය ප්‍රත්‍යය විභඞ්ගය නිමි.

## (8) නිඃශ්‍රය ප්‍රත්‍යය විභඞ්ගය.

නිඃශ්‍රය ප්‍රත්‍යය විභඞ්ගයෙහි කුසලෙන කුසලය සහජාතය අනුව විස්තර කරනු. පූර්වජාත නිඃශ්‍රයයෙහි හේතුපදයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ පශ්චිම පශ්චිම කුසල් සිත් එක් විස්සට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනා හෘදයවස්තුව ය, මරණාසන්න කුසලජවන පසට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් හෘදයවස්තුව ය යන මොවුන් ගේ පූර්වජාත නිඃශ්‍රය ශක්තිය ලැබේ. කුසලෙන අව්‍යාකතය සහජාතය මෙනි. කුසලෙන කුසලාව්‍යාකතයෙහි ද සහජාත ය අනුව අභිධෙය අවුල්නු. හේතුපදාභිධෙය සහජාත නිඃශ්‍රයෙහි සහජාතයෙහි මෙන් අවුලනු. පූර්වජාත නිඃශ්‍රයයෙහි හේතු පදයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ පශ්චිම පශ්චිම කුසල් සිත් එක්විස්සට ප්‍රත්‍යය වන හෘදය වස්තුව ය මරණාසන්න කුසල ජවන පසට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපන් හෘදයවස්තුව ය යන මොවුන් ගේ පූර්වජාත නිඃශ්‍රය ශක්තිය ලැබේ. ස්කන්ධවාර දෙසිය දසයෙකි.

අකුසලෙන අකුසලයෙහි සහජාතනිඃශ්‍රය වශයෙන් අභිධෙය සහජාතයෙහි මෙනි. පූර්වජාත නිඃශ්‍රය වශයෙන් හේතුපදයේ අභිධෙය මෙසේ ය. පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ පශ්චිම පශ්චිම අකුසල චිත්තයන්ට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනෝද්වාරා-

Non-commercial distribution

වර්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපද්නා හෘදය වස්තුව හා මරණාසන්න අකුශල ජවන පසට ප්‍රත්‍යය වන ච්‍යුති චිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදනා හෘදය වස්තුව ද යන ප්‍රත්‍යය ධර්මයන් ගේ පූරේජාත නිඃශ්‍රය ශක්තිය හේතුපදයෙන් ලැබේ. අකුසලෙන අබ්‍යාකතය සහජාතය මෙනි. අකුසලෙන අකුසලාබ්‍යාකතයෙහි ද ව්‍යාඛ්‍යානුසාරයෙන් අභිධෙය අවුලනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි අභිධෙය ව්‍යාඛ්‍යානුසාරයෙන් අවුලනු. හේතුපාඨයේ අභිධෙය සහජාත නිඃශ්‍රයයෙහි සහජාතයෙහි මෙන් අවුලනු. පූරේජාත නිඃශ්‍රය වශයෙන් මෙසේ ය. චක්ෂුර්විඥාන ද්වයයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක චක්ෂුවස්තුව ය, -පෙ- කායවිඥාන ද්වයයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක කාය ප්‍රසාදය ය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන වර්ජිත පශ්චිම පශ්චිම වූ විපාකසිත් දෙවිස්ස ය ක්‍රියා සිත් විස්සය යන මොවුන්ට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධ්‍යාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හෘදය වස්තුව ය මරණාසන්නකාලයෙහි පඤ්චවෝකාර භවාඞ්ග පසළොස ය, ආවර්ජන දෙක ය, සම්පටිච්ඡන දෙක ය, සන්තීරණ තුන ය, ව්‍යවස්ථාපනය ය, මරණාසන්න ජවන පස ය තදාරම්මණය ය ච්‍යුතිය ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ච්‍යුතියෙන් සතළොස් වන චිත්තය හා උපන් හෘදයවස්තුව ය යන මොවුන් ගේ පූරේජාත නිඃශ්‍රය ශක්තිය හේතුපදයෙන් ලැබේ. ප්‍රතිසන්ධිවාරය හා ශුද්ධරූපවාරය ද සහජාතය අනුව දත යුතු ය. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතවාරය හා අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකත වාරය ද සහජාතය අනුව දත යුතු.

**නිඃශ්‍රය ප්‍රත්‍යය විභඞ්ගය නිමි.**

---

## (9) උපනිඃශ්‍රය ප්‍රත්‍යය විභඞ්ගය.

උපනිඃශ්‍රය විභඞ්ගයෙහි කුසලෙන කුසලයෙහි හේතුපදාභිධෙය ආරම්මණෝපනිඃශ්‍රය වශයෙන් ආරම්මණාධිපතියෙහි මෙන් ද අනන්තරෝපනිඃශ්‍රය වශයෙන් අනන්තර ප්‍රත්‍යයෙහි මෙන් ද ගන්නේ ය. ප්‍රකෘතෝපනිඃශ්‍රය වශයෙන් පශ්චිම පශ්චිම කුසල් සිත් එක් විස්සට ප්‍රත්‍යය වන අතීත්මාගී අතීත්ඵල වර්ජිත බලවත් වූ සිත් සත් අසූව ය චෛතසික දෙපනස ය, රූප අටවිස්සය, ප්‍රඥප්තියය යන ප්‍රත්‍යය ධර්මයන් ගේ ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය හේතුපදයෙන් ලැබේ. (පරසන්තානයෙන් ප්‍රත්‍යය ලැබීමේදී සිත් එකුන් අනූව ම ගත යුතු ය.)

Non-commercial distribution

අකුසලෙන අකුසලයෙහි හේතුපාඨාභිධෙය ආරම්මණෝපනිඃශ්‍රය වශයෙන් ආරම්මණාධිපතියෙහි මෙන් ද අනන්තරෝපනිඃශ්‍රය වශයෙන් අනන්තරයෙහි මෙන් ද ගන්නේ ය. ප්‍රකෘතෝපනිඃශ්‍රය වශයෙන් පශ්චිම පශ්චිම දොළොස් අකුසල චිත්තයන්ට ප්‍රත්‍යයවන බලවත් වූ ලෞකික සිත් එක්අසූව ය, අටවිසි රූපය ය, ප්‍රඥප්තිය ය, යන ප්‍රත්‍යය ධර්මයන් ගේ ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි.

අව්‍යාකතෙන අව්‍යාකතයෙහි ප්‍රවෘත්ති කාලයෙහි හේතුපදභිධෙය ආරම්මණෝපනිඃශ්‍රය වශයෙන් ආරම්මණාධිපතියෙහි මෙන් ද අනන්තරෝපනිඃශ්‍රය වශයෙන් අනන්තර ප්‍රත්‍යයෙහි මෙන් ද ගන්නේ ය. පශ්චිම පශ්චිම වූ විපාක සතිසට හා ක්‍රියා සිත් විස්සට ප්‍රත්‍යය වන බලවත් වූ එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය, රූප අටවිස්ස ය, ප්‍රඥප්තිය ය යන ප්‍රත්‍යය ධර්මයන් ගේ ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය ලැබේ. ප්‍රතිසන්ධි කාලයෙහි ආරම්මණයෙහි මෙන් අභිධෙය ගන්නේ ය. හේතුපාඨයෙන් අනන්තරෝප නිඃශ්‍රය වශයෙන් අභිධෙය අනන්තරයෙහි මෙන් ගන්නේ ය. ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සට ප්‍රත්‍යය වන බලවත් වූ ලෞකික සිත් එක් අසූව ය. චෛතසික දෙපනස ය, රූප අටවිස්ස ය, ප්‍රඥප්තිය ය නානාක්ෂණික කුශලා කුශල චේතනා ය යන මොවුන් ගේ ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය හේතුපාඨයෙන් ලැබේ.

උපනිඃශ්‍රය විභඞ්ගය නිමි.

---

## (10) පූරේජාත ප්‍රත්‍යය විභඞ්ගය.

පූරේජාත විභඞ්ගයෙහි කුසලෙන කුසලයෙහි කතිඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක් විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා කුසල් සිත් එක් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. හේතුපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ පශ්චිම පශ්චිම කුශලනාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හෘදය වස්තුව ය, මරණාසන්න ජවන පසට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා හෘදය වස්තුව ය යන ප්‍රත්‍යය ධර්මයන් ගේ වස්තු පූරේජාත ශක්තිය ලැබේ.

අකුසලනෙ අකුසලයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුසල් සිත් දෙළොස ය, චෛතසික සත්විස්සය යන අවයව

Non-commercial distribution

නාමස්කන්ධයන් නිසා උපදනා අකුසල් සිත් දෙළොසය, චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ කතීපාඨයෙන් ලැබෙත්. හේතුපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ පශ්චිම පශ්චිම අකුසල චිත්තයන්ට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හෘදය වස්තුව ය, මරණාසන්න අකුශල ජවන පසට ප්‍රත්‍යය වන ච්‍යුති චිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් හෘදය වස්තුව ය යන මොවුන් ගේ වස්තුපුරේජාත ශක්තිය ලැබේ.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කතීපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක වර්ජිත විපාක දෙතිස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ විපාක සිත් දෙතිස ය ක්‍රියා සිත් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. හේතුපාඨයේ අභිධෙය පුරේජාත නිස්සය අනුව දන්නේ ය.

### පුරේජාත විභඞ්ගය නිමි.

---

**විශේෂ කරුණු.**

මෙහි "වත්ථුං පුරේජාත පච්චයා" යි වස්තු පුරේජාතය පමණක් දේශිත ය, ආරම්මණ පුරේජාතය අදේශිත ය, එයට හේතුව පඤ්චවිඥාන ධාතුන්ට පඤ්චාරම්මණය පුරේජාත ප්‍රත්‍යය වන්නාක් මෙන් අතීතානාගතය ද අරමුණු කරන මනෝවිඥාන ධාතුවට නියමයෙන් ආරම්මණපුරේජාතප්‍රත්‍යය නොලැබීමය. "ආරම්මණං පන නියමතො පුරෙජාත පච්චයභාවං න ලබ්භති. රූපායතනාදීනි හි චක්ඛු-විඤ්ඤාණාදීනං යෙව පුරේජාත පච්චයතං සාධෙන්ති, මනොවිඤ්ඤාණධාතුයා පන අතීතානාගතානි පි ආරම්මණාහොන්ති යෙව තස්මා ඉධ න ගහිතං" යනු අටුවා යි.

පශ්චාජ්ජාත ප්‍රත්‍යය මේ විභඞ්ගවාරයෙහි වදරා නැත. එයට හේතුව එය ජනකප්‍රත්‍යයක් නොවීම ය, "පච්ඡාජාතො කුසලාකුසලානං පච්චයො න හොති අබ්‍යාකතස්සා පි උපත්ථම්භකො ව, න ජනකො. තස්මා උප්පජ්ජති පච්ඡාජාත පච්චයා ති එවං න වත්තබ්බා"පශ්චාජාත වශයෙන් නාම ධර්මයන් ප්‍රත්‍යය වන්නේ උපන් රූප ධර්මයනට ය. එබැවින් "කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති පච්ඡාජාත පච්චයා"යි නො වදළ හැකි ය.

Non-commercial distribution

## (12) ආසේවන ප්‍රත්‍යය විභඞ්ගය.

ආසෙවන විභඞ්ගයෙහි කුසලෙන කුසලයෙහි කතීඃපාඨයෙන් මහා කුශල ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතකුශල නවයය, මාර්ගසිත් සතර ය යන අවයව නාමසඬායන් නිසා උපදනා වූ ද්විතීයාදි මහා කුශල ජවනයෝ ය, මහද්ගත කුශල නවය ය, මාර්ගසිත් සතර ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. හේතුපාඨයෙන් ප්‍රථමජවන වර්ජිත පශ්චිම පශ්චිම එක්විසි කුශල ජවනයන්ට ප්‍රත්‍යය වන පූර්ව පූර්ව වූ ලෞකික කුසල් සතොළොස වූ ප්‍රත්‍යය ධර්මයන් ගේ ආසේවන ශක්තිය ලැබේ. නොහොත් මහා කුශල ද්විතීය ජවනයන්ට ප්‍රත්‍යය වන ප්‍රථම ජවනය ය, -පෙ- සප්තම ජවනයට ප්‍රත්‍යය වන ෂෂ්ට ජවනයය, සෝමනස්ස සහගත මහද්ගත කුශල සතරට හා මාර්ග සෝමනස්ස සහගත සිත් සොළොසට ප්‍රත්‍යය වන ගෝත්‍රභූ වෝදන කෘත්‍යයන් ඇති මහාකුශල ප්‍රථමද්වය ය. මහද්ගත කුසල උපේක්ෂා සහගත සිත් පසට හා මාර්ගෝපේක්ෂා සහගත සිත් සතරට ද ප්‍රත්‍යය වන ගෝත්‍රභූවෝදන කෘත්‍යවත් මහා කුශල තෘතියද්වය ය, සමාපජ්ජන වීථීන්හි පශ්චිම පශ්චිම මහද්ගත ජවනයන්ට ප්‍රත්‍යය වන පූර්ව පූර්ව මහද්ගත ජවනයෝ ය යන මොවුන් ගේ ආසේවන ශක්තිය ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි.

අකුසලෙන අකුසලයෙහි අකුසලො යන කතීඃපාඨයෙන් දෙළොස් අකුසලයන් ගේ ද්විතියාදි ජවනයෝ ය, චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ දෙළොස් අකුසලයන් ගේ ද්විතියාදි ජවනයෝ ය, චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. හේතුපාඨයෙන් ප්‍රථම ජවන වර්ජිත පශ්චිම පශ්චිම අකුශල ජවනයන්ට ප්‍රත්‍යය වන අන්තිම ජවන වර්ජිත පූර්ව පූර්ව අකුශල ජවනයන්ගේ ආසේවන ශක්තිය ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කතීඃපාඨයෙන් හසිතෝත්පාද මහා ක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගත ක්‍රියා නවය ය චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ හසිතෝත්පාද මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගත ක්‍රියා නවය ය, චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. හේතුපාඨයෙන් ප්‍රථමජවන වර්ජිත පශ්චිම පශ්චිම ක්‍රියා ජවනයන්ට ප්‍රත්‍යය වන අන්තිම ජවන වර්ජිත පූර්ව පූර්ව අටොළොස් ක්‍රියා ජවනයන් ගේ ආසේවන ශක්තිය ලැබේ. නොහොත් හසිතෝත්පාද මහාක්‍රියා ද්විතීය ජවනයට ප්‍රත්‍යය වන ප්‍රථම ජවනය ය, -පෙ- සප්තම ජවනයට ප්‍රත්‍යය වන ෂෂ්ට ජවනය ය, මහද්ගත සෝමනස්ස සහගත ක්‍රියා සතරට

Non-commercial distribution

ප්‍රත්‍යය වන ගෝත්‍රභූ කෘත්‍යවත් මහාක්‍රියා ප්‍රථමද්වය ය, මහද්ගත උපේක්‍ෂා සහගත ක්‍රියා පසට ප්‍රත්‍යය වන ගෝත්‍රභූ කෘත්‍යවත් මහාක්‍රියා තෘතීය ද්වය ය, සමාපජ්ජන වීථියෙහි පශ්චිම පශ්චිම මහද්ගත ක්‍රියා ජවනයන්ට ප්‍රත්‍යය වන පූර්‍ව පූර්‍ව මහද්ගත ජවනයෝ ය යන මොවුන් ගේ ආසේවන ශක්තිය ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි.

ආසේවන විභඞ්ගය නිමි.

## 13. කර්‍මප්‍රත්‍යය විභඞ්ගය.

කර්‍මප්‍රත්‍යයවිභඞ්ගයෙහි කුසලෙන කුසලයෙහි "කුසලො ධම්මො" යන කර්‍තෘපාඨයෙන් කුසල් සිත් එක්විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ කුසල් සිත් එක්විස්ස ය, චේතනා වර්ජිත චෛතසික සත්තිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන එක්විසි කුසල චිත්තයන්හි ඇති චේතනා එක් විස්සෙහි සහජාතකර්‍ම ශක්තිය ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි.

කුසලෙන අව්‍යාකතයෙහි කර්‍තෘපාඨාභිධෙය හේතු ප්‍රත්‍යයෙහි මෙන් ගන්නේ ය. හේතුපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ එක් එක් කුසල චිත්තයෙක්හි ඇති චේතනා චෛතසිකයා ගේ සහජාත කර්‍ම ප්‍රත්‍යය ශක්තිය ලැබේ. ස්කන්ධවාර දෙසියවිසිපසෙකි.

කුසලෙන කුසලාව්‍යාකතයෙහි කර්‍තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනාවූ කුසල් සිත් එක්විස්ස ය චේතනා වර්ජිත චෛතසික සත්තිස ය යන අවයව නාමස්කන්ධයෝ ය, ඔවුන් නිසා උපදනා චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ එක්විසි කුසල චේතනාවන්ගේ සහජාත කර්‍ම ශක්තිය ලැබේ. ස්කන්ධවාර දෙසියදසයෙකි.

අකුසලෙන අකුසලයෙහි කර්‍තෘපාඨයෙන් අකුසල් සිත් දොළොස ය, චෛතසික සත් විස්ස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ අකුසල් සිත් දොළොස ය, චේතනා වර්ජිත චෛතසික සවිස්සය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. හේතු පාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන දොළොස් අකුසල චිත්තයන්හි ඇති චේතනා චෛතසික දොළොසෙහි සහජාත කර්‍ම ශක්තිය ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි.

Non-commercial distribution

අකුසලෙන අබ්‍යාකතයෙහි කත්‍ථපදහිධෙය හේතුවෙහි මෙනි. හේතුපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ දෙළොස් අකුශල චේතනාවන්ගේ සහජාත කර්‍ම ශක්තිය ලැබේ.

අකුසලෙන අකුසලාබ්‍යාකතයෙහි කත්‍ථපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අකුසල් සිත් දෙළොස ය, චෛතසික සත්විස්සය යන අවයව නාමස්කන්‍ධයන් නිසා උපදනා වූ අකුසල් සිත් දෙළොස ය, චේතනා වර්ජිත චෛතසික සවිස්ස ය යන අවයව නාමස්කන්‍ධයන් හා ඔවුන් නිසා උපදනා චිත්තජරූපයෝ ද ලැබෙත්. හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට හා චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අකුසල් සිත් දෙළොසෙහි ඇති චේතනා දෙළොසෙහි සහජාත කර්‍ම ශක්තිය ලැබේ. ස්කන්‍ධවාර දෙසිය දසයෙකි.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කත්‍ථපාඨයෙන් විපාකසිත් සතිස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්‍ධයන් නිසා උපදනා වූ විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්සය ක්‍රියා චේතනා වර්ජිත චෛතසික අටතිසය ය යන අවයව නාමස්කන්‍ධයෝ ය ඒ නාමස්කන්‍ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. (නානාක්‍ෂණික කර්‍මප්‍රත්‍යයෝත්පන්නයන් ඇතුළුවන බැවින් විපාක චේතනාව බැහැර නොකරන ලදි.) හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන විපාක සිත් සතිසෙහි හා ක්‍රියා සිත් විස්සෙහි ඇති චේතනාවන් ගේ සහජාත කර්‍ම ශක්තිය ලැබේ. විපාක සිත් සතිසට ප්‍රත්‍යය වන අතීත-කුශලාකුශල චේතනාවන් ගේ නානාක්‍ෂණික කර්‍මශක්තිය ද ලැබේ. නොහොත් අකුසලවිපාක සතට ප්‍රත්‍යය වන දෙළොස් අකුශල චේතනා ය, අහේතුක කුශලවිපාක මහාවිපාක නාමස්කන්‍ධයන්ට ප්‍රත්‍යය වන ත්‍රිහේතුකෝත්කෘෂ්ට මහා කුශල චේතනා ය, අහේතුක කුශල විපාකයන්ට හා ඥානවිප්‍රයුක්ත මහාවිපාක සතරට ද ප්‍රත්‍යය වන ත්‍රිහේතුකෝමක ද්විහේතුකෝත්කෘෂ්ට මහාකුශල චේතනා ය, අහේතුක කුශල විපාකයන්ට ප්‍රත්‍යය වන ද්විහේතුකෝමක මහා කුශල චේතනාය, ප්‍රථමධ්‍යාන විපාක නාමස්කන්‍ධයන්ට ප්‍රත්‍යය වන ප්‍රථමධ්‍යාන කුශල චේතනාව ය, -පෙ- පඤ්චමධ්‍යාන විපාකනාමස්කන්‍ධයන්ට ප්‍රත්‍යය වන පඤ්චමධ්‍යාන කුශල චේතනාවය ආකාසානඤ්චායතන විපාක නාමස්කන්‍ධයන්ට ප්‍රත්‍යය වන ආකාසාන-ඤ්චායතන කුසල චේතනාවය -පෙ- නේවසඤ්ඤානාසඤ්ඤායතන විපාකයට ප්‍රත්‍යය වන නේවසඤ්ඤා- නාසඤ්ඤායතන කුශල චේතනාව ය, සෝතාපත්ති ඵලයට ප්‍රත්‍යය වන සෝතාපත්ති මග්ගචේතනාව ය -පෙ- අර්හත්තඵලයට ප්‍රත්‍යය වන අර්හත්තමග්ග චේතනාවය යන මොවුන් ගේ නානාක්‍ෂණික කර්‍ම ශක්තිය ලැබේ. ස්කන්‍ධවාර දෙසිය දසයෙකි.

Non-commercial distribution

ප්‍රතිසන්ධිකාලයෙහි කතීඃපාඨයෙන් ප්‍රතිසන්ධිසිත් එකුන් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා හෘදය වස්තුව ද නිසා උපදනා වූ ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා කෘතත්වාත් රූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයට ද සම්ප්‍රයුක්තස්කන්ධ කෘතත්වාත් රූපයන්ට ද ප්‍රත්‍යය වන එකුන්විසි ප්‍රතිසන්ධි චිත්තයන් හි ඇති චේතනා එකුන් විස්සෙහි සහජාත කර්මශක්තිය ද ප්‍රතිසන්ධි නාමස්කන්ධ කෘතත්වාත් රූපයන්ට ප්‍රත්‍යය වන ඖද්ධත්‍යසහගත සිත්හි චේතනාව හැර එකොළොස් අකුශල චේතනාය, මහා කුසල චේතනා අටය, මහද්ගත කුසල චේතනා නවය ය යන ප්‍රත්‍යය ධර්මයන් ගේ නානාක්ෂණික කර්ම ශක්තිය ලැබේ. නොහොත් දුර්ගති අහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට හා ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ද ප්‍රත්‍යය වන ඖද්ධත්‍ය චේතනා වර්ජිත අකුශල චේතනා එකොළොසය, කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට හා ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන ත්‍රිහේතුකෝත්කෘෂ්ඨ මහාකුශල චේතනා ය, ද්විහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට හා ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන ත්‍රිහේතුකෝමක ද්විහේතුකෝත්කෘෂ්ට මහාකුශල චේතනා ය, සුගති අහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට හා ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන ද්විහේතුකෝමක මහාකුශල චේතනා ය, ප්‍රථමධ්‍යාන ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට හා ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන ප්‍රථමධ්‍යාන කුශල චේතනාව ය, -පෙ- පඤ්චමධ්‍යාන ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට හා කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චමධ්‍යාන කුශල චේතනාව ය, ආකාසානඤ්චායතන ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ආකාසානඤ්චායතන කුසල චේතනාව ය, -පෙ- නේවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසලචේතනාව ය යන මේ ප්‍රත්‍යය ධර්මයන් ගේ නානාක්ෂණික කර්ම ශක්තිය ලැබේ.

ශුද්ධරූපවාරයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කතීඃපාඨයෙන් අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත කුශලාකුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන චිත්තජ මහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා උපදනා කර්මජ මහාභූතයෝ ය, අසංඥසත්ත්ව කර්මජ මහාභූතයෝ ය, ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය, යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ උපාදය රූපයෝ ලැබෙත්. "කම්මපච්චයා" යන හේතුපාඨයෙන් චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත

Non-commercial distribution

කුශලාකුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන්හි වූ චේතනාවන් ගේ සහජාත කර්‍ම ශක්තිය ද, ප්‍රතිසන්ධි කර්‍මජ රූපයන්ට ප්‍රත්‍යය වන ඖද්ධත්‍ය චේතනා වර්ජිත අකුශල චේතනා එකොළොස ය, මහාකුශල චේතනා අටය, රූප කුශල චේතනා පසය, ප්‍රවෘත්ති කර්‍මජ රූපයන්ට ප්‍රත්‍යය වන අකුසල චේතනා දොළොසය, මහාකුසල චේතනා අටය, රූප කුශල චේතනා පසය, අසංඥ සත්ත්ව කර්‍මජ රූපයන්ට ප්‍රත්‍යය වන රූපාවචර පඤ්චමධ්‍යාන කුශල චේතනාව ය යන මොවුන් ගේ නානාක්ෂණික කර්‍ම ශක්තිය ද ලැබේ. ඉතිරි වාර දෙක උක්තානු සාරයෙන් දත්තේය.

**කර්‍ම ප්‍රත්‍යය විභඞ්ගය නිමි.**

## (14) විපාක ප්‍රත්‍යය විභඞ්ගය.

විපාකප්‍රත්‍යය විභඞ්ගයෙහි ප්‍රවෘත්තිකාලයෙහි "අබ්‍යාකතො" යන කර්‍තෘපාඨයෙන් විපාක සිත් සතිස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා විපාකසිත් සතිස ය චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. හේතුපාඨයෙන් අන්‍යෝන්‍ය වශයෙන් නාමස්කන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ද ප්‍රත්‍යය වන විපාකසිත් සතිස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් ගේ විපාක ශක්තිය ලැබේ.

ප්‍රතිසන්ධිකාලයෙහි අබ්‍යාකතො යන කර්‍තෘපාඨයෙන් ප්‍රතිසන්ධි සිත් එකුන්විස්ස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා හෘදය වස්තුව නිසා උපදනා වූ ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා කෘතත්වාන් රූපයෝ ලැබෙත්. විපාක පච්චයා යන හේතුපාඨයෙන් ඔවුනොවුන්ට ද, ඔවුනොවුන්ට හා කෘතත්වාන් රූපයන්ට ද ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධිසිත් එකුන් විස්ස ය චෛතසික පන්තිස ය යන නාමස්කන්ධයන් ගේ විපාක ශක්තිය ලැබේ.

ශුද්ධරූපවාරයෙහි කර්‍තෘපාඨයෙන් අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාවයුති වර්ජිත පඤ්චවෝකාර විපාක නාමස්කන්ධයන් විසින් උපදවන චිත්තජ මහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා උපන් කර්‍මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත චිත්තජ ප්‍රතිසන්ධි කර්‍මජ උපාදය රූපයෝ ලැබෙත්. හේතු පාඨයෙන් චිත්තජරූප ප්‍රතිසන්ධි කර්‍මජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන වර්ජිත විපාක

Non-commercial distribution

සිත් දෙවිස්ස ය, චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයන් ගේ විපාක ශක්තිය ලැබේ.

## විපාකප්‍රත්‍යය විභඞ්ගය නිමි.

## (15) ආහාර ප්‍රත්‍යය විභඞ්ගය.

ආහාරපච්චය විභඞ්ගයෙහි කුසලෙන කුසලයෙහි හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන කුසල්සිත් එක්විස්සෙහි එක්එක් ධර්මරාශියක ඇති ඵස්ස චේතනා විඥාන යන ප්‍රත්‍යය ධර්මයන් ගේ ආහාර ශක්තිය ලැබේ.

කුසලෙන අබ්‍යාකතයෙහි කතිපාඨාභිධෙය සහජාතයෙහි මෙන් ගන්නේ ය. හේතුපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ එක්විසි කුසලචිත්තයන් ගේ එක් එක් ධර්ම සමූහයක ඇති ඵස්ස චේතනා විඥාන යන ආහාරයන් ගේ නාමාහාර ශක්තිය ලැබේ.

කුසලෙන කුසලාබ්‍යාකතයෙහි කතිපාඨාභිධෙය සහජාතයෙහි මෙනි, හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ එක් එක් කුශල චිත්තක්ෂණයක ඇති ඵස්ස චේතනා විඥාන යන නාමාහාරයන් ගේ නාමාහාර ශක්තිය ලැබේ.

අකුසලෙන අකුසලය, අකුසලෙන අබ්‍යාකතය, අකුසලෙන අකුසලාබ්‍යාකතය යන වාර තුන ද සහජාතයෙහි මෙන් දන්නේය. හේතුපාඨාභිධෙය ද කුශල පදනුසාරයෙන් දන්නේ ය. "දෙළොස් අකුසල චිත්තක්ෂණයන්හි ඇති ඵස්ස චේතනා විඥානය" යි කීම පමණක් වෙනස ය.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතිපාඨාභිධෙය සහජාතයෙහි මෙනි. හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන විපාක ක්‍රියා චිත්තක්ෂණයන්හි ඇති ඵස්ස චේතනා විඥාන යන මොවුන් ගේ නාමාහාර ශක්තිය ලැබේ. ස්කන්ධවාර දෙසිය දසයෙකි.

ප්‍රතිසන්ධිකාලයෙහි සහජාතයෙහි මෙනි. හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තසන්ධයන්ට හා කෘත්තවාත් රූපයන්ට ද ප්‍රත්‍ය වන එකුන්විසි ප්‍රතිසන්ධිචිත්තක්ෂණයන් ගෙන් එක එකක ඇති ඵස්ස චේතනා විඥානයන් ගේ නාමාහාර ශක්තිය ලැබේ.

Non-commercial distribution

ශුඩරූප වාරයෙහි කතීඃ පාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාවාද්‍යුති වර්ජිත කුශලා-කුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන චිත්තජ මහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා උපදනා ප්‍රතිසන්ධි කර්මජ මහාභූතයෝ ය, ආහාරජ මහා භූතයෝ ය යන මොවුන් නිසා උපදනා වූ භූතරූප සහිත වූ චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ ආහාරජ උපාදාය රූපයෝ ලැබෙත්. හේතු පාඨයෙන් චිත්තජරූපයන්ට හා ප්‍රතිසන්ධි-කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාවාද්‍යුති වර්ජිත කුශලා කුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන්ට අයත් වූ ස්පර්ශ චේතනා විඥානයන් ගේ නාමාහාර ශක්තිය ද, ආහාරජරූපයන්ට ප්‍රත්‍යය වන බාහ්‍ය සෘතුජ ඕජාවෙහි රූපාහාර ශක්තිය ද ලැබේ, (ඇතැම් ආචාර්‍ය්‍යවරයෝ ආධ්‍යාත්මික ඕජාව ද ගනිති.) කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හා අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය සහජාතය මෙනි, හේතුපාඨයෙන් සම්ප්‍රයුක්ත ස්කන්ධ චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන නාමාහාර තුනය යි කියයුතු.

## ආහාරපච්චය විභඞ්ගය නිමි.

## (16) ඉන්ද්‍රිය ප්‍රත්‍යය විභඞ්ගය.

ඉන්ද්‍රියපච්චයවිභඞ්ගයෙහි කුසලෙන කුසලය සහජාතයෙහි මෙනි. හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන එක් විසි කුශලචිත්තයන් ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති ජීවිත චිත්ත වේදනා සද්ධා විරිය සති එකග්ගතා පඤ්ඤා යන නාමේන්ද්‍රිය ධර්ම අටෙහි සහජාතේන්ද්‍රිය ශක්තිය ලැබේ.

කුසලෙන අබ්‍යාකතයෙහි හේතුපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා වූ එක්විසි කුශල චිත්තක්ෂණයන්හි ඇති නාමේන්ද්‍රිය ධර්ම අටදෙනා ගේ සහජාතේන්ද්‍රිය ශක්තිය ලැබේ.

කුසලෙන කුසලාබ්‍යාකතයෙහි හේතුපාඨයෙන් සම්ප්‍රයුක්ත-ස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ එක්විසි කුසලචිත්තක්ෂණයන්හි ඇති නාමේන්ද්‍රිය ධර්ම අටදෙනාගේ සහජාතේන්ද්‍රිය ශක්තිය ලැබේ.

අකුසලෙන අකුසලයෙහි හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන දෙළොස් අකුශල චිත්තක්ෂණයෙහි ඇති ජීවිත චිත්ත වේදනා විරිය ඒකග්ගතා යන නාමේන්ද්‍රිය ධර්ම පසෙහි සහජාතේන්ද්‍රිය ශක්තිය ලැබේ. අකුසලෙන අබ්‍යාකතයෙහි හා අකුසලෙන අකුසලාබ්‍යා-

Non-commercial distribution

කතයෙහි අභිධෙය උක්තානුසාරයෙන් දන්නේ ය. හේතුපාඨයෙන් නාමේන්‍ද්‍රිය පසෙහි ඉන්‍ද්‍රිය ශක්තිය ගන්නේ ය,

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි "අබ්‍යාකතො" යන කතෘපාඨයේ අභිධෙය සහජාතයෙහි මෙනි. හේතු පාඨයෙන් සම්ප්‍රයුක්ත-ස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ටද ප්‍රත්‍යය වන නාමේන්‍ද්‍රිය ධර්ම අටෙහි සහජාතේන්‍ද්‍රිය ශක්තිය ද චක්ෂුර් විඥාන ද්වයයට ප්‍රත්‍යය වන අතීත භවාඞ්ගය හා උපන් මධ්‍යමායුෂ්ක චක්ෂුරින්ද්‍රිය ය -පෙ- කායවිඥාන ද්වයයට ප්‍රත්‍යය වන අතීතභවාඞ්ගය හා උපන් මධ්‍යමායුෂ්ක කායේන්ද්‍රිය ය යන මොවුන් ගේ පූර්වජාතීන්ද්‍රිය ශක්තිය ද ලැබේ.

ප්‍රතිසන්ධිකාලයෙහි අභිධෙය ද සහජාතයෙහි මෙනි. හේතු පාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා කෘතත්වාත්රූපයන්ට ද ප්‍රත්‍යය වන එකුන් විසි ප්‍රතිසන්ධි චිත්තක්ෂණයන් ගෙන් එක එකක ඇති නාමේන්ද්‍රිය ධර්ම අටෙහි නාමේන්ද්‍රිය ශක්තිය ද ලැබේ.

ශුද්ධරූපවාරයෙහි කතෘපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥානව්‍යුති වර්ජිත කුශලා කුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් ශුද්ධාෂ්ට පරිදි උපදවන චිත්තජ මහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා ශුද්ධාෂ්ට පරිදි උපදනා කර්මජමහාභූතයෝ ය, අසංඥසත්ත්ව කර්මජ මහාභූතයෝ ය, ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා වූ භූත රූප සහිත වූ චිත්තජ උපාදයරූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ උපාදය රූපයෝ ය, රූප ජීවිතේන්ද්‍රිය වර්ජිත අසංඥසත්ත්ව කර්මජ උපාදය රූපයෝ ය, ප්‍රවෘත්තිකර්මජ උපාදයරූපයෝ ය යන මොවුහු ලැබෙත්. හේතුපාඨයෙන් චිත්තජරූපයන්ට හා ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥානව්‍යුති වර්ජිත කුශලා කුශල විපාක ක්‍රියා චිත්තක්ෂණ එක එකක ඇති නාමේන්ද්‍රිය ධර්ම අටෙහි සහජාතේන්ද්‍රිය ශක්තිය ද කර්මජරූප කලාපයන්හි රූප-ජීවිතේන්ද්‍රියයා ගේ සහජාතේන්ද්‍රිය ශක්තිය ද ලැබේ.

කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි හේතුපාඨයෙන් සම්ප්‍රයුක්ත-ස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන එක්විසි කුශල චිත්තක්ෂණ-යන්හි ඇති නාමේන්ද්‍රියයන් ගේ සහජාතේන්ද්‍රිය ශක්තිය ලැබේ.

අකුසලෙන අකුසලාබ්‍යාකතයෙහි අභිධෙය වුක්තානුසාරයෙන් දන්නේ ය.

**ඉන්ද්‍රිය ප්‍රත්‍යය විභඞ්ගය නිමි.**

Non-commercial distribution

## (17) ධ්‍යාන ප්‍රත්‍යය විභඞ්ගය.

කුසලෙන කුසලයෙහි හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන එක්විසි කුශලචිත්තක්ෂණයන් ගෙන් එක එකක ඇති විතර්‍ක විචාර පීති ඒකග්ගතා වේදනා යන ධ්‍යානාඞ්ග ධර්‍මයන්ගේ ධ්‍යාන ශක්තිය ලැබේ.

කුසලෙන අබ්‍යාකතය හා කුසලෙන කුසලාබ්‍යාකතය ද සහජාතය මෙන් දත්තේ ය. හේතුපාඨාභිධෙය වශයෙන් ධ්‍යානාඞ්ගධර්‍මයන් ගේ ධ්‍යාන ශක්තිය ගන්නේ ය. අකුසලෙන අකුසලය ද සහජාතය මෙනි. හේතුපාඨයෙන් අකුශලචිත්තක්ෂණයන්හි ඇති ධ්‍යානාඞ්ග ධර්‍ම පසෙහි ධ්‍යානශක්තිය ගන්නේ ය. අකුසලෙන අබ්‍යාකතය අකුසලෙන අකුසලාබ්‍යාකතය ද ව්‍යක්තානුසාරයෙන් දත යුතු. හේතුපාඨයෙන් ධ්‍යානාඞ්ගධර්‍ම පස ගන්නේ ය.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කර්‍තෘපාඨයෙන් ද්විපඤ්චවිඥානයෙන් අන්‍ය වූ විපාක සිත් සවිස්ස ය, ක්‍රියාසිත් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ විපාකසිත් සවිස්ස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් නිසා උපදනා වූ චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ග ධර්‍ම පසෙහි ධ්‍යාන ශක්තිය ලැබේ.

ප්‍රතිසන්ධිකාලයෙහි අභිධෙය සහජාතය අනුව ගන්නේ ය. හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා කෘතත්වාත්රූපයන්ට ද ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධිචිත්තක්ෂණ එකුන් විස්සෙහි ඇති ධ්‍යානාඞ්ග ධර්‍මයන් ගේ ධ්‍යානශක්තිය ලැබේ.

ශුද්ධරූපවාරයෙහි කර්‍තෘපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිත්තච්‍යුති වර්ජිත කුශලා කුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන චිත්තජමහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසලොස හා සුදුසු පරිදි උපදනා කර්‍මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා වූ භූතරූප සහිත වූ චිත්තජ ප්‍රතිසන්ධිකර්‍මජ උපාදය රූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක ද්විපඤ්චවිඥාන අභිත්තච්‍යුති වර්ජිත කුශලාකුශල විපාකක්‍රියා එක් එක් චිත්තක්ෂණයක ඇති ධ්‍යානාඞ්ගධර්‍මයන් ගේ ධ්‍යානශක්තිය ලැබේ.

Non-commercial distribution

කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය, අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙක සහජාතයෙහි මෙන් දත යුතු. හේතුපාඨයෙන් ධ්‍යානාඞ්ග ධර්‍මයන් ගේ ධ්‍යානශක්තිය ගන්නේ ය.

ධ්‍යාන ප්‍රත්‍යය විභඞ්ගය නිමි.

## (18) මාර්‍ග ප්‍රත්‍යය විභඞ්ගය.

මාර්‍ගප්‍රත්‍යය විභඞ්ගයෙහි කුසලෙන කුසලයෙහි හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන එක්විසි කුශල චිත්තක්ෂණයන්හි ඇති පඤ්ඤා විතක්ක සම්මාවාචා සම්මාකම්මන්ත සම්මාආජීව විරිය සති ඒකග්ගතා යන මාර්‍ගාඞ්ගධර්‍මයන් ගේ මාර්‍ගප්‍රත්‍යය ශක්තිය ලැබේ.

කුසලෙන අබ්‍යාකතයෙහි හේතුප්‍රත්‍යයෙහි මෙන් අභිධෙය ගන්නේ ය. හේතු පාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ එක්විසි කුශලයන් ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති මාර්‍ගාඞ්ග අටෙහි මාර්‍ග ශක්තිය ලැබේ.

කුසලෙන කුසලාබ්‍යාකතයෙහි හේතුවෙහි මෙන් අභිධෙය ගන්නේ ය. හේතුපාඨයේ අභිධෙය ගැනීමේදී "සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට" යනු යොදා කියනු.

අකුසලෙන අකුසලයෙහි සහජාතයෙහි මෙන් අභිධෙය ගන්නේ ය, හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන දොළොස් අකුශල චිත්තයන් ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති විතක්ක විරිය ඒකග්ගතා දිට්ඨි යන මාර්‍ගාඞ්ග සතරෙහි මාර්‍ගශක්තිය ලැබේ. අකුසලෙන අබ්‍යාකතය ය, අකුසලෙන අකුසලාබ්‍යාකතය ය යන දෙක සහජාතය මෙනි. හේතු පාඨයෙන් මාර්‍ගාඞ්ග සතර ගන්නේ ය. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්ති කාලයේ අභිධෙය හේතුවෙහි මෙනි. හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තකන්ධයන්ට හා චිත්තජ රූපයන්ට ද ප්‍රත්‍යය වන මාර්‍ගාඞ්ග අටෙහි මාර්‍ග ශක්තිය ලැබේ.

ප්‍රතිසන්ධිකාලයෙහි අභිධෙය හේතුවෙහි මෙනි. හේතුපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා කෘතත්වාත් රූපයන්ට ප්‍රත්‍යය වන සහේතුකප්‍රතිසන්ධි සතළොසෙහි ඇති පඤ්ඤා විතක්ක විරිය සති ඒකග්ගතා යන මාර්‍ගාඞ්ගයන් ගේ මාර්‍ග ශක්තිය ලැබේ.

Non-commercial distribution

ශුඬරූපවාරයෙහි හේතුවෙහි මෙනි. හේතුපාඨයෙන් සහේතුක චිත්තජරූපයන්ට හා සහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක අභිඤ්ඤාව්‍යුතිවර්ජිත කුශලා කුශල සහේතුක විපාක ක්‍රියා චිත්තක්‍ෂණ-යන්හි ඇති මාර්ගාඬ්ගධර්ම අටෙහි මාර්ගශක්තිය ලැබේ.

කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හේතුව මෙනි. හේතුපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ එක්විසි කුශලයන් ගේ එක් එක් චිත්තක්‍ෂණයක ඇති මාර්ගාඬ්ග අටෙහි මාර්ග ශක්තිය ලැබේ. අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හේතුව මෙනි. හේතුපාඨාභිධෙය වශයෙන් මාර්ගාඬ්ගධර්මයන්ගේ මාර්ගශක්තිය ලැබේ.

**මාර්ග ප්‍රත්‍යය විභඬ්ගය නිමි.**

---

## (19) සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය විභඬ්ගය

සම්ප්‍රයුක්ත විභඬ්ගයෙහි කුසලෙන කුසලය ආරම්මණය මෙනි. හේතුපාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන කුසල සිත් එක් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් ගේ සම්ප්‍රයුක්තශක්තිය ලැබේ. අකුසලෙන අකුසලයද එසේය, අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි අභිධෙය ආරම්මණයෙහි මෙනි. හේතුපාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන විපාක සිත් සතිස ය, ක්‍රියාසිත් විස්ස ය යන අවයව නාමස්කන්ධයන් ගේ සම්ප්‍රයුක්ත ශක්තිය ලැබේ. ප්‍රතිසන්ධි කාලයෙහි අභිධෙය ද ආරම්මණයෙහි මෙනි, හේතුපාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි සිත් එකුන්විස්ස ය චෛතසික පන්තිස ය යන නාමස්කන්ධයන් ගේ සම්ප්‍රයුක්ත ශක්තිය ලැබේ. රූපවාරයක් නැත්තේ ය.

**සම්ප්‍රයුක්ත විභඬ්ගය නිමි.**

---

## (20) විප්‍රයුක්ත ප්‍රත්‍යය විභඬ්ගය.

විප්‍රයුක්තප්‍රත්‍යය විභඬ්ගයෙහි කුසලෙන කුසලයෙහි "වත්ථුං විප්පයුත්ත පච්චයා" යන පාඨයෙහි පදාර්ථ: "හදය වස්තුවෙන් විප්‍රයුක්ත ප්‍රත්‍යය භාවය සිද්ධ කිරීමෙන්" යි කිය යුතු ය. කර්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා කුසල්

Non-commercial distribution

සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. හේතුපාඨයේ අභිධෙය පූරේජාතයෙහි මෙනි.

කුසලෙන අබ්‍යාකතයෙහි "**කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං ඛන්ධෙවිප්පයුත්ත පච්චයා**" පදාර්‍ථ: කුසලෙ ඛන්ධෙ, පඤ්චවෝකාර භූමියෙහි උපදනා කුශල නාමස්කන්ධයන් හා පටිච්ච, එක්ව ඉපදීමට පැමිණ; විප්පයුත්තපච්චයා, විප්‍රයුක්ත ප්‍රත්‍යය භාවය සිද්ධකරන්නා වූ; ඛන්ධෙ, අවයව වූ ද සමූහ වූ ද පඤ්චවෝකාරභූමියෙහි උපදනා කුශල නාමස්කන්ධයන් නිසා; චිත්තසමුට්ඨානං රූපං, චිත්තසමුට්ඨාන රූපය; (උපදී.) කත්‍ෘපාඨයේ අභිධෙය සහජාතයෙහි මෙනි, හේතුපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් ගේ සහජාත විප්‍රයුක්තශක්තිය ලැබේ.

කුසලෙන කුසලාබ්‍යාකතයෙහි "**ඛන්ධා වත්ථුං විප්පයුත්ත පච්චයා, චිත්තසමුට්ඨානං රූපං ඛන්ධෙ විප්පයුත්තපච්චයා**" පදාර්‍ථ:- වත්ථුං විප්පයුත්තපච්චයා, හෘදය වස්තුව විප්‍රයුක්ත ප්‍රත්‍යය ශක්තියෙන් උපකාරවීම හේතු කොට; ඛන්ධා, පඤ්චවෝකාර කුශල නාමස්කන්ධයෝ (උපදිති,) ඛන්ධෙ විප්පයුත්තපච්චයා; පඤ්චවෝකාර කුසලනාමස්කන්ධයන් විප්‍රයුක්ත භාවයෙන් ප්‍රත්‍යය වීමෙන්, චිත්තසමුට්ඨානං රූපං, චිත්තජරූපය; (උපදී.) කත්‍ෘපාඨයේ අභිධෙය සහජාතයෙහි මෙනි. හේතුපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන කුසල් සිත් එක්විස්ස ය, චෛතසික අටතිසය යන අවයවවූද සමූහවූද නාමස්කන්ධයන් ගේ සහජාත විප්‍රයුක්ත ශක්තියද, පශ්චිම පශ්චිම වූ කුසල් සිත් එක්විස්සට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්‍ව පූර්‍ව චිත්තයන් හා උපන් හෘදයවස්තුව ගේ ද, මරණාසන්න කුශල ජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුති චිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපන් හෘදය වස්තුව ගේ ද, පූරේජාත විප්‍රයුක්ත ශක්තිය ද ලැබේ.

අකුසලෙන අකුසලයෙහි කත්‍ෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුසල් සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. හේතුපාඨාභිධෙය පූරේජාතයෙහි මෙනි.

අකුසලෙන අබ්‍යාකතයෙහි අභිධෙය සහජාතයෙහි මෙනි, හේතුපාඨයෙහි චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන අකුසල් සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් ගේ සහජාත විප්‍රයුක්ත ශක්තිය ලැබේ.

Non-commercial distribution

අකුසලෙන අකුසලාබ්‍යාකතයෙහි කතීඃපාඨාභිධෙය සහජාත-යෙහි මෙති. චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුසල් සිත් දොළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් ගේ සහජාත විප්‍රයුක්ත ශක්තිය ද, පශ්චිම පශ්චිම දොළොස් අකුසලයන්ට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්‍ව පූර්‍ව චිත්තයන් හා උපදනා හෘදය වස්තුවෙහි හා මරණාසන්න අකුසල ජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපන් හෘදය වස්තුවෙහි පුරේජාත විප්‍රයුක්ත ශක්තිය ද ලැබේ.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි "**ඛන්ධා වත්ථුං විප්පයුත්තපච්චයා චිත්තසමුට්ඨානං රූපං ඛන්ධෙ විප්පයුත්ත පච්චයා**" පදාර්‍ථ: වත්ථුං, වස්තුව; විප්පයුත්තපච්චයා, විප්‍රයුක්ත ශක්තියෙන් ප්‍රත්‍යය වීමෙන්; ඛන්ධා, පඤ්චවෝකාර විපාක ක්‍රියා නාමස්කන්ධයෝ (උපදිති.) ඛන්ධෙ, පඤ්චවෝකාර විපාක ක්‍රියා නාමස්කන්ධයන්; විප්පයුත්තපච්චයා, විප්‍රයුක්ත ශක්තියෙන් ප්‍රත්‍යය වීමෙන්; චිත්-තසමුට්ඨානං රූපං, චිත්තසමුට්ඨාන රූපය; (උපදී.)

කතීඃ පාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක වර්ජිත විපාකසිත් දෙතිස ය ක්‍රියාසිත් විස්ස ය, චෛතසික අටතිස ය, යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනාවූ විපාක සිත් දෙතිස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. හේතුපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුතිවර්ජිත විපාකසිත් දෙවිස්ස ය, ක්‍රියාසිත් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන්ගේ සහජාත විප්‍රයුක්තශක්තිය ද, චක්ෂුර්විඥානද්වයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක චක්ෂුර් වස්තුව ය -පෙ- කාය විඥාන ද්වයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක කායවස්තුව ය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන වර්ජිත පශ්චිම පශ්චිම විපාක ක්‍රියා නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධ්‍යාදි පූර්‍ව පූර්‍ව චිත්තයන් හා උපදනා හෘදය වස්තුව ය, මරණාසන්න කාලයෙහි පඤ්චවෝකාර භවාඞ්ග පසළොස ය, ආවර්ජනද්වය ය, සම්ප්‍රතීච්ඡණද්වය ය, සන්තීරණත්‍රය ය, ව්‍යවස්ථාපනය ය, මරණාසන්නජවන පස ය, තදරම්මණය ය, ච්‍යුතිය ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපන් හෘදය වස්තුව ය යන මොවුන් ගේ පුරේජාත විප්‍රයුක්ත ශක්තිය ද ලැබේ.

Non-commercial distribution

ප්‍රතිසන්ධි කාලයෙහි "**ඛන්ධා වත්ථුං විප්පයුත්තපච්චයා, කටත්තා රූපං ඛන්ධෙ විප්පයුත්තපච්චයා**" පදථීඃ වත්ථුං විප්පයුත්තපච්චයා, හෘදයවස්තුව විප්‍රයුක්ත ශක්තියෙන් ප්‍රත්‍යය වීමෙන්; ඛන්ධා, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ; (උපදිති.) ඛන්ධෙවිප්පයුත්තපච්චයා, පඤ්ච-වෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් විප්‍රයුක්ත ශක්තියෙන් ප්‍රත්‍යය වීමෙන්; කටත්තා රූපං, කෘතත්වාත් රූපය; (උපදී.)

කතීඃපාඨයෙන් පඤ්චවෝකාර ප්‍රතිසන්ධිසිත් පසළොස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් හා හෘදය වස්තුව ද නිසා උපදනා වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස ය, චෛතසික පන්තිසය ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් හා කෘතත්වාත් රූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් කෘතත්වාත් රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොසය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද, නාමස්කන්ධයෝ ය, ඕවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධ හෘදයවස්තුහු ය යන ප්‍රත්‍යය ධර්‍මයන් ගේ සහජාත විප්‍රයුක්ත ශක්තිය ලැබේ.

ප්‍රතිසන්ධිකාලයෙහි ශේෂය "**ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා, ඛන්ධා වත්ථුං විප්පයුත්ත පච්චයා, වත්ථු ඛන්ධෙ විප්පයුත්ත පච්චයා**" පදථීඃ ඛන්ධෙ පටිච්ච, එක් ව ඉපදීම් වශයෙන් ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් නිසා; වත්ථු, හෘදය වස්තුව (උපදී.) වත්ථුං පටිච්ච, එක් ව ඉපදීම් වශයෙන් හෘදය වස්තුව නිසා, ඛන්ධා, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ; (උපදිති.) වත්ථුං විප්පයුත්තපච්චයා, හෘදයවස්තුව විප්පයුත්ත ශක්තියෙන් ප්‍රත්‍යය වීමෙන්; ඛන්ධා, ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ; (උපදිති.) ඛන්ධෙ විප්පයුත්ත පච්චයා, ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් විප්ප්‍රයුක්ත ශක්තියෙන් ප්‍රත්‍යය වීමෙන්; වත්ථු, හෘදය වස්තුව; (උපදී.)

ශුඩරූපවාරයෙහි "**මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තා රූපං ඛන්ධෙ විප්පයුත්තපච්චයා**" පදථීඃ ඛන්ධෙ, පඤ්චවෝකාර විපාක ක්‍රියා නාමස්කන්ධයන්; විප්පයුත්තපච්චයා,විප්‍රයුක්ත ශක්තියෙන් ප්‍රත්‍යය වීමෙන්; මහාභූතෙ පටිච්ච, එක් ව ඉපදීම් වශයෙන් මහාභූතයන් නිසා, චිත්තසමුට්ඨානං රූපං, සිතින් උපදනා රූපය ද; කටත්තා රූපං, කර්‍මජරූපය ද; (උපදී)

කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාචිත්ත වර්ජිත කුශලාකුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන චිත්තජ මහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා සුදුසු පරිදි උපදනා කර්‍මජ මහා

Non-commercial distribution

භූතයෝ ය, යන මොවුන් නිසා උපදනා වූ චිත්තජ ප්‍රතිසන්ධි කර්‍මජ උපාදය රූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් චිත්තජරූප ප්‍රතිසන්ධි කර්‍මජ-රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාවාප්ති වර්ජිත කුශලා කුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් ගේ සහජාත විප්‍රයුක්ත ශක්තිය ලැබේ.

කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි හේතුපාඨයෙන් චිත්තජරූප-යන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල්සිත් එක් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් ගේ සහජාත විප්‍රයුක්ත ශක්තිය ලැබේ.

අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි හේතුපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුසල් සිත් දොළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් ගේ සහජාත විප්‍රයුක්ත ශක්තිය ලැබේ.

**විප්‍රයුක්ත ප්‍රත්‍යය නිර්දේශය නිමි.**

21 - 22 - 23 - 24

අස්තිප්‍රත්‍යය විභඞ්ගයෙහි අභිධෙය සහජාතයෙහි මෙනි, හේතු පාඨයේ අභිධෙය ද සහජාතාස්තියෙහි සහජාතයෙහි මෙන් ද, පූර්වජාතාස්තියෙහි පූර්වජාතයෙහි මෙන් ද, ආහාරාස්තියෙහි රූපාහාර ප්‍රත්‍යයෙහි මෙන් ද, ඉන්ද්‍රියාස්තිය රූපජීවිතේන්ද්‍රියයෙහි මෙන් ද ගන්නේ ය. නාස්ති විභඞ්ගයේ අභිධෙය ආරම්මණයෙහි මෙනි, හේතුපාඨයේ අභිධෙය අනන්තරය අනුව ගන්නේ ය. විගත විභඞ්ගය ද එසේ ම ය. අවිගතවිභඞ්ගය නාසති විභඞ්ගය මෙනි.

**ඉමෙ තෙවීසති පච්චයා සජ්ඣායන්තෙන විත්ථාරෙතබ්බා**, මේ තෙවිසි ප්‍රත්‍යයන් සජ්ඣායනා කරමින් විස්තර කළ යුතු ය.

**විභඞ්ගවාරය නිමි.**

Non-commercial distribution

# අනුලෝම සඞ්ඛ්‍යා වාර පාළිය.

හෙතුයා නව. ආරම්මණෙ තීණි. අධිපතියා නව. අනන්තරෙ තීණි. සමනන්තරෙ තීණි. සහජාතෙ නව. අඤ්ඤමඤ්ඤෙ තීණි. නිස්සයෙ නව. උපනිස්සයෙ තීණි. පුරෙජාතෙ තීණි. ආසෙවනෙ තීණි. කම්මෙ නව. විපාකෙ එකං. ආහාරෙ නව. ඉන්ද්‍රියෙ නව. ඣානෙ නව. මග්ගෙ නව. සම්පයුත්තෙ තීණි. විප්පයුත්තෙ නව. අත්ථියා නව. නත්ථියා තීණි. විගතෙ තීණි. අවිගතෙ නව.

හෙතුපච්චයා ආරම්මණෙ තීණි. අධිපතියා නව. අනන්තරෙ තීණි. සමනන්තරෙ තීණි. සහජාතෙ නව. අඤ්ඤමඤ්ඤෙ තීණි. නිස්සයෙ නව. උපනිස්සයෙ තීණි. පුරෙජාතෙ තීණි. ආසෙවනෙ තීණි. කම්මෙ නව. විපාකෙ එකං. ආහාරෙ නව. ඉන්ද්‍රියෙ නව. ඣානෙ නව. මග්ගෙ නව. සම්පයුත්තෙ තීණි. විප්පයුත්තෙ නව. අත්ථියා නව. නත්ථියා තීණි. විගතෙ තීණි. අවිගතෙ නව.

හෙතුපච්චයා ආරම්මණපච්චයා අධිපතියා තීණි. අනන්තරෙ තීණි. සමනන්තරෙ තීණි. සහජාතෙ තීණි. අඤ්ඤමඤ්ඤෙ තීණි. නිස්සයෙ තීණි. උපනිස්සයෙ තීණි. පුරෙජාතෙ තීණි. ආසෙවනෙ තීණි. කම්මෙ තීණි. විපාකෙ එකං. ආහාරෙ තීණි. ඉන්ද්‍රියෙ තීණි. ඣානෙ තීණි. මග්ගෙ තීණි. සම්පයුත්තෙ තීණි. විප්පයුත්තෙ තීණි. අත්ථියා තීණි. නත්ථියා තීණි. විගතෙ තීණි. අවිගතෙ තීණි.

හෙතුපච්චයා ආරම්මණපච්චයා අධිපතිපච්චයා අනන්තරපච්චයා සමනන්තරපච්චයා සහජාතපච්චයා අඤ්ඤමඤ්ඤපච්චයා නිස්සයපච්චයා උපනිස්සයපච්චයා පුරෙජාතපච්චයා ආසෙවනපච්චයා කම්මෙ තීණි, ඣානෙ තීණි. මග්ගෙ තීණි. සම්පයුත්තෙ තීණි. විප්පයුත්තෙ තීණි. අත්ථියා තීණි. නත්ථියා තීණි. විගතෙ තීණි. අවිගතෙ තීණි.

හෙතුපච්චයා ආරම්මණපච්චයා -පෙ- ආසෙවනපච්චයා කම්මපච්චයා ආහාරපච්චයා ඉන්ද්‍රියපච්චයා ඣානපච්චයා මග්ගපච්චයා සම්පයුත්තපච්චයා විප්පයුත්තපච්චයා අත්ථිපච්චයා නත්ථි පච්චයා විගතපච්චයා අවිගතෙ තීණි.

හෙතුපච්චයා ආරම්මණපච්චයො -පෙ- පුරෙජාතපච්චයා කම්මපච්චයා විපාකපච්චයා ආහාරෙ එකං. ඉන්ද්‍රියෙ එකං. ඣානෙ එකං. මග්ගෙ එකං. සම්පයුත්තෙ එකං. විප්පයුත්තෙ එකං. අත්ථියා එකං. නත්ථියා එකං. විගතෙ එකං. අවිගතෙ එකං.

Non-commercial distribution

හෙතුපච්චයා ආරම්මණපච්චයා -පෙ- පුරෙජාතපච්චයා කම්මපච්චයා විපාකපච්චයා ආහාරපච්චයා ඉන්‍ද්‍රියපච්චයා ඣාන පච්චයා මග්ගපච්චයා සම්පයුත්තපච්චයා විප්පයුත්තපච්චයා අත්ථිපච්චයා නත්ථිපච්චයා විගතපච්චයා අවිගතෙ එකං.

## ගණනා හෙතුමූලකා නිට්ඨිතා

ආරම්මණෙ ඨිතෙන සබ්බත්ථ තීණෙව පඤ්හා. ආරම්මණපච්චයා හෙතුයා තීණි. අධිපතියා තීණි. -පෙ- අවිගතෙ තීණි. අධිපති පච්චයා හෙතුයා නව. ආරම්මණෙ තීණි. -පෙ- අවිගතෙ නව. අනන්තර පච්චයා සමනන්තර පච්චයා හෙතුයා තීණි. -පෙ- අවිගතෙ තීණි. සහජාතපච්චයා හෙතුයා නව. -පෙ- අඤ්ඤමඤ්ඤපච්චයා හෙතුයා තීණි. නිස්සය පච්චයා හෙතුයා නව. උපනිස්සයපච්චයා හෙතුයා තීණි. පුරෙජාත පච්චයා හෙතුයා තීණි. ආසෙවන පච්චයා හෙතුයා තීණි. ආරම්මණෙ තීණි. අධිපතියා තීණි. අනන්තරෙ තීණි. සමනන්තරෙ තීණි. සහජාතෙ තීණි. අඤ්ඤමඤ්ඤෙ තීණි. නිස්සයෙ තීණි. උපනිස්සයෙ තීණි. පුරෙජාතෙ තීණි. කම්මෙ තීණි. ආහාරෙ තීණි. ඉන්‍ද්‍රියෙ තීණි. ඣානෙ තීණි. මග්ගෙ තීණි. සම්පයුත්තෙ තීණි. විප්පයුත්තෙ තීණි. අත්ථියා තීණි. නත්ථියා තීණි. විගතෙ තීණි. අවිගතෙ තීණි. ආසෙවන මූලකෙ විපාකං නත්ථි.

කම්මපච්චයා හෙතුයා නව. විපාකපච්චයා හෙතුයා එකං. ආරම්මණෙ එකං. අධිපතියා එකං. අනන්තරෙ එකං. සමනන්තරෙ එකං. සහජාතෙ එකං. අඤ්ඤමඤ්ඤෙ එකං. නිස්සයෙ එකං. උපනිස්සයෙ එකං. පුරෙජාතෙ එකං. කම්මෙ එකං. ආහාරෙ එකං. ඉන්‍ද්‍රියෙ එකං. ඣානෙ එකං. මග්ගෙ එකං. සම්පයුත්තෙ එකං. විප්පයුත්තෙ එකං. අත්ථියා එකං. නත්ථියා එකං. විගතෙ එකං. අවිගතෙ එකං. විපාක මූලකෙ ආසෙවනං නත්ථි.

ආහාරපච්චයා හෙතුයා නව. ඉන්‍ද්‍රියපච්චයා හෙතුයා නව. ඣාන පච්චයා හෙතුයා නව. මග්ගපච්චයා හෙතුයා නව. සම්පයුත්තපච්චයා හෙතුයා තීණි. විප්පයුත්තපච්චයා හෙතුයා නව. අත්ථිපච්චයා හෙතුයා නව. නත්ථිපච්චයා හෙතුයා තීණි. විගතපච්චයා හෙතුයා තීණි. අවිගතපච්චයා හෙතුයා නව. ආරම්මණෙ තීණි. අධිපතියා නව. නත්ථියා තීණි. විගතෙ තීණි. එකෙකං පච්චයං මූලකං කාතුන සජ්ඣායන්තෙන ගණෙතබ්බා ති.

## අනුලෝමං.

Non-commercial distribution

# අනුලෝම සඞ්ඛ්‍යා වාරය.

## සන්නය.

විභඞ්ගවාරයට අනතුරුව සඞ්ඛ්‍යාවාරය වදාළ සේක. එය ද ශුද්ධ සඞ්ඛ්‍යාවාර ද්‍ුකාදි සඞ්ඛ්‍යාවාර වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් ශුද්ධ සඞ්ඛ්‍යාවාරය පළමුකොට වදාළ සේක. එය ද හේතුප්‍රත්‍යය ශුද්ධසඞ්ඛ්‍යා වාරාදි වශයෙන් තෙවිසි වැදෑරුම් වේ. එයින් හේතුප්‍රත්‍යය ශුද්ධසඞ්ඛ්‍යා වාරය පළමු කොට වදාළ සේක. ඒ මෙසේ ය. සහේතුක සිත් එක් සත්තෑව ය, මෝහමූලද්වයයෙහි මෝහවර්ජිත චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය සහේතුක චිත්තජ රූපයෝ ය, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොවුහු හේතුප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. ඒ ධර්මයන් මේ අනුලෝම නයයෙහි නයයට අනුව ද වාරයට අනුව ද ත්‍රිකපදයට අනුව ද කර්තෘ වීම අනුව ද "**හෙතුයා නව**" යි වදාළ සේක. හේතුප්‍රත්‍යයෙහි විසර්ජනා නවයක් ලැබේය යනු අර්ථ යි.

එහි 'නව' යනු කුසලෙන කුසලය ය, කුසලෙන අබ්‍යාකතය ය, කුසලෙන කුසලාබ්‍යාකතය ය, අකුසලෙන අකුසලය ය, අකුසලෙන අබ්‍යාකතය ය, අකුසලෙන අකුසලාබ්‍යාකතය ය, අබ්‍යාකතෙන අබ්‍යාකතය ය, කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය, අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය යන වාර නවය ය.

කුසලෙන කුසලයෙහි "කුසලො ධම්මො" යන කර්තෘපාඨයෙන් කුසල් සිත් එක්විස්සය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා කුසල් සිත් එක්විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධ වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. එ බැවින් ඒ ධර්මයන් ගේ වීථිවිභඞ්ගය "**කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා. කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා , තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා**" යි ඉදිරිය යුතුය. මෙසේ පිළිවෙළින් අභිධෙය අවුලා විභඞ්ග උදුරමින් සියල්ල විස්තර කරනු.

හේතුප්‍රත්‍යය ශුද්ධසඞ්ඛ්‍යාවාරයට අනතුරුව ආරම්මණ ප්‍රත්‍යය ශුද්ධසඞ්ඛ්‍යාවාරය වදාළ සේක. එකුන් අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ආරම්මණ ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. ඒ ධර්මයන් මේ අනුලෝම යෙහි නයයට අනුව ද, වාරයට අනුව ද ත්‍රිකපදයට අනුව ද කර්තෘවීම අනුව ද "**ආරම්මණෙ තීණි.**" යි වදාළ සේක. එහි "තීණි", යනු කුසලෙන කුසලය ය, අකුසලෙන

Non-commercial distribution

අකුසලය ය, අබ්‍යාකතෙන අබ්‍යාකතය ය යන මොහු ය, කතීඃපදයන්ගේ අභිධෙය අවුලා වීථිවිභඞ්ග දක්වමින් විස්තර කරනු.

ආරම්මණ ප්‍රත්‍යය ශුඩසඞ්ඛ්‍යාවාරයට අනතුරු ව අධිපති ප්‍රත්‍යය ශුඩසඞ්ඛ්‍යාවාරය වදාළ සේක. අධිපති වන ධර්මයෙන් අන්‍ය වූ දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ ය සාධිපති චිත්තජ රූපයෝ ය යන මොව්හු අධිපති ප්‍රත්‍යයෝත්පන්නයන් වන ධර්මයෝ ය. ඒ ධර්මයන් මේ අනුලෝමයෙහි නයයට අනුව ද වාරයට අනුව ද තික පදයට අනුව ද කර්මකතීඃ වීම අනුව ද "**අධිපතියා නව**" යි වදාළ සේක." අධිපතිප්‍රත්‍යයෙහි විස්සර්ජනාවාර නවයක් වේය" යනු අර්ථ යි.

එහි "නව" යනු කුසලෙන කුසලය ය, කුසලෙන අබ්‍යාකතය ය, කුසලෙන කුසලාබ්‍යාකතය ය, අකුසලෙන අකුසලය ය, අකුසලෙන අබ්‍යාකතය ය, අකුසලෙන අකුසලාබ්‍යාකතය ය, අබ්‍යාකතෙන අබ්‍යාකතය ය, කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය, අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය යන මොහු ය. අභිධෙය දක්වමින් විභඞ්ග උදුරනු.

අනන්තර ශුඩසඞ්ඛ්‍යා වාරයෙහි සියලු එකුන් අනූ චිත්තය ය චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ අනන්තර ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. -පෙ- "**අනන්තරෙ තීණි**" යි වදාළ සේක. සමනන්තරය ද එසේ ම ය.

සහජාත ශුඩසඞ්ඛ්‍යා වාරයෙහි සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජරූපයෝ ය යන මොවුහු සහජාත ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. -පෙ- "**සහජාතෙ නව**" යි වදාළ සේක. විස්තර කරනු.

අන්‍යෝන්‍ය ශුඩසඞ්ඛ්‍යා වාරයෙහි සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධිනාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන හෘදය වස්තුවය, හෘදයවස්තුවෙන් ප්‍රත්‍යය ලබන ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජාදි මහාභූතයෝ ය යන මොහු අන්‍යොන්‍ය ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න යෝ ය. -පෙ- "**අඤ්ඤමඤ්ඤෙ තීණි**" යි වදාළ සේක.

නිඃශ්‍රය ශුඩසඞ්ඛ්‍යාවාරය සහජාතය මෙන් විස්තර කරනු. උපනිඃශ්‍රය ශුඩසඞ්ඛ්‍යාවාරය ආරම්මණයෙහි මෙන් විස්තර කරනු.

Non-commercial distribution

පුරේජාත ශුධසඞ්ඛ්‍යාවාරයෙහි අරූපවිපාක වර්ජිත පඤ්චවෝකාර ප්‍රවෘත්ති නාමස්කන්ධයෝ පුරේජාතප්‍රත්‍යයෝත්පන්නයෝ ය. -පෙ- **පුරෙජාතෙ තීණි**" යි වදළ සේක.

ආසේවන ශුධසඞ්ඛ්‍යා වාරයෙහි ප්‍රථමජවන ඵලජවන වර්ජිත පශ්චිම පශ්චිම එක්පනස් ජවන නාමස්කන්ධයෝ ආසේවන ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. -පෙ- "**ආසෙවනෙ තීණි**" යි වදළ සේක.

කර්ම ශුධසඞ්ඛ්‍යාවාරයෙහි කුශලාකුශල -ක්‍රියා චේතනා වර්ජිතසකලප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, චිත්තජරූපයෝ ය ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය යන මොහු කර්මප්‍රත්‍යයෝත්පන්නයෝ ය. -පෙ- "**කම්මෙ නව**" යි වදළ සේක.

විපාක ශුධසඞ්ඛ්‍යාවාරයෙහි සකල විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, විපාක චිත්තජරූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොහු විපාක ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. -පෙ- **විපාකෙ එකං.**

ආහාර ශුධසඞ්ඛ්‍යාවාරයෙහි සකලප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, චිත්තජරූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, ආහාරජ රූපයෝ ය යන මොහු ආහාර ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. **ආහාරෙ නව.**

ඉන්ද්‍රිය ශුධසඞ්ඛ්‍යාවාරයෙහි සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, චිත්තජරූපයෝ ය ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය, රූප ජීවිතේන්ද්‍රියයෙන් අන්‍ය වූ අසංඥසත්ත්ව කර්මජරූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොහු ඉන්ද්‍රියප්‍රත්‍යයෝත්පන්නයෝ ය. **ඉන්ද්‍රියෙ නව.**

ධ්‍යාන ශුධසඞ්ඛ්‍යාවාරයෙහි ද්විපඤ්චවිඥානයන් ගෙන් අන්‍ය වූ සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, චිත්තජරූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය යන මොහු ධ්‍යාන ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. **ඣානෙ නව.**

මාර්ග ශුධසඞ්ඛ්‍යාවාරයෙහි සහේතුක සිත් එක්සැත්තෑව ය, චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, සහේතුකචිත්තජ රූපයෝ ය, සහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොහු මාර්ගප්‍රත්‍යයෝත්පන්නයෝ ය. **මග්ගෙ නව.**

සම්ප්‍රයුක්ත ශුධසඞ්ඛ්‍යාවාරයෙහි සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ සම්ප්‍රයුක්තප්‍රත්‍යයෝත්පන්නයෝ ය. **සම්පයුත්තෙ තීණි.**

*Non-commercial distribution*

විප්‍රයුක්ත ශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි අරූපවිපාක වර්ජිත පඤ්ච-වෝකාර ප්‍රවෘත්ති ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය, චිත්තජරූපයෝ ය ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය යන මොව්හු විප්‍රයුක්ත ප්‍රත්‍යයෝත්පන්නයෝ ය, **විප්පයුත්තෙ නව.**

අස්තිප්‍රත්‍යයේ ශුද්ධ සඞ්ඛ්‍යාවාරය සහජාතයෙහි මෙන් විස්තර කරනු. **අත්ථියා නව.** නාස්තිප්‍රත්‍යය ශුද්ධසඞ්ඛ්‍යාවාරය ආරම්මණ යෙහි සේ විස්තර කරනු. **නත්ථියා තීණි.** විගතශුද්ධවාරය ද ආරම්මණයෙහි මෙන් විස්තර කරනු. **විගතෙ තීණි.** අවිගත ශුද්ධසඞ්ඛ්‍යාවාරය සහජාතයෙහි මෙන් විස්තර කරනු. **අවිගතෙ නව.** ශුද්ධ සඞ්ඛ්‍යාවාරය නිමි. හේතුයා නව, ආරම්මණෙ තීණි යනාදි පාලිය ප්‍රගුණ කර ගත යුතුය.

## දුකාදි සඞ්ඛ්‍යා වාරය.

ශුද්ධසඞ්ඛ්‍යාවාරයට අනතුරුව දුකාදිසඞ්ඛ්‍යාවාරය විදාළසේක. එය ද හේතුප්‍රත්‍යය දුකාදි සඞ්ඛ්‍යාවාරය ය ආරම්මණප්‍රත්‍යය දුකාදි සඞ්ඛ්‍යාවාරය ය යනාදි වසයෙන් තෙවිසි වැදෑරුම් වේ. එයින් හේතු ප්‍රත්‍යය දුකාදි සඞ්ඛ්‍යාවාරය පළමු කොට වදළ සේක. එය ද දුක තික -පෙ- තෙවිසතික වසයෙන් තෙ විසි වැදෑරුම් වේ. එයින් දුකවාරය පළමු කොට වදළ සේක. එද හේතුමූලක ආරම්මණ දුකාදි වශයෙන් දෙවිසි වැදෑරුම් වේ. එයින් හේතුමූලක ආරම්මණ දුකසඞ්ඛ්‍යාවාරය පළමුකොට වදළ සේක.

### (හේතුමූලක ආරම්මණ දුකය.)

ඒ හේතුමූලක ආරම්මණදුක සඞ්ඛ්‍යාවාරයෙහි මෝහමූලද්වය යෙහි මෝහය ය අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොහු ආරම්මණ ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයන් ම වී හේතුප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයන් නො වන බැවින් හේතු ප්‍රත්‍යය බැහැර කෙරෙති. එ බැවින් ඒ ධර්මයෝ පච්චනීයානුලෝම යෙහි "**න හෙතු පච්චයා ආරම්මණෙ ද්වෙ**" යි වදරන ලදහ. එහි ද්වෙ යනු අකුසලෙන අකුසලය අබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙවාරය ය.

අකුසලෙන අකුසලයෙහි " අකුසලො ධම්මො" යන කතිඃපාඨයෙන් අවයව වූද සමූහ වූ ද විචිකිත්සා සහගත ඖද්ධත්‍ය සහගත නාමස්කන්ධයන් නිසා උපදනා වූ විචිකිත්සා සහගත ඖද්ධත්‍ය සහගත දෙසිතෙහි මෝහය ලැබේ. එබැවින් ඒ ධර්මයන් ගේ වීථිවිභඞ්ගය "**අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති නහෙතු පච්චයා, ආරම්මණ පච්චයා, විචිකිච්ඡා සහගතෙ උද්ධච්ච සහගතෙ ඛන්ධෙ පටිච්ච විචිකිච්ඡා සහගතො උද්ධච්ච සහගතො මොහො**" යි ඉදිරිය යුතු ය.

Non-commercial distribution

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්ති කාලයෙහි අබ්‍යාකතො ධම්මො යන කර්තෘපාඨයෙන් අහේතුක සිත් අටොළොස ය, ඡන්‍ද වර්ජිත අන්‍ය සමාන චෛතසික දොළොස ය යන අවයව නාමස්කන්‍ධයන් නිසා උපදනා අහේතුක සිත් අටොළොස ය, ඡන්‍ද වර්ජිත අන්‍ය සමාන චෛතසික දොළොස ය යන අවයව නාමස්කන්‍ධයෝ ලැබෙත්. ප්‍රතිසන්‍ධි කාලයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කර්තෘ පාඨයෙන් අහේතුක ප්‍රතිසන්‍ධි දෙක ය, ඡන්‍ද ප්‍රීති වීර්‍ය්‍ය-වර්ජිත අන්‍ය සමාන චෛතසික දසය ය යන අවයව නාමස්කන්‍ධයන් හා හෘදයවස්තුව ද නිසා උපදනා වූ අහේතුක ප්‍රතිසන්‍ධි දෙක ය, චෛතසික දසය ය යන අවයව වූ ද සමූහවූ ද නාමස්කන්‍ධයෝ ලැබෙත්. එ බැවින් ඒ ධර්‍මයන්ගේ වීපීවිභඞ්ගය **"අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති නහෙතු පච්චයා ආරම්මණ පච්චයා, අහෙතුකං විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්‍ධං පටිච්ච තයො ඛන්‍ධා, තයො ඛන්‍ධෙ පටිච්ච එකො ඛන්‍ධො, ද්වෙ ඛන්‍ධෙ පටිච්ච ද්වෙ ඛන්‍ධා, අහෙතුක පටිසන්‍ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්‍ධං පටිච්ච තයො ඛන්‍ධා. තයො ඛන්‍ධෙ පටිච්ච එකො ඛන්‍ධො, ද්වෙ ඛන්‍ධෙ පටිච්ච ද්වෙ ඛන්‍ධා. වත්ථුං පටිච්ච ඛන්‍ධා"** යි ඉදිරිය යුතු ය.

සහේතුක චිත්තජ රූපයෝ ය, සහේතුක ප්‍රතිසන්‍ධි කර්‍මජ රූපයෝ ය යන මෝහ හේතුප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයන් ම වී ආරම්මණ ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්නයන් නො වන බැවින් ආරම්මණ ප්‍රත්‍යය බැහැර කෙරෙති. එබැවින් ඒ ධර්‍මයෝ අනුලෝම පච්චනීයයෙහි **"හෙතුපච්චයා න ආරම්මණෙ පඤ්ච"** යි වදරන ලදහ. එහි පඤ්ච යනු කුසලෙන අබ්‍යාකතය ය, අකුසලෙන අබ්‍යාකතය ය, අබ්‍යාකතෙන අබ්‍යාකතය ය, කුසලාබ්‍යාකතෙන අබ්‍යාකත ය ය, අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකත ය යන මෝහුය. .

කුසලෙන අබ්‍යාකතයෙහි අබ්‍යාකතො යන කර්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් නිසා උපදනා වූ චිත්තජරූපයෝ ලැබෙත්. එබැවින් ඒ ධර්‍මයන් ගේ වීපීවිභඞ්ගය **"කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතු පච්චයා න ආරම්මණ පච්චයා, කුසලෙ ඛන්‍ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං"** යි ඉදිරිය යුතු ය.

අකුසලෙන අබ්‍යාකතයෙහි "අබ්‍යාකතො" යන කර්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුසල් සිත් දොළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූද නාමස්කන්‍ධ

Non-commercial distribution

නිසා උපදනා වූ චිත්තජ රූපයෝ ලැබෙත්. එ බැවින් ඒ ධර්මයන් ගේ වීථිවිභඞ්ගය "**අකුසලං ධම්මං -පෙ- අකුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්ත-සමුට්ඨානං රූපං**" යි ඉදිරිය යුතු ය.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි අබ්‍යාකතො යන කර්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක අභිඥාවද්‍යාති වර්ජිත සහේතුක විපාක සතොළොස ය, සහේතුක ක්‍රියා සතොළොස ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා වූ සහේතුක චිත්තජරූපයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි කර්තෘ පාඨයෙන් සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි තෙළෙස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා වූ කෘතත්වාත් රූපයෝ ලැබෙත්. ශුද්ධ රූපවාරයෙහි කර්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක අභිඥාවද්‍යාති වර්ජිත කුශලා කුශල සහේතුක විපාක සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන සහේතුක චිත්තජමහාභූතයෝ ය සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි තෙළෙස හා උපදනා කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා වූ භූතරූප සහිත වූ සහේතුක චිත්තජ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ උපාදය රූපයෝ ලැබෙත්. එ බැවින් ඒ ධර්මයන් ගේ වීථි විභඞ්ගය "**අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති හෙතුපච්චයා න ආරම්මණපච්චයා, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තා රූපං ඛන්ධෙ පටිච්ච වත්ථු, එකං මහාභූතං පටිච්ච -පෙ- මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, කටත්තාරූපං, උපාදය රූපං**" යි ඉදිරිය යුතු ය.

කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය යන දෙක - හේතුවිභඞ්ගවාරය අනුව විස්තර කරනු.

අහේතුක චිත්තජරූපයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි කර්මජරූප යෝ ය, බාහිරරූපයෝ ය, ආහාරජරූපයෝ ය, ඍතුජරූපයෝ ය, අසංඥසත්ත්වකර්මජරූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජරූපයෝ ය යන ධර්මයෝ හේතු ආරම්මණ ප්‍රත්‍යය දෙදෙනා ගේ ම ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වන්නාහ. එ බැවින් ඒ ධර්මයෝ පච්චනීයයෙහි "**න හෙතුපච්චයා න ආරම්මණෙ එකං**" යි වදාරන ලදහ. එහි එකං යනු අබ්‍යාකතෙන අබ්‍යාකතය ය, එහි අබ්‍යාකතො යන කර්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ද්විපඤ්චවිඥාන වර්ජිත අහේතුක විපාක ක්‍රියාචිත්තයෝ ය

Non-commercial distribution

ඡන්ද වර්ජිත අන්‍යසමාන චෛතසික දෙළොස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි "අබ්‍යාකතො" යන කර්‍තෘපාඨයෙන් අහේතුකප්‍රතිසන්ධි දෙක ය ඡන්ද ප්‍රීති වීර්‍ය්‍යයී වර්ජිත අන්‍යසමාන චෛතසික දසය ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා වූ කෘතත්වාත් රූපයෝ ලැබෙත්. ශුද්ධරූපවාරයෙහි කර්‍තෘ පාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ද්විපඤ්චවිඥානවර්ජිත අහේතුක විපාක අහේතුකක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන චිත්තජමහාභූතයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි දෙක හා උපදනා කර්මජ මහාභූතයෝ ය, බාහිර මහාභූතයෝ ය, ආහාරජ මහාභූතයෝය, සෘතුජ මහාභූතයෝ ය, අසංඥ-සත්ත්වකර්මජ මහාභූතයෝ ය, ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා වූ භූතරූපසහිත වූ චිත්තජ උපාදය අහේතුක ප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ සෘතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදායරූපයෝ ලැබෙත්. එබැවින් ඒ ධර්මයන් ගේ විපීවිභඞ්ගය "**අබ්‍යාකතං ධම්මං පටිච්ච -පෙ- අහෙතුකවිපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, අහෙතුක පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තාරූපං ඛන්ධෙ පටිච්ච වත්ථු, එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා -පෙ- මහා භූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, කටත්තා රූපං. උපාදය රූපං -බාහිරං එකං මහාභූතං -පෙ- මහාභූතෙ පටිච්ච උපාදයරූපං, ආහාර සමුට්ඨානං -පෙ- උතුසමුට්ඨානං - පෙ- අසඤ්ඤසත්තානං එකං මහාභූතං -පෙ- මහාභූතෙ පටිච්ච කටත්තාරූපං උපාදය රූපං**" යි ඉදිරිය යුතු ය.

සහේතුක සිත් එක්සැත්තෑව ය මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත චෛතසික දෙපනස ය යන සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ හේතු ආරම්මණ ප්‍රත්‍යය දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. එ බැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමයෙහි නයයට අනුව ද; වාරයට අනුව ද, ත්‍රිකපදාභිධෙයයට අනුව ද කර්ම කර්‍තෘ දෙකට අනුව ද"**හෙතු පච්චයා ආරම්මණෙ තීණි**" යි වදරන ලදහ. "තීණි" යනු කුසලෙන කුසලය ය, අකුසලෙන අකුසලය ය, අබ්‍යාකතෙන අබ්‍යාකතය ය යන මොහු ය.

කුසලෙන කුසලය ය අකුසලෙන අකුසලය ය යන වාර දෙක හේතුප්‍රත්‍යය අනුව අභිධෙය අවුලා විභඞ්ග උදුරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කර්‍තෘපාඨයෙන් සහේතුකවිපාක එක්විස්ස ය, සහේතුක ක්‍රියා සතළොස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ සහේතුකවිපාක එක්විස්ස ය, සහේතුකක්‍රියා සතළොස ය, චෛතසික අටතිස ය යන අව

Non-commercial distribution

යව නාමස්කන්ධයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි කත්‍රෑපාඨයෙන් සහේතුකප්‍රතිසන්ධි සතොළොස ය, චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයන් හා හෘදයවස්තුව ද නිසා උපදනා වූ සහේතුකප්‍රතිසන්ධි සතොළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්. එබැවින් ඒ ධර්මයන්ගේ වීථිවිභඞ්ගය "**අබ්‍යාකතං ධම්මං පටිච්ච -පෙ- විපාකාබ්‍යාකතං -පෙ- වත්ථුං පටිච්ච ඛන්ධා**" යි ඉදිරිය යුතු ය (ආරම්මණවිභඞ්ගය අනුව පාලිය යොදනු.)

**(හේතුමූලක අධිපති දුක ය.)**

හේතුමූල අධිපතිදුකයෙහි අධිපතිප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න වී හේතුප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්මයක් නැත්තේ ය. එ බැවින් පච්චනියානුලෝමයෙහි "න හෙතුපච්චයා අධිපතියා" යනාදීන් වාරයක් නො වදළ සේක.

ඒ ඒ අවස්ථාවට අධිපති වන ධර්මය හා මෝහමූලද්වයයෙහි මෝහය හැර අකුසල් සිත් දොළොස ය, මහා කුශල මහා ක්‍රියාය, සහේතුක ලෞකික විපාකයෝ ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, නිරාධිපති චිත්තජරූපයෝ ය සහේතුකප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොව්හූ හේතුප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න වී අධිපති ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න නො වන බැවින් අධිපති ප්‍රත්‍යය බැහැර කෙරෙති, එබැවින් ඒ ධර්මයෝ අනුලෝමපච්චනිය යෙහි "**හෙතුපච්චයා න අධිපතියා නව**" යි වදරන ලදහ. එහි 'නව' යනු කුසලෙන කුසලය ය, -පෙ- කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය යන මොහුය.

කුසලෙන කුසලයෙහි කත්‍රෑපාඨයෙන් අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාකුසල් සිත් අට ය, නියමයෙන් අධිපති ප්‍රත්‍යය ලැබෙන මහද්ගත කුශල නවය ය, මාර්ගසිත් සතර ය, චෛතසික අට තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා වූ අධිපති ධර්මයෝ ය, අධිපතිප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි වූ මහා කුසල්සිත් අට ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ මහාකුසල් අට ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. (විභඞ්ගය හේතුවෙහි මෙන් උදුරනු.)

කුසලෙන අබ්‍යාකතයෙහි අබ්‍යාකතො යන කත්‍රෑපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි වූ මහාකුසල් සිත් අට ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා නිරාධිපතිචිත්තජරූපයෝ ලැබෙත්. (හේතුවිභඞ්ගය සේ විස්තර කරනු.)

Non-commercial distribution

කුසලෙන කුසලාබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි වූ මහාකුසල් සිත් අට ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා මහාකුසල් සිත් අට ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් විසින් උපදවන නිරාධිපති චිත්තජරූපයෝ ය යන මොව්හු ලැබෙත්. (විභඞ්ගය හේතුව අනුව උදුරනු.)

අකුසලෙන අකුසලයෙහි කතීඃපාඨයෙන් අධිපතිප්‍රත්‍යය ලබන අවස්ථාවෙහි වූ ලෝභමූල සිත් අට ය, ද්වේෂමූලසිත් දෙක ය, විචිකිත්සා වර්ජිත චෛතසික සවිස්ස ය යන මොවුන් නිසා උපදනා අධිපති ධර්මයෝ ය, අධිපති ප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි වූ අකුසල්සිත් දොළොස ය, මෝහමූල ද්වයෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය උදුරනු.

අකුසලෙන අබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි අකුසල්සිත් දොළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා නිරාධිපති චිත්තජරූපයෝ ලැබෙත්. විභඞ්ගය හේතු ප්‍රත්‍යය අනුව උදුරනු.

අකුසලෙන අකුසලාබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි වූ අකුසල් සිත් දොළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ අකුසල් සිත් දොළොස ය, මෝහමූලයෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්සය යන අවයව නාමස්කන්ධයෝය, ඒ නාමස්කන්ධයන් විසින් උපදවන නිරාධිපති චිත්තජරූපයෝ ය යන මොව්හු ලැබෙත්, විභඞ්ගය හේතුවිභඞ්ගය අනුව විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි අබ්‍යාකතො යන කතීඃපාඨයෙන් අධිපති ප්‍රත්‍යය ලබන අවස්ථාවෙහි වූ මහා ක්‍රියා සිත් අට ය, අධිපති ප්‍රත්‍යය නියමයෙන් ලබන මහද්ගත ක්‍රියා නවය ය ඵලසිත් සතර ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්මයෝ ය, අධිපති ප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි වූ මහාක්‍රියා සිත් අට ය, සහේතුක ලෞකික විපාක සිත් සතොළොස ය, චෛතසික පන්තිස ය, යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා මහා ක්‍රියා සිත් අට ය, සහේතුක ලෞකික විපාක සතොළොස ය, චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් නිසා උපදනා නිරාධිපති චිත්තජරූපයෝ ය යන මොවුහු ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි අභිධෙය

Non-commercial distribution

හේතුප්‍රත්‍යයෙහි මෙන් ගන්නේ ය. ශුද්ධරූපවාරයෙහි කර්‍තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක අභිඥාවයුති වර්ජිත නිරාධිපති කුශලාකුශල සහේතුක විපාක සහේතුකක්‍රියා නාමස්කන්‍ධයන් විසින් සුදුසු පරිදි උපදවන නිරාධිපති චිත්තජ මහාභූතයෝ ය, සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්‍ධි තෙළෙස හා සුදුසු පරිදි උපදනා සහේතුක කර්‍මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ නිරාධිපති සහේතුක චිත්තජ උපාදය රූපයෝ ය, සහේතුක ප්‍රතිසන්‍ධි කර්‍මජ උපාදය රූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්‍මයෝ ලැබෙත්. වීපීවිභඞ්ගය හේතුප්‍රත්‍යය අනුව උදුරනු.

කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කර්‍තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි වූ මහාකුසල් සිත් අට ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් හා මහාභූතයන් නිසා උපදනා වූ නිරාධිපති චිත්තජ රූපයෝ ලැබෙත්. විභඞ්ගය හේතුව අනුව උදුරනු.

අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කර්‍තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි අධිපතිප්‍රත්‍යය නො ලබන අවස්ථා-වෙහි වූ අකුසල් සිත් දොළොසය, චෛතසික සත් විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් හා මහාභූතයන් නිසා උපදනා නිරාධිපති චිත්තජරූපයෝ ලැබෙත්. විභඞ්ගය හේතු විභඞ්ගය අනුව උදුරනු.

මෝහමූලද්වයයෙහි මෝහය ය, අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්‍ධි නාමස්කන්‍ධයෝ ය, අහේතුක චිත්තජරූපයෝ ය, අහේතුක ප්‍රතිසන්‍ධි කර්‍මජරූපයෝ ය, බාහිරරූපයෝ ය, ආහාරජරූපයෝ ය, ඍතුජරූපයෝ ය, අසංඥසත්ත්ව කර්‍මජරූපයෝ ය, ප්‍රවෘත්ති කර්‍මජ රූපයෝ ය යන මොව්හු හේතු ආරම්මණ ප්‍රත්‍යය දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. එ බැවින් ඒ ධර්‍මයෝ පච්චනියයෙහි **"න හෙතුපච්චයා නාධිපතියා ද්වෙ"** යි වදරන ලදහ. ද්වෙ යනු අකුසලෙන අකුසල ය අබ්‍යාකතෙන අබ්‍යාකත ය යන මොහු ය. අකුසලෙන අකුසලයෙහි අභිධෙය අවුලා විභඞ්ගය උදුරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි අබ්‍යාකතො යන කර්‍තෘපාඨයෙන් අහේතුක සිත් අටොළොස ය, ඡන්‍දවර්ජිත අන්‍යසමාන චෛතසික දොළොස ය යන අවයව නාමස්කන්‍ධයන් නිසා උපදනා අහේතුක සිත් අටළොස ය, ඡන්‍දවර්ජිත අන්‍යසමාන දොළොස ය යන අවයව නාමස්කන්‍ධයන් හා ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ද

Non-commercial distribution

ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි කතීඃ පාඨයෙන් අහේතුක ප්‍රතිසන්ධි දෙක ය; ඡන්ද ප්‍රීති වීර්‍ය්‍යයෝ වර්ජිත අන්‍යසමාන චෛතසික දශය ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා හෘදය වස්තුව නිසා උපදනා අහේතුක ප්‍රතිසන්ධි දෙක ය, චෛතසික දශය ය යන අවයව වූ ද, අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා කෘතත්වාත් රූපයෝ ලැබෙත්. ගූඪරූපවාරයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ද්විපඤ්චවිඥාන වර්ජිත අහේතුක විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් උපදවන අහේතුක චිත්තජමහාභූතයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා සූදුසු පරිදි උපදනා අහේතුක ප්‍රතිසන්ධි කර්මජ මහාභූතයෝ ය. බාහ්‍ය, ආහාරජ, ඍතුජ, අසංඥසත්ත්ව කර්මජ, ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ උපාදය රූපයෝ ලැබෙත්. එබැවින් ඒ ධර්මයන්ගේ විපීවිභඞ්ගය "**අබ්‍යාකතං -පෙ- නාධිපති පච්චයා, අහේතුකංවිපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්ත සමුට්ඨාන ඤ්ච රූපං -පෙ- අහෙතුක පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තා ච රූපං -පෙ- ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා, එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා -පෙ- මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තා රූපං උපාදය රූපං, බාහිරං, -පෙ- ආහාර සමුට්ඨානං -පෙ- උතුසමුට්ඨානං -පෙ- අසඤ්ඤ සත්තානං -පෙ- රූපං**" යි ඉදිරිය යුතු ය.

අධිපති වන ධර්මයන්ගෙන් අන්‍ය වූ දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ ය, සාධිපති චිත්තජරූපයෝ ය යන මොහු හේතු අධිපති ප්‍රත්‍යය දෙක්හි ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙති. එ බැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමයෙහි -පෙ- "**හේතුපච්චයා අධිපතියා නව**" යි වදරන ලදහ. 'නව' යනු කුසලෙන කුසලය ය, -පෙ- අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය යන මොහු ය. අධිපති ප්‍රත්‍යයෙහි මෙන් අභිධෙය අවුලමින් විභඞ්ග උදුරනු.

**හෙතු මූලක අනන්තර සමනන්තර දුක දෙක ආරම්මණ දුකය** අනුව විස්තර කරනු.

**(හෙතුමූලක සහජාත දුකය.)**

හේතුමූලක සහජාත දුකයෙහි මෝහමූලද්වයෙහි මෝහය අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අහේතුකචිත්තජරූපයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසඥසත්ත්වකර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති

Non-commercial distribution

කර්‍මජ රූපයෝ ය යන මොහු සහජාත ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න වී හේතුප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න නො වන බැවින් හේතුප්‍රත්‍යය බැහැර කෙරෙති. එබැවින් එ ධර්‍මයෝ පච්චනීයානුලෝමයෙහි **"න හෙතුපච්චයා සහජාතෙ ද්වෙ"** යි වදාරන ලදහ. ද්වේ යනු අකුසලෙන අබ්‍යාකතය හා අබ්‍යාකතෙන අබ්‍යාකතය ය. අකුසලෙන අකුසලයෙහි අභිධෙය අවුලා විභඞ්ග උදුරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතීපායයෙන් අහේතුක සිත් අටළොස ය, ඡන්‍ද වර්ජිත අන්‍යසමාන චෛතසික දෙළොසය යන අවයව නාමස්කන්‍ධයන් නිසා උපදනා වූ අහේතුක සිත් අටොළොස ය ඡන්‍ද වර්ජිත අන්‍ය සමාන චෛතසික දෙළොසය යන අවයව නාමස්කන්‍ධයෝ ය, ඒ නාමස්කන්‍ධයන් විසින් උපදවන චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. ප්‍රතිසන්‍ධිකාලයෙහි කතීපායයෙන් අහේතුක ප්‍රතිසන්‍ධි දෙක ය, ඡන්‍ද, ප්‍රීති, වීර්‍ය්‍ය, වර්ජිත අන්‍යසමාන චෛතසික දශ ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්‍ධයන් හා කෘත්‍යත්වාත් රූපයෝ ලැබෙත්. ශුද්ධරූපවාරයේ අභිධෙය ආරම්මණ දුකයෙහි පච්චනීයයෙහි මෙන් ගන්නේ ය. ඒ ධර්‍මයන් ගේ වීථි විභඞ්ගය **"අබ්‍යාකතං -පෙ- න හෙතු පච්චයා සහජාතපච්චයා අහෙතුක විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්‍ධං පටිච්ච තයො ඛන්‍ධා චිත්ත සමුට්ඨාන ඤ්ච රූපං -පෙ- අහෙතුක පටිසන්‍ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්‍ධං පටිච්ච තයො ඛන්‍ධා කටත්තා ච රූපං -පෙ- ද්වෙ ඛන්‍ධා -පෙ- බාහිරං -පෙ- ආහාරසමුට්ඨානං -පෙ- උතුසමුට්ඨානං -පෙ- අසඤ්ඤසත්තානං -පෙ- රූපං"** යි උදුළ යුතුය.

හේතුප්‍රත්‍යයයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී සහජාතප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්‍මයක් නැත්තේ ය. එබැවින් අනුලෝම පච්චනීයයෙහි "හෙතුපච්චයා න සහජාතෙ" යනාදිය නො වදළ සේක.

හේතු සහජාත දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්‍මයක් ද නැත්තේ ය. එබැවින් පච්චනීයයෙහි "න හෙතුපච්චයා න සහජාතෙ" යනාදිය නො වදළ සේක.

සහේතුකසිත් එක්සැත්තෑව ය, මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත චෛතසික දෙපනස ය, යන සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්‍ධි නාමස්කන්‍ධයෝ ය. සහේතුක චිත්තජරූපයෝ ය, සහේතුක ප්‍රතිසන්‍ධි කර්‍මජරූපයෝ ය, යන මොව්හු හේතු සහජාත දෙක්හිම ප්‍රත්‍ය-යෝත්පන්නයෝ වෙති. එ බැවින් ඒ ධර්‍මයෝ මේ අනුලෝමයෙහි -පෙ-

Non-commercial distribution

**"හෙතුපච්චයා සහජාතෙ නව"** යි වදරන ලදහ. හේතුප්‍රත්‍යයෙහි මෙන් විස්තර කරනු.

**(හේතුමූලක අඤ්ඤමඤ්ඤ දුකය.)**

හේතුමූලක අඤ්ඤමඤ්ඤ දුකයෙහි මෝහමූලද්වයයෙහි මෝහය ය, අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තුව ය, ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන අහේතුක චිත්තජ අහේතුක ප්‍රතිසන්ධි කර්මජ බාහ්‍ය ආහාරජ සෘතුජ අසඥසත්ත කර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොව්හූ අන්‍යෝන්‍ය ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී හේතු ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න නො වීමෙන් හේතු ප්‍රත්‍යය බැහැර කරති. එ බැවින් ඒ ධර්මයෝ පච්චනියානුලෝමයෙහි **"න හෙතු පච්චයා අඤ්ඤමඤ්ඤෙ ද්වෙ"** යි වදරන ලදහ. "ද්වේ" යනු අකුසලෙන අකුසලය අබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙවාරය ය. අකුසලෙන අකුසලය ආරම්මණයෙහි මෙන් විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලවාරය ආරම්මණ දුකය අනුව විස්තර කරනු. ප්‍රතිසන්ධිකාලයෙහි කර්තෘපාඨයෙන් අහේතුක ප්‍රතිසන්ධි දෙක ය, ඡන්ද ප්‍රීති වීර්‍ය්‍ය වර්ජිත අන්‍යසමාන චෛතසික දශය ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධ හෘදය වස්තූන් නිසා උපදනා වූ අහේතුකප්‍රතිසන්ධි දෙක ය ඡන්ද ප්‍රීති වීර්‍ය්‍ය වර්ජිත අන්‍යසමාන චෛතසික දශය ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා හෘදය වස්තුව ද වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. ශුද්ධරූපවාරයෙහි කර්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ද්විපඤ්ච විඥ්ඥාණ වර්ජිත අහේතුක විපාකක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන අහේතුක චිත්තජ මහාභූතයෝය, අහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා උපදනා අහේතුක ප්‍රතිසන්ධිකර්මජ මහාභූතයෝ ය, බාහ්‍යමහාභූතයෝ ය, ආහාරජ මහාභූතයෝ ය, සෘතුජමහා භූතයෝ ය, අසංඥසත්ත්වකර්මජ මහාභූතයෝ ය, ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා මහාභූතවූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. එබැවින් ඒ ධර්මයන්ගේ වීථි විභඞ්ගය **"අබ්‍යාකතං ධම්මං පටිච්ච -පෙ- පච්චයා. අහෙතුක විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා. අහෙතුක පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා වත්ථු ච, ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා, එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා -පෙ- මහාභූතා, බාහිරං ආහාරසමුට්ඨානං**

Non-commercial distribution

උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච -පෙ- ද්වෙ මහාභූතා" යි ඉදිරිය යුතුය.

නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන සහේතුක චිත්තජ රූපයෝ ය හෘදයවස්තුවෙන් අන්‍ය වූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය මහා භූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන සහේතුක චිත්තජ උපාදය රූපයෝ ය සහේතුක ප්‍රතිසන්ධි කර්මජ උපාදයරූපයෝ ය යන මේ ධර්මයෝ හේතු ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී අන්‍යෝන්‍ය ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න නො වන බැවින් අන්‍යෝන්‍ය ප්‍රත්‍යය බැහැර කෙරෙති. එබැවින් ඒ ධර්මයෝ අනුලෝම පච්චනියයෙහි **"හෙතුපච්චයා න අඤ්ඤමඤ්ඤ පඤ්ච"** යි වදරන ලදහ. 'පඤ්ච' යනු කුසලෙන අබ්‍යාකත ය, අකුසලෙන අබ්‍යාකතය, අබ්‍යාකතෙන අබ්‍යාකතය, කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය, අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය යන මොහු ය

කුසලෙන අබ්‍යාකතය අකුසලෙන අබ්‍යාකතය යන දෙවාරය ආරම්මණදුකය මෙන් විස්තර කරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලවාරය ආරම්මණ දුකය අනුව විස්තර කරනු. ප්‍රතිසන්ධිකාලයෙහි කර්මොපාධයෙන් සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි තෙළෙස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා හෘදය වස්තුවෙන් අන්‍ය වූ කෘතත්වාත් රූපයෝ ලැබෙත්. ශුධරූපවාරයෙහි කර්මොපාධයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක අභිඥාවෘති වර්ජිත කුශලාකුශල සහේතුක විපාක සහේතුකක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන සහේතුක චිත්තජ මහාභූතයෝ ය, සහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්ධි තෙළෙස හා සුදුසු පරිදි උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා වූ සහේතුක චිත්තජ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ උපාදයරූපයෝ ලැබෙත්. එ බැවින් -පෙ- **"අබ්‍යාකතං ධම්මං -පෙ- න අඤ්ඤමඤ්ඤපච්චයා, විපාකබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තා රූපං මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තා රූපං උපාදය රූපං"**යි ඉදිරිය යුතු ය.

කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙවාරය ආරම්මණදුකය අනුව විස්තර කරන්නේ ය.

නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන අහේතුක චිත්තජ රූපයෝ ය, **හෘදයවස්තුවෙන්** අන්‍ය වූ අහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, මහාභූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන අහේතුක චිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ

Non-commercial distribution

උපාදයරූපයෝ ය බාහ්‍යආහාරජ සෘතුජ අසඤ්ඤසත්ත්වකර්මජ ප්‍රවෘත්ති කර්මජ උපාදය රූපයෝ ය යන මොහු හේතු අන්‍යෝන්‍ය ප්‍රත්‍යය දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. එබැවින් ඒ ධර්මයෝ පච්චනීයයෙහි **"න හෙතුපච්චයා න අඤ්ඤමඤ්ඤෙ එකං"**යි වදරන ලදහ. එය අබ්‍යාකතෙන අබ්‍යාකතය ය. එහි ප්‍රවෘත්තිකාලයේ අභිධෙය ආරම්මණ දූකයෙහි මෙන් ගන්නේ ය. ප්‍රතිසන්ධිකාලයේහි අහේතුක ප්‍රතිසන්ධි දෙක ය, ඡන්ද ප්‍රීති වීර්‍ය්‍ය වර්ජිත අන්‍යසමාන චෛතසික දශය ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා හෘදයවස්තුවෙන් අන්‍ය වූ අහේතුක ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ලැබෙත්. ශුද්ධරූපවාරයෙහි කත්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ද්විපඤ්චවිඥාන වර්ජිත අහේතුක විපාක අහේතුක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන අහේතුක චිත්තජ මහාභූතයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි දෙක හා සුදුසු පරිදි උපදනා අහේතුක ප්‍රතිසන්ධි කර්මජ මහාභූතයෝ ය බාහිර මහාභූතයෝ ය ආහාරජ මහාභූතයෝ ය සෘතුජ මහාභූතයෝ ය අසඤ්ඤසත්ත්ව කර්මජ මහාභූතයෝ ය ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා අහේතුක චිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ සෘතුජ අසඤ්ඤසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදය රූපයෝ ලැබෙත්, එබැවින් **"අබ්‍යාකතං -පෙ- අහෙතුකවිපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං අහෙතුක පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තාරූපං, මහාභූතෙ පටිච්චචිත්තසමුට්ඨානං රූපං උපාදය රූපං, බාහිරෙ මහාභූතෙ පටිච්ච උපාදයරූපං, උතුසමුට්ඨානෙ මහාභූතෙ පටිච්ච උපාදයරූපං, අසඤ්ඤසත්තානං මහාභූතෙ පටිච්ච කටත්තාරූපං, උපාදයරූපං"**යි ඉදිරිය යුතු ය.

සහේතුක සිත් එක්සැත්තෑව ය මෝහමූලද්වයෙහි මෝහවර්ජිත චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය සහේතුක ප්‍රතිසන්ධිනාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තුව ය ඔවුනොවුන් ගෙන් ප්‍රත්‍යය ලබන සහේතුක චිත්තජමහාභූතයෝ ය සහේතුක ප්‍රතිසන්ධිකර්මජ මහාභූතයෝ ය යන මේ ධර්මයෝ හේතු අන්‍යෝන්‍ය ප්‍රත්‍යය දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. ඒ බැවින් -පෙ- "හෙතුපච්චයා අඤ්ඤමඤ්ඤෙ තීණි"යි වදරන ලදහ. තීණි යනු කුසලෙන කුසලය අකුසලෙන අකුසලය අබ්‍යාකතෙන අබ්‍යාකතය යන මොහු ය. කුසලෙන කුසලය අකුසලෙන අකුසලය යන දෙවාරය ආරම්මණදූකය අනුව විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි ආරම්මණයෙහි සේ අභිධෙය අවුලනු. ප්‍රතිසන්ධිකාලයෙහි කත්තෘපාඨයෙන් සහේතුක

Non-commercial distribution

ප්‍රතිසන්ධි සතළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා හෘදයවස්තුව නිසා උපදනා වූ සහේතුක ප්‍රතිසන්ධි සතොළොසය චෛතසික පන්තිසය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා හෘදයවස්තුව ලැබේ. ශුධරූපවාරයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහිවූ අරූප විපාක අභිඥාවන්‍යුති වර්ජිත කුශලාකුශල සහේතුකවිපාක සහේතුකක්‍රියා නාමස්කන්ධයන් විසින් උපදවන සහේතුකචිත්තජ මහාභූතයෝ ය, සහේතුකපඤ්චවෝකාරප්‍රතිසන්ධි තෙළෙස හා සූදූස පරිදි උපදනා වූ ප්‍රතිසන්ධිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා මහාභූත වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. විභඞ්ගය අඤ්ඤමඤ්ඤ විභඞ්ගය සේ උදුරත්‍ත.

**හේතුමූලක නිඃශ්‍රයද්විකය** සහජාතදුකය අනුව විස්තර කරත්‍ත. **හේතුමූලක උපනිඃශ්‍රය ද්විකය** ආරම්මණ දුකය සේ විස්තර කරත්‍ත.

**(හේතුමූලක පූරේජාත දුකය.)**

හේතුමූලක පූරේජාත දුකයෙහි පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මෝහමූලද්වයෙහි මෝහය ය අහේතුක ප්‍රවෘත්ති නාමස්කන්ධ සතර ය යන මොහු -පෙ- "**න හෙතුපච්චයා පුරෙජාතෙ ද්වෙ**" යි වදරන ලදහ. ද්වේ යත්‍ත අකුසලෙන අකුශලය අබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙවාරය ය.

අකුසලෙන අකුසලයෙහි "අකුසලො" යන කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ විචිකිච්ඡාසහගත උද්ධච්ච සහගත දෙසිත ය චෛතසික තුදුස ය යන අවයව වූ ද සමූහ වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා විචිකිච්ඡාසහගත උද්ධච්චසහගත මෝහය ලැබේ. එ බැවින් ඒ ධර්මයන්ගේ පිටිවිභඞ්ගයන් "**අකුසලං -පෙ- පුරෙජාතපච්චයා, විචිකිච්ඡා සහගතෙ උද්ධච්ච සහගතෙ ඛන්ධෙ පටිච්ච විචිකිච්ඡා සහගතො උද්ධච්ච සහගතො මොහො උප්පජ්ජති පුරෙජාත පච්චයා**" ය ඉදිරිය යුතුය.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අහේතුක විපාක අහේතුක ක්‍රියා චිත්තයෝ ය, ඡන්ද වර්ජිත අන්‍යසමාන චෛතසික දොළොස ය යන අවයව නාමසකන්ධයන් නිසා උපදනා -පෙ- ලැබෙත්. -පෙ- "**අබ්‍යාකතං -පෙ- පච්චයා, අහෙතුකංවිපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං -පෙ- උප්පජ්ජති පුරෙජාත පච්චයා**"යි ඉදිරිය යුතු ය.

Non-commercial distribution

අරූපවිපාක සතර ය අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභ-මූලද්වයෙහි මෝහ වර්ජිත වූ ලෝභමූල මෝහමූල මහාකුශල මහාක්‍රියා අරූප කුශල අරූපක්‍රියාවෝ ය, ප්‍රථම මාර්ග වර්ජිත ලෝකෝත්තර නාමස්කන්ධයෝ ය සහේතුකචිත්තජ රූපයෝ ය සහේතුකප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොහූ හේතුප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න වී පූර්වජාත ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න නො වන බැවින් පූර්වජාතප්‍රත්‍යය බැහැර කෙරෙති. එ බැවින් -පෙ- **හේතුපච්චයා න පුරෙජාතෙ සත්ත**" යි වදාරන ලදහ. "සත්ත" යනු කුසලෙන කුසලය, කුසලෙන අබ්‍යාකතය, අකුසලෙන අකුසලය, අකුසලෙන අබ්‍යාකතය, අබ්‍යාකතෙන අබ්‍යාකතය, කුසලාබ්‍යා-කතෙන අබ්‍යාකතය, අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය යන මොහූ ය.

කුසලෙන කුසලයෙහි කත්‍ථපාඨයෙන් අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මහා කුසල් අට ය අරූපකුසල් සතර ය උපරිම මාර්ගත්‍රය ය චෛතසික සතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ මහාකුසල් අට ය අරූප කුසල් සතරය, උපරිමමාර්ගත්‍රයය චෛතසික සතිසය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍යයයෝත්පන්නයෝ ලැබෙත්, එ බැවින් ඒ ධර්මයන් ගේ විපීවිභඞ්ගයන් "**කුසලං -පෙ- හෙතුපච්චයා න පුරෙජාත පච්චයා, අරූපෙ කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා තයො ඛන්ධෙ පටිච්ච තයො ඛන්ධා තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා**,"යි ඉදිරිය යුතු ය,

කුසලෙන අබ්‍යාකතයෙහි කත්‍ථපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ලැබෙත්. එ බැවින් ඒ ධර්මයන් ගේ වීපී විභඞ්ගයන් "කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො -පෙ- කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං"යි ඉදිරිය යුතු ය.

අකුසලෙන අකුසලයෙහි කත්‍ථපාඨයෙන් අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල සිත් අට ය මෝහමූල සිත් දෙක ය චෛතසික දෙවිස්ස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ ලෝභමූල සිත් අට ය මෝහ මූල සිත් දෙක ය මෝහ මූලයෙහි මෝහ වර්ජිත චෛතසික තෙවිස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. එ බැවින් -පෙ- **අරූපෙ අකුසලං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා**" යි ඉදිරිය යුතු ය. අකුසලෙන අබ්‍යාකතය ආරම්මණ දූකයෙහි මෙන් විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කත්‍ථපාඨයෙන් අරූපවිපාක සතර ය අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මහා ක්‍රියා

Non-commercial distribution

අට ය අරූපක්‍රියා සතර ය එලසිත් සතරය චෛතසික සතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ අරූප විපාක සතර ය අරූප භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මහාක්‍රියා අට ය අරූපක්‍රියා සතර ය එලසිත් සතර ය චෛතසික සතිස ය යන අවයව නාමස්කන්ධයෝ ය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක අභිඥා ව්‍යුති වර්ජිත සහේතුකවිපාක සතොළොස ය සහේතුක ක්‍රියා සතොළොස ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිවාරයෙහි හා ශුද්ධරූපවාරයෙහි අභිධෙය හේතු විභඞ්ගයෙහි මෙන් ගන්නේ ය. විභඞ්ගය "**අබ්‍යාකතං ධම්මං පටිච්ච -පෙ- හෙතුපච්චයා න පුරෙජාතපච්චයා, අරූපෙ විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා -පෙ- විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්චචිත්තසමුට්ඨානං රූපං පටිසන්ධික්ඛණෙ**" හේතුවෙහි මෙන් උදුරනු. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය යන දෙවාර හේතුවිභඞ්ගවාරය මෙන් විස්තර කරනු.

අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මෝහමූලද්වයයෙහි මෝහය ය, මනෝද්වාරාවර්ජන ය, අහේතුක පඤ්චවෝකාර භූමියෙහි ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර යඃ අහේතුක චිත්තජරූපයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය බාහිර රූපයෝ ය, ආහාරජරූපයෝ ය, සෘතුජරූපයෝ ය, අසංඥසත්ත්වකර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මේ ධර්මයෝ හේතු පූර්වජාත ප්‍රත්‍යය දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. එ බැවින් ඒ ධර්මයෝ පච්චනීයයෙහි "**න හෙතුපච්චයා න පුරේජාතෙ ද්වෙ**" යි වදරන ලදහ. ද්වේ යනු අකුසලෙන අකුසලය අබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙක ය.

අකුසලෙන අකුසලයෙහි "අකුසලො" යන කතීෘපාඨයෙන් විචිකිච්ඡාඋද්ධච්චසහගත දෙසිත ය චෛතසික තුදුස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා විචිකිච්ඡාසහගත උද්ධච්චසහගත දෙසිතෙහි මෝහය ලැබේ. එ බැවින් ඒ ධර්මයෝ වීථි විභඞ්ගය "**අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති න හෙතුපච්චයා, න පුරෙජාත පච්චයා, අරූපෙ විචිකිච්ඡාසහගතෙ උද්ධච්චසහගතෙ ඛන්ධෙ පටිච්ච විචිකිච්ඡාසහගතො උද්ධච්චසහගතො මොහො**" යි ඉදිරිය යුතු ය.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි "අබ්‍යාකතො" යන කතීෘපාඨයෙන් අරූපභූමියෙහි උපදනා මනෝද්වාරාවර්ජනය ය ඡන්ද ප්‍රීති වර්ජිත අන්‍යසමාන චෛතසික එකොළොස ය යන අවයව

Non-commercial distribution

නාමස්කන්ධයන් නිසා උපදනා අවයව නාමස්කන්ධයෝ ය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ද්විපඤ්චවිඥානයන් ගෙන් අන්‍ය වූ අහේතුක විපාක ක්‍රියාවෝ ය, ඡන්ද වර්ජිත අන්‍යසමාන චෛතසික දෙළොසය ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. ප්‍රතිසන්ධි කාලයෙහි කතීපායයෙන් අහේතුකප්‍රතිසන්ධි දෙක ය ඡන්ද ප්‍රීති වීර්‍ය්‍ය වර්ජිත අන්‍යසමාන දශය ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා හෘදය වස්තුව නිසා උපදනා වූ අහේතුක ප්‍රතිසන්ධි දෙක ය, චෛතසික දශය ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා කෘතත්වාත් රූපයෝ ලැබෙත්. ශුඪරූපවාරයෙහි කතීපායයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා ද්විපඤ්චවිඥාන වර්ජිත අහේතුක විපාකක්‍රියා විසින් උපදවන අහේතුක චිත්තජ මහාභූතයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි ද්වය හා සූදුසු පරිදි උපදනා අහේතුක ප්‍රතිසන්ධි කර්මජ මහාභූතයෝ ය, බාහ්‍ය මහාභූතයෝ ය, ආහාරජ මහාභූතයෝ ය, ඍතුජ මහාභූතයෝ ය, අසංඥසත්ත්වකර්මජ මහාභූතයෝ ය, ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ චිත්තජාදි උපාදය රූපයෝ ලැබෙත්. -පෙ- "**අබ්‍යාකතං -පෙ- න හෙතු පච්චයා න පුරෙජාත පච්චයා, අරූපෙ අහෙතුක කිරියාබ්‍යාකතං එකං ඛන්ධං -පෙ- ඛන්ධා, අහෙතුකවිපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, අහෙතුක පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තා ච රූපං -පෙ- ද්වෙ ඛන්ධා කටත්තා ච රූපං, ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා, එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, -පෙ- මහාභූතා මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තා උපාදය රූපං, බාහිරං -පෙ- ආහාරසමුට්ඨානං -පෙ- උතුසමුට්ඨානං -පෙ- අසඤ්ඤසත්තානං -පෙ- මහාභූතෙපටිච්ච කටත්තා රූපං උපාදය රූපං**"යි ඉදිරිය යුතුය.

පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මෝහමූලද්ව ය, අරූපවිපාක සතර ය යන මොවුන් ගෙන් අන්‍ය වූ සහේතුක ප්‍රවෘත්ති නාමස්කන්ධයෝ හේතුපුරේජාත ප්‍රත්‍යය දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙති. එ බැවින් -පෙ- "**හෙතුපච්චයා පුරෙජාතෙ තීණි**" යි වදරන ලදහ. '**තීණි**' යනු කුසලෙන කුසලය ය, අකුසලෙන අකුසලය ය, අබ්‍යාකතෙන අබ්‍යාකතය ය යන මොහු ය. කුසලෙන කුසලවාරය පුරේජාතයෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ගය උදුරනු.

අකුසලෙන අකුසලයෙහි කතීපායයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුසල් සිත් දෙළොස ය චෛතසික සත්විස්ස ය

Non-commercial distribution

යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ අකුසල් සිත් දෙළොස ය, මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය පූර්වජාතයෙහි මෙනි.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කතීපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක වර්ජිත සහේතුකවිපාක සතොළොස ය සහේතුක්‍රියා සතොළොස ය චෛතසික අටතිස ය යන අවයව -පෙ- අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය පූර්වජාතයෙහි මෙනි.

## (හේතුමූලක ආසෙවන දුකය.)

හේතුමූලක ආසේවන දුකයෙහි මෝහමූල ද්විතීයාදී ජවනයන්හි මෝහය ය, හසිතෝත්පාද ද්විතීයාදි ජවනයෝ ය යන මොහු ආසේවන ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී හේතුප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයන් නො වීමෙන් හේතුප්‍රත්‍යය බැහැර කෙරෙති. -පෙ- පච්චනීයානු ලෝමයෙහි " න හෙතුපච්චයා ආසෙවනෙ ද්වෙ" යි වදරන ලදහ. "ද්වෙ" යනු අකුසලෙන අකුසලය අබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙක ය.

අකුසලෙන අකුසලයෙහි කතී පාඨයෙන් මෝහමූල ද්විතීයාදි ජවනයෝ ය චෛතසික තුදුස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා මෝහය ලැබේ. විභඞ්ගය උදුරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කතීපාඨයෙන් හසිතෝත්පාද ද්විතීයාදි ජවනයෝ ය ඡන්ද වර්ජිත අන්‍යසමාන දෙළොස ය යන අවයව -පෙ- ලැබෙත්.-පෙ-**"අහෙතුක කිරියාබ්‍යාකතං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා"** යි ඉදිරිය යුතු ය.

මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත ද්වාදශාකුශල මහාකුශල මහාක්‍රියා ප්‍රථම ජවනයෝ ය, සහේතුක විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය, සහේතුක චිත්තජ රූපයෝ ය, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොව්හු -පෙ- **"හෙතුපච්චයා න ආසෙවනෙ නව"** යි වදරන ලදහ. "නව" යනු කුසලෙන කුසලය ය -පෙ- අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය යන මොහු ය.

කුසලෙන කුසලයෙහි කතීපාඨයෙන් මහාකුශලප්‍රථම ජවනය ය චෛතසික අටතිස ය යන -පෙ- ලැබෙත්. විභඞ්ගය හේතුවිභඞ්ගය මෙනි. කුසලෙන අබ්‍යාකතය හේතු ප්‍රත්‍යයෙහි මෙන් විස්තර කරනු. කුසලෙන කුසලාබ්‍යාකතයෙහි කතීපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මහාකුශල ප්‍රථමජවන ය චෛතසික අටතිස ය යන අවයව -පෙ- අවයව නාමස්කන්ධයන් හා ඔවුන් නිසා උපදනා චිත්තජරූපයෝ ද ලැබෙත්. විභඞ්ගය හේතුවෙහි මෙනි.

Non-commercial distribution

අකුසලෙන අකුසලයෙහි කතිඃපාඨයෙන් දෙළොස් අකුසලයන් ගේ ප්‍රථමජවනයෝ ය චෛතසික සත්විස්ස ය යන අවයව -පෙ- ද්වාදශාකුසල ප්‍රථමජවනයෝය මෝහමූලද්වයයෙහි මෝහවර්ජිත චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය හේතුවෙහි මෙන් උදුරනු. අකුසලෙන අබ්‍යාකතය හේතුවෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ගය උදුරනු. අකුසලෙන අකුසලාබ්‍යාකතයෙහි කතිඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුසල ප්‍රථම ජවනයෝ ය චෛතසික සත්විස්ස ය යන අවයව -පෙ- අකුශල ප්‍රථම ජවනයෝ ය මෝහමූලද්වයයෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයන් හා ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ද ලැබෙත්. විභඞ්ගය හේතුවෙහි මෙනි.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි මහාක්‍රියා ප්‍රථම ජවනයෝ ය සහේතුක විපාක එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- අවයව නාමස්කන්ධයන් හා ඔවුන් නිසා උපදනා චිත්තජ රූපයෝ ද පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මහාක්‍රියා ප්‍රථමජවනයෝ ය මහද්ගතක්‍රියා නවය ය චෛතසික පන්තිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිවාරයෙහි හා ශුඬරූපවාරයෙහි ද හේතුවෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ගය උදුරනු.

කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙවාරය හේතුවෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ග උදුරනු.

මෝහමූල ප්‍රථම ජවනයෙහි මෝහය ය, හසිතෝත්පාද ප්‍රථමජවනය ය, හසිතෝත්පාදයෙන් අන්‍ය වූ අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය අහේතුක චිත්තජරූපයෝ ය අහේතුකප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොව්හු -පෙ- "**න හේතුපච්චයා න ආසෙවනෙ ද්වෙ**" යි වදරන ලදහ. "ද්වෙ" යනු අකුසලෙන අකුසල ය අබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙවාරය ය.

අකුසලෙන අකුසලයෙහි කතිඃපාඨයෙන් විචිකිත්සාසහගත ඖද්ධත්‍ය සහගත ප්‍රථමජවනයෝ ය චෛතසික තුදුස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා මෝහය වූ ප්‍රත්‍යයෝත්පන්න ධර්මය ලැබේ. විභඞ්ගය "**විචිකිච්ඡාසහගතෙ උද්ධච්ච සහගතෙ ඛන්ධෙ පටිච්ච විචිකිච්ඡාසහගතො උද්ධච්ච සහගතො මොහො**" යි ඉදිරිය යුතු ය.

Non-commercial distribution

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතීඃපාඨයෙන් හසිතෝත්පාද ප්‍රථම ජවනය ය හසිතෝත්පාද වර්ජිත අහේතුක සිත් සතොළොස ය ඡන්දවර්ජිත අන්‍යසමාන දෙළොසය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ හසිතෝත්පාද ප්‍රථම ජවනය ය හසිතෝත්පාද වර්ජිත අහේතුක සිත් සතොළොස ය ඡන්ද වර්ජිත අන්‍යසමාන දෙළොස ය යන අවයව නාමස්කන්ධයෝ ය ඒ නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි කතීඃපාඨයෙන් අහේතුක ප්‍රතිසන්ධි දෙක ය ඡන්ද ප්‍රීති වීර්‍ය්‍ය වර්ජිත අන්‍යසමාන දශය ය -පෙ- ආරම්මණදුකයෙහි මෙන් විස්තර කරනු. ශුද්ධරූපවාරයෙහි ආරම්මණයෙහි මෙන් අභිධෙය ගන්නේ ය. විභඞ්ගය ද ආරම්මණදුකය අනුව උදුරනු.

අකුසල් සිත් දෙළොස ය මහාකුශල මහාක්‍රියා ය යන මොවුන්ගේ ද්විතීයාදි ජවනයෝ ය මහද්ගතකුශල මහද්ගත ක්‍රියා ලෝකෝත්තර කුශලයෝ ය මෝහමූල ද්වයයෙහි මෝහවර්ජිත චෛතසික දෙපනස ය යන මොව්හු හේතු ආසේවන ප්‍රත්‍යය දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝය යන -පෙ- "**හේතුපච්චයා ආසෙවනෙ තීණි**" යි වදාරන ලදහ. 'තීණි' යනු කුසලෙන කුසලය, අකුසලෙන අකුසල ය, අබ්‍යාකතෙන අබ්‍යාකතය යන තුන් වාරය ය.

කුසලෙන කුසලයෙහි ආසේවන ප්‍රත්‍යයෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ගය උදුරනු. අකුසලෙන අකුසලයෙහි ද්වාදශාකුශල ද්විතීයාදි ජවනයෝ ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා ද්වාදශාකුශල ද්විතීයාදි ජවනයෝ ය මෝහමූලයෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය උදුරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කතීඃ පාඨයෙන් මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය මහද්ගත ක්‍රියා නවය ය චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය ආසේවනයෙහි මෙන් උදුරනු.

### (හේතුමූලක කර්‍මප්‍රත්‍යය දුකය)

හේතුමූලක කර්‍මදුකයෙහි මෝහමූලද්වයෙහි මෝහයෙන් හා ක්‍රියා චේතනාවන් ගෙන් ද අන්‍ය වූ අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධිනාමස්කන්ධ සතර ය, අහේතුක චිත්තජ රූපයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි කර්‍මජ රූපයෝ ය, අසංඥසත්ත්‍ව කර්‍මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්‍මජ රූපයෝ ය යන මොව්හු කර්‍මප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයන් වී -පෙ- "**න හෙතුපච්චයා කම්මෙ**

Non-commercial distribution

ද්වෙ" යි වදරන ලදහ. "ද්වෙ" යනු අකුසලෙන අකුසලය අබ්‍යාකතෙන අබ්‍යාකත ය යන දෙවාරය ය, අකුසලෙන අකුසලය උක්තානුසාරයෙන් විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතීඃ පාඨයෙන් අහේතුක සිත් අටොළොස ය, ඡන්ද වර්ජිත අන්‍යසමාන දොළොස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අහේතුක සිත් අටොළොසය, ක්‍රියා චේතනා ඡන්ද වර්ජිත අන්‍යසමාන චෛතසික දෙළොස ය යන අවයව නාමස්කන්ධයන් හා ඔවුන් නිසා උපදනා අහේතුක චිත්තජ රූපයෝ ද ලැබෙත්. ප්‍රතිසන්ධි කාලයෙහි කතීඃ පාඨයේ අභිධෙය සහජාතයෙහි මෙනි. ශුද්ධරූපචාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අහේතුක විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් උපදවන අහේතුක චිත්තජ මහාභූතයෝ ය, අහේතුක ප්‍රතිසන්ධිද්වය හා සූදුසු පරිදි උපදනා අහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ මහාභූතයෝ ය ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා වූ උපාදයරූපයෝ ලැබෙත්. විභඞ්ගය "අබ්‍යාකතං -පෙ- **න හෙතු පච්චයා කම්මපච්චයා, අහෙතුක විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං -පෙ- රූපං, අහෙතුකපටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච -පෙ- රූපං, අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච -පෙ- මහාභූතෙ පටිච්ච කටත්තාරූපං උපාදයරූපං**" යි වදරන ලදහ.

කුශලා කුශල සහේතුක ක්‍රියා චේතනාවෝ හේතුප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී කර්ම ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න නො වන බැවින් කර්ම ප්‍රත්‍යය බැහැර කෙරෙති. -පෙ- "**හෙතුපච්චයා න කම්මෙ තීණි.**" යි වදරන ලදහ. "තීණි" යනු කුසලෙන කුසලය ය, අකුසලෙන අකුසලය ය, අබ්‍යාකතෙන අබ්‍යාකතයය යන මොහු ය.

කුසලෙන කුසලයෙහි කතීඃපාඨයෙන් කුසල් සිත් එක්විස්ස ය චේතනා වර්ජිත චෛතසික සත්තිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චේතනාව ලැබේ. -පෙ- "**කුසලං -පෙ- හෙතුපච්චයා න කම්මපච්චයා, කුසලෙන ඛන්ධෙ පටිච්ච කුසලා චෙතනා**" යි ඉදිරිය යුතු ය.

"අකුසලො" යන කතීඃ පාඨයෙන් අකුසල් සිත් දෙළොස ය චේතනා වර්ජිත චෛතසික සවිස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චේතනාව ලැබේ. -පෙ- "**අකුසලං -පෙ- අකුසලෙ ඛන්ධෙ පටිච්ච අකුසලා චෙතනා**" යි ඉදිරිය යුතු ය.

Non-commercial distribution

"අබ්‍යාකතො" යන කර්‍ම පාඨයෙන් සහේතුක ක්‍රියා සතොළොස ය චේතනා වර්ජිත චෛතසික සූතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් නිසා උපදනා චේතනාව ලැබේ. -පෙ- "**අබ්‍යාකතං -පෙ- හෙතුපච්චයා න කම්මපච්චයා, කිරියාබ්‍යාකතෙ ඛන්‍ධෙ පටිච්ච කිරියාබ්‍යාකතා චෙතනා**" යි ඉදිරිය යුතු ය.

අහේතුකක්‍රියා චේතනාව ය, බාහ්‍ය ආහාරජ සෘතුජ රූපයෝ ය යන මොහු හේතු කර්‍ම ප්‍රත්‍යය දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. -පෙ- "**න හෙතුපච්චයා න කම්මෙ එකං**" යි වදරන ලදහ. "එකං" යනු අබ්‍යාකතෙන අබ්‍යාකතය ය. ප්‍රවෘත්තිකාලයෙහි කර්‍ම පාඨයෙන් අහේතුක ක්‍රියා තුන ය ඡන්‍ද ප්‍රීති චේතනා වර්ජිත අන්‍යසමාන චෛතසික දශය ය යන අවයව් වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් නිසා උපදනා චේතනාව ලැබේ. ශුද්ධරූපවාරයෙහි බාහිර මහාභූතයෝ ය ආහාරජ මහාභූතයෝ ය සෘතුජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ බාහ්‍ය ආහාරජ සෘතුජ උපාදයරූපයෝ ලැබෙත්. -පෙ- "**අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න හෙතුපච්චයා න කම්මපච්චයා. අහේතුකකිරියාබ්‍යාකතෙ ඛන්‍ධෙ පටිච්ච අහෙතුක කිරියාබ්‍යාකතා චෙතනා, බාහිරං -පෙ- ආහාර සමුට්ඨානං උතුසමුට්ඨානං -පෙ- එකං මහාභූතං -පෙ- මහාභූතෙ පටිච්ච උපාදය රූපං**" යි ඉදිරිය යුතු ය.

මෝහමූලද්වයයෙහි මෝහය හා කුශලාකුශල ක්‍රියා චේතනා ද හැර සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්‍ධි නාමස්කන්‍ධයෝ ය, සහේතුක චිත්තජ රූපයෝ ය, සහේතුක ප්‍රතිසන්‍ධි කර්‍මජ රූපයෝ ය යන මොවුහු හේතුකර්‍ම ප්‍රත්‍යය දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. "**හෙතුපච්චයා කම්මෙ නව**" යි වදරන ලදහ. නවය කුසලෙන කුසල වාරාදිය ය. කුශලපදයේ වාර තුන කර්‍මප්‍රත්‍යයෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ග උදුරනු.

අකුසලෙන අකුසලයෙහි කර්‍මපාඨයෙන් අකුසල්සිත් දෙළොස ය චෛතසික සත්විස්ස ය යන අවයවනාමස්කන්‍ධයන් නිසා උපදනා වූ අකුසල්සිත් දෙළොස ය මෝහමූලද්වයයෙහි මෝහය හා චේතනාව වර්ජිත චෛතසික සවිස්ස ය යන අවයව නාමස්කන්‍ධයෝ ලැබෙත්. විභඞ්ගය හේතුවෙහි මෙනි. අකුසලෙන අබ්‍යාකතය හේතුයෙහි මෙන් අභධෙය ගෙන විභඞ්ගය උදුරනු. අකුසලෙන අකුසලාබ්‍යාකතයෙහි කර්‍මපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුසල් සිත් දෙළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්‍ධයන් නිසා උපදනා අකුසල් සිත් දෙළොස ය මෝහ මූලද්වයයෙහි මෝහයෙන් හා චේතනාවෙන් අන්‍ය වූ චෛතසික සවිස්ස

Non-commercial distribution

ය යන අවයව නාමසකන්ධයන් හා ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ද ලැබෙත්. විභඞ්ගය හේතුවෙහි මෙන් උද්ධරනු

. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කත්‍ථපාඨයෙන් සහේතුකවිපාක එක්විස්සය සහේතුකක්‍රියා සතොළොස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා සහේතුකවිපාක එක්විස්ස ය සහේතුකක්‍රියා සතොළොස ය ක්‍රියා චේතනා වර්ජිත චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් හා ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ද ලැබෙත්. ප්‍රතිසන්ධිශුඞරූප දෙවාරයෙහි හේතුයෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ගය උද්ධරනු. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය යන දෙවාරය ද හේතුයෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ගය උද්ධරනු. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙවාරය ද හේතුයෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ගය උද්ධරනු.

## (හේතුමූලක විපාක දුකය)

හේතුමූලක විපාකදුකයෙහි අහේතුකවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර ය විපාකචිත්තයන් විසින් උපදවන අහේතුකචිත්තජ රූපයෝ ය සහේතුකප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය යන මොවුහු විපාක ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී -පෙ- "**න හෙතුපච්චයා විපාකෙ එකං**" යි විදරන ලදහ. ප්‍රවෘත්තිකාලයෙහි අබ්‍යාකතො යන කත්‍ථ පාඨයෙන් අහේතුකවිපාක සතොළොස ය ඡන්ද වීර්‍ය්‍ය වර්ජිත අන්‍යසමාන චෛතසික එකොළොස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ අහේතුක විපාක -පෙ- අන්‍යසමාන එකොළොස ය යන අවයව නාමස්කන්ධයන් හා ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝද ලැබෙත්, ප්‍රතිසන්ධිකාලයෙහි අභිධෙය වශයෙන් අහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා කෘතත්වත්රූපයෝ ලැබෙත්. රූපවාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අහේතුකවිපාක නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන අහේතුකචිත්තජ මහාභූතයෝ ය, අහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ අහේතුකචිත්තජ අහේතුක ප්‍රතිසන්ධිකර්මජ උපාදාය රූපයෝ ලැබෙත්, විභඞ්ගය "**අබ්‍යාකතං ධම්මං පටිච්ච -පෙ- න හෙතුපච්චයා, විපාකපච්චයා, අහේතුකවිපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං -පෙ- රූපං, අහෙතුක පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තා ච රූපං, -පෙ- රූපං, ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා, එකං**

Non-commercial distribution

**මහාභූතං පටිච්ච -පෙ- චිත්තසමුට්ඨානං රූපං, කටත්තාරූපං, උපාදායරූපං**" යි උදුළ යුතුය.

මෝහමූලද්වයයෙහි මෝහයෙන් අන්‍ය වූ කුශලාකුශල සහේතුක ක්‍රියා නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ය යන මොව්හු -පෙ- "**හෙතුපච්චයා න විපාකෙ නව**" යි වදරන ලදහ. 'නව' යනු කුසලෙන කුසලාදිය ය. කුසලපදයෙහි වාර තුන හා අකුසලපදයේ වාර තුන හේතුව අනුව විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතීඃපාඨයෙන් සහේතුක ක්‍රියා සතොළොස ය, චෛතසික පන්තිස ය යන නාමස්කන්ධයන් නිසා උපදනා සහේතුක ක්‍රියා සතොළොස ය, චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයෝ ය, ඔවුන් නිසා උපදනා චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. ශුද්ධරූපවාරයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුශලාකුශල සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන සහේතුක චිත්තජ මහාභූතයන් නිසා උපදනා වූ භූතරූප සහිත වූ චිත්තජ උපාදායරූපයෝ ලැබෙත්. -පෙ- "**අබ්‍යාකතං ධම්මං -පෙ- හෙතු පච්චයා න විපාක පච්චයා, කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, -පෙ- රූපං, එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, -පෙ- මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං උපාදාය රූපං**" යි උදුළ යුතු ය. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය යන දෙවාරය හේතුව අනුව විස්තර කරනු.

මෝහමූලද්වයෙහි මෝහය ය, අහේතුකක්‍රියා නාමස්කන්ධ සතර ය, අහේතුකක්‍රියා සිත්වලින් උපදවන චිත්තජරූපයෝ ය, බාහිරරූපයෝ ය, ආහාරජරූපයෝ ය, ඍතුජරූපයෝ ය, අසංඥසත්ත්වකර්මජරූපයෝ ය, ප්‍රවෘත්තිකර්මජරූපයෝ ය යන මොව්හු හේතුවිපාක ප්‍රත්‍යය දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. -පෙ- පච්චනීයයෙහි "**න හෙතු පච්චයා න විපාකෙ ද්වෙ**" යි වදරන ලදහ. අකුසලෙන අකුසලයෙහි අභිධෙය අවුලා විභඞ්ගය උදුරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතීඃපාඨයෙන් අහේතුකක්‍රියා තුන ය ඡන්ද වර්ජිත අන්‍යසමාන දෙළොස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- නාමස්කන්ධයන් හා අහේතුක ක්‍රියා චිත්තජ රූපයෝ ලැබෙත්. ශුද්ධ රූප වාරයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අහේතුක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන අහේතුක චිත්තජ මහාභූතයෝ ය ආහාරජ මහා භූතයෝ ය, ඍතුජ මහාභූතයෝ ය අසංඥසත්ත්වකර්මජ

Non-commercial distribution

මහාභූතයෝ ය ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා වූ භූතරූප සහිත වූ උපාදය රූපයෝ ලැබෙත්. විභඞගය "**අබ්‍යාකතං ධම්මං පටිච්ච -පෙ- න හෙතුපච්චයා න විපාකපච්චයා, අහෙතුක කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨානංච රූපං, -පෙ- එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, -පෙ- මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, උපාදය රූපං, බාහිරං -පෙ- ආහාරසමුට්ඨානං -පෙ- උතුසමුට්ඨානං -පෙ- අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච -පෙ- මහාභූතෙ පටිච්ච කටත්තාරූපං උපාදයරූපං**" යි උදුළ යුතු ය.

සහේතුකවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, විපාකයන් විසින් උපදවන සහේතුකචිත්තජ රූපයෝ ය, සහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූප යෝ ය යන මොව්හු -පෙ- "**හෙතුපච්චයා විපාකෙ එකං**" යි වදරන ලදහ.

ප්‍රවෘත්තිකාලයෙහි "අබ්‍යාකතො" යන කතීඃපාඨයෙන් සහේතුක විපාක එක්විස්ස ය චෛතසික සතිස ය යන -පෙ- නාමස්කන්ධයෝ ය ඔවුන් විසින් උපදවන සහේතුක චිත්තජරූපයෝ ය යන මොහු ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි සහේතුක ප්‍රතිසන්ධි පසළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා හෘදයවස්තුව නිසා උපදනා සහේතුක ප්‍රතිසන්ධි පසළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්. රූපවාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා වූ අරූපවිපාක අභිඥාචිත්ත වර්ජිත සහේතුක විපාක නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන සහේතුකචිත්තජ මහාභූතයන් නිසා උපදනා භූතරූප සහිත වූ උපාදයරූපයෝ ලැබෙත්. විභඞගය විපාකවිභඞගය අනුව උදුරනු.

### (හේතුමූලක ආහාර දුකය.)

හේතුමූලක ආහාරදුකයෙහි මෝහමූලද්වයෙහි මෝහය ය, අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර ය, අහේතුකචිත්තජ රූපයෝ ය, යන මොහු -පෙ- "**න හෙතු පච්චයා ආහාරෙ ද්වෙ**" යි වදරන ලදහ. අකුසලෙන අකුසලයෙහි අභිධෙය අවුලා විභඞගය උදුරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි හා ප්‍රතිසන්ධිකාලයෙහි පෙර පරිදි අභිධෙය ගත්තේ ය, රූපවාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ද්විපඤ්චවිඥාන වර්ජිත අහේතුක විපාකක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන අහේතුක චිත්තජ මහාභූතයෝ ය, අහේතුක ප්‍රතිසන්ධිද්වය හා උපදනා අහේතුක ප්‍රතිසන්ධි කර්මජ මහාභූතයෝ ය ආහාරජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා වූ

Non-commercial distribution

භූතරූප සහිත වූ උපාදයරූපයෝ ලැබෙත්. විභඞගය "**අබ්‍යාකතං -පෙ- ආහාර සමුට්ඨානං එකං මහාභූතං පටිච්ච -පෙ- මහාභූතෙ පටිච්ච උපාදය රූපං**" යි උදුළ යුතු ය.

හේතුප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී ආහාර ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්මයක් නැති බැවින් අනුලෝමපච්චනීයයෙහි "හෙතුපච්චයා න ආහාරෙ" යනාදිය නො වදරන ලද්දේ ය. බාහ්‍ය රූප-යෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු හේතු ආහාර ප්‍රත්‍යය දෙක්හිම ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. -පෙ- "**න හෙතුපච්චයා න ආහාරෙ එකං**" යි වදරන ලදහ. "අබ්‍යාකතො" යන කර්තෘපාඨයෙන් බාහ්‍ය ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයන් නිසා උපදනා භූතරූප සහිත වූ බාහ්‍ය ඍතුජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදයරූපයෝ ලැබෙත්. විභඞගය "**බාහිරං -පෙ- උතුසමුට්ඨානං - අසඤ්ඤසත්තානං එකං මහාභූතං -පෙ- මහාභූතෙ පටිච්ච කටත්තා රූපං උපාදය රූපං**" යි උදුළ යුතු ය.

මෝහමූලද්වයෙහි මෝහය වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර ය, සහේතුකචිත්තජරූපයෝ ය, සහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය යන මොවුහු -පෙ- **හෙතුපච්චයා ආහාරෙ නව**" යි වදරන ලදහ. හේතුප්‍රත්‍යයෙහි මෙන් විස්තර කරනු.

### (හේතුමූලක ඉන්ද්‍රිය දුකය)

මෝහමූලද්වයෙහි මෝහය හා අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අහේතුකචිත්තජ රූපයෝ ය අහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය ජීවිතේන්ද්‍රිය වර්ජිත අසංඥසත්ත්වකර්මජ රූපයෝ ය ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොහු ඉන්ද්‍රියප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී -පෙ- "**න හෙතුපච්චයා ඉන්ද්‍රියෙ ද්වෙ**" යි වදරන ලදහ. අකුසලෙන අකුසලය වුක්තානුසාරයෙන් විස්තර කරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි දෙක්හි අභිධෙය වුක්තානුසාරයෙන් ගන්නේ ය. රූපවාරයෙහි කර්තෘපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහිවූ ද්විපඤ්චවිඥාන වර්ජිත අහේතුක විපාකක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන අහේතුකචිත්තජ මහාභූතයෝ ය අහේතුකප්‍රතිසන්ධි දෙක හා සුදුසු පරිදි උපදනා අහේතුක ප්‍රතිසන්ධි කර්මජ මහාභූතයෝ ය, අසංඥසත්ත්වකර්මජ මහාභූතයෝ ය ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා වූ භූතරූප සහිත වූ අහේතුකචිත්තජ උපාදය රූපයෝ ය, අහේතුකප්‍රතිසන්ධි කර්මජ උපාදයරූපයෝ ය, ජීවිතේන්ද්‍රිය වර්ජිත අසංඥසත්ත්වකර්මජ උපාදය රූපයෝ ය,

Non-commercial distribution

ප්‍රවෘත්තිකර්මජ උපාදය රූපයෝ ය යන මොවුහු ලැබෙත්. විභඞ්ගය කම්මදූකය අනුව උදුරනු.

හේතුප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න වී ඉන්‍ද්‍රියප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්‍ම නැත්තේ ය. එ බැවින් "හෙතුපච්චයා න ඉන්‍ද්‍රියෙ" යනාදිය නො වදළ සේක.

බාහ්‍යරූප ආහාරජරූප සෘතුජරූපයෝ ය අසංඥසත්ත්වයන් ගේ රූප ජීවිතේන්‍ද්‍රි ය යන මොවුහු හේතු ඉන්‍ද්‍රිය දෙක්හිම ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. -පෙ- **"න හෙතුපච්චයා න ඉන්‍ද්‍රියෙ එකං"** යි වදරන ලදහ. "අබ්‍යාකතො" යන කතිපායෙන් බාහ්‍ය ආහාරජ සෘතුජ මහාභූතයන් නිසා උපදනා භූතරූප සහිත වූ බාහ්‍ය ආහාරජ සෘතුජ උපාදයරූපයෝ ය අසංඥසත්ත්වකර්මජ මහාභූතයන් හා ප්‍රවෘත්ති කර්මජ මහාභූතයන් නිසා උපදනා රූපජීවිතේන්‍ද්‍රිය රූපය ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. විභඞ්ගය **"අබ්‍යාකතං -පෙ- න හෙතු පච්චයා න ඉන්‍ද්‍රියපච්චයා, බාහිරං -පෙ- ආහාර සමුට්ඨානං -පෙ- උතුසමුට්ඨානං එකං මහාභූතං -පෙ- මහාභූතෙ පටිච්ච උපාදය රූපං අසඤ්ඤසත්තානං මහාභූතෙ පටිච්ච රූපජීවිතින්‍ද්‍රියං"** යි උදුළ යුතුය.

මෝහමූල ද්වයයෙහි මෝහ වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර ය සහේතුකචිත්තජ සහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොවුහු හේතු ඉන්‍ද්‍රිය දෙදෙනා ගේ ම ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙති. -පෙ- **"හෙතුපච්චයා ඉන්‍ද්‍රියෙ නව"** යි වදරන ලදහ. හේතුප්‍රත්‍යය අනු ව අභිධෙය ගෙන විභඞ්ග උදුරනු.

## (හේතුමූලක ඣාන දූකය)

හේතුමූලක ඣානදූකයෙහි මෝහමූල ද්වයෙහි මෝහය ය ද්විපඤ්චවිඥාන වර්ජිත අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර ය යන අහේතුක චිත්තජ රූපයෝ ය අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොහු ධ්‍යානප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී හේතුප්‍රත්‍යයා ගේ **"න හේතු පච්චයා ඣානෙ ද්වෙ"** යි වදරන ලදහ.

අකුසලෙන අකුසලය විස්තර කරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්ති කාලයෙහි කතිපායෙන් ද්විපඤ්චවිඥාන වර්ජිත අහේතුක විපාකක්‍රියා ය, ඡන්ද වර්ජිත අන්‍යසමාන දෙළොස ය යන අචයව -පෙ- ඔවුන් විසින් උපදවන අහේතුක විපාක චිත්තජ රූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි අහේතුක ප්‍රතිසන්ධි දෙක

Non-commercial distribution

ගත්තේ ය. රූපවාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ද්විපඤ්චවිඥාන වර්ජිත අහේතුක විපාකක්‍රියා නාමස්කන්‍ධයන් විසින් උපදවන අහේතුක චිත්තජ මහාභූතයෝ ය. අහේතුක ප්‍රතිසන්‍ධි දෙක හා උපදනා අහේතුක ප්‍රතිසන්‍ධි කර්මජ උපාදය රූපයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ අහේතුක චිත්තජ අහේතුකප්‍රතිසන්‍ධිකර්මජ උපාදයරූපයෝ ලැබෙත්. විභඞ්ගය උද්ධරත්‍.

හේතුප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී ධ්‍යානප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්මයන් නැති බැවින් අනුලෝමපච්චනීයයෙහි "හෙතුපච්චයා න ඣානෙ" යනාදිය නො වදළ සේක.

ද්විපඤ්චවිඥානනාමස්කන්‍ධයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොහු -පෙ- පච්චනියයෙහි **"න හෙතුපච්චයා න ඣානෙ එකං"** යි වදරන ලදහ. ප්‍රවෘත්තිකාලයෙහි "අබ්‍යාකතො" යන කර්තෘ පාඨයෙන් පඤ්චවිඥාන දශය ය සර්වචිත්ත සාධාරණ චෛතසික සත ය යන අවයව -පෙ- අවයව නාමස්කන්‍ධයෝ ලැබෙත්. (ප්‍රතිසන්‍ධිවාරය නො ලැබේ.) රූපවාරයෙහි කර්තෘපාඨයෙන් බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයන් නිසා උපදනා භූතරූප සහිත වූ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදය රූපයෝ ලැබෙත්. විභඞ්ගය **අබ්‍යාකතං -පෙ- න හෙතු පච්චයා න ඣානපච්චයා, පඤ්චවිඤ්ඤාණසහගතං එකං ඛන්‍ධං පටිච්ච තයො ඛන්‍ධා -පෙ- ද්වෙ ඛන්‍ධා බාහිරං ආහාර සමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං -පෙ- කටත්තාරූපං උපාදයරූපං"** යි උද්ධෘළ යුතු ය.

මෝහමූලද්වයයෙහි මෝහ වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්‍ධි නාමස්කන්‍ධ සතර ය, සහේතුකචිත්තජ රූපයෝ ය සහේතුක ප්‍රතිසන්‍ධි කර්මජරූපයෝ ය යන මොහු -පෙ- "හෙතුපච්චයා ඣානෙ නව" යනු වදරන ලදහ. හේතුයෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ගය උද්ධරත්‍.

**(හේතුමූලක මග්ග ද්‍වකය.)**

හේතුමූලක මග්ග ද්‍වකයෙහි මෝහමූලද්වයයෙහි මෝහය මාර්ගී ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න වී -පෙ- **"න හෙතුපච්චයා මග්ගෙ එකං"** යි වදරන ලදහ. අභිධෙය දක්වා විභඞ්ගය උද්ධරත්‍. හේතුප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී -පෙ- ධර්ම නැත්තේ ය. එ බැවින් "හෙතුපච්චයා න මග්ගෙ" යනාදිය නො වදළ සේක.

Non-commercial distribution

අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර ය අහේතුක චිත්තජ රූපයෝ ය අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොහු -පෙ- "**න හෙතු පච්චයා න මග්ගෙ එකං**" යි වදරන ලදහ. අබ්‍යාකතො යන කතීපායයේ අභිධෙය අවුලා විභඞ්ගය උදුරනු.

මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, සහේතුකචිත්තජ රූපයෝ ය සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොවුහු -පෙ- "**හෙතු පච්චයා මග්ගෙ නව**" යි වදරන ලදහ. අභධෙය අවුලා විභඞ්ග උදුරනු.

## (හෙතුමූලක සම්පයුත්ත විප්පයුත්ත දුකයෝ)

හේතුමූලක සම්පයුත්ත දුකය ආරම්මණ දුකය අනුව විස්තර කරනු. හේතුමූලක විප්පයුත්ත දුකයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මෝහමූලද්වයයෙහි මෝහය ය අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය අහේතුක චිත්තජ රූපයෝ ය. අහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය යන මොහු -පෙ- "**න හෙතු පච්චයා විප්පයුත්තෙ ද්වෙ**" යි වදරන ලදහ. අකුසලෙන අකුසලය පූරේජාත දුකය සේ විස්තර කරනු. "වත්ථුං විප්පයුත්ත පච්චයා" යි යෙදීම පමණක් වෙනස ය. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්ති කාලයෙහි කතීපායයේ අභිධෙය පූරේජාත දුකයෙහි මෙනි. ප්‍රතිසන්ධි කාලයෙහි අහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් ගන්නේ ය. රූපවාරයෙහි කතීපායයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ද්විපඤ්චවිඥාන වර්ජිත -පෙ- අහේතුක චිත්තජ මහාභූතයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි ද්වය හා -පෙ- අහේතුක ප්‍රතිසන්ධි කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත උපාදයරූපයෝ ලැබෙත්. විභඞ්ගය "**අහේතුක ද්විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨානඤ්ච රූපං, -පෙ- රූපං ඛන්ධා වත්ථුං විප්පයුත්තපච්චයා, චිත්තසමුට්ඨානං රූපං ඛන්ධෙ විප්පයුත්තපච්චයා, අහෙතුකපටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තා ච රූපං -පෙ- රූපං ඛන්ධා වත්ථුං විප්පයුත්තපච්චයා, කටත්තාරූපං ඛන්ධෙ විප්පයුත්ත පච්චයා, ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා, ඛන්ධා වත්ථුං විප්පයුත්ත පච්චයා වත්ථු ඛන්ධෙ විප්පයුත්තපච්චයා, එකං මහාභූතං පටිච්ච -පෙ- මහාභූතෙ පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං කටත්තා රූපං උපාදය රූපං ඛන්ධෙ විප්පයුත්ත පච්චයා**" යි උදුළ යුතු ය.

Non-commercial distribution

අරූපවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර ය, අරූප භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත ලෝභමූල මෝහමූල මහාකුශල මහාක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිම මාර්ග සර්ව ලෝකෝත්තරඵල නාමස්කන්ධයෝ හේතුප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී -පෙ- "**හෙතුපච්චයා න විප්පයුත්තෙ තීණි**" යි වදරන ලදහ. කුසලෙන කුසලය අකුසලෙන අකුසලය යන දෙවාරය පූර්වජාත ද්‍රිකය අනු ව විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කතීපායයෙන් අරූපවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි මහාක්‍රියා අට ය, අරූපක්‍රියා සතර ය, ඵලසිත් සතර ය චෛතසික සතිස ය යන අවයව -පෙ- අරූපවිපාක ක්‍රියා මහා ක්‍රියා චිත්තයෝ ය ඵලසිත් සතර ය චෛතසික සතිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය අබ්‍යාකතං -පෙ- "**හෙතු පච්චයා න විප්පයුත්ත පච්චයා, අරූපෙ විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච -පෙ- ද්වෙ ඛන්ධා**" යි උදුළ යුතු ය.

අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මෝහමූලද්වයෙහි මෝහය ය, මනෝද්වාරාවර්ජනය ය බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොව්හු -පෙ- "**න හෙතු පච්චයා න විප්පයුත්තෙ ද්වෙ**" යි වදරන ලදහ. අකුසලෙන අකුසලය පූර්වජාත ද්‍රිකයෙහි මෙන් විස්තර කරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කතීපායයෙන් අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මනෝද්වාරාවජ්ජනය ය, ඡන්ද ප්‍රීති වර්ජිත අන්‍යසමාන එකොළොස ය යන අවයව -පෙ- නාමස්කන්ධයෝ ලැබෙත්. රූප වාරයෙහි කතීපායයෙන් බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයන් නිසා උපදනා භූතරූප සහිත වූ බාහ්‍යාදි උපාදයරූපයෝ ලැබෙත්. විභඞ්ගය "**අබ්‍යාකතං -පෙ- න හෙතුපච්චයා න විප්පයුත්තපච්චයා, අරූපෙ අහෙතුක කිරියාබ්‍යාකතං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා, බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං -පෙ- මහාභූතෙ පටිච්ච කටත්තාරූපං, උපාදයරූපං**" යි උදුළ යුතු ය.

මෝහමූලද්වයයෙහි මෝහයෙන් හා අරූප විපාක සතරෙන් අන්‍ය වූ සහේතුක පඤ්චවෝකාර ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර ය, සහේතුක චිත්තජ රූපයෝ ය, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොහු හේතු විප්‍රයුක්ත ප්‍රත්‍යය දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. -පෙ- "**හෙතුපච්චයා විප්පයුත්තෙ නව**" යි වදරන ලදහ.

Non-commercial distribution

"නව" යනු කුසලෙනකුසලාදිය ය. කුසලපදයේ වාර තුන හා අකුසලපදයේ වාර තුන විප්‍රයුක්තය අනුව විස්තර කරනු. වෙනස මෝහමූලද්වයයෙහි මෝහය බැහැර කිරීම පමණෙකි. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කතිපායයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක වර්ජිත සහේතුක විපාක සතොළොස ය, සහේතුකක්‍රියා සතොළොස ය යන අවයව -පෙ- නාමස්කන්‍ධයෝ ය, ඔවුන් නිසා උපදනා චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්. ප්‍රතිසන්‍ධිකාලයෙහි කතිපායයෙන් පඤ්චවෝකාර ත්‍රිහේතුක ප්‍රතිසන්‍ධි තෙළෙස ය, චෛතසික පන්තිසය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්‍ධ හෘදයවස්තූන් නිසා උපදනා පඤ්චවෝකාර ත්‍රිහේතුක ප්‍රතිසන්‍ධි තෙළෙස ය චෛතසික පන්තිසය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්‍ධයන් හා කෘතත්වාත් රූපයෝ ලැබෙත්. විභඞ්ගය විප්‍රයුක්තයෙහි මෙන් උදුරනු.

හේතුමූලක අත්‍ථිදුකය සහජාතය මෙන් විස්තර කරනු. හේතු මූලක නත්‍ථි විගත දුක දෙක ආරම්මණ දුකය මෙන් විස්තර කරනු. හේතුමූලක අවිගත දුකය ද සහජාත දුකය මෙන් විස්තර කරනු. පාලියෙහි එන සැටියට තිකාදිය ද දැක්විය යුතු වුව ද ඉතා දීර්ඝ වීමෙන් ග්‍රහණධාරණය අපහසු වන බැවින් තිකාදිය මෙහි නොදක්වනු ලැබේ. හේතුදුක සඞ්ඛ්‍යාවාරය නිමි.

## ආරම්මණමූලක වාරය

### (ආරම්මණමූලක හේතු දුකය.)

ආරම්මණමූලක හේතු දුකයෙහි සහේතුක චිත්තජ රූපයන් හා සහේතුක ප්‍රතිසන්‍ධි කර්මජරූපයෝ හේතුප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී ආරම්මණ ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න නො වීමෙන් ආරම්මණ ප්‍රත්‍යය බැහැර කෙරෙති. එබැවින් ඒ ධර්මයෝ පච්චනීයානුලෝමයෙහි "**න ආරම්මණ පච්චයා හෙතුයා පඤ්ච**" යි වදරන ලදහ. අභිධෙය අවුලා විභඞ්ගය උදුරනු.

මෝහමූලද්වයයෙහි මෝහය හා අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්‍ධි නාමස්කන්‍ධයෝ ආරම්මණප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී හේතු ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න නොවීමෙන් හේතුප්‍රත්‍යය බැහැර කරති. එ බැවින් ඒ ධර්මයෝ අනුලෝමපච්චනීයයෙහි '**ආරම්මණපච්චයා න හෙතුයා ද්වෙ**' යි වදරන ලදහ. අභිධෙය අවුලා විභඞ්ගය උදුරනු.

අහේතුක චිත්තජ රූපයෝ ය, අහේතුක ප්‍රතිසන්‍ධි කර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥ සත්ත්වකර්මජ රූපයෝ ය, ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොව්හු හේතු ආරම්මණ ප්‍රත්‍යය දෙදෙනාගේ ම ප්‍රත්‍යයෝත්පන්නයෝ

Non-commercial distribution

නොවෙති. -පෙ- "න ආරම්මණ පච්චයා න හෙතුයා එකං" අභිධෙය අවුලා විභඞ්ගය උදුරනු.

මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත සහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ආරම්මණ හේතුප්‍රත්‍යය දෙක්හිම ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. -පෙ- අනුලෝමනයෙහි -පෙ- "ආරම්මණ පච්චයා හෙතුයා තීණි" යි වදරන ලදහ. අභිධෙය අවුලා විභඞ්ගය උදුරනු.

**(ආරම්මණ මූලක අධිපති දුකය)**

ආරම්මණමූලක අධිපති දුකයෙහි සාධිපති චිත්තජරූපයෝ අධිපති ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී -පෙ- පච්චනියානු ලෝමයෙහි "න ආරම්මණ පච්චයා අධිපතියා පඤ්ච" යි වදරන ලදහ. "පඤ්ච" යනු කුසලෙන අබ්‍යාකතය ය, අකුසලෙන අබ්‍යාකතය ය, අබ්‍යාකතෙන අබ්‍යාකතය ය, කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය, අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ය යන මොහු ය.

කුසලෙන අබ්‍යාකතය අකුසලෙන අබ්‍යාකතය යන දෙවාරය අධිපතිප්‍රත්‍යය අනුව විස්තර කරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතීපායේයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහා ක්‍රියා අටය නියමයෙන් අධිපති ප්‍රත්‍යය ලැබෙන මහද්ගත ක්‍රියා නවය හා ඵලසිත් සතර ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා සාධිපති චිත්තජරූපයෝ ලැබෙත්. රූපවාරයෙහි අභිධෙය අධිපති ප්‍රත්‍යයෙහි මෙති. විභඞ්ගය "**අබ්‍යාකතං -පෙ- න ආරම්මණ පච්චයා අධිපතිපච්චයා, විපාකබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං එකං මහාභූතං පටිච්ච -පෙ- මහාභූතෙ පටිච්ච චිත්ත සමුට්ඨානං උපාදය රූපං**" යි උදුළ යුතු ය. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙවාරය අධිපති ප්‍රත්‍යය අනුව විස්තර කරන්නේ ය.

අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවන්හි අධිපතිප්‍රත්‍යය වන ධර්මය, අහේතුක ක්‍රියා තුන ය, අධිපති ප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි වූ මහා ක්‍රියා අට ය ලෞකික විපාක දෙතිස ය යන නාමස්කන්ධයෝ -පෙ- "ආරම්මණ පච්චයා න අධිපතියා තීණි" යි වදරන ලදහ.

නිරාධිපතිචිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ-රූපයෝ ය, ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු ප්‍රත්‍යය දෙක්හිම ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. "න ආරම්මණ පච්චයා න අධිපතියා

Non-commercial distribution

පඤ්ච" "පඤ්ච". යනු කුසලෙන අබ්‍යාකතා දිය ය, කුසලෙන අබ්‍යාකතයෙහි කතිඃ පාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි මහාකුසල් අටය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා නිරාධිපති චිත්තජ රූපයෝ ලැබෙත්. විභඞ්ගය "**කුසලං -පෙ- නාරම්මණ පච්චයා න අධිපති පච්චයා කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං**" යි උදුළ යුතු ය. අකුසලෙන අබ්‍යාකතයෙහි කතිඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි අකුසල් සිත් දොළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා නිරාධිපති චිත්තජ රූපයෝ ලැබෙත්. විභඞ්ගය **-පෙ- අකුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං.**

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතිඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි අහේතුකක්‍රියා තුනය, මහාක්‍රියා අටය, අරූප විපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත ලෞකිකවිපාක අටොළොස ය, චෛතසික පන්තිස ය යන අවයවවූ ද සමූහ වූද නාමස්කන්ධයන් නිසා උපදනා නිරාධිපති චිත්තජ රූපයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි කතිඃපාඨයෙන් ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා කෘතත්වාත් රූපයෝ ලැබෙත්. රූපවාරයෙහි කතිඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත නිරාධිපති කුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන නිරාධිපති චිත්තජ මහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා සුදුසු පරිදි උපදනා කර්මජ මහාභූතයෝ ය, බාහිර මහාභූතයෝ ය, ආහාරජ ඍතුජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ නිරාධිපති චිත්තජ උපාදය රූපයෝ ය, -පෙ- ප්‍රවෘත්ති කර්මජ උපාදය රූපයෝ ය යන මොව්හු ලැබෙත්. විභඞ්ගය "**අබ්‍යාකතං -පෙ- න ආරම්මණ පච්චයා න අධිපති පච්චයා, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තා රූපං, ඛන්ධෙ පටිච්ච වත්ථු, එකං මහාභූතං පටිච්ච තයො, -පෙ- මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, කටත්තාරූපං උපාදය රූපං, බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං -පෙ- මහාභූතෙ පටිච්ච කටත්තා රූපං උපාදය රූපං**" යි උදුළ යුතු ය. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකත ය යන දෙවාරය හේතු ප්‍රත්‍යය අනුව විස්තර කරනු.

Non-commercial distribution

අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපති වන ධර්මය හැර දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ -පෙ- ආරම්මණ පච්චයා අධිපතියා "තීණි" යි වදරන ලදහ. කුසලෙන කුසලය අකුසලෙන අකුසලය යන දෙවාරය අධිපති ප්‍රත්‍යයෙහි මෙන් විස්තර කරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කර්‍මජපාර්ශ්වයෙන් අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහා ක්‍රියා අට ය, සෑම කල්හි අධිපති ප්‍රත්‍යය ලැබෙන මහද්ගතක්‍රියා නවය ය, ඵල සිත් සතර ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය "**අබ්‍යාකතං -පෙ- ආරම්මණපච්චයා අධිපති පච්චයා. විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච -පෙ- ද්වෙ ඛන්ධා**" යි උදුළ යුතු ය.

**(ආරම්මණ මූලක අනන්තර දුකය.)**

ආරම්මණමූලක අනන්තර දුකයෙහි අනන්තරප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න වී ආරම්මණ ප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්ම නැති බැවින් පච්චනීයානුලෝමයෙහි "නාරම්මණ පච්චයා අනන්තරේ" යනාදිය නො වදළ සේක.

ආරම්මණ ප්‍රත්‍යයෝත්පන්න වී අනන්තර ප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්ම නැති බැවින් අනුලෝම පච්චනීයයෙහි "ආරම්මණ පච්චයා නානන්තරේ" යනාදිය නො වදළ සේක.

චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූප බාහ්‍යරූප ආහාරජරූප ඍතුජරූප අසංඥසත්ව කර්මජරූප ප්‍රවෘත්ති කර්මජරූපයෝ ආරම්මණ අනන්තර -පෙ- දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. -පෙ- "**න ආරම්මණ පච්චයා න අනන්තරෙ පඤ්ච**" "පඤ්ච" යනු කුසලෙන අබ්‍යාකතාදිය ය. කුසලෙන අබ්‍යාකත ය අකුසලෙන අබ්‍යාකත ය යන දෙක හේතු ප්‍රත්‍යයෙහි මෙන් විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්ති කාලයෙහි කර්‍මජපාර්ශ්වයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත විපාක සිත් දෙවිස්ස ය. ක්‍රියා සිත් විස්ස ය. චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා කෘතත්වාත් රූපයෝ ලැබෙත්. ශුද්ධරූපවාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත කුශලා කුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින්

Non-commercial distribution

සුදුසු පරිදි උපදවන චිත්තජ මහාභූතයෝ ය. පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා උපදනා කර්ම්ජ මහාභූතයෝ ය. බාහ්‍ය ආහාරජ ඍතුජ අසඤ්ඤසත්ත්වකර්ම් ප්‍රවෘත්ති කර්ම්ජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප· සහිත වූ චිත්තජ -පෙ- ප්‍රවෘත්තිකර්ම්ජ උපාදය රූපයෝ ලැබෙත්. විභඞ්ගය "**අබ්‍යාකතං -පෙ- විපාකබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තා රූපං, ඛන්ධෙ පටිච්ච වත්ථු එකං මහාභූතං -පෙ- මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, බාහිරං ආහාර සමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං -පෙ- මහාභූතෙ පටිච්ච කටත්තාරූපං උපාදයරූපං**" යි උදුළ යුතු ය. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හා අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හේතුප්‍රත්‍යය අනුව විස්තර කරනු.

එකුන්අනූ චිත්තය ය, චෛතසික දෙපනස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ආරම්මණ අනන්තර ප්‍රත්‍යදෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ ය, -පෙ- "**ආරම්මණ පච්චයා අනන්තරෙ තීණි**" ආරම්මණ ප්‍රත්‍යය අනු ව විස්තර කරනු. සමනන්තරය ද එසේ ම ය.

(**ආරම්මණ මූලක සහජාත දුකය.**)

චිත්තජ ප්‍රතිසන්ධිකර්ම්ජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්ව කර්ම්ජ ප්‍රවෘත්තිකර්ම්ජ රූපයෝ සහජාත ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න වී -පෙ- "**න ආරම්මණ පච්චයා සහජාතෙ පඤ්ච**" අනන්තර දුක පච්චනීය ය අනුව විස්තර කරනු.

ආරම්මණ ප්‍රත්‍යයෝත්පන්න වී සහජාත ප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්ම් නැති බැවින් අනුලෝම පච්චනීයයෙහි "ආරම්මණ පච්චයා න සහජාතෙ" යනාදිය නො වදළ සේක. ප්‍රත්‍යය දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්ම්යන් ද නැත්තේය. එබැවින් -පෙ- නො වදළ සේක.

සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ආරම්මණ සහජාත දෙක්හිම -පෙ- "**ආරම්මණ පච්චයා සහජාතෙ තීණි**" ආරම්මණය මෙන් විස්තර කරනු.

(**ආරම්මණ මූලක අඤ්ඤමඤ්ඤ දුකය.**)

ආරම්මණමූලක අඤ්ඤමඤ්ඤ දුකයෙහි ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හෘදය වස්තුව ය, ඔවුනොවුන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්ම්ජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්ම්ජ ප්‍රවෘත්තිකර්ම්ජ මහාභූතයෝ ය යන මොවුහු අන්‍යෝන්‍යප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී

Non-commercial distribution

-පෙ- **න ආරම්මණ පච්චයා අඤ්ඤමඤ්ඤ එකං** ප්‍රතිසන්ධිකාලයෙහි අබ්‍යාකතො යන කතීඃපාඨයෙන් පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා හෘදයවස්තුව ලැබේ. රූපවාරයෙහි පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්ච විඥාන අභිඥාච්‍යුති වර්ජිත කුශලාකුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන චිත්තජ මහාභූතයෝ ය. පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස -පෙ- කර්මජ මහාභූතයෝ ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා මහාභූතයෝ ලැබෙත්. විභඞ්ගය අබ්‍යාකතං ධම්මං පටිච්ච -පෙ- "**පටිසන්ධික්ඛණෙ -පෙ- ඛන්ධෙ පටිච්ච වත්ථු, එකං මහාභූතං -පෙ- ද්වෙ මහාභූතා, බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං -පෙ- මහාභූතා**" යි උදුළ යුතු ය. ආරම්මණ ප්‍රත්‍යයෝත්පන්න වී අන්‍යෝන්‍යප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්ම නැත්තේ ය. -පෙ- නො වදළ සේක.

නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජරූපයෝ ය, හෘදය වස්තුවෙන් අන්‍ය වූ කර්මජරූපයෝ ය, මහාභූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ උපාදය ප්‍රතිසන්ධිකර්මජ උපාදය බාහ්‍ය උපාදය ආහාරජ උපාදය ඍතුජ උපාදය අසංඥසත්ත්වකර්මජ උපාදය ප්‍රවෘත්තිකර්මජ උපාදය රූපයෝ ය. යන මොවුහු ආරම්මණ අන්‍යෝන්‍ය දෙක්හිම ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. -පෙ- "**න ආරම්මණ පච්චයා න අඤ්ඤමඤ්ඤ පඤ්ච**" කුසලෙන අබ්‍යාකතය හා අකුසලෙන අබ්‍යාකතය හේතුප්‍රත්‍යය අනුව විස්තර කරත්.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්ච විඥාන අභිඥාච්‍යුති වර්ජිත විපාකසිත් දෙවිස්ස ය, ක්‍රියා සිත් විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි පඤ්චවෝකාර ප්‍රතිසන්ධිපසළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා හෘදයවස්තුවෙන් අන්‍ය වූ කෘතත්වාත්රූපයෝ ලැබෙත්. රූපවාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත කුශලාකුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන චිත්තජ මහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා උපදනා කර්මජ මහාභූතයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා උපාදයරූපයෝ ලැබෙත්. විභඞ්ගය

Non-commercial distribution

"අබ්‍යාකතං -පෙ- න ආරම්මණ පච්චයා න අඤ්ඤමඤ්ඤපච්චයා, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තාරූපං, මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තාරූපං උපාදය රූපං බාහිරෙ මහාභූතෙ පටිච්ච -පෙ- අසඤ්ඤසත්තානං මහාභූතෙ පටිච්ච කටත්තාරූපං උපාදයරූපං." කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හා අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හේතුප්‍රත්‍යය අනුව විස්තර කරනු.

සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ප්‍රත්‍යය දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ ය. **ආරම්මණ පච්චයා අඤ්ඤමඤ්ඤෙ තීණි.** ආරම්මණ සේ විස්තර කරනු.

## (ආරම්මණ මූලක නිස්සය දුකය)

ආරම්මණ මූලක නිස්සය දුකය සහජාතදුකය මෙන් ද **ආරම්මණ මූලක උපනිස්සය දුකය** අනන්තර දුකය මෙන් ද විස්තර කරනු.

## (ආරම්මණමූලක පුරේජාත දුකය)

ආරම්මණමූලක පුරේජාතදුකයෙහි පුරේජාතප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්නවී ආරම්මණ ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්මයක් නැත්තේ ය. -පෙ- නො වදළ සේක. අරූප විපාක සතර ය, අරූප භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන මහාකුශල මහාක්‍රියා අරූපකුශල අරූප ක්‍රියාවෝ ය, උපරිමමාර්ග තුන ය. ඵලසතර ය, ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය යන මොහු ආරම්මණ ප්‍රත්‍යයෝත්පන්න වී පුරේජාතප්‍රත්‍යයෝත්පන්න නොවීමෙන් පුරේජාතප්‍රත්‍යය බැහැර කෙරෙති. අනුලෝමපච්චනීයයෙහි **"ආරම්මණ පච්චයා න පුරෙජාතෙතීණි"**

"කුසලො යන කතීඃපාඨයෙන් අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මහාකුශල අට ය, අරූපකුශල සතර ය, උපරිම මාර්ග තුනය, චෛතසික සතිසය යන අවයව -පෙ- නාමස්කන්ධ ලැබෙත්. **"කුසලං -පෙ- ආරම්මණ පච්චයා න පුරෙජාත පච්චයා, අරූපෙ කුසලං එකං ඛන්ධං පටිච්ච -පෙ- ද්වෙ ඛන්ධා"**

"කුසලො" යන කතීඃපාඨයෙන් අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභ මූල සිත් අට ය, මෝහමූල ද්වය ය, චෛතසික තෙවිස්ස ය, -පෙ- ලැබෙත්. **අරූපෙ අකුසලං එකං ඛන්ධං පටිච්ච -පෙ- ද්වෙ ඛන්ධා"**

අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතීඃපාඨයෙන් අරූප විපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි මහාක්‍රියා අට ය,

Non-commercial distribution

අරූපක්‍රියා සතර ය, ඵල සිත් සතර ය, චෛතසික සතිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිවාරයේ අභිධෙය ආරම්මණයෙහි මෙනි. විභඞ්ගය "**අබ්‍යාකතං -පෙ- අරූපෙ විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං -පෙ- ද්වෙ ඛන්ධා, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා, වත්ථුං පටිච්ච ඛන්ධා**"

චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ සෘතුජ අසංඥසත්ව කර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ -පෙ- **න ආරම්මණපච්චයා න පුරෙජාතෙ පඤ්ච**" අභිධෙය අවුලා විභඞ්ග උදුරනු.

අරූප විපාක වර්ජිත පඤ්චවෝකාර ප්‍රවෘත්ති නාමස්කන්ධයෝ -පෙ-"**ආරම්මණපච්චයා පුරෙජාතෙ තීණි**" පූර්වජාතයෙහි මෙන් විස්තර කරනු.

## (ආරම්මණ මූලක ආසේවන දුකය)

ආරම්මණමූලක ආසේවන දුකයෙහි ආරම්මණප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. අකුශල හසිතෝත්පාද මහාකුශල මහාක්‍රියා ප්‍රථම ජවනයෝ ය, ආවර්ජන ද්වය ය, විපාකසිත් සතිස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ -පෙ- අනුලෝමපච්චනීයයෙහි "**ආරම්මණ පච්චයා න ආසෙවනෙ තීණි**" කුසලෙන කුසලයෙහි කර්තෘපාඨයෙන් මහාකුශල ප්‍රථම ජවනය හා චෛතසික අටතිස ලැබේ. ආරම්මණය අනුව විභඞ්ගය උදුරනු. අකුසලෙන අකුසලයෙහි කර්තෘ වශයෙන් අකුසල ප්‍රථමජවනයත් හා චෛතසික සත්විස්ස ලැබෙත්. විභඞ්ගය උදුරනු. අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්ති කාලයෙහි කර්තෘපාඨයෙන් හසිතෝත්පාද මහාක්‍රියා ප්‍රථම ජවනයෝ ය, විපාකසිත් සතිස ය, චෛතසික අටතිස ය යන අවයව -පෙ- ලැබෙත්, ප්‍රතිසන්ධිකාලයේ ආරම්මණයෙහි මෙන් අභිධෙය ගෙන ආරම්මණය අනුව ම විභඞ්ගය උදුරනු.

චිත්තජ -පෙ- ප්‍රවෘත්තිකර්මජ රූපයෝ -පෙ- **නාරම්මණපච්චයා න ආසෙවනෙ පඤ්ච**" විස්තර කරනු. ප්‍රථමජවන ඵලජවන වර්ජිත පශ්චිම පශ්චිම වූ ජවන එක්පනස ය, චෛතසික දෙපනස ය යන මොහු -පෙ- "**ආරම්මණපච්චයා ආසෙවනෙ තීණි**" ආසේවනය මෙන් විස්තර කරනු.

## (ආරම්මණමූලක කම්ම දුකය.)

ආරම්මණමූලක කම්මදුකයෙහි චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ අසංඥ-සත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ -පෙ- "**න ආරම්මණපච්චයා කම්මෙ පඤ්ච**" කුසලෙන අබ්‍යාකතය අකුසලෙන අබ්‍යාකතය යන දෙවාරය හේතුව අනුව විස්තර කරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි දෙක්හි අභිධෙය වශයෙන් රූප ම ගත යුතු ය, රූපවාරයෙහි අභිධෙය

Non-commercial distribution

ද කර්මප්‍රත්‍යයෙහි මෙන් ගන්නේ ය. **අබ්‍යාකතං -පෙ- න ආරම්මණපච්චයා කම්මපච්චයා, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තා රූපං, ඛන්ධෙ පටිච්ච වත්ථු, එකං මහාභූතං පටිච්ච -පෙ- මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තා රූපං උපාදායරූපං, අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච -පෙ- රූපං."**

කුශලාකුශලක්‍රියා චේතනාවන් කර්ම ප්‍රත්‍යය බැහැර කෙරෙති. "**ආරම්මණ පච්චයා කම්මෙ තීණි**" කුසලෙන කුසලය අකුසලෙන අකුසලය යන දෙවාරය හේතුව අනුව විස්තර කරනු. අබ්‍යාකතයෙහි ක්‍රියාසිත් විස්ස ය, චේතනා වර්ජිත චෛතසික සූතිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චේතනාව ලැබේ. "කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කිරියාබ්‍යාකතා චෙතනා"

බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ -පෙ- පච්චනීයයෙහි "**න ආරම්මණ පච්චයා න කම්මෙ එකං**" බාහ්‍ය ආහාරජ ඍතුජ මහාභූතයන් නිසා උපදනා භූතරූප සහිත උපාදාය රූපයෝ -පෙ- "**බාහිරං එකං මහාභූතං පටිච්ච -පෙ- ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං -පෙ- රූපං.**

කුශලාකුශල ක්‍රියා චේතනා වර්ජිත ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ -පෙ- අනුලෝමයෙහි "**ආරම්මණ පච්චයා කම්මෙ තීණි**" චේතනාව බැහැර කොට ආරම්මණය අනුව විස්තර කරනු.

**(ආරම්මණ මූලක විපාක දුකය.)**

ආරම්මණ මූලක විපාක දුකයෙහි විපාක චිත්තජ රූපයෝ ය ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොව්හු ආරම්මණ ප්‍රත්‍යය බැහැර කෙරෙති. "**න ආරම්මණ පච්චයා විපාකෙ එකං**" ප්‍රවෘත්තිකාලයෙහි අබ්‍යාකතො යන කතෘපාඨයෙන් අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත විපාකසිත් දෙවිස්ස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහවූද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්. ප්‍රතිසන්ධි කාලයෙහි පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා කෘතත්වාත්රූපයෝ ලැබෙත්. රූපචාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප-විපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත විපාක නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ මහාභූතරූපයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස -පෙ- කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ විපාක චිත්තජ ප්‍රතිසන්ධි කර්මජ උපාදාය රූපයෝ ලැබෙත්. "-පෙ- **විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං,**

Non-commercial distribution

**පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තාරූපං, ඛන්ධෙ පටිච්ච වත්ථු, එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තාරූපං උපාදාරූපං".**

කුශලාකුශල ක්‍රියා නාමස්කන්ධයෝ -පෙ- අනුලෝම පච්චනීයයෙහි "**ආරම්මණ පච්චයා න විපාකෙ තීණි**" කුසලෙන කුසලය හා අකුසලෙන අකුසලය ආරම්මණ අනුව විස්තර කරනු. අබ්‍යාකත වාරය ක්‍රියා විස්ස ගෙන විස්තර කරනු.

කුසලාකුසල ක්‍රියා චිත්තජ රූපයෝ ය. බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොව්හු පච්චනීයයෙහි "**න ආරම්මණ පච්චයා න විපාකෙ පඤ්ච**" අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්තිකාලයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ක්‍රියාසිත් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ලැබෙත්. රූපවාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුශලා කුශල ක්‍රියා චිත්තයන් විසින් උපදවන චිත්තජ මහාභූතයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත උපාදාය රූපයෝ ලැබෙත්. "**කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං -පෙ- එකං මහාභූතං පටිච්ච -පෙ- චිත්තසමුට්ඨානං රූපං උපාදාය රූපං**"

සතිස් විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ -පෙ- අනුලෝමයෙහි **ආරම්මණ පච්චයා විපාකෙ තීණි**. විපාක ප්‍රත්‍යය අනු ව විස්තර කරනු.

**(ආරම්මණ මූලක ආහාර දුකය.)**

ආරම්මණ මූලක ආහාර දුකයෙහි චිත්තජ ප්‍රතිසන්ධි කර්මජ ආහාරජ රූපයෝ -පෙ- ආරම්මණ ප්‍රත්‍යය බැහැර කරති. "**ආරම්මණ පච්චයා ආහාරෙ පඤ්ච**" එහි අබ්‍යාකතවාරයෙහි "ආහාරසමුට්ඨානං" යි යෙදීම පමණක් වෙනස ය. අනුලෝම පච්චනීයයෙහි ආහාර ප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. බාහ්‍ය ඍතුජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයෝ "**න ආරම්මණ පච්චයා න ආහාරෙ එකං**" සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ - අනුලෝමයෙහි "**ආරම්මණ පච්චයා ආහාරෙ තීණි**"

**ආරම්මණ මූලක ඉන්ද්‍රිය දුකයෙහි** චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, රූපජීවිතේන්ද්‍රිය වර්ජිත අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය, ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොහු -පෙ- ආරම්මණය බැහැර කෙරෙති. "**පඤ්ච**" අබ්‍යාකතයෙහි රූපවාරය පමණක් වෙනස් ය. කතිපය පාඨයෙන්

Non-commercial distribution

පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ -පෙ- කුශලාකුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසූ පරිදි උපදවන චිත්තජ මහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි -පෙ- කර්මජ මහාභූතයෝ ය, අසංඥසත්ත්වකර්මජ මහාභූතයෝ ය, ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා චිත්තජ ප්‍රතිසන්ධි කර්මජ රූපජීවිතේන්ද්‍රිය වර්ජිත අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ උපාදාය රූපයෝ ලැබෙත්. අසඤ්ඤසත්තානං යනාදිය යොද විභඞ්ගය උද්ධරනු. ඉන්ද්‍රිය ප්‍රත්‍යය බැහැර කිරීමක් නැත.

බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්ව රූපජීවිතේන්ද්‍රිය ය, ප්‍රවෘත්ති රූපජීවිතේන්ද්‍රියය, පච්චනීයයෙහි "**න ආරම්මණ පච්චයා න ඉන්ද්‍රියෙ එකං**" කතීඝපාඨයෙන් බාහ්‍ය ආහාරජ ඍතුජ මහාභූතයන් නිසා උපදනා භූතරූප සහිත වූ ඒ ඒ උපාදාය රූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ මහාභූතයන් හා ප්‍රවෘත්ති කර්මජ මහාභූතයන් නිසා උපදනා වූ අසංඥසත්ත්ව රූපජීවිතේන්ද්‍රිය හා ප්‍රවෘත්ති කර්මජ රූපජීවිතේන්ද්‍රිය ය යන මොවුහු ලැබෙත්. "**බාහිරං එකං මහාභූතං -පෙ- මහාභූතෙ පටිච්ච උපාදාය රූපං,අසඤ්ඤසත්තානං මහාභූතෙ පටිච්ච රූපජීවිතේන්ද්‍රියං**" සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමසකන්ධයෝ -පෙ- අනුලෝමයෙහි "තීණි" අභිධෙය අවුලා විභඞ්ගය උද්ධරනු.

**ආරම්මණමූලක ඣානදුකයෙහි** චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ, පච්චනීයානුලෝමයෙහි "**න ආරම්මණ පච්චයා ඣානෙ පඤ්ච**" විස්තර කරනු. ද්විපඤ්චවිඥාන නාමස්කන්ධයෝ ධ්‍යාන ප්‍රත්‍යය බැහැර කෙරෙති. අනුලෝමපච්චනීයයෙහි ආරම්මණ පච්චයා න ඣානෙ එකං කතීඝපාඨයෙන් පඤ්චවිඥාන නාමස්කන්ධයෝ ලැබෙත්. "**පඤ්චවිඤ්ඤාණ සහගතං එකං ඛන්ධං පටිච්ච -පෙ- ද්වෙ ඛන්ධා.**"

බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ, පච්චනීයයෙහි 'එකං' අභිධෙය අවුලනු. විභඞ්ගය උද්ධරනු. ද්විපඤ්චවිඥාන වර්ජිත සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි "**ආරම්මණපච්චයා ඣානෙ තීණි**" ආරම්මණයෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ග උද්ධරනු.

**ආරම්මණමූලක මග්ගදුකයෙහි** සහේතුකචිත්තජ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ආරම්මණ ප්‍රත්‍යය බැහැර කෙරෙති. 'පඤ්ච' හේතු දුකය අනු ව විස්තර කරනු. අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ මාර්ගප්‍රත්‍යය බැහැර කෙරෙති. '**ආරම්මණ පච්චයා න මග්ගෙ එකං**" අභිධෙය ගෙන

Non-commercial distribution

විභඞ්ගය උද්ධරනු. බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයෝ, පච්චනීයයෙහි 'එකං' හේතුද්‍වකයෙහි මෙන් විස්තර කරනු. සහේතුක සිත් එක්සැත්තෑව ය -පෙ- ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි "තීණි" අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි සහේතුක විපාක ක්‍රියා නාමස්කන්ධයෝ අභිධෙයයෝ ය. ආරම්මණය අනු ව විභඞ්ගය උද්ධරනු.

**ආරම්මණමූලක සම්පයුත්ත ද්‍වකය** අනන්තරද්‍වකය සේ විස්තර කරනු. **ආරම්මණමූලක විප්පයුත්ත ද්‍වකයෙහි** චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ආරම්මණප්‍රත්‍යය බැහැර කෙරෙති. "පඤ්ච" විස්තර කරනු. අරූප විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාසමකන්ධ සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මනොද්වාරාවර්ජන මහාකුශල මහා ක්‍රියා අරූපකුශල අරූප ක්‍රියා උපරිම මාර්ග සකලඵල නාමස්කන්ධයෝ විප්‍රයුක්තප්‍රත්‍යය බැහැර කෙරෙති. "තීණි" අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කත්‍ථ පාඨයෙන් අරූපවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය, අරූප භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මනෝද්වාරාවර්ජන මහාක්‍රියා අරූපක්‍රියා ලෝකෝත්තරඵල අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- නාමස්කන්ධයෝ ලැබෙත්. **අරූපෙවිපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං -පෙ- ඛන්ධා.**

බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ පච්චනීයයෙහි "**එකං**" විස්තර කරනු. අරූපවිපාක වර්ජිත පඤ්චවෝකාර ප්‍රවෘත්ති ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ, අනුලෝමයෙහි "තීණි" කුසලෙන කුසලයෙහි හා අකුසලෙන අකුසලයෙහි පුරේජාත ද්‍වකයෙහි මෙන් අභිධෙය ගන්නේ ය. විභඞ්ගයා ගේ අවසානයට "වත්ථුං විප්පයුත්තපච්චයා" යි යොදනු.

අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයේ අභිධෙය පුරේජාතයෙහි මෙන් ගන්නේ ය. ප්‍රතිසන්ධි කාලයේ කත්‍ථපාඨයෙන් පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස ය -පෙ- යන අවයව නාමස්කන්ධයන් හා හෘදය වස්තුව නිසා උපදනා පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොසය චෛතසික පන්තිස ය යන අවයව වූද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්. "**අබ්‍යාකතං -පෙ- විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං -පෙ- ද්වෙ ඛන්ධා, වත්ථුං විප්පයුත්තත පච්චයා, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං -පෙ- ද්වෙ ඛන්ධා, වත්ථුං විප්පයුත්ත පච්චයා, වත්ථුං පටිච්ච ඛන්ධා විප්පයුත්ත පච්චයා**" අත්ථිද්‍වකය සහජාතද්‍වකය මෙනි. නත්ථිද්‍වකය අනන්තර ද්‍වකය මෙනි. අවිගතද්‍වකය සහජාතද්‍වකය මෙනි.

*Non-commercial distribution*

## අධිපතිමූලකය

අධිපතිමූලක හේතුදුකය හා ආරම්මණදුකය වුක්තානුසාරයෙන් විස්තර කරනු. අධිපතිමූලක අනන්තරදුකය ආරම්මණ මූලක අධිපති දුකය මෙනි. අධිපතිමූලක සහජාතදුකයෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවන්හි අධිපති ධර්මයෝ ය, නො ලැබෙන අවස්ථාවෙහි අකුශල අහේතුක ක්‍රියා මහාකුශල මහාක්‍රියා ලෞකික විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, නිරාධිපතිචිත්තජ ප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ සෘතුජ අසඥසත්ත්වකර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු අධිපති ප්‍රත්‍යය බැහැර කෙරෙති. පච්චනීයානුලෝමයෙහි "**න අධිපතිපච්චයා සහජාතෙ නව**" කුසලපදයේ වාර තුන හා අකුසලපදයේ වාර තුන හේතුප්‍රත්‍යය අනුව විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතීඋපායයෙන් අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාක්‍රියා සිත් අටය, සැම කල්හි අධිපතිය ලැබෙන මහද්ගතක්‍රියා නවය ය ඵලසිත් සතර ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්මයෝ ය, අධිපතිය නො ලැබෙන අවස්ථාවෙහි අහේතුක ක්‍රියා තුන ය, මහා ක්‍රියා අට ය, ලෞකික විපාක දෙතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- අවයව නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන නිරාධිපති චිත්තජ රූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයේ අභිධෙය සහජාතයෙහි මෙනි. රූපවාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි අරූපවිපාක ද්විපඤ්චවිඥානථා අභිඥානච්‍යුති වර්ජිත නිරාධිපති කුශලාකුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් -පෙ- නිරාධිපති චිත්තජ මහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධිකර්මජ මහාභූතයෝ ය, බාහ්‍ය මහාභූතයෝ ය -පෙ- ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ ඒ ඒ උපාදය රූපයෝ ලැබෙත්. විභඞ්ගය සහජාතය අනුව උදුරනු. සහජාත ප්‍රත්‍යය බැහැර කිරීමක් නැත.

අධිපතිවන ධර්මයන් ගෙන් අන්‍ය වූ සාධිපතිජවන නාමස්කන්ධයෝ ය, සාධිපතිචිත්තජ රූපයෝ ය යන මොවුහු -පෙ- 'නව' අධිපතියෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ග උදුරනු.

**අධිපතිමූලක අඤ්ඤමඤ්ඤ දුකයෙහි** අධිපතිප්‍රත්‍යය ලබන අවස්ථාවෙහි අධිපති ධර්මයෝ ය, නො ලබන අවස්ථාවෙහි අහේතුක ක්‍රියා මහාකුශල මහාක්‍රියා ලෞකික විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හෘදය වස්තුවය ඔවුනොවුන් ගෙන්

Non-commercial distribution

ප්‍රත්‍යය ලබන නිරාධිපති චිත්තජ රූපයෝ ය ප්‍රතිසන්ධි කර්මජ මහාභූතයෝය බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුහු අධිපතිප්‍රත්‍යය බැහැර කෙරෙති. **"න අධිපති පච්චයා අඤ්ඤමඤ්ඤෙ තීණි"**

නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන සාධිපති චිත්තජ රූපයෝ ය, මහාභූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන සාධිපති චිත්තජ උපාදයයෝ ය යන මොහු අන්‍යෝන්‍යප්‍රත්‍යය බැහැර කෙරෙති. "පඤ්ච" කුසලෙන අබ්‍යාකතය හා අකුසලෙන අබ්‍යාකතය අධිපතියෙහි මෙන් විස්තර කරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්ති කාලයෙහි අභිධෙය ආරම්මණ දූකයෙහි මෙනි. රූපවාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ සාධිපති කුශලා කුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් උපදවන සාධිපති චිත්තජ මහාභූතයන් නිසා උපදනා සාධිපති චිත්තජ උපාදය රූපයෝ ලැබෙත්. **"අබ්‍යාකතං -පෙ- පච්චයා, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං උපාදයරූපං"**

නාමසකන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන නිරාධිපති චිත්තජ රූපයෝ ය, හෘදයවස්තුවෙන් අන්‍ය වූ ප්‍රතිසන්ධි කර්මජ රූපයෝය, මහාභූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන නිරාධිපති චිත්තජ උපාදය රූපයෝ ය, ප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදය රූපයෝ ය, -පෙ- පච්චනීයයෙහි "පඤ්ච"

අධිපති වන ධර්මයන් ගෙන් අන්‍ය වූ සාධිපතිජවන නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන් ගෙන් ප්‍රත්‍යය ලබන සාධිපති චිත්තජ මහා භූතයෝ ය, අනුලෝමයෙහි 'තීණි' කුසලෙන කුසලය අකුසලෙන අකුසලය යන දෙවාරය අධිපතිය අනුව විස්තර කරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතෘපාඨයෙන් අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාක්‍රියා අට ය, නියමයෙන් අධිපතිය ලැබෙන මහද්ගත ක්‍රියා නවය හා ඵලසිත් සතරය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අධිපතිධර්ම වර්ජිත වූ මහාක්‍රියා අට ය, මහද්ගත ක්‍රියා නවය ය, ඵලසිත් සතර ය, චෛතසික අටතිසය -පෙ- ලැබෙත්. රූපවාරයෙහි පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ සාධිපති කුශලා කුශල ක්‍රියා නාමස්කන්ධයන් විසින් උපදවන සාධිපති චිත්තජ මහාභූතයන් නිසා .උපදනා මහාභූතයෝ ලැබෙත්. **"අබ්‍යාකතං -පෙ- පච්චයා, විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා, එකං මහාභූතං පටිච්ච -පෙ- ද්වෙ මහාභූතා"**

Non-commercial distribution

**අධිපතිමූලක නිස්සය දුකය** සහජාතදුකය මෙනි. උපනිස්සය දුකය අනන්තර දුකය මෙනි. අධිපතිමූලක පූරේජාතදුකයෙහි පඤ්ච-වෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලබන අවස්ථාවෙහි අධිපති ධර්මයෝ ය, නොලබන අවස්ථාවෙහි අකුසල් සිත් දොළොස ය, අහේතුක ක්‍රියා තුන ය, මහාක්‍රියා අට ය, අරූපවිපාක වර්ජිත ලෞකික විපාක අටවිස්ස ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ අධිපතිප්‍රත්‍යය බැහැර කෙරෙති. "**තීණි**"

කුසලෙන කුසලයෙහි කත්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාකුසල් අට ය අධිපතිය නියමයෙන් ලැබෙන මහද්ගත කුසල් නවය ය. මාර්ගසිත් සතර ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්මයෝ ය, අධිපති නොබලන අවස්ථාවෙහි වූ මහා කුසල් අට ය, චෛතසික අටතිස ය යන -පෙ- ලැබෙත්. විභඞ්ගය පූරේජාතයෙහි මෙනි.

අකුසලෙන අකුසලයෙහි කත්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමි-යෙහි අධිපති ලබන අවස්ථාවෙහි වූ ලෝභමූල සිත් අටය, දෝසමූලසිත් දෙක ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්මයෝ ය, අධිපති නො ලබන අවස්ථාවෙහි වූ අකුසල් සිත් දොළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයව -පෙ- අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය පූරේජාතයෙහි මෙනි.

අබ්‍යාකතවාරයෙහි පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාක්‍රියා අට ය, මහද්ගතක්‍රියා නවය ය, ඵලසිත් සතර ය, චෛතසික අටතිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා වූ අධිපති ධර්මයෝ ය, නො ලැබෙන අවස්ථාවෙහි වූ අහේතුකක්‍රියා මහාක්‍රියාවෝ ය, අරූප විපාක හැර ලෞකික විපාක අටවිස්ස ය, චෛතසික පන්තිස ය යන අවයව -පෙ- නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය පූරේජාතයෙහි මෙනි.

අරූපභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ අධිපති ධර්මයන් ගෙන් අන්‍ය වූ ලෝභමූල මහාකුශල මහාක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිමමාර්ග සවිඵල නාමස්කන්ධයෝ ය, සාධිපතිචිත්තජ රූපයෝ ය යන මොඝ පූරේජාත ය බැහැර කෙරෙති. "**අධිපතිපච්චයා න පුරේජාතෙ සත්ත**" "සත්ත" යනු කුසලෙන කුසල ය, කුසලෙන අබ්‍යාකත ය, අකුසලෙන අකුසල ය, අකුසලෙන අබ්‍යාකත ය, අබ්‍යාකතෙන අබ්‍යාකත ය, කුසලාබ්‍යාකතෙන අබ්‍යාකත ය, අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය යන මොඝ ය.

Non-commercial distribution

කුසලෙන කුසලයෙහි කතීඃපාඨයෙන් අරූපභූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහා කුසල් අට ය, සැමකල්හිම අධිපති ප්‍රත්‍යය ලැබෙන අරූපකුසල් සතර ය, උපරිම මාර්ග තුනය, චෛතසික සතිස ය යන අවයව -පෙ- අධිපති ධර්ම වර්ජිත මහා කුසල් අට ය, අරූපකුසල් සතර ය උපරිමමාර්ග තුන ය, චෛතසික සතිස ය යන අවයව නාමසකන්ධයෝ ලැබෙත්. "කුසලං -පෙ- න පුරේජාත පච්චයා, අරූපෙ කුසලං එකං -පෙ- ඛන්ධා" කුසලෙන අබ්‍යාකතය අධිපතිය සේ විස්තර කරනු.

අකුසලෙන අකුසලයෙහි කතීඃපාඨයෙන් අරූපභූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල සිත් අට ය, චෛතසික දෙවිස්ස ය යන අවයව -පෙ- අධිපති ධර්ම වර්ජිත ලෝභමූල සිත් අට ය, චෛතසික දෙවිස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය "අරූපෙ" යනු යොද උදුරනු. අකුසලෙන අබ්‍යාකතය අධිපති අනුව විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් අරූපභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාක්‍රියා අට ය, අරූප ක්‍රියා සතර ය, ඵල සිත් සතර ය, චෛතසික සතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්ම වර්ජිත මහාක්‍රියා අරූප ක්‍රියා ලෝකෝත්තර ඵල අවයව නාමස්කන්ධයෝ ය, පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය ලබන අවස්ථාවෙහි වූ මහා ක්‍රියා අට ය, මහද්ගතක්‍රියා නවය ය ඵලසිත් සතර ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා සාධිපති චිත්තජරූපයෝ ය යන මොවුහු ලැබෙත්. රූපාවාරයේ අභිධෙය අධිපතිප්‍රත්‍යයෙහි මෙන් ගන්නේ ය. **"අබ්‍යාකතං -පෙ- න පුරෙජාතපච්චයා, අරූපෙ විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං -පෙ- ද්වෙ ඛන්ධා, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙපටිච්ච චිත්තසමුට්ඨානං රූපං උපාදය රූපං එකං මහාභූතං -පෙ- මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨාන රූපං, උපාදය රූපං"** කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙවාරය අධිපති ප්‍රත්‍යය අනුව විස්තර කරනු.

අරූපවිපාක සතර ය අරූප භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්මයෝ ය නො ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල මනෝද්වාරාවර්ජන මහාකුශල මහාක්‍රියා නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධි-නාමස්කන්ධයෝ ය, නිරාධිපතිචිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්ති කර්මජරූපයෝ ය යන මොහු, පච්චනීයයෙහි **"න අධිපතිපච්චයා න පුරෙජාතෙ සත්ත"**

Non-commercial distribution

කුසලෙන කුසලයෙහි කතීඃපාඨයෙන් අරූපභූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුසල් අටය, සැමකල්හිම අධිපති ලැබෙන අරූප කුසල් සතර හා මාර්ගසිත් තුන ය චෛතසික සතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපතිධර්මයෝ ය අධිපතිය නො ලැබෙන අවස්ථාවෙහි වූ මහා කුසල් අට ය චෛතසික සතිස ය යන අවයව -පෙ- අවයව නාමස්කන්ධයෝ ය යන මොවුහූ ලැබෙත්. **"අරූපෙ කුසලං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා"**

කුසලෙන අබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය නො ලැබෙන අවස්ථාවෙහි මහාකුසල් අට ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්. **"කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං"**

අකුසලෙන අකුසලයෙහි අරූපභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල සිත් අට ය, චෛතසික දෙවිස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා වූ අධිපති ධර්මයෝ ය, අධිපති නොලැබෙන අවස්ථාවෙහි ලෝභමූල සිත් අට ය චෛතසික දෙවිස්ස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- අවයව නාමස්කන්ධයෝ ය යන මොවුහූ ලැබෙත්. **"අරූපෙ අකුසලං එකං -පෙ- ඛන්ධා"**

අකුසලෙන අබ්‍යාකයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය නො ලැබෙන අවස්ථාවෙහි අකුසල් සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා නිරාධිපති චිත්තජ රූපයෝ ලැබෙත්. **"අකුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං"**

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් අරූපවිපාක සතර ය, අරූපභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහා ක්‍රියා අට ය අධිපති ලැබීම නියත වූ අරූප ක්‍රියා සතර හා ඵලසිත් සතර ය, චෛතසික සතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්මයෝ ය, අධිපති නොලබන අවස්ථාවෙහි වූ මනෝද්වාරාවර්ජනය ය, මහා ක්‍රියා අට ය, චෛතසික දෙතිස ය යන අවයව නාමස්කන්ධයෝ ය, පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත ලෞකිකවිපාක අටොළොස ය, අහේතුක ක්‍රියා තුන ය. චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ය යන මොවුහු ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි ප්‍රතිසන්ධි සිත් එකුන්විස්ස සහජාතයෙහි මෙන් ගන්නේ ය. රූපවාරයෙහි පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය

Non-commercial distribution

නො ලබන අවස්ථාවෙහි සහජාත දුකයෙහි මෙන් අභිධෙය ගන්නේය. **"අරූපෙ විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං"** ප්‍රතිසන්ධිකාලය හා රූප පිළිබඳ සහජාත විභඞ්ගය සහජාතය අනුව උදුරනු. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙවාරය සහජාතදුකය අනුව විස්තර කරනු.

පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලබන අවස්ථාවෙහි අධිපති ධර්‍ම වර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්ධයෝ, අනුලොමයෙහි **"තීණි"** අකුසලෙන කුසලය අකුසලෙන අකුසලය යන දෙක්හි පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන කුශලා කුශලයන් ගන්නේ ය. විභඞ්ගය පුරේජාතය අනුව උදුරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාක්‍රියා අට ය, සැමකල්හි අධිපති ලැබෙන මහද්ගතක්‍රියා නවය හා ඵලසිත් සතර ය, චෛතසික අටතිස ය යන අවයව -පෙ- අධිපති ධර්‍මවර්ජිත -පෙ- නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය පුරේජාතය අනුව උදුරනු.

**අධිපතිමූලක ආසේවන දුකයෙහි** අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයන්හි ද සැම කල්හි අධිපති ලැබෙන මහද්ගතකුශල මහද්ගතක්‍රියා ලෝකෝත්තර මාර්‍ග ජවනයන්හි ද ඇති අධිපතිධර්‍මයෝ ය, අධිපතිප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි වූ අකුශල හසිතෝත්පාද මහා කුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය යන මොවුහු අධිපතිප්‍රත්‍යය බැහැර කෙරෙති. **"තීණි"**

• කුසලෙන කුසලයෙහි අධිපතිප්‍රත්‍යය ලබන අවස්ථාවෙහි මහාකුශල ද්විතීයාදි ජවනයෝ ය, සැමකල්හි අධිපති ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුශලයෝ ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපතිධර්‍මයෝ ය, අධිපති නො ලබන අවස්ථාවෙහි වූ මහාකුශල ද්විතීයාදි ජවනයෝ ය, චෛතසික අටතිස ය යන අවයවනාමස්කන්ධයෝ ය - යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. විභඞ්ගය ආසේවනය අනුව උදුරනු.

අකුසලෙන අකුසලයෙහි කර්‍තෲපායයෙන් අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ ලෝභමූල ද්වේෂමූල ද්විතීයාදි ජවනයෝ ය, චෛතසික සවිස්සය ය යන අවයව වූද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්‍මයෝ ය. අධිපති නොලබන අවස්ථාවෙහි වූ අකුශල ද්විතීයාදි ජවනයෝ ය චෛතසික සත්විස්සය යන අවයව නාමස්කන්ධයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. විභඞ්ගය ආසේවනය අනුව උදුරනු.

Non-commercial distribution

අබ්‍යාකත වාරයෙහි කතීඃපාඨයෙන් අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතක්‍රියා නවය ය, චෛතසික පන්තිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපතිධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි හසිතෝත්පාද මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- ලැබෙත්. විභඩ්ගය ආසේවනය අනුව උද්ධරත්‍ා.

අධිපතිප්‍රත්‍යය ලබන අවස්ථාවෙහි අධිපතිධර්ම හැර ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ප්‍රථමජවනයෝ ය, ඵලසිත්සතර ය යන නාමස්කන්ධයෝ ය, සාධිපති චිත්තජ රූපයෝ ය යන මොවුහු ආසේවන ප්‍රත්‍යය බැහැර කෙරෙති. **"අධිපතිපච්චයා න ආසෙවනෙ නව"**

කුසලෙන කුසලයෙහි කතීඃපාඨයෙන් අධිපති ලැබෙන අවස්ථාවෙහි මහාකුශල ප්‍රථමජවනය ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අධිපතිධර්ම වර්ජිත මහාකුශල -පෙ- අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. විභඩ්ගය අධිපතිය අනුව උද්ධරත්‍ා. කුසලෙන අබ්‍යාකතය අධිපතිය අනුව විස්තර කරත්‍ා. කුසලෙන කුසලාබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාකුශල ප්‍රථමජවනයෝ ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අධිපතිධර්ම වර්ජිත -පෙ- සාධිපතිචිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්. විභඩ්ගය උද්ධරත්‍ා.

අකුසලෙන අකුසලයෙහි කතීඃපාඨයෙන් අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ ලෝභමූල ද්වේෂමූල ප්‍රථම ජවනයෝ ය, චෛතසික සවිස්ස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්ම වර්ජිත ලෝභමූල ද්වේෂමූල -පෙ- නාමස්කන්ධයෝ ලැබෙත්. අකුසලෙන අබ්‍යාකතය අධිපතිය අනුව විස්තර කරත්‍ා. අකුසලෙන අකුසලාබ්‍යාකතයෙහි පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල ද්වේෂ මූල ප්‍රථම ජවනයෝ ය, -පෙ- යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- නාමස්කන්ධයන් හා ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ද ලැබෙත්. විභඩ්ගය උද්ධරත්‍ා.

අබ්‍යාකතවාරයෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාක්‍රියා ප්‍රථම ජවනයෝ ය, ඵලජවනයෝ ය, චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අධිපතිධර්ම වර්ජිත මහාක්‍රියා ප්‍රථම ජවන ඵල ජවන නාමස්කන්ධයන් හා සාධිපතිචිත්තජ රූපයෝ ය, පඤ්චවෝකාරභූමියෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි මහාක්‍රියා ප්‍රථම ජවනයෝ ය, මහද්ගතක්‍රියා නවය ය යන අවයව වූ ද සමූහ වූ ද

Non-commercial distribution

නාමස්කන්ධයන් නිසා උපදනා සාධිපතිචිත්තජ රූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. රූපවාරයෙහි අධිපතියෙහි මෙන් අභිධෙය ගන්නේය. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය අධිපතිප්‍රත්‍යය අනුව විස්තර කරනු.

අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල ද්වේෂමූල මහා කුශල මහාක්‍රියා ප්‍රථමජවනයන්හි හා ඵලචිත්තයන් හි ලැබෙන අධිපතිධර්මයෝ ය, අධිපතිප්‍රත්‍යය නො ලැබෙන අවස්ථාවෙහි අකුශල හසිතෝත්පාද මහාකුශල මහාක්‍රියා ප්‍රථමජවන ආවර්ජන ලෞකිකවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, නිරාධිපතිචිත්තජ ප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි "නව"

කුසලෙන කුසලයෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි මහාකුශල ප්‍රථමජවනයෝ ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපතිධර්මයෝ ය, අධිපති නොලැබෙන අවස්ථාවෙහි මහාකුශල ප්‍රථම ජවනයෝ ය, චෛතසික අටතිස ය යන අවයව -පෙ- නාමස්කන්ධයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කුසලෙන අබ්‍යාකතයෙහි පඤ්චවෝකාරයෙහි අධිපති ප්‍රත්‍යය නො ලැබෙන අවස්ථාවෙහි මහාකුසල් අට ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා නිරාධිපති චිත්තජ රූපයෝ ලැබෙත්. විභඞ්ගය උදුරනු. කුසලෙන කුසලාබ්‍යාකතයෙහි පඤ්චවෝකාරයෙහි අධිපති නො ලැබෙන අවස්ථාවෙහි මහාකුශල ප්‍රථම ජවනයෝ ය, චෛතසික අටතිස ය යන -පෙ- අවයව නාමස්කන්ධයන් හා ඔවුන් විසින් උපදවන නිරාධිපති චිත්තජරූපයෝ ද ලැබෙත්. විභඞ්ගය උදුරනු.

අකුසලෙන අකුසලයෙහි කත්‍රෘපාධයෙන් අධිපති ලැබෙන අවස්ථාවෙහි වූ ලෝභමූල ද්වේෂමූල ප්‍රථම ජවනයෝ ය, චෛතසික සවිස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්මයෝ ය, අධිපති නො ලබන අවස්ථාවෙහි අකුශල ප්‍රථම ජවනයෝ ය, චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයන් -පෙ- අවයව නාමස්කන්ධයෝ ය යන මොවුහු ලැබෙත්. විභඞ්ගය උදුරනු. අකුසලෙන අබ්‍යාකතයෙහි පඤ්චවෝකාරභූමියෙහි අධිපති නො ලබන අවස්ථාවෙහි අකුසල් සිත් දෙළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා නිරාධිපති චිත්තජරූපයෝ ලැබෙත්. විභඞ්ගය උදුරනු. අකුසලෙන අකුසලාබ්‍යාකතයෙහි පඤ්චවෝකාරභූමියෙහි අධිපති නො ලබන අවස්ථාවෙහි අකුශල ප්‍රථම

Non-commercial distribution

ජවනයෝ ය, චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- අවයව නාමස්කන්ධයන් හා ඔවුන් විසින් උපදවන නිරාධිපති චිත්තජ රූපයෝ ද ලැබෙත්. විභඞ්ගය උදුරනු.

අබ්‍යාකතවාරයෙහි කතීඃපාඨයෙන් අධිපති ලැබෙන අවස්ථාවෙහි මහාක්‍රියා ප්‍රථම ජවනයෝ ය, ඵලජවනයෝ ය. චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපතිධර්මයෝ ය, අධිපති නො ලැබන අවස්ථාවෙහි හසිතෝත්පාද මහාක්‍රියා ප්‍රථමජවනයෝ ය, ආවර්ජනද්වය ය, ලෞකික විපාක දෙතිස ය, චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා හසිතෝත්පාද මහාක්‍රියා ප්‍රථම ජවනයෝ ය, ආවර්ජනද්වයය, ලෞකික විපාක දෙතිසය, චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන නිරාධිපති චිත්තජරූපයෝ ය, පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය නො ලබන අවස්ථාවෙහි හසිතෝත්පාද මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා නිරාධිපති චිත්තජ රූපයෝ ය යන මේ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිවාරයෙහි හා රූපවාරයේ අභිධෙය සහජාත දූකයෙහි මෙන් ගන්නේ ය. විභඞ්ගය ද සහජාතාය අනුව උදුරනු.

අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්මයන් ගෙන් අන්‍ය වූ ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගත කුශල මහද්ගතක්‍රියාවෝ ය, මාර්ගසිත් සතර ය යන නාමස්කන්ධයෝ අනුලෝමයෙහි "තීණි" කුසලෙන කුසලයෙහි කතීඃපාඨයෙන් අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුශල ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතකුශල නවය ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අධිපතිධර්ම වර්ජිත මහාකුශල ද්විතීයාදි ජවනයෝ ය -පෙ- අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය ආසේවනයෙහි මෙන් උදුරනු. අකුසලෙන අකුසලයෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි වූ ලෝභමූල ද්වේෂමූල ද්විතීයාදි ජවනයෝ ය, චෛතසික සවිස්ස ය යන -පෙ- අධිපතිධර්ම වර්ජිත -පෙ- නාමස්කන්ධයෝ ලැබෙත්. අබ්‍යාකතයෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි වූ මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය මහද්ගතක්‍රියා නවය ය, චෛතසික පන්තිස ය යන -පෙ- අධිපතිධර්ම වර්ජිත නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය ආසේවනයෙහි මෙනි.

**අධිපතිමූලක කම්මදූකයෙහි** අධිපති ප්‍රත්‍යය ලැබෙන තන්හි අධිපති ධර්මයෝ ය. අධිපති නො ලැබෙන අවස්ථාවෙහි වූ කුශලා කුශල ක්‍රියා චේතනා වර්ජිත අකුශල අහේතුක ක්‍රියා මහාකුශල මහාක්‍රියා ලෞකික විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතරය, නිරාධිපති චිත්තජ

Non-commercial distribution

ප්‍රතිසන්ධි කර්මජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු අධිපති ප්‍රත්‍යය බැහැර කෙරෙති. "නව"

කුසලෙන කුසලයෙහි කත්‍ථපායයෙන් අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාකුසල් අට ය, මහද්ගතකුසල් නවය ය, මාර්ගසිත් සතර ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්මයෝ ය, අධිපති නොලැබෙන අවස්ථාවෙහි මහා කුසල් අටය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා මහාකුසල් අට ය චේතනා වර්ජිත චෛතසික සත්තිස ය යන -පෙ- ලැබෙත්. විභඞ්ගය කර්මයෙහි මෙනි. කුසලෙන අබ්‍යාකතය සහජාතය මෙන් විස්තර කරනු. කුසලෙන කුසලාබ්‍යාකතය චේතනාව හැර සහජාතය මෙන් විස්තර කරනු.

අකුසලෙන අකුසලයෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල ද්වේෂමූල සිත් දශය ය, චෛතසික සවිස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි අකුසල සිත් දෙළොස ය චෛතසික සත් විස්ස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අකුසල් දෙළොස ය චේතනා වර්ජිත චෛතසික සවිස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. විභඞ්ගය කර්මයෙහි මෙනි. අකුසලෙන අබ්‍යාකතය අකුසලෙන අකුසලාබ්‍යාකතය යන දෙක සහජාතදුකයෙහි මෙන් විස්තර කරනු. චේතනාව හරිනු.

අබ්‍යාකතවාරයෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාක්‍රියා අට ය අධිපති නියත මහද්ගතක්‍රියා නවය ය, ඵලසිත් සතර ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපතිධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි අහේතුක ක්‍රියා මහාක්‍රියාවෝ ය ලෞකිකවිපාක දෙතිස ය චෛතසික පන්තිස ය යන අවයව -පෙ- අහේතුක ක්‍රියා මහාක්‍රියා ලෞකික විපාකයෝ ය ක්‍රියා චේතනා වර්ජිත චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයෝ ය ඔවුන් විසින් උපදවන නිරාධිපති චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි කර්මයෙහි මෙන් අභිධෙය ගන්නේ ය. රූපවාරයෙහි නිරාධිපතිචිත්තජ ප්‍රතිසන්ධිකර්මජ අසංඥසත්ත්ව කර්මජරූපයන් ගන්නේ ය. විභඞ්ගය කර්මප්‍රත්‍යය අනුව උදුරනු. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙතන්හි සහජාතදුකය අනුව අභිධෙය ගන්නේ ය. කම්මදුකය අනුව විභඞ්ගය උදුරනු.

සාධිපති කුශලා කුශල ක්‍රියා චේතනාවෝ කර්මප්‍රත්‍යය බැහැර කෙරෙති. අනුලෝමපච්චනීයයෙහි "තීණි" කුසලෙන කුසලයෙහි අධිපති ලබන අවස්ථාවෙහි මහා කුසල් අටය, අධිපති නියත වූ මහද්ගත කුසල් නවය

Non-commercial distribution

හා මාර්‍ග සිත් සතරය, චේතනා වර්ජිත චෛතසික සත්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් නිසා උපදනා චේතනාව ලැබේ. "**කුසලෙ ඛන්‍ධෙපටිච්ච කුසලාචෙතනා**" අකුසලෙන අකුසලයෙහි ලෝභමූලසිත් අට ය, ද්වේෂමූල සිත් දෙක ය, විචිකිත්සාචේතනා වර්ජිත චෛතසික පස්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් නිසා උපදනා චේතනාව ලැබේ. "**අකුසලෙ ඛන්‍ධෙ පටිච්ච අකුසලා චෙතනා**" අබ්‍යාකතවාරයෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහා ක්‍රියා අටය, අධිපති නියත මහද්ගත ක්‍රියා නවය ය, චේතනා වර්ජිත චෛතසික සූතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් නිසා උපදනා චේතනාව ලැබේ. **අබ්‍යාකතෙ ඛන්‍ධෙපටිච්ච කිරියාබ්‍යාකතා චෙතනා.**

නිරාධිපති කුශලා කුශල ක්‍රියා චේතනාවෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝය යන මොවුහු, පච්චනීයයෙහි "**තීණි**" කුසලෙන කුසලයෙහි අධිපති නො ලැබෙන අවස්ථාවෙහි මහාකුසල් අට ය චේතනා වර්ජිත චෛතසික සත්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් නිසා උපදනා චේතනා ලැබේ. "**කුසලෙ ඛන්‍ධෙ පටිච්ච කුසලා චෙතනා**" අකුසලෙන අකුසලයෙහි අධිපති නො ලැබෙන අවස්ථාවෙහි අකුසල් සිත් දොළොස ය, චේතනා වර්ජිත චෛතසික සවිස්ස ය යන -පෙ- චේතනාව ලැබේ. "**අකුසලෙ ඛන්‍ධෙ පටිච්ච අකුසලා චෙතනා**" අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්ති කාලයෙහි අධිපති නොලැබෙන අවස්ථාවෙහි අහේතුකක්‍රියා තුනය, මහාක්‍රියා අට ය චේතනා වර්ජිත චෛතසික සූතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් නිසා උපදනා චේතනාව ලැබේ. "**කිරියාබ්‍යාකතෙ ඛන්‍ධෙ පටිච්ච කිරියාබ්‍යාකතා චෙතනා**" රූපවාරයෙහි බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයන් ගෙන් විභඞ්ගය උදුරනු.

අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපති ධර්‍ම හා කුශලා කුශල ක්‍රියා චේතනා ද හැර දෙපනස් සාධිපතිජවන නාමස්කන්‍ධයෝ ය, ඔවුන් විසින් උපදවන සාධිපති චිත්තජ රූපයෝ ය යන මොහු, අනුලෝමයෙහි "**නව**" විස්තර කරනු.

**අධිපතිමූලක විපාක දුකයෙහි** ඵලසිත්වල අධිපති ධර්මයෝ ය, ලෞකිකවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්‍ධිනාමස්කන්‍ධයෝ ය, ලෞකික විපාකයන් විසින් උපදවන චිත්තජරූපයෝ ය, ප්‍රතිසන්‍ධිකර්‍මජ රූපයෝ ය යන මොහු අධිපතිප්‍රත්‍යය බැහැර කරති. පච්චනීයානුලෝමයෙහි '**එකං**' එනම් අබ්‍යාකතෙන අබ්‍යාකතය යි. එහි කර්‍මපාථයෙන් ඵලසිත් සතර ය, චෛතසික සතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් නිසා උපදනා අධිපති ධර්මයෝ ය, ලෞකික විපාක දෙතිස ය, චෛතසික පන්තිස

Non-commercial distribution

ය යන -පෙ- අවයව නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. ප්‍රතිසන්ධි වාරයේ අභිධෙය කියනු. රූපවාරයෙහි පඤ්චවෝකාරයෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත ලෞකික විපාක නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන නිරාධිපති චිත්තජ මහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධයන් හා උපදනා කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදිනා භූතරූප සහිත වූ විපාකයන් උපදවන නිරාධිපති චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොව්හු ලැබෙත්. විභඞ්ගය විපාක ප්‍රත්‍යය අනුව උදුරනු.

අධිපතිධර්මයන්ගෙන් අන්‍ය වූ සාධිපති කුශලා කුශල ක්‍රියා නාමස්කන්ධයෝ ය, කුශලාකුශලක්‍රියාවන් විසින් උපදවන සාධිපති චිත්තජ රූපයෝ ය යන මොවුහු විපාකප්‍රත්‍යය බැහැර කෙරෙති. අනුලෝමපච්චනීයයෙහි **නව**. කුසල පදයේ වාර තුන හා අකුසල පදයේ වාර තුන අධිපතිප්‍රත්‍යය අනුව අභිධෙය ගෙන විස්තර කරනු.

අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතිපායයෙන් අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහා ක්‍රියා අට ය අධිපති නියත මහද්ගත ක්‍රියා නව ය ය චෛතසික පන්තිසය යන අවයව -පෙ- අධිපති ධර්මවර්ජිත මහාක්‍රියා අට ය, මහද්ගතක්‍රියා නවය ය, චෛතසික පන්තිස ය යන -පෙ- ලැබෙන්. රූපවාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ සාධිපති කුසලා කුසල ක්‍රියා නාමස්කන්ධයන් විසින්උපදවන සාධිපතිචිත්තජ මහාභූතයන් නිසා උපදනා භූතරූප සහිත සාධිපති චිතකජ උපාදයරූපයෝ ලැබෙත්. විභඞ්ගය උදුරනු.

කුශලාකුශලක්‍රියා නාමස්කන්ධයන්හි අධිපති ධර්මයෝ ය, අධිපති නොලබන අවස්ථාවෙහි වූ අකුශල අහේතුක ක්‍රියා මහා කුශල මහාක්‍රියා නාමස්කන්ධයෝ ය, කුශලාකුශලක්‍රියා නාමස්කාධයන් විසින් උපදවන නිරාධිපති චිත්තජ රූපයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු පච්චනීයයෙහි **'නව'** කුශලාකුශල දෙපදයේ වාර සයෙහි සහජාතදූකයේ පච්චනීයානුලෝමය අනුව අභිධෙය ගෙන විභඞ්ග උදුරනු.

අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතිපායයෙන් අධිපති ලැබෙන අවස්ථාවෙහි මහාක්‍රියා අට ය, අධිපති නියත මහද්ගත ක්‍රියා නවය ය. චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි අහේතුක ක්‍රියා මහාක්‍රියා ය, චෛතසික පන්තිස ය යන නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන නිරාධිපති චිත්තජ රූපයෝ ය යන මොවුහු

Non-commercial distribution

ලැබෙත්. රූපවාරයෙහි පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ නිරාධිපති කුසලා කුසල ක්‍රියා නාමස්කන්ධයන් විසින් උපදවන නිරාධිපති චිත්තජමහාභූතයෝ ය. බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත උපාදයරූපයෝ ලැබෙත්. **"කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච -පෙ- ඛන්ධා චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා -පෙ- මහාභූතෙ පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං උපාදය රූපං බාහිරං ආහාරසමුට්ඨානං උතු සමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං -පෙ- රූපං"**

අධිපතිධර්ම වර්ජිත ඵලනාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ය යන මොවුහු, අනුලෝමයෙහි "**එකං**" 'අබ්‍යාකතො' යන කතිෘපාඨයෙන් ඵලසිත් සතර ය, චෛතසික සතිසය යන අවයව නාමසකන්ධයන් නිසා උපදනා අධිපති ධර්ම වර්ජිත ඵලසිත් සතර ය, -පෙ- ඔවුන් විසින් උපදවන චිත්තජ රූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පනයෝ ලැබෙත්. රූපවාරයෙහි පඤ්චවෝකාරයෙහි උපදනා අවස්ථාවෙහි වූ ඵලනාමස්කන්ධයන් විසින් උපදවන චිත්තජමහාභූතයන් නිසා උපදනා වූ භූතරූප සහිත වූ සාධිපති චිත්තජ උපාදය රූපයෝ ලැබෙත්. විභඞ්ගය විපාකයෙහි මෙන් ප්‍රතිසන්ධි වාරය නො ගෙන උදුරනු.

**අධිපතිමූලක ආහාර දුකයෙහි** අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපති ධර්මයෝ ය, නො ලැබෙන අවස්ථාවෙහි අකුශල අහේතුක ක්‍රියා මහාකුසල මහාක්‍රියා ලෞකිකවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, නිරාධිපතිචිත්තජ ප්‍රතිසන්ධිකර්මජ ආහාරජ රූපයෝ ය යන මොවුහු අධිපතිප්‍රත්‍යය බැහැර කෙරෙති. පච්චනීයානුලෝමයෙහි "**නව**" කුශලා කුශල දෙපදයේ වාර සය සහජාතදුකය අනුව විස්තර කරනු. අබ්‍යාකතපදවාරයෙහි ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි වාරදෙක්හි අභිධෙය ද සහජාතයෙහි මෙනි. රූපවාරයෙහි දී ආහාරජරූප පමණක් සහජාත දුකය අනුව ගන්නේ ය. "ආහාර සමුට්ඨානං" යනු යොද විභඞ්ගය උදුරනු. ආහාර ප්‍රත්‍යය බැහැර කිරීමක් නැත්තේය.

බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ පච්චනීයයෙහි '**එකං**' විස්තර කරනු.

අධිපතිධර්මවර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්ධයන් හා සාධිපති චිත්තජරූපයෝ, අනුලෝමයෙහි "**නව**" අධිපතිය අනුව විස්තර කරනු.

**අධිපතිමූලක ඉන්ද්‍රියදුකයෙහි** අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්මයෝ ය, නො ලැබෙන අවස්ථාවෙහි අකුශල අහේතුකක්‍රියා

Non-commercial distribution

මහාකුශල මහාක්‍රියා ලෞකික විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, නිරාධිපති චිත්තජරූපයෝ ය, ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය, රූප ජීවිතේන්ද්‍රිය වර්ජිත අසංඥසත්ත්ව කර්මජරූපයෝ ය ප්‍රවෘත්තිකර්මජරූපයෝ ය යන මොවුහු අධිපති ප්‍රත්‍යය බැහැර කෙරෙති. පච්චනීයානුලෝමයෙහි **නව** කුශලා කුශල දෙපදයේ වාර සය සහජාතදුකයෙහි මෙන් විස්තර කරනු. අබ්‍යාතකයෙහි ප්‍රවෘත්තිප්‍රතිසන්ධි දෙවාරය සහජාතදුකයෙහි මෙනි. රූපවාරයෙහි චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ රූපයන් ද රූප ජීවිතේන්ද්‍රිය හැර අසංඥසත්ත්වකර්මජ රූපයන් ද ප්‍රවෘත්තිකර්මජ රූපයන්ද ගන්නේ ය. විභඞ්ගය උදුරනු. ඉන්ද්‍රියප්‍රත්‍යය බැහැර කිරිමක් නැත.

බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ ය. අසංඥසත්ත්වරූප ජීවිතේන්ද්‍රිය ය, ප්‍රවෘත්තිරූපජීවිතේන්ද්‍රි ය යන මොවුහු පච්චනීයයෙහි '**එකං**' "**බාහිරං එකං මහාභූතං -පෙ- ආහාර සමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං මහාභූතෙ පටිච්ච රූපජීවිතෙන්ද්‍රියං**"

අධිපතිධර්ම වර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්ධයන් හා සාධිපති චිත්තජරූපයෝ, අනුලෝමයෙහි '**නව**' විස්තර කරනු.

**අධිපතිමූලක ඣානදුකයෙහි** අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතීහුය, නො ලැබෙන අවස්ථාවෙහි අකුශල අහේතුක ක්‍රියා මහාකුශල මහාක්‍රියා ද්විපඤ්චවිඥාන වර්ජිත ලෞකිකවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, නිරාධිපති චිත්තජරූපයෝ ය, ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොවුහු අධිපතිප්‍රත්‍යය බැහැර කෙරෙති. '**නව**' කුශලපදයේ වාර තුන හා අකුශලපදයේ වාර තුන විස්තර කරනු. අබ්‍යාකතපදයෙහි ප්‍රවෘත්ති කාලයෙහි ද්විපඤ්ච විඤ්ඤාණය හරිනු. ප්‍රතිසන්ධි වාරයෙහි ප්‍රතිසන්ධිනාමස්කන්ධ හා කර්මජරූප ගන්නේය. රූපවාරයෙහි නිරාධිපති-චිත්තජරූප හා ප්‍රතිසන්ධිකර්මජරූපද ගන්නේය. විභඞ්ග ධ්‍යානප්‍රත්‍යය අනුව උදුරනු. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හා අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය සහජාතදුකය අනුව විස්තර කරනු.

ධ්‍යානප්‍රත්‍යය බැහැර කිරීමක් නැත්තේ ය. ද්විපඤ්චවිඥාන නාමස්කන්ධයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ, "**එකං**" හේතුමූලක ඣානදුකයේ පච්චනීයය අනුව විස්තර කරනු. අධිපතිධර්ම වර්ජිත සාධිපති ජවන නාමස්කන්ධයන් හා සාධිපති චිත්තජරූපයෝ "**නව**" අධිපතිය මෙන් විස්තර කරනු.

**අධිපතිමූලක මග්ගදුකයෙහි** අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපති ධර්මයෝ ය, නො ලැබෙන අවස්ථාවෙහි අකුසල් සිත් දෙළොස ය මහාකුශල

Non-commercial distribution

මහාක්‍රියා සහේතුකලෞකිකවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, නිරාධිපති සහේතුක චිත්තජ රූපයෝ ය, සහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය යන මොවුහු අධිපතිප්‍රත්‍යය බැහැර කෙරෙති. "**නව**" කුසලාකුසල දෙපදයේ වාර සය සහජාත දුකය අනුව විස්තර කරනු. අබ්‍යාකතවාරය හේතුදුකය අනුව විස්තර කරනු. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හා අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ද හේතුදුකය අනුව ම විස්තර කරනු. මාර්ගප්‍රත්‍යය බැහැර කිරීමක් නැත්තේය.

අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අහේතුක චිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොහු පච්චනීයයෙහි "**එකං**" හේතු දුකය අනුව විස්තර කරනු. අනුලෝමය ද එසේම ය.

**අධිපතිමූලක සම්පයුත්ත දුකය** ආරම්මණ දුකය මෙනි. **අධිපතිමූලකවිප්පයුත්ත දුකයෙහි** පඤ්චවෝකාරයෙහි අධිපති ලැබෙන කල්හි අධිපති ධර්මයෝ ය, නො ලැබෙන කල්හි අකුසල් සිත් දෙළොස ය, අහේතුක ක්‍රියාවෝ ය, මහාකුශල මහාක්‍රියා ය, අරූපවිපාක වර්ජිත ලෞකික විපාකයෝ ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, නිරාධිපති චිත්තජරූප හා ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය යන මොහු අධිපති ප්‍රත්‍යය බැහැර කෙරෙති. "**නව**" කුසලාකුසල දෙපදයේ වාර සය සහජාතය අනුව විස්තර කරනු.

අබ්‍යාකතවාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපති ලැබෙන ධර්මයෝ ය, නො ලැබෙන අවස්ථාවෙහි අහේතුක ක්‍රියා ය, මහාක්‍රියා ය, අරූපවිපාක වර්ජිත ලෞකික විපාකයෝ ය, චෛතසික පන්තිස ය යන අවයව නාමස්කන්ධයයෝ ය, නිරාධිපති චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයේ අභිධෙය විප්‍රයුක්තයෙහි මෙනි. රූපවාරයෙහි නිරාධිපති චිත්තජරූප හා ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ලැබෙත්.

අරූපභූමියෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපති ධර්ම වර්ජිත ලෝභමූල මහාකුශල මහාක්‍රියා නාමස්කන්ධයෝ ය, අධිපති නියත වූ අරූපකුශලක්‍රියා උපරිමමාර්ග සකලඵල නාමස්කන්ධයෝ ය යන මොහු විප්‍රයුක්තය බැහැර කෙරෙති. "**තීණි**" පුරේජාත දුකයෙහි මෙන් විස්තර කරනු.

අරූපවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අරූපභූමියෙහි අධිපති ලැබෙන කල්හි අධිපති ධර්මයෝ ය, නො ලැබෙන කල්හි

Non-commercial distribution

ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන මහාකුශල මහාක්‍රියා නාමස්කන්ධයෝ ය, බාහ්‍ය ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු පච්චනීයයෙහි "තීණි" කුසලෙන කුසලය හා අකුසලෙන අකුසලය පූර්වජාත දුකයෙහි පච්චනීය ය අනුව විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි අරූපවිපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය. අරූපභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලබන අවස්ථාවෙහි මහාක්‍රියා අට ය, සැමකල්හිම අධිපති ලැබෙන අරූපක්‍රියා සතර හා ඵලසිත් සතර ය, චෛතසික සතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි මනොද්වාරාවර්ජන ය, මහාක්‍රියා අට ය, චෛතසික සතිසය යන අවයව වූ නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- නාමස්කන්ධයෝ ය යන මොවුහු ලැබෙත්. රූපවාරයෙහි බාහිරරූපාදිය ගන්නේ ය. "**අරූපෙ විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච -පෙ- ඛන්ධා බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං -පෙ- උපාදායරූපං**"

පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ ය, සාධිපතිචිත්තජරූපයෝ ය යන මොවුහු අනුලෝමයෙහි "නව" අධිපතිප්‍රත්‍යය අනුව පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි යනු යොද විස්තර කරනු. විභඞ්ගය ද අධිපතිප්‍රත්‍යය අනුව උදුරනු. "ඛන්ධා වත්ථුං විප්පයුත්තපච්චයා, චිත්තසමුට්ඨානං රූපං ඛන්ධෙ විප්පයුත්තපච්චයා" යනු අගට යොදනු. අධිපතිමූලකඅත්ථි දුකය සහජාත දුකය මෙනි. නත්ථිදුකය අනන්තර දුකය මෙනි. අවිගත දුකය සහජාත දුකය මෙනි.

## අනන්තර සමනන්තර සහජාතමූලක දුකයෝ

අනන්තර සමනන්තර මූලක හේතුදුකාදිය ආරම්මණමූලක හේතුදුකාදිය මෙනි. සහජාතමූලක හේතුදුකාදිය ඉහත දැක්වුණු දුකයන් අනුව දත හැකි ය,

**සහජාතමූලක අඤ්ඤමඤ්ඤ දුකයෙහි** සහජාතය බැහැර කිරීමක් නැත. නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජරූප හා හෘදයවස්තුවෙන් අන්‍ය ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය. මහාභූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන උපාදාය රූපයෝ ය යන මොහු අන්‍යෝන්‍යප්‍රත්‍යය බැහැර කෙරෙති. "**පඤ්ච**" කුසලෙන අබ්‍යාකත ය, අකුසලෙන අබ්‍යාකතය යන දෙතන්හි අභිධෙය වශයෙන් රූප ගන්නේ ය. අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්ති කාලයට

Non-commercial distribution

විපාකක්‍රියා නාමසකන්ධයන් විසින් උපදවන චිත්තජරූප ගන්නේ ය. ප්‍රතිසන්ධිකාලයෙහි පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස ය. චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා හෘදය වස්තුවෙන් අන්‍ය වූ ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ලැබෙත්. රූප-වාරයෙහි පඤ්චවෝකාරයෙහි උපදනා අවස්ථාවෙහි අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාවුති වර්ජිත කුශලා කුශල විපාකක්‍රියා නාමස්කන්ධයන් විසින් උපදවන චිත්තජමහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා උපදනා කර්මජ මහාභූතයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා උපාදය රූපයෝ ලැබෙත්. "**විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තාරූපං උපාදයරූපං, බාහිරෙ මහාභූතෙ පටිච්ච උපාදයරූපං, -පෙ- අසඤ්ඤසත්තානං මහාභූතෙ පටිච්ච කටත්තාරූපං උපාදයරූපං**" කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හා අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හේතුමූලක අඤ්ඤමඤ්ඤදුකය අනුව විස්තර කරනු. පච්චනීයවාරය නැත්තේය. අනුලෝමවාරය ශුද්ධ අන්‍යෝන්‍යප්‍රත්‍යය අනුව විස්තර කරනු.

**සහජාතමූලක නිස්සය දුකයෙහි** සහජාතය බැහැර කිරීමක් නැත. නිඃශ්‍රයය බැහැරකිරීමක් ද නැත. පච්චනීයවාරය ද නැත. අනුලෝමවාරය ශුද්ධ සහජාතය අනුව විස්තර කරනු. **සහජාතමූලක උපනිස්සය දුකය** ආරම්මණ මූලක සහජාත දුකය අනුව ප්‍රත්‍යයන් බැහැර කරමින් විස්තර කරනු.

**සහජාතමූලක පුරේජාත දුකයෙහි** සහජාතය බැහැර කිරීමක් නැත. අරූපවිපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන අරූපකුශල අරූපක්‍රියා උපරිමමාර්ග සකලඵල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, චිත්තජාදිරූපයෝ ය යන මොවුහු පුරේජාතය බැහැර කෙරෙති. "**සත්ත**" කුසලපදයේ දෙවාරය හේතුමූලකයෙහි මෙන් විස්තර කරනු. අකුසල පදයේ දෙවාරය මෝහමූලයේ මෝහය නො හැර හේතුමූලකය අනුව විස්තර කරනු.

අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතිඃපාඨයෙන් අරූප විපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි මනෝද්වාරාවර්ජනය ය, මහාක්‍රියා අට ය, අරූපක්‍රියා සතර ය, ඵලසිත් සතර ය, චෛතසික සතිස ය යන අවයව -පෙ- නාමස්කන්ධයෝ ය, පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත විපාක

Non-commercial distribution

සිත් දෙවිස්ස ය ක්‍රියාසිත් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ය යන මොවුහු ලැබෙත්. ප්‍රතිසන්ධිවාරයෙහි හා රූපවාරයෙහි සහජාතයෙහි මෙන් අභිධෙය කියනු. "**අරූපෙ විපාකබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං**" ප්‍රතිසන්ධි වාරය හා රූපවාරය සහජාතයෙහි මෙන් කියනු. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හා අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ද සහජාතයෙහි මෙනි. පච්චනීයවාරය නැත්තේ ය. පඤ්චවෝකාර ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි "**තීණි**" පූර්වජාතය මෙනි.

**සහජාතමූලක ආසේවන ද්‍රකයෙහි** සහජාතය බැහැරකිරීමක් නැත. අකුශල හසිතෝත්පාද මහාකුශල මහාක්‍රියා ප්‍රථම ජවනයෝ ය, ආවර්ජන දෙක ය, විපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, චිත්තජ -පෙ- ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොහු ආසේවනප්‍රත්‍යය බැහැර කෙරෙති. "**නව**" කුසල පදයේ වාර තුන හා අකුසලපදයේ වාර තුන හේතුමූලක ආසේවන ද්‍රකයේ අනුලෝමපච්චනීය ය අනුව මෝහමූලයෙහි මෝහය නො හැර විස්තර කරනු.

අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්තිකාලයේ කර්මෝපාධියෙන් හසිතෝත්පාද මහාක්‍රියා ප්‍රථමජවනයෝ ය, ආවර්ජනද්වය, විපාකසතිස ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා -පෙ- අවයව නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ හසිතෝත්පාද මහාක්‍රියා ප්‍රථම ජවනයෝ ය මහද්ගතක්‍රියා නවය ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ය යන මොහු ලැබෙත්. ප්‍රතිසන්ධිවාරය හා රූපවාරය සහජාතය මෙනි. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හා අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ද සහජාතයෙහි මෙන් විස්තර කරනු. පච්චනීය නො ලැබේ. අනුලෝමය ශුද්ධ ආසේවන ය මෙන් විස්තර කරනු.

සහජාතමූලක කම්මද්‍රකයෙහි සහජාතය බැහැර කිරීමක් නැත. කුශලා කුශල ක්‍රියා චේතනා ය, බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ ය යන මොහු කර්මප්‍රත්‍යය බැහැර කෙරෙති. "**තීණි**" කුසලෙනකුසලය අකුසලෙන අකුසලය යන දෙවාරය හේතු මූලක කම්මද්‍රකයේ අනුලෝම පච්චනීය ය අනුව විස්තර කරනු.

අබ්‍යාකතවාරයෙහි ක්‍රියාසිත් විස්ස ය, චේතනා වර්ජිත චෛතසික සූතිසය යන අවයව වූද සමූහ වූද නාමස්කන්ධයන් නිසා උපදනාචේතනාව

Non-commercial distribution

ලැබේ. ප්‍රතිසන්ධිවාරය නො ලැබේ. රූපවාරයෙහි බාහ්‍යමහා භූතයෝ ය, ආහාරජ මහාභූතයෝය ඍතුජ මහා භූතයෝය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත උපාදය රූපයෝ ලැබෙත්. **කිරියාබ්‍යාකතෙ ඛන්‍ධෙ පටිච්ච චෙතනා කිරියාබ්‍යාකතා බාහිරං එකං -පෙ- මහා භූතෙ පටිච්ච උපාදය රූපං බාහිරං ආහාරසමුට්ඨානං -පෙ- රූපං** පච්චනීයවාරය නො ලැබේ. අනුලෝම වාරය කර්‍මශුද්ධවාරය සේ විස්තර කරනු.

**සහජාතමූලක විපාකදුකයෙහි** සහජාතය බැහැර කිරීමක් නැත. සකල කුශලා කුශල ක්‍රියා නාමස්කන්‍ධයෝ ය, ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ය, බාහිරරූපයෝ ය, -පෙ- ප්‍රවෘත්තිකර්‍මජ රූපයෝ ය යන මොහු විපාක ප්‍රත්‍ය බැහැර කෙරෙති. "**නව**" කුසලා කුසල දෙපදයේ වාර සය සහජාතය මෙන් විස්තර කරනු.

අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්තිකාලයෙහි ක්‍රියා සිත් විස්ස ය, චෛතසික පන්තිස ය යන ඈවයව නාමස්කන්‍ධයෝ ය, ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ය යන මොවුහු ලැබෙත්. ප්‍රතිසන්ධිවාරය නො ලැබේ. රූපවාරයෙහි පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි කුශලා කුශල ක්‍රියා නාමස්කන්‍ධයන් විසින් උපදවන චිත්තජ මහාභූතයෝ ය, බාහ්‍ය මහාභූතයෝ ය, -පෙ- ප්‍රවෘත්තිකර්‍මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ උපාදයරූපයෝ ලැබෙත්. "**කිරියාබ්‍යාකතං එකං ඛන්‍ධං -පෙ- ඛන්‍ධා, චිත්තසමුට්ඨානං ඤව රූපං, එකං මහාභූතං පටිච්ච -පෙ- මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං උපාදයරූපං, බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං -පෙ- රූපං**" කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය හා අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය සහජාතය අනුව විස්තර කරනු. පච්චනීය ය නො ලැබේ. අනුලෝමය විපාකශුද්ධවාරය අනුව විස්තර කරනු.

**සහජාතමූලක ආහාර දුකයෙහි** සහජාතය බැහැර කිරීමක් නැත. බාහ්‍ය ඍතුජ අසංඥසත්ත්ව කර්‍මජ ප්‍රවෘත්තිකර්‍මජ රූපයෝ ආහාරප්‍රත්‍යය බැහැර කෙරෙති. අනුලෝමපච්චනීයෙහි "එකං" කතීඃපායයෙන් බාහිරමහාභූතයෝ ය -පෙ- ප්‍රවෘත්තිකර්‍මජ මහා භූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ බාහ්‍ය -පෙ- ප්‍රවෘත්තිකර්‍මජ උපාදය රූපයෝ ලැබෙත්. "**බාහිරං එකං -පෙ- උතුසමුට්ඨානං, අසඤ්ඤසත්තානං -පෙ- උපාදයරූපං**" පච්චනීයවාරය නො ලැබේ. අනුලෝම වාරය ආහාර ශුද්ධවාරය මෙනි.

**සහජාතමූලක ඉන්‍ද්‍රියදුකයෙහි** සහජාතය බැහැර නො කෙරේ. බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ ය, අසඤ්ඤසත්ත්ව රූපජීවිතේන්‍ද්‍රියය,

Non-commercial distribution

ප්‍රවෘත්ති රූපජීවිතේන්ද්‍රිය ය යන මොවුහු ඉන්ද්‍රිය ප්‍රත්‍යය බැහැර කරති. "එකං" කතිඃපායයෙන් බාහ්‍ය ආහාරජ ඍතුජ මහාභූතයන් නිසා උපදනා භූතරූප සහිත වූ බාහ්‍ය ආහාරජ ඍතුජ උපාදයරූපයෝ ය, අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයන් නිසා උපදනා රූප-ජීවිතේන්ද්‍රිය යන මොවුහු ලැබෙත්. **බාහිරං එකං මහාභූතං -පෙ- ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං එකං මහාභූතං පටිච්ච -පෙ- උපාදයරූපං, අසඤ්ඤසත්තානං මහාභූතෙ පටිච්ච රූපජීවිතින්ද්‍රියං.** පච්චනීයය නො ලැබේ. අනුලෝමවාරය ඉන්ද්‍රියශුඩවාරය අනුව විස්තර කරනු.

**සහජාතමූලක ඣාන දුකයෙහි** සහජාතය බැහැර කිරීමක් නැත. ද්විපඤ්චවිඥාන නාමස්කන්ධයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු ධ්‍යාන ප්‍රත්‍යය බැහැර කෙරෙති. "**එකං**" ද්විපඤ්චවිඥාන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- නාමස්කන්ධයෝ ලැබෙත්. රූපවාරයෙහි බාහ්‍ය -පෙ- ප්‍රවෘත්ති කර්මජ මහාභූතයන් නිසා උපදනා භූතරූප සහිත වූ බාහ්‍යාදි උපාදය රූපයෝ ලැබෙත්. "**පඤ්චවිඤ්ඤාණ සහගතං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා, බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං -පෙ- රූපං**" පච්චනීය නො ලැබේ. අනුලෝමය ශුඩ ධ්‍යානප්‍රත්‍යය වාරය මෙනි.

**සහජාතමූලක මග්ග දුකයෙහි** සහජාතය බැහැර කිරීමක් නැත. අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අහේතුක චිත්තජ අහේතුක ප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොහු මාර්ගප්‍රත්‍යය බැහැර කෙරෙති. "එකං" පච්චනීය නො ලැබේ. අනුලෝමය මග්ගසුඩවාරය මෙනි.

**සහජාතමූලක විප්පයුත්ත දුකයෙහි** සහජාතය බැහැර කිරීමක් නැත. අරූපවිපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන මහා කුශල මහාක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිම මාර්ග සකල ඵල නාමස්කන්ධයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු විප්‍රයුක්තය බැහැර කෙරෙති. "**තීණි**" කුසලෙන කුසලය අකුසලෙන අකුසලය ය යන දෙවාරයෙහි පූර්වජාත දුකයෙහි මෙන් අභිධෙය ගන්නේ ය. "චත්තාරිං විප්පයුත්තපච්චයා" යනු යොද විභඞ්ගය උදුරනු.

අබ්‍යාකතවාරයෙහි අරූපවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාම සකන්ධ-යෝ ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මනෝද්වාරාවජ්ජන ය,

Non-commercial distribution

මහා ක්‍රියා අට ය, අරූපක්‍රියා සතර ය, ඵලසිත් සතර ය, චෛතසික සතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා -පෙ- අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. රූපවාරයෙහි බාහිර මහා භූතයෝ ය -පෙ- ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ -පෙ- උපාදයරූපයෝ ලැබෙත්. **"අරූපෙ විපාකාබ්‍යාකතං එකං -පෙ- බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං -පෙ- උපාදයරූපං"** පච්චනිය නො ලැබේ. අනුලෝමය විප්පයුත්තය මෙනි.

සහජාතමූලක අත්ථිදුකය නිස්සය දුකය මෙන් ද, නත්ථි විගත දුක දෙක අනන්තරදුකය මෙන් ද, අවිගතදුකය නිස්සය දුකය මෙන් ද විස්තර කරනු.

**අඤ්ඤමඤ්ඤ මූලකය**

**අඤ්ඤමඤ්ඤමූලක හේතුදුකාදිය** ඉහත කී පරිදි ප්‍රත්‍යයන් බැහැර කරමින් විස්තර කරනු. අඤ්ඤමඤ්ඤමූලක නිස්සය දුකය සහජාතදුකය අනුව විස්තර කරනු. උපනිස්සය දුකය ආරම්මණ දුකය අනුව විස්තර කරනු.

**අඤ්ඤමඤ්ඤමූලක පුරේජාත** දුකයෙහි අඤ්ඤමඤ්ඤය බැහැර කිරීමක් නැත. අරූපවිපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන මහාකුශල මහාක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිම මාර්ගී සකලඵල නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන හෘදය වස්තුව ය, ඔවුනොවුන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුහු පුරේජාතය බැහැර කෙරෙති. **"තීණි"** කුසලෙන කුසලය හේතුමූලක පුරේජාතය මෙන් විස්තර කරනු. අකුසලෙන අකුසලය මෝහ මූලයෙහි මෝහය නො හැර හේතුමූලක පුරේජාතය මෙන් විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතීපායයෙන් අරූපවිපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි මනෝද්වාරාවර්ජන ය, මහාක්‍රියා අට ය, අරූපක්‍රියා සතර ය, ඵල සතර ය, චෛතසික සතිස ය යන අවයව -පෙ- නාමස්කන්ධයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිවාර රූපවාර දෙක්හි අභිධෙය අඤ්ඤමඤ්ඤයෙහි මෙන් ගන්නේ ය. විභඞ්ගය "අරූපෙ විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං" යනු යොද උදුරනු.

නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජරූපයෝ ය, හෘදයවතුවෙන් අන්‍ය වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, මහාභූතයන් ගෙන්

Non-commercial distribution

ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදයරූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි "පඤ්ච" සහජාත මූලක අඤ්ඤමඤ්ඤදුකයේ අනුලෝම පච්චනී ය අනුව විස්තර කරනු. අනුලෝමය ශුද්ධ පූරේජාතය අනුව විස්තර කරනු.

**අඤ්ඤමඤ්ඤමූලක ආසේවන දුකයෙහි** අඤ්ඤමඤ්ඤය බැහැර කිරීමක් නැත. අකුශල හසිතෝත්පාද මහාකුශල මහාක්‍රියා ප්‍රථමජවනයෝ ය, ආවර්ජනද්වය ය, සතිස් විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධිනාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තුව ය, ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ -පෙ- ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුහු ආසේවනය බැහැර කෙරෙති. "**තීණි**" කුසලෙන කුසලයෙහි මහාකුශලප්‍රථමජවනය ගෙන විභඞ්ගය උදුරනු. අකුසලෙන අකුසලයෙහි අකුශල ප්‍රථම ජවනයන් ගන්නේ ය. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි හසිතෝත්පාද මහාක්‍රියා ප්‍රථමජවනයෝ ය, ආවර්ජනද්වය ය, විපාක සතිස ය චෛතසික අටතිස ය යන මොවුන් ගන්නේ ය. ප්‍රතිසන්ධිකාලයෙහි හා රූපවාරයෙහි අන්‍යෝන්‍යයෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ගය උදුරනු. පච්චනීය ය පූරේජාතදුකයේ පච්චනීය ය මෙනි. අනුලෝමය ශුධආසේවනය අනුව විස්තර කරනු.

**අඤ්ඤමඤ්ඤමූලක කම්මදුකයෙහි** නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ රූපයෝ ය, හෘදයවස්තුවෙන් අන්‍ය ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, මහාභූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදයරූපයෝ ය යන මොවුහු අඤ්ඤමඤ්ඤය බැහැර කෙරෙති. "**පඤ්ච**" ඉහත කී නයයන් අනුව විස්තර කරනු.

කුශලා කුශල ක්‍රියා චෙතනාවෝ ය, ඔවුනොවුන් ගෙන් ප්‍රත්‍යය ලබන බාහ්‍ය ආහාරජ ඍතුජ මහාභූතයෝ ය යන මොවුහු කර්මප්‍රත්‍යය බැහැර කෙරෙති. "**තීණි**" කුසලෙන කුසලය අකුසලෙන අකුසලය යන දෙවාරය හේතුමූලක කම්මදුකයේ අනුලෝමපච්චනීය ය අනුව විස්තර කරනු. අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්තිකාලයේ කතෘපාධයෙන් ක්‍රියාචේතනා ගන්නේ ය, රූපවාරයෙහි බාහ්‍ය ආහාරජ ඍතුජ මහාභූතයන් නිසා උපදනා බාහ්‍යාදි මහාභූතයන් ගන්නේ ය. "**කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කිරියාබ්‍යාකතා චෙතනා, බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං එකං මහාභූතං -පෙ- මහාභූතා.**"

මහාභූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන බාහ්‍ය ආහාරජ ඍතුජ උපාදය රූපයෝ, පච්චනීයයෙහි "**එකං**" බාහ්‍ය ආහාරජ ඍතුජ මහාභූතයන් නිසා උපදනා බාහ්‍ය ආහාරජ ඍතුජ උපාදය රූපයෝ ලැබෙත්. "**බාහිරෙ මහාභූතෙ**

Non-commercial distribution

පටිච්ච උපාදයරූපං ආහාරසමුට්ඨානෙ උතුසමුට්ඨානෙ මහාභූතෙ පටිච්ච උපාදයරූපං"

අඤ්ඤමඤ්ඤමූලක විපාක දුකයෙහි නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන විපාකචිත්තජ රූපයෝ ය. හෘදය වස්තුවෙන් ප්‍රත්‍යය ලබන හෘදය වස්තුවෙන් අන්‍ය වූ ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, මහාභූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන විපාක චිත්තජ උපාදයරූපයෝ ය යන මොවුහු අඤ්ඤමඤ්ඤය බැහැර කෙරෙති. "එකං" ප්‍රවෘත්තිකාලයෙහි කර්ත්‍රපාඨයෙන් පඤ්චවෝකාරයෙහි උපදනා අවස්ථාවෙහි අරූප විපාක ද්විපඤ්චවිඥාන අභිඥාවිධ්‍යතිවර්ජිත විපාක සිත් දෙවිස්ස ය, චෛතසික සතිස ය, යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා හෘදය වස්තුවෙන් අන්‍ය වූ කෘතත්වාත්රූපයෝ ලැබෙත්. රූපවාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාවිධ්‍යති වර්ජිත දෙවිසි විපාකනාමස්කන්ධයන් විසින් උපදවන චිත්තජ මහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා උපදනා ප්‍රතිසන්ධිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා විපාක චිත්තජ ප්‍රතිසන්ධි කර්මජ උපාදයරූපයෝ ලැබෙත්. **"අබ්‍යාකතෙ ඛන්ධෙපටිච්ච චිත්තසමුට්ඨානං රූපං, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්චකටත්තාරූපං, මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තා රූපං උපාදයරූපං"**

කුශලා කුශල ක්‍රියා නාමස්කන්ධයෝ ය. ඔවුනොවුන් ගෙන් ප්‍රත්‍යය ලබන කුශලා කුශල ක්‍රියා චිත්තජ මහාභූතයෝ ය, ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුහු විපාක ප්‍රත්‍යය බැහැර කෙරෙති. **"තීණි"** කුසලපදවාරය හා අකුසලපදවාරය විස්තර කරත්‍. අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්තිකාලයට ක්‍රියා විස්ස ගන්නේ ය. රූපවාරයෙහි පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි කුශලාකුශල ක්‍රියා චිත්තයන් විසින් උපදවන චිත්තජ මහාභූතයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ මහාභූතයන් නිසා උපදනා කුශලාකුශල ක්‍රියාවන් විසින් උපදවන චිත්තජමහාභූතයෝ ය -පෙ- ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුහු ලැබෙත්. **"කිරියාබ්‍යාකතං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා, එකං මහාභූතං පටිච්ච -පෙ- ද්වෙ මහාභූතා, බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං -පෙ- මහාභූතා"**

නාමසකන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන කුශලා කුශල ක්‍රියා නාමස්කන්ධයන් විසින් උපදවන චිත්තජරූපයෝ ය, මහාභූතයන්ගෙන්

Non-commercial distribution

ප්‍රත්‍යය ලබන කුසලා කුසල ක්‍රියාචිත්තජ උපාදය රූපයෝය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ උපාදය රූපයෝය යන මොවුහු පච්චනීයයෙහි "පඤ්ච" කුසලෙන අබ්‍යාකතය සහ අකුසලෙන අබ්‍යාකතය විස්තර කරත්‍. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි ක්‍රියාසිත විස්සය, චෛතසිකපන්තිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්. රූපවාරයෙහි පඤ්චවෝකාරයෙහි උපදනා අවස්ථාවෙහි කුශලා කුශලක්‍රියා නාමස්කන්ධයන් විසින් උපදවන චිත්තජ මහාභූතයෝ ය බාහ්‍ය ආහාරජ ඍතුජ අසඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ මහා භූතයෝ යන මොවුන් නිසා උපදනා වූ චිත්තජ -පෙ- ප්‍රවෘත්තිකර්මජ උපාදයරූපයෝ ලැබෙත්. "කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං උපදායරූපං, බාහිරෙ මහාභූතෙ පටිච්ච උපාදයරූපං -පෙ- අසඤ්ඤසත්තානං මහාභූතෙ පටිච්ච උපාදයරූපං" ඉතිරි වාර දෙක විස්තර කරත්‍.

"සකල විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තුව ය, ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන විපාක චිත්තජ මහාභූතයෝ ය, ප්‍රතිසන්ධිකර්මජ මහාභූතයෝ ය යන මොවුහු අනුලෝමයෙහි "**එකං**" අබ්‍යාකතො යන කථාපාඨයෙන් ප්‍රවෘත්තිකාලයෙහි විපාක-නාමස්කන්ධයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිවාරය අඤ්ඤමඤ්ඤයෙහි මෙති. රූපවාරයෙහි පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත දෙවිසි විපාකස්කන්ධයන් විසින් උපදවන චිත්තජමහා භූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා මහාභූතයෝ ලැබෙත්. "**විපාකාබ්‍යාකතං, එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා, එකං මහාභූතං -පෙ- ද්වෙ මහාභූතා.**

අඤ්ඤමඤ්ඤ මූලක අහාරදුකයෙහි නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජරූප හා හෘදයවස්තුවෙන් අන්‍ය වූ ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය, මහාභූතයන්ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ ආහාරජ උපාදයරූපයෝ ය යන මොවුහු අඤ්ඤමඤ්ඤය බැහැර කෙරෙති. පච්චනියානුලෝමයෙහි "**පඤ්ච**" පෙර කී නයයන් අනුව විස්තර කරත්‍.

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන බාහ්‍ය ඍතුජ අසඥසත්ත්ව-කර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ආහාරප්‍රත්‍යය බැහැර කෙරෙති. "**එකං**" විස්තර කරත්‍. මහාභූතයන්ගෙන් ප්‍රත්‍යය ලබන බාහ්‍ය ඍතුජ අසඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදයරූපයෝ පච්චනීයයෙහි "**එකං**" ඉහත කී නය අනුව විස්තර කරත්‍.

Non-commercial distribution

සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධිනාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තුව ය, ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ ආහාරජ මහාභූතයෝ ය යන මොවුහු අනුලෝමයෙහි "තීණි" අව්‍යාකතවාරයෙහි ප්‍රවෘත්ති ප්‍රතිසන්ධිකාලදෙක්හි අභිධෙය ඉහිත කී පරිදි ගන්නේය. රූපවාරයට චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ ආහාරජ මහාභූතයන් ගන්නේ ය.

අඤ්ඤමඤ්ඤමූලක **ඉන්ද්‍රිය දුකයෙහි** නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජරූපයෝ ය, හෘදයවස්තුවෙන් අන්‍ය වූ ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය, මහාභූතයන්ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ උපාදය රූපයෝය, ජීවිතේන්ද්‍රියෙන් අන්‍ය වූ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදයරූපයෝ ය යන මොවුහු අඤ්ඤමඤ්ඤය බැහැර කෙරෙති. "**පඤ්ච**" විස්තර කරනු.

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන බාහ්‍යආහාරජ ඍතුජ මහාභූතයෝ ඉන්ද්‍රිය ප්‍රත්‍යය බැහැර කෙරෙති. "එකං" විස්තර කරනු. මහා භූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන බාහ්‍ය ආහාරජ ඍතුජ උපාදයරූපයෝ ය, අසංඥසත්ත්ව රූපජීවිතේන්ද්‍රිය ය ප්‍රවෘත්ති රූපජීවිතේන්ද්‍රිය ය, යන මොවුහු පච්චනීයයෙහි "**එකං**" විස්තර කරනු.

සකල ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තුව ය, ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ අසංඥසත්ත්වකර්මජ මහා භූතයෝ ය යන මොවුහු, අනුලෝමයෙහි "**තීණි**" අන්‍යෝන්‍යයෙහි ලැබෙන ධර්මයන්ගෙන් බාහ්‍ය ආහාරජ ඍතුජ මහාභූතයන් හැර අභිධෙය ගන්නේ ය.

අඤ්ඤමඤ්ඤමූලක **ධ්‍යාන දුකයෙහි** නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජරූපයෝ ය, හෘදයවස්තුවෙන් අන්‍ය වූ ප්‍රතිසන්ධි කර්මජරූපයෝය, මහාභූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ උපාදයරූපයෝ ය යන මොවුහු අඤ්ඤමඤ්ඤය බැහැර කෙරෙති. "**පඤ්ච**" විස්තර කරනු.

ද්විපඤ්චවිඥාන නාමස්කන්ධයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය, අනුලෝමපච්චනීයයෙහි "**එකං**" වූක්තානුසාරයෙන් විස්තර කරනු.

මහාභූතයන්ගෙන් ප්‍රත්‍යය ලබන බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදයරූපයෝ පච්චනීයයෙහි "**එකං**" විස්තර කරනු.

ද්විපඤ්චවිඥානයන් ගෙන් අන්‍ය වූ සකල ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධිනාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන

Non-commercial distribution

හෘදයවස්තුව ය, ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ මහාභූතයෝ ය යන මොවුහු "**තීණි**" බාහ්‍යාදි මහාභූතයන් හැර අඤ්ඤමඤ්ඤය අනුව විස්තර කරනු.

**අඤ්ඤමඤ්ඤමූලක මග්ගදුකයෙහි** නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජරූපයෝ ය, හෘදයවස්තුවෙන් අන්‍ය වූ සහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, මහාභූතයන්ගෙන් ප්‍රත්‍යය ලබන සහේතුක චිත්තජ සහේතුකප්‍රතිසන්ධිකර්මජ උපාදයරූපයෝ ය යන මොවුහු අඤ්ඤමඤ්ඤය බැහැර කෙරෙති. "**පඤ්ච**" හේතුව අනුව අභිධෙය ගෙන විභඞ්ග උදුරනු.

අහේතුක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර ය, අහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තුව ය, ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුහු මාර්ගප්‍රත්‍යය බැහැර කෙරෙති. "**එකං**" හේතුමූලක අඤ්ඤමඤ්ඤදුකයේ පච්චනියානුලෝමය අනුව විස්තර කරනු.

නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන අහේතුකචිත්තජරූපයෝ ය, හෘදයවස්තුවෙන් අන්‍ය වූ අහේතුකප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, මහාභූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදයරූපයෝ ය යන මොවුහු පච්චනීයයෙහි "**එකං**" හේතුමූලක අඤ්ඤමඤ්ඤදුක පච්චනීය ය අනුව විස්තර කරනු.

සකල සහේතුක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, සහේතුක ප්‍රතිසන්ධිනාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තුව ය, ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන සහේතුකචිත්තජ සහේතුකප්‍රතිසන්ධිකර්මජ මහාභූතයෝ ය යන මොවුහු අනුලෝමයෙහි "**තීණි**" මෝහමූලයෙහි මෝහය නොහැර හේතුමූලක අඤ්ඤමඤ්ඤදුකයේ අනුලෝමය මෙන් විස්තර කරනු. අඤ්ඤමඤ්ඤ මූලක සම්පයුත්ත දුකය ආරම්මණදුකය මෙනි.

අඤ්ඤමඤ්ඤමූලක **විප්පයුත්තදුකයෙහි** නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජරූප හා හෘදය වස්තුවෙන් අන්‍ය ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, මහාභූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ උපාදයරූපයෝ ය යන මොහු අඤ්ඤමඤ්ඤය බැහැර කෙරෙති. "**පඤ්ච**" විස්තර කරනු.

අරූපවිපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන මහාකුශල මහාක්‍රියා උපරිමමාර්ග සකලඵලනාමස්කන්ධයෝ ය,

Non-commercial distribution

ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොහු විප්පයුත්තය බැහැර කෙරෙති. "**තීණි**" කුසලෙන කුසලය හා අකුසලෙන අකුසලය ආරම්මණමූලක විප්පයුත්තදුකය අනුව විස්තර කරනු. අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්තිකාලයෙහි අභිධෙය ආරම්මණමූලකයෙහි මෙනි. රූපවාරයෙහි බාහ්‍යාදි මහාභූතයෝ ලැබෙත්. විභඞ්ගය උද්ධරනු.

මහාභූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදයරූපයෝ, පච්චනීයයෙහි "**එකං**" විස්තර කරනු.

අරූපවිපාක වර්ජිත පඤ්චවෝකාර ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධිනාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තුව ය, ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ මහාභූතයෝ ය, අනුලෝමයෙහි "**තීණි**" පඤ්චවෝකාරයෙහි ලැබෙන අන්‍යෝන්‍ය ප්‍රත්‍යය යන ධර්ම අභිධෙය වශයෙන් ගෙන විස්තර කරනු. රූපවලින් බාහ්‍යාදිකොටස් පස ගන්නේ ය. අඤ්ඤමඤ්ඤමූලක අත්ථි අවිගත දුකයෝ සහජාතදුකයට සමාන වෙති. නත්ථිවිගතදුකයෝ අනන්තරදුකය මෙනි.

**නිස්සයමූලකය** සහජාතමූලකය මෙනි. **උපනිස්සයමූලකය** ආරම්මණමූලකය මෙනි.

## පුරේජාත මූලකය.

පුරේජාතමූලකයෙහි හේතුදුකයේ පටන් උපනිස්සය දුකය දක්වා ඇති දුකයෝ කියන ලද නය අනුව විස්තර කළ යුත්තාහු ය. **පුරේජාත මූලක ආසේවන දුකයෙහි** අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, අරූපකුසල අරූපක්‍රියාවෝ ය, උපරිමමාර්ග තුන ය යන නාමස්කන්ධයෝ පුරේජාතය බැහැර කෙරෙති. "**තීණි**" කුසලෙන කුසලයෙහි අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මහා කුශල ද්විතීයාදි ජවනයෝ ය, අරූප කුසල් සතර ය, උපරිම මාර්ග තුන ය, චෛතසික සතිස ය යන අවයව -පෙ- නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය "අරූපෙකුසලං" යනු යොද උද්ධරනු. අකුසලෙන අකුසලයෙහි ලෝභමූල ද්විතීයාදි ජවනයෝ ය චෛතසික තෙවිස්සය යන -පෙ- ලැබෙත්. "අරූපෙ අකුසලං" යනු යොද විභඞ්ගය උද්ධරනු. අබ්‍යාකතයෙහි අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, අරූපක්‍රියා සතර ය, චෛතසික පන්තිස ය, -පෙ- ලැබෙත්. විභඞ්ගයට "අරූපෙ ක්‍රියාබ්‍යාකතං" යනු යොදනු.

Non-commercial distribution

පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුශල හසිතෝත්පාද මහා කුශල මහා ක්‍රියා ප්‍රථමජවනයෝ ය, ආවර්ජනදෙක ය, පඤ්චවෝකාර විපාකප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොවුහු ආසේවනය බැහැර කෙරෙති. "තීණි" කුසලෙන කුසලයෙහි පඤ්චවෝකාරයෙහි උපදනා අවස්ථාවෙහි වූ මහාකුශල ප්‍රථමජවනයන් ගන්නේ ය. අකුසලෙන අකුසලයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුශලප්‍රථමජවනයන් ගන්නේ ය. අකුසලෙන අකුසලයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුශලප්‍රථමජවනයන් ගන්නේ ය, අබ්‍යාකතවාරයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ හසිතොත්පාද මහාක්‍රියා ප්‍රථම-ජවනයෝ ය, ආවර්ජනද්වය ය, අරූප විපාක වර්ජිත විපාක සිත් දෙතිස ය, චෛතසික අටතිස ය යන මොවුන් ගන්නේ ය, විභඞ්ගය පූර්ජාතය අනුව උදුරතු.

අරූපවිපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මහාකුශල මහාක්‍රියා ප්‍රථමජවනයෝ ය, මනෝද්වාරා වර්ජනය ය, ඵලසිත් සතරය යන නාමස්කන්ධයෝ ය චිත්තජප්‍රතිසන්ධි කර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු පච්චනීයයෙහි "සත්ත" කුසලෙන කුසලයෙහි අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මහාකුශල ප්‍රථම ජවනයන් හා චෛතසික තෙතිස ගන්නේ ය. (අරූපභූමියෙහි උපදනා ලෞකික සිත්වල විරති අප්‍රමාණයෝ නො ලැබෙති.) කුසලෙන අබ්‍යාකතයෙහි හේතුමූලයෙහි චිත්තජරූප ගන්නේ ය.

අකුසලෙන අකුසලයෙහි අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල ප්‍රථමජවනයන් ගන්නේ ය. අකුසලෙන අබ්‍යාකතයෙහි අකුසල චිත්තජරූප ගන්නේ ය,

අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතීඍපායයෙන් අරූප විපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි මහා ක්‍රියා ප්‍රථමජවනය ය, මනෝද්වාරාවර්ජනය ය, ඵල සතර ය, චෛතසික සතිස ය යන අවයව -පෙ- නාමස්කන්ධයෝ ය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥත්තච්‍යුති වර්ජිත විපාකසිත් දෙවිස්ස ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි හා රූපවාරයෙහි අභිධෙය සහජාතයෙහි මෙනි. "**අරූපෙ විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා, විපාකාබ්‍යාකතෙ**

Non-commercial distribution

**කිරියාබ්‍යාකතෙ ඛන්‍ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං**" ප්‍රතිසන්ධිවාරය හා රූපවාරය සහජාතය මෙනි.

පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුශල හසිතෝත්පාද මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගත කුශල ක්‍රියා ය, මාර්ගසිත් සතර ය යන නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි "**තීණි**" ආසේවනය ලැබෙන පඤ්චවෝකාරනාමස්කන්ධයන් අභිධෙය වශයෙන් ගන්නේ ය. විභඞ්ගය ඉදිරීමෙහි දී "වත්ථුං පුරේජාතපච්චයා" යනු යොදනු.

පුරේජාතමූලක **කම්මදුකයෙහි** අරූපවිපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි කුශලාකුශලක්‍රියා චේතනා වර්ජිත ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන මහාකුශල මහාක්‍රියා අරූප කුශල අරූප ක්‍රියා උපරිමමාර්ගී සකලඵල නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය, චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය, යන මොවුහු පුරේජාතය බැහැර කෙරෙති. '**සත්ත**'

කුසලෙන කුසලයෙහි අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි මහාකුසල් අට ය, අරූපකුසල් සතර ය, උපරිමමාර්ගී තුන ය, චෛතසික සතිස ය යන අවයව නාමසන්ධයන් නිසා උපදනා -පෙ- චේතනා වර්ජිත චෛතසික පන්තිස ය යන අවයව නාමසකන්ධයෝ ලැබෙත්. "අරූපෙ කුසලං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා" කුසලෙන අබ්‍යාකතය කර්මප්‍රත්‍යය මෙනි.

අකුසලෙන අකුසලයෙහි අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි ලෝභමූල මෝහමූලයෝ ය, චෛතසික තෙවිස්ස ය යන අවයව -පෙ- චේතනා වර්ජිත චෛතසික දෙවිස්ස ය යන අවයව, "**අරූපෙ අකුසලං එකං ඛන්ධං -පෙ- ද්වෙ ඛන්ධා**" අකුසලෙන අබ්‍යාකතය කර්මප්‍රත්‍යය අනුව විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි අරූපවිපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි මනෝද්වාරාවජ්ජනය ය, මහා ක්‍රියා අට ය, අරූප ක්‍රියා සතර ය ඵල සතර ය, චෛතසික සතිස ය යන අවයව -පෙ- ක්‍රියාචේතනා වර්ජිත චෛතසික සතිස ය යන අවයව නාමස්කන්ධයන් හා පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත විපාක සිත් දෙවිස්ස ය, ක්‍රියාසිත් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිවාර රූපවාර දෙක්හි අභිධෙය කර්මප්‍රත්‍යයෙහි මෙනි. විභඞ්ගය උද්ධරනු.

Non-commercial distribution

පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුශලාකුශල ක්‍රියාචේතනාවෝ කර්මප්‍රත්‍යය බැහැර කෙරෙති. "තීණි" කුසලෙන කුසලයෙහි පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල්සිත් එක් විස්ස ය, චේතනා වර්ජිත චෛතසික සත්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චේතනාව ලැබේ. "**කුසලෙ ඛන්ධෙ පටිච්ච කුසලා චෙතනා, වත්ථුං පුරෙජාත පච්චයා**" ඉතිරි දෙවාරය ද මේ නය අනුව විස්තර කරනු.

අරූප භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුශලා කුශල ක්‍රියා චේතනාවෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ ය, පච්චනීයයෙහි "**තීණි**" කුසලෙන කුසලයෙහි අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මහාකුසල් අට ය, අරූපකුසල් සතර ය, උපරිම මාර්ග තුනය, චේතනා වර්ජිත චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චේතනාව ලැබේ. "**කුසලෙ ඛන්ධෙ පටිච්ච කුසලා චෙතනා**" ඉතිරි දෙවාරය ද කියන ලද නය අනුව විස්තර කරනු. අබ්‍යාකතයෙහි බාහ්‍යාදි රූප ද ගන්නේ ය.

කුශලාකුශලක්‍රියාචේතනා ය, අරූපවිපාකයෝ ය යන මොවුන්ගෙන් අන්‍ය වූ පඤ්චවෝකාර ප්‍රවෘත්ති නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි "**තීණි**" පූර්වජාතයෙහි ලැබෙන අභිධෙයයන්ගෙන් කුශලාකුශල ක්‍රියා චේතනාවන් හැර අභිධෙය ගෙන විස්තර කරනු.

**පූර්වජාතමූලක විපාකදුකයෙහි** අරූපවිපාක සතර ය අරූපභූමියෙහි උපදනා ඵලසිත් සතර ය, ප්‍රතිසන්ධිනාමස්කන්ධ සතර ය, විපාක චිත්තජරූපයෝ ය, ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය යන මොවුහු පූර්වජාතය බැහැර කෙරෙති. "එකං" කත්තෘපාඨයෙන් අරූපවිපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි ඵලසිත් සතර ය, චෛතසික සතිස ය යන නාමස්කන්ධයෝ ය, පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්ච විඥාන අභිත්තච්‍යුති වර්ජිත විපාකසිත් දෙවිස්ස ය, චෛතසික අටතිස ය යන අවයව වූද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්. ප්‍රතිසන්ධිවාරයෙහි හා රූපවාරයේ අභිධෙය විපාක ප්‍රත්‍යයෙහි මෙනි. "අරූපෙ විපාකාබ්‍යාකතං -පෙ- ද්වෙ ඛන්ධා විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං" ප්‍රතිසන්ධිවාර රූපවාර දෙක්හි විපාක ප්‍රත්‍යයෙහි මෙන් විභඞ්ගය උදුරනු.

පඤ්චවෝකාර භූමියෙහි උපදවන අවස්ථාවෙහි වූ කුශලාකුශලක්‍රියා නාමස්කන්ධයෝ විපාකප්‍රත්‍යය බැහැර කෙරෙති. "**තීණි**" කුශලාකුශල

Non-commercial distribution

දෙපදය පූරේජාතය මෙන් විස්තර කරනු. අබ්‍යාකතවාරයෙහි අභිධෙය වශයෙන් ක්‍රියානාමස්කන්‍ධයන් ගෙන විභඞ්ගය උදුරනු.

අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුශලාකුශල ක්‍රියා නාමස්කන්‍ධයෝ ය, කුශලාකුශලක්‍රියාචිත් විසින් උපදවන චිත්තජ රූපයෝ ය බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි "**සත්ත**"

"කුසලො" යන කතීඃපාඨයෙන් අරූප්භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මහාකුසල් අට ය, අරූපකුසල් සතර ය, මාර්ගීසිත් තුන ය, චෛතසික සතිස ය යන මොහු ලැබෙත්. **අරූපෙ කුසලං එකං ඛන්‍ධං -පෙ- ද්වෙ ඛන්‍ධා.**"

අකුසලපදයෙහි කතීඃපාඨයෙන් අරූපභූමියෙහි උපදනා ලෝභමූල මෝහමූල සිත් හා චෛතසික තෙවිස්ස ද ගන්නේ ය. "අරූපෙ අකුසලං" යනාදීන් විභඞ්ගය උදුරනු. අබ්‍යාකතයෙහි අරූපභූමියෙහි, උපදනා මනෝද්වාරාවජ්ජනය ය, මහා ක්‍රියා අටය, අරූප ක්‍රියා සතර ය, චෛතසික තෙතිස ය යන මොවුන් ගන්නේ ය. "අරූපෙ කිරියාබ්‍යාකතං" යනාදීන් විභඞ්ගය උදුරනු.

පඤ්චවෝකාරවිපාක ප්‍රවෘත්ති නාමස්කන්‍ධයෝ, අනුලෝමයෙහි "එකං" කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා විපාක සිත් දෙතිස හා චෛතසික අටතිස ගන්නේ ය. "**විපාකාබ්‍යාකතං එකං ඛන්‍ධං -පෙ- ද්වෙ ඛන්‍ධා, වත්ථුං පුරෙජාත පච්චයා**

**පූරේජාතමූලක ආහාර දුකයෙහි** අරූපවිපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන මහාකුශල මහා ක්‍රියා අරූපකුශල අරූපක්‍රියා චිත්තයෝ ය, උපරිම මාර්ගී තුන ය, ඵල සතර ය, ප්‍රතිසන්‍ධි නාමස්කන්‍ධයෝ ය, චිත්තජ ප්‍රතිසන්‍ධිකර්මජ ආහාරජ රූපයෝ ය යන මොවුහු පූරේජාතය බැහැර කෙරෙති. "**සත්ත**" ඉහත කී නය අනුව විස්තර කරනු. ආහාර ප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. බාහ්‍යරූපයෝ ය, ඍතුජරූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ රූපයෝ ය ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු පච්චනීයයෙහි '**එකං**' විස්තර කරනු. අනුලෝමවාරය ශුද්ධ පූරේජාතය අනුව විස්තර කරනු.

**පූරේජාත මූලක ඉන්‍ද්‍රිය දුකයෙහි** අරූපවිපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන මහාකුශල මහාක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිමමාර්ගී සකලඵල නාමස්කන්‍ධයෝ ය, ප්‍රතිසන්‍ධි නාමස්කන්‍ධයෝ ය, චිත්තජ රූප හා

Non-commercial distribution

ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, ජීවිතේන්ද්‍රිය වර්ජිත අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු පුරේජාතප්‍රත්‍යය බැහැර කෙරෙති. **'සත්ත'** කියන ලද නය අනුව විස්තර කරනු. ඉන්ද්‍රියප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. බාහ්‍ය ආහාරජ ඍතුජ අසඥසත්ත්ව රූපජීවිතේන්ද්‍රිය ය යන මොවුහු, පච්චනීයයෙහි **"එකං"** විස්තරකරනු. අනුලෝමය ශුද්ධ පුරේජාතය අනුව විස්තර කරනු.

**පුරෙජාත මූලක ඣාන දුකයෙහි** අරූපවිපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මනෝද්වාරා-වර්ජිත මහා කුශල මහාක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිම මාර්ග සකලඵල නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය, චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොහු පුරේජාතය බැහැර කෙරෙති. **"සත්ත"** විස්තර කරනු. ද්විපඤ්චවිඥාන නාමස්කන්ධයෝ ධ්‍යානප්‍රත්‍යය බැහැර කෙරෙති. "එකං" පඤ්චවිඤ්ඤාණ සහගතං" යනු යොද විභඞ්ගය උදුරනු. "වත්ථුං පුරේජාත පච්චයා" යි අගට යොදනු. බාහ්‍ය අහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ පච්චනීයයෙහි 'එකං' විස්තර කරනු. අරූපවිපාක සතර ය, ද්විපඤ්චවිඥාන වර්ජිත පඤ්චවෝකාර විපාක ප්‍රවෘත්ති නාමස්කන්ධ-යෝ ය යන මොහු "එකං" 'වත්ථුං පුරෙජාත පච්චයා' යි යොද විභඞ්ගය උදුරනු.

**පුරෙජාතමූලක මග්ගදුකයෙහි** අරූපවිපාක සතර ය, අරූප-භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මනෝද්වාරා-වර්ජන මහා කුශල මහා ක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිමමාර්ග සකලඵල නාමස්කන්ධයෝ ය, සහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, සහේතුක චිත්තජ සහේතුප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොවුහු පූරේජාතය බැහැර කෙරෙති. **"සත්ත"** හේතුමූලක පුරේජාත දුකය අනුව විස්තර කරනු. පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අහේතුක ප්‍රවෘත්ති නාමස්කන්ධයෝ මාර්ග ප්‍රත්‍යය බැහැර කෙරෙති. "එකං" අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මනෝද්වාරාවර්ජනය ය, අහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතර ය, අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොහු, පච්චනීයයෙහි "එකං" අරූපවිපාක වර්ජිත සහේතුක පඤ්චවෝකාර ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි **"තීණි"** පුරේජාතප්‍රත්‍යයෝත්ප-න්නයන්ගෙන් සහේතුක විපාකක්‍රියා අභිධෙය වශයෙන් ගන්නේ ය. විභඞ්ගය ද පුරේජාතයෙහි මෙනි.

Non-commercial distribution

**පුරෙජාත මූලක සම්පයුත්ත දුකය** ආරම්මණ දුකය මෙනි. **පුරේජාතමූලක විප්පයුත්තදුකයෙහි** පඤ්චවෝකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධ සතර ය, චිත්තජරූපයෝ ය, ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය යන මොහු පුරේජාත ය බැහැර කෙරෙති. "පඤ්ච" අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්තිකාලයෙහි විපාක ක්‍රියා චිත්තයන් නිසා උපදනා චිත්තජරූපයන් ගන්නේ ය. ප්‍රතිසන්ධිවාරය හා රූපවාරය විප්පයුත්තය මෙනි. අන්‍යවාරයන් වුක්තානුසාරයෙන් විස්තර කළ හැකි ය. විප්‍රයුක්තය බැහැර කිරීමක් නැත. අරූපවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන මහා කුශල මහා ක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිමමාර්‍ග සකලඵල නාමස්කන්ධයෝ ය, බාහ්‍ය ආහාරජ සෘතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොහු. පච්චනියයෙහි "එකං" විස්තර කරනු. අනුලෝමය ශුද්ධපුරේජාතය අනුව විස්තර කරනු. පුරේජාතමූලක අත්ථි අවිගත දුකයන් සහජාත දුකය මෙන් ද නත්ථිවිගත දුකයන් අනන්තර දුකය මෙන් ද විස්තර කරනු.

## ආසේවනමූලකය.

ආසේවනමූලක හේතුදුකාදිය ඉහත කී නයයන් අනුව විස්තර කරනු. ආසේවන මූලක කම්මදුකයෙහි කුශලාකුශලක්‍රියා චේතනා වර්ජිත අකුශල හසිතෝත්පාද මහා කුශල මහා ක්‍රියා ප්‍රථමජවනයෝ ය, ආවර්ජනද්වයය, විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොහු ආසේවනය බැහැර කෙරෙති. "නව" කුසලො යන කතීපාඨයෙන් මහාකුශල- ප්‍රථමජවනයෝ ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය උදුරනු. කුසලෙන අබ්‍යාකතය කර්මප්‍රත්‍යයෙහි මෙන් විස්තර කරනු. කුසලෙන කුසලාබ්‍යාකතයෙහි පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මහාකුශල ප්‍රථමද්ව ය, චේතනා වර්ජිත චෛතසික සත්තිස ය, චිත්තජරූපයෝ ය යන මොවුහු ලැබෙත්. අකුසලපදයේ වාරතුන කියන ලද නයින් විස්තර කරනු.

අබ්‍යාකතවාරයෙහි හසිතෝත්පාද මහාක්‍රියා ප්‍රථමජවනයෝය, ආවර්ජනද්වය ය, විපාක සිත් සතිස ය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- ක්‍රියාචේතනා වර්ජිත චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝ ය, චිත්තජ රූපයෝ ය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ හසිතෝත්පාද මහාක්‍රියාවෝය, මහද්ගත

Non-commercial distribution

ක්‍රියා නවය ය චෛතසික පන්තිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්. ප්‍රතිසන්ධිවාරයෙහි හා රූපවාරයෙහි කර්‍මප්‍රත්‍යයෙහි මෙන් අභිධෙය ගන්නේ ය. විභඩ්ගයන් ද කර්‍මවිභඩ්ගය මෙන් උද්ධරනු.

අකුසල හසිතෝත්පාද මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතකුශල මහද්ගත ක්‍රියා ය, මාර්‍ගී සිත් සතර ය යන මේ සිත්වල චේතනාව කර්‍මප්‍රත්‍යය බැහැර කෙරෙති. "**තීණි**" කුසලෙන කුසලයෙහි මහාකුශල ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගත කුසල නවය ය, මාර්‍ගීසිත් සතර ය, චේතනා වර්ජිත චෛතසික සත්තිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චේතනාව ලැබේ. "**කුසලෙ ඛන්‍ධෙ පටිච්ච කුසලා චෙතනා**" අකුසලපදයෙහි ද්විතීයාදි අකුසල ජවනයන්හි චේතනාව ලැබේ. විභඩ්ගය උද්ධරනු. අව්‍යාකතපදයෙන් හසිතෝත්පාද මහාක්‍රියා ද්විතියාදි ජවනයන් ගේ හා මහද්ගත ක්‍රියාවන් ගේ චේතනාව ලැබේ. විභඩ්ගය උද්ධරනු.

අකුශල හසිතෝත්පාද මහාකුශල මහාක්‍රියා ප්‍රථමජවනයන්ගේ ද ආවර්ජනද්වයයා ගේ ද චේතනාව ය, බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි '**තීණි**' වුක්තානුසාරයෙන් විස්තර කරනු.

අකුසල්සිත් දෙළොස ය, හසිතෝත්පාදය ය, මහාකුශල මහා ක්‍රියා ය යන මොවුන් ගේ ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතකුශල ක්‍රියාවෝ ය, මාර්‍ගීසිත් සතර ය යන චේතනා වර්ජිත නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි "**තීණි**" ආසේවනය අනුව චේතනාව හැර අභිධෙය ගෙන ආසේවනය අනුව ම විභඩ්ගය ද උද්ධරනු. විපාකදුකය නො ලැබේ.

**ආසේවනමූලක ආහාර දුකයෙහි** අකුශල හසිතෝත්පාද මහා කුශල මහා ක්‍රියා ප්‍රථමජවනයෝ ය, ආවර්ජනද්ව ය, විපාක සිත් සතිස ය යන ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, චිත්තජ ප්‍රතිසන්ධිකර්‍මජ ආහාරජ රූපයෝ ය යන මොවුහු ආසේවනය බැහැර කෙරෙති. '**නව**' යටකී නය අනුව අභිධෙය ගෙන ආහාර විභඩ්ගය අනුව විභඩ්ගය උද්ධරනු. ආහාරප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. බාහ්‍ය ඍතුජ අසඥසත්ත්වකර්‍මජ ප්‍රවෘත්තිකර්‍මජ රූපයෝ පච්චනීයයෙහි "**එකං**" විභඩ්ගය උද්ධරනු. අනුලෝමය ආසේවනය අනුව විස්තර කරනු.

**ආසේවනමූලක ඉන්‍ද්‍රිය දුකයෙහි** අකුශල හසිතෝත්පාද මහා කුශල මහා ක්‍රියා ප්‍රථම ජවනයෝ ය, ආවර්ජනද්වයය විපාකසිත් සතිසය යන නාමස්කන්ධයෝ ය, චිත්තජ ප්‍රතිසන්ධිකර්‍මජ රූපයෝ ය

Non-commercial distribution

වර්ජිත අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු ආසේවනය බැහැර කෙරෙති. ,නව, අභිධෙය අවුලා ඉන්ද්‍රිය විභඞ්ගය අනු ව විභඞ්ගය උදුරනු. ඉන්ද්‍රිය ප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. බාහ්‍ය ආහාරජඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්ව කර්මජ රූපජීවිතේන්ද්‍රිය ය යන මොවුහු, පච්චනියයෙහි "එකං" විස්තර කරනු. අනුලෝමය ශුධ ආසේවනය අනුව විස්තර කරනු.

**ආසේවනමූලක ඣාන දුකයෙහි** අකුශල හසිතෝත්පාද මහා කුශල මහා ක්‍රියා ප්‍රථම ජවනයෝ ය, ආවර්ජන දෙක ය, ද්විපඤ්චවිඥාන වර්ජිත විපාක සිත් සවිස්ස ය යන ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, චිත්තජරූපයෝ ය, ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය යන මොවුහු ආසේවනය බැහැර කෙරෙති. 'නව' ඣාන විභඞ්ගය අනුව විභඞ්ගය උදුරනු. ද්විපඤ්චවිඥානනාමස්කන්ධයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජරූපයෝ ය යන මොහු, පච්චනීයයෙහි 'එකං' විස්තර කරනු. අනුලෝමය ආසේවනය අනුව විස්තර කරනු.

**ආසේවනමූලක මග්ග දුකයෙහි** අකුශල මහාකුශල මහා ක්‍රියා ප්‍රථම ජවනයෝ ය, සහේතුකවිපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය, සහේතුකචිත්තජ සහේතුකප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොවුහු ආසේවනය බැහැර කෙරෙති. "නව" මෝහමූලයෙහි මෝහය හැර හේතුමූලක ආසේවනය දුකය අනුව විස්තර කරනු. හසිතෝත්පාද ද්විතීයාදි ජවනයෝ මාර්ගප්‍රත්‍යය බැහැර කෙරෙති. "එකං" හසිතෝත්පාද ප්‍රථමජවන ය, හසිතෝත්පාද වර්ජිත අහේතුකප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ -පෙ- ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොහු, පච්චනීයයෙහි "එකං" හේතුමූලක පච්චනීය ය අනුව විස්තර කරනු. අකුශල මහාකුශල මහා ක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය මහද්ගත කුශලක්‍රියාවෝ ය, මාර්ගසිත් සතර ය, යන මොහු, අනුලෝමයෙහි "තීණි" හසිතෝත්පාදය හැර ආසේවනය අනුව විස්තර කරනු.

**අසේවනමූලක විප්පයුත්තදුකයෙහි** පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුශල හසිතෝත්පාද මහාකුශල මහා ක්‍රියා ප්‍රථමජවනයෝ ය, ආවර්ජනද්වය ය, අරූපවිපාකවර්ජිත විපාකසිත් දෙවිස්ස ය යන නාමස්කන්ධයෝ ය, චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොවුහු ආසේවනය බැහැර කෙරෙති. "නව" වුක්තානුසාරයෙන් විස්තර කරනු.

අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මහාකුශල මහා ක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, අරූපකුශල අරූප ක්‍රියාවෝ ය, උපරිම

Non-commercial distribution

මාර්ගීතුන ය යන නාමස්කන්ධයෝ විප්පයුත්තය බැහැර කෙරෙති. "**තීණි**" පුරේජාත දුකය අනුව විස්තර කරනු.

අරූපවිපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මහාකුශල මහා ක්‍රියා ප්‍රථමජවනයෝ ය, මනෝද්වාරාවර්ජනය ය, ඵල සතර ය යන නාමස්කන්ධයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි "**තීණි**" වුක්ත නය අනුව විස්තර කරනු.

පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුශල හසිතෝත්පාද මහාකුශල මහා ක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතකුශල ක්‍රියා ය, මාර්ගී සතර ය යන නාමස්කන්ධයෝ ය යන මොවුහු අනුලෝමයෙහි "**තීණි**" පුරේජාත දුකය අනු ව විස්තර කරනු. "චත්තාරිං විප්පයුත්ත පච්චයා" යි අගට යොදනු. අත්ථි අවිගත දුක දෙක සහජාත දුකය මෙනි. නත්ථි විගත දෙක අනන්තර දුකය මෙනි.

## කම්මමූලකය.

කම්මමූලකයෙහි හේතුදුකයේ පටන් ආසේවන දුකය දක්වා ඇති දුකයන් උක්තානුසාරයෙන් විස්තර කරනු. **කම්මමූලක විපාක දුකයෙහි** කර්මප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. චේතනාවෙන් අන්‍ය වූ කුශලාකුශල ක්‍රියා නාමස්කන්ධයෝ ය, කුශලාකුශලක්‍රියාවන් විසින් උපදවන චිත්තජරූපයෝ ය, අසංඥසත්ත්වකර්මජ රූපයෝ ය, ප්‍රවෘත්තිකර්මජරූපයෝ ය යන මොහු විපාක ප්‍රත්‍යය බැහැර කෙරෙති. "**නව**" කුශලාකුශල පදයන් ගේ වාර සය කර්ම ප්‍රත්‍යය අනු ව විස්තර කරනු. අබ්‍යාකතපදයෙහි ප්‍රවෘත්තිකාලයෙහි ක්‍රියාසිත් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව -පෙ- චේතනා වර්ජිත චෛතසික සූතිස ය යන නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ය, -පෙ- ප්‍රතිසන්ධිවාරය නො ලැබේ. රූපවාරයෙහි පඤ්චවෝකාරභූමියෙහි උපදනා කුශලා කුශල ක්‍රියා නාමස්කන්ධයන් විසින් උපදවන චිත්තජ මහාභූතයෝය, අසංඥසත්ත්වකර්මජ මහාභූතයෝ ය, ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත චිත්තජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදාය රූපයෝ ලැබෙත්. **කිරියාබ්‍යාකතං එකං -පෙ- චිත්තසමුට්ඨානඤ්ච රූපං, එකං මහාභූතං -පෙ- චිත්තසමුට්ඨානං උපාදායරූපං**" කුශලාකුශල ක්‍රියා චේතනාවෝය, බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ ය යන මොවුහු පච්චනීයයෙහි "**තීණි**" සහජාතමූලකය

Non-commercial distribution

කම්මදුකයේ අනුලෝමපච්චනීය අනුව විස්තර කරනු. අනුලෝමය ශුධවිපාකප්‍රත්‍යය අනුව විස්තර කරනු.

**කම්මමූලක ආහාරදුකයෙහි** කුශලාකුශල ක්‍රියාචේතනාවන් හා ආහාරජරූපයෝ කර්‍මප්‍රත්‍යය බැහැර කෙරෙති. "**තීණි**" උක්තානුසාරයෙන් විස්තර කරනු. අසංඥසත්ත්වකර්‍මජ ප්‍රවෘත්ති කර්‍මජරූපයෝ ආහාර ප්‍රත්‍යය බැහැර කෙරෙති. "**එකං**" විස්තර කරනු. බාහ්‍යරූප හා ඍතුජරූපයෝ, පච්චනීයයෙහි "**එකං**" කුශලාකුශල ක්‍රියා චේතනා වර්ජිත සකල ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය චිත්තජ ප්‍රතිසන්ධි කර්‍මජ රූපයෝ ය යන මොහු, අනුලෝමයෙහි "නව" අසංඥසත්ත්ව කර්‍මජරූප හැර ශුධකර්‍ම ප්‍රත්‍යය අනුව විස්තර කරනු.

**කම්මමූලක ඉන්ද්‍රිය දුකයෙහි** කුශලාකුශල ක්‍රියා චේතනාවෝ කර්‍මප්‍රත්‍යය බැහැර කෙරෙති. "**තීණි**" අසංඥසත්ත්ව රූප ජීවිතේන්ද්‍රිය ය හා ප්‍රවෘත්තිකර්‍මජ රූපජීවිතේන්ද්‍රිය ය ඉන්ද්‍රිය ප්‍රත්‍යය බැහැර කෙරේ. "**එකං**". "**අසඤ්ඤසත්තානං මහාභූතෙ පටිච්ච රූප ජීවිතේන්ද්‍රියං**" බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ, පච්චනීයයෙහි "**එකං**" කුශලාකුශල ක්‍රියාචේතනා වර්ජිත සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, රූපජීවිතේන්ද්‍රිය වර්ජිත අසංඥසත්ත්වකර්‍මජ ප්‍රවෘත්තිකර්‍මජ රූපයෝ ය යන මොවුහු අනුලෝමයෙහි "තීණි" කුශලාකුශල චේතනා හැර ශුධ ඉන්ද්‍රිය ප්‍රත්‍යය අනුව විස්තර කරනු.

**කම්මමූලක ඣාන දුකයෙහි** කුශලාකුශල චේතනාවෝ කර්‍ම ප්‍රත්‍යය බැහැර කෙරෙති. "තීණි" ද්විපඤ්චවිඥාන නාමස්කන්ධයෝ ය, අසංඥසත්ත්වකර්‍මජ ප්‍රවෘත්තිකර්‍මජ රූපයෝ ය යන මොවුහු ධ්‍යාන ප්‍රත්‍යය බැහැර කෙරෙති. "**එකං**" බාහ්‍යරූප හා ඍතුජරූපයෝ, පච්චනීයයෙහි "එකං" ද්විපඤ්චවිඥානයන් හා කුසලාකුසල චේතනාවන් හැර ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, චිත්තජ රූපයෝ ය ප්‍රතිසන්ධිකර්‍මජ රූපයෝ ය යන මොවුහු අනුලෝමයෙහි "**නව**" කුශලාකුශල ක්‍රියා චේතනාවන් හැර ධ්‍යාන ප්‍රත්‍යය අනුව අභිධෙය ගෙන එය අනුව ම විභඞ්ගය උදුරනු.

**කම්මමූලක මග්ගදුකයෙහි** කුශලාකුශල සහේතුකක්‍රියා චේතනාවෝ කර්‍මප්‍රත්‍යය බැහැර කෙරෙති. "**තීණි**" ක්‍රියා චේතනා වර්ජිත සකල අහේතුක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අහේතුක චිත්තජ ප්‍රතිසන්ධිකර්‍මජ අසංඥසත්ත්වකර්‍මජ රූපයෝ ය යන මොවුහු මාර්‍ගප්‍රත්‍යය බැහැර කෙරෙති. "**එකං**" අහේතුක ක්‍රියා චේතනාවෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි '**එකං**' හේතුමූලක කම්මදුකය අනුව විස්තර කරනු. කුශලාකුශල ක්‍රියා චේතනා වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි

Non-commercial distribution

නාමස්කන්ධයෝ ය, සහේතුක චිත්තජ සහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොවුහු, අනුලෝමයෙහි 'නව' කුශලාකුශල ක්‍රියා චේතනා හැර ශුඩමාර්ගප්‍රත්‍යය අනුව විස්තර කරනු.

**කම්මමූලක සම්පයුත්තදුකයෙහි** කුශලාකුශලක්‍රියා චේතනාවෝ කර්මප්‍රත්‍යය බැහැර කෙරෙති. "**තීණි**" ආරම්මණ මූලකය අනුව විස්තර කරනු. චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයෝ සම්ප්‍රයුක්තය බැහැර කෙරෙති. 'පඤ්ච' බාහ්‍ය ආහාරජ ඍතුජරූපයෝ, පච්චනීයයෙහි '**එකං**' කුශලාකුශල ක්‍රියා චේතනා වර්ජිත සකල ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි '**තීණි**' කුශලාකුශලක්‍රියා චේතනා හැර සම්ප්‍රයුක්තය අනුව විස්තර කරනු.

**කම්මමූලක විප්පයුත්ත දුකයෙහි** පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුශලාකුශල ක්‍රියා චේතනාවෝ කර්මප්‍රත්‍ය බැහැර කෙරෙති. '**තීණි**' පුරේජාතදුකය අනුව විස්තර කරනු.

අරූපවිපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුශලාකුශලක්‍රියා චේතනා වර්ජිත ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන මහාකුශල මහාක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිම මාර්ග සකලඵල නාමස්කන්ධයෝ ය, අසංඥසත්ත්වකර්මජ රූපයෝ ය, ප්‍රවෘත්තිකර්මජ රූපයෝය යන මොවුහු, විප්‍රයුක්තය බැහැර කෙරෙති. "**තීණි**" පුරේජාත දුකය අනුව විස්තර කරනු.

අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුශලා කුශලක්‍රියා චේතනාවෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ ය යන මොහු, පච්චනීයයෙහි '**එකං**' පුරේජාතමූලක කම්මදුකයේ පච්චනීය ය අනුව විස්තර කරනු.

පඤ්චවෝකාර භූමියෙහි කුශලාකුශලක්‍රියා චේතනාව හා අරූපවිපාක ද වර්ජිත වූ ප්‍රවෘත්තිප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය, චිත්තජ රූප ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය යන මොවුහු, අනුලෝමයෙහි "**නව**" ශුඩ විප්‍රයුක්තය අනුව කුශලාකුශලක්‍රියා චේතනාවන් හැර අභිධෙය ගෙන විභඞ්ගය උදුරනු. කම්මමූලක අත්ථි අවිගතදුක සහජාතදුකය මෙන් ද නත්ථිවිගත දුක අනන්තර දුකය මෙන් ද දත යුතු ය.

## විපාකමූලකය.

විපාකමූලකයෙහි හේතුදුකයේ පටන් කම්මදුකය දක්වා ඇති දුකයන් උක්තානුසාරයෙන් විස්තර කරනු. **විපාක මූලක ආහාර දුකයෙහි** සකල කුශලාකුශලක්‍රියා නාමස්කන්ධයෝ ය, කුශලා කුශල ක්‍රියා විසින් උපදවන

Non-commercial distribution

චිත්තජරූපයෝ ය, ආහාරජරූපයෝ ය යන මොවුහු විපාකප්‍රත්‍යය බැහැර කෙරෙති. "නව" අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි ක්‍රියාසිත් විස්ස හා චෛතසික පන්තිස ද ඔවුන් විසින් උපදවන චිත්තජරූපයන් ද ගන්නේ ය. ප්‍රතිසන්ධිවාරය නො ලැබේ. රූපවාරයෙහි කුශලාකුශලක්‍රියා විසින් උපදවන චිත්තජරූපයන් හා අහාරජරූප ගන්නේ ය. විභඞ්ගය උදුරනු. ආහාරප්‍රත්‍යය බැහැරකිරීමක් නැත. බාහ්‍ය සෘතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ, පච්චනීයයෙහි 'එකං' අනුලෝමය ශුද්ධවිපාකප්‍රත්‍යය අනුව විස්තර කරනු.

**විපාකමූලක ඉන්ද්‍රිය දුකයෙහි** කුශලාකුශලක්‍රියා නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ය, රූපජීවිතේන්ද්‍රියයෙන් අන්‍ය වූ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු විපාකප්‍රත්‍යය බැහැර කෙරෙති. "නව" අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිකාලයෙහි ක්‍රියා නාමස්කන්ධයන් හා ඔවුන් විසින් උපදවන චිත්තජරූප ගන්නේ ය. රූපවාරයෙහි කුශලාකුශලක්‍රියාවන් විසින් උපදවන චිත්තජරූප හා රූපජීවිතේන්ද්‍රියයෙන් අන්‍ය වූ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයන් ද ගන්නේ ය. ඉන්ද්‍රිය ප්‍රත්‍යය බැහැරකිරීමක් නැත. බාහ්‍ය ආහාරජ රූපයෝ ය, අසඥසත්ත්වකර්මජ රූප ජීවිතේන්ද්‍රිය ය, ප්‍රවෘත්තිකර්මජ රූපජීවිතේන්ද්‍රිය ය යන මොවුහු, පච්චනියයෙහි "එකං" අනුලෝමය ශුද්ධවිපාකප්‍රත්‍යය අනුව විස්තර කරනු.

**විපාකමූලක ධ්‍යානදුකයෙහි** කුශලාකුශලක්‍රියා නාමස්කන්ධයන් හා ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ විපාකප්‍රත්‍යය බැහැර කෙරෙති. "නව" විස්තර කරනු. ද්විපඤ්චවිඥාන නාමස්කන්ධයෝ ධ්‍යානප්‍රත්‍යය බැහැර කෙරෙති. 'එකං' "පඤ්චවිඤ්ඤාණ සහගතං" යනු යොද විභඞ්ගය උදුරනු. බාහ්‍ය -පෙ- ප්‍රවෘත්ති කර්මජරූපයෝ, "එකං" විස්තර කරනු. ද්විපඤ්චවිඥාන වර්ජිත සකලවිපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, විපාකචිත්තජ රූපයෝය, ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය යන මොව්හු, අනුලෝමයෙහි "එකං" ද්විපඤ්චවිඥානය හැර විපාක ප්‍රත්‍යය අනුව විස්තර කරනු.

**විපාකමූලක මග්ගදුකයෙහි** කුශලාකුශල සහේතුක ක්‍රියා නාමස්කන්ධයන් හා ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ විපාක ප්‍රත්‍යය බැහැර කෙරෙති. "නව" අහේතුකවිපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අහේතුකවිපාක චිත්තජරූපයෝ ය අහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය යන මොවුහු මාර්ගප්‍රත්‍යය බැහැර කෙරෙති. "එකං" හේතුමූලක විපාකදුකය අනුව විස්තර කරනු. අහේතුක ක්‍රියා නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින්

Non-commercial distribution

උපදවන චිත්තජරූපයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥ සත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි "එකං" හේතුමූලකය අනුව විස්තර කරනු. සහේතුකවිපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, සහේතුකවිපාක චිත්තජරූපයෝ ය, සහේතුක ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය යන මොවුහු අනුලෝමයෙහි "එකං" හේතුමූලකය අනුව විස්තර කරනු.

**විපාකමූලක සම්පයුත්තදුකයෙහි** පඤ්චවෝකාරභූමියෙහි උපදනා කුශලාකුශලක්‍රියා නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන චිත්තජ රූපයෝ ය යන මොවුහු විපාක ප්‍රත්‍යය බැහැර කෙරෙති. 'නව' චෙතසක් ඇත්තේ අබ්‍යාකතවාරයෙහි පමණෙකි. අබ්‍යාකතයෙහි ක්‍රියා නාමස්කන්ධයන් හා ඔවුන් විසින් උපදවන චිත්තජරූපයන් ගන්නේ ය. විභඞ්ගය උදුරනු.

අරූපවිපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ඵලසතර ය යන මොවුහු විප්‍රයුක්තය බැහැර කෙරෙති. **"එකං"**

අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන මහාකුශල මහාක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිමමාර්ග නාමස්කන්ධයෝ ය බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු පච්චනීයයෙහි '**තීණි**' කියන ලද නය අනුව විස්තර කරනු.

පඤ්චවෝකාරවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, විපාක චිත්තජ රූපයෝ ය, ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොවුහු අනුලෝමයෙකහි **"එකං"** අරූපවිපාකයන් හැර විපාක ප්‍රත්‍යය අනුව අභිධෙය ඟෙන **"චතුඃ විප්පයුත්තපච්චයා"** යනු යොද විභඞ්ගය උදුරනු. අත්ථි අවිගතදුකයන් සහජාතදුකය මෙන් ද නත්ථිවිගත දුකයන් ආරම්මණ දුකය මෙන් ද විස්තර කරනු.

## ආහාර මූලකය.

ආහාරමූලකයෙහි හේතුදුකයේ පටන් විපාකදුකය දක්වා ඇති දුකයන් කියන ලද නය අනුව දත හැකි ය. **ආහාර මූලක ඉන්ද්‍රියදුකයෙහි** රූපජීවිතේන්ද්‍රියයෙන් අන්‍ය වූ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජරූපයෝ ආහාරප්‍රත්‍යය බැහැර කෙරෙති. '**එකං**' ආහාරජරූපයෝ ඉන්ද්‍රියප්‍රත්‍යය බැහැර කෙරෙති. **"එකං"** බාහිර රූපයෝ ය, ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්වරූපජීවිතේන්ද්‍රි ය, ප්‍රවෘත්තිරූපජීවිතේන්ද්‍රිය ය යන මොවුහු,

Non-commercial distribution

පච්චනීයයෙහි "එකං" සකල ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, චිත්තජරූපයෝ ය, ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, අනුලෝමයෙහි "නව"

ආහාරමූලක ඣාන දුකයෙහි ආහාරප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. ද්විපඤ්චවිඥානනාමස්කන්ධයන් හා ආහාරජරූපයෝ ධ්‍යානප්‍රත්‍යය බැහැර කෙරෙති. "එකං" බාහ්‍ය සෘතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ, පච්චනීයයෙහි "එකං" ද්විපඤ්චවිඥාන වර්ජිත සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, චිත්තජරූපයෝ ය, ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය, අනුලෝමයෙහි "නව" ධ්‍යාන ප්‍රත්‍යය අනුව විස්තර කරනු.

**ආහාරමූලක මග්ගදුකයෙහි** ආහාරප්‍රත්‍යය බැහැරකිරීමක් නැත. අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අහේතුක චිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ ආහාරජ රූපයෝ ය යන මොවුහු මාර්ගප්‍රත්‍යය බැහැර කෙරෙති. "එකං" හේතුමූලකය අනුව විස්තර කරනු. බාහ්‍ය සෘතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජරූපයෝ පච්චනීයයෙහි "එකං" සහේතුක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, සහේතුකචිත්තජ සහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, අනුලෝමයෙහි "නව" මාර්ගප්‍රත්‍යය මෙන් විස්තර කරනු. ආහාරමූලක සම්පයුත්තදුකය ආරම්මණදුකය මෙනි.

**ආහාරමූලක විප්පයුත්තදුකයෙහි** ආහාරප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. අරූපවිපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මහාකුශල මහාක්‍රියා අරූප කුශල අරූපක්‍රියා උපරිමමාර්ග සකලඵල නාමස්කන්ධයෝ ය, ආහාරජ රූපයෝ ය යන මොවුහු විප්පයුත්තය බැහැර කෙරෙති. "**තීණි**" බාහ්‍ය සෘතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ පච්චනීයයෙහි "එකං", අනුලෝමය ශුද්ධ විප්‍රයුක්තය මෙන් විස්තර කරනු. අත්ථිදුකාදිය ද වුක්තානුසාරයෙන් දත යුතු.

## ඉන්ද්‍රිය මූලකය.

ඉන්ද්‍රියමූලකයෙහි හේතුදුකයේ පටන් ආහාරදුකය දක්වා ඇති දුකයෝ උක්තානුසාරයෙන් දත යුත්තාහ. **ඉන්ද්‍රියමූලක ඣාන දුකයෙහි** ඉන්ද්‍රියප්‍රත්‍යය බැහැරකිරීමක් නැත. ද්විපඤ්චවිඥාන නාමස්කන්ධයෝ ය, ජීවිතේන්ද්‍රියයෙන් අන්‍ය වූ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය, පච්චනීයයෙහි "එකං" බාහ්‍ය ආහාරජ රූපයෝ ය, අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය, පච්චනීයයෙහි "**එකං**" බාහ්‍ය ආහාරජ රූපයෝ ය, අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූප-ජීවිතේන්ද්‍රිය ය, පච්චනීයයෙහි "**එකං**" අනුලෝමය ශුද්ධධ්‍යානප්‍රත්‍යය මෙනි.

Non-commercial distribution

**ඉන්ද්‍රිය මූලක මග්ග දුකයෙහි** ඉන්ද්‍රියප්‍රත්‍යය බැහැරකිරීමක් නැත. අහේතුක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අහේතුකචිත්තජරූපයෝ ය, අහේතුකප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය, රූපජීවිතේන්ද්‍රියෙන් අන්‍ය වූ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජරූපයෝය යන මොවුහු මාර්ගප්‍රත්‍යය බැහැර කෙරෙති. 'එකං' හේතුමූලකය මෙනි. බාහ්‍යරූපයෝ ය, ආහාරජ රූපයෝ ය, ඍතුජරූපයෝ ය, අසංඥසත්ත්වරූප ජීවිතේන්ද්‍රිය ය, ප්‍රවෘත්තිරූපජීවිතේන්ද්‍රිය ය, පච්චනීයයෙහි "එකං" අනුලෝමය ශුද්ධමාර්ගප්‍රත්‍යය අනුව විස්තර කරනු. ඉන්ද්‍රියමූලක සම්පයුත්ත දුකය ආරම්මණදුකය මෙනි.

**ඉන්ද්‍රියමූලක විප්පයුත්ත දුකයෙහි** ඉන්ද්‍රියප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. අරූපවිපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන මහාකුශල මහාක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිමමාර්ග සකලඵල නාමස්කන්ධයෝ ය, රූපජීවිතේන්ද්‍රියවර්ජිත අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු විප්‍රයුක්තය බැහැර කෙරෙති. "**තීණි**" බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ, පච්චනීයයෙහි "එකං" අනුලෝමය ශුද්ධ විප්‍රයුක්තය මෙනි. අත්ථිදුකාදිය වුක්තානුසාරයෙන් දත හැකිය

## ධ්‍යානමූලකය

ධ්‍යානමූලකයෙහි හේතුදුකයෙහි පටන් ඉන්ද්‍රිය දුකය දක්වා ඇති දුකයන්හි විශේෂයක් නැත්තේ ය. **ධ්‍යානමූලක මග්ග දුකයෙහි** ධ්‍යානප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. ද්විපඤ්චවිඥානවර්ජිත අහේතුක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අහේතුක චිත්තජරූපයෝ ය, අහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොහු මාර්ගප්‍රත්‍යය බැහැර කෙරෙති. 'එකං' ද්විපඤ්චවිඥාන නාමස්කන්ධයෝ ය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය, පච්චනීයයෙහි "එකං" අනුලෝමය ශුද්ධමාර්ගප්‍රත්‍යය මෙනි. ධ්‍යානමූලක සම්පයුත්ත දුකය ආරම්මණදුකය මෙනි.

**ධ්‍යානමූලක විප්පයුත්ත දුකයෙහි** ද්විපඤ්චවිඥාන නාමස්කන්ධයෝ ධ්‍යානප්‍රත්‍යය බැහැර කෙරෙති. "එකං" අරූපවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ද, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි ලෝභමූල මෝහමූල මනෝද්වාරාවර්ජන මහාකුශල මහාක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිමමාර්ග සකලඵල නාමස්කන්ධයෝ ද විප්‍රයුක්තය බැහැර කෙරෙති. '**තීණි**' බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ, පච්චනීයයෙහි '**එකං**' අරූපවිපාක ද්විපඤ්චවිඥානයන් ගෙන් අන්‍ය වූ පඤ්චවෝකාර ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය,

Non-commercial distribution

චිත්තජරූපයෝ ය, ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය, අනුලෝමයෙහි 'නව' ද්විපඤ්චවිඥානය හැර විප්‍රයුක්තප්‍රත්‍යය අනුව අභිධෙය ගෙන විප්‍රයුක්තය අනුව ම විභඞ්ගය උද්ධරනු. අත්ථිදුකාදිය වුක්තානුසාරයෙන් දත යුතු.

### මග්ගමූලකය

මග්ගමූලකයෙහි ඣාන දුකය දක්වා ඇති දුකයෝ උක්තානු සාරයෙන් දතයුත්තාහ. මග්ගමූලක සම්ප්‍රයුත්තදුකය ආරම්මණදුකය මෙති. **මග්ගමූලක විප්පයුත්ත දුකයෙහි** පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අහේතුක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අහේතුක චිත්තජරූපයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය යන මොවුහු මාර්ගප්‍රත්‍යය බැහැර කෙරෙති. '**එකං**' හේතුමූලක අනුව විස්තර කරනු.

අරූපවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල මෝහමූල මහාකුශල මහාක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිමමාර්ග සකලඵල නාමස්කන්ධයෝ ය යන මොවුහු විප්‍රයුක්තය බැහැර කෙරෙති. '**තීණි**' මෝහමූලද්වයහි මෝහය නො හැර හේතුමූලකය අනුව විස්තර කරනු.

අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මනෝද්වාරාවර්ජනයය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසඤ්ඤසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝය යන මොවුහු පච්චනීයයෙහි 'එකං' හේතුමූලකය අනුව විස්තර කරනු.

අරූපවිපාක වර්ජිත පඤ්චවෝකාර සහේතුක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, සහේතුකචිත්තජ සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, අනුලෝමයෙහි 'නව' අරූපවිපාක හැර මාර්ග ප්‍රත්‍යය අනුව විස්තර කරනු. අත්ථිදුකාදිය වුක්තානුසාරයෙන් දත යුතු. සම්පයුත්තමූලකය ආරම්මණමූලකය මෙති.

විප්පයුත්තමූලකයෙහි සම්පයුත්තදුකය දක්වා ඇති දුකයෝ වුක්තානු-සාරයෙන් දතයුත්තාහ. විප්පයුත්තමූලක අත්ථිදුකය සහජාත මූලක විප්පයුත්තදුකය මෙති. නත්ථිවිගතදුකයෝ ආරම්මණදුකය වැනිය හ. අත්ථිඅවිගත මූලකයෝ සහජාතමූලකය වැනිය හ. නත්ථිවිගත මූලකයෝ ආරම්මණමූලකය වැනිය හ. මෙතෙකින් දුකවාරවිභාගය නිමියේ ය.

**විශේෂ කරුණු.**

මෙතෙකින් දැක්වුණු ප්‍රත්‍යයන් ගේ දුකවාර විභාගය පාලි නය අනුව කරන ලද්දක් නොවේ. පාලික්‍රමය නො වතු දු පළමුකොට දුකවාරය

Non-commercial distribution

පමණක් ප්‍රගුණ කරගෙන මේ ප්‍රකරණය උගෙනීම පහසු වන බැවින් පූර්වාචාර්‍ය්‍යවරයෝ පළමුකොට දුකවාර සමූහය පමණක් ශිෂ්‍යයනට ප්‍රගුණ කරවති. මෙහි දුකවාර පමණක් පළමුකොට දක්වන ලදුයේ එහෙයිනි. දක්වන ලද දුකවාර විභාගය තේරුම් ගෙන හොඳින් ප්‍රගුණ කර ගත යුතුය. එසේ කළ කල්හි ත්‍රිකචතුෂ්කාදි වාරයන්හි පහසු වන්නේ ය.

# තිකාදි වාරයෝ.

## හේතු ආරම්මණ මූලක අධිපති තිකය.

දුකවාරයට අනතුරු ව තිකවාරය වදළ සේක. එය හේතු ආරම්මණ මූලක අධිපති තිකාදි වසයෙන් එක්විසි වැදෑරුම් වේ. එයින් අධිපති තිකය පළමු කොට වදළ සේක.

ඒ අධිපති තිකයෙහි සාධිපතිචිත්තජරූපයෝ අධිපති ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයන්වී ආරම්මණප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්නයන් නො වීමෙන් ආරම්මණ ප්‍රත්‍යය බැහැර කෙරෙති. ඒ ධර්‍මයෝ පච්චනීයානුලෝමයෙහි "න ආරම්මණපච්චයා අධිපතියා පඤ්ච" යි වදරන ලදහ.

අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපති ධර්‍මයෝ ය, නො ලැබෙන අවස්ථාවෙහි අකුශල අහේතුක ක්‍රියා මහාකුශල මහාක්‍රියා ලෞකිකවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ආරම්මණ ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්නයන් වී අධිපතිප්‍රත්‍යයෝත්පන්නයන් නො වීමෙන් අධිපතිප්‍රත්‍යය බැහැර කෙරෙති. ඒ ධර්‍මයෝ අනුලෝම පච්චනීයයෙහි "ආරම්මණපච්චයා න අධිපතියා තීණි" යි වදරන ලදහ. (මෙසේ දුකය ශුද්ධ කොට පසුව තිකය ශුද්ධ කළ යුතු ය.)

අධිපති ප්‍රත්‍යයේ ප්‍රත්‍යයෝත්පන්න ම වී හේතු ආරම්මණ ප්‍රත්‍යය දෙක්හි ප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්‍ම නැති බැවින් පච්චනීයානුලෝමයෙහි" න හෙතුපච්චයා න ආරම්මණපච්චයා අධිපතිපච්චයා" යනාදිය නො වදළ සේක.

අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්‍මයෝ ය, නො ලැබෙන අවස්ථාවෙහි මෝහමූලද්වයයෙහි මෝහ වර්ජිත අකුශල මහාකුශල මහාක්‍රියා සහේතුක ලෞකික විපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොවුහු හේතු ආරම්මණප්‍රත්‍යය දෙක්හි ප්‍රත්‍යයෝත්පන්න වී අධිපතිප්‍රත්‍යයෝත්පන්න නො වීමෙන් අධිපති ප්‍රත්‍යය බැහැර කෙරෙති. ඒ ධර්‍මයෝ අනුලෝම පච්චනීයයෙහි "හේතුපච්චයා ආරම්මණපච්චයා න අධිපතියා තීණි" යි වදරන ලදහ. තීණි යනු කුසලෙන කුසලය,

Non-commercial distribution

අකුසලෙන අකුසලය, අබ්‍යාකතෙන අබ්‍යාකතය යන මොහු ය. කුශලාකුශල දෙපදයෙහි හේතු මූලක අධිපතිදුකයෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ග උදුරනු. අබ්‍යාකතපදයෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි වූ මහා ක්‍රියා සිත් අට ය, සැමකල්හි අධිපති ලැබෙන මහද්ගත ක්‍රියා නවය හා ඵලසිත් සතර ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයන් නිසා උපදනා අධිපතිධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි වූ මහාක්‍රියා අට ය සහේතුක ලෞකික විපාක දෙතිස ය චෛතසික පන්තිස ය යන අවයව -පෙ- අවයව නාමස්කන්‍ධයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. ආරම්මණප්‍රත්‍යය අනුව විභඞ්ගය උදුරනු.

අහේතුකචිත්තජ රූපයෝ ය, අහේතුකප්‍රතිසන්‍ධිකර්මජ රූපයෝ ය බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්ති කර්මජ රූපයෝ ය යන මොවුහු ප්‍රත්‍යය තුනෙහි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. ඒ ධර්මයෝ පච්චනීයයෙහි "න හෙතුපච්චයා න ආරම්මණපච්චයා න අධිපතියා එකං" යි වදරන ලදහ. දුකය අනුව විස්තර කරනු.

අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්‍ධයෝ හේතු ආරම්මණ අධිපතිප්‍රත්‍යය තුනෙහි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙති. ඒ ධර්මයෝ අනුලෝමයෙහි "හෙතුපච්චයා ආරම්මණපච්චයා අධිපතියා තීණි" යි වදරන ලදහ. කුසලාකුසල දෙපදය අධිපති අනුව විස්තර කරනු.

අබ්‍යාකතවාරයෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාක්‍රියා අට ය, අධිපති නියත වූ මහද්ගත ක්‍රියා නවය ය, ඵලසිත් සතර ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්‍ධයන් නිසා උපදනා වූ අධිපතිධර්ම වර්ජිත වූ මහාක්‍රියා අට ය මහද්ගතක්‍රියා නවය ය ඵලසිත් සතර ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්‍ධයෝ ලැබෙත්. "විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්‍ධං -පෙ- ද්වෙ ඛන්‍ධා"

**හේතු ආරම්මණමූලක අනන්තර තිකයෙහි** ආරම්මණප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. අනන්තරප්‍රත්‍යය බැහැර කිරීමක් ද නැත. අනන්තර ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න වී හේතු ආරම්මණප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්ම නැත්තාහ. එබැවින් හේතුආරම්මණ ප්‍රත්‍යය දෙක බැහැර කිරීමක් නැත්තේ ය. එබැවින් පච්චනීයානුලෝමයෙහි "න හේතුපච්චයා න ආරම්මණපච්චයා අනන්තරෙ" යනාදිය නො වදළ සේක.

හේතුආරම්මණ දෙක්හි ප්‍රත්‍යයෝත්පන්න වී අනන්තර ප්‍රත්‍යයෝත්පන්න නො වන ධර්මයෝ නැතහ. එබැවින් අනුලෝම පච්චනීයෙහි "හෙතුපච්චයා ආරම්මණපච්චයා න අනන්තරෙ" යනාදිය නො වදළ සේක.

Non-commercial distribution

අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ප්‍රත්‍යය තුනෙහි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. එබැවින් පච්චනීයයෙහි "න හෙතුපච්චයා න ආරම්මණපච්චයා න අනන්තරෙ එකං" යි වදළ සේක.

මෝහමූලද්වයෙහි මෝහවර්ජිත සකල සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ප්‍රත්‍යය තුනෙහි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙති. අනුලෝමයෙහි "හෙතුපච්චයා ආරම්මණ පච්චයා අනන්තරෙ තීණි"

**හේතුආරම්මණමූලක සහජාත තිකයෙහි** චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ආරම්මණප්‍රත්‍යය බැහැර කෙරෙති. පච්චනීයානුලෝමයෙහි "**එකං**" සහජාතය බැහැර කිරීමක් නැත.

අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ -පෙ- ප්‍රවෘත්තිකර්මජ රූපයෝ හේතුආරම්මණප්‍රත්‍යය දෙක ම බැහැර කෙරෙති. පච්චනීයානුලෝමයෙහි "**එකං**" සහජාතය බැහැර කිරීමක් නැත. පච්චනීය ද නැත.

මෝහමූලද්වයයෙහි මෝහවර්ජිත සහේතුක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ප්‍රත්‍යය තුනෙහි ම ප්‍රත්‍යයෝත්පනයෝ ය, අනුලෝමයෙහි "**හේතුපච්චයා ආරම්මණපච්චයා සහජාතෙ තීණි**"

**හේතුආරම්මණමූලක අඤ්ඤමඤ්ඤ තිකයෙහි** ආරම්මණ අඤ්ඤමඤ්ඤ ද්‍විකය ශුද්ධ කරනු. අහේතුකප්‍රතිසන්ධිනාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තුව ය, ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන අහේතුකචිත්තජ මහාභූතයෝ ය අහේතුකප්‍රතිසන්ධිකර්මජ මහාභූතයෝ ය, -පෙ- ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුහු හේතු ආරම්මණ දෙක බැහැර කෙරෙති. "**එකං**" අඤ්ඤමඤ්ඤය බැහැර කිරීමක් නැත.

නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන අහේතුක චිත්තජ රූපයෝ ය, හෘදයවස්තුවෙන් අන්‍ය අහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, මහාභූතයන්-ගෙන් ප්‍රත්‍යය ලබන අහේතුක චිත්තජ උපාදායරූපයෝ ය, අහේතුක ප්‍රතිසන්ධිකර්මජ උපාදාය රූපයෝ ය, -පෙ- ප්‍රවෘත්තිකර්මජ උපාදාය රූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි "**එකං**"

මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි "**තීණි**" හේතු ආරම්මණ මූලක නිස්සය තිකය සහජාත තිකය මෙනි. උපනිස්සය තිකය අනන්තර තිකය මෙනි.

Non-commercial distribution

**හේතුආරම්මණමූලක පුරේජාත තිකයෙහි** ආරම්මණප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. පුරේජාතය බැහැර කරනු. හේතු ආරම්මණ දෙක බැහැර කිරීමක් ද නැත. අරූපවිපාක සතර ය අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මෝහමූලද්වයෙහි මෝහවර්ජිත ලෝභමූල මෝහමූල මහාකුශල මහා ක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිමමාර්ග සකලඵල නාමස්කන්ධයෝ ය, සහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොවුහු හේතුආරම්මණ දෙක්හි ප්‍රත්‍යයෝත්පන්න වී පුරේජාතය බැහැර කෙරෙති. **"තීණි"**

අහේතුක චිත්තජ රූපයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය, -පෙ- ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි **"එකං"**

මෝහමූලද්වයයෙහි මෝහයෙන් හා අරූපවිපාකයන් ගෙන් අන්‍ය වූ පඤ්චවෝකාර සහේතුක ප්‍රවෘත්තිනාමස්කන්ධයෝ ප්‍රත්‍යය තුනෙහි ම ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙති. අනුලෝමයෙහි **"තීණි"** දුකය අනුව විස්තර කරනු.

හේතු ආරම්මණමූලක ආසේවනතිකයෙහි ආරම්මණය බැහැර කිරීමක් නැත. ආසේවන දුකය ශුද්ධ කරනු. හේතු ආරම්මණ දෙක බැහැර කිරීමක් නැත. මෝහමූලද්වයෙහි මෝහවර්ජිත අකුශල මහා කුශල මහාක්‍රියා ප්‍රථමජවනයෝ ය, සහේතුක විපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොවුහු ආසේවනය බැහැර කෙරෙති. **'තීණි'** අහේතුක චිත්තජ අහේතුක ප්‍රතිසන්ධි කර්මජ -පෙ- ප්‍රවෘත්තිකර්මජ රූපයෝ, පච්චනීයෙහි **"එකං"**

මෝහමූලද්වයයෙහි මෝහ වර්ජිත අකුශල මහාකුශල මහා ක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතකුශල මහද්ගත ක්‍රියා ලෝකෝත්තර මාර්ගයෝ ය යන නාමස්කන්ධයෝ ප්‍රත්‍යය තුනෙහිම ප්‍රත්‍යයෝත්පන්නයෝ වෙති. **'තීණි'**

**හේතුආරම්මණ මූලක කම්මතිකයෙහි** ආරම්මණ කම්මදුකය ශුද්ධ කරනු. අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ හේතුආරම්මණ දෙක බැහැර කෙරෙති. **'එකං'**

කුශලා කුශල සහේතුක ක්‍රියා චේතනාවෝ කර්ම ප්‍රත්‍ය බැහැර කෙරෙති. **'තීණි'** බාහ්‍ය ආහාරජ ඍතුජරූපයෝ, පච්චනීයෙහි **'එකං'**

මෝහමූලද්වයෙහි මෝහය හා කුශලාකුශලක්‍රියා චේතනා ද වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි **'තීණි'**

Non-commercial distribution

**හේතුආරම්මණ මූලක විපාක තිකයෙහි** ආරම්මණවිපාක දුකය ශුධ කරනු. විපාක චිත්තයන් උපදවන අහේතුක චිත්තජ රූපයෝ ය, අහේතුක ප්‍රතිසන්ධිකර්‍මජ රූපයෝ ය යන මොවුහු හේතුආරම්මණ දෙක බැහැර කෙරෙති. **'එකං'**

මෝහමූලද්වයෙහි මෝහවර්ජිත කුශලා කුශල සහේතුක ක්‍රියා නාමස්‌කන්‍ධයෝ විපාකප්‍රත්‍යය බැහැර කෙරෙති. **'තීණි'**

අහේතුකක්‍රියාචිත්තජ රූපයෝය, බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥ-සත්ත්වකර්‍මජ ප්‍රවෘත්තිකර්‍මජ රූපයෝ ය යන මොවුහු පච්චනීයයෙහි 'එකං' සහේතුකවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්‌කන්‍ධයෝ අනුලෝම-යෙහි "එකං"

**හේතුආරම්මණමූලක ආහාරතිකයෙහි** ආරම්මණ ආහාර දුකය ශුධ කරනු. අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්‍මජ ආහාරජ රූපයෝ හේතුආරම්මණ දෙක බැහැර කෙරෙති. "එකං" ආහාරය බැහැර කිරීමක් නැත. ඍතුජ අසංඥසත්ත්වකර්‍මජ ප්‍රවෘත්තිකර්‍මජරූපයෝ පච්චනීයයෙහි "එකං" මෝහමූලද්වයෙහි මෝහයෙන් අන්‍ය වූ සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධිනාමස්‌කන්‍ධයෝ, අනුලෝමයෙහි "**තීණි**"

**හේතුආරම්මණ මූලක ඉන්‍ද්‍රියතිකයෙහි** ආරම්මණ ඉන්‍ද්‍රියදුකය ශුධ කරනු. අහේතුකචිත්තජ අහේතුක ප්‍රතිසන්ධිකර්‍මජ රූපජීවිතේන්‍ද්‍රිය වර්ජිත අසංඥසත්ත්වකර්‍මජ ප්‍රවෘත්ති කර්‍මජරූපයෝ හේතු ආරම්මණ දෙක බැහැර කෙරෙති. 'එකං' ඉන්‍ද්‍රිය ප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ ය, අසංඥසත්ත්ව කර්‍මජ ප්‍රවෘත්තිකර්‍මජ රූප ජීවිතේන්‍ද්‍රියයෝය, පච්චනීයයෙහි "එකං" මෝහමූලද්වයයෙහි මෝහ වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්‌කන්‍ධයෝ, අනුලෝමයෙහි "**තීණි**"

**හේතුආරම්මණ මූලකඣානතිකයෙහි** දුකශුද්ධිය කරනු. අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්‍මජ රූපයෝ හේතුආරම්මණ දෙක බැහැර කෙරෙති. 'එකං' ධ්‍යානය බැහැර කිරීමක් නැත. බාහ්‍ය ආහාරජ -පෙ- ප්‍රවෘත්තිකර්‍මජ රූපයෝ, පච්චනීයයෙහි "එකං" මෝහමූලද්වයයෙහි මෝහවර්ජිත සහේතුක ප්‍රවෘතති ප්‍රතිසන්ධි නාමසකන්ධයෝ, අනුලෝමයෙහි "**තීණි**"

**හේතුආරම්මණ මූලක මග්ගතිකයෙහි** දුකසුද්ධිය කරනු. හේතු ආරම්මණයන් බැහැර කිරීමක් නැත. අහේතුක චිත්තජ -පෙ- ප්‍රවෘත්ති-කර්‍මජරූපයෝ පච්චනීයයෙහි "එකං" හේතුආරම්මණ මූලක සම්පයුත්තතිකය අනන්තරතිකය මෙනි.

Non-commercial distribution

**හේතුආරම්මණමූලක විප්පයුත්තතිකයෙහි** දුකසුද්ධිය කරනු. අහේතුක චිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ රූපයෝ හේතුආරම්මණයන් බැහැර කෙරෙති. අරූපවිපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මෝහමූලද්වයයෙහි මෝහය වර්ජිතවූ ලෝභමූල මෝහමූල මහාකුශල මහාක්‍රියා අරූපකුශල අරූප ක්‍රියා උපරිමමාර්ග සකලඵල නාමස්කන්ධයෝ විප්පයුත්තය බැහැර කෙරෙති. "**තීණි**" බාහ්‍ය ආහාරජ -පෙ- ප්‍රවෘත්තිකර්මජරූපයෝ පච්චනියයෙහි "එකං" මෝහමූලද්වයයෙහි මෝහය හා අරූපවිපාක වර්ජිත පඤ්චවෝකාර ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි '**තීණි**' හේතුආරම්මණමූලක අත්ථිතිකය සහජාතතිකය මෙනි. නත්ථි-විගතතික දෙක අනන්තරතිකය මෙනි.

තිකවාරය නිමි.

---

## **චතුක්ක වාරය.**

තිකවාරයට අනතුරු ව චතුක්කවාරය වදාළ සේක. එද හේතු ආරම්මණ අධිපතිමූලක අනන්තර චතුක්කය යනාදි වශයෙන් විසි වැදෑරුම් වේ. එයින් හේතුආරම්මණඅධිපතිමූලක අනන්තරචතුක්කය පළමු කොට වදාළ සේක. අධිපතිඅනන්තර දුකය ශුඩකරනු. හේතු-ආරම්මණ අධිපති තුන බැහැර කිරීමක් නැත. අනන්තරය බැහැර කිරීමක් ද නැත. අහේතුකචිත්තජ -පෙ- ප්‍රවෘත්තිකර්මජරූපයෝ, පච්චනියයෙහි "එකං" අධිපතිධර්ම වර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි '**තීණි**'

**හේතු ආරම්මණ අධිපතිමූලක සහජාත චතුක්කයෙහි** අධිපති සහජාතදුක ශුද්ධිය කරනු. අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ -පෙ- ප්‍රවෘත්තිකර්මජරූපයෝ හේතුආරම්මණ අධිපති තුන බැහැර කෙරෙති. 'එකං' සහජාතය බැහැර කිරීමක් නැත. පච්චනීය ද නැත. අධිපතිධර්මවර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්ධයෝ අනුලෝම යෙහි 'තීණි"

**හේතු ආරම්මණ අධිපතිමූලක අඤ්ඤමඤ්ඤ චතුක්කයෙහි** අධිපති අඤ්ඤමඤ්ඤදුක සුද්ධිය කරනු. අහේතුක ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තුව ය, ඔවුනොවුන්ගෙන් ප්‍රත්‍යය ලබන අහේතුකචිත්තජ මහාභූතයෝ ය, අසංඥසත්ත්වකර්මජ මහාභූතයෝ ය, ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුහු හේත්වාදි තුන බැහැර කෙරෙති. 'එකං' අඤ්ඤමඤ්ඤය බැහැර කිරීමක් නැත. නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන

*Non-commercial distribution*

අහේතුක චිත්තජරූපයෝ ය, හෘදයවස්තුවෙන් අන්‍ය වූ අහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය, මහාභූතයන් ගෙන් ප්‍රත්‍යය ලබන අහේතුකචිත්තජ -පෙ- ප්‍රවෘත්තිකර්මජ උපාදයරූපයෝ ය යන මොවුහු, පච්චනීයෙහි 'එකං' අධිපතිධර්ම වර්ජිත සාධිපතිජවන නාමස්කන්ධයෝ අනුලෝමයෙහි '**තීණි**' **හේතු ආරම්මණ අධිපති මූලක නිස්සය චතුක්කය** සහජාත චතුක්කය මෙනි. උපනිස්සය චතුකකය අනන්තර චතුක්කය මෙනි.

**හේතු ආරම්මණ අධිපතිමූලක පුරේජාත චතුක්කයෙහි** අධිපති පුරේජාත සූඩිය කරනු. ප්‍රත්‍යය තුන බැහැර කිරීමක් නැත. අරූපභූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත ලෝභමූල මෝහමූල මහාකුශල මහාක්‍රියාවෝ ය, සැමකල්හි අධිපති ලැබෙන අරූපකුශල අරූපක්‍රියා උපරිමමාර්‍ගී සකලඵලයෝ ය යන මේ නාමස්කන්ධයෝ පුරේජාතය බැහැර කෙරෙති. '**තීණි**' අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ -පෙ- ප්‍රවෘත්තිකර්මජරූපයෝ, පච්චනියයෙහි "**එකං**" පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි, අධිපතිධර්ම වර්ජිත සාධිපතිජවන නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි "**තීණි**"

**හේතු ආරම්මණ අධිපතිමූලක ආසේවන චතුක්කයෙහි** අධිපති ආසේවන සූඩිය කරනු. හේත්වාදි තුන බැහැර කිරීමක් නැත. අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ප්‍රථමජවනයෝ ය, ඵල සතර ය යන නාමස්කන්ධයෝ ආසේවනය බැහැර කෙරෙති. අහේතුකචිත්තජ -පෙ- ප්‍රවෘත්ති කර්මජරූපයෝ, පච්චනීයෙහි "එකං" අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදිජවනයෝ ය, අධිපති නියත මහද්ගතකුශල මහද්ගතක්‍රියා ලෝකෝත්තරමාර්‍ගීයෝ ය යන නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි "**තීණි**"

**හේතු ආරම්මණ අධිපති මූලක කම්මචතුක්කයෙහි** අධිපති කම්මදුක සූඩිය කරනු. අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ප්‍රත්‍යය තුන බැහැර කෙරෙති. "එකං" සාධිපති කුශලාකුශලක්‍රියා චේතනාවෝ කර්මය බැහැර කෙරෙති. "තීණි" බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ, පච්චනීයෙහි "එකං" අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම හා කුශලාකුශල ක්‍රියාචේතනා ද වර්ජිත සාධිපති ජවන නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි "**තීණි**"

**හේතුආරම්මණ අධිපති මූලක විපාක චතුක්කයෙහි** අධිපති විපාක දුකය ශුඩ කරනු. විපාකචිත්තජ ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ප්‍රත්‍යය තුන

Non-commercial distribution

බැහැර කෙරෙති. 'එකං' අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්‍ම වර්ජිත සාධිපති කුශලාකුශල ක්‍රියා නාමස්කන්ධයෝ විපාක ප්‍රත්‍යය බැහැර කෙරෙති. **'තීණි'** අහේතුකක්‍රියාචිත්තජ රූපයෝ ය. බාහ්‍ය ප්‍රවෘත්තිකර්‍මජ රූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි **"එකං"** අධිපතිධර්‍ම වර්ජිත ඵලනාමස්කන්ධයෝ අනුලෝමයෙහි 'එකං"

**හේතු ආරම්මණ අධිපතිමූලක ආහාරචතුක්කයෙහි** අධිපති ආහාර දෙක ශුද්ධ කරනු. අහේතුක චිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්‍මජ රූපයෝ ප්‍රත්‍යය තුන බැහැර කෙරෙති. 'එකං' ආහාරය බැහැර කිරීමක් නැත. බාහ්‍ය ඍතුජ අසංඥසත්ත්වකර්‍මජ ප්‍රවෘත්තිකර්‍මජ රූපයෝ පච්චනීයයෙහි 'එකං' අධිපතිධර්‍ම වර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි **'තීණි'**

**හේතුආරම්මණ අධිපතිමූලක ඉන්ද්‍රියචතුක්කයෙහි** අධිපති ඉන්ද්‍රිය දෙක ශුද්ධකරනු. අහේතුකචිත්තජ අහේතුක ප්‍රතිසන්ධිකර්‍මජ රූප ජීවිතේන්ද්‍රිය වර්ජිත අසංඥසත්ත්වකර්‍මජ ප්‍රවෘත්තිකර්‍මජරූපයෝ තුන බැහැර කෙරෙති. 'එකං' ඉන්ද්‍රිය බැහැර නො කෙරේ. බාහ්‍ය ආහාරජ ඍතුජ රූපයෝ ය, අසංඥසත්වකර්‍මජ ප්‍රවෘත්තිකර්‍මජ රූපජීවිතේන්ද්‍රියෝ ය, පච්චනීයයෙහි 'එකං' අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්‍ම වර්ජිත දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ අනුලෝමයෙහි 'තීණි'

**හේතුආරම්මණ අධිපතිමූලක ධ්‍යාන චතුක්කයෙහි** දූකසුද්ධිය කරනු. අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්‍මජ රූපයෝ තුන බැහැර කෙරෙති. "එකං" ධ්‍යානය බැහැර නො කෙරේ. බාහ්‍ය -පෙ- ප්‍රවෘත්තිකර්‍මජ රූපයෝ පච්චනීයයෙහි "එකං" අධිපතිධර්‍ම වර්ජිත සාධිපතිජවන නාමස්කන්ධයෝ අනුලෝමයෙහි 'තීණි'

**හේතුආරම්මණ අධිපතිමූලක මග්ගචතුක්කයෙහි** දූකසුද්ධිය කරනු. තුන බැහැර නො කෙරේ. මාර්‍ගප්‍රත්‍යය ද බැහැර නො කෙරේ. අහේතුකචිත්තජ -පෙ- ප්‍රවෘත්තිකර්‍මජරූපයෝ, පච්චනීයයෙහි 'එකං' අධිපතිධර්මවර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්ධයෝ අනුලෝමයෙහි **'තීණි'** සම්පයුත්තචතුක්කය අනන්තර චතුක්කය මෙනි.

**හේතුආරම්මණ අධිපතිමූලක විප්පයුත්තචතුක්කයෙහි** දූක සුද්ධිය කරනු. අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්‍මජ රූපයෝ තුන බැහැර කෙරෙති. 'එකං' අරූපභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්‍ම වර්ජිත ලෝභමූල මහාකුශල මහාක්‍රියා ය අධිපතිනියත අරූපකුශල අරූපක්‍රියා උපරිමමාර්‍ග සකලඵලයෝය යන නාමස්කන්ධයෝ,

Non-commercial distribution

විප්පයුත්තය බැහැර කෙරෙති. 'තීණි' බාහ්‍ය -පෙ- ප්‍රවෘත්තිකර්මජ රූපයෝ පච්චනීයයෙහි 'එකං' පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ අනුලෝමයෙහි "තීණි" අත්ථිඅවිගතචතුක්කයෝ සහජාත චතුක්කය මෙනි. නත්ථිවිගත චතුක්කයෝ අනන්තර චතුක්කය මෙනි.

චතුක්කවාරය නිමියේ ය.

## පඤ්චකාදි වාරයෝ.

චතුක්කවාරයට අනතුරු ව පඤ්චකවාරය වදළ සේක. එහි හේතුආරම්මණ අධිපති අනන්තර මූලක සමනන්තර පඤ්චකාදි වශයෙන් වාර එකුන්විස්සක් ඇත්තේ ය. එයින් සමනන්තර පඤ්චකය පළමු කොට වදළ සේක. චතුක්කයන් අනුව විස්තර කරනු. වෙනසක් නැත.

පඤ්චකවාරය නිමියේ ය.

පඤ්චකවාරයට අනතුරු ව ඡක්කවාරය වදළ සේක. එහි හේතු ආරම්මණ අධිපති අනන්තර සමනන්තර මූලක සහජාත ඡක්කාදි වසයෙන් වාර අටළොසක් ඇත්තේ ය. එයින් සහජාත ඡක්කය පළමුකොට වදළ සේක. චතුක්කයන් සේ විස්තර කරනු.

ඡක්කවාරය නිමි.

ඡක්කවාරයට අනතුරු ව සත්තකවාරය වදළ සේක. එහි ද හේතුආරම්මණ අධිපති අනන්තර සමනන්තර සහජාත මූලක අඤ්ඤමඤ්ඤ සත්තකාදි වශයෙන් වාරසතළොසක් ඇත්තේය, එයින් අඤ්ඤමඤ්ඤ සත්තකය පළමු කොට වදළ සේක. එහි සහජාත අඤ්ඤමඤ්ඤදුකශුද්ධිය කරනු. මූලප්‍රත්‍යය සය බැහැර කිරීමක් නැත. අඤ්ඤමඤ්ඤය බැහැර කිරිමක් නැත. පච්චනීය ය ද නැත. අධිපතිප්‍රත්‍යය ලබන අවස්ථාවෙහි අධිපති ධර්ම වර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි 'තීණි" නිස්සයසත්තක උපනිස්සය සත්තකයන්ගේ වෙනසක් නැත.

පුරේජාත සත්තකයෙහි දුකය ශුද්ධ කරනු. මූල සය බැහැර කිරීමක් නැත. අරූපභූමියෙහි අධිපති ලබන අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත ලෝභමූල මහාකුශල මහාක්‍රියා අරූපකුශල අරූපක්‍රියා උපරිමමාර්ග සකලඵල නාමස්කන්ධයෝ පුරේජාතය බැහැර කෙරෙති. පච්චනීයය

Non-commercial distribution

නො ලැබේ. පඤ්චවෝකාරභූමියෙහි අධිපතිධර්‍ම වර්ජිත සාධිපතිජවන නාමස්කන්‍ධයෝ, අනුලෝමයෙහි 'තීණි'

ආසේවන සත්තකයෙහි සහජාත ආසේවන සූධිය කරනු. සය බැහැර කිරීමක් නැත. අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්‍ම වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ප්‍රථම ජවන ලෝකෝත්තරඵලජවන නාමස්කන්‍ධයෝ ආසේවනය බැහැර කෙරෙති. 'තීණි' පච්චනීය නැත. අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්‍මවර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය මහද්ගත කුශල මහද්ගතක්‍රියා ලෝකෝත්තර මාර්‍ගයෝ ය යන නාමස්කන්‍ධයෝ, අනුලෝමයෙහි 'තීණි'

කම්මසත්තකයෙහි දූකය ශුධ කරනු. සය බැහැර නො කෙරේ. සාධිපති කුශලාකුශල ක්‍රියා චේතනාවෝ කම්මය බැහැර කෙරෙති. 'තීණි' පච්චනීයය නො ලැබේ. අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්‍ම හා කුශලාකුශල ක්‍රියාචේතනා ද වර්ජිත වූ දෙපනස් සාධිපතිජවන නාමස්කන්‍ධයෝ, අනුලෝමයෙහි 'තීණි'

විපාකසත්තකයෙහි දූකය ශුධ කරනු. සය බැහැර නො කෙරේ. අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්‍ම වර්ජිත සාධිපති කුශලාකුශල ක්‍රියා නාමස්කන්‍ධයෝ විපාකය බැහැර කෙරෙති. "තීණි" පච්චනීය නො ලැබේ. අධිපති ධර්මවර්ජිත ඵලනාමස්කන්‍ධයෝ, අනුලෝමයෙහි 'එකං'

ආහාරසත්තකයෙහි දූකය ශුධ කරනු. සය බැහැර නොකෙරේ. ආහාරය ද බැහැර නො කෙරේ. පච්චනීයය ද නැත. අධිපතිධර්‍මවර්ජිත සාධිපති ජවන නාමස්කන්‍ධයෝ අනුලෝමයෙහි 'තීණි' ඉන්‍ද්‍රියසත්තකයේ පටන් සම්පයුත්තසත්තකය දක්වා වෙනසක් නැත. විප්පයුත්තසත්තකය පුරේජාතසත්තකය මෙනි. අත්‍ථිසත්තකාදිය ආහාරසත්තකය මෙනි. සත්තකවාරය නිමි.

සත්තකවාරයට අනතුරු ව අට්ඨකවාරය වදාළ සේක. එහි හේතු ආරම්මණ අධිපති අනන්තර සමනන්තර සහජාත අඤ්ඤමඤ්ඤමූලක නිස්සයඅට්ඨකාදි වසයෙන් වාරසොළොසක් ඇත්තේ ය. එයින් නිස්සය අට්ඨකවාරය පළමුකොට වදාළ සේක. ඒවායේ ද වෙනසක් නැත. අට්ඨකවාරය නිමි.

අට්ඨකවාරයට අනතුරු ව නවකවාරය වදාළ සේක. එහි හේතු ආරම්මණ අධිපති අනන්තර සමනන්තර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය

Non-commercial distribution

මූලක උපනිස්සය නවකාදි වශයෙන් වාර පසළොසක් ඇත්තේ ය. එයින් උපනිස්සය නවකය පළමු කොට වදළ සේක. නවකයන්හි සත්තකයන්ට වඩා වෙනසක් නැත. නවක වාරය නිමි.

නවකවාරයට අනතුරු ව දසකවාරය වදළ සේක. එහි ද හේතු ආරම්මණ අධිපති අනන්තර සමනන්තර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය උපනිස්සයමූලක පුරේජාත දසකාදි වසයෙන් වාර තුදුසක් ඇත්තේ ය. එයින් පුරේජාත දසකය පළමු කොට වදළ සේක. දසකයන් ගේ ද වෙනසක් නැත්තේ ය. දසකවාරය නිමි.

දසකවාරයට අනතුරුව ඒකාදසක වාරය වදළ සේක. එහි ද හේතු ආරම්මණය -පෙ- පුරේජාත මූලක ආසේවන ඒකාදසකවාරාදි වශයෙන් වාර තෙළෙසක් ඇත්තේ ය. එයින් ආසේවන ඒකාදසක වාරය පළමු කොට වදළ සේක. දූකය ශුද්ධ කරනු. දශය බැහැර කිරීමක් නැත. පඤ්චවෝකාරභූමියෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපති ධර්‍ම වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහා කුශල මහාක්‍රියා ප්‍රථම ජවන ඵල නාමස්කන්ධයෝ ආසේවනය බැහැර කෙරෙති. 'තීණි' පච්චනීයය නො ලැබේ. පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන, අවස්ථාවෙහි අධිපතිධර්‍ම වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා, ද්විතියාදිජවනයෝ ය, මහද්ගතකුශල මහද්ගතක්‍රියා ලෝකෝත්තර මාර්‍ග චිත්තජරූපයෝ ය යන නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි 'තීණි'

කම්ම ඒකාදසකයෙහි දූක ශුද්ධිය කරනු. දශය බැහැර නො කෙරේ. පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි සාධිපති කුශලාකුශලක්‍රියා චේතනාවෝ කර්‍මය බැහැර කෙරෙති. 'තීණි' පච්චනීය නො ලැබේ. පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්‍ම හා කුශලාකුශල ක්‍රියා චේතනා ද වර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි 'තීණි'

විපාකඒකාදසකයෙහි දූක ශුද්ධිය කරනු. දශය බැහැර නො කෙරේ. පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්‍ම වර්ජිත සාධිපති කුශලාකුශල ක්‍රියා නාමස්කන්ධයෝ විපාකය බැහැර කෙරෙති. 'තීණි' පච්චනීය නොලැබේ. පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි අධිපතිධර්‍ම වර්ජිත ඵල නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි 'ඒකං'

ආහාර ඒකාදසකයෙහි දූක ශුද්ධිය කරනු. දශය බැහැර නො කෙරේ. ආහාරය බැහැර නොකෙරේ. පච්චනීය නො ලැබේ. පඤ්චවෝකාර භූමියෙහි අධිපතිධර්‍ම වර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්ධයෝ,

Non-commercial distribution

අනුලෝමයෙහි 'තීණි' ඉන්ද්‍රිය ඒකාදසකාදිය ආහාර ඒකාදසකය මෙනි. අනුලෝමය පමණක් ලැබේ. ඒකා දසකවාරය නිමි.

ඒකාදසකවාරයට අනතුරු ව ද්වාදසකවාරය වදළසේක. එහි ද කම්මද්වාදසකාදිවසයෙන් වාර එකොළොසක් ඇත්තේ ය. එයින් කම්මද්වාදසකය පළමු කොට වදළ සේක. එහි ආසේවනකම්මද්දුකය ශුධ කරනු. එකොළොස බැහැර නො කෙරේ. පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයන්හි හා මහද්ගතකුශල මහද්ගතක්‍රියා ලෝකෝත්තරකුශලයන්හිද ඇති චේතනාවෝ කම්මය බැහැර කෙරෙති. පච්චනීය නො ලැබේ. පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම හා චේතනා ද වර්ජිත වූ ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතියාදි ජවනයෝ ය මහද්ගත කුශලක්‍රියා ලෝකෝත්තරකුශලයෝ ය යන නාමස්කන්ධයෝ අනුලෝමයෙහි 'තීණි' (හේතු -පෙ- ආසේවන මූලක විපාකවාරය නො ලැබේ.)

ආහාරද්වාදශකයෙහි දුකස්‍සුධිය කරනු. එකොළොස බැහැර නො කෙරේ. ආහාරය ද බැහැර නො කෙරේ. පච්චනීය ද නැත. පඤ්චවෝකාරභූමියෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගත කුශල මහද්ගතක්‍රියා ලෝකෝතරකුශලයෝ ය යන නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි 'තීණි' ඉන්ද්‍රියද්වාදසකාදියෙහි වෙනසක් නැත්තේ ය. ද්වාදසකවාරය නිමි.

ද්වාදසකවාරයට අනතුරු ව තේරසකවාරය වදළ සේක. එහි ද හේතු -පෙ- කම්මමූලක අහාර තේරසකාදි වසයෙන් වාර දශයක් ඇත්තේ ය. එයින් ආහාරතේරසකය පළමු කොට වදළ සේක. එහි දුකස්‍සුධිය කරනු. දෙළොස බැහැර නො කෙරේ. අහාරය ද බැහැර නො කෙරේ. පච්චනීයය ද නො ලැබේ. පඤ්චවෝකාරභූමියෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපති ධර්ම හා චේතනා ද වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතකුශල මහද්ගතක්‍රියා ලෝකෝත්තරකුශලයෝ ය යතා නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි "තීණි" ඉන්ද්‍රිය තේරසකාදියෙහි වෙනසක් නැත්තේ ය.

තේරසකවාරය නිමි.

තේරසකවාරයට අනතුරු ව චුද්දසක වාරය වදළ සේක. එහි ද හේතු -පෙ- ආහාර මූලක ඉන්ද්‍රිය චුද්දසකාදි වසයෙන් වාර නවයක්

Non-commercial distribution

ඇත්තේ ය. එයින් ඉන්ද්‍රියචුද්දසකය පළමු කොට වදාළ සේක. එහි දුකසුඩ්ය කරත්තු. කෙළෙස බැහැර නො කෙරේ. ඉන්ද්‍රිය ය ද බැහැර නො කෙරේ. පච්චනීයය ද නැත්තේ ය. පඤ්චවෝකාරභූමියෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම හා චේතනා ද වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවන මහද්ගතකුශල මහද්ගතක්‍රියා ලෝකෝත්තර කුශල නාමස්කන්ධයෝ, අනුලෝම යෙහි "තීණි" ඣානචුද්දසකාදියෙහි ද වෙනසක් නැත්තේ ය. චුද්දසකවාරය නිමි.

චුද්දසකවාරයට අනතුරු ව පන්නරසකවාරය වදාළ සේක. එහි ද හේතු -පෙ- ඉන්ද්‍රියමූලක ඣාන පන්නරසකාදි වසයෙන් වාර අටක් ඇත්තේ ය. පන්නරසකවාරයෙහි ද විශේෂයක් නැත්තේ ය. පන්නරසකවාරය නිමි.

පන්නරසකවාරයට අනතුරු ව සොළොසක වාරය වදාළ සේක. එහි ද හේතු -පෙ- ඣාන මූලක මග්ග සෝළසකාදි වසයෙන් වාර සතක් ඇත්තේ ය. චුද්දසකය අනුව විස්තර කරත්තු. සෝළසකවාරය නිමි.

සෝළසක වාරයට අනතුරු ව සත්තරසකවාරය වදාළ සේක. එහි හේතු -පෙ- මග්ග මූලක සම්පයුත්තසත්තරසකාදි වශයෙන් වාර සයක් ඇත්තේ ය. සත්තරසක වාරයෙහි ද විශේෂයක් නැත්තේ ය. සත්තරසකය නිමි.

සත්තරසක වාරයට අනතුරු ව අට්ඨාරස වාරය වදාළ සේක. එහි හේතු -පෙ- සම්පයුත්ත මූලක විප්පයුත්ත අට්ඨාරසකාදි වසයෙන් වාර පසක් ඇත්තේ ය. එහි ද විශේෂයක් නැත්තේ ය. අට්ඨාරකසය නිමි.

අට්ඨාරසකවාරයට අනතුරු ව එකූනවීසක වාරය වදාළ සේක. එහි හේතු -පෙ- විප්පයුත්ත මූලක අත්ථි ඒකූනවීසකාදි වශයෙන් වාර සතරක් ඇත්තේ ය. විශේෂයක් නැත්තේ ය. එකූනවීසකය නිමි.

ඒකූනවීසකයට අනතුරු ව වීසක වාරය වදාළ සේක. එහි හේතු -පෙ- අත්ථි මූලක නත්ථිවීසකාදි වසයෙන් වාර තුනක් ඇත්තේ ය. එහි ද විශේෂයක් නැත. ඒකවීසකයෙහි ද හේතු -පෙ- නත්ථි මූලක විගත ඒකවීසකාදි වසයෙන් වාර දෙකක් ඇත්තේ ය. එහි ද වෙනසක් නැත. වීසකඒකවීසකවාරයෝ නිමියහ.

ඒකවීසකයට අනතුරු ව බාවීසකය වදාළ සේක. එය අවිගත බාවීසක වශයෙන් එක් වාරයෙකි. එක්විස්ස බැහැර කිරීමක් නැත.

Non-commercial distribution

අවිගතය බැහැර කිරීමක් ද නැත. පච්චනීයය ද නැත. පඤ්චවෝකාර භූමියෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම හා කුශලාකුශල ක්‍රියා චේතනා ද වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවන මහද්ගතකුශල මහද්ගත ක්‍රියා ලෝකෝත්තර කුශල නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි "තීණි" මේ ආසේවන ප්‍රත්‍යය හා විපාක ප්‍රත්‍යයෙහි අනුලෝමය නො ලැබෙන බැවින් විපාක ප්‍රත්‍යය නො ගන්නා ලද පාලි ක්‍රමය ය.

විපාකප්‍රත්‍යය ගන්නා පාලි ක්‍රමයෙන් මෙසේ ය. හේතු -පෙ- පූරේජාත කම්ම විපාක මූලක ආහාරසතේරසකාදි වසයෙන් වාර එකොළොසක් ඇත්තේ ය. එයින් ආහාර තේරසකය පළමු කොට වදළ සේක. එහි දුක සුද්ධිය කරනු. දෙළොස බැහැර කිරීමක් නැත. ආහාරය බැහැර කිරීමක් ද නැත. පච්චනීය ය ද නැත. පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත ඵලනාමස්කන්ධයෝ, අනුලෝම-යෙහි '**එකං**' ඉන්ද්‍රිය තේරසකාදියෙහි වෙනසක් නැත.

හේතු -පෙ- විපාක ආහාරමූලක ඉන්ද්‍රියචුද්දසකාදියෙහි ද, ඣාන පන්නරසකාදියෙහි ද මග්ගසෝළසකාදියෙහි ද., සම්පයුත්ත සත්තරසකාදියෙහිද, විප්පයුත්ත අට්ඨරසකාදියෙහිද අත්ථි ඒකූන වීසකාදියෙහි ද, නත්ථි වීසකාදියෙහි ද විගත ඒකවීසකාදියෙහිද අවිගත බාවීසකාදියෙහිද වෙනසක් නැත්තේ ය. සියල්ලෙහි ම ලැබෙන්නේ පඤ්චවෝකාර භූමියෙහි අධිපතිධර්ම වර්ජිත ඵල-නාමස්කන්ධයන් ම ය.

**හේතුකාදිය නිමි.**

හේතුප්‍රත්‍යයා ගේ දුකාදිවාරයට අනතුරු ව ආරම්මණ ප්‍රත්‍යයාගේ දුකාදිවාරය වදළ සේක. එ ද දුක තික චතුක්ක -පෙ- බාවීසකවාර වසයෙන් දෙවිසි වැදෑරුම් වේ. එයින් දුකවාරය පළමු කොට වදළ සේක. එ ද ආරම්මණමූලක හේතුදුකා දි වශයෙන් දෙවිසි වැදෑරුම් වේ. එයින් ආරම්මණමූලක හේතුදුකය පළමු කොට වදළ සේක. අවිගත දුකය දක්වා ප්‍රත්‍යයන් බැහැර කරමින් විස්තර කරනු.

දුකවාරයට අනතුරු ව තිකවාරය වදළ සේක. එහි ආරම්මණහේතු මූලක අධිපති තිකදි වශයෙන් වාර එක් විස්සක් ඇත්තේ ය. එයින් අධිපති තික ය පළමු කොට වදළ සේක. අවිගත තිකය දක්වා විස්තර කරනු. හේතුදුකාදිය අනුව බාවීසකය දක්වා විස්තර කරනු.

**ආරම්මණදුකාදිය නිමි.**

Non-commercial distribution

ආරම්මණදුකාදියට අනතුරු ව අධිපතිදුකාදිය වදරන ලදී. එහි ද දුක තික චතුක්ක -පෙ- බාවීසතික වසයෙන් වාර දෙවිස්සක් ඇත්තේ ය. එයින් දුකය පළමු කොට වදළ සේක. එහි ද අධිපතිමූලක හේතුදුකාදි වශයෙන් වාර දෙවිස්සක් ඇත්තේ ය. එයින් අධිපතිමූලක හේතුදුකය පළමු කොට වදළ සේක. අවිගත දුකය දක්වා විස්තර කරනු. තික චතුක්ක -පෙ- බාවීසතිකයන් හි ද විශේෂයක් නැත්තේය. වෙනස අධිපතිය මුල්කර ගැනීම පමණ ය. අනන්තරදුකාදියෙහි හා සමනන්තර දුකාදියෙහි ද විශේෂයක් නැත්තේ ය.

සමනන්තරදුකාදියට අනතුරු ව සහජාතදුකාදිය වදළ සේක. එහි ද දුකාදි වසයෙන් වාර දෙවිස්සක් ඇත්තේ ය. එයින් දුක වාරය පළමු කොට වදළ සේක. එහි ද සහජාතමූලක හේතු දුකාදි වසයෙන් වාර දෙවිස්සක් ඇත්තේ ය. එයින් සහජාතමූලක හේතුදුකය පළමු කොට වදළ සේක. ප්‍රත්‍යයන් බැහැර කරමින් අවිගතදුකය දක්වා විස්තර කරනු.

දුකවාරයට අනතුරු ව තිකවාරය වදළ සේක. එහි ද සහජාත හේතුමූලක ආරම්මණතිකාදි වසයෙන් වාර එක්විස්සක් ඇත්තේය. එයින් සහජාතහේතුමූලක ආරම්මණතිකය පළමු කොට වදළ සේක. ආරම්මණ හේතුදුකය ශුද්ධ කරනු.සහජාතහේතු දෙක බැහැර නො කෙරේ. සහේතුකචිත්තජ සහේතුක ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ආරම්මණය බැහැර කෙරෙති. '**එකං**' පච්චනීය නො ලැබේ. මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත සකල සහේතුක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි '**තීණි**' ඉතිරි තිකයන් හේතු දුකාදිය අනුව අභිධෙය සලකා විස්තර කරනු.

සහජාතදුකාදියට අනතුරුව අඤ්ඤමඤ්ඤදුකාදිය වදළ සේක. දුකයෝ ඉහත විස්තර කරන ලදහ. අඤ්ඤමඤ්ඤහේතු මූලක අධිපති තිකයෙහි දෙක බැහැර නො කෙරේ. අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපති ධර්මයෝ ය, නො ලැබෙන අවස්ථාවෙහි මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත අකුශල මහාකුශල මහාක්‍රියා සහේතුක ලෞකිකවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය, සහේතුකප්‍රතිසන්ධි නාමස්කන්ධයන්ගෙන් ප්‍රත්‍යය ලබන හෘදයවස්තුව ය, ඕවුනොවුන් ගෙන් ප්‍රත්‍යය ලබන සහේතුකචිත්තජ සහේතුකප්‍රතිසන්ධිකර්මජ මහාභූතයෝ ය යන මොවුහු අධිපතිය බැහැර කෙරෙති. '**තීණි**' නාමස්කන්ධයන් ගෙන් ප්‍රත්‍යය ලබන ආහේතුක චිත්තජ රූපයෝ ය, හෘදයවස්තුවෙන් අන්‍ය වූ අහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය, මහාභූතයන්ගෙන් ගෙන් ප්‍රත්‍යය ලබන

Non-commercial distribution

අහේතුක චිත්තජ අහේතුක ප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ උපාදය රූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි 'එකං' අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත සාධිපති ජවන නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන් ගෙන් ප්‍රත්‍යය ලබන සාධිපති චිත්තජ මහාභූතයෝ ය යන මොවුහු අනුලෝමයෙහි 'තීණි' මේ ක්‍රමය අනු ව සෙස්ස විස්තර කරනු.

නිස්සය දුකාදිය ද සහජාත දුකාදිය මෙනි. උපනිස්සය දුකාදිය ආරම්මණ දුකාදිය මෙනි. පුරේජාතදුකාදියෙහි පුරේජාතමූලක හේතු දුකාදිය ඉහත විස්තර විය. පුරේජාත හේතුමූලක අධිපති තිකයෙහි දුක සුද්ධිය කරනු. දෙක බැහැර කිරීමක් නැත. පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපති ධර්මයෝ ය, නො ලැබෙන අවස්ථාවෙහි මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත අකුශල මහාකුශල මහා ක්‍රියාවෝ ය, අරූපවිපාක වර්ජිත ලෞකික විපාකයෝ ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ අධිපතිය බැහැර කෙරෙති. "**පුරේජාත පච්චයා හෙතුපච්චයා න අධිපතියා තීණි**" අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි මෝහමූලද්වයෙහි මෝහය හා මනෝද්වාරාවජ්ජනය ය, අහේතුකප්‍රතිසන්ධිනාමසකන්ධ සතර ය, අහේතුකචිත්තජරූපයෝ ය, අහේතුකප්‍රතිසන්ධි කර්මජරූපයෝ ය -පෙ- ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි 'එකං' පඤ්චවෝකාරභූමියෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්මවර්ජිත දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි 'තීණි'

පුරේජාත හේතුමූලක් ආසේවනතිකයෙහි දුකය ශුද්ධ කරනු. අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මෝහමූල ද්විතීයාදි ජවනයන්හි මෝහය දෙක බැහැර කෙරේ. 'එකං' පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි මෝහමූලයෙහි මෝහ වර්ජිත අකුශල මහාකුශල මහාක්‍රියා ප්‍රථමජවනයෝ ය අරූපවිපාක වර්ජිත සහේතුක විපාකයෝ ය යන ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ආසේවනය බැහැර කෙරෙති. 'තීණි' අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි මෝහමූල ප්‍රථමජවනයන්ගේ මෝහය ය, මනෝද්වාරාවජ්ජනය ය, අහේතුකප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය, අහේතුකචිත්තජරූපයෝ ය, -පෙ- ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි "ද්වෙ" පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මෝහමූලද්වයයෙහි මෝහ වර්ජිත අකුශල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතක්‍රියා ය, ලෝකෝත්තර කුශලයෝ ය යන නාමස්කන්ධයෝ, අනුලෝමයෙහි 'තීණි' චතුක්කාදිය ද මේ ක්‍රමය අනුව විස්තර කරනු.

Non-commercial distribution

ආසේවන දුකාදියෙහි ආසේවනමූලක හේතුදුකාදිය කියන ලද නය අනුව විස්තර කරනු. ආසේවන හේතුමූලක ආරම්මණතිකය සුගම ය. අධිපති තිකයෙහි දුක ශුඪිය කරනු. දෙක බැහැර කිරීමක් නැත. අධිපති ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදිජවනයෝ ය, නියමයෙන් අධිපති ලැබෙන මහද්ගතකුශල ක්‍රියාවෝ ය මාර්ගසිත් සතර ය යන මොවුන් ගේ අධිපති ධර්මයෝ ය, අධිපති නො ලැබෙන කල්හි මෝහමූලද්වයයෙහි මෝහ වර්ජිත අකුශල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය යන මොවුහු අධිපතිය බැහැර කෙරෙති. **'තීණි'**

මෝහමූල ප්‍රථමජවනයෙහි මෝහය ය, හසිතෝත්පාද ප්‍රථම ජවනය ය, හසිතෝත්පාද වර්ජිත අහේතුක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, අහේතුක චිත්තජරූපයෝ ය, -පෙ- ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ය යන මොවුහු පච්චනීයයෙහි **'ද්වෙ'** අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපති ධර්ම වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතකුශල මහද්ගතක්‍රියා ලෝකෝත්තරකුශලයෝ ය යන නාමස්කන්ධයෝ අනුලෝමයෙහි **'තීණි'** මේ ක්‍රමය අනුව තිකචතුක්කයන් විස්තර කරනු.

ආසේවන හේතු ආරම්මණ අධිපතිමූලක පුරේජාත පඤ්චකයෙහි දුකය ශුඪ කරනු. සතර බැහැර කිරීමක් නැත. අරූපභූමියෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපති ධර්ම වර්ජිත ලෝභමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදිජවනයෝ ය, සැම කල්හි අධිපති ලැබෙන අරූපකුශල ක්‍රියාය, උපරිම මාර්ගයෝ ය යන නාමස්කන්ධයෝ පුරේජාතය බැහැර කෙරෙති. **'තීණි'** අහේතුකචිත්තජ -පෙ- ප්‍රවෘත්තිකර්මජ රූපයෝ, පච්චනීයයෙහි **'එකං'** පඤ්චවෝකාරභූමියෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි අධිපති වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතකුශලක්‍රියා ය ලෝකෝත්තර කුශලයෝ ය යන නාමස්කන්ධයෝ අනුලෝමයෙහි **'තීණි'** මේ නයය අනුව ආසේවනය අවසානය තෙක් විස්තර කරනු. **'ආසේවනමූලකෙ විපාකං නත්ථි.'** ආසේවනමූලකයෙහි විපාක ප්‍රත්‍යය නැත. විපාකය හැර ඉතිරිප්‍රත්‍යයන් ම ආසේවන මූලකයෙහි යොදනු. කම්මදුකාදිය කුශලාකුශල චේතනා හරිමින් විස්තර කරනු. විපාකදුකාදියෙහි විපාකමූලක හේතුදුකාදිය යට කියැවිණ.

විපාකහේතුමූලක අධිපති තිකයෙහි දුක සුඪිය කරනු. විපාකහේතු දෙක බැහැර නො කෙරේ. ඵලසතරෙහි අධිපති ධර්මයෝ ය, සහේතුක ලෞකික විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, සහේතුක ලෞකික

Non-commercial distribution

විපාක චිත්තජරූපයෝ ය, සහේතුක ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය යන මොවුහු අධිපතිය බැහැර කෙරෙති. '**එකං**' මෝහමූල දෙක්හි මෝහය ය අහේතුකක්‍රියා නාමස්කන්ධයෝ ය, අහේතුකක්‍රියා චිත්තජ රූපයෝ ය, බාහිර රූපයෝ ය, -පෙ- ප්‍රවෘත්තිකර්මජරූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි '**ද්වෙ**' අධිපතිධර්ම වර්ජිත ඵලනාමස්කන්ධයෝ ය, ඵලචිත්තජරූපයෝ ය යන මොවුහු අනුලෝමයෙහි '**එකං**' ආරම්මණාදි ප්‍රත්‍යයන් ඇතුළු වන තන්හි අධිපතිධර්ම වර්ජිත ඵලනාමස්කන්ධයෝ ම ලැබෙත්. පුරේජාතය ඇතුළුවන තන්හි පඤ්චවෝකාරභූමියෙහි අධිපතිධර්ම වර්ජිත ඵලනාමස්කන්ධයෝ ලැබෙත්. '**විපාක මූලකෙ ආසෙවනං නත්ථි.** විපාකමූලකය ආසේවනය හැර විස්තර කරනු. ඉතිරි සියල්ල උක්තානුසාරයෙන් විස්තර කරනු.

අනුලෝම වාරය නිමි.

Non-commercial distribution

පටිච්චවාරයේ
# පච්චය පච්චනීය විභඞ්ගවාර පාළිය.

(1. න හෙතු)

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති න හෙතු පච්චයා, විචිකිච්ඡාසහගතෙ උද්ධච්චසහගතෙ ඛන්ධෙ පටිච්ච විචිකිච්ඡාසහගතො උද්ධච්චසහගතො මොහො.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න හෙතු පච්චයා, අහෙතුකං විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, චිත්තසමුට්ඨාන ඤ්ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨානඤ්ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨාඤ්ච රූපං, අහේතුකපටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තාච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො කටත්තා ච රූපං ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා කටත්තා ච රූපං, ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා. එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, කටත්තා රූපං, උපාදය රූපං, බාහිරං ආහාර සමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, මහාභූතෙ පටිච්ච කටත්තාරූපං උපාදයරූපං.

(2. න ආරම්මණ.)

කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න ආරම්මණ පච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

අසකුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න ආරම්මණ පච්චයා, අකුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න ආරම්මණපච්චයා, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්ත-සමුට්ඨානං රූපං, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තා රූපං, ඛන්ධෙ පටිච්ච වත්ථු. එකං මහාභූතං, පටිච්ච තයෝ මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, කටත්තාරූපං උපාදය රූපං, බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤ-

Non-commercial distribution

සන්තානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, මහාභූතෙ පටිච්ච කටත්තා රූපං උපාදයරූපං.

කුසල ඤ්ච අබ්‍යාකතඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න ආරම්මණ පච්චයා, කුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

අකුසලඤ්ච අබ්‍යාකතඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න ආරම්මණ පච්චයා, අකුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

(3. න අධිපති)

කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති න අධිපති පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න අධිපති පච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

කුසලං ධම්මං පටිච්ච කුසලො ච අබ්‍යාකතො ච ධම්මා උප්පජ්ජන්ති න අධිපතිපච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්ත-සමුට්ඨානඤ්ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨානඤ්ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨානඤ්ච රූපං.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති න අධිපති පච්චයා, අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

අකුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න අධිපති පච්චයා, අකුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ච අබ්‍යාකතො ච ධම්මා උප්පජ්ජන්ති න අධිපති පච්චයා, අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්ත-සමුට්ඨානඤ්ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨානඤ්ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්ත සමුට්ඨානඤ්ච රූපං.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න අධිපති පච්චයා, විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨානඤ්ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්ත-

Non-commercial distribution

සමුට්ඨාන කඤ්ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨාන කඤ්ච රූපං, පටිසන්ධික්ඛණෙ. විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තා ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො කටත්තා ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා කටත්තා ච රූපං ඛන්ධෙ පටිච්ච වත්ථු,වත්ථුං පටිච්ච ඛන්ධා. එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, මහා භූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තා රූපං උපාදාය රූපං බාහිරං ආහාර සමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා මහාභූතෙ පටිච්ච කටත්තාරූපං උපාදාය රූපං.

කුසලඤ්ච අබ්‍යාකතඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න අධිපතිපච්චයා, කුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

අකුසලඤ්ච අබ්‍යාකතඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න අධිපති පච්චයා, අකුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

### (4. 5. න අනන්තර න සමනන්තර)

කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න අනන්තර පච්චයා, න සමනන්තර පච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං. න අනන්තරපච්චයංපි න සමනන්තර පච්චයංපි න ආරම්මණ පච්චයා සදිසං.

### (6. න අඤ්ඤමඤ්ඤ)

කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න අඤ්ඤමඤ්ඤ පච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං. අකුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න අඤ්ඤමඤ්ඤ පච්චයා, අකුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං. අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න අඤ්ඤමඤ්ඤ පච්චයා, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තාරූපං. මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තාරූපං උපාදාය රූපං. බාහිරෙ මහාභූතෙ පටිච්ච උපාදායරූපං, ආහාරසමුට්ඨානෙ මහාභූතෙ පටිච්ච උපාදායරූපං, උතුසමුට්ඨානෙ මහාභූතෙ පටිච්ච උපාදාය රූපං අසඤ්ඤසත්තානං මහාභූතෙ පටිච්ච කටත්තා රූපං උපාදාය රූපං, කුසලංඤ්ච අබ්‍යාකතඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො

Non-commercial distribution

උප්පජ්ජති න අඤ්ඤමඤ්ඤපච්චයා කුසලෙබන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්ත සමුට්ඨානං රූපං. අකුසලඤ්ච අබ්‍යාකතඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න අඤ්ඤමඤ්ඤපච්චයා අකුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

## (7. න උපනිස්සය)

කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න උපනිස්සය පච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං. න උපනිස්සය පච්චයං න ආරම්මණ පච්චයා් සදිසං.

## (8. න පුරේජාත)

කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති න පුරේජාත පච්චයා, අරූපෙ කුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න පුරෙජාත පච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති න පුරෙජාත පච්චයා, අරූපෙ අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා,

අකුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න පුරේජාත පච්චයා, අකුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න පුරෙජාතපච්චයා, අරූපෙ විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තා ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො කටත්තා ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා කටත්තා ච රූපං,ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා, එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තා රූපං උපාදාය රූපං බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤ සත්තානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, මහාභූතෙ පටිච්ච කටත්තාරූපං උපාදාය රූපං.

Non-commercial distribution

කුසලක්ඛ අබ්‍යාකතක්ඛ ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න පුරෙජාතපච්චයා, කුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

අකුසලක්ඛ අබ්‍යාකතක්ඛ ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න පුරෙජාතපච්චයා, අකුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

### (9. න පච්ඡාජාත, 10. න ආසෙවන)

කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති න පච්ඡාජාත පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච -පෙ- කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති න ආසෙවන පච්චයා. කුසලං එකං ඛන්ධං පටිච්ච න පච්ඡාජාත පච්චයම්පි න ආසෙවනපච්චයංපි න අධිපතිපච්චය සදිසං.

### (11. න කම්ම)

කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති න කම්මපච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච කුසලා චේතනා.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති න කම්ම පච්චයා, අකුසලෙ ඛන්ධෙ පටිච්ච අකුසලා චෙතනා.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න කම්ම පච්චයා, කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කිරියාබ්‍යාකතාචෙතනා. බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා, මහාභූතෙ පටිච්ච උපාදය රූපං.

### (12. න විපාක)

කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති න විපාක පච්චයා, කුසලං එකං ඛන්ධං පටිච්ච, තීණි.

අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති න විපාක පච්චයා, තීණි.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න විපාක පච්චයා, කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨානක්ඛ රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො චිත්තසමුට්ඨානක්ඛ රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨාන-ක්ඛ රූපං, එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා -පෙ- මහාභූතෙ

Non-commercial distribution

පටිච්ච චිත්තසමුට්ඨානං රූපං උපාදය රූපං, බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා -පෙ- මහාභූතෙ පටිච්ච කටත්තා රූපං උපාදයරූපං.

කුසලඤ්ච අබ්‍යාකතඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න විපාක පච්චයා, කුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

අකුසලඤ්ච අබ්‍යාකතඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න විපාකපච්චයා, අකුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං.

## (13. න ආහාර)

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න ආහාර පච්චයා, බාහිරං උතුසමුට්ඨානං අසඤ්ඤ සත්තානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා -පෙ- මහාභූතෙ පටිච්ච කටත්තා රූපං උපාදය රූපං.

## (14. න ඉන්ද්‍රිය)

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න ඉන්ද්‍රිය පච්චයා, බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා -පෙ- මහාභූතෙ පටිච්ච උපාදයරූපං, අසඤ්ඤසත්තානං මහාභූතෙ පටිච්ච රූපජීවිතින්ද්‍රියං.

## (15. න ඣාන)

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න බාඣාන පච්චයා, පඤ්චවිඤ්ඤාණසහගතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා -පෙ- මහාභූතෙ පටිච්ච කටත්තා රූපං උපාදයරූපං.

## (16. න මග්ග)

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න මග්ග පච්චයා, අහෙතුකං විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨානඤ්ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො

Non-commercial distribution

ඛන්ධා, චිත්තසමුට්ඨානඤ්ච රූපං ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨානඤ්ච රූපං, අහෙතුක පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තා ච රූපං, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො කටත්තා ච රූපං, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා කටත්තා ච රූපං, ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා. එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, තයො මහාභූතෙ පටිච්ච එකං මහාභූතං, ද්වෙ මහාභූතෙ පටිච්ච ද්වෙ මහාභූතා මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තා රූපං උපාදය රූපං, බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා -පෙ- මහාභූතෙ පටිච්ච කටත්තාරූපං උපාදය රූපං.

### (17. න සම්පයුත්ත)

කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න සම්පයුත්ත පච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං. න ආරම්මණ පච්චය සදිසං.

### (18. න විප්පයුත්ත)

කුසලං ධම්මං පටිච්ච කුසලො ධම්මො උප්පජ්ජති න විප්පයුත්ත පච්චයා, අරූපෙ අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

අකුසලිං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති න විප්පයුත්ත පච්චයා, අරූපෙ අකුසලං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා, තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා.

අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න විප්පයුත්තපච්චයා, අරූපෙ විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා. තයො ඛන්ධෙ පටිච්ච එකො ඛන්ධො, ද්වෙ ඛන්ධෙ පටිච්ච ද්වෙ ඛන්ධා, බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුසට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා -පෙ- මහාභූතෙ පටිච්ච කටත්තා රූපං උපාදය රූපං.

### (19. නො නත්ථි 20.නො විගත)

කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති නො නත්ථි පච්චයා, නො විගත පච්චයා කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං න ආරම්මණපච්චය සදිසං.

Non-commercial distribution

පටිච්චවාරයේ

# පච්චය පච්චනීය විභඞ්ග වාර සන්නය.

## (1. න හෙතු)

අනුලෝමවාරයට අනතුරු ව පච්චනීයවාරය වදාළ සේක. එය ද විභඞ්ගවාර සඞ්ඛාවාර වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් විභඞ්ගවාරය පළමු කොට වදාළ සේක. එය ද නහේතුපච්චය විභඞ්ගවාරාදි වසයෙන් විසිවැදෑරුම් වේ. එයින් න හේතුපච්චය විභඞ්ගවාරය පළමු කොට වදාළ සේක. එහි ද අකුසලපදවාර අබ්‍යාකතපද වාර වසයෙන් දෙවාරයක් ඇත්තේ ය. එයින් අකුසල පදවාරය පළමු කොට වදාළ සේක. අකුසල පදවසාන වාර වසයෙන් එය එක් වාරයෙකි. එය වීථි අනුවාද වසයෙන් දෙවැදෑරුම් වේ. එයින් වීථිය පළමුකොට වදාළ සේක. කෙසේ ද? යත්, "**අකුසලං ධම්මං පටිච්ච අකුසලො ධම්මො උප්පජ්ජති න හෙතු පච්චයා**" යනුවෙනි. වීථියට අනතුරු ව අනුවාදය වදාළ සේක. කෙසේ ද? යත්, **විචිකිච්ඡාසහගතෙ උද්ධච්ච සහගතෙ ඛන්ධෙ පටිච්ච විචිකිච්ඡා සහගතො උධච්චසහගතො මොහො**" යනුවෙනි.

**පදර්ථ:**

අකුසලං ධම්මං පටිච්ච, එක් ව ඉපදීම් වශයෙන් අකුශල ධර්‍මය නිසා: අකුසලො ධම්මො, අකුසල ධර්‍මය: න හෙතුපච්චයා, හේතුප්‍රත්‍යයෙන් අන්‍ය වූ ප්‍රත්‍යයෙන්: උප්පජ්ජති, උපදී: විචිකිච්ඡාසහගතෙ උධච්චසහගතෙ ඛන්ධෙ පටිච්ච: එක් ව ඉපදීම් වශයෙන් විචිකිත්සාසහගත ඖද්ධත්‍ය සහගත ස්කන්ධයන් නිසා: විචිකිච්ඡාසහගතො, විචිකිත්සාසහගත වූ ද: උධච්චසහගතො, ඖද්ධත්‍යසහගත වූ ද: මොහො, මෝහය: හේතුප්‍රත්‍යයෙන් අන්‍ය ප්‍රත්‍යයෙන් උපදී.

**අභිධෙයාර්ථ:**

එහි "**අකුසලො ධම්මො**" යන කර්තෘපාදයෙන් විචිකිත්සා සහගත සිත ය, ඖද්ධත්‍යසහගත සිත ය, චෛතසික තුදුස ය යන අවයව වූ ද සමූහවූ ද නාමස්කන්ධයන් නිසා උපදනා වූ මෝහ ය ලැබේ.

"**නහෙතුපච්චයා**" යන හේතුපාදයෙන් සුදුසු පරිදි ලැබෙන හේතු-ප්‍රත්‍යයෙන් අන්‍ය වූ ප්‍රත්‍යයන් ගේ ශක්තීහු ලැබෙත්. නොහොත් නහෙතුපච්චයා යන හේතුපාදයෙන් විචිකිත්සා සහගත ඖද්ධත්‍යසහගත මෝහයට ප්‍රත්‍යය වන ලෞකික සිත් එක්අසූව ය චෛතසික දෙපනසය රූපඅටවිස්ස ය ප්‍රඥප්තිය ය යන ෂඩාරම්මණධර්‍මයන් ගේ ආරම්මණ ශක්තිය ද,

Non-commercial distribution

මරණාසන්නකාලයෙහි ච්‍යුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපන් හෘදයවස්තු සඞ්ඛ්‍යාත වස්ත්වාරම්මණය වේ නම් ආරම්මණ, වත්ථාරම්මණ, ආරම්මණ පුරේජාත, වත්ථාරම්මණ විප්පයුත්ත, ආරම්මණ පුරේජාත අත්ථි, ආරම්මණ පුරේජාත අවිගත යන ප්‍රත්‍යයශක්ති සය ද, විචිකිත්සාසහගත ඖද්ධත්‍ය සහගත මෝහයට ප්‍රත්‍යය වන සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ගේ සහජාත අඤ්ඤමඤ්ඤ, සහජාතනිස්සය, සම්පයුත්ත සහජාතත්ථි, සහජාත අවිගත යන ශක්ති සය ද, විචිකිත්සා සහගත ඖද්ධත්‍යසහගත මෝහයට ප්‍රත්‍යය වන සම්ප්‍රයුක්ත චේතනාවෙහි කම්ම ආහාර දෙක ද සහිත වූ ප්‍රත්‍යය ශක්ති අටද, විචිකිත්සා සහගත ඖද්ධත්‍ය සහගත මෝහයට ප්‍රත්‍යය වන සම්ප්‍රයුක්ත වූ ජීවිත චිත්ත වේදනා විරිය ඒකග්ගතාවන් ගේ ඉන්ද්‍රිය ශක්තිය ද සහිත වූ ප්‍රත්‍යය ශක්ති සය ද, විචිකිත්සාසහගත ඖෂත්‍යසහගත මෝහය හා සම්ප්‍රයුක්ත විතක්ක විචාර වේදනා ඒකග්ගතාවන් ගේ ධ්‍යානශක්තිය සහිත වූ ප්‍රත්‍යය ශක්ති සත ද, ඒ මෝහය හා සම්ප්‍රයුතක විතක්ක විරිය ඒකග්ගතා වන්ගේ මාර්ග ප්‍රත්‍යය සහිත වූ ප්‍රත්‍යය ශක්ති සතද, විචිකිත්සා සහගත ඖද්ධත්‍යසහගත ප්‍රථමජවනයෙහි මෝහයට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනයන් ගේ අනන්තර, සමනන්තර, උපනිස්සය, නත්ථි, විගත යන ප්‍රත්‍යයශක්ති පස ද, පශ්චිම පශ්චිම විචිකිත්සාසහගත ඖද්ධත්‍යසහගත මෝහයන්ට ප්‍රත්‍යය වන ප්‍රථමාදි පූර්ව පූර්ව වූ විචිකිත්සා සහගත ඖද්ධත්‍ය සහගත ජවනයන්ගේ ආසේවන ශක්තිය සහිත වූ ප්‍රත්‍යය ශක්ති සයද විචිකිත්සා සහගත ඖද්ධත්‍ය සහගත මෝහයට ප්‍රත්‍යය වන ' බලවත් වූ ලෞකිකසිත් එක් අසූව ය චෛතසික දෙපනස ය රූපඅටවිස්ස ය ප්‍රඥප්තිය ය යන මොවුන් ගේ ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය ද ලැබේ. (මෙය ඒ ඒ අවස්ථාවලදී ලැබෙන ලැබෙන පරිදි ප්‍රත්‍යය ශක්ති දැක්වීමකි. අධිපති විපාක ශක්ති දෙක මෙහි නො ලැබේ.)

**ස්කන්ධවාර**

ස්කන්ධවාර පසළොසෙකි. එහි ඒකකවාර සතරෙකි, තිකවාර සතරෙකි, ද්‍වකවාර සයෙකි. චතුෂ්කවාරයෙකි.

"විචිකිච්ඡාසහගතෙ උද්ධච්චසහගතෙ ඛන්ධෙ පටිච්ච -පෙ- මොහො" යන අනුවාද පාලියෙහි විචිකිච්ඡා සහගතෙ -පෙ- ඛන්ධෙ යනුවෙන් වේදනා ස්කන්ධය ගෙන විචිකිච්ඡාසහගතො උද්ධච්චසහගතො මොහො" යනුවෙන් මෝහය ගන්න එක්වාරයෙකි, "විචිකිච්ඡා -පෙ- ඛන්ධෙ"යනුවෙන් පඤ්ඤාව ගෙන "මොහො" යනුවෙන් මෝහය ගන්නා එක් වාරයෙකි. "ඛන්ධෙ" යනුවෙන් සඞ්කාරය ගෙන "මොහො" යනුවෙන් මෝහය ගන්නා එක් වාරයෙකි. "ඛන්ධෙ" යනුවෙන් විඤ්ඤාණ ගෙන, "මොහො" යනුවෙන් මෝහය ගන්නා එක් වාරයෙකිඃ මෙසේ ඒකකවාර සතරක් වේ.

Non-commercial distribution

"ඛන්ධෙ" යනුවෙන් වේදනා සඤ්ඤා සඞ්ඛාරයන් ගෙන 'මොහො' යනුවෙන් මෝහය ගන්නා එක් වාරයෙකි. 'ඛන්ධෙ' යනුවෙන් සඤ්ඤා සඞ්ඛාර විඤ්ඤාණයන් ගෙන 'මොහො' යනුවෙන් මෝහය ගන්නා එක් වාරයෙකි. 'ඛන්ධෙ" යනුවෙන් සඞ්ඛාර විඤ්ඤාණ වේදනාවන් ගෙන'මොහො' යනුවෙන් මෝහය ගන්නා එක් වාරයෙකි. 'ඛන්ධෙ' යනුවෙන් විඤ්ඤාණ වේදනා සඤ්ඤාවන් ගෙන, 'මොහො' යනුවෙන් මෝහය ගන්නා එක් වාරයෙකි, මෙසේ තිකවාර සතරක් වේ.

"ඛන්ධෙ, මොහො " යන දෙපදයෙන් පිළිවෙළින් වේදනා සඤ්ඤා දෙක හා මෝහය ද, වේදනා සඞ්ඛාර දෙක හා මෝහය ද, වේදනා විඤ්ඤාණ දෙක හා මෝහය ද, සඤ්ඤා සඞ්ඛාර දෙක හා මෝහය ද සඤ්ඤා විඤ්ඤාණ දෙක හා මෝහය ද සඞ්ඛාර විඤ්ඤාණ දෙක හා මෝහය ද ගැනීමෙන් දුකවාර සයක් වේ.

ඛන්ධෙ යනුවෙන් නාමස්කන්ධ සතර හා 'මොහො' යනුවෙන් මෝහය ගන්නා වාරය චතුෂ්කවාරය ය. මෙසේ ස්කන්ධවාර පසළොසක් වේ.

අකුසලපදවාරයට අනතුරු ව අබ්‍යාකතපද වාරය වදළසේක. එය අබ්‍යාකත පදවසාන වශයෙන් එක් වාරයෙකි. එය වීථි අනුවාද වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් වීථිය පළමු කොට වදළ සේක. "**අබ්‍යාකතං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න හෙතු පච්චයා** " යනුයි. අනතුරුව අනුවාදය වදළ සේක. "**අහේතුකං විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා චිත්තසමුට්ඨානඤ්ච රූපං -පෙ- අහේතුක පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පටිච්ච තයො ඛන්ධා කටත්තා ච රූපං -පෙ- ද්වෙ ඛන්ධා කටත්තා ච රූපං, ඛන්ධෙ පටිච්ච වත්ථු, වත්ථුං පටිච්ච ඛන්ධා එකං මහාභූතං පටිච්ච තයො මහාභූතා, -පෙ- මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තා-රූපං, උපාදයරූපං බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං -පෙ- රූපං** " යනුයි. පදාර්ථ සුගමයි.

**අභිධෙයාර්ථ**

"**අබ්‍යාකතං -පෙ- යා** " යන අනුවාද පාලියෙහි ප්‍රවෘත්ති කාලයෙහි කර්මපාථයෙන් අහේතුක සිත් අටළොස ය, ඡන්ද වර්ජිත අන්‍යසමාන දෙළොස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා අහේතුක සිත් අටොළොස ය ඡන්ද වර්ජිත අන්‍යසමාන දෙළොස ය යන අවයව නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන චිත්තජ රූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්.

Non-commercial distribution

**"නහේතු පච්චයා"** යන හේතුපාඨයෙන් ලැබෙන පරිදි වූ හේතු ප්‍රත්‍යයෙන් අන්‍ය ප්‍රත්‍යය ශක්තීහු ලැබෙත්.

නොහොත් 'නහේතු පච්චයා' යන පාඨයෙන් චක්ෂුර්විඥානද්වයයට ප්‍රත්‍යය වන වර්තමාන රූපාරම්මණය ය, -පෙ- කායවිඥාන ද්වයයට ප්‍රත්‍යය වන වර්තමාන ස්ප්‍රෂ්ටව්‍යාරම්මණය ය, මනෝධාතුත්‍රයට ප්‍රත්‍යය වන වර්තමාන පඤ්චාරම්මණය ය, සන්තීරණහසිතෝත්පාදයන්ට ප්‍රත්‍යය වන කාමසිත් සිවුපනස ය චෛතසික දෙපනස ය රූප අටවිස්ස ය යන ෂඩාරම්මණය ය, මනෝද්වාරාවජ්ජනයට ප්‍රත්‍යය වන සිත් එකුන් අනූව ය, චෛතසික දෙපනස ය, රූප අටවිස්ස ය නිර්වාණය ප්‍රඥප්තිය යන ෂඩාරම්මණය යන මේ ආරම්මණ ධර්මයන් ගේ ආරම්මණ, වත්ථාරම්මණ නිස්සය, ආරම්මණපුරේජාත, වත්ථාරම්මණ පුරේජාතාත්ථි, වත්ථාරම්මණ පුරේජාත අවිගත යන ප්‍රත්‍යය ශක්තිහු ද,

ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන අහේතුක ප්‍රවෘත්තිනාමස්කන්ධයන් ගේ සහජාත, අඤ්ඤමඤ්ඤ සහජාතනිස්සය, සහජාතකම්ම, විපාක, සහජාතාහාර, සහජාතින්ද්‍රිය, ඣාන, සම්පයුත්ත, විප්පයුත්ත සහජාතත්ථි, සහජාත අවිගත යන ප්‍රත්‍යය ශක්තීහු ද,

අහේතුක ප්‍රථමභවාඞ්ග නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අහේතුක ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය, ද්විතීයාදි පශ්චිම පශ්චිම භවාඞ්ග නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ප්‍රථමාදි පූර්වපූර්ව භවාඞ්ග නාමස්කන්ධයෝ ය, ආවර්ජනද්වයට ප්‍රත්‍යය වන භවාඞ්ගුපච්ඡේද පසළොස ය, මනොද්වාරාවජ්ජනයට ප්‍රත්‍යය වන අරූපභවාඞ්ගුපච්ඡේද සතර ය, පඤ්චවිඤ්ඤාණයන්ට ප්‍රත්‍යය වන පඤ්චද්වාරාවජ්ජනය ය සම්පටිච්ඡනයන්ට ප්‍රත්‍යය වන පඤ්චවිඤ්ඤාණයෝය, සන්තීරණයන්ට ප්‍රත්‍යය වන සම්පටිච්ඡනයෝ ය, වොත්ථපනයට ප්‍රත්‍යය වන සන්තීරණයෝ ය, පරිත්තාරම්මණවීථියෙහි දෙවන වොත්ථපනයයට ප්‍රත්‍යය වන පළමු වන වොත්ථපනය ය, අති මහන්තාරම්මණවිභූතාරම්මණ අවිභූතාරම්මණ වීථීන්හි හසිතෝත්පාද ප්‍රථමජවනයට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනයෝය ද්විතීයජවනයට ප්‍රත්‍යය වන ප්‍රථමජවනය ය, -පෙ- සප්තම ජවනයට ප්‍රත්‍යය වන සවන ජවනනය ය, හසිතෝත්පාද මහාක්‍රියා සෝමනස්ස සහගත ජවනයන් කෙරෙන් තදරම්මණය වන කල්හි සෝමනස්ස සන්තීරණ තදරම්මණයට ප්‍රත්‍යය වන හසිතෝත්පාද සෝමනස්ස සහගත මහාක්‍රියා අන්තිම ජවනයෝ ය, මහාක්‍රියා උපේක්ෂා සහගත ජවනයන්ට අනතුරු ව තදරම්මණය වන කල්හි උපේක්ෂා සහගත සන්තීරණ තදරම්මණයට ප්‍රත්‍යය වන මහාක්‍රියා උපේක්ෂා සහගත

Non-commercial distribution

ජවනයෝ ය, උපේක්ෂාසහගතසන්තීරණ තදරම්මණ භවාඞ්ගයන්ට ප්‍රත්‍යය වන ද්වේෂමූල අන්තිමජවනය ය, සන්තීරණ තදරම්මණ තුනට හා සන්තීරණ භවාඞ්ග තුනට ප්‍රත්‍යය වන ලෝභ මූල මෝහමූල මහාකුශල අන්තිමජවනයෝ ය, දෙවන සන්තීරණ තදරම්මණයට ප්‍රත්‍යය වන පළමු වන තදරම්මණය ය, සන්තීරණ භවාඞ්ග දෙකට ප්‍රත්‍යය වන දෙවන තදරම්මණය ය, මරණාසන්න කාලයෙහි තදරම්මණයට අනතුරුව ච්‍යුතිය වන කල්හි උපේක්ෂාසන්තීරණ ච්‍යුතියට ප්‍රත්‍යය වන සන්තීරණ තදරම්මණ තුන ය, ජවනයට අනතුරු ව චුතිය වන කල්හි උපේක්ෂා සන්තීරණ ච්‍යුතියට ප්‍රත්‍යය වන මහාකුශල අකුශල පඤ්චම ජවනයෝ ය, භවාඞ්ගයට අනතුරු ව ච්‍යුතිය වන කල්හි උපේක්ෂා සන්තීරණ චුතියට ප්‍රත්‍යය වන උපේක්ෂා සන්තීරණ භවාඞ්ගය ය යන මොවුන් කෙරෙහි සුදුසු පරිදි ලැබෙන අනන්තර, සමනන්තර, අනන්තරූපනිස්සය නත්ථි විගත යන ශක්තීහු ද,

ප්‍රථමජවන වර්ජිත පශ්චිම පශ්චිම හසිතෝත්පාදයන්ට ප්‍රත්‍යය වන අන්තිම ජවන වර්ජිත පූර්වපූර්ව හසිතෝත්පාද ජවනයන් ගේ ආසේවන ශක්තිය සහිත වූ ශක්ති සය ද,

අහේතුක සිත් අටොළොසට ප්‍රත්‍යය වන බලවත් වූ එකුන් අනූ චිත්තය ය චෛතසික දෙපනස ය රූප අටවිස්ස ය ප්‍රඥප්තිය ය යන මොවුන් ගේ ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය ද,

අකුශලවිපාක සතට ප්‍රත්‍යය වන බලවත් වූ ද්වාදශාකුශල චේතනා ය අහේතුකකුශලවිපාක අටට ප්‍රත්‍යය වන මහාකුශල චේතනා ය යන මොවුන් ගේ නා නා ක්‍ෂණිකකර්ම ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්ති දෙක ද, දුර්වල වූ අකුශල මහාකුශල චේතනාවන් ගේ නානාක්‍ෂණිකකර්ම ශක්තිය ද යන මේ ශක්තීහු ලැබෙත්. ස්කන්ධවාර දෙසිය දශයෙකි. ප්‍රතිසන්ධි වාරයෙහි හා රූපවාරයේ අභිධෙය කියන ලද නය අනුව උදුරනු.

න හේතු විභඞ්ගවාරය නිමි.

## (2. න ආරම්මණ)

නහේතු ප්‍රත්‍යය විභඞ්ගයට අනතුරු ව නාරම්මණ විභඞ්ගය වදළ සේක. එහි කුශලපද අකුශලපද අබ්‍යාකතපද කුසලාබ්‍යාකතපද අකුසලාබ්‍යාකතපදයන් ගේ වශයෙන් වාර පසක් ඇත්තේ ය. එයින් කුසලපදවාරය පළමු කොට වදළ සේක. එය අබ්‍යාකතපදවසාන වාර වශයෙන් එක් වාරයෙකි. විථි අනුවාද වශයෙන් දෙවැදෑරුම් වේ. **"කුසලං ධම්මං පටිච්ච අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න ආරම්මණ පච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං "** පදාර්ථ සුගමය.

Non-commercial distribution

"අබ්‍යාකතො" යන කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල්සිත් එක්විස්ස ය, චෛතසික අට තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ලැබෙත්.

"**න ආරම්මණ පච්චයා** "යන හේතුපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන කුසල් එක් විස්ස ය, චෛතසික අටතිසය යන ප්‍රත්‍යය ධර්‍ම-යන්හි සුදුසු පරිදි ලැබෙන හේතු, සහජාත, සහජාතාධිපති, සහජාතනිස්සය, සහජාතකම්ම, සහජාතින්ද්‍රිය, ඣාන, මග්ග, සහජාත විප්පයුත්ත, සහජාතත්‍ථි සහජාත අවිගත යන ශක්තීහු ලැබෙත්.

(මෙය සංක්ෂේපයෙන් දැක්වීමකි. පච්චයඝටනාව හා පච්චනීද්දෙසයේ කරණපාඨයේ හා අනුලෝම විභඞ්ගවාරයේ හේතුපාඨයේ ද අභිධෙය අනුව විස්තර කරනු.)

කුසලපදවාරයට අනතුරු ව අකුසලපද වාරය වදළ සේක."**අකුසලං -පෙ- චිත්තසමුට්ඨානං රූපං** " කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුසල් සිත් දොළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්. "න ආරම්මණ පච්චයා" යන හේතුපාඨයෙන් ආරම්මණප්‍රත්‍යයෙන් අන්‍ය වූ හේතු අධිපති සහජාත යන ප්‍රත්‍යයන්ගේ ශක්තීහු ලැබෙත්.

අකුසලපදවාරයට අනතුරු ව අබ්‍යාකතපදවාරය වදළසේක. "**අබ්‍යාකතං -පෙ- විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තා රූපං, ඛන්ධෙ පටිච්ච වත්‍ථු, එකං මහාභූතං -පෙ- මහාභූතෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං කටත්තාරූපං උපාදය රූපං, බාහිරං ආහාර සමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං -පෙ- මහාභූතෙ පටිච්ච කටත්තාරූපං උපාදයරූපං** "
පදාර්‍ථ සුගමය.
**අභිධෙයාර්‍ථ.**

ප්‍රවෘත්තිකාලයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත විපාක සිත් දෙවිස්ස ය, චෛතසික අටතිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්.

නාරම්මණපච්චයා යන හේතුපාඨයෙන් ආරම්මණප්‍රත්‍යයෙන් අන්‍ය වූ හේතු සහජාත අධිපති ආදි ශක්තීහු ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි

Non-commercial distribution

කත්‍ථපාඨයෙන් පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා කෘතත්වාත් රූපයෝ ලැබෙත්. කරණ පාඨයෙන් සහජාතාදි ශක්තීහු ලැබෙත්. මෙහි අධිපතිය නො ලැබේ.

රූපචාරයෙහි කත්‍ථපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත කුශලාකුශලවිපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන චිත්තජ මහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා උපදනා කර්මජ මහාභූතයෝ ය, ආහාරජ ඍතුජ අසඤ්ඤසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ චිත්තජාදි උපාදයරූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් සුදුසු පරිදි ලැබෙන ආරම්මණ ප්‍රත්‍යයෙන් අන්‍ය වූ හේතු සහජාත අධිපතිආදි ශක්තීහු ලැබෙත්.

අව්‍යාකතපද වාරයට අනතුරු ව කුසලාව්‍යාකතපද වාරය වදළ සේක. "**කුසලඤ්ච අබ්‍යාකතඤ්ච -පෙ- අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න ආරම්මණ පච්චයා, කුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං** " කත්‍ථපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල්සිත් එක් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ලැබෙත්. හේතුපාඨයේ අභිධෙය උක්තානුසාරයෙන් ගන්නේ ය.

කුසලාව්‍යාකතපද වාරයට අනතුරු ව අකුසලාව්‍යාකත පද වාරය වදළ සේක. "**අකුසලඤ්ච අබ්‍යාකතඤ්ච ධම්මං පටිච්ච අබ්‍යාකතො -පෙ- අකුසලෙ ඛන්ධෙ ච මහාභූතෙ ච පටිච්ච චිත්තසමුට්ඨානං රූපං** " කත්‍ථපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුසල්සිත් දෙළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්. හේතුපදයේ අභිධෙය අවුලනු.

## (3. න අධිපති)

න ආරම්මණප්‍රත්‍යය විභඞ්ගයට අනතුරු ව -පෙ- වදළ සේක. විභඞ්ගය උදුරනු. 'කුසලො' යන කත්‍ථපාඨයෙන් අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාකුසල් අට ය, සැම කල්හි අධිපති ලැබෙන මහද්ගත කුසල් නවය හා මාර්ගසිත් සතර ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුසල් අට ය, චෛතසික අටතිස

Non-commercial distribution

ය යන අවයව නාමසකන්ධයන් නිසා උපදනා වූ මහාකුසල් අට ය, චෛතසික අටතිස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. 'න අධිපති පච්චයා " යන හේතුපාඨයෙන් අධිපති ශක්තියෙන් අන්‍ය වූ හේතු ආරම්මණ අනන්තරාදි ශක්තීහු ලැබෙත්. (නො ලැබෙන්නේ අධිපති විපාක පච්ඡාජාත තුන පමණෙකි.)

කුසලෙන අබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති නො ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුසල් අට ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා නිරාධිපති චිත්තජ රූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් අධිපති ශක්තියෙන් අන්‍ය වූ හේතු සහජාතාදි ශක්තීහු සූදුසු පරිදි ලැබෙත්. නාරම්මණ හේතු පාඨය අනුව විස්තර කරනු.

කුසලාබ්‍යාකත පදවාසාන වාරයෙහි කතීඃපාඨයෙන් පඤ්ච-වෝකාරභූමියෙහි අධිපති නො ලැබෙන අවස්ථාවෙහි මහාකුසල් අට ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා මහාකුසල් අට ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් හා ඔවුන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් අධිපති ශක්තියෙන් අන්‍ය වූ සුදුසු පරිදි ලැබෙන හේතු ආරම්මණ අනන්තර සහජාතාදි ශක්තීහු ලැබෙත්.

අකුසලෙන අකුසලයෙහි කතීඃපාඨයෙන් අධිපති ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල අට ය, ද්වේෂමූල සිත් දෙක ය, විචිකිත්සා වර්ජිත චෛතසික සවිස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා වූ අධිපති ධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි වූ අකුසල් සිත් දෙළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව -පෙ- අවයව නාමස්කන්ධයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. හේතුපාඨයෙන් අධිපති විපාක පශ්චාජ්ජාත ශක්තීන් ගෙන් අන්‍ය වූ ප්‍රත්‍යය ශක්ති එක්විස්ස ලැබේ.

අකුසලෙන අබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය නො ලැබෙන අවස්ථාවෙහි අකුසල් සිත් දෙළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් අධිපතිශක්තියෙන් අන්‍ය වූ හේතුසහජාතාදි ශක්තීහු සූදුසු පරිදි ලැබෙත්.

"අකුසලො ච අබ්‍යාකතො ච" යන කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති නො ලැබෙන අවස්ථාවෙහි අකුසල් සිත් දෙළොස ය

Non-commercial distribution

චෛතසික සත්විස්ස ය යන අවයව -පෙ- නාමස්කන්ධයන් හා ඔවුන් විසින් උපදවන චිත්තජරූපයෝ ද ලැබෙත්. හේතුපාඨයෙන් අධිපති ශක්තියෙන් අන්‍ය වූ හේතු ආරම්මණ අනන්තරාදි ශක්තීහු සුදුසු පරිදි ලැබෙත්.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කර්‍තෘපාඨයෙන් අධිපති ලැබෙන අවස්ථාවෙහි මහාක්‍රියා අටය සැම කල්හි අධිපති ලැබෙන මහද්ගත ක්‍රියා ලෝකෝත්තරඵල චිත්තයෝ ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අධිපති ධර්‍මයෝ ය, අධිපති නොලැබෙන අවස්ථාවෙහි අහේතුකක්‍රියා මහාක්‍රියා ලෞකිකවිපාකයෝ ය චෛතසික පන්තිස ය යන අවයව -පෙ- නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන නිරාධිපති චිත්තජ රූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. හේතුපාඨයෙන් අධිපතිශක්තියෙන් අන්‍ය වූ හේතු ආරම්මණ අනන්තරාදි ශක්තීහු සුදුසු පරිදි ලැබෙත්. ප්‍රතිසන්ධිකාලයෙහි සහජාතයෙහි මෙන් ප්‍රතිසන්ධිසිත් එකුන්විස්ස හා කෘතත්වාත් රූපයන් ගන්නේ ය. හේතුපාඨයෙන් සුදුසු පරිදි හේතු ආරම්මණ අනන්තරාදි ශක්තීන් ගන්නේ ය. පූර්‍වජාත පශ්චාජ්ජාත ආසේවන අධිපතීහු නො ලැබෙත්. රූපවාරයෙහි කර්‍තෘපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත නිරාධිපති කුශලා කුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් සුදුසු පරිදි උපදවන චිත්තජ මහාභූතයෝ ය, පඤ්චවෝකාරප්‍රතිසන්ධි පසළොස හා උපදනා කර්‍මජ මහා භූතයෝ ය, බාහ්‍ය ඍතුජ අසංඥසත්ත්වකර්‍මජ ප්‍රවෘත්තිකර්‍මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ චිත්තජාදි උපාදයරූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් අධිපතිප්‍රත්‍යයෙන් අන්‍ය වූ හේතු සහජාතාදි ශක්තීහු සුදුසු පරිදි ලැබෙත්.

කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කර්‍තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති නො ලැබෙන අවස්ථාවෙහි මහාකුසල් අට ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමසකන්ධයන් හා මහාභූතයන් නිසා උපදනා නිරාධිපති චිත්තජරූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් අධිපති ශකතියෙන් අන්‍ය වූ හේතු සහජාතාදි ශක්තීහු සුදුසු පරිදි ලැබෙත්.

අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කර්‍තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති නො ලැබෙන අවස්ථාවෙහි අකුසල් සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් හා මහාභූතයන් නිසා උපදනා නිරාධිපති චිත්තජරූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් අධිපතිශක්තියෙන් අන්‍ය වූ හේතුසහජාතාදි ශක්තීහු සුදුසු පරිදි ලැබෙත්. **නාධිපති විභඞ්ගය නිමි.**

Non-commercial distribution

### (4 5. න අනන්තර, න සමනන්තර)

න අනන්තර න සමනන්තර විභඞ්ගයන්හි න ආරම්මණ විභඞ්ග-යෙහි මෙන් වාර පස බැගින් ඇත්තේ ය. න ආරම්මණ විභඞ්ගය අනුව සියල්ල විස්තර කරනු. හේතුපාඨයෙන් අනන්තර සමනන්තර ශක්තීන්ගෙන් අන්‍ය ප්‍රත්‍යය ශක්තීන් ගන්නේ ය.

### (6. න අඤ්ඤමඤ්ඤ)

න අඤ්ඤමඤ්ඤයෙහි කුසලඅකුසලපදවාරයන් නාරම්මණය සේ විස්තර කරනු. "**අබ්‍යාකතං -පෙ- න අඤ්ඤමඤ්ඤ පච්චයා විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං. පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කටත්තා රූපං මහාභූතෙ පටිච්ච උපාදාය රූපං -පෙ- අසඤ්ඤසත්තානං මහාභූතෙ පටිච්ච කටත්තාරූපං, උපාදායරූපං.**" කථිතපාඨයෙහි ප්‍රවෘත්තිකාලයේ අභිධෙය නාරම්මණය අනුව ගන්නේ ය. ප්‍රතිසන්ධිකාලයෙහි කථිතපාඨයෙන් පඤ්චවෝකාරප්‍රතිසන්ධි පසළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා හෘදයවස්තුවෙන් අන්‍ය කෘතත්වාත් රූපයෝ ලැබෙත්. හේතු පාඨයෙන් අන්‍යෝන්‍යශක්තියෙන් අන්‍ය වූ හේතු සහජාතාදි ශක්තීහු සුදුසු පරිදි ලැබෙත්. රූපවාරයෙහි කථිතපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක ද්විපඤ්ච විඤ්ඤාණ අභිත්තච්‍යුති වර්ජිත කුශලා කුශල විපාක ක්‍රියා නාමස්කන්ධයන් විසින් උපදවන චිත්තජමහාභූතයෝ ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස හා උපදනා කර්මජ මහාභූතයෝ ය බාහිර මහාභූතයෝ ය -පෙ- ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා වූ උපාදායරූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් අන්‍යෝන්‍යප්‍රත්‍යයෙන් අන්‍ය වූ හේතු සහජාත අධිපති ආදි ශක්තීහු සුදුසු පරිදි ලැබෙත්. කුසලාබ්‍යාකත අකුසලාබ්‍යාකත දෙපදය නාරම්මණය අනුව විස්තර කරනු.

### (7. න උපනිස්සය 8. න පුරේජාත)

න උපනිස්සය විභඞ්ගය නාරම්මණ විභඞ්ගය සේ විස්තර කරනු. හේතුපාඨයේ අභිධෙය ගැනීමේ දී උපනිඃශ්‍රයප්‍රත්‍යය හරිනු.

න පුරේජාතයෙහි "**කුසලං -පෙ- න පුරෙජාතපච්චයා, අරූපෙ කුසලං එකං ඛන්ධං පටිච්ච -පෙ- ද්වෙ ඛන්ධා**" කථිතපාඨයෙන් අරූපභූමියෙහි මහාකුසල් අට ය, අරූපකුසල් සතර ය, උපරිමමාර්ග තුන ය, චෛතසික සතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා වූ -පෙ- අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. හේතුපාඨයෙන් පුරේජාත ශක්තියෙන් අන්‍ය වූ

Non-commercial distribution

හේතුසහජාතාදි වූ ශක්තීහු සුදුසු පරිදි ලැබෙත්. කුසලෙන අබ්‍යාකතය න ආරම්මණය මෙනි.

අකුසලෙන අකුසලයෙහි කතීඃපාඨයෙන් ලෝභමූල සිත් අටය, මෝහමූල සිත් දෙක ය, චෛතසික තෙවිස්ස ය යන අවයව -පෙ-නාමස්කන්ධයෝ ලැබෙත්. හේතුපාඨයෙන් පූරේජාතයෙන් අන්‍ය වූ හේතුආරම්මණාදි ශක්තීහු සුදුසු පරිදි ලැබෙත්. අකුසලෙන අබ්‍යාකතය න ආරම්මණය මෙනි.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි "**අරූපෙ විපාකාබ්‍යාකතං -පෙ- ඛන්ධා, විපාකාබ්‍යාකතෙ කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච චිත්තසමුට්ඨානං රූපං**" ප්‍රතිසන්ධිකාලය හා රූපවාරය ආරම්මණයෙහි මෙනි. ප්‍රවෘත්තිකාලයෙහි කතීඃපාඨයෙන් අරූපවිපාක සතර ය, අරූපභූමියෙහි උපදනා අවස්ථාවෙහි මනෝද්වාරාවර්ජනය ය, මහාක්‍රියා අට ය, අරූප ක්‍රියා සතර ය, ඵලසිත් සතරය, චෛතසික සතිස ය යන අවයව -පෙ- නාමස්කන්ධයෝ ය පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක ද්විපඤ්චවිඥාන අභිඥාව්‍යාප්ති වර්ජිත විපාකසිත් දෙවිස්ස ය, ක්‍රියා සිත් විස්ස ය. චෛතසික අටතිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්. හේතුපාඨයෙන් පූරේජාතයෙන් අන්‍ය වූ හේතු ආරම්මණ අධිපති ආදි ශක්තීහු සුදුසු පරිදි ලැබෙත්. පටිසන්ධිකාලයේ හා රූප වාරයේ අභිධෙය සහජාතයෙහි මෙනි. හේතුපාඨයේ අභිධෙය පූරේජාතය හැර ගත යුතු ය.

කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය යන දෙවාරය ද නාරම්මණය සේ විස්තර කරනු.න පූරේජාතය නිමියේ ය.

### (9. න පච්ඡාජාත)

න පච්ඡාජාතවිභඞ්ගය අනුලෝමවාරයේ සහජාතවිභඞ්ගය අනු ව විස්තර කරනු. "න පච්ඡාජාත පච්චයා" යන හේතු පාඨයෙන් පශ්චාජ්ජාතයෙන් අන්‍ය වූ ප්‍රත්‍යය ශක්ති තෙවිස්ස නාමරූප දෙපක්ෂයෙහි ලැබෙන පරිදි ගන්නේ ය.

### (10. න ආසේවන)

න අසේවනයෙහි විභඞ්ග නවය අනුලෝමයේ සහජාත විභඞ්ගය අනුව උදුරනු. කුසලෙන කුසලයෙහි කතීඃපාඨයෙන් මහාකුශල ප්‍රථමජවනයෝ ය, චෛතසික අටතිස ය යන අවයව -පෙ- නාමස්කන්ධයෝ ලැබෙත්. හේතුපාඨයෙන් ආසේවනයෙන් අන්‍ය හේතුසහජාතාදි ශක්තීහු සුදුසු පරිදි ලැබෙත්.

Non-commercial distribution

කුසලෙන අබ්‍යාකතය නාරම්මණය මෙන් විස්තර කරනු. කුසලෙන කුසලාබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි මහාකුශල ප්‍රථමජවනයෝ ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- නාමස්කන්ධයන් හා ඔවුන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්. හේතුපාඨයේ අභිධෙය උදුරනු.

අකුසලෙන අකුසලයෙහි කතීඃපාඨයෙන් දෙළොස් අකුශලයන් ගේ ප්‍රථම ජවනයන් හා චෛතසික සත්විස්ස ලැබෙත්. අකුසලෙන අබ්‍යාකතය නාරම්මණය මෙනි. අකුසලෙන අකුසලාබ්‍යාකතයෙහි අකුශල ප්‍රථම-ජවනයන් හා චිත්තජ රූපයෝ ලැබෙත්.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් හසිතෝත්පාද මහාක්‍රියා ප්‍රථම ජවනයෝ ය, ආවර්ජනද්වය ය විපාකසිත් සතිසය යන අවයව නාමස්කන්ධයන් නිසා උපදනා -පෙ- නාමස්කන්ධයෝ ය, ඔවුන් නිසා උපදනා චිත්තජරූපයෝ ය, පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ හසිතෝත්පාද මහාක්‍රියා ප්‍රථම ජවනයෝ ය මහද්ගත ක්‍රියා නවය ය, චෛතසික පන්තිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චිත්තජරූපයෝ ය යන මොවුහු ලැබෙත්. පටිසන්ධිවාර රූපවාර දෙක්හි අභිධෙය සහජාතය මෙනි. ඉතිරි විභඞ්ගවාර දෙක නාමරම්මණය මෙන් විස්තර කරනු. හේතුපදභිධෙය ගැනීමේදී ආසේවනය හරිනු.

## (11. න කම්ම)

න කම්මවිභඞ්ගවාරයෙහි "**කුසලං -පෙ- න කම්ම පච්චයා, කුසලෙ ඛන්ධෙ පටිච්ච කුසලා චෙතනා**" කතීඃපාඨයෙන් කුසල් සිත් එක්විස්ස ය, චේතනා වර්ජිත චෛතසික සත්තිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චේතනාව ලැබේ. හේතුපාඨයෙන් කර්මප්‍රත්‍යයෙන් අන්‍ය වූ හේතු ආරම්මණ ආදීන් ගේ ශක්තීහු සුදුසු පරිදි ලැබෙත්. සඞ්ඛ්‍යවාර පසළොසකි.

'**අකුසලං -පෙ- අකුසලෙ ඛන්ධෙ පටිච්ච අකුසලා චෙතනා**' අකුසල් දෙළොස ය, චේතනා වර්ජිත චෛතසික සවිස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා අකුශල චේතනා ලැබෙත්.

අබ්‍යාකතයෙහි "**කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පටිච්ච කිරියාබ්‍යාකතා චෙතනා බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං එකං -පෙ- මහාභූතෙ පටිච්ච උපාදය රූපං**" ප්‍රවෘත්තිකාලයෙහි කතීඃපාඨයෙන් ක්‍රියාසිත්

Non-commercial distribution

විස්ස ය චේතනා වර්ජිත චෛතසික සූතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් නිසා උපදනා චේතනාවෝ ලැබෙත්. රූපවාරයෙහි බාහ්‍ය ආහාරජ ඍතුජ මහාභූතයන් නිසා උපදනා වූ භූතරූප සහිත වූ බහ්‍යාදි උපාදය රූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් සහජාත, නිඃශ්‍රය, රූපාහාර, සහජාතත්ථි, සහජාත අවිගත යන ප්‍රත්‍යය ශක්තීහු ලැබෙත්. න කම්ම විභඞ්ගය නිමි.

## (12. න විපාක)

න විපාකයෙහි විභඞ්ගවාර නවයෙහි කුසලාකුසල දෙපදයේ වාර සය සහජාතය අනු ව විස්තර කරනු. හේතුපදයන් ගේ අභිධෙය ගැනීමේදී විපාක පස හරිනු. අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්ති කාලයේ නත්‍ථිපාඨයෙන් ක්‍රියාසිත් විස්ස ය, චෛතසික පන්තිස ය, යන අවයව -පෙ- නාමස්කන්ධයන් හා ක්‍රියා චිත්තජරූපයෝ ලැබෙත්. ප්‍රතිසන්ධිවාරය නො ලැබේ. රූපවාරයෙහි කත්‍ථිපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුශලා කුශල ක්‍රියා නාමස්කන්ධයන් විසින් උපදවන චිත්තජ මහාභූතයෝ ය, බාහ්‍ය මහාභූතයෝ ය, ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයෝ ය යන මොවුන් නිසා උපදනා භූතරූප සහිත වූ ඒ ඒ උපාදයරූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් හේතු, සහජාත, අධිපති ආදි ශක්තීහූ යෙදෙන පරිද්දෙන් ලැබෙත්. න විපාක විභඞ්ගය නිමි.

## (13. න ආහාර)

න ආහාරයෙහි "**අබ්‍යාකතං -පෙ- අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න ආහාර පච්චයා, බාහිරං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං -පෙ- මහාභූතෙ පටිච්ච -පෙ- උපාදය රූපං**" කත්‍ථිපාඨයෙන් බාහ්‍ය ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූතයන් නිසා උපදනා භූතරූප සහිත වූ ඒ ඒ උපාදයරූපයෝ ලැබෙත්. හේතුපාඨයෙන් සහජාත, සහජාත නිඃශ්‍රය, නානාක්ෂණික කම්ම, රූපජීවිතේන්ද්‍රිය, සහජාතත්ථි, සහජාත අවිගත යන ශක්ති සය සුදුසු පරිදි ලැබේ. න ආහාරය නිමි,

## (14. න ඉන්ද්‍රිය.)

කුසලාබ්‍යාකත පදවසානවාරයෙහි කතීඃපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වරාවර්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හෘදයවස්තුව හා මරණාසන්නකාලයෙහි ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා හෘදයස්තුව ද පූරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යයකොට උපදනා කුසල් සිත් එක් විස්සය, චෛතසික අටතිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධ යෝ ය, ඒ නාමස්කන්ධයන් නිසා උපදනා මහාභූතයන් සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා චිත්තජ රූපයෝ ය යන මොවූහූ ලැබෙත්.

අකුශලපදවසාන වාරයෙහි කතීඃපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනා හෘදයවස්තුව හා මරණාසන්නකාලයෙහි ච්‍යුති චිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා හෘදය වස්තුව ද පූරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා අකුසල්සිත් දොළොස ය, මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්.

අකුසලාබ්‍යාකතපදවසාන වාරයෙහි කතීඃ පාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හෘදය වස්තුව හා මරණාසන්න කාලයෙහි ච්‍යුති චිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපදනා හෘදය වස්තුවද පූරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා අකුසල් සිත් දොළොසය, මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්සය යන අවයව වූද සමූහ වූ ද නාමසකන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් නිසා උපදනා මහාභූතයන් සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා චිත්තජ රූපයෝ ය යන මොවූහූ ලැබෙත්.

කුසලාබ්‍යාකත පදවාරයෙහි "කුසලොධම්මො" යන කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි කුසල්සිත් එක්විස්ස ය

Non-commercial distribution

චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද, ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනා වූ ද මරණාසන්නකාලයෙහි ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා වූ ද හෘදයවස්තුව පුරේජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට ද උපදනා වූ කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්.

කුසලාබ්‍යාකතපදවාරයේ අබ්‍යාකතපදවසානවාරයෙහි අභිධෙය පටිච්චවාරයෙහි මෙනි. කුසලාබ්‍යාකත පදවසානවාරයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා උපන්නා වූ ද මරණාසන්නකාලයෙහි ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන්නා වූ ද හෘදයවස්තූන් පුරේජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට ද උපන්නා වූ ද කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ය, ඔවුන් හා මහාභූතයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා චිත්තජරූපයෝය යන මොවුහු ලැබෙත්.

අකුසලාබ්‍යාකතපදවාරයෙහි "අකුසලො" යන කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි අකුසල්සිත් දෙළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයන් සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපනමානෝද්වාරවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනා වූ ද මරණාසන්නකාලයෙහි ච්‍යුති චිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදනා වූ ද හෘදයවසතූන් පුරේජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ ද අකුසල්සිත් දෙළොසය මෝහමූලද්වයෙහි මෝහවර්ජිත චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. අබ්‍යාකතපදවසානවාරය පටිච්චවාරයෙහි මෙනි.

අකුසලාබ්‍යාකතපදවසානවාරයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි අකුසල්සිත් දෙළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනා වූ ද මරණාසන්නකාලයෙහි චුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපදනා වූ ද හෘදයවස්තූන් පුරේජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට ද උපදනා වූ අකුසල්සිත් දෙළොස ය මෝහ මූලද්වයෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් හා මහාභූතයන් සහජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා චිත්තජරූපයෝ ය යන මොහු ලැබෙත්.

කුසලපදවාරයෙහි වාරතුනක් ද අකුශලපදයෙහි තුනක් ද අබ්‍යාකතපදයෙහි පසක් ද කුසලාබ්‍යාකතපදයෙහි තුනක් ද අකුසලාබ්‍යාකත

Non-commercial distribution

පදයෙහි තුනක් ද වීමෙන් හේතුප්‍රත්‍යය විභඞ්ගයෙහි වාර සතොළොසක් වේ. පටිච්චවාරයෙහි හේතුප්‍රත්‍යය විභඞ්ගයේ ඇත්තේ වාර නවයෙකි. හේතුප්‍රත්‍යය විභඞ්ගය නිමි.

## ආරම්මණ විභඞ්ගය.

හේතුප්‍රත්‍යය විභඞ්ගවාරයට අනතුරු ව ආරම්මණප්‍රත්‍යය විභඞ්ගවාරය වදළ සේක. එහි ද කුශලපද අකුශලපද අබ්‍යාකත පද කුශලාබ්‍යාකතපද අකුශලාබ්‍යාකතපදයන් ගේ වශයෙන් වාර පසක් ඇත්තේ ය. එයින් කුසලපදවාරය පළමු කොට වදළ සේක. එය කුශලපදවසානවාර වශයෙන් එක් වාරයෙකි. පටිච්චවාරය අනුව විස්තර කරනු. අකුශලපදවාර ද අකුශල පදවසානවාර වශයෙන් එක් වාරයෙකි. එද පටිච්චවාරය අනුව විස්තර කරනු.

අබ්‍යාකත පදවාරයෙහි අබ්‍යාකතපදවසානවාර කුශලපදවසානවාර අකුශලපදවසානවාර වශයෙන් වාරතුනක් ඇත්තේ ය. එයින් අබ්‍යාකතපදවසානවාරය පළමු කොට වදළ සේක. එහි ද ප්‍රවෘත්තිවාර ප්‍රතිසන්ධිවාර වස්තුරූපවාර වශයෙන් වාරතුනක් ඇත්තේ ය. එයින් ප්‍රවෘත්තිප්‍රතිසන්ධි දෙවාරයෙහි අභිධෙය පටිච්ච වාරයෙහි මෙනි. "චක්ඛායතනං පච්චයා චක්ඛුවිඤ්ඤාණං" යනාදිය වස්තුරූපවාරය ය. වස්තුරූපවාරයෙහි "අබ්‍යාකතො" යන කර්තෘ පාඨයෙන් අතීත භවාංගය හා උපන් මධ්‍යමායුෂ්ක චක්ෂුර්වස්තුව පූර්ෙජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා චක්ෂුර්විඥානද්වය ය සර්‍වචිත්තසාධාරණ චෛතසික සත ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය -පෙ- අතීතභවාඞ්ගය හා උපදනා මධ්‍යමායුෂ්ක කායවස්තුව පූරෙජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා කායවිඥානද්වය ය සර්‍වචිත්තසාධාරණ චෛතසික සත ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධ්‍යාදි පූර්‍වපූර්‍ව චිත්තයන් හා උපදනා හෘදයවස්තුව හා මරණාසන්නකාලයෙහි චුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා හෘදයවස්තුව ද පූර්ෙජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන වර්ජිත විපාකසිත් දෙවිස්ස ය ක්‍රියා සිත් විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය යන මොවුහු ලැබෙත්.

කුසලපදවසානවාරයෙහි (වත්ථුං පච්චයා කුසලා ඛන්ධා) කර්තෘපාඨයේ අභිධෙය හේතුවිභඞ්ගයෙහි මෙනි. අකුසලපදවසානවාරයෙහි කර්තෘපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්‍වපූර්‍ව චිත්තයන් හා උපදනා වූ ද මරණාසන්න කාලයෙහි ච්‍යුති චිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපදනා වූ ද හෘදයවස්තුව පූර්ෙජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා අකුසල්සිත් දෙළොස ය, චෛතසික සත්විස්ස ය යන අවයවවූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්.

Non-commercial distribution

කුසලාබ්‍යාකතපදවාරයෙහි කතීපායෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනා වූ හෘදයවස්තුව පූරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද උපදනා කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්.

අකුශලාබ්‍යාකතපද වාරයෙහි අභිධෙය කුශලපදවාරය අනුව ගන්නේ ය. කුසලපදයෙහි එක්වාරයක් ද අකුසලපදයෙහි එක් වාරයක් ද අබ්‍යාකතපදයෙහි තුන්වාරයක් ද කුශලාබ්‍යාකත පදයෙහි එක්වාරයක් ද අකුශලාබ්‍යාකතපදයෙහි එක්වාරයක් ද වීමෙන් ආරම්මණ ප්‍රත්‍යය විභඞ්ගයෙහි වාර සතක් වේ. ආරම්මණ විභඞ්ගවාරය නිමි.

## අධිපති විභඞ්ගය

ආරම්මණප්‍රත්‍යය විභඞ්ගවාරයට අනතුරුව අධිපතිප්‍රත්‍යය විභඞ්ග-වාරය විදළ සේක. එහි ආදිපද පසෙකි. අවසානපදයන් ගේ වශයෙන් වාර සතොළොසෙකි. හේතුවිභඞ්ගයෙහි මෙනි. කුශලාකුශල දෙපදයේ වාර සය පටිච්චවාරයෙහි මෙන් අභිධෙය ඇවිලා විස්තර කරනු. පටිච්ච-වාරයෙහි දී "නිසා උපදනා ධර්මයෝය" යි කියන තැන මෙහි "සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා ධර්මය" යි කිම පමණක් වෙනස ය.

අබ්‍යාකතපදයෙහි අබ්‍යාකතපදවසානවාරයෙහි ප්‍රවෘත්ති වාර රූපවාර දෙක පටිච්චවාරය අනුව විස්තර කරනු. "වත්ථුං පච්චයා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා" යන වස්තුරූපවාරයෙහි කතීපායෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනා වූ ද ච්‍යුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපදනා වූ ද හෘදයවස්තුව පූරේජාතනිඃශ්‍රය කොට උපදනා පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්මවර්ජිත මහා ක්‍රියා අට ය, සැමකල්හි අධිපති ලැබෙන මහද්ගතක්‍රියා නවය ය, ඵලසිත් සතර ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්.

කුසලපදවසානවාරයෙහි (වත්ථුං පච්චයා කුසලා ඛන්ධා) කතීපායෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්වචිත්තයන් හා උපදනා වූ ද ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා වූ ද හෘදය වස්තුව පූරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා වූ පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්මවර්ජිත මහා කුසල් සිත් අට ය, සැමකල්හි අධිපති ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුශලයෝය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්.

Non-commercial distribution

අකුසලපදාවසානවාරයෙහි (වත්ථුං පච්චයා අකුසලා ඛන්ධා) කතීපායයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- උපදනා වූ ද හෘදය වස්තුව පුරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා වූ ද පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්මවර්ජිත ලෝභමූල ද්වේෂමූල සිත් දසය ය, විචිකිච්ඡාවර්ජිත චෛතසික සවිස්සය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්.

කුසලාබ්‍යාකතපදාවසානවාරයෙහි කතීපායයෙන් ව්‍යවස්ථාපන -පෙ- හෘදයවස්තුව පුරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා වූ පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්මවර්ජිත මහාකුසල් සිත් අට ය සැමකල්හි අධිපති ලැබෙන මහද්ගතලෝකෝත්තර කුශල නවය ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය ඔවුන් විසින් උපදවන මහාභූතයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා සාධිපති චිත්තජරූපයෝ ය යන මොවුහු ලැබෙත්.

අකුසලාබ්‍යාකතපදාවසානවාරයෙහි (වත්ථුං පච්චයා අකුසලා ඛන්ධා) කතීපායයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව පුරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා වූ පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්මවර්ජිත ලෝභමූල සිත් දෙකය ද්වේෂමූල සිත් දෙකය විචිකිත්සා වර්ජිත චෛතසික සවිස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය ඔවුන් විසින් උපදවන මහාභූතයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා සාධිපති චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්.

කුසලාබ්‍යාකතෙන කුසලයෙහි කතීපායයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි මහාකුසල් අට ය සැමකල්හි අධිපති ලැබෙන මහද්ගත කුශල නවය ය මාර්ගසිත් සතර ය චෛතසික අටතිස ය යන නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව පුරේජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට ද උපදනා වූ අධිපතිධර්ම වර්ජිත වූ මහාකුසල් අට ය සැම කල්හි අධිපති ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුශලයෝ ය චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය පටිච්චවාරයෙහි මෙනි.

කුසලාබ්‍යාකතෙන කුසලාබ්‍යාකතයෙහි කතීපායයෙන් පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාකුසල් අට ය සැමකල්හි අධිපති ලැබෙන මහද්ගත කුසල් නවය ය ලෝකෝත්තර කුසල්

Non-commercial distribution

සතර ය චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයන් සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන -පෙ- හෘදය වස්තුව පූරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද උපදනා වූ අධිපතිධර්මවර්ජිත මහා කුසල් අට ය සැමකල්හි අධිපතිප්‍රත්‍යය ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුසලයෝ ය චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් උපදවන මහාභූතයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා සාධිපති චිත්තජරූපයෝ ය යන මොවුහු ලැබෙත්.

අකුසලාබ්‍යාකතෙන අකුසලයෙහි පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල සිත් අට ය ද්වේෂමූල සිත් දෙකය චෛතසික සවිස්ස ය යන අවයව නාමස්කන්ධයන් සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන -පෙ- හෘදයවස්තුව පූරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද උපදනා අධිපතිධර්ම වර්ජිත ලෝභමූල ද්වේෂමූල චිත්තයෝ ය චෛතසික සවිස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්.

අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි අභිධෙය පටිච්චවාරයෙහි මෙනි. අකුසලාබ්‍යාකතෙන අකුසලාබ්‍යාකතයෙහි කතිඃපායයෙන් පඤ්චවෝකාර-භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල සිත් අට ය ද්වේෂමූල දෙසිත ය චෛතසික සවිස්ස ය යන අවයව නාමස්කන්ධයන් සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන -පෙ- හෘදයවස්තුව පූරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොටද උපදනා අධිපතිධර්ම වර්ජිත ලෝභමූල සිත් අටය ද්වේෂමූල දෙසිත ය චෛතසික සවිස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ය ඒ නාමස්කන්ධයන් විසින් උපදවන මහාභූතයන් සහජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා චිත්තජරූපයෝ ය යන මොවුහු ලැබෙත්. අධිපති විභඞ්ගවාරය නිමි.

## අනන්තර සමනන්තර සහජාත විභඞ්ග

අනන්තර සමනන්තර විභඞ්ග ආරම්මණ විභඞ්ගය මෙනි. සහජාත විභඞ්ගයෙහි කුසලාකුසල දෙපදයේ වාර සය පටිච්චවාරය අනුව විස්තර කරනු. අබ්‍යාකතපදයෙහි ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි රූප වාර පටිච්චවාරය මෙනි. "චක්ඛායතනං පච්චයා චක්ඛුවිඤ්ඤාණං" යනාදි වස්තුරූප වාරයෙහි අතීතභවාඞ්ගය හා උපදනා මධ්‍යමායුෂ්ක චක්ෂුර්වස්තුව පූරේජාත නිඃශ්‍රය කොට උපදනා චක්ෂුර්විඥානද්වය ය සර්වචිත්තසාධාරණ චෛතසික සත ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, -පෙ- අතීත භවාඞ්ගය හා උපදනා මධ්‍යමායුෂ්ක කායවස්තුව පූරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා කායවිඥානද්වය ය සර්වචිත්ත සාධාරණ

Non-commercial distribution

චෛතසික සත ය යන අවයව වූ ද සමූහ වූ ද නාසමකන්ධයෝ ය, ප්‍රතිසන්ධාදි පූර්වපූර්ව චිත්තය සමග උපදනා වූ ද මරණාසන්න කාලයෙහි චුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා වූ ද හෘදයවස්තුව පූර්වජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි අරූපවිපාක ද්විපඤ්චවිඥාන වර්ජිත පශ්චිම පශ්චිම වූ විපාක සිත් දෙවිස්ස ය ක්‍රියාසිත් විස්ස ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය් යන මොවුහු ලැබෙත්. අබ්‍යාකතෙන කුසලය හේතුවිභඞ්ගය මෙනි. අබ්‍යාකතෙන අකුසලය ආරම්මණවිභඞ්ගය මෙනි. අබ්‍යාකතෙන කුසලාබ්‍යාකතය හේතුවිභඞ්ගය මෙනි. අබ්‍යාකතෙන අකුසලාබ්‍යාකතය මෝහමූලයෙහි මෝහය නො හැර හේතුවිභඞ්ගය මෙන් විස්තර කරනු. අකුසලාබ්‍යාකතයෙහි වාර තුනම මෝහමූලයෙහි මෝහය නො හැර හේතුවිභඞ්ගය සේ විස්තර කරනු. සහජාතවිභඞ්ගවාරය නිමි.

## අඤ්ඤමඤ්ඤ නිස්සය උපනිස්සයය
## පුරේජාත විභඞ්ග.

අඤ්ඤමඤ්ඤ විභඞ්ගයෙහි වාර සතෙකි. ආරම්මණවිභඞ්ගය අනුව විස්තර කරනු. නිස්සය විභඞ්ගයෙහි වාර සතොළොසෙකි. සහජාතය මෙනි. උපනිස්සයවිභඞ්ගයෙහි වාර සතෙකි. ආරම්මණය මෙනි.

පුරේජාතවිභඞ්ගයෙහි "කුසලං -පෙ- වත්ථුං පුරේජාත පච්චයා" පටිච්චවාරය අනුව විස්තර කරනු. අකුසලපදවාරය ද එසේ විස්තර කරනු.

"අබ්‍යාකතං -පෙ- වත්ථුං පුරෙජාතපච්චයා, චක්ඛායතනං පච්චයා චක්ඛුවිඤ්ඤාණං, -පෙ- කායායතනං පච්චයා කාය විඤ්ඤාණං, වත්ථුං පච්චයා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා වත්ථුං පුරේජාත පච්චයා" ප්‍රවෘත්තිකාලයෙහි අභිධෙය පටිච්චවාරයෙහි මෙනි. වස්තුරූප වාරයෙහි ආරම්මණයෙහි මෙනි. අබ්‍යාකතෙන කුසල ය අබ්‍යාකතෙන අකුසලය යන දෙවාරය ආරම්මණය මෙනි. අවසානයෙහි "වත්ථුං පුරේජාතපච්චයා" යි යෙදීම ම වෙනස ය.

## ආසේවන විභඞ්ගය

කුසලාකුසල දෙපදය පටිච්චවාරයෙහි මෙනි. අබ්‍යාකතවාරයෙහි ප්‍රවෘත්තිකාලයේ අභිධෙය පටිච්චවාරයෙහි මෙනි. වස්තු රූපවාරයෙහි කතීඃපාඨයෙන් ප්‍රථමජවනාදි පූර්වපූර්ව චිත්තය හා උපන් හෘදය වස්තුව හා මරණාසන්නකාලයෙහි චුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපන් හෘදය වස්තුව පූර්වජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා හසිතෝත්පාද

Non-commercial distribution

මහාක්‍රියා ද්විතියාදි ජවනයෝ ය, මහද්ගත ක්‍රියා නවය ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්.

අබ්‍යාකතෙන කුසලයෙහි " කුසලො ධම්මො" යන කතීඃපාඨයෙන් ප්‍රථමජවනාදි පූර්‍වපූර්‍ව චිත්තයන් හා උපදනා වූ ද මරණාසන්නකාලයෙහි ච්‍යුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපන්නා වූ ද හෘදය වස්තුව පූරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා වූ මහාකුශලද්විතියාදි ජවනයෝ ය, මහද්ගතකුසල් නවය ය මාර්ගසිත් සතරය චෛතසික අටතිස ය යන නාමස්කන්ධයෝ ලැබෙත්.

අබ්‍යාකතෙන අකුසලයෙහි කතීඃපාඨයෙන් ප්‍රථමජවනාදි පූර්‍වපූර්‍ව චිත්තයන් හා උපදනා වූ ද ච්‍යුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපදනා වූ ද හෘදයවස්තුව පූරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා වූ අකුශලද්විතීයාදිජවනයෝ ය චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්.

කුසලාබ්‍යාකතෙන කුසලයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි මහාකුශලද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතකුශල නවය ය මාර්ගසිත් සතර ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද, ප්‍රථමජවනාදි පූර්‍වපූර්‍ව චිත්තයන් හා උපදනා වූ ද ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා වූ ද හෘදය වස්තු පූරේජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට ද උපදනා වූ ද මහාකුශලද්විතියාදි ජවනයෝ ය, මහද්ගතකුශල නවය ය මාර්ගසිත් සතර ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්.

අකුසලාබ්‍යාකතෙන අකුසලයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාර-භූමියෙහි උපදනා අවස්ථාවෙහි අකුශලද්විතීයාදි ජවනයෝ ය, චෛතසික සත්විස්ස ය යන අවයවනාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍ය කොට ද ප්‍රථමජවනාදි පූර්‍වපූර්‍ව චිත්තයන් හා උපදනා වූ ද ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා වූ ද හෘදයවස්තුව පූරේජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ ද අකුශලද්විතියාදිජවනයෝ ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. ආසේවන විභඞ්ගය නිමි.

## කම්ම විභඞ්ගය

කම්මවිභඞ්ගයෙහි කුසලාකුසල දෙපදයේ වාර සය පටිච්ච-වාරයෙහි මෙනි. අබ්‍යාකතපදයෙහි ප්‍රවෘත්තිප්‍රතිසන්ධිරූප වාරතුන ද පටිච්චවාරයෙහි මෙනි. වස්තුරූපවාරයෙහි අභිධෙය ක්‍රියා චේතනාව හැර ආරම්මණයෙහි මෙන් ගන්නේ ය.

Non-commercial distribution

අබ්‍යාකතෙන කුසලයෙහි චේතනාව හැර ආරම්මණයෙහි මෙන් අභිධෙය ගන්නේ ය. අබ්‍යාකතෙන අකුසලයෙහි ද චේතනාව හරිනු. අබ්‍යාකතෙන කුසලාබ්‍යාකතය, අබ්‍යාකතෙන අකුසලාබ්‍යාකතය යන දෙතන්හි ද චේතනාව හරිනු. කුසලාබ්‍යාකතෙන කුසලය, කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය, කුසලාබ්‍යාකතෙන කුසලාබ්‍යාකතය යන තුන් වාරය ද අකුසලාබ්‍යාකතයෙහි තුන්වාරය ද චේතනාව හැර විස්තර කරනු. කම්මවිභඞ්ගය නිමි.

## විපාක විභඞ්ගය

විපාකප්‍රත්‍යයෙහි එක් විභඞ්ග වාරයෙකි. ප්‍රවෘත්ති ප්‍රතිසන්ධිරූප-වාරයන්හි අභිධෙය පටිච්චවාරයෙහි මෙනි. වස්තුරූපවාරයෙහි කත්‍ථ පාඨයෙන් අතීතභවාඞ්ගය හා උපදනා මධ්‍යමායුෂ්ක චක්‍ෂුර්වස්තුව පුරේජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා චක්‍ෂුර්විඥානද්වය ය සර්වචිත්ත සාධාරණ චෛතසික සතය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, -පෙ- කායවස්තුව පුරේජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා කායවිඥානද්වය ය සර්වචිත්තසාධාරණ චෛතසික සත ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධ්‍යාදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනා වූ ද ච්‍යුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපදනා වූ ද හෘදයවස්තුව පුරේජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ ද පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන වර්ජිත විපාකසිත් දෙවිස්ස ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය යන මොවුහු ලැබෙත්. විපාකවිභඞ්ගය නිමි.

## ආහාරාදි විභඞ්ගයෝ

ආහාර විභඞ්ගයෙහි වාර සතොළොසෙකි. සහජාතය මෙනි. ඉන්ද්‍රිය විභඞ්ගය ද එසේ ය. ධ්‍යානවිභඞ්ගයෙහි ද වාර සතොළොසෙකි. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ද්විපඤ්චවිඥානය හැර අභිධෙය ගැනීම පමණක් එහි ඇති වෙනස ය. මාර්ගවිභඞ්ගය හේතුවිභඞ්ගය මෙනි. මෝහමූලද්වයෙහි මෝහය නොහල යුතුය. සම්ප්‍රයුක්ත විභඞ්ගය ද ආරම්මණ විභඞ්ගය මෙනි. විප්‍රයුක්ත විභඞ්ගයෙහි සහජාතයට වෙනස අවසානයෙහි "වත්‍ථුං විප්පයුත්තපච්චයා" යනු යෙදී තිබීම පමණෙකි. වස්තු රූපවාරය සහජාතය මෙන් ද ඉතිරි තැන් පටිච්චවාරය අනුව ද විස්තර කරනු. අත්‍ථිවිභඞ්ගය ද සහජාතය මෙනි. නත්‍ථිවිභඞ්ගය ආරම්මණය මෙනි.

## විභඞ්ගවාරය නිමි.

---

Non-commercial distribution

# පච්චයවාරයේ අනුලෝම සඞ්ඛ්‍යාවාර පාළිය

හෙතුයා සත්තරස, ආරම්මණෙ සත්ත, අධිපතියා සත්තරස, අනන්තරෙ සත්ත, සමනන්තරෙ සත්ත, සහජාතෙ සත්තරස, අඤ්ඤමඤ්ඤෙ සත්ත, නිස්සයෙ සත්තරස, උපනිස්සයෙ සත්ත, පුරෙජාතෙ සත්ත, ආසෙවනෙ සත්ත, කම්මෙසත්තරස, විපාකෙ එකං, ආහාරෙ සත්තරස, ඉන්ද්‍රියෙ සත්ත, ඣානෙ සත්තරස, මග්ගෙ සත්තරස, සම්පයුත්තෙ සත්ත, විප්පයුත්තෙ සත්තරස, අත්ථියා සත්තරස, නත්ථියා සත්ත, විගතෙ සත්ත, අවිගතෙ සත්තරස.

හෙතුපච්චයා ආරම්මණෙ සත්ත, අධිපතියා සත්තරස, අනන්තරෙ සත්ත, සමනන්තරෙ සත්ත, සහජාතෙ සත්තරස, -පෙ- අවිගතෙ සත්තරස.

හෙතුපච්චයා ආරම්මණපච්චයා අධිපතියා සත්ත, සබ්බත්ථ සත්ත, විපාකෙ එකංඃ අවිගතෙ සත්ත.

හෙතුපච්චයා ආරම්මණපච්චයා අධිපතිපච්චයා අනන්තරපච්චයා සමනන්තර පච්චයා සහජාත පච්චයා අඤ්ඤමඤ්ඤපච්චයා නිස්සය පච්චයා උපනිස්සය පච්චයා පුරෙජාත පච්චයා ආසෙවන පච්චයා කම්මෙ සත්ත, ආහාරෙ සත්ත, අවිගතෙ සත්ත.

හෙතුපච්චයා ආරම්මණපච්චයා පුරෙජාත පච්චයා ආසෙවන පච්චයා කම්ම පච්චයා ආහාර පච්චයා විගත පච්චයා අවිගතෙ සත්ත.

හෙතුපච්චයා ආරම්මණපච්චයා පුරෙජාත පච්චයා කම්මපච්චයා විපාකපච්චයා ආහාරෙ එකං, අවිගතෙ එකං.

හෙතුපච්චයා ආරම්මණපච්චයා පුරෙජාතපච්චයා කම්මපච්චයා විපාකපච්චයා ආහාරපච්චයා විගතපච්චයා අවිගතෙ එකං.

හෙතුමූලකං

ආරම්මණපච්චයා හෙතුයා සත්ත, අධිපතියා සත්ත, -පෙ- ආරම්මණ මූලකං. යථා හෙතුමූලකං එවං විත්ථාරෙතබ්බං.

අධිපතිපච්චයා හෙතුයා සත්තරස. අනන්තර පච්චයා සමනන්තරපච්චයා හෙතුයා සත්ත. සහජාතපච්චයා අඤ්ඤමඤ්ඤපච්චයා නිස්සය පච්චයා උපනිස්සය පච්චයා පුරෙජාතපච්චයා ආසෙවනපච්චයා හෙතුයා සත්ත, ආරම්මණෙ සත්ත, අධිපතියා සත්ත, අනන්තරෙ සත්ත,

Non-commercial distribution

සමනන්තරෙ සත්ත, සහජාතෙ සත්ත, අඤ්ඤමඤ්ඤෙ සත්ත, නිස්සයෙ සත්ත, උපනිස්සයෙ සත්ත, පුරෙජාතෙ සත්ත, කම්මෙ සත්ත, ආහාරෙ සත්ත, ඉන්ද්‍රියෙ සත්ත, ඣානෙ සත්ත, මග්ගෙ සත්ත, සම්පයුත්තෙ සත්ත, විප්පයුත්තෙ සත්ත, අත්ථියා සත්ත, නත්ථියා සත්ත, විගතෙ සත්ත, අවිගතෙ සත්ත.

කම්මපච්චයා විපාකපච්චයා හෙතුයා එකං, ආරම්මණෙ එකං, අධිපතියා එකං, අනන්තරෙ එකං, සමනන්තරෙ එකං, සහජාතෙ එකං, කම්මෙ එකං, ආහාරෙ එකං, ඉන්ද්‍රියෙ එකං, ඣානෙ එකං, මග්ගෙ එකං, සම්පයුත්තෙ එකං, විප්පයුත්තෙ එකං, අත්ථියා එකං, නත්ථියා එකං, විගතෙ එකං, අවිගතෙ එකං.

ආහාරපච්චයා ඉන්ද්‍රියපච්චයා ඣානපච්චයා මග්ගපච්චයා සම්පයුත්තපච්චයා විප්පයුත්ත පච්චයා අත්ථිපච්චයා නත්ථිපච්චයා විගතපච්චයා අවිගතපච්චයා හෙතුයා සත්ත, ආරම්මණෙ සත්ත, විගතෙ සත්ත.

පච්චයවාරෙ අනුලොමං

---

# පච්චයවාරයේ අනුලෝම සඞ්ඛ්‍යාවාරය.

විභඞ්ගවාරයට අනතුරුව සඞ්ඛ්‍යාවාරය වදාළ සේක. එය ශුද්ධසඞ්ඛ්‍යාවාර ද්විකාදිසඞ්ඛ්‍යාවාර වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් ශුද්ධ සඞ්ඛ්‍යාවාරය පළමුකොට වදාළ සේක. එහි ද හේතුපච්චය සුද්ධ සඞ්ඛ්‍යාවාරාදීන් ගේ වශයෙන් වාර තෙවිස්සක් ඇත්තේ ය. එයින් හේතුපච්චය සුද්ධසඞ්ඛ්‍යාවාරය පළමු කොට වදාළ සේක. එහි මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, සහේතුක චිත්තජ රූපයෝ ය, සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොවුහු හේතුප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්නධර්මයෝ ය. ඒ ධර්මයෝ මේ අනුලෝම වාරයෙහි නයයට අනුව ද වාරයට අනුව ද ත්‍රිකපදයන්ට අනුව ද **"හෙතුයා සත්තරස"** යි වදරන ලදහ. මේ ශුද්ධවාරය පටිච්චවාරය සේ විස්තර කරනු.

**"ආරම්මණෙ සත්ත, අධිපතියා සත්තරස, අනන්තරෙ සත්ත, සමනන්තරෙ සත්ත, සහජාතෙ සත්තරස, අඤ්ඤමඤ්ඤෙ සත්ත, නිස්සයෙ සත්තරස, උපනිස්සයෙ සත්ත, පුරෙජාතෙ සත්ත, ආසෙවනෙ සත්ත, කම්මෙසත්තරස, විපාකෙ එකං, ආහාරෙ සත්තරස, ඉන්ද්‍රියෙ සත්තරස, ඣානෙ සත්තරස, මග්ගෙ සත්තරස, සම්පයුත්තෙ සත්ත, විප්පයුත්තෙ සත්තරස,**

Non-commercial distribution

**අපච්චයා සත්තරස, නපච්චයා සත්ත, විගතෙ සත්ත, අවිගතෙ සත්තරස."** මේ තෙවිසි ප්‍රත්‍යයන් අතුරෙන් වාර සතොළොස බැගින් ලැබෙන ප්‍රත්‍යය දෙළොසෙකි. සත ලැබෙන ප්‍රත්‍යය දශයෙකි. විපාකයෙහි පමණක් එක් වාරයෙකි.

සුද්ධසඞ්ඛ්‍යාවාරයට අනතුරුව දුකාදිසඞ්ඛ්‍යාවාරය වදළ සේක. එහි ද හේතුදුකාදි ආරම්මණදුකාදි යනාදි වශයෙන් වාර තෙවිස්සක් ඇත්තේ ය. එයින් හේතුදුකාදිය පළමුකොට වදළ සේක. එහි ද දුක තික චතුකාදි වසයෙන් වාර දෙවිස්සක් ඇත්තේ ය. එයින් දුක වාරය පළමුකොට වදළ සේක. එද හේතුමූලක ආරම්මණදුකාදි වශයෙන් දෙවිසි වැදෑරුම් වේ. එයින් හේතුමූලක ආරම්මණදුකාදිවාරය පළමුකොට වදළසේක. එහි මෝහමූලද්වයයෙහි මෝහය ය අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධ සතරය යන මොවුහු ආරම්මණ ප්‍රත්‍යයා ගේ ප්‍රත්‍යයෝත්පන්න වී හේතු ප්‍රත්‍යයාගේ ප්‍රත්‍යයෝත්පන්න නොවීමෙන් හේතු ප්‍රත්‍යය බැහැර කරති. එ බැවින් ඒ ධර්මයෝ පච්චනියානුලෝමයෙහි "න හෙතුපච්චයා ආරම්මණෙ චත්තාරි" යි වදළ සේක.

"චත්තාරි" යනු අකුසලෙන අකුසලය, අබ්‍යාකතෙන අබ්‍යාකතය, අබ්‍යාකතෙන අකුසලය, අකුසලාබ්‍යාකතෙන අකුසලය යන මොහුය. අකුසලෙන අකුසලයෙහි පටිච්චවාරයෙහි මෙන් අභිධෙය ගෙන විභඞ්ගය උදුරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි රූප වාරයන්හි අභිධෙය පටිච්චවාරයෙහි මෙනි. වස්තුරූප වාරයෙහි අතිතභවාඞ්ගය හා උපදනා වූ මධ්‍යමායුෂ්ක චක්ෂුර්වස්තුව පූරේජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ චක්ෂුර්විඥානද්වය ය, සර්වචිත්තසාධාරණ චෛතසික සත ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, -පෙ- කායවස්තුව පූරේජාත නිඃශ්‍රය කොට උපදනා කාය විඥානද්වය ය සර්වචිත්තසාධාරණ චෛතසික සතය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝය ප්‍රතිසන්ධ්‍යාදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනාවූ ද ච්‍යුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපදනා වූ ද හෘදය වස්තුව පූරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා වූ ද්විපඤ්චවිඥාන වර්ජිත අහේතුකවිපාක අහේතුක ක්‍රියා නාමස්කන්ධයන් හා ඡන්දවර්ජිත අන්‍යසමාන චෛතසික දෙළොස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය යන මොවුහු ලැබෙත්. එහි විභඞ්ගය මෙසේ ය. "අබ්‍යාකතං ධම්මං පච්චයා -පෙ- න හෙතුපච්චයා ආරම්මණ පච්චයා, අහෙතුකං - විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පච්චයා තයො ඛන්ධා, -පෙ- චක්ඛායතනං පච්චයා චක්ඛුවිඤ්ඤාණං -පෙ- කායවිඤ්ඤාණං. වත්ථුං පච්චයා අහෙතුකවිපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා."

Non-commercial distribution

අබ්‍යාකතෙන අකුසලයෙහි කතීඃපායයෙන් ව්‍යවස්ථාපන මනොද්වාරාවර්ජනාදි -පෙ- උපදනාවූ ද චුතිචිත්තයෙන් -පෙ- උපදනාවූ ද හෘදයවස්තුව පුරේජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනාවූ මෝහමූලද්වයයෙහි මෝහය ලැබේ. විභඞ්ගය මෙසේ ය. අබ්‍යාකතං -පෙ- න හෙතුපච්චයා ආරම්මණපච්චයා, වත්ථුං පච්චයා විචිකිච්ඡාසහගතො උද්ධච්චසහගතො මොහො.

අකුසලාබ්‍යාකතෙන අකුසලයෙහි කතීඃපායයෙන් මෝහමූලසිත් දෙක ය චෛතසික තුදුස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- චුතිචිත්තයෙන් -පෙ- පුරේජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට ද උපදනා විචිකිච්ඡාසහගත උද්ධච්චසහගත දෙසිතෙහි මෝහය ලැබේ. විභඞ්ගය මෙසේ ය. අකුසලඤ්ච අබ්‍යාකතඤ්ච -පෙ- න හෙතුපච්චයා ආරම්මණ පච්චයා, විචිකිච්ඡාසහගතෙ උද්ධච්චසහගතෙ ඛන්ධෙ ච වත්ථුං ච පච්චයා විචිකිච්ඡාසහගතො උද්ධච්ච සහගතො මොහො.

සහේතුකචිත්තජරූපයෝ ය සහේතුකප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොවුහු ආරම්මණප්‍රත්‍යය බැහැර කෙරෙති. එ බැවින් අනුලෝම පච්චනියයෙහි **"හෙතුපච්චයා න ආරම්මණෙ පඤ්ච"** යි වදළ සේක. පටිච්ච වාරය අනුව විස්තර කරනු.

අහේතුකචිත්තජ අහේතුකප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ රූපයෝ ප්‍රත්‍යය දෙක ම බැහැර කෙරෙති. පච්චනියයෙහි **'එකං'** පටිච්චවාරය අනුව විස්තර කරනු.

මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ හේතු ආරම්මණ දෙක්හි ම ප්‍රත්‍යයෝත්පන්නයෝය. එ බැවින් ඒ ධර්මයෝ මේ අනුලෝම වාරයෙහි **"හෙතුපච්චයා ආරම්මණෙ සත්ත"** යි වදාරන ලදහ. ආරම්මණවිභඞ්ගය අනු ව විස්තර කරනු.

හේතුමූලක අධිපතිදුකයෙහි හේතුප්‍රත්‍යය බැහැර කිරීමක් නැත. අධිපතිධර්මයෝ ම අධිපතිප්‍රත්‍යය නො ලැබෙන අවස්ථාවෙහි මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත අකුශල මහාකුශල මහාක්‍රියා සහේතුක ලෞකිකවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය නිරාධිපති සහේතුක චිත්තජරූපයෝ ය, සහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයෝ ය යන මොවුහු අධිපතිප්‍රත්‍යය බැහැර කෙරෙති. **'හෙතුපච්චයා න අධිපතියා සත්තරස'** කුසල පදයේ වාර තුන හා අකුසලපදයේ වාර තුන ද අබ්‍යාකතපදයෙහි ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි රූපවාර තුන ද පටිච්චවාරයෙහි මෙන් විස්තර කරනු. වස්තුරූපවාරයෙහි කතීඃපායයෙන් ප්‍රතිසන්ධ්‍යාදි පූර්වපූර්වචිත්තයන් හා ද චුතිචිත්තයෙන්

Non-commercial distribution

සතොළොස් වන චිත්තය හා ද උපදනා හෘදය වස්තුව පූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාක්‍රියා අට ය සැම කල්හි අධිපති ලැබෙන මහද්ගතක්‍රියා නවය ය ඵලසිත් සතර ය යන මොවුන් කෙරෙහි වූ මහාක්‍රියා අට ය අරූපවිපාක වර්ජිත සහේතුක ලෞකික විපාක සතොළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්. විභඞ්ගය හේතුව අනුව උදුරනු.

අබ්‍යාකතෙන කුසලයෙහි කතීඃපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්-වාරාවර්ජනාදි -පෙ- චුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා ද උපදනා හෘදයවස්තුව පූර්වජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුසල් අට ය සැම කල්හි අධිපති ලැබෙන මහද්ගතකුශල නවය ය මාර්ගසිත් සතර ය යන මොවුන් ගේ අධිපති ධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුසල් අට ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්.

අබ්‍යාකතෙන අකුසලයෙහි කතීඃපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්-වාරාවර්ජනාදි -පෙ- චුතිචිත්තයෙන් -පෙ- හෘදයවස්තුව පූර්වජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා පඤ්චවෝකාර භූමියෙහි අධිපති ලැබෙන අවස්ථාවෙහි වූ ලෝභමූල ද්වේෂමූල චිත්තක්ෂණයන්හි ලැබෙන අධිපති ධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි වූ අකුසල් සිත් දොළොස ය මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්සය යන අවයව වූ ද සමූහ වූ ද නාමසකන්ධයෝ ලැබෙත්. විභඞ්ගය හේතු විභඞ්ගය අනුව උදුරනු.

අබ්‍යාකතෙන කුසලාබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- චුතිචිත්තයෙන් -පෙ- හෘදයවස්තුව පූර්වජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය නො ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුසල් අට ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් විසින් උපදවන මහාභූතයන් සහජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා නිරාධිපති චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්. (අධිපති ධර්ම ගත හොත් සාධිපති චිත්තජ රූපයන් ද ගන්නට වන බැවින් අධිපති ධර්ම නො ගන්නා ලදී.)

අබ්‍යාකතෙන අකුසලාබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- චුතිචිත්තයෙන් -පෙ- හෘදයවස්තුව පූර්වජාත-

Non-commercial distribution

නිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා පඤ්චවෝකාරභූමියෙහි අධිපති නො ලැබෙන අවස්ථාවෙහි වූ අකුසල් සිත් දෙළොස ය මෝහමූලද්වයෙහි මෝහවර්ජිත චෛතසික සත්විස්සය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන මහාභූතයන් සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා නිරාධිපති චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්.

මෝහමූලද්වයෙහි මෝහයය, අහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධ-යෝ ය, අහේතුක චිත්තජරූපයෝ ය, අහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයෝ ය යන මොවුහු, පච්චනීයයෙහි '**න හෙතුපච්චයා නාධිපතියා චත්තාරි**'

අධිපතිධර්ම වර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්ධයෝ ය සාධිපතිචිත්තජරූපයෝ ය යන මොවුහු, අනුලෝමයෙහි '**හෙතුපච්චයා අධිපතියා සත්තරස**' අධිපති විභඞ්ගය අනුව විස්තර කරනු.

ප්‍රත්‍යයන් බැහැර කිරීමෙහි පටිච්චවාර පච්චයවාර දෙක්හි වෙනසක් නැත්තේ ය. නාමස්කන්ධයන් ලැබෙන තන්හි වාරසඞ්ඛ්‍යාව පමණක් වෙනස් වේ. රූප විෂයෙහි සඞ්ඛ්‍යා වෙනසක් ද නැත්තේ ය. කියන ලද ක්‍රමයෙන් පටිච්චවාරයෙහි මෙන් අවිගතය දක්වා යෙදෙන පරිදි ප්‍රත්‍යයන් බැහැර කරමින් විස්තර කරනු. ප්‍රත්‍යයන් බැහැර කරමින් මතු දැක්වෙන පරිදි සඞ්ඛ්‍යා උදුරනු.

න හෙතුපච්චයා ආරම්මණෙ චත්තාරි, අනන්තරෙ චත්තාරි, සමනන්තරෙ චත්තාරි, අඤ්ඤමඤ්ඤෙ චත්තාරි, උපනිස්සයෙ චත්තාරි, පුරෙජාතෙ චත්තාරි, ආසෙවනෙ චත්තාරි, කම්මෙ චත්තාරි, විපාකෙ එකං ආහාරෙ චත්තාරි, ඉන්ද්‍රියෙ චත්තාරි, ඣානෙ චත්තාරි, මග්ගෙ තීණි, සම්පයුත්තෙ චත්තාරි, විප්පයුත්තෙ චත්තාරි, අත්ථියා චත්තාරි, නත්ථියා චත්තාරි, විගතෙ චත්තාරි, අවිගතෙ චත්තාරි.

හෙතුපච්චයා න ආරම්මණෙ පඤ්ච, න අධිපතියා සත්තරස, න අනන්තරෙ පඤ්ච, න සමනන්තරෙ පඤ්ච, න අඤ්ඤමඤ්ඤෙ පඤ්ච, න උපනිස්සයෙ පඤ්ච, න පුරෙජාතෙ සත්ත, න පච්ඡාජාතෙ සත්තරස, න ආසෙවනෙ සත්තරස, න කම්මෙ සත්ත, න විපාකෙ සත්තරස, න සම්පයුත්තෙ පඤ්ච, න විප්පයුත්තෙ තීණි, නො නත්ථියා පඤ්ච, නොවිගතෙ පඤ්ච.

"න කම්මෙ සත්ත" යනු කුසලෙන කුසලය ය, අකුසලෙන අකුසලය ය, අබ්‍යාකතෙන අබ්‍යාකතය ය, අබ්‍යාකතෙන කුසලය ය, අබ්‍යාකතෙන අකුසලය ය, කුසලාබ්‍යාකතෙන කුසලය ය, අකුසලා-බ්‍යාකතෙන අකුසලය යන මොහු ය.

Non-commercial distribution

කුසලපද අකුසලපද අබ්‍යාකතපදයන්හි ප්‍රවෘත්තිකාලයෙහි අභිධෙය පටිච්චවාරයෙහි මෙනි. වස්තුරූපවාරයෙහි කතිඃපායයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- චුතිචිත්තයෙන් -පෙ- හෘදයවස්තුව පූර්වජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා සහේතුකක්‍රියා සනොළොසෙහි චේතනාවෝ ලැබෙත්. විභඞ්ගය "කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පච්චයා කිරියාබ්‍යාකතා චෙතනා" යනුයි.

අබ්‍යාකතෙන අකුසලයෙහි කතිඃපායයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- චුතිචිත්තයෙන් -පෙ- හෘදයවස්තුව පූර්වජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක් විස්සෙහි චේතනාවෝ ලැබෙත්. විභඞ්ගය "වත්ථුං පච්චයා කුසලා චෙතනා" යනුයි. අබ්‍යාකතෙන අකුසලයෙහි අකුසල චේතනා ගන්නේ ය. විභඞ්ගය "වත්ථුං පච්චයා අකුසලා චෙතනා" යනු යි.

කුසලාබ්‍යාකතෙන කුසලයෙහි කතිඃපායයෙන් පඤ්චවෝකාර-භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්ස ය චේතනා වර්ජිත චෛතසික සන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ ද ව්‍යවස්ථාපන -පෙ- චුතිචිත්තයෙන් -පෙ- හෘදයවස්තුව පූර්වජාතනිඃශ්‍රයප්‍රත්‍යයකොට උපදනා වූ ද චේතනාවෝ ලැබෙත්. විභඞ්ගය "කුසලෙ ඛන්ධෙ ච වත්ථුං ච පච්චයා කුසලා චෙතනා" යනුයි. අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය ව්‍යක්තානුසාරයෙන් විස්තර කරනු.

න හෙතුපච්චයා න ආරම්මණෙ එකං, න අධිපතියා චත්තාරි, න අනන්තරෙ එකං, න සමනන්තරෙ එකං, න අඤ්ඤමඤ්ඤෙ එකං, න උපනිස්සයෙ එකං, න පුරෙජාතෙ ද්වෙ, න ආසෙවනෙ චත්තාරි, න කම්මෙ එකං, න විපාකෙ චත්තාරි, න ආහාරෙ එකං, න ඉන්ද්‍රියෙ එකං, න ඣානෙ එකං, න මග්ගෙ එකං, න සම්පයුත්තෙ එකං, න විප්පයුත්තෙ ද්වෙ, නො නත්ථියා එකං, නො විගතෙ එකං.

හෙතුපච්චයා ආරම්මණෙ සත්ත, අධිපතියා සත්තරස, අනන්තරෙ සත්ත, සමනන්තරෙ සත්ත, සහජාතෙ සත්තරස, අඤ්ඤමඤ්ඤෙ සත්ත, නිස්සයෙ සත්තරස, උපනිස්සයෙ සත්ත, පුරෙජාතෙ සත්ත, ආසෙවනෙ සත්ත, කම්මෙ සත්තරස, විපාකෙ එකං, ආහාරෙ සත්ත, ඉන්ද්‍රියෙ සත්තරස, ඣානෙ සත්තරස, මග්ගෙ සත්තරස, සම්පයුත්තෙ සත්ත, විප්පයුත්තෙ සත්තරස, අත්ථියා සත්තරස, නත්ථියා සත්ත, විගතෙ සත්ත, අවිගතෙ සත්තරස, ප්‍රත්‍යයන් බැහැර කොට මෙසේ විභඞ්ගසඞ්ඛ්‍යා උදුරනු.

*Non-commercial distribution*

මතුවාරයන්හි ද ප්‍රත්‍යය බැහැර කිරීමෙහි වෙනසක් නැත. පටිච්චවාරයෙහි මෙන් ම කරනු. නාමස්කන්ධ විෂයෙහි සඞ්ඛ්‍යාව වෙනස් වන තැන් පමණක් මතු දක්වනු ලැබේ. හෙතුපච්චයා ආරම්මණපච්චයා අධිපතියා සත්ත. අභිධෙය අධිපතිධර්ම වර්ජිත දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ ය.

හෙතුපච්චයා ආරම්මණපච්චයා අනන්තරෙ සත්ත, සමනන්තරෙ සත්ත, සහජාතෙ සත්ත, අඤ්ඤමඤ්ඤෙ සත්ත, නිස්සයෙ සත්ත, උපනිස්සයෙ සත්ත, අභිධෙය මෝහමූලද්වයයෙහි මෝහ වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය.

පුරෙජාතෙ සත්ත, අභිධෙය පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ මෝහමූලද්වයෙහි මෝහය හා අරූපවිපාක ද වර්ජිත වූ සහේතුක ප්‍රවෘත්තිනාමස්කන්ධයෝ ය.

ආසෙවනෙ සත්ත, අභිධෙය මෝහමූලද්වයෙහි මෝහවර්ජිත අකුශල මහාකුශල මහාක්‍රියා ද්විතියාදි ජවනයෝ ය, මහද්ගත කුශල මහද්ගත ක්‍රියාවෝ ය, ඵල සිත් සතර ය යන නාමස්කන්ධයෝ ය.

කම්මෙ සත්ත, අභිධෙය මෝහමූලද්වයෙහි මෝහය හා කුශලාකුශලක්‍රියා චේතනා ද වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය. විපාකෙ එකං, අභිධෙය සහේතුක විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය.

ආහාරෙ සත්ත, ඉන්ද්‍රියෙ සත්ත, ඣානෙ සත්ත, සම්පයුත්තෙ සත්ත, අභිධෙය මෝහමූලද්වයයෙහි මෝහ වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය.

විප්පයුත්තෙ සත්ත, මෝහමූලද්වයෙහි මෝහය හා අරූප විපාක වර්ජිත පඤ්චවෝකාර ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය.

අත්ථියා සත්ත, විගතෙ සත්ත, අවිගතෙ සත්ත අභිධෙය මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත සහේතුක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය.

හෙතුපච්චයා ආරම්මණපච්චයා අධිපතිපච්චයා අනන්තරෙ සත්ත, සමනන්තරෙ සත්ත, සහජාතෙ සත්ත, අඤ්ඤමඤ්ඤෙ සත්ත, නිස්සයෙ සත්ත, උපනිස්සයෙ සත්ත, අභිධෙය අධිපතිධර්ම වර්ජිත දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ ය.

පුරෙජාතෙ සත්ත, අභිධෙය පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ ය.

Non-commercial distribution

ආසෙවනෙ සත්ත, අභිධෙය අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, නියතයෙන් අධිපති ලැබෙන මහද්ගත කුශල මහද්ගත ක්‍රියා ලෝකෝත්තරකුශල නාමස්කන්ධයෝය යන මොහු ය.

කම්මෙ සත්ත, අභිධෙය අධිපතිධර්ම හා කුශලාකුශලක්‍රියා චේතනා ද වර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්ධයෝ ය.

විපාකෙ එකං, අභිධෙය අධිපතිධර්ම වර්ජිත ඵල නාමස්කන්ධයෝ ය.

ආහාරෙ සත්ත, ඉන්ද්‍රියෙ සත්ත, ඣානෙ සත්ත, මග්ගෙ සත්ත, සම්පයුත්තෙ සත්ත. අභිධෙය අධිපතිධර්ම වර්ජිත දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ ය.

විප්පයුත්තෙ සත්ත, අභිධෙය පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අධිපතිධර්ම වර්ජිත දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ ය.

අත්ථියා සත්ත, නත්ථියා සත්ත, විගතෙ සත්ත, අවිගතෙ සත්ත, අභිධෙය අධිපති ධර්ම වර්ජිත දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ ය. හේතුවෙහි පටන් උපනිඃශ්‍රය දක්වා ප්‍රත්‍යයන් මුල් කොට යෙදෙන වාරවල ද වෙනසක් නැත්තේ ය.

හෙතුපච්චයා -පෙ- උපනිස්සය පච්චයා පුරෙජාත පච්චයා ආසෙවනෙ තීණි, අභිධෙය පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහා කුශල මහාක්‍රියා ද්විතියාදි ජවනයෝ ය, මහද්ගතකුශල මහද්ගත ක්‍රියා ලෝකෝත්තර කුශලයෝ ය යන නාමස්කන්ධයෝ ය.

කම්මෙ තීණි, අභිධෙය පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපති ධර්ම හා කුශලාකුශලක්‍රියා චේතනා ද වර්ජිත දෙපනස් සාධිපතිජවන නාමස්කන්ධයෝ ය.

විපාකෙ එකං, අභිධෙය පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අධිපතිධර්ම වර්ජිත ඵලනාමස්කන්ධයෝ ය.

ආහාරෙ සත්ත, ඉන්ද්‍රියෙ සත්ත, ඣානෙ සත්ත, මග්ගෙ සත්ත, සම්පයුත්තෙ සත්ත, විප්පයුත්තෙ සත්ත, අත්ථියා සත්ත, නත්ථියා සත්ත, විගතෙ සත්ත, අවිගතෙ සත්ත, අභිධෙය පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අධිපතිධර්මවර්ජිත දෙපනස් සාධිපති ජවන නාමස්කන්ධයෝ ය.

Non-commercial distribution

හෙතුපච්චයා -පෙ- පුරෙජාතපච්චයා ආසෙවනපච්චයා කම්මෙ සත්ත, අභිධෙය පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම හා චේතනා ද වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහදගතකුශල මහද්ගත ක්‍රියා ලෝකෝත්තර කුශලයෝ ය යන නාමස්කන්ධයෝ ය.

හෙතුපච්චයා -පෙ- පුරෙජාතපච්චයා ආසෙවනපච්චයා ආහාරෙ සත්ත, -පෙ- අවිගතෙ සත්ත, අභිධෙය පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම වර්ජිත ලෝභමූල ද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතකුශල මහද්ගත-ක්‍රියා ලෝකෝත්තර කුශලයෝ ය යන නාමස්කන්ධයෝ ය.

හෙතුපච්චයා -පෙ- පුරෙජාතපච්චයා ආසෙවනපච්චයා කම්මපච්චයා ආහාරෙ සත්ත, අවිගතෙ සත්ත, අභිධෙය පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි අධිපතිධර්ම හා චේතනා වර්ජිත ලෝභමූලද්වේෂමූල මහාකුශල මහාක්‍රියා ද්විතියාදි ජවනයෝ ය, මහද්ගතකුශල මහද්ගත ක්‍රියා ලෝකෝත්තර කුශල යෝ ය යන නාමසකන්ධයෝ ය.

හෙතු -පෙ- නත්ථිපච්චයා විගතපච්චයා අවිගතෙ සත්ත, අභිධෙය පෙර පරිදි ම ය.

හෙතු -පෙ- පුරෙජාත කම්ම විපාකපච්චයා ආහාරෙ එකං, අභිධෙය පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අධිපතිධර්ම වර්ජිත ඵල නාමස්කන්ධයෝ ය. හෙතු -පෙ- විපාක ආහාර ඉන්ද්‍රිය, -පෙ- විගත පච්චයා අවිගතෙ එකං, අභිධෙය පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අධිපතිධර්ම වර්ජිත ඵල නාමස්කන්ධයෝ ය. හේතුමූලකය නිමි. ආරම්මණ අධිපති ආදි මූලක වාරයන් ද වුක්තා-නුසාරයෙන් විස්තර කරනු.

**පච්චයානුලෝම වාරය නිමි.**

*Non-commercial distribution*

පච්චයවාරයෙහි

# පච්චය පච්චනීය වාර පාලිය.

අකුසලං ධම්මං පච්චයා අකුසලො ධම්මො උප්පජ්ජති න හෙතු පච්චයා, විචිකිච්ඡාසහගතෙ උද්ධච්චසහගතෙ ඛන්ධෙ පච්චයා විචිකිච්ඡාසහගතො උද්ධච්චසහගතො මොහො.

අබ්‍යාකතං ධම්මං පච්චයා අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න හෙතු පච්චයා, අහෙතුකං විපාකාබ්‍යාකතං කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පච්චයා තයො ඛන්ධා චිත්තසමුට්ඨානඤ්ච රූපං, -පෙ- ද්වෙ ඛන්ධෙ පච්චයා ද්වෙ ඛන්ධා චිත්තසමුට්ඨානඤ්ච රූපං. අහෙතුක පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතං එකං ඛන්ධං පච්චයා තයො ඛන්ධා කටත්තා ච රූපං, -පෙ- ද්වෙ ඛන්ධෙ පච්චයා ද්වෙ ඛන්ධා කටත්තා ච රූපං ඛන්ධෙ පච්චයා වත්ථු, වත්ථුං පච්චයා ඛන්ධා, එකං මහාභූතං පච්චයා තයො මහාභූතා, -පෙ- මහාභූතෙ පච්චයා චිත්තසමුට්ඨානං රූපං, කටත්තා රූපං, උපාදය රූපං. බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං පච්චයා තයො මහාභූතා, -පෙ- මහාභූතෙ පච්චයා කටත්තාරූපං උපාදයරූපං, චක්ඛායතනං පච්චයා චක්ඛුවිඤ්ඤාණං, -පෙ- කායායතනං පච්චයා කායවිඤ්ඤාණං, වත්ථුං පච්චයා අහෙතුකවිපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා, අබ්‍යාකතං ධම්මං පච්චයා අකුසලො ධම්මො උප්පජ්ජති න හෙතුපච්චයා, වත්ථුං පච්චයා විචිකිච්ඡාසහගතො උද්ධච්ච සහගතො මොහො.

අකුසලඤ්ච අබ්‍යාකතඤ්ච ධම්මං පච්චයා අකුසලො ධම්මො උප්පජ්ජති න හෙතුපච්චයා, විචිකිච්ඡා සහගතෙ උද්ධච්චසහගතෙ ඛන්ධෙ ච වත්ථුං ච පච්චයා විචිකිච්ඡාසහගතො උද්ධච්චසහගතො මොහො.

කුසලං ධම්මං පච්චයා අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න ආරම්මණපච්චයා, කුසලෙ ඛන්ධෙ පච්චයා චිත්තසමුට්ඨානං රූපං. යථා පටිච්චවාරෙ න ආරම්මණපච්චයා එවං විත්ථාරෙතබ්බං.

කුසලං ධම්මං පච්චයා කුසලො ධම්මො උප්පජ්ජති න අධිපතිපච්චයා, කුසලං එකං ඛන්ධං පච්චයා, තීණි, අකුසලං ධම්මං පච්චයා තීණි. අබ්‍යාකතං ධම්මං පච්චයා පටිසන්ධික්ඛණෙ -පෙ- අබ්‍යාකතං, පරිපුණ්ණං කාතබ්බං. බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං පච්චයා -පෙ- චක්ඛායතනං පච්චයා චක්ඛුවිඤ්ඤාණං -පෙ- කායායතනං පච්චයා කායවිඤ්ඤාණං. වත්ථුං පච්චයා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා.

Non-commercial distribution

අබ්‍යාකතං ධම්මං පච්චයා කුසලො ධම්මො උප්පජ්ජති න අධිපතිපච්චයා, වත්ථුං පච්චයා කුසලා ඛන්ධා, -පෙ- යථා අනුලොමෙ සහජාත පච්චයා එවං ගණෙතබ්බං.

කුසලං ධම්මං පච්චයා අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න අනන්තර පච්චයා න සමනන්තර පච්චයා, න අඤ්ඤමඤ්ඤපච්චයා, න උපනිස්සය පච්චයා න පුරෙජාතපච්චයා. යථා පටිච්චවාරෙ එවං විත්ථාරෙතබ්බං.

කුසලං ධම්මං පච්චයා කුසලො ධම්මො උප්පජ්ජති න පච්ඡාජාතපච්චයා, න ආසෙවනපච්චයා, චක්ඛායතනං පච්චයා -පෙ- න පච්ඡාජාතපච්චයං පි න ආසෙවනපච්චයං පි පරිපුණ්ණං සත්තරස. යථා අනුලොමෙ සහජාතපච්චයං එවං විත්ථාරෙතබ්බං.

කුසලං ධම්මං පච්චයා කුසලො ධම්මො උප්පජ්ජති න කම්ම පච්චයා, කුසලෙ ඛන්ධෙ පච්චයා කුසලා චෙතනා.

අකුසලං ධම්මං පච්චයා අකුසලො ධම්මො උප්පජ්ජති න කම්ම පච්චයා, අකුසලෙ ඛන්ධෙ පච්චයා අකුසලා චෙතනා.

අබ්‍යාකතං ධම්මං පච්චයා අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න කම්මපච්චයා, කිරියාබ්‍යාකතෙ ඛන්ධෙ පච්චයා කිරියාබ්‍යාකතා චෙතනා. බාහිරං ආහාරසමුට්ඨානං උතුසමුට්ඨානං එකං මහාභූතං පච්චයා -පෙ- උපාදයරූපං වත්ථුං පච්චයා කිරියාබ්‍යාකතා චෙතනා.

අබ්‍යාකතං ධම්මං පච්චයා කුසලො ධම්මො උප්පජ්ජති න කම්ම-පච්චයා, වත්ථුං පච්චයා කුසලා චෙතනා. අබ්‍යාකතං ධම්මං පච්චයා අකුසලො ධම්මො උප්පජ්ජති න කම්මපච්චයා, වත්ථුං පච්චයා අකුසලා චෙතනා.

කුසලඤ්ච අබ්‍යාකතඤ්ච ධම්මං පච්චයා කුසලො ධම්මො උප්පජ්ජති න කම්ම පච්චයා, කුසලෙ ඛන්ධෙ ච වත්ථුං ච පච්චයා කුසලා චෙතනා.

අකුසලඤ්ච අබ්‍යාකතඤ්ච ධම්මං පච්චයා අකුසලො ධම්මො උප්පජ්ජති න කම්මපච්චයා, අකුසලෙ ඛන්ධෙච වත්ථුං ච පච්චයා අකුසලා චෙතනා.

කුසලං ධම්මං පච්චයා කුසලො ධම්මො උප්පජ්ජති න විපාක පච්චයා, කුසලං එකං ඛන්ධං පච්චයා තීණි. අකුසලං ධම්මං පච්චයා අකුසලා චෙතනා.

අබ්‍යාකතං ධම්මං පච්චයා අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න විපාකපච්චයා, කිරියාබ්‍යාකතං එකං ඛන්ධං පච්චයා තයො ඛන්ධා චිත්තසමුට්ඨානඤ්ච රූපං, -පෙ- ද්වෙ ඛන්ධෙ පච්චයා ද්වෙ ඛන්ධා චිත්ත

Non-commercial distribution

සමුට්ඨානඤ්ච රූපං. එකං මහාභූතං පච්චයා තයො මහාභූතා -පෙ- මහාභූතෙ පච්චයා චිත්තසමුට්ඨානං රූපං. උපාදයරූපං, බාහිරං ආහාර සමුට්ඨානං උතුසමුට්ඨානං අසඤ්ඤසත්තානං එකං මහාභූතං පච්චයා තයො මහාභූතා -පෙ- මහාභූතෙ පච්චයා කටත්තාරූපං, උපාදයරූපං, වත්ථුං පච්චයා කිරියාබ්‍යාකතා ඛන්ධා, අබ්‍යාකතං ධම්මං පච්චයා කුසලො ධම්මො උප්පජ්ජති න විපාකපච්චයා, වත්ථුං පච්චයා කුසලා ඛන්ධා, විපාකං ඨපෙත්වා සබ්බත්ථ විත්ථාරෙතබ්බං,

අබ්‍යාකතං ධම්මං පච්චයා අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති න ආහාරපච්චයා, න ඉන්ද්‍රියපච්චයා, න ඣාන පච්චයා, චක්ඛායතනං පච්චයා චක්ඛුවිඤ්ඤාණං, -පෙ- කායායතනං පච්චයා කායවිඤ්ඤාණං, න ඣානෙ ඉමං නානාකරණං න මග්ගපච්චයා චක්ඛායතනං පච්චයා චක්ඛුවිඤ්ඤාණං -පෙ- කායායතනං පච්චයා කායවිඤ්ඤාණං වත්ථුං පච්චයා අහෙතුක විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා, න මග්ගෙ ඉමං නානාකරණං අවසෙසං යථා පටිච්චවාරෙ පච්චනියං එවං විත්ථාරෙතබ්බං.

න සම්පයුත්තපච්චයා, න විප්පයුත්තපච්චයා, නො නත්ථි පච්චයා, කුසලං ධම්මංපච්චයා අබ්‍යාකතො ධම්මො උප්පජ්ජති නො විගත පච්චයා, කුසලෙ ඛන්ධෙ පච්චයා චිත්තසමුට්ඨානං රූපං. යථා පටිච්චවාරෙ එවං විත්ථාරෙතබ්බං.

පච්චයවාරයෙහි

## පච්චය පච්චනීය වාරය.

පච්චයානුලෝමවාරයට අනතුරුව පච්චය පච්චනීයවාරය වදළ සේක. ඒ ද විභඞ්ගවාර සඞ්ඛ්‍යාවාරවශයෙන් දෙවැදෑරුම් වේ. එයින් විභඞ්ගවාරය පළමු කොට වදළ සේක. එහි ද නහේතුපච්චයවිභඞ්ගවාරාදි වශයෙන් වාර විස්සක් ඇත්තේ ය. එයින් න හේතුපච්චය විභඞ්ගවාරය පළමු කොට වදළ සේක. එහි ද අකුශලපදවාරය ය, අබ්‍යාකතපදවාරය ය, අකුශලාබ්‍යාකතපදවාරය ය යි වාර තුනක් ඇත්තේ ය. එයින් අකුශල-පදවාරය පළමු කොට වදළ සේක. ඒ මෙසේ ය. "අකුසලං ධම්මං පච්චයා -පෙ- විචිකිච්ඡාසහගතෙ උද්ධච්චසහගතෙ ඛන්ධෙ පච්චයා විචිකිච්ඡාසහගතො උද්ධච්චසහගතො මොහො" පටිච්චවාරයෙහි මෙන් අභිධෙය ගන්නේ ය.

අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි ප්‍රවෘත්තිප්‍රතිසන්ධි රූපවාරයන්හි අභිධෙය පටිච්චවාරයෙහි මෙන් ගන්නේ ය. "චක්ඛායතනං පච්චයා

Non-commercial distribution

චක්ඛුවිඤ්ඤාණං" යනාදි වස්තුරූපයන් කර්මත්වයෙන් සිටින තන්හි කර්‍මෝපායයෙන් අතීතභවාඞ්ගය හා උපදනා මධ්‍යමායුෂ්ක චක්ෂුර්වස්තුව පූර්‍වජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා චක්ෂුර්විඥානද්වය ය, සර්‍වචිත්තසාධාරණ චෛතසික සතය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයෝ ය, -පෙ- කායවිඥානද්වය ය, සර්‍වචිත්තසාධාරණ චෛතසික සත ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයෝ ය, ප්‍රතිසන්‍ධ්‍යාදි පූර්‍වපූර්‍ව චිත්තයන් හා උපදනා වූ ද ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා වූ ද පූර්‍වජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනාවූ පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ද්විපඤ්චවිඥාන වර්ජිත ප්‍රථම භවාඞ්ගාදි අහේතුක විපාක අහේතුකක්‍රියාචිත්තයෝ ය, ඡන්‍දවර්ජිත අන්‍යසමාන චෛතසික දෙළොසය ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්‍ධයෝ ය යන මොවුහු ලැබෙත්.

අබ්‍යාකතෙන අකුසලයෙහි "වත්ථුං පච්චයා විචිකිච්ඡාසහගතො උද්ධච්චසහගතො මොහො" කර්‍මෝපායයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරා වර්ජනාදි පූර්‍වපූර්‍ව චිත්තයන් හා උපදනා වූ ද ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තයන් හා උපදනා වූ ද හෘදයවස්තුව පූර්‍වජතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ විචිකිච්ඡාසහගත උද්ධච්ච-සහගත දෙසිතෙහි මෝහය ලැබේ.

අකුසලාබ්‍යාකතෙන අකුසලයෙහි කර්‍මෝපායයෙන් විචිකිච්ඡා-සහගත උද්ධච්චසහගත දෙසිතය චෛතසික තුදුස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමසකන්‍ධයන් සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව පූර්‍වජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට ද උපදනා වූ විචිකිච්ඡාසහගත උද්ධච්චසහගත දෙසිතෙහි මෝහය ලැබේ.

**න හෙතුවිභඞ්ගවාරය නිමි.**

නාරම්මණවිභඞ්ගයෙහි වාර පස ම පටිච්චවාරයෙහි මෙනි. නාධිපති විභඞ්ගවාරයෙහි කුසලපදයේ වාර තුන ද අකුසලපදයේ වාර තුන ද අබ්‍යාකතපදයෙහි ප්‍රවෘත්ති රූපවාර දෙක ද පටිච්චවාරයෙහි මෙනි. වස්තුරූපය කර්මය වන තන්හි "චක්ඛායතනං පච්චයා චක්ඛුවිඤ්ඤාණං, -පෙ- වත්ථුං පච්චයා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්‍ධා" කර්‍මෝපායයෙන් අතීත භවාඞ්ගය හා උපදනා මධ්‍යමායුෂ්ක චක්ෂුර්වස්තුව පූර්‍වජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා චක්ෂුර්විඥානද්වය ය, සර්‍වචිත්තසාධාරණ චෛතසික සත ය යන අවයව වූ ද සමූහ වූ ද

Non-commercial distribution

නාමස්කන්ධයෝ ය, -පෙ- කාය විඥානද්වය ය, සර්වචිත්තසාධාරණ චෛතසික සත ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධ්‍යාදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනා වූ ද චුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා වූ ද හෘදයවස්තුව පූර්වජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහා ක්‍රියා සිත් අට ය නියතයෙන් අධිපති ලැබෙන මහද්ගත ක්‍රියා නවය ය ඵලසිත් සතරය යන මොවුන්ගේ අධිපති ධර්මයෝ ය, අධිපති ප්‍රත්‍යය නො ලැබෙන අරූපවිපාක ද්විපඤ්චවිඥාන වර්ජිත ලෞකිකවිපාක අටොළොස ය කාමක්‍රියා එකොළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය යන මොවුහු ලැබෙත්.

අව්‍යාකතෙන කුශලයෙහි කර්‍තෘපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව පූර්වජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහා කුසල් අට ය නියතයෙන් අධිපති ලැබෙන මහද්ගතලෝකෝත්තර කුශලයෝ ය මොවුන් ගේ අධිපති ධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුසල් අට ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද, නාමස්කන්ධයෝ ය යන මොවුහු ලැබෙත්.

අව්‍යාකතෙන අකුසලයෙහි කර්‍තෘපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව පූර්වජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ ලෝභමූල සිත් අට ය ද්වේෂමූල සිත් දෙකය විචිකිත්සා වර්ජිත චෛතසික සවිස්ස ය යන මොවුන් ගේ අධිපති ධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි අකුසල්සිත් දෙළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය යන මොවුහු ලැබෙත්.

අව්‍යාකතෙන කුසලාව්‍යාකතයෙහි කර්‍තෘපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව පූර්වජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ට උපදනා වූ පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය නො ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුසල් සිත් අට ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය ඔවුන් විසින් උපදවන මහාභූතයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා නිරාධිපතිචිත්තජරූපයෝ ය යන මොවුහු ලැබෙත්. (මෙහි අධිපතිධර්මයෝ නො ගනු ලැබෙත්).

අව්‍යාකතෙන අකුසලාව්‍යාකතයෙහි කර්‍තෘපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට

Non-commercial distribution

උපදනා වූ පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය නො ලැබෙන අවස්ථාවෙහි වූ අකුසල් සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන මහාභූතයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා නිරාධිපති චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්.

කුසලාබ්‍යාකතෙන කුසලයෙහි කත්‍ථපාඨයෙන් පඤ්චවෝකාර-භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුශල් සිත් අටය, සැම කල්හි අධිපති ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුශලයෝ ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව පූර්ජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට ද උපදනා වූ අධිපති ධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුශල් අට ය චෛතසික අටතිස ය යන මොවුන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව පූර්ජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද උපදනා වූ කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය යන මොවුහු ලැබෙත්.

කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි 'අබ්‍යාකතො' යන කත්‍ථපාඨයේ අභිධෙය පටිච්චවාරයෙහි මෙනි. "කුසලො ච අබ්‍යාකතො ච" යන කත්‍ථපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය නො ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුසල් අට ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ ද ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- පූර්ජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද උපදනා මහාකුසල් අට ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ය නාමස්කන්ධයන් හා මහාභූතයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා නිරාධිපති චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්.

අකුසලාබ්‍යාකතෙන අකුසලයෙහි කත්‍ථපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි ලෝභමූලසිත් අටය ද්වේෂමූල දෙසිත ය විචිකිත්සා වර්ජිත චෛතසික සවිස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව පූර්ජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට ද උපදනා අධිපති ධර්මයෝ ය, අධිපති නො ලැබෙන අවස්ථාවෙහි අකුසල් සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයන් සහජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට ද

Non-commercial distribution

ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- පූරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොටද උපදනා අකුසල් සිත් දෙළොසය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ය යන මොවුහු ලැබෙත්.

අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි පටිච්චවාරයෙහි මෙන් රූපයන් ගන්නේ ය. අකුසලාබ්‍යාකතෙන අකුසලාබ්‍යාකතයෙහි කතිඃපායයෙන් පඤ්චවෝකාරභූමියෙහි අධිපති ප්‍රත්‍යය නො ලැබෙන අවස්ථාවෙහි අකුසල් දෙළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්ඣයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන -පෙ- හෘදයවස්තුව පූරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද උපදනා අකුසල් සිත් දෙළොස ය චෛතසික සත්විස්ස ය යන අවයව් නාමස්කන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් හා මහාභූතයන් සහජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා නිරාධිපති චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්.

## නාධිපති විභඞ්ගය නිමි.

න අනන්තර න සමනන්තර න අඤ්ඤමඤ්ඤ න උපනිස්සය විභඞ්ග වාර පස පටිච්චවාරයෙහි මෙනි. න පූරේජාත විභඞ්ගවාරයෙහි වාර සත ද පටිච්චවාරයෙහි මෙනි. න ආසේවන විභඞ්ගවාරයෙහි කුසලපදයේ වාර තුන හා අකුසලපදයේ වාර තුන ද අබ්‍යාකතපදයෙහි ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි රූප වාර තුන ද පටිච්චවාරයෙහි මෙනි. "චක්ඛායතනං පච්චයා චක්ඛුවිඤ්ඤාණං -පෙ- වත්ථුං පච්චයා විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා ඛන්ධා" යන වස්තුරූපවාරයෙහි කතිඃපායයෙන් අනිත්‍යභවාඞ්ගය හා උපදනා මධ්‍යමායුෂ්ක චක්ෂුර්වස්තුව පූරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා චක්ෂුර්විඥානද්වය ය, සර්වචිත්තසාධාරණ චෛතසික සත ය යන අවයව් වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය -පෙ- කායවිඥානද්වය ය සර්වචිත්තසාධාරණ චෛතසික සත ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, ප්‍රතිසන්ධ්‍යාදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනා වූ ද ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා වූ ද හෘදයවස්තුව පූරේජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ හසිතෝත්පාද මහාක්‍රියා ප්‍රථමජවනයෝ ය, ආවර්ජනද්වය ය, අරූපවිපාක ද්විපඤ්ච-විඥාන වර්ජිත විපාකසිත් දෙවිස්සය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයො ය යන මොවුහු ලැබෙත්.

අබ්‍යාකතෙන කුසලයෙහි කතිඃපායයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදීන් හා උපදනා වූ ද ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා වූ ද හෘදයවස්තුව පූරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යය

Non-commercial distribution

කොට උපදනා මහාකුශල ප්‍රථමජවනයෝ ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූද නාමස්කන්ධයෝ ලැබෙත්.

අබ්‍යාකතෙන අකුසලයෙහි කතිඃපායයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදීන් හා ද චුතිචිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපදනා වූද හෘදයවස්තුව පූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනාවූ දෙළොස් අකුසලයන්ගේ ප්‍රථමජවනයෝ ය චෛතසික සත්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්.

අබ්‍යාකතෙන කුසලාබ්‍යාකතයෙහි කතිඃපායයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදීන් හා ද චුතිචිත්තයෙන් සතළොස් වන චිත්තය හා ද උපදනා හෘදයවස්තුව පූර්වජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා මහාකුශල ප්‍රථමජවනයෝ ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, ඔවුන් විසින් උපදවන මහාභූතයන් සහජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා චිත්තජ රූපයෝ ය යන මොවුහු ලැබෙත්.

අබ්‍යාකතෙන අකුසලාබ්‍යාකතයෙහි කතිඃපායයෙන් ව්‍යවස්ථාපන -පෙ- පූර්වජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා වූ අකුසල ප්‍රථම ජවනයෝ ය චෛතසික සත්විස්සය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය යන ඔවුන් විසින් උපදවන මහාභූතයන් සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා චිත්තජරූපයෝය යන මොවුහු ලැබෙත්.

කුසලාබ්‍යාකතෙන කුසලයෙහි කතිඃපායයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි මහාකුශල ප්‍රථම ජවනයෝ ය. චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් සහජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන -පෙ- හෘදයවස්තුව පූර්වජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට ද උපදනා වූ මහාකුශල ප්‍රථම ජවනයෝ ය, චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්.

කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතය පටිච්චවාරයෙහි මෙනි. කුසලාබ්‍යාකතෙන කුසලාබ්‍යාකතයෙහි පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි මහාකුශල ප්‍රථමජවනයෝ ය චෛතසික අටතිස ය යන අවයවනාමස්කන්ධයන් සහජාත නිඃශ්‍රයප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව පූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද උපදනා වූ මහාකුශල ප්‍රථම ජවනයෝ ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් හා මහාභූතයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා චිත්තජරූපයෝ ය යන මොවුහු ලැබෙත්.

Non-commercial distribution

අකුසලාබ්‍යාකතෙන අකුසලයෙහි කත්තෘපාඨයෙන් අකුශල ප්‍රථම ජවනයෝ ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයන් සහජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද ව්‍යවස්ථාපන -පෙ- හෘදයවස්තුව පූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද උපදනා වූ ද්වාදශාකුශල ප්‍රථම ජවනයෝ ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්.

අකුසලාබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි පටිච්චවාරයෙහි මෙනි. අකුසලාබ්‍යාකතෙන අකුසලාබ්‍යාකතයෙහි පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අකුශල ප්‍රථමජවනයෝ ය චෛතසික සත්විස්ස ය යන අවයව නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රයප්‍රත්‍යය ද ව්‍යවස්ථාපන -පෙ- හෘදයවස්තුව පූර්වජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට ද උපදනා අකුශලප්‍රථම-ජවනයෝ ය චෛතසික සත්විස්සය යන අවයව නාමස්කන්ධයෝ ය, ඒ නාමස්කන්ධයන් හා මහාභූතයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා චිත්තජරූපයෝ ය යන මොවුහු ලැබෙත්.

## නාසේවන විභඞ්ගය නිමි.

න කම්ම විභඞ්ගයෙහි කුශලාකුශල දෙපදය පටිච්චවාරයෙහි මෙනි. අබ්‍යාකත පදයෙහි ප්‍රවෘත්ති වාර රූපවාර දෙකද පටිච්ච වාරයෙහි මෙනි. චක්ෂුරූපවාරයෙහි භවාඞ්ගොපච්ඡෙදදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනාවූ ච්‍යුතිචිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපදනා වූ හෘදය වස්තුව පූර්වජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ ක්‍රියා සිත් විස්සෙහි ඇති චේතනාවෝ ලැබෙත්.

අබ්‍යාකතෙන කුසලයෙහි කත්තෘපාඨයෙන් ව්‍යවස්ථාපන-මනෝද්වාරාවර්ජනාදි -පෙ- පූර්වජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ එක්විසි කුසල චිත්තයන්හි ඇති චේතනාවෝ ලැබෙත්.

අබ්‍යාකතෙන අකුසලයෙහි කත්තෘපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව පූර්වජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට උපදනා වූ දෙළොස් අකුසල චිත්තයන්හි චේතනාවෝ ලැබෙත්.

කුසලාබ්‍යාකතෙන කුසලයෙහි කත්තෘපාඨයෙන් පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල්සිත් එක්විස්සය චේතනාවර්ජිත චෛතසික සත්තිසය යන අවයවවූද සමූහ වූ ද නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද, ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව පූර්වජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද උපදනා වූ එක් විසි කුසලයන්හි චේතනාවෝ ලැබෙත්. "කුසලෙ ඛන්ධෙ ච වත්ථුං ච පච්චයා කුසලා චෙතනා"

Non-commercial distribution

අකුසලාබ්‍යාකතෙන අකුසලයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාර-භූමියෙහි උපදනා අවස්ථාවෙහි අකුසල්සිත් දොළොසය චේතනා වර්ජිත චෛතසික සවිස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් සහජාතනිඃශ්‍රයප්‍රත්‍යය කොට ද, ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි -පෙ- හෘදයවස්තුව පූර්වජාත නිඃශ්‍රය ප්‍රත්‍යය කොට ද උපදනා දොළොස් අකුසල චිත්තයන්හි ඇති චේතනාවෝ ලැබෙත්.

න කම්ම විභඞ්ගය නිමි.

න කම්මයෙහි කුශලාකුශල දෙපදයේ වාර සය සහජාතයෙහි මෙනි. අබ්‍යාකත පදයෙහි ප්‍රවෘත්තිවාර රූපවාරදෙක පටිච්චවාරයෙහි මෙනි. වස්තුරූපවාරයෙහි "වත්ථුං පච්චයා කිරියාබ්‍යාකතා ඛන්ධා" කතීඃපාඨයෙන් භවාඞ්ගාපච්ඡේදදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනා වූ ද චුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපදනා වූ ද හෘදයවස්තුව පූර්වජාතනිඃශ්‍රය ප්‍රත්‍යය කොට උපදනා වූ ක්‍රියාසිත් විස්ස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්. (වෙනස ඇත්තේ මේ අබ්‍යාකතපදවසානවාරයෙහි පමණෙකි. ඉතිරි වාර සොළොස ම සහජාතය මෙනි.)

අකුසලො ච අබ්‍යාකතො ච ධම්මා අබ්‍යාකතස්ස ධම්මස්ස අත්ථිපච්චයෙන පච්චයො, සහජාතං, පච්ඡාජාතං, ආහාරං, ඉන්ද්‍රියං, සහජාතා අකුසලා ඛන්ධා ච මහාභූතා ච චිත්තසමුට්ඨානානං රූපානං අත්ථිපච්චයෙන පච්චයො, පච්ඡාජාතා අකුසලා ඛන්ධා ච කබලිංකාරො ආහාරො ච ඉමස්ස කායස්ස අත්ථිපච්චයෙන පච්චයො, පච්ඡාජාතා අකුසලා ඛන්ධා ච රූපජීවිතින්ද්‍රියඤ්ච කටත්තා රූපානං අත්ථිපච්චයෙන පච්චයො.

## (නත්ථි)

කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස නත්ථිපච්චයෙන පච්චයො, පුරිමා පුරිමා කුසලා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ඛන්ධානං නත්ථි පච්චයෙන පච්චයො, සංඛිත්තං. යථා අනන්තර පච්චයං එවං විත්ථාරෙ තබ්බං.

## (විගත)

කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස විගතපච්චයෙන පච්චයො, පුරිමා පුරිමා කුසලා ඛන්ධා පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ඛන්ධානං විගතපච්චයෙන පච්චයො, සංඛිත්තං. යථා අනන්තර පච්චයං එවං විත්ථාරෙතබ්බං.

## (අවිගත)

කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අවිගතපච්චයෙන පච්චයො, කුසලො එකො ඛන්ධො තිණ්ණන්නං ඛන්ධානං අවිගත පච්චයෙන පච්චයො, තයො ඛන්ධා එකස්ස ඛන්ධස්ස අවිගත පච්චයෙන පච්චයො, ද්වෙ ඛන්ධා ද්වින්නං ඛන්ධානං අවිගතපච්චයෙන පච්චයො, සංඛිත්තං. යථා අත්ථිපච්චයං එවං විත්ථාරෙතබ්බං.

**පඤ්හාවාරස්ස විභඞ්ගො.**

Non-commercial distribution

# පඤ්හාවාර විභඞ්ගයේ සන්නය

## 1. හෙතුප්‍රත්‍යය විභඞ්ගවාරය.

සම්ප්‍රයුක්තවාරයට අනතුරු ව පඤ්හාවාරය වදාළ සේක. එහි පච්චයානුලෝම වාරය ය, පච්චය පච් චනීය වාරය ය, පච්චයානුලෝම පච්චනීය වාරය ය, පච්චය පච්චනීයානුලෝම වාරයයයි වාර සතරක් ඇත්තේ ය. එයින් පච්චයානුලෝමවාරය පළමු කොට වදාළ සේක. එද විභඞ්ගවාර සඞ්ඛ්‍යාවාරවශයෙන් දෙවැදෑරුම් වේ. එයින් විභඞ්ගවාරය පළමු කොට වදාළ සේක. එද හේතුපච්චය විභඞ්ග වාරාදි වශයෙන් සූවිසි වැදෑරුම් වේ. එයින් හේතුපච්චය විභඞ්ග වාරය පළමු කොට වදාළ සේක. එහි ද කුසලපදය අකුසල පදය අබ්‍යාකතපදය යි පද තුනක් ඇත්තේ ය. එයින් කුශලපද වාරය පළමු කොට වදාළ සේක. එහි ද කුසලපදවසානවාරයය, අකුසලපදවසානවාරය ය, අබ්‍යාකත පදවසාන වාර යයි වාර තුනක් ඇත්තේය. එයින් කුසලපදවසාන වාරය පළමු කොට වදාළ සේක. එය ද වීථි අනුවාද වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් වීථිය පළමුකොට වදාළ සේක. කෙසේ ද? යත් "**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො**" යනුවෙනි. වීථියට අනතුරුව අනුවාදය වදාළ සේක. කෙසේද යත්, "**කුසලා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං හෙතුපච්චයෙන පච්චයො**" යනුවෙනි.

**පදාර්ථ:**

කුසලො, නිරවද්‍ය ඉෂ්ටවිපාක ලක්‍ෂණය ඇත්තා වූ: ධම්මො, නිඃසත්ත්ව නිර්ජීව ස්වභාවය: කුසලස්ස, නිරවද්‍ය ඉෂ්ටවිපාක ලක්‍ෂණය ඇත්තා වූ: ධම්මස්ස, නිඃසත්ත්ව නිර්ජීව ස්වභාවයට: හෙතුපච්චයෙන. හේතුප්‍රත්‍යය ශක්තියෙන්: පච්චයො: උපකාරක වේ. කුසලො, කුසල් වූ: හෙතු, හේතූහු: සම්පයුත්තකානං. එකෝත්පාදදිභාවයෙන් ඔවුනොවුන් මිශ්‍රත්වයට පැමිණෙන්නා වූ: ධම්මානං, කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිසය යන ධර්මයන්ට: හෙතුපච්චයෙන, හේතුප්‍රත්‍යය ශක්තියෙන්: පච්චයො, උපකාරක වේ.

**අභිධෙයාර්ථ:**

"කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො" යන වීථිපාලියෙහි "කුසලො ධම්මො" යන කර්තෘපාඨයෙන් කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන මොවුන් ගේ ද්විහේතුක චිත්තක්‍ෂණයන්හි ඇති අලෝභ අදෝස දෙක ය, ත්‍රිහේතුක චිත්තක්‍ෂණයන්හි ඇති අලෝභ අදෝස අමෝහ තුන ය යන ප්‍රත්‍ය ධර්මයෝ ලැබෙත්. "කුසලස්ස ධම්මස්ස"

Non-commercial distribution

යන සම්ප්‍රදනපාඨයෙන් කුසල් සිත් එක් විස්ස ය චෛතසික අටතිස ය යන සම්ප්‍රයුක්ත ධර්මයෝ ලැබෙත්. "හේතුපච්චයෙන" යන කරණ පාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන කුශලහේතුත්‍රයයෙහි එක් වර ලැබෙන හේතු අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය මග්ග සම්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති දශයෙන් හේතුශක්තිය ලැබේ.

ස්කන්ධවාරඃ

"කුසලා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං" යන අනුවාද පාලියෙහි ද්විහේතුක චිත්තයන් ගේ වශයෙන් කියන කල්හි "කුශලා හෙතු" යනුවෙන් අලෝභය හා "සම්පයුත්තකානං ඛන්ධානං" යනුවෙන් සම්පයුක්ත ස්කන්ධයන් ගන්නා එක්වාරයක් ද, එසේම අදෝසය හා සම්ප්‍රයුක්ත ස්කන්ධයන් ගන්නා එක්වාරයක් ද. අලෝභ අදෝස දෙක හා සම්ප්‍රයුක්තසකන්ධයන් ගන්නා එක් වාරයක් ද වේ. ත්‍රිහේතුක චිත්තවිෂයෙහි අලෝභය හා සම්ප්‍රයුක්ත-ස්කන්ධයන් ගන්නා එක් වාරයක් ද, අදෝසය හා සම්ප්‍රයුක්තස්කන්ධයන් ගන්නා එක් වාරයක් ද, අමෝහය හා සම්ප්‍රයුක්තස්කන්ධයන් ගන්නා එක් වාරයක් ද, අලෝභ අදෝසයන් හා සම්ප්‍රයුක්තස්කන්ධන් ගන්නා එක්වාරයක් ද අලෝභ අමෝහයන් හා සම්ප්‍රයුක්තස්කන්ධයන් එක්වාරයක් ද, අදෝස අමෝහයන් හා සම්ප්‍රයුක්ත ස්කන්ධයන් ගන්නා එක් වාරයක් ද අලෝභ අදේස අමෝහයන් හා සම්ප්‍රයුක්තස්කන්ධයන් ගන්නා එක්වාරයක් ද වේ. මෙසේ ද්විහේතුක චිත්තවිෂයෙහි තිදෙනකු වූ ස්කන්ධවාරයන්ගේ වශයෙන් ද ත්‍රිහේතුක චිත්ත විෂයෙහි සත්දෙනෙකු වූ ස්කන්ධවාරයන් ගේ වශයෙන් ද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වීම "හෙතුපච්චයෙන" යන පාඨයෙන් දැක්වූ සේක.

ප්‍රත්‍යය වන ආකාරයඃ

ලෞකික සිත් එක් අසූව ය, චෛතසික දෙපනස ය, රූප අටවිස්ස ය, ප්‍රඥප්තිය ය යන ෂඩාරම්මණයන් අතුරෙන් යම්කිසිවක් අරමුණු කොට ඥානවිප්‍රයුක්ත කාමාවචර කුශලය උපදනා කල්හි තමා ගේ ප්‍රතිසන්ධි-චිත්තය හා භූමිජාති සම්ප්‍රයුක්තධර්ම සංසකාර ආරම්මණයන් ගේ වශයෙන් සමාන වූ එකුන් විසි භවාඞ්ගචිත්තයන් අතුරෙන් එක් සිතක් කර්ම කර්මනිමිත්ත ගතිනිමිත්තයන් අතුරෙන් යම්කිසිවක් අරමුණු කොට භවාඞ්ගචලන භවාඞ්ගුපච්ඡේද වශයෙන් දෙවරක් ඉපද නිරුද්ධ වේ. අනතුරු ව ලෞකික සිත් එක් අසූව ය, චෛතසික දෙපනස ය, රූප අටවිස්ස ය, ප්‍රඥප්තිය ය යන ෂඩාරම්මණයන් අතුරෙන් යම් කිසිවක් අරමුණු කොට මනෝද්වාරාවර්ජන චිත්තය උපදී. අනතුරු ව මහාකුශල ඥානවිප්‍රයුක්ත සිත් සතර අතුරෙන් එක් සිත් සත්වරක් ජවන කෘත්‍යයෙන් උපදී. අනතුරු

Non-commercial distribution

ව විභූතාරම්මණ විථියක් වේ නම් එකොළොස් තදරමණ චිත්තයන් අතුරෙන් යම්කිසි සිතක් තදරම්මණකෘත්‍යයෙන් දෙවරක් ඉපිද නිරුධ වේ. අවිභූතාරම්මණ වීථියක් වේ නම් ජවනයට අනතුරුව එකුන්විසි භවාඞ්ගචිත්තයන්ගෙන් යම්කිසි සිතක් භවාඞ්ගකෘතයෙන් උපදී. එසේ උපදනා කාමාවචර ඥානවිප්‍රයුක්ත කුශල ජවනයන් ගේ එක් එක් චිත්තක්‍ෂණයක ඇති අලෝභය ද අදෝසය ද අලෝභාදෝස දෙක ද ප්‍රත්‍යයභාවයෙන් ගෙන සම්ප්‍රයුක්තස්කන්ධයන් ප්‍රත්‍යයෝත්පන්න භාවයෙන් ගෙන එක එකක් වූ ද දෙකක් වූ ද හේතූන් සම්ප්‍රයුක්ත ධර්‍මයන්ට ප්‍රත්‍යයවීම "කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්ච-යෙන පච්චයො" යනුවෙන් වදළ සේක.

අභිඥාමාර්‍ගී අභිඥාඵල වර්ජිත සිත් සත් අසූව ය චෛතසික දෙපනස ය රූප අටවිස්ස ය නිර්‍වාණය ය ප්‍රඥප්තිය ය යන ෂඩාරම්මණයන් අතුරෙන් යම්කිසිවක් අරමුණු කොට මහාකුශල ඥානසම්ප්‍රයුක්ත ජවනය උපදනා කල්හි භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡෙදයන්ට අනතුරුව ඉහත කී ෂඩාරම්මණ ධර්‍මයන් ගෙන් යම් කිසිවක් අරමුණු කොට මනෝද්වාරාවර්ජනය ද ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් සතර අතුරෙන් යම්කිසිවක් ජවනකෘත්‍යයෙන් පිළිවෙළින් සත්වරක් ද ඉපද නිරුධ වූ පසු විභූතාරම්මණ වීථියක් වේ නම් එකොළොස් තදරම්මණයන් අතුරෙන් යම්කිසි තදරම්මයක් දෙවරක් ඉපද නිරුද්ධ වේ. අවිභූතාරම්මණවිථියක් වේ නම් ජවනයට අනතුරු ව භවාඞ්ග එකුන්විස්ස අතුරෙන් යම්කිසි සිතක් භවාඞ්ගකෘත්‍යයෙන් උපදී. එසේ උපදනා කල්හි මහාකුශල ඥාණසම්ප්‍රයුක්ත චිත්තක්‍ෂණයන්හි ලැබෙන අලෝභය ද, අදෝසය ද, අමෝහය ද, අලෝභ අදෝස දෙක ද අදෝස අමෝහ දෙක ද, අලෝභ අදෝස අමෝහ තුන ද ප්‍රත්‍යය වශයෙන් ගෙන සම්ප්‍රයුක්තධර්‍මයන් ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් ගෙන "කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො" යනු වදළ සේක. මේ ක්‍රමයෙන් මහද්ගතලෝකෝත්තර කුශලයන් ද විස්තර කරනු.

කුසලපදවසාන වාරයට අනතුරු ව අබ්‍යාකතපදවසාන වාරය වදළ සේක. එ ය වීථි අනුවාද වසයෙන් දෙවැදෑරුම් වේ. එයින් වීථිය පළමු කොට වදළ සේක. කෙසේ ද? යත්, "**කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චනෙ පච්චයො**" යනුවෙනි. වීථියට අනතුරු ව අනුවාදය වදළ සේක. කෙසේ ද? යත්, "**කුසලා හෙතු චිත්තසමුට්ඨානානං රූපානං හෙතුපච්චයෙන පච්චයො**" යනුවෙනි. පදාර්‍ථ කියනු.

**අභිධෙයාර්‍ථ:**

එහි "කුසලො ධම්මො" යන කතෘපාඨයෙන් එක්විසිකුශල චිත්තයන් ගේ ද්විහේතුක චිත්තක්‍ෂණයන්හි ලැබෙන අලෝභ අදෝස දෙකය,

Non-commercial distribution

ත්‍රිහේතුක චිත්තක්ෂණයන්හි ලැබෙන අලෝභ අදෝස අමෝහ තුන ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. "අබ්‍යාකතස්ස ධම්මස්ස" යන සම්ප්‍රදාන පාඨයෙන් කුශල චිත්තයන් විසින් උපදවන චිත්තජරූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන කුසලහේතූන්හි සුදුසු පරිදි එක් වර ලැබෙන හේතු අධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති නවය අතුරෙන් හේතුශක්තිය ලැබේ. ප්‍රත්‍යය වන ආකාරය කුසලපදවසාන වාරයෙහි කළ විස්තරය අනුව මෙහි ද විසතර කරනු.

අබ්‍යාකතපදවසාන වාරයට අනතුරු ව කුසලාබ්‍යාකතපදවසාන වාරය වදාළ සේක. එය ද විථි අනුවාද වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් විථිය පළමු කොට වදාළ සේක. එනම් "**කුසලො ධම්මො කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස හෙතු පච්චයෙන පච්චයො**" යනු යි. විථියට අනතුරුව අනුවාදය වදාළ සේක. එනම් "**කුසලා හෙතු සපයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං හෙතුපච්චයෙන පච්චයො**" යනුයි.

විථිපාලියෙහි "කුසලො ධම්මො" යන කර්තෘපාඨයෙන් සම්ප්‍රයුක්ත-ස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ද්විහේතුක චිත්තයන්ගේ අලෝභ අදෝස දෙක ය ත්‍රිහේතුක චිත්තයන් ගේ අලෝභ අදෝස අමෝහ තුන ය යන හේතු ධර්මයෝ ලැබෙත්. "කුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස" යන සම්ප්‍රදානපාඨයෙන් කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා චිත්තජරූපයෝ ලැබෙත්. "හෙතුපච්චයෙන" යන කරණපාඨයෙන් සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුශලහේතු තුනෙහි සුදුසු පරිදි එක් වර ලැබෙන හේතු අධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති අටෙන් හේතු සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. ප්‍රත්‍යය වන ආකාරය කුශලපදවසානවාරයෙහි කියනලද්ද අනුව විස්තර කරනු.

කුසලපදවාරයට අනතුරු ව අකුසලපද වාරය වදාළ සේක. එහි ද අකුසලපදවසාන, අබ්‍යාකතපදවසාන. අකුසලාබ්‍යාකතපදවසාන වශයෙන් වාර තුනක් ඇත්තේ ය. එයින් අකුසලපදවසාන වාරය පළමු කොට වදාළ සේක. කෙසේ ද? යත්, "අකුසලො ධම්මො -පෙ- හෙතුපච්චයෙන පච්චයො" යනුවෙනි.

අකුසලො, සාවද්‍ය දුඃඛවිපාක ලක්ෂණ වූඃ ධම්මො, ධර්මය තෙමඃ අකුසලස්ස, සාවද්‍ය දුඃඛවිපාක ලක්ෂණ වූඃ ධම්මස්ස, ධර්මයටඃ හෙතුපච්චයෙන පච්චයො. අකුසලා, අකුසල වූඃ හෙතු, හේතුභූඃ සම්පයුත්තකානං, සම්පයුක්ත

Non-commercial distribution

වූ: ඛන්ධානං, අකුසල් සිත් දෙළොස ය මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්ස ය යන නාමස්කන්ධයන්ට: හෙතුපච්චයෙන පච්චයො.

වීථිපාලියෙහි "අකුසලො ධම්මො" යන කර්තෘපාඨයෙන් සම්ප්‍රයුක්ත-ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ලෝභමූල චිත්තයන්හි ලෝභ මෝහ දෙක ය, ද්වේෂමූල චිත්තයන්හි ද්වේෂ මෝහ දෙක ය, මෝහමූල චිත්තයන්හි මෝහය ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. "අකුසලස්ස ධම්මස්ස" යන සම්ප්‍රදානපාඨයෙන් අකුසල්සිත් දෙළොස ය මෝහමූලද්වයෙහි මෝහවර්ජිත චෛතසික සත්විස්ස ය යන නාමස්කන්ධයෝ ලැබෙත්. 'හෙතුපච්චයෙන" යන කරණපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අකුශල හේතූන්හි එක් වර ලැබිය හැකි හේතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගත යන ශක්ති සත අතුරෙන් හේතුශක්තිය ලැබේ.

එහි සකන්ධවාර විභාගය මෙසේ ය. "අකුසලාහෙතු සම්පයුත්තකානං ඛන්ධානං" යන අනුවාද පාලියෙහි ලෝභමූලචිත්ත විෂයෙහි "අකුසලා හෙතු" යනුවෙන් ලෝභය හා "සම්පයුත්තකානං ඛන්ධානං" යනුවෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන් ගන්නා වූ එක් ස්කන්ධවාරයක් ද, එසේම මෝහය හා සම්ප්‍රයුක්ත සකන්ධයන් ගන්නා එක් වාරයක් ද, ලෝභ මෝහ දෙක හා සම්ප්‍රයුක්තස්කන්ධයන් ගන්නා එක් වාරයක් ද වේ. ද්වේෂමූලචිත්ත විෂයෙහි ද්වේෂය හා සම්ප්‍රයුක්තස්කන්ධයන් ගන්නා එක්වාරයක් ද මෝහය හා සම්ප්‍රයුක්සකන්ධයන් ගන්නා එක්වායක් ද, ද්වේෂ මෝහ දෙක හා සම්පයුක්තසකන්ධයන් ගන්නාඑක්වාරයක් ද වේ. මෝහමූල චිත්ත විෂයෙහි මෝහය හා සම්ප්‍රයුක්තස්කන්ධයන් ගන්නා එක්වාරයෙකි. මෙසේ ලෝභමූල චිත්තයා ගේ වශයෙන් ස්කන්ධවාර තුනක් ද ද්වේෂමූල චිත්තයා ගේ වශයෙන් ස්කන්ධවාර තුනක් ද මෝහමූල චිත්තයා ගේ වශයෙන් එක් ස්කන්ධවාරයක් ද වීමෙන් ස්කන්ධවාර සතක් වේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ ය. ලෞකිකසිත් එක් අසූව ය, චෛතසික දෙපනස ය, රූප අටවිස්ස ය, ප්‍රඥප්තිය ය යන ෂඩාරම්මණයන් අතුරෙන් යම්කිසිවක් අරමුණු කොට අකුසලජවනයන් උපදනා කල්හි එකුන්විසි භවාඞගයන් අතුරෙන් යම්කිසි සිතක් භවාඞගචලන භවාඞෙගාපච්ඡෙද වශයෙන් ඉපද නිරුධ වීමෙන් පසු ලෞකික සිත් එක් අසූව ය -පෙ- යන ෂඩාරම්මණය අතුරෙන් යම්කිසිවක් අරමුණු කොට මනෝද්වාරාවර්ජනචිත්තය ඉපද නිරුධ වේ. අනතුරු ව දෙළොස් අකුසලචිත්තයන් අතුරෙන් යම්කිසි සිතක් ඒ ආරම්මණය ගනිමින් ජවනකෘත්‍යයෙන් සත්වරක් උපදී. විභූතාරම්මණවීථියක් වේ නම් එයට අනතුරු ව ඒ ආරම්මණය ම ගනිමින් එකොළොස් තදරම්මණයන් අතුරෙන්

Non-commercial distribution

යම්කිසි සිතක් තදරම්මණකෘත්‍යයෙන් දෙවරක් ඉපද නිරුද්ධ වේ. අනතුරු ව කාමභවාඞ්ග චිත්තයක් උපදී. අවිභූතාරම්මණ වීථියක් වේ නම් භවාඞ්ගසිත් එකුන්විස්ස අතුරෙන් යම්කිසි සිතක් ජවනයට අනතුරු ව උපදී. එසේ උපදනා වූ ලෝභමූල අකුසල ජවනයන් ගේ ලෝභ මෝහ දෙක ද දෝසමූල අකුසලජවනයන් ගේ දෝස මෝහ දෙක ද මෝහමූල ජවනයන්හි මෝහය ද යන හේතුධර්මයන් ප්‍රත්‍යය වශයෙන් හා සම්ප්‍රයුක්ත අකුශලධර්මයන් ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් ද ගෙන "අකුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො" යනු වදළ සේක.

අකුසලපදවසාන වාරයට අනතුරු ව අබ්‍යාකතපදවසාන වාරය වදළසේක. **"අකුසලො ධම්මො අබ්‍යාකතස්ස -පෙ- පච්චයො"** යනුයි. වීථිපාලියෙහි "අකුසලො ධම්මො" යන කර්තෘපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ දෙළොස් අකුශලචිත්තයන්හි ඇති ලෝභ මෝහ, දෝස මෝහ, මෝහ යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. "අබ්‍යාකතස්ස ධම්මස්ස" යන සම්ප්‍රදානපාඨයෙන් අකුශලචිත්තයන් නිසා උපදනා චිත්තජරූපයෝ ලැබෙත්. "හෙතුපච්චයෙන" යන කරණපාඨයෙන් දෙළොස් අකුසලචිත්තයන්හි ඇති ලෝභාදි හේතූන්හි එක් වර ලැබිය හැකි හේතු සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් හේතු සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. ස්කන්ධවාර විභාගය වුක්තානුසාරයෙන් දත යුතු ය.

අබ්‍යාකතපදවසාන වාරයට අනතුරුව අකුසලාබ්‍යාකතපදවසාන වාරය වදළ සේක. **"අකුසලොධම්මො අකුසලස්ස ච අබ්‍යාකතස්ස ච ධම්මස්ස -පෙ- පච්චයො"** වීථිපාලියෙහි **"අකුසලො ධම්මො"** යන කර්තෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ දෙළොස් අකුසල චිත්තයන්හි ඇති ලෝභාදි හේතූහු ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් අකුසල් සිත් දෙළොස ය මෝහමූලද්වයෙහි මෝහ වර්ජිත චෛතසික සත්විස්සය අකුසලචිත්තජ රූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. "හෙතුපච්ච-යෙන" යන කරණපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන අකුශල හේතූන්හි එක්වර ලැබිය හැකි හේතු සහජාත නිස්සය අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන් හේතුසඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. ස්කන්ධවාර විභාගය හා ප්‍රත්‍යය වන ආකාරය විස්තර කරනු.

අකුසලපද වාරයට අනතුරු ව අබ්‍යාකතපද වාරය වදළ සේක. එය අබ්‍යාකතපදවසාන වාර වශයෙන් එකකි. එහි වීථිය **"අබ්‍යාකතො-ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හේතුපච්චයෙන පච්චයො"** යනුයි. අනුවාදය **"විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා හෙතු සම්පයුත්තකානං**

Non-commercial distribution

**ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං හේතුපච්චයෙන පච්චයො, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං කටත්තාච රූපානං හෙතුපච්චයෙන පච්චයො"** යනුයි. එහි විපී පාලියෙහි අබ්‍යාකතය ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි වශයෙන් දෙවැදෑරුම් වේ. ප්‍රවෘත්ති කාලයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කර්තෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන සහේතුක විපාක සිත් එක් විස්ස ය සහේතුක ක්‍රියාසිත් සතොළොසය ය චෛතසික අටතිසය යන මොවුන්ගේ ද්විහේතුක චිත්තක්ෂණයන්හි ලැබෙන ආලෝභ අද්වේස දෙකය. ත්‍රිහේතුක චිත්තක්ෂණයන්හි ලැබෙන අලෝභ අද්වේස අමෝහ තුනය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. "අබ්‍යාකතස්ස ධම්මස්ස" යන සම්ප්‍රදානපාඨයෙන් සහේතුක විපාක සිත් එක් විස්සය, සහේතුක ක්‍රියා සිත් සතොළොසය චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා චිත්තජරූපයෝ ලැබෙත්. "හේතුපච්චයෙන," යන කරණපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන විපාක ක්‍රියා හේතූන්හි එක් වර සුදුසු පරිදි ලැබෙන හේතු අධිපති සහජාත නිඃශ්‍රය විපාක ඉන්ද්‍රිය මාර්ග විප්‍රයුක්ත අස්ති අවිගත යන ප්‍රත්‍යය ශක්ති අතුරෙන් හේතු සංඛ්‍යාත ශක්තිවිශේෂය ලැබේ. ස්කන්ධවාර විභාගය කරනු.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේය:- කාමසිත් සිවුපනසය චෛතසික දෙපනස ය රූප අටවිස්ස ය යන ෂඩාරම්මණයන් අතුරෙන් එක් ආරම්මණයක් ගෙන මහාවිපාකය භවාඞ්ග තදාරම්මණ වශයෙන් උපදනා කල්හි මහා විපාක අට අතුරෙන් තමන්ගේ ප්‍රතිසන්ධි චිත්තය හා සමාන වූ යම්කිසි සිතක් කර්ම කර්මනිමිත්ත ගතිනිමිත්තයන් අතුරෙන් එක් ආරම්මණයක් ගනිමින් භවාඞ්ගචලන භවාංගුපච්ඡේද වශයෙන් ඉපද නිරුද්ධ වේ. අනතුරු ව කාමසිත් සිවුපනසය, -පෙ- යන ෂඩාරම්මණයන්ගෙන් යම්කිසිවක් අරමුණු කොට මනෝද්වාරාවර්ජනය ද එකුන්තිස් කාමජවනයන්-ගෙන් යම්කිසි සිතක් ජවනකෘත්‍යයෙන් සත්වරක් ද ඉපද නිරුද්ධ වූ පසු සහේතුකකාමවිපාක අට අතුරෙන් යම්කිසි සිතක් තදාරම්මණකෘත්‍යයෙන් දෙවරක් ඉපද නිරුද්ධ වේ. අනතුරුව සහේතුකකාමවිපාක අට අතුරෙන් එක්සිතක් තදාරම්මණ කෘත්‍යයෙන් දෙවරක් ඉපිද නිරුද්ධ වේ. අනතුරුව සහේතුක කාමවිපාක සිතක් ම භවාඞ්ගකෘත්‍යයෙන් උපදනේ ය. එසේ උපදනා කල්හි ද්විහේතුක කාමවිපාකයන්හි ඇති අලෝභ අද්වේස දෙක හා ත්‍රිහේතුක කාමවිපාක සතරෙහි ඇති අලෝභ අද්වේස අමෝහ තුන ද ප්‍රත්‍යය වශයෙන් ගෙන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා චිත්තජ රූපයන් ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් ගෙන "අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස

Non-commercial distribution

ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො" යනු වදළ සේක. ච්‍යුතිචිත්තයෙහි ප්‍රත්‍යය වන ආකාරය මරණාසන්නවීථියෙන් දැක්විය යුතුය. මහාක්‍රියා මහද්ගත විපාක ක්‍රියා ලෝකෝත්තරවිපාක චිත්තයන්හි ප්‍රත්‍යය වීමේ ආකාරය ද ඒ ඒ චිත්තවීථීන් අනුව විස්තර කළ යුතු ය.

ප්‍රතිසන්ධිකාලයෙහි "අබ්‍යාකතො ධම්මො" යන කර්තෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ටද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා කෘතත්වාත්-රූපයන්ට ද ප්‍රත්‍යය වන සහේතුක ප්‍රතිසන්ධි සතොළොසය චෛතසික පන්තිස ය යන මොවුන්ගේ ද්විහේතුක චිත්තක්ෂණයන්හි ඇති අලෝභ අද්වේස දෙකය ත්‍රිහේතුක චිත්තක්ෂණයන්හි ඇති අලෝභ අද්වේස අමෝහ තුනය යන හේතුධර්මයෝ ලැබෙත්. "අබ්‍යාකතස්ස ධම්මස්ස, යන සම්ප්‍රදානපාඨයෙන් සහේතුක ප්‍රතිසන්ධි සතොළොසය, චෛතසික පන්තිසය, ප්‍රතිසන්ධිකර්මජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නධර්මයෝ ලැබෙත්. "හෙතුපච්චයෙන" යන කරණපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ටද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා කෘතත්වාත් රූපයන්ට ද ප්‍රත්‍යය වන සහේතුකප්‍රතිසන්ධි සතොළොසෙහි ඇති හේතු තුනෙහි සූදුසූ පරිදි එක්වර ලැබෙන හේතුසහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති අතුරෙන් හේතුසඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. ස්කන්ධවාර විභාගය සුගම ය.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ ය. එකොළොස් කාමභූමින්ගෙන් චුත ව කාමසුගතිභූමි සතෙහි පිළිසිඳ ගන්නවුන් ගේ මරණාසන්නවීථිය තදාරම්මණයට අනතුරුව ච්‍යුතියවන්නාවූ වීථියය ජවනයට අනතුරුව ච්‍යුතිය වන්නා වූ වීථිය ය, භවාඞ්ගයට අනතුරුව ච්‍යුතිය වන්නාවූ වීථිය යයි තුන් වැදෑරුම් වේ. එයින් තදාරම්මණයට අනතුරුව ච්‍යුතිය වන්නා වූ වීථිය මෙසේ ය. වර්තමානභවයෙන් පහවීමට සමීප වූ කල්හි කාම-භවාඞ්ග දශය අතුරෙන් තමා ගේ ප්‍රතිසන්ධිචිත්තය හා භූමිජාත්‍යාදීන් ගේ වශයෙන් සමාන වූ යම්කිසි සිතක් භවාඞ්ගචලන භවාඞ්ගොපච්ඡේද වශයෙන් ඉපිද නිරුද්ධ වීමෙන් පසු කර්ම කර්මනිමිත්ත ගතිනිමිත්තයන් අතුරෙන් එක් දෙයක් අරමුණු කොට මනෝද්වාරාවර්ජනය ද පස්වරක් මරණාසන්න ජවනය ද දෙවරක් තදාරම්මණය ද ඉපිද නිරුද්ධ වෙති. අනතුරු ව කාමච්‍යුති සිත් දශය අතුරෙන් එක් සිතක් අතීතභවයේ මරණාසන්නජවනයෙන් ගන්නා ලද කර්ම කර්මනිමිත්ත ගතිනිමිත්තයන් අතුරෙන් එක් දෙයක් ගනිමින් ච්‍යුතිකෘත්‍යයෙන් ඉපිද නිරුද්ධ වේ. අනතුරුව මහාවිපාක සිත් අට අතුරෙන් එක්තරා සිතක් අවිද්‍යානුශයෙන් පරිවරන ලද තෘෂ්ණානුශය මුල් කොට ඇත්තා වූ කාමාවචර කුශල සඞ්ඛ්‍යාත ජනක කර්මයෙන් උපදවනු ලැබීම් වශයෙන් සම්ප්‍රයුක්තධර්මයන් විසින් පිරිවරන ලදු ව සහජාතධර්මයනට

Non-commercial distribution

ප්‍රතිෂ්ඨාභාවයෙන් මරණාසන්න ජවනයෙන් ගන්නා ලද කර්මාදීන් ගෙන් එකක් වූ ආරම්මණය ගනිමින් පූරාණභවය හා අභිනව භවය සම්බන්ධ කිරීම වූ ප්‍රතිසන්ධිකෘත්‍යයෙන් එක් වරක් ඉපද නිරුද්ධ වේ. අනතුරු ව ඒ චිත්තය ම භවාඞ්ගකෘත්‍යයෙන් පසළොස් වරක් හෝ සොළොස් වරක් ඉපද නිරුද්ධවීමෙන් පසු අභිනවභවය වූ ප්‍රතිසන්ධිනාමස්කන්ධයන් හා කෘතත්වාත් රූපයන් අරමුණු කරමින් මනෝද්වාරාවර්ජනය ද අභිනවභවයට ඇලුම් කිරීම් වශයෙන් ලෝභමූලචිත්තයන් ගෙන් එක් සිතක් ජවනකෘත්‍යයෙන් සත්වරක් ද අනතුරුව භවාඞ්ගචිත්තය ද ඉපද නිරුද්ධ වන්නාහ. එසේ උපදනා වූ ද්විහේතුක මහාවිපාක ප්‍රතිසන්ධි චිත්තයන් ගේ ආලෝභ අදෝස හේතු දෙක ද ත්‍රිහේතුක මහා විපාක ප්‍රතිසන්ධි චිත්තයන් ගේ අලෝභ අදෝස අමෝහ යන හේතු තුන ද ප්‍රත්‍යය භාවයෙන් ගෙන සම්ප්‍රයුක්තධර්මයන් හා කෘතත්වාත් රූපයන් ප්‍රත්‍යයෝත්පන්න වශයෙන් ද ගෙන "අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො" යනු වදළ සේක.

හේතුප්‍රත්‍යය විභඞ්ගවාරය නිමි.

## 2. ආරම්මණප්‍රත්‍යය විභඞ්ගවාරය

හේතුප්‍රත්‍යය විභඞ්ගවාරයට අනතුරු ව ආරම්මණප්‍රත්‍යය විභඞ්ගය වදළ සේක. එහි ද කුසලපදවාරය ය, අකුසලපදවාරය ය, අබ්‍යාකතපදවාරය යි වාර තුනක් ඇත්තේ ය. එයින් කුශලපද වාරය පළමුකොට වදළ සේක. එහි ද කුසලපදවසාන වාරය ය, අකුසලපදවසානවාරය ය, අබ්‍යාකතපදවසාන වාරය යි අවසානපද වශයෙන් වාර තුනක් ඇත්තේ ය. එයින් කුලසපදවසාන වාරය පළමු කොට වදළ සේක. එද වීථි අනුවාද වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් වීථිය පළමු කොට වදළ සේක. එනම් "**කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො**" යනුයි. වීථියට අනතුරු ව අනුවාදය වදළ සේක. එනම් "**දානං දත්වා සීලං සමාදියිත්වා උපොසථ-කම්මං කත්වා -පෙ- පච්චයො**" යනු යි. පදර්ථ සුගම ය.

වීථිපාලියෙහි "කුසලො ධම්මො" යන කර්තෘපාඨයෙන් අභිඥාමාර්ග වර්ජිත කුසල් සිත් විස්ස ය චෛතසික අටතිස්ස ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. "කුසලස්ස ධම්මස්ස" යන සම්ප්‍රදානපාඨයෙන් මහා කුසල්සිත් අට ය, විඤ්ඤාණඤ්චායතන කුසලය ය, නේවසඤ්ඤා නාසඤ්ඤායතන කුසලයය, ඉද්ධිවිධ චේතෝපරිය පුබ්බෙනිවාසානුස්සති යථාකම්මූපග අනාගතංස කුසලාභිඤ්ඤාවෝ ය විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික

Non-commercial distribution

තෙතිසය යන නාමස්කන්ධයෝ ලැබෙත්. විස්තර වශයෙන් මෙසේ ය. කතිපාඨයෙන් මහාකුසල ඤාණවිප්පයුත්ත සිත් සතරට ප්‍රත්‍යය වන ලෞකික කුසල් සතොළොස ය, මහාකුසල ඤාණසම්පයුත්ත සිත් සතරට ප්‍රත්‍යය වන අර්හත්මාර්ගවර්ජිත කුසල් සිත් විස්ස ය, විඤ්ඤාණඤ්චායතන කුසලයට ප්‍රත්‍යය වන වර්තමාන භවයෙහි හා අතීත භවයෙහි ස්වසන්තානයෙහි උපන් ආකාසානඤ්චායතන කුසලය ය, නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසලයට ප්‍රත්‍යය වන වර්තමාන භවයෙහි හා අතීත භවයෙහි ස්වසන්තානයෙහි උපන් ආකිඤ්චඤ්ඤායතන කුසලය ය, ඉද්ධිවිධ කුසලාභිඤ්ඤාවට ප්‍රත්‍යය වන පාදකරූපාවචර පඤ්චමධ්‍යාන කුශලය ය, චේතෝපරියකුසලාභිඤ්ඤාවට ප්‍රත්‍යය වන අතීතයෙන් සත්දිනක් ද අනාගතයෙන් සත්දිනක් ද ඇතුළු කාලත්‍රයයෙහි වූ අර්හත්මාර්ගයෙන් අන්‍ය වූ අන්‍යසත්වයන් ගේ කුසල් සිත් විස්ස ය, පුබ්බෙනිවාසානුස්සති කුසලාභිඤ්ඤාවට ප්‍රත්‍යය වන පෙරජාතිවල උපන් අර්හත්මාර්ගයෙන් අන්‍ය වූ කුසල් සිත් විස්ස ය, යථාකම්මූපගකුසලාභිඤ්ඤාවට ප්‍රත්‍යය වන අතීත ලෞකික කුශලධර්මයෝ ය, අනාගතංස කුසලාභිඤ්ඤාවට ප්‍රත්‍ය වන අර්හත්මාර්ග වර්ජිත කුසල් සිත් විස්සය, චෛතසික අටතිස ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයේ අභිධෙය වශයෙන් කියන ලද ධර්ම අරමුණු කොට උපදනා චිත්තචෛතසිකයෝ ලැබෙත්. "ආරම්මණපච්චයෙන" යන කරණ පාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබිය හැකි ආරම්මණ ආරම්මණාධිපති ආරම්මණූපනිස්සය යන ප්‍රත්‍යය ශක්තිත්‍රත අතුරෙන් ආරම්මණසඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

දානං දත්වා තං පච්චවෙක්ඛති යන අනුවාදපාලියෙහි "දානං දත්වා" යනුවෙන් දැක්වෙන පරිත්‍යාගචේතනා ප්‍රධාන කාමාවචර කුශල චිත්තය 'තං පච්චවෙක්ඛති' යනුවෙන් දැක්වෙන මෙනෙහි කරන්නාවූ කාමාවචර කුශලචිත්තයට ආරම්මණශක්තියෙන් ප්‍රත්‍යය වේ .

ප්‍රත්‍යය වන ආකාරය මෙසේයඃ- ආහාරපානාදි වස්තූන් දෙන කල්හි දෙන තැනැත්තහු ගේ ප්‍රතිසන්ධිචිත්තය හා සමාන වූ සිතක් කර්ම කර්මනිමිත්ත ගතිනිමිත්තයන් අතුරෙන් එකක් අරමුණු කොට භවාඞ්ගචලන භවාඞ්ගුපච්ඡේද කෘත්‍යයෙන් ඉපද නිරුද්ධ වූ පසු ආහාරපානාදි දානවස්තු අරමුණු කොට මනෝද්වාරාවර්ජන චිත්තය ද මහාකුසල් සිත් අට අතුරෙන් එක් සිතක් ජවනකෘත්‍යයෙන් සත්වරයක් ද ඉපද නිරුද්ධ වෙති. අනතුරුව එය විභූතාරම්මණ වීථියක් වේ නම් දෙවරක් තදරම්මණ ඉපිද නිරුද්ධ වීමෙන් පසු භවාඞ්ගය වේ. අවිභූතාරම්මණ වීථියක් වේ නම් ජවනයට අනතුරු ව භවාඞ්ගය වේ. ඒ වීථියෙන් ආහාරාදි වස්තූන් දීම සිදුවේ. අනතුරු ව ඒ දානවස්තුව අරමුණු කොට තදනුවර්තික මනෝද්වාරවීථිහු

උපදිති. පසු ව ඒ දයකයා විසින් තමා ගේ සන්තානයෙහි උපන් පරිත්‍යාග-චේතනාව ප්‍රධාන කොට ඇති කුශලචිත්තය මෙනෙහි කරන්නේ නම් ඔහු ගේ ප්‍රතිසන්ධිචිත්තය හා සමාන වූ සිතක් කර්‍මාදීන් ගෙන් එකක් අරමුණු කොට භවාඞ්ගචලන භවාඞ්ගුපච්ඡෙද වශයෙන් ඉපද නිරුද්ධ වූ පසු ඒ දන චේතනාව ප්‍රධාන කොට උපන් කාමාවචර කුශල චිත්තය අරමුණු කොට මනෝද්වාරාවජ්ජනය ද මහාකුසල් සිත් අට අතුරෙන් එක් සිතක් ජවනකෘත්‍යයෙන් සත් වරක් ද ඉපද නිරුඬ වෙති. විභූතාරම්මණවීථියක් වේ නම් එයට අනතුරුව තදරම්මණය දෙවරක් ඉපදීමෙන් පසු භවාඞ්ගය වේ. අවිභූතාරම්මණවීථියක් වේ නම් ජවනයට අනතුරුව භවාඞ්ගය වේ. අනතුරුව ඒ පරිත්‍යාගචේතනාව ප්‍රධාන කොට උපන් කුශල චිත්තය අරමුණු කොට බොහෝ තදනුවර්තික මනෝද්වාරවීථිහු උපදිති. එසේ උපදනා කාමාවචර ජවනයන් අතුරෙන් පරිත්‍යාග චේතනාව ප්‍රධාන කොට ඇති කාමාවචර කුශලයන් ප්‍රත්‍යය භාවයෙන් ද ඒවා අරමුණු කොට පසු ව උපදනා කාමාවචරජවනයන් ප්‍රත්‍යයෝත්පන්නභාවයෙන් ද ගෙන පරිත්‍යාගචේතනාව ප්‍රධාන කොට ඇති කාමාවචරකුශලචිත්තය එය මෙනෙහිකිරීම් වශයෙන් පසු ව උපදනා කාමාවචර කුශලචිත්තයට ආරම්මණපත්‍යයෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො" කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො" යි වදළ සේක.

"**සීලං සමාදියිත්වා තං පච්චවෙක්ඛති**" යන අනුවාදපාලියෙහි සීලං සමාදියිත්වා යනුවෙන් ගැනෙන පඤ්චාඞ්ගසීල චේතනාව ප්‍රධාන කාමාවචර කුසල චිත්තය 'තං පච්චවෙක්ඛති' යනුවෙන් ගැනෙන ප්‍රත්‍යවේක්ෂා කරන කාමාවචර කුශලචිත්තයට ආරම්මණශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ යඃ- ප්‍රාණඝාතාදි අකුශල පසින් වළක්නා වූ තැනැත්තා හට තමාගේ ප්‍රතිසන්ධි චිත්තයට සමාන වූ සිතක් භවාඞ්ගචලන භවාඞ්ගුපච්ඡෙ ද වශයෙන් ඉපද නිරුඬ වූ පසු ප්‍රාණඝාතයෙන් වළක්නේ වේ නම් රූපජීවිතේන්ද්‍රියය හෝ ඒ රූපජීවිතේන්ද්‍රිය අරමුණු කරන අකුශල චේතනාව ප්‍රධාන කොට ඇති දෝසමූල මෝහමූල චිත්තය හෝ ඒ දෝසමූල මෝහමූල චිත්තයන් විසින් උපදවන කායවිඥප්තිය හෝ අරමුණු කොට ද, අදත්තාදනයෙන් වළක්නේ වේ නම් පරිපරිගෘහිත වස්තුව හෝ එය අරමුණු කොට උපදනා අකුශල චේතනාව ප්‍රධාන කොට ඇති දෙළොස් අකුශල චිත්තයන් හෝ ඒ සිත්වලින් උපදවන කාය විඥප්තිය හෝ අරමුණු කොට ද , කාමමිථ්‍යාචාරයෙන් වළක්නේ නම් පරස්ත්‍රීපුරුෂයන් හෝ ඔවුන් අරමුණු කොට උපදනා චේතනාව ප්‍රධාන කොට ඇති ලෝභමූල මෝහමූල චිත්තයන් හෝ ඒ සිත්වලින් උපදවන කායවිඥප්තිය

Non-commercial distribution

හෝ අරමුණ කොට ද, මුසාවදයෙන් වළක්නේ නම් අසත්‍යවස්තුව හෝ එය අරමුණු කොට උපදනා අකුශල චේතනාව ප්‍රධාන කොට ඇති දෙළොස් අකුශල චිත්තයන් හෝ ඒවායින් උපදවන කායවාක්විඥප්තීන් හෝ අරමුණු කොට ද සුරාපානයෙන් වළක්නේ නම් සුරාව හෝ එය අරමුණු කරන අකුශලචේතනාව ප්‍රධාන කොට ඇති ලෝභමූල මෝහමූල චිත්තයන් හෝ ඒ සිත්වලින් උපදවන කායවිඥප්තිය හෝ අරමුණු කොට ද මනෝද්වාරාවර්ජන චිත්තය හා මහාකුසල් අට අතුරෙන් එක් සිතක් ජවනකෘත්‍යයෙන් සත්වරක් ද ඉපද නිරුඬ වීමෙන් පසු එකොළොස් තදරම්මණයන් ගෙන් එක් සිතක් තදරම්මණකෘත්‍යයෙන් දෙවරක් උපන් පසු භවාඞගය වේ. මේ වීථියෙන් ප්‍රාණඝාතාදියෙන් වැළකීම සිදු වේ. එයට අනතුරු ව තදනුවර්තික මනෝද්වාරවීථිහු සුදුසු පරිදි උපදනාහ. ප්‍රාණ-ඝාතාදියෙන් වැළකුණා වූ පුද්ගලයා විසින් එය මෙනෙහි කරන කල්හි තමා ගේ ප්‍රතිසන්ධි චිත්තයට සමාන වූ සිතක් භවාඞගචලන භවාඞගුපච්ඡේද වශයෙන් දෙවරක් ඉපද නිරුඬ වූ පසු පඤ්චාඞග ශීලචේතනා ප්‍රධාන කාමාවචර කුශලචිත්තයන් අරමුණු කොට මනෝද්වාරාවර්ජනය ද මහාකුසල් අට අතුරෙන් එක්තරා සිතක් ජවනකෘත්‍යයෙන් සත් වරක් ද ඉපද නිරුඬ වූ පසු විභූතාරම්මණ වීථියක් වේ නම් එකොළොස් තදරම්මණයන්ගෙන් එක් සිතක් දෙවරක් ඉපදීමෙන් පසු භවාඞගයෝ වෙති. අවිභූතාරම්මණවීථියක් වේ නම් ජවනයට අනතුරු ව භවාඞගය වේ. මේ වීථියෙන් පඤ්චාඞග ශීලචේතනා ප්‍රධාන කාමාවචර කුශලය ප්‍රත්‍යවේක්ෂා කෙරේ. අනතුරු ව සුදුසු පරිදි තදනුවර්තික මනෝද්වාරවීථිහු උපදිති. එසේ උපදනා කාමාවචර කුශල චිත්තයන් ගෙන් අනුවාදපාලියෙහි "සීලං සමාදියිත්වා තං" යනුවෙන් දැක්වෙන පඤ්චාඞගශීල චේතනා ප්‍රධාන කාමාවචර කුශලචිත්තය 'පච්චවෙක්ඛති' යනුවෙන් දැක්වෙන ප්‍රත්‍යවේක්ෂා කරන කාමාවචර කුශලචිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො" යන වීථිපාලියෙන් දැක්වූ සේක. මේ පඤ්චාඞගශීලයා ගේ වශයෙන් ප්‍රත්‍ය ප්‍රත්‍යයෝත්පන්න විභාගය ය.

දශාඞගශීලයා ගේ වශයෙන් ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න විභාගය මෙසේය. ප්‍රාණඝාතාදි කර්ම දශයෙන් වළක්නා කල්හි තමා ගේ ප්‍රතිසන්ධි චිත්තයට සමාන සිතක් භවාඞගචලන භවාඞගුපච්ඡේද වශයෙන් ඉපද නිරුඬ වූ පසු (පාණාතිපාතා අදින්නාදන දෙකින් වැළකීමේ දී සිත් පිළිවෙළ ඉහත කී පරිදි විස්තර කරනු) අබ්‍රහ්මචර්‍ය්‍යාවෙන් වළක්නේ නම් නුවණැතියන් පිළිකුල් කරන මෛථුන සේවනය හෝ එය අරමුණු කරන අකුශලචේතනාව ප්‍රධාන ලෝභමූල චිත්තයන් හෝ අරමුණු කොට ද,

Non-commercial distribution

මුසාවාද පිසුණාවාච ඵරුසාවාච සම්ඵප්පලාපයන් ගෙන් වළක්නා කල්හි ඒ ඒ කර්මය සිදුකරන අකුශලචේතනාවන් ප්‍රධාන කොට ඇති ලෝභමූල දෝසමූල මෝහමූල චිත්තයන් හෝ ඒවායින් උපවදන වාක්විඥප්තිය හෝ අරමුණු කොට ද, (සුරාමේරය කර්මය ගැන කියන ලදි) විකාලභෝජනයෙන් වළක්නේ වේ නම් භෝජනයන්හි ඇති වර්‍ණගන්ධාදි අවයවයන් හෝ සකල භෝජනයම හෝ ඒ භෝජනයට ඇලුම් කරන ලෝභය ප්‍රධාන කොට ඇති චිත්තයන් හෝ අරමුණු කොට ද, නච්ච ගීත වාදිත විසූක දස්සනයෙන් වළක්නේ නම් නෘත්‍ය ගීතාදිය පිළිබඳ රූපශබ්දයෙන් හෝ ඒවාට ඇලුම්කරන ලෝභප්‍රධාන චිත්තයන් හෝ අරමුණු කොට ද මාලා ගන්ධ විලේපන ධාරණාදියෙන් වළක්නේ නම් මාලාගන්ධාදියේ වර්‍ණගන්ධාදිය හෝ ඒවාට ඇලුම් කරන ලෝභසහගත චිත්තෝත්පාදයන් හෝ අරමුණු කොට ද, උච්චාසයන මහාසයනයන් ගෙන් වළක්නේ නම් උච්චාසයන මහාසයනයන් හෝ ඒවායේ රූපාරම්මණ පොට්ඨබ්බාරම්මණයන් හෝ ඒවා අරමුණු කරන ලෝභසහගත චිත්තයන් හෝ අරමුණු කොට ද, ජාතරූප රජතපටිග්ගහනයෙන් වළක්නේ නම් රන් රිදී ආදිය හෝ ඒවා අරමුණු කරන ලෝභප්‍රධාන චිත්තෝත්පාදනයන් හෝ අරමුණු කොට ද, මනෝද්වාරාවර්ජන චිත්තය ද මහාකුසල් සිත් අට අතුරෙන් එක් සිතක් ජවනකෘත්‍යයෙන් සත්වරක් ද විභූතාරම්මණ වීථියක් වේ නම් එකොළොස් තදරම්මණයන් ගෙන් එක් සිතක් දෙවරක් ද ඉපද නිරුඪ වීමෙන් පසු භවාඞ්ගයෝ වෙති. අවිභූතාරම්මණවීථියක් වේ නම් ජවනයට අනතුරු ව භවාඞ්ගපතනය වේ. මේ වීථිචිත්තයන්ගෙන් ප්‍රාණඝාතාදියෙන් වැළකීම සිදු වේ. ඒ වීථිවලට අනතුරුව සුදුසු පරිදි තදනුවර්තික මනෝද්වාරවීථීහු ද වෙති. ප්‍රාණඝාතාදියෙන් වැළකුණු තැනැත්තා විසින් ශීලචේතනාව ප්‍රධාන කාමාවචර කුශලය මෙනෙහි කරනු කැමති කල්හි තමා ගේ ප්‍රතිසන්ධිචිත්තයට සමාන වූ සිතක් භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡෙද වශයෙන් ඉපද නිරුඪ වූ පසු ශීලචේතනා ප්‍රධාන කාමාවචර කුශලය අරමුණු කොට මනෝද්වාරාවර්ජනය ද මහාකුසල් අට අතුරෙන් එක් සිතක් ජවනකෘත්‍යයෙන් සත් වරක් ද විභූතාරම්මණ වීථියක් වේ නම් එකොළොස් තදරම්මණයන් ගෙන් එක් සිතක් දෙවරක් ද ඉපදීමෙන් පසු භවාඞ්ග පතනය වේ. අවිභූතාරම්මණ වීථියක් වේ නම් ජවනාවසානයේ භවාඞ්ගයෝ වෙති. අනතුරුව සුදුසු පරිදි තදනුවර්තික මනෝද්වාරවීථීහු වෙති. එසේ උපදනා චිත්තවීථීන් ගේ ශීලචේතනා ප්‍රධාන කාමාවචර කුශලචිත්තයන් ඒවා අරමුණු කොට උපදනා කාමාවචර කුශල චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණ

Non-commercial distribution

පච්චයෙන පච්චයො" යනුවෙන් වදළ සේක. මෙය දශශීලය පිළිබඳ ප්‍රත්‍යයප්‍රත්‍යයෝත්පන්න විභාගය ය.

**"උපොසථ කම්මං කත්වා තං පච්චවෙක්ඛති"** යන අනුවාද පාලියෙහි "උපොසථ කම්මං කත්වා" යනුවෙන් දැක්වෙන පෞෂධ ශීල චේතනා ප්‍රධාන කාමාවචරකුශලය 'තං පච්චවෙක්ඛති' යනුවෙන් දැක්වෙන ප්‍රත්‍යවේක්ෂා කරන කාමාවචර කුශලයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ ය. ප්‍රාණාතිපාතාදි කර්‍ම අටෙන් වළක්නා තැනැත්තා හට තමා ගේ ප්‍රතිසන්ධිචිත්තයට සමාන සිතක් භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡේද වශයෙන් ඉපද නිරුද්ධ වූ පසු (ඉහත කී පරිදි කර්‍ම අට ගැන කියනු.) -පෙ- අරමුණු කොට මනෝද්වාරාවර්ජනය ද මහාකුසල් අට අතුරෙන් එක් සිතක් ජවනකෘත්‍යයෙන් ද ඉපද නිරුද්ධ වූ පසු විභූතාරම්මණවීථියක් වේ නම් එකොළොස් තදාරම්මණයන් ගෙන් එක් සිතක් දෙවරක් තදාරම්මණකෘත්‍යයෙන් ඉපද නිරුද්ධ වූ පසු භවාඞ්ගය වේ. අවිභූතාරම්මණ වීථියක් නම් ජවනාවසානයෙහි භවාඞ්ගය වේ. මේ චිත්තයන් ගෙන් ප්‍රාණාතිපාතාදියෙන් වැළකීම සිදු වේ. සෙස්ස දශශීලයෙහි කී පරිදි විස්තර කරනු.

(පඤ්චශීලය ගිහියන් ගේ නිත්‍යශීලය ය, දශශීලය සාමණේරයන් ගේ නිත්‍ය ශීලය ය. භික්ෂූන් ගේ චතුපාරිශුද්ධිශීලය හා වත්පිළිවෙත් ද "සීලංසමාදියිත්වා" යනුවෙහි ම සඞ්ග්‍රහ වෙති)

**"පුබ්බෙ සුචිණ්ණානි පච්චවෙක්ඛති"** යන අනුවාදපාලියෙහි "පුබ්බෙ සුචිණ්ණානි" යනුවෙන් දැක්වෙන දාන ශීල පෞෂධශීල චේතනා ප්‍රධාන කාමාවචර කුශලය "පච්චවෙක්ඛති" යනුවෙන් දැක්වෙන ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ කාමාවචරකුශලයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ප්‍රත්‍යය වන අකාරය මෙසේ ය. පෙර පවත්වන ලද දාන ශීල පෞෂධශීල චේතනා ප්‍රධාන කාමාවචරකුශලය ප්‍රත්‍යවේක්ෂා කරනු කැමති කල්හි තමා ගේ ප්‍රතිසන්ධි චිත්තය හා සමාන සිතක් භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡේද වශයෙන් ඉපද නිරුද්ධ වූ පසු පෙර ස්වසන්තානයෙහි ඇති වූ දාන ශීල පෞෂධශීල චේතනා ප්‍රධාන කාමාවචරකුශලය අරමුණු කොට මනෝද්වාරාවර්ජනය ද කාමාවචරකුශල් සිත් අට අතුරෙන් එක් සිතක් ජවනකෘත්‍යයෙන් සත්වරක් ද ඉපද නිරුද්ධ වූ පසු විභූතාරම්මණ වීථියක් වේ නම් තදාරම්මණය දෙවරක් වීමෙන් පසු කාමභවාඞ්ගය වේ. අවිභූතාරම්මණවීථියක් වේ නම් සුද්දසු භවාඞ්ගයක් වේ. මේ වීථියෙන්

Non-commercial distribution

පෙර පවත්වන ලද දන ශීල පෞෂධශීල චේතනා ප්‍රධාන කාමාවචරකුශලය ප්‍රත්‍යයවේක්‍ෂා කෙරේ. අනතුරුව සුදුසු පරිදි තදනුවර්ථක මනෝද්වාර වීථීහු වෙති. එසේ උපදනා කාමාවචර කුසල චිත්තයන්ට පෙර පවත්වන ලද දනශීල පෞෂධශීල චේතනා ප්‍රධාන කාමාවචර කුශලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො" යනුවෙන් දැක්වූ සේක.

"ඣානා වුට්ඨහිත්වා ඣානං පච්චවෙක්ඛති" යන අනුවාදපාලියෙහි "ඣානං" යනුවෙන් කියැවෙන මහද්ගතකුශල නවය "පච්චවෙක්ඛති" යනුවෙන් දැක්වෙන ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ කාමාවචර කුශලයට ආරම්මණශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙ සේ ය. දශකසිණයන් අතුරෙන් යම්කිසි කසිණයක ප්‍රතිභාගනිමිත්තය ගෙන පඨවී පඨවී යනාදීන් පරිකම් කරන්නා වූ ප්‍රථමධ්‍යානය ලැබීමේ හේතු සම්පත් ඇත්තා වූ කාම ත්‍රිහේතුක පුද්ගලයාහට ඒ ප්‍රථම ධ්‍යානය ඉපදීමට සමීප වූ කල්හි තමා ගේ ප්‍රතිසන්ධිචිත්තයට සමාන වූ සිතක් භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡෙද වශයෙන් දෙවරක් ඉපද නිරුඩ වූ පසු කසිණ ප්‍රතිභාගනිමිත්තය අරමුණු කොට මනෝද්වාරාවර්ජන චිත්තය උපදී. අනතුරු ව මහාකුශල ප්‍රථම චිත්තද්වය අතුරෙන් යම්කිසි සිතක් ඒ පුද්ගලයා මන්දප්‍රාඥ දන්ධාභිඥයෙක් වේ නම් පරිකම් උපචාරය අනුලෝම ගෝත්‍රභූ වශයෙන් සතර වරක් ද තීක්‍ෂණප්‍රාඥ ක්‍ෂිප්‍රාභිඥ පුද්ගලයෙක් වේ නම් උපචාර අනුලෝම ගෝත්‍රභූ වශයෙන් තෙවරක් ද ඉපද නිරුඩ වූ පසු පස් වනු ව හෝ සතර වනු ව විතර්කාදි පඤ්චාඞ්ගයෙන් යුක්ත වූ ප්‍රථමධ්‍යාන චිත්තය එක් වරක් උපදනේ ය. අනතුරු ව කාමත්‍රිහේතුක භවාඞ්ග සතර අතුරෙන් යම්කිසි සිතක් භවාඞ්ග වශයෙන් උපදී.

ප්‍රථමධ්‍යානය ලැබූ ත්‍රිහේතුක පුද්ගලයා ඒ ප්‍රථමධ්‍යානයට අයත් විතර්කය මෙනෙහි කරනු කැමැති කල්හි තමා ගේ ප්‍රතිසන්ධි චිත්තයට - පෙ- නිරුඩ වූ පසු විතර්කය අරමුණු කොට මනෝද්වාරාවර්ජනය ද අනතුරු ව මහාකුසල් අට අතුරෙන් යම්කිසි සිතක් ප්‍රත්‍යවේක්‍ෂා ජවන වශයෙන් සත් වරක් හෝ සතර වරක් පස් වරක් හෝ ඉපද නිරුඩ වූ පසු සුදුසු පරිදි භවාඞ්ගයෝ වෙති. මේ වීථියෙන් තමා ලැබූ ධ්‍යානයෙහි වූ විතර්කය දැන ගනී. එසේ ම විචාරය මෙනෙහි කරන්නා වූ වීථියක් ද, ප්‍රීතිය මෙනෙහි කරන්නා වූ වීතියක් ද සුඛය මෙනෙහි කරන්නා වූ වීථියක් ද, ඒකාග්‍රතාව මෙනෙහි කරන්නා වූ වීථියක් ද විතර්කාදි ධ්‍යානාඞ්ග සමූහය ම මෙනෙහිකරන්නා වූ වීථියක් ද ඇති වේ. මේ වීථි-වලින් ප්‍රථමධ්‍යාන වීථියෙහි ධ්‍යානකුශලචිත්තය ප්‍රත්‍යවේක්‍ෂා වීථි සයෙහි

Non-commercial distribution

කාමාවචර ජවනයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම 'කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො" යනුවෙන් වදළ සේක.

ප්‍රථමධ්‍යානය ලැබූ ත්‍රිහේතුක පුද්ගලයා ප්‍රථමධ්‍යාන සමාපත්තියට සමවදිනු කැමති කල්හි තමාගේ ප්‍රතිසන්ධි චිත්තයට -පෙ- නිරුද්ධ වූ පසු කසින ප්‍රතිභාග නිමිත්තය අරමුණු කොට මනෝද්වාරාවර්ජන චිත්තය ද මහාකුශල ප්‍රථමචිත්තද්වය අතුරෙන් එක් සිතක් මන්දප්‍රාඥ තීක්ෂණප්‍රාඥ පුද්ගලයන් ගේ වශයෙන් සතර වරක් හෝ තුන් වරක් පරිකර්ම උපචාර අනුලෝම ගෝත්‍රභූ යන නම් වලින් ඉපද නිරුද්ධ වූ පසු තීක්ෂණ ප්‍රාඥයාට සතර වැනි ජවනය වශයෙන් ද මන්දප්‍රාඥයාට පස් වන ජවනය වශයෙන් ද ධ්‍යානාඞ්ගපඤ්චකයෙන් යුක්ත වූ රූපාවචර ප්‍රථමධ්‍යාන චිත්තය භවාඞ්ගසන්තතිය සේ බොහෝ වාර ගණනක් උපදනේ ය. අනතුරු ව කාමත්‍රිහේතුකභවාඞ්ග සතර ය රූපාවචර භවාඞ්ග පස ය යන මොවුන්ගෙන් එක් චිත්තයක් භවාඞ්ගකෘත්‍යයෙන් උපදී.

ප්‍රථමධ්‍යානයට සමවැදුණු ත්‍රිහේතුක පුද්ගල තෙමේ ධ්‍යානාඞ්ගයන් මෙනෙහි කරන කල්හි තමාගේ ප්‍රතිසන්ධි චිත්තයට -පෙ- පසු විතර්කය අරමුණු කොට මනොද්වාරාවජ්ජන චිත්තය ද මහා කුශල් අට අතුරෙන් එක් සිතක් ජවන කෘත්‍යයෙන් සත් වරක් හෝ සතර වරක් පස් වරක් ද ඉපද නිරුද්ධ වීමෙන් පසු කාමත්‍රිහේතුක භවාඞ්ග සතරය රූපාවචර භවාඞ්ග සතරය යන මොවුන්ගෙන් යම්කිසි සිතක් භවාඞ්ගකෘත්‍යයෙන් උපදී. මේ වීථියෙන් තමා සමවැදුණු ප්‍රථමධ්‍යානයේ විතර්කය දැනගනී. අනතුරු ව විචාරය මෙනෙහි කරන වීථියක් ද ප්‍රීතිය මෙනෙහි කරන වීථියක්ද සුඛය මෙනෙහි කරන වීථියක් ද ඒකාග්‍රතාව මෙනෙහි කරන වීථියක් ද ධ්‍යානාඞ්ග සියල්ල මෙනෙහි කරන වීථියක් ද ඇතිවේ. මේ වීථිවලින් සමාපජ්ජන වීථියෙහි ඇති වූ රූපාවචර ප්‍රථමධ්‍යාන චිත්තය ආවර්ජන වීථිවල කාමාවචර කුශල ජවනයන්ට හේතුශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො -පෙ-" යනුවෙන් දැක්වූ සේක.

මේ ක්‍රමයෙන් ඉතිරි රූපාවචරධ්‍යාන සතර හා අරූපාවචර ධ්‍යාන සතර ද ඒවා පිළිබඳ ප්‍රත්‍යවේක්ෂා වීථිද දක්වා ප්‍රත්‍යය ප්‍රත්‍යයෝත්පන්න විභාගය කරනු. වෙනස් වන්නේ ප්‍රත්‍යවේක්ෂා වීථිසඞ්ඛ්‍යාව පමණෙකි. ඒවා ඒ ඒ ධ්‍යානයන්ට අයත් ධ්‍යානාඞ්ග ප්‍රමාණයෙන් දැක්විය යුතුය.

**"සෙක්ඛා ගොත්‍රභුං පච්චවෙක්ඛන්ති"** යන අනුවාද පාලියෙහි "ගොත්‍රභුං" යනුවෙන් දැක්වෙන සෝවාන්මාර්ග චිත්තයට පූර්වයෙහි උපදනා මහාකුශල ඥානසම්ප්‍රයුක්තචිත්තය "පච්චවෙක්ඛන්ති" යනුවෙන් දැක්වෙන සෝවාන් පුද්ගලයාගේ සන්තානයෙහි උපදනා ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ කාමාවචර කුශලචිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

Non-commercial distribution

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ ය. සංස්කාරයන් අනිත්‍යාදි වශයෙන් සම්මර්ශනය කරමින් හැසිරෙන්නා වූ සෝවාන් මාර්ගයට පැමිණීමේ භාග්‍යය ඇති ත්‍රිහේතුක පෘථග්ජන පුද්ගලයාහට සෝවාන්මාර්ගචිත්තය ඉපදීමට ළං වූ කල්හි තමාගේ ප්‍රතිසන්ධි චිත්තයට -පෙ- ඉපද නිරුද්ධ වූ පසු ලෞකික සිත් එක් අසූව ය, චෛතසික දෙපනස ය, රූප අට විස්ස ය යන ත්‍රෛභූමක සංස්කාරයන් අතුරෙන් යම්කිසිවක් හෝ සියල්ල ම හෝ අරමුණුකොට මනෝද්වාරාවර්ජනය ඉපද නිරුද්ධ වේ. අනතුරුව න සම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් සතර අතුරෙන් යම්කිසි සිතක් ත්‍රෛභූමකසංස්කාරයන් අරමුණු කොට මන්දප්‍රාඥයාගේ වශයෙන් පරිකර්ම උපචාර අනුලෝම නාමයෙන් තෙවරක් හෝ තීක්ෂණප්‍රාඥයා ගේ වශයෙන් උපචාර අනුලෝම නාමයෙන් දෙවරක් හෝ ඉපද නිරුද්ධ වීමෙන් පසු ඒ සිතම නිර්වාණය අරමුණු කරමින් ගෝත්‍රභූ යන නාමයෙන් ඉපද නිරුද්ධ වේ. අනතුරුව නිර්වාණය අරමුණු කරමින් සෝවාන් මාර්ග චිත්තය එක් වරක් ඉපද නිරුද්ධ වේ. එයට අනතුරුව ඒ සෝතාපත්ති මග්ග චේතනාවේ ඵලය වූ සෝතාපත්ති ඵල චිත්තය තීක්ෂණප්‍රාඥයාට තෙවරක් ද මන්දප්‍රාඥයාට දෙවරක් ද ඉපද නිරුද්ධ වීමෙන් පසු ත්‍රිහේතුක භවාඞ්ගචිත්තයක් සුදුසු පරිදි උපදනේ ය.

සෝවාන් පුද්ගලයා විසින් තමාගේ ගෝත්‍රභූචිත්තය මෙනෙහි කරනු කැමති කල්හි තමාගේ ප්‍රතිසන්ධිචිත්තයට සමාන -පෙ- ඉපද නිරුද්ධ වූ පසු සෝවාන් මාර්ගචිත්තයට පූර්වයෙන් ඇති වූ ගෝත්‍රභූචිත්තය අරමුණුකොට මනෝද්වාරාවර්ජනය ද එයට අනතුරු ව ගෝත්‍රභූචිත්තය අරමුණුකොට කාමාවචර කුසල් අට අතුරෙන් එක්සිතක් ජවනකෘත්‍යයෙන් සත්වරක් ද ඉපද නිරුද්ධ වූ පසු පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ග චිත්තයන් අතුරෙන් එක්සිතක් භවාඞ්ගකෘත්‍යයෙන් උපදනේ ය. ඒ වීථියෙහි උපදනා මහාකුශල ජවනයට සෝවාන් පුද්ගලයා ගේ ගෝත්‍රභූචිත්තය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො -පෙ-" යනුවෙන් දැක්වූ සේක.

**"සෙක්ඛා වොදානං පච්චවෙක්ඛන්ති"** යන අනුවාද පාලියෙහි වොදානං යනුවෙන් දැක්වෙන සකෘදගාමි අනාගාමි මාර්ග දෙකට පූර්වයෙහි වෝදන-කෘත්‍යයෙන් උපදනා මහාකුශල ඥානසම්ප්‍රයුක්ත චිත්තය එය ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ කාමාවචර කුශල චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍ය වේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ ය. සකෘදගාමි අනාගාමි පුද්ගලයන් තමතමන් ගේ වෝදන චිත්තයන් මෙනෙහි කරනු කැමති කල්හි තමන් ගේ ප්‍රතිසන්ධි -පෙ- නිරුද්ධ වූ පසු වෝදනකෘත්‍යයෙන් උපන් මහා කුශලචිත්තය අරමුණු කොට මනෝද්වාරාවර්ජනය ද කාමකුසල් අටෙන් එක් සිතක් ජවනකෘත්‍යයෙන් සත් වරක් ද ඉපද නිරුද්ධ වීමෙන් පසු

Non-commercial distribution

ත්‍රිහේතුක භවාඞ්ග තෙළෙස අතුරෙන් එක්තරා සිතක් භවාඞ්ගකෘත්‍යයෙන් උපදී. එසේ උපදනා කාමාවචර ප්‍රත්‍යවේක්‍ෂා ජවනයන්ට වෝදනකෘත්‍යවත් ඥානසම්ප්‍රයුක්ත කාමාවචර කුශලය ආරම්මණශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො -පෙ-" යනුවෙන් දැක්වූ සේක.

**"සෙක්ඛා මග්ගා වුට්ඨහිත්වා මග්ගං පච්චවෙක්ඛන්ති"** යන අනුවාදපාලියෙහි 'මග්ගං' යනුවෙන් දැක්වෙන හෙට්ඨිමමාර්ග තුන "පච්චවෙක්ඛන්ති" යනුවෙන් දැක්වෙන ප්‍රත්‍යවේක්ෂා කරන මහා කුශලඥානසම්පයුක්ත චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙ සේ ය. මෙහි සෝතාපත්තිමග්ග වීථිය යට කී පරිදි විස්තර කරනු. සෝවාන් මාර්ගයට ඵලයට පැමිණි යෝගාවචරයා තමා පැමිණි සෝවාන්මාර්ගය මෙනෙහි කරනු කැමැති කල්හි භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡේදයන්ට අනතුරු ව සෝවාන් මාර්ගය අරමුණු කරමින් මනෝද්වාරාවජ්ජනය ද මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතර අතුරෙන් එක් සිතක් ජවන කෘත්‍යයෙන් සත්වරක් ද ඉපද නිරුධ වීමෙන් පසු පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ගචිත්තයන් ගෙන් එක්සිතක් භවාඞ්ගකෘත්‍යයෙන් උපදී. මේ වීථියෙහි මාර්ගය ප්‍රත්‍යවේක්ෂා කරන මහාකුශල ඥානසම්ප්‍රයුක්ත ජවනයට සෝවාන්මාර්ගචිත්තය ආරම්මණ-ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො කුසලස්ස -පෙ-" දැක්වූ සේක. මේ නයින් සකෘදගාමි මාර්ග අනාගාමිමාර්ග වීථි හා ප්‍රත්‍යවේක්ෂාවීථි ද දක්වා ප්‍රත්‍යවීමේ ආකාරය විස්තර කරනු.

**"සෙක්ඛා වා පුථුජ්ජනා වා කුසලං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති"**යන මෙහි "කුසලං" යනුවෙන් දැක්වෙන ත්‍රෛභූමික කුශලය "අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සන්ති" යනුවෙන් දැක්වෙන විදර්ශනා කරන කාමාවචර කුශලයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍ය වේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ ය. ශෛක්ෂයන් විසින් හෝ පෘථග්ජනයන් විසින් හෝ ත්‍රෛභූමික කුශලය අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කරනු කැමති කල්හි භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡේදයන්ට අනතුරුව ත්‍රෛභූමික කුශලයන් අරමුණු කොට මනෝද්වාරාවජ්ජනය හා මහා කුසල් අට අතුරෙන් එක්සිතක් ජවනකෘත්‍යයෙන් සත් වරක් ද ඉපද නිරුධ වීමෙන් පසු ත්‍රිහේතුකභවාඞ්ග තෙළෙස අතුරෙන් යම්කිසි සිතක් භවාඞ්ගකෘත්‍යයෙන් උපදනේ ය. විදර්ශනා කිරීම් වශයෙන් මෙ බඳු වීථිහු බොහෝ ඇති වෙති. ඒ වීථිවල කාමාවචර කුශල ජවනයන්ට ත්‍රෛභූමිකකුශලයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවීම "කුසලො ධම්මො -පෙ-" දැක්වූ සේක.

Non-commercial distribution

"**සෙක්ඛා වා පුථුජ්ජනා වා චේතොපරියඤාණෙන කුසල චිත්තසමඞ්ගිස්ස චිත්තං ජානන්ති**" යන අනුවාද පාලියෙහි "කුසලචිත්තසමඞ්ගිස්ස චිත්තං" යනුවෙන් දැක්වෙන අතීත සත් වන දිනයේ පටන් අනාගත සත්වන දින දක්වා ඇති කාලයෙහි අන්‍ය පුද්ගලයන් ගේ සන්තානයෙහි කාලත්‍රයට අයත්වූ අභීත් මාර්ගී වර්ජිත කුසල් සිත් විස්ස ඒවා දක්නා වූ ශෛක්‍ෂ පෘථග්ජනයන්ගේ චේතෝපරිය කුසලාභිඥාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍ය වේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ ය. චේතොපරිය කුසලාභිඥාව ලබා සිටින්නාවූ ශෛක්‍ෂ පෘථග්ජන පුද්ගලයන් ගෙන් කෙනකු අතීත සත් වන දිනට හා අනාගත සත්වන දිනයටත් අතර කාලත්‍රයට අයත් වූ අභීත්මාර්ගීයෙන් අන්‍ය වූ පරසන්තාන ගත කුශලයන් දකිනු පිණිස රූපාවචර පඤ්චමධ්‍යානයට සමවදිනු කැමති කල්හි භවාඞ්ගචලන භවාඞෙගා්පච්ඡේදයන්ට අනතුරු ව ආලෝක කසිනය අරමුණුකොට මනොද්වාරාවජ්ජන චිත්තය ඉපිද නිරුධ වේ. අනතුරුව එයම අරමුණුකොට මහාකුශල උපේක්ෂාසහගත ඥානසම්ප්‍රයුක්ත සිත් දෙක අතුරෙන් එක් සිතක් මන්දප්‍රාඥ තීක්‍ෂණප්‍රාඥ පුද්ගලයන් ගේ වශයෙන් සතර වරක් හෝ තුන් වරක් ඉපද නිරුධ වූ පසු රූපාවචර පඤ්චමධ්‍යානචිත්තය භවාඞ්ග සන්තතිය සේ බොහෝ වාර ගණනක් ඉපදීමෙන් පසු භවාඞ්ගයෝ වන්නාහ. අනතුරු ව පරචිත්තය දැන ගැනීමට අධිෂ්ඨාන කිරීමේදී භවාඞ්ග චලන භවඞෙගා්පච්ඡේදයනට අනතුරු ව අධිෂ්ඨානය ආවර්ජනය කිරීම් වශයෙන් ආවර්ජනචිත්තය ද මහාකුසල් සිත් අට අතුරෙන් එක් සිතක් "ඉමස්ස චිත්තං ජානාමි" යි අධිෂ්ඨානකිරීම් වශයෙන් ජවන කෘත්‍යයෙන් සත් වරක් ද ඉපදීමෙන් පසු භවාඞ්ගයෝ වෙති.

එයට අනතුරු ව චේතෝපරිය කුසලාභිඥාවට පාදක වන රූපාවචර පඤ්චමධ්‍යානයට සමවැදීමේ දී ඉහත කී පරිදි ම නැවත සමාපජ්ජන වීථියක් වේ. පාදකධ්‍යානයෙන් නැගුණු පසු අතීත සප්තම දිනයට හා අනාගත සප්තම දිනයට අතර කාලත්‍රය පර්‍යාපන්න වූ පරසන්තාන ගත අභීත්මාර්ගීයෙන් අන්‍ය වූ කුසල් සිත් විස්ස දක්නා වූ චේතෝපරිය කුසලාභිඥාචිත්තය ඉපදීමේ දී භවාඞ්ගචලන භවාඞෙගා්පච්ඡේදයන්ට අනතුරු ව කුසල්සිත් විස්ස අරමුණු කොට මනෝද්වාරාවජ්ජනය ද මහාකුශල උපේක්ෂාසහගත ඥානසම්ප්‍රයුක්ත සිත් දෙක අතුරෙන් එක් සිතක් මන්දප්‍රාඥ තීක්ෂණප්‍රාඥ පුද්ගලයන්ට අනුරූප පරිදි සතරවරක් හෝ තුන්වරක් ජවනකෘත්‍යයෙන් උපන් පසු රූපාවචර කුශල පඤ්චමධ්‍යාන චිත්තය පරචිත්තය දක්නා වූ චේතොපරිය අභිඥාභාවයෙන් එක් වරක් උපදී. අනතුරු ව භවාඞ්ගයෝ වෙති. අනතුරු ව භවාඞ්ගචලන

Non-commercial distribution

භවාඞ්ගෝපච්ඡෙදයන් ගෙන් පසු චේතොපරියඤාණයෙන් දක්නාලද පරචිත්තය අරමුණු කොට මනෝද්වාරාවජ්ජනය ද මහාකුසල් සිත් අටෙන් එක් සිතක් පරචිත්තය අරමුණු කොට ජවන කෘත්‍යයෙන් සත්වරක් ද ඉපද නිරුඩවීමෙන් පසු භවාඞ්ගයෝ වෙති. ඒ වීථියෙන් පරචිත්තය දැනගන්නේ ය. මේ වීථිවලින් අභිඤ්ඤාවීථියේ චේතෝපරිය ඥානය ප්‍රධාන රූපාවචර කුශල පඤ්චම ධ්‍යාන චිත්තයට හා එයට අනතුරු ව ඇතිවන වීථියේ මහාකුශල ජවනයන්ට ද පරසන්තාන ගත කුසල් සිත් විස්ස ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො" -පෙ- දැක් වූ සේක.

"ආකාසානඤ්චායතන කුසලං විඤ්ඤාණඤ්චායතන කුසලස්ස" යන අනුවාද පාලියෙහි දැක්වෙන වර්තමානාතීතභවයන්හි ස්වසන්තානයෙහි උපන් අකාසානඤ්චායතන කුශලය වර්තමාන භවයෙහි ආකාසානඤ්චායතන කුසලයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ යඃ ආකාසානඤ්චායතන කුශල ධ්‍යානය ලැබූ කාමත්‍රිහේතුක රූපභූමික අකාසානඤ්චායතනභූමික පුද්ගලයන් තමන් ලබා සිටින ආකාසානඤ්චායතන ධ්‍යානයෙහි දෙස් දැක විඤ්ඤාණඤ්චායතනධ්‍යානයේ ශාන්තභාවය දැක එය ලබනු පිණිස අකාසානඤ්චායතන කුශලවිඤ්ඤාණය අරමුණු කොට "විඤ්ඤාණං අනන්තං විඤ්ඤාණං අනන්තං" යි භාවනාවෙහි යෙදීමෙන් විඤ්ඤාණඤ්චායතන ධ්‍යානය ලැබීමට සමීප වූ කල්හි භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡෙදයන් ඉපද නිරුඩ වීමෙන් පසු ආධ්‍යාත්මික සන්තානයෙහි ඇති වූ අකාසානඤ්චායතන විඤ්ඤාණය අරමුණු කොට මනොද්වාරාවජ්ජනය වේ. අනතුරු ව මහාකුශල උපේක්ෂා සහගත ඥානසම්ප්‍රයුක්ත සිත් දෙක අතුරෙන් එක් සිතක් මන්දප්‍රාඥයාට පරිකර්‍ම උපචාර අනුලෝම ගෝත්‍රභූය යි සතර වරක් ද තීක්ෂණප්‍රාඥයා හට උපචාර අනුලෝම ගෝත්‍රභූ කියා තෙවරක් ද උපන් පසු විඤ්ඤාණඤ්චායතන කුශලධ්‍යානය උපදනේ ය. එයට අනතුරුව පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ග නවය ය, ආකාසානඤ්චායතන භවාඞ්ගය යන මොවුන්ගෙන් එක් සිතක් භවාඞ්ග කෘත්‍යයෙන් උපදනේ ය.

විඤ්ඤාණඤ්චායතනධ්‍යානය ලැබූ තැනැත්තේ එයට සමවදිනු කැමති කල්හි භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡෙදයන්ට අනතුරුවූ අතීත වර්තමාන භවදෙකින් එකකදී තමාගේ සන්තානයෙහි උපන් ආකාසානඤ්චා-යතන කුශලචිත්තය අරමුණු කොට මනෝද්වාරාවජ්ජනය ද අනතුරුව මහාකුශලතෘතීයචිත්තද්වය අතුරෙන් එක්සිතක් මන්දප්‍රාඥයෙක් වේ නම් පරිකර්‍ම උපචාර අනුලෝම ගොත්‍රභූ වශයෙන් සතර වරක්ද තීක්ෂණප්‍රාඥයෙක් වේනම් උපචාර අනුලෝම ගෝත්‍රභූ වශයෙන් තෙවරක් ද ඉපදීමෙන් පසු

Non-commercial distribution

විඤ්ඤාණඤ්චායතන කුශලධ්‍යානචිත්තය භවාඞගසනතතිය සේ බොහෝ වාර ගණනක් උපදනේ ය. එයට අනතුරු ව ත්‍රිහේතුක කාමභවාඞග සතර ය රූපාවචර භවාඞග පස ය. ආකාසානඤ්චායතන විඤ්ඤාණඤ්චායතන භවාඞග දෙක ය යන මොවුන් අතුරෙන් එක් සිතක් භවාඞගකෘත්‍යයෙන් උපදින්නේ ය. එසේ උපදනා විඤ්ඤාණඤ්චායතන කුසල චිත්තයන්ට අතීත භවයේ හා වර්තමාන භවයේ ඒ පුද්ගලයා ගේ සන්තානයෙහි උපන් ආකාසානඤ්චායතන කුසල චිත්තයන් ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම කුසලො ධම්මො -පෙ- වදළ සේක.

"**ආකිඤ්චඤ්ඤායතන කුසලං නෙවසඤ්ඤා නාසඤ්ඤායතන කුසලස්ස**" යන අනුවාදපාලියෙහි දැක්වෙන ආකිඤ්චඤ්ඤායතන කුසලය නේවසඤ්ඤා නාසඤ්ඤායතන කුසලයට ප්‍රත්‍යය වන සැටි කියන ලද ක්‍රමය අනුව විස්තර කරනු.

"**කුසලා ඛන්ධා ඉද්ධිවිධ ඤාණස්ස**" යන අනුවාද පාලියෙහි "කුසලාඛන්ධා" යනුවෙන් දැක්වෙන පාදක රූපාවචර කුශල පඤ්චමධ්‍යානය "ඉද්ධිවිධඥාණස්ස" යනුවෙන් දැක්වෙන ඉද්ධිවිධකුසලාභිඤ්ඤාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍ය වේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ ය. රූපයන් නිර්මාණය කරනු පිණිස රූපාවචර පඤ්චමධ්‍යානයට සමවැදීමෙහි දී තමා ගේ ප්‍රතිසන්ධිචිත්තයට සමාන වූ සිතක් භවාඞගචලන භවාඞෙගා්පච්ඡෙද වශයෙන් ඉපද නිරුධ වූ පසු පෘථිවි කසිණ ප්‍රතිභාගනිමිත්ත අරමුණු කොට මනෝද්වාරාවජ්ජනය ද මහාකුශල තෘතියචිත්තද්වය අතුරෙන් එක් සිතක් මන්දප්‍රාඥ තීක්ෂණප්‍රාඥයන්ට අනුරූප පරිදි සතරවරක් හෝ තුන්වරක් ඉපද නිරුධ වූ පසු රූපාවචර පඤ්චමධ්‍යාන චිත්තය භවාඞගසනතතිය සේ බොහෝ වාර ගණනක් උපදනේ ය. අනතුරු ව භවාඞගය වන්නේ ය.

අනතුරු ව "සතං හොමි, සහස්සං හොමි" යනාදීන් අධිෂ්ඨාන කරන කල්හි තමා ගේ ප්‍රතිසන්ධිචිත්තයට -පෙ- පසු අධිෂ්ඨානය අරමුණු කොට මනෝද්වාරාවර්ජනය ද මහාකුසල් සිත් අට අතුරෙන් එකක් අධිෂ්ඨාන ජවන කෘත්‍යයෙන් සත්වරක් ද ඉපද නිරුධ වීමෙන් පසු භවාංගයෝ වෙති.

නැවත ඉද්ධිවිධ කුසලාභිඤ්ඤාවට පාදකවනු පිණිස රූපාවචර කුශල පඤ්චමධ්‍යානයට සමවදනා කල්හි තමා ගේ ප්‍රතිසන්ධිචිත්තයට -පෙ- පසු පඨවී කසිණපටිභාගනිමිත්ත අරමුණු කොට මනෝද්වාරාවර්ජ්ජනය ද මහාකුශල තෘතීය චිත්තද්වය අතුරෙන් එක් සිතක් මන්දප්‍රාඥ -

Non-commercial distribution

තීක්ෂණප්‍රාඥ පුද්ගලයන් ගේ වශයෙන් සතරවරක් හෝ තුන්වරක් ඉපද නිරුධ වීමෙන් පසු රූපාවචර කුශල පඤ්චමධ්‍යාන චිත්තය භවාංග සන්තතිය සේ බොහෝ වාර ගණනක් ද ඉපදීමෙන් පසු භවාංගයෝ වන්නාහ.

අනතුරු ව ඉද්ධිවිධ අභිඤ්ඤාචිත්තය උපදනා කල්හි තමා ගේ ප්‍රතිසන්ධි චිත්තයට -පෙ- පසු රූපාවචර කුශල පඤ්චමධ්‍යානය අරමුණු කොට මනෝද්වාරාවජ්ජනය ද මහා කුශල තෘතීයද්වය අතුරෙන් එක් සිතක් මන්‍දතීක්ෂණප්‍රාඥයන් ගේ වශයෙන් සතර වරක් හෝ තුන්වරක් ද උපන් පසු රූපාවචර පඤ්චමධ්‍යාන චිත්තය පාදක රූපාවචර පඤ්චමධ්‍යානය අරමුණු කරමින් ශතසහස්‍රාදි රූපයන් නිර්මාණය කරමින් ඍද්ධිවිධ අභිඥාකෘත්‍යයෙන් එක් වරක් උපදනේ ය. අනතුරුව භවාංගයෝ වෙති. මේ වීථියට පසු නිර්මිත රූපයන් අරමුණු කොට තදනුවර්තික මනෝද්වාරවීථීහු වෙති.

මේ වීථිවල පාදකරූපාවචර කුශලපඤ්චමධ්‍යානය අභිඤ්ඤා රූපාවචර කුසල පඤ්චමධ්‍යාන චිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො -පෙ-" දැක්වූ සේක.

"**කුසලා ඛන්ධා චෙතොපරියඤාණස්ස**" යන අනුවාදපාලියෙහි "කුසලා ඛන්ධා" යනුවෙන් දැක්වෙන අතීත සප්තමදිනයේ පටන් අනාගත සප්තම දිනය දක්වා කාලයෙහි කාලත්‍රයයට අයත් පරසන්තානගත අභිනමාගී වර්ජිත කුසල් සිත් විස්ස චේතෝපරිය කුසලාභිඤ්ඤාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ. (ප්‍රත්‍යය වන ආකාරය ඉද්ධිවිධඤාණයෙහි කියනලද ක්‍රමය අනුව විස්තර කරනු. චේතෝපරියඤාණයට පාදක වනුයේ ආලෝකකසිණය අරමුණු කරන පඤ්චමධ්‍යානය ය. අධිෂ්ඨානවීථියට අරමුණු වන්නේ අභිනමාගීයෙන් අන්‍ය වූ පරසන්තානගත කුසල් සිත් විස්සය. "ඉමස්ස කුසලචිත්තං ජානාමි" යි අධිෂ්ඨාන කළ යුතු ය. අභිඥාචිත්තයට අරමුණු වන්නේ ද ඒ කුසල් සිත් විස්සමය. මෙහි වෙනස එ පමණය.)

"**කුසලා ඛන්ධා පුබ්බෙනිවාසානුස්සති ඤාණස්ස**" යන අනුවාද-පාලියෙහි "කුසලා ඛන්ධා" යනුවෙන් ගැනෙන අභිනමාගී වර්ජිත කුසල් සිත් විස්ස පුබ්බෙනිවාසනානුස්සති කුසලාභිඤ්ඤාවට ආරම්මණශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො -පෙ-" දැක්වූ සේක. (ප්‍රත්‍යය වන ආකාරය විස්තර කරනු. මෙහි ද පාදක වනුයේ ආලෝක කසිණය අරමුණු කරන පඤ්චමධ්‍යානය ය. අධිෂ්ඨාන කළ යුත්තේ "පුබ්බෙනිවුත්ථං කුසලං ජානාමි" කියා ය. අධිෂ්ඨාන වීථියට හා අභිඥාවීථියට අරමුණු වන්නේ කුසල් සිත් විස්ස ය.)

Non-commercial distribution

"කුසලා ඛන්ධා යථාකම්මූපගඤාණස්ස" යන අනුවාදපාලියෙහි "කුසලා ඛන්ධා" යනුවෙන් ගැනෙන අතීත ලෞකික කුසල් සිත් සතොළොස යථාකම්මූපග කුසලාභිඥාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම කුසලො ධම්මො -පෙ- දැක් වූ සේක. (ප්‍රත්‍යය වන ආකාරය විස්තර කරනු. මෙහි ද පාදක වනුයේ ආලෝකකසිත පඤ්චමධ්‍යානයය. අධිෂ්ඨාන කළ යුත්තේ "අතීතං කම්මං ජානාමි" කියා ය. අධිෂ්ඨාන වීථියට හා අභිඥාවීථියට අරමුණුවන්නේ ද අතීත ලෞකික කුසල් සිත් සතොළොස ය.)

"කුසලා ඛන්ධා අනාගතංසඤාණස්ස" යන අනුවාදපාලියෙහි "කුසලා ඛන්ධා" යනුවෙන් ගැනෙන අභිත්මාගීයෙන් අන්‍ය වූ අනාගත කුසල් සිත් විස්ස අනාගතංස කුසලාභිඥාවට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො -පෙ-" දැක් වූ සේක. (ප්‍රත්‍යය වන අයුරු විස්තර කරනු. පාදක වනුයේ ආලෝක කෘත්ස්න පඤ්චමධ්‍යානය ය. අධිෂ්ඨාන කළ යුත්තේ "අනාගතං ඛන්ධං ජානාමි" කියා ය. අධිෂ්ඨාන වීථියට හා අභිඥාවීථියට අරමුණු වන්නේ අනාගත කුසල් සිත් විස්සය.)

කුසලපදවසානවාරයට අනතුරුව අකුසලපදවසානවාරය වදළ සේක. කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො, දනං දත්වා සීලං සමාදියිත්වා -පෙ- දෙමනස්සං උප්පජ්ජති.

**දුර්බෝධපදයන්ගේ අර්ථ**- අස්සාදෙති, ඒ කාමාවචරකුසලය සෝමනස්ස-සහගත ලෝභසම්ප්‍රයුක්ත චිත්තයෙන් අනුභව කරයි: අභිනන්දති, ඒ කුශලය ගැන තෘෂ්ණාසහගත සිතින් සතුටු වෙයි: දෘෂ්ටි වශයෙන් හෝ සතුටු වෙයි: රාගො උප්පජ්ජති: හොඳ පිනකැ යි ඇල්ම ඇති වෙයි: දිට්ඨි උප්පජ්ජති, මම පින් කෙළෙමි ය, මාගේ පින ය කියා දෘෂ්ටිය උපදී. විචිකිච්ඡා උප්පජ්ජති, එය පිනක් ද පිනක් නොවේ ද යනාදීන් සැකය උපදී: උද්ධච්චං උප්පජ්ජති, වික්ෂෙපස්වභාවය (කලබල ගතිය) ඇති වේ: දෙමනස්සං උප්පජ්ජති, දන්දීම් ආදියෙන් මවිසින් වරදක් කරන ලද්දේ ය මෝඩකමක් කරන ලද්දේය යනාදීන් දෙම්නස උපදී: ඣානෙ පරිහීනෙ විප්පටිසාරිස්සදෙමනස්සං උප්පජ්ජති, ධ්‍යානය පිරිහුණුකල්හි නැවත සිහිකරන්නා හට දෙම්නස උපදී: සම්පූර්ණකොට පදර්ථ කියනු.

කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස යනාදි පාලියෙහි අදහස මෙසේ ය. කුශලධර්මය අකුශල ධර්මය හට ආරම්මණ ශක්තියෙන් උපකාර වේ. කෙසේ උපකාර වේ ද යත්, දන් දී මා විසින් උසස් පිනක් කරගන්නා ලද්දේය යි, ඒ කාමාවචර කුශලය සෝමනස්ස සහගත ලෝභසම්ප්‍රයුක්ත සිතින් ආස්වාදනය කරන කල්හි ලෝභමූල සෝමනස්ස සහගත සිත් සතරට ද, මගේ පින ඉතා හොඳය' යි ඒ පින ගැන සතුටු වන කල්හි

Non-commercial distribution

ප්‍රීති සහගත ලෝභමූල චිත්තයට ද පිනට ඇලුම් කරන කල්හි රාගය ප්‍රධාන ලෝභමූල සිත් අටට ද, "මම පිනක් කෙළෙමි" යි වරදවා ගන්නා කල්හි දෘෂ්ටිසම්ප්‍රයුක්ත සිත් සතරට ද, දන් දී මා කෙළේ පිනක් ද පවක් ද යනාදීන් සැක ඇති වන කල්හි විචිකිත්සාසහගත චිත්තයට ද වික්ෂිප්ත වන කල්හි උද්ධච්ච සහගත චිත්තයට ද, දන් දී පසුව ඒ ගැන නොසතුටුවන කල්හි දෝමනස්සසහගත සිත් දෙකට ද ඒ කාමාවචර කුශලය ආරම්මණ ශක්තියෙන් උපකාරක වේ. සීලං සමාදියිත්වා යනාදිය ද මේ නයින් විස්තර කරනු.

වීථීපාලියෙහි "කුසලො ධම්මො" යන කත්‍ෘපාඨයෙන් ලෞකික කුසල් සිත් සතොළොස වූ ප්‍රත්‍ය ධර්‍මය ලැබේ. "අකුසලස්ස ධම්මස්ස" යන සම්ප්‍රදානපාඨයෙන් අකුසල් සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. "ආරම්මණ පච්චයෙන" යන කරණපාඨයෙන් එක් වර සුදුසු පරිදි ලැබිය හැකි ආරම්මණ ආරම්මණාධිපති ආරම්මණූ-පනිස්සය යන ශක්ති තුනෙන් ආරම්මණ සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

"දනං දත්වා තං අස්සාදෙති" යනාදි අනුවාදපාලියෙහි "දනං දත්වා" යනුවෙන් ගැනෙන ත්‍යාගචේතනා ප්‍රධාන කාමාවචර කුශලය "තං අස්සාදෙති" යනුවෙන් ගැනෙන ලෝභමූල සෝමනස්ස සහගත සිත් සතරට ද, "අභිනන්දති" යනුවෙන් ගැනෙන ප්‍රීතිය ප්‍රධාන ලෝභමූල සිත් සතරට ද, "රාගො උප්පජ්ජති" යනුවෙන් ගැනෙන රාගය ප්‍රධාන ලෝභමූල සිත් අටට ද, "දිට්ඨි උප්පජ්ජති" යනුවෙන් ගැනෙන දෘෂ්ටිය ප්‍රධාන ලෝභමූල සිත් සතරට ද, "විචිකිච්ඡා උප්පජ්ජති" යනුවෙන් ගැනෙන විචිකිත්සා සහගත චිත්තයට ද, "උද්ධච්චං උප්පජ්ජති"යනුවෙන් ගැනෙන ඖද්ධත්‍ය සහගත චිත්තයට ද, "දෙමනස්සං උප්පජ්ජති" යනුවෙන් ගැනෙන ද්වේෂමූල සිත් දෙකට ද ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ ය. පරිත්‍යාග චේතනාව ප්‍රධාන කොට ඇති මහාකුසල් සිත් අට අරමුණු කොට ආස්වාදනාභිනන්දනා දි වශයෙන් අකුශලජවනචිත්තවීථීන් උපදනා කල්හි තමා ගේ ප්‍රතිසන්ධිචිත්තයට සමාන සිතක් භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡේද වශයෙන් ඉපද නිරුද්ධ වූ පසු පරිත්‍යාගචේතනා ප්‍රධාන කාමාවචර කුශලය අරමුණු කොට මනෝද්වාරාවජ්ජන චිත්තය ඉපද නිරුද්ධ වේ. එයට අනතුරු ව කුශලය ආස්වාදනය කරන්නේ නම් සෝමනස්සසහගත ලෝභමූල සිත් සතර අතුරෙන් එකක් ද, සතුටු වන්නේ නම් සප්‍රීතික තෘෂ්ණා ප්‍රධාන ලෝභමූල සෝමනස්සසහගත සිත් සතරෙන් එකක් ද, ඇලුම් කරන්නේ නම් රාගප්‍රධාන ලෝභමූල සිත් අට අතුරෙන් එකක් ද, වරදවා ගන්නේ නම්

Non-commercial distribution

ලෝභමූල දෘෂ්ටිසහගත සිත් සතරෙන් එකක් ද, සැක කරන්නේ නම් විචිකිත්සා සහගත සිත ද, වික්ෂිප්ත වන්නේ නම් ඖද්ධත්‍ය සහගත චිත්තය ද, නොසතුටුවන්නේ නම් ද්වේෂමූල සිත් දෙකින් එකක් ද, ජවනකෘත්‍යයෙන් සත්වරක් ඉපද නිරුද්ධ වේ. එය විභූතාරම්මණ වීථියක් වේ නම් එකොළොස් තදරම්මණයන්ගෙන් එක් සිතක් දෙවරක් ඉපද නිරුද්ධ වූ පසු සුදුසු පරිදි කාමභවාඞ්ගයෝ උපදනාහ. අවිභූතාරම්මණවීථියක් වේ නම් ජවනයට අනතුරු ව සුදුසු පරිදි පඤ්චවෝකාර භවාඞ්ගයෝ වෙති. මේ වීථියෙහි අකුශලජවනයන්ට කාමාවචර කුශලය ආරම්මණශක්තියෙන් ප්‍රත්‍යවීම 'කුසලො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො" යනුවෙන් වදළ සේක.

"**සීලං සමාදියිත්වා තං අස්සාදෙති**" යනාදි අනුවාදපාලියෙහි "සීලං සමාදියිත්වා" යනුවෙන් දැක්වෙන ශීලචේතනා ප්‍රධාන කාමාවචර කුශලය "තං අස්සාදෙති" යනුවෙන් දැක්වෙන ලෝභමූල සෝමනස්ස සහගත සිත් සතරට ද, -පෙ- ද්වේෂමූල සිත් දෙකට ද ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ. මෙසේ සීලචේතනා ප්‍රධාන කාමාවචර කුශලය දෙළොස් අකුශලයන්ට ම ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ. ප්‍රත්‍යය වන අකාරය ඉහත කී පරිදි විස්තර කරනු.

"**උපොසථකම්මං කත්වා තං අස්සාදෙති**" යනාදි අනුවාද පාලියෙහි "උපොසථ කම්මං කත්වා" යනුවෙන් දැක්වෙන අෂ්ටාඞ්ග පෞෂධ ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුසලය -පෙ- (ඉහත කී පරිදි විස්තර කරනු.)

"**පුබ්බෙ සුචිණ්ණානි අස්සාදෙති**" යනාදි අනුවාද පාලියෙහි "පුබ්බෙ සුචිණ්ණානි" යනුවෙන් දැක්වෙන පෙර පවත්වන ලද දන ශීල අෂ්ටාඞ්ග ශීල චේතනා ප්‍රධාන කාමාවචර කුශලය -පෙ- විස්තර කරනු.

"**ඣානා වුට්ඨහිත්වා ඣානං අස්සාදෙති**" යනාදි අනුවාද පාලියෙහි 'ඣානා' යනුවෙන් දැක්වෙන මහද්ගත කුශල නවය -පෙ- විස්තර කරනු.

"**ඣානෙ පරිහීනෙ විප්පටිසාරිස්ස දොමනස්සං උප්පජ්ජති**" යන අනුවාදපාලියෙහි "ඣානෙ පරිහීනෙ" යනුවෙන් දැක්වෙන පරිහීන මහද්ගත කුශල ධ්‍යානය "දොමනස්සං උප්පජ්ජති" යනුවෙන් දැක්වෙන ද්වේෂමූලික අකුශල ජවනයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙ සේ යඃ යම් කිසි නුසුදුසු කරුණකින් පිරිහුණා වූ ධ්‍යානය අරමුණු කොට ද්වේෂමූලජවනය උපදනා කල්හි තමා ගේ ප්‍රතිසන්ධිචිත්තයට සමාන වූ කාමත්‍රිහේතුක භවාඞ්ගයක් භවාඞ්ගචලන

Non-commercial distribution

භවාඞ්ගෝපච්ඡෙද වශයෙන් ඉපද නිරුද්ධ වූ පසු "පරිහීනධ්‍යානය අරමුණු කොට මනෝද්වාරාවජ්ජනය ද, එයට අනතුරු ව ද්වේෂමූලචිත්තද්වයෙන් එක් සිතක් ජවන කෘත්‍යයෙන් සත්වරක් ද, ඉපදීමෙන් පසු ඒ පුද්ගලයා කාමත්‍රිහේතුකෝපේක්ෂාසහගත චිත්තයකින් පිළිසිඳගත් කෙනකු වී නම් කාමත්‍රිහේතුකෝපේක්ෂාසහගත භවාඞ්ග දෙකින් එක් සිතක් භවාඞ්ගකෘත්‍යයෙන් උපදනේ ය. හේ සෝමනස්ස ප්‍රතිසන්ධියකු වී නම් උපේක්ෂාසහගත සන්තීරණ චිත්තය පෙර පුරුදු අරමුණක් ගනිමින් ආගන්තුක භවාඞ්ගකෘත්‍යයෙන් ඉපද නිරුද්ධ වීමෙන් පසු එයින් අනන්තරාදි ප්‍රත්‍යයන් ලැබ කාමත්‍රිහේතුක සෝමනස්ස භවාඞ්ග දෙකින් එක් සිතක් භවාඞ්ගකෘත්‍යයෙන් උපදනේ ය. මේ වීථියෙහි අකුශලජවනයන්ට පරිහීන ධ්‍යානකුශලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම කුසලො ධම්මො -පෙ- පච්චයො යනුවෙන් වදළ සේක.

කුසලපදවසානවාරයට අනතුරු ව අබ්‍යාකතපදවසානවාරය වදළ සේක. එනම්, "කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස -පෙ- අනාගතංස ඤාණස්ස ආවජ්ජනාය ආරම්මණපච්චයෙන පච්චයො" යනුයි. පදථී, විපාකො තදාරම්මණතා උප්පජ්ජති, විපාකචිත්තය තදාරම්මණභාවයෙන් උපදී: සෙස්ස සුගම ය.

"කුසලො ධම්මො" යන කර්තෘ පාඨයෙන් එක් විසි කුශල චිත්තය වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් තදාරම්මණ එකොළොස ය, පඤ්චද්වාරාවර්ජනයෙන් අන්‍ය වූ කාමක්‍රියා දශය ය, විඤ්ඤාණඤ්චායතන විපාකක්‍රියා දෙක ය, නෙවසඤ්ඤා නාසඤ්ඤායතන විපාක ක්‍රියා දෙක ය, චෙතෝපරිය පුබ්බෙනිවාසානුස්සති යථාකම්මූපග අනාගතංස ක්‍රියාභිඥාවෝ ය, විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික තෙතිස ය යන ප්‍රත්‍යයෝත්පන්න නාමස්කන්ධයෝ ලැබෙත්. කරණපාඨයෙන් සුදුසු පරිදි එක්වරලැබෙන ආරම්මණ ආරම්මණාධිපති ආරම්මණූපනිස්සය යන ශක්ති තුනෙන් ආරම්මණශක්තිය ලැබේ.

"අරහා මග්ගා වුට්ඨහිත්වා මග්ගං පච්චවෙක්ඛති" යන අනුවාද පාලියෙහි "මග්ගා" යනුවෙන් දැක්වෙන අභිඥාගී කුශලය "පච්චවෙක්ඛති" යනුවෙන් දැක්වෙන ප්‍රත්‍යවේක්ෂා කරන කාමක්‍රියා චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ප්‍රත්‍යය වන අකාරය මෙසේ ය. අභිඥාගීවීථිය විස්තර කරනු. අභිඥ් පුද්ගලයා තමා ලත් අභිඥාගීය ප්‍රත්‍යවේක්ෂා කරනු කැමති කල්හි තමා ගේ ප්‍රතිසන්ධි චිත්තයට -පෙ- අභිඥාගීය අරමුණු කොට

Non-commercial distribution

මනෝද්වාරාවජ්ජන ද මහාක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිත් සතරින් එක් සිතක් ප්‍රත්‍යවේක්ෂා ජවන කෘත්‍යයෙන් සත් වරක් ද ඉපද නිරුද්ධ වීමෙන් පසු භවාඞ්ගය වේ. මේ වීථිවල අභිඥාර්ත්මාගී චිත්තය එය ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ කාමක්‍රියා චිත්තයන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො අබ්‍යාකතස්ස -පෙ-" වදළ සේක.

"**පුබ්බෙ සුචිණ්ණානි පච්චවෙක්ඛති**" මෙහි පච්චවෙක්ඛති යනුවෙන් දැක්වෙන්නේ ප්‍රත්‍යවේක්ෂා කරන කාමක්‍රියා ජවනයෝ ය. වීථිය දක්වා විස්තර කරනු. "**කුසලං අනිච්චතො**" යනාදිය ද එසේ ම විස්තර කරනු.

"**චෙතොපරියඤාණෙන කුසලචිත්ත සමඞ්ගිස්ස චිත්තං ජානාති**" මෙහි ක්‍රියාභිඥාව ගැනීම ම වෙනස ය.

"**සෙක්ඛා වා පුථුජ්ජනා වා කුසලං අනිච්චතො -පෙ- තදාරම්මණතා උප්පජ්ජති**" යන අනුවාද පාලියෙහි "කුසලං" යනුවෙන් ගැනෙන කාමාවචර කුශලය "සෙක්ඛා වා පුථුජ්ජනා වා කුසලං අනිච්චතො දුක්ඛතො අනත්තතො විපස්සති කුසලෙ නිරුද්ධෙ විපාකො තදාරම්මණතා උප්පජ්ජති" යනුවෙන් ගැනෙන අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් විදර්ශනා කරන කාමාවචර කුශල ජවනය කෙරෙන් උපදනා තදාරම්මණ එකොළොසට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යවේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ ය - කාමකුශලය අරමුණු කොට උපදනා විදර්ශනා ජවනය කෙරෙන් තදාරම්මණය ඉපදීමට ඇතිකල්හි තමාගේ ප්‍රතිසන්ධි චිත්තයට -පෙ- පසු කාමකුශලය අරමුණු කොට මනොද්වාරාවජ්ජනය ද එයට අනතුරුව මහාකුශලයන් ගෙන් එක් සිතක් විදර්ශනා ජවනකෘත්‍යයෙන් සත් වරක් ද ඉපදීමෙන් පසු එකොළොස් තදාරම්මණයන් ගෙන් එක් සිතක් තදාරම්මණකෘත්‍යයෙන් උපදී. අනතුරුව සුදුසු භවාඞ්ගචිත්තයක් වේ. මේ වීථියෙහි තදාරම්මණ චිත්තයට විදර්ශනා කරනු ලබන කාමාවචර කුශලචිත්තයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම කුසලො ධම්මො අබ්‍යාකතස්ස -පෙ-" වදළ සේක, (රූපාරූප කුශලයන් අනිත්‍යාදි වශයෙන් මෙනෙහි කිරීමේ දී තදාරම්මණය නො වන බැවින් මෙහි කාමකුශලයම ගන්නා ලදී.)

"**කුසලං අස්සාදෙති අභිනන්දති -පෙ- තදාරම්මණතා උප්පජ්ජන්ති**" යන අනුවාදපාලියෙහි 'කුසලං' යනුවෙන් ගැනෙන කාමාවචර කුශලය "අස්සාදෙති අකුසලෙ නිරුද්ධෙ විපාකො තදාරම්මණතා උප්පජ්ජති" යනුවෙන් ගැනෙන ලෝභමූල සෝමනස්ස සහගත චිත්තයන් කෙරෙන් වන තදාරම්මණයට ද, 'අභිනන්දති අකුසලෙ නිරුද්ධෙ විපාකො තදාරම්මණතා

Non-commercial distribution

උප්පජ්ජති' යනුවෙන් දැක්වෙන සප්‍රීතික තෘෂ්ණා ප්‍රධාන ලෝභමූල සෝමනස්ස සහගත ජවනයන් කෙරෙන් වන තදරම්මණයට ද, 'රාගො උප්පජ්ජති අකුසලෙ -පෙ- උප්පජ්ජති' යනුවෙන් දැක්වෙන රාග ප්‍රධාන ලෝභමූල ජවනයන් කෙරෙහි වන තදරම්මණයට ද, "දිට්ඨි උප්පජ්ජති -පෙ- අකුසලෙ -පෙ- උප්පජ්ජති" යනුවෙන් දැක්වෙන දෘෂ්ටිසම්ප්‍රයුක්ත ජවනයන් කෙරෙන් වන තදරම්මණයටද, 'විචිකිච්ඡා උප්පජ්ජති අකුසලෙ -පෙ- තදරම්මණතා උප්පජ්ජති' යනුවෙන් දැක්වෙන විචිකිච්ඡා සහගත ජවනය කෙරෙන් වන තදරම්මණයට ද, "උද්ධච්චං උප්පජ්ජති -පෙ- විපාකො තදරම්මණතා උප්පජ්ජති" යනුවෙන් දැක්වෙන උද්ධච්චසහගත ජවනය කෙරෙන් වන තදරම්මණයට ද, "දොමනස්සං උප්පජ්ජති -පෙ- තදරම්මණතා උප්පජ්ජති" යනුවෙන් දැක්වෙන දෝසමූල ජවනය කෙරෙන් වන තදරම්මණ සයටද ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යයවේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ ය. කාමකුශලය අරමුණුකොට ආස්වාදනාභිනන්‍දනාදි වශයෙන් උපදනා අකුශල ජවනයන් කෙරෙන් තදරම්මණය වීමෙහි දී භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡෙදයන්ට අනතුරුව කාමකුශලය අරමුණු කොට මනොද්වාරාවජ්ජනයද, කාමකුශලය අරමුණු කොට එය ආසවාදනය කෙරේ නම් ලෝභමූල සෝමනස්සසහගත සිත් සතරෙන් එකක් ද, එයට සතුටු වේ නම් සප්‍රීතික තෘෂ්ණාව ප්‍රධාන ලෝභමූල සෝමනස්ස සහගත සිත් සතරෙන් එකක් ද, එයට ඇලුම් කෙරේ නම් රාගය ප්‍රධාන ලෝභමූල සිත් අට අතුරෙන් එකක් ද, වරදවා ගනිනම් දෘෂටිසම්ප්‍රයුක්තසිත් සතරෙන් එකක් ද, සැක කෙරේ නම් විචිකිත්සා සහගත චිත්තය ද, වික්ෂිප්ත නම් ඖද්ධත්‍යසහගත චිත්තය ද, නො සතුටු වේ නම් ද්වේෂමූල සිත් දෙකින් එකක් ද ජවනකෘත්‍යයෙන් සත් වරක් ඉපදීමෙන් පසු එකොළොස් තදරම්මණයන් ගෙන් එක් සිතක් තදරම්මණකෘත්‍යයෙන් දෙවරක් උපදී. අනතුරුව කාමභවාඞ්ගයන් ගෙන් එක් සිතක් සුදුසු පරිදි උපදී. මේ චිත්තවීථියෙහි තදරම්මණයට කාමාවචර කුශලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම 'කුසලො ධම්මො අබ්‍යාකතස්ස -පෙ-' වදළ සේක.

**"ආකාසානඤ්චායතන කුසලං විඤ්ඤාණඤ්චායතන විපාකස්ස ච කිරියස්සච"** යන අනුවාදපාලියෙහි 'ආකාසානඤ්චායතන කුසලං' යනුවෙන් දැක්වෙන අතීතභවයේ ආධ්‍යාත්මික සන්තානයෙහි ඇති වූ ආකාසානඤ්චායතන කුශලය 'විඤ්ඤාණඤ්චායතන විපාකස්ස' යනුවෙන් දැක්වෙන ප්‍රතිසන්‍ධි භවාඞ්ගච්‍යුති වශයෙන් පවත්නා විඤ්ඤාණඤ්චායතන විපාකයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

Non-commercial distribution

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ ය. කාමසුගතිභූමි සතය, අසංඥ භූමියෙන් අන්‍ය වූ රූපභූමි පසළොස ය, අකාසානඤ්චායතන භූමියය යන භූමි තෙවිස්සෙන් චුතව විඤ්ඤාණඤ්චායතන භූමියෙහි උපදනා පුද්ගලයන්ගේ මරණාසන්න විථිය ජවනයට අනතුරු ව චුතිය වන වීථිය ය, භවාඞගයට අනතුරුව චුතිය වන වීථිය යයි දෙවැදෑරුම් වේ. ජවනයට අනතුරුව චුතිය වන වීථිය උපදනා කල්හි පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞග නවය ය, ආකාසානඤ්චායතන භවාඞගය ය යන මොවුන්ගෙන් එක් සිතක් කර්‍මී කර්‍මීනිමිත්ත ගතිනිමිත්තයන් ගෙන් එකක් අරමුණුකොට භවාඞගචලන භවාඞගෝපච්ඡෙද වශයෙන් ඉපද නිරුධ වූ පසු ආධ්‍යාත්මසන්තානයෙහි පූර්‍වයෙහි ඇති වූ ආකාසානඤ්චායතන කුශලය වූ කර්‍මනිමිත්ත අරමුණු කොට මනෝද්වාරාවජ්ජනය හා කාමාවචර මරණාසන්නජවන චිත්තයක් පස්වරක් ඉපද නිරුධ වේ. අනතුරුව පඤ්චවෝකාර ත්‍රිහේතුකච්‍යුති නවය ය ආකාසානඤ්චායතන ච්‍යුතිය ය යන මොවුන් ගෙන් එක් සිතක් කර්‍මී කර්‍මීනිමිත්ත ගතිනිමිත්තයන් ගෙන් එකක් අරමුණු කොට ච්‍යුතිකෘත්‍යයෙන් එක්වරක් ඉපදීමෙන් පසු විඤ්ඤාණඤ්චායතන විපාකචිත්තය මරණාසන්න ජවනය විසින් ගන්නාලද පූර්‍වභවයෙහි ආධ්‍යාත්මසන්තානයෙහි උපන් ආකාසානඤ්චායතන කුශලය වූ කර්‍මනිමිත්තය අරමුණුකොට ප්‍රතිසන්ධිකෘත්‍යයෙන් එක් වරක් උපදනේ ය, අනතුරුව ඒ විඤ්ඤාණඤ්චායතන විපාකචිත්තය ම භවාඞගකෘත්‍යයෙන් සොළොස්වරක් හෝ පසළොස්වරක් උපන් පසු අභිනවභවය වූ විඤ්ඤාණඤ්චායතන ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් අරමුණු කොට මනෝද්වාරාවජ්ජනය ද භවනිකන්තික ලෝභ ජවනය සත්වරක් ද ඉපදීමෙන් පසු විඤ්ඤාණඤ්චායතන භවාඞගය වේ. මෙසේ ප්‍රතිසන්ධි භවාඞගවශයෙන් හා අවසානයෙහි ච්‍යුති වශයෙන් ද උපදනා වූ විඤ්ඤාණඤ්චායතන විපාකයට ආකාසානඤ්චායතන කුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම 'කුසලො ධම්මො අබ්‍යාකතස්ස -පෙ-" වදළ සේක.

'අකාසානඤ්චායතන කුසලං... විඤ්ඤාණඤ්චායතන කිරියස්ස' යන අනුවාදපාලියෙහි "අකාසානඤ්චායතන කුසලස්ස" යනුවෙන් දැක්වෙන වර්‍තමානභවයේ හෝ අතීතභවයෙහි ස්වසන්තානයෙහි ඇති වූ අකාසානඤ්චායතන කුසලය විඤ්ඤාණඤ්චායතන කිරියචිත්තයට ආරම්මණශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ප්‍රත්‍යය වන අකාරය මෙසේයː- කාමරූප ආකාසානඤ්චායතන භූමින්හි අෂ්ටසමාපත්තිලාභි අනාගාමිපුද්ගලයා අභිජ්ඣයට පැමිණ ආකාසානඤ්චායතන කිරියාසමාපත්තියට සමවැදීමට පෙරාතුව ම නේව-සඤ්ඤානාසඤ්ඤායතන සමාපත්තියෙහි පටන් ප්‍රතිලෝම ක්‍රමයෙන්

Non-commercial distribution

සමාපත්තිවලට සමවැදීම් වශයෙන් හෝ ප්‍රථමධ්‍යානයෙහි පටන් ඒකන්තරික ක්‍රමයෙන් සමාපත්තිවලට සමවැදීම් වශයෙන් හෝ විඤ්ඤාණඤ්චායතන ක්‍රියාසමාපත්තියට සමවදිනු කැමති කල්හි භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡෙදයන්ට අනතුරුව වර්තමානභවයෙහි ආධ්‍යාත්මික සන්තානයෙහි අතීතයෙහි ඇතිවූ අකාසානඤ්චායතන කුශලය අරමුණු කොට මනෝද්වාරාවජ්ජනය ඉපද නිරුද්ධ වූ පසු මහාක්‍රියා තෘතීයචිත්තද්වය අතුරෙන් එක් සිතක් මන්දප්‍රාඥයෙක් වේ නම් පරිකර්ම උපචාර අනුලෝම ගෝත්‍රභූ වශයෙන් සතරවරක් ද තීක්ෂණප්‍රාඥයෙක් වේ නම් උපචාර අනුලෝම ගෝත්‍රභූ වශයෙන් තුන්වරක් ද ඉපද නිරුද්ධ වූ පසු විඤ්ඤාණඤ්චායතන කිරියා චිත්තය භවාඞ්ග සන්තතිය සේ බොහෝ වාර ගණනක් ඉපදීමෙන් පසු සුදුසු භවාඞ්ගචිත්තයක් උපදනේය. (රහත් වීමෙන් පසු ආකාසානඤ්චායතන ක්‍රියා සමාපත්තියට සමවන් රහතුන්ට විඤ්ඤාණඤ්චායතන චිත්තය ඇති වන්නේ අකාසානඤ්චායතන ක්‍රියාව ම අරමුණු කොට ගෙන ය. එබැවින් ආකාසානඤ්චායතන ක්‍රියාසමාපත්තියට සමවන් අභිත්පුද්ගලයාහට ආකාසානඤ්චායතන කුශලය අරමුණු කොට විඤ්ඤාණඤ්චායතන චිත්තයක් නූ පදී.)

විඤ්ඤාණඤ්චායතන භූමියෙහි අභිත් පුද්ගලයා විඤ්ඤාණඤ්චායතන ක්‍රියා සමාපත්තියට සමවදිනු කැමති කල්හි භවාඞ්ගචලන භවාඞ්ගෝප-ච්ඡෙදයන්ට අනතුරුව අතීතභවයෙහි ආධ්‍යාත්මිකසන්තානයෙහි ඇතිවූ ආකාසානඤ්චායතන කුසලය අරමුණු කොට මනෝද්වාරාවජ්ජනයද මහාක්‍රියා තෘතීයද්වයෙන් එක් සිතක් තුන්වරක් හෝ සතර වරක් ද ඉපදීමෙන් අතීතභවයේ අකාසානඤ්චායතන කුසලය අරමුණුකොට විඤ්ඤා-නඤ්චායතන කිරියා චිත්තය භවාඞ්ගසන්තතිය මෙන් බොහෝ වාරගණනක් ඉපදීමෙන් පසු විඤ්ඤාණඤ්චායතන භවාඞ්ගය වේ. (විඤ්ඤාණඤ්චායතන භූමියෙහි ආකාසානඤ්චායතන කුසලය නො ලැබෙන බැවින් එහි රහතුන් ගේ විඤ්ඤාණඤ්චායතන කිරියචිත්තයට අතීතභවයේ ආකාසානඤ්චායතන කුසලයම අරමුණු වේ.) මේ වීථිවල විඤ්ඤාණඤ්චායතන කිරිය චිත්තයන්ට ආකාසානඤ්චායතන කුසලය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම "කුසලො ධම්මො අබ්‍යාකතස්ස -පෙ-" වදළ සේක.

**"ආකිඤ්චඤ්ඤායතන කුසලං නෙවසඤ්ඤානාසඤ්ඤායතන විපාකස්ස ච කිරියස්ස ච"** යනුද වුක්තානුසාරයෙන් විස්තර කරනු. (කිරියස්සා ති අරහත්තං පත්වා අසමාපන්නපුබ්බෙ ආකාසානඤ්චයතනෙ පටිලොමතො වා එකන්තරික වසෙන වා සමාපන්න කිරියාය" යනු අටුවා යි. පටිලොමතො වා එකන්තරික වසෙනවා ති වදන්තෙනවා අනුලොමතො සමාපජ්ජනෙ යෙභුය්‍යෙන ආසන්න සමාපත්තියා ආරම්මණභාවො දස්සිතො ති

Non-commercial distribution

දට්ඨබ්බො. යථා පන පටිලොමතො එකන්තරික වසෙනා පි සමාපජ්ජ-න්තස්ස අනාසනන්නාපි සමාපත්ති ආරම්මණං හොති එවං අනුලොමතො සමාපජ්ජන්තස්සා පි භවෙය්‍යා ති" යනු ටීකායි.)

**"කුසලා ඛන්ධා චෙතොපරියඤාණස්ස"** යන අනුවාදපාලියෙහි "කුසලා ඛන්ධා" යනුවෙන් දැක්වෙන පරසන්තානගත කුශලචිත්තය "චෙතොපරියඤාණස්ස" යනුවෙන් දැක්වෙන චෙතෝපරිය කිරියා අභිඥාවට ද, -

**"කුසලා ඛන්ධා පුබ්බෙනිවාසනුස්සති ඤාණස්ස"** යන අනුවාද පාලියෙහි "කුසලා ඛන්ධා" යනුවෙන් දැක්වෙන පූර්වභවයන්හි වූ කුශලය "පුබ්බෙනිවාසානුස්සතිඤාණස්ස" යනුවෙන් දැක්වෙන පුබ්බෙනිවාසානුස්සති කිරියා අභිඥාවට ද,-

**"කුසලා ඛන්ධා යථාකම්මූපගඤාණස්ස"** යන අනුවාදපාලියෙහි "කුසලා ඛන්ධා" යනුවෙන් දැක්වෙන අතීත ලෞකිකකුශලයන් "යථාකම්මූපගඤාණස්ස" යනුවෙන් දැක්වෙන යථාකම්මූපග කිරියා අභිඥාවට ද,-

**"කුසලා ඛන්ධා අනාගතංස ඤාණස්ස"** යන අනුවාදපාලියෙහි "කුසලා ඛන්ධා" යනුවෙන් දැක්වෙන අනාගත එක්විසි කුශල චිත්තය 'අනාගතං-සඤාණස්ස" යනුවෙන් දැක්වෙන අනාගතංස කිරියා අභිඥාවට ද,-

**"කුසලා ඛන්ධා ආවජ්ජනාය"** යන අනුවාදපාලියෙහි "කුසලා ඛන්ධා" යනුවෙන් දැක්වෙන කුසල්සිත් එක්විස්ස "ආවජ්ජනාය" යනුවෙන් දැක්වෙන කුශලය අරමුණු කරන මනෝද්වාරාවර්ජනයට ද ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම 'කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො" යනුවෙන් වදළ සේක. ප්‍රත්‍යය වන අකාරය වූක්තානුසාරයෙන් චිත්තවීථි උදාරා විස්තර කරනු.

කුසලපදවාරයට අනතුරුව අකුසලපදවාරය වදළ සේක. එද අකුසලපදවසානවාරය ය, කුසලපදවසාන වාරය ය, අබ්‍යාකත පදවසාන වාරයය යන මොවුන් ගේ වශයෙන් තෙවැදෑරුම් වේ. එයින් අකුසලපදවසානවාරය පළමු කොට වදළ සේක. එනම් **"අකුසලො ධම්මො අකුසලස්ස - පෙ- උධච්චං උප්පජ්ජති"** යනුයි. පදාර්ථ සුගම ය.

වීථිපාලියෙහි "අකුසලො" යන කර්තෘපාඨයෙන් අකුසල් සිත් දොළොසය චෛතසික සත්විස්ස ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් ප්‍රත්‍යයෝත්පන්න වූ ඒ ධර්මයෝම ලැබෙත්. කරණපාඨයෙන්

Non-commercial distribution

ආරම්මණ, ආරම්මණාධිපති, ආරම්මණූපනිස්සය යන ශක්ති තුනෙන් ආරම්මණ ශක්තිය ලැබේ.

"**රාගං අස්සාදෙති**" යනාදි අනුවාදපාලියෙහි "රාගං" යනුවෙන් රාගය ප්‍රධාන ලෝභමූල චිත්තෝත්පාදය ද "අස්සාදෙති" යනුවෙන් ආස්වාදනය කරන ලෝභමූල සෝමනස්ස සහගත චිත්තයන් ද "**අභිනන්දති**' යනුවෙන් සප්‍රීතික තෘෂ්ණාව ප්‍රධාන ලෝභමූල සෝමනස්ස සහගත චිත්තයන් ද ගනිමින් **රාගො** යනුවෙන් රාගප්‍රධාන ලෝභමූල චිත්තයන් ද ඉතිරි පදවල අභිධෙය්‍ය වුක්තානුසාරයෙන් ද ගනිමින් සියල්ල විපී දක්වමින් විස්තර කරනු.

අකුසලපදවසානවාරයට අනතුරුව කුසලපදවසානවාරය වදළ සේක. එනම්, "**අකුසලො ධම්මො කුසලස්ස -පෙ- අනාගතංස ඤාණස්ස ආරම්මණපච්චයෙන පච්චයො**" යනු යි. පදථි සුගම ය.

එහි අදහස මෙ සේ යː- අකුශල ධර්මය කුශල ධර්මයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වන්නේ මෙ සේ යː- සෝවාන් පුද්ගලයා විසින් සෝවාන් මාර්ගයෙන් ප්‍රහාණය කළ දෘෂ්ටි විචිකිත්සා ද්වය ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි ඒ ක්ලේශයෝ ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ කාමාවචර කුශලයට ද, සකෘදගාමි පුද්ගලයා විසින් සකෘදගාමිමාර්ගයෙන් තුනීකිරීම් වශයෙන් ප්‍රහාණය කළ ඖදරික රාග ද්වේෂ මෝහයන් ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි ඒ ක්ලේශයන් ප්‍රත්‍යවේක්ෂා කරන කාමාවචර කුශල චිත්තයට ද, අනාගාමි පුද්ගලයා විසින් අනාගාමි මාර්ගයෙන් ප්‍රහාණය කළ කාමරාග ව්‍යාපාදයන් ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි ඒ ක්ලේශයෝ ප්‍රත්‍යවේක්ෂා කරන කාමාවචර කුශලයට ද, සෝවාන් පුද්ගලයා විසින් සෝවාන්මාර්ගයෙන් අප්‍රහීන ලෝභ දෝස මෝහ මාන ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන ක්ලෙශයන් ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි ඒ ක්ලේශයෝ අප්‍රහීන ක්ලේශයන් ප්‍රත්‍යවේක්ෂා කරන කාමාවචර කුශලයට ද, සකෘදගාමි පුද්ගලයා විසින් සකෘදගාමිමාර්ගයෙන් තුනී නො කළ සූක්ෂම වූ රාග දෝස මෝහ මාන ථීන උඩච්ච අහිරික අනොත්තප්ප යන ක්ලේශයන් ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි ඒ ක්ලේශයෝ අප්‍රහීණ ක්ලේශයන් ප්‍රත්‍යවේක්ෂා කරන කාමාවචර කුශලයට ද, අනාගාමි පුද්ගලයා විසින් අනාගාමි මාර්ගයෙන් අප්‍රහීන රූපරාග අරූපරාග මෝහ මාන ථීන උඩච්ච අහිරික අනොත්තප්ප යන ක්ලේශයන් ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි ඒ කෙලශයෝ අප්‍රහීණ කෙලශයන් ප්‍රත්‍යවේක්ෂා කරන කාමාවචර කුශලයට ද, ශෛක්ෂ පෘථග්ජනයන් අකුශලය අනිත්‍ය දුඃඛ අනාත්ම වශයෙන් විදර්ශනා කරන කල්හි ඒ කුශලය විදර්ශනා කරන කාමාවචර කුශලයට ද, ශෛක්ෂපෘථග්ජනයන් අන්‍යයයන්ගේ අකුශලචිත්තය චේතෝපරියඤාණයෙන් බලන කල්හි ඒ අකුශලයෝ

Non-commercial distribution

චේතෝපරිය කුශලාභිඥාවට හා එය අනුව පවත්නා කාමකුශලයට ද, පෙර ජාතිවල පැවති අකුශලයෝ කුශල පුබ්බෙනිවාසානුස්සති අභිඥාවටද, අතීත අකුශලකර්මයෝ යථාකම්මූපගඅභිඥාකුශලයට ද, අනාගත අකුශලයෝ අනාගතාංශ අභිඥා කුශලයට ද ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

අනුවාදපාලියෙහි කතිඃපාඨයෙන් අකුසල් සිත් දෙළොස හා චෛතසික සත්විස්ස ලැබෙත්. සම්ප්‍රදනපාඨයෙන් මහාකුසල් අට ය, චේතෝපරිය පුබ්බෙනිවාසානුස්සති යථාකම්මූපග අනාගතංස කුශලාභිඥාචෝ ය අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සතිස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් ආරම්මණශක්තිය ලැබේ.

"**සෙක්ඛා පහීනෙ කිලෙසෙ පච්චවෙක්ඛන්ති**" යන අනුවාද පාලියෙහි සෝවාන් පුද්ගලයා ගේ වශයෙන් කියන කල්හි "පහීනෙ කිලෙසෙ" යනුවෙන් ගැනෙන දෘෂ්ටිවිචිකිත්සා සඞ්ඛ්‍යාත ක්ලේශද්වයය "පච්චවෙක්ඛන්ති" යනුවෙන් ගැනෙන සෝවාන් පුද්ගලයා ගේ ප්‍රත්‍යවේක්ෂා කරන කාමාවචර කුශලයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍ය වේ.

ප්‍රත්‍යය වන ආකාරය මෙසේ යඃ- සෝවාන් පුද්ගලයා විසින් තමා ගේ මාර්ගයෙන් ප්‍රහීන ක්ලේශයන් මෙනෙහි කරනු කැමති කල්හි තමා ගේ ප්‍රතිසන්ධි චිත්තයට සමාන සිතක් භවාඞගචලන භවාඞගෝපච්ඡේද වශයෙන් ඉපද නිරුද්ධ වූ පසු සෝවාන්මාර්ගයෙන් ප්‍රහීන දෘෂ්ටිවිචිකිත්සා සඞ්ඛ්‍යාත ක්ලේශද්වයය අරමුණු කොට මනෝද්වාරාවර්ජනය ද මහාකුසල් අට අතුරෙන් එක්සිතක් ප්‍රත්‍යවේක්ෂා ජවන වශයෙන් සත්වරක් ද උපන් පසු භවාඞගය වේ. අනතුරුව තදනුවර්තික මනෝද්වාරවීථියකින් තමා ප්‍රහාණය කළ කෙළෙස් මෙතෙකැ යි දැනගන්නේ ය. මේ වීථීන්හි ප්‍රත්‍යවේක්ෂා කුසල ජවනයන්ට ප්‍රහීන ක්ලේශයෝ ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වෙති.

"පහීනෙ කිලෙසෙ" යනුවෙන් දැක්වෙන සකෘදගාමි මාර්ගයෙන් තනුකරණ වසයෙන් ප්‍රහාණය කරන ඖදරික රාගද්වේෂමෝහයන් ද අනාගාමි මාර්ගයෙන් ප්‍රහාණය කරන කාමරාගව්‍යාපාදයන් ද ප්‍රත්‍යවේක්ෂාජවනයන්ට ද ආරම්මණශක්තියෙන් ප්‍රත්‍යය වීම ඉහත කී ක්‍රමයෙන් විස්තර කරනු.

"**සෙක්ඛා වික්ඛම්භිතෙ කිලෙසෙ පච්චවෙක්ඛන්ති**" යන අනුවාද-පාලියෙහි සෝවාන් පුද්ගලයාගේ වශයෙන් කියන කල්හි "වික්ඛම්භිතෙ කිලෙසෙ" යනුවෙන් ගැනෙන සෝවාන්මාර්ගයෙන් අප්‍රහීණ ලෝභ දෝස මෝහ මාන ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන ක්ලේශයෝ අටදෙන

Non-commercial distribution

"පච්චවෙක්ඛන්ති" යනුවෙන් දැක්වෙන අවශේෂක්ලේශයන් මෙහෙහි කරන කාමාවචර කුශලයට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වේ. ප්‍රත්‍යය වන ආකාරය මෙසේ යඃ- සෝවාන් පුද්ගලයා විසින් අප්‍රහීණ ක්ලේශයන් ප්‍රත්‍යවේක්ෂා කිරීමට කැමති කල්හි භවාඞ්ග චලන භවාඞෙග්පච්ඡේදයන්ට අනතුරුව අප්‍රහීණ ක්ලේශ අට අරමුණු කොට මනෝද්වාරාවජ්ජනය ද මහා කුසල් අට අතුරෙන් එක් සිතක් ප්‍රත්‍යවේක්ෂා ජවන කෘත්‍යයෙන් සත් වරක් ද ඉපදීමෙන් පසු භවාඞ්ගය වේ. අනතුරුව තදනුවර්තික වීථිහු වෙති. මේ වීථිවලින් අප්‍රහීණ ක්ලේශ මෙතෙකැයි දැන ගනී. මේ වීථිවල කාමජවනයන්ට සෝවාන් මාර්ගයෙන් අප්‍රහීණ ක්ලෙශයන් ආරම්මණ-ශක්තියෙන් ප්‍රත්‍යය වීම "අකුසලො ධම්මො, කුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො" යනුවෙන් වදළ සේක.

වික්ඛම්භිතෙ කිලෙසෙ යනුවෙන් සකෘදගාමිපුද්ගලයා ගේ වශයෙන් ගැනෙන සකෘදගාමිමාර්ගයෙන් අප්‍රහීණ සූක්ෂම වූ රාග දෝස මෝහ මාන ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන ක්ලේශ අට ද අනාගාමිපුද්ගලයා ගේ වශයෙන් ගැනෙන රූපරාග අරූපරාග මෝහ මාන ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන ක්ලේශ අට ද ප්‍රත්‍යවේක්ෂා කාමාවචර කුශලජවනයන්ට ආරම්මණශක්තියෙන් ප්‍රත්‍යය වීම කියන ලද නය අනුව විස්තර කරනු.

"**පුබ්බෙ සමුදාචිණ්ණෙ කිලෙසෙ ජානන්ති**" යන අනුවාද පාලියෙන් දැක්වෙන පෙර පැවති කෙලෙසුන් ඒවා දැනගන්නා වූ කාමාවචර කුශලයට ප්‍රත්‍යය වීම ද "**සෙක්ඛා වා පුථුජ්ජනා වා අකුසලං -පෙ- විපස්සන්ති**" යන අනුවාදපාලියෙන් දැක්වෙන අකුශලය විදර්ශනා කරන කාමාවචරකුශලයට ප්‍රත්‍යය වීම ද වුක්තානුසාරයෙන් වීථි දක්වා විස්තර කරනු. "චෙතොපරියඤාණෙන අකුශලචිත්තසමඞ්ගිස්ස චිත්තං ජානන්ති, අකුසලා ඛන්ධා චෙතොපරියඤාණස්ස" යනාදියෙහි අකුශල ස්කන්ධයන් චේතෝපරියඥාණයට ද, පුබ්බෙනිවාසානුස්සතිඥාණයට ද යථාකම්මූපග ඥාණයට ද, අනාගතංස ඥාණයට ද ආරම්මණප්‍රත්‍යය වන සැටි "කුසලො කුසලස්ස" යන වාරයෙහි දැක් වූ ආකාරය අනුව වීථි දක්වා විස්තර කරනු.

කුසලපදවසානවාරයට අනතුරු ව අබ්‍යාකතපදවසානවාරය වදළ සේක. "**අකුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස -පෙ- අනාගතංසඤාණස්ස ආවජ්ජනාය ආරම්මණපච්චයෙන පච්චයො**" යනු යි. "අකුසලො ධම්මො" යන කර්තෘපාඨයෙන් අකුසල් සිත් දොළොස හා චෛතසික සත්විස්ස ලැබේ. "අබ්‍යාකතස්ස ධම්මස්ස" යන සම්ප්‍රදානපාඨයෙන් තදරම්මණ

Non-commercial distribution

එකොළොස ය, පඤ්චද්වාරාවජ්ජනය හැර කාම ක්‍රියා දශය ය, චේතෝපරිය පුබ්බෙනිවාසානුස්සති යථාකම්මූපග අනාගතංස කිරියා අභිඤ්ඤාවෝ ය, විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික තෙතිසය යන මොවුහු ලැබෙත්. කරණපාඨයෙන් ආරම්මණ ශක්තිය ලැබේ.

"අරහා පහීනෙ කිලෙසෙ පච්චවෙක්ඛති" යන අනුවාදපාලියෙන් දැක්වෙන අර්හත්මාර්ගයෙන් ප්‍රහීණ රූපරාග අරූපරාග මෝහ මාන ථීන උද්ධච්ච අහිරික අනොත්තප්ප යන අකුශලධර්මයෝ ඒවා ප්‍රත්‍යවේක්ෂා කරන කාමක්‍රියාවන්ට ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වෙති. ප්‍රත්‍යය වන ආකාරය විස්තර කරනු. "පුබ්බෙ සමුදච්ණෙණ" යනාදිය ද කියන ලද නය අනුව දත හැකිය.

අකුසලපදවාරයට අනතුරු ව අබ්‍යාකතපදවාරය වදළ සේක. එහි ද අබ්‍යාකතපදවසානවාරාදි වශයෙන් වාර තුනෙකි. එයින් අබ්‍යාකතපදවසානවාරය පළමු කොට වදළ සේක. "**අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස -පෙ- කිරියාබ්‍යාකත චිත්තසමඞ්ගිස්ස චිත්තං ජානාති**" යනු යි. එහි "අබ්‍යාකතො" යන කර්තෘපාඨයෙන් විපාකසිත් සතිස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික අටතිස ය, රූප අටවිස්ස ය, නිවන ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් කාමවිපාක තෙවිස්ස ය, කාමක්‍රියා එකොළොස ය, විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤා-නාසඤ්ඤායතන කිරියා දෙක ය, දිබ්බචක්ඛු දිබ්බසොත ඉද්ධිවිධ චේතෝපරිය පුබ්බෙනිවාසානුස්සති යථාකම්මූපග අනාගතංස යන ක්‍රියා අභිඤ්ඤාය ය, ඵලසිත් සතර ය, අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික සතිස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්.

විස්තර වශයෙන් මෙසේය:- චක්ෂුර්විඥානද්වයට ප්‍රත්‍යයවන වර්තමාන රූපාරම්මණය ය, -පෙ- මනෝධාතුත්‍රයට ප්‍රත්‍යය වන වර්තමාන පඤ්චාලම්බණය ය, තදරම්මණ එකොළොසට හා හසිතෝත්පාදයට ප්‍රත්‍යය වන කාමවිපාක තෙවිස්ස ය කාමක්‍රියා එකොළොසය, රූප අටවිස්සය යන මොවුහුය. මහාක්‍රියා ඥාන විප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන ලෞකික විපාක දෙතිස ය, ක්‍රියා සිත් විස්ස ය, රූප අට විස්ස ය යන මොවුහු ය, මහා ක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට හා මනෝද්වාරාවජ්ජනට ප්‍රත්‍යය වන විපාක සිත් සතිසය ක්‍රියාසිත් විස්ස ය රූප අට විස්ස ය නිවන ය යන ධර්මයෝ ය, විඤ්ඤාණඤ්චායතන ක්‍රියා චිත්තයට ප්‍රත්‍යයවන වර්තමානභවයේ ආධ්‍යාත්මික සන්තානයෙහි උපන් ආකාසානඤ්චායතන කිරියචිත්තය ය, නේවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියාචිත්තයට ප්‍රත්‍යය වන වර්තමාන භවයේ ආධ්‍යාත්මික සන්තානයෙහි උපන් ආකිඤ්චඤ්ඤායතන

Non-commercial distribution

ක්‍රියාචිත්තය ය, දිබ්බචක්ඛු කිරියා අභිඤ්ඤාවට ප්‍රත්‍යය වන දූර ප්‍රච්ඡන්න ස්තිගධ සූක්‍ෂම වර්‍තමාන රූපාරම්මණය ය, දිබ්බසෝත කිරියා අභිඤ්ඤාවට ප්‍රත්‍යය වන දූර ප්‍රච්ඡන්න ස්තිගධ සූක්‍ෂම ශබ්දාරම්මණය ය, චේතෝපරිය කිරියා අභිඤ්ඤාවට ප්‍රත්‍යය වන අන්‍යයන් ගේ විපාකසිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය යන ධර්‍මාරම්මණය ය ඉද්ධිවිද කිරියා අභිඤ්ඤාවට ප්‍රත්‍යය වන පාදක රූපාවචර පඤ්චමධ්‍යාන ක්‍රියාචිත්තය හා නිර්මිතරූපයෝ ය යන ෂඩාරම්මණය ය, පුබ්බෙනිවාසානුස්සති කිරිය අභිඤ්ඤාවටප්‍රත්‍යය වන පෙරජාතිවල වූ විපාක සිත් සතිස ය රූප අටවිස්ස ය යන පඤ්චස්කන්ධය ය, පඤ්චස්කන්ධානුසාරයෙන් දත යුතු නිර්‍වාණය ය යන ෂඩාරම්මණය ය, අනාගතංස කිරිය අභිඤ්ඤාවට ප්‍රත්‍යය වන අනාගත විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය රූප අටවිස්ස ය ස්කන්ධානුසාරයෙන් දතයුතු වූ නිවන ය යන ෂඩාරම්මණය ය, ඵලසිත් සතරට ප්‍රත්‍යය වන නිවන ය යන මොවුහු "අබ්‍යාකතො ධම්මො" යන කර්‍තෘපාඨයෙන් ලැබෙත්. සම්ප්‍රදානපාඨයේ අභිධෙය ව්‍යක්තානුසාරයෙන් දත හැකි ය. කරණපාඨයෙන් ආරම්මණ, ආරම්මණාධිපති, වත්ථාරම්මණනිඃශ්‍රය, ආරම්මණූපනිඃශ්‍රය, ආරම්මණපුරේජාත, වත්ථාරම්මණ විප්පයුත්ත, ආරම්මණපුරෙජාතත්ථි, ආරම්මම්පුරෙජාතාවිගත යන ශක්ති අට අතුරෙන් ආරම්මණශක්තිය ලැබේ.

"**අරහා ඵලං පච්චවෙක්ඛති**" යන අනුවාදපාලියෙන් දැක්වෙන අර්‍හත්ඵලය ප්‍රත්‍යවේක්‍ෂා කරන්නා වූ ඥානසම්ප්‍රයුක්ත මහාක්‍රියා චිත්තයන්ට ප්‍රත්‍යය වන ආකාරය මෙ සේ ය. අර්‍හත් පුද්ගලයා තමා ගේ ඵලය ප්‍රත්‍යවේක්‍ෂා කරනු කැමති කල්හි භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡේදයන්ට අනතුරු ව අර්‍හත්ඵලය අරමුණු කොට මනෝද්වාරාවර්‍ජනය ද ඥානසම්ප්‍රයුක්ත මහා ක්‍රියා සිත් සතරින් එකක් ප්‍රත්‍යවේක්‍ෂා ජවනකෘත්‍යයෙන් සත් වරක් ද උපන් පසු භවාඞ්ගය වේ. අනතුරු ව තදනුවර්‍තික මනෝද්වාර වීථීහු වෙති. අර්‍හත්ඵල චිත්තය ඒ වීථීන්හි මනෝද්වාරාවර්‍ජනයට හා මහාක්‍රියා ජවනයන්ට ප්‍රත්‍යය වීම 'අබ්‍යාකතො ධම්මො -පෙ- වදළ සේක. "**නිබ්බානං පච්චවෙක්ඛති**" යනු ද විස්තර කරනු.

"**නිබ්බානං ඵලස්ස**" යන අනුවාද පාලියෙන් දැක්වෙන නිර්‍වාණය ඵල සිත් සතරට ප්‍රත්‍යය වන ආකාරය මෙසේ ය. සෝවාන් පුද්ගලයා තමා ගේ ඵලයට සමවදිනු කැමති කල්හි භවාඞ්ගචලන භවාඞ්ගෝ-පච්ඡේදයන්ට අනතුරු ව ත්‍රෛභූමික සංස්කාරයන් අරමුණු කොට මනෝද්වාරාවර්‍ජනය ද අනතුරු ව මහාකුශල ප්‍රථමද්වයයෙන් එක් සිතක් අනුලෝමජවන වශයෙන් සතරවරක් හෝ තුන්වරක් ඉපදීමෙන් පසු

Non-commercial distribution

ප්‍රථමධ්‍යාන සහගත වූ හෝ ද්විතීය තෘතීය චතුර්ථධ්‍යාන සහගත වූ හෝ, අනුලෝමය මහාකුශල තෘතිය ද්වයයෙන් එකක් වී නම් පඤ්චමධ්‍යාන සහගත වූ හෝ සෝතාපත්තිඵලචිත්තය භවාඞ්ගසන්තතිය මෙන් කැමතිතාක් උපදනේ ය. සකෘදගාමි අනාගාමි ඵලසමාපත්ති වීථීහු ද එ සේ ම ය. අර්හත්ඵල සමාපත්තිවීථීන්හි අනුලෝම ජවනයෝ මහා ක්‍රියා ඥාන-සම්ප්‍රයුක්ත චිත්තයෝ ය. මේ වීථිවල ඵලචිත්තයන්ට නිර්වාණය ආරම්මණ ශක්තියෙන් ප්‍රත්‍යය වීම අබ්‍යාකතො -පෙ- වදළ සේක.

**'නිබ්බානං ආවජ්ජනාය'** යන අනුවාද පාලියෙන් දැක්වෙන පරිදි නිර්වාණය මනෝද්වාරාවජ්ජනයට ප්‍රත්‍යය වන ආකාරය මෙ සේ ය. අර්හත් පුද්ගලයා නිවන ප්‍රත්‍යවේක්‍ෂා කරනු කැමති කල්හි භවාඞ්ගචලන භවාඞ්ගෝපච්ඡේදයන්ට අනතුරුව නිර්වාණය අරමුණු කොට මනෝද්වාරාවජ්ජනය ද මහාක්‍රියාඥානසම්ප්‍රයුක්ත සිත් සතරින් එකක් ප්‍රත්‍යවේක්‍ෂා ජවනකෘත්‍යයෙන් සත් වරක් ද ඉපදීමෙන් පසු භවාඞ්ගය වේ. හෙට්ඨිමඵලස්ථයන් ගේ වීථිවල එ සේ ම මහාකුශල චිත්තය ජවනකෘත්‍යයෙන් උපදී. මේ වීථිවල -පෙ- වදළ සේක.

**"අරහා චක්ඛුං -පෙ- විපස්සති"** යන අනුවාදපාලියෙහි දැක්වෙන චක්ෂුඃප්‍රසාදය ද **"සොතං ඝානං ජිව්හං කායං"** යනුවෙන් දැක්වෙන ශ්‍රෝත්‍රාදි ප්‍රසාද සතර ද, **'රූපෙ'** යනුවෙන් දැක්වෙන චතුසමුට්ඨානික රූපයන් ගේ වර්ණය ද, **'සද්දෙ'** යනුවෙන් දැක්වෙන ද්විසමුට්ඨානික ශබ්දයද, **"ගන්ධෙ රසෙ ඵොට්ඨබ්බෙ"** යනුවෙන් දැක්වෙන චතුසමුට්ඨානික ගන්ධ රස ඵොට්ඨබ්බයන් ද **'වත්ථු'** යනුවෙන් දැක්වෙන කර්මජ හෘදයවස්තු රූපය ද, **'විපාකාබ්‍යාකතෙ'** යනුවෙන් දැක්වෙන විපාකසිත් දෙතිස ද **'කිරියාබ්‍යාකතෙ'** යනුවෙන් දැක්වෙන ක්‍රියා සිත් විස්ස ද අර්හත් පුද්ගලයාගේ ප්‍රත්‍යවේක්‍ෂාචිත්තයන්ට ප්‍රත්‍යය වීම උක්තානුසාරයෙන් විස්තර කරනු. (අනුවාදපාලියෙහි එක් හේතුවකින් හටගන්නා රූපයන් ඒකවචනයෙන් ද බොහෝ හේතූන් ගෙන් හටගන්නා රූපයන් 'රූපෙ සද්දෙ' යනාදීන් බහුවචනයෙන් ද දක්වා තිබේ.)

**'දිබ්බෙන චක්ඛුනා රූපං පස්සති'** යන අනුවාදපාලියෙන් දැක්වෙන දූරප්‍රතිච්ඡන්න ස්නිග්ධ සූක්‍ෂම රූපාරම්මණය දිබ්බචක්ඛු කිරිය අභිඥා චිත්තයට ප්‍රත්‍යය වීම ද. 'දිබ්බාය සොතධාතුයා සද්දං සුණාති' යනුවෙන් දැක්වෙන දූර ප්‍රතිච්ඡන්න ස්නිග්ධ සූක්‍ෂම ශබ්දාරම්මණය දිබ්බසෝත කිරියා අභිඥාවට ප්‍රත්‍යයවීමද චේතොපරියකිරියා අභිඥා ආදියට ප්‍රත්‍යවීම ද විස්තර කරනු. 'රූපායතනං චක්ඛුවිඤ්ඤාණස්ස යනාදිය පඤ්චද්වාර වීථි දක්වමින් විස්තර කරනු.

Non-commercial distribution

'**අබ්‍යාකතා ඛන්ධා ඉද්ධිවිධඤාණස්ස**' යන අනුවාදපාලියෙහි අබ්‍යාකතා ඛන්ධා යනුවෙන් දැක්වෙන පාදක රූපාවචර පඤ්චමධ්‍යානය හා නිර්මිත රූපයන් ඉද්ධිවිධකිරියා අභිඤ්ඤාවට ප්‍රත්‍යය වීම ද, පරසන්තානගත විපාක ක්‍රියාචිත්තයන් චේතෝපරිය කිරියා අභිඤ්ඤාවට ප්‍රත්‍යය වීම ද, පෙර ජාතිවලට අයත් විපාකසිත් සතිස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික අටතිස ය, රූප අටවිස්ස ය යන අව්‍යාකෘත ධර්මයන් පුබ්බෙනිවාසානුස්සති කිරියා අභිඤ්ඤාවට ප්‍රත්‍යය වීම ද, අනාගතංස කිරියා අභිඤ්ඤාවට ප්‍රත්‍යය වීම ද, අව්‍යාකෘත ධර්මයන් ආවර්ජනයට ප්‍රත්‍යය වීම ද වීපී දක්වමින් විස්තර කරනු.

අබ්‍යාකතපදවසානවාරයට අනතුරු ව කුසලපදවසානවාරය වදළ සේක. '**අබ්‍යාකතො ධම්මො කුසලස්ස -පෙ- අනාගතංසඤාණස්ස, ආරම්මණ පච්චයෙන පච්චයො**" යනු යි. කතිෘපාඨයෙන් අභිත්ඵලයෙන් අන්‍ය වූ විපාක සිත් පන්තිස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික අටතිස ය, රූප අටවිස්ස ය, නිවන ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදාන පාඨයෙන් මහා කුසල් අට ය, දිබ්බචක්ඛු දිබ්බසොත ඉද්ධිවිධ චේතොපරිය පුබ්බෙනිවාසානුස්සති අනාගතංස කුසලඅභිඤ්ඤාවෝය අප්‍රමාණ වර්ජිත චෛතසික සතිස ය යන ප්‍රත්‍යයෝත්පන්න ධර්මයෝ ලැබෙත්. විස්තර වශයෙන් මෙසේ යː- මහාකුශලඥානවිප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන ලෞකිකවිපාක දෙතිස ය ක්‍රියා සිත් විස්ස ය රූප අටවිස්ස ය යන මොහු ය, මහාකුසල ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන අභිත්ඵල වර්ජිත විපාකසිත් පන්තිස ය ක්‍රියා සිත් විස්ස ය රූප අටවිස්ස ය නිවන ය යන මොවුහු ය, දිබ්බචක්ඛු කුසලාභිඤ්ඤාවට ප්‍රත්‍යය වන දූර ප්‍රතිච්ඡන්න ස්නිග්ධ සූක්ෂම වර්තමාන රූපාරම්මණ ය ය, දිබ්බසෝතකුසලාභිඤ්ඤාවට ප්‍රත්‍යය වන දූර ප්‍රතිච්ඡන්න ස්නිග්ධ සූක්ෂම වර්තමාන ශබ්දරම්මණය ය, ඉද්ධිවිධ කුශලාභිඤ්ඤාවට ප්‍රත්‍යයවන නිර්මිත රූප සඞ්ඛ්‍යාත ෂඩාරම්මණය ය, චේතෝපරිය කුසලාභිඤ්ඤාවට ප්‍රත්‍යය වන අතීත සත්වන දිනයට හා අනාගත සත්වන දිනයට අතරෙහි කාලත්‍රයට අයත් පරසන්තාන ගත අභිත්ඵල වර්ජිත විපාකසිත් පන්තිස ය ක්‍රියා විස්සය යන ධර්මාරම්මණයය පුබ්බෙනිවාසානුස්සති කුශලාභිඤ්ඤාවට ප්‍රත්‍යය වන පෙරජාතියෙහි වූ අභිත්ඵල වර්ජිත විපාක පන්තිස ය ක්‍රියා සිත් විස්ස ය රූප අට විස්ස ය යන ස්කන්ධ පඤ්චකය ය ඒ ස්කන්ධානුසාරයෙන් දත යුතු වූ නිවනය යන ෂඩාරම්මණය ය අනාගතංස කුසලාභිඤ්ඤාවට ප්‍රත්‍යය වන අනාගත වූ ඒ ධර්මයෝ ය යන ප්‍රත්‍යධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයේ අභිධෙය පෙර පරිදිමය. කරණපාඨයෙන් එක් වර ලැබෙන ආරම්මණ සභාග ප්‍රත්‍යයන් ගේ ශක්තීන් අතුරෙන් ආරම්මණ ශක්තිය ලැබේ.

Non-commercial distribution

(ආරම්මණ, ආරම්මණාධිපති, වත්ථාරම්මණනිස්සය, ආරම්මණූපනිස්සය, ආරම්මණපුරෙජාත, වත්ථාරම්මණවිප්පයුත්ත, ආරම්මණපුරෙජාතත්ථි ආරම්මණපුරේජාතවිගත යන මේ අට ආරම්මණසභාගයෝ ය.)

**"සෙක්ඛා ඵලං පච්චවෙක්ඛන්ති"** යනාදි අනුවාදපාලියෙන් දැක්වෙන සෝවාන් සකෘදගාමී අනාගාමී ඵලයන් හා නිර්‍වාණය ඒ ඒ පුද්ගලයන්ගේ ප්‍රත්‍යාවේක්‍ෂා කරන්නා වූ ඥානසම්ප්‍රයුක්ත කාමාවචරකුශල චිත්තයන්ට ප්‍රත්‍යය වීම යනාදිය ද වීථි උදුරමින් එකින් එක වූක්තානුසාරයෙන් විස්තර කරනු.

කුසලපදවසාන වාරයට අනතුරු ව අකුසලපදවසාන වාරය වදළ සේක. **"අබ්‍යාකතො ධම්මො අකුසලස්ස -පෙ- පච්චයො"** යනු යි. කර්තෘපාඨයෙන් ලෞකිකවිපාක දෙතිස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික පන්තිස ය රූප අටවිස්ස ය යන ප්‍රත්‍යය ධර්‍මයෝ ලැබෙත්. සම්ප්‍රදාන පාඨයෙන් අකුසල් සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් ආරම්මණසභාග ප්‍රත්‍යයන් අතුරෙන් ආරම්මණශක්තිය ලැබේ. වූක්තානුසාරයෙන් විස්තර කරනු.

ආරම්මණ විභඞ්ග වාරය නිමි.

## 3 අධිපති විභඞ්ග වාරය

ආරම්මණප්‍රත්‍යය විභඞ්ගවාරයට අනතුරු ව අධිපතිප්‍රත්‍යය විභඞ්ගවාරය වදළ සේක. එහිද කුශලපද අකුශලපද අබ්‍යාකතපදයන්ගේ වශයෙන් වාර තුනක් ඇත්තේ ය. එයින් කුශලපද වාරය පළමුකොට වදළ සේක. එද කුශලපදවසානවාරාදි වශයෙන් සිවුවැදෑරුම් වේ. එයින් කුශලපදවසාන වාරය පළමු කොට වදළසේක. **කුසලො ධම්මො කුසලස්ස -පෙ- කුසලාධිපති සම්පයුත්තකානං ඛන්ධානං අධිපති පච්චයෙන පච්චයො"** යනු යි.

**පදර්‍ථ:**

කුසලොධම්මො කුසලස්ස ධම්මස්ස අධිපතිපච්චයෙන පච්චයො, ආරම්මණාධිපති, ආරම්මණාධිපතිය යඃ සහජාතාධිපතිය යයිඃ (අධිපතිප්‍රත්‍යය දෙවැදෑරුම් වේ.) ආරම්මණාධිපති, එයින් ආරම්මණාධිපතියඃ (මෙසේ ය) දානං දත්වා, දන් දී හෙවත් දානචේතනාව උපදවාඃ සෙස්ස සුගම ය.

ආරම්මණාධිපතිය වේ නම් එහි "කුසලො ධම්මො" යන කර්තෘපාඨයෙන් අභිඥාවර්ජිත ගරු කළ යුතුවූ කුසල් සිත් විස්ස ය චෛතසික අටතිස

Non-commercial distribution

ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. විස්තර වශයෙන් මෙසේ ය:- ගරු කොට අරමුණු කරන්නා වූ මහාකුශල ඥානවිප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ ලෞකික කුසල් සතොළොස ය, ගරු කොට අරමුණු කරන මහාකුශල ඥානසම්ප්‍රයුක්ත චිත්තයන්ට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ අභිඤ්ඤාගී වර්ජිත කුසල් සිත් විස්ස ය චෛතසික අටතිස ය යන මොවුහු කතිඃපාඨයෙන් ලැබෙත්. සම්ප්‍රදනපාඨයෙන් ගරු කර අරමුණු කරන මහාකුසල් සිත් අට හා විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික තෙතිස ද ලැබේ. කරණපාඨයෙන් එක්වර ලැබිය හැකි ආරම්මණාධිපති, ආරම්මණ, ආරම්මණූපනිස්සය යන ප්‍රත්‍යය ශක්ති තුනෙන් ආරම්මණා-ධිපති ශක්තිය ලැබේ.

"**දානං දත්වා තංගරුං කත්වා පච්චවෙක්ඛති**" යන අනුවාදපාලියෙහි "දානං දත්වා" යනුවෙන් ගැනෙන දාන චේතනාව ප්‍රධාන කාමාවචර කුශලය එය ගරු කොට ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ කාමාවචර කුශලචිත්තයට ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ. ප්‍රත්‍යය වන ආකාරය ආම්මණප්‍රත්‍යයෙහි කී පරිදි ය.

"**සීලංසමාදියිත්වා තං ගරුං කත්වා පච්චවෙක්ඛති**" යන අනුවාද පාලියෙහි "සීලං සමාදියිත්වා" යනුවෙන් ගැනෙන පඤ්චාඞගශීල දශාඞගසිල චේතනා ප්‍රධාන කාමාවචර කුශලය එය ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ කාමාවචර කුශලයට ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ. ආරම්මණවිභඞගය මෙන් විස්තර කරනු. (මහද්ගත කුශලය තමා මහත්බවට පැමිණ සිටින බැවින් අනෙකක් ගරු කොට අරමුණු නො කරයි. "අත්තනො මහග්ගතතාය ගරුං න කරොති" යනු අටුවා යි.

සහජාතාධිපතිය වේ නම් කතිඃපාඨයෙන් අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුසල් අට ය සැමකල්හි අධිපති ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුසල් තෙළෙස ය චෛතසික අටතිස ය යන මොවුන් ගේ එක් එක් චිත්තයක ඇති අධිපති තුන හා සතර අතුරෙන් එක එකක් වූ ප්‍රත්‍යය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් අධිපති වන ධර්මය හා සම්ප්‍රයුක්ත ධර්මයෝ ලැබෙත්. කරණපාඨයෙන් සහජාතාධිපති ශක්තිය ලැබේ.

කුසලපදාවසාන වාරයට අනතුරුව අකුසල පදාවසාන වාරය වදළ සේක. "**කුසලො ධම්මො අකුසලස්ස -පෙ- දිට්ඨිඋප්පජ්ජති**" යනු යි. පදාර්ථ සුගම ය. කුශලධර්මය අකුශලධර්මයට ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ. ආහාරපානාදි දානවස්තූන් දී පරිත්‍යාගචේතනා ප්‍රධාන කාමාවචර කුශලය ගරු කොට ආස්වාදනය කරන කල්හි ඒ කුශලය

Non-commercial distribution

ගරුකොට ආස්වාදනය කරන ලෝභමූල සෝමනස්ස සහගත සිත් සතරට ද, සතුටු වන කල්හි සප්‍රීතික තෘෂ්ණා ප්‍රධාන ලෝභමූල සෝමනස්සසහගත සිත් සතරට ද වරදවා ගන්නා කල්හි ලෝභමූල දෘෂ්ටිසම්ප්‍රයුක්ත සිත් සතරට ද මෙ සේ අවසානය වන තෙක් විස්තර කරනු. කතීපාඨයෙන් ලෞකික කුසල් සතොළොස වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අට ලැබේ. කරණපාඨයෙන් ආරම්මණ ආම්මණාධිපති ආරම්මණූපනිස්සය යන ශක්ති තුනෙන් ආරම්මණශක්තිය ලැබේ. ආරම්මණ ප්‍රත්‍යය අනු ව විස්තර කරනු.

අකුසලපදවසාන වාරයට අනතුරු ව අබ්‍යාකතපදවසාන වාරය විදළ සේක. **"කුසලො ධම්මො අබ්‍යාකතස්ස -පෙ- පච්චයො"** යනු යි. අදහස මෙසේ ය. කුශලධර්මය අබ්‍යාකතධර්මයට අධිපතිශක්තියෙන් ප්‍රත්‍යය වේ. අහීත් පුද්ගලයා අහීත්මාගීයෙන් නැගිට එය ගරු කොට ප්‍රත්‍යවේක්ෂා කිරීමේ දී අහීත්මාගීය, ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ ඥානසම්ප්‍රයුක්ත මහාක්‍රියා සිත් සතරට ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ. පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහා කුසල් අටෙහි හා සැම කල්හි අධිපති ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුශලයන්හි ද ඇති අධිපති ධර්මයෝ සාධිපති චිත්තජරූපයන්ට අධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වෙති. මෙ සේ කුසල ය අබ්‍යාකතයට අධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ආරම්මණාධිපතිය වේ නම් එහි කතීපාඨයෙන් ගරු කොට අරමුණු කරන මහා ක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන අහීත්මාගී සඞ්ඛ්‍යාත ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් ගරු කොට අරමුණු කරන මහාක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිත් සතර ය, විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික තෙතිසය යන මොවුහු ලැබෙත්. කරණපාඨයෙන් ආරම්මණ ආරම්මණාධිපති ආරම්මණූපනිස්ස ය යන ශක්ති තුනෙන් ආරම්මණාධිපති ශක්තිය ලැබේ. **අරහා මග්ගා වුට්ඨහිත්වා** යනාදි අනුවාදපාලිය අහීත්මාගීය ගරු කොට අරමුණු කරන වීථිය දක්වමින් විස්තර කරනු.

සහජාතිධිපතියෙහි "කුසලාධිපති" යන කතීපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහා කුසල් අටෙහි හා මහද්ගත ලෝකෝත්තරකුශලයන්හි ද ඇති අධිපති ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් චිත්තජරූපයෝ ලැබෙත්.

(මහාක්‍රියා ඥානවිප්‍රයුක්තචිත්තයෝ ලෝකෝත්තර ධර්මයන් අරමුණු කිරීමට නො සමත් බැවින් ආරම්මණාධිපති ප්‍රත්‍යයෝත්පන්න භාවයෙන් නො ගන්නා ලදී. රහතුන් ලෞකික ධර්මයන් ගරු නො කරන බැවින් ලෞකිකධර්මයන් ගේ වශයෙන් ද ඒවා ආරම්මණාධිපති

Non-commercial distribution

ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති. ද්වේෂමූලචිත්තය කිසිවක් ගරු නො කරන බැවින් ද මෝහමූලචිත්තය සමෝහය නිසා කිසිවක් ගරු කොට නො ගන්නා බැවින් ද ආරම්මණාධිපති ප්‍රත්‍යයෝත්පන්නයෝ නො වෙති.)

**"කුසලො කුසලාබ්‍යාකතස්ස"** යන්නෙහි කතිඃපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාකුසල් අටෙහි ද මහද්ගත කුසල් නවයෙහි ද මාර්ගසිත් සතරෙහි ද ඇති අධිපතිධර්ම තුන හා සතර අතුරෙන් එක එකක් වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් අධිපති වන ධර්මයෙන් අන්‍ය වූ සම්ප්‍රයුක්තස්කන්ධයන් හා චිත්තජරූපයෝ ලැබෙත්. අනුවාදය විස්තර කරනු.

කුසලපදවාරයට අනතුරු ව අකුසලපදවාරය වදළ සේක. එහි ද අකුශලපදවසානවාරාදි වශයෙන් වාර තුනක් ඇත්තේ ය. එයින් අකුසලපදවසානවාරය පළමු කොට වදළ සේක. **"අකුසලො ධම්මො -පෙ- පච්චයො"** යනු යි. පදාර්ථ සුගමය. එහි අදහස මෙසේ යඃ- අකුශලධර්මය අකුශලධර්මයට අධිපති ශක්තියෙන් ප්‍රත්‍යවේ. රාග ප්‍රධාන ලෝභමූලචිත්තය ගරු කොට ආසවාදනය කරන කල්හි ඒ ලෝභමූල චිත්තය ගරු කොට ආස්වාදනය කරන්නා වූ ලෝභමූල සෝමනස්ස සහගත සිත් සතරට ද, සතුටුවන කල්හි සප්‍රීතික තෘෂ්ණා ප්‍රධාන ලෝභමූල සෝමනස්ස සහගත සිත් සතරට ද ගරු කොට ඇලුම් කරන කල්හි රාග ප්‍රධාන ලෝභමූල සිත් අටට ද, වරදවා ගන්නා කල්හි දෘෂ්ටිසම්ප්‍රයුක්ත සිත් සතරට ද, ආරම්මණාධිපතිශක්තියෙන් ප්‍රත්‍යය වේ. සහජාතාධිපතිය මෙ සේ යඃ- අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි ලෝභමූල ද්වේෂමූල චිත්තයන් ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති අධිපති ධර්ම තුන අතුරෙන් එක එකක් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ආරම්මණාධිපතියෙහි 'අකුසලො' යන කතිඃපාඨයෙන් ගරු කොට අරමුණු කරන ලෝභමූලසිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ ලෝභමූල සිත් අට වූ ප්‍රත්‍යය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අට ය චෛතසික දෙවිස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර ලැබෙන ආරම්මණ, ආරම්මණාධිපති ආරම්මණූපනිස්සය යන ශක්ති තුනෙන් ආරම්මණාධිපති ශක්තිය ලබේ. **'රාගං ගරුං කත්වා අස්සාදෙති'** යනාදිය ආරම්මණයෙහි කළ විස්තරය අනුව විථි දක්වා විස්තර කරනු.

Non-commercial distribution

සහජාතාධිපතියෙහි 'අකුසලො' යන කතීඃපාඨයෙන් අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ලෝභමූල සිත් අට ය, ද්වේෂමූල සිත් දෙක ය, විචිකිත්සා වර්ජිත චෛතසික සවිස්ස ය යන මොවුන්ගේ එක්එක් චිත්තක්ෂණයක ලැබෙන අධිපති ධර්ම තුනෙන් එක එකක් වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් අධිපතිවන ධර්මයෙන් අන්‍ය වූ සම්ප්‍රයුක්ත ධර්මයෝ ලැබෙත්. කරණපාඨයෙන් සහජාතාධිපති ප්‍රත්‍යය ශක්තිය ලැබේ. අනුවාදය විස්තර කරනු.

**"අකුසලො අබ්‍යාකතස්ස"** යනාදි වාරයෙහි කතීඃපාඨයෙන් සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ ලෝභමූල සිත් අට ය, ද්වේෂමූල සිත් දෙක ය, විචිකිත්සා වර්ජිත චෛතසික සවිස්ස ය යන මොවුන් ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති අධිපතිධර්ම තුනෙන් එක් එක් ධර්මයක් වූ ප්‍රත්‍යය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් සාධිපතිචිත්තජ රූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් සහජාතාධිපති ශක්තිය ලැබේ. අනුවාදය විස්තර කරනු.

**"අකුසලො අකුසලාබ්‍යාකතස්ස"** යනාදිවාරයෙහි කතීඃපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ ලෝභමූල සිත් අට ය, ද්වේෂමූල සිත් දෙක ය, චෛතසික සවිස්ස ය යන මොවුන් ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති අධිපතිධර්ම තුනෙන් එක එකක් වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන් හා සාධිපති චිත්තජරූපයන් වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් සහජාතාධිපති ශක්තිය ලැබේ. අනුවාදය විස්තර කරනු.

අකුසලපදවාරයට අනතුරු ව අබ්‍යාකතපදවාරය වදළ සේක. අබ්‍යාකතපදවසානවාරාදි වශයෙන් එහි වාර තුනකි. එයින් -පෙ- වදළ සේක. **අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස -පෙ- චිත්තසමුට්ඨානානඤ්ච රූපානං අධිපතිපච්චයෙන පච්චයො"** යනුයි. පදාර්ථ සුගම ය. එහි අදහස මෙසේ යː- අව්‍යාකෘතධර්මය අව්‍යාකෘතධර්මයට අධිපති ප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වේ. ඒ මෙ සේ යː- අර්හත් පුද්ගලයා අර්හත්ඵලය හා නිර්වාණය ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරන කල්හි ඒ අර්හත් ඵලය හා නිර්වාණය ගරු කොට ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ මහා ක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට ද නිර්වාණය අර්හත්ඵලයට ද ආරම්මණාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ. අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාක්‍රියා සිත් අට ය නියමයෙන් අධිපති ලැබෙන මහද්ගත ක්‍රියා නවය ය, ඵලසිත් සතර ය යන මොවුන් ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති අධිපති ධර්ම තුන හා සතර අතුරෙන්

Non-commercial distribution

එක එකක් වූ අධිපති ධර්මය අධිපති වන ධර්මයෙන් අන්‍ය වූ සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජ රූපයන්ට සහජාතාධිපති ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

ආරම්මණාධිපතියෙහි 'අබ්‍යාකතො" යන කර්තෘපාඨයෙන් ගරු කොට අරමුණු කරන මහාක්‍රියා ඥානසම්ප්‍රයුක්ත චිත්තයන්ට ප්‍රත්‍යය වන ගරු කළ යුතු අර්හත්ඵලය හා නිර්වාණය ය, ගරු කොට අරමුණු කරන ඵලසිත් සතර ප්‍රත්‍යය වන නිර්වාණය ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් මහාක්‍රියාඥානසම්ප්‍රයුක්ත සිත් සතර ය ඵලසිත් සතර ය, චෛතසික සතිස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් ආරම්මණාධිපති ශක්තිය ලැබේ. "අරහා ඵලං පච්චවෙක්ඛති" යනාදිය විස්තර කරනු.

සහජාතාධිපතියෙහි කර්තෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාක්‍රියා අට ය, මහද්ගතක්‍රියා නවය ය, ඵලසිත් සතර ය, චෛතසික අටතිස ය යන මොවුන් ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති අධිපති ධර්ම තුන සතර අතුරෙන් එක එකක් වූ ප්‍රත්‍යය ධර්මය ලබේ. සම්ප්‍රදානපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන් හා සාධිපති චිත්තජරූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් සහජාතාධිපති ශක්තිය ලැබේ. අනුවාදය විස්තර කරනු.

"**අබ්‍යාකතො කුසලස්ස**" යනාදි වාරයෙහි කර්තෘපාඨයෙන් ගරු කොට අරමුණු කරන මහා කුශල ඥානසම්ප්‍රයුක්ත චිත්තයන්ට ප්‍රත්‍යය වන හෙට්ඨිමඵල තුන හා නිර්වාණය ය, මාර්ග සිත් සතරට ප්‍රත්‍යය වන නිර්වාණය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතර ය මාර්ග සිත් සතර ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් ආරම්මණ ආරම්මණාධිපති ආරම්මණූපනිස්සය යන ශක්ති තුනෙන් ආරම්මණාධිපති ශක්තිය ලැබේ. ප්‍රත්‍යවේක්ෂා වීථි හා මාර්ග වීථි උක්තානුසාරයෙන් දක්වමින් අනුවාදය විස්තර කරනු.

'**අබ්‍යාකතො අකුසලස්ස**' යනාදිවාරයෙහි ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ඉෂ්ටනිෂ්පන්න රූප අටොළොස ය, දුඃඛසහගත කායවිඥාන වර්ජිත ලෞකික විපාක එක් තිස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික පන්තිස ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් ලෝභමූල සිත් අටය, චෛතසික දෙවිස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් ආරම්මණාධිපති ශක්තිය ලැබේ.

Non-commercial distribution

"චක්ඛුං ගරුං කත්වා අස්සාදෙති" යනාදි අනුවාදපාලියෙහි 'චක්ඛුං' යනුවෙන් ගරු කළ යුතු වූ ඉෂ්ට චක්ෂුඃ ප්‍රසාදය ද, "ගරුං කත්වා අස්සාදෙති' යනුවෙන් ගරු කොට ආස්වාදනය කරන ලෝභමූල සෝමනස්ස සහගත සිත් සතර ද, 'අභිනන්දති' යනුවෙන් ගරු කොට අරමුණු කරන සප්‍රීතික තෘෂ්ණා ප්‍රධාන ලෝභමූල සෝමනස්ස සහගත සිත් සතර ද, 'රාගො උප්පජ්ජති' යනුවෙන් ගරුකොට අරමුණු කරන රාගප්‍රධාන ලෝභමූල සිත් අට ද, 'දිට්ඨි' යනුවෙන් ගරුකොට අරමුණු කරන දෘෂ්ටිසම්ප්‍රයුක්ත සිත් සතර ද ගනිමින් 'සොතං' යනාදියේ අර්ථය ද ඒ ආකාරයෙන් ම ගනිමින් අනුවාදපාලිය විස්තර කරනු.

## 4. අනන්තර විභඞ්ග වාරය.

අධිපතිප්‍රත්‍යය විභඞ්ගවාරයට අනතුරු ව අනන්තර ප්‍රත්‍යය විභඞ්ග වාරය වදළ සේක. -පෙ- **කුසලො ධම්මො කුසලස්ස** -පෙ- **වොදානං මග්ගස්ස අනන්තර පච්චයෙන පච්චයො**" යනු යි.

**පදාර්ථ**

පුරිමා පුරිමා, පූර්ව පූර්ව වූ: කුසලා ඛන්ධා, අන්තිම ජවන වර්ජිත සතොළොස් ලෞකික කුශල නාමස්කන්ධයෝ: පච්ඡිමානං පච්ඡිමානං, පසු පසු වූ, කුසලානං ඛන්ධානං, ප්‍රථමජවන වර්ජිත එක්විසි කුශලජවන නාමස්කන්ධයන්ට, අනුලොමං, සංස්කාරාරම්මණික අනුලෝමකෘත්‍යවත් ඥාන සම්ප්‍රයුක්ත මහාකුශල චිත්තය, ගොත්‍රභුස්ස, නිර්වාණාරම්මණික ගෝත්‍රභූකෘත්‍යවත් මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට: අනුලොමං, සංස්කාරාරම්මණික අනුලෝමකෘත්‍යවත් මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතර: වොදානස්ස, නිර්වාණාරම්මණික වෝදානකෘත්‍යවත් මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට, 'ගොත්‍රභූ' නිර්වාණාරම්මණික ගෝත්‍රභූකෘත්‍යවත් මහා කුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතර: මග්ගස්ස, සෝවාන් මාර්ග චිත්තයට, වොදානං, නිර්වාණාරම්මණික වෝදානකෘත්‍යවත් මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතර: මග්ගස්ස, උපරිම මාර්ගත්‍රයට: අනන්තර පච්චයෙන පච්චයො.

**අභිධෙයාර්ථ**

කර්තෘ පාඨයෙන් අන්තිමජවන වර්ජිත පූර්ව පූර්ව ලෞකික කුසල් සතොළොස වූ ප්‍රත්‍යය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් ප්‍රථමජවන වර්ජිත පශ්චිම පශ්චිම කුසල් සිත් එක්විස්සවූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. විස්තර වශයෙන් මෙසේ ය. මහාකුශල ද්විතීය ජවනයට ප්‍රත්‍යයවන ප්‍රථම ජවනයය, -පෙ- සප්තම ජවනයට ප්‍රත්‍යය වන ෂෂ්ඨම ජවනය ය මහද්ගත සෝමනස්සසහගත සිත් සතරට හා මාර්ගසෝමනස්සසහගත සිත් සොළොසට

Non-commercial distribution

ප්‍රත්‍යය වන ගෝත්‍රභූ වෝදන කෘත්‍යවත් මහාකුශල ප්‍රථමද්වය ය, මහද්ගතකුශල උපේක්ෂාසහගත සිත් පසට හා මාර්ගෝපේක්ෂාසහගත සිත් සතරට ප්‍රත්‍යයවන ගෝත්‍රභූ වෝදනකෘත්‍යවත් මහාකුශල තෘතීයද්වය ය, සමාපජ්ජන වීථීන්හි පශ්චිම පශ්චිම මහද්ගතකුශලයන්ට ප්‍රත්‍යය වන පූර්ව පූර්ව සමාන වූ මහද්ගත කුශලයෝ ය යන ප්‍රත්‍යය ධර්මයෝ කර්තෘපාඨයෙන් ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් මහාකුශල ද්විතීයාදි ජවනයෝ ය. මහද්ගත කුසල් නවය ය, මාර්ග සිත් සතරය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණ පාඨයෙන් එක්වර සූදුසු පරිදි ලැබෙන අනන්තර, සමනන්තර, උපනිස්සය ආසේවන, නත්ථි, විගත, යන ප්‍රත්‍ය ශක්ති සය අතුරෙන් අනන්තර ශක්තිය ලැබේ.

"පුරිමා පුරිමා කුසලා ධම්මා" යනාදි පාඨයෙහි 'පුරිමා පුරිමා කුසලා ධම්මා' යනුවෙන් දැක්වෙන මහාකුශල ද්විතීයාදි ජවනයන්ට ප්‍රත්‍යය වන පූර්ව පූර්ව මහාකුශල ජවනයෝ ය, මහද්ගතකුශලසෝමනස්ස සහගත සිත් සතර හා මාර්ග සෝමනස්ස සහගත සිත් සොළොසට ප්‍රත්‍යයවන ගෝත්‍රභූ වෝදන කෘත්‍යවත් මහාකුශල ප්‍රථමද්වයය, මහද්ගත කුශල උපේක්ෂා සහගත සිත් පසට හා මාර්ග උපේක්ෂා සහගත සිත් සතරට ප්‍රත්‍යය වන ගෝත්‍රභූ වෝදන කෘත්‍යවත් මහාකුශල තෘතීයද්වය ය, සමාපජ්ජන වීථියෙහි පශ්චිම පශ්චිම මහද්ගතකුශලයන්ට ප්‍රත්‍යය වන පූර්ව පූර්ව මහද්ගත ජවනයෝ ය, යන මොවුහු පච්ඡිමානං පච්ඡිමානං කුසලානං ධම්මානං යනුවෙන් දැක්වෙන මහාකුශල ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගත කුසල නවය ය, මාර්ග සිත් සතර ය යන මොවුන්ට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වෙති. 'අනුලොමං ගොත්‍රභුස්ස' යන අනුවාදපාලියෙහි දැක්වෙන සංස්කාරාරම්මණික අනුලෝමකෘත්‍යවත් මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතර නිර්වාණාරම්මණික ගෝත්‍රභූ කෘත්‍යවත් මහාකුශල ඥාණසම්ප්‍රයුක්ත සිත් සතරට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වේ. 'අනුලොමං වොදනස්ස' යන අනුවාදපාලියෙහි දැක්වෙන සංස්කාරාරම්මණික අනුලෝම කෘත්‍යවත් මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතර නිර්වාණාරම්මණික වෝදනකෘත්‍යවත්-මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතරට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යයවේ. 'ගෝත්‍රභූ මග්ගස්ස' යන අනුවාද පාලියෙහි දැක්වෙන නිර්වාණාරම්මණික ගෝත්‍රභූ කෘත්‍යවත් මහාකුශල ඥාණසම්ප්‍රයුක්ත සිත් සතර සෝවාන් මාර්ග චිත්තයට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වේ. "වොදනං මග්ගස්ස" යන අනුවාද පාලියෙහිදක්වෙන වෝදනකෘත්‍යවත් නිර්වාණාරම්මණික මහාකුශල ඥාන-සම්ප්‍රයුක්ත සිත් සතර උපරිම මාර්ගත්‍රයට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

(මේ වාරයෙහි "පුරිමා පුරිමා කුසලා" යනාදි පාඨයෙන් භූමිත්‍රයට අයත් කුශල ධර්මයන්ට අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යවීම දක්වන ලදී. කුශලය

Non-commercial distribution

කුශලයට අනන්තරශක්තියෙන් ප්‍රත්‍යය වන සියල්ල එයින් දැක්වුණු නමුඃ ආරම්මණ වශයෙන් හා භූමිවශයෙන් භින්න කුශලයන් අතර අනන්තරප්‍රත්‍යය භාවය ඇත ද නැත ද යන සැකය දුරුවනු පිණිස 'අනුලොමං ගොත්‍රභුස්ස, අනුලෝමං වොදානස්ස, ගොත්‍රභු මග්ගස්ස, වොදානං මග්ගස්ස' යනු වදළ සේක. ඒ පාඨයන්ගෙන් නානාරම්මණික කුශලයන් අතර හා නානාභූමික කුශලයන් අතර ද අනන්තර ප්‍රත්‍යය භාවය ඇති බව දැක් වේ.)

කුසලාබ්‍යාකතවාරයෙහි පදථීඃ කුසලං, සතොළොස් ලෞකික කුසලයන් ගේ අන්තිම ජවනයඃ වුට්ඨානස්ස, තදරම්මණයට හා භවාඞගයටඃ මග්ගො, මාර්ගසිත් සතරඃ ඵලස්ස, ඵලසිත් සතරටඃ අනුලෝමං, සංස්කාරාරම්මණික අනුලෝම කෘත්‍යවත් මහාකුසල ඥානසම්ප්‍රයුක්ත සිත් සතරඃ සෙක්ඛාය, ශෛක්ෂ වූ, ඵලසමාපත්තියා, ඵලසමාපත්තියටඃ නිරොධා, නිරෝධසමාපත්තියෙන්ඃ වුට්ඨහන්තස්ස, නගින්නා වූ අනාගාමිපුද්ගලයා ගේඃ නෙවසඤ්ඤානාසඤ්ඤායතන කුසලං, නෙව-සඤ්ඤානාසඤ්ඤායතන කුසලයඃ ඵලසමාපත්තියා, අනාගාමිඵල සමාපත්තියටඃ අනන්තර පච්චයෙන පච්චයො.

කත්‍ථිපාඨයෙන් සතොළොස් ලෞකික කුශලයන් ගේ අන්තිම ජවනයෝ ය, මාර්ගජවන සතර ය යන ප්‍රත්‍යයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් සන්තීරණ තුන ය, මහාවිපාක අට ය, මහද්ගත විපාක නවය ය, ඵලසිත් සතර ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. විස්තර වශයෙන් මෙසේ යඃ- මහාකුශලජවනය කෙරෙන් තදරම්මණය වන කල්හි තදරම්මණ එකොළොස ය, නොවන කල්හි භවාඞග එකුන්විස්ස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන මහාකුශල අන්තිමජවනය ය, පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞගනවයට ප්‍රත්‍යය වන රූපාවචරකුශල අන්තිමජවනය ය, පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞග නවයට හා ආකාසානඤ්චායතන භවාඞගයට ප්‍රත්‍යය වන ආකාසානඤ්චායතනකුශල අන්තිම ජවනය ය, -පෙ- ත්‍රිහේතුකභවාඞග තෙළෙසට හා නිරෝධ සමාපත්තියෙන් නගින කල්හි අනාගාමිඵලචිත්තයට ද ප්‍රත්‍යය වන නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසල අන්තිම ජවනය ය, සෝවාන් ඵලයට ප්‍රත්‍යය වන සෝවාන්මාර්ගචිත්තය ය, -පෙ- අර්හත්ඵලයට ප්‍රත්‍යය වන අර්හත්මාර්ගචිත්තය ය යන මොවුහු කත්‍ථිපාඨයෙන් ලැබෙත්. සම්ප්‍රදානපාඨාභිධෙය කියනු. කරණපාඨයෙන් එක් වර සුදුසු පරිදි ලැබෙන අනන්තර, සමනන්තර, උපනිස්සය, කම්ම, නත්‍ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති සයෙන් අනන්තර ශක්ති විශේෂය ලැබේ. අනුවාදය විස්තර කරනු.

අකුසලපද අකුසලපදවසානවාරයෙහි පදථී සුගම ය. කත්‍ථිපාඨයෙන් අන්තිමජවන වර්ජිත පුර්ව පුර්ව දෙළොස් අකුශල ජවනයෝ ලැබෙත්.

Non-commercial distribution

සම්ප්‍රදානපාඨයෙන් ප්‍රථමජවන වර්ජිත පශ්චිම පශ්චිම වූ දෙළොස් අකුශලජවනයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක් වර සුදුසු පරිදි ලැබෙන අනන්තර, සමනන්තර, ආසෙවන, නත්‍ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති පස අතුරෙන් අනන්තර ශක්ති විශේෂය ලැබේ.

අබ්‍යාකතපදවසාන වාරයෙහි අදහස මෙ සේ යඃ- ලෝභමූල මෝහමූල ජවනයන් කෙරෙන් තදාරම්මණය වන කල්හි අන්තිම ජවනය තදාරම්මණ එකොළොසට ද, තදාරම්මණය නො වන කල්හි අන්තිමජවනය භවාඞ්ග එකුන්විස්සට ද, දෝසමූලජවනය කෙරෙන් තදාරම්මණය වන කල්හි අන්තිම ජවනය උපේක්‍ෂාතදාරම්මණ සයට ද, නො වන කල්හි කාම උපේක්‍ෂාභවාඞ්ග සයට ද, අනන්තරශක්තියෙන් ප්‍රත්‍යය වේ. කතිඃපාඨයෙන් දෙළොස් අකුශලයන් ගේ අන්තිම ජවනයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් සන්තීරණ තුන ය, මහාවිපාක අට ය, මහග්ගතවිපාක නවය ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් අනන්තර, සමනන්තර. උපනිස්සය, නත්‍ථි, විගත යන ශක්ති පසෙන් අනන්තර ශක්තිය ලැබේ.

අබ්‍යාකතපද අබ්‍යාකතපදවසානවාරයෙහි පදාර්ථ සුගම ය. අව්‍යාකෘතධර්මය අව්‍යාකෘතධර්මයට අනන්තරශක්තියෙන් ප්‍රත්‍යයවීම මෙසේ ය. අභිනවච්‍යුති වර්ජිත පූර්ව පූර්ව විපාකක්‍රියා නාමස්කන්ධයෝ අභිනවච්‍යුතිය සහිත වූ පශ්චිම පශ්චිම විපාකක්‍රියා නාමස්කන්ධයන්ට ද, පඤ්චවෝකාර භවාඞ්ගුපච්ඡෙද එකුන්විස්ස ආවර්ජන දෙකටද, අරූපභවාඞ්ගුපච්ඡෙද සතර මනෝද්වාරාවජ්ජනයට ද, ඉතිරි ක්‍රියා සිත් අටොළොසෙහි අන්තිමජවනය හා ව්‍යවස්ථාපනය තදාරම්මණ භවාඞ්ගයන්ට ද අනුලෝම කෘත්‍යවත් මහාක්‍රියා ප්‍රථමද්වය හා තෘතීයද්වය අර්හත් ඵලයට ද නිරෝධසමාපත්තියෙන් නැඟිමේදී නේවසඤ්ඤානාසඤ්ඤායතන අන්තිම ජවනය අර්හත්ඵලයට ද අනන්තර ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

කතිඃපාඨයෙන් අභිනවච්‍යුති වර්ජිත පූර්වපූර්ව විපාකසිත් සතිසය ක්‍රියා සිත් විස්ස ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. විස්තර වශයෙන් මෙ සේ යඃ ප්‍රථම භවාඞ්ග නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය, ද්විතියාදි පශ්චිම පශ්චිම භවාඞ්ග නාමස්කන්ධයන්ට ප්‍රත්‍යයවන ප්‍රථමාදි පූර්ව පූර්ව භවාඞ්ගනාමස්කන්ධයෝ ය, ආවර්ජනද්වයයට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභවාඞ්ගෝපච්ඡෙද පසළොස ය, මනෝද්වාරාවජ්ජනයට ප්‍රත්‍යය වන අරූපභවාඞ්ගෝපච්ඡෙද සතර ය, පඤ්චවිඥානයන්ට ප්‍රත්‍යය වන පඤ්චද්වාරාවජ්ජනය ය, සම්පටිච්ඡන දෙකට ප්‍රත්‍යය වන පඤ්චවිඥානයෝය, සන්තීරණයන්ට ප්‍රත්‍යය වන සම්පටිච්ඡනයෝ ය, ව්‍යවස්ථාපනයට ප්‍රත්‍යය වන සන්තීරණයෝ ය, පරිත්තාරම්මණවීථියෙහි ද්විතීයව්‍යවස්ථාපනයට ප්‍රත්‍යය වන ප්‍රථම ව්‍යවස්ථාපනය ය, පඤ්චවෝකාර භවාඞ්ග පසළොසට

Non-commercial distribution

ප්‍රත්‍යය වන ද්විතියව්‍යවස්ථාපනය ය, අතිමහන්තාරම්මණ විභූතාරම්මණ අවිභූතාරම්මණ වීථීන්හි හසිතෝත්පාද මහාක්‍රියා ප්‍රථමජවනයන්ට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනයෝ ය, ද්විතීය ජවනයට ප්‍රත්‍යය වන ප්‍රථමජවනය ය, -පෙ- සප්තම ජවනයට ප්‍රත්‍යය වන ෂෂ්ඨ ජවනයය, හසිතෝත්පාදය කෙරෙන් තදරම්මණය වන කල්හි සෝමනස්ස තදරම්මණ පසටද නො වන කල්හි පඤ්චවෝකාර ත්‍රිහේතුකභවාඞ්ග නවයටද ප්‍රත්‍යය වන හසිතෝත්පාද අන්තිමජවනය ය, මහාක්‍රියා සෝමනස්ස ජවනයන් කෙරෙන් තදරම්මණය වන කල්හි සෝමනස්ස තදරම්මණ පසට ද නො වන කල්හි ත්‍රිහේතුක භවාඞ්ග තෙළෙසට ද ප්‍රත්‍යය වන සෝමනස්ස සහගත මහාක්‍රියා අන්තිම ජවනය ය, මහාක්‍රියා උපේක්‍ෂාසහගත ජවනය කෙරෙන් තදරම්මණය වන කල්හි උපේක්‍ෂාතදරම්මණ සයටද නො වන කල්හි ත්‍රිහේතුක භවාඞ්ග තෙළෙසට ද ප්‍රත්‍යය වන උපේක්‍ෂා සහගත මහාක්‍රියා අන්තිමජවනයෝ ය, ද්විතීය තදරම්මණයට ප්‍රත්‍යය වන ප්‍රථමතදරම්මණය ය, කාමභවාඞ්ග දශයට ප්‍රත්‍යයවන ද්විතීය තදරම්මණයය මහද්ගත ක්‍රියා සෝමනස්ස සහගත සිත් සතරට හා අර්හත්ඵල සෝමනස්සසහගත සිත් සතරට ප්‍රත්‍යය වන ගෝත්‍රභූ අනුලෝම කෘත්‍යවත් මහාක්‍රියා ප්‍රථමද්වයය, මහද්ගතක්‍රියා උපේක්‍ෂාසහගත සිත් පසට හා අර්හත්ඵල .උපේක්‍ෂා සහගත සිතට ද ප්‍රත්‍යය වන ගෝත්‍රභූ අනුලෝම කෘත්‍යවත් මහා ක්‍රියා තෘතීය ද්වය ය, සමාපජ්ජනවීථීන්හි පශ්චිම පශ්චිම මහද්ගත ක්‍රියා ජවනයන්ට ප්‍රත්‍යය වන පූර්ව පූර්ව මහද්ගත ක්‍රියා ජවනයෝ ය. පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ගන-වයට ප්‍රත්‍යය වන රූපාවචර ක්‍රියා අන්තිමජවනයෝ ය, පඤ්චවෝකාර ත්‍රිහේතුක භවාඞ්ග නවයට හා අකාසානඤ්චායතන භවාඞ්ගයට ප්‍රත්‍යය වන ආකාසානඤ්චායතන ක්‍රියා අන්තිම ජවනයය, -පෙ- ත්‍රිහේතුක භවාඞ්ග තෙළෙසට හා නිරෝධසමාපත්තියෙන් නගින අවස්ථාවෙහි අර්හත්ඵලයට ද ප්‍රත්‍යය වන නේවසඤ්ඤානාසඤ්ඤායතන ක්‍රියා අන්තිමජවනය ය, පශ්චිම පශ්චිම ඵලසිත් සතරට ප්‍රත්‍යය වන පූර්ව පූර්ව ඵලසිත් සතර ය, ත්‍රිහේතුක භවාඞ්ගතෙළෙසට ප්‍රත්‍යය වන අන්තිම ඵලජවනයෝ ය, මරණාසන්නයෙහි තදරම්මණයට අනතුරු ව ච්‍යුතිය වන කල්හි කාමච්‍යුති දශයට ප්‍රත්‍යයවන ද්විතීය තදරම්මණය ය ජවනයට අනතුරු ව ච්‍යුතිය වන කල්හි ත්‍රිහේතුකච්‍යුති තෙළෙසට ප්‍රත්‍යවන මහාක්‍රියා පඤ්චම ජවන ය, (මරණාසන්න ජවන වශයෙන් මහද්ගතජවනයන් හා හසිතෝත්පාද-ජවනයෝ නො යෙදෙති.) භවාඞ්ගයට අනතුරු ව ච්‍යුතිය වන කල්හි ච්‍යුති එකුන්විස්සට ප්‍රත්‍යය වන භවාඞ්ග එකුන්විස්සය කාමප්‍රතිසන්ධි දශයට ප්‍රත්‍යයවන ද්විහේතුක අහේතුක ච්‍යුතීහු ය, ප්‍රතිසන්ධි එකුන්විස්සට ම ප්‍රත්‍යය වන කාමත්‍රිහේතුක ච්‍යුති සතර ය. සහේතුකප්‍රතිසන්ධි සතොළොසට

Non-commercial distribution

ප්‍රත්‍යය වන රූපාවචරච්‍යුති පස ය, කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතරට හා අරූපප්‍රතිසන්ධි සතරට ප්‍රත්‍යය වන අකාසානඤ්චායතන ච්‍යුතිය ය, කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතරට හා උපරිම අරූපප්‍රතිසන්ධි තුනට ප්‍රත්‍යය වන විඤ්ඤාණඤ්චායතනච්‍යුතිය ය, කාමත්‍රිහේතුක ප්‍රතිසන්ධි සතරට හා ආකිඤ්චඤ්ඤායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධි දෙකට ප්‍රත්‍යය වන ආකිඤ්චඤ්ඤායතන චුතියය, කාම ත්‍රිහේතුක ප්‍රතිසන්ධීන් හා නේවසඤ්ඤානාසඤ්ඤායතන ප්‍රතිසන්ධියට ප්‍රත්‍යයවන නේවසඤ්ඤා-නාසඤ්ඤායතන චුතිය ය යන මොවුහු කතිඃපාඨයෙන් ලැබෙත්. සම්ප්‍රදනපාඨයෙන් අභිනන්‍නච්‍යුතිය සහිත වූ පශ්චිම පශ්චිම වූ විපාකසිත් සතිස ය ක්‍රියා විස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්‍නයෝ ලැබෙත්. කරණපාඨයෙන් සුදුසු පරිදි එක් වර ලැබෙන අනන්තර, සමනන්තර, උපනිස්සය, ආසෙවන, නත්ථි, විගත යන ප්‍රත්‍යය ශක්ති සයෙන් අනන්තර ශක්තිය ලැබේ. (මේවාරයෙහි දක්වා තිබෙන්නේ විපාක විපාකයන්ට ද, ක්‍රියා ක්‍රියාවන්ට හා විපාක ක්‍රියාවන්ට ද, ක්‍රියා විපාකයන්ට ද ප්‍රත්‍යයවීම ය.)

කුසලපදවසානවාරයෙහි කතිඃපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජන සඞ්ඛ්‍යාතප්‍රත්‍යය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් මහාකුශල ප්‍රථමජවනය වූ ප්‍රත්‍යයෝත්පන්‍න ධර්මය ලැබේ. කරණපාඨයෙන් අනන්තර, සමනන්තර, උපනිස්සය, නත්ථි, විගත යන ශක්ති පස අතුරෙන් අනන්තර ශක්තිය ලැබේ.

අකුසලපදවසාන වාරයෙහි සම්ප්‍රදනපාඨයෙන් අකුසල් සිත් දෙළොස ගැනීම ම වෙනස ය. සෙස්ස කුසලපදවසානවාරයෙහි මෙනි. සමනන්තර විභඞ්ගය අනන්තරය මෙනි.

## 6 සහජාත විභඞ්ගවාරය

සමනන්තර ප්‍රත්‍යය විභඞ්ගයට අනතුරුව සහජාතප්‍රත්‍යය විභඞ්ගය වදාළ සේක. එහි කුසලපද කුසලපදවසාන වාරය පළමු කොට වදාළ සේක. පදාර්ථ සුගමය, කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන නාමස්කන්ධ සතර අතුරෙන් එක් එක් නාමස්කන්ධයක් තිදෙනෙකු තිදෙනෙකු වූ නාමස්කන්ධයන්ටද, තිදෙනකු තිදෙනෙකු වූ නාමස්කන්ධයෝ එක් එක් නාමස්කන්ධයකට ද, දෙදෙනකු දෙදෙනකු වූ නාමස්කන්ධයෝ දෙදෙනකු දෙදෙනකු වූ නාමස්කන්ධයන්ට ද සහාජාතප්‍රත්‍යයෙන් ප්‍රත්‍යය වෙත් ය යනු එහි අදහස ය.

"කුසලො" යන කතිඃපාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන කුසල් සිත් එක්විස්සය චෛතසික අටතිසය යන අවයවනාමස්කන්ධ වූ ප්‍රත්‍යය

Non-commercial distribution

ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් කුසල්සිත් එක්විස්ස ය -පෙ- යන අවයව නාමස්කන්ධ වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් සහජාත, නිස්සය, අඤ්ඤමඤ්ඤ, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් සහජාතශක්තිය ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි. පටිච්චවාරයෙහි විස්තර කළ පරිදි ය.

අබ්‍යාකතපදවසාන වාරයෙහි පදථ්:- කුසලා, කුසල්වූ, ඛන්ධා අවයව වූ ද සමූහ වූද නාමස්කන්ධයෝ, චිත්තසමුට්ඨානානං, සිතින් උපදවන්නා වූ, රූපානං, රූපයන්ට, අදහස මෙසේ ය. කුසල් සිත් එක්විස්ස ය, චෛතසික අටතිස ය යන නාමස්කන්ධයන් ගෙන් එක එකක් වූ ද, දෙක බැගින් වූ ද තුනබැගින් වූ ද, සතරදෙනම වූ ද නාමස්කන්ධයෝ චිත්තජරූපයන්ට සහජාත ශක්තියෙන් ප්‍රත්‍යය වෙති ය යනුයි. කත්තෘපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක් විස්ස ය චෛතසික අටතිසය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්. සම්ප්‍රදනපාඨයෙන් චිත්තජරූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක් වර ලැබෙන සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි, අවිගත යන ප්‍රත්‍යශක්ති පස අතුරෙන් සහජාත ශක්තිය ලැබේ. ස්කන්ධවාර දෙසිය විසිපසෙකි. සහජාතවාරය මෙති.

කුසලාබ්‍යාකතපදවසානවාරයෙහි කත්තෘපාඨයෙන් ඔවුනොවුන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාම-ස්කන්ධයෝ ලැබෙත්. සම්ප්‍රදනපාඨයෙන් කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිසය චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්න ලැබෙත්. කරණපාඨයෙන් සහජාත, නිසසය, අත්ථි, අවිගත යන ශක්ති සතරෙන් සහජාත ශක්තිය ලැබේ. අකුසලපදයේ වාරතුන ද කුසලපදය අනුව විස්තර කරනු.

අබ්‍යාකතපදවාරයෙහි පදථ් සුගම ය. ප්‍රවෘත්තිකාලයෙහි කත්තෘ-පාඨයෙන් ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යයවන විපාකසිත් සතිසය ක්‍රියාසිත් විස්සය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයෝ ලැබෙත්. සම්ප්‍රදනපාඨයෙන් විපාකසිත් සතිස ය, ක්‍රියාසිත් විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධයන් හා චිත්තජරූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත, අඤ්ඤ-මඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුක්ත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් සහජාත ශක්තිය ලැබේ. ස්කන්ධවාර දෙසිය දසයෙකි.

ප්‍රතිසන්ධි කාලයෙහි කත්තෘපාඨයෙන් ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා කෘතත්වාත් රූපයන්ට ද ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය

Non-commercial distribution

චෛතසික පන්තිස ය යන අවයව වූ ද අවයව හා සමූහ වූ ද නාමස්කන්ධයන් හා හෘදයවස්තුවය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදාන පාඨයෙන් ප්‍රතිසන්ධිසිත් එකුන් විස්ස ය චෛතසික පන්තිසය යන අවයව වූ ද සමූහ වූ ද, නාමස්කන්ධයන් හා කෘතත්වාත් රූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, විප්පයුක්ත, අත්ථි, අවිගත යන ශක්ති අතුරෙන් සහජාත ශක්තිය ලැබේ. ස්කන්ධවාර දෙසිය සතළිසෙකි.

ශුඬරූපවාරයෙහි කර්තෲපාඨයෙන් ඔවුනොවුන්ට හා උපාදයරූපයන්ට ද ප්‍රත්‍යය වන චිත්තජ ප්‍රතිසන්ධි කර්මජබාහිර ආහාරජ ඍතුජ අසඤ්ඤසත්ත්වකර්මජ ප්‍රවෘත්තිකර්මජ මහාභූත වූ ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් භූතරූප සහිත වූ උපාදයරූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු සේ ලැබෙන සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත යන ශක්ති පස අතුරෙන් සහජාත ශක්තිය ලැබේ. ස්කන්ධවාර එකසිය පසෙකි. පටිච්චවාරයෙහි මෙනි.

කුසලාබ්‍යාකතපද වාරයෙහි කර්තෲපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් එක්විස්ස ය චෛතසික අටතිස් ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, අවයව වූ ද සමූහ වූ ද මහාභූතයෝ ය යන මොවුහු ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් චිත්තජරූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර ලැබෙන සහජාත, නිස්සය, අත්ථි, අවිගත, යන ශක්ති සතරෙන් සහජාතශක්තිය ලැබේ. ස්කන්ධවාර දෙසිය විසිපසෙකි. අකුසලාබ්‍යාකත-පදවාරය සුගමය. සහජාත විභඞ්ගවාරය නිමි.

## 7 අඤ්ඤමඤ්ඤ විභඞ්ග වාරය.

අඤ්ඤමඤ්ඤ විභඞ්ගයෙහි කුසලපද අකුසලපද වාර දෙක සහජාතවාරයට සමානය. අබ්‍යාකතපදවාරයෙහි ප්‍රවෘත්ති කාලයෙහි කර්තෲපාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන විපාකසිත් සතිස ය ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය යන අවය නාමස්කන්ධයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් විපාක සිත් සතිස ය ක්‍රියාසිත් විස්සය චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුක්ත, අත්ථි, අවිගත යන ශක්ති සත අතුරෙන් අන්‍යෝන්‍ය ශක්තිය ලැබේ. ස්කන්ධවාර තුදුසෙකි.

ප්‍රතිසන්ධිකාලයෙහි කර්තෲපාඨයෙන් අන්‍යෝන්‍ය වශයෙන් නාමස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි සිත් එකුන්

Non-commercial distribution

විස්ස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද අවයව හා සමූහ වූද නාමස්කන්ධයන් හා හෘදය වස්තුව වූ ප්‍රත්‍යය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් ප්‍රතිසන්ධි සිත් එකුන්විස්ස ය චෛතසික පන්තිස ය යන අවයවූ ද අවයව හා සමූහවූ ද නාමස්කන්ධයන් හා හෘදයවස්තුව ද වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අතුරෙන් අන්‍යෝන්‍ය ශක්තිය ලැබේ. (මෙහි විපාක, සම්පයුත්ත, විප්පයුත්ත යන ශක්ති තුන සියල්ලෙහි ම නොයෙදේ.)

රූපවාරයෙහි කත්තෘපාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන චිත්තජ ප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ සෘතුජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් මහාභූත වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණ පාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, අත්ථි, අවිගත, යන ශක්ති පස අතුරෙන් අන්‍යෝන්‍ය ශක්තිය ලැබේ. ස්කන්ධවාර අට අනුවකි. අඤ්ඤමඤ්ඤ විභඞ්ගය නිමි.

## 8. නිඃශ්‍රය ප්‍රත්‍යය විභඞ්ගය.

නිස්සය විභඞ්ගයෙහි කුසලාකුසල් දෙපදයේ වාර තුන සහජාතයෙහි මෙනි. අබ්‍යාකතපදවාරයෙහි පදත්ථ සුගම ය. නිඃශ්‍රයප්‍රත්‍යය සහජාත පුරේජාතවශයෙන් දෙවැදෑරුම් වේ. සහජාත නිස්සය සහජාතය මෙනි. පුරේජාතනිස්සය යෙහි "අබ්‍යාකතො" යන කත්තෘපාඨයෙන් චක්ෂුර්විඥානද්වයයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක චක්ෂුර්වස්තුවය -පෙ- කාය විඥානද්වයයට ප්‍රත්‍යවන මධ්‍යමායුෂ්ක කායවස්තුව ය, පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥානවර්ජිත ප්‍රථමභවාඞ්ගාදි පශ්චිම පශ්චිම වූ විපාකසිත් දෙවිස්ස ය ක්‍රියාසිත් විස්ස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධ්‍යාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හෘදය වස්තුව ය, මරණාසන්න කාලයෙහි පඤ්චවෝකාර භවාඞ්ග පසළොස ය, ආවර්ජනද්වය ය, සම්ප්‍රතෝෂණද්වය ය, සන්තීරණත්‍රය ය, ව්‍යවස්ථාපනය ය, මරණාසන්නජවන පස ය, තදරම්මණය ය, චුතිය ය යන මොවුන්ට ප්‍රත්‍යය වන චුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් හෘදය වස්තුව ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක වර්ජිත ප්‍රථමභවාඞ්ගාදි පශ්චිම පශ්චිම විපාකසිත් දෙතිසය, ක්‍රියාසිත් විස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන නිස්සය, ආරම්මණ, පුරේජාත, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් නිඃශ්‍රයශක්තිවිශේෂය ලැබේ.

Non-commercial distribution

ස්කන්ධවාර අනුවෙකි. ඒ නම් චක්ඛායතනයෙහි වාරපසළොස ය, -පෙ- හෘදයවස්තුවෙහි වාර පසළොස ය යන මේවා ය.

කුසලපදවසානවාරයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ පශ්චිම පශ්චිම කුසල් සිත් විස්සට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා උපදනා හෘදයවස්තුවය, මරණාසන්න කුසල ජවන පසට ප්‍රත්‍යය වන චුතිචිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපදනා හෘදයවස්තුවය යන මොවුහු ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් පශ්චිම පශ්චිම කුසල් සිත් එක්විස්ස ලැබේ. කරණ පාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන නිස්සය, ආරම්මණ, පුරේජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් නිඃශ්‍රය ශක්තිය ලැබේ. ස්කන්ධවාර පසොළොසකි.

අකුසලපදවසානවාරයෙහි කතීඃපාඨයෙන් පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ පශ්චිම පශ්චිම දෙළොස් අකුසල චිත්තයන්ට ප්‍රත්‍යය වන ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනා හෘදයවස්තුව ය, මරණාසන්න අකුශල ජවන පසට ප්‍රත්‍යය වන චුතිචිත්තයෙන් සතළොස්වන චිත්තය හා උපදනා හෘදයවස්තුව ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් පශ්චිම පශ්චිම අකුසල් සිත් දෙළොස වූ ප්‍රත්‍යයෝත්පනයෝ ලැබෙත්. කරණපාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන නිස්සය, ආරම්මණ, ආරම්මණාධිපති, ආරම්මණූප-නිස්සය, පුරේජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් නිඃශ්‍රයශක්තිය ලැබේ.

කුසලාබ්‍යාකතපදවාරයෙහි කතීඃපාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනාඅවස්ථාවෙහි වූ කුසල සිත් එක් විස්සය චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයෝය, ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා උපදනා හෘදයවස්තුව ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් කුසල්සිත් එක් විස්සය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධ වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර ලැබෙන නිස්සය, අත්ථි, අවිගත යන ශක්ති තුනෙන් නිඃශ්‍රයශක්තිය ලැබේ. අකුසලාබ්‍යාකතපදවාරය ද මේ ක්‍රමයෙන් විස්තර කරනු. නිස්සය පච්චය විභඞ්ගය නිමි.

## 9 උපනිඃශ්‍රය ප්‍රත්‍යය විභඞ්ගය.

(උපනිඃශ්‍රයප්‍රත්‍යය විභඞ්ගයෙහි කුසලා කුසල අබ්‍යාකතපද තුනෙහි වාර තුන බැගින් වීමෙන් වාර නවයකි. ආරම්මණූපනිස්සය

Non-commercial distribution

අනන්තරූපනිස්සය දෙක වූක්තානුසාරයෙන් දත හැකි බැවින් ප්‍රකෘතෝපනිඃශ්‍රය පමණක් විස්තර කරනු ලැබේ. සුගම බැවින් පදපීද නො දක්වනු ලැබේ.)

කුසලපද කුසලපදවසානවාරයෙහි ප්‍රකෘතෝපනිඃශ්‍රයෙහි කතිඃපාඨයෙන් අභිත්මාර්ගී වර්ජිත බලවත් වූ කුසල්සිත් විස්ස ය, චෛතසික අටතිස ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදනපාඨයෙන් කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය ලැබේ.

"**සද්ධං උපනිස්සාය දනං දෙති**" යන අනුවාදපාලියෙන් ශ්‍රද්ධාව ප්‍රධාන කාමාවචර කුශලය දනචේතනා ප්‍රධාන කාමවචර කුශලයට ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තියෙන් ප්‍රත්‍යය වීම දැක් වූ සේක. ප්‍රත්‍යය වන ආකාරය මෙසේයඃ- ජලය කැමති තැනැත්තා මේ පොළොව තුළ එකාන්තයෙන් ජලය ඇතය යන විශ්වාසයෙන් ජලය ලබනු පිණිස පොළොව කණින්නාක් මෙන් භවභෝග සම්පත් කැමති තැනැත්තා දනමය කුශලයෙන් ඒවා ලැබිය හැකිය යන විශ්වාසයෙන් දන් දෙනු කැමති කල්හි භවාඞ්ගචලන භවාඞෙගාපච්ඡෙදයන්ට අනතුරු ව ආහාර පානවස්ත්‍රාදි දන වස්තූන් අරමුණු කොට මනෝද්වාරාවර්ජනය ද අනතුරු ව මහාකුසල් සිත් අට අතුරෙන් එක් සිතක් ජවනකෘත්‍යයෙන් සත්වරක් ද ඉපදීමෙන් පසු විභූතාරම්මණ වීථියක් වේ නම් දෙවරක් ද තදරම්මණය ඉපදීමෙන් පසු කාමභවාඞ්ගය වේ. අවිභූතාරම්මණවිථියක්වේ නම් ජවනයට අනතුරු ව පඤ්චවෝකාර භවාඞ්ග පසළොස අතුරෙන් එක් චිත්තයක් උපදී. අනතුරු ව ප්‍රත්‍යවේක්ෂා වීථිහු වෙති. මේ වීථිවල මහාකුශල ජවනයන්ට ශ්‍රද්ධා ප්‍රධාන කාමාවචර කුශලය ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තියෙන් ප්‍රත්‍යය වේ.

"**සද්ධං උපනිස්සාය සීලං සමාදියති**" යන අනුවාදපාලියෙන් ශ්‍රද්ධාවප්‍රධාන කාමාවචර කුශලය පඤ්චාඞ්ගශීල දශාඞ්ගශීල චේතනා ප්‍රධාන කාමාවචර කුශලයට ප්‍රත්‍යය වීම ද,

"**උපොසථ කම්මං කරොති**" යන අනුවාදපාලියෙන් අෂ්ටාඞ්ගපෞෂධ ශීලචේතනා ප්‍රධාන කාමාවචර කුශලයට ප්‍රත්‍යය වීම ද, "**ඣානං උප්පාදෙති**" යන අනුවාදපාලියෙන් මහද්ගතධ්‍යාන කුශලයට ප්‍රත්‍යය වීම ද,

"**විපස්සනං උප්පාදෙති**" යනුවෙන් විදර්ශනා කරන කාමාවචර කුශලයට ප්‍රත්‍යය වීම ද,

"**මග්ගං උප්පාදෙති**" යනුවෙන් ලෝකෝත්තර මාර්ගකුශලයට ප්‍රත්‍යය වීම ද,

Non-commercial distribution

අභිඤ්ඤං උප්පාදෙති" යනුවෙන් කුශලාභිඥා පසට ප්‍රත්‍යය වීම ද,

"සමාපත්තිං උප්පාදෙති" යනුවෙන් කුශලසමාපත්ති අටට ප්‍රත්‍යය වීම ද, දැක්වූ සේක. ප්‍රත්‍යය වන ආකාරය වූක්තානුසාරයෙන් දැක්විය යුතු ය.

සීලං සුතං චාගං පඤ්ඤං උපනිස්සාය දනං දෙති. සීලං සමාදියති. උපොසථකම්මං කරොති. ඣානං උප්පාදෙති, විපස්සනං උප්පාදෙති, මග්ගං උප්පාදෙති, අභිඤ්ඤං උප්පාදෙති, සමාපත්තිං උප්පාදෙති" යන මෙහි සීලං සුතං චාගං පඤ්ඤං යන පද සතර වෙන වෙනම දනං දෙති යන ආදි වාක්‍ය අට හා යොද අර්ථය ගතයුතුය.

"**සීලං උපනිස්සාය දනං දෙති**" යනුවෙන් පඤ්චාඞ්ගශීල දශාඞ්ග-සීලචේතනා ප්‍රධාන කාමාවචර කුශලය දනචේතනා ප්‍රධාන කාමාවචර කුශලයටද '**සීලං සමාදියති**' යනුවෙන් ශීලචේතනා ප්‍රධාන කාමාවචර කුශලයට ද, ප්‍රත්‍යය වීම දැක්වූ සේක. යනාදීන් සියල්ල විස්තරකරනු. "සුතං" යනුවෙන් ශ්‍රැතමය ප්‍රඥාව ප්‍රධාන කාමාවචර කුශලය ද, පඤ්ඤං" යනුවෙන් ප්‍රඥා ප්‍රධාන ඥාන සම්ප්‍රයුක්ත කාමාවචර කුසල් සිත් සතර ද දැක්වේ.

පඨමජ්ඣානස්ස පරිකම්මං යනුවෙන් දැක්වෙන්නේ ප්‍රථමධ්‍යානය ලබනු සඳහා පඨවි පඨවි යනාදීන් භාවනා කිරීමේ දී උපදනා මහාකුශල් සිත් අට ය. ධ්‍යානවීථියේ පරිකම්මචිත්තය එයින් නො ගනු ලැබේ. ("පරිකම්මන්ති අනන්තරං අගහෙත්වා පුබ්බභාගං පරිකම්මං ගහෙතබ්බං" යනු අටුවාව යි.) සියල්ල වූක්තානුසාරයෙන් විස්තර කරනු.

අකුසලපදවසාන වාරයෙහි පදාර්, මානං ජප්පෙති, මානය පවත්වයි, දිට්ඨිං ගණ්හාති, දෘෂ්ටිය උපදවයි, පත්ථනාය, භවභෝගසම්පත් පතන්නා වූ ලෝභයට: මට ශ්‍රද්ධාව ඇත, අන්‍යයන්ට මට මෙන් ශ්‍රද්ධාව නැත යයි තමා උසස් කොට ගැනීම් වශයෙන් ශ්‍රද්ධාව නිසා මානය උපදී. ඒ ඒ ධර්මපාඨයන් ශ්‍රද්ධා වශයෙන් පිළිගෙන අර්ථය මැනවින් තේරුම් නොගෙන පින් පව් කරන පින්පව්වල විපාක ය විඳින පුද්ගලයකු ඇතය යි දෘෂ්ටිය උපදව යි. සීල සුත චාග පඤ්ඤා යන ධර්මයන් නිසා මම සිල්වතෙක්මි ය උගතෙක් මිය දෙනකෙනෙක් වෙමි ය නුවණැත්තෙමිය යි මානය උපදව යි. මම සිල් රකිමි ය යනාදීන් වරදවා ගැනීමෙන් දෘෂ්ටිය උපදී. ශ්‍රද්ධාදිය නිසා තමා උසස් කොට ගන්නා කල්හි ඒ ධර්මයෝ රාගයට ද අනුන් පහත් කොට සලකන්නා වූ කාලයේ දී ද්වේෂයට ද ඒ අවස්ථා දෙක ම මෝහයට ද උපනිඃශ්‍රය වෙති.

Non-commercial distribution

කතීඃ පාඨයෙන් බලවත් වූ ලෞකික කුසල් සතොළොස වූ ප්‍රත්‍යය ධර්‍මය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් අකුසල් සිත් දොළොසය ය චෛතසික සත්විස්සය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණ පාඨයෙන් ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය ලැබේ.

ශාන්ත වූ ද ප්‍රණීත වූද උත්තම වූ ද අකුසල් නසන්නා වූද ලෝකෝත්තර කුශලය අකුශලයට උපනිඃශ්‍රය නොවන බැවින් මේ වාරයේ දී නො ගන්නා ලදී. එව මෙතථ ලොකියකුසලක්කෙව දස්සිතං, ලොකුත්තරං පන සන්තං පණීතං උත්තමං අකුසලවිධංසනං, තස්මා චන්දො විය අන්ධකාර විධමනං අකුසලස්ස උපනිස්සයො න හොතී ති න ගහිතං" යනු අටුවා යි.

අබ්‍යාකතපදවසානවාරයෙහි පදථී, අත්තානං ආතාපෙති,. තමා තවයි, පරිතාපෙති, හාත්පසින් තවයි, පරියෙට්ඨිමූලකං ප්‍රත්‍යය සෙවීම මුල් කොට ඇති, දුක්ඛං පච්චනුභොති, දුක් විඳී. අදහස මෙසේ යඃ බලවත් ශ්‍රද්ධාව ඇති තැනැත්තේ ශ්‍රද්ධාව නිසා ශීතෝෂ්ණාදිය නොසලකා වත්පිළිවෙත් ආදිය කිරීමෙන් තමා තවයි. වස්තුව සපයා ගෙන දනාදි පින්කම් කෙරෙමි යි වස්තුව සඳහා වැඩ කොට දුක් විඳී. ශීලයෙන් යුක්ත තැනැත්තේ හොඳින් සිල් රකිමි යි අභ්‍යාවකාශ වෘක්ෂමූල වාසාදි වශයෙන් තමා තවයි. පිඬු සිඟීම් ආදී වශයෙන් ප්‍රත්‍යය සෙවීම මුල් කොට ඇති දුක් විඳී. බහුශ්‍රැත තැනැත්තේ තමා ගේ බහුශ්‍රැතභාවයෙන් ප්‍රයෝජන ලබමි යි නො පසු බැස උගැන්වීම් දහම්දෙසීම් ආදියෙන් තමා තවයි. තමා දැනගත් ධර්‍මයට අනුව ප්‍රත්‍යය සොයා ජීවත්වෙමි යි පිණ්ඩචරණාදියෙන් දුක් විඳී. ත්‍යාගවත් තැනැත්තේ ත්‍යාගවත් භාවය නිසා තමා ගේ දිවි රැකීම පිණිස ප්‍රත්‍යය ඉතිරි කර නො ගෙන දන් දීමෙන් ද අඩගප්‍රත්‍යාඩගයන් පරිත්‍යාග කිරීමෙන් ද තමා තවයි. දීමට වස්තුව සෙවීම් වශයෙන් ද දුක් විඳී. ප්‍රඥාවත් තැනැත්තේ ද තමා ගේ ප්‍රඥාව වඩාත් දියුණු කරගත යුතු යයි ශීතෝෂ්ණාදිය ගණන් නොගෙන සජ්ඣායන මනස්කාරාදියෙන් තමා තවයි. මිථ්‍යාජීවයෙහි ආදීනවය හා සම්‍යගාජීවයෙහි අනුසස් ද දැක දැහැමින් ප්‍රත්‍යය සෙවීම් වශයෙන් දුක් විඳී. ශ්‍රද්ධාදි ධර්‍මයන්ගෙන් යුක්තවීම නිසා ඇතිවන ප්‍රීතිසහගත චිත්තයෙන් උපදවන ප්‍රණීත රූපයන්ගේ ස්පර්‍ශය ලබන කල්හි කායික සුඛයට ද ඉහත කී පරිදි දුක් ඇතිවීමේ දී කායික දුඃඛයට ද, ඵලයට සමවැදීමේදී ඵලසමාපත්තියටද බලවත් වූ එක්විසි කුසල චේතනාවෝ එකුන්තිස් කුසලවිපාකයන්ට ද ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තියෙන් ප්‍රත්‍යය වේ. "අරහා මග්ගං උපනිස්සාය" යනාදියෙහි අදහස සුගමය.

Non-commercial distribution

කත්තෘපාඨයෙන් බලවත් වූ කුසලසිත් එක්විස්සය චෛතසික අටතිසය යන ප්‍රත්‍යධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදන පාඨයෙන් විපාක සිත් සතිසය ක්‍රියා සිත් විස්සය චෛතසික අටතිසය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය ලැබේ.

අකුසලපද අකුසලපදවසානවාරයෙහි පදර්‍ථ, රාගං උපනිස්සාය, රාගය උපනිඃශ්‍රය කොට: පාණං හනති, අන්‍යයන්ගේ ප්‍රාණයනසයි; අදින්නං ආදියති, හිමියන් විසින් නුදුන්දැ පැහැරගනී; මුසා භණති, බොරු කියයි; ඵරුසං භණති, රළු වචන කියයි; සම්ඵං පලපති, නිරර්‍ථක කථා කරයි: සන්ධිං ඡින්දති, ගෙවල් බිඳී; නිල්ලොපං හරති, සැහවී සිට පැහැර ගනී: එකාගාරිකං කරොති, බොහෝ දෙනා එක්ව එක් ගෙයක් වට කොට වස්තුව පැහැරගනී: පරිපන්ථෙ තිට්ඨති, මග රැක සිට අනුන්ගේ වස්තුව උදුරා ගනී: පරදාරං ගච්ඡති, පරභාර්‍ය්‍යාවන් කරා යෙයි: ගාමඝාතං කරොති, ගම් කොල්ලකයි: නිගමඝාතං කරොති, නියම්ගම් කොල්ලකයි; මාතරං ජීවිතා වොරොපෙති, මව ජීවිතයෙන් තොරකරයි: පිතරං ජීවිතා වොරොපෙති, පියා ජීවිතයෙන් තොරකරයි: අරහන්තං ජීවිතා වොරොපෙති, රහතුන් ජීවිතයෙන් තොර කරයි, දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදෙති, දුෂ්ටසිතින් තථාගත ශරීරයෙහි ලේ උපදවයි: සංඝං භින්දති, සඞ්ඝයා බිඳී; සෙස්ස සුගමය.

කත්තෘ පාඨයෙන් බලවත් වූද දුබලවූද අකුසල සිත් දොළොස ය. චෛතසික සත් විස්සය යන ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදන පාඨයෙන් ප්‍රත්‍යයෝත්පන්න වූ ඒ ධර්මයෝ ම ලැබෙත්. කරණපාඨයෙන් ප්‍රකෘතෝප නිඃශ්‍රය ශක්තිය ලැබේ.

("බලවං දුබ්බලස්ස දුබ්බලඤ්ච බලවස්ස උපනිස්සයො හොති යෙව, යං පන පච්චය විභඞ්ගස්ස උද්දෙස වණ්ණණායං වුත්තං බලවකාරණට්ඨෙන උපනිස්සයො හොතී ති තං කාරණභාවසෙසච බලවතාය වුත්තං න උපනිස්සය ධම්මානං, කම්මකිලෙසා හි බලවන්තො පි දුබ්බලා පි බලව කාරණං හොන්ති යෙව' යනු අටුවායි.)

"රාගං උපනිස්සාය පාණං හනති:' යනාදී අනුවාදපාලියෙහි රාගං යනුවෙන් රාගප්‍රධාන ලෝභමූල චිත්තය ද, 'පාණං හනති' යනුවෙන් ප්‍රාණඝාතක ද්වේෂමූල මෝහමූල චිත්තයන් ද 'අදින්නං ආදියති' යනුවෙන් අදින්නාදානය කරන අකුසල් සිත් දොළොසද, 'මුසා භණති' යනුවෙන් මුසාවාදක අකුසල්සිත් දොළොස ද, පිසුණං භණති' යනුවෙන් කේලාම් කීම කරන අකුසල් සිත් දොළොස ද 'ඵරුසං භණති: යනුවෙන් පරුෂවචන කීමෙහි උපදනා ද්වේෂමූල චිත්තයද, සම්ඵං පලපති යනුවෙන්' නිරර්‍ථක වචන

Non-commercial distribution

කියන අකුසල් සිත් දෙළොස ද, 'සන්ධිං ඡින්දති, නිල්ලොපං හරති, එකාගාරිකං කරොති. පරිපන්ථෙ තිට්ඨති, ගාමඝාතං කරොති, නිගමඝාතං කරොති' යන පාඨවලින් අදත්තාදාන වශයෙන් පවත්නා අකුසල් සිත් දෙළොස ද, පරදාරං ගච්ඡති' යනුවෙන් කාමමිථ්‍යාචාර වශයෙන් උපදනා ලෝභමූල මෝහමූල චිත්තයන් ද, 'මාතරං ජීවිතා වොරොපෙති, පිතරං ජීවිතා වොරොපෙති. අරහන්තං ජීවිතා වොරොපෙති. දුට්ඨෙන චිත්තෙන තථාගතස්ස ලොහිතං උප්පාදෙති 'සංඝං භින්දති' යන පාඨවලින් ඒ කර්ම සිදුකරන්නා වූ ද්වේෂමූල චිත්තය ද, දෙසං' යනුවෙන් ද්වේෂ ප්‍රධාන ද්වේෂමූල චිත්තය ද, මොහං' යනුවෙන් මෝහ ප්‍රධාන අකුසල් සිත් දෙළොසද, මානං' යනුවෙන් මානප්‍රධාන දෘෂ්ටිවිප්පයුක්ත සිත් සතර ද, 'දිට්ඨිං යනුවෙන් මිථ්‍යාදෘෂ්ටිප්‍රධාන දෘෂ්ටිසම්ප්‍රයුක්ත සිත් සතර ද, 'පත්ථනං' යනුවෙන් භවභෝග සම්පත් පිළිබඳ වූ ලෝභමූල සිත් අට ද කියැවේ.

"මාතුඝාතිකම්මං මාතුඝාතිකම්මස්ස උපනිස්සය පච්චයෙන පච්චයො" යනුවෙන් දැක්වෙන මාතෘඝාත කර්මය මාතෘඝාතකර්මයට උපනිඃශ්‍රය වීම මෙසේ දතයුතු. අනුන් විසින් ඔවුන් ගේ මවුන් මරනු දැක එය කළ යුත්තකැ යි වරදවා ගෙන තමන්ගේ මවුන් මරන්නවුන් ගේ මාතෘඝාත කර්මයට අනුන්ගේ මාතෘඝාතකර්මය උපනිඃශ්‍රය වේ. එක් භවයකදී මාතෘඝාත කර්මය කළ තැනැත්තාට නැවත භවයකදී එය කිරීමට ද අතීතභවයේ මාතෘඝාතකර්මය උපනිඃශ්‍රය වේ. නැවත නැවත අණකිරීම් වශයෙන් මව මරන්නා වූ තැනැත්තා හට පළමු පළමු අණකිරීම් වූ මාතෘඝාත කර්මය පසුව අණකිරීම වූ මාතෘඝාතකර්මයට උපනිඃශ්‍රය වේ. දෙපහරකින් මැරෙන්නා වූ මවට පළමු පහරදීම වූ මාතෘඝාත කර්මය දෙවන පහර දීම වූ මාතෘ ඝාතකර්මයට උපනිඃශ්‍රය වේ. මෙසේ මාතෘඝාත කර්මය මාතෘඝාතකර්මයට උපනිඃශ්‍රය වීම සතරාකාරයකින් දක්වා තිබේ. 'මාතු-ඝාතිකම්මං මාතුඝාති කම්මස්සාති අඤ්ඤං මාතරං හනන්තං දිස්වා වට්ටති එවං කාතුන්ති අත්තනො මාතරං හනන්තස්ස වා එකස්මිං භවෙ හන්ත්වා අපරස්මිං හනන වසෙනවා එකස්මිං යෙව භවෙ ගච්ඡ මාතරං හනාහීති පුනප්පුනං ආණාපනවසෙන වා ද්වීහිපහාරෙහි නියත මරණාය දුතිය පහාර දානෙනවා මාතුඝාතිකම්මං මාතුඝාතිකම්මස්ස උපනිස්සයො හොති' යන අටුවා යි. "පුනප්පුනං ආණාපන වසෙනවා ති මාතුඝාත කම්මෙන සදිසතාය පුබ්බපවත්තාය පි ආණත්තචෙතනාය මාතුඝාත කම්ම නාමං ආරොපෙත්වා වදන්ති එසනයො ද්වීහි පහාරෙහී ති එත්ථපි" යනු ටීකායි.

අකුසලපද කුසලපදවසානවාරයෙහි "පානං හන්ත්වා තස්ස පටිඝාතත්ථාය දානං දෙති" යනුවෙනි. අර්ථය ප්‍රාණය නසා ඒ පව නැසීම පිණිස දන්දේය යනුයි. සෙස්ස සුගමය. මේ වාරයෙහි ආරම්මණූපනිස්සය

Non-commercial distribution

අනන්තරූපනිස්සය ප්‍රත්‍යය දෙක නොලැබේ. ප්‍රකෘතෝපනිඃශ්‍රය වශයෙන් කර්තෘපාඨයෙන් අකුසල් සිත් දොළොසය චෛතසික සත්විස්සය යන ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් කුසල් සිත් එක්විස්සය චෛතසික අටතිසය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය ලැබේ. අනුවාදපාලියෙහි පාඨවල අභිධෙය චූක්තානුසාරයෙන් දත හැකිය.

අබ්‍යාකත පදවසානවාරයෙහි ආරම්මණූපනිස්සය නො ලැබේ. පදර්ථාදිය සුගමය. කර්තෘපායෙන් අකුසල්සිත් දොළොසය චෛතසික සත්විස්සය යන ප්‍රත්‍යයධර්මය ලැබේ. සම්ප්‍රදානයෙන් විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්සය චෛතසික අටතිසය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය ලැබේ. අනුවාද පාලියෙහි 'අකුසලං කම්මං' යනුවෙන් බලවත් අකුශල චේතනා ද 'විපාකස්ස' යනුවෙන් අකුසල විපාක සිත් සත ද ගත යුතුය.

අබ්‍යාකතපද අබ්‍යාකතපදවසානවාරයෙහි කර්තෘපාඨයෙන් විපාක සිත් සතිස ය, ක්‍රියාසිත් විස්ස ය, චෛතසික අටතිස ය යන ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් ප්‍රත්‍යයෝත්පන්න වූ ඒ ධර්මයෝ ම ලැබෙත්. කරණපාඨයෙන් ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය ලැබේ.

කුසලපදවසානවාරයෙහි "අබ්‍යාකතො" යන කර්තෘපාඨයෙන් අර්හත්ඵලයෙන් අන්‍ය වූ විපාකසිත් පන්තිස ය ක්‍රියාසිත් විස්ස ය චෛතසික අටතිස ය රූප අටවිස්ස ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය ලැබේ.

අකුසලපදවසානවාරයෙහි කර්තෘපාඨයෙන් ලෞකිකවිපාක දෙතිස ය ක්‍රියාසිත් විස්ස ය චෛතසික පන්තිස ය රූප අටවිස්ස ය යන ප්‍රත්‍යයධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් අකුසල්සිත් දොළොස ය චෛතසික සත්විස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් ප්‍රකෘතෝපනිඃශ්‍රය ශක්තිය ලැබේ.

කුසලය කුසලයට ආරම්මණූපනිස්සය අනන්තරූපනිස්සය පකතූප- නිස්සය යන තුන් ආකාරයෙන් ප්‍රත්‍යය වේ. අකුසලයට අනන්තරූප නිස්සය හැර දෙයාකාරයෙන් ප්‍රත්‍යය වේ. අබ්‍යාකතයට තුන් ආකාරයෙන් ම ප්‍රත්‍යය වේ. අකුසලය ද අකුසලයට තුන් අකාරයෙන් ද කුසලයට පකතූපනිස්සය වූ එක් අකාරයකින් ද අබ්‍යාකතයට දෙයාකාරයෙකින් ද ප්‍රත්‍යය වේ. අබ්‍යාකතය අබ්‍යාකතයට තුන් ආකාරයෙන් ම ද කුසලාකුසල දෙකට ද එසේ තුන් ආකාරයෙන් ම ද ප්‍රත්‍යය වේ. මෙසේ කුසලය අට

Non-commercial distribution

ආකාරයකින් ද අකුසලය සයාකාරයකින් ද අබ්‍යාකෘතය නවාකාර-යකින් ද ප්‍රත්‍යය වීමෙන් උපනිස්සය තෙවිසි වැදෑරුම් වේ.

## 10. පුරේජාත ප්‍රත්‍යය විභඞ්ගය.

පුරේජාතවිභඞ්ගයෙහි අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන්නෙහි පදඵීඃ ආරම්මණපුරෙජාතං, ආරම්මණපුරේජාතයඃ වත්ථුපුරෙජාතං. වත්ථුපුරේජාත-යයි (පුරේජාතය දෙවැදෑරුම් වේ.) ආරම්මණපුරෙජාතං, (එයින්) ආරම්මණපුරේජාතය (මෙසේය.) සෙස්ස සුගම ය.

කතිඃපාඨයෙන් චක්ෂුර්විඥානද්වයයට ප්‍රත්‍යය වන වර්තමාන රූපාරම්මණය ය, -පෙ- කායවිඥානද්වයයට ප්‍රත්‍යය වන වර්තමාන ස්ප්‍රෂ්ටව්‍යාරම්මණය ය, මනෝධාතුත්‍රයට ප්‍රත්‍යය වන වර්තමාන පඤ්චාරම්මණය ය, මනෝද්වාරාවර්ජනය ය කාමක්‍රියාජවන නවය ය තදාරම්මණ එකොළොස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන වර්තමාන නිෂ්පන්නරූප අටොළොස ය. දිබ්බචක්ඛු ක්‍රියා අභිඥාවට ප්‍රත්‍යය වන දූර ප්‍රතිච්ඡන්න ස්නිග්ධ සූක්ෂම වර්තමාන රූපාරම්මණය ය, දිබ්බසෝත ක්‍රියා අභිඥාවට ප්‍රත්‍යය වන දූර ප්‍රතිච්ඡන්න ස්නිග්ධ සූක්ෂම වර්තමාන ශබ්දාරම්මණය ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් කාමවිපාක තෙවිස්ස ය කාමක්‍රියා එකොළොස ය, දිබ්බචක්ඛු දිබ්බසෝත ක්‍රියා අභිඥා දෙක ය විරති, අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික තෙතිස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන ආරම්මණ, නිස්සය, පුරේජාත, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් පුරේජාත ශක්තිය ලැබේ. අනුවාදය ආරම්මණප්‍රත්‍යය අනුව විස්තර කරනු. වස්තුපුරේජාතයා ගේ වශයෙන් අභිධෙය පුරේජාත නිස්සයෙහි මෙන් ගත යුතු ය.

අබ්‍යාකතො කුසලස්ස යන වාරයෙහි ආරම්මණපුරේජාත වශයෙන් කතිඃපාඨයෙන් මහාකුසල් අටට ප්‍රත්‍යය වන වර්තමාන නිෂ්පන්නරූප අටොළොස ය, දිබ්බචක්ඛු කුසලාභිඥාවට ප්‍රත්‍යය වන දූර ප්‍රතිච්ඡන්න ස්නිග්ධ සූක්ෂම වර්තමාන රූපාරම්මණය ය, දිබ්බසෝත කුසලාභිඥාවට ප්‍රත්‍යය වන දූර ප්‍රතිච්ඡන්න ස්නිග්ධ සූක්ෂම වර්තමාන ශබ්දාරම්මණය ය යන ප්‍රත්‍යයධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් මහාකුසල් අටය දිබ්බචක්ඛු දිබ්බසෝත කුසලාභිඥාය, විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික තෙතිස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන ආරම්මණ නිස්සය පුරේජාත විප්පයුත්ත අත්ථි අවිගත යන ශක්ති සය අතුරෙන් පුරේජාත ශක්තිය ලැබේ. වස්තු පුරේජාත වශයෙන් අභිධෙය වස්තුපුරේජාත නිස්සයෙහි මෙනි.

Non-commercial distribution

අබ්‍යාකතො අකුසලස්ස යන්නෙහි ආරම්මණපුරේජාත වශයෙන් කත්‍ථෘපාඨයෙන් වර්තමාන නිෂ්පන්නරූප අටළොස ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් අකුසල් සිත් දොළොස හා චෛතසික සත්විස්ස ලැබේ. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන ආරම්මණ සහාග ප්‍රත්‍යය ශක්ති අටෙන් ආරම්මණපුරේජාත ශක්තිවිශේෂය ලැබේ. වස්තුපුරේජාත වශයෙන් අභිධෙය පුරේජාත නිඃසයෙහි මෙනි. පුරේජාත විභඞ්ගය නිමි.

## 11. පශ්චාජ්ජාත විභඞ්ගය

අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන්නෙහි කත්‍ථෘපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා ඉපද ස්ථිතියට පැමිණෙන තිජචතුජකායයන්ට ප්‍රත්‍යයවන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍යය ධර්මය ලැබේ. අකුසලො අබ්‍යාකතස්ස යන්නෙහි ද එසේ ම ය. අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන්නෙහි කත්‍ථෘපාඨයෙන් ප්‍රතිසන්ධ්‍යාදි පූර්වපූර්ව චිත්තයන් හා ඉපද ස්ථිතියට පැමිණෙන ඒකජ ද්විජ තිජ චතුජ කායයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක වර්ජිත ප්‍රථමභවාඞ්ගාදි පශ්චිම පශ්චිම විපාකසිත් දෙතිස ය, ක්‍රියාසිත් විස්සය, චෛතසික අටතිස ය යන ප්‍රත්‍යයධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් ප්‍රතිසන්ධ්‍යාදි පූර්වපූර්ව චිත්තයන් හා ඉපද ස්ථිතියට පැමිණි ඒකජ ද්විජ තිජ චතුජ කායයන් වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර ලැබෙන පච්ඡාජාත, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන ශක්ති සතර අතුරෙන් පශ්චාජ්ජාතශක්තිය ලැබේ. පශ්චාජ්ජාත විභඞ්ගය නිමි.

## 12. ආසෙවන විභඞ්ගය.

ආසේවනයෙහි කුසලො කුසලස්ස අකුසලො අකුසලස්ස යන දෙවාරය අනන්තරයෙහි මෙනි. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි කත්‍ථෘපාඨයෙන් පශ්චිම පශ්චිම වූ අටොළොස් ක්‍රියාජවනයන්ට ප්‍රත්‍යය වන අන්තිම ජවනවර්ජිත පූර්වපූර්ව අටළොස් ක්‍රියාජවනයන් වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් ප්‍රථමජවන වර්ජිත පශ්චිම පශ්චිම ක්‍රියාජවන අටළොස වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. නොහොත් හසිතෝත්පාද මහාක්‍රියා ද්විතීයජවනයට ප්‍රත්‍යය වන ප්‍රථමජවනය ය, -පෙ- සප්තමජවනයට ප්‍රත්‍යය වන ෂෂ්ඨජවනය ය, මහද්ගතක්‍රියා සෝමනස්ස සිත් සතරට ප්‍රත්‍යය වන ගෝත්‍රභූකෘත්‍යවත් මහාක්‍රියා ප්‍රථමද්වය ය, මහද්ගතක්‍රියා උපේක්ෂා සහගත සිත් පසට ප්‍රත්‍යය වන ගෝත්‍රභූකෘත්‍යයවත් මහාක්‍රියා තෘතීයද්වය ය, සමාපජ්ජනවීථීන්හි පශ්චිම පශ්චිම මහද්ගතක්‍රියා

Non-commercial distribution

ජවනයන්ට ප්‍රත්‍යය වන පූර්වපූර්ව මහද්ගත ක්‍රියාජවනයෝ ය යන ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් හසිතෝත්පාද මහාක්‍රියා ද්විතීයාදි ජවනයෝ ය, මහද්ගතක්‍රියා නවය ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර ලැබෙන අනන්තර සමනන්තර උපනිඃශ්‍රය ආසේවන නත්‍ථි විගත යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් ආසේවන ශක්තිවිශේෂය ලැබේ. ආසේවන විභඞ්ගය නිමි.

## 13. කර්මප්‍රත්‍යය විභඞ්ගය.

කර්මප්‍රත්‍යයවිභඞ්ගයෙහි කුසලෙනකුසලයෙහි කර්තෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට ප්‍රත්‍යය වන එක්විසි කුසලචිත්තයන්හි ඇති චේතනා එකුන්විස්ස වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් කුසල් සිත් එක්විස්ස ය චේතනා වර්ජිත චෛතසික සත්තිසය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත, අඤ්ඤමඤ්ඤ, නිඃශ්‍රය, කම්ම, ආහාර, සම්පයුත්ත, අත්‍ථි අවිගත යන ප්‍රත්‍යශක්ති අට අතුරෙන් කර්ම ශක්තිය ලැබේ.

කුසලෙන අබ්‍යාකතයෙහි සහජාත වශයෙන් කර්තෘපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ එක්විසි කුසලචිත්තයෙහි චේතනා එකුන්විස්ස ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් කුසලචිත්තජරූපයෝ ලැබෙත්, කරණපාඨයෙන් එක්වර ලැබෙන සහජාත, නිඃශ්‍රය, කම්ම, ආහාර, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් කර්මශක්තිය ලැබේ. නානාක්‍ෂණිකකර්ම වශයෙන් කර්තෘපාඨයෙන් එකුන්තිස් කුශලවිපාකයන්ට හා කෘතත්වාත්රූපයන්ට ප්‍රත්‍යය වන අතීත වූ එක්විසි කුශලචේතනාවෝ ලැබෙත්. විස්තර වශයෙන් මෙ සේ ය. අහේතුකකුශල විපාක මහාවිපාක නාමස්කන්‍ධයන්ට හා කෘතත්වාත්රූපයන්ට ප්‍රත්‍යය වන ත්‍රිහේතුකෝත්කෘෂ්ට මහාකුශල චේතනාව ය, අහේතුකකුශලවිපාක ඥානවිප්‍රයුක්ත මහා විපාකනාමස්කන්‍ධයන්ට හා කෘතත්වාත් රූපයන්ට ප්‍රත්‍යය වන ත්‍රිහේතුකෝමක ද්විහේතුකෝත්කෘෂ්ට මහාකුශල චේතනා ය, අහේතුක කුශල විපාක නාමස්කන්‍ධයන්ට හා කෘතත්වාත් රූපයන්ට ප්‍රත්‍යය වන ද්විහේතුකෝමක මහා කුසල චේතනාය, ප්‍රථම ධ්‍යාන විපාක නාමස්කන්‍ධයන්ට හා කෘතත්වාත් රූපයන්ට ප්‍රත්‍යය වන ප්‍රථම ධ්‍යාන කුශල චේතනාව ය, -පෙ- පඤ්චමධ්‍යාන විපාක නාමස්කන්‍ධයන්ට හා කෘතත්වාත් රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චමධ්‍යාන කුශලචේතනාව ය, ආකාසානඤ්චායතන විපාක නාමස්කන්‍ධයන්ට ප්‍රත්‍යය වන අකාසානඤ්චායතන කුසල චේතනාව ය, -පෙ- නේවසඤ්ඤානාසඤ්ඤායතන විපාක නාමස්කන්‍ධයන්ට ප්‍රත්‍යය වන

Non-commercial distribution

නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසල චේතනාව ය, සෝතාපත්තිඵල නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන සෝතාපත්තිමග්ග චේතනාව ය, -පෙ- අරහත්තඵල නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අරහත්තමග්ගචේතනාව ය යන ප්‍රත්‍යය ධර්මයෝ කර්තෘපාධ්‍යයෙන් ලැබෙත්. සම්ප්‍රදනපාධ්‍යයෙන් එකුන්තිස් කුසලවිපාක නාමස්කන්ධයන් හා කෘතත්වාත්රූපයෝ ලැබෙත්. කරණපාධ්‍යයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන කම්ම, උපනිස්සය යන ප්‍රත්‍යය ශක්ති දෙකින් නානාක්ෂණික කර්ම ශක්තිය ලැබේ.

කුසලෙන කුසලාබ්‍යාකතවාරයෙහි කර්තෘපාධ්‍යයෙන් සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ එක්විසි කුසලචිත්තයන්හි චේතනාව වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදනපාධ්‍යයෙන් සම්ප්‍රයුක්තස්කන්ධචිත්තජරූප වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාධ්‍යයෙන් එක්වර ලැබෙන සහජාත, නිස්සය, කම්ම, ආහාර, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සය අතුරෙන් කර්මශක්තිය ලැබේ.

අකුසලපද අකුසලපදවසානවාරයෙහි කර්තෘපාධ්‍යයෙන් සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන දෙළොස් අකුසල චේතනාවෝ ලැබෙත්. සම්ප්‍රදනපාධ්‍යයෙන් අකුසල්සිත් දෙළොස ය, චේතනා වර්ජිත චෛතසික සවිස්ස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාධ්‍යයෙන් එක්වර ලැබෙන සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, කම්ම, ආහාර, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති අට අතුරෙන් කර්මශක්තිය ලැබේ.

අකුසලෙන අබ්‍යාකත වාරයෙහි සහජාතකර්ම වසයෙන් කර්තෘපාධ්‍යයෙන් චිත්තජ රූපයන්ට ප්‍රත්‍යයවන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ දෙළොස් අකුසල චේතනාවෝ ලැබෙත්. සම්ප්‍රදනපාධ්‍යයෙන් අකුසල චිත්තජරූපයෝ ලැබෙත්. කරණපාධ්‍යයෙන් එක්වර ලැබෙන සහජාත නිස්සය කම්ම ආහාර විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් සහජාතකර්මශක්තිය ලැබේ. නානාක්ෂණිකකර්ම වශයෙන් කර්තෘපාධ්‍යයෙන් අකුසල විපාක නාමස්කන්ධයන්ට හා කෘතත්වාත්රූපයන්ට ප්‍රත්‍යය වන දෙළොස් අකුසල චේතනාවෝ ලැබෙත්. සම්ප්‍රදනපාධ්‍යයෙන් අකුශල විපාක නාමස්කන්ධයන් හා කෘතත්වාත් රූපයෝ ලැබෙත්. කරණ පාධ්‍යයෙන් එක්වර සුදුසුපරිදි ලැබෙන කර්ම උපනිඃශ්‍රය ප්‍රත්‍යය ශක්ති දෙකින් නානාක්ෂණික කර්ම ශක්තිය ලැබේ.

අකුසලෙන අකුසලාබ්‍යාකතවාරයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ දෙළොස් අකුශල චේතනාවෝ ලැබෙත්. සම්ප්‍රදනපාධ්‍යයෙන් අකුසල්සිත් දෙළොසය චේතනා වර්ජිත චෛතසික සවිස්සය

Non-commercial distribution

චිත්තජරූපයෝ ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර ලැබෙන සහජාත, නිස්සය, කම්ම, ආහාර, අත්‍ථි, අවිගත යන ශක්ති සයෙන් කර්‍ම ශක්තිය ලැබේ.

අබ්‍යාකතපද අබ්‍යාකතපදවසාන වාරයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කර්‍තෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ටද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන විපාකසිත් සතිස ය ක්‍රියාසිත් විස්සය යන මොවුන් ගේ චේතනාව වූ ප්‍රත්‍යය ධර්‍මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් විපාකසිත් සතිසය ක්‍රියා සිත් විස්ස ය චේතනා වර්ජිත චෛතසික සත්තිසය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා චිත්තජරූපයෝ ලැබෙත්. කරණ-පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන සහජාත, නිස්සය, කම්ම, විපාක. ආහාර, විප්පයුත්ත, අත්‍ථි, අවිගත, යන ප්‍රත්‍යයශක්ති අට අතුරෙන් කර්‍මශක්තිය ලැබේ. ප්‍රතිසන්‍ධිකාලයෙහි කර්‍තෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධ-යන්ටද සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා කෘතත්වාත් රූපයන්ට ද ප්‍රත්‍යය වන ප්‍රතිසන්‍ධි චේතනා එකුන්විස්ස ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් ප්‍රතිසන්‍ධි සිත් එකුන්විස්ස ය, චේතනා වර්ජිත චෛතසික සූතිස ය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා කෘතත්වාත් රූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, කම්ම, විපාක, ආහාර, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන ශක්ති අතුරෙන් කර්‍මශක්තිය ලැබේ.

## 14. විපාක ප්‍රත්‍යය විභඞ්ගය.

විපාකප්‍රත්‍යය විභඞ්ගයෙහි ඇත්තේ අබ්‍යාකතවාරය පමණකි. කර්‍තෘපාඨයෙන් ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන විපාකසිත් සතිස ය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයන් වූ ප්‍රත්‍යය ධර්‍මය ලැබේ. සම්ප්‍රදාන පාඨයෙන් විපාක සිත් සතිසය, චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධයන් හා චිත්තජරූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත, නිස්සය, විපාක, විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන ශක්ති සය අතුරෙන් විපාකශක්තිය ලැබේ. ප්‍රතිසන්‍ධිකාලයෙහි කර්‍තෘපාඨයෙන් ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා කෘතත්වාත් රූපයන්ට ද ප්‍රත්‍යය වන ප්‍රතිසන්‍ධි සිත් එකුන්විස්සය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් ප්‍රතිසන්‍ධිසිත් එකුන්විස්ස ය චෛතසික පන්තිසය යන අවයව නාමස්කන්ධයන් හා කෘතත්වාත්රූපයෝ ද ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක විප්පයුත්ත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අතුරෙන් විපාකශක්තිය ලැබේ. විපාක විභඞ්ගය නිමි.

Non-commercial distribution

## 15. ආහාරප්‍රත්‍යය විභඞ්ගය.

ආහාරප්‍රත්‍යය විභඞ්ගයෙහි කුසලෙන කුසලයෙහි කතීඃපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන කුසල්සිත් එක්විස්ස ය, චෛතසික අටතිස ය යන මොවුන් කෙරෙහි ඇති ඵස්ස චේතනා විඤ්ඤාණ යන නාමාහාර තුන ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන සම්ප්‍රයුක්තස්කන්ධ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන නාමාහාරත්‍රයෙහි එක්වර සුදුසු පරිදි ලැබිය හැකි අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, කම්ම, ආහාර, ඉන්ද්‍රිය, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දශය අතුරෙන් ආහාර ශක්තිය ලැබේ.

කුසලෙන අබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක් විස්ස ය, චෛතසික අටතිස ය යන මොවුන් කෙරෙහි ඇති ඵස්ස, චේතනා, විඤ්ඤාණ යන නාමාහාරත්‍රය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් කුසලචිත්තජරූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන අධිපති, සහජාත, නිස්සය, කම්ම, ආහාර, ඉන්ද්‍රිය, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ශක්ති නවය අතුරෙන් ආහාරශක්තිය ලැබේ.

කුසලෙන කුසලාබ්‍යාකතවාරයෙහි කතීඃපාඨයෙන් සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල් සිත් එක්විස්සය චෛතසික අටතිස ය යන මොවුන් ගේ ඵස්ස, චේතනා, විඤ්ඤාණ යන නාමහාරත්‍රය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් කුසල්සිත් එක්විස්ස ය, චෛතසික අටතිස ය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා චිත්තජරූප වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන අධිපති, සහජාත, නිස්සය, කම්ම, ආහාර, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති සත අතුරෙන් ආහාරශක්තිය ලැබේ. කුශලපදයේ වාර තුන අනුව අකුසලපදයේ වාර තුන ද විස්තර කරනු.

අබ්‍යාකතෙන අබ්‍යාකත වාරයෙහි නාමාහාරයෙහි ප්‍රවෘත්ති කාලයෙහි කතීඃපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන විපාක සිත් සතිස ය ක්‍රියා සිත් විස්සය චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්තස්කන්ධයන්හි ඇති නාමාහාර තුනවූ ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් විපාක සිත් සතිසය ක්‍රියා සිත් විස්සය චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා චිත්තජ රූප වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණ පාඨයෙන් එක්වර සුදුසු පරිදි

Non-commercial distribution

ලැබෙන අධිපති, සහජාත, නිස්සය, කම්ම, විපාක, ආහාර, ඉන්‍ද්‍රිය, විප්පයුක්ත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අතුරෙන් ආහාර ශක්තිය ලැබේ. ප්‍රතිසන්‍ධි කාලයෙහි කත්‍තෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ටද සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට හා කෘතත්‍වාත් රූපයන්ට ද ප්‍රත්‍යය වන ප්‍රතිසන්‍ධි සිත් එකුන්විස්සෙහි හා චෛතසික පන්තිසෙහි ඇති නාමාහාරත්‍රය වූ ප්‍රත්‍යය ලැබේ. සම්ප්‍රදාන පාඨයෙන් ප්‍රතිසන්‍ධි සිත් එකුන්විස්සය චෛතසික පන්තිසය යන සම්ප්‍රයුක්තස්කන්‍ධයන් හා කෘතත්‍වාත්රූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, කම්ම, විපාක, ආහාර, ඉන්‍ද්‍රිය, විප්පයුක්ත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අතුරෙන් ආහාර ශක්තිය ලැබේ.

රූපාහාරයෙහි කත්‍තෘපාඨයෙන් ඒක කලාපගත වූද නානා කලාප ගත වූ ද චතුසමුට්ඨානික රූපයන්ට ප්‍රත්‍යය වන ඔජාව වූ ප්‍රත්‍යය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් චතුසමුට්ඨානික රූපයෝ ලැබෙත්. කරණ පාඨයෙන් එක්වර ලැබෙන ආහාර, අත්‍ථි, අවිගත යන ශක්තිතුනෙන් ආහාර ශක්තිය ලැබේ.

## 16 ඉන්‍ද්‍රිය ප්‍රත්‍යය විභඞ්ගය.

ඉන්‍ද්‍රිය විභඞ්ගයෙහි කුසලෙන කුසලයෙහි කත්‍තෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට ප්‍රත්‍යය වන එක්විසි කුසලයන්හි ඇති ජීවිත, චිත්ත, වේදනා. සද්‍ධා, විරිය, සති, ඒකග්ගතා, පඤ්ඤා යන නාමේන්‍ද්‍රිය ධර්‍ම අට වූ ප්‍රත්‍යය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් කුශල නාමස්කන්‍ධ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණ පාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන හේතු, අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ආහාර, ඉන්‍ද්‍රිය, ඣාන, මග්ග, සම්පයුක්ත, අත්‍ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති දෙළොස අතුරෙන් ඉන්‍ද්‍රිය ශක්තිය ලැබේ.

කුසලෙන අව්‍යාකතයෙහි කත්‍තෘපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල්සිත් එක්විස්සෙහි නාමේන්‍ද්‍රිය ධර්‍ම අට වූ ප්‍රත්‍යය ධර්‍මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් කුශලචිත්තජරූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් ඉහත කී ප්‍රත්‍යය ශක්ති දෙළොස අතුරෙන් ඉන්‍ද්‍රිය ශක්තිය ලැබේ. (සම්ප්‍රයුක්තය හැර විප්‍රයුක්තය ඇතුළු කොට ප්‍රත්‍යය ශක්ති දෙළොස ගත යුතු ය.)

කුසලෙන කුසලාව්‍යාකතවාරයෙහි කත්‍තෘපාඨයෙන් සම්ප්‍රයුක්ත-ස්කන්‍ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන කුසලචිත්තයන්හි ඇති නාමේන්‍ද්‍රිය ධර්‍ම අට වූ ප්‍රත්‍යය ධර්‍මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්‍ධයන් හා චිත්තජරූපයෝ ලැබෙත්. කරණපාඨයෙන්

Non-commercial distribution

ඉහත කී ප්‍රත්‍යශක්ති දෙළොසෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත ශක්ති දෙකෙන් අන්‍ය වූ ශක්ති දශය අතුරෙන් ඉන්ද්‍රිය ශක්තිය ලැබේ. අකුශලපදයේ වාරතුන ද කුශලපදනුසාරයෙන් විස්තර කරනු. ජීවිත චිත්ත වේදනා විරිය ඒකග්‍රතා යන ඉන්ද්‍රිය පස එහි ඇත්තේ ය.

අබ්‍යාකතපදවාරයෙහි නාමේන්ද්‍රියයන්ගේ වශයෙන් ප්‍රවෘත්ති කාලයෙහි කත්‍ථපාධයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජ රූපයන්ට ද ප්‍රත්‍යය වන විපාක සිත්සතිස ය, ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය යන ධර්මයන්හි ඇති නාමේන්ද්‍රිය ධර්ම අට ලැබේ. සම්ප්‍රදාන පාධයෙන් විපාක සිත් සතිසය, ක්‍රියා සිත් විස්ස ය චෛතසික අටතිස ය යන නාමස්කන්ධයන් හා චිත්තජ රූප ද වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාධයෙන් ඉහත කී ප්‍රත්‍යය ශක්ති දෙළොස ය විපාක විප්‍රයුක්ත ශක්ති දෙක ය යන ප්‍රත්‍යය ශක්ති තුදුස අතුරෙන් ඉන්ද්‍රිය ශක්තිය ලැබේ. ප්‍රතිසන්ධි කාලයෙහි කත්‍ථපාධයෙන් සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධ කෘතත්වාත් රූපයන්ට ද ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි සිත් එකුන් විස්සය චෛතසික පන්තිසය යන මොවුන් කෙරෙහි ඇති නාමේන්ද්‍රිය ධර්ම අට ලැබේ. සම්ප්‍රදාන පාධයෙන් ප්‍රතිසන්ධි සිත් එකුන් විස්ස ය, චෛතසික පන්තිස ය යන නාමස්කන්ධ වූ ද කෘතත්වාත් රූප වූද ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාධයෙන් ඉහත කී ප්‍රත්‍යශක්ති තුදුස අතුරෙන් ඉන්ද්‍රිය ශක්තිය ලැබේ.

පුරේජාතින්ද්‍රියෙහි කත්‍ථපාධයෙන් චක්‍ෂුර්විඥානද්වයයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක චක්‍ෂුඃප්‍රසාදය ය. -පෙ- කායවිඥානද්වයයට ප්‍රත්‍යය වන මධ්‍යමායුෂ්ක කායප්‍රසාදය ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදාන පාධයෙන් ද්විපඤ්චවිඤ්ඤාණය ය සර්වචිත්තසාධාරණ චෛතසික සත ය යන ප්‍රත්‍යයෝත්පනයෝ ලැබෙත්. කරණ පාධයෙන් එක්වර ලැබෙන නිස්සය, පුරෙජාත, ඉන්ද්‍රිය, විප්පයුක්ත, අත්ථි, අවිගත යන ශක්ති සය අතුරෙන් ඉන්ද්‍රිය ශක්තිය ලැබේ.

රූපජීවිතේන්ද්‍රියයෙහි කත්‍ථපාධයෙන් කර්මජකලාපවල ඉතිරි රූපයන්ට ප්‍රත්‍යය වන රූපජීවිතේන්ද්‍රියය ලැබේ. සම්ප්‍රදානපාධයෙන් කර්මජ කලාපයන්හි රූපජීවිතේන්ද්‍රියයෙන් අන්‍ය රූපයෝ ලැබෙත්. කරණ පාධයෙන් ඉන්ද්‍රිය අත්ථි අවිගත යන ශක්ති තුන අතුරෙන් ඉන්ද්‍රිය සඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ. ඉන්ද්‍රිය විභඞ්ගය නිමි.

## 17 ධ්‍යාන ප්‍රත්‍යය විභඞ්ගය

ධ්‍යාන ප්‍රත්‍යය විභඞ්ගයෙහි කුසලෙන කුසලයෙහි සම්ප්‍රයුක්ත-ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන කුසල් සිත් එක්විස්සය චෛතසික අටතිස ය

Non-commercial distribution

යන මොවුන් කෙරෙහි ඇති විතක්ක, විචාර, පීති, ඒකග්ගතා වේදනා යන ධ්‍යානාඞ්ගධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදනපාඨයෙන් කුසල් සිත් එක් විස්සය චෛතසික අටතිස ය යන සම්ප්‍රයුක්තස්කන්ධවූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති නවය අතුරෙන් ධ්‍යානශක්තිය ලැබේ.

කුසලෙන අබ්‍යාකතයෙහි චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිසය යන මොවුන් කෙරෙහි ඇති ධ්‍යානාඞ්ග පස වූ ප්‍රත්‍යයධර්මය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් කුශලචිත්තජරූප වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක් වර සුදුසු පරිදි ලැබෙන සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්ති අට අතුරෙන් ධ්‍යානසඞ්ඛ්‍යාත ශක්ති විශේෂය ලැබේ.

කුසලෙන කුසලාබ්‍යාකතයෙහි කත්ථෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන මොවුන් කෙරෙහි ඇති ධ්‍යානාඞ්ග පස වූ ප්‍රත්‍යයධර්මය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් කුසල් සිත් එක්විස්ස ය චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා කුසලචිත්තජරූප ද වූ ප්‍රත්‍යයෝත්පනයෝ ලැබෙත්. කරණපාඨයෙන් සහජාත, නිස්සය, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, අත්ථි අවිගත යන ප්‍රත්‍යයශක්ති සත අතුරෙන් ධ්‍යාන ශක්තිය ලැබේ. අකුසලපදයේ වාරතුන ද එසේ විස්තර කරනු.

අබ්‍යාකතපදවාරයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කත්ථෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන ද්විපඤ්චවිඥාන වර්ජිත විපාකසිත් සවිස්ස ය ක්‍රියාසිත් විස්ස ය චෛතසික අටතිසය යන මොවුන් කෙරෙහි ඇති ධ්‍යානාඞ්ගධර්ම පස වූ ප්‍රත්‍යය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් ද්විපඤ්චවිඥාන වර්ජිත විපාකසිත් සවිස්සය ක්‍රියාසිත් විස්සය චෛතසික අටතිසය යන සම්ප්‍රයුක්තස්කන්ධ හා චිත්තජරූප ද වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති අතුරෙන් ධ්‍යානශක්තිය ලැබේ. ප්‍රතිසන්ධි කාලයෙහි කත්ථෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා කෘතත්වාත්රූපයන්ට ද ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධිසිත් එකුන්විස්ස ය චෛතසික පන්තිසය යන මොවුන් කෙරෙහි ඇති ධ්‍යානාඞ්ගධර්ම පස වූ ප්‍රත්‍යය ලබේ. සම්ප්‍රදනපාඨයෙන් ප්‍රතිසන්ධිසිත්

Non-commercial distribution

එකූන්විස්ස ය චෛතසික පන්තිසය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා කෘතත්වාත් රූප ද වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් ධ්‍යානශක්තිය ලැබේ. ධ්‍යාන විභඞ්ගය නිමි.

## 18. මාර්ග ප්‍රත්‍යය විභඞ්ගය.

මාර්ගප්‍රත්‍යය විභඞ්ගයෙහි කුසලෙන කුසලයෙහි කතීපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන පඤ්ඤා විතක්ක විරති විරිය සති ඒකග්ගතා යන මාර්ගාඞ්ග අට වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන සම්ප්‍රයුක්තස්කන්ධ වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන හේතු, අධිපති, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ශක්ති එකොළොස අතුරෙන් මාර්ගප්‍රත්‍යය ශක්තිය ලැබේ.

කුසලෙන අබ්‍යාකතයෙහි කතීඃපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන මාර්ගාඞ්ග අට ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් චිත්තජරූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් ඉහත කී ප්‍රත්‍යයශක්ති එකොළොසෙන් සම්ප්‍රයුක්තය හැර විප්‍රයුක්තය ඇතුළු කොට ප්‍රත්‍යයශක්ති එකොළොස අතුරෙන් මාර්ගශක්තිය ලැබේ.

කුසලාබ්‍යාකතපදවසානවාරයෙහි කතීඃපාඨයෙන් සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන කුශලමාර්ගාඞ්ගයෝ ද සම්ප්‍රදනපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන් හා චිත්තජරූපයෝ ද කරණපාඨයෙන් සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත දෙකින් අන්‍යවූ ප්‍රත්‍යයශක්ති නවයෙන් මාර්ගශක්තිය ලැබෙත්. අකුශලපදයේ වාර තුන ද විස්තර කරනු. එහි ලැබෙන්නේ විතක්ක විරිය ඒකග්ගතා දිට්ඨි යන මාර්ගාඞ්ග සතර ය.

අබ්‍යාකතපදවාරයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කතීඃපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන සහේතුකවිපාක එක්විස්සෙහි හා සහේතුක ක්‍රියා සතළොසෙහි ඇති මාර්ගාඞ්ග අට වූ ප්‍රත්‍යයධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් සහේතුකවිපාක එක්විස්ස ය, සහේතුකක්‍රියා සතොළොස ය චෛතසික අටතිස ය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා චිත්තජරූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් ඉහත කී ප්‍රත්‍යය එකොළොස ය විපාක ප්‍රත්‍යය යන ප්‍රත්‍යයශක්ති දෙළොස අතුරෙන් මාර්ග ශක්තිය ලැබේ. ප්‍රතිසන්ධිකාලයෙහි කතීඃපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා කෘතත්වාත් රූපයන්ට ද ප්‍රත්‍යවන සහේතුක ප්‍රතිසන්ධි සතොළොසෙහි ඇති

Non-commercial distribution

පඤ්ඤා විතක්ක විරිය සති ඒකග්ගතා යන මාර්ගාඞ්ගපඤ්චක ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් සහේතුක ප්‍රතිසන්ධි සතොළොසය චෛතසික පන්තිස ය යන සම්ප්‍රයුක්තස්කන්ධයන් හා කෘතත්වාත්රූපයෝ ලැබෙත්. කරණපාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන හේතු, සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, ඉන්ද්‍රිය, ඣාන, මග්ග, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ශක්ති අතුරෙන් මාර්ගශක්තිය ලැබේ. මග්ගවිභඞ්ගය නිමි.

## 19. සම්පයුත්ත විභඞ්ග වාරය

සම්ප්‍රයුක්ත විභඞ්ගයෙහි කුසලාකුසල දෙවාරය සහජාතයෙහි මෙනි. අබ්‍යාකතපද වාරයෙහි ප්‍රවෘත්තිකාලයෙහි කර්තෘපාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන විපාකසිත් සතිස ය ක්‍රියාසිත් විස්ස ය චෛතසික අටතිසය යන අවයව නාමස්කන්ධ වූ ප්‍රත්‍යයධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් විපාකසිත් සතිස ය ක්‍රියාසිත් විස්ස ය චෛතසික අටතිස ය යන අවයව නාමස්කන්ධ වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් සුදුසු පරිදි එක්වර ලැබෙන සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, සම්පයුත්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යයශක්ති සත අතුරෙන් සම්ප්‍රයුක්ත ශක්තිය ලැබේ. ප්‍රතිසන්ධිකාලයෙහි කියන ලද පරිදි ප්‍රතිසන්ධිසිත් එකුන්විස්ස ගෙන විස්තර කරනු. සම්ප්‍රයුක්තවිභඞ්ගය නිමි.

## 20. විප්‍රයුක්ත විභඞ්ගය.

විප්‍රයුක්තවිභඞ්ගයෙහි කුසලපදවාරය සහජාතවිප්‍රයුක්තය සහජාතය අනුව ද පශ්චාජ්ජාතවිප්‍රයුක්තය පශ්චාජ්ජාතය අනුව ද විස්තර කරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතය ද සහජාත පූර්වජාත පශ්චාජ්ජාත වශයෙන් තෙවැදෑරුම් වේ. එයින් සහජාතවිප්‍රයුක්තයෙහි ප්‍රවෘත්ති කාලයෙහි කර්තෘපාඨයෙන් චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අර්හත්තච්‍යුති වර්ජිත විපාකසිත් දෙවිස්ස ය, ක්‍රියා සිත් විස්ස ය, චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහවූ ද නාමස්කන්ධ වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් විපාක ක්‍රියාචිත්තජරූප වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත, නිස්සය, විපාක, විප්පයුත්ත, අත්ථි, අවිගත යන ශක්ති සය අතුරෙන් විප්‍රයුක්තශක්තිය ලැබේ. ප්‍රතිසන්ධිකාලයෙහි කර්තෘපාඨයෙන් කෘතත්වාත් රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි පසළොස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරප්‍රතිසන්ධි පසළොස ය, චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහවූ ද නාමකන්ධයන් හා

Non-commercial distribution

හෘදයවස්තුව ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සමුද්‍රදනපාඨයෙන් පඤ්චවෝකාරප්‍රතිසන්ධි පසළොස ය චෛතසික පන්තිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයන් හා කෘතත්වාත් රූපයන් ද වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් එක්වර සුදුසු පරිදි ලැබෙන සහජාත, අඤ්ඤමඤ්ඤ, නිස්සය, විපාක, විප්‍රයුක්ත, අත්ථි, අවිගත යන ප්‍රත්‍යය ශක්තීන් අතුරෙන් විප්‍රයුක්ත ශක්තිය ලැබේ. පුරේජාතවිප්පයුත්තය පුරේජාතය සේ විස්තර කරනු. පච්ඡාජාතවිප්පයුත්තය පච්ඡාජාතය අනුව විස්තර කරනු. විප්පයුත්ත විභඞ්ගය නිමි.

## 21. අත්ථි පච්චය විභඞ්ගය.

අත්ථිවිභඞ්ගයෙහි කුශලාකුශල දෙපදයේ වාර සය සහජාතය මෙන් විස්තර කරනු. අබ්‍යාකතෙන අබ්‍යාකතයෙහි සහජාතත්ථිය සහජාතය මෙන් ද පුරේජාතත්ථිය පුරේජාතය මෙන් ද පච්ඡාජාතත්ථිය පච්ඡාජාතය මෙන් ද ආහාරත්ථිය රූපාහාරය මෙන් ද ඉන්ද්‍රියත්ථිය රූපජීවිතින්ද්‍රිය මෙන් ද විස්තර කරනු. අබ්‍යාකතෙන කුසලවාරය හා අබ්‍යාකතෙන අකුසල-වාරය පුරේජාතය මෙන් විස්තර කරනු. කුසලාබ්‍යාකතෙන කුසලවාරය සහජාතපුරෙජාතමිශ්‍රකනිඃශ්‍රය ප්‍රත්‍යය අනුව විස්තරකරනු, කුසලාබ්‍යාකතෙන අබ්‍යාකතවාරයෙහි සහජාතය ය, පශ්චාජ්ජාත ආහාරමිශ්‍රක ය, පශ්චාජ්ජාත ඉන්ද්‍රිය මිශ්‍රකය යන තුනෙන් සහජාතත්ථිය සහජාතය මෙන් විස්තර කරනු. පශ්චාජ්ජාත ආහාරමිශ්‍රකයෙහි කත්ථෘපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා ඉපද ස්ථිතියට පැමිණෙන තිජ චතුජ කායයන්ට ප්‍රත්‍යය වන පශ්චිම පශ්චිම වූ කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා ඉපද ස්ථිතියට පැමිණෙන ඕජාවය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදනපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා ඉපද ස්ථිතියට පැමිණි තිජ චතුජ කායයන් වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. පශ්චාජ්ජාත ඉන්ද්‍රිය මිශ්‍රකයා ගේ වශයෙන් කත්ථෘපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්ව පූර්ව චිත්තයන් හා ඉපද ස්ථිතියට පැමිණි කර්මජකායයට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ පශ්චිම පශ්චිම වූ කුසල් සිත් එක්විස්ස ය යන අවයව වූ ද සමූහ වූ ද නාමස්කන්ධයෝ ය, ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා ඉපද ස්ථිතියට පැමිණි රූපජීවිතේන්ද්‍රිය ය යන ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් ව්‍යවස්ථාපන මනෝද්වාරාවර්ජනාදි පූර්වපූර්ව චිත්තයන් හා ස්ථිතියට පැමිණි රූපජීවිතේන්ද්‍රිය වර්ජිත කර්මජකාය ය ලැබේ. කරණ පාඨයෙන් එක්වර ලැබෙන අත්ථි අවිගත යන ශක්ති

Non-commercial distribution

දෙකින් අස්තිශක්තිය ලැබේ. අකුසලාබ්‍යාකතපද වාරයද කියන ලද්ද අනුව විස්තර කරනු. අත්ථිපච්චය විභඞ්ගය නිමි.

නත්ථි විගත විභඞ්ග දෙක අනන්තර විභඞ්ගය මෙනි. අවිගත විභඞ්ගය නත්ථි පච්චය විභඞ්ගය මෙනි.

පඤ්හාවාර විභඞ්ගය නිමි.

# පඤ්හාවාරයේ ශුද්ධසඞ්ඛ්‍යාවාර පාලිය.

හෙතුයා සත්ත, ආරම්මණෙ නව, අධිපතියා දස, අනන්තරෙ සත්ත, සමනන්තරෙ සත්ත, සහජාතෙ නව, අඤ්ඤමඤ්ඤෙ තීණි, නිස්සයෙ තෙරස, උපනිස්සයෙ නව, පුරෙජාතෙ තීණි, පච්ඡාජාතෙ තීණි, ආසෙවනෙ තීණි, කම්මෙ සත්ත, විපාකෙ එකං, ආහාරෙ සත්ත, ඉන්ද්‍රියෙ සත්ත, ඣානෙ සත්ත, මග්ගෙ සත්ත, සම්පයුත්තෙ තීණි, විප්පයුත්තෙ පඤ්ච, අත්ථියා තෙරස, නත්ථියා සත්ත, විගතෙ සත්ත, අවිගතෙ තෙරස,

**සන්නය:**

විභඞ්ගවාරයට අනතුරු ව සඞ්ඛ්‍යාවාරය වදළසේක. එද ශුද්ධසඞ්ඛ්‍යාවාර මිශ්‍රක සඞ්ඛ්‍යාවාර වශයෙන් දෙවැදෑරුම් වේ, එයින් ශුද්ධ සංඛ්‍යාවාරය පළමු කොට වදළ සේක. එද හේතුප්‍රත්‍යය ශුද්ධ සඞ්ඛ්‍යාවාරය ආරම්මණ ප්‍රත්‍යය ශුද්ධසඞ්ඛ්‍යාවාරාදි වශයෙන් සූවිසි වැදෑරුම් වේ. එයින් හේතුප්‍රත්‍යය ශුද්ධසඞ්ඛ්‍යාවාරය පළමු කොට වදළ සේක. එහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සහේතුක චිත්තජරූපයන්ට ද සහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන හේතු ෂට්කය හේතුප්‍රත්‍යය වන ධර්මයෝ ය. එබැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමසඞ්ඛ්‍යාවාරයෙහි නයයට අනුව ද වාරයට අනුව ද ත්‍රිකපදයට අනුව ද කර්තෘසම්ප්‍රදානයන්ට අනුව ද "**හෙතුයා සත්ත**" යි වදරන ලදහ. හේතුප්‍රත්‍යයෙහි විසර්ජනාවාර සතක් ලැබේය යනු එහි අර්ථය ය. 'සත්ත' යනු කුසලො කුසලස්ස යනාදි ය, කුසලො කුසලස්ස යන්නෙහි කර්තෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන එක්විසි කුසලචිත්තයන් ගේ ද්විහේතුකචිත්තයන්හි ඇති අලෝභ අද්වේෂ දෙක ය, ත්‍රිහේතුක චිත්තයන්හි ඇති අලෝභ අද්වේෂ අමෝහ තුනය යන හේතු ධර්මයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් කුසල්සිත් එක්විස්ස ය, චෛතසික අටතිස ය යන සම්ප්‍රයුක්තස්කන්ධ වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් හේතුශක්තිය ලැබේ. එබැවින් ඒ ධර්මයන් ගේ විථිවිභඞ්ගය 'කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස

Non-commercial distribution

හෙතුපච්චයෙන පච්චයො, කුසලා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං හෙතුපච්චයෙන පච්චයො' යි උදුළ යුතුය. මෙසේ ඉතිරිවාර සය ද අභිධෙය දක්වා වීථිවිභඞ්ගයන් උදුරමින් විස්තර කරනු.

ආරම්මණශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි කාමසිත් සිවුපනස ය විඤ්ඤාණඤ්චායතන සිත් තුන ය, නේවසඤ්ඤානාසඤ්ඤායතන සිත් තුන ය, අභිඤ්ඤා දෙසිත ය, ලෝකෝත්තර සිත් අටය යන මොවුන්ට ප්‍රත්‍යය වන එකුන් අනූවිත්තය ය, චෛතසික දෙපනස ය, රූප අටවිස්ස ය යන මොවුහු ආරම්මණ ප්‍රත්‍යය වන ධර්මයෝ ය. එබැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමවාරයෙහි -පෙ- **"ආරම්මණෙ නව"** යි වදරන ලදහ. "නව" යනු කුසලො කුසලස්ස යනාදිය ය. කුසලො කුසලස්ස යන වාරයෙහි කත්‍ථපාඨයෙන් අභිඥාගී වර්ජිත කුසල් සිත් එක්විස්ස වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් මහාකුසල් අට ය, විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන කුසලයෝ ය, ඉද්ධිවිධ චේතෝපරිය පුබ්බෙනිවාසානුස්සති යථාකම්මූපග අනාගතංස කුසලාභිඤ්ඤාය විරති අප්‍රමාණ්‍ය වර්ජිත චෛතසික තෙතිස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණපාඨයෙන් ආරම්මණශක්තිය ලැබේ. එ බැවින් ධර්මයන්ගේ වීථිවිභඞ්ගය "කුසලො ධම්මො කුසලස්ස -පෙ- දනං දත්වා සීලං සමාදියිත්වා -පෙ- පච්චයො" යි උදුළ යුතු ය. මෙසේ වාර සියල්ල විස්තර කරනු.

අධිපති ශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අට ය, මහාකුසල් සිත් අට ය, මහාක්‍රියා ඥානසම්ප්‍රයුක්ත සිත් සතර ය, ලෝකෝත්තර සිත් අට ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ ඉෂ්ට නිෂ්පන්නරූප අටළොස ය ද්වේෂමූල මෝහමූල දුඃඛසහගතකායවිඥාන වර්ජිත සිත් සූ අසූවය ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය විචිකිත්සා වර්ජිත චෛතසික සත් සාළිස ය නිර්වාණය ය යන ආරම්මණාධිපති ප්‍රත්‍යය ය, සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන අධිපති ධර්ම වූ සහජාතාධිපතිප්‍රත්‍යය යන මොවුහු අධිපතිප්‍රත්‍යය ධර්මයෝ ය. එ බැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමවාරයෙහි -පෙ- **'අධිපතියා දස'** යි වදරන ලදහ. 'දස' යනු කුසලො කුසලස්ස යනාදිය ය. කුසලො කුසලස්ස යනාදි වාරයෙහි අධිපතිප්‍රත්‍යය ආරම්මණාධිපති සහජාතාධිපති වශයෙන් දෙවැදෑරුම් වේ. ආරම්මණාධිපති වශයෙන් කත්‍ථපාඨයෙන් ගරු කොට අරමුණු කරන මහාකුශල ඥානවිප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ ලෞකික කුසල්සිත් සතොළොස ය, ගරු කොට අරමුණු කරන මහා කුශලඥානසම්ප්‍රයුක්ත සිත් සතරට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ අභිඥාගී වර්ජිත කුසල් සිත් විස්ස ය යන ප්‍රත්‍යය ධර්මයෝ ලැබෙත්.

Non-commercial distribution

සම්ප්‍රදනපාඨයෙන් ගරු කොට අරමුණු කරන මහාකුසල් සිත් අට ලැබේ. සහජාතාධිපති වශයෙන් කතෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි වූ මහාකුසල් අටය, සැම කල්හි අධිපති ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුසලයෝ ය, චෛතසික අටතිස ය යන මොවුන් ගේ එක් එක් චිත්තක්ෂණයක ඇති අධිපති ධර්ම තුන සතර අතුරෙන් එක එකක් වූ ප්‍රත්‍යයධර්මය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් අධිපති වන ධර්මයෙන් අන්‍ය වූ සම්ප්‍රයුක්තස්කන්ධයෝ ලැබෙත්. කරණ පාඨයෙන් සහජාතාධිපතිශක්තිය ලැබේ. එ බැවින් ඒ ධර්මයන්ගේ වීථිවිභඞ්ගය "කුසලො ධම්මො -පෙ- ආරම්මණාධිපති, සහජාතාධිපති, ආරම්මණාධිපති, දනං දත්වා -පෙ- පච්චයො" යි උදුළ යුතු ය. සියල්ල මෙ සේ විස්තර කරනු.

අනන්තර ශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි අභිනතව්‍යුතිය සහිතවූ පශ්චිම පශ්චිම නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අභිනතව්‍යුතියෙන් අන්‍ය වූ පූර්වපූර්ව නාමස්කන්ධයෝ අනන්තර ප්‍රත්‍යය ධර්මයෝ ය. එබැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමසඞ්ඛ්‍යාවාරයෙහි -පෙ- "**අනන්තරෙ සත්ත**" යි වදරන ලදහ. "සත්ත" යනු කුසලො කුසලස්ස යනාදිය ය. කුසලො කුසලස්ස යනාදි වාරයෙහි කතෘපාඨයෙන් ප්‍රථමජවන වර්ජිත පශ්චිම පශ්චිම නාමස්කන්ධයන්ට ප්‍රත්‍යවන අන්තිමජවන වර්ජිත පූර්ව පූර්ව ලෞකික කුශල නාමස්කන්ධයෝ ලැබෙත්. සම්ප්‍රදනපාඨයෙන් ප්‍රථමජවන වර්ජිත පශ්චිම පශ්චිම එක්විසි කුශලනාමස්කන්ධයෝ ලැබෙත්. කරණ පාඨයෙන් අනන්තරශක්තිය ලැබේ. එබැවින් ඒ ධර්මයන් ගේ වීථිවිභඞ්ගය "කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස අනන්තරපච්චයෙන පච්චයො පුරිමා පුරිමා -පෙ- පච්චයො" යි උදුළ යුතු ය. ඉතිරි වාර විභඞ්ගවාරයෙහි දැක්වුණු පරිදි අභිධෙය ගනිමින් විස්තර කරනු. සමනන්තර විභඞ්ගය අනන්තරවිභඞ්ගය මෙනි.

සහජාතශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි ඔවුනොවුන්ට ද අන්‍යෝන්‍ය වශයෙන් නාමස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට හා උපාදයරූපයන්ට ද ප්‍රත්‍යය වන චිත්තජප්‍රතිසන්ධිකර්මජ බාහ්‍ය ආහාරජ ඍතුජ අසංඥසත්ත්ව කර්මජ ප්‍රවෘත්ති කර්මජ මහාභූතයෝ ය ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධයන් හා හෘදයවස්තුව ය යන මොවුහු සහජාතප්‍රත්‍යය ධර්මයෝ ය. ඒ ධර්මයෝ මේ අනුලෝමසඞ්ඛ්‍යාවාරයෙහි -පෙ- "**සහජාතෙ නව**" යි වදරන ලදහ. "නව" යනු කුසලො කුසලස්ස යන ආදිය ය. කුසලො කුසලස්ස යනාදිවාරයෙහි කතෘපාඨයෙන් ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන කුසල් සිත් එක්විස්ස හා

Non-commercial distribution

චෛතසික අටතිස ද වූ නාමස්කන්ධයෝ ලැබෙත්. සම්ප්‍රදානපාඨයෙන් කුසල්සිත් එක්විස්ස ය චෛතසික අටතිස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. කරණ පාඨයෙන් සහජාත ශක්තිය ලැබේ. එබැවින් ඒ ධර්‍මයන් ගේ වීථිවිභඞ්ග කුසලො -පෙ- සහජාත පච්චයෙන පච්චයො' යි උදුළ යුතු ය. ඉතිරි වාර විස්තර කරනු.

අන්‍යෝන්‍යශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, මහාභූතයෝ ය පඤ්චවෝකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධ හෘදයවස්තුහුය යන මොවුහු අන්‍යෝන්‍යප්‍රත්‍යය ධර්‍මයෝ ය. එබැවින් ඒ ධර්‍මයෝ -පෙ- "**අඤ්ඤමඤ්ඤෙ තීණි**" යි වදරන ලදහ. "තීණි" කුසලො කුසලස්ස යනාදිය ය. වුක්තානුසාරයෙන් විස්තර කරනු.

නිඃශ්‍රයශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි සහජාතනිඃශ්‍රය සහජාතය මෙනි. පඤ්චවෝකාරභූමියෙහි අරූපවිපාක වර්ජිත සප්තවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන ෂට්වස්තූහු වස්තුපුරේජාත නිඃශ්‍රයප්‍රත්‍යය වන ධර්‍මයෝ ය. එබැවින් ඒ ධර්‍මයෝ -පෙ-"**නිස්සයෙ තෙරස**" යි වදරන ලදහ. විභඞ්ගවාරයෙහි මෙන් අභිධෙය ගෙන විස්තර කරනු.

උපනිඃශ්‍රයශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි ආරම්මණෝපනිඃශ්‍රය ආරම්මණාධිපතිය මෙන් ද අනන්තරෝපනිඃශ්‍රය අනන්තරය මෙන් ද විස්තර කරනු. එකුන් අනූචිත්තය ය චෛතසික දෙපනස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන බලවත් වූ එකුන්අනූචිත්තය ය චෛතසික දෙපනස ය රූප අටවිස්ස ය යන මොවුහු ප්‍රකෘතෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ධර්‍මයෝ ය. එ බැවින් ඒ ධර්‍මයෝ -පෙ- "**උපනිස්සයෙ නව**" යි වදරන ලදහ. විභඞ්ග වාරයෙහි මෙන් විස්තර කරනු.

පූර්‍වේජාතශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි කාමසිත් සිවුපනසට හා දිබ්බ චක්ඛු දිබ්බසෝත අභිඤ්ඤා දෙකට ද ප්‍රත්‍යය වන නිෂ්පන්න රූප අටළොස වූ ආරම්මණපුරේජාත ප්‍රත්‍යය ය, පඤ්චවෝකාර භූමියෙහි අරූපවිපාක වර්ජිත සප්තවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන ෂට්වස්තුසඞ්ඛ්‍යාත වස්තු-පූර්‍වේජාතප්‍රත්‍යය යන මොවුහු පූර්‍වේජාත ප්‍රත්‍යය ධර්‍මයෝ ය. එබැවින් ඒ ධර්‍මයෝ -පෙ- "**පුරෙජාතෙ තීණි**" යි වදරන ලදහ. විභඞ්ගවාරයෙහි මෙන් විස්තර කරනු.

පශ්චාජ්ජාතශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි ප්‍රතිසන්ධ්‍යාදි පූර්‍වපූර්‍ව චිත්තයන් හා ඉපද සථිතියට පැමිණි ඒකජ ද්විජ තිජ චතුජ කායයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක

Non-commercial distribution

වර්ජිත ප්‍රථම භවාඞ්ගාදි පශ්චිම පශ්චිම නාමස්කන්ධයෝ පශ්චාජ්ජාත ප්‍රත්‍යය ධර්‍මයෝ ය. ඒ බැවින් ඒ ධර්‍මයෝ -පෙ- "**පච්ඡාජාතෙ තීණි**" යි වදරන ලදහ. විස්තර කරනු.

ආසේවන ශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි ප්‍රථමජවන ඵලජවන වර්ජිත පශ්චිම පශ්චිම එක්පනස් ජවනයන්ට ප්‍රත්‍යය වන අන්තිම ජවන වර්ජිත පූර්‍ව පූර්‍ව වූ ලෞකික ජවන සත්සාළිස ආසේවන ප්‍රත්‍යය ධර්‍මයෝ ය. "**ආසේවනෙ තීණි**" විස්තර කරනු.

කර්‍මශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ ප්‍රතිසන්ධිකර්‍මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන එකුන්අනූචිත්තයෙහි ඇති චේතනා එකුන් අනූව වූ සහජාතකර්‍මප්‍රත්‍යය ය, විපාකනාමස්කන්ධයන්ට හා කෘතත්වාත්රූපයන්ට ප්‍රත්‍යය වන කුශලාකුශල චේතනා සඞ්ඛ්‍යාත නානාක්ෂණික කර්‍මප්‍රත්‍යයය යන මේ ධර්‍මයෝ කර්‍මප්‍රත්‍යය ධර්‍මයෝය, "**කම්මෙ සත්ත**" විස්තර කරනු.

විපාක ශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්‍මජරූපයන්ට ද ප්‍රත්‍යය වන සකල විපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය හෘදය වස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය යන මොවුහු විපාක ප්‍රත්‍යය ධර්‍මයෝ ය. "**විපාකෙ එකං**" විස්තර කරනු.

ආහාරශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූපප්‍රතිසන්ධිකර්‍මජරූපයන්ට ද ප්‍රත්‍යය වන ස්පර්ශ චේතනා විඥාන යන නාමාහාර ප්‍රත්‍යය ය චතුසමුට්ඨානික රූපයන්ට ප්‍රත්‍යය වන ඕජාව වූ රූපාහාරප්‍රත්‍යය යන මොවුහූ ආහාරප්‍රත්‍යය වන ධර්‍මයෝ ය, "**ආහාරෙ සත්ත**" විස්තර කරනු.

ඉන්ද්‍රියශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූපප්‍රතිසන්ධිකර්‍මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්‍ම අට වූ සහජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ය, පඤ්චවිඥානයන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තු සඞ්ඛ්‍යාත පුරේජාතේන්ද්‍රිය ප්‍රත්‍යය, කර්‍මජරූපයන්ට ප්‍රත්‍යය වන රූප ජීවිතේන්ද්‍රිය ප්‍රත්‍යය යන මොවුහූ ඉන්ද්‍රියප්‍රත්‍යය ධර්‍මයෝ ය. "**ඉන්ද්‍රියෙ සත්ත**"

ධ්‍යානශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ රූප ප්‍රතිසන්ධිකර්‍මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන විතර්‍කක විචාර පීති ඒකාග්‍රතා වේදනා යන ධ්‍යානාඞ්ගයෝ ධ්‍යානප්‍රත්‍යය ධර්‍මයෝ ය. "**ඣානෙ සත්ත**" විස්තර කරනු.

Non-commercial distribution

මාර්ගශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සහේතුක චිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන පඤ්චා විතක්ක විරති විරිය සති ඒකග්ගතා දිට්ඨි යන මාර්ගාඞ්ගයෝ නව දෙන මාර්ගප්‍රත්‍යය ධර්මයෝ ය, "**මග්ගෙ සත්ත**." විස්තර කරනු.

සම්ප්‍රයුක්තශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ සම්ප්‍රයුක්තප්‍රත්‍යය ධර්මයෝ ය. "**සම්පයුත්තෙ තීණි**" විස්තර කරනු.

විප්‍රයුක්තශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක ද්විපඤ්චවිඥාන අභිඥාච්‍යුති වර්ජිත ප්‍රවෘත්ති ප්‍රතිසන්ධිනාමස්කන්ධ-යෝ ය ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධ හෘදයවස්තුහුය යන සහජාත විප්‍රයුක්තප්‍රත්‍යය ය, පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූප විපාක වර්ජිත සප්තවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන ෂට්වස්තුසඞ්ඛ්‍යාත පූර්වජාත විප්‍රයුක්තප්‍රත්‍යය ය, පශ්චාජ්ජාතවිප්‍රයුක්තප්‍රත්‍යය යන මොවුහු විප්‍රයුක්තප්‍රත්‍යය වන ධර්මයෝ ය. "**විප්පයුත්තෙ පඤ්ච**" විස්තර කරනු.

අස්තිශුද්ධසඞ්ඛ්‍යාවාරයෙහි සහජාතාස්තිය සහජාතය මෙන් ද පූර්වජාතාස්තිය පූර්වජාත ප්‍රත්‍යය මෙන් ද පශ්චාජ්ජාතාස්තිය පශ්චාජ්ජාත ප්‍රත්‍යය මෙන් ද ආහාරාස්තිය රූපාහාරප්‍රත්‍යය මෙන් ද ඉන්ද්‍රියාස්තිය රූපජීවිතේන්ද්‍රිය ප්‍රත්‍යය මෙන් ද දත යුතු. "**අත්ථියා තෙරස**" විස්තර කරනු. නත්ථි විගතවාර දෙක අනන්තරය මෙනි. අවිගතවාරය අත්ථිය මෙනි.

**ශුද්ධසඞ්ඛ්‍යාවාරය නිමි.**

Non-commercial distribution

# පඤ්හාවාරයේ මිශ්‍රක සඞ්ඛ්‍යාවාර පාලිය

## 1. හෙතුප්‍රත්‍යයමිශ්‍රක සඞ්ඛ්‍යාවාර පාලිය,

හෙතුපච්චයා අධිපතියා චත්තාරි, සහජාතෙ සත්ත, අඤ්ඤමඤ්ඤෙ තීණි, නිස්සයෙ සත්ත, විපාකෙ එකං, ඉන්ද්‍රියෙ චත්තාරි, මග්ගෙ චත්තාරි, සම්පයුත්තෙ තීණි, විප්පයුත්තෙ තීණි, අත්ථියා සත්ත, අවිගතෙ සත්ත.

(සාමඤ්ඤ අවිපාක ඝටනා)

(1) හෙතු සහජාත නිස්සය අත්ථි අවිගතන්ති සත්ත.
(2) හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගතන්ති තීණි.
(3) හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි.
(4) හෙතු සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි.

(සාමඤ්ඤ විපාක ඝටනා)

(5) හෙතු සහජාත නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං.
(6) හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං.
(7) හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.
(8) හෙතු සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.
(9) හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.

(සඉන්ද්‍රියමග්ග අවිපාක ඝටනා)

(10) හෙතු සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති චත්තාරි.
(11) හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති ද්වේ.
(12) හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය මග්ග සම්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ.
(13) හෙතු සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ.

(සඉන්ද්‍රිය මග්ග සවිපාක ඝටනා)

(14) හෙතු සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති එකං.
(15) හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති එකං

Non-commercial distribution

(16) හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග සම්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං.

(17) හෙතු සහජාත නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං.

(18) හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං.

(සාධිපති ඉන්‍ද්‍රියමග්ග අවිපාක ඝටනා)

(19) හෙතාධිපති සහජාත නිස්සය ඉන්‍ද්‍රිය මග්ග අත්‍ථි අවිගතන්ති චත්තාරි.

(20) හෙතාධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්‍ද්‍රිය මග්ග සම්පයුත්ත අත්‍ථි අවිගතන්ති ද්වෙ.

(21) හෙතාධිපති සහජාත නිස්සය ඉන්‍ද්‍රිය මග්ග විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති ද්වෙ.

(සාධිපති ඉන්‍ද්‍රියමග්ග සවිපාක ඝටනා)

(22) හෙතාධිපති සහජාත නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග අත්‍ථි අවිගතන්ති එකං.

(23) හෙතාධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග සම්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං.

(24) හෙතාධිපති සහජාත නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං.

හෙතුමූලකං

---

## මිශ්‍රක සඞ්ඛ්‍යාවාරයේ සත්නය.

### 1. හේතුප්‍රත්‍යය මිශ්‍රකසඞ්ඛ්‍යාවාරය.

ශුද්ධ සඞ්ඛ්‍යාවාරයට අනතුරුව මිශ්‍රකසඞ්ඛ්‍යාවාරය වදාළ සේක. එහි හේතුප්‍රත්‍යය මිශ්‍රක සඞ්ඛ්‍යාවාරාදි වශයෙන් වාර සූවිස්සක් ඇත්තේ ය. එයින් හේතුප්‍රත්‍යය මිශ්‍රකසඞ්ඛ්‍යාවාරය පළමු කොට වදාළ සේක. එද සභාගවාර ඝටනාවාර වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් සභාගවාරය පළමු කොට වදාළ සේක. එහිද හේතුමූලක අධිපතිසභාගය හේතුමූලක සහජාතසභාගය අඤ්ඤමඤ්ඤසභාගය නිස්සයසභාගය විපාකසභාගය ඉන්‍ද්‍රියසභාගය මග්ගසභාගය සම්පයුත්තසභාගය විප්පයුත්තසභාගය

Non-commercial distribution

අත්‍ථිසභාගය අවිගතසභාගය යි වාර එකොළොසක් ඇත්තේ ය. එයින් හේතු මූලක අධිපතිසභාගවාරය පළමු කොට වදළ සේක.

එහි ගරු කොට අරමුණු කරන ලෝභමූලසිත් අට ය මහා කුසල් අට ය මහා ක්‍රියා ඤාණසම්ප්‍රයුක්තසිත් සතර ය ලෝකෝත්තර සිත් අට ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ ඉෂ්ට නිෂ්පන්නරූප අටොළොස ය ද්වේෂමූල මෝහමූල දුඃඛසහගත කායවිඥාන වර්ජිත සිත් සූ අසූවය ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍ය විචිකිත්සා වර්ජිත චෛතසික සත්සාළිස ය නිර්වාණය ය යන ආරම්මණාධිපතිප්‍රත්‍යධර්මයෝ ය, සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන විමංසාධිපතියෙන් අන්‍යවූ අධිපතිධර්ම තුනෙන් එක එකක් වූ සහජාතාධිපතිප්‍රත්‍යය ය යන මොවුහු අධිපතිප්‍රත්‍යය වී හේතුප්‍රත්‍යය නො වන බැවින් හේතු ප්‍රත්‍යය බැහැර කෙරෙති. එබැවින් ඒ ධර්මයෝ පච්චනීයානුලෝමයෙහි "න හෙතුපච්චයා අධිපතියා දස" යි වදාරන ලදහ. වාර දශය අධිපතියෙහි දැක්වුණු පරිදි විස්තර කරනු.

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සහේතුකචිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විමංසාධිපතියෙන් අන්‍ය වූ හේතු ධර්මයෝ සදෙන හේතුප්‍රත්‍යය වී අධිපතිප්‍රත්‍යය නො වන බැවින් අධිපති ප්‍රත්‍යය බැහැර කෙරෙති. (මෙහි ගනු ලබන්නේ අධිපති නො වන අවස්ථාවේ විමංසය ය.) ඒ ධර්මයෝ අනුලෝම පච්චනීයයෙහි "හෙතුපච්චයා න අධිපතියා සත්ත" යි වදාරන ලදහ. විස්තර කරනු.

ගරු කොට අරමුණු නො කරන කාමසිත් සිවුපනස ය විඥානඤ්චායතනසිත් තුන ය නෙවසඤ්ඤානාසඤ්ඤායතනසිත් තුන ය, අභිඥා දෙසිතට ප්‍රත්‍යය වන ගරු නො කරනු ලබන එකුන් අනූ චිත්තය හා නිවනය යන **ආරම්මණ ප්‍රත්‍යය ය**, නාමස්කන්ධයන්ට ද නාමස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ද ප්‍රත්‍යය වන හේතු සය වූ හේතුප්‍රත්‍යයෙන් ද අධිපතිධර්මයන්ගෙන් ද අන්‍ය වූ සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට හා උපාදයරූපයන්ට ප්‍රත්‍යය වන මහාභූත සතර ය. ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන හේතු ධර්මයන් ගෙන් අන්‍ය වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා හෘදයවස්තුවය යන **සහජාත ප්‍රත්‍යය ය**, අභිනන්තච්‍යුතිය සහිත වූ පශ්චිම පශ්චිම නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අභිනන්තච්‍යුති වර්ජිත පූර්ව පූර්ව නාමස්කන්ධයන් වූ අනන්තරූප නිඃශ්‍රය ප්‍රත්‍යය ය, එකුන් අනූචිත්තය ය චෛතසික දෙපනස ය යන නාමස්කන්ධන්ට ප්‍රත්‍යය වන බලවත් වූ එකුන් අනූ චිත්තය ය චෛතසික දෙපනස ය රූප අටවිස්ස ය යන ප්‍රකෘතෝපනිඃශ්‍රයප්‍රත්‍යය ය යන නිඃශ්‍රය ප්‍රත්‍යය ය,

Non-commercial distribution

පඤ්චවෝකාර භූමියෙහි අරූපවිපාකවර්ජිත සප්තවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන ෂට්වස්තූන් වූ **වස්තුපුරේජාතප්‍රත්‍යය ය**, ප්‍රතිසන්ධ්‍යාදි පූර්ව පූර්ව චිත්තයන් හා ඉපද සථිතියට පැමිණි ඒකජ ද්විජ ත්‍රිජ චතුජ කායයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරභූමියෙහි උපදනා අවස්ථාවෙහි වූ අරූපවිපාක වර්ජිත ප්‍රථමභවාඞ්ගාදි පශ්චිම පශ්චිම නාමස්කන්ධයන් වූ **පශ්චාජ්ජාත ප්‍රත්‍යය ය**, විපාකස්කන්ධයන්ට හා කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන **නානාක්ෂණිකකර්මප්‍රත්‍යය ය**, ආධ්‍යාත්මික චතුසමුට්ඨානික රූපයන්ට ප්‍රත්‍යය වන ආධ්‍යාත්මික බාහ්‍ය ඕජාව වූ **ආහාර ප්‍රත්‍යය ය**, කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන රූපජීවිතේන්ද්‍රිය ය වූ **ඉන්ද්‍රියප්‍රත්‍යය ය** යන මේ ප්‍රත්‍යය අට හේතු අධිපති ප්‍රත්‍යය දෙක ම නො වෙති. එ බැවින් ඒ ධර්මයෝ පච්චනීයයෙහි 'න හෙතුපච්චයා න අධිපතියා පන්නරස' යි වදරන ලදහ. (වාර පසළොස පච්චයුද්ධාර පච්චනීයයේ දී දත හැකිය.)

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතිය හේතුප්‍රත්‍යය ද වේ. අධිපති ප්‍රත්‍යයද වේ. එ බැවින් එය මේ අනුලෝමයෙහි නයයට අනුව ද වාරයට අනුවද ත්‍රිකපදයට අනුව ද කර්තෘසම්ප්‍රදනයන්ට අනුව ද **"හෙතුපච්චයා අධිපතියා චත්තාරි"** යි වදළ සේක. 'චත්තාරි' යනු කුසලො කුසලස්ස, කුසලො අබ්‍යාකතස්ස, කුසලො කුසලාබ්‍යාකතස්ස, අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන වාරයෝ ය.

කුසලො කුසලස්ස යන වාරයෙහි කර්තෘපාඨයෙන් සම්ප්‍රයුක්ත-ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අධිපතිප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතර ය සැමකල්හි අධිපති ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුසල් තෙළෙස ය යන මොවුන් කෙරෙහි ඇති විමංසාධිපති ප්‍රත්‍යය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් අධිපති ධර්මයෙන් අන්‍යසම්ප්‍රයුක්තස්කන්ධයෝ ලැබෙත්. එ බැවින් ඒ ධර්මයන් ගේ විපිවිහඞ්ගයන් "කුසලො ධම්මො කුසලස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො, අධිපති පච්චයෙන පච්චයො, කුසලාවීමංසා සම්පයුත්තකානං ඛන්ධානං හෙතුපච්චයෙන පච්චයො අධිපතිපච්චයෙන පච්චයො" යි උදුළ යුතු ය.

කුසලො අබ්‍යාකතස්ස යන වාරයෙහි කර්තෘපාඨයෙන් සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි අධිපති ප්‍රත්‍යය ලැබෙන අවස්ථාවෙහි මහාකුශලඥානසම්පයුක්තසිත් සතරෙහි හා සැමකල්හි අධිපති ප්‍රත්‍යය ලැබෙන මහද්ගත ලෝකෝත්තර කුශලයන්හි

Non-commercial distribution

ද ඇති වීමංසාධිපතිය ලැබේ. සම්ප්‍රදන පාඨයෙන් සාධිපතිචිත්තජ-රූපයෝ ලැබෙත්. එ බැවින් ඒ ධර්‍මයන් ගේ විපීවිභඞ්ගය කුසලො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො අධිපතිපච්ච-යෙන පච්චයො, කුසලා වීමංසා චිත්තසමුට්ඨානානං රූපානං හෙතුපච්චයෙන පච්චයො අධිපතිපච්චයෙන පච්චයො' යි උදුළ යුතු ය.

කුසලො කුසලාබ්‍යාකතස්ස යන වාරයෙහි කර්‍තෘපාඨයෙන් සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර භූමියෙහි -පෙ- වීමංසාධිතිය ලැබේ, සම්ප්‍රදනපාඨයෙන් වීමංසාධිපතියෙන් අන්‍ය කුශලනාමස්කන්ධයන් හා සාධිපතිචිත්තජරූපයෝ ලැබෙත්. "කුසලා වීමංසා සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං හෙතුපච්චයෙන පච්චයො අධිපතිපච්චයෙන පච්චයො" යි උදුළ යුතු ය.

අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන වාරයෙහි කර්‍තෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ද සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන මහාක්‍රියාඥානසම්ප්‍රයුක්ත සිත් සතරෙහි හා මහද්ගතක්‍රියා නවයෙහි ද ඵල සිත්සතරෙහි ද ඇති වීමංසාධිපතිය ලැබේ. සම්ප්‍රදනපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපති චිත්තජ රූපයෝ ලැබෙත්. 'අබ්‍යාකතො -පෙ- විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා වීමංසාධිපති සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානං ච රූපානං හේතුපච්චයෙන පච්චයො අධිපතිපච්චයෙන පච්චයො."

(හේතුමූලක සහජාත සභාගය)

හේතුමූලක සහජාතසභාගයෙහි ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්‍මජරූපයන්ට ද ප්‍රත්‍යය වන හේතු ෂට්කයෙන් අන්‍ය වූ සකලප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට හා උපාදයරූපයන්ට ප්‍රත්‍යය වන මහා භූතයෝය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන හේතුන්ගෙන් අන්‍ය වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධ හෘදයවස්තූහු ය යන සහජාත ප්‍රත්‍ය ධර්‍මයෝ සහජාත ප්‍රත්‍යය වී හේතු ප්‍රත්‍යය නො වන බැවින් හේතුප්‍රත්‍යය බැහැර කෙරෙති. එ බැවින් ඒ ධර්‍මයෝ පච්චනීයානුලෝමයෙහි 'න හෙතුපච්චයා සහජාතෙ නව' යි වදරන ලදහ. වාර නවය සහජාත විභඞ්ගයෙහි මෙන් හේතුන් බැහැර කොට විස්තර කරනු.

හේතුප්‍රත්‍යය වී සහජාත ප්‍රත්‍යය නො වන ධර්‍මයක් නැත්තේ ය. එ බැවින් අනුලෝම පච්චනීයයෙහි "හෙතුපච්චයා න සහජාතෙ" යනාදිය නො වදළ සේක.

Non-commercial distribution

කාමසිත් සිවුපනස ය අභිඥා දෙසිත ය විඤ්ඤාණඤ්චායතන සිත් තුන ය නේවසඤ්ඤානාසඤ්ඤායතන සිත් තුන ය ලෝකෝත්තර සිත් අට ය යන මොවුන්ට ප්‍රත්‍යය වන එකුන් අනූ චිත්තය ය චෛතසික දෙපනස ය රූප අටවිස්ස ය නිවන ය යන ආරම්මණ ප්‍රත්‍යය ය, අනන්තරෝප ප්‍රකෘතෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ය, වස්තුපුරේජාතප්‍රත්‍යය ය පශ්චාජ්ජාත ප්‍රත්‍යය ය, නානාක්ෂණික කර්‍මප්‍රත්‍යය ය, රූපාහාර ප්‍රත්‍යය ය රූපජීවිතේන්ද්‍රියප්‍රත්‍යය ය යන මේ ප්‍රත්‍යයෝ අට දෙන හේතු සහජාත ප්‍රත්‍යය දෙකම නො වෙති. එබැවින් පච්චනීයයෙහි "න හේතුපච්චයා න සහජාතෙ එකාදසා" යි වදළ සේක. (වාර එකොළොස පච්චයුධාරපච්චනීයේදී දත හැකි වන්නේ ය.)

සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක චිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධිකර්‍මජ රූපයන්ට ප්‍රත්‍යය වන හේතු සය හේතු සහජාත ප්‍රත්‍යය දෙක ම වන ධර්‍මයෝ ය. එබැවින් ඒ ධර්‍මයෝ මේ අනුලෝමයෙහි "හෙතුපච්චයා සහජාතෙ සත්ත" යි වදරන ලදහ. වාර සත හේතු විභඞ්ගයෙහි මෙන් විස්තර කරනු.

(හේතුමූලක අඤ්ඤමඤ්ඤ සභාගය.)

හේතුමූලක අඤ්ඤමඤ්ඤ සභාගයෙහි ඔවුනොවුනට ප්‍රත්‍යය වන හේතු සයෙන් අන්‍ය වූ සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන මහාභූත සතර ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන හේතූන් ගෙන් අන්‍ය වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධ හෘදයවස්තූහු ය යන මොවුහු අන්‍යෝන්‍ය ප්‍රත්‍යය වී හේතුප්‍රත්‍යය නොවීමෙන් හේතුප්‍රත්‍යය බැහැර කෙරෙති. එ බැවින් ඒ ධර්‍මයෝ පච්චනීයානුලෝමයෙහි "න හෙතුපච්චයා අඤ්ඤමඤ්ඤෙ තීණි" යි වදරන ලදහ. හේතූන් බැහැර කොට අන්‍යෝන්‍ය විභඞ්ගයෙහි මෙන් විස්තර කරනු.

සහේතුකචිත්තජරූපයෝ ය, හෘදයවස්තුවෙන් අන්‍ය සහේතුක ප්‍රතිසන්ධි කර්‍මජරූපයෝ ය යන මොවුන්ට ප්‍රත්‍යය වන හේතුධර්‍මයෝ හේතුප්‍රත්‍යය වී අන්‍යෝන්‍ය ප්‍රත්‍යය නොවීමෙන් අන්‍යෝන්‍ය ප්‍රත්‍යය බැහැර කෙරෙති. අනුලෝම පච්චනීයයෙහි "හෙතුපච්චයා න අඤ්ඤමඤ්ඤෙ තීණි" යි වදරන ලදහ. "තීණි" යනු කුසලෙන අබ්‍යාකත ය, අකුසලෙන අබ්‍යාකත ය, අබ්‍යාකතෙන අබ්‍යාකතය ය යන මොහු ය. විස්තර කරනු.

සකල ආරම්මණප්‍රත්‍යය ධර්‍මයෝ ය, චිත්තජරූපයන්ට හා හෘදයවස්තුවෙන් අන්‍ය ප්‍රතිසන්ධිකර්‍මජරූපයන්ටද ප්‍රත්‍යය වන හේතුධර්‍මයන්-ගෙන් අන්‍ය වූ සකල පඤ්චවෝකාර ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, උපාදයරූපයන්ට ප්‍රත්‍යය වන මහා භූත සතර ය යන සහජාත ප්‍රත්‍යය

Non-commercial distribution

ය, අනන්තරෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ය, ප්‍රකෘතෝපනිඃශ්‍රයප්‍රත්‍යය ය, වස්තුපුරේජාත ප්‍රත්‍යය ය, පශ්චාජ්ජාතප්‍රත්‍ය ය, නානාක්ෂණික කර්මප්‍රත්‍යයය, රූපාහාර ප්‍රත්‍යය ය රූපජීවිතේන්ද්‍රිය ප්‍රත්‍යය ය යන මේ ප්‍රත්‍යයෝ නවදෙන හේතු අන්‍යෝන්‍ය දෙක ම නොවන්නාහු ය. ඒ ධර්මයෝ පච්චනීයයෙහි "න හෙතුපච්චයා න අඤ්ඤමඤ්ඤෙ එකාදස" යි වදරන ලදහ.

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදය වස්තුවට ප්‍රත්‍යය වන හේතු ධර්මයෝ හේතුප්‍රත්‍යය ද වෙති, අන්‍යෝන්‍යප්‍රත්‍යය ද වෙති. එ බැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමවාරයෙහි "**හෙතුපච්චයා අඤ්ඤමඤ්ඤෙ තීණි**" යි වදරන ලද හ. "තීණි" යනු කුසලො කුසලස්ස, අකුසලො අකුසලස්ස, අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන වාරතුන ය.

අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන වාරයෙහි ප්‍රවෘත්තිකාලයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන විපාකක්‍රියා හේතූන් ගන්නේ ය. ප්‍රතිසන්ධිකාලයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍ය ය වන සහේතුකප්‍රතිසන්ධි සතොළොසෙහි හේතු තුන ගන්නේ ය. සම්ප්‍රදානපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන් හා හෘදයවස්තුව ලැබේ. විපාකාබ්‍යාකතා කිරියාබ්‍යාකතා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං හෙතුපච්චයෙන පච්චයො, අඤ්ඤමඤ්ඤපච්චයෙන පච්චයො, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා හෙතුසම්පයුත්තකානං ඛන්ධානං වත්ථුස්ස ච හෙතුපච්චයෙන පච්චයො, අඤ්ඤමඤ්ඤපච්චයෙන පච්චයො" යි විභඞ්ගය උදුරනු.

(හේතුමූලක නිස්සය සභාගය.)

හේතුමූලක නිස්සය සභාගයෙහි හේතූන්ගෙන් අන්‍ය වූ සහජාතනිඃශ්‍රයප්‍රත්‍යය ධර්මයෝ ය, අරූපවිපාක වර්ජිත සප්තවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන ෂට්වස්තුව වූ පුරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යය ය යන මොහු හේතු ප්‍රත්‍යය බැහැර කෙරෙති. "න හෙතුපච්චයා නිස්සයෙ තෙරස."

හේතුප්‍රත්‍යය වී නිඃශ්‍රයප්‍රත්‍යය නො වන ධර්ම නැති බැවින් අනුලෝමපච්චනීයයෙහි "හෙතුපච්චයා න නිස්සයෙ" යනාදිය නො වදළ සේක.

උපස්තම්භාරම්මණයෙන් අන්‍ය සකල ආරම්මණප්‍රත්‍යය ධර්මයෝ ය, අනන්තරූපනිඃශ්‍රයප්‍රකෘතෝපනිඃශ්‍රයප්‍රත්‍යයෝ ය, පශ්චාජ්ජාත ප්‍රත්‍යය ය, නානාක්ෂණික කර්මප්‍රත්‍යය ය, රූපාහාරප්‍රත්‍යය ය, රූපජීවිතේන්ද්‍රිය ය යන ප්‍රත්‍යය ය සත හේතුප්‍රත්‍යයය ද නොවෙති, නිඃශ්‍රයප්‍රත්‍යය ද නො වෙති. පච්චනීයයෙහි "න හෙතුපච්චයා න නිස්සයෙ එකාදස."

Non-commercial distribution

සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක චිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධි කර්මජ-රූපයන්ට ප්‍රත්‍යය වන හේතූහු හේතුප්‍රත්‍යය ද වෙති, නිඃශ්‍රය ප්‍රත්‍යය ද වෙති. ආනුලෝමයෙහි "**හෙතුපච්චයා නිස්සයෙ සත්ත**" හේතුවිභඞ්ගය අනුව විස්තර කරනු.

(හේතුමූලක විපාක සභාගය)

හේතුමූලක විපාක සභාගයෙහි ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා විපාකචිත්තජ ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන විපාක හේතුන්-ගෙන් අන්‍ය වූ සකල විපාකප්‍රවෘත්ති ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය, හෘදය වස්තුවට ප්‍රත්‍යය වන හේතුන් ගෙන් අන්‍ය වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොවුහු විපාක ප්‍රත්‍යය වී හේතුප්‍රත්‍යය නො වන බැවින් හේතුප්‍රත්‍යය බැහැර කෙරෙති. පච්චනීයානුලෝමයෙහි "න හෙතුපච්චයා විපාකෙ එකං"

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සහේතුක චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන කුශලා කුශල ක්‍රියා හේතූහු සදෙන හේතුප්‍රත්‍යය වී විපාකප්‍රත්‍යය නො වන බැවින් විපාකප්‍රත්‍යය බැහැර කෙරෙති. අනුලෝමපච්චනීයයෙහි 'හෙතුපච්චයා න විපාකෙ සත්ත"

සකලආරම්මණ ප්‍රත්‍යය ය, ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රත්‍යය වන හේතුධර්මයන් ගෙන් අන්‍ය වූ කුශලා කුශල ක්‍රියා නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට හා උපාදය රූපයන්ට ප්‍රත්‍යය වන මහාභූත සතර ය, පඤ්චවෝකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන හෘදයවස්තුව ය යන සහජාතප්‍රත්‍යය ය අනන්තරෝපනිඃශ්‍රය ප්‍රත්‍යයය, ප්‍රකෘතෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ය, වස්තුපුරේජාත ප්‍රත්‍යය ය පශ්චාජ්ජාත ප්‍රත්‍යය ය, නානාක්ෂණිකකර්ම ප්‍රත්‍යයය, රූපාහාර ප්‍රත්‍යය ය, රූපජීවිතේන්ද්‍රියප්‍රත්‍යය ය යන ප්‍රත්‍යය ය අට හේතුප්‍රත්‍යය ද නො වෙති. විපාකප්‍රත්‍යය ද නො වෙති. පච්චනීයයෙහි "න හෙතුපච්චයා න විපාකෙ පන්නරස"

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සහේතුකචිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යයවන විපාකහේතූහු තිදෙන හේතුප්‍රත්‍යය ද වෙති. විපාකප්‍රත්‍යය ද වෙති. "**හෙතුපච්චයා විපාකෙ එකං**"

අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන්නෙහි ප්‍රවෘත්ති කාලයෙහි කර්තෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක චිත්තජරූපයන්ට ප්‍රත්‍යයවන සහේතුක විපාක එක්විස්සෙහි ඇති හේතු තුන වූ ප්‍රත්‍යය ධර්මය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක චිත්තජරූපයෝ ලැබෙත්, ප්‍රතිසන්ධිකාලයෙහි කර්තෘපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා

Non-commercial distribution

කෘතත්වාත් රූපයන්ට ප්‍රත්‍යය වන සහේතුක ප්‍රතිසන්ධි සතොලොසෙහි හේතු තුන ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්ධයන් හා කෘතත්වාත් රූප වූ ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. "අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස හෙතුපච්චයෙන පච්චයො, විපාකපච්චයෙන පච්චයො, විපාකාබ්‍යාකතා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං චිත්තසමුට්ඨානානඤ්ච රූපානං හෙතු පච්චයෙන පච්චයො, විපාකපච්චයෙන පච්චයො, පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා හෙතු සම්පයුත්තකානං ඛන්ධානං කටත්තා ච රූපානං හෙතුපච්චයෙන පච්චයො, විපාකපච්චයෙන පච්චයො" යි විභඞ්ගය උදුල යුතු ය.

(හේතුමූලක ඉන්ද්‍රිය සභාගය)

හේතුමූලක ඉන්ද්‍රිය සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන ප්‍රඥාවෙන් අන්‍ය වූ නාමේන්ද්‍රිය ධර්ම සත වූ සහජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ය, පඤ්චවිඥානධාතුන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තු සඞ්ඛ්‍යාත පුරේජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ය කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන රූපජීවිතේන්ද්‍රිය සඞ්ඛ්‍යාත රූපජීවිතේන්ද්‍රිය ප්‍රත්‍යය යන මොවුහු ඉන්ද්‍රිය ප්‍රත්‍යය වී හේතුප්‍රත්‍යය නො වන බැවින් හේතුප්‍රත්‍යය බැහැර කෙරෙති. පච්චනීයානුලෝමයෙහි "න හෙතු පච්චයා ඉන්ද්‍රියෙ සත්ත"

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සහේතුක චිත්තජ සහේතුකප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන අමෝහයෙන් අන්‍ය හේතුහු හේතු ප්‍රත්‍යය වී ඉන්ද්‍රිය ප්‍රත්‍යය නොවීමෙන් ඉන්ද්‍රිය ප්‍රත්‍යය බැහැර කෙරෙති. අනුලෝම පච්චනීයයෙහි "හෙතුපච්චයා න ඉන්ද්‍රියෙ සත්ත, "

සකලාරම්මණප්‍රත්‍යය ය, ඔවුනොවුන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන හේතු සයෙන් හා නාමේන්ද්‍රිය අටෙන් අන්‍ය වූ සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට හා උපාදය රූපයන්ට ප්‍රත්‍යය වන මහාභූතයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරප්‍රතිසන්ධිනාමස්කන්ධ හෘදයවස්තුහු ය යන සහජාත ප්‍රත්‍යය ය, අනන්තරෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ය, ප්‍රකෘතෝපනිඃශ්‍රයප්‍රත්‍යය ය, වස්තුපුරේජාත ප්‍රත්‍යය ය. පශ්චාජ්ජාතප්‍රත්‍යය ය, නානාක්ෂණික කර්මප්‍රත්‍යය ය. රූපාහාර ප්‍රත්‍යය යන මේ ප්‍රත්‍යයෝ සත්දෙන හේතුප්‍රත්‍යය ද නොවෙති. ඉන්ද්‍රිය ප්‍රත්‍යය ද නො වෙති. පච්චනීයයෙහි "න හෙතුපච්චයා න ඉන්ද්‍රියෙ සත්තරස"

සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුකචිත්තජරූප සහේතුකප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන අමෝහය හේතුප්‍රත්‍යය ද වේ. ඉන්ද්‍රිය ප්‍රත්‍යය ද වේ. එබැවින් මේ අනුලෝමයෙහි "**හේතුපච්චයා ඉන්ද්‍රියෙ චත්තාරි**" යි වදළ සේක. චත්තාරි යනු කුසලො කුසලස්ස, කුසලො අබ්‍යාකතස්ස, කුසලො

Non-commercial distribution

කුසලාබ්‍යාකතස්ස අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන වාර සතරය. කුසලො කුසලස්ස යන වාරයෙහි කත්‍රෘපාඨයෙන් සම්ප්‍රයුක්ත ස්කන්‍ධයන්ට ප්‍රත්‍යය වන මහාකුශල ඥානසම්ප්‍රයුක්ත සිත් සතරෙහි හා මහද්ගතලෝකෝත්තර කුශලයන්හි ද ඇති අමෝහය ලැබේ, සම්ප්‍රදාන පාඨයෙන් සම්ප්‍රයුක්තස්කන්‍ධයෝ ලැබෙත්. "කුසලො -පෙ- කුසලා හෙතු සම්පයුත්තකානං ඛන්‍ධානං හෙතුපච්චයෙන පච්චයො" යි උදුළ යුතු ය, ඉතිරි වාර තුන ද මෙය අනුව විස්තර කරනු,

(හේතුමූලක මග්ග සභාගය)

හේතුමූලක මග්ගසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්‍ධ චිත්තජරූපප්‍රතිසන්‍ධි කර්‍මජරූපයන්ට ප්‍රත්‍යය වන අමෝහයෙන් අන්‍ය වූ මාර්‍ගාඞ්ගයෝ සත් දෙන මාර්‍ගප්‍රත්‍යය වී හේතුප්‍රත්‍යය නො වීමෙන් හේතුප්‍රත්‍යය බැහැර කෙරෙති. පච්චනීයානුලෝමයෙහි "න හේතු පච්චයා මග්ගෙ සත්ත"

සම්ප්‍රයුක්තස්කන්‍ධ සහේතුකචිත්තජ රූප සහේතුක ප්‍රතිසන්‍ධිකර්‍මජ රූපයන්ට ප්‍රත්‍යය වන අමෝහයෙන් අන්‍ය වූ හේතුධර්‍ම පස හේතුප්‍රත්‍යය වී මාර්‍ග ප්‍රත්‍යය නො වීමෙන් මාර්‍ග ප්‍රත්‍යය බැහැර කෙරෙති, අනුලෝම පච්චනීයයෙහි "හේතුපච්චයා න මග්ගෙ සත්ත"

සකලාරම්මණප්‍රත්‍යය ය, ඔවුනොවුන්ට හා චිත්තජ ප්‍රතිසන්‍ධි කර්‍මජරූපයන්ට ද ප්‍රත්‍යය වන හේතු සයෙන් හා මාර්‍ගාඞ්ග අටෙන් අන්‍ය වූ සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්‍ධි නාමස්කන්‍ධයෝ ය, ඔවුනොවුන්ට හා උපාදය රූපයන්ට ප්‍රත්‍යය වන මහාභූත සතර ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන ප්‍රතිසන්‍ධි හේතු තුනෙන් හා මාර්‍ගාඞ්ග අටෙන් අන්‍යවූ පඤ්චවෝකාර ප්‍රතිසන්‍ධි නාමස්කන්‍ධ හා හෘදය වස්තුවය යන සහජාත ප්‍රත්‍යය ය, අනන්තරෝප නිඃශ්‍රයප්‍රත්‍යය, ප්‍රකෘතෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ය, වස්තු පූර්‍වජාත ප්‍රත්‍යය ය, පශ්චාජ්ජාත ප්‍රත්‍යය ය, නානාක්ෂණික කර්‍මප්‍රත්‍යය ය, රූපාහාර ප්‍රත්‍යය ය, රූප ජීවිතේන්‍ද්‍රිය ප්‍රත්‍යයය යන මේ ධර්‍මයෝ හේතු ප්‍රත්‍යය ද නො වෙති. මාර්‍ගප්‍රත්‍යය ද නො වෙති, පච්චනීයයෙහි න හේතුපච්චයා න මග්ගෙ පන්නරස"

සම්ප්‍රයුක්තස්කන්‍ධ සහේතුක චිත්තජරූප සහේතුක ප්‍රතිසන්‍ධි කර්‍මජ රූපයන්ට ප්‍රත්‍යය වන අමෝහය හේතුප්‍රත්‍යය ද මාර්‍ග ප්‍රත්‍යය ද වේ, **"හේතුපච්චයා මග්ගෙ චත්තාරි"** විස්තර කරනු.

(හේතුමූලක සම්පයුත්ත සභාගය.)

හේතුමූලක සම්ප්‍රයුක්තසභාගයෙහි ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන හේතුෂට්කයෙන් අන්‍ය සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්‍ධි නාමස්කන්‍ධයෝ හේතුප්‍රත්‍යය බැහැර කෙරෙති. "න හෙතුපච්චයා සම්පයුත්තෙ තීණි"

Non-commercial distribution

සහේතුකචිත්තජ සහේතුකප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන හේතූහු සදෙන හේතුප්‍රත්‍යය වී සම්ප්‍රයුක්තප්‍රත්‍යය නොවීමෙන් සම්ප්‍රයුක්තප්‍රත්‍යය බැහැර කෙරෙති. "හෙතුපච්චයා න සම්පයුත්තෙ තීණි"

සකලාරම්මණප්‍රත්‍යය ය, චිත්තජප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන හේතු සයෙන් අන්‍ය වූ පඤ්චවෝකාරප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට හා උපාදයරූපයන්ට ප්‍රත්‍යය වන මහාභූත සතර ය ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි හේතු තුනෙන් අන්‍ය වූ ප්‍රතිසන්ධිනාමස්කන්ධ හෘදයවස්තූහු ය යන සහජාතප්‍රත්‍යය ය, අනන්තරෝපනිඃශ්‍රය ය, ප්‍රකෘතෝප-නිඃශ්‍රයප්‍රත්‍යය ය, වස්තුපුරේජාත ප්‍රත්‍යය ය, පශ්චාජ්ජාත ප්‍රත්‍යය ය, නානාක්ෂණික කර්මප්‍රත්‍යය ය, රූපාහාරප්‍රත්‍යය ය, රූපජීවිතේන්ද්‍රිය ප්‍රත්‍යයය යන මේ ප්‍රත්‍යය ධර්මයෝ අට දෙන හේතු ප්‍රත්‍යය ද නො වෙති. සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ද නො වෙති. "න හෙතුපච්චයා න සම්පයුත්තෙ එකාදස"

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන හේතූහු සදෙන හේතු ප්‍රත්‍යය ද වෙති. සම්ප්‍රයුක්තප්‍රත්‍යය ද වෙති. "හෙතුපච්චයා සම්පයුත්තෙ තීණි" තීණි යනු කුසලො කුසලස්ස, අකුසලො අකුසලස්ස, අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන තුන ය. විස්තර කරනු.

(හේතුමූලක විප්පයුත්ත සභාග ය)

හේතුමූලක විප්පයුත්තසභාගයෙහි චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ-රූපයන්ට ප්‍රත්‍යය වන හේතු ෂට්කයෙන් අන්‍ය වූ පඤ්චවෝකාර ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි හේතු තුනෙන් අන්‍ය වූ පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධ හෘදයවස්තූහුය යන සහජාතවිප්‍රයුක්තප්‍රත්‍යය ය, අරූප විපාක වර්ජිත සප්තවිඥානධාතුන්ට ප්‍රත්‍යය වන ෂට්වස්තු සඞ්ඛ්‍යාත පුරේජාත විප්‍රයුක්තප්‍රත්‍යය ය පශ්චාජ්ජාත ප්‍රත්‍යය ය යන මේ ධර්මයෝ හේතුප්‍රත්‍යය බැහැර කෙරෙති. "න හෙතු පච්චයා විප්පයුත්තෙ පඤ්ච"

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන හේතුධර්මයන් ගෙන් අන්‍ය -පෙ- "හෙතුපච්චයා න විප්පයුත්තෙ තීණි"

වස්තවාරම්මණ ප්‍රත්‍යයෙන් අන්‍ය වූ සකලාරම්මණප්‍රත්‍යය ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන හේතුෂට්කයෙන් අන්‍ය වූ සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට හා උපාදයරූපයන්ට ප්‍රත්‍යය වන මහාභූතසතර ය යන සහජාතප්‍රත්‍යය ය, අනන්තරෝපනිඃශ්‍රයප්‍රත්‍යය ය, ප්‍රකෘතෝපනිඃශ්‍රය ප්‍රත්‍ය ය, නානාක්ෂණිකකර්ම ප්‍රත්‍යය ය, රූපාහාරප්‍රත්‍යය ය, රූපජීවිතේන්ද්‍රිය ප්‍රත්‍යය යන ප්‍රත්‍යය ධර්මයෝ සදෙන හේතුප්‍රත්‍යය ද

Non-commercial distribution

විප්‍රයුක්තප්‍රත්‍යය ද නො වෙති. පච්චනීයයෙහි "න හෙතුපච්චයා නවිප්පයුත්තෙ නව"

සහේතුකචිත්තජ සහේතුකප්‍රතිසන්‍ධිකර්‍මජ රූපයන්ට ප්‍රත්‍යය වන හේතූහු සදෙන හේතුප්‍රත්‍යය ද වෙති. විප්‍රයුක්තප්‍රත්‍යය ද වෙති. "**හෙතුපච්චයා විප්පයුත්තෙ තීණි**" තීණි යනු කුසලො අබ්‍යාකතස්ස අකුසලො අබ්‍යාකතස්ස, අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන වාරයෝ ය. විස්තර කරනු.

(හේතුමූලක අත්‍ථි සභාගය)

හේතුමූලක අත්‍ථිසභාගයෙහි හේතුෂට්කයෙන් අන්‍ය වූ සහජාතාස්ති ප්‍රත්‍ය ය, පූර්‍වජාතාස්තිප්‍රත්‍යය ය, පශ්චාජ්ජාතාස්ති ප්‍රත්‍යය ය, ආහාරාස්ති-ප්‍රත්‍යය ය, ඉන්‍ද්‍රියාස්තිප්‍රත්‍යය ය යන මොවුහු හේතුප්‍රත්‍යය බැහැර කෙරෙති. "න හෙතුපච්චයා අත්‍ථියා තෙරස" අස්තිප්‍රත්‍යය බැහැර කරන ධර්‍ම නැත්තේ ය.

ආරම්මණපූර්‍වජාතයෙන් අන්‍ය වූ සකලාරම්මණප්‍රත්‍යය ය, අනන්‍ත-රෝපනිඃශ්‍රයප්‍රත්‍යය ය, ප්‍රකෘතෝපනිඃශ්‍රයප්‍රත්‍යය ය නානාක්‍ෂණික කර්‍මප්‍රත්‍යය ය යන මේ ප්‍රත්‍යයධර්‍මයෝ තිදෙන හේතුප්‍රත්‍යය ද නො වෙති. අස්තිප්‍රත්‍යය ද නො වෙති. පච්චනීයයෙහි "න හෙතුපච්චයා න අත්‍ථියා නව"

සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට හා සහේතුකචිත්තජ සහේතුක ප්‍රතිසන්‍ධි කර්‍මජරූපයන්ට ප්‍රත්‍යය වන හේතුෂට්කය "**හෙතුපච්චයා අත්‍ථියා සත්ත**" අවිගතසභාගය අත්‍ථිසභාගය මෙනි.

## ඝටනාවාරය.

සභාගවාරයට අනතුරු ව ඝටනාවාරය වදාළ සේක. එහි සාමඤ්ඤඝටනා ය, සඉන්‍ද්‍රියමග්ගඝටනා ය, සාධිපතිඉන්‍ද්‍රියමග්ග ඝටනා ය යි වාර තුනකි. එයින් සාමඤ්ඤ ඝටනා වාරය පළමු කොට වදාළ සේක. එද අවිපාකඝටනා සවිපාකඝටනා වසයෙන් දෙවැදෑරුම් වේ. එයින් අවිපාකඝටනාවාරය පළමු කොට වදාළ සේක. එ ද සබ්බට්ඨානිකඝටනා, සඅඤ්ඤමඤ්ඤඝටනා අඤ්ඤමඤ්ඤ සම්පයුත්තඝටනා, සවිප්පයුත්තඝටනා වශයෙන් සිවුවැදෑරුම් වේ.

### අවිපාක සාමඤ්ඤඝටනා සතර.

(1 සබ්බට්ඨානික ඝටනාව.)

එයින් සබ්බට්ඨානිකඝටනාව මෙසේ ය. සම්ප්‍රයුක්තස්කන්‍ධ සහේතුකචිත්තජරූප සහේතුක ප්‍රතිසන්‍ධිකර්‍මජරූපයන්ට ප්‍රත්‍යය වන

Non-commercial distribution

හේතුධර්මයෝ සදෙන හේතු සහජාත නිස්සය අත්ථි අවිගත යන ප්‍රත්‍යයෝ පස් දෙන වන්නාහ. එ බැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමයෙහි "**හේතු සහජාත නිස්සය අත්ථි අවිගත සත්ත**" යි වදරන ලදහ. හේතු සහජාත නිස්සය අත්ථි අවිගත යන මේ ප්‍රත්‍යයන් ගැටුණු කල්හි (එක් වූ කල්හි) හේතුප්‍රත්‍යය-යෙහි දැක්වූ විභඩග සත ලැබෙත් ය යනු එහි තේරුම ය. විභඩග සත හේතු ප්‍රත්‍යය අනුව විස්තර කරනු.

(2. සඅඤ්ඤමඤ්ඤ සටනාව)

සඅඤ්ඤමඤ්ඤසටනාව මෙ සේ ය. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන හේතූහු සදෙන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගත යන ප්‍රත්‍යයෝ සදෙන වෙති. එ බැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමයෙහි "**හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගතන්ති තීණි**" වදරන ලදහ. වාරතුන අඤ්ඤමඤ්ඤසභාගයෙහි මෙනි.

(3. සඅඤ්ඤමඤ්ඤසම්පයුත්ත සටනාව)

සඅඤ්ඤමඤ්ඤසම්පයුත්තසටනාව මෙ සේ ය: සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන හේතූහු සදෙන හේතු සහජාත අඤ්ඤමඤ්ඤ නිසසය සම්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍යයයෝ සත් දෙන වෙති. එ බැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමයෙහි "**හේතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි**" යි වදරන ලදහ. සම්පයුත්ත සභාගය අනුව විස්තර කරනු.

(4. සවිප්පයුත්ත සටනාව)

සවිප්පයුත්තසටනාව මෙ සේ ය. සහේතුකචිත්තජ සහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන හේතූහු සදෙන හේතු සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍ය සය වෙති. එ බැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමයෙහි '**හෙතු සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි**" යි වදරන ලදහ. විප්පයුත්තසභාගය අනුව විස්තර කරනු.

**සවිපාක සටනා පස.**

සබ්බට්ඨානික සටනාව ය, සඅඤ්ඤමඤ්ඤ සටනාව ය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත සටනාවය, සවිප්පයුත්ත සටනාව ය, සඅඤ්ඤමඤ්ඤ විපයුත්ත සටනාව ය යි සවිපාක සටනා පසෙකි.

(1. සබ්බට්ඨානික සටනාව)

එයින් සබ්බට්ඨානිකසටනා ව මෙසේ ය. සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක චිත්තජරූපයෝ සහේතුකප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකහේතූහු

Non-commercial distribution

තිදෙන හේතු සහජාත නිස්සය විපාක අත්ථි අවිගත යන ප්‍රත්‍යය සය වෙති. එ බැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමයෙහි '**හෙතු සහජාත නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං**' යි වදාරන ලදහ. විපාකසභාගය මෙති.

(2. සඅඤ්ඤමඤ්ඤ ඝටනාව)

සඅඤ්ඤමඤ්ඤ ඝටනාව මෙසේ ය. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හෘදය වස්තුන්ට ප්‍රත්‍යය වන විපාක හේතු තුන හේතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගත යන ප්‍රත්‍යය සත වේ. ඒවා මේ අනුලෝමයෙහි "**හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගතන්ති එකං**" යි වදාරන ලදී. එකං යනු අබ්‍යාකතෙන අබ්‍යාකතය ය.

(3. සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව)

සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන විපාක හේතු තුන හේතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍යය අට වේ. ඒවා '**හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක' සම්පයුත්ත අත්ථිඅවිගතන්ති**' යි වදාරන ලදී.

(4. සවිප්පයුත්ත ඝටනාව)

සහේතුකචිත්තජ සහේතුකප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාක හේතූහූ තිදෙන හේතු සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගත යන ප්‍රත්‍යය සත වෙති. එ බැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමයෙහි '**හෙතු සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං**' යි වදාරන ලදහ.

(5. සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත ඝටනාව)

සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත ඝටනාව මෙ සේ ය: හෘදයවස්තුවට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධිහේතූහූ තිදෙන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගත යන මේ ප්‍රත්‍යය අට වේ. එ බැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමයෙහි '**හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං**" යි. "පටිසන්ධික්ඛණෙ විපාකාබ්‍යාකතා හේතු වත්ථුස්ස -පෙ- අවිගත පච්චයෙන පච්චයො" විභඞ්ගය උදුරනු. සාමාන්‍යඝටනා නවය නිමි.

**ස ඉන්ද්‍රිය මග්ග ඝටනා**

සාමඤ්ඤඝටනාවන්ට අනතුරු ව සඉන්ද්‍රිය මග්ග ඝටනා වාරය වදාළ සේක. ඒ ද අවිපාකඝටනා සවිපාකඝටනා වසයෙන් දෙවැදෑරුම් වේ.

Non-commercial distribution

එයින් අවිපාකඝටනා වාරය පලමුකොට වදාළ සේක. එහි ද සබ්බට්ඨානික ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාවය, ස විප්පයුත්ත ඝටනාවය යි ඝටනා සතරෙකි.

**අවිපාක ඝනටා සතර.**

(1. සබ්බට්ඨානික ඝටනාව)

එයින් සබ්බට්ඨානිකඝටනාව මෙසේ ය. සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක-චිත්තජ රූප සහේතුකප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන අමෝහය හේතු සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගත යන ප්‍රත්‍යය සත වේ. එ බැවින් එය මේ අනුලෝමයෙහි "**හෙතු සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති චත්තාරි**" යි වදරන ලදී. ඉන්ද්‍රියසභාගයෙහි මෙන් විස්තර කරනු.

(2. සඅඤ්ඤමඤ්ඤ ඝටනාව)

ස අඤ්ඤමඤ්ඤ ඝටනාව මෙසේ ය. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන අමෝහය හේතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගත යන මේ ප්‍රත්‍යය අට වේ. එය මේ අනුලෝමයෙහි "**හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති ද්වෙ**" යි වදරන ලදී. කුසලො කුසලස්ස, අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන දෙවාරය ය.

(3. සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව)

සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව මෙසේ ය: සම්පයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අමෝහය -පෙ- "**හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය මග්ග සම්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ.**"

(4. සවිප්පයුත්ත ඝටනාව)

සවිප්පයුත්ත ඝටනාව මෙසේ ය. සහේතුකචිත්තජ සහේතුක ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන අමෝහය -පෙ- "**හෙතු සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ**" කුසලො අබ්‍යාකතස්ස, අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන දෙක ය.

**සවිපාක ඝටනා පස**

අවිපාක ඝටනාවන්ට අනතුරු ව සවිපාකඝටනා වදාළ සේක. සබ්බට්ඨානිකඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ

Non-commercial distribution

සම්ප්‍රයුක්ත ඝටනාව ය, සවිප්පයුත්තඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත ඝටනාවය යි සවිපාක ඝටනා පසෙකි.

(1. සබ්බට්ඨානික ඝටනාව)

එහි සබ්බට්ඨානිකඝටනාව මෙ සේ ය. සම්ප්‍රයුක්තස්කන්‍ධ සහේතුක චිත්තජරූප සහේතුකප්‍රතිසන්‍ධිකර්‍මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක අමෝහය -පෙ- **හෙතු සහජාත නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග අත්‍ථි අවිගතන්ති එකං"** අබ්‍යාකතෙන අබ්‍යාකතය ය.

(2. ස අඤ්ඤමඤ්ඤ ඝටනාව)

ස අඤ්ඤමඤ්ඤ ඝටනාව මෙ සේ ය. සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට හා හෘදය වස්තුවට ප්‍රත්‍යය වන විපාකචිත්තයන්හි අමෝහය -පෙ- **"හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග අත්‍ථි අවිගතන්ති එකං"**

(3. සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව)

සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව මෙ සේ ය. සම්පයුත්ත ස්කන්‍ධයන්ට ප්‍රත්‍යය වන විපාක චිත්තයන්හි අමෝහය -පෙ- **"හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං"**

(4. සවිප්පයුත්ත ඝටනා)

සවිප්පයුත්තඝටනාව මෙ සේ ය. සහේතුකචිත්තජරූප සහේතුක ප්‍රතිසන්‍ධිකර්‍මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකාමෝහය -පෙ- **'හෙතු සහජාත නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග විප්පයුත්ත අත්‍ථි අවිගත නත්‍ථි එකං"**

(5. සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත ඝටනාව)

සඅඤ්ඤමඤ්ඤ විප්පයුක්ත ඝටනාව මෙ සේ ය. හෘදයවස්තුවට ප්‍රත්‍යය වන ප්‍රතිසන්‍ධි චිත්තසම්ප්‍රයුක්ත අමෝහය -පෙ- **'හෙතු සහජාත නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං'** අබ්‍යාකතො අබ්‍යාකතස්ස වාරය ය. කථෘපාඨයෙන් හෘදයවස්තුවට ප්‍රත්‍යය වන ත්‍රිහේතුක පඤ්චවෝකාර ප්‍රතිසන්‍ධි නවයෙහි අමෝහය ලැබේ. සම්ප්‍රදන-පාඨයෙන් හෘදය වස්තුව ලැබේ. විභඞ්ගය පටිසන්‍ධික්ඛණෙ විපාකාබ්‍යාකතා හේතු වත්‍ථුස්ස හෙතුපච්චයෙන පච්චයො, -පෙ- අවිගත පච්චයෙන පච්චයො" යනු යි.

**සාධිපති ඉන්‍ද්‍රිය මග්ග ඝටනා**

සඉන්‍ද්‍රියමග්ගඝටනාවන්ට අනතුරු ව සාධිපතිඉන්‍ද්‍රිය මග්ග ඝටනා වාරය වදළ සේක. ඒ ද අවිපාකඝටනා සවිපාකඝටනා වශයෙන්

Non-commercial distribution

දෙවැදෑරුම් වේ. එයින් අවිපාක ඝටනා වාරය පළමු කොට වදළ සේක. එහි ද සබ්බට්ඨානිකඝටනාව ය සඤ්ඤමඤ්ඤඝටනාව ය සවිප්පයුත්තඝටනාවය යි ඝටනා තුනෙකි.

අවිපාක ඝටනා තුන

(1. සබ්බට්ඨානික ඝටනාව)

එහි සබ්බට්ඨානික ඝටනාව මෙ සේ ය. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතිය -පෙ- "**හෙතු අධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති චත්තාරි**"

(2. සඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව)

සඤ්ඤමඤ්ඤ සම්පයුත්තඝටනාව මෙසේ ය. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන විමංශාධිපතිය -පෙ- '**හෙතු අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය මග්ග සම්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ.**

(3. සවිප්පයුත්ත ඝටනාව.)

සවිප්පයුත්තඝටනාව මෙ සේ ය. සාධිපතිචිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතිය -පෙ- '**හෙතු අධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ**'

**සවිපාකඝටනා තුන.**

අවිපාක ඝටනාවන්ට අනතුරු ව සවිපාක ඝටනා වදළ සේක. සබ්බට්ඨානික ඝටනාව ය: සඤ්ඤමඤ්ඤ සම්පයුත්තඝටනාව ය, සවිප්පයුත්ත ඝටනාවය යි සවිපාක ඝටනා තුනෙකි.

(1. සබ්බට්ඨානික ඝටනාව)

එහි සබ්බට්ඨානික ඝටනාව මෙ සේ ය. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ඵලසතරෙහි වීමංසාධිපතිය -පෙ- '**හෙතු අධිපති සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති එකං**'

(2. සඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව,)

සඤ්ඤමඤ්ඤසම්පයුත්ත ඝටනාව මෙ සේ ය. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ඵලසිත් සතරෙහි වීමංසාධිපතිය -පෙ- '**හෙතු අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං**'

Non-commercial distribution

(3. සම්පයුත්ත ඝටනාව.)

සම්පයුත්ත ඝටනාව මෙ සේ ය. සාධිපතිචිත්තරූපයන්ට ප්‍රත්‍යය වන එලසිත් සතරෙහි වීමංසාධිපතිය -පෙ- '**හෙතු අධිපති සහජාත නිස්සය විපාකඉන්ද්‍රිය මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං**' යනු වදළ සේක. විපාකාබ්‍යාකතා වීමංසා චිත්තසමුට්ඨානානං රූපානං හෙතුපච්චයෙන පච්චයො, -පෙ- අවිගතපච්චයෙන පච්චයො" යි විභඞ්ගය උදුරනු.

හේතුසභාග දසය හා ඝටනා සුවිස්ස නිමි.

## 2. ආරම්මණ මිශ්‍රකවාර පාලිය

ආරම්මණපච්චයා අධිපතියා සත්ත, නිස්සයෙ තීණි, උපනිස්සයෙ සත්ත, පුරෙජාතෙ තීණි, විප්පයුත්තෙ තීණි, අත්ථියා තීණි, අවිගතෙ තීණි.

ආරම්මණාධිපති උපනිස්සයන්ති සත්ත, ආරම්මණ පුරෙජාත අත්ථි අවිගතන්ති තීණි, ආරම්මණ නිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, ආරම්මණාධිපති උපනිස්සය පුරෙජාත අත්ථි අවිගතන්ති එකං.

### සන්නය.

හේතුමිශ්‍රක වාරයට අනතුරු ව ආරම්මණ මිශ්‍රක වාරය වදළ සේක. එ ද සභාග ඝටනා වසයෙන් දෙවැදෑරුම් වේ. එයින් සභාග වාරය පළමු කොට වදළ සේක. එ ද ආරම්මණ මූලක අධිපතිසභාගය, නිස්සය සභාගය, උපනිස්සයසභාගය, පුරේජාතසභාගය, විප්පයුත්තසභාගය, අත්ථිසභාගය, අවිගතසභාගය යි සත්වැදෑරුම් වේ. එයින් හේතුමූලක අධිපතිසභාගය පළමු කොට වදළ සේක.

(1) ඒ හේතුමූලක අධිපතිසභාගයෙහි ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටය මහාකුසල් අට ය මහාක්‍රියාඥානසම්ප්‍රයුක්ත සිත් සතර ය ලෝකෝත්තර සිත් අට ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ඉෂ්ටනිෂ්පන්නරූප අටළොස ය ද්වේෂමූල මෝහමූල දුඃඛසහගතකාය විඥාන වර්ජිත සිත් සූ අසූව ය, ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍යය විචිකිත්සා වර්ජිත චෛතසික සත් සාලිස ය නිර්වාණය ය යන මේ ධර්මයෝ ආරම්මණ ප්‍රත්‍යය ද අධිපති ප්‍රත්‍යය ද වන ධර්මයෝ ය. එබැවින් ඒ ධර්මයෝ මේ අනුලෝමයෙහි "**ආරම්මණපච්චයා අධිපතියා සත්ත**" යි වදරන ලදහ. සත්ත යනු කුසලො කුසලස්ස යනාදිය ය. ආරම්මණාධිපතිවිභඞ්ගය අනුව විභඞ්ගය උදුරනු.

Non-commercial distribution

(2) නිස්සයසභාගයෙහි මනොද්වාරාවජ්ජනය ය, මරණාසන්න ජවනයෝ ය, තදරම්මණ එකොළොස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපන් වස්තවාරම්මණ ප්‍රත්‍යය ධර්‍මයෝ ආරම්මණප්‍රත්‍යය ද නිඃශ්‍රයප්‍රත්‍යය ද වෙති. "**ආරම්මණ පච්චයා නිස්සයෙ තීණි**" තීණි යනු අබ්‍යාකතො අබ්‍යාකතස්ස, අබ්‍යාකතො කුසලස්ස, අබ්‍යාකතො අකුසලස්ස යන මොහු ය. අබ්‍යාකතො අබ්‍යාකතස්ස යන වාරයෙහි කර්‍මපාඨයෙන් මනෝද්වාරාවර්ජනය ය, ක්‍රියාමරණාසන්නජවන පසය, තදරම්මණ එකොළොස ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් වස්තවාරම්මණ ප්‍රත්‍යය ලැබේ. සම්ප්‍රදානපාඨයෙන් මනෝද්වාරාවර්ජනය ය ක්‍රියා මරණාසන්නජවන පස ය තදරම්මණ එකොළොස ය යන ප්‍රත්‍යයෝත්පන්නයෝ ලැබෙත්. එ බැවින් ඒ ධර්‍මයන් ගේ වීථි විභඞ්ගය "අබ්‍යාකතො ධම්මො අබ්‍යාකතස්ස ධම්මස්ස ආරම්මණ පච්චයෙන පච්චයො, නිස්සයපච්චයෙන පච්චයො, චතුන්නං විපාකාබ්‍යාකතානං ඛන්ධානං කිරියාබ්‍යාකතානං ඛන්ධානං ආරම්මණ-පච්චයෙන පච්චයො, නිස්සයපච්චයෙන පච්චයො" යි උදුළ යුතුය. අබ්‍යාකතො කුසලස්ස යන වාරයෙහි මරණාසන්නකුශලජවන පසට ප්‍රත්‍යය වන හෘදයවස්තුව ද, අබ්‍යාකතො අකුසලස්ස යන වාරයෙහි මරණාසන්න අකුසලජවනයන්ට ප්‍රත්‍යය වන හෘදයවස්තුව ද ලැබේ.

(3) උපනිස්සයසභාගය අධිපතිසභාගය මෙනි.

(4) පුරේජාතසභාගයෙහි කාමසිත් සිවුපනසට හා අභිඥාදෙසිතට ප්‍රත්‍යය වන වර්‍තමාන නිෂ්පන්නරූප අටොළොස වූ ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ධර්‍මයෝ ආරම්මණ ප්‍රත්‍යය ද වෙති, පුරේජාත ප්‍රත්‍යය ද වෙති. --පෙ- "**ආරම්මණපච්චයා පුරෙජාතෙ තීණි**" "**තීණි**" යනු අබ්‍යාකතො අබ්‍යාකතස්ස, අබ්‍යකතො කුසලස්ස, අබ්‍යාකතො අකුසලස්ස යන මොහු ය. අභිධෙය හා විභඞ්ග ආරම්මණ පුරේජාතයෙහි මෙන් උදුරනු.

(5) විප්පයුත්තසභාගයෙහි මරණාසන්න මනෝද්වාරාවජ්ජන ජවන තදරම්මණයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් හෘදයවස්තුව වූ වස්තවාරම්මණ විප්‍රයුක්ත ප්‍රත්‍යය ධර්‍මය ආරම්මණප්‍රත්‍යය ද වේ. විප්ප්‍රයුක්තප්‍රත්‍යය ද වේ. "**ආරම්මණපච්චයා විප්පයුත්තෙ තීණි**" නිඃශ්‍රයසභාගය අනුව විස්තර කරනු.

(6-7) අත්ථිසභාග අවිගතසභාග දෙවාරය පුරේජාතසභාගය මෙනි. ප්‍රත්‍යය බැහැර කිරීම හේතුසභාගයෙහි දැක්වූ ක්‍රමය අනුව විස්තර කරනු.

Non-commercial distribution

## ඝටනාවාරය.

සභාගවාරයට අනතුරු ව ඝටනාවාරය වදාළ සේක. එහි අධිපති උපනිස්සය ඝටනාව ය, පුරේජාත අත්ථි අවිගත ඝටනාව ය, සනිස්සය විප්පයුත්තඝටනාව ය, සාධිපති උපනිස්සය ඝටනාව ය, සාධිපතිඋපනිස්සය විප්පයුත්තඝටනාවය යි ඝටනා පසෙකි.

(1) එහි අධිපති උපනිස්සය ඝටනාව මෙ සේ යඃ- ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අට ය, මහාකුසල් අට ය, මහාක්‍රියාඥානසම්ප්‍රයුක්ත සිත් සතර ය, ලෝකෝත්තර සිත් අට ය යන මොවුන්ට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ ඉෂ්ටනිෂ්පන්නරූප අටළොස ය, ද්වේෂමූල මෝහමූල දුඃඛසහගතකායවිඥාන වර්ජිත සිත් සූ අසූවය, ද්වේෂ ඊර්ෂ්‍යා මාත්සර්‍ය්‍ය කෞකෘත්‍යය විචිකිත්සා වර්ජිත චෛතසික සත්සාලිස ය නිර්වාණ ය යන ධර්‍මයෝ ආරම්මණ ප්‍රත්‍යය ද අධිපතිප්‍රත්‍යය ද උපනිඃශ්‍රය ප්‍රත්‍යය ද වෙති. එබැවින් ඒ ධර්‍මයෝ මේ අනුලෝමයෙහි **"ආරම්මණ අධිපති උපනිස්සයන්ති සත්ත"** යි වදරන ලදහ,

(2) පුරේජාත අත්ථි අවිගත ඝටනාව මෙ සේ යඃ- කාමසිත් සිවුපනසට හා දිබ්බචක්ඛු දිබ්බසෝත අභිඤ්ඤාවන්ට ද ප්‍රත්‍යය වන වර්තමාන නිෂ්පන්නරූප අටොළොස වූ ආරම්මණ පුරේජාතප්‍රත්‍යය ධර්‍මයෝ ආරම්මණය ද පුරේජාතය ද අත්ථිය ද අවිගතය ද වෙති. **"ආරම්මණ පුරේජාත අත්ථි අවිගතන්ති තීණි"** පුරේජාතසභාගය අනුව විස්තර කරනු,

(3) සනිස්සය විප්පයුත්තඝටනාව මෙ සේ යඃ- මරණාසන්න මනෝද්වාරාවර්ජන ජවන තදාරම්මණයන්ට ප්‍රත්‍යය වන ච්‍යුති චිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් හෘදයවස්තුව වූ වස්තුවාරම්මණප්‍රත්‍යය -පෙ- **"ආරම්මණ පුරේජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි"** නිස්සය සභාගය අනුව විස්තර කරනු.

(4) සාධිපති උපනිස්සය ඝටනාව මෙ සේ යඃ- ගරු කොට අරමුණු කරණ ලෝභ මූල සිත් අටට ප්‍රත්‍යය වන ඉෂ්ටනිෂ්පන්න රූප අටළොසය -පෙ- **"ආරම්මණ අධිපති උපනිස්සය පුරෙජාත අත්ථි අවිගතන්ති එකං"** අබ්‍යාකතො අකුසලස්ස.

(5) සාධිපති උපනිස්සය විප්පයුත්ත ඝටනාව මෙ සේ යඃ- ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්නජවන පසට ප්‍රත්‍යය වන ච්‍යුති චිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපන් ගරු කළ යුතු වූ *හෘදයවස්තු සඞ්ඛ්‍යාත* වස්තුවාරම්මණප්‍රත්‍යය -පෙ- **"ආරම්මණ අධිපති නිස්සය උපනිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං"** එකං යනු

Non-commercial distribution

අබ්‍යාකතෙන අබ්‍යාකතය ය. "අබ්‍යාකතො ධම්මො අකුසලස්ස ධම්මස්ස ආරම්මණපච්චයෙන පච්චයො, -පෙ- අවිගතපච්චයෙන පච්චයො, චක්ඛුං ගරුං කත්වා අස්සාදෙති අභිනන්දති. තං ගරුං කත්වා රාගො උප්පජ්ජති. දිට්ඨි උප්පජ්ජති" යි වීථිවිභඞ්ගයන් උදුළ යුතු ය. ආරම්මණසභාග සත හා ඝටනා පස නිමි.

## 3 අධිපති මිශ්‍රක පාලිය.

අධිපතිපච්චයා හෙතුයා චත්තාරි, ආරම්මණෙ සත්ත, සහජාතෙ සත්ත, අඤ්ඤමඤ්ඤෙ තීණි, නිස්සයෙ අට්ඨ, උපනිස්සයෙ සත්ත, පුරෙජාතෙ එකං, විපාකෙ එකං, ආහාරෙ සත්ත, ඉන්ද්‍රියෙ සත්ත, මග්ගෙ සත්ත, සම්පයුත්තෙ තීණි, විප්පයුත්තෙ චත්තාරි, අත්ථියා අට්ඨ, අවිගතෙ අට්ඨ,

අධිපති අත්ථි අවිගතන්ති අට්ඨ, අධිපති නිස්සය අත්ථි අවිගතන්ති අට්ඨ, අධිපති නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති චත්තාරි,

අධිපති ආරම්මණූ පනිස්සයන්ති සත්ත, අධිපති ආරම්මණූපනිස්සය පුරෙජාත අත්ථි අවිගතන්ති එකං, අධිපති ආරම්මණ නිස්සය උපනිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං,

අධිපති සහජාත නිස්සය අත්ථි අවිගතන්ති සත්ත, අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, අධිපති සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, අධිපති සහජාත නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං, අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, අධිපති සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං

අධිපති සහජාත නිස්සය ආහාර ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති සත්ත, අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ආහාර ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි, අධිපති සහජාත නිස්සය ආහාර ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි, අධිපති සහජාත නිස්සය විපාක ආහාර ඉන්ද්‍රිය අත්ථි අවිගත න්ති එකං, අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං: අධිපති සහජාත නිස්සය විපාක ආහාර ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං,

අධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති සත්ත, අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය මග්ග සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, අධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, අධිපති සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති එකං,

Non-commercial distribution

අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග සම්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං, අධිපති සහජාත නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං,

අධිපති හෙතු සහජාත නිස්සය ඉන්‍ද්‍රිය මග්ග අත්‍ථි අවිගතන්ති චත්තාරි, අධිපති හෙතු අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්‍ද්‍රිය මග්ග සම්පයුත්ත අත්‍ථි අවිගතන්ති ද්වෙ, අධිපති හෙතු සහජාත නිස්සය ඉන්‍ද්‍රිය මග්ග විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති ද්වෙ, අධිපති හෙතු සහජාත නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග අත්‍ථි අවිගතන්ති එකං, අධිපති හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග සම්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං, අධිපති හෙතු සහජාත නිස්සය විපාක ඉන්‍ද්‍රිය මග්ග විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං.

## අධිපති මිශ්‍රකයේ සන්නය.

ආරම්මණ මිශ්‍රකවාරයට අනතුරුව අධිපති මිශ්‍රකවාරය වදළ සේක. එ ද සභාග ඝටනා වසයෙන් දෙවැදෑරුම් වේ. එයින් සභාගවාරය පළමුකොට වදළ සේක. එහි ද අධිපතිමූලක හේතුසභාගය, ආරම්මණ සභාගය, සහජාතසභාගය අඤ්ඤමඤ්ඤසභාගය, නිස්සයසභාගය, උපනිස්සයසභාගය, පුරේජාතසභාගය, විපාක සභාගය, ආහාරසභාගය, ඉන්‍ද්‍රියසභාගය, මග්ගසභාගය, සම්පයුත්තසභාගය, විප්පයුත්තසභාගය, අත්‍ථිසභාගය, අවිගතසභාගය යි වාර පසළොසෙකි.

(1) එයින් අධිපතිමූලක හේතුසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතිය **"අධිපතිපච්චයා හෙතුයා චත්තාරි"**

(2) අධිපතිමූලක ආරම්මණසභාගයෙහි - සකල ආරම්මණාධිපති ප්‍රත්‍යය **"අධිපතිපච්චයා ආරම්මණෙ සත්ත"**

(3) සහජාතසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන අධිපති ධර්‍ම තුන සතර අතුරෙන් එක එකක් වූ සහජාතාධිපතිප්‍රත්‍යය **"අධිපතිපච්චයාසහජාතෙ සත්ත"**

(4) අඤ්ඤමඤ්ඤ සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට ප්‍රත්‍යය වන අධිපති ධර්‍ම තුන සතර අතුරෙන් එක එකක් වූ සහජාතාධිපති ප්‍රත්‍යය **"අධිපතිපච්චයා අඤ්ඤමඤ්ඤෙ තීණි"**

(5) නිස්සයසභාගයෙහි සකල සහජාතාධිපති ප්‍රත්‍යයධර්‍මයෝ ය, ගරුකොට අරමුණු කරන ලෝභමූලමරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන

Non-commercial distribution

ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් හෘදයවස්තුව ' වස්තුවාරම්මණප්‍රත්‍යය යන මොවුහු- "**අධිපති පච්චයා නිස්සයෙ අට්ඨ**

(6) උපනිස්සය සභාගයෙහි සකලාරම්මණෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ධර්‍මයෝ - "**අධිපතිපච්චයා උපනිස්සයෙ සත්ත**"

(7) පුරේජාතසභාගයෙහි ගරුකොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ ඉෂ්ටනිෂ්පන්නරූප අටොළොස වූ ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ධර්‍මයෝ - "**අධිපතිපච්චයා පුරේජාතෙ එකං**"

(8) විපාකසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්‍ධ සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලසිත් සතරෙහි අධිපතිධර්‍ම සතර අතුරෙන් එක එකක් වූ සහජාතාධිපතිප්‍රත්‍යයධර්‍මයෝ - '**අධිපතිපච්චයා විපාකෙ එකං**"

(9) ආහාරසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන චිත්තාධිපතිය - "**අධිපතිපච්චයා ආහාරෙ සත්ත**"

(10) ඉන්‍ද්‍රියසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්‍ධ සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන චිත්ත විරිය වීමංස යන අධිපතිධර්‍ම තුන අතුරෙන් එක් එක් ධර්‍මයක් වූ අධිපතිප්‍රත්‍යය - **අධිපතිපච්චයා ඉන්‍ද්‍රියෙ සත්ත**"

(11) මග්ගසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්‍ධ සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතිය - "**අධිපතිපච්චයා මග්ගෙ සත්ත**"

(12) සම්පයුත්තසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට ප්‍රත්‍යය වන අධිපති ධර්‍ම තුන සතර අතුරෙන් එක එකක් වූ අධිපති ප්‍රත්‍යය "**අධිපතිපච්චයා සම්පයුත්තෙ තීණි**"

(13) විප්පයුත්ත සභාගයෙහි සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යයවන අධිපති ධර්‍ම තුන සතර අතුරෙන් එක එකක් වූ සහජාතාධිපති ප්‍රත්‍යය ගරුකොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් ගරු කළ යුතු හෘදයවස්තුව වූ වස්තුවාරම්මණ ප්‍රත්‍යය ය යන මොවුහු - "**අධිපතිපච්චයා විප්පයුත්තෙ චත්තාරි**" කුසලො අබ්‍යාකතස්ස, අකුසලො අබ්‍යාකතස්ස. අබ්‍යාකතො අබ්‍යාකතස්ස, අබ්‍යාකතො අකුසලස්ස යන වාර සතර ය.

(14) අත්‍ථිසභාගයෙහි සකල සහජාතාධිපතිප්‍රත්‍යය ය, ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යවන ගරු කළ යුතු වූ

Non-commercial distribution

නිෂ්පන්නරූප අටළොස වූ ආරම්මණාධිපති ප්‍රත්‍යය ය යන මොවුහු - **"අධිපති පච්චයා අත්ථියා අට්ඨ"**

**(15) අධිපතිපච්චයා අවිගතෙ අට්ඨ-**

සඝටනාවාරය.

සභාගවාරයට අනතුරුව සඝටනා වාරය වදාළ සේක. එහි මිස්සක සඝටනා ය, පකිණ්ණකසඝටනා ය, සහජාතසඝටනා යයි සඝටනා තුන් කොටසක් ඇත්තේ ය. එයින් මිස්සකසඝටනාවෝ පළමු කොට වදරන ලදහ. අත්ථි අවිගතසඝටනාව ය, සනිස්සයසඝටනාව ය, සනිස්සය විප්පයුත්ත සඝටනාවය යි මිස්සකසඝටනා තුනෙකි.

(1) එයින් අත්ථි අවිගත සඝටනාව මෙ සේ යः සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන අධිපති ධර්‍ම තුන සතර අතුරෙන් එක එකක් වූ සහජාතාධිපතිප්‍රත්‍යය ය, ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ඉෂ්ටනිෂ්පන්න රූප අටළොස වූ ආරම්මණාධිපතිප්‍රත්‍යය යන මොවුහු අධිපති ප්‍රත්‍යය ද අස්තිප්‍රත්‍යය ද අවිගත ප්‍රත්‍යය ද වෙති, එබැවින් ඒ ධර්‍මයෝ **"අධිපති අත්ථි අවිගතන්ති අට්ඨ"** යි වදරන ලදහ. "අට්ඨ" යනු කුසලපදයෙහි වාර තුන ය. අකුසලපදයේ වාර තුන ය, අබ්‍යාකතො අබ්‍යාකතස්ස, අබ්‍යාකතො අකුසලස්ස යන දෙවාරය ය යන මොවුහු ය. පූර්‍වවාර සතෙහි සහජාතාධිපතිය ද අවසානවාරයෙහි ආරම්මණාධි-පතිය ද ගත යුතු ය.

(2) සනිස්සය සඝටනාව මෙසේ ය. සකල සහජාතාධිපති ප්‍රත්‍යය, ගරුකොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් ගරු කළ යුතු හෘදයවස්තුව වූ වස්තුවාරම්මණප්‍රත්‍යය ය යන මොවුහු **"අධිපති නිස්සය අත්ථි අවිගතන්ති අට්ඨ"** වාර අට ඉහත කී පරිදි ය. අබ්‍යාකතො අකුසලස්ස යන වාරයෙහි ලෝභමූල මරණාසන්නජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් ගරු කළ යුතු හෘදයවස්තුව ලැබේ. **"වත්ථුං ගරුං කත්වා රාගො උප්පජ්ජති දිට්ඨි උප්පජ්ජති"** යි විභඞ්ගය උදුරනු.

(3) සනිස්සය විප්පයුත්ත සඝටනාව මෙ සේ යः සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන අධිපතිධර්‍ම තුන සතර අතුරෙන් එක එකක් වූ සහජාතා-ධිපතිප්‍රත්‍යය ය, ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්නජවනයට -පෙ- හෘදයවස්තුව වූ වස්තුවාරම්මණ ප්‍රත්‍යය ය යන මොවුහු -

Non-commercial distribution

**"අධිපති නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති චත්තාරි"** වාර සතර කුසලො අබ්‍යාකතස්ස, අකුසලො අබ්‍යාකතස්ස, අබ්‍යාකතො අබ්‍යාකතස්ස, අබ්‍යාකතො අකුසලස්ස යන වාරයෝ ය. අබ්‍යාකතො අකුසලස්ස යන වාරයට ගරු කළ යුතු හෘදයවස්තුව වූ වස්තුවාරම්මණප්‍රත්‍යය ගන්නේ ය, **මිශ්‍රකඝටනා නිමි.**

මිශ්‍රකඝනාවන්ට අනතුරු ව ප්‍රකීර්ණකඝටනා වදරන ලදහ. ආරම්මණ උපනිස්සය ඝටනාව ය, සපුරේජාත අත්ථි අවිගත ඝටනාව ය, සනිස්සය පුරේජාත විප්පයුත්ත අත්ථි අවිගත ඝටනාව යයි ප්‍රකීර්ණක ඝටනා තුනෙකි.

(1) එයින් ආරම්මණ උපනිස්සය ඝටනාව මෙසේ යː සකලාරම්මණාධිපතිප්‍රත්‍යය ධර්මයෝ- **"අධිපති ආරම්මණ උපනිස්සය න්ති සත්ත."**

(2) සපුරේජාත අත්ථි අවිගත ඝටනාව මෙ සේ යː ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු නිෂ්පන්නරූප අටළොස - **"අධිපති ආරම්මණ උපනිස්සය පුරෙජාත අත්ථි අවිගතන්ති එකං."**

(3) සනිස්සය පුරේජාත විප්පයුත්ත ඝටනාව මෙසේ යː ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්නජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපන් ගරු කළ යුතු හෘදය වස්තුව වූ වස්තුවාරම්මණප්‍රත්‍යය - **අධිපති ආරම්මණ නිස්සය උපනිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං."**

**ප්‍රකීර්ණක ඝටනා තුන නිමි.**

ප්‍රකීර්ණකඝටනාවන්ට අනතුරු ව සහජාතඝටනා වදළ සේක. ඡන්දාධිපතිඝටනා ය, චිත්තාධිපතිඝටනා ය, විරියාධිපතිඝටනා ය, වීමංසාධිපතිඝටනා ය යි සහජාතඝටනා සතර කොටසෙකි. එයින් ඡන්දාධිපතිඝටනාවන් පළමු කොට වදළ සේක. එහි ද අවිපාක සවිපාක වශයෙන් ඝටනා දෙ කොටසකි. එයින් අවිපාකඝටනා පළමු කොට වදළ සේක. සබ්බට්ඨානිකඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව ය, සවිප්පයුත්තඝටනාව ය යි අවිපාක ඝටනා තුනෙකි.

(1) එයින් සබ්බට්ඨානිකඝටනාව මෙ සේ යː සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඡන්දාධිපතිය - **"අධිපති සහජාත නිස්සය අත්ථි අවිගතන්ති සත්ත."**

Non-commercial distribution

(2) සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව මෙසේ ය: සම්ප්‍රයුක්ත-ස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන ඡන්දාධිපති - **"අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි."**

(3) සවිප්පයුත්ත ඝටනාව මෙසේ ය: සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ඡන්දාධිපති **"අධිපති සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි."** අවිපාකඝටනා තුන ය.

අවිපාකඝටනාවන්ට අනතුරු ව සවිපාකඝටනාවන් වදාළ සේක. සබ්බට්ඨානික ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤසම්පයුත්තඝටනාව ය, සවිප්පයුත්ත ඝටනාව යයි සවිපාක ඝටනා තුනෙකි.

(4) එයින් සබ්බට්ඨානිකඝටනාව මෙ සේ ය, සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලසිත් සතරෙහි ඡන්දාධිපතිය, **"අධිපති සහජාත නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං"**

(5) සඅඤ්ඤමඤ්ඤඝටනාව මෙ සේ ය. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන ඵලසිත් සතරෙහි ඡන්දාධිපතිය - **"අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං"**

(6) සවිප්පයුත්තඝටනාව මෙ සේ ය. සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලසිත් සතරෙහි ඡන්දාධිපතිය - **අධිපති සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං"** මේ සවිපාක ඝටනා තුනය.

**ඡන්දාධිපති ඝටනා සය නිමි.**

ඡන්දාධිපතිඝටනාවන්ට අනතුරු ව චිත්තාධිපති ඝටනාවන් වදාළ සේක. එහි ද අවිපාක සවිපාක වශයෙන් ඝටනා දෙකොටසෙකි. එයින් අවිපාක ඝටනාවන් පළමුකොට වදාළ සේක. සබ්බට්ඨානික ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව ය, සවිප්පයුත්ත ඝටනාව ය යි අවිපාක ඝටනා තුනෙකි.

(1) එයින් සබ්බට්ඨානික ඝටනාව මෙසේ ය: සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන චිත්තාධිපතිය- **"අධිපති සහජාත නිස්සය ආහාර ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති සත්ත"**

(2) සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව මෙ සේ ය: සම්ප්‍රයුක්ත-ස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන චිත්තාධිපතිය **අධිපතිසහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ආහාර ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි"**

Non-commercial distribution

(3) සවිප්පයුත්තඝටනාව මෙසේ ය. සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන චිත්තාධිපතිය - "**අධිපති සහජාත නිස්සය ආහාර ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි**" මේ අවිපාක ඝටනා තුන ය,

අවිපාක ඝටනාවන්ට අනතුරු ව සවිපාක ඝටනාවන් වදළ සේක. සබ්බට්ඨානික ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤසම්පයුක්ත ඝටනාව ය, සවිප්පයුත්ත ඝටනාව ය යි සවිපාක ඝටනා තුනෙකි.

(4) එයින් සබ්බට්ඨානික ඝටනාව මෙ සේ යː සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලසිත් සතර වූ චිත්තාධිපතිය - "**අධිපති සහජාත නිස්සය විපාක ආහාර ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති එකං**"

(5) සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව මෙසේ යː සම්ප්‍රයුක්ත-ස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන ඵලසිත් සතර වූ චිත්තාධිපතිය -"**අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං**"

(6) සවිප්පයුත්ත ඝටනාව මෙසේ ය. සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලසිත් සතර වූ චිත්තාධිපතිය-**අධිපති සහජාත නිස්සය විපාක ආහාර ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං**" මේ සවිපාක ඝටනා තුනය.

**චිත්තාධිපති ඝටනා සය නිමි.**

චිත්තාධිපතිඝටනාවන්ට අනතුරු ව විරියාධිපති ඝටනාවන් වදළ සේක. එහි ද අවිපාක සවිපාක වශයෙන් ඝටනා දෙකොටසෙකි. එයින් අවිපාක ඝටනාවන් පළමු කොට වදළ සේක. සබ්බට්ඨානික ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාවය සවිප්පයුත්ත ඝටනාවය යි අවිපාක ඝටනා තුනෙකි.

(1) එයින් සබ්බට්ඨානික ඝටනාව මෙසේ ය. සම්පයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන විරියාධිපතිය "**අධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති සත්ත**"

(2) සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්තඝටනාව මෙ සේ ය. සම්පයුක්ත ස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන විරියාධිපති- "**අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය මග්ග සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි**"

(3) සවිප්පයුත්තඝටනාව මෙ සේ ය. සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන විරියාධිපතිය- "**අධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි**" මේ අවිපාක ඝටනා තුන ය.

*Non-commercial distribution*

අවිපාකඝටනාවන්ට අනතුරු ව සවිපාක ඝටනාවන් වදාළ සේක. සබ්බට්ඨානිකඝටනාව ය සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාවය, සවිප්පයුත්තඝටනාව ය යි සවිපාකඝටනා තුනෙකි.

(4) එයින් සබ්බට්ඨානිකඝටනාව මෙ සේ ය. සම්පයුක්තස්කන්ධ සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන එලසිත් සතරෙහි විරියාධිපතිය - **"අධිපති සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති එකං"**

(5) සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්තඝටනාව මෙසේ ය. සම්පයුක්ත-ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ඵලසිත් සතරෙහි විරියාධිපතිය- **"අධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං"**

(6) සවිප්පයුත්තඝටනාව මෙසේ ය. සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලසිත් සතරෙහි විරියාධිපති ය **"අධිපති සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං"** මේ අවිපාක ඝටනා තුන ය.

**විරියාධිපති ඝටනා සය නිමි**

විරියාධිපතිඝටනාවන්ට අනතුරු ව වීමංසාධිපතිඝටනාවන් වදාළ සේක. එයද අවිපාකඝටනා සවිපාකඝටනා වශයෙන් දෙකොටසකි. එයින් අවිපාකඝටනාවන් පළමු කොට වදාළ සේක. සබ්බට්ඨානිකඝට-නාව ය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව ය සවිප්පයුත්ත ඝටනාව යයි අවිපාක ඝටනා තුනෙකි.

(1) එයින් සබ්බට්ඨානික ඝටනාව මෙ සේ ය. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතිය **"අධිපති හෙතු සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති චත්තාරි,"**

(2) සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව මෙ සේ යඃ සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතිය - **"අධිපති හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය මග්ග සම්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ"**

(3) සවිප්පයුත්තඝටනාව මෙ සේ යඃ සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතිය - **"අධිපති හෙතු සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ"** මේ අවිපාක ඝටනා තුනය.

සබ්බට්ඨානිකඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව ය, සවිප්පයුත්ත ඝටනාව යයි සවිපාකඝටනා තුනෙකි.

Non-commercial distribution

(4) එයින් සබ්බට්ඨානික ඝටනාව මෙ සේ ය: සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන එලසිත් සතරෙහි වීමංසාධිපතිය- "අධිපති හෙතු සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග අත්‍ථි අවිගතන්ති එකං"

(5) සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්තඝටනාව මෙ සේ ය: සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන එලසිත් සතරෙහි වීමංසාධිපතිය- "අධිපති හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග අත්‍ථි අවිගතන්ති එකං"

(6) සවිප්පයුත්තඝටනාව මෙ සේ ය: සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන එලසිත් සතරෙහි වීමංසාධිපතිය - "අධිපති හෙතු සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං" මේ සවිපාක ඝටනා තුන ය.

වීමංසාධිපති ඝටනා සය නිමි.

මෙහි සභාග පසළොසෙකි. මිශ්‍රකඝටනා තුන ය. ප්‍රකීර්‍ණක ඝටනා තුන ය, සහජාත ඝටනා සූවිස්සය යි ඝටනා තිසෙකි.

4 අනන්තර මිශ්‍රක පාලිය.

අනන්තරපච්චයා සමනන්තරෙ සත්ත, උපනිස්සයෙ සත්ත, ආසෙවනෙ තීණි; කම්මෙ එකං, නත්‍ථියා සත්ත, විගතෙ සත්ත.

අනන්තර සමනන්තර උපනිස්සය නත්‍ථි විගතන්ති සත්ත, අනන්තර සමනන්තර උපනිස්සය ආසෙවන නත්‍ථි විගතන්ති තීණි, අනන්තර සමනන්තර උපනිස්සය කම්ම නත්‍ථි විගතන්ති එකං.

අනන්තර මිශ්‍රකයේ සන්නය.

අධිපති මිශ්‍රකයට අනතුරු ව අනන්තරමිශ්‍රකය වදළ සේක. එ ද සභාග ඝටනා වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් සභාගයන් පළමු කොට වදළ සේක. අනන්තරමූලක සමනන්තර සභාගය, උපනිස්සය සභාගය, ආසේවන සභාගය, කම්මසභාගය, නත්‍ථි සභාගය, විගතසභාගය යි සභාගවාර සයෙකි.

(1) ඔවුන් ගෙන් අනන්තරමූලක සමනන්තරසභාගයෙහි අභිනතච්‍යුතිය සහිතවූ පශ්චිම පශ්චිම නාමස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අභිනතච්‍යුති වර්ජිත පූර්‍වපූර්‍ව නාමස්කන්ධයෝ අනන්තර

Non-commercial distribution

ප්‍රත්‍යය ද සමනන්තර ප්‍රත්‍යය ද වෙති. එ බැවින් ඒ ධර්මයෝ "අනන්තර පච්චයා සමනන්තරෙ සත්ත" යි වදරන ලදහ. උපනිස්සය සභාගය ද එසේ ය.

(3) ආසේවන සභාගයෙහි ප්‍රථමජවනඵලජවන වර්ජිත පශ්චිම පශ්චිම එක්පනස් ජවනයන්ට ප්‍රත්‍යය වන අන්තිමජවන වර්ජිත පශ්චිම පශ්චිම සත්සාළිස් ලෞකික ජවනයෝ- "අනන්තර පච්චයා ආසෙවනෙ තීණි"

(4) කම්මසභාගයෙහි මාර්ගානන්තර ඵලසිත් සතරට ප්‍රත්‍යය වන මාර්ගචේතනාව- "අනන්තර පච්චයා කම්මෙ එකං" "මග්ගො ඵලස්ස" යි විභඞ්ගය උදුරනු. නත්ථිසභාග විගතසභාග දෙක සමනන්තර සභාගය මෙනි.

සභාගයන්ට අනතුරු ව ඝටනාවන් වදළ සේක. සමනන්තර උපනිස්සය නත්ථි විගත ඝටනාව ය, ආසේවන ඝටනාව ය, සම්පයුත්ත ඝටනාවය යි ඝටනා තුනෙකි.

(1) සකලානන්තරප්‍රත්‍යය ධර්මයෝ- "අනන්තර සමනන්තර නත්ථි විගතන්ති සත්ත" (2) සකලාසේවන ප්‍රත්‍යය ධර්මයෝ- "අනන්තරසමනන්තර උපනිස්සය ආසෙවන නත්ථි විගතන්ති තීණි" (3) මාර්ගානන්තරඵල චිත්තයන්ට ප්‍රත්‍යය වන මාර්ගචේතනාව- "අනන්තර සමනන්තර උපනිස්සය කම්ම නත්ථි විගතන්ති එකං" මෙහි සභාග වාර සයෙකි. ඝටනා තුනෙකි.

## 5 සමනන්තර මිශ්‍රක පාලිය,

සමනනතරපච්චයා අනන්තරෙ සත්ත. උපනිස්සයෙ සත්ත, ආසෙවනෙ තීණි, කම්මෙ එකං, නත්ථියා සත්ත, විගතෙ සත්ත, සමනන්තර අනන්තර උපනිස්සය නත්ථි විගත න්ති සත්ත, සමනන්තර අනන්තර උපනිස්සය ආසෙවන නත්ථි විගතන්ති තීණි, සමනන්තර අනන්තර උපනිස්සය කම්ම නත්ථි විගතන්ති එකං, (අනන්තරය මෙනි.)

## 6 සහජාත මිශ්‍රක පාලිය.

සහජාතපච්චයා හෙතුයා සත්ත, අධිපතියා සත්ත, අඤ්ඤමඤ්ඤෙ තීණි, නිස්සයෙ නව. කම්මෙ සත්ත, විපාකෙ එකං, ආහාරෙ සත්ත, ඉන්ද්‍රියෙ සත්ත, ඣානෙ සත්ත, මග්ගෙ සත්ත, සම්පයුත්තෙ තීණි, විප්පයුත්තෙ තීණි, අත්ථියා නව, අවිගතෙ නව,

Non-commercial distribution

සහජාත නිස්සය අත්‍ථි අවිගතන්ති නව, සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්‍ථි අවිගතන්ති තීණි, සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්‍ථි අවිගත න්ති තීණි, සහජාත නිස්සය විප්පයුත්ත අත්‍ථි අවිගත න්ති තීණි, සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විප්පයුත්ත අත්‍ථි අවිගත න්ති එකං.

සහජාත නිස්සය විපාක අත්‍ථි අවිගතන්ති එකං, සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්‍ථි අවිගතන්ති එකං, සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත අත්‍ථි අවිගත න්ති එකං, සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්‍ථි අවිගත න්ති එකං, සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්‍ථි අවිගත න්ති එකං,

සහජාතමිශ්‍රකයේ සන්නය.

සමනන්තර මිශ්‍රකයට අනතුරු ව සහජාතමිශ්‍රකය වදාළ සේක, එහි සහජාත මූලක හේතුසභාගය ය, අධිපතිසභාගය ය, අඤ්ඤමඤ්ඤ සභාගය ය, නිස්සයසභාගය ය, කම්මසභාගය ය, විපාක සභාගය ය, ආහාරසභාගය ය, ඉන්‍ද්‍රිය සභාගය ය, ඣානසභාගය ය, මග්ගසභාගය ය, සම්පයුත්තසභාගය ය, විප්පයුත්තසභාගය ය, අත්‍ථි සභාගය ය, අවිගතසභාගය ය යි සභාගවාර තුදුසෙකි.

(1) එයින් සහජාතමූලක හේතුසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්‍ධයන්ට හා සාධිපතිචිත්තජරූපයන්ට ද සහේතුක ප්‍රතිසන්‍ධිකර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන හේතු සය- "සහජාතපච්චයා හෙතුයා සත්ත"

(2) අධිපතිසභාගයෙහි සකල සහජාතාධිපති ප්‍රත්‍යයධර්මයෝ. "සහජාතපච්චයා අධිපතියා සත්ත"

(3) අඤ්ඤමඤ්ඤසභාගයෙහි සකලාන්‍යෝන්‍යප්‍රත්‍යධර්මයෝ - සහජාත පච්චයා අඤ්ඤමඤ්ඤ තීණි" (4) නිස්සයසභාගයෙහි - සකල සහජාතනිඃශ්‍රයප්‍රත්‍යය ධර්මයෝ - "සහජාතපච්චයානිස්සයෙ නව" (5) කම්ම-සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්‍ධ සහේතුකචිත්තජරූප සහේතුක ප්‍රතිසන්‍ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන චේතනාව වූ සහජාත කර්මප්‍රත්‍යය- "සහජාතපච්චයා කම්මෙ සත්ත"

(6) විපාකසභාගයෙහි ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූප ප්‍රතිසන්‍ධිකර්මජරූපයන්ට ද ප්‍රත්‍යය වන සකල විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්‍ධි නාමස්කන්‍ධයෝ ය, හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්‍ධිනාමස්කන්‍ධයෝ ය යන මොවුහු- "සහජාත පච්චයා විපාකෙ එකං"

Non-commercial distribution

(7) ආහාරසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජ-ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන ඵස්ස චේතනා විඤ්ඤාණ යන නාමාහාරයෝ- "සහජාතපච්චයා ආහාරෙ සත්ත"

(8) ඉන්ද්‍රියසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රියධර්ම අට වූ සහජාතේන්ද්‍රිය ප්‍රත්‍යය- "සහජාත පච්චයා ඉන්ද්‍රියෙ සත්ත"

(9) ඣානසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ගධර්මයෝ නවදෙන- "සහජාත පච්චයා ඣානෙ සත්ත"

(10) මග්ගසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද සහේතුකප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ද ප්‍රත්‍යය වන මාර්ගාඞ්ගයෝ නව දෙන "සහජාතපච්චයා මග්ගෙ සත්ත"

(11) සම්පයුත්තසභාගයෙහි සකල සම්ප්‍රයුක්ත ප්‍රත්‍යය ධර්මයෝ- "සහජාතපච්චයා සම්පයුත්තෙ තීණි" (12) විප්පයුත්තසභාගයෙහි සකල-විප්‍රයුක්තප්‍රත්‍යය ධර්මයෝ "සහජාතපච්චයා විප්පයුත්තෙ තීණි" අත්ථි අවිගත සභාග දෙක සහජාතය මෙනි, "සහජාතපච්චයා අත්ථියා නව අවිගතෙ නව"

සඝටනා

සභාගයන්ට අනතුරු ව සඝටනාවන් වදාළ සේක. එහි අවිපාක සවිපාක වශයෙන් සඝටනා දෙකොටසකි. සබ්බට්ඨානික සඝටනාවය, සඅඤ්ඤමඤ්ඤ සඝටනාවය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත සඝටනාවය, සවිප්පයුත්ත සඝටනාවය, සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත සඝටනාවය යි අවිපාක සඝටනා පසෙකි.

(1) එයින් සබ්බට්ඨානික සඝටනාව මෙසේ ය: ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ද ප්‍රත්‍යය වන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට හා උපාදාය රූපයන්ට ද ප්‍රත්‍යය වන මහාභූත සතර ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා හෘදයවස්තුව ය යන මොවුහු "සහජාත නිස්සය අත්ථි අවිගතන්ති නව"

(2) සඅඤ්ඤමඤ්ඤ සඝටනාව මෙසේ ය: ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය

Non-commercial distribution

වන මහාභූත සතර ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා හෘදයවස්තුව ය යන මොවුහු - සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගත නති තීණි"

(3) සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව මෙසේ ය: ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ- "සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි"

(4) සවිප්පයුත්තඝටනාව මෙසේ ය: චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන අරූපවිපාක ද්විපඤ්චවිඥාන අර්හත්තච්‍යුති වර්ජිත පඤ්චවෝකාර ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධ හෘදයවස්තුහුය යන මොවුහු - "සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි"

(5) සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්තඝටනාව මෙසේ ය: ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධ හෘදයවස්තුහු - සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං" මේ අවිපාක ඝටනා පස ය.

(සවිපාක ඝටනා.)

සබ්බට්ඨානිකඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්තඝටනාව ය, සවිප්පයුත්තඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත ඝටනාවය යි සවිපාක ඝටනා පසකි.

(1) එයින් සබ්බට්ඨානිකඝටනාව මෙසේ ය: ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ද ප්‍රත්‍යය වන සකල විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදය වස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොවුහු - "සහජාත නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං"

(2) සඅඤ්ඤමඤ්ඤ ඝටනාව මෙසේ ය: ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය යන මොවුහු - "සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං"

(3) සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව මෙසේ ය: ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල විපාක නාමස්කන්ධයෝ - "සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත අත්ථි අවිගත නති එකං"

Non-commercial distribution

(4) සවිප්පයුත්තඝටනාව මෙසේ ය: චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදය වස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොවුහු - "සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං"

(5) සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත ඝටනාව මෙසේ ය: හෘදය වස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ- සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං" මේ සවිපාකඝටනා පස ය.

සහජාත සභාග තුදුස හා ඝටනා දසය නිමි.

(7) අඤ්ඤමඤ්ඤ මිස්සක පාලිය

අඤ්ඤමඤ්ඤපච්චයා හෙතුයා තීණි, අධිපතියා තීණි, සහජාතෙ තීණි, නිස්සයෙ තීණි, කම්මෙ තීණි, විපාකෙ එකං ආහාරෙ තීණි, ඉන්ද්‍රියෙ තීණි, ඣානෙ තීණි, මග්ගෙ තීණි, සම්පයුත්තෙ තීණි, විප්පයුත්තෙ එකං, අත්ථියා තීණි, අවිගතෙ තීණි.

අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය අත්ථි අවිගතන්ති තීණි, අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං,

අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං, අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය විපාක සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.

අඤ්ඤමඤ්ඤමිස්සකයේ සන්නය.

සහජාතමිශ්‍රකයට අනතුරු ව අන්‍යෝන්‍ය මිශ්‍රකය වදාළ සේක. එ ද සභාග ඝටනා වශයෙන් දෙවැදෑරුම් වේ. අඤ්ඤමඤ්ඤමූලක හේතු සභාගය ය, අධිපති සභාගය ය, සහජාත සභාගය ය, කම්මසභාගය ය, විපාකසභාගය ය, ආහාර සභාගය ය, ඉන්ද්‍රිය සභාගය ය, ඣාන සභාගය ය, මග්ගසභාගයය, සම්පයුත්තසභාගය ය, විප්පයුත්තසභාගය ය, අත්ථිසභාගය ය, අවිගතසභාගය ය යි සභාගවාර තුදුසෙකි.

(1) එයින් හේතුසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදය වස්තුවට ප්‍රත්‍යය වන හේතු සය "අඤ්ඤමඤ්ඤ පච්චයා හෙතුයා තීණි"

(2) අධිපති සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන අධිපති ධර්මයෝ - "අඤ්ඤමඤ්ඤ පච්චයා අධිපතියා තීණි"

Non-commercial distribution

(3-4) සහජාතසභාගයෙහි සකල අන්‍යෝන්‍ය ප්‍රත්‍යය ධර්මයෝ "අඤ්ඤමඤ්ඤපච්චයා සහජාතෙ තීණි" - නිස්සයෙ තීණි"

(5) කම්මසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන චේතනාව "අඤ්ඤමඤ්ඤපච්චයා කම්මෙ තීණි"

(6) විපාකසභාගයෙහි ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදය වස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය යන මොවුහු- "අඤ්ඤ-මඤ්ඤපච්චයා විපාකෙ එකං"

(7) ආහාරසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදය වස්තුවට ප්‍රත්‍යය වන නාමාහාර තුන "අඤ්ඤමඤ්ඤපච්චයා ආහාරෙ තීණි"

(8) ඉන්ද්‍රියසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන ඉන්ද්‍රිය අට- " අඤ්ඤමඤ්ඤපච්චයා ඉන්ද්‍රියෙ තීණි"

(9) ඣානසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ග ධර්ම පස - "අඤ්ඤමඤ්ඤපච්චයා ඣානෙ තීණි"

(10) මග්ගසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන මාර්ගාඞ්ග ධර්ම නවය - "අඤ්ඤමඤ්ඤපච්චයා මග්ගෙ තීණි"

(11) සම්පයුත්තසභාගයෙහි ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ- "අඤ්ඤමඤ්ඤපච්චයා සම්පයුත්තෙ තීණි"

(12) විප්පයුත්තසභාගයෙහි ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධ හා හෘදයවස්තුව - "අඤ්ඤමඤ්ඤපච්චයා විප්පයුත්තෙ එකං" "පටිසන්ධික්ඛණෙ ඛන්ධා වත්ථුස්ස වත්ථු ඛන්ධානං" යි විභඞ්ගය උදුරනු.

(13-14) අත්ථිසභාගය හා අවිගත සභාගය අඤ්ඤමඤ්ඤය මෙනි.

ඝටනා.

සභාගවාරයට අනතුරු ව ඝටනාවාරය වදළ සේක. අවිපාක සවිපාක වශයෙන් ඝටනා දෙ කොටසෙකි. සබ්බට්ඨානිකඝටනාව ය, සම්පයුත්තඝටනාව ය, සවිප්පයුත්තඝටනාව ය යි අවිපාක ඝටනා තුනෙකි.

(1) එයින් සබ්බට්ඨානිකඝටනාව මෙසේ ය: ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල නාමස්කන්ධයෝ ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන

Non-commercial distribution

මහාභූත සතර ය, ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධ හා හෘදයවස්තුව ය යන මොවුහු - "අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය අත්ථි අවිගතන්ති තීණි"

(2) සම්පයුත්තඝටනාව මෙ සේ ය. ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ- "අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි"

(3) සවිප්පයුත්තඝටනාව මෙ සේ ය. ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයන් හා හෘදයවස්තුව අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං"

සබ්බට්ඨානිකඝටනාව ය, සම්පයුත්තඝටනාව ය, සවිප්පයුත්ත ඝටනාව ය යි සවිපාකඝටනා තුනෙකි.

(4) එයින් සබ්බට්ඨානික ඝටනාව මෙසේ ය: ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල විපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය, හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාරප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය යන මොවුහු - "අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං"

(5) සම්පයුත්තඝටනාව මෙසේ ය: ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල විපාක ප්‍රවෘත්තිප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ-"අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය විපාක සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං"

(9) සවිප්පයුත්තඝටනාව මෙ සේ ය; හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ-"අඤ්ඤමඤ්ඤ සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං" මෙසේ සභාගවාර තුදුසක් හා ඝටනා සයක් වේ.

## 8. නිඃශ්‍රය මිශ්‍රක පාලිය

නිස්සයපච්චයා හෙතුයා සත්ත, ආරම්මණෙ තීණි, අධිපතියා අට්ඨ, සහජාතෙ නව, අඤ්ඤමඤ්ඤෙ තීණි, උපනිස්සයෙ එකං, පුරෙජාතෙ තීණි, කම්මෙ සත්ත, විපාකෙ එකං, ආහාරෙ සත්ත, ඉන්ද්‍රියෙ සත්ත, ඣානෙ සත්ත, මග්ගෙ සත්ත, සම්පයුත්තෙ තීණි, විප්පයුත්තෙ පඤ්ච, අත්ථියා තෙරස, අවිගතෙ තෙරස.

නිස්සය අත්ථි අවිගතන්ති තෙරස, නිස්සය අධිපති අත්ථි අවිගතන්ති අට්ඨ, නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති සත්ත, නිස්සය විප්පයුත්ත

Non-commercial distribution

අත්‍ථි අවිගත නත්‍ථි පඤ්ච, නිස්සය අධිපති විප්පයුත්ත අත්‍ථි අවිගත නත්‍ථි චත්තාරි, නිස්සය ඉන්ද්‍රිය විප්පයුත්ත අත්‍ථි අවිගත නත්‍ථි තීණි.

නිස්සය පුරෙජාත විප්පයුත්ත අත්‍ථි අවිගත නත්‍ථි තීණි, නිස්සය ආරම්මණ පුරෙජාත විප්පයුත්ත අත්‍ථි අවිගත නත්‍ථි තීණි, නිස්සය ආරම්මණ අධිපති උපනිස්සය පුරෙජාත විප්පයුතත අත්‍ථි අවිගතනත්‍ථි එකං, නිස්සය පුරෙජාත ඉන්ද්‍රිය විප්පයුත්ත අත්‍ථි අවිගතනත්‍ථි එකං.

නිස්සය සහජාත අත්‍ථි අවිගතනත්‍ථි නව, නිස්සය සහජාත අඤ්ඤමඤ්ඤ අත්‍ථි අවිගතනත්‍ථි තීණි, නිස්සය සහජාත අඤ්ඤමඤ්ඤ සම්පයුත්ත අත්‍ථි අවිගතනත්‍ථි තීණි, නිස්සය සහජාත විප්පයුත්ත අත්‍ථි අවිගත නත්‍ථි තීණි, නිස්සය සහජාත අඤ්ඤමඤ්ඤ විප්පයුත්ත අත්‍ථි අවිගත නත්‍ථි එකං.

නිස්සය සහජාත විපාක අත්‍ථි අවිගත නත්‍ථි එකං, නිස්සය සහජාත අඤ්ඤමඤ්ඤ විපාක අත්‍ථි අවිගත නත්‍ථි එකං, නිස්සය සහජාත අඤ්ඤමඤ්ඤ විපාක සම්පයුත්ත අත්‍ථි අවිගතනත්‍ථි එකං, නිස්සය සහජාත විපාක විප්පයුත්ත අත්‍ථි අවිගතනත්‍ථි එකං, නිස්සය සහජාත අඤ්ඤමඤ්ඤ විපාක විප්පයුත්ත අත්‍ථි අවිගත නත්‍ථි එකං.

## නිඃශ්‍රය මිශ්‍රකයේ සන්නය.

අන්‍යෝන්‍ය මිශ්‍රකයට අනතුරු ව නිඃශ්‍රය මිශ්‍රකය වදළ සේක. එ ද සභාග ඝටනා වශයෙන් දෙවැදෑරුම් වේ. නිස්සයමූලක හේතු සභාගය ය, ආරම්මණ සභාගය ය, අධිපතිසභාගය ය, සහජාතසභාගය ය, අඤ්ඤ-මඤ්ඤසභාගය ය, උනිස්සයසභාගය ය, පුරේජාත සභාගය ය, කම්මසභාගය ය, විපාක සභාගය ය, ආහාරසභාගය ය, ඉන්ද්‍රියසභාගය ය,ඣානසභාගය ය, මග්ගසභාගය ය, සම්පයුත්ත සභාගය ය, විප්පයුත්තසභාගය ය, අත්‍ථි සභාගය ය, අවිගතසභාගය යි සභාගවාර සතොළොසෙකි.

(1) එයින් නිස්සයමූලක හේතුසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුකචිත්තජරූප සහේතුකප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන හේතු සය - "නිස්සය පච්චයා හෙතුයා සත්ත"

(2) ආරම්මණසභාගයෙහි මනෝද්වාරාවර්ජන මරණාසන්න-ජවන තදාරම්මණයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපන් හෘදයවස්තුව වූ වස්තවාරම්මණප්‍රත්‍යය- "නිස්සය පච්චයා ආරම්මණෙ තීණි"

(3) අධිපතිසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපතිචිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන අධිපති ධර්ම තුන සතර අතුරෙන් එක එකක් වූ

Non-commercial distribution

සහජාතාධිපති ප්‍රත්‍යය ය, ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන -පෙ- හෘදයවස්තුව වූ වස්තවා-රම්මණප්‍රත්‍යය ය යන මොවුහු - "නිස්සය පච්චයා අධිපතියා අට්ඨ"

(4) සහජාතසභාගයෙහි සකල සහජාත ප්‍රත්‍යයධර්මයෝ- "නිස්සය පච්චයා සහජාතෙ නව"

(5) අඤ්ඤමඤ්ඤසභාගයෙහි සකල අන්‍යෝන්‍යප්‍රත්‍යය ධර්මයෝ- "නිස්සයපච්චයා අඤ්ඤමඤ්ඤෙ තීණි"

(6) උපනිස්සය සභාගයෙහි ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න -පෙ- ගරු කළ යුතු හෘදයවස්තුව වූ වස්තවාරම්මණ ප්‍රත්‍යය "නිස්සයපච්චයා උපනිස්සයෙ එකං"

(7) පුරේජාතසභාගයෙහි පඤ්චවෝකාරභූමියෙහි අරූපවිපාක වර්ජිත සප්තවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන ෂට්වස්තු සඞ්ඛ්‍යාත පුරේජාත නිඃශ්‍රයප්‍රත්‍යය- "නිස්සයපච්චයා පුරෙජාතෙ තීණි"

(8) කම්මසභාගයෙහි සකල සහජාතකර්මප්‍රත්‍යය ධර්මයෝ- "නිස්සයපච්චයා කම්මෙ සත්ත"

(9) විපාකසභාගයෙහි සකල විපාකප්‍රත්‍යය ධර්මයෝ- "නිස්සය පච්චයා විපාකෙ එකං"

(10) ආහාරසභාගයෙහි සකල සහජාතාහාර ප්‍රත්‍යය ධර්මයෝ- "නිස්සයපච්චයා ආහාරෙ සත්ත"

(11) ඉන්ද්‍රියසභාගයෙහි සකල සහජාතේන්ද්‍රිය පුරේජාතේන්ද්‍රිය ප්‍රත්‍යයධර්මයෝ -"නිස්සයපච්චයා ඉන්ද්‍රියෙ සත්ත"

(12) ඣානසභාගයෙහි සකල ධ්‍යානප්‍රත්‍යය ධර්මයෝ- "නිස්සය පච්චයා ඣානෙ සත්ත"

(13) මග්ගසභාගයෙහි සකල මාර්ගප්‍රත්‍යයධර්මයෝ - "නිස්සය පච්චයා මග්ගෙ සත්ත"

(14) සම්පයුත්තසභාගයෙහි සකල සම්ප්‍රයුක්තප්‍රත්‍යයධර්මයෝ - "නිස්සයපච්චයා සම්පයුත්තෙ තීණි"

(15) විප්පයුත්තසභාගයෙහි සකල සහජාතවිප්‍රයුක්ත පුරේජාත විප්‍රයුක්ත ධර්මයෝ - "නිස්සයපච්චයා විප්පයුත්තෙ පඤ්ච"

Non-commercial distribution

(16. 17) අත්ථිසභාගයෙහි සකල සහජාතනිඃශ්‍රය පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යයධර්මයෝ- "නිස්සයපච්චයා අත්ථියා තෙරස" අවිගතය ද ඒ සේ ය.

සටනා

සභාගයන්ට අනතුරුව සටනාවන් වදළ සේක. එහි මිස්සක සටනා ය, පකිණ්ණක සටනා ය, සහජාත සටනා ය යි සටනා තුන් කොටසකි. අත්ථි අවිගත සටනාව ය, සාධිපති සටනාව ය, සඉන්ද්‍රිය සටනාව ය, සවිප්පයුත්ත සටනාව ය, සාධිපතිවිප්පයුත්ත සටනාව ය, සඉන්ද්‍රිය විප්පයුත්ත සටනාව ය යි මිශ්‍රක සටනා සයෙකි.

(1) එයින් අත්ථි අවිගත සටනාව මෙ සේ ය. සකලසහජාත-නිඃශ්‍රය පුරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යය ධර්මයෝ- "නිස්සය අත්ථි අවිගත න්ති තෙරස"

(2) සාධිපති සටනාව මෙසේ ය. සකල සහජාතාධිපති ප්‍රත්‍යය ධර්මයෝ ය, ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්නජවන පසට -පෙ- හෘදයවස්තුව වූ වස්තවාරම්මණප්‍රත්‍යය ය යන මොවුහු "නිස්සය අධිපති අත්ථි අවිගතන්ති අට්ඨ"

(3) සඉන්ද්‍රියසටනාව මෙ සේ ය. සකල සහජාතේන්ද්‍රිය පුරේජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝ - "නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති සත්ත"

(4) සවිප්පයුත්තසටනාව මෙ සේ ය. සකල සහජාතනිඃශ්‍රය පුරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යය ධර්මයෝ -"නිස්සය විප්පයුත්ත අත්ථි අවිගත න්ති පඤ්ච.

(5) සාධිපතිවිප්පයුත්තසටනාව මෙ සේ ය. සාධිපතිචිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන අධිපතිධර්ම තුන සතර අතුරෙන් එක එකක් වූ සහජාතාධිපතිප්‍රත්‍යය ය, ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවන -පෙ- හෘදයවස්තුව වූ වස්තවාරම්මණප්‍රත්‍යය ය යන මොවුහු "නිස්සය අධිපති විප්පයුත්ත අත්ථි අවිගතන්ති චත්තාරි"

(6) සඉන්ද්‍රිය විප්පයුත්තසටනාව මෙ සේ ය. චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රියධර්ම අට වූ සහජාතේන්ද්‍රිය ප්‍රත්‍යය- "නිස්සය ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි"

පුරේජාතවිප්පයුත්ත අත්ථි අවිගත සටනාව ය, සාරම්මණසටනාව ය, සාරම්මණාධිපති උපනිස්සය සටනාව ය, සඉන්ද්‍රියසටනාව ය යි ප්‍රකීර්ණක සටනා සතරෙකි.

Non-commercial distribution

(1) පුරේජාතවිප්පයුත්ත අත්ථි අවිගත ඝටනාව මෙ සේ ය. සකලපුරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යධර්මයෝ - "නිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගතන්ති තිණි"

(2) සාරම්මණඝටනාව මෙ සේ ය. මනෝද්වාරාවර්ජන මරණාසන්නජවන තදාරම්මණයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස් වන චිත්තය හා උපන් හෘදයවස්තුව වූ වස්ත්වාරම්මණ ප්‍රත්‍යය- "නිස්සය ආරම්මණ පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං."

(3) සාරම්මණ අධිපති උපනිස්සය ඝටනාව මෙ සේ ය. ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්නජවන -පෙ- ගරු කළ යුතු හෘදයවස්තුව වූ වස්ත්වාරම්මණප්‍රත්‍යය - 'නිස්සය ආරම්මණ අධිපති උපනිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං,"

(4) සඉන්ද්‍රියඝටනාව මෙ සේ ය. පඤ්චවිඥානයන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තුසඞ්ඛ්‍යාත පුරේජාතේන්ද්‍රිය ප්‍රත්‍යය- 'නිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං'

ප්‍රකීර්ණකඝටනාවන්ට අනතුරු ව සහජාත ඝටනාවන් වදාළ සේක. (ඝටනා දසය සහජාත ප්‍රත්‍යයෙහි මෙන් විස්තර කරනු.) මෙහි සභාගවාර සතොළොසකි. ඝටනා විස්සකි.

## 9. උපනිඃශ්‍රය මිශ්‍රක පාළිය.

උපනිස්සයපච්චයා ආරම්මණෙ සත්ත, අධිපතියා සත්ත, අනන්තරෙ සත්ත, සමනන්තරෙ සත්ත, නිස්සයෙ එකං, පුරෙජාතෙ එකං, ආසෙවනෙ තීණි, කම්මෙ ද්වෙ, විප්පයුත්තෙ එකං, අත්ථියා එකං, නත්ථියා සත්ත, විගතෙ සත්ත, අවිගතෙ එකං.

උපනිස්සය ආරම්මණාධිපතී ති සත්ත, උපනිස්සය ආරම්මණාධිපති පුරෙජාත අත්ථි අවිගතන්ති එකං, උපනිස්සය ආරම්මණාධිපති නිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං උපනිස්සය අනන්තර සමනන්තර නත්ථි විගතන්ති සත්ත, උපනිස්සය අනන්තර සමනන්තර ආසෙවන නත්ථි විගතන්ති තීණි, උපනිස්සය කම්මන්ති ද්වෙ, උපනිස්සය අනන්තර සමනන්තර කම්ම නත්ථි විගත න්ති එකං.

## සන්නය.

නිඃශ්‍රයමිශ්‍රකයට අනතුරු ව උපනිඃශ්‍රයමිශ්‍රකය වදාළ සේක. එ ද සභාග ඝටනා වශයෙන් දෙවැදෑරුම් වේ. උපනිස්සයමූලක ආරම්මණසභාගය

Non-commercial distribution

ය, අධිපතිසභාගය ය, අනන්තරසභාගය ය, සමනන්තර සභාගය ය, නිස්සය සභාගයය, පුරේජාත සභාගය ය, ආසේවන සභාගය ය, කම්ම සභාගය ය, විප්පයුත්ත සභාගය ය, අත්ථි සභාගය ය, නත්ථි සභාගය ය, විගත සභාගය ය, අවිගත සභාගය යයි සභාගවාර තෙළෙසකි.

(1) එයින් උපනිස්සයමූලක ආරම්මණසභාගයෙහි සකලාරම්මණෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ධර්‍මයෝ- "උපනිස්සයපච්චයා ආරම්මණෙ සත්ත.'

(2) අධිපති සභාගයෙහි සකලාරම්මණාධිපතිප්‍රත්‍යය ධර්‍මයෝ- "උපනිස්සයපච්චයා අධිපතියා සත්ත."

(3) අනන්තර සභාගයෙහි සකලානන්තරෝප නිඃශ්‍රය ප්‍රත්‍යය ධර්‍මයෝ- "උපනිස්සයපච්චයා අනන්තරෙ සත්ත." සමනන්තරය ද එ සේ ය.

(5) නිස්සයසභාගයෙහි ගරු කොට අරමුණු කරන ලෝභ මූල මරණාසන්න -පෙ- ගරු කළ යුතු හෘදයවස්තුව වූ වස්තවාරම්මණප්‍රත්‍යය- "උපනිස්සය පච්චයා නිස්සයෙ එකං"

(6) පුරේජාතසභාගයෙහි ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ඉෂ්ට නිෂ්පන්නරූප අටළොස වූ ආරම්මණපුරේජාත ප්‍රත්‍යය ධර්‍මයෝ- "උපනිස්සයපච්චයා පුරෙජාතෙ එකං"

(7) ආසේවනසභාගයෙහි සකලාසේවනප්‍රත්‍යය ධර්‍මයෝ- "උපනිස්සයපච්චයා ආසෙවනෙ තීණි"

(8) කම්මසභාගයෙහි විපාකසිත් සතිසට ප්‍රත්‍යය වන බලවත් වූ කුශලාකුශල චේතනාවෝ-"උපනිස්සයපච්චයා කම්මෙ ද්වෙ"

(9) විප්පයුත්තසභාගයෙහි ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න -පෙ- හෘදයවස්තුව වූ වස්තවාරම්මණ ප්‍රත්‍යය- "උපනිස්සයපච්චයා විප්පයුත්තෙ එකං"

(10) අත්ථි සභාගයෙහි ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ඉෂ්ට නිෂ්පන්නරූප අටළොස- "උපනිස්සය පච්චයා අත්ථියා එකං"

(11. 12. 13.) නත්ථිසභාගයෙහි සකලානන්තරෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ධර්‍මයෝ- "උපනිස්සයපච්චයා නත්ථියා සත්ත" විගත සභාගය ද එ සේය. අවිගතසභාගය අත්ථිසභාගය මෙනි.

Non-commercial distribution

## ඝටනා

සභාගයන්ට අනතුරු ව ඝටනාවන් වදාළ සේක. ආරම්මණාධිපති ඝටනාව ය, සපුරේජාත අත්ථි අවිගත ඝටනාව ය, සනිස්සය පුරේජාත විප්පයුත්ත අත්ථි අවිගත ඝටනාව ය, අනන්තර සමනන්තර නත්ථි විගත ඝටනාව ය, ආසේවන ඝටනාව ය, කම්ම ඝටනාව ය: අනන්තර සමනන්තර නත්ථි විගත ඝටනාව යයි උපනිඃශ්‍රයප්‍රත්‍යය ඝටනා සතෙකි.

(1) එයින් ආරම්මණ අධිපති ඝටනාව මෙ සේ ය: සකලාරම්මණෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ධර්මයෝ- "උපනිස්සය ආරම්මණාධිපති ති සත්ත"

(2) සපුරේජාත අත්ථි අවිගත ඝටනාව මෙසේ ය: ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ ඉෂ්ට නිෂ්පන්නරූප අටොළොස වූ ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය ධර්මයෝ "උපනිස්සය ආරම්මණාධිපති පුරෙජාත අත්ථි අවිගතන්ති එකං"

(3) සනිස්සය පුරේජාත විප්පයුත්ත අත්ථි අවිගත ඝටනාව මෙසේ ය:- ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවන -පෙ- හෘදයවස්තුව වූ වස්තුවාරම්මණප්‍රත්‍යය "උපනිස්සය ආරම්මණාධිපති නිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං"

(4) අනන්තර සමනන්තර නත්ථි විගත ඝටනාව මෙසේ ය: සකලානන්තරෝපනිඃශ්‍රය ප්‍රත්‍යය ධර්මයෝ- "උපනිස්සය අනන්තර සමනන්තර නත්ථි විගතන්ති සත්ත"

(5) ආසේවන ඝටනාව මෙසේ ය: සකලාසේවන ප්‍රත්‍යය ධර්මයෝ- 'උපනිස්සය අනන්තර සමනන්තර ආසේවන නත්ථි විගතන්ති තීණි"

(6) කම්ම ඝටනාව මෙසේ ය: විපාක සිත් සතිසට ප්‍රත්‍යය වන බලවත් වූ කුශලාකුශල චේතනා සංඛ්‍යාත නානාක්ෂණික කර්ම ප්‍රත්‍යය ධර්මයෝ උපනිස්සය කම්ම න්ති ද්වෙ.

(7) අනන්තර සමනන්තර නත්ථි විගත ඝටනාව මෙසේ ය. මාර්ගානන්තර ඵල සිත් සතරට ප්‍රත්‍යය වන මාර්ග චේතනා සතර "අනන්තර සමනන්තර කම්ම නත්ථි විගතන්ති එකං" මෙහි සභාගවාර තෙළෙසෙකි. ඝටනා සතකි.

## 10 පුරේජාත මිශ්‍රකයේ පාළිය

පුරෙජාතපච්චයා ආරම්මණෙ තීණි, අධිපතියා එකං, නිස්සයෙ තීණි, උපනිස්සයෙ එකං, ඉන්ද්‍රියෙ එකං, විප්පයුත්තෙ තීණි, අත්ථියා තීණි,

Non-commercial distribution

අවිගතෙ තීණි. පුරේජාතෙ අත්ථි අවිගතන්ති තීණි, පුරේජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, පුරෙජාත ආරම්මණ අත්ථි අවිගත න්ති තීණි, පුරෙජාත ආරම්මණ නිස්සය විප්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි, පුරෙජාත ආරම්මණාධිපති උපනිස්සය අත්ථි අවිගත න්ති එකං, පුරෙජාත ආරම්මණාධිපති නිස්සය උපනිස්සය විප්පයුත්ත අත්ථි අවිගත න්ති එකං, පුරෙජාත නිස්සය ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං'

## සන්නය

උපනිඃශ්‍රය මිශ්‍රකයට අනතුරුව පුරේජාත මිශ්‍රකය වදළසේක. එද සභාග ඝටනා වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් සභාගයන් පළමු කොට වදළ සේක. පුරේජාතමූලක ආරම්මණ සභාගය ය, අධිපති සභාගය ය, නිස්සය සභාගය ය, උපනිස්සය සභාගය ය, ඉන්ද්‍රිය සභාගය ය, විප්පයුත්ත සභාගය ය, අත්ථි සභාගය ය අවිගත සභාගයයි සභාගවාර අටෙකි.

(1) එයින් පුරේජාතමූලක ආරම්මණ සභාගයෙහි සකලාරම්මණ පුරේජාත ප්‍රත්‍යය ධර්‍මයෝ - පුරේජාත පච්චයා ආරම්මණෙ තීණි"

(2) අධිපති සභාගය මෙසේය: ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන වර්‍තමාන ඉෂ්ටනිෂ්පන්නරූප අටළොස වූ ආරම්මණපුරේජාතප්‍රත්‍යය- "පුරෙජාතපච්චයා අධිපතියා එකං"

(3) නිස්සය සභාගයෙහි සකලපුරේජාතනිඃශ්‍රය ප්‍රත්‍යය ධර්‍මයෝ "පුරෙජාත පච්චයා නිස්සයෙ තීණි."

(4) උපනිස්සය සභාගයෙහි, (අධිපතිය මෙනි) පුරෙජාතපච්චයා උපනිස්සයෙ එකං"

(5) ඉන්ද්‍රිය සභාගයෙහි සකලපුරේජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ධර්‍මයෝ "උපනිස්සය පච්චයා ඉන්ද්‍රියෙ එකං"

(6) විප්‍රයුක්ත සභාගයෙහි සකල පුරේජාත විපයුක්ත ප්‍රත්‍යය ධර්‍මයෝ- "පුරේජාත පච්චයා විප්පයුත්තෙ තීණි"

(7) අත්ථි සභාගයෙහි සකලාරම්මණපුරේජාත වස්තු පුරේජාත ප්‍රත්‍යය ධර්‍මයෝ- "පුරෙජාතපච්චයා අත්ථියා තීණි" (8) අවිගත සභාගය අත්ථි සභාගය මෙනි.

Non-commercial distribution

## ඝටනා.

සභාගයන්ට අනතුරුව ඝටනාවන් වදළ සේක. අත්‍ථි අවිගත ඝටනාව ය, සනිස්සය විප්පයුත්ත ඝටනාව ය, සාරම්මණ ඝටනාවය, සාරම්මණ නිස්සය විප්පයුත්ත ඝටනාවය, සාරම්මණ අධිපති උපනිස්සය ඝටනාවය, සාරම්මණාධිපති නිස්සය උපනිස්සය විප්පයුත්ත ඝටනාවය, සනිස්සය ඉන්‍ද්‍රිය විප්පයුත්ත ඝටනාව යයි පුරේජාත ප්‍රත්‍යය ඝටනා සතෙකි.

(1) එයින් අත්‍ථි අවිගත ඝටනාව මෙසේ ය: සකලාරම්මණ පුරේජාත වස්තුපුරේජාත ප්‍රත්‍යය ධර්‍මයෝ- "පුරෙජාත අත්‍ථි අවිගත න්ති තීණි"

(2) සනිස්සය විප්පයුත්ත ඝටනාව මෙසේ ය: සකලවස්තු පුරේජාත ප්‍රත්‍යය ධර්‍මයෝ- "පුරෙජාත නිස්සය විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති තීණි"

(3) සාරම්මණඝටනාව මෙසේ ය: සකලාරම්මණ පුරේජාත ප්‍රත්‍යය ධර්‍මයෝ- "පුරේජාත ආරම්මණ අත්‍ථි අවිගතන්ති තීණි"

(4) සාරම්මණ නිස්සය විප්පයුත්ත අත්‍ථි අවිගත ඝටනාව මෙසේ ය: වස්ත්වාරම්මණ ප්‍රත්‍යය- "පුරෙජාත ආරම්මණ නිස්සය විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං"

(5) සාරම්මණාධිපති උපනිස්සය ඝටනාව මෙසේ ය: ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු වූ ඉෂ්ට නිෂ්පන්න රූප අටොළොස වූ ආරම්මණපුරේජාත ප්‍රත්‍යය ධර්‍මයෝ - පුරේජාත ආරම්මණ අධිපති උපනිස්සය අත්‍ථි අවිගතන්ති එකං"

(6) සාරම්මණාධිපති නිස්සය උපනිස්සය විප්පයුත්ත ඝටනාව මෙසේ ය: ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන -පෙ- හෘදයවස්තුව වූ වස්ත්වාරම්මණප්‍රත්‍යය- "පුරෙජාත ආරම්මණාධිපති නිස්සය උපනිස්සය විප්පයුත්ත අත්‍ථි අවිගත න්ති එකං"

(7) සනිස්සය ඉන්‍ද්‍රිය විප්පයුත්ත ඝටනාව මෙසේ ය: සකල පුරේජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ධර්‍මයෝ- "පුරෙජාත නිස්සය ඉන්‍ද්‍රිය විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති එකං" මෙහි සභාග වාර අටක් හා ඝටනා සතක් ද වෙති.

Non-commercial distribution

## 11. පශ්චාජ්ජාත මිශ්‍රක පාලිය

පච්ඡාජාතපච්චයා විප්පයුත්තෙ තීණි, අත්ථියා තීණි, අවිගතෙ තීණි, පච්ඡාජාත විප්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි.

සන්නය.

පුරේජාත මිශ්‍රකයට අනතුරු ව පශ්චාජ්ජාතමිශ්‍රකය වදාළ සේක. එද සභාග ඝටනා වශයෙන් දෙවැදෑරුම් වේ. එහි පච්ඡාජාත මූලක විප්පයුත්ත සභාගය ය, අත්ථි සභාගය ය, අවිගත සභාගය යි වාර තුනෙකි.

(1) පච්ඡාජාතමූලක විප්පයුත්ත සභාගයෙහි සකල පශ්චාජ්ජාත ප්‍රත්‍යය ධර්මයෝ- "පච්ඡාජාතපච්චයා විප්පයුත්තෙ තීණි"

(2. 3.) අත්ථියා තීණි, අවිගතෙ තීණි,

ඝටනාව.

එහි එක් ඝටනාවෙකි. ඒ මෙසේ ය: සකල පශ්චාජ්ජාත ප්‍රත්‍යය ධර්මයෝ- "පච්ඡාජාත විප්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි"

## 12. ආසේවන මිශ්‍රක පාලිය.

ආසෙවනපච්චයා අනන්තරෙ තීණි, සමනන්තරෙ තීණි, උපනිස්සයෙ තීණි, නත්ථියා තීණි, විගතෙ තීණි,

ආසෙවන අනන්තර සමනන්තර උපනිස්සය නත්ථි විගත න්ති තීණි,

සන්නය.

පශ්චාජ්ජාතමිශ්‍රකයට අනතුරු ව ආසේවනමිශ්‍රකය වදාළ සේක. එද සභාග ඝටනා වශයෙන් දෙවැදෑරුම් වේ. එහි ආසේවන මූලක අනන්තර සභාගය ය, සමනන්තර සභාගය ය, උපනිස්සය සභාගය ය, නත්ථි සභාගය ය, විගත සභාගය ය යි සභාග වාර පසෙකි.

ආසේවන මූලක අනන්තරසභාගයෙහි සකලාසේවන ප්‍රත්‍යය ධර්මයෝ - "ආසෙවන පච්චයා අනන්තරෙ තීණි" සමනන්තර සභාගාදිය ද එසේ ම ය. ඝටනා එකකි. සකලාසේවනප්‍රත්‍යය ධර්මයෝ- "ආසෙවන අනන්තර සමනන්තර උපනිස්සය නත්ථි විගතන්ති තීණි"

## 13. කර්ම මිශ්‍රක පාලිය.

කම්මපච්චයා අනන්තරෙ එකං, සමනන්තරෙ එකං, සහජාතෙ සත්ත, අඤ්ඤමඤ්ඤෙ තීණි, නිස්සයෙ සත්ත, උපනිස්සයෙ ද්වෙ, විපාකෙ එකං, ආහාරෙ

Non-commercial distribution

සත්ත, සම්පයුත්තෙ තීණි, විප්පයුත්තෙ තීණි, අත්ථියා සත්ත, නත්ථියා එකං, විගතෙ එකං, අවිගතෙ සත්ත.

කම්ම උපනිස්සයන්ති, ද්වෙ, කම්ම අනන්තර සමනන්තර උපනිස්සය නත්ථි විගතන්ති එකං,

කම්ම සහජාත නිස්සය ආහාර අත්ථි අවිගත න්ති සත්ත, කම්ම සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ආහාර අත්ථි අවිගත න්ති තීණි, කම්ම සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ආහාර සම්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි, කම්ම සහජාත නිස්සය ආහාර විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි,

කම්ම සහජාත නිස්සය විපාක ආහාර අත්ථි අවිගත න්ති එකං, කම්ම සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර අත්ථි අවිගත න්ති එකං, කම්ම සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර සම්පයුත්ත අත්ථි අවිගත න්ති එකං, කම්ම සහජාත නිස්සය විපාක ආහාර විප්පයුත්ත අත්ථි අවිගත න්ති එකං, කම්ම සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර විප්පයුත්ත අත්ථි අවිගත න්ති එකං.

## සන්නය.

ආසේවන මිශ්‍රකයට අනතුරු ව කර්‍මමිශ්‍රකය වදළ සේක. එ ද සභාග ඝටනා වශයෙන් දෙවැදෑරුම් වේ. එහි කම්මමූලක අනන්තර සභාගය ය, සමනන්තර සභාගය ය, සහජාත සභාගය ය, අඤ්ඤමඤ්ඤ සභාගය ය, නිස්සය සභාගය ය, උපනිස්සය සභාගය ය. ආහාර සභාගය ය, සම්පයුත්ත සභාගය ය, විප්පයුත්ත සභාගය ය, අත්ථි සභාගය ය, නත්ථි සභාගය ය, විගත සභාගය ය, අවිගත සභාගය යයි සභාගවාර තුදුසෙකි.

(1.) කම්මමූලක අනන්තර සභාගයෙහි මාර්‍ගානන්තර ඵලචිත්තයන්ට ප්‍රත්‍යය වන මාර්‍ග චේතනා සතර- "කම්මපච්චයා අනන්තරෙ එකං" (2.) සමනන්තරසභාගය ද එ සේ ය.

(3.) සහජාත සභාගයෙහි සකල සහජාත කර්‍ම ප්‍රත්‍යය කම්මපච්චයා සහජාතෙ සත්ත"

(4.) අඤ්ඤමඤ්ඤ සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන චේතනාව - කම්මපච්චයා අඤ්ඤමඤ්ඤෙ තීණි"

(5.) නිස්සයසභාගය සහජාත සභාගය මෙනි. (6.) උප නිස්සය සභාගයෙහි විපාක සිත් සතිසට ප්‍රත්‍යය වන බලවත් වූ කුශලා කුසල චේතනාවෝ - කම්මපච්චයා උපනිස්සයෙ ද්වෙ"

Non-commercial distribution

(7.) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ද ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන විපාකචේතනාවෝ -"කම්ම පච්චයා විපාකෙ එකං"

(8.) ආහාර සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ද ප්‍රත්‍යය වන චේතනාව "කම්මපච්චයා ආහාරෙ සත්ත"

(9.) සම්පයුත්තසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන චේතනාව "කම්මපච්චයා සම්පයුත්තෙ තීණි"

(10.) විප්පයුත්තසභාගයෙහි චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන චේතනාව - කම්මපච්චයා විප්පයුත්තෙ තීණි"

(11.) අත්ථිසභාගයෙහි සකලසහජාතකර්මප්‍රත්‍යය:- "කම්මපච්චයා අත්ථියා සත්ත"

(12.) නත්ථිසභාගයෙහි මාර්ගානන්තර ඵලචිත්තයන්ට ප්‍රත්‍යය වන මාර්ගචේතනා සතර- "කම්මපච්චයා නත්ථියා එකං"

(13. 14.) විගතසභාගය ද එසේ ය. අවිගතසභාගය නත්ථි සභාගය මෙනි.

සටනා

සභාගයන්ට අනතුරු ව සටනාවන් වදාළ සේක. පකිණ්ණක සටනා ය, සහජාත සටනායයි එහි සටනා දෙකොටසෙකි. එයින් පකිණ්ණකසට නාවෝ පළමු කොට වදරන ලදහ. උපනිස්සය සටනාව ය, අනන්තර සමනන්තර උපනිස්සය නත්ථි විගත සටනාව ය යි පකිණ්ණක සටනා දෙකකි.

(1.) එයින් උපනිස්සයසටනාව මෙසේ ය. විපාක සිත් සතිසට ප්‍රත්‍යය වන බලවත් වූ කුශලා කුශල චේතනාවෝ- "කම්ම උපනිස්සය නති ද්වෙ"

(2.) අනන්තර සමනන්තර උපනිස්සය නත්ථි විගත සටනාව මෙසේය: මාර්ගානන්තර ඵලසිත් සතරට ප්‍රත්‍යය වන මාර්ගචේතනා සතර- "කම්ම අනන්තර සමනන්තර උපනිස්සය නත්ථි විගත නති එකං"

පකිණ්ණකසටනාවන්ට අනතුරුව සහජාතසටනාවන් වදාළ සේක. අවිපාක සවිපාක වශයෙන් සහජාත සටනා දෙකොටසෙකි. සබ්බට්ඨානික

Non-commercial distribution

සචේතනාව ය, සඅඤ්ඤමඤ්ඤ සචේතනාව ය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත සචේතනාව ය, සවිප්පයුත්ත සචේතනාව යයි අවිපාක සචේතනා සතරෙකි.

(1.) එයින් සබ්බට්ඨානිකසචේතනාව මෙසේ ය. සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන චේතනාව- "කම්මසහජාත නිස්සය ආහාර අත්ථි අවිගත නති සත්ත"

(2.) සඅඤ්ඤමඤ්ඤ සචේතනාව මෙසේ ය, සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදය වස්තුවට ප්‍රත්‍යය වන චේතනාව- "කම්ම සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ආහාර අත්ථි අවිගත නති තීණි"

(3.) සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත සචේතනාව මෙසේ ය. සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන චේතනාව - කම්ම සහජාත නිස්සය ආහාර විප්පයුත්ත අත්ථි අවිගත නති තීණි"

(4.) සවිප්පයුත්ත සචේතනාව මෙසේ ය, චිත්තජ රූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන චේතනාව- "කම්ම සහජාත නිස්සය ආහාර විප්පයුත්ත අත්ථි අවිගත නති තීණි"

සබ්බට්ඨානිකසචේතනාව ය, ස අඤ්ඤමඤ්ඤ සචේතනාව ය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත සචේතනාව ය, සවිප්පයුත්ත සචේතනාව ය, සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත සචේතනාව ය යි සවිපාක සචේතනා පසෙකි.

(1.) එයින් සබ්බට්ඨානික සචේතනාව මෙසේ ය: සම්පයුත්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාක චේතනාව "කම්මසහජාත නිස්සය විපාක ආහාර අත්ථි අවිගත නති එකං"

(2.) සඅඤ්ඤමඤ්ඤ සචේතනාව මෙසේ ය: සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන විපාක චේතනාව- "කම්මසහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර අත්ථි අවිගත නති එකං"

(3.) සඅඤ්ඤමඤ්ඤ සම්ප්‍රයුත්ත සචේතනාව මෙසේ ය: සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන විපාක චේතනාව - කම්ම සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර සම්පයුත්ත අත්ථි අවිගත නති එකං"

(4.) සවිප්පයුත්තසචේතනාව මෙසේ ය: චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක චේතනාව- කම්ම සහජාත නිස්සය විපාක ආහාර විප්පයුත්ත අත්ථි අවිගතනති එකං"

(5.) සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත සචේතනාව මෙසේ ය. හෘදයවස්තුවට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධිචේතනාව "කම්ම සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය

Non-commercial distribution

විපාක ආහාර විප්පයුත්ත අත්ථි අවිගත නති එකං" මෙහි සභාගවාර තුදුසකි. ඝටනා එකොළොසකි.

## 14. විපාක මිශ්‍රක පාලිය

විපාකපච්චයා හෙතුයා එකං, අධිපතියා එකං, සහජාතෙ එකං, අඤ්ඤමඤ්ඤෙ එකං, නිස්සයෙ එකං, කම්මෙ එකං, ආහාරෙ එකං, ඉන්ද්‍රියෙ එකං, ඣානෙ එකං, මග්ගෙ එකං, සම්පයුත්තෙ එකං, විප්පයුත්තෙ එකං, අත්ථියා එකං, අවිගතෙ එකං,

විපාක සහජාත නිස්සය අත්ථි අවිගත නති එකං, විපාක සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගත නති එකං, විපාක සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගත නති එකං, විපාක සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගත නති එකං, විපාක සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විප්පයුත්ත අත්ථි අවිගත නති එකං.

### සන්නය.

කම්මමිස්සකයට අනතුරු ව විපාක මිස්සකය වදළ සේක. එ ද සභාග ඝටනා වශයෙන් දෙවැදෑරුම් වේ. විපාකමූලක හේතු සභාගය ය, අධිපති සභාගය ය, සහජාත සභාගය ය, අඤ්ඤමඤ්ඤ සභාගය ය, නිස්සය සභාගය ය, කම්ම සභාගය ය, ආහාර සභාගය ය, ඉන්ද්‍රිය සභාගය ය, ඣානසභාග ය, මග්ගසභාගය ය, සම්පයුත්ත සභාගය ය, විප්පයුත්ත සභාගය ය, අත්ථි සභාගය ය, අවිගත සභාගය යි සභාගවාර තුදුසකි.

(1.) එයින් හේතුසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක චිත්තජ සහේතුක ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක හේතු තුන- 'විපාකපච්චයා හේතුයා එකං.'

(2.) අධිපතිසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපතිචිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන ඵලනාමස්කන්ධයන්හි ඇති අධිපතිධර්මසතර අතුරෙන් එක එකක්වූ අධිපති ප්‍රත්‍යයධර්මයෝ- 'විපාකපච්චයා අධිපතියා එකං"

(3.) සහජාතසභාගයෙහි ඔවුනොවුන්ට ද ඔවුනොවුන්ට හා චිත්තජ ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ද ප්‍රත්‍යය වන සකල විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොවුහු- "විපාකපච්චයා සහජාතෙ එකං"

(4.) අඤ්ඤමඤ්ඤසභාගයෙහි ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකලවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදයවස්තුවට ප්‍රත්‍යය

Non-commercial distribution

වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝ ය යන මොහු- "විපාක පච්චයා අඤ්ඤමඤ්ඤෙ එකං" (5.) නිස්සයසභාගය සහජාත සභාගය මෙනි.

(6.) කම්මසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකයන්හි චේතනාව- "විපාකපච්චයා කම්මෙ එකං."

(7.) සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකනාමාහාරයෝ - 'විපාකපච්චයා ආහාරෙ එකං.'

(8.) ඉන්ද්‍රිය සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකයන්හි ඇති නාමේන්ද්‍රිය ධර්මයෝ "විපාකපච්චයා ඉන්ද්‍රියෙ එකං"

(9.) සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකයන්හි ධ්‍යානාඞ්ග ධර්මයෝ "විපාකපච්චයා ඣානෙ එකං."

(10) මග්ගසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකචිත්තයන්හි මාර්ගාඞ්ග ධර්මයෝ- "විපාකපච්චයා මග්ගෙ එකං"

(11) සම්පයුත්තසභාගයෙහි ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන. සකලවිපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ "විපාකපච්චයා සම්පයුත්තෙ එකං"

(12) විප්පයුත්තසභාගයෙහි චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ - "විපාකපච්චයා විප්පයුත්තෙ එකං"

(13. 14) අත්ථිසභාග විගතසභාග දෙක සහජාත සභාගය මෙනි.

සඨනා

සභාගයන්ට අනතුරු ව ඝටනාවන් වදාළ සේක. සබ්බට්ඨානික ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව ය, සවිප්පයුත්ත ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත ඝටනාවය යි ඝටනා පසෙකි. සවිපාක සහජාත ඝටනාවන් අනුව විස්තර කරනු.

15. ආහාර මිශ්‍රක පාලිය.

ආහාරපච්චයා අධිපතියා සත්ත, සහජාතෙ සත්ත, අඤ්ඤමඤ්ඤෙ තීණි. නිස්සයෙ සත්ත, කම්මෙ සත්ත, විපාකෙ එකං,ඉන්ද්‍රියෙ සත්ත, සම්පයුත්තෙ තීණි, විප්පයුත්තෙ තීණි, අත්ථියා සත්ත, අවිගතෙ සත්ත,

Non-commercial distribution

ආහාර අත්ථි අවිගත නත්ති සත්ත.

ආහාර සහජාත නිස්සය අත්ථි අවිගත නත්ති සත්ත, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගතනත්ති තීණි, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගත නත්ති තීණි, ආහාර සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතනත්ති තීණි.

ආහාර සහජාත නිස්සය විපාක අත්ථි අවිගතනත්ති එකං. ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගතනත්ති එකං, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත අත්ථි අවිගතනත්ති එකං, ආහාර සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගත නත්ති එකං, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගත නත්ති එකං.

ආහාර සහජාත නිස්සය කම්ම අත්ථි අවිගතනත්ති සත්ත, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය කම්ම අත්ථි අවිගතනත්ති තීණි, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය කම්ම සම්පයුත්ත අත්ථි අවිගතනත්ති තීණි, ආහාර සහජාත නිස්සය කම්ම විප්පයුත්ත අත්ථි අවිගතනත්ති තීණි.

ආහාර සහජාත නිස්සය කම්ම විපාක අත්ථි අවිගත නත්ති එකං, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය කම්ම විපාක අත්ථි අවිගත නත්ති එකං, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය කම්ම විපාක සම්පයුත්ත අත්ථි අවිගත නත්ති එකං, ආහාර සහජාත නිස්සය කම්ම විපාක විප්පයුත්ත අත්ථි අවිගත නත්ති එකං, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය කම්ම විපාක විප්පයුත්ත අත්ථි අවිගත නත්ති එකං.

ආහාර සහජාත නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගත නත්ති සත්ත, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගත නත්ති තීණි, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගත නත්ති තීණි, ආහාර සහජාත නිස්සය ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත නත්ති තීණි.

ආහාර සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගත නත්ති එකං, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගත නත්ති එකං, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගත නත්ති එකං, අහාර සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත නත්ති එකං, ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත නත්ති එකං.

Non-commercial distribution

ආහාරාධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය අත්‍ථි අවිගත න්‍ති සත්‍ත, ආහාරාධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය සම්පයුත්‍ත අත්‍ථි අවිගත න්‍ති තීණි, ආහාරාධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය විප්පයුත්‍ත අත්‍ථි අවිගත න්‍ති තීණි.

ආහාරාධිපති සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය අත්‍ථි අවිගතන්‍ති එකං, ආහාරාධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය සම්පයුත්‍ත අත්‍ථි අවිගත න්‍ති එකං. ආහාරාධිපති සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය විප්පයුත්‍ත අත්‍ථි අවිගතන්‍ති එකං.

සත්‍තය.

විපාකමිශ්‍රකයට අනතුරු ව ආහාරමිශ්‍රකය වදාළ සේක. එ ද සභාග සටනා වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් සභාගවාරය පළමු කොට වදාළ සේක. එහි ආහාරමූලක අධිපති සභාගය ය, සහජාත සභාගයය, අඤ්ඤමඤ්ඤ සභාගය ය, නිස්සය සභාගය ය, කම්ම සභාගය ය, විපාක සභාගය ය, ඉන්ද්‍රිය සභාගය ය, සම්පයුත්‍ත සභාගය ය, විප්පයුත්‍ත සභාගය ය, අත්‍ථි සභාගය ය, අවිගත සභාගය ය යි සභාගවාර එකොළොසෙකි.

(1.) එයින් ආහාරමූලක අධිපති සභාගයෙහි සම්ප්‍රයුක්‍ත ස්‍කන්‍ධ සාධිපති චිත්‍තජරූපයන්ට ප්‍රත්‍යය වන චිත්‍තාධිපතිය- "ආහාරපච්චයා අධිපතියා සත්‍ත"

(2.) සහජාත සභාගයෙහි සම්ප්‍රයුක්‍තසකන්‍ධ චිත්‍තජරූප ප්‍රතිසන්‍ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන ඵස්ස චේතනා විඤ්ඤාණ යන නාමාහාරයෝ- "ආහාරපච්චයා සහජාතෙ සත්‍ත"

(3.) සම්ප්‍රයුක්‍තස්‍කන්‍ධයන්ට ද සම්ප්‍රයුක්‍තස්‍කන්‍ධයන්ට හා හෘදයවස්‍තුවට ද ප්‍රත්‍යය වන නාමාහාර තුන- "ආහාරපච්චයා අඤ්ඤමඤ්ඤෙ තීණි" (4.) නිස්සය සභාගය සහජාතනිස්සය ය මෙනි.

(5.) කම්මසභාගයෙහි සකල සහජාතකර්මප්‍රත්‍යය ධර්මයෝ- "ආහාරපච්චයා කම්මෙ සත්‍ත"

(6.) විපාකසභාගයෙහි සම්ප්‍රයුක්‍තස්‍කන්‍ධ චිත්‍තජරූප ප්‍රතිසන්‍ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක නාමාහාර තුන - "ආහාර පච්චයා විපාකෙ එකං"

Non-commercial distribution

(7.) ඉන්‍ද්‍රිය සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන මනින්ද්‍රියය - "ආහාරපච්චයා ඉන්‍ද්‍රියෙ සත්ත"

(8.) සම්පයුත්තසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන නාමාහාරයෝ- "ආහාරපච්චයා සම්පයුත්තෙ තීණි"

(9.) විප්පයුත්තසභාගයෙහි චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමාහාරයෝ "ආහාරපච්චයා විප්පයුත්තෙ තීණි"

(10.) අත්‍ථිසභාගයෙහි සකල නාමාහාර ප්‍රත්‍යය ධර්මයෝ- "ආහාරපච්චයා අත්‍ථියා සත්ත"

(11.) අවිගතය ද එසේ ම ය.

ඝටනා

සභාගවාරයට අනතුරු ව ඝටනාවාරය වදාළ සේක. එය මිස්සකඝටනා සහජාතඝටනා වසයෙන් දෙවැදෑරුම් වේ. මිශ්‍රක ඝටනා එකකි. එය මෙ සේ ය: සකල නාමාහාර රූපාහාර ප්‍රත්‍යය ධර්මයෝ "ආහාර අත්‍ථි අවිගතන්ති සත්ත"

එයට අනතුරු ව සහජාතඝටනා වාරය වදාළ සේක. සාමඤ්ඤ-ඝටනාවාරය ය, සකම්මඝටනා වාරය ය, සඉන්ද්‍රියඝටනා වාරය ය, සාධිපතිඝටනා වාරය යි එහි වාර සතරක් ඇත්තේ ය. එයින් සාමඤ්ඤ ඝටනා වාරය පළමු කොට වදාළ සේක. එහි අවිපාක සවිපාක වශයෙන් ඝටනා දෙකොටසෙකි. එයින් අවිපාක ඝටනා වාරය පළමු කොට වදාළ සේක. සබ්බට්ඨානික ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව ය, සවිප්පයුත්ත ඝටනාව ය යි අවිපාකඝටනා සතරෙකි.

(1.) එයින් සබ්බට්ඨානිකඝටනාව මෙ සේ ය: සම්ප්‍රයුක්ත ස්කන්ධචිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමාහාරයෝ- "ආහාර සහජාත නිස්සය අත්‍ථි අවිගතන්ති සත්ත"

(2.) සඅඤ්ඤසඤ්ඤ ඝටනාව මෙ සේ ය: සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන නාමාහාර තුන- "ආහාරසහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්‍ථි අවිගතන්ති තීණි"

(3.) සඅඤ්ඤමඤ්ඤ සම්ප්‍රයුත්ත ඝටනාව මෙ සේ ය: සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන නාමාහාර තුන- "ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්‍ථි අවිගතන්ති තීණි"

Non-commercial distribution

(4.) සවිප්පයුත්තඝටනාව මෙ සේ ය: චිත්තජරූප ප්‍රතිසන්ධි-කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන නාමාහාර තුන-"ආහාර සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි"

මේ අවිපාක ඝටනා සතර ය.

අවිපාකඝටනාවන්ට අනතුරු ව සවිපාකඝටනාවන් වදළසේක. සබ්බට්ඨානික ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව ය, සවිප්පයුත්ත ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත ඝටනාව ය යි සවිපාක ඝටනා පසෙකි.

(5.) එයින් සබ්බට්ඨානික ඝටනාව මෙ සේ ය: සම්ප්‍රයුක්ත ස්කන්ධචිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකනාමාහාර තුන - "ආහාර සහජාත නිස්සය විපාක අත්ථි අවිගතන්ති ඒකං"

(6.) සඅඤ්ඤමඤ්ඤ ඝටනාව මෙසේ ය: සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන විපාකනාමාහාර තුන- "ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගතන්ති ඒකං"

(7.) සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව මෙ සේ ය: සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන විපාක නාමාහාර තුන- "ආහාරසහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත අත්ථි අවිගතන්ති ඒකං"

(8.) සවිප්පයුත්ත ඝටනාව මෙසේ ය: චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමහාර තුන- "ආහාර සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති ඒකං"

(9.) සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත ඝටනාව මෙසේ ය: හෘදයවස්තුවට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධිනාමාහාර තුන- "ආහාර සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති ඒකං" මේ සවිපාක ඝටනා පස ය.

සාමාන්‍ය ඝටනා නවය නිමි.

සාමඤ්ඤඝටනා වාරයට අනතුරු ව සකම්මඝටනා වාරය වදළ සේක. එ ද අවිපාක සවිපාක වශයෙන් දෙවැදෑරුම් වේ, එයින් අවිපාක ඝටනා වාරය පළමු කොට වදළ සේක. සබ්බට්ඨානිකඝටනාදි වසයෙන් අවිපාක ඝටනා සතරෙකි. එයින් සබ්බට්ඨානික ඝටනාව මෙසේ ය. සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන චේතනාහාරය - "ආහාර සහජාත නිස්සය අත්ථි අවිගත න්ති සත්ත" ඉතිරි ඝටනා තුන අඤ්ඤමඤ්ඤාදිය යොද විස්තර කරනු. අවිපාකඝටනා වාරයට

Non-commercial distribution

අනතුරුව සවිපාක ඝටනා වාරය වදළ සේක. සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූපප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක චේතනාව "ආහාර සහජාත නිස්සය කම්ම විපාක අත්ථි අවිගත න්ති එකං" ඉතිරි ඝටනා සතර අඤ්ඤමඤ්ඤාදිය යොද විස්තර කරනු. සවිපාක ඝටනා සසෙකි.

සකම්ම ඝටනා නවය නිමි.

සකම්මඝටනා වාරයට අනතුරු ව සඉන්ද්‍රියඝටනා වාරය වදළ සේක. එ ද අවිපාක සවිපාක වශයෙන් දෙවැදෑරුම් වේ. සබ්බට්ඨානිකඝටනාදි වශයෙන් අවිපාක ඝටනා සතරෙකි. සබ්බට්ඨානික ඝටනාව මෙසේ ය. සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූපප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විඤ්ඤාණාහාරය-,'ආහාර සහජාත නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගත න්ති සත්ත" ඉතිරි ඝටනා තුන අඤ්ඤමඤ්ඤාදිය යොද විස්තර කරනු. අවිපාක ඝටනාවන්ට අනතුරු ව සවිපාක ඝටනාවෝ වදරන ලදහ. සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක විඤ්ඤාණාහාරය - "ආහාර සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති එකං." ඉතිරි ඝටනා සතර අඤ්ඤමඤ්ඤාදිය යොද විස්තර කරනු.

සඉන්ද්‍රිය ඝටනා නවය නිමි.

සඉන්ද්‍රිය ඝටනා වාරයට අනතුරු ව සාධිපති ඉන්ද්‍රිය ඝටනා වාරය වදළ සේක. එ ද අවිපාක සවිපාක වශයෙන් දෙවැදෑරුම් වේ. එහි සබ්බට්ඨානික ඝටනාව ය, සඅඤ්ඤමඤ්ඤසම්ප්‍රයුත්ත ඝටනාව ය, සවිප්පයුත්ත ඝටනාවය යි ඝටනා තුනෙකි. සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන චිත්තාධිපතිය- "ආහාර අධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති සත්ත" ඉතිරි දෙකින් පළමුවැන්න අඤ්ඤමඤ්ඤ සම්පයුත්ත දෙක යොද විස්තර කරනු. දෙවැන්න විප්පයුත්තය යොද විස්තර කරනු.

සවිපාකඝටනාවන්හි - සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන එලසිත් සතර වූ චිත්තාධිපතිය - "ආහාර අධිපති සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති එකං" ඉතිරි ඝටනා දෙක අඤ්ඤමඤ්ඤ සම්පයුත්ත දෙක හා විප්පයුත්තය යොද විස්තර කරනු.

සාධිපති ඉන්ද්‍රිය ඝටනා සය නිමි.

මෙහි සභාගවාර එකොළොසෙකි. මිස්සක ඝටනා එකකි, සහජාත ඝටනා තෙතිසකි, සියලු ඝටනා සුතිසෙකි.

Non-commercial distribution

## 16 ඉන්ද්‍රියමිශ්‍රක පාලිය.

ඉන්ද්‍රියපච්චයා හෙතුයා චත්තාරි, අධිපතියා සත්ත, සහජාතෙ සත්ත, අඤ්ඤමඤ්ඤෙ තීණි, නිස්සයෙ සත්ත, පුරෙජාතෙ එකං, විපාකෙ එකං, ආහාරෙ සත්ත, ඣානෙ සත්ත, මග්ගෙ සත්ත, සම්පයුත්තෙ තීණි, විප්පයුත්තෙ තීණි, අත්ථියා සත්ත, අවිගතෙ සත්ත,

ඉන්ද්‍රිය අත්ථි අවිගත න්ති සත්ත, ඉන්ද්‍රිය නිස්සය අත්ථි අවිගතන්ති සත්ත, ඉන්ද්‍රිය නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි.

ඉන්ද්‍රිය නිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.

ඉන්ද්‍රිය සහජාත නිස්සය අත්ථි අවිගතන්ති සත්ත, ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගතන්ති තීණි, ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, ඉන්ද්‍රිය සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි,

ඉන්ද්‍රිය සහජාත නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං, ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං, ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත අත්ථි අවිගත න්ති එකං, ඉන්ද්‍රිය සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.

ඉන්ද්‍රිය සහජාත නිස්සය මග්ග අත්ථි අවිගතන්ති සත්ත, ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය මග්ග අත්ථි අවිගත න්ති තීණි, ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය මග්ග සම්පයුක්ත අත්ථි අවිගතන්ති තීණි, ඉන්ද්‍රිය සහජාත නිස්සය මග්ග විප්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි.

ඉන්ද්‍රිය සහජාත නිස්සය විපාක මග්ග අත්ථි අවිගතන්ති එකං, ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක මග්ග අත්ථි අවිගත න්ති එකං, ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක මග්ග සම්පයුත්ත අත්ථි අවිගත න්ති එකං, ඉන්ද්‍රිය සහජාත නිස්සය විපාක මග්ග විප්පයුත්ත අත්ථි අවිගත න්ති එකං, ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.

ඉන්ද්‍රිය සහජාත නිස්සය ඣාන අත්ථි අවිගතන්ති සත්ත, ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඣාන අත්ථි අවිගත න්ති තීණි, ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඣාන සම්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි, ඉන්ද්‍රිය සහජාත නිස්සය ඣාන විප්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි.

*Non-commercial distribution*

ඉන්‍ද්‍රිය සහජාත නිස්සය විපාක ඣාන අත්‍ථි අවිගත න්‍ති එකං, ඉන්‍ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඣාන අත්‍ථි අවිගත න්‍ති එකං, ඉන්‍ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඣාන සම්පයුත්ත අත්‍ථි අවිගත න්‍ති එකං, ඉන්‍ද්‍රිය සහජාත නිස්සය විපාක ඣාන විප්පයුත්ත අත්‍ථි අවිගත න්‍ති එකං, ඉන්‍ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඣාන විප්පයුත්ත අත්‍ථි අවිගතන්‍ති එකං.

ඉන්‍ද්‍රිය සහජාත නිස්සය ඣාන මග්ග අත්‍ථි අවිගත න්‍ති සත්‍ත, ඉන්‍ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඣාන මග්ග අත්‍ථි අවිගත න්‍ති තීණි, ඉන්‍ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඣාන මග්ග සම්පයුත්ත අත්‍ථි අවිගත න්‍ති තීණි, ඉන්‍ද්‍රිය සහජාත නිස්සය ඣාන මග්ග විප්පයුත්ත අත්‍ථි අවිගතන්‍ති තීණි.

ඉන්‍ද්‍රිය සහජාත නිස්සය විපාක ඣාන මග්ග අත්‍ථි අවිගතන්‍ති එකං, ඉන්‍ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඣාන මග්ග අත්‍ථි අවිගත න්‍ති එකං, ඉන්‍ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඣාන මග්ග සම්පයුත්ත අත්‍ථි අවිගත න්‍ති එකං, ඉන්‍ද්‍රිය සහජාත නිස්සය විපාක ඣාන මග්ග විප්පයුත්ත අත්‍ථි අවිගතන්‍ති එකං, ඉන්‍ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඣාන විප්පයුත්ත අත්‍ථි අවිගත න්‍ති එකං,

ඉන්‍ද්‍රිය සහජාත නිස්සය ආහාර අත්‍ථි අවිගතන්‍ති සත්‍ත, ඉන්‍ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ආහාර අත්‍ථි අවිගතන්‍ති තීණි, ඉන්‍ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ආහාර සම්පයුත්ත අත්‍ථි අවිගතන්‍ති තීණි, ඉන්‍ද්‍රිය සහජාත නිස්සය ආහාර විප්පයුත්ත අත්‍ථි අවිගතන්‍ති තීණි.

ඉන්‍ද්‍රිය සහජාත නිස්සය විපාක ආහාර අත්‍ථි අවිගතනති එකං, ඉන්‍ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර අත්‍ථි අවිගත න්‍ති එකං, ඉන්‍ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර සම්පයුත්ත අත්‍ථි අවිගත න්‍ති එකං, ඉන්‍ද්‍රිය සහජාත නිස්සය විපාක ආහාර විප්පයුත්ත අත්‍ථි අවිගතන්‍ති එකං, ඉන්‍ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර විප්පයුත්ත අත්‍ථි අවිගතන්‍ති එකං.

ඉන්‍ද්‍රියාධිපති සහජාත නිස්සය ආහාර අත්‍ථි අවිගතන්‍ති සත්‍ත, ඉන්‍ද්‍රියාධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ආහාර සම්පයුත්ත අත්‍ථි අවිගත න්‍ති තීණි, ඉන්‍ද්‍රියාධිපති සහජාත නිස්සය ආහාර විප්පයුත්ත අත්‍ථි අවිගතන්‍ති තීණි.

ඉන්‍ද්‍රියාධිපති සහජාත නිස්සය විපාක ආහාර අත්‍ථි අවිගතන්‍ති එකං, ඉන්‍ද්‍රියා ධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ආහාර සම්පයුත්ත

Non-commercial distribution

අත්ථි අවිගතන්ති එකං, ඉන්ද්‍රියාධිපති සහජාත නිස්සය විපාක ආහාර විප්පයුත්ත අත්ථි අවිගත න්ති එකං,

ඉන්ද්‍රියාධිපති සහජාත නිස්සය මග්ග අත්ථි අවිගත න්ති එකං, ඉන්ද්‍රියාධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය මග්ග සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, ඉන්ද්‍රියාධිපති සහජාත නිස්සය මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි.

ඉන්ද්‍රියාධිපති සහජාත නිස්සය විපාක මග්ග අත්ථි අවිගතන්ති එකං, ඉන්ද්‍රියා ධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක මග්ග සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, ඉන්ද්‍රියාධිපති සහජාත නිස්සය විපාක මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.

ඉන්ද්‍රිය හෙතු සහජාත නිස්සය මග්ග අත්ථි අවිගතනති චත්තාරි, ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය මග්ග අත්ථි අවිගතන්ති ද්වෙ, ඉන්ද්‍රිය හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය මග්ග සම්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ, ඉන්ද්‍රිය හෙතු සහජාත නිස්සය මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ.

ඉන්ද්‍රිය හෙතු සහජාත නිස්සය විපාක මග්ග අත්ථි අවිගතන්ති එකං, ඉන්ද්‍රිය හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක මග්ග අත්ථි අවිගත න්ති එකං, ඉන්ද්‍රිය හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක මග්ග සම්පයුත්ත අත්ථි අවිගත න්ති එකං, ඉන්ද්‍රිය හෙතු සහජාත නිස්සය විපාක මග්ග විප්පයුත්ත අත්ථි අවිගත න්ති එකං, ඉන්ද්‍රිය හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක මග්ග විප්පයුත්ත අත්ථි අවිගත න්ති එකං.

ඉන්ද්‍රිය හෙතාධිපති සහජාත නිස්සය මග්ග අත්ථි අවිගත න්ති චත්තාරි, ඉන්ද්‍රිය හෙතාධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය මග්ග සම්පයුත්ත අත්ථි අවිගත න්ති ද්වෙ. ඉන්ද්‍රිය හෙතාධිපති සහජාත නිස්සය මග්ග විප්පයුත්ත අත්ථි අවිගත න්ති ද්වෙ.

ඉන්ද්‍රිය හෙතාධිපති සහජාත නිස්සය විපාක මග්ග අත්ථි අවිගත න්ති එකං, ඉන්ද්‍රිය හෙතාධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක මග්ග සම්පයුත්ත අත්ථි අවිගත න්ති එකං, ඉන්ද්‍රිය හෙතාධිපති සහජාත නිස්සය විපාක මග්ග විප්පයුත්ත අත්ථි අවිගත න්ති එකං.

ඉන්ද්‍රිය මිශ්‍රකයේ සන්නය.

ආහාර මිශ්‍රකයට අනතුරුව ඉන්ද්‍රිය මිශ්‍රකය වදළ සේක. එද සභාග ඝටනා වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් සභාග වාරය පළමු කොට වදළ

Non-commercial distribution

සේක. ඉන්ද්‍රිය මූලක හේතු සභාගය ය, අධිපති සභාග ය ය, සහජාත සභාගය ය, අඤ්ඤමඤ්ඤ සභාගයය, නිස්සය සභාගය ය, පුරේජාත සභාගය ය, විපාක සභාගය ය, ආහාර සභාගය ය, ඣාන සභාගය ය, මග්ග සභාගය ය, සම්පයුත්ත සභාගය ය, විප්පයුත්ත සභාගය ය, අත්ථි සභාගය ය, අවිගත සභාගය ය යි සභාගවාර තුදුසෙකි.

1. එයින් ඉන්ද්‍රිය මූලක අධිපති සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක චිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන අමෝහය - "ඉන්ද්‍රිය පච්චයා හෙතුයා චත්තාරි"

2. අධිපති සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන චිත්ත විරිය වීමංස යන මොවුන් ගෙන් එක එකක් වූ අධිපති ප්‍රත්‍යය ධර්මයෝ- "ඉන්ද්‍රිය පච්චයා අධිපතියා සත්ත"

3. සහජාත සභාගයෙහි සකල සහජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝ- "ඉන්ද්‍රිය පච්චයා සහජාතෙ සත්ත"

4. අඤ්ඤමඤ්ඤ සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්මයෝ අට දෙන- "ඉන්ද්‍රිය පච්චයා අඤ්ඤමඤ්ඤෙ තීණි"

5. නිස්සය සභාගයෙහි සකල සහජාතේන්ද්‍රිය පුරේජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝ- "ඉන්ද්‍රිය පච්චයා නිස්සයෙ සත්ත"

6. පුරේජාත සභාගයෙහි සකල පුරේජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝ- "ඉන්ද්‍රිය පච්චයා පුරේජාතෙ එකං"

7. විපාක සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක නාමේන්ද්‍රිය ධර්මයෝ අට දෙන- "ඉන්ද්‍රිය පච්චයා විපාකෙ එකං"

8. ආහාර සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විඤ්ඤාණාහාරය- "ඉන්ද්‍රිය පච්චයා ආහාරෙ සත්ත"

(9) ඣානසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන වේදනා ඒකග්ගතා දෙක "ඉන්ද්‍රිය පච්චයා ඣානෙ සත්ත"

(10) මග්ගසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විරිය සති ඒකග්ගතා පඤ්ඤා යන මොවුහු "ඉන්ද්‍රියපච්චයා මග්ගෙ සත්ත"

Non-commercial distribution

(11) සම්පයුත්තසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්මයෝ "ඉන්ද්‍රියපච්චයා සම්පයුත්තෙන තීණි"

(12) විප්පයුත්ත සභාගයෙහි චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ-රූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රි ය අට වූ සහජාතේන්ද්‍රිය ප්‍රත්‍යය හා පූර්වජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ඉන්ද්‍රිය පච්චයා විප්පයුත්තෙන තීණි"

(13) අත්ථිසභාගයෙහි සකල සහජාතේන්ද්‍රිය පූර්වජාතේන්ද්‍රිය රූපජීවිතේන්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝ "ඉන්ද්‍රියපච්චයා අත්ථියා සත්ත" (14) අවිගත සභාගය ද එසේ ම ය.

සටනා

සභාගවාරයට අනතුරු ව සටනාවාරය වදාළ සේක. මිස්සකසටනා ය, පකිණ්ණකසටනා ය, සහජාතසටනා ය යි එහි කොටස් තුනෙකි. අත්ථි අවිගත සටනාව ය, සනිස්සය සටනා ව ය, සනිස්සය විප්පයුත්ත සටනාව ය යි මිස්සකසටනා තුනෙකි.

(1) එයින් අත්ථි අවිගත සටනාව මෙසේ ය: සකල සහජාතේන්ද්‍රිය පූර්වජාතේන්ද්‍රිය රූප ජීවිතේන්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝ "ඉන්ද්‍රිය අත්ථි අවිගත න්ති සත්ත"

(2) සනිස්සය සටනාව මෙ සේ ය: සකල සහජාතේන්ද්‍රිය පූර්වජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝ "ඉන්ද්‍රිය නිස්සය අත්ථි අවිගත න්ති සත්ත"

(3) සනිස්සය විප්පයුත්ත සටනාව මෙ සේ ය: චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්ම අට වූ සහජාතේන්ද්‍රිය ප්‍රත්‍යය හා පූර්වජාතේන්ද්‍රිය ප්‍රත්‍යය "ඉන්ද්‍රිය නිස්සය විප්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි"

මිස්සක සටනාවන්ට අනතුරුව පකිණ්ණක සටනාව වදාළ සේක. පඤ්චවිඥාන ධාතුන්ට ප්‍රත්‍යය වන පඤ්ච වස්තූහු "ඉන්ද්‍රිය නිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං"

මිස්සකසටනාවන්ට අනතුරුව සහජාත සටනා වදාළ සේක. සාමඤ්ඤ සටනා ය, සමග්ග සටනා ය, සජ්ඣාන සටනා ය, සජ්ඣාන මග්ග සටනාය, ස ආහාර සටනා ය, සාධිපති ආහාර සටනා ය, සාධිපති මග්ග සටනා ය, සහේතු මග්ග සටනා ය, සහේතු අධිපති මග්ග සටනාය යි සහජාත සටනා කොටස් නවයෙකි.

Non-commercial distribution

සාමඤ්ඤ ඝටනා ද අවිපාක සවිපාක වශයෙන් දෙකොටසෙකි. සබ්බට්ඨානික ඝටනාව ය, ස අඤ්ඤමඤ්ඤ ඝටනාව ය, ස අඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව ය, සවිප්පයුත්ත ඝටනාව ය යි අවිපාක ඝටනා සතරෙකි.

(1) එයින් සබ්බට්ඨානික ඝටනාව මෙසේ ය: සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්මයෝ "ඉන්ද්‍රිය සහජාත නිස්සය අත්ථි අවිගත න්ති සත්ත"

(2) සඅඤ්ඤමඤ්ඤ ඝටනාව මෙසේ ය. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රියයෝ "ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගත න්ති තීණි"

(3) සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව මෙසේ ය: සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්මයෝ "ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි"

(4) සවිප්පයුත්ත ඝටනාව මෙසේ ය: චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය අට "ඉන්ද්‍රිය සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි"

මේ අවිපාක ඝටනා සතර ය.

(1) සවිපාක ඝටනා පස මෙසේ ය: සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකනාමේන්ද්‍රිය අට "ඉන්ද්‍රිය සහජාත නිස්සය විපාක අත්ථි අවිගත න්ති එකං" (2) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන විපාක නාමේන්ද්‍රිය අට "ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං" (3) සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍ය වන විපාක නාමේන්ද්‍රිය අට "ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං" (4) චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක නාමේන්ද්‍රිය අට "ඉන්ද්‍රිය සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං" (5) හෘදය වස්තුවට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධිනාමේන්ද්‍රියයෝ "ඉන්ද්‍රිය සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගත න්ති එකං" මේ සවිපාක ඝටනා පස ය.

සාමාන්‍ය ඝටනා නවය නිමි.

සාමාන්‍ය ඝටනාවන්ට අනතුරුව සමාගී ඝටනාවෝ වදරන ලදහ. එහි ද අවිපාක සවිපාක වශයෙන් ඝටනා දෙකොටසෙකි. අවිපාක ඝටනා සතරෙකි, සවිපාක ඝටනා පසෙකි. අවිපාක ඝටනා සතර මෙ සේ ය:

Non-commercial distribution

සබ්බට්ඨානික සටනාදි විභාගය කරනු. සම්ප්‍රයුක්ත ස්කන්ධ චිත්තජ රූප ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විරිය සති ඒකග්ගතා පඤ්ඤා යන මොවුහු "ඉන්ද්‍රිය සහජාත නිස්සය මග්ග අත්ථි අවිගත නති සත්ත" ඉතිරි සටනා තුන අඤ්ඤමඤ්ඤය ද අඤ්ඤමඤ්ඤ සම්පයුත්ත දෙකද විප්පයුත්තය ද යොදා විස්තර කරනු.

සවිපාක සටනා පස මෙසේ ය: සබ්බට්ඨානික සටනාදි විභාගය කරනු. සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකයන්හි ඇති විරිය සති ඒකග්ගතා පඤ්ඤා යන මොවුහු "ඉන්ද්‍රිය සහජාත නිස්සය විපාක මග්ග අත්ථි අවිගතන්ති එකං" ඉතිරි සතර අඤ්ඤමඤ්ඤ ද අඤ්ඤමඤ්ඤය හා සම්පයුත්තය ද විප්පයුත්තය ද අඤ්ඤමඤ්ඤය හා විප්ප-යුත්තය ද පිළිවෙළින් යොදා විස්තර කරනු. මේ සවිපාක සටනා පස ය.

සමාගී සටනා නවය නිමි.

සමාගීසටනාවන් ට අනතුරු ව ස්කන්‍යානසටනාවෝ වදරන ලදහ. එහි ද අවිපාක සවිපාක වශයෙන් සටනා දෙකොටසෙකි. අවිපාකසටනා සතරෙකි. සවිපාකසටනා නවයෙකි. අවිපාක සටනා සතර මෙ සේ ය: සබ්බට්ඨානිකසටනාදි විභාගය කරනු. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යයවන වේදනා ඒකග්ගතා දෙක "ඉන්ද්‍රිය සහජාත නිස්සය ඣාන අත්ථි අවිගත නති සත්ත" ඉතිරි සටනා තුන අඤ්ඤමඤ්ඤය ද, අඤ්ඤමඤ්ඤ සම්පයුත්ත දෙක ද, විප්පයුත්තය ද පිළිවෙළින් යොදා විස්තර කරනු. මේ අවිපාක සටනා සතර ය.

සවිපාක සටනා පස මෙ සේ ය: සබ්බට්ඨානික සටනාදි විභාගය කරනු. සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකයන්හි ඇති වේදනා ඒකග්ගතා දෙක "ඉන්ද්‍රිය සහජාත නිස්සය විපාක ඣාන අත්ථි අවිගතන්ති එකං" ඉතිරි සතර විස්තර කරනු. මේ සවිපාක සටනා පස ය.

ස්කන්ධානසටනා නවය නිමි

ස්ඣාන මග්ග සටනාවෝ ද අවිපාක සවිපාක වශයෙන් දෙවැදෑරුම් වෙත්. අවිපාක සටනා සතරෙකි. සවිපාක සටනා පසෙකි. එයින් අවිපාක සටනා සතර මෙ සේ ය: සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන ඒකග්ගතාව "ඉන්ද්‍රිය සහජාත නිස්සය ඣාන මග්ග අත්ථි අවිගතන්ති සත්ත" ඉදිරි සටනා තුන අඤ්ඤමඤ්ඤය ද, අඤ්ඤමඤ්ඤ සම්ප්‍රයුක්ත දෙක ද විප්පයුත්තය ද පිළිවෙළින් යොදා විස්තර කරනු. මේ අවිපාක සටනා සතරය.

Non-commercial distribution

සවිපාක ඝටනා පස මෙ සේ ය; සබ්බට්ඨානිකාදි විභාගය කරනු. සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක ඒකග්ගතාව "ඉන්ද්‍රිය සහජාත නිස්සය විපාක ඣාන මග්ග අත්ථි අවිගත නත්ති එකං" ඉතිරි ඝටනා සතර අඤ්ඤමඤ්ඤ ය ද, අඤ්ඤමඤ්ඤ සම්පයුත්ත දෙක ද, විප්පයුත්තය ද, අඤ්ඤමඤ්ඤ විප්පයුත්ත දෙක ද, පිළිවෙළින් යොද විස්තර කරනු. මේ සවිපාක ඝටනා පස ය.

සඣාන මග්ග ඝටනා නවය නිමි.

සඣාන මග්ග ඝටනාවන්ට අනතුරු ව සආහාරඝටනාවෝ වදරන ලදහ. එහි ද අවිපාක සවිපාක වසයෙන් ඝටනා දෙකොටසෙකි. අවිපාක ඝටනා සතරෙකි. සවිපාකඝටනා පසෙකි. අවිපාකඝටනා සතර මෙ සේ ය: සබ්බට්ඨානිකාදි විභාගය කරනු. සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විඥානාහාරය "ඉන්ද්‍රිය සහජාත නිස්සය ආහාර අත්ථි අවිගතනත්ති එකං" ඉතිරි ඝටනා තුන පාලිය අනුව විස්තර කරනු.

සවිපාකඝටනා පස මෙ සේ ය: සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක විඥානාහාරය "ඉන්ද්‍රිය සහජාත නිස්සය විපාක ආහාර අත්ථි අවිගත නත්ති එකං" ඉතිරි සතර පාලිය අනුව විස්තර කරනු.

ස ආහාර ඝටනා නවය නිමි

ස ආහාරඝටනාවන්ට අනතුරු ව සාධිපති ආහාරඝටනාවෝ වදරන ලදහ. එහි අවිපාකඝටනා තුනක් හා සවිපාකඝටනා තුනක් ද වෙති. අවිපාකඝටනා තුන මෙසේ ය: සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට හා සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන චිත්තාධිපතිය "ඉන්ද්‍රියාධිපති සහජාත නිස්සය ආහාර අත්ථි අවිගත නත්ති සත්ත" ඉතිරි ඝටනා දෙක අඤ්ඤමඤ්ඤ සම්පයුත්ත දෙක ද විප්පයුත්තය ද යොද විස්තර කරනු.

සවිපාක ඝටනා තුන මෙසේ ය: සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන එලසිත් සතර වූ චිත්තාධිපතිය ඉන්ද්‍රියාධිපති සහජාත නිස්සය විපාක ආහාර අත්ථි අවිගත නත්ති එකං" ඉතිරි දෙක අඤ්ඤමඤ්ඤ සම්පයුත්තයන් හා විප්පයුත්තය ද යොද විස්තර කරනු.

සාධිපති ආහාරඝටනා සය නිමි.

සාධිපති ආහාර ඝටනාවන්ට අනතුරු ව සාධිපති මග්ග ඝටනාවන් වදරන ලදහ. එහි ද අවිපාක ඝටනා තුනෙකි. සවිපාක ඝටනා තුනෙකි.

Non-commercial distribution

අවිපාක සටනා තුන මෙ සේ ය: සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීර්‍ය්‍යාධිපතිය "ඉන්ද්‍රියාධිපති සහජාත නිස්සය මග්ග අත්ථි අවිගත නති සත්ත" ඉතිරි සටනා දෙක අඤ්ඤමඤ්ඤ සම්පයුත්තයන් හා විප්පයුත්තය යොද විස්තර කරනු.

සවිපාකසටනා තුන මෙ සේ ය: සම්පයුත්තස්කන්ධ සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන විරියාධිපතිය "ඉන්ද්‍රියාධිපති සහජාත නිස්සය විපාක මග්ග අත්ථි අවිගත නති එකං" ඉතිරි දෙක අඤ්ඤමඤ්ඤ සම්පයුත්ත දෙක හා විප්පයුත්තය යොද විස්තර කරනු.

සාධිපති මග්ග සටනා සය නිමි.

සාධිපතිමග්ග සටනාවන්ට අනතුරුව සහේතු මග්ග සටනාවන් වදළ සේක. එහි අවිපාකසටනා සතරෙකි. සවිපාක සටනා පසෙකි. අවිපාක සටනා සතර මෙ සේ ය: සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක චිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන අමෝහය - "ඉන්ද්‍රිය හෙතු සහජාත නිස්සය මග්ග අත්ථි අවිගත නති චත්තාරි." ඉතිරි සටනා තුන හේතු සටනා අනුව විස්තර කරනු.

සවිපාකසටනා සතර මෙ සේ ය; සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක චිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකචිත්තයන්හි අමෝහය "ඉන්ද්‍රිය සහජාත නිස්සය විපාක මග්ග අත්ථි අවිගත නති එකං" ඉතිරි වාර සතර හේතු ප්‍රත්‍යයෙහි මෙන් විස්තර කරනු.

සහේතු මග්ග සටනා නවය නිමි.

සහේතු මග්ග සටනාවන්ට අනතුරු ව සහේතු අධිපති මග්ග සටනාවෝ වදරන ලදහ. එහි අවිපාක සටනා තුනෙකි. සවිපාක සටනා තුනෙකි. අවිපාක සටනා තුන මෙ සේ ය: සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකාමෝහය - "ඉන්ද්‍රිය හෙතු අධිපති සහජාත නිස්සය මග්ග අත්ථි අවිගත නති චත්තාරි" ඉතිරි දෙක විස්තර කරනු.

සවිපාක සටනා තුන මෙ සේ ය; සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලචිත්තයන්හි වීමංසාධිපතිය- "ඉන්ද්‍රිය හෙතු අධිපති සහජාත නිස්සය විපාක මග්ග අත්ථි අවිගත නති එකං." ඉතිරි දෙක විස්තර කරනු.

සහේතු අධිපති මග්ග සටනා සය නිමි.

Non-commercial distribution

ඉන්ද්‍රියමිශ්‍රකයෙහි සභාගවාර තුදුසෙකි, මිශ්‍රකඝටනා තුන ය, ප්‍රකීර්ණකඝටනාව ය, සහජාත ඝටනා දෙසැත්තෑව ය යි ඝටනා සසැත්තෑවක් වේ.

17. ඣාන මිස්සක පාලිය.

ඣානපච්චයා සහජාතෙ සත්ත, අඤ්ඤමඤ්ඤෙ තීණි; නිස්සයෙ සත්ත, විපාකෙ එකං, ඉන්ද්‍රියෙ සත්ත, මග්ගෙ සත්ත, සම්පයුත්තෙ තීණි, විප්පයුත්තෙ තීණි, අත්ථියා සත්ත, අවිගතෙ සත්ත.

ඣාන සහජාත නිස්සය අත්ථි අවිගතන්ති සත්ත, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගතන්ති තීණි, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, ඣාන සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි.

ඣාන සහජාත නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගත න්ති එකං, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත අත්ථි අවිගත න්ති එකං, ඣාන සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.

ඣාන සහජාත නිස්සය ඉන්ද්‍රිය අවිගතන්ති සත්ත, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති තීණි, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, ඣාන සහජාත නිස්සය ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි.

ඣාන සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති එකං, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති එකං, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, ඣාන සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.

ඣාන සහජාත නිස්සය මග්ග අත්ථි අවිගතන්ති සත්ත. ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය මග්ග අත්ථි අවිගතන්ති තීණි, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය මග්ග සම්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි, ඣාන සහජාත නිස්සය මග්ග විප්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි.

ඣාන සහජාත නිස්සය විපාක මග්ග අත්ථි අවිගත න්ති එකං, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක මග්ග අත්ථි අවිගත න්ති

Non-commercial distribution

එකං, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක මග්ග සම්පයුත්ත අත්ථි අවිගත න්ති එකං, ඣාන සහජාත නිස්සය විපාක මග්ග විප්පයුත්ත අත්ථි අවිගත න්ති එකං, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක මග්ග විප්පයුත්ත අත්ථි අවිගත න්ති එකං.

ඣාන සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගත න්ති සත්ත, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගත න්ති තීණි, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය මග්ග සම්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි, ඣාන සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග විප්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි.

ඣාන සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගත න්ති එකං, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගත න්ති එකං. ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, ඣාන සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.

ඣාන මිස්සකයේ සන්නය.

ඉන්ද්‍රිය මිශ්‍රකයට අනතුරු ව ඣානමිස්සකය වදාළ සේක. එද සභාග ඝටනා වශයෙන් දෙවැදෑරුම් වේ. එයින් සභාගවාරය පළමුකොට වදාළ සේක. එහි ඣාන මූලක සහජාත සභාගය ය, අඤ්ඤමඤ්ඤ සභාගය ය, නිස්සය සභාගය ය, විපාකසභාගය ය, ඉන්ද්‍රිය සභාගය ය, මග්ගසභාගය ය, සම්පයුත්තසභාගය ය, විප්පයුත්තසභාගය ය, අත්ථි සභාගය ය, අවිගත සභාගය යයි සභාග වාර දශයකි.

(1.) එයින් සහජාත සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ගධර්මයෝ පස්දෙන- "ඣානපච්චයා සහජාතෙ සත්ත."

(2.) අඤ්ඤමඤ්ඤ සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ග ධර්ම පස- "ඣානපච්චයා අඤ්ඤමඤ්ඤෙ තීණි." (3.) නිස්සය සභාගය සහජාත සභාගය මෙනි.

(4.) විපාක සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක චිත්තයන්හි ධ්‍යානාඞ්ග ධර්මපස - "ඣාන පච්චයා විපාකෙ එකං"

(5.) සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන වේදනා ඒකාග්‍රතා දෙක- "ඣානපච්චයා ඉන්ද්‍රියෙ සත්ත."

Non-commercial distribution

(6.) සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විතර්ක ඒකාග්‍රතා දෙක: "ඣානපච්චයා මග්ගෙ සත්ත."

(7.) සම්ප්‍රයුක්තසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ග පස- "ඣානපච්චයා සම්පයුත්තෙ තීණි"

(8.) විප්පයුත්ත සභාගයෙහි චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ග පස- "ඣාන පච්චයා විප්පයුත්තෙ තීණි" අත්ථි අවිගත සභාග දෙක සහජාත සභාගය මෙති.

ඝටනා

සභාගයන්ට අනතුරුව ඝටනාවෝ වදරන ලදහ. එහි සාමඤ්ඤ- ඝටනාය, සඉන්ද්‍රියඝටනාය, සමග්ගඝටනාය, සඉන්ද්‍රිය මග්ග ඝටනා යයි සතර කොටසකි. එයින් සාමඤ්ඤ ඝටනාවෝ පළමු කොට වදරන ලදහ. එහි අවිපාක ඝටනා සතරෙකි. සවිපාකඝටනා පසෙකි. අවිපාක ඝටනා සතර මෙසේ ය: සබ්බට්ඨානික ඝටනාදි විභාගය කරනු.

(1.) සබ්බට්ඨානික ඝටනාව මෙසේ ය; සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ග පස- "ඣාන සහජාත නිස්සය අත්ථි අවිගත න්ති සත්ත."

(2.) සඅඤ්ඤමඤ්ඤ ඝටනාව මෙසේ ය: සම්ප්‍රයුක්තස්කන්ධ හෘදයවස්තුන්ට ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ග පස- "ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි."

(3.) සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත ඝටනාව මෙසෝ ය: සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ග පස- "ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගතනති තීණි."

(4.) සවිප්පයුත්තඝටනාව මෙසේ ය, චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ග ධර්මයෝ- "ඣාන සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගත නති තීණි."

අවිපාක ඝටනාවන්ට අනතුරු ව සවිපාකඝටනාවන් වදරන ලදහ. සබ්බට්ඨානිකාදි විභාගය කරනු. 1.සබ්බට්ඨානිකඝටනාව මෙසේ ය: සම්ප්‍ර- යුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක- ධ්‍යානාඞ්ගයෝ- "ඣාන සහජාත නිස්සය විපාක අත්ථිඅවිගත නති එකං"

2. සඅඤ්ඤමඤ්ඤඝටනාව මෙසේ ය. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදයවස්තුවට ප්‍රත්‍යය වන විපාකධ්‍යානාඞ්ගයෝ "ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගතනති එකං"

Non-commercial distribution

3. සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්ත සටනාව මෙසේ ය: සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ටම ප්‍රත්‍යය වන විපාක ධ්‍යානාංගයෝ - "ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත අත්‍ථි අවිගත නත්‍ථි එකං."

4. සවිප්පයුත්තසටනාව මෙසේ ය: චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකධ්‍යානාඞගයෝ- "ඣාන සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්‍ථි අවිගත නත්‍ථි එකං"

5. සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත සටනාව මෙසේ ය: හෘදයවස්තුවට ප්‍රත්‍යය වන ප්‍රතිසන්ධි ධ්‍යානාඞගයෝ- "ඣාන සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්‍ථි අවිගත නත්‍ථි එකං,

සාමාන්‍ය සටනා නවය නිමි.

සාමාන්‍ය සටනාවන්ට අනතුරුව සඉන්ද්‍රිය සටනාවන් වදාළ සේක. එහි අවිපාක සටනා සතර මෙසේ ය: සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි-කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන වේදනා ඒකග්‍රතා දෙක- "ඣාන සහජාත නිස්සය ඉන්ද්‍රිය අත්‍ථි අවිගත නත්‍ථි සත්ත." ඉතිරි සටනා තුන අඤ්ඤමඤ්ඤය ද, අඤ්ඤමඤ්ඤසම්පයුත්ත දෙක ද විප්පයුත්තය ද පිළිවෙළින් යොද විස්තර කරනු. සවිපාක සටනා පස මෙසේ ය: සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක වේදනා ඒකග්‍රතාවෝ- "ඣාන සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය අත්‍ථි අවිගත නත්‍ථි එකං."ඉතිරි සටනා සතර සාමාන්‍ය සටනාවන්හි මෙන් ප්‍රත්‍යයන් යොද විස්තර කරනු.

සඉන්ද්‍රිය සටනා නවය නිමි.

සඉන්ද්‍රියසටනාවන්ට අනතුරු ව සමග්ගසටනාවෝ වදරන ලදහ. අවිපාකාදි විභාගය කරනු. අවිපාකසටනාවන්හි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විතක්ක ඒකග්‍රතා දෙක "ඣාන සහජාත නිස්සය මග්ග අත්‍ථි අවිගතනත්‍ථි සත්ත." ඉතිරි සටනා තුන අඤ්ඤමඤ්ඤාදීන් යොද විස්තර කරනු. සවිපාකසටනාවන්හි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකයන්හි විතක්ක ඒකග්‍රතා දෙක- "ඣාන සහජාත නිස්සය විපාක මග්ග අත්‍ථි අවිගත නත්‍ථි එකං." ඉතිරි සටනා සතර අඤ්ඤමඤ්ඤාදීන් යොද විස්තර කරනු.

සමග්ග සටනා නවය නිමි.

සමග්ගසටනාවන්ට අනතුරු ව සඉන්ද්‍රිය මග්ගසටනාවන් වදාළ සේක. අවිපාකාදි වාර විභාග කරනු. අවිපාකයන්හි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප

Non-commercial distribution

ප්‍රතිසන්ධිකම්ජරූපයන්ට ප්‍රත්‍යය වන එකග්ගතාව- "ඣාන සහජාත නිස්සය ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගත නත්ති සත්ත." ඉතිරි තුන අඤ්ඤමඤ්ඤාදීන් යොදා විස්තර කරනු. සවිපාකයන්හි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකම්ජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකයන්හි ඒකග්ගතාව- "ඣාන සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය මග්ග අත්ථි අවිගතන්ති එකං." ඉතිරි ඝටනා සතර අඤ්ඤමඤ්ඤාදීන් යොදා විස්තර කරනු.

සඉන්ද්‍රිය මග්ග ඝටනා නවය නිමි.

මෙහි සභාග වාර දශයෙකි, ඝටනා තිසකි.

18 මග්ග මිස්සක පාලිය.

මග්ගපච්චයා හෙතුයා චත්තාරි, අධිපතියා සත්ත, සහජාතෙ සත්ත, අඤ්ඤමඤ්ඤෙ තීණි, නිස්සයෙ සත්ත, විපාකෙ එකං, ඉන්ද්‍රියෙ සත්ත, ඣානෙ සත්ත, සම්පයුත්තෙ තීණි, විප්පයුත්තෙ තීණි, අත්ථියා සත්ත, අවිගතෙ සත්ත.

මග්ග සහජාත නිස්සය අත්ථි අවිගත නත්ති සත්ත, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගත නත්ති තීණි, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි අවිගත නත්ති තීණි. මග්ග සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි අවිගත නත්ති තීණි.

මග්ග සහජාත නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, මග්ග සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං,

මග්ග සහජාත නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති සත්ත, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති තීණි, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, මග්ග සහජාත නිස්සය ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි.

මග්ග සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති එකං, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති එකං, මග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, මග්ග සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති

Non-commercial distribution

එකං, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත න්ති එකං.

මග්ග සහජාත නිස්සය ඣාන අත්ථි අවිගත න්ති සත්ත, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඣාන අත්ථි අවිගත න්ති තීණි, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඣාන සම්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි, මග්ග සහජාත නිස්සය ඣාන විප්පයුත්ත අත්ථි අවිගත න්ති තීණි.

මග්ග සහජාත නිස්සය විපාක ඣාන අත්ථි අවිගතන්ති එකං, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඣාන අත්ථි අවිගතන්ති එකං, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඣාන සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, මග්ග සහජාත නිස්සය විපාක ඣාන විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඣාන විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.

මග්ග සහජාත නිස්සය ඉන්ද්‍රිය ඣාන අත්ථි අවිගතන්ති සත්ත, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය ඣාන අත්ථි අවිගතන්ති තීණි, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය ඣාන සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, මග්ග සහජාත නිස්සය ඉන්ද්‍රිය ඣාන විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි.

මග්ග සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය ඣාන අත්ථි අවිගතන්ති එකං, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය ඣාන අත්ථි අවිගත න්ති එකං, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය ඣාන සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, මග්ග සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය ඣාන විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, මග්ග සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය ඣාන විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.

මග්ගාධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති සත්ත, මග්ගාධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි, මග්ගාධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති තීණි.

මග්ගාධිපති සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගත න්ති එකං, මග්ගාධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගත න්ති එකං, මග්ගාධිපති සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.

මග්ග හෙතු සහජාත නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති චත්තාරි, මග්ග හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති

Non-commercial distribution

ද්වෙ, මග්ග හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ, මග්ග හෙතු සහජාත නිස්සය ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ.

මග්ග හෙතු සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගත න්ති එකං, මග්ග හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගත න්ති එකං, මග්ග හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං. මග්ග හෙතු සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, මග්ග හෙතු සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති එකං.

මග්ග හෙතාධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති චත්තාරි, මග්ග හෙතාධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ, මග්ග හෙතාධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගතන්ති ද්වෙ.

මග්ග හෙතාධිපති සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගත න්ති එකං, මග්ග හෙතාධිපති සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක ඉන්ද්‍රිය සම්පයුත්ත අත්ථි අවිගතන්ති එකං, මග්ග හෙතාධිපති සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි අවිගත න්ති එකං.

## මග්ග මිස්සකයේ සන්නය

ඣාන මිස්සකයට අනතුරු ව මග්ග මිස්සකය වදාළ සේක. එද සභාග ඝටනා වසයෙන් දෙවැදෑරුම් වේ. එහි මග්ග මූලක හේතුසභාගය ය, අධිපතිසභාගය ය, සහජාත සභාගය ය, අඤ්ඤමඤ්ඤ සභාගය ය, නිස්සය සභාගය ය, විපාක සභාගය ය, ඉන්ද්‍රිය සභාගය ය, ඣාන සභාගය ය, සම්පයුත්ත සභාගය ය, විප්පයුත්ත සභාගය ය, අත්ථි සභාගය ය, අවිගත සභාගය යයි සභාගවාර දෙළොසෙකි.

(1) එයින් හේතු සභාගයෙහි සම්ප්‍රයුක්තසකන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන අමෝහය- "මග්ගපච්චයා හෙතුයා චත්තාරි"

(2) අධිපති සභාගයෙහි සම්ප්‍රයුක්තසකන්ධ සාධිපති චිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන විරිය වීමංස අධිපති දෙක- "මග්ගපච්චයා අධිපතියා සත්ත".

(3) සහජාත සභාගයෙහි සම්ප්‍රයුක්තසකන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන මාර්ගාඞ්ග ධර්මයෝ නව දෙන "මග්ග පච්චයා සහජාතෙ සත්ත"

Non-commercial distribution

(4) අඤ්ඤමඤ්ඤ සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට හා හෘදය වස්තුවට ප්‍රත්‍යය වන මාර්ගාඞ්ගයෝ නව දෙන- "මග්ග පච්චයා අඤ්ඤමඤ්ඤෙ තීණි"

(5) නිස්සය සභාගයෙහි - (සහජාතයෙහි මෙනි.)

(6) විපාකසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකමාර්ගාඞ්ගයෝ අට දෙන- "මග්ග පච්චයා විපාකෙ එකං.

(7) ඉන්ද්‍රිය සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විරිය සති ඒකග්ගතා පඤ්ඤා යන මාර්ගාඞ්ගයෝ- "මග්ගපච්චයා ඉන්ද්‍රියෙ සත්ත"

(8) ධ්‍යානසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විතක්ක එකග්ගතා දෙක- "මග්ගපච්චයා ඣානෙ සත්ත"

(9) සම්ප්‍රයුක්තසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන මාර්ගාඞ්ගයෝ නව දෙන- "මග්ගපච්චයා සම්පයුත්තෙ තීණි"

(10) විප්පයුත්තසභාගයෙහි චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන මාර්ගාඞ්ගයෝ නව දෙන- "මග්ගපච්චයා විප්පයුත්තෙ තීණි"

11, 12, අත්ථි අවිගත සභාග දෙක සහජාත සභාගය මෙනි.

## සටනා

සභාගයන්ට අනතුරු ව සටනාවන් වදළ සේක. එහි සාමඤ්ඤසටනාය, සඉන්ද්‍රිය සටනාය, සඣාන සටනාය, සඉන්ද්‍රිය ඣාන සටනාය, සාධිපති ඉන්ද්‍රිය සටනාය, සහේතු ඉන්ද්‍රියසටනාය, සහේතු අධිපති ඉන්ද්‍රියසටනා යයි සටනා සත් කොටසෙකි.

සටනාවන්ගෙන් සාමඤ්ඤ සටනාවෝ පළමු කොට වදළ සේක. අවිපාක සවිපාකාදි විභාග කරනු. සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන මාර්ගාඞ්ගයෝ නවදෙන- "මග්ග සහජාත නිස්සය අත්ථි අවිගතන්ති සත්ත." ඉතිරි සටනා තුන අඤ්ඤමඤ්ඤාදීන් යොද විස්තර කරනු. සවිපාක සටනාවන්හි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක මාර්ගාඞ්ගයෝ අටදෙන- "මග්ග සහජාත නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං" ඉතිරි සටනා සතර අඤ්ඤමඤ්ඤාදීන් යොද විස්තර කරනු. සාමඤ්ඤ සටනා නවයෙකි.

Non-commercial distribution

සඉන්‍ද්‍රිය ඝටනාවන්හි අවිපාක සවිපාකාදි විභාග කරනු. අවිපාක ඝටනාවන්හි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විරිය සති එකග්ගතා පඤ්ඤා යන මාර්‍ගාඞ්ගයෝ "මග්ග සහජාත නිස්සය ඉන්‍ද්‍රිය අත්ථි අවිගතන්ති සත්ත" ඉතිරි ඝටනා තුන අඤ්ඤමඤ්ඤාදීන් යොදා විස්තර කරනු. සවිපාක ඝටනාවන්හි සම්ප්‍රයුක්ත ස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකයන්හි ඇති විරිය සති ඒකග්ගතා පඤ්ඤා යන මොවුහු "මග්ග සහජාත නිස්සය විපාක ඉන්‍ද්‍රිය අත්ථි අවිගත න්ති එකං" ඉතිරි ඝටනා සතර අඤ්ඤමඤ්ඤා-දීන් යොදා විස්තර කරනු. සඉන්‍ද්‍රිය ඝටනා නවයෙකි.

සඣාන අවිපාකඝටනාවන්හි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විතක්ක ඒකග්ගතා දෙක "මග්ග සහජාත නිස්සය ඣාන අත්ථි අවිගතන්ති සත්ත" ඉතිරි ඝටනා තුන අඤ්ඤමඤ්ඤාදීන් යොදා විස්තර කරනු. සවිපාක ඝටනාවන්හි සම්ප්‍රයුක්ත- ස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකයන්හි විතක්ක ඒකග්ගතා දෙක - "මග්ග සහජාත නිස්සය විපාක ඣාන අත්ථි අවිගතන්ති එකං" ඉතිරි ඝටනා සතර අඤ්ඤමඤ්ඤාදීන් යොදා විස්තර කරනු. සඣාන ඝටනා නවයෙකි.

සඉන්‍ද්‍රිය ඣාන අවිපාක ඝටනාවන්හි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජ රූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන ඒකග්ගතාව - "මග්ගසහජාත නිස්සය ඉන්‍ද්‍රිය ඣාන අත්ථි අවිගතන්ති සත්ත" ඉතිරි තුන විස්තර කරනු. සවිපාක ඝටනාවන්හි සම්ප්‍රයුක්තස්කන්ධ චිත්තජරූප ප්‍රතිසන්ධිකර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාකයන්හි ඒකග්ගතාව- "මග්ග සහජාත නිස්සය විපාක ඉන්‍ද්‍රිය ඣාන අත්ථි අවිගත න්ති එකං" ඉතිරි ඝටනා සතර විස්තර කරනු. සඉන්‍ද්‍රිය ඣාන ඝටනා නවයෙකි.

අධිපති ඉන්‍ද්‍රිය අවිපාකඝටනාවන්හි සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීර්‍ය්‍යාධිපතිය - "මග්ගාධිපති සහජාත නිස්සය ඉන්‍ද්‍රිය අත්ථි අවිගතන්ති සත්ත" ඉතිරි ඝටනා දෙක විස්තර කරනු. සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලසිත් සතරෙහි වීර්‍ය්‍යාධිපතිය - "මග්ගාධිපති සහජාත නිස්සය විපාක ඉන්‍ද්‍රිය අත්ථි අවිගත න්ති එකං" ඉතිරි ඝටනා දෙක අඤ්ඤමඤ්ඤසම්පයුත්ත දෙක හා විප්පයුත්තය ද යොදා විස්තර කරනු. අධිපති ඉන්‍ද්‍රියඝටනා සයෙකි.

සහේතු ඉන්‍ද්‍රිය අවිපාකඝටනාවන්හි සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක චිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන අමෝහය -

Non-commercial distribution

"මග්ග හෙතු සහජාත නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති චත්තාරි" ඉතිරි සටනා තුන අඤ්ඤමඤ්ඤාදීන් යොද විස්තර කරනු. සවිපාකයන්හි සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක චිත්තජරූප සහේතුක ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාකාමෝහය- "මග්ග හෙතු සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති එකං" ඉතිරි සටනා සතර අඤ්ඤමඤ්ඤාදීන් යොද විස්තර කරනු. සහේතු ඉන්ද්‍රිය සටනා නවයෙකි.

සහේතු අධිපති ඉන්ද්‍රිය අවිපාකසටනාවන්හි සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපතිචිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන වීමංසාධිපතිය "මග්ග හෙතු අධිපති සහජාත නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති චත්තාරි" ඉතිරි සටනා දෙකින් අඤ්ඤමඤ්ඤ සම්පයුත්තයන් යොද එකක් ද විප්පයුත්තය යොද එකක් ද විස්තර කරනු. සවිපාකයන්හි සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන ඵලචිත්තයන්හි වීමංසාධිපතිය - "මග්ග හෙතු අධිපති සහජාත නිස්සය විපාක ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති එකං" ඉතිරි සටනා දෙක පිළිවෙළින් අඤ්ඤමඤ්ඤ ය හා සම්ප්‍රයුක්තය ද විප්පයුත්තය ද යොද විස්තර කරනු. සහේතු අධිපති ඉන්ද්‍රිය සටනා සයෙකි. මග්ගමිස්සකයෙහි සභාග දෙළොසෙකි. සටනා සත්පනසෙකි.

## 19 සම්පයුත්ත මිස්සක පාලිය.

සම්පයුත්තපච්චයා හෙතුයා තීණි, අධිපතියා තීණි, සහජාතෙ තීණි, අඤ්ඤමඤ්ඤෙ තීණි, නිස්සයෙ තීණි, කම්මෙ තීණි, විපාකෙ එකං, ආහාරෙ තීණි, ඉන්ද්‍රියෙ තීණි, ඣානෙ තීණි, මග්ගෙ තීණි, අත්ථියා තීණි, අවිගතෙ තීණි.

සම්පයුත්ත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගතන්ති තීණි, සම්පයුත්ත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං.

### සන්නය.

මග්ගමිස්සකයට අනතුරුව සම්පයුත්ත මිස්සකය වදළ සේක. එද සභාග සටනා වශයෙන් දෙවැදෑරුම් වේ. එහි සම්පයුත්ත මූලක හේතුසභාගය ය, අධිපතිසභාගය ය, සහජාතසභාගය ය, අඤ්ඤමඤ්ඤසභාගය ය, නිස්සයසභාගය ය, කම්මසභාගය ය, විපාකසභාගය ය, ආහාරසභාගය ය, ඉන්ද්‍රියසභාගය ය, ඣානසභාගය ය, මග්ගසභාගය ය, අත්ථිසභාගය ය, අවිගතසභාගය ය යයි සභාගවාර තෙළෙසකි.

1. එයින් සම්පයුත්තමූලක හේතුසභාගයෙහි සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන හේතු සය- "සම්පයුත්ත පච්චයා හෙතුයා තීණි"

Non-commercial distribution

2. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන අධිපති ධර්‍ම තුන සතර අතුරෙන් එක එකක් වූ අධිපති ප්‍රත්‍යය - "සම්පයුත්ත පච්චයා අධිපතියා තීණි"

3. සහජාත සභාගයෙහි ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ- "සම්පයුත්තපච්චයා සහජාතෙ තීණි" 4. 5. අඤ්ඤමඤ්ඤ නිස්සය සභාග දෙක ද එසේය.

6. කර්‍මසභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන චේතනාව- "සම්පයුත්තපච්චයා කම්මෙ තීණි" 7. විපාකසභාගයෙහි ඔවුනොවුන්ට ම ප්‍රත්‍යය වන විපාකනාමස්කන්ධයෝ "සම්පයුත්තපච්චයා විපාකෙ එකං" 8. ආහාරසභාගයෙහි සම්පයුක්තස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන නාමාහාර තුන "සම්පයුත්ත පච්චයා ආහාරෙ තීණි" 9. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්‍ම අට- "සම්පයුත්තපච්චයා ඉන්ද්‍රියෙ තීණි" 10. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ග පස "සම්ප්‍රයුක්ත පච්චයා ඣානෙ තීණි"

11. සම්ප්‍රයුක්තස්කන්ධයන්ට ම ප්‍රත්‍යය වන මාර්‍ගාඞ්ග නවය "සම්පයුත්තපච්චයා මග්ගෙ තීණි" 12. 13. අත්ථි අවිගත දෙක සහජාතය මෙනි. "තීණි"

සටනා

මග්ගමිස්සකයෙහි අවිපාක සවිපාක වශයෙන් සටනා දෙකකි. ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ "සම්පයුත්ත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගතන්ති තීණි" සවිපාක සටනාවෙහි ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ "සම්පයුත්ත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං"

## 20 විප්පයුත්ත මිස්සක පාලිය

විප්පයුත්තපච්චයා හෙතුයා තීණි, ආරම්මණෙ තීණි, අධිපතියා චත්තාරි, සහජාතෙ තීණි, අඤ්ඤමඤ්ඤෙ එකං, නිස්සයෙ පඤ්ච, උපනිස්සයෙ එකං, පුරෙජාතෙ තීණි, පච්ඡාජාතෙ තීණි, කම්මෙ තීණි, විපාකෙ එකං, ආහාරෙ තීණි, ඉන්ද්‍රියෙ තීණි, ඣානෙ තීණි, මග්ගෙ තීණි, අත්ථියා පඤ්ච, අවිගතෙ පඤ්ච.

විප්පයුත්ත අත්ථි අවිගතන්ති පඤ්ච, විප්පයුත්ත නිස්සය අත්ථි අවිගත න්ති පඤ්ච, විප්පයුත්තාධිපති නිස්සය අත්ථි අවිගතන්ති චත්තාරි, විප්පයුත්ත නිස්සය ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති තීණි.

Non-commercial distribution

විප්පයුත්ත පච්ඡාජාත අත්ථි අවිගතන්ති තීණි, විප්පයුත්ත නිස්සය පුරෙජාත අත්ථි අවිගතන්ති තීණි, විප්පයුත්ත ආරම්මණ නිස්සය පුරෙජාත අත්ථි අවිගතන්ති තීණි, විප්පයුත්ත ආරම්මණාධිපති නිස්සය උපනිස්සය පුරෙජාත අත්ථි අවිගතන්ති එකං, විප්පයුත්ත නිස්සය පුරෙජාත ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති එකං.

විප්පයුත්ත සහජාත නිස්සය අත්ථි අවිගතන්ති තීණි, විප්පයුත්ත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගතන්ති එකං, විප්පයුත්ත සහජාත නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං, විප්පයුත්ත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං.

සන්නය.

සම්පයුත්තමිස්සකයට අනතුරු ව විප්පයුත්ත මිස්සකය වදළ සේක. එද සභාගඝටනා වශයෙන් දෙවැදෑරුම් වේ. එහි විප්පයුත්ත මූලක හේතුසභාගය ය, ආරම්මණසභාගය ය, අධිපති සභාගය ය, සහජාතසභාගය ය, අඤ්ඤමඤ්ඤසභාගය ය, නිස්සය සභාගය ය, උපනිස්සයසභාගය ය, පුරේජාතසභාගය ය, පච්ඡාජාත සභාගය ය, කම්මසභාගය ය, විපාකසභාගය ය, ආහාරසභාගය ය, ඉන්ද්‍රියසභාගය ය, ඣානසභාගය ය, මග්ගසභාගය ය, අත්ථි සභාගය ය, අවිගතසභාගය ය යි සභාග වාර සතොළොසෙකි.

1. එයින් හේතුසභාගයෙහි සහේතුකචිත්තජ සහේතුක ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන හේතු සය විප්පයුත්ත පච්චයා හේතුයා තීණි"

2. ආරම්මණ සභාගයෙහි මනෝද්වාරාවජ්ජන මරණාසන්න ජවන තදරම්මණයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතොළොස්වන චිත්තය හා උපන් හෘදය වස්තුව වූ වස්තුවාරම්මණ ප්‍රත්‍යය- "විප්පයුත්ත පච්චයා ආරම්මණෙ තීණි"

3. විප්පයුත්තමූලක අධිපති සභාගයෙහි සාධිපති චිත්තජ- රූපයන්ට ප්‍රත්‍යය වන අධිපතිධර්ම තුන සතර අතුරෙන් එක එකක් වූ ආරම්මණාධිපති ප්‍රත්‍යය, ගරුකොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන ච්‍යුතිචිත්තයෙන් සතළොස් වන චිත්තය හා උපන් හෘදය වස්තුව වූ වස්තුවාරම්මණ ප්‍රත්‍යය ය යන මොවුහු- "විප්පයුත්තපච්චයා අධිපතියා චත්තාරි"

4. සහජාතසභාගයෙහි සකල සහජාත විප්‍රයුක්තප්‍රත්‍යය ධර්මයෝ- "විප්පයුත්තපච්චයා සහජාතෙ තීණි"

Non-commercial distribution

5. අඤ්ඤමඤ්ඤසභාගයෙහි ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධ හෘදයවස්තූහු- "විප්පයුත්ත පච්චයා අඤ්ඤමඤ්ඤෙ එකං"

6. නිස්සය සභාගයෙහි ගරු කළ යුතු වූ වස්ත්වාරම්මණ ප්‍රත්‍යය "විප්පයුත්තපච්චයා නිස්සයෙ එකං"

7. පුරේජාතසභාගයෙහි සකල පුරේජාත විප්පයුක්තප්‍රත්‍යය ධර්‍මයෝ- "විප්පයුත්තපච්චයා පුරෙජාතෙ තීණි"

8. පශ්චාජ්ජාතසභාගයෙහි සකල පශ්චාජ්ජාතප්‍රත්‍යය ධර්‍මයෝ- "විප්පයුත්තපච්චයා පච්ඡාජාතෙ තීණි"

9. කම්මසභාගයෙහි චිත්තජරූප ප්‍රතිසන්ධිකර්‍මජරූපයන්ට ප්‍රත්‍යය වන චේතනා වූ සහජාත කර්‍මප්‍රත්‍යය- "විප්පයුත්තපච්චයා කම්මෙ තීණි"

10. විපාකසභාගයෙහි චිත්තජරූප ප්‍රතිසන්ධිකර්‍මජරූපයන්ට ප්‍රත්‍යය වන විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය යන මොවුහු- "විප්පයුත්තපච්චයා විපාකෙ එකං"

11. ආහාරසභාගයෙහි චිත්තජරූප ප්‍රතිසන්ධිකර්‍මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමාහාර තුන "විප්පයුත්තපච්චයා ආහාරෙ තීණි"

12. ඉන්ද්‍රියසභාගයෙහි චිත්තජරූප ප්‍රතිසන්ධිකර්‍මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්‍ම අට- "විප්පයුත්තපච්චයා ඉන්ද්‍රියෙ තීණි"

13. ධ්‍යානසභාගයෙහි චිත්තජරූප ප්‍රතිසන්ධිකර්‍මජරූපයන්ට ප්‍රත්‍යය වන ධ්‍යානාඞ්ග ධර්‍මපස- "විප්පයුත්තපච්චයා ඣානෙ තීණි"

14. චිත්තජරූප ප්‍රතිසන්ධි කර්‍මජරූපයන්ට ප්‍රත්‍යය වන මාර්ගාඞ්ගධර්‍ම නවය- "විප්පයුත්තපච්චයා මග්ගෙ තීණි"

15. 16. අත්ථිසභාගයෙහි සකල සහජාත විප්පයුත්ත පුරේජාත විප්පයුක්ත පශ්චාජ්ජාත විප්පයුක්ත ප්‍රත්‍යය ධර්‍මයෝ- "විප්පයුත්තපච්චයා පඤ්ච" "අවිගතෙ පඤ්ච"

## ඝටනා

සභාගයන්ට අනතුරුව ඝටනාවන් වදළ සේක. මෙහි මිස්සකඝටනාය, පකිණ්ණකඝටනාය, සහජාත ඝටනාය යි ඝටනා තුන් කොටසෙකි. අත්ථි

Non-commercial distribution

අවිගත ඝටනාවය, සනිස්සය ඝටනාවය සාධිපතිනිස්සයඝටනාවය, සනිස්සය ඉන්ද්‍රියඝටනාව යයි මිශ්‍රක ඝටනා සතරෙකි.

1. එයින් අත්‍ථි අවිගතඝටනාව මෙසේ ය: සකල සහජාත විප්‍රයුක්ත පුරේජාත විප්‍රයුක්ත පශ්චාජ්ජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ධර්මයෝ "විප්පයුත්ත අත්‍ථි අවිගතන්ති පඤ්ච"

2. සනිස්සයඝටනාව මෙසේ ය, සකල සහජාත විප්‍රයුක්ත පුරේජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ධර්මයෝ- "විප්පයුත්ත නිස්සය අත්‍ථි අවිගතන්ති පඤ්ච"

3. සාධිපති නිස්සය ඝටනාව මෙසේ ය: සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යය වන අධිපති ධර්ම තුන සතර අතුරෙන් එක එකක් වූ සහජාතාධිපති ප්‍රත්‍යයය, ගරුකොට අරමුණු කරන ලෝභමූල මරණාසන්නජවනයන්ට ප්‍රත්‍යය වන ගරු කළ යුතු හෘදය වස්තුව වූ වස්ත්‍වාරම්මණ ප්‍රත්‍යය ය යන මොවුහු "විප්පයුත්ත අධිපති නිස්සය අත්‍ථි අවිගතන්ති චත්තාරි"

4. සනිස්සය ඉන්ද්‍රිය ඝටනාව මෙසේ ය: චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්ම අට වූ සහජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ය, පඤ්චවිඥාන ධාතුන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තු සඞ්ඛ්‍යාත පුරේජාතේන්ද්‍රිය ප්‍රත්‍යය යන මොව්හු "විප්පයුත්ත නිස්සය අත්‍ථි අවිගතන්ති තීණි"

මිස්සකඝටනා නිමි

පච්ඡාජාත අත්‍ථි අවිගත ඝටනාව ය, නිස්සය පුරේජාත අත්‍ථි අවිගත ඝටනාවය. සාරම්මණ ඝටනාව ය, සාරම්මණාධිපති උපනිස්සය ඝටනාව ය, ස ඉන්ද්‍රිය ඝටනාව යයි ප්‍රකීර්ණක ඝටනා පසෙකි.

1. එහි පච්ඡාජාත අත්‍ථි අවිගත ඝටනාව මෙසේය: සකල පශ්චාජ්ජාත ප්‍රත්‍යය ධර්මයෝ "විප්පයුත්ත පච්ඡාජාත අත්‍ථි අවිගතන්ති තීණි"

2. නිස්සය පුරේජාත අත්‍ථි අවිගත ඝටනාව මෙසේය: සකල පුරේජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ධර්මයෝ: "විප්පයුත්ත නිස්සය පුරෙජාත අත්‍ථි අවිගතන්ති තීණි"

3. සාරම්මණඝටනාව මෙසේය: මනෝද්වාරාවජ්ජන මරණාසන්න -පෙ- හෘදය වස්තුව වූ වස්ත්‍වාරම්මණ ප්‍රත්‍යය "විප්පයුත්ත ආරම්මණ නිස්සය පුරෙජාත අත්‍ථි අවිගතන්ති තීණි"

4. සාරම්මණාධිපති උපනිස්සය ඝටනාව මෙසේ ය: ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න ජවනයන්ට ප්‍රත්‍යය වන -පෙ-

Non-commercial distribution

වත්ථාරම්මණප්‍රත්‍යය "විප්පයුත්ත ආරම්මණාධිපති නිස්සය උපනිස්සය පුරේජාත අත්ථි අවිගතන්ති එකං"

5. සඉන්ද්‍රිය ඝටනාව මෙසේය: පඤ්චවිඥාන ධාතුන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තූහු: "විප්පයුත්ත නිස්සය පුරෙජාත ඉන්ද්‍රිය අත්ථි අවිගතන්ති එකං"

ප්‍රකීර්ණක ඝටනා නිමි.

අවිපාක සවිපාක වශයෙන් සහජාත ඝටනා දෙකොටසෙකි. එහි සබ්බට්ඨානික ඝටනාවය, ස අඤ්ඤමඤ්ඤ ඝටනාව යයි අවිපාක ඝටනා දෙකකි. (1) එයින් සබ්බට්ඨානිඝටනාව මෙසේ ය: සකල සහජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය: "විප්පයුත්ත සහජාත නිස්සය අත්ථි අවිගතන්ති තීණි" (2) ස අඤ්ඤමඤ්ඤ ඝටනාව මෙසේ ය: ඔවුනොවුන්ට ප්‍රත්‍යය වන සකල ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ: "විප්පයුත්ත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි අවිගතන්ති එකං"

සබ්බට්ඨානික ඝටනාවය, සඅඤ්ඤමඤ්ඤ ඝටනාව යයි සවිපාක ඝටනා දෙකකි. (1) සබ්බට්ඨානික ඝටනාව මෙසේය: චිත්තජ රූප ප්‍රතිසන්ධි කර්‍මජ රූපයන්ට ප්‍රත්‍යය වන විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝය යන මොවුහු "විප්පයුත්ත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං" (2) සඅඤ්ඤමඤ්ඤ ඝටනාව මෙසේ ය: හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ "විප්පයුත්ත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි අවිගතන්ති එකං"

සහජාත ඝටනා සතර නිමි.

මෙහි සභාගවාර සතොළොසකි. මිස්සක ඝටනා සතරය, පකිණ්ණක ඝටනා පසය, සහජාත ඝටනා සතරය යි ඝටනා තෙළෙසකි.

අත්ථිමිස්සක පාලිය

අත්ථිපච්චයා හෙතුයා සත්ත, ආරම්මණෙ තීණි, අධිපතියා අට්ඨ. සහජාතෙ නව, අඤ්ඤමඤ්ඤෙ තීණි, නිස්සයෙ තෙරස, උපනිස්සයෙ එකං, පුරෙජාතෙ තීණි, පච්ඡාජාතෙ තීණි; කම්මෙ සත්ත, විපාකෙ එකං, ආහාරෙ සත්ත, ඉන්ද්‍රියෙ සත්ත, ඣානෙ සත්ත, මග්ගෙ සත්ත, සම්පයුත්තෙ තීණි, විප්පයුත්තෙ පඤ්ච, අවිගතෙ තෙරස.

අත්ථි අවිගතන්ති තෙරස, අත්ථි නිස්සය අවිගත න්ති තෙරස, අත්ථි අධිපති අවිගතන්ති, අට්ඨ අත්ථි අධිපති නිස්සය අවිගතන්ති අට්ඨ, අත්ථි

Non-commercial distribution

ආහාර අවිගත න්ති සත්ත, අත්ථි ඉන්ද්‍රිය අවිගතන්ති සත්ත, අත්ථි නිස්සය ඉන්ද්‍රිය අවිගතන්ති පඤ්ච, අත්ථි විප්පයුත්ත අවිගතන්ති පඤ්ච, අත්ථි නිස්සය විප්පයුත්ත අවිගතන්ති පඤ්ච, අත්ථි අධිපති නිස්සය විප්පයුත්ත අවිගතන්ති චත්තාරි, අත්ථි නිස්සය ඉන්ද්‍රිය විප්පයුත්ත අවිගතන්ති තීණි.

අත්ථි පච්ඡාජාත විප්පයුත්ත අවිගතන්ති තීණි, අත්ථි පුරෙජාත අවිගතන්ති තීණි, අත්ථි නිස්සය පුරෙජාත විප්පයුත්ත අවිගතන්ති තීණි, අත්ථි ආරම්මණ පුරෙජාත අවිගතන්ති තීණි, අත්ථි ආරම්මණ නිස්සය පුරෙජාත විප්පයුත්ත අවිගත න්ති තීණි, අත්ථි ආරම්මණාධිපති උපනිස්සය පුරෙජාත අවිගතන්ති එකං, අත්ථි ආරම්මණාධිපති නිස්සය උපනිස්සය පුරෙජාත විප්පයුත්ත අවිගතන්ති එකං, අත්ථි නිස්සය පුරෙජාත ඉන්ද්‍රිය විප්පයුත්ත අවිගතන්ති එකං. (පකිණ්ණකං නාම ඉමං)

අත්ථි සහජාත නිස්සය අවිගත න්ති නව, අත්ථි සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අවිගතන්ති තීණි, අත්ථි සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අවිගතන්ති තීණි, අත්ථි සහජාත නිස්සය විප්පයුත්ත අවිගතන්ති තීණි. අත්ථි සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විප්පයුත්ත අවිගතන්ති එකං.

අත්ථි සහජාත නිස්සය විපාක අවිගතන්ති එකං, අත්ථි සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අවිගතන්ති එකං, අත්ථි සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක සම්පයුත්ත අවිගතන්ති එකං, අත්ථි සහජාත නිස්සය විපාක විප්පයුත්ත අවිගතන්ති එකං, අත්ථි සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අවිගතන්ති එකං.

## සන්නය

විප්පයුත්ත මිස්සකයට අනතුරුව අත්ථි මිස්සකය වදාළ සේක. එද සභාග ඝටනා වශයෙන් දෙවැදෑරුම් වේ. එහි අත්ථිමූලක හේතු සභාගය ය, ආරම්මණ සභාගයය, අධිපති සභාගය ය, සහජාත සභාගය ය, අඤ්ඤමඤ්ඤ සභාගයය, නිස්සය සභාගය ය. උපනිස්සය සභාගය ය, පුරෙජාත සභාගය ය, පච්ඡාජාත සභාගයය, කම්මසභාගය ය, විපාක සභාගයය, ආහාර සභාගයය, ඉන්ද්‍රිය සභාගය ය, ඣානසභාගය ය, මග්ගසභාගයය, සම්පයුත්තසභාගය ය, විප්පයුත්ත සභාගයය, අවිගත සභාගය ය යයි සභාගවාර අටළොසෙකි.

1. එහි අත්ථි මූලක හේතු සභාගයෙහි සම්ප්‍රයුක්තස්කන්ධ සහේතුක චිත්තජ රූප සහේතුක ප්‍රතිසන්ධි කර්මජ රූපයන්ට ප්‍රත්‍යය වන හේතු සය "අත්ථිපච්චයා හෙතුයා සත්ත"

2. ආරම්මණ සභාගයෙහි කාමසිත් සිවුපනසට හා දිබ්බචක්ඛු දිබ්බසෝත අභිඤ්ඤාවන්ට ප්‍රත්‍යය වන නිෂ්පන්නරූප අටොළොස වූ ආරම්මණ පුරේජාත ප්‍රත්‍යය "අත්ථිපච්චයා ආරම්මණෙ තීණි"

3. අධිපති සභාගයෙහි ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු ඉෂ්ට නිෂ්පන්නරූප අටොළොස වූ ආරම්මණාධිපති ප්‍රත්‍යය ය, සකලසහජාතාධිපති ප්‍රත්‍යය ය යන මොවුහු "අත්ථිපච්චයා අධිපතියා අට්ඨ"

4. සහජාතසභාගයෙහි සකල සහජාත ප්‍රත්‍යයධර්මයෝ "අත්ථි පච්චයා සහජාතෙ නව"

5. අඤ්ඤමඤ්ඤ සභාගයෙහි සකල අන්‍යෝන්‍ය ප්‍රත්‍යය "අත්ථි පච්චයා අඤ්ඤමඤ්ඤෙ තීණි"

6. නිස්සය සභාගයෙහි සකල සහජාත නිඃශ්‍රය පුරේජාත නිඃශ්‍රය ප්‍රත්‍යය ධර්මයෝ "අත්ථි පච්චයා නිස්සයෙ තෙරස"

7. උපනිස්සය සභාගයෙහි ගරු කොට අරමුණු කරන ලෝභ මූල අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු ඉෂ්ටනිෂ්පන්නරූප අටළොස වූ ආරම්මණපුරේජාතාත්ථිය "අත්ථි පච්චයා උපනිස්සයෙ එකං"

8. පුරේජාත සභාගයෙහි සකලාරම්මණ පුරේජාත වත්ථු පුරේජාත ප්‍රත්‍යයෝ "අත්ථි පච්චයා පුරේජාතෙ තීණි" (9) පච්ඡාජාතසභාගයෙහි සකලපශ්චාජ්ජාත ප්‍රත්‍යය ධර්මයෝ "අත්ථි පච්චයා පච්ඡාජාතෙ තීණි" (10) කම්මසභාගයෙහි සකලසහජාත කර්මප්‍රත්‍යය "අත්ථි පච්චයා කම්මෙ සත්ත" (11) විපාක සභාගයෙහි සකල විපාක ප්‍රත්‍යය "අත්ථි පච්චයා විපාකෙ එකං" (12) ආහාර සභාගයෙහි සකලනාමාහාර රූපාහාර ප්‍රත්‍යය ධර්මයෝ "අත්ථි පච්චයා ආහාරෙ තීණි" (13) ඉන්ද්‍රියසභාගයෙහි සකල සහජාතේන්ද්‍රිය පුරේජාතේන්ද්‍රිය රූප ජීවිතේන්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝ "අත්ථි පච්චයා ඉන්ද්‍රියෙ සත්ත" (14) ඣාන සභාගයෙහි සකලධ්‍යාන ප්‍රත්‍යය ධර්මයෝ "අත්ථි පච්චයා ඣානෙ සත්ත" (15) මග්ගසභාගයෙහි සකලමාර්ගප්‍රත්‍ය ධර්මයෝ "අත්ථිපච්චයා මග්ගෙ සත්ත" (16) සම්පයුත්තසභාගයෙහි සකල සම්ප්‍රයුක්තප්‍රත්‍යය ධර්මයෝ "අත්ථිපච්චයා සම්පයුත්තෙ තීණි" (17) විප්පයුත්ත සභාගයෙහි සකල සහජාත විප්‍රයුක්ත පුරේජාත විප්‍රයුක්ත පශ්චාජ්ජාතවිප්‍රයුක්ත ප්‍රත්‍යය ධර්මයෝ "අත්ථිපච්චයා විප්පයුත්තෙ පඤ්ච" (18) අවිගත සභාගයෙහි සකලාස්ති ප්‍රත්‍යය ධර්මයෝ "අත්ථිපච්චයා අවිගතෙ තෙරස"

Non-commercial distribution

## සඝටනා

සභාගයන්ට අනතුරුව සඝටනාවන් වදාළ සේක. මිස්සක සඝටනා ය, පකිණ්ණක සඝටනාය, සහජාත සඝටනා යයි එහි සඝටනා තුන් කොටසෙකි. අවිගත සඝටනාවය, සනිස්සය සඝටනාවය, සාධිපති සඝටනාවය, සාධිපතිනිස්සය සඝටනාව ය, ස ආහාරසඝටනාව ය, ස ඉන්ද්‍රියසඝටනාව ය, සනිස්සයඉන්ද්‍රිය සඝටනාව ය, සවිප්පයුත්තසඝටනාව ය, සනිස්සය විප්පයුත්ත සඝටනාවය, සාධිපති නිස්සය විප්පයුත්ත සඝටනාව ය, සනිස්සය ඉන්ද්‍රියවිප්පයුත්ත සඝටනාව යයි මිශ්‍රක සඝටනා එකොළොසකි.

1. එහි අවිගත සඝටනාව මෙසේ ය: සකල සහජාතාස්ති පුරේජාතාස්ති පශ්චාජ්ජාතාස්ති ආහාරාස්ති ඉන්ද්‍රියාස්ති ප්‍රත්‍යය ධර්මයෝ - "අත්ථි අවිගතන්ති තෙරස."

2. සනිස්සය සඝටනාව මෙසේ ය: සකලසහජාතනිඃශ්‍රය පුරෙජාත නිඃශ්‍රය ප්‍රත්‍යය ධර්මයෝ- "අත්ථි නිස්සය අවිගතන්ති තෙරස."

3. සාධිපති සඝටනාව මෙසේ ය: සම්ප්‍රයුක්තස්කන්ධ සාධිපති චිත්තජරූපයන්ට ප්‍රත්‍යයවන සකලසහජාතාධිපති ප්‍රත්‍යය ධර්මයෝ ය, ගරුකොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු ඉෂ්ටනිෂ්පන්නරූප අටළොස වූ ආරම්මණාධිපති ප්‍රත්‍යයය යන මොවුහු- "අත්ථි අධිපති අවිගතන්ති අට්ඨ."

4. සාධිපති නිස්සය සඝටනාව මෙසේ ය: සකලසහජතාධිපති ප්‍රත්‍යයය ගරුකොට අරමුණු කරන ලෝභමූලමරණාසන්න -පෙ- හෘදයවස්තුව වූ වස්තුවාරම්මණ ප්‍රත්‍යය ය යන මොවුහු- "අත්ථි අධිපති නිස්සය අවිගතන්ති අට්ඨ."

5. සආහාරසඝටනාව මෙසේ ය: සකල නාමාහාර රූපාහාර ප්‍රත්‍යය ධර්මයෝ "අත්ථි ආහාර අවිගතන්ති සත්ත."

6. සඉන්ද්‍රිය සඝටනාව මෙසේ ය: සකලසහජාතේන්ද්‍රිය පුරේජාතේන්ද්‍රිය රූපජීවිතේන්ද්‍රිය ප්‍රත්‍යයධර්මයෝ- "අත්ථි ඉන්ද්‍රිය අවිගතන්ති සත්ත. 7. සනිස්සය ඉන්ද්‍රිය සඝටනාවෙහි සකලසහජාතේන්ද්‍රිය පුරේජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ධර්මයෝ- "අත්ථි නිස්සය, ඉන්ද්‍රිය අවිගතන්ති සත්ත." 8. සවිප්පයුත්ත සඝටනාවෙහි සකලසහජාත විප්‍රයුක්ත පුරේජාත විප්‍රයුක්ත පශ්චාජ්ජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ධර්මයෝ- "අත්ථි විප්පයුත්ත අවිගත න්ති පඤ්ච" 9. සනිස්සය විප්පයුක්ත සඝටනා වෙහි සකල සහජාත විප්‍රයුක්ත පුරේජාත විප්‍රයුක්ත ප්‍රත්‍යය ධර්මයෝ- "අත්ථි නිස්සය විප්පයුත්ත අවිගත න්ති පඤ්ච." 10. සාධිපති නිස්සය විප්පයුත්ත

Non-commercial distribution

සටනාවෙහි සාධිපතිචිත්තජ රූපයන්ට ප්‍රත්‍යය වන අධිපති ධර්ම තුන සතර අතුරෙන් එක එකක් වූ සහජාතාධිපති ප්‍රත්‍යය ය, ගරු කොට අරමුණු කරන ලෝභමූල මරණාසන්නජවනයන්ට ප්‍රත්‍යය වන -පෙ- වස්තුවාරම්මණ ප්‍රත්‍යයය යන මොවුහු- "අත්ථි අධිපති නිස්සය විප්පයුත්ත අවිගතන්ති චත්තාරි" 11. සනිස්සය ඉන්ද්‍රිය විප්පයුත්ත සටනාවෙහි චිත්තජ ප්‍රතිසන්ධිකර්මජරූපයන්ට ප්‍රත්‍යය වන නාමේන්ද්‍රිය ධර්ම අට වූ සහජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ය, පඤ්චවිඥානයන්ට ප්‍රත්‍යය වන පඤ්ච වස්තු සඞ්ඛ්‍යාත පුරේජාතේන්ද්‍රිය ප්‍රත්‍යය ය යන මොවුහු- "අත්ථි නිස්සය ඉන්ද්‍රිය විප්පයුත්ත අවිගත න්ති තීණි."

මිශ්‍රක සටනා එකොළොස නිමි.

පච්ඡාජාත අවිගත සටනාව ය, පුරේජාත අවිගත සටනාව ය, සනිස්සය විප්පයුත්ත සටනාව ය, සාරම්මණ සටනාව ය, සාරම්මණ නිස්සය විප්පයුත්තසටනාව ය, සාරම්මණාධිපති උපනිස්සය සටනාව ය, සාරම්මණාධිපති නිස්සය උපනිස්සය විප්පයුත්ත සටනාව ය. සනිස්සය ඉන්ද්‍රිය විප්පයුත්තසටනාව යයි ප්‍රකීර්ණක සටනා අටෙකි.

1. එහි පච්ඡාජාත අවිගත සටනාව මෙසේ ය: සකල පශ්චාජ්ජාත ප්‍රත්‍යය ධර්මයෝ- "අත්ථි පච්ඡාජාත විප්පයුත්ත අවිගතන්ති තීණි.

2. පුරේජාත අවිගත සටනාව මෙසේ ය: සකලාරම්මණ පුරේජාතාස්ති වස්තුපුරේජාතාස්ති ප්‍රත්‍යයෝ- "අත්ථි පුරේජාත අවිගතන්ති තීණි."

3. සනිසසය විපපයුතත සටනාව මෙසේ ය: සකලපුරේජාතාස්ති ප්‍රත්‍යය ධර්මයෝ- "අත්ථිනිස්සයපුරෙජාත විප්පයුත්ත අවිගතන්ති තීණි." 4. සාරම්මණ සටනාවෙහි සකලාරම්මණ පුරේජාතාස්ති ප්‍රත්‍යය- "අත්ථි ආරම්මණ පුරේජාත අවිගතන්ති තීණි." 5. සාරම්මණ නිස්සය විප්පයුත්ත සටනාවෙහි- මනෝද්වාරාවජ්ජනය ය මරණාසන්න -පෙ- වස්තුවාරම්මණ ප්‍රත්‍යය "අත්ථි ආරම්මණ නිස්සය පුරෙජාත විප්ප යුත්ත අවිගතන්ති තීණි." 6. සාරම්මණ අධිපති උපනිස්සය සටනාවෙහි ගරු කොට අරමුණු කරන ලෝභමූල සිත් අටට ප්‍රත්‍යය වන ගරු කළ යුතු ඉෂ්ටනිෂ්පන්නරූප අටළොස- "අත්ථි ආරම්මණාධිපති උපනිස්සය පුරෙජාත අවිගතන්ති එකං." 7. සාරම්මණාධිපති නිස්සය උපනිස්සය විප්පයුත්ත සටනාවෙහි ගරුකොට අරමුණු කරන ලෝභමූල මරණාසන්න -පෙ- වස්තුවාරම්මණ ප්‍රත්‍යය- "අත්ථි ආරම්මණාධිපති නිස්සය උපනිස්සය පුරෙජානෙ විප්පයුත්ත අවිගතන්ති එකං." 8.

Non-commercial distribution

සනිස්සය ඉන්‍ද්‍රිය විප්පයුත්ත සටනාවෙහි පඤ්චවිඥානධාතූන්ට ප්‍රත්‍යය වන පඤ්චවස්තූහු- "අත්ථි නිස්සය පුරෙජාත ඉන්‍ද්‍රිය විප්පයුත්ත අවිගතන්ති එකං."

ප්‍රකීර්ණක සටනා අට නිමි.

ප්‍රකීර්ණකසටනාවන්ට අනතුරු ව සහජාත සටනාවන් වදළ සේක. එහි සබ්බට්ඨානික සටනාවය, සඅඤ්ඤමඤ්ඤ සටනාවය, සඅඤ්ඤමඤ්ඤ සම්පයුත්තසටනාවය, සවිප්පයුත්ත සටනාවය, සඅඤ්ඤමඤ්ඤ විප්පයුත්ත සටනාවය යි අවිපාක සටනා පසෙකි. එහි සබ්බට්ඨානික සටනාවෙහි සකලසහජාතාස්ති -පෙ- "අත්ථි සහජාත නිස්සය අවිගත න්ති නව." ඉතිරි සටනා සතර අඤ්ඤමඤ්ඤය ද, අඤ්ඤමඤ්ඤ සම්පයුත්ත දෙක ද, විප්පයුත්තය ද, අඤ්ඤමඤ්ඤ විප්පයුත්ත දෙක ද පිළිවෙළින් යොද සහජාතයෙහි මෙන් විස්තර කරනු.

සවිපාක සටනාවන්හි ඔවුනොවුන්ට ද, ඔවුනොවුන්ට හා චිත්තජරූප ප්‍රතිසන්ධි කර්මජරූපයන්ට ද, ප්‍රත්‍යය වන සකල විපාක ප්‍රවෘත්ති ප්‍රතිසන්ධි නාමස්කන්ධයෝ ය, හෘදයවස්තුවට ප්‍රත්‍යය වන පඤ්චවෝකාර ප්‍රතිසන්ධිනාමස්කන්ධයෝය යන මොවුහු- "අත්ථි සහජාත නිස්සය විපාක අවිගතන්ති එකං" ඉතිරි සටනා සතර අවිපාක සටනා අනුව විස්තර කරනු.

සහජාත සටනා දශය නිමි.

මෙහි සභාගවාර අටළොසකි. මිශ්‍රක සටනා එකොළොස ය, ප්‍රකීර්ණක සටනා අට ය, සහජාත සටනා දශය යයි සටනා එකුන් තිසකි.

නත්ථිමිස්සක පාලිය

නත්ථිපච්චයා අනන්තරෙ සත්ත, සමනන්තරෙ සත්ත, උපනිස්සයෙ සත්ත, ආසෙවනෙ තීණි, කම්මෙ එකං, විගතෙ සත්ත.

නත්ථි අනන්තර සමනන්තර උපනිස්සය විගතන්ති සත්ත, නත්ථි අනන්තර සමනන්තර උපනිස්සය ආසෙවන විගතන්ති තීණි, නත්ථි අනන්තර සමනන්තර උපනිස්සය කම්ම විගතන්ති එකං."

විගතමිස්සක පාලිය.

විගතපච්චයා අනන්තරෙ සත්ත, සමනන්තරෙ සත්ත, උපනිස්සයෙ සත්ත, ආසෙවෙන තීණි, කම්මෙ එකං, නත්ථියා සත්ත.

Non-commercial distribution

විගත අනන්තර සමනන්තර උපනිස්සය නත්ථිති සත්ත, විගත අනන්තර සමනන්තර උපනිස්සය ආසෙවන නත්ථිති තීණි, විගත අනන්තර සමනන්තර උපනිස්සය කම්ම නත්ථි ති එකං.

(නත්ථි විගත මිශ්‍රක වාර දෙක අනන්තර මිශ්‍රකය මෙන් විස්තර කරනු.)

## අවිගත මිස්සක පාලිය.

අවිගතපච්චයා හෙතුයා සත්ත, ආරම්මණෙ තීණි, අධිපතියා අට්ඨ, සහජාතෙ නව, අඤ්ඤමඤ්ඤෙ තීණි, නිස්සයෙ තෙරස, උපනිස්සයෙ එකං, පුරෙජාතෙ තීණි, පච්ඡාජාතෙ තීණි, කම්මෙ සත්ත, විපාකෙ එකං, ආහාරෙ සත්ත, ඉන්ද්‍රියෙ සත්ත, ඣානෙ සත්ත, මග්ගෙ සත්ත, සම්පයුත්තෙ තීණි, විප්පයුත්තෙ පඤ්ච, අත්ථියා තෙරස.

අවිගත අත්ථිති තෙරස, අවිගත නිස්සය අත්ථි ති තෙරස, අවිගත අධිපති අත්ථි ති අට්ඨ, අවිගතාධිපති නිස්සය අත්ථි ති අට්ඨ, අවිගත ආහාර අත්ථිති සත්ත, අවිගත ඉන්ද්‍රිය අත්ථිති සත්ත, අවිගත නිස්සය ඉන්ද්‍රිය අත්ථිති සත්ත, අවිගත විප්පයුත්ත අත්ථි ති පඤ්ච, අවිගත නිස්සය විප්පයුත්ත අත්ථි ති පඤ්ච, අවිගත අධිපති නිස්සය විප්පයුත්ත අත්ථි ති චත්තාරි, අවිගත නිස්සය ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථිති තීණි.

අවිගත පච්ඡාජාත විප්පයුත්ත අත්ථිති තීණි, අවිගත පුරෙජාත අත්ථිති තීණි, අවිගත නිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථිති තීණි, අවිගත ආරම්මණ පුරෙජාත අත්ථි ති තීණි අවිගත ආරම්මණ නිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථි ති තීණි, අවිගත ආම්මණාධිපති උපනිස්සය පුරෙජාත අත්ථි ති එකං, අවිගත ආරම්මණාධිපති නිස්සය උපනිස්සය පුරෙජාත විප්පයුත්ත අත්ථි ති එකං, අවිගත නිස්සය පුරෙජාත ඉන්ද්‍රිය විප්පයුත්ත අත්ථි ති එකං. පකිණ්ණකං නාම ඉමං.

අවිගත සහජාත නිස්සය අත්ථි ති නව, අවිගත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය අත්ථි ති තීණි, අවිගත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය සම්පයුත්ත අත්ථි ති තීණි, අවිගත සහජාත නිස්සය විප්පයුත්ත අත්ථි ති තීණි, අවිගත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විප්පයුත්ත අත්ථි ති එකං.

අවිගත සහජාත නිස්සය විපාක අත්ථි ති එකං, අවිගත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක අත්ථි ති එකං, අවිගත සහජාත අඤ්ඤමඤ්ඤ

Non-commercial distribution

නිස්සය විපාක සම්පයුත්ත අත්ථි ති එකං, අවිගත සහජාත නිස්සය විපාක විප්පයුත්ත අත්ථි ති එකං, අවිගත සහජාත අඤ්ඤමඤ්ඤ නිස්සය විපාක විප්පයුත්ත අත්ථි ති එකං.

පඤ්හාවාරස්ස අනුලෝම ගණනා.

(අවිගත මිශ්‍රකය අත්ථි මිශ්‍රකය සේ විස්තර කරනු.)

පඤ්හාවාරයේ

# අනුලෝම ගණනා වාරය

නිමි.

මහාචාර්ය

රේරුකානේ චන්දවිමල මහා ස්ථවිරයන් වහන්සේ

විසින් සම්පාදිත

පට්ඨාන මහා පකරණ සන්නයේ

ප්‍රථම භාගය ය.

Non-commercial distribution